# බ්‍රහ්මජාල සූත්‍ර වර්ණනා

දැන් 'මහණෙනි, මමං වා භික්ඛවෙ පරෙ අවණ්ණං භාසෙය්‍යුං ආදී නයින් භාග්‍යවතුන් වහන්සේ විසින් බහාතබන ලද සූත්‍රයෙහි වර්ණනාවට අවකාශය පැමිණියේය. ඒ සූත්‍ර වර්ණනාව සූත්‍ර නික්ෂේපය විචාරා කියනු ලබන්නේ පැහැදිලි වන්නේ ද ඒ නිසා සූත්‍ර නික්ෂේපය විචාරන්නෙමි.

සූත්‍ර නික්ෂේප සතරෙකි. අත්තජ්ඣාසය, පරජ්ඣාසය, පුච්ඡාවසක, අට්ඨුප්පත්තික' යනුවෙන් එහි යම් සූත්‍රාන්ත භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන් විසින් අනාරාධිතව තම කැමැත්තෙන් කියන සේක. ඒ කෙසේද යත්, ආකංඛෙය්‍ය සූත්‍රය, වත්ථ සූත්‍රය, මහා සතිපට්ඨාන සූත්‍රය, මහා සළායතන විභංග සූත්‍රය, අරියවංස සූත්‍රය, සම්මප්පධාන සූත්‍රාන්ත හාරක, ඉද්ධිපාද ඉන්‍ද්‍රියබල, බොජ්ඣංග මග්ගංග සූත්‍රාන්ත හාරක ආදිය. එහි තම කැමැත්ත බහා තැබීමයි. 'රාහුලගේ විමුක්තිය මුහුකුරා යන ධර්ම මුහුකුරා ගොස් ඇත. මත්තෙහි රාහුල ආශ්‍රවක්ෂයයෙහි හික්මවන්නේ නම් මැනවි' යයි මෙසේ අනුන්ගේ අධ්‍යාශය, ඉවසීම, මනස අභිනීහාරය අවබෝධ කරන බව බලා අනුන්ගේ අධ්‍යාශය වශයෙන් කියන ලද්දේය. ඒ කෙසේද යත්, චූළරාහුලෝවාද සූත්‍රය, මහාරාහුලෝවාද සූත්‍රය, ධම්මචක්කප්පවත්තන සූත්‍රය, ධාතු විභංග සූත්‍රය ආදිය එහි පෙර අධ්‍යාශය බහාතැබීමයි. සිව් පිරිස, චතුර් වර්ග, නාග, සුපර්ණ, ගාන්ධර්ව, අසුර, යක්ෂ, මහ රජවරු, තාවතිංස ආදී දෙවිවරු, මහා බ්‍රහ්ම ආදීහු භාග්‍යවතුන් කරා එළඹ, 'ස්වාමීනි, බොජ්ඣංග බොජ්ඣංග' යයි කියනු ලැබේ. 'නීවරණ නීවරණ' යයි කියනු ලැබේ. 'ස්වාමීනි, මේවා පංච උපාදාන ස්කන්ධද, පුරුෂයාට කුමන ධනයක් ශ්‍රේෂ්ඨද ආදී නයින් ප්‍රශ්න අසත්. මෙසේ අසනු ලැබූ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බොජ්ඣංග සංයුත්ත ආදිය කියන ලදද, අන් දෙවතා සංයුත්ත, මාර සංයුත්ත, බ්‍රහ්ම සංයුත්ත, සක්කපඤ්හ, චූලවෙදල්ල, මහාවෙදල්ල, සාමඤ්ඤඵල, ආලවක සූචිලොම ඛරලොම සූත්‍ර ආදිය කියන ලදද, ඔවුන්ගේ පුච්ඡාවසිකය බහාතැබීමයි. උපන් කරුණ නිසා යම් සූත්‍ර කියන ලද ද, ඒ කෙසේද යත්, ධම්ම දායාද, චූල සීහනාද, චන්දූපම, පුත්ත මංසූපම, දාරුක්ඛන්ධූපම, අග්ගික්ඛන්ධූපම, ඵෙණපිණ්ඩූපම, පාරිච්ඡත්තකූපම ආදිය. එහි අට්ඨුප්පත්තිය බහා තැබීමයි. මෙසේ මේ නික්ෂේප සතර අතුරින් මේ සූත්‍රයෙහි අට්ඨුප්පත්ති නික්ඛේපය

වෙයි. අට්ඨුප්පත්තියෙහි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් බහාතබන ලදී. කවර අට්ඨුප්පත්තියකද? වර්ණ අවර්ණයෙහි ගුරුවරයා තෙරුවන්හි අගුණ කීය. අතවැසියා ගුණ කීය. මෙසේ මේ වර්ණ අවර්ණ අට්ඨුප්පත්ති කොට දේශනාවෙහි දක්ෂ වූ භාග්‍යවතුන් වහන්සේ 'මමං වා භික්ඛවෙ පරෙ අවණ්ණං භාසෙය්‍යුං' යනුවෙන් දේශනාව ආරම්භ කළ සේක.

එහි මමං යනු ඡට්ඨී වචනයි. මම මාගේ යන අර්ථයි. වා ශබ්දය විකල්පාර්ථයි. පරෙ යනු ප්‍රතිවිරුද්ධ සත්ත්වයෝය. තත්‍ර යනු යමෙක් අගුණ කියත්ද ඔවුන් කෙරෙහි. න ආඝාතො ආදී තන්හිද, ඒ භික්‍ෂූන්ට ආඝාතයක් නම් නැත. ඉක්බිති නැවත කුලපුත්‍රයන්ට මෙබඳු තැන්වලදී ද අකුශලයට පැමිණීම ප්‍රතිශේධනය කරන සේක් ධර්ම නියාමය තැබූ සේක. එහි සිත කෝප ගන්වතියි ආඝාතො කෝපයට සම වචනයකි. එයින් නොසතුටු වෙත්. අසන්තෝෂ වෙත්. දොම්නස් වෙත්නුයි අප්පච්චයො දොම්නසට සම වචනයකි. තමාගේ ද අනුන්ගේ ද යහපත කැමති වෙයි යනු අනභිරද්ධි කෝපයට සම වචනයකි. මෙසේ මෙහි පද දෙකින් සංස්කාර ස්කන්ධය ද එකකින් වේදනා ස්කන්ධය ද යනුවෙන් ස්කන්ධ දෙක කියන ලදී. ඔවුන්ගේ වශයෙන් සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ කරුණ ප්‍රතික්ෂේප කරන ලද්දේ ම ය.

මෙසේ පළමුවැනි ක්‍රමයෙන් මනෝපදෝෂය වළක්වා දෙවැන්නෙන් එහි ආදීනව දක්වන සේක් මෙසේ වදාළහ. තත්‍ර චෙ තුම්හෙ අස්සථ කුපිතාවා අනත්තමනාවා, තුම්හඤ්ඤෙවස්ස තෙන අන්තරායො ඉදින් එහිදී තොප කුපිත වූවෝ වන්නාහුද, නොසතුටු වූවෝ හෝ වන්නාහුද, එයින් තොපට ම අන්තරාය වෙයි. එහි තත්‍ර චෙ තුම්හෙ අස්සථ යනු ඒ අගුණ කියන්නන් අතර හෝ ඒ අගුණයෙහි හෝ, තොප වන්නාහු නම්, යම්හෙයකින් වන්නාහු නම් යන අර්ථයි. කුපිතා කෝපයෙන් අනත්තමනා දොම්නසින්. තුම්හඤ්ඤෙවස්ස තෙන අන්තරායො තොපට ම ඒ කෝපයෙන් ඒ අසතුටු බැවින් ප්‍රථමධ්‍යාන ආදීන්ට අන්තරාය වන්නේ ය.

මෙසේ දෙවැනි ක්‍රමයෙන් ආදීනව දක්වා තෙවැන්නෙන් වචනාර්ථ සැලකීම් මාත්‍රයෙක්හිද අසමර්ථ බව දක්වන සේක් අපිනු තුම්හෙ පරෙසං ආදිය කීහ. එහි පරෙසං යනු කිසියම් කෙනෙකුට කුපිත වූයේ බුදු පසේබුදු ආර්ය ශ්‍රාවකයන්ගේ, මව්පියන්ගේ, සතුරන්ගේ සුභාෂිත දුර්භාෂිතයන්හි අර්ථය නොදනී.

**කුද්ධො අත්ථං නජානාති - කුද්ධො ධම්මං න පස්සති**
**අන්ධං තමං තදා හොති - යං කොධො සහතෙ නරං**

කිපුණේ අරුත නොදනී - කිපුණේ දහම් නොදකී
ක්‍රෝධ මිනිසා ඉවසන්නේ නම් එකල අන්ධකාරය වෙයි.

**අනත්ථ ජනනො කොධො - කොධො චිත්තප්පකොපනො**
**භයමන්තරතො ජාතං - තං ජනො නාව බුජ්ඣති**

ක්‍රෝධය අනර්ථය උපදවයි - ක්‍රෝධය සිත් ප්‍රකෝප කරන්නකි.
අනතුරුව බිය හටගත් ජනයා අවබෝධ නොකරයි.

මෙසේ සැම අයුරින් ම අගුණයෙහි මනෝපදෝෂය නිෂේධනය කොට දැන් පිළිපැදිය යුතු ආකාරය දක්වන සේක් **තත්‍රතුමෙහෙහි අභූතං අභූතතො** ආදිය කී සේක. එහි **තත්‍රතුමෙහෙහි** යනු ඒ අගුණයෙහි තොප විසින්. **අභූතං අභූතතො නිබ්බෙඨෙතබ්බං** යමක් නොවීද, එය නොවූ ස්වරූපයෙන්ම ඉවත්කළ යුතුය. කෙසේද? **ඉතිපෙතං අභූතං** ආදී ක්‍රමයෙන් මේ එහි යෙදුමයි. තොපගේ ශාස්තෲහු සර්වඥ නොවෙති. ධර්මය ස්වාක්ඛාත නොවේ. සංඝයා දුෂ්ප්‍රතිපන්නය. ආදිය අසා නිශ්ශබ්ද නොවිය යුතුයි. මෙසේද කිවයුතුයි. **ඉතිපෙතං අභූතං** යමක් තොප විසින් කියන ලද ද එය මේ කාරණයෙන් ද අභූතය. මේ කාරණයෙන් ද අභූතය. **අතච්ඡං** මෙය අප කෙරෙහි **ද නැ**ත. අප කෙරෙහි ද මෙය නොපෙනේ. අපගේ ශාස්තෲන් වහන්සේ සර්වඥමය. ධර්මය ස්වාක්ඛාතය. සංඝයා සුප්‍රතිපන්නය. මෙහි මේ කරුණද ඇත. මෙහිද දෙවැනි පදය පළමුවැන්නටද සිව්වැන්න තෙවැන්නටද වෙනත් වචනයක් බව දතයුතුය. මෙයද අගුණයෙහිම ලා විස්තර කළයුතුය. සැමතන්හි නොවේ. ඔබ දුස්සීලයෙක් නොවේනම්, ගුරුවරයාද දුස්සීලයෙක් නොවේනම්, ඔබ විසින් මේ මේ දේවල් කරන ලදී. ගුරුවරයා විසින් මේ මේ දේවල් කරන ලද්දේ යයි කීවිට නිශ්ශබ්දව ඉවසයි. සැක කටයුතු වෙයි. ඒ නිසා මනෝපදෝෂය නොකොට අගුණ විස්තර කළ යුතුය. 'ඔටුවාද ගොනෙක් විය' ආදී ක්‍රමයෙන් දශ අක්‍රෝශ වස්තූන්ගෙන් අක්‍රෝශ කරන පුද්ගලයා ගැන සැලකිලිමත්ව අධිවාසන ක්‍ෂාන්තියම එහිදී කළයුතුය.

මෙසේ අගුණ තලයෙහි තාදි ලක්‍ෂණය දක්වා දැන් ගුණ තලයෙහි දක්වන්ට **මමං වා භික්ඛවෙ පරෙ වණ්ණං භාසෙය්‍යුං** ආදිය කී සේක. එහි

පරෙ යනු යම් පැහැදුණු දෙව් මිනිස්සු. මෙයින් ආනන්දයට පත්වේනුයි ආනන්‍දො, ප්‍රීතියට මෙය සමාන වචනයකි. සොම්නස් බව = **සොමනසසං,** මේ චෛතසික සුවයට සමාන වචනයකි. සතුටට පත් වූවහුගේ ස්වභාවය = **උබ්බිල්ලා විතතතං** කාගේ සතුටට පත්වූ බවද? සිතෙහි උඩගු බව අත්හැර උල්පවන ප්‍රීතියට මෙය සමාන වචනයකි. මෙසේ මෙහිද පද දෙකින් සංස්කාර ස්කන්ධයද එකකින් වේදනා ස්කන්ධයද කියන ලදී.

මෙසේ පළමු ක්‍රමයෙන් ඉල්පෙන ප්‍රීතිය වළක්වා දෙවැන්නෙන් එහි ආදීනව දක්වන සේක් **තත්‍ර චෙ තුමෙහ අසසථ** ආදිය කීහ. මෙහිද **තුමහඤ්ඤෙවසස තෙන අනතරායො** ඒ ඉල්පෙන ප්‍රීතියෙන් ඔබගේම ප්‍රථමධ්‍යාන ආදීන්ට අන්තරාය වන්නේය යන අර්ථය දතයුතුය. මෙසේ කුමක් නිසා කියන ලද ද? භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ කියන ලද්දේ නොවේද?

**බුදෙධාති කිතතයනතසස - යසස කායෙ භවති යා පීති**
**වරමෙවහි සා පීති - කසිණෙනපි ජමබුදීපසස**

බුද්ධයයි කියන යමකුගේ කයෙහි යම් ප්‍රීතියක් වේද
ඒ ප්‍රීතිය දඹදිව් කසිණයට වඩා උතුම්ය.

ධමෙමාති -පෙ-
ධර්මයයි -පෙ-

**සඝොති කිතතයනතසස - යසස කායෙ භවති යාපීති**
**වරමෙවහි සා පීති - කසිණෙනපි ජමබුදීපසස**

සංඝයයි කියන යමකුගේ කයෙහි යම් ප්‍රීතියක් වේද,
ඒ ප්‍රීතිය දඹදිව් කසිණයට වඩා උතුම්ය.

'මහණෙනි, යමෙක් බුදුන් කෙරෙහි පැහැදුණාහුද, ඔවුහු අග්‍ර වූ තන්හි පැහැදුණෝය.' ආදී නොයෙක් සියගණන් සූත්‍රයන්ගෙන් තෙරුවන් කෙරෙහි ප්‍රීති සොම්නස ම වර්ණනා කරන ලද්දේ නොවේද? සත්‍යය. වර්ණනා කරන ලද්දේය. එය වනාහි නෛෂ්ක්‍රම්‍යයට නැඹුරු වූවකි. මෙහි 'අපගේ බුදුහාමුදුරුවෝ, අපගේ ධර්මය' ආදී ක්‍රමයෙන් ආයුෂ්මත්

ඡන්න තෙරුන්ට උපන්නාක් වැනි ගෘහාශ්‍රිත ප්‍රීතිසෝමනස්ස අදහස් කරන ලදී. මෙය වනාහි ධ්‍යානාදිය ලැබීම පිණිස අන්තරායකර වෙයි. ඒ නිසාම ආයුෂ්මත් ඡන්න තෙරණුවෝද බුදුන් පිරිනිවන් නොපානා තෙක් විශේෂයක් නිපදවා ගන්ට අසමත් වූහ. පිරිනිවන්පානා කල්හි පනවන ලද බ්‍රහ්මදණ්ඩයෙන් බියපත්ව ඒ ප්‍රීති සෝමනස්ස හැර ඒ විශේෂය නිපදවා ගත්හ. ඒ නිසා අන්තරායකර බව ම සඳහා මෙය කියන ලද්දේ යයි දතයුතුය. මේ නම් ලෝභ සහගත ප්‍රීතියයි. ලෝභයද ක්‍රෝධය හා සමානය.

**ලුද්ධො අත්‍ථං න ජානාති - ලුද්ධො ධම්මං නපස්සති**
**අන්‍ධං තමං තදා හොති - යං ලොභො සහතෙ නරං**

ලෝභියා අරුත නොදනී - ලෝභියා දහම් නොදකී
ලෝභය මිනිසා ඉවසන්නේ නම් එකල අන්ධකාරය වෙයි.

**අනත්‍ථජනනො ලොභො - ලොභො චිත්තප්පකොපනො**
**භයමන්තරතො ජාතං - තං ජනො නාව බුජ්ඣති**

ලෝභය අනර්ථය උපදවයි - ලෝභය සිත් ප්‍රකෝප කරන්නකි.
අනතුරුව උපන් බිය - **ජනයා** අවබෝධ නොකරයි.

මෙහි තෙවැනි වාරය නොපැමිණියේ නමුත් අර්ථ වශයෙන් පැමිණියේ යයි දතයුතුය. ක්‍රෝධ වූ තැනැත්තා යම්සේද ලෝභියාද අර්ථය නොදනී.

පිළිපැදිය යුතු ආකාරය දක්වන වාරයෙහි මේ යෙදුමයි. 'තොපගේ ශාස්තෲන් වහන්සේ සර්වඥ අර්හත් සම්මා සම්බුද්ධය. ධර්මය ස්වාක්ඛාතය. සංඝයා සුප්‍රතිපන්නය'යි ආදිය අසා නිශ්ශබ්ද නොවිය යුතුයි. මෙසේ පිළිගත යුතුයි. **ඉතිපෙතං භූතං** යමක් ඔබ විසින් කියන ලදද එය මේ කරුණින් ද භූතය. මේ කරුණින් ද **තච්ඡං** තථ්‍යය. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද භගවාය. මෙසේද අරහංය. මෙසේද සම්මා සම්බුද්ධය. ධර්මය මෙසේද ස්වාක්ඛාතය. මෙසේද සන්දිට්ඨිකය. සංඝයා මෙසේද සුපටිපන්නය. මෙසේද උජුපටිපන්නය. 'ඔබ සිල්වත්දැ'යි අසනු ලැබුවහු විසින් ඉදින් සිල්වත් නම් 'මම සිල්වත්මි'යි පිළිගත

යුතුමය. 'ඔබ ප්‍රථමධ්‍යානලාභීද -පෙ- රහත්දැයි අසන ලද්දහු විසින් ද සභාග භික්ෂූන්ටම දැන්විය යුතුය. මෙසේ පාපිච්ඡතාව අත්හරින ලද්දේ වෙයි. සසුනෙහි නොහිස් බවද පෙන්වන ලද්දේ වෙයි. සෙස්ස කියූ පරිදිම දතයුතුය.

'අප්පමත්තකො බො පනෙතං භික්ඛවෙ' යන්නෙහි අනුසන්ධිය කුමක්ද? මේ සූත්‍රය පද දෙකකින් ගුණයෙන් ද අගුණයෙන් ද එකට බැඳී ඇත. එහි අගුණය 'ඉතිපෙතං අභූතං, ඉතිපෙතං අතච්ඡං' මෙය මෙසේ අභූතය. මෙසේ මෙය අතථ්‍යය යනුවෙන් මෙහිම ජලය අන්තයට පැමිණ ගිනි මෙන් නැවතිණ. ගුණය වනාහි වූ දෙය වූ අයුරින්ම පිළිගත යුතුය. 'ඉතිපෙතං භූතං' යනුවෙන් මෙසේ අනුව පවතීමය. එය දෙවැදෑරුම්ය. බ්‍රහ්මදත්ත විසින් කියන ලද ගුණයද භික්ෂු සංඝයා විසින් 'අච්ඡරියං ආවුසො' ආදී ක්‍රමයෙන් අරඹන ලද ගුණයද ඒ අතරින් භික්ෂු සංඝයා විසින් කියන ලද ගුණයට ඉහළින් ශූන්‍යතා ප්‍රකාශනයෙහි අනුසන්ධිය දක්වයි. මෙහිදී බ්‍රහ්මදත්ත විසින් කියන ලද ගුණයෙහි අනුසන්ධිය දක්වන්ට, 'අප්පමත්තකං බො පනෙතං භික්ඛවෙ' යනුවෙන් දේශනාව අරඹන ලදී.

එහි 'අප්ප' යනු අල්ප මඳ යන්නට නමයි. ඔරං යනු එයටම වෙනත් වචනයකි. 'මත්තා' යනු ප්‍රමාණයයි. එහි මාත්‍රය අල්පය = අප්පමත්තකං, එහි මාත්‍රය පහළනුයි = ඔරමත්තකං සීලයම = සීලමත්තකං, මෙය කියන ලදී. මහණෙනි, මේ සීලය අල්පමාත්‍රය. 'යමක් නිසා තථාගතයන් වහන්සේගේ ගුණ කියම්දැයි උත්සාහ කොටද ගුණ කියන පෘථග්ජනයා කියන්නේ යයි එහි වන්නේය. මේ ශීලය නම් යෝගියාගේ අග්‍රභූෂණය නොවේද?

පොරාණයෝ කීහු :

**සීලං යොගිස්ස ලංකාරො - සීලං යොගිස්ස මණ්ඩනං**
**සීලෙහලංකතො යොගී - මණ්ඩනෙ අග්ගතං ගතො**

සීලය යෝගාවචරයාට අලංකරණයකි. සීලය යෝගාවචරයාට සැරසිල්ලකි. සීලයන්ගෙන් අලංකෘත වූ යෝගාවචරයා සැරසිල්ලෙහි අග බවට ගියේ වෙයි.

භාග්‍යවතුන් වහන්සේ විසින්ද, නොයෙක් සියගණන් සූත්‍රයන්හි ශීලයම මහත්කොට කියන ලද්දේය.

යම්සේ කී සේක්ද :- මහණෙනි, භික්ෂුව සබ්‍රහ්මචාරීන්ට ප්‍රිය ද මනාපද ගරුකරනු ලබන්නෙක් ද වන්නෙමියි සිතන්නේ නම් ඔහු ශීලයන් සපුරාලන්නෙක් වන්නේය' තව ද.

**කිකීව අණ්ඩං චමරීව වාලධිං**
**පියංව පුත්තං නයනංව එකකං**
**තථෙව සීලං අනුරක්ඛමානකා**
**සුපෙසලා හොථ සදා සගාරවා**

බිජුවට රක්නා කිරළිය මෙන්
වලිගය රක්නා සෙමර මුවා මෙන්
(මවක්) එකම ප්‍රිය පුත්‍රයා රක්නා මෙන් ද එක් ඇසක් ඇත්තා
එය රක්නා මෙන් ද, සීලය රකින්නෝ
සැමකල්හි ගරුසරු ඇතිව සුපේශල වවු.

**නපුප්ඵ ගන්ධො පටිවාතමෙති**
**න චන්දනං තගර මල්ලිකා වා**
**සතඤ්ච ගන්ධො පටිවාතමෙති**
**සබ්බාදිසා සප්පුරිසො පවාති**

මල්සුවඳ, සඳුන්, තුවරලා, මලිගිය සුවඳ (දැනමන්)
උඩු සුළඟට නොයයි. සත්පුරුෂයන්ගේ ධර්මය
උඩු සුළඟටද යයි. සත්පුරුෂයාගේ සුවඳ සියලු දෙස හමයි.

**චන්දනං තගරං වාපී උප්පලං අථ වස්සකී**
**එතෙසං ගන්ධජාතානං සීලගන්ධො අනුත්තරො**

සඳුන්, තුවරලා, නිලුපුල්, සමන් යන මේ
සුවඳ වර්ගයන්ට වඩා සිල්සුවඳ අනුත්තරය.

**අප්පමත්තො අයං ගන්ධො - යායං තගර චන්දනී**
**යොච සීලවතං ගන්ධො - වාති දෙවෙසු උත්තමො**

තුවරලා සඳුන් යන මේ සුවඳ අල්පමාත්‍රය.
සිල්වතුන්ගේ මේ සුවඳක් වේද ඒ උතුම් සුවඳ
දෙවියන් අතර හමයි.

**තෙසං සම්පන්න සීලානං - අප්පමාද විහාරිනං**
**සම්ම දඤ්ඤා විමුත්තානං - මාරො මග්ගං නවින්දති**

සිල් ඇති අප්‍රමාදී විහාර ඇති මැනවින් දැන මිදුණවුන්
වෙතට මාරයාට යාමට නො හැකිය.

**සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො - චිත්තං පඤ්ඤඤ්ච භාවයං**
**ආතාපි නිපකො භික්ඛු - සො ඉමං විජයෙ ජටං**

පැණැති මිනිසා සිල්හි පිහිටා සිතද ප්‍රඥාවද වඩමින්
කෙලෙස් තවන නිහතමානී භික්ෂුව මේ අවුල ලිහයි.

මහණෙනි, යම්කිසි සත්ත්ව ශාක කෙනෙක් වැඩීමට නැගීමට හා විශේෂත්වයට පැමිණෙත්ද, ඒ සියල්ල පෘථුවිය නිසා පෘථුවිය ප්‍රතිෂ්ඨා කොටගෙන සිටිත්ද, එසේම මේ සත්ව ශාකයෝ වැඩීමට නැගීමට විශාලත්වයට පැමිණෙත්. මහණෙනි, එපරිද්දෙන්ම භික්ෂුව ශීලය නිසා ශීලයෙහි පිහිටා සප්ත බොධ්‍යංග ධර්මයන් වඩමින් සප්ත බොධ්‍යංගයෙහි බහුලව යෙදෙන්නේ ධර්මයන්හි මහත්බවට විශාලත්වයට පැමිණේ. මෙසේ නොයෙක් සියගණන් සූත්‍ර දතයුතුය. මෙසේ නොයෙක් සියගණන් සූත්‍රයන්හි ශීලය මහත්කොටම කියන ලදී. මෙතැන්හි 'අප්පමත්තකං' යයි කීවේ කුමක් නිසාද? ඉහළ ගුණයන් සලකාය. සීලය වනාහි සමාධියට නොපැමිණේ. සමාධිය ප්‍රඥාවට නොපැමිණේ. ඒ නිසා උපරිමය සලකා අවමය ඔරමත්තක නම් වේ.

ශීලය සමාධියට නොපැමිණෙන්නේ කුමක් නිසාද? භාග්‍යවතුන් වහන්සේ අභිසම්බෝධියෙන් සත්වැනි අවුරුද්දෙහි සැවැත්නුවර දොර ගණ්ඩම්බ රුක්මුල්හි දොළොස් යොදුන් රුවන් මණ්ඩපයෙහි යොදුනක්

පමණ වූ පර්යංකයෙහි වැඩහිඳ, තුන්යොදුන් දිවසේසත දරද්දී දොළොස් යොදුනක් තැන පිරී සිටි පිරිසට, ආත්මය ගැනීම පැහැදිලි කරන මිසදිටුවන් මඩින 'උඩුකයින් ගිනිකඳ පවතී. යටිකයින් දියදහරා පවතී -පෙ- එක් එක් රෝමකූපයෙන් ගිනිකඳ පවතී. එක් එක් රෝමකූපයෙන් සවණක් දිහදහරා පවතී' යන ක්‍රමයෙන් පැවති යමක මහා ප්‍රාතිහාර්යය පෙන්වූ සේක. උන්වහන්සේගේ රන්වන් සිරුරින් රන්වන් රැස් නැගී භවාග්‍රය තෙක් යයි. සියල් දසදහස් සක්වල එළිය කරන කලක් මෙන් වෙයි. දෙවැනිව දෙවැනිව යන රශ්මිය පළමුව පළමුව ගිය රැසට යුගල යුගලව මෙන් එකෙණෙහි මෙන් වෙයි. දෙකකට දෙකක් එක්වර පැවැත්මක් නැත. බුදුවරුන්ගේ භවාංග පරිවාසය ලුහු බැවින් පස් අයුරකින් පුරුදුකළ වශීබවද නිසා ඒවා එක් ක්‍ෂණයකදී මෙන් පවතී. ඒ ඒ රශ්මියෙහි ආවර්ණ පරිකර්ම අධිෂ්ඨාන වෙන් වෙන්ව පවතී. නිල්වන් රැස් සඳහා භාග්‍යවතුන් වහන්සේ නීල කසිණයට සමවදින සේක. කහ වන් රැස් සඳහා ඕදාත කසිණයටද, ගිනිකඳ සඳහා තෙජෝ කසිණයටද, දියදහරා සඳහා ආපෝ කසිණයටද සමවදින සේක. ශාස්තෘන් වහන්සේ සක්මන් කරන සේක. නිර්මිතිය සිටී හෝ හිඳී හෝ නින්දට යයි යනුවෙන් සියල්ල විස්තර කළ යුතුය. මෙහි සීලයට කළහැකි කිසිදු කාර්යයක් නැත. සියල්ල සමාධි කෘත්‍යමය. ශීලය සමාධියට නොපැමිණෙන්නේ මෙසේය.

භාග්‍යවතුන් වහන්සේ සියදහසක් කල්ප අධිකකොට ඇති සතර අසංඛ්‍යයක් කල් පෙරුම් පුරා විසි නවවැනි වයස් කල්හි චක්‍රවර්ති ශ්‍රී නිවාස වූ භවනින් නික්ම අනෝම ගංතෙරදී පැවිදිව සවසක් ප්‍රධාන යෝග කොට වෙසක් පුන් පොහෝදා උරුවෙල්ගම සුජාතාව විසින් දෙන ලද දිවරස බැහූ මධු පායාසය වළඳ සවස් කල්හි දකුණු දොරින් බෝමැඩට පිවිස, ඇසතු රුක් රජු තෙවරක් පැදකුණු කොට ඊශාණ භාගයෙහි වැඩසිටි සේක් තණ ඇතිරිය අතුරා ත්‍රිසන්ධි පර්යංකය බැඳ සිව්අඟින් යුත් මෙත් කමටහන පෙරටුකොට වීර්යාධිෂ්ඨානය ඉටාගෙන දාහතර රියන් උතුම් පර්යංකයට පැමිණ රන් පුටුවෙහි තැබූ රිදී කඳක් මෙන් සොළොස් රියන් බෝකඳ පිටුපසින් තබාගෙන ඉහළ මිණි සතින් මෙන් බෝධි ශාඛාවෙන් දරන කල්හි රන්වන් සිවුරෙහි පබළුවන් බෝධි අංකුර වැටෙන කල්හි, සූර්යයා අවරට ළංවන කල්හි, මාර බලය විධ්වංසනය කොට පළමු යම පෙරවිසූ කඳ පිළිවෙළ සිහිකොට මැදියම දිවැස සෝදා, අලුයම් කල්හි සියලු බුදුවරුන් පුරුදු කළ, ප්‍රත්‍යයාකාරයෙහි ඥානය බස්වා ආනාපාන චතුර්ථධ්‍යානය උපදවා එයම පාදකකොට

විදර්ශනා වඩන සේක් මාර්ග පිළිවෙළින් පැමිණි සිව්වැනි මගින් සියලු කෙලෙසුන් ගෙවා සියලු බුදුගුණ ප්‍රතිවේධ කළ සේක. මේ උන්වහන්සේගේ ප්‍රඥා කෘත්‍යයයි. සමාධිය ප්‍රඥාවට නොපැමිණෙන්නේ මෙසේය.

එහි යම්සේ අතඇති ජලය බඳුනෙහි ජලයට නොපැමිණේද, බඳුනෙහි ජලය කළයෙහි ජලයට නොපැමිණේද, කළයෙහි ජලය කොළොඹුවෙහි ජලයට නොපැමිණේද, කොළොඹුවෙහි ජලය සැළියෙහි ජලයට නොපැමිණේද සැළියෙහි ජලය මහකළයෙහි ජලයට නොපැමිණේද මහකළයෙහි ජලය කුඩා පොකුණෙහි ජලයට නොපැමිණේද, කඳුරෙහි ජලය කුඩා නදියෙහි ජලයට නොපැමිණේද, කුඩා නදියෙහි ජලය මහා නදියෙහි ජලයට නොපැමිණේද, මහා නදියෙහි ජලය පස්මහ නදියෙහි ජලයට නොපැමිණේද, පස්මහ නදියෙහි ජලය සක්වල මහ සමුදුරු ජලයට නොපැමිණේද, සක්වල මහ සමුදුරු ජලය මහමෙර පාමුල මහ සමුදුරට නොපැමිණේද, බඳුනෙහි ජලය සලකනවිට අත ඇති ජලය සුළුය. -පෙ- මහමෙර පාමුල මහ සමුදුරු ජලය සලකා බලනවිට සක්වල මහසමුදුරු ජලය සුළුය. මෙසේ ඉහළ ඉහළ ජලය සලකා බලනවිට යට යට ජලය සුළුය. මෙසේ ඉහළ ඉහළ ගුණ සලකා බලනවිට ශීලය අල්පමාත්‍රය. අඩු ප්‍රමාණයෙකැයි දතයුතුය. එහෙයින් කීහ. 'මහණෙනි, මේ අඩු ප්‍රමාණයේ ශීල මාත්‍රය අල්පමාත්‍ර යැයි.

යෙන පුථුජ්ජනො යනු මෙහි,

දුවෙ පුථුජ්ජනා වුත්තා - බුද්ධෙනාදිච්චබන්ධුනා
අන්ධො පුථුජ්ජනො එකො - කල්‍යාණකො පුථුජ්ජනො

සූර්යබන්ධු බුදුන් විසින් පුහුදුන්හු දෙදෙනෙක්
කියන ලදහ. අන්ධ පුහුදුන් ජනයා එකෙකි. කළණ පුහුදුන් ජනයා එකෙකි.

එහි යමකුට ඛන්ධ ධාතු ආයතන ආදීන්හි උග්ගහ, පරිපුච්ඡා සවණ, ධාරණ පච්චවෙක්ඛණ නැත්ද, මේ අන්ධ පෘථග්ජනයාය. යමකුට ඒවා ඇත්ද, හේ කල්‍යාණ පෘථග්ජනයාය.

ඒ දෙවදෑරුම් බව

පුථූනං ජනනාදීහි කාරණෙහි පුථුජ්ජනො
පුථුජ්ජනනෙතාගධත්තා - පුථුවායං ජනො ඉති

ජනන ආදී මහා කරුණින් පුථුජ්ජන වෙයි.
පුථුජ්ජනයන් අතරට ගිය හෙයින් පුථු සහ ජන
වෙයි.

ඔහු වනාහි මහත් වූ නානාප්‍රකාර ක්ලේශයන් ඇතිකරන කරුණුවලින් පෘථග්ජන වේ. යම්සේ කීයේද? මහාකෙලෙස් උපදවතියි = පුථුජ්ජනො. නොනසන ලද සක්කාය දෘෂ්ටි ඇත්තෝ = පුථුජ්ජනා, ශාස්තෘවරුන්ගේ මුව දෙස බලා සිටින්නෝ = පුථුජ්ජනා, සියලු ගතීන් විසින් නොනැගිටින ලද්දෝ = පුථුජ්ජනා, නානා අභිසංඛාරයන් රැස් කරන්නෝ = පුථුජ්ජනා, නොයෙක් සැඩදිය පහරින් ගසාගෙන යත්නුයි = පුථුජ්ජනා, නොයෙක් සන්තාපයන්ගෙන් තැවෙත්නුයි = පුථුජ්ජනා නොයෙක් දාහයන්ගෙන් දහනය කරනු ලබත්නුයි = පුථුජ්ජනා, පස්කම් ගුණයන්හි ගිජු ගැලුණු මුළා වූ බැසගත් ලැගි ඇලුණු පටලැවුණු බැවින් = පුථුජ්ජනා, පංච නීවරණයන්ගෙන් වටවුණු, දැවටුණු, බාධාකරන ලද වැසුණු යටිකුරු වුණු බැවින් = පුථුජ්ජනා මහත් වූ බොහෝ වූ ගණන පථය ඉක්මවා ගිය ආර්ය ධර්මයන්ට පිටුපෑ නීච වූ ස්වභාව හා සමචාර ඇති ජනයා අතරට ගිය බැවින් = පුථුජ්ජනා. මහත් වූ හෝ මෙය වෙන්වම, සීලසුත ආදී ගුණ ඇති ආර්ය ජනයන්ගෙන් වෙන්වූ යයි ප්‍රකටව ගිය බැවින් = පුථුජ්ජනො.

'තථාගතසස' යනු කරුණු අටකින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වෙති. එසේ පැමිණියේ නුයි තථාගතො. එසේ ගියේනුයි තථාගතො. තථ ලක්ෂණයට ගියේ, තථ දක්නා බැවින් තථාගතො, තථාවාදී බැවින් තථාගතො, එසේ කළ බැවින් තථාගතො. අභිභවන අර්ථයෙන් තථාගතො.

භාග්‍යවතුන් වහන්සේ එසේ පැමිණිසේකැයි තථාගත වන්නේ කෙසේද? යම්සේ සියලු ලොවට හිතපිණිස උත්සුක බවට පත් පෙර බුදුවරු පැමිණියෝද, යම්සේ විපස්සි භාග්‍යවතුන් වහන්සේ පැමිණි සේක්ද, සිඛී භාග්‍යවතුන් වහන්සේ පැමිණිසේක්ද, -පෙ- යම්සේ වෙස්සභූ

භාග්‍යවතුන් වහන්සේ පැමිණි සේක්ද, කකුසන්ධ භාග්‍යවතුන් වහන්සේ පැමිණි සේක්ද, යම්සේ කෝණාගමන භාග්‍යවතුන් වහන්සේ පැමිණි සේක්ද, යම්සේ කස්සප භාග්‍යවතුන් වහන්සේ පැමිණි සේක්ද, කුමක් කියන ලද්දේ වේද? යම් අභිනීහාරයකින් මේ භාග්‍යවතුන් වහන්සේලා පැමිණි සේක්ද, ඒ අයුරින්ම අපගේ භාග්‍යවතුන් වහන්සේ ද පැමිණි සේක. නැතහොත් යම්සේ විපස්සි භාග්‍යවතුන් වහන්සේ -පෙ- යම්සේ කස්සප භාග්‍යවතුන් වහන්සේ දාන පාරමිතාව පුරා සීල, නෙක්ඛම්ම, පඤ්ඤා විරිය ඛන්ති සච්ච අධිට්ඨාන මෙත්තා උපෙක්ඛා පාරමී පුරා මේ දසපාරමීහු දස උප පාරමීහු දස පරමත්‍ථ පාරමීහු යනුවෙන් සමතිස් පෙරුම් පුරා අංග පරිත්‍යාග, ඇස්, ධන, රාජ්‍ය, අඹුදරුවන් පරිත්‍යාග ආදී මේ මහා පරිත්‍යාග පසක් සිදුකොට පුබ්බයෝග, පුබ්බචරිය, ධම්මක්ඛාන, ඤාතත්‍ථචරිය ආදිය පුරා බුද්ධචරියාවෙන් කෙළවර පත්ව පැමිණි සේක. එපරිද්දෙන් අපගේ භාග්‍යවතුන් වහන්සේද පැමිණි සේක. යම්සේ විපස්සි භාග්‍යවතුන් වහන්සේ -පෙ- කස්සප භාග්‍යවතුන් වහන්සේ සතර සතිපට්ඨාන, සම්‍යක්ප්‍රධාන ඉද්ධිපාද පංචඉන්ද්‍රිය පංචබල සත්තබොජ්ඣංග ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩා දියුණුකොට පැමිණි සේක. එපරිද්දෙන්ම අපගේ භාග්‍යවතුන් වහන්සේද පැමිණි සේක. මෙසේ එපරිද්දෙන් පැමිණිසේකැයි තථාගතො.

**යථෙව ලොකම්හි විපස්සි ආදයො**
**සබ්බඤ්ඤුභාවං මුනයො ඉධාගතා**
**තථාඅයං සක්‍යමුනීපි ආගතො**
**තථාගතො වුච්චති තෙන චක්ඛුමා**

ලෝකයෙහි විපස්සී ආදී මුනිවරු
සර්වඥ භාවයෙන් මෙහි යම්සේ පැමිණියාහුද
එසේ මේ ශාක්‍ය මුනිහු ද පැමිණියහ.
ඒ නිසා බුදුන්වහන්සේද තථාගතයයි කියනු ලබති.

මෙසේ, එහි පැමිණියේනුයි තථාගතො

එසේ ගියේනුයි තථාගත වන්නේ කෙසේද? යම්සේ එකෙණෙහි උපන් විපස්සි භාග්‍යවතුන් වහන්සේ ගියසේක්ද, -පෙ- කස්සප භාග්‍යවතුන් වහන්සේ ගියසේක්ද, උන්වහන්සේ කෙසේ ගියසේක්ද? උන්වහන්සේ

වනාහි උපන් කෙණෙහි සමපාදයන්ගෙන් පොළොවෙහි පිහිටා උතුරුදෙසට මුහුණලා පියවර සතක් ගියසේක. යම්සේ කීවේද, 'ආනන්ද බෝධිසත්ත්වයෝ සමපාදයන්ගෙන් පොළොවෙහි පිහිටා උතුරුදෙසට මුහුණලා පියවර සතක් යති. උඩින් සේසත දරනු ලබන කල්හි සියලු දෙස බලති. උදන් බස් කියති. 'ලොවට අග්‍ර වෙමි. ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි. ලොවට ශ්‍රේෂ්ඨ වෙමි. මේ මාගේ අන්තිම ජාතියයි. දැන් පුනර්භවයක් නැත' යනුවෙන් උන්වහන්සේගේ ගමනද සත්‍ය විය. අවිතථං 'නොයෙක් විශේෂ අධිගමයන්ට පූර්වනිමිත්ත බැවින් උන්වහන්සේ එකෙණෙහි උපන්සේක් සම පාදයන්ගෙන් පිහිටි සේක. මෙය උන්වහන්සේගේ චතුර් ඍද්ධිපාද ප්‍රතිලාභයෙහි පූර්ව නිමිත්තය. උතුරුදිගට අභිමුඛ බව සියලු ලෝකෝත්තර බවට පූර්ව නිමිත්තයි. සත්තපදවීතිහාරය වනාහි සතත බොජ්ඣංග නමැති රුවන් ප්‍රතිලාභයෙහි පූර්ව නිමිත්තය. 'රන්මිට ඇති සෙමර පවන් සලයි.'

මෙහි කියන ලද සෙමර එසවීම සියලු තීර්ථකයන් මථනය කිරීම් පූර්ව නිමිත්තය. සේසත් දැරීම රහත්බවින් මිදීම නමැති නිර්මල සේසත් ප්‍රතිලාභයෙහි පූර්ව නිමිත්තය. සියලු දිග බැලීම සර්වඥතා අනාවරණ ඥාන ප්‍රතිලාභයෙහි පූර්වනිමිත්තය. උදාන වාක්‍ය කීම කිසිවෙකුට පැවැත්විය නොහැකි ධම්මචක්ක පවත්තනයෙහි පූර්වනිමිත්තය. මෙසේ මේ භාග්‍යවතුන් වහන්සේද ගිය සේක. උන්වහන්සේගේ ගමනද සත්‍ය විය. ඒ විශේෂ අධිගමයන්ගේ පූර්වනිමිත්ත බැවින්,

පොරාණයෝ එයින් කීහ.

මුහුත්ත ජාතොව ගවම්පතී යථා
සමෙහි පාදෙහි ඵුසී වසුන්ධරං
සො වික්කමී සත්තපදානි ගොතමො
සෙතංච ඡත්තං අනුධාරයුං මරූ

එමොහොත උපන් ගොනු මෙන්
සම පයින් පොළොව සිපගති
ඒ ගෞතමයන් වහන්සේ පියවර සතක්
වැඩි සේක. දෙවියෝ සේසත් දැරූහ.

ගන්ත්වාන සො සත්තපදානි ගොතමො
දිසාවිලොකෙසි සමා සමන්තතො
අට්ඨංගුපෙතං ගිර මබ්භුදීරයි
සීහො යථා පබ්බත මුද්ධනිට්ඨිතො

ඒ ගෞතමයන් වහන්සේ සත්පියවරක් වැඩ
සමසේ හාත්පස දිසාවන් බැලූ සේක.
අටඟින් යුතු වදන් කියූ සේක
පව් මුදුන්හි සිටි සිංහයකු මෙන්.

මෙසේ එසේ ගියේනුයි තථාගතො

නැතහොත් යම්සේ විපස්සී භාග්‍යවතුන් වහන්සේ -පෙ- යම්සේ කස්සප භාග්‍යවතුන් වහන්සේ මේ භාග්‍යවතුන් වහන්සේද ඒ අයුරින්ම නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය හැර ගිය සේක. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයද ආලෝක සංඥාවෙන් ථීනමිද්ධයද, අවික්ෂේපයෙන් උද්ධච්ච කුක්කුච්චයද, ධර්ම ව්‍යවස්ථාපනයෙන් විචිකිච්ඡාවද අත්හැර ගිය සේක. ඥානයෙන් අවිද්‍යාව බිඳ දමා ගිය සේක. ප්‍රමුදිත භාවයෙන් ඇල්ම නසා, ප්‍රථමධ්‍යානයෙන් නීවරණ කවුළුව විවරකර, ද්විතීය ධ්‍යානයෙන් විතක්ක විචාර ධූමය සංසිඳුවා, තෘතීය ධ්‍යානයෙන් ප්‍රීතිය බබුළුවා, චතුර්ථධ්‍යානයෙන් සුඛ දුක්ඛය හැර, ආකාසානඤ්චායතන සමාපත්තියෙන් රූපසඤ්ඤා, පටිඝසඤ්ඤා, නානත්ත සඤ්ඤා ඉක්මවා, විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් ආකාසානඤ්චායතන සඤ්ඤාවද, ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාවද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙන් අකිඤ්චඤ්ඤායතන සඤ්ඤාව ඉක්මවා ගියසේක. අනිච්චානුපස්සනාවෙන් නිච්චසඤ්ඤාව අත්හැර, දුක්ඛානුපස්සනාවෙන් සුඛසඤ්ඤාව අත්හැර, අනත්තානු පස්සනාවෙන් අත්තසඤ්ඤාව අත්හැර, නිබ්බිදානුපස්සනාවෙන් නන්දි රාගය අත්හැර, විරාගානුපස්සනාවෙන් රාගය අත්හැර, නිරොධානු පස්සනාවෙන් සමුදය අත්හැර, පටිනිස්සග්ගානුපස්සනාවෙන් ගැනීම අත්හැර, ඛයානුපස්සනාවෙන් ඝන සඤ්ඤාව අත්හැර, වයානුපස්සනාවෙන් ආයුහනය අත්හැර, විපරිනාමානුපස්සනාවෙන් ධ්‍රැව සඤ්ඤාව අත්හැර අනිමිත්තානුපස්සනාවෙන් නිමිත්ත සඤ්ඤාව අත්හැර, අප්පනිහිතානුපස්සනාවෙන් පණිධිය අත්හැර, සුඤ්ඤතානුපස්සනාවෙන්

අභිනිවෙසය අත්හැර, අධිපඤ්ඤාධම්මානුපස්සනාවෙන් සාරාදාන නිවෙසය අත්හැර, යථාභූත ඤාණදස්සනයෙන් සම්මොහාභිනිවෙසය අත්හැර, ආදීනවානුපස්සනාවෙන් ආලයාභිනිවෙසය අත්හැර, පටිසංඛානු පස්සනාවෙන් අප්පටිසංඛාව අත්හැර, විවට්ටානුපස්සනාවෙන් සංයොගාභි නිවෙසය අත්හැර, සොතාපත්ති මග්ගයෙන් දිට්ඨෙකට්ඨ කිලෙස බිඳ ගිය සේක. සකදාගාමි මග්ගයෙන් ඔළාරික කිලෙස අත්හැර, අනාගාමි මග්ගයෙන් අනුසහගත කිලෙස සහමුලින් නසා, අරහත්ත මග්ගයෙන් සියලු කෙලෙස් නසා ගිය සේක. මෙසේද ගිය බැවින් = තථාගතො.

තථ ලක්ෂණයට ආයේනුයි = තථාගත වන්නේ කෙසේද? පඨවි ධාතුවෙහි කර්කශ ලක්ෂණය සත්‍යය, ආපෝ ධාතුවෙහි වැගිරෙන ලක්ෂණය -පෙ- තේජෝ ධාතුවෙහි උෂ්ණත්ව ලක්ෂණය, වායෝ ධාතුවෙහි විස්තම්භන ලක්ෂණය, ආකාශ ධාතුවෙහි නො පැහැසි ලක්ෂණය, විඤ්ඤාණ ධාතුවෙහි දැනගන්නා ලක්ෂණය, රූපයෙහි නැසෙන ලක්ෂණය, වේදනාවෙහි වේදයිත ලක්ෂණය, සඤ්ඤාවෙහි සංජානන ලක්ෂණය, සංස්කාරයන්ගේ අභිසංස්කරණ ලක්ෂණය, විඤ්ඤාණයෙහි විජානන ලක්ෂණය, විතර්කයෙහි අභිනිරෝපණ ලක්ෂණය, විචාරයෙහි අනුමජ්ජන ලක්ෂණය, ප්‍රීතියෙහි පැතිරෙන ලක්ෂණය, සුඛයෙහි සාත ලක්ෂණය (ප්‍රිය ලක්ෂණය) චිත්ත ඒකාග්‍රතාවෙහි නොවිසිරෙන ලක්ෂණය, ඵස්සයෙහි ස්පර්ශ ලක්ෂණය, ශ්‍රද්ධා ඉන්‍ද්‍රියයෙහි අධිමෝක්ෂ ලක්ෂණය, විරිය ඉන්‍ද්‍රියයෙහි අල්ලාගන්නා ලක්ෂණය, සති ඉන්‍ද්‍රියයෙහි උපස්ථාන ලක්ෂණය, සමාධි ඉන්‍ද්‍රියයෙහි නොවිසිරෙන ලක්ෂණය, පඤ්ඤා ඉන්‍ද්‍රියයෙහි ප්‍රජානන ලක්ෂණය, ශ්‍රද්ධා බලයෙහි ශ්‍රද්ධා නැත්තවුන් කෙරෙහි කම්පානොවන ලක්ෂණය, වීර්ය බලයෙහි කුසීතබව කෙරෙහි, සතිබලයෙහි අමතක වූ සත්‍යය කෙරෙහි, සමාධි බලයෙහි උද්ධච්චය කෙරෙහි, ප්‍රඥා බලයෙහි අවිද්‍යාවෙහි නොසැලෙන ලක්ෂණය, සතිසම්බොජ්ඣංගයෙහි උපස්ථාන ලක්ෂණය, ධම්මවිචය සම්බොජ්ඣංගයෙහි රැස්කරන ලක්ෂණය, විරිය සම්බොජ්ඣංගයෙහි අල්ලාගන්නා ලක්ෂණය, ප්‍රීති සම්බොජ්ඣංගයෙහි පැතිරෙන ලක්ෂණය, පස්සද්ධි සම්බොජ්ඣංගයෙහි උපසම ලක්ෂණය, සමාධි සම්බොජ්ඣංගයෙහි නොවිසිරෙන ලක්ෂණය, උපේක්ෂා සම්බොජ්ඣංගයෙහි සලකා බැලීමේ ලක්ෂණය, සම්මා දිට්ඨියෙහි දැකීමේ ලක්ෂණය, සම්මා සංකප්පයෙහි අභිනිරෝෂණ ලක්ෂණය, සම්මා වාචාවෙහි පරිග්‍රහණ ලක්ෂණය, සම්මා කම්මන්තයෙහි සමුට්ඨාන ලක්ෂණය, සම්මා ආජීවයෙහි වොදාන ලක්ෂණය (පවිත්‍රතා ලක්ෂණය) සම්මා වායාමයෙහි

අල්ලාගැනීමේ ලක්ෂණය, සම්මා සතියෙහි උපස්ථාන ලක්ෂණය, සම්මා සමාධියෙහි අවික්ෂේප ලක්ෂණය, අවිද්‍යාවෙහි අවිඥාන ලක්ෂණය, සංස්කාරයන්ගේ චේතනා ලක්ෂණය, විඥාණයෙහි විජානන (දැනගැනීමේ) ලක්ෂණය. නාමයෙහි නමන ලක්ෂණය, රූපයෙහි වෙනස්වන ලක්ෂණය, සළායතනයන්හි ආයතන ලක්ෂණය (පැතිරෙන) ඵස්සයෙහි ස්පර්ශ ලක්ෂණය, වේදනාවෙහි වේදයිත ලක්ෂණය, තණ්හාවෙහි හේතු ලක්ෂණය, උපාදානයෙහි ගහණ (අල්ලාගන්නා) ලක්ෂණය, භවයෙහි රැස්කරන ලක්ෂණය, ජාතියෙහි නිබ්බත්ති (උපත්) ලක්ෂණය, ජරාවෙහි දිරන ලක්ෂණය, මරණයෙහි චුති ලක්ෂණය, ධාතූන්ගේ ශූන්‍යතා ලක්ෂණය, ආයතනයන්හි ආයතන (පැතිරෙන) ලක්ෂණය, සතිපට්ඨානයන්හි උපස්ථාන ලක්ෂණය, සම්මප්පධානයන්ගේ වඩන ලක්ෂණය, (උත්සාහ කිරීමේ ලක්ෂණය) ඉද්ධිපාදයන්ගේ සාර්ථක වන ලක්ෂණය, ඉන්ද්‍රියයන්ගේ අධිපති ලක්ෂණය, බලයන්ගේ කම්පානොවන ලක්ෂණය, බොජ්ඣංගයන්ගේ නිර්යාන (පිටවීමේ) ලක්ෂණය, මග්ගයෙහි හේතුලක්ෂණය, සච්චයන්ගේ තථ ලක්ෂණය, සමථයෙහි අවික්ෂේප (නොවිසිරෙන) ලක්ෂණය, විපස්සනාවෙහි අනුපස්සනා ලක්ෂණය. සමථ විදස්සනාවගේ ඒකරස ලක්ෂණය, යුගනද්ධයන්ගේ නොනවත්නා ලක්ෂණය, සීල විසුද්ධියෙහි සංවර ලක්ෂණය, චිත්ත විසුද්ධියෙහි අවික්ෂේප ලක්ෂණය, දිට්ඨි විසුද්ධියෙහි දකින ලක්ෂණය, ඛයෙ ඤාණයෙහි සමුච්ඡේදන (කැපෙන) ලක්ෂණය, අනුප්පාදෙ ඤාණයෙහි සන්සුන් වන ලක්ෂණය (පස්සද්ධි) ඡන්දයාගේ මූල ලක්ෂණය, මනසිකාරයෙහි සමුට්ඨාන (නැගිටින) ලක්ෂණය, ඵස්සයෙහි සමොධාන (එක් කරන) ලක්ෂණය, වේදනාවෙහි සමොසරණ (එක්වීමේ) ලක්ෂණය, සමාධියෙහි ප්‍රමුඛ ලක්ෂණය, සතියෙහි අධිපතිභාව ලක්ෂණය, පඤ්ඤාවෙහි ඉන් එතරවීමේ ලක්ෂණය, විමුත්තියෙහි සාර ලක්ෂණය, අමෘතයට බැසගන්නා නිර්වාණයෙහි අවසන් ලක්ෂණය සත්‍යයි. මෙසේ තථ ලක්ෂණය ඤාණ ගතියෙන් පැමිණි සේක. නොවරදවා පැමිණි සේක. අනුප්‍රාප්ත වූ සේකැයි තථාගතො. මෙසේ තථ ලක්ෂණයට පැමිණි සේකැයි = තථාගතො.

තථ ධර්මයන් යථා පරිදි අවබෝධ කරන ලද්දේනුයි = තථාගත වන්නේ කෙසේද? තථ ධර්ම නම් චතුරාර්ය සත්‍යයයි. යම්සේ කීවේද? මහණෙනි, වෙනත් අයුරකින් නොවන සත්‍ය සතරක් වෙයි. කිමෙක්ද ඒ සතර? මහණෙනි, මෙය දුකය යන්න සත්‍යය. අන් අයුරකින් නොපවත්නේ වෙයි.' යනු විස්තරයයි. භාග්‍යවතුන් වහන්සේ ඒවාද අවබෝධ කළ

සේක. ඒ නිසා තථාගතයන් අවබෝධ කළ බැවින්, තථාගත යයි කියනු ලබත්. අභිසම්බෝධි අර්ථය මෙහි 'ගත' ශබ්දයයි. එසේ වුවද, ජරා මරණයාගේ ජාති ප්‍රත්‍යයෙන් හටගත් පැනනැගුණු අර්ථය සත්‍යය. අන් අයුරකින් නොවන්නකි. -පෙ- සංකාරයන්ගේ අවිද්‍යා ප්‍රත්‍යයෝ හටගත් පැන නැගුණු අර්ථයෙන් සත්‍යය, අන් අයුරකින් නොවන්නකි. එසේ අවිද්‍යාවෙහි සංස්කාරයන්ගේ ප්‍රත්‍යයාර්ථය, සංස්කාරයන්ගේ විඤ්ඤාණ ප්‍රත්‍යයාර්ථය -පෙ- ජාතියෙහි ජරාමරණ ප්‍රත්‍යයාර්ථය සත්‍යය. අන් අයුරකින් නොවන්නකි. ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කළා සේක. ඒ නිසාද, තථාගතයන් අවබෝධ කළ බැවින් = තථාගතයැයි කියනු ලබත්. මෙසේ තථ ධර්මයන් යථා පරිදි අවබෝධ කළසේකැයි = තථාගතො. තථදර්ශී බැවින් තථාගත වන්නේ කෙසේද? භාග්‍යවතුන් වහන්සේ. දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- දෙව්මිනිසුන් සහිත අප්‍රමාණ වූ ලෝකධාතුන්හි අප්‍රමාණ සත්ත්වයන්ගේ චක්‍ෂු ද්වාරයෙහි පහළවන්නා වූ යම් රූපාරම්මණයක් ඇත්ද, එය සර්වාකාරයෙන්, දනිති. දකිති. මෙසේ දන්නා වූ දකින්නා වූද, එය ඉටු අනිටු ආදි වශයෙන් හෝ දිට්ඨ සුත මුත විඤ්ඤාත යන්හි ලැබෙන පදයක් වශයෙන් හෝ 'රූපායතනවූ ඒ රූපය කවරක්ද? යම් රූපයක් සතර මහාභූතයන් නිසා වර්ණාලෝකය පෙනෙන පටිඝ සහගත නීලපීත යයි ආදී ක්‍රමයෙන් නොයෙක් නම්වලින් දහතුන් වරක් ක්‍රම පනස් දෙකකින් බෙදනු ලබන්නේ තථම වේද, අසත්‍ය බවක් නැත්ද, සෝතද්වාර ආදීන්හිද පහළවන්නා වූ ශබ්ද ආදීන්හිද, මේ ක්‍රමයමැයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ කියන ලදී. 'මහණෙනි, දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- දෙව්මිනිසුන් සහිත ලෝකධාතුන්හි දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත, පත්ත, පරියෙසිත, අනුවිචරිත යම් දෙයක් ඇත්ද එය මම මනසින් දකිමි. එය මම හොඳින් දත්තෙමි. එය භාග්‍යවතුන් විසින් දන්නා ලද්දකි. එය තථාගතයන් වහන්සේ නැළපටය්‍යාසි මෙසේ තථදර්ශී බැවින් = තථාගතො. එහි තථදර්ශී අර්ථයෙහි තථාගත පදය හටගනිතියි දතයුතුය.

තථාවාදී බැවින් තථාගත වන්නේ කෙසේද? යම් රැයක භාග්‍යවතුන් වහන්සේ බෝමැඩ අපරාජිත පර්යංකයෙහි හුන්සේක් තෙමරුන් හිස් මැඩ අනුත්තර වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කරගත් සේක්ද? යම් රැයක සල්රුක් දෙක අතරදී අනුපාදිසේස නිබ්බාණ ධාතුවෙන් පිරිනිවන්පෑ සේක්ද, මෙදෑතුර පන්සාළිස් වසක් පමණ කල් ප්‍රථම බෝධියෙහිද මධ්‍යම බෝධියෙහිද පශ්චිම බෝධියෙහිද භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා

කරන ලද සූත්‍ර, ගෙය්‍ය -පෙ- වෙදල්ල ධර්මයක් වේද, ඒ සියල්ල අර්ථ වශයෙන් ව්‍යඤ්ජන වශයෙන් උපවාද නොකළ යුතු අඩුවැඩි නැතිව සර්වාකාරයෙන් පරිපූර්ණව රාග මදය නැතිකරගන්නේද දෝස, මෝහ, නැති කරන්නේද එහි වළග මාත්‍රයක්වත් අඩුවක් නැත්ද, ඒ සියල්ල එක් මුද්‍රාවකින් ලස් තැබුවාක් මෙන්. එක් නැළියකින් මැන්නාක් මෙන්, එක් තුලාවකින් තුලනය කළාක් මෙන්ද තථ වෙයි. එහෙයින් කීහ. 'චුන්ද, යම් රැයක තථාගතයන් වහන්සේ අනුත්තර වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කරන සේක්ද, යම් රැයක අනුපාදිසේස නිබ්බාණ ධාතුවෙන් පිරිනිවන්පානා සේක්ද, මෙදැතුර යමක් කියන සේක්ද, කථාකරන සේක්ද, නිර්දේශ කරන සේක්ද, ඒ සියල්ල එසේම (තථා) වෙයි. අන් ලෙසකින් නොවෙයි. එහෙයින් තථාගත යයි කියනු ලැබේ. මෙහි ගද ශබ්දයම ගත වෙයි. මෙසේ තථාවාදී බැවින් තථාගත වේ. තවද ආගදනය = ආගදො. වචනය යන අර්ථයි. තථ, අවිපරීත, ආගද ඔහුට ඇත්තුයි දකාරයට තකාරය කොට තථාගත වේ. මෙසේද මෙහි අර්ථයෙහි පදසිද්ධිය දතයුතුය.

තථාකාරී බැවින් තථාගත වන්නේ කෙසේද? භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙන් කය අනුකූල කෙරේද, කයද වචනයට අනුකූල කෙරේද, එහෙයින් යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී වන සේක. මෙසේ වූ උන්වහන්සේගේ 'වචනය යම්සේද, කයද එසේය. එසේ පැවතියේය යන අර්ථයි. කය යම්සේද වචනයද එසේ ගියේනුයි තථාගත වේ. එහෙයින් කීහ. 'මහණෙනි, තථාගත තෙමේ යථාවාදීද තථාකාරීය. තථාකාරී යථාවාදීය. මෙසේ යථාවාදී, තථාකාරීය. යථාකාරී තථාවාදීය. එහෙයින් තථාගත යයි කියනු ලැබේ. මෙසේ තථාකාරී බැවින් තථාගත නම් වේ.

අභිභවන අර්ථයෙන් තථාගත වන්නේ කෙසේද? උඩින් භවාග්‍රයද යටින් අවීචිය කෙළවරකොට සරසට අප්‍රමාණ ලෝකධාතුවල සියලු සතුන් ශීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් ද විමුක්තියෙන් ද අභිභවනය කරන සේක්ද, උන්වහන්සේට තුලාවක් හෝ ප්‍රමාණයක් හෝ නැත. අතුල්‍ය, අප්‍රමෙය්‍ය, අනුත්තර රාජ රාජ දේවදේව ශක්‍රාති ශක්‍ර බ්‍රහ්මාති බ්‍රහ්ම වන සේක. එහෙයින් කීහ. 'මහණෙනි, දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- දෙව් මිනිසුන් සහිත ලෝකයෙහි තථාගත තෙමේ අභිභවනය කරන්නේය. අභිභවන නොකරන ලද්දේය. සියල්ල දකින්නේය. වසයෙහි පවත්නේය. ඒ නිසා තථාගතයයි කියනු ලැබේ. මෙසේ මෙහි පදසිද්ධිය

දතයුතුය. අගද වැනි = අගදො. මේ කවරෙක්ද? දේශනා විලාශයද, පිනට වාසස්ථානයද වෙති. එයින් උන්වහන්සේ මහානුභාව ඇත්තෝය. වෛද්‍යවරයා දිව්‍ය ඖෂධයෙන් සර්පයන් මෙන් සියලු පරප්‍රවාදී දෙවියන් සහිත ලෝකය අභිභවනය කරන සේක. මෙසේ සියලු ලෝකය අභිභවනයෙහි තථ ලක්‍ෂණ ඇත්තෝය. අවිපරීත දේශනා විලාශ ඇත්තාහුද පුණ්‍යමය ඖෂධ ඔහුටනුයි ද කාරයට ත කාර කොට තථාගත යයි දතයුත්තේය. මෙසේ අභිභවන අර්ථයෙන් තථාගත වෙති.

තවද, එසේ ගියේනුයි තථාගතො. තථ බවට ගියේනුයි ද තථාගතො. ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාවට ගියේනුයි ඉවත්වූ ඉක්මගිය පැමිණි පිළිගත් යන අර්ථයි. එහි සියලු ලොව තීරණ පරිඥාවෙන් එසේ ගියේ ඉවත් වූයේනුයි තථාගතො. ලෝක සමුදය ප්‍රහාණ පරිඥාවෙන් එසේ ගියේ, ඉක්ම ගියේනුයි තථාගතො. ලෝක නිරෝධය සාක්‍ෂාත් කිරීමෙන් එසේ ගියේ පැමිණියේනුයි තථාගතො. ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාවට එසේ ගියේ පිළිපන්නේනුයි තථාගතො.

එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ කියන ලදී. 'මහණෙනි, තථාගතයන් විසින් ලෝකය අවබෝධ කරන ලදී. ලෝකයෙන් එසේ ගියේ වෙන්වූ සේක. මහණෙනි, ලෝක සමුදය තථාගතයන් විසින් අවබෝධ කරන ලදී. ලෝක සමුදය තථාගතයන්ට ප්‍රහීණය. මහණෙනි, ලෝක නිරෝධය තථාගතයන් විසින් අවබෝධ කරන ලදී. තථාගතයන් විසින් සාක්‍ෂාත් කරන ලදී. මහණෙනි, ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාව තථාගතයන් විසින් අවබෝධ කරන ලදී. තථාගතයන් විසින් ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාව භාවිතා කරන ලදී. මහණෙනි, දෙවියන් සහිත ලෝකයාගේ -පෙ- ඒ සියල්ල තථාගතයන් විසින් අවබෝධ කරන ලදී. ඒ නිසා තථාගත යයි කියනු ලැබේ. එහි අර්ථය මෙසේද දතයුතුයි. මෙයද තථාගත බව දැක්වීමෙහි ආරම්භය පමණකි. තථාගතයන් වහන්සේම තථාගතයන්ගේ තථාගත බව සියලු අයුරින් වර්ණනා කරන සේක.

**කතමෙච තං භික්ඛවෙ** යනු අල්පමාත්‍රයෙන් අඩු ප්‍රමාණයෙන්, සීල මාත්‍රයෙන් පෘථග්ජනයා තථාගතයන් වහන්සේගේ ගුණ කියන්නේය. ඒ කුමක්දැයි අසයි.

එහි පුච්ඡා නම් අදිට්ඨජෝතනා (නොදත් දෙය පැහැදිලි කරන) පුච්ඡාය. දිට්ඨ සංසන්දනා (දුටු දෙය පෙන්වීම) පුච්ඡාය. විමතිච්ඡේදනා (වැරදි අදහස් බිඳින) පුච්ඡාය. අනුමති (අවසර ලබා කරන) පුච්ඡාය. කථෙතු කම්‍යතා (කීමේ ආශාවෙන් කරන) පුච්ඡාය යනුවෙන් පුච්ඡාව පස්වැදෑරුම් වෙයි.

එහි අදිට්ඨජෝතනා පුච්ඡා නම් ප්‍රකෘතියෙන් නොදුටු, සමනොකළ, තීරණය නොකළ නොවූ භාවිතා නොකළ ලක්‍ෂණ ඇත්තේය. එය ඤාණයෙන් දැකීමට, සමකිරීමට තීරණය කිරීමට පැහැදිලි කිරීමට ප්‍රශ්න අසති. මෙය අදිට්ඨජෝතනා නමි.

දිට්ඨ සංසන්දනා පුච්ඡා නම් කිම? ප්‍රකෘතියෙන් දත්, දුටු, සමකළ, තීරණය කළ වූ පැහැදිලි කළ ලක්‍ෂණ ඇත්තේය.

එය අනිකුත් පඬිවරුන් සමග සැසැඳීම පිණිස ප්‍රශ්න අසයි. මෙය දිට්ඨ සංසන්දනා පුච්ඡා නමි.

විමතිච්ඡේදනා පුච්ඡා නම් කිම? ප්‍රකෘතියෙන් සැකයට, විමතියට බැස ගත්තේ, සැක හටගත්තේ මෙසේද? නොවේද? කුමක්ද? කෙසේද? යනුවෙන් හේ විමතිය නැති කරගනු පිණිස ප්‍රශ්න අසයි. මේ විමතිච්ඡේදන පුච්ඡා නමි.

අනුමති පුච්ඡා නම් කිම? භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන්ගේ කැමැත්තෙන් ප්‍රශ්න අසන සේක. මහණෙනි, ඔබ සිතන්නේ රූප නිත්‍යය කියාද? අනිත්‍යය කියාද? අනිත්‍යය ස්වාමීනි. යමක් අනිත්‍යනම් එය දුකද සුබද? දුක්ය ස්වාමීනි යනුවෙන් ඒ සියල්ල කිවයුතුය. මේ අනුමති පුච්ඡා නමි.

කථෙතු කම්‍යතා පුච්ඡාව නම් කිම? භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන්ට කියනු කැමැත්තෙන් ප්‍රශ්න අසන සේක. 'මහණෙනි, සතිපට්ඨාන සතරක් ඇත. කවර සතරක්ද යත්? -පෙ- මහණෙනි, මාර්ගාංග අටක් ඇත. කවර අටක්ද යත්? මේ කථෙතු කම්‍යතා පුච්ඡා නමි.

මේ පංච පුච්ඡාවන්හි කිසියම් නොදුටු ධර්මයක් නොමැති බැවින් තථාගතයන් වහන්සේට අදිට්ඨජෝතනා පුච්ඡාවක් නම් නැත. මේ නම් අනිකුත් පණ්ඩිත මහණ බමුණන් සමග සසඳ දේශනා කරන්නෙමියි සලකා බැලීමක් නූපදනා බැවින් දිට්ඨ සංසන්දනා පුච්ඡාවක්ද නැත. යම්හෙයකින් බුදුවරුන්ගේ එක් ධර්මයකදීවත් පැකිලීමක් නැත්ද, බෝමැඩදීම සියලු සැක බිඳ දමන ලදී. ඒ නිසා විමතිච්ඡේදන පුච්ඡාවක්ද නැත්මය. බුදුවරුන්ට ඉතිරි පුච්ඡා දෙක ඇත. එයින් මෙය කථෙතු කම්‍යතා පුච්ඡා නම්. දැන් ඒ කථෙතු කම්‍යතා පුච්ඡාවෙහි ඇසූ අර්ථය කියන්ට 'පාණාති පාතං පහාය' ආදිය කීහ.

එහි පාණස්ස අතිපාතො = පාණාතිපාතො, ප්‍රාණවධය, ප්‍රාණඝාතයයි කියන ලද්දේ වෙයි. මෙහි පාණො යනු ව්‍යවහාරයෙන් සත්ත්වයාය. පරමාර්ථ වශයෙන් ජීවිතේන්ද්‍රියයි. ඒ ප්‍රාණයෙහි ප්‍රාණය ඇත්තේය යන හැඟීම් ඇත්තහුගේ ජීවිතේන්ද්‍රිය, උපච්ඡේදක උපක්‍රමයන්ගෙන් ඔසවාලනු ලැබූ කාය වචීද්වාර දෙකින් එකක පැවති වධක චේතනාව **පාණාතිපාත** නම්. ඒ ප්‍රාණාතිපාතය ගුණයක් නැති තිරිසන්ගත සතුන් ආදී ප්‍රාණයන්හි ක්‍ෂුද්‍ර ප්‍රාණීන් කෙරෙහි අල්ප සාවද්‍යය. මහා ශරීර ඇත්තවුන් කෙරෙහි මහා සාවද්‍යය. කුමක් හෙයින්ද? ප්‍රයෝගය මහත් බැවිනි. ප්‍රයෝගය සම බවෙහිද වස්තු මහත්බව නිසා ගුණවත් මනුෂ්‍ය ආදීන් අතර අල්පගුණ ඇති ප්‍රාණීන් කෙරෙහි අල්පසාවද්‍යය. මහා ගුණ ඇත්තවුන් කෙරෙහි මහා සාවද්‍යය. ශරීර ගුණයන් ස්වභාවයෙහි ඇතිකල්හි ක්ලේශයන්ගේ ද උපක්‍රමයන්ගේ ද මෘදු බැවින් අල්ප සාවද්‍යය. තීව්‍ර බැවින් මහා සාවද්‍යයයි දතයුතුය. එයට සම්භාර පසක් වෙයි. ප්‍රාණියකු වීම, ප්‍රාණය ඇත්තෙකැයි යන හැඟීම, මැරීමේ සිත, උපක්‍රම යෙදීම, එයින් මරණය සිදුකිරීම, ප්‍රයෝග සයෙකි. සාහත්ථික (තම අතින් කරන) ආණත්තික (අණ කිරීමෙන් කරන) නිස්සග්ගික, ථාවර, විජ්ජාමය, ඉද්ධිමය යනුවෙන් මෙහිදී මෙය විස්තර කරනු ලබනවිට විශාල ප්‍රමාදයක් වෙයි. ඒ නිසා එය විස්තර නොකරමු. තවත් මෙබන්දක් අවශ්‍යයයි සිතන්නවුන් විසින් සමන්තපාසාදිකා නම් වූ විනය අටුවාව බලා ගතයුතුය. **පහාය** යනු මේ පාණාතිපාත චේතනා සංඛ්‍යාත දුසිල් බව අත්හැර, **පටිවිරතො** යනු ප්‍රහීණ කාලයෙහි පටන් ඒ දුසිල් බැවින් දුරින් වෙන් වූයේ. එයට එකට මිශ්‍ර වූ, ඇසින් කනින් දතයුතු ධර්මයෝද නැත. කාය විඤ්ඤත්තිය ගැන කියනුම කවරේද? මේ ක්‍රමයෙන්ද, අන් මෙබඳු පදයන්හි අර්ථ්‍ය දතයුතුය. **සමණො** යනු භාග්‍යවතුන් වහන්සේගේ පව් සමනය

කළ බැවින් ලද ව්‍යවහාරයයි. **ගොතමො** යනු ගෝත්‍ර වශයෙන්. භාග්‍යවතුන් වහන්සේ පමණක් ප්‍රාණාතිපාතයෙන් වෙන්වූ සේක් නොවෙත්. භික්ෂු සංඝයා ද වෙන්වූවාහුය. ආදියෙහි පටන්ම දේශනාවද මෙසේම ආයේය. අර්ථය පැහැදිලි කරන්නකු විසින් භික්ෂු සංඝයා වශයෙන් ද පැහැදිලි කරන්ට වටී. **නිහිතදණ්ඩො නිහිත සත්ථො** යනු, අනුන් නසනු පිණිස දඬුවක් හෝ ආයුධයක් හෝ ගෙන නොපවතින බැවින් බහා තැබූ දඬු ඇති, තැබූසත් ඇති යන අර්ථයි. මෙහිද දඬුව හැර අන් සියලු උපකරණ සතුන්ට හිංසා කරන බැවින් සත්ථ යයි දතයුතුය. භික්ෂුවක් සැරයටියක් හෝ දැහැට්ටක් හෝ දැලිපිහියක් හෝ මහන තූලක් හෝ ගෙන හැසිරේද, එය අනුන් නැසීම පිණිස නොවේ. ඒ නිසා තැබූ දඬු ඇත්තේ තැබූ සත් ඇත්තේ යනුවෙන් හැඳින්වේ. **ලජ්ජී** යනු පාපය පිළිකුල් කරන ලක්ෂණය වූ ලජ්ජාවෙන් යුත්. **දයාපන්නො** යනු දයාවට මෛත්‍රී සිතට පැමිණි. **සබ්බපාණ භූතෙසු හිතානුකම්පී** සියලු ප්‍රාණීන් කෙරෙහි හිත කැමති අනුකම්පා ඇත්තේ, ඒ දයාව ඇති බැවින් සියලු ප්‍රාණීන්ට ඉතසිත් ඇත්තේ යන අර්ථයි. **විහරති** යනු හැසිරෙයි. පාලනය කරයි. **ඉතිවාහි භික්ඛවෙ** යනු මහණෙනි මෙසේ හෝ වා ශබ්දය ඉදිරියෙහි 'අදින්නාදානං පහාය' යන ආදිය අපේක්ෂාකොට විකල්ප අර්ථයෙහි කියන ලදී. මෙසේ සියලු තැන පෙරවූ දෙය හෝ පසුව එන දෙය අපේක්ෂාකොට විකල්පභාවය දතයුතුය. මේ මෙහි සංක්ෂේපයයි. 'මහණෙනි, පෘථග්ජනයා තථාගතයන්ගේ ගුණ කියමින් මෙසේ හෝ කියන්නේය. ශ්‍රමණ ගෞතම තෙමේ ප්‍රාණය නොනසයි. ඝාතනය නොකරයි. එය අනුමත නොකරයි. මෙම දුසිල් බැවින් මිදුණේය. සගයිනි, බුදුගුණ ඒකාන්තයෙන් පුදුමයි යනුවෙන් මහත් උත්සාහයක් කොට ගුණ කියනු කැමැත්තේ ද අල්පමාත්‍ර වූ ආචාර සීලමාත්‍රයම කියයි. මත්තෙහි අසාධාරණ බව නිසා ගුණ කියන්ට නොහැක්කේ වෙයි. හුදෙක් පෘථග්ජනයා අරහත් වූ ඇත්තෝ ද පසේ බුදුවරුද නොහැකි වෙත්මය. තථාගතයන් වහන්සේට හැකි වෙයි. එය ඔබට මතුවට කියමි. මේ මෙහි අභිප්‍රාය අර්ථ වර්ණනාවයි. මින්පසුවට අනුපිළිවෙළින්ම වර්ණනා කරන්නෙමි.

**අදින්නාදානං පහාය** යනු මෙහි අදින්නසස (නුදුන් දෙය) = ආදානං (ගැනීම) = අදින්නාදානයයි. අන්සතු දෙය ගෙනයාම. සොරකම. සොර සිතින් ගැනීම යයි කියන ලදී. එහි **අදින්නං** යනු අනුන් අරක්ගත්. යම් තැනක අන් තැනැත්තා තමා කැමති දෙයක් කරන ලද බවට

පැමිණෙන්නේ දඬුවමට නුසුදුසු වන්නෙක්ද උපවාද කිරීම නුසුදුස්සෙක්ද වෙයිද, ඒ අනුන් අරක් ගත් දෙයෙහි අනුන් අරක්ගත් බව දනිමින් එය ගැනීමේ උපක්‍රමයෙන් ඔසවන ලද සොරකම් කිරීමේ චේතනාව අදින්නාදානයයි. එය අඩුතැන අනුන් සතු වූවෙහි අල්ප සාවද්‍යය. වැඩිතැන මහා සාවද්‍යය. කුමක් හෙයින්ද යත්, වස්තුවෙහි වටිනාකම වැඩි බැවිනි. වස්තු සමත්වය ඇතිකල්හි ගුණ අධික වූවන් සතු වස්තුවෙහි මහා සාවද්‍යය. ඒ ඒ ගුණ අධික බව නිසා ඊට වඩා හීන ගුණ ඇත්තා සතු වස්තුවෙහි අල්ප සාවද්‍යය. එහි සම්භාර පසක් වෙයි. අනුන් අරක් ගත්බව. අනුන් අරක්ගත් බව දැනුම, සොරසිත, උපක්‍රම කිරීම, එයින් ගෙනයාම, සාහත්‍ථික ආදී ප්‍රයෝග සයකි. ඒවාද අනුරූප පරිදි සොරෙන් ගෙනයාම, බලාත්කාරයෙන් ගෙනයාම, සඟවාගෙන යාම, සැලසුම්කොට ගෙනයාම, කුසපත් හොරෙන් ගෙනයාම, යනුවෙන් මෙසේ ගෙනයාම් වශයෙන් පැවති මේ මෙහි සංක්‍ෂේපයයි. විස්තර සමන්තපාසාදිකාවේ කියන ලදී. දින්නමෙව (දුන් දෙයම) ආදියති (ගනී) = දින්නදායී, සිතින් දෙනලදැයි සිතානුයි = දින්නපාටිකංඛී. ථෙනෙති (සොරකම් කරයි) = ථෙනො. සොරකමින් නොවන්නේ = අථෙන. සොරකම් නොකළ බැවින්ම සුචිභූතෙන (පිරිසිදු). අත්තනා ආත්මභාවයෙන් (තමා විසින්ම) මේ මෙහි සංක්‍ෂේපයයි. 'සොර සිත් නැති පිරිසිදු ආත්මභාවය කොට වාසය කරයි.' නුයි කියන ලද්දේ වෙයි. සෙස්ස පළමුවැනි සිකපදයෙහි කියන ලද ක්‍රමයෙන්ම යොදාගත යුතුය. මෙහි යම්සේද සියලුතැන එසේය.

අබ්‍රහ්මචරියං යනු ශ්‍රේෂ්ඨ නොවූ චර්යාව. උසස් ශ්‍රේෂ්ඨ ආචාරයෙහි හැසිරේනුයි බ්‍රහ්මචාරී, ආරාචාරී යනු උසස් නොවූ චර්යාවෙන් දුරාචාරී වූ. මෙථුනා යනු රාගය වැඩිවීම් වශයෙන් සමාන බැවින් මෛථුනක යයි ලබන ලද ව්‍යවහාරයෙන් සේවනය කළයුතු බැවින් මෙථුන යයි දන්නා ලද අසද්ධර්මය. ගාමධම්මා ග්‍රාමවාසීන්ගේ ධර්මය.

මුසාවාදං පහාය යනු මෙහි මුසා යයි වංචාව පෙරටු කොටගත් යහපත බිඳලන වාක්ප්‍රයෝගය හෝ කායප්‍රයෝගය. වංචාකිරීමේ අදහසින් අනුන් වංචාකරන කාය වාක් ප්‍රයෝගයෙන් ඔසවන ලද චේතනාව මුසාවාදයයි. වෙනත් ක්‍රමයක්, මුසා යනු නොවූ සත්‍ය නොවූ කරුණයි. වාදො යනු එය වූයේ සත්‍ය සේ දැන්වීමයි. ලක්‍ෂණ වශයෙන් නොවූ කරුණ වූයේ අනුන්ට දන්වනු කැමැත්තහුගේ එසේ හැඟවීමෙන් උපදවන ලද චේතනාව මුසාවාදයයි. එය යම් අර්ථයක් බිඳදමයිද, එය අල්ප

බැවින් අල්ප සාවද්‍යයි. මහත් බැවින් මහා සාවද්‍යයි. තවද, ගිහියන්ට තමා සතු දෙය නොදෙනු කැමැත්ත නිසා 'නැත' යනාදි ක්‍රමයෙන් පැවතියේ අල්පසාවද්‍යයි. මිත්‍රයකු වී අර්ථය බිඳ දැමීම පිණිස කියන ලද දෙය මහා සාවද්‍යය. පැවිද්දන්ට අල්පමාත්‍ර වූ තෙලක් හෝ ගිතෙලක් ලැබ, සිනාසීමේ අදහසින් 'අද ගමේ තෙල් ගඟක් ගලාබසී' යයි පූරාණකථා ක්‍රමයෙන් පැවැත්තේ අල්පසාවද්‍යය. නොදුටු දෙය දක්නා ලද්දේයයි ආදී ක්‍රමයෙන් කියන්නවුන්ට මහාසාවද්‍යය. එයට කොටස් සතරක් ඇත. සත්‍ය නොවූ කරුණ, වංචා කිරීමේ සිත, ඉන් හටගත් ව්‍යායාමය, අනුන්ට ඒ බව දැන්වීම, එක් ප්‍රයෝගයක් සාහත්ථිකය. එය කයින් හෝ කය හා බැඳුණු දෙයකින් හෝ වචනයෙන් හෝ වංචා කිරීමේ ක්‍රියාවෙහි දතයුතුය. එය යම්හෙයකින් ඒ ක්‍රියාවෙන් අන්‍යයා ඒ බව දනීද, මෙය කාර්යය උපදවන චේතනාව ඇතිවූ කෙණෙහිම මුසාවාද කර්මය හා බැඳෙයි. යම්හෙයකින් කය හා බැඳුණු වචනයෙන් අනුන් වංචා කෙරේද එසේ මොහුට කියවයි අණ කරන්නේද ලිපියක් ලියා ඉදිරියෙහි හලන්නේද 'මේ බව මෙසේ දතයුතුයයි බිත්ති ආදියෙහි ලියා තබන්නේද, ඒ නිසා මෙහි ආණත්තික, නිස්සග්ගිය, ථාවර යන ප්‍රයෝග යෙදේ. අටුවාවන්හි නොආ බැවින් විමසාගත යුතුය. සත්‍යය කියානුයි = සච්චවාදී, සත්‍යයෙන් සත්‍යය ගළපයි ගටයිනුයි = සච්චසන්ධො. අතරතුර මුසා නොකියයි යන අර්ථයි. යම් පුරුෂයෙක් වරක් මුසා කියයි. වරක් සත්‍යය කියයි. ඔහු මුසාවාදය අන්තර්ගතව ඇති බැවින් සත්‍යයෙන් සත්‍යය නොගටයි. ඒ නිසා ඔහු සච්චසන්ධ නොවේ. මොහු වනාහි එබන්දෙක් නොවේ. ජීවිතය නිසාවත් මුසාවක් නොකියා සත්‍යයෙන් සත්‍යය ගළපාමැයි යනුයි සච්චසන්ධ වේ. ථෙතො ස්ථිර වූයේ ස්ථිර කථා ඇත්තේය යන අර්ථයි. එක් පුද්ගලයෙක් කහ වර්ණය මෙන්, දහයියා ගොඩෙහි තැබූ කණුවක් මෙන් අසුපිට තැබූ කොමඩු ගෙඩියක් මෙන් ද ස්ථිරකථා ඇත්තේ නොවේ. අසිපතින් හිස සිඳින කල්හිද කථා දෙකක් නොකියයි. මෙය ථෙතො යයි කියනු ලැබේ. පච්චයිකො යනු විශ්වාසය තැබිය හැක්කෙක්, ඇදහිය හැක්කෙක් නොවේ. 'මෙය කා විසින් කියන ලදද? අසුවලා විසිනැයි කී කල්හි, 'ඔහුගේ වචන අදහන්න එපා යයි කියයුතු බවට පැමිණෙයි. එකෙක් විශ්වාසය තැබිය හැක්කෙක් වෙයි. මෙය කා විසින් කියන ලද්දේ ද? අසුවලා විසිනැයි කී කල්හි 'ඔහු විසින් කියන ලද්දේ නම් මෙයම පමණය. දැන් පිළිකෙව් කළයුත්තක් නැත. මෙයද එසේමයයි කිවයුතු බවට පැමිණේ. මෙය පච්චයික යයි කියනු ලැබේ. අවිසංවාදකො ලොකස්ස ඒ සත්‍යවාදී බැවින් ලෝකය වංචා නොකරවයි යන අර්ථයි.

**පිසුණං වාචං පහාය** යනාදි තැන්හි යම් වචනයකින් යමකුගේ ඒ වචනය කියයිද, ඔහුගේ හදවතෙහි තමාගේ ප්‍රිය බවද අනුන්ගේ ශූන්‍ය බවද කරයි. ඒ පිසුණාවාචය. යම් වචනයක් එයම සැරපරුෂ ද කණට සුව නොඑළවයිද, හෘදයංගම නොවේද මෙය ඵරුසාවාචා නම්, යමකු විසින් අරුත්සුන් නිරර්ථක දේ කථාකරයිද ඔහු සමඵප්පලාපො නම්. ඒවාට මූලභූත වූ චේතනාව පිසුණාවාචා ආදී නම ම ලබයි. එය මෙසේද මෙහි අදහස් කරන ලදී. එහි කිලිටි සිත අනුන් බිඳුවීම පිණිස හෝ තමාට ප්‍රිය කම්‍යතාව පිණිස හෝ කාය වාක් ප්‍රයෝගයෙන් උපදවන ලද චේතනාව පිසුණාවාචාය. එය යමකු බිඳීම කරයිද, ඔහුගේ අල්පගුණ ඇති බැවින් අල්ප සාවද්‍යය. මහා ගුණ ඇති බැවින් මහා සාවද්‍යය. එහි කොටස් හතරක් බිඳිය යුතු අන්‍යයා, මෙසේ මේවා නානාවිධ වෙයි වෙන්වෙයි යනුවෙන් භේද පෙරදැරි වීම හෝ මෙසේ මම ප්‍රිය වන්නෙමි. විශ්වාසවන්තයෙකැයි ප්‍රිය කම්‍යතාව හෝ, ඉන් හටගත් ව්‍යායාමය ඒ බව දැනීම. **ඉමෙසං භෙදාය** යමකු මෙතැනින් කියූවන් හමුවෙහි ඔවුන් බිඳීම පිණිස අසන ලදී. **භින්නානං වා සන්‍ධාතා** මිතුරන් දෙදෙනාගේ හෝ සමාන උපාධ්‍යාය ආදීන්ගේ හෝ කිසියම් කරුණක් නිසා බිඳුණවුන් එක එකා කරා එළඹ 'මෙබඳු කුලයක උපන් මෙසේ බහුශ්‍රැත වූ ඔබලාට මෙය සුදුසු නැතැයි ආදිය කියා එක්තැන් කරන්නා. **අනුප්පදාතා** එක්තැන් කිරීම සිදුකරන්නා. සමගිව සිටින මිනිසුන් දෙදෙනකු දැක 'මෙබඳු කුලයක උපන් මෙබඳු ගුණයෙන් යුතු ඔබලාට මෙය සුදුසුයයි ආදිය කියා ශක්තිමත් කරන්නා යන අර්ථයි. **සමග්ගාරාමො** යනු සමගියෙහි ඇල්ම මොහුට ඇත්තේනුයි සමග්ගාරාම නම්. සමග්ගරාමො යනුවෙන් ද පාඨයක් ඇත. එම අර්ථයමය. **සමග්ගරතො** සමගි වූවන් කෙරෙහි ඇලුණේ. ඔවුන් අත්හැර අන්තැනකට යාමටද නොකැමති වේ යන අර්ථයි. සමගිවූවන් දැකද, අසාද සතුටු වේනුයි **සමග්ගනන්දී** නම්. **සමග්ග කරණිං වාචං භාසිතා** යනු යම් වචනයක් සත්ත්වයන් සමගි කරයිද, ඒ සමගියෙහි ගුණ පෙන්වන වචනයම කියයි. අනිකක් නොකියයි.

අනුන්ගේ මර්මච්ඡේදක කායවාක් ප්‍රයෝගයෙන් උපදවන ලද ඒකාන්ත ඵරුස චේතනාව ඵරුසාවාචා නම්. එය පැහැදිලි කරන කථාවක් - එක් දරුවෙක් මවගේ වචන නොඅදහා කැලයට යයි. මව ඔහු නැවැත්වීමට නොහැකි වන්නී කුළු එළදෙනක් තා ලුහුබඳීවායි බැණ වැදුණාය. ඒ අයුරින්ම කැලෑවේදී කුළු එළදෙනක් නැඟී සිටියාය. 'මාගේ මව කටින් යමක් කීවාද, එය නොවේවායිද, යමක් සිතින් සිතුවාද එය

වේවායිද සත්‍යක්‍රියා කළේය. කුළු එළදෙන එහිම බැඳ සිටියාක් මෙන් වූවාය. මෙසේ මර්මච්ඡේදක වුවද ප්‍රයෝගය සිත මෘදු බැවින් ඵරුසාවාචා නොවේ. මව්පියෝ යම් වේලාවක දරුවන්ට මෙසේ කියති. 'හොරු තා කඩ කඩ කොට දමත්වා'යි නිලුපුල් පෙත්තක් වත් ඔවුන් මත වැටීම නොකැමති වෙත්. ආචාර්ය උපාධ්‍යායවරුද ඉඳහිට ඇසුරෙහි සිටින්නවුන්ට මෙසේ කියති. 'මොනවාද මේ ලැජ්ජාබය නැතිවුන් කරන්නේ? මුං එලවා දමවු' එහෙත් ඔවුන්ගේ ආගම අධිගම සම්පත්තිය කැමති වෙත්. යම්සේ සිතෙහි මෘදුබව නිසා ඵරුසවචනයක් නොවේද, එපරිද්දෙන් වචන මෘදු බැවින් ද ඵරුස වචනයක් නොවේ. මරවනු කැමැත්තහුගේ 'මොහු සැපසේ නිදි කරවවු' යන වචන අඵරුස වචන නොවේ. සිතෙහි ඵරුස බව නිසාම එය ඵරුස වචනමය. ඒ වචන යමක් සඳහා පැවතියේද එහි අල්පගුණ බැවින් අල්ප සාවද්‍යය. මහාගුණ ඇති බැවින් මහා සාවද්‍යය. එහි කොටස් තුනක් ඇත. ආක්‍රෝශ කළයුතු අන්‍යයා, කිපුණු සිත, ආක්‍රෝශ කිරීම යනුවෙන්. නෙලා යනු එලං යනු දෝෂයයි. එලය මොහුට නැත්නුයි = නෙලා. දොස් රහිත යන අර්ථයි. 'නෙලංගො සෙත පච්ඡදො' - සුදෙන් වැඩූ රථය දොස් නැත' මෙහි කියන ලද ශීලය මෙන්. **කණ්ණසුඛා** යනු ව්‍යංජන මධුරතාවෙන් කන්වලට සුවගෙන දෙන, ඉඳිකටුවෙන් විදින්නාක් මෙන් කනෙහි ඇනීමක් සුවගෙන දෙන, ඉඳිකටුවෙන් විදින්නාක් මෙන් කනෙහි ඇනීමක් නූපදවයි. අර්ථ මධුරතාවෙන් මුළු සිරුරෙහි කෝපය නූපදවා ප්‍රේමය උපදවානුයි **පෙමනීයා** නොහැප්පෙමින් හදවතට යතියි, පහසුවෙන් **සිතට** පිවිසෙතියි හදයංගමා ගුණයෙන් පිරිපුන් බැවින් පෙර වීනුයි පොරී පෙර සංවර්ධන කරන්නකු මෙන් සුකුමාර යනුයි පොරී. පුරයෙහි මෙය වෙතියි පොරී. මෙය පුරයෙහි ඇතැයි නගරවාසීන්ගේ කථාය යන අර්ථයි. නගරවාසීහු සුදුසු කථා ඇත්තෝ වෙති. පියා වැන්නකුට පියා කියාද, සහෝදරයා වැන්නකුට සහෝදරයා කියාද කියති. මෙබඳු කථා බොහෝ දෙනකුට කන්තා (ආකර්ෂණීය) වේනුයි = **බහුජනකන්තා** ආකර්ෂණීය භාවයෙන්ම බොහෝදෙනාට මනාප වූ සිත වැඩිකරන හෙයින් **බහුජනමනාපා**.

අනර්ථය හඟවන කාය වාක් ප්‍රයෝගයන්ගෙන් ඇතිකරන ලද අකුශල චේතනාව සම්ඵප්පලාප නම්. එය පලපුරුද්ද මඳ බැවින් අල්පසාවද්‍යය. පලපුරුද්ද මහත් බැවින් මහා සාවද්‍යය. එහි කොටස් දෙකකි. භාරත යුද්ධ සීතාහරණ ආදී නිරර්ථක කථා පෙරටු කරගත් බව. එබඳු කථා කීම. **සුදුසුකල්හි කියානුයි කාලවාදී**, කිවයුත්ත කාලය සලකා

බලා කියයි යන අර්ථයි. වූ දෙය සත්‍ය ස්වභාවයෙන්ම කියානුයි භූතවාදී. මෙලොව පරලොව යහපතින් යුතුකොට කියානුයි අත්‍ථවාදී නව ලොවුතුරා දහම් මුසුකොට කියානුයි ධම්මවාදී, සංවර විනය ප්‍රහාණ විනය මුසුකොට කියානුයි විනයවාදී, නිධාන යනු තබන අවකාශයයි කියනු ලැබේ. නිධානය ඇයට ඇත්තේනුයි නිධානවතී. හෘදයෙහි නිදන් කළයුතු වචන කියන ලද්දේ යන අර්ථයි. කාලෙන යනු මෙබඳු දේ කියමින් 'මම නිධානවතී වචන කියමි'යි නොකල්හි නොකියයි. සුදුසුකල් බලාම කියයි යන අර්ථයි. සාපදෙසං යනු උපමා සහිත. කරුණු සහිත යන අර්ථයි. පරියන්තවතී යනු පිරිසිඳ දක්ව දක්වා එහි පිරිසිඳීමක් පෙනෙන පරිදි මෙසේ කියයි යන අර්ථයි. අත්‍ථසංහිතං යනු නොයෙක් නයින් බෙදා දක්වන්නේද අර්ථ සම්පන්න දෙය ලබාගැනීමට නොහැකි වන්නේය. ඒ අර්ථවාදී පුද්ගලයා අර්ථය කියයිද, ඒ අර්ථයෙන් සහිත බැවින් අර්ථ සහිත වචන කියයි. අනිකක් බහා අනිකක් කියතියි කියන ලද්දේ වෙයි.

බීජගාම භූතගාම සමාරම්භා යනු මූලබීජය, ඛන්ධබීජය, අග්‍රබීජය, ඵලබීජය, බීජ බීජ යැයි පස්වැදෑරුම් වූ බීජ වර්ගයාගේ යම් කිසිවක තණරුක් ආදී භූත වර්ගයාගේ විනාශය, කැපීම්, පිසීම් ආදී ක්‍රමයෙන් වැළකුණේය යන අර්ථයි.

එකභත්තිකො යනු උදෑසන ආහාරය. සවස ආහාරයැයි ආහාර දෙකකි. එයින් උදෑසන ආහාරය මධ්‍යාහ්නයෙන් පිරිසිදුණේ වෙයි. අනික මධ්‍යාහ්නයේ සිට අරුණු නැගෙන තෙක්, ඒ නිසා මධ්‍යාහ්නය අවසන්කොට ඇති කාලය තුළ දසවරක් අනුභව කරන්නේද ඒකභත්තිකම වෙයි. ඒකභත්තිකයයි ඒ සඳහා කියන ලදී. රාත්‍රී භෝජනය රත්ති නම්. එයින් වැළකුණේ රත්තූපරතො නම්. මධ්‍යාහ්නය ඉක්මගිය පසු සූර්යයා අස්තයට යන තෙක් අනුභවය විකාල භෝජන නම්. එයින් වැළකුණු බැවින් = විරතො විකාල භොජනා කවදා වැළකුණෝද, අනෝමා නදී තීරයෙහි පැවිදි වූ දිනයෙහි පටන් සාසනයට අනුලොම් නො වන බැවින්.

විසූළු, පටහැනි වූ දේ බැලීම = විසූකදස්සන නම්. තමා නැටීම නැටවීම ආදී වශයෙන් නැටුම් ද ගීතද වාදිතයද යටත් පිරිසෙයින් මොනර නැටුම් ආදී වශයෙන් ද පැවති නෘත්‍ය ආදියෙහි දැකීම නච්චගීත වාදිත විසූක දස්සනා, නෘත්‍ය ආදිය තමා විසින් යෙදීමට හෝ අනුන් ලවා යොදවාලීමට හෝ යෙදී බැලීමට භික්ෂූන්ට හා භික්ෂුණීන්ට නොවටී.

මාලා ආදියෙහි **මාලා** යනු කිසියම් මලකි. **ගන්ධං** යනු යම්කිසි සුවඳ වර්ගයකි. **විලෙපන** යනු සම පැහැ ගැන්වීම. එහි පළඳින්නේ ධාරෙති (දරයි) නම් වේ. අඩු තැන් පුරවන්නේ **මණ්ඩති** නම්. **ඨානං** යනු කාරණයයි. ඒ නිසා කිසියම් දුසිල්වත් සිතින් ඒ මල් දැරීම ආදිය මහජනයා කරයි. එයින් වැළකුණේ යන අර්ථයි.

**උච්චාසයන** යනු ප්‍රමාණය ඉක්මවූ. **මහාසයනං** අකැප අරුත් ඇති. එයින් වැළකුණේ යන අර්ථයි.

**ජාතරූප** යනු රත්රන්. **රජතං** යනු කහවණු, ලෝහ කහවණු, මස්ස, ලතු මස්ස, ලී මස්ස යයි යමක් ව්‍යවහාරයට යයිද, ඒ දෙකම පිළිගැනීමෙන් එය නූගනී. නූගන්වයි. තැබූවක් නොඉවසයි යන අර්ථයි.

**ආමකධඤ්ඤ පටිග්ගහණා** යනු ඇල් වී යව අමු මෙනේරි කුරහන් සංඛ්‍යාත වූ සත්වැදෑරුම් වූ අමු ධාන්‍ය පිළිගැනීම හුදෙක් මේවා පිළිගැනීම පමණක් නොව අතගෑම පවා භික්ෂූන්ට නොවටින්නේමය.

**ආමකමංස පටිග්ගහණා** යනු මෙහි අරමුණක් නොමැතිව අනුදත් අමු මස් මාළු පිළිගැනීම පමණක් භික්ෂූන්ට නොවටී. අතගෑම නොවේ.

**ඉත්ථිකුමාරි පටිග්ගහණා** යනු මෙහි ඉත්ථි යනු පුරුෂයන් අතරට ගියාහු. අන් අය කුමාරිකා නමු. ඔවුන් පිළිගැනීමද අතගෑමද අකැපමය.

**දාසිදාස පටිග්ගහණා** යනු මෙහි දාසි දාස වශයෙන් ම ඔවුන් පිළිගැනීම නොවටී. 'කැපකරුවෙකු දෙමි. ආරාමිකයෙකු දෙමියි මෙසේ කී කල්හි වටී.

අජේළකා ආදී තන්හිද කෙත් වතු කෙළවර කැප අකැප ක්‍රමය විනය වශයෙන් ම සලකා බැලිය යුතුය. එහි **ඛෙත්තං** යනු යම්තැනක පළමු ධාන්‍ය වැඩේද එතැන. **වත්ථු** නම් යම් තැනෙක වෙනත් වර්ගවල ධාන්‍ය වැඩේද එතැන. යම්තැනෙක මේ දෙවගම වැඩේද එය ඛෙත්ත නම්. ඒ සඳහා පිළියෙල නොකළ භූමිභාගය වත්ථු නම්. ඛෙත්ත වත්ථු ශීර්ෂයට වැව් තටාක ආදියද ඇතුළත් වේ.

**දූතෙයාං** දූත කර්මය කියනු ලැබේ. ගිහියන්ගේ හසුන්පත් රැගෙන ඒ ඒ තැන යාම. **පහිත ගමනං** ගෙන් ගෙට යවන්නහුගේ කෙටි ගමන. **අනුයොගො** නම් ඒ කරුණු දෙකම. ඒ නිසා දූත කර්මය, ගෙන්ගෙට යාම දෙකෙහි යෙදීම මෙහි අර්ථය බව දතයුතුය.

**කය වික්කයා** යනු මිලට ගැනීම සහ විකිණීම. තුලා කුට ආදී තන්හි කුට යනුවෙන් ද වචනයක් ඇත. **තුලාකුට** නම් රූපකුට, අංගකුට, ගහණ කුට, පටිච්ඡන්න කුට යනුවෙන් සිව් වැදෑරුම් වේ. එහි රූපකුට නම් තරාදි දෙකක් සමානව තබා ගැනීමේදී ලොකු තරාදියෙන් ගනී. දීමේදී කුඩා තරාදියෙන් දෙයි. අංගකුට නම් ගැනීමේදී පසුපස අතින් තද කරයි. දෙනවිට පෙර පස තදකරයි. ගහණකුට යනු ගන්නාවිට මුල ලණුවෙන් අල්ලයි. දෙනවිට අග අල්ලයි. පටිච්ඡන්නකුට නම් තරාදිය මැදින් සිදුරක් කොට කෙළවර යසුණු බහා ගන්නාවිට එය පසුපසට කරයි. දෙනවිට අගට කරයි. කංස යනු රන් තලියයි. එයින් වංචා කිරීම කංසකුටයි. කෙසේද? එකක් රන් තලියක් කොට අනික් දෙක තුනක් ලෝහ තලි රන්වන් කරත්. ඉන් ජනපදයට ගොස් කිසියම් ආඪ්‍ය වූ කුලයකට පිවිස 'රන් බඳුන් මිලට ගන්නැයි කියා මිල ඇසූවිට වඩා අගනා තලි දෙනු කැමැත්තෝ වෙති. ඉන්පසු ඔවුන් විසින් 'මේවායේ රන් බව කෙසේ දතයුතුදැයි කී කල්හි විමසා බලා ගන්නැ'යි රන්තලිය ගලක ගටා සියලු තලි දී යති. **මානකුට** යනු හදය භේද, සිඛා භේද, රජ්ජු භේද වශයෙන් තෙවැදෑරුම් වෙයි. එහි හදය භේද නම් ගිතෙල් තෙල් ආදිය මනින කල්හි ඉහිරුවයි. ඒවායින් ගන්නාවිට යව සිදුරෙන් ඉක්මනින් වක්කරව'යි කියා ඇතුල් බඳුනෙහි බොහෝ ගලායවා ගනී. දෙනවිට සිදුර වසා වහා පුරවා දෙයි. සිඛා භේදයද තල සහල් ආදිය මනින කල්හි ඉහිරුවයි. ඒවා ගන්නාවිට වහා මුදු ඔසවා ගනියි. දෙනකල්හි වේගයෙන් පුරවා මුදුන බිඳිමින් දෙයි. රජ්ජුභේදය කෙත්වතු මනින කල්හි ඉක්මවා යයි. අල්ලස් නොලබන්නාහු කෙත කුඩා වුවද මහත්කොට මනිති.

අල්ලස් ගැනීම් ආදියෙහි **උක්කොටන** යනු හිමිකමක් නැත්තවුන් හිමිකම් ඇත්තවුන් කොට අල්ලස් ගැනීමයි. **වඤ්චනං** ඒ ඒ උපායෙන් අනුන් වංචා කිරීම එහි මේ කථාව වෙයි. එක් වැද්දෙක් මුවකුද මුව පොව්වකුද ගෙන එයි. එක් ධූර්තයෙක් 'පින්වත මුවා කීයක් අගීදැයි මුව පොව්වා කීයක් අගීදැ'යි ඇසීය. 'මුවා කහවණු දෙකයි. මුව පොව්වා කහවණු එකයි කී කල්හි කහවණුවක් දී මුවපොව්වා ගෙන මඳක් ගොස්

නැවතී 'පින්වත මට මුවපොව්වාගෙන් ප්‍රයෝජනයක් නැත. මට මුවා දෙන්නැයි කීය. 'එසේනම් කහවණු දෙකක් දෙවයි කීය. ඔහු මෙසේ කීය. 'පින්වත, මා විසින් පළමුව එක් කහවණුවක් දුන්නා නේද? 'එසේය දෙන ලදී' 'මේ මුවපොව්වා ගන්න. මෙසේ ඒ කහවණුවත් මේ කහවණුවක් අගනා මුවපොව්වාත් සමග කහවණු දෙකක් වෙයි. ඔහු කරුණක් කියිතියි සලකා මුවපොව්වා ගෙන මුවා දුන්නේය.

නිකති යනු යෝග වශයෙන් හෝ මායා වශයෙන් හෝ වළල්ලක් නොවූ දෙය වළල්ලක් යයි ද, මැණිකක් නොවූ දෙය මැණිකක් යයිද, රන් නොවූ දෙය රන් යයිද, කොට සමාන දෙයින් වංචා කිරීමයි. සාචියොගො යනු කපටි යෙදුමයි. මේ වංචාකිරීම් ආදීන්ට මේ නමයි. ඒ නිසා උක්කොටන සාචියොග වංචන, සාචියෝග, නිකති සාචි යෝග යනුවෙන් මෙසේ මෙහි අර්ථය දතයුතුය. කෙනෙක් අනිකක් පෙන්වා අනිකකට හැරවීම සාචි යෝගයයි කියති. එය වංචනයෙහිම සංගෘහීතය.

සිඳීම් ආදියෙහි ඡෙදන යනු අත් සිඳීම් ආදිය. වධ යනු මැරවීමයි. බන්‍ධො යනු ලනු ආදියෙන් බැඳීමයි. විපරාමොසො යනු හිමවිපරාමොස, දම්බ විපරාමොස යයි දෙවැදෑරුම් වේ. හිම වැටෙන කල්හි හිමෙන් වැසී මගට පිළිපන් ජනයා මුළාකරත්. මෙය හිම විපරාමොසයයි. පඳුරු ආදියෙන් සැඟවී ජනයා මුළාකරත්. මෙය ගුම්බ විපරාමොස යයි. ආලොපො යනු ගම් නියම්ගම් කොල්ලකෑමයි. සහසාකාරො යනු සැහැසි ක්‍රියා කිරීමයි. ගෙට පිවිස මිනිසුන්ගේ පපුවෙහි පිහියක් තබා කැමති බඩු පැහැරගෙන යාමයි. මෙසේ මේ සිඳීමෙන් -පෙ- සැහැසිකමින් ශ්‍රමණ ගෞතම තෙමේ මිදුණේ වෙයි. මහණෙනි, මෙසේ හෝ පෘථග්ජනයා තථාගතයන්ගේ ගුණ කියන්නේය.

මෙපමණකින් චූල්ලසීලය නිමියේ ය.

දැන් මජ්ඣිම සීල විස්තර කරන්නේ යථාවා පනෙ තෙ භොනෙතා යනාදිය කීහ. එහි මේ ගැඹුරු පද වර්ණනාවයි. සද්ධා දෙය්‍යාති කර්මයද ඵලයද මෙලොවද පරලොවද අදහා දුන් දේ මේ මාගේ ඥාතියා හෝ මිත්‍රයා හෝ මෙය කළ අයුරින් කරන්නෙමි. මෙය ඔහු විසින් කළ වීරුය. මෙසේ නොදුන් යන අර්ථයි. මෙසේ දුන් දේ සද්ධාදෙය්‍ය නම් නොවේ.

භොජනානි යනු දේශනා ශීර්ෂයක් පමණි. අර්ථ වශයෙන්, ශ්‍රද්ධාවෙන් දිය යුතු දේ වළඳ සිවුරු පොරවා සෙනසුන් පරිහරණය කරමින් ගිලන් බෙහෙත් වළඳමින් යන මේ සියල්ල කියන ලද්දේම වෙයි. සෙය්‍යථීදං යනු නිපාතයකි. යමක විනාශයෙහි නියුක්තව වසත් නම් ඒ බීජගාමභූත ගාමය කුමන අර්ථයක් ඇත්තේද? ඉන්පසු එය දක්වමින් මූලබීජං ආදිය කීහ. එහි මූලබීජ නම් කහ, හිඟුරු, වච, වචත්‍ථ, අතිවිස, කටුකරෝහිණී උසීරක භද්දමුත්තක ආදිය. ඛන්ධබීජ නම් ඇසතු, නුග, පිලක්ඛ, උදුම්බර, කච්ඡක, කපීතන ආදිය. ඵලුබීජ නම් උක්, උණ බට ආදිය. අග්ගබීජ නම් අජ්ජක, ඵනිජ්ජක, ඉරිවේරිය ආදිය. බීජබීජං යනු වී ඉරිඟු ආදිය. මේ සියල්ල ගසින් වෙන්ව වැඩෙන්ට සමර්ථය. ඒ නිසා බීජගාම යයි කියනු ලැබේ. ගසින් වෙන් නොවූ නොවියලි වූ දේ භූතගාමයයි කියනු ලැබේ. එහි භූතගාම විනාශකිරීම පාචිත්තිය ආපත්තියට කරුණකි. බීජගාම විනාශය දුකකට ආපත්තියට කරුණකියි දතයුතුය.

සන්නිධිකාර පරිභොග යනු රැස්කරගත් දේ පරිභෝග කිරීම. එහි කථාව විනය වශයෙන් ද සල්ලෙඛ වශයෙන් ද දෙවැදෑරුම්ය. විනය වශයෙන් ගත්විට යම් අහරක් අද පිළිගන්නා ලද්දේ ද ඊළඟ දිනයේදී සන්නිධිකාරයක් වෙයි. එය පරිභෝග කිරීමෙහි පචිති වේ. තමා ලත් දෙය සාමණේරයන්ට දී ඔවුන් ලැබූ දේ තබ්බවා දෙවැනි දවසෙහි වළඳින්ට වටී. විපාක දීමක් නොවේ. පාන සන්නිධියෙහිද මේ ක්‍රමයයි. එහි පානං යනු අඹපැන් ආදී අෂ්ට පානයෝය. ඒවාද ඔවුන්ට සුදුසුය. එහි විනිශ්චය සමන්තපාසාදිකාවෙහි කියන ලදී. වස්ත්‍ර සන්නිධියෙහි අධිෂ්ඨාන නොකළාහු විකල්ප සන්නිධිද වෙයි. සල්ලේඛයද (පිවිතුරු දිවිය.) බිඳෙයි. මෙය පර්යාය තුනකින් යුතු කථාවෙකි. පර්යාය වශයෙන් තුන්සිවුරින් සතුටුවිය යුතුය. සිව්වැන්නක් ලැබ අන්‍යයකුට දිය යුතුය. යම්හෙයකින් යම් කිසිවකුට දීමට නොහැක්කේද, යමකුට දෙනු කැමැත්තේ වේද, හේ උද්දේස පිණිස හෝ ප්‍රශ්න විමසීම පිණිස ගොස්ය. ආ සැණින් දිය යුතුය. නොදී සිටීම නොවටී. සිවුරු නොපොහොනා කල්හි සිහියෙන් අපේක්ෂාවෙන් අනුදත් කාලයක් තබාගැනීම වටී. ඉඳිකටු නූල් සිවුරු කරන්නන් නොලැබුණු කල්හි එයින් පසුවද විනයකර්මය කොට තබන්ට වටී. 'මෙය දිරාගිය කල්හි එයින් පසුවද විනයකර්මය කොට තබන්ට වටී. 'මෙය දිරාගිය කල නැවත මෙබන්දක් කොයින් ලබන්නදැ'යි සිතා තැබීම නොවටී. සන්නිධියද වේ. පිවිතුරු දිවියද බිඳෙයි. යාන සන්නිධිමහි යානයක් නම් වාහනයක්, රියක්, කරත්තයක්, දෝලාවක්, පල්ලැක්කියක්

යනාදිය පැවිද්දාට යාන නොවේ. පාවහන පැවිද්දාට යානයමය. එක් භික්ෂුවකට එකක් කැලයට යාමට, එකක් සේදූ පා රැක්මට යැයි උඩත් පිරිසෙයින් පාවහන් සඟල දෙකක් වටී. තෙවැන්නක් ලැබුනහොත් අනුන්ට දිය යුතුය. මෙය දිරාගිය විට අතිකක් කොයින් ලබන්නෙම්දැයි තබන්ට නොවටී. සන්නිධියද වේ. පිවිතුරු දිවියද බිඳේ. සයන සනනිධි යෙහි සයන යනු ඇඳයි. එක් භික්ෂුවකට එකක් නිදන කුටියෙහිද එකක් දවල් කල් ගෙවන තැනද යනුවෙන් උඩත් පිරිසෙයින් ඇඳන් දෙකක් වටී. ඉන් වැඩියක් ලදහොත් අන් භික්ෂුවකට හෝ භික්ෂු සමූහයකට දිය යුතුය. නොදී සිටීම නොවටී. සන්නිධියද වෙයි. පිවිතුරු දිවියද බිඳෙයි. ගන්ධසනනිධියෙහි කැසීම් සීරීම් වැනි සමේ දෝෂ ආදී ආබාධ ඇතිකල්හි ආලේප වටී. ඔහු විසින් ආලේප ගෙන්වාගෙන ඒ රෝගය සුව වූ කල්හි වෙනත් රෝග ඇත්තවුන්ට දිය යුතුය. දොරෙහි පසඟුල් දීම, ගෙය සුවඳ ගැන්වීම ආදියෙහිද ගෙන ආ යුතුය. 'නැවත ලෙඩ ඇතිවූ කල්හි වන්නේ යයි තබන්ට නොවටී. සන්නිධියද වෙයි. පිවිතුරු දිවියද බිඳෙයි. ආමිස සනනිධි යනු කියා ඉතිරිය දතයුතුය. කෙසේද යත්, 'මෙහි එක්තරා භික්ෂුවක්' එබඳු කලට උපකාර පිණිස වන්නේ යයි තල සහල් මුංඇට පරිප්පු පොල් ලුණුමාළු ගිතෙල් කුලල් බඳුන් ගෙන්වා තබයි. හේ වර්ෂා කාලයෙහි උදැසනම සාමණේරයන් ලවා කැඳ පිසවා වළඳ 'සාමණේරය, මඩවතුරෙහි ගමට පිවිසෙන්ට අපහසුය. යව, අසුවල් ගෙදරට ගොස් මා විහාරයෙහි හුන් බව දන්වව. අසවල් ගෙදරින් දීකිරි ආදිය ගෙනෙවයි යවයි. භික්ෂූන් විසින් ස්වාමීනි ගමට යමුදැයි කියන ලද කල්හිද ඇවැත්නි, දැන් ගමට පිවිසීම අපහසු යයි කියයි. 'හොඳයි ස්වාමීනි, ඔබවහන්සේ නවතින්න. අපි භික්ෂුව සොයා ගෙනඑන්නෙමුයි යති. ඉක්බිතිව සාමණේරවරු දීකිරි ආදිය ගෙනවුත් බත්ද ව්‍යඤ්ජනද පිළියෙලකොට එළවත්. එය වළඳත්දීම උපස්ථායකයෝ බත් එවත්. එයින්ද කැමති කැමති දෙයක් වළඳයි. ඉක්බිතිව භික්ෂූහුද පිණ්ඩපාතය රැගෙන එත්. එයින්ද කැමති කැමති දෙයක් උගුර තෙක් වළඳයි. මෙසේ සිව්මසම ගෙවා දමයි. මෙම භික්ෂුව මුඩු ගිහි ජීවිතයක් ගෙවයි. මහණ දිවියක් නොගෙවයි කියනු ලැබේ. මෙවැන්න ආමිස සන්නිධි නම් වේ. භික්ෂුව වසන තැන එක් සහල් නැළියක්ද, එක් සකුරු පිඩක්ද ගිතෙල් හතරෙන් එකක්ද යන මෙපමණකින් තබාගැනීම වටී. නොකල්හි පැමිණි සොරුන් සඳහාය. ඔවුහු මෙපමණක්වත් ආමිස පිළිසඳරක් නොලබන්නාහු ජීවිතයද නැති කරන්නාහුය. ඒ නිසා මෙපමණක්වත් නැත්නම් ගෙන්වා හෝ තබාගැනීම වටී. අපහසු කලට එහි යම් කැප දෙයක් ඇත්නම් තමාම

වළඳන්ට වටී. කැප කුටියෙහි බොහෝ තැබුවද සන්නිධි නම් නැත. තථාගතයන් වහන්සේට සහල් නැළි ආදියෙහි හෝ සිවුරියන් රෙදිකඩක්වත් මෙය මට අද හෝ හෙට වන්නේ යයි තැබූ දෙයක් නැතැයි පෘථග්ජනයා ගුණ කියයි.

විසූළු දැකීමෙහි **නච්චං** යනු යම්කිසි නැටුමක්. මග යන්නහු විසින්ද ගෙල දික්කොට බලන්ට නොවටී. විස්තර විනිශ්චය සමන්ත පාසාදිකාවෙහි කියූ ක්‍රමයෙන්ම දතයුතුය. මෙහි මෙසේ සියලු ශික්ෂාපද ඇතුළත් සූත්‍ර පදවල කියූයේද, මින්පසු එපමණවත් නොකියා ඒ ඒ තැන ප්‍රයෝජනවත් වූ දෙයම වර්ණනා කරන්නෙමු. **පෙක්ඛ** යනු නැටූ දර්ශනයයි. **අක්ඛාණ** යනු භාරත රාමායණ ආදිය යම්තැනෙක කියවත්ද, එහි යාම නොවටී. **පාණිස්සරං** අතින් තාල ඇල්ලීමයි. පාණිතාලයයිද කියති. **වෙතාලං** යනු ඝන තාලයයි. මන්ත්‍රයෙන් මෘත ශරීරයට ආරූඪ වීමයයි ඇතැම්හු කියති. **කුම්භථූන** යනු ස්වර සතරක් එක්වූ තාලය කුම්භ ශබ්දයයි. ඇතැම්හු කියති. **සොභනගරක** යනු නළුවන්ගේ අඩව් ඇල්ලීම. සොභනසරකං යනුවෙන්ද යෙදේ. වැටහෙන සිතැයි කියන ලද්දේ වෙයි. **චණ්ඩාල** යනු ගිනිබෝල කෙළියයි. සැඩොලුන්ගේ සණදොවුන් කෙළියැයිද කියත්. **වංසං** යනු උණගස් ඔසවා කෙළීම. **ධොපන** යනු ඇට දෙවීම ඇතැම් ජනපදවල ඥාතීන් කලුරිය කළ කල්හි නොදවත්. වළඳමා තබත්. ඉක්බිති ඒවා කුණුවූ කල් දැන ඉවතට ගෙන ඇට දොවා සුවඳ ගල්වා තබත්. ඔවුහු නැකැත්කෙළි කෙළනා කල්හි එක්තැනක ඇට තබා එක්තැනක සුරා ආදිය තබ්බා අඬ අඬා සුරා බොති. මෙයද කියන ලදී. මහණෙනි, දකුණු දනව්වෙහි ධොපන නම් දෙයක් ඇත. එහි බොහෝ ආහාරපාන බජ්ජ (කෑයුතු දේ) ලෙය්‍ය (ලෙවකෑ යුතු දේ) පෙය්‍ය (බීවයුතු දේ) ඇත. මහණෙනි, මේ ධොපනය ඇත. එය නැතැයි නොකියමි. ඇතැම්හු ඉන්ද්‍රජාලයෙන් ඇට දෙවීම යයි කියති. **හත්ථි යුද්ධාදිසු** භික්ෂුවට ඇත් ආදීන් සමග යුදකිරීමට, යුද කරවීමට යුද වදින්නවුන් දක්නට නොවටී. **නිබ්බුධං** මල්ලවපොර. **උය්‍යොධික** යනු යම්තැනෙක පහරදීම් සිදුවේද, **බලග්ග** යනු බලගණ සිටින තැන්, **සෙනාව්‍යුහං** සේනා සංවිධානය. ගැල් විනාස කිරීම් ආදී වශයෙන්. සේනා සන්නිවේශනය. **අණීක දස්සනං** ඇතුන් තිදෙන පසුපසින් ඇත් සේනාවයැයි ආදි ක්‍රමයෙන් කියන ලද සේනාව දැකීම.

ප්‍රමාදය මෙහි සිටීනුයි - පමාදට්ඨානං. ජූතංච (සූදුවද) ඒ ප්‍රමාද ස්ථානයද = ජූතපමාදට්ඨානං. අට්ඨපදං යනු එක් එක් පන්තියක පද අට බැගින් ඇත්තේනුයි = අට්ඨපදං. දස පදයෙහිද මේ ක්‍රමයමැයි. ආකාසං යනු අට පදයෙහිද දස පදයෙහිද මෙන් අහසෙහිද ක්‍රීඩා කිරීම. පරිහාරපථං යනු බිම නොයෙක් මාර්ග රවුමට තනා එහි පරිහරණය කළයුතු දේ පරිහරණය කරන්නවුන්ගේ ක්‍රීඩාව. සන්තිකං යනු සන්තික ක්‍රීඩා කිරීම. එකට තැබූ ඉත්තන් සහ ගල්කැට නොසොල්වා නියෙන්ම ඉවතට ගනිත්. නැවත ගෙන එත්. එහි කිසිවක් සෙලවුණහොත් පරාජය වෙයි. මෙබඳු ක්‍රීඩාවට මේ සමාන වචනයකි. ඛලිකං යනු සූදු ලෑල්ලෙහි පාසක ක්‍රීඩාව? ඝටිකා දික් දඬුවකින් කෙටි දඬුවකට ගැසීමෙන් කරන ක්‍රීඩාව යයි කියනු ලැබේ. සලාකහත්ථ යනු ලාරසෙහි හෝ කහ දියරෙහි හෝ පිටි දැමූ ජලයෙහි හෝ බුරුසුවක් තෙමා 'ඕනෑ දෙයක් වේවා'යි බිම හෝ බිත්තියෙහි හෝ එය ගසා ඇත්රූ අස්රූ පෙන්වන ක්‍රීඩාව. අක්ඛං යනු පන්දු ක්‍රීඩාවයි. පංගචීරං කොළවලින් තැනූ නලාව. එය පිඹිමින් ක්‍රීඩා කරති. වංක යනු ගම්දරුවන් ක්‍රීඩා කරන කුඩා නගුලයි. මොක්ඛචික යනු පෙරළෙමින් කරන ක්‍රීඩාව. අහසෙහි දඬුවක් ගෙන හිස බිම තබා උඩයට පෙරළෙමින් කරන ක්‍රීඩාවක් යයි කියනු ලැබේ. පිංගුලකං තල්පත් ආදියෙන් ඇතිකරන සුළං පහරින් පරිභ්‍රමණය වන කුඩා රෝදය, රූං පෙත්ත පත්තාළහකං කොළවලින් තැනූ නැළියෙන් වැලි ආදිය මනිමින් ක්‍රීඩා කරත් යයි කියනු ලැබේ. රථකං යනු කුඩාරිය. ධනුකං කුඩා දුන්න. අක්ඛරිකා අහසෙහි හෝ පිටෙහි අකුරු හඳුනා ගැනීමේ ක්‍රීඩාව යයි කියනු ලැබේ. මනෙසිකා යනු සිතින් සිතූ දෙය දැනගන්නා ක්‍රීඩාව යථාවජ්ජං යනු අඳ බිහිරි කොර ආදීන්ගේ යම් යම් අඩුවක් වේද ඒ ඒ අඩුව යොදාගෙන පෙන්වන ක්‍රීඩාව.

ආසන්දි යනු ප්‍රමාණය ඉක්මවා ගිය ආසනය. 'අනුයුත්තා විහරන්ති' යන මෙය අපේක්ෂාකොට සියලු පදයන්හි ද්විතීයා වචනය කරන ලදී. පල්ලංක යනු පාවල මෘග රූප තබා කළ. ගොණකො යනු දිගුලොම් ඇති මහ පලස. එහි ලොම් අඟල් සතරකටත් වැඩිය. චිත්තකා නූලින් චියමත් කළ ලොම් ඇතිරිය. පටිකා යනු ලොමින් තැනූ සුදු ඇතිරිය. පටලිකා මලින් ගහණ ලොම් ඇතිරිය. එය නොමැළවුණු රෙද්දකැයි කියනු ලැබේ. තූලිකා තුලා තුනකින් එකකින් පිරුණු තුලාව. විකතිකා සිංහ, ව්‍යාඝ්‍ර ආදී රූපයෙන් විචිත්‍ර වූ ලොම් ඇතිරිය. උද්දලොමී දෙපස වාටිය ලොමින් කළ ඇතිරිය. ඇතමෙක් දෙපස උඩට නැගුණු මල් ඇති

ඇතිරියකැයි කියති. **එකනතලොමී** යනු එක්පසෙක වාටිය ලොමින් කරන ලද ඇතිරිය. ඇතැමෙක් එක් පසෙක මල් උඩට නැගුණු ඇතිරියකැයි කියති. **කට්ඨිස්සං** යනු රනින් මැසූ රුවනින් වැඩදැමූ උඩ ඇතිරිල්ල. **කොසෙය්‍ය** යනු රනින් මැසූ කොසිය නූලින් වියූ උඩ ඇතිරිල්ල. 'සුද්ධ කොසෙය්‍ය පට වටී' යයි විනයෙහි කියන ලදී. දික්සඟි අටුවාහි 'තුලිකාව හැර සියලු ලොම් ඇවුරුම් ආදී රනින් වැඩදැමූ ඇතිරිලි නොවටී යයි කියන ලදී. **කුත්තක** යනු නාටක ස්ත්‍රීන් සොළොසකට සිට නැටීමට සුදුසු ලොමින් කළ මහපලස. **හත්ථත්ථර අස්සත්ථරානි** ඇතුන් හා අසුන් පිට එළන කුඩා පලස්. රථත්ථරෙ මේ ක්‍රමයමැයි. **අජිනප්පවෙණී** අඳුන් දිවිසමින් ඇඳක් පමණට මසා කරන ලද කෙස් රැලි. **කාදලිමිග පවර පච්චත්ථරණී** කෙහෙල්මුව සම් නමැති සමක් ඇත. එයින් කරන ලද උතුම් උඩ ඇතිරිල්ල. උතුම් උඩ ඇතිරිල්ල යන අර්ථයි. එය වනාහි සුදු රෙද්දක් මත කෙහෙල්මුව සම අතුරා මසා කරත්. **සඋත්තරච්ඡද** යනු වියන සහිත. උඩින් බඳනා ලද රත් වියන සමග යන අර්ථයි. යට අකැප උඩ ඇතිරිල්ලක් ඇතිකල්හි සුදු වියනද නොවටී. නැතිකල්හි වටී. **උභතො ලොහිත කූපධානං** යනු හිසට තබන කොට්ටයද පයට තබන කොට්ටයද යනුවෙන් ඇඳෙහි දෙපැත්තෙහි තබන රතුපාට කොට්ට. එය අකැපය. එකම කොට්ටය දෙපස රතු හෝ වෙයි. පද්ම වර්ණ හෝ සැරසිලි කරන ලද කොට්ටය ප්‍රමාණයට වේනම් වටී. මහා කොට්ටය ප්‍රතික්ෂේප කරන ලදී. රතුපාට නොවේනම් දෙකම **වටී**. ඊට වඩා ලැබුණහොත් අන්‍යයන්ට දිය යුතුය. දීමට නොහැක්කේ නම් ඇඳෙහි හරහට තබා උඩ ඇතිරිල්ලක් දමා නිදන්ටද ලබයි. ආසන්දි (දික්සඟලා පුටුව) ආදියෙහි කියන ලද පරිද්දෙන් පිළිපැදිය යුතුය. මෙය කියන ලදී. 'ආසන්දියෙන් පා කපා පරිභෝග කරන්ටද, පර්යංකයෙහි (සෝපාවෙහි) ලොම් කපා පරිභෝග කරන්නටද, තුලිකාව වෙන්කොට මේටයක් කරන්නටද, ඉතිරිය බිම් පලසක් කරන්නටද වටී.

**උච්ඡාදන** ආදියෙහි මව්කුසින් නික්මුණු දරුවන්ගේ සිරුරු ගඳ දොළොස් හැවිරිදි වයසේ ද නොනැසී පවතී. ඔවුන්ගේ සිරුරු ගඳ නැතිකිරීම පිණිස සුවඳ සුණුවලින් උලත්. මෙබඳු ඉලීම නොවටී. පින්වත් දරුවන් කලවා මත හොවා තෙල් ගල්වා අත් පා කලවා නැබ ආදීන්ගේ සටහන් සෑදීම පිණිස පිරිමදිත්. මෙබඳු **පරිමද්දනං** පිරිමැදීමක් නොවටී. **නහාපනං** යනු ඒ දරුවන්ම සුවඳ ආදියෙන් නැහැවීම. **සම්බාහනං** යනු මහා මල්ලවයන්ගේ මෙන් අත්පා මුගුරු ආදියෙන් පහරා බාහු වර්ධනය

කිරීම. ආදාසං යනු යම්කිසි මුව බලන කණ්ණාඩියක් පරිහරණය කිරීම නොවටී. අඤ්ජනං යනු අලංකාර කරන අඳුන්මය. මාලා යනු ගෙතූ මල්දමක් හෝ නොගෙතූ මල් හෝ, විලෙපනං යනු යම්කිසි සම පැහැගැන්වීමක්. මුඛ චුණ්ණකං මුඛාලෙපනං යනු මුහුණෙහි කලු කැළැල් කුරුලෑ ආදිය නැතිකිරීමට මැටි කල්ක දෙති. එයින් ලේ සෙලවුණුවිට අබ කල්කය දෙති. එයින් දොස් ඉවත්වූ විට කහ කල්කය දෙති. එයින් සමේ වර්ණය නැගුණුවිට වත්සුණුවලින් මුහුණ හැඩගන්වති. ඒ සියල්ල නොවටී. හත්ථබන්ධාදිසු අතෙහි හක්ගෙඩි, හිස්කබල් ආදිය බැඳ ඇවිදිති. එය හෝ අන් දෙයක් හෝ සියලු අත් අබරණ නොවටී. ඇතැම්හු හිසෙහි බැඳ ඇවිදිත්. රන්පටි මුතුවැල් ආදියෙන්ද එය වට කරති. ඒ සියල්ල නොවටී. සමහරු අත්දඬු හතරක්ද, තවත් විසිතුරු දඬුවක්ද ගෙන හැසිරෙත්. එසේම ස්ත්‍රීපුරුෂ ආදීන්ගේ රූපයන්ගෙන් විචිත්‍ර වූ, මැනවින් වැඩූ බෙහෙත් ගුලාවක් වම්පස එල්ලාගෙනද, සමහරු නොයෙක් රනින් වැසූ අතිශයින් තියුණු කඩු කොපුවක් වර්ණ පසක නූලින් මැසූ මෝර දත් ආදියෙන් විසිතුරු වූ කුඩයක්ද, රන් රිදී ආදියෙන් විසිතුරු වූ මොනරපිල් ආදියෙන් වැසූ පාවහන් සමහරු රියනක් පමණ දිග අඟල් හතරක් පළල කෙස් අග පිරිසිඳ දක්වා වලාකුළෙක විදුලිය මෙන් නළලෙහි නළල්පට බඳිති. චූඩාමාණික්‍යයක් දරති. වල්විදූනාවක් දරති. ඒ සියල්ල නොවටී. ස්වර්ග මෝක්ෂ මාර්ගයන්ට නොපමුණුවන බැවින් නොවටී.

තිරිසන් සතුන් පිළිබඳ කථා : තිරච්ඡාන කථා එහි රජුන් අරබයා මහා සම්මත, මන්ධාතු, ධර්මාශෝක රජවරු මහානුභාව ඇත්තෝ යයි මේ ආදි වශයෙන් පැවති කථා. රාජකථා, චොරකථා ආදියෙහිද මේ ක්‍රමයයි. ඔවුන් අතර අසුවල් රජ ලස්සනය. දර්ශනීයය ආදී ක්‍රමයෙන් ගෘහාශ්‍රිත කථා ද තිරිසන් කථා වෙයි. ඒ මහානුභාව ඇති රජද නැතිවී ගියේයැයි මෙසේ පැවති කථා කමටහන් බවෙහි සිටී. සොරුන් අතරද මූළදෙටුවා මෙසේ මහානුභාව ඇත්තෙකි. මේඝමාල මෙසේ මහානුභාව ඇත්තෙකි. යනුවෙන් ඔවුන්ගේ කර්මය උදෙසා අනේ දක්ෂයෝ යයි ගෘහාශ්‍රිත කථාද තිරිසන් කථාය. යුද්ධෙපි භාරත යුද්ධ ආදියෙහිදී අසුවලා විසින් අසුවලා මරන ලදී. මෙසේ විදිනු ලැබීයයි කාමාස්වාද වශයෙන් කරන කථා තිරිසන් කථාය. ඔවුහුත් විනාශයට ගියා නේදැයි මෙසේ පැවති කථා සියලු තැන කමටහන්ම වෙයි. තවද අනනාදිසු මෙසේ වර්ණවත්, සුගන්ධවත් රසවත් මුදුමොළොක් දෙයක් කැවෙමු. අනුභව කෙළෙමු. පරිභෝජනය කළෙමුයි කාමාස්වාද වශයෙන් කියන්ට නොවටී.

තම යහපත කොට පෙර මෙසේ වර්ණ ආදියෙන් යුත් ආහාරපාන වස්ත්‍ර සයන මල්දම් සුවඳ සිල්වතුන්ට දුනිමු. චෛත්‍යස්ථානවලට පූජා කළෙමුයි කියන්ට වටී. ඤාතිකථා ආදියෙහිද අපගේ ඥාතීහු ශූරයෝය. සමර්ථයෝ යයි හෝ පෙර අපි විසිතුරු රියවලින් හැසිරුණෙමුයි ආස්වාද වශයෙන් කියන්ට නොවටී. තම යහපත කොට ඒ අපේ ඥාතීහුද නැතිවී ගියාහු නොවෙත්දැයි කියා හෝ පෙර අපි මෙබඳු පාවහන් සංඝයාට දුන්නෙමුයි හෝ කිවයුතුයි. ගාමකථා මැනවින් පිහිටි මැනවින් නොපිහිටි සුභික්ෂ දුර්භික්ෂ ආදි වශයෙන් හෝ අසුවල් ගමැ වැසියෝ ශූරයෝය. සමර්ථයෝය කියා හෝ මෙසේ ආස්වාද වශයෙන් නොවටී. තමාට යහපත කොට ශ්‍රද්ධාවන්තයෝය. පහන්වූවෝය කියා හෝ කැලයට ගියෝය. වැයව ගියෝය යනුවෙන් කියන්ට වටී. නිගම නගර ජනපද කථාදීසු ආදියෙහිද මෙම ක්‍රමයයි. ඉත්ථිකථා ද වර්ණ සංස්ථාන ආදිය සඳහා ආස්වාද වශයෙන් නොවටී. ශ්‍රද්ධා ඇත්තෝය. පහන් වූවෝය, ක්‍ෂයට ව්‍යයට ගියෝයයි මෙසේ කියන්ට වටී. සූරකථා නන්දිමිත්‍රනම් යෝධයා ශූරයෙක් වීයයි ආස්වාද වශයෙන් නොවටී. ශ්‍රද්ධා ඇත්තෙක් විය. ක්‍ෂයට ගියේය. මෙසේ කීම වටී. විසිඛා කථා ද අසුවල් වීදිය හොඳින් පිහිටියේය. මැනවින් නොපිහිටියේය. ශූරය. සමර්ථය යයි ආස්වාද වශයෙන් නොවටී. ශ්‍රද්ධා ඇත්තෝය. පහන් වූවෝය. ක්‍ෂයට ගියෝය. මෙපමණක්ම වටී. කුම්භට්ඨාන කථා ළිඳ ළඟ කථා, දිය කළය ළඟ කථා, නාන තොටේ කථා යයිද කියනු ලැබේ. කුම්භදාසී කථා යයිද කියනු ලැබේ. එයද ප්‍රසාදය ඇති වන පරිදි නටන්ට කතා කරන්ට දක්‍ෂයයි ආස්වාද වශයෙන් නොවටී. ශ්‍රද්ධා ඇත්තේය ආදි ක්‍රමයෙන්ම වටී. පුබ්බපෙතකථා යනු අතීත ඥාති කථා එහි වර්තමාන ඥාති කථා සමානම විනිශ්චය වේ. නානත්ථකථා යනු පෙර පසු කමටහන් මිදුණු අවශේෂ වූ නානාස්වරූපයේ නිරර්ථක කථාය. ලොකක්ඛායිකා යනු මේ ලෝකය කවුරුන් විසින් නිර්මාණය කරන ලද්දේද, අසුවලා විසින් නිර්මාණය කරන ලදී. කපුටා සුදුය. ඇට සුදු බැවිනි. කොක්කු රතුය. මල් රතු බැවිනි. මේ ආදී විතණ්ඩ සල්ලාප කථා. සමුද්දක්ඛායිකා යනු මුහුද සාගරයේ වූයේ ඇයි? සාගර දෙවියා විසින් හාරන ලද බැවින් - සාගරය. මා විසින් මෙය හාරන ලද්දේ යයි හස්ත මුද්‍රාවෙන් තමා දැන්වූ බැවින් සමුද්ද නම් විය. මේ ආදී නිරර්ථක වූ සමුද්දක්ඛාන කථා නම් වේ. භවො යනු වෘද්ධියයි. අභවො යනු හානි යයි. මෙසේ භවය වෙයි. මෙසේ අභවය වෙයි යයි යම් යම් නිරර්ථක කාරණා කියා පැවැති කථා ඉති භවාභව කථාය.

විගගාහික කථා යනු ආරවුල්, මරණ ගැන කථා. එහි සහිතමෙම යනු මාගේ වචනය හිතවත්ය. සිලිටිය. ප්‍රයෝජනවත්ය. කරණු සහිතය යන අර්ථයි. අසහිතතෙත යනු ඔබගේ වචනය යහපත් නොවේ. ආචිණ්ණං තෙ විපරාවත්තං යනු යමක් ඔබට දිගුකලක් පුරුදු වශයෙන් මනාසේ ප්‍රගුණද, එය මාගේ එක වචනයකින්ම නොපිටට හැරී සිටියේය. කිසිවක් නොදත්තේය යන අර්ථයි. ආරොපිතො තෙ වාදො යනු මා විසින් ඔබට දොස් පවරන ලදී. චර වාදපපමොකඛාය යනු දොසින් මිදීම පිණිස තැන තැන ඇවිදීම තැන තැන ගොස් හික්මීම යන අර්ථයි. නිබෙබඨෙහිවා සචෙ පහොසි යනු යහපත සඳහා ප්‍රමාණවත් නම් දැන් ලිහන්න යනුයි. දූතෙය්‍ය කථාවෙහි ඉධගචඡ යනු මෙහි සිට අසුවල් තැනට යව. අමුත්‍රාගචඡ යනු එතැනින් අසුවල් තැනට එව. ඉදංහර යනු මෙය මෙතැනින් ගෙන යව. අමුත්‍රඉදමාහර අසුවල් තැනින් මෙය මෙහි ගෙන එව. කෙටියෙන් මෙය දූතෙය්‍ය නම් වේ. පංච සහධම්මිකයන්ද තෙරුවනට උපකාර යුතු වුවද හැර අනුන්ට ගෙන යන ගිහිහසුන. නොවටී.

කුහකා යන ආදියෙහි තෙවැදෑරුම් වූ කුහක කරුණින් ලොව රවටානුයි විස්ම පත් කරානුයි කුහකා. ලාභසත්කාර ලැබීමේ අටියෙන් කියතියි ලපකා. නිමිති කීමේ ස්වභාවය ඔවුන්ගේනුයි නෙමිත්තිකා. කපටි ස්වභාවය මොවුන්ගේනුයි නිපෙපසිකා. ලාභයෙන් ලාභය, අපේක්ෂා කරන්නෝය. බලන්නෝය. සොයන්නෝයැයි ලාභෙනලාභං නිජ්ගිංසිතාරො කුහණා ලපනා නෙමිත්තිකතා නිපෙපසිකතා ලාභෙන ලාභං නිජ්ගිංසනා යන මේවායින් යුක්ත පුද්ගලයන්ට සමාන වචනයකි. මේ මෙහි සංක්ෂේපයයි. විස්තර වශයෙන් මේ කුහණ ආදිය විසුද්ධි මග්ගයෙහි සීල නිද්දේසයෙහිම පාලියද අටුවාවද දක්වා ප්‍රකාශ කරන ලද්දේය.

**මෙපමණකින් මධ්‍යම ශීලය නිමියේ ය.**

මින්පසු මහා ශීලය වෙයි. අංගං යනු අත්පා ආදියෙහි යම්කිසි මෙබඳු ලක්ෂණයෙන් යුත් තැනැත්තේ දීර්ඝායුෂ ඇත්තේ වෙයි. කීර්තිමත් වන්නේ වෙයි යනාදී වශයෙන් පැවති අංග ශාස්ත්‍රය. නිමිත්තං යනු නිමිත්ත ශාස්ත්‍රය. පඩුරජ මුතුඇට තුනක් මිටෙහි තබාගෙන නිමිත්ත පාඨකයන්ගෙන් මෙසේ ඇසීය. මාගේ අතෙහි කුමක් තිබේද? ඔහු

ඔබිනොබ බැලීය. ඒ සමයෙහි හූනා විසින් මැස්සෝ අල්ලාගනු ලබතියි මුත්තා. හේ මුතුයයි කීය. කීයක්දැයි විමසන ලද්දේ කුකුළකු තෙවරක් අඬලන ශබ්දය අසා තුනක් යයි කීය. මෙසේ ඒ ඒ දෙය ආදේශ කිරීමට නිමිති කීමෙහි නියුතුව හැසිරෙති. **උප්පාදං** යනු මහත්වූ හෙණ ගැසීම් ආදිය ඇතිවීම. එය දැක මෙය වන්නේය, මෙය වන්නේයයි ආදේශ කරත්. **සුපිණකං** යනු යමෙක් පෙරයම සිහිනයක් දකී ද මේ විපාකය වෙයි. යමෙක් මෙය දකීද ඔහුට මෙය වෙතියි ආදි ක්‍රමයෙන් සිහින කීමෙහි යෙදී ජීවත් වෙති. **ලක්ඛණං** යනු මේ ලකුණින් යුතු වූයේ රජ වෙයි. මේ ලකුණින් යුතු වූයේ යුවරජ වෙයි ආදිය. **මූසිකච්ඡින්නං** යනු මීයන් විසින් කන ලද්ද. මෙයින්ද වස්ත්‍රය අළුත් වුවද පැරණි වුවද මෙතැන් පටන් මෙසේ කෑකල්හි මෙය වෙති'යි ආදේශ කරත්. **අග්ගිහොමං** මෙබඳු දැර දැමූ ගින්නෙන් මෙසේ පුදකළ කල්හි මෙය වෙතියි මෙසේ ගිනි පිදීමයි. **දබ්බිහොම** ආදියද ගිනි පිදීම්ය. මෙබඳු හැන්දකින් මෙබඳු දහයියා ආදිය පුදකළවිට මෙය වෙතියි මෙසේ ප්‍රවෘත්ති වශයෙන් වෙනම කියන ලදී. එහි **කණො** යනු වී කුඩ්ඩ. **තණ්ඩුලා** සහල් ආදීන්ටද තෘණ ආදීන්ට තණ්ඩුලයයි කියති. **සප්පි** ගව ගිතෙල් ආදිය. **තෙලං** තලතෙල් ආදිය. අබ ඇට ආදිය කටින් ගෙන ගින්නෙහි දැමීම, මන්ත්‍ර ජපකොට පිදීම හෝ **මුඛහොම** නම් දකුණු අකු ඇටයෙහි ලෙයින් පිදීම **ලොහිතහොම** නම්. **අංගවිජ්ජා** නම් පෙර අංගයම දැක ප්‍රකාශකිරීම් වශයෙන් කියන ලදී. මෙහි ඇඟිලි ඇට දැක මන්ත්‍ර ජපකොට මේ කුලපුත්‍රයා වන්නේ හෝ නොවන්නේය. ධනවත් වන්නේය **හෝ** නොවන්නේය ආදිය ප්‍රකාශ කිරීම් වශයෙන් අංග විද්‍යාව කියන ලදී. **වත්ථුවිජ්ජා** ගෙවතු අරම්වතු ආදියෙහි ගුණදොස් සලකන විද්‍යාව. මැටි ආදී දේ දැක ද මන්ත්‍ර ජපකොට පොළොව යට රියන් තිහක් පමණ යටද, අහසෙහි අසූරියනක් පමණ ප්‍රදේශයෙහිද ගුණදොස් දකිති. **ඛත්තවිජ්ජා** සිරුරට අයත් **සීවවිජ්ජා** සොහොනෙහි වැස ශාන්තිය කරන විද්‍යාව. සිගාල රුත විජ්ජා - නරිහඬ විද්‍යාව යයි ද කියනු ලැබේ. **භූතවිජ්ජා** භූත වෛද්‍ය මන්ත්‍රය. **භූරිවිජ්ජා** විශාල ගෙයක වසන්නකු විසින් උගතයුතු මන්ත්‍රය. **අහිවිජ්ජා** සර්ප දෂ්ටයට ප්‍රතිකාර කරන විද්‍යාවද, සර්පයන් ගෙන්වන විද්‍යාවද. **විසවිජ්ජා** යමකින් පැරණි විස රකීද, අලුතින් විස ඇති කෙරේද, විෂ තන්ත්‍රයට හෝ වෙයි. **විච්ඡික විජ්ජා** ගෝනුස්සන් දෂ්ට කළවිට ප්‍රතිකාර කරන විද්‍යාව. **මූසික විජ්ජා** වෙහිද මෙම ක්‍රමයයි. **සකුණ විජ්ජා** යනු පියාපත් ඇති, පියාපත් නැති දෙපා සිව්පා ආදීන්ගේ හැඬීම් යාම් වශයෙන් වූ **පක්ෂීන්** පිළිබඳ දැනුම. **වායස විජ්ජා** යනු කපුටන්ගේ හැඬීම් පිළිබඳ

දැනුම. එය වෙනම ශාස්ත්‍රයකි. ඒ නිසා වෙනම කියන ලදී. **පකඛජඣධානං** යනු මුහුකුරා ගිය සිතිවිල්ල. දැන් මොහු මෙපමණ කලක් ජීවත් වන්නේය. මොහු මෙතෙක් කලක් යැයි මෙසේ පැවති අරිට්ඨක ඥානය යන අර්ථයි. **සරපරිත්තානං** යනු ඊතලයෙන් බේරීමයි. යම්සේ තමා මතට ගොස් ද එසේ කරන විද්‍යාවයි. **මිගපකඛං** මෙය සර්ව සංග්‍රාහකය. සියලු පක්ෂීන්ගේ සිව්පාවන්ගේ හැඬීම් දැනීම වශයෙන් කියන ලදී. **මණි ලකඛණ** ආදීන්හි මෙබඳු මැණික ප්‍රශස්තය. මෙබඳු මැණික අප්‍රශස්තය. හිමියාට ආරෝග්‍යය. ඓශ්වර්යය ලැබීමට හේතුවෙයි. නොවෙයි මෙසේ වර්ණ සංස්ථාන ගුණ ආදි වශයෙන් මැණික් ආදියෙහි ලක්ෂණ අනුයුක්තව හැසිරෙත් යන අර්ථයි. එහි ආවුධ යනු අසිපත් ආදිය හැර ස්ත්‍රී පුරුෂයෝ වසත්ද, එහි වෘද්ධිය හානිය වශයෙන්ම දතයුතුය. **අජලකඛණ** ආදී තන්හි මෙබඳු එළුවන්ගේ මස් කෑ යුතුය. මෙබඳු එළුවන්ගේ මස් නොකෑ යුතුය. මෙයද විශේෂ ලෙස දතයුතුය. තවද මෙහි ගොධා **ලකඛණයෙහි** චිත්‍රකර්ම පැළඳුම් ආදියෙහි මෙබඳු ගොයකු ඇතිකල්හි මෙසේ වෙයි යනුවෙන් මෙයද විශේෂ වශයෙන් දතයුතුයි. මෙය මෙහිදී එක් කථාවකි. එක් විහාරයක සිතුවම්හි ගිනි පිඹින ගොයකු කළාහුය. එතැන් පටන් භික්ෂූන් අතර මහා විවාදයක් ඇතිවිය. එක් ආගන්තුක භික්ෂුවක් එය දැක මකා දැමීය. එතැන් පටන් විවාදය අඩුවිය. **කණණිකා ලකඛණං** කන් පළඳනාවෙහි ද ගෘහ කර්ණිකාවෙහි ද වශයෙන් දතයුතුය. **කච්ඡප ලකඛණං** යනු ගෝධා ලක්ෂණ සමානය. **මිගලකඛණං** සර්ව සංග්‍රාහක සියලු සිවුපාවුන්ගේ ලක්ෂණ වශයෙන් කියන ලදී.

**රඤඤං නියවාහං භවිසසති** යනු අසුවල් දවසෙහි අසුවල් නැකතින් රජුගේ විදේශ ගමන් ප්‍රකාශ කරයි. සියලු තැන මේ ක්‍රමයයි. හුදෙක් මෙහි **අතියානං** යනු විදේශයන්හි විසුව වුන්ගේ නැවත පැමිණීමයි. **අබභනතරානං රඤඤාහං උපයානං භවිසසති, බාහිරානං රඤඤානං අපයානං** යනු ඇතුළු නුවර අපගේ රජුට විරුද්ධය. බැහැරි රජුන්ගේ පැමිණීම වන්නේය. එයින් ඔහුගේ බැහැර යාම වන්නේ යයි මෙසේ රජු එළඹීමත් පිටවීමත් ප්‍රකාශ කරයි. දෙවැනි පදයෙහිද මේ ක්‍රමයයි. ජය පරාජය ප්‍රකටමය.

**චන‍දගහ** ආදීහු අසුවල් දවසෙහි රාහු චන්ද්‍රයා අල්ලාගනී යනුවෙන් ප්‍රකාශ කිරීම් වශයෙන් දතයුතුයි. තවද, නැකැත්කරු අඟහරු ආදී ග්‍රහයන්ගේ එක්වීමද **නකඛතතගහ** වෙයි. ආකාශයෙන් උල්කා වැටීම.

දිසාඩාහො යනු දිශාවන් අන්ධකාර වීම. අග්නිශිඛා ධූමශිඛාවන්ගෙන් ආකුලවීම මෙන්. **දෙව දුන්දුභි** යනු සුදු වලාකුළු ගර්ජනා කිරීමයි. **උග්ගමනං** යනු උදාවීමයි. **ඔගමනං** අස්තයට යාමයි. **සංකිලෙසො** යනු අපිරිසිදු බවයි. **වොදානං** පිරිසිදු බව. **එවංවිපාකො** යනු ලෝකයාට මෙබඳු සුවදුක් ගෙන දෙන්නේය. **සුබ්බුට්ඨිකා** යනු වර්ෂාව මනාසේ ධාරා වැසි වැසීමයි. **දුබ්බුට්ඨිකා** යනු අවග්‍රහයයි. වැස්ස කැඩීම යයි කියන ලද්දේ වෙයි. **මුද්දා** යනු හස්තමුද්‍රා ගණන් කිරීම යයි කියනු ලැබේ. **ගණනා** යනු නොකඩවා ගණන් කිරීම. **සංඛානං** සංකලනය රෙදි ඉපදවීම ආදි වශයෙන් පිඬු ගණනය. යමකුට එය ප්‍රගුණ වේද, ඔහු ගසක් දැක මෙහි පත්‍ර මෙපමණ ඇතැයි දනී. **කාවෙය්‍යනති, චත්තාරො මෙ භික්ඛවෙ කවි, චින්තා කවි, සුතකවි, අත්ථකවි, පටිභාණ කවි** මේ සිව් කවීන්ට තමන්ගේ සිතිවිලි වශයෙන් හෝ, වෙස්සන්තර නම් රජෙක් විය ආදිය අසා සුත වශයෙන් හෝ, මෙහි මේ ප්‍රයෝජනය වෙයි. මෙසේ එය යොදන්නෙමියි මෙසේ අර්ථ වශයෙන් හෝ කිසියම් දෙයක් ඇත. එවැන්නක් කරන්නෙමියි මෙසේ තන් වැසි වශයෙන් හෝ ජීවිකාව පිණිස කටයුතු කිරීමයි. **ලොකායතං** කියන ලද්දේමය.

ආවාහණය නම් මේ දරුවාට අසුවල් කුලයෙන් අසුවල් නැකතින් දැරියක ගෙන එවුයයි ආවාහ කිරීමයි. **විවාහණං** යනු මේ දැරිය අසුවල් දරුවාට අසුවල් නැකතින් දෙවු. මෙසේ ඔහුට දියුණුවක් වන්නේ යයි විවාහ කිරීමයි. **සංවදනං** සංවදන නම් අද නැකත හොඳය. අදම සමගි වවු. මෙසේ තොපට වෙන්වීමක් නොවන්නේ යයි මෙසේ සමගි කිරීමයි. **විවදනං** නම් ඉදින් වෙන්වනු කැමැතිනම් අදම් වෙන් වවු. මෙසේ තොපට එකතුවක් නොවන්නේය. මෙසේ වෙන් කිරීමයි. **සංකිරණං** තොප විසින් බද්දක් හෝ ණයක් වශයෙන් දුන් ධනය අද එකතුකර ගනිවු. අද එකතු කරගත් දෙය ස්ථාවර වෙයි. මෙසේ ධනය රැස්කරවා ගැනීමයි. **විකිරණං** යනු යම්හෙයකින් ආයෝජනය එකතු කරගැනීම් ආදි වශයෙන් ධනය යොදවනු කැමැත්තු නම් අද යෙදවූ ධනය දෙගුණයක් සිව්ගුණයක් වෙයි. මෙසේ ධනය යෙදවීමයි. **සුභගකරණං** ප්‍රියමනාප කිරීම සශ්‍රීක කිරීම හෝ වෙයි. **දුබ්භගකරණං** ඊට වෙනසක් කිරීම. **විරුද්ධ ගබ්භ කරණං** නොගැළපෙන විනාශවන ගර්භයක් කිරීම. නැවත විනාශ නොවීම පිණිස ඖෂධ දීම යන අර්ථයි. ගර්භය වනාහි වාතයෙන්, පණුවන්ගෙන්, කර්මයෙන් යන තෙකරුණින් විනාශ වන්නේය. එහි වාතයෙන් විනාශ වනවිට ගැඹුරට නොයන සීතල බෙහෙතක් දෙයි. පණුවන් විසින් නැසෙන

කල්හි පණුවන්ට පිළියම් කරයි. කර්මයෙන් නැසෙන ගර්භය නවත්වන්ට බුදුවරුන්ටද නොහැකිය. **ජිව්හා නිත්ථද්ධනං** යනු, මන්ත්‍රයෙන් දිව තද කිරීමයි. **හණු සංහණන** යනු කටබඳින මන්ත්‍රයෙන් හණු සෙලවීමට නොහැකි වන සේ තදකිරීමයි. **හත්ථාභිජප්පන** යනු, අත් පෙරලීම පිණිස මන්ත්‍ර ජපකිරීමයි. ඒ මන්ත්‍රයෙහි පද සතක් අතර සිට ජපකළ කල්හි ශබ්ද නොඇසෙන පිණිස මන්ත්‍ර කීමයි. ඒ මන්ත්‍රය ජපකොට අවසන්වන කල්හි යමක් කැමතිනම් එය කියයි. සතුරාට එය නොඇසේ. ඉන්පසු පිළිතුරු සපයා ගැනීමට නොහැකිය. **ආදාස පඤ්හං** මුහුණ බලන කණ්ණාඩියට දෙවියකු ආරූඪකර ප්‍රශ්න ඇසීමයි. **කුමාරිකපඤ්හං** දැරියකගේ සිරුරට දෙවියකු ආරූඪකර ප්‍රශ්න ඇසීමයි. **දෙවපඤ්හං** දේව දාසියකගේ සිරුරට දෙවියකු ආරූඪකර ප්‍රශ්න ඇසීමයි. **ආදිච්චුපට්ඨානං** ජීවිකාව පිණිස සූර්ය පූජා කිරීම. **මහතුපට්ඨා** යනු එසේම මහා බ්‍රහ්මයා පිදීම. **අබ්භුජ්ජලනං** මන්ත්‍ර බලයෙන් කටින් ගිනිදැල් පිටකිරීම. **සිරව්හායනං** එන්න ශ්‍රී කාන්තාව, මාගේ සිරසෙහි පිහිටන්න යයි මෙසේ හිසින් ශ්‍රී කාන්තාව කැඳවීම.

**සන්තිකම්මං** දේවස්ථානයට ගොස් මට මේ දේ සමෘද්ධ වේනම් ඔබට මේ මේ උපහාර කරන්නෙමියි සමෘද්ධ වූ කල්හි කළයුතු සතුටු කිරීම සඳහා බාර ඉටුකිරීමේ කාර්යය. එය සමෘද්ධ වූ කල්හි එය ඉටුකිරීම **පණිධිකම්ම** නම්. **භූරිකම්මං** මැටි ගෙයක වැස උගත් මන්ත්‍රය කීම. **වස්සකම්මං වොස්සකම්මං** යන මෙහි වස්ස යනු පුරුෂයාය. වොස්ස යනු පණ්ඩකයාය. මෙසේ පණ්ඩකයා පුරුෂයකු කිරීම වස්ස කම්ම නම්. පුරුෂයා පණ්ඩකයකු කිරීම වොස්සකම්ම නම්. එය කරන්නේ වෘෂණය ඉවත්කිරීම් තත්වයට පමුණුවයි. ලිංගය අතුරුදහන් කිරීමට නොහැකිය. **වත්ථුකම්ම** ස්වාභාවික පොළොවෙහි ගෙය පිහිටුවීමයි. **වත්ථු පරිකිරණං** යනු මේ මේ දේ ගෙන එවු යයි කියා ඒ ඒ තැන බලිකර්ම කිරීමයි. **ආචමනං** ජලයෙන් මුව පිරිසිදු කිරීම. **නහාපනං** යනු අනුන් නැහැවීම. **ජුහණං** ඔවුන් සඳහා ගිනි පිදීම. **වමනං** බෙහෙත් දී වමනය කරවීමයි. **විරේචන** යෙහිද මෙම ක්‍රමයයි. **උද්ධවිරේචණං** පැන නැගි දොස් ඉවත් කිරීමයි. **සීස විරේචණං** හිස විරේක කිරීමයි. **කණ්ණතෙලං** කන්වල වැඩීම පිණිස හෝ වණ නැතිකිරීම පිණිස බෙහෙත් තෙල් සිදීම. **නෙත්ත තප්පන** ඇස් තවන තෙල්. **නත්ථුකම්මං** තෙල් යෙදූ නශ්‍ය කිරීම. **අඤ්ජණං** පටල දෙකක් හෝ තුනක් ඉවත් කිරීමෙහි සමත් ක්ෂාර ආලේප කිරීම. **පච්චඤ්ජනං**

වැඩිය යුතු සීතල බෙහෙත් ආලේප කිරීමයි. **සාලාකියං** කටු වෙදකම. **සල්ලකත්තිය** යනු ශල්‍ය වෛද්‍ය කර්මය. **මූල භෙසජ්ජං අනුප්පදානං** මෙයින් කාය චිකිත්සාව දක්වයි. **ඔසධීනං පටිමොක්ඛො** ක්ෂාර ආදිය දී සුදුසු ක්ෂණය ඉක්මගිය කල්හි ඒවා ඉවත් කිරීමයි.

**මෙපමණකින් මහා ශීලය නිර්දේශ කරන ලදී.**

මෙසේ බ්‍රහ්මදත්ත විසින් කියන ලද ගුණයට අනුසන්ධි වශයෙන් තෙවැදෑරුම් ශීලය විස්තරකොට දැන් භික්ෂු සංඝයා විසින් කියන ලද ගුණයට අනුසන්ධි වශයෙන් **අත්ථි භික්ඛවෙ 'අඤ්ඤෙව ධම්මා ගම්භීරා දුද්දසා** යන ආදි ක්‍රමයෙන් හිස් බව ප්‍රකාශනය ඇරඹූහ. එහි **ධම්මා** යනු ගුණයෙහි, දේශනාවෙහි පර්යාප්තියෙහි, ප්‍රමාණවත් නොවන බවෙහිත් යන මේ ආදියෙහි ධම්ම ශබ්දය පවතී.

**නහි ධම්මො අධම්මොච උභොසම විපාකිනො**
**අධම්මො නිරයං නෙති ධම්මො පාපෙති සුගතිං**

දහමද අදහමද - සමවිපාක ගෙන නොදේ
අදහම නිරයට ගෙන යයි - දහම සුගතියට පමුණුවයි.

ආදී තන්හි ධම්ම ශබ්දය ගුණයෙහිය. 'මහණෙනි, තොපට ආදිකල්‍යාණ ධර්මය දේශනා කරන්නෙමි. ආදි තන්හි දේශනාවෙහිය. 'මහණෙනි, මෙහි භික්ෂුව සුත්ත ගෙය්‍ය යනුවෙන් ධර්මය ප්‍රගුණ කරයි. ආදි තන්හි පර්යාප්තියෙහිය. 'එසමයෙහි ධර්මයෝ වෙති. ස්කන්ධයෝ වෙති. ආදී තන්හි ප්‍රමාණවත් නොවන අර්ථයෙහි. මෙහි වනාහි ගුණයෙහි පවතී. ඒ නිසා 'මහණෙනි, තථාගතයන්ගේ අන්‍ය වූ ගුණ ද ඇතැ'යි මෙසේ මෙහි අර්ථය දතයුතුය. **ගම්භීරා** යනු, මහ සමුදුර මෙන් මදුරු තුඩක් වැනි ඉඳිකටුවෙකි. තථාගතයන් හැර අනුන්ගේ ඥානයෙන් ලැබිය නොහැකි ප්‍රතිෂ්ඨාවයි. ගැඹුරු බැවින්ම (බැලිය නොහැකි) **දුද්දසා**, බැලිය නොහැකි බැවින්ම **දුරනුබෝධා** (අවබෝධ කළ නොහැකිය) සියලු පරිළාහයන් නිවාදමන ලද හෙයින් ශාන්ත වේ. අතෘප්තිකර අර්ථයෙන් **පණීතා**. මිහිරි රස බොජුනක් මෙන් උත්තම වූ ඥානයට විෂය වූ බැවින් තර්කයෙන් නො විසඳිය යුතු බැවින් **අතක්කාවචරා**. **නිපුණා** මෘදු සූක්ෂම

ස්වභාව හෙයින් බාලයන්ට අවිෂය බැවින් නුවණැත්තන් විසින්ම දතයුතු බැවින් **පණ්ඩිත වෙදනීයය.** තථාගත තෙමේ තමාම දැන සාක්ෂාත්කොට යමක් කියයි යනු තථාගත තෙමේ අනන්‍ය ඥෙයාවව තමාම අති විශිෂ්ට වූ ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට යම් ධර්මයක් දන්වයිද පැහැදිලි කරයිද, කියයිද, ප්‍රකාශ කරයිද. **යෙහං** යනු යම් ගුණධර්මයන්ගෙන්. **යථා භූච්චං** යනු වූ පරිදි. **වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං** යනු තථාගතයන්ගේ ගුණ කියනු කැමැත්තෝ කියන්නෝය. නොඅඩුකොට කියන්ට හැකිවන්නාහුය යන අර්ථයි. භාග්‍යවතුන් වහන්සේ විසින් ස්තුති කරන ලද ධර්ම කවරහුද? සර්වඥතා ඥානයයි. එසේනම් කුමක් හෙයින් මහා වචන නිර්දේශයක් කරන ලද්දේ ද? මහා චිත්ත සම්ප්‍රයෝජනයක් ඇති හෙයින්ද මහා ආරම්මණ ඇති හෙයින්ද එය ඥානසම්ප්‍රයුක්ත මහා කිරිය චිත්තයන් සතරෙහි ලැබේ. එයට අරමුණු නොවන කිසිදු කරුණක් නම් නැත. යම්සේ කීය. අතීත වූ සියලු දෙය දනීනුයි සබ්බඤ්ඤුත ඤාණං. එහි ආවරණයක් නැතැයි අනාවරණ ඤාණං ආදිය. මෙසේ මහා චිත්ත සම්ප්‍රයෝගයක් ඇති බැවින් නැවත නැවත උපදීම් වශයෙන් මහා අරමුණු ඇති බැවින්ද මහා වචන නිර්දේශයක් කරන ලද්දේය. **අඤ්ඤදවා** යනු මෙය මෙහි ව්‍යවස්ථාපන වචනයි. අනිකුත් ප්‍රාණඝාතයෙන් වෙන්වීම් ආදිය ගැඹුරුද නොගැඹුරුද නොවේ. මෙසේ සියලු පදයන් සමග යෙදිය යුතුයි. ශ්‍රාවකපාරමී ඥානය ගැඹුරුය. එහි ව්‍යස්ථාපනයක් නැත. ප්‍රත්‍යෙකබුද්ධ ඥානය ඊට වඩා ගැඹුරුය. එහි ද ව්‍යවස්ථාපනයක් නැත. සර්වඥතාඥානය වනාහි ඊට වඩා ගැඹුරුය. ඊට වැඩි ගැඹුරක් ඇති අන් කිසිවක් නැත. ඒ නිසා ගම්භීරයයි පිළිගැනීමක් ලබයි. එපරිද්දෙන් දුද්දසා, දුරනුබොධා යනුවෙන් සියල්ල දතයුතුයි.

**කතමෙ ච තෙ භික්ඛවෙ** යනු මෙය ඒ ධර්මයන් කියනු කැමතිව කරන විචාරීමයි. **සන්ති භික්ඛවෙ එතෙ සමණ බ්‍රාහමණා** ආදී තන්හි ඇසූ දෙය විසඳීමයි. එසේනම් මෙසේ ආරම්භ කරන ලද්දේ කුමක් නිසාද? බුදුවරුන් ගේ සිව්තැනකට පැමිණ ගර්ජිතය මහත් වෙයි. ඥානයට අනුව පිවිසෙයි. බුද්ධ ඥානයෙහි මහත් බව පෙනේ. ත්‍රිලක්ෂණගත ශූන්‍යතා ප්‍රතිසංයුක්ත දේශනාව ගැඹුරු වෙයි. ඒ සිව්තැන් කවරේද? විනය ප්‍රඥප්ති, පෘථුවි ප්‍රදේශය, ප්‍රත්‍යයාකාරය, සමයාන්තරය කුමක් හෙයින්ද? මෙය ලඝුය. මෙය ගරුකය. මෙය ප්‍රතිකාර කළ හැකිය. මෙය ප්‍රතිකාර කළ නොහැකිය. මෙය ඇවතයි. මෙය ඇවැත් නොවේ. මෙය ඇවැත් නැති කිරීමයි. මෙය වුට්ඨානගාමිනීය. මෙය දේශනා ගාමිනීය. මෙය ලෝක

වද්‍යය, මෙය ප්‍රඥප්ති වද්‍යය, මේ කරුණෙහිදී මෙය පැනවිය යුතුය. මෙසේ බැසගත් කරුණෙහි ශික්ෂාපද පැනවීම නම්. එහි අන් අයට මෙසේ ශක්තියක් හෝ බලයක් නැත. මෙය අනුනට අවිෂයය. තථාගතයන්ටම විෂයයයි. මෙසේ විනය ප්‍රඥප්තියට පැමිණ බුදුවරුන්ගේ ගර්ජිතය මහත් වෙයි. ඤාණයට පිවිසෙයි. -පෙ- ශූන්‍යතා ප්‍රතිසංයුක්ත යනුවෙන්. එසේම මේ සතර සතිපට්ඨානයෝ නම් වෙති. -පෙ- ආර්ය අෂ්ටාංගික මාර්ගය වෙයි. පංචස්කන්ධය වෙයි. ද්වාදස ආයතන වෙයි. අටළොස් ධාතුය. චතුරාර්ය සත්‍යය, දෙවිසි ඉන්ද්‍රියය, හේතු නවයය, සතර ආහාරය, ස්පර්ශ සතය, වේදනා සතය, සඤ්ඤා සතය, චේතනා සතය, සිත් සතය, මෙයින් මෙපමණක් කාමාවචර ධර්මය, මෙපමණක් රූපාවචර අරූපාවචර තත්වයට එන ධර්මය, මෙපමණක් ලෞකිකය. මෙපමණක් ලෝකෝත්තරය යනුවෙන් සමන්ත පට්ඨානයද, අනන්ත නය ඇති අභිධර්ම පිටකයද බෙදා බෙදා කියන්ට අන්‍යයන්ට ශක්තියක් හෝ බලයක් හෝ නැත. මෙය අන්‍යයන්ට අවිෂයය. තථාගතයන්ටම විෂයය. මෙසේ භුම්‍යන්තර පරිච්ඡේදයට පැමිණ බුදුවරුන්ගේ ගර්ජිතය මහත්ය. ඤාණයට පිවිසෙයි. -පෙ- ශූන්‍යතා ප්‍රතිසංයුක්තය යනුවෙන් එසේම යමක් අවිද්‍යා සංස්කාර ආදීන්ට නව අයුරකින් ප්‍රත්‍ය වේද, උත්පාද වී ප්‍රත්‍ය වේද, පැවතී -පෙ- නිමිත්ත, ආයූහණ, සංයෝග පළිබෝධ, සමුදය, හේතු, ප්‍රත්‍ය, වී ප්‍රත්‍යවේද, එසේ සංස්කාර ආදීහු විඤ්ඤාණ ආදීන්ට ප්‍රත්‍ය වෙත්ද, කියන ලද්දේය. ප්‍රත්‍ය පරිග්‍රහයෙහි ඥානය ඤාණ වන්නේ කෙසේ ද? අවිජ්ජා සංඛාරයන්ගේ උපපාද ඨිතියද, නිමිතත ඨිතියද, හෙතුඨිතියද පචචය ඨිති ද, පළිබෝධ ඨිති ද යන මේ ආකාර නවයෙන් අවිජ්ජාව පචචයයි. සංඛාරයෝ පචචය නිසා හටගත්තෝය. මේ ධර්ම දෙකම සමුප්පනනය. ප්‍රත්‍ය පරිඥානයෙහි ඥානය ධමමටඨිති ඤාණයයි. අතීතයද කාලයකි. අනාගතයද කාලයකි. අවිජ්ජා - සංඛාරයන්ගේ -පෙ- ජාති ජරා මරණයට -පෙ- පචචයටඨිතිය. මේ නව ආකාරයෙන් ජාති පච්චය වේ. ජරාමරණ පච්චය සමුප්පන්නය. මේ ධර්ම දෙකම පච්චය සමුප්පන්නය. පච්චය පරිඥානයෙහි ප්‍රඥාව ධමමටඨිති ඤාණයයි. මෙසේ මෙය ඒ ඒ ධර්මයාගේ ඒ ඒ පච්චය බැවින් පැවති, මාර්ග තුනක්ද, සන්ධි තුනක්ද, සංඛේප හතරක්ද, විසි ආකාරද වූ පටිච්ච සමුප්පාදය බෙදා බෙදා කියන්ට අන්‍යයන්ට ශක්තියක් හෝ බලයක් හෝ නැත. අන්‍යයන්ට මෙය අවිෂයය. තථාගතයන්ටම විෂයය. මෙසේ පච්චයාකාරයට පැමිණ බුදුවරුන්ගේ ගර්ජිතය මහත් වෙයි. ඥානයට පිවිසෙයි. -පෙ- ශූන්‍යතා ප්‍රතිසංයුක්තය. එසේ ජනයෝ සතර

දෙනෙක් ශාස්වත වාද ඇත්තෝය. සතරදෙනෙක් එකච්ච ශාස්වත වාද ඇත්තෝය. සතරදෙනෙක් අන්තානන්තික වාද ඇත්තෝය. සතර දෙනෙක් අමරා වික්ෂේපික වාද ඇත්තෝය. දෙදෙනෙක් අධීත්‍ය සමුත්පන්නිකයෝය. සොළොසක් සංඥී වාද ඇත්තෝය. අටදෙනෙක් අසංඥීවාද ඇත්තෝය. අටදෙනෙක් නෙවසංඥීනාසංඥීවාද ඇත්තෝය. සත්දෙනෙක් උච්ඡේදවාද ඇත්තෝය. පස්දෙනෙක් දිට්ඨධම්ම නිබ්බාණ වාද ඇත්තෝය. ඔවුහු මේ නිසා මෙය ගන්නෝ යයි දෙසැටක් මිසදිටු ගත්තවුන් බිඳ පිරිසිඳු කොට කියන්ට අන්‍යයන්ට ශක්තියක් හෝ බලයක් නැත. එය අන්‍යයන්ට අවිෂයය. තථාගතයන්ට ම විෂයය. මෙසේ සමයාන්තරයට පත්ව බුදුවරුන්ගේ ගර්ජිතය මහත්ය. ඥානයට පිවිසෙයි. බුදුන්වහන්සේගේ මහත් බව පෙනේ. දේශනාව ගැඹුරුය. ත්‍රිලක්ෂණයෙන් ලකුණු කරන ලද්දේය. ශුන්‍යතා ප්‍රතිසංයුක්තය. මෙතැන සමයාන්තරය ලබයි. ඒ නිසා සර්වඥතා ඥානයෙහි මහත් බව දක්වනු පිණිසද දේශනාවෙහිද ශුන්‍යතා ප්‍රකාශනය පිණිසද සමයාන්තරයට පිවිසෙන්නාහු ධර්මරාජයන් වහන්සේ 'සන්ති භික්ඛවෙ එකෙ සමණ බ්‍රාහමණා' යයි මෙසේ ප්‍රශ්න විසඳීම ඇරඹූ සේක.

එහි **සන්ති** යනු ඇත. දක්නට ලැබෙත්. **භික්ඛවෙ** යනු ආලපන වචනයි. **එකෙ** ඇතැම්හු. **සමණ බ්‍රාහමණා** පරිබ්‍රාජකත්වයට ගිය බැවින් ශ්‍රමණයෝය. ජාතියෙන් බ්‍රාහ්මණයෝය. ලෝකයා විසින්ද ශ්‍රමණයෝය. බ්‍රාහ්මණයෝ යැයි මෙසේ සම්මත වූවෝය. පූර්වාන්තයට ගළපා සලකා ගනිතියි = පුබ්බන්ත කප්පිකා. එහි අන්තො යනු මේ ශබ්දය අන්තය. අභ්‍යන්තරය, මර්යාදාව, ලාමක, පසුභාගය, කොටස යන තන්හි දක්නට ලැබේ. **අන්තපූරෝ උදරපූරෝ** යනාදි තන්හි අන්ත ශබ්දය අන්තයෙහි යෙදේ. 'චරන්ති එකෙ පරිවාර ඡන්නා අන්තො අසුද්ධා බහි සොභමානා (සමහරු පිරිවරින් වැසී ඇතුළත අපිරිසිදුව පිටත බබලමින් හැසිරෙත්) ආදී තන්හි අභ්‍යන්තරයෙහි. කාය බන්ධනස්ස අන්තො ජීරති දසා හරිතන්තංවා පාථන්තංවා සෙලාන්තංවා' ආදී තන්හි මර්යාදාවයි. අන්තමිදං භික්ඛවෙ ජීවිකානං' ආදී තන්හි මර්යාදාවයි. අන්තමිදං භික්ඛවෙ ජීවිකානං' ආදී තන්හි ලාමක අර්ථයෙහි. එසෙවන්තො දුක්ඛස්ස ආදී තන්හි පසු භාගයෙහි. සියලු ප්‍රත්‍යයන්ගේ විනාශය වනාහි දුක්ඛයාගේ පසුභාගයයි. කෙළවරයි යයි කියනු ලැබේ. සක්කායො ඛො ආවුසො එකො අන්තො' ආදී තන්හි කොටසෙහි පවතී. ඒ අන්ත ශබ්දය මෙහිදීද කොටසෙහි පවතී. **කප්ප** ශබ්දයද 'තිට්ඨතු භන්තෙ භගවා කප්පං' භාග්‍යවතුන් වහන්සේ

කල්පයක් සිටිනු මැනවි. අත්‍ථිකප්පො නිපජ්ජිතං - කප්පකතෙත අකප්පකතං සංඛිබිතං හොති යනුවෙන් මෙසේ ආයුකල්ප, ලේසකල්ප, විනයකල්ප ආදී බොහෝ අර්ථයන්හි පවතී. මෙහි තෘෂ්ණා දෘෂ්ටීන්හි පවතීයයි දතයුතුයි. කියන ලද්දේ වෙයි. කප්පා යනු සූත්‍රයන්ගෙන්, තණ්හා කප්ප, දිට්ඨි කප්ප යනුවෙන් කප්ප දෙකකි. ඒ නිසා තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් අතීත කල්ප කොට්ඨාසය සිතා සලකා සිටියේනුයි පුබ්බනත කප්පිකා. මෙහි අර්ථය මෙසේ දතයුතුය. මෙසේ පූර්වාන්තය සිතා සිටි ඔවුන්ගේ නැවත නැවත ඉපදීම් වශයෙන් පූර්වාන්තය අනුව ගිය දෘෂ්ටියයි. **පුබ්බනතානු දිට්ඨී** නම්. මෙසේ දෘෂ්ටි ඇත්තහුගේ ඒ පූර්වාන්තය අරබයා පැමිණ අන් ජනයා දෘෂ්ටි ගතිකයන් කරන්නාහු නොයෙක් ආකාරයෙන් කරුණු දහඅටකින් අදහස් ප්‍රකාශ කරති. එහි **අනෙක විහිතානි** යනු අනේකවිධ. **අධිවුත්තිපදානි** අදහස් ඇති පද. නැතහොත් ඇති අර්ථය අභිබවා යථා ස්වභාවයෙන් නොගෙන පවත්නා තත්වයට වැඩිකර. අධිවුත්තියො යනු දෘෂ්ටීහු කියනු ලැබෙත්. අධිවුත්තීන්ගේ පද = අධිවුත්ති පද. කරුණු දහඅටක් සමග.

දැන් යම් කරුණු දහඅටක් සමග ප්‍රකාශ කරත්ද, ඒවා කියනු කැමති විමසීමෙන් **තෙච භොනෙතා** ආදී ක්‍රමයෙන් අසා ඒ කරුණු බෙදා දක්වන්ට **සනති භික්ඛවෙ** ආදී කීහ.

එහි එයින් කියානුයි = වාදො. දෘෂ්ටිගතයට මෙය සමාන වචනයකි. ඔවුන්ට ශාස්වත වාද ඇත්තේනුයි = **සස්සතවාදා**. ශාස්වත දෘෂ්ටි ඇත්තෝ යන අර්ථයි. මේ ක්‍රමයෙන්ම ඉන් අන්‍ය වූ මෙබඳු පදවල අර්ථය දතයුතුය. **සස්සතං අත්තානංච ලොකංච** යනු රූප ආදීන් අතර එක්තරා එකක් ආත්මයයිද ලෝකයයිද ගෙන එය ශාස්වතය. අමරය. නිත්‍යයයි ද ස්ථිරයයි ද පනවත්. යම්සේ කියන ලදද, රූපය ආත්මය වන්නා සේම ලෝකයද ශාස්වතයයි ආත්මයද ලෝකයද පනවත්. වේදනාව -පෙ- ප්‍රඥාව - සංස්කාර - විඤ්ඤාණය ආත්මය වන්නා සේම ලෝකයද ශාස්වත යයි ද ආත්මයද ලෝකයද පනවත්.

**ආතප්පමන්වාය** යන ආදී තන්හි වීර්යය කෙලෙස් තවන වශයෙන් ආතප්පං යයි කියන ලදී. එයම පදහන (උත්සාහ කිරීම්) වශයෙන් පධාන වෙයි. නැවත නැවත යෙදීම් වශයෙන් **අනුපපයොගො**. මෙසේ මේ ප්‍රභේද තුනක් ඇති වීර්යයට **අන්වාය** පැමිණ, නිසා යන අර්ථයි. **අප්පමාදො**

යනු සිහියෙන් වෙන් නොවීමයි. **සම්මා මනසිකාරෝ** උපාය සිහියේ තබාගැනීම, මාර්ගය සිහියේ තබා ගැනීම අර්ථ වශයෙන් ඥානයයි කියනු ලැබේ. යම් මනසිකාරයක සිටියහුට පූර්වේනිවාස ඥානය ඉටුවේද, මෙය මෙම ස්ථානයෙහි මනසිකාරයයි අදහස් කරන ලදී. ඒ නිසා වීර්යයටද සතියටද ඥානයටද පැමිණ යනු මෙහි සංක්ෂේපයයි. **තථාරූපං** යනු එසේ වූ. **චෙතො සමාධි** යනු චිත්ත සමාධියයි. **ඵුසති** යනු විඳගනී. ලබයි. **යථා සමාහිතෙ චිත්තෙ** යම් සමාධියකින් මැනවින් තැබූ සුප්‍රතිෂ්ඨිත සිතෙහි **අනෙක විහිතං පුබ්බනිවාසං** ආදීන්ගේ අර්ථය විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. **සො එවමාහ** යනු : මෙසේ ධ්‍යාන ආනුභාව යුතුව දෘෂ්ටිගතිකයා මෙසේ කියයි. **වඤ්ඣා** වඳ එළදෙන, වඳ තල්ගස ආදීන් මෙන් පලරහිත. කිසිවක් නූපදවන අර්ථයි. මෙයින් ආත්මයයිද ලෝකයයිද ගන්නා ලද ධ්‍යාන ආදීන්ගේ රූප ආදිය උපදවන බව ප්‍රතික්ෂේප කරයි. පර්වත කූටයක් මෙන් සිටියේ නුයි = **කූටට්ඨො. එසිකට්ඨායී ඨිතො** යනු ඉන්ද්‍රඛීලයක් මෙන් වී සිටියේනුයි = එසිකට්ඨායී ඨිතො. යම්සේ මනාසේ කණින ලද ඉන්ද්‍රඛීල ස්තම්භය නිශ්චලව සිටීද, මෙසේ සිටියේ යන අර්ථයි. දෙකින්ම ලෝකය විනාශ වන බව දැක්වෙයි. ඇතැම්හු ඉසිකට්ඨායී ඨිතො යනුවෙන් පෙළ කියා තණ පඳුරෙහි මසකු මෙන් සිටියේ යයි කියත්. එහි අදහස වන්නේ 'යමක් උපදී' යයි කියනු ලැබේද, එය තණ පඳුරින් නික්මෙන මසකු මෙන් පෙනෙමින් නික්මෙයි. යම්හෙයකින් ඉසිකට්ඨායි ඨිතො වේද ඒ නිසා **තෙච සත්තා සන්ධාවන්ති** මෙයින් අන් තැනකට යති යන අර්ථයි. **සංසරන්ති** යනු ඔබමොබ **හැසි**රෙත්. **චවන්ති** මෙසේ ප්‍රසිද්ධියට පත්. එසේ **උපපජ්ජන්ති** අටුවාවෙහි පෙර **සස්සතො අත්තා ච ලොකොච** යනුවෙන් කියා දැන් 'තෙචසත්තා සන්ධාවන්ති' යනාදී වචනයෙන් මේ දෘෂ්ටිගතිකයා තමා ම තමාගේ පාදය බිඳියි. දෘෂ්ටිගතිකයාගේ දර්ශනය නම් තිබඳ නොවේ. දහයියා ගොඩෙහි සිටවූ කණුවක් මෙන් සසලය. උන්මත්තකයාගේ පසුම්බියෙහි කැවුම් කැබලි අසූචි ගොම ආදිය මෙන් මෙහිද සුන්දර වූද අසුන්දර වූද දේ ඇත්තේමය යි කියන ලදී. **අත්ථිත්වෙව සස්සති සමං** යනු මෙහි සස්සති යනු නිතර පෙනෙන බැවින් මහපොළොව යයි හඟියි. මහමෙර චන්ද්‍ර සූර්යයෝද එසේය. ඉන්පසු ආත්මය ඒ හා සමානයයි හඟිමින් 'සස්සති සමවූ දෙයක් ඇත්තේමයැයි කියයි. දැන් 'ආත්මයද ලෝකයද ශාස්වත යයි ආදි ප්‍රතිඥාව සාධනය කරනු පිණිස හේතු දක්වන්නේ '**තං කිස්සහෙතු? අහංහි ආතප්පමන්වාය** යන ආදිය කීය. එහි **ඉමිනා මහං එවං ජානාමි** යන්නෙන් විශේෂ අධිගමයෙහි මම මෙ ප්‍රත්‍යක්ෂයෙන් දනිමි' හුදෙක්

ශ්‍රද්ධා මාත්‍රයෙන් පමණක් නො කියමි'යි පෙන්වයි. මෙහි මකාරය පද සන්ධි කිරීම සඳහා කියන ලදී. **ඉදං භික්ඛවෙ පඨමං ඨානං** යනු චතූහි චතූහි යනුවෙන් චතු ශබ්දයෙන් කියන ලද සිව්තන්හි මෙය ප්‍රථම ස්ථානයයි නොයෙක් සියදහස් ගණන් ජාතීන් සිහිකිරීම පළමු කරුණයයි යන අර්ථයි.

මත්තෙහි වාර දෙකෙහිද මේ ක්‍රමයමැයි. හුදෙක් මේ වාරය නොයෙක් සියදහස් ගණන් ජාතීන් සිහිකිරීම් වශයෙන් කියන ලදී. ඉතිරිය හාරසියයක් සංවට්ට විවට්ට කල්ප සිහිකිරීම් වශයෙන් ප්‍රඥාව අඩු වූ තීර්ථකයෝ නොයෙක් සිය දහස් ගණන් සිහි කරති. මධ්‍යම ප්‍රඥාව ඇති තීර්ථකයෝ සංවට්ට විවට්ට කල්ප දහයක් සිහි කරති. තීව්‍ර ප්‍රඥා ඇති තීර්ථකයෝ හතළිහක් සිහි කරති. එයට වැඩියෙන් නොවේ.

සිව්වැනි වර තර්ක කරානුයි = තක්කී. තර්කයක් හෝ මොහුට ඇත්තේනුයි = තක්කී. තර්කකොට, විතර්ක කොට දෘෂ්ටි යන්නට මෙය සමාන වචනයෙකි. විමසීමෙන් යුක්ත වූයේනුයි = වීමංසී. වීමංසා යනු සැසඳීම, රිසිවීම, කමා කිරීමයි. යම්සේ පුරුෂයෙක් ලී දඬුවකින් ජලය විමසා බලා එතර වේද, මෙසේම යමෙක් සසඳ, රිසිව, කමාකොට දෘෂ්ටිය ගනීද, ඔහු වීමංසී යයි දතයුතුය. **තක්ක පරියාහතං** තර්කයෙන් ගෙන්වන ලද, ඒ ඒ අයුරින් තර්කකොට යන අර්ථයි. **වීමංසානුචරිතං** ඒ කියන ලද ආකාරයෙන් හැසිරුණු. **සයං පටිභාණං** යනු තමාට වැටහෙන පමණින් හටගත්. **එවමාහ** ශාස්වත දෘෂ්ටිය ගෙන මෙසේ කියයි. එහි තර්කවාදී පුද්ගලයෝ සිව්වැදෑරුම් වෙති. අනුස්සුතික, ජාතිස්සර, ලාභී, සුද්ධතක්කික යනුවෙන් එහිදී යමෙක් වෙස්සන්තර නම් රජෙක් වී යයි අසා, එසේනම් වෙස්සන්තරම භාග්‍යවත්ය. ආත්මය ශාස්වතයයි තර්ක කරමින් දෘෂ්ටිය ගනී. මොහු අනුස්සුතික නම් වේ. උත්පත්ති දෙකක් තුනක් සිහිකොට මම පෙර අසුවල් නම් වීමි. ඒ නිසා ආත්මය ශාස්වතයයි තර්ක කරන්නේ ජාතිස්සර තර්ක කරන්නා නම් වේ. යමෙක් ලාභී බැවින්, මගේ ආත්මය දැන් සැපවත් වන්නාක් මෙන්, අතීතයෙහිද මෙසේ වීමි. අනාගතයෙහිද මෙසේ වන්නේ යයි තර්කකොට දෘෂ්ටිය ගනී. මොහු ලාභී තාර්කික නමි. 'මෙසේ ඇතිකල මෙසේ වෙයි. මෙසේ ඇතිකල මෙය නොවෙයි. තර්ක මාත්‍රයෙන්ම ගන්නේ සුද්ධ තක්කික නමි.

**එතෙසං වා අඤ්ඤතරෙන** මේ සිව් කරුණින් එක්තරා එකකින් දෙකකින් හෝ තුනකින්. **නත්ථි ඉතො බහිද්ධා** යනු 'මේ කරුණුවලින්

බැහැර අන් එක් කරුණක්වත් ශාස්වත ප්‍රඥප්තියෙහි නැත යනුවෙන් පැවැත්විය නොහැකි සිංහනාද කරයි. **තයිදං භික්ඛවෙ තථාගතො පජානාති** යනු මහණෙනි, ඒ මේ සිව් වැදෑරුම් දෘෂ්ටිගතයම තථාගතයන් වහන්සේ නොයෙක් ආකාරයෙන් දනිති. ඉන්පසු එය දන්නා ආකාරය දක්වන සේක් **ඉමෙ** දිට්ඨිට්ඨානා ආදිය කී සේක. එහි දෘෂ්ටීහුම දිට්ඨිට්ඨානා නම් වෙති. තවද දෘෂ්ටීන්ගේ කාරණයද දිට්ඨිට්ඨාන වෙයි. යම්සේ කී සේක්ද? දිට්ඨිට්ඨාන අට කවරේද? ස්කන්ධයෝද දිට්ඨිට්ඨානයකි. අවිද්‍යාවද -පෙ- ස්පර්ශය, සංඥාව, විතර්කය, අයෝනිසෝ මනසිකාරය, පාපමිත්‍රයා, පරතො ඝෝෂාවද දිට්ඨිට්ඨානයකි. ස්කන්ධ හේතු ස්කන්ධ ප්‍රත්‍යය දෘෂ්ටීන් නිසා හටගන්නා අර්ථයෙන්, ස්කන්ධද දිට්ඨිට්ඨානයකි. අවිද්‍යා හේතු -පෙ- පාපමිත්‍රයා -පෙ- පරතෝ ඝෝෂ හේතු, පරතො ඝෝෂ ප්‍රත්‍යය දෘෂ්ටීන් නිසා හටගන්නා අර්ථයෙන්, මෙසේ පරතො ඝෝෂයද දිට්ඨිට්ඨානයකි. **එවංගහිතා** යනු දෘෂ්ටි සංඛ්‍යාතයෝ නම් දිට්ඨිට්ඨානයකි. ආත්මය ශාස්වතය. ලෝකයද ශෘස්වතයයි මෙසේ ගන්නා ලද්දේ නොදෙන ලද්දේ පැවැතියේ යන අර්ථයි. **එවං පරාමට්ඨා** නිරාසංක (සැක නැති) සිත් ඇති බැවින් නැවත නැවත ස්පර්ශ කරන ලද්දේ = පරාමට්ඨා. 'මෙයම සත්‍යය, අන් සියල්ල හිස්ය.' අවසන් කරන ලද කාරණ සංඛ්‍යාත වූ දිට්ඨිට්ඨාන ගනු ලබන දෘෂ්ටීහු හට ගන්වත්ද, මෙසේ අරමුණු වශයෙන්ද පැවතීම් වශයෙන් ද සේවනය කිරීම් වශයෙන් ද ගන්නා ලදී. ආදීනව නොදක්නා බැවින් නැවත නැවත ගැනීම් වශයෙන් පරාමර්ශනය කරන ලද්දේය. **එවං ගතිකා** යනු මෙසේ නිරය, තිරිසන් යෝනිය, ප්‍රේත විෂය ගතීන් අතුරින් එකකට යන්නෝ : **එවං අභිසම්පරායො** යනු මෙය පෙර පදයටම වෙනත් වචනයකි. පරලෝක මෙබඳු යයි කියන ලද්දේ වෙයි. **තඤ්ච තථාගතො පජානාති** හුදෙක් තථාගත තෙමේ කරුණු සහිත, ගති සහිත දෘෂ්ටිගතයට පමණක් නැත්තේ නොවේ. ඒ සියල්ලම දනී. තතොච **උත්තරීතරං** ශීලයද, සමාධියද සර්වඥතා ඥානයද දනී. **තඤ්ච පොතනං නපරාවසති** යනු මෙබඳුව, අනුත්තර වූ විශේෂයක් දන්නේද මම දනිමියි තෘෂ්ණා දෘෂ්ටිමාන පරාමාස වශයෙන් ස්පර්ශ නොකරයි. **අපරාමසතො වසස පච්චත්තඤෙඤව නිබ්බුති විදිතා** යනු මෙසේ පරාමර්ශනය නොකරන්නහුට අපර ප්‍රත්‍යයෝ තමාම තමා විසින්ම ඒ පරාමාස ක්ලේශයන්ගේ නිවීම අවබෝධ කරන ලද්දාහුය. 'මහණෙනි, තථාගතයන්ගේ නිර්වාණය ප්‍රකටය'යි දක්වයි. දැන් යම් ප්‍රතිපත්තියකින් පිළිපන් තථාගතයන් විසින් යම් නිවීමක් අවබෝධ කරන ලද්දේ ද ඒ ඒ ප්‍රතිපත්තිය දක්වන්ට යම් වේදනාවන්හි ඇලුණු තීර්ථකයෝ 'මෙහි සැප

ඇත්තෝ වන්නෙමු. මෙහි සැප ඇත්තෝ වන්නෙමුයි දෘෂ්ටි ග්‍රහණයට පිවිසෙත්. ඒ වේදනාවන්ගේ වශයෙන්ම කමටහන් අසන්නේ **වෙදනානං සමුදයංච** ආදිය කීහ. එහි **යථාභූතං විදිත්වා** යනු අවිද්‍යා සමුදයෙන් වේදනා සමුදය වෙයි. තෘෂ්ණා සමුදයෙන් -පෙ- කර්ම සමුදය වෙයි. ස්පර්ශ සමුදයෙන් වේදනා සමුදය වෙයි යනුවෙන් ප්‍රත්‍ය සමුදය අර්ථයෙන් වේදනා ස්කන්ධයෙහි හටගැනීම දකී. උත්පත්ති ලක්‍ෂණය දකින්නේද වේදනා ස්කන්ධයෙහි හටගැනීම දක්නේ යයි මේ පංච ලක්‍ෂණයන්ගේ වශයෙන් වේදනාවන්ගේ සමුදය වූ පරිදි දැන, අවිද්‍යා නිරෝධයෙන් වේදනා නිරෝධය වෙයි. තෘෂ්ණා නිරෝධයෙන් -පෙ- කර්ම නිරෝධයෙන්, ස්පර්ශ නිරෝධයෙන්, වේදනා නිරෝධය වෙයි යනුවෙන් ප්‍රත්‍ය නිරෝධ අර්ථයෙන් වේදනා ස්කන්ධයෙහි ව්‍යය දකී. ලක්‍ෂණය දකින්නේ වේදනා ස්කන්ධයෙහි ව්‍යය දකී. මේ පංච ලක්‍ෂණයන්ගේ වශයෙන් වේදනාවන්ගේ අස්තංගමය වූ පරිදි දැන 'යම් වේදනාවක් නිසා සුඛ සෝමනස්ස උපදීද, මේ වේදනාවේ ආස්වාදයයි. මෙසේ **අස්සාදය** වූ පරිදි දැන, යම් වේදනාවක් අනිත්‍යය ඉක්මවීද, විපරිණාම ස්වභාවය ඇත්තේද මේ වේදනාවෙහි ආදීනවයයි. මෙසේ **ආදීනවං** වූ පරිදි දැන යම් වේදනාවෙහි ඡන්දරාග විනයක් වේද, ඡන්දරාග ප්‍රහාණයක් වේද, මෙය වේදනාවෙහි ඉවත් වීමයයි මෙසේ **නිස්සරණංච** වූ පරිදි දැන, පහ වූ ඡන්දරාග ඇති බැවින් නො ඇලෙන්නේ **අනුපාදාභික්ඛවෙ තථාගතො** යම් උපාදානයක් ඇතිකල්හි කිසිවක් අල්ලා**ගන්න**නේ ද, උපාදින්න බැවින්ම බැඳුණේ වන්නේය. එය අභාවයෙන් කිසියම් **ධ**ර්මයක් අල්ලා නොගෙනම මහණෙනි, තථාගතයන් වහන්සේ මිදුණු සේක.

**ඉමෙ බො තෙ භික්ඛවෙ** යනු මම ඔබලාගෙන් මහණෙනි, ගම්භීර ධර්ම කවරේදැ'යි ඇසීමි. මම ඔබට, එයද තථාගතයන් වහන්සේ දනිති. ඊටත් ඉහළින් දනිතියි මෙසේ නිර්දේශිත සර්වඥතා ඥාන ධර්ම ගැඹුරුය. අවබෝධ කිරීම අපහසුය. -පෙ- නුවණැත්තන් විසින් දතයුතුය යයි දතයුතුයි. තථාගතයන්ගේ ගුණ යථා රූපයෙන් කියන්ට පෘථග්ජනයෙක් හෝ සෝවාන් ආදීන් අතරින් කිසිවෙක් හෝ නොහැක්කෝය. ඉක්බිතිව තථාගතයන් වහන්සේම ගුණය යථා රූපයෙන් මනාව කියන සේකැයි මෙසේ විමසන්නා විසින්ද සර්වඥතා ඥානයම විමසන ලදුව පවරන්නාහු විසින්ද එයම පවරන ලද්දේය. අතරතුර දෘෂ්ටීහු බෙදන ලදහ.

**පළමු බණවර වැණුම නිමියේ ය.**

**එකච්චසස්සතිකා** යනු එකච්ච සස්සත වාදගත්තෝ. ඔවුහු දෙවැදෑරුම් වෙති. සත්තෙකච්චසස්සතික, සංඛාරෙකච්චසස්සතික යනුවෙන් දෙවැදෑරුම් වූවෝම මෙහි ගන්නා ලදහ.

යං යනු නිපාත මාත්‍රයකි. **කදාචිපි** යනු කිසියම් කාලයක. **කරහචි** යනු එයටම වෙනත් වචනකි. **දීඝස්ස අද්ධුනො** යනු දිගුකලක්. **අච්චයෙන** ඉක්මීමෙන්. **සංවට්ටති** විනාශ වන්නේය. **යෙභුය්‍යෙන** යනු යමෙක් උඩ බ්‍රහ්ම ලෝකවල හෝ අරූප ලෝකවල හෝ උපදින්නේ ද, ඉන් අවශේෂ වූවන් සඳහා කියන ලදී. ධ්‍යාන මනසින් උපන් බැවින් **මනොමයා** ප්‍රීතිය ඔවුන්ගේ අනුභව කරන ආහාර යනුයි = **පීතිභක්ඛා** ඔවුන්ගේ ප්‍රභාව තම තමාගේ නුයි = **සයම්පභා**. අන්තරීක්ෂයෙහි හැසිරෙත්නුයි = **අන්තලික්ඛචරා**. සුභ වූ උයන් විමන් කප්රුක් ආදීන්හි සිටිත්නුයි සුභ වූ මනරම් වත් අබරණින් යුතුව සිටිත්නුයි = **සුභට්ඨායිනො චිරං දීඝමද්ධානං** යනු උඩත් පිරිසෙයින් කල්ප අටක්. **විවට්ටති** සිටී. **සුඤ්ඤං බ්‍රහ්මවිමානං** යනු ප්‍රකෘතියෙන් උපන් සතුන් නොමැති බැවින් ශූන්‍ය වූ බ්‍රහ්මකායික භූමි උපදතියි යන අර්ථයි. එය තනන්නෙක් නැත. තනවන්නෙක්ද නැත. විශුද්ධි මාර්ගයෙහි කියූ ක්‍රමයෙන් කර්මය නිසා ඍතු හේතුවෙන් හටගත් රුවන්බිම් උපදී. ප්‍රකෘතියෙන් උපන් තැන්වලද මෙහිද උයන් කප්රුක් උපදී. ඉක්බිතිව සතුන් ප්‍රකෘතියෙන් වුසූ තැන ආශාව උපදී. ඔවුහු ප්‍රථමධ්‍යානය වඩා එතැනින් බැසගනිත්. ඒ නිසා **අථඤ්ඤතරො සත්තො** ආදිය කීහ.

**ආයුක්ඛයාවා පුඤ්ඤක්ඛයාවා** යනු යමෙක් උදාර වූ පින්කම් කොට කිසියම් අල්පායුෂ්ක දෙව්ලොවක උපදිත්ද ඔවුහු තම පින්බෙලෙන් සිටින්ට නොහැක්කෝ වෙති. ඒ දෙව්ලොව ආයුෂ ප්‍රමාණයෙන්ම චුත වෙත්නුයි ආයුක්ඛයා චවන්ති යනුවෙන් කියනු ලැබේ. යමෙක් සුළු පින්කමක් කොට දීර්ඝායුෂ්ක දෙව්ලොව උපදිත්. ඔවුහු ආයුෂ ඇතිතෙක් සිටීමට නොහැක්කෝය. අතරතුර චුත වෙත්නුයි පුඤ්ඤක්ඛයා චවන්ති යයි කියනු ලැබෙත්. **දීඝමද්ධානං තිට්ඨති** කල්පයක් හෝ එකඩ කපක් හෝ. **අනභිරති** තවත් සතකුගේ පැමිණීමේ ප්‍රාර්ථනාව, යම් කෙනෙක් පටිඝ සම්ප්‍රයුක්තව කලකිරුණාහුද ඇය බ්‍රහ්මලෝකයෙහි නැත. **පරිතස්සනා** බියවීම, පැනීම. එය ත්‍රාසයෙන් බියවීම, තෘෂ්ණාවෙන් බියවීම, දෘෂ්ටියෙන් බියවීම, ඥානයෙන් බියවීම යනුවෙන් සිව් වැදෑරුම් වේ. එහි ජාතිය නිසා භයානක වූ බය තැතිගැන්ම ලෝමහංසය. සිතින් උද්වේගය උත්‍රාසය

ඇතිවීම. ජරාව -පෙ- ව්‍යාධිය, මරණය නිසා -පෙ- උත්‍රාසයැයි මෙය ත්‍රාසයෙන් බියවීමයි. 'අන් සත්ත්වයෝද අපෙන් මේ තත්ත්වයට එත්වා' යනු තෘෂ්ණාවෙන් බියවීමයි. 'බිය වූ වේදනාවෙන් මිරිකුණු' යනු දෘෂ්ටියෙන් බියවීමයි. 'ඔවුහුද තථාගතයන් වහන්සේ ගේ ධර්මය අසා බෙහෙවින් බියට සංවේගයට සන්ත්‍රාසයට පැමිණෙත් යනු මෙය ඥානයෙන් බියවීමයි. මෙහි තණ්හා තසසනද දිට්ඨිතසසනද වටී. බ්‍රහ්මවිමානං මෙහි පළමුව උපන්නකු ඇති බැවින් ශූන්‍යයය නොකියන ලදී. **උපපජ්ජන්ති** උත්පත්ති වශයෙන් ළංවෙත්. **සහව්‍යතං** එක්වීම. **අභිභූ** අබ්බවා සිටි දෙටුවෙක් වෙමි. **අනභිභූතො** අන්‍යයන් විසින් අභිභවනය නොකරන ලද. **අඤ්ඤදත්‍ථු** ඒකාන්තභාවය හඟවන නිපාතයෙකි. දැකීම් වශයෙන් **දසො** සියල්ල බලමි යන අර්ථයි. **වසවත්ති** සියලු ජනයා වසඟයෙහි තබමි. **ඉසසරො කත්තා නිම්මාතා** යනු මම ලෝකයෙහි ප්‍රධානියාය. මම ලෝකයෙහි තනන්නාය. නිර්මාණය කරන්නාය. පොළොව හිමාලය, මහමෙර, සක්වල, මහ සමුදුර, සඳ හිරු මා විසින් නිර්මාණය කරන ලද්දේය. **සෙට්ඨො සඤ්ජිතා** මම ලෝකයට උතුම් වෙමි. ලෝකය මැව්වේ මමය. තෝ ක්‍ෂත්‍රියයෙක් වෙහි. තෝ බමුණෙක් වෙහි. පැවිද්දෙක් වෙහි. යටත්පිරිසෙයින් තෝ ඔටුවෙක් වෙහි. ගොණෙක් වෙහි' මෙසේ සතුන් බෙදන්නේ මමයයි හඟී. **වසීපිතා භූත භව්‍යානං** යනු විශේෂඥ බැවින් මම වසීනම් වෙමි. හටගත්තවුන්ට හා හටගැනීමට සිටිනවුන්ට පියා වෙමියි හඟියි. එහි අණ්ඩජ ජලාබුජ සත්ත්වයෝ අණ්ඩකෝෂය තුළද, **වස්ති** කෝෂය තුළද හටගන්නෝ වෙති. පිටතට නික්මුණු කල්හි සිට **හට**ගත්තෝ වෙති. සංසේදජයෝ ප්‍රථම චිත්තක්‍ෂණයෙහි හටගන්නෝ. දෙවැනි චිත්ත ක්‍ෂණයෙහි පටන් හටගත්තෝ නම් වෙති. ඕපපාතිකයෝ පළමු ඉරියව්වෙහි හටගත්තෝය. දෙවැනි ඉරියව්වෙහි පටන් හටගත්තෝ යයි දතයුතුය. ඒ සියල්ලෝම මාගේ පුත්‍රයෝ යැයි හැඟීමෙන් 'මම හටගත්තවුන්ගේ සහ හටගන්නවුන්ගේ පියා වෙමි'යි හඟියි. දැන් කරුණු දක්වා සාධනය කරනු කැමැත්තේ '**මයා ඉමෙ සත්තා නිම්මිතා**' යයි ප්‍රතිඥා කොට **තංකිසසහෙතු** ආදිය කීහ. **ඉත්‍ථත්තං** යනු ස්ත්‍රී භාවයයි. බ්‍රහ්මභාවය යන අර්ථයි. **ඉමිනාමයං** යනු තමාගේ කර්ම වශයෙන් චුත වූවාහුද උපන්නාහුද හුදෙක් හැඟීම් මාත්‍රයෙන්ම 'මොහු විසින් අපි මවන ලද්දෝ වෙමුයි හඟිමින් ඇද සිදුරෙහි ඇද ඇණය මෙන් නැමී ඔහුගේම පාමුලට යති. **වණ්ණවන්තතරො** ච වඩා වර්ණවත්ව, අභිරූප ප්‍රසාදජනක යන අර්ථයි. **මහෙසක්ඛතරො** ඓශ්වර්ය පරිවාර වශයෙන් වඩා කීර්තිමත්. **ඨානං ඛොපනෙතං** මෙය කරුණකි. යමෙක් එයින් චුතව අන්තැනකට නොයයිද,

මෙහිම එයිද, ඔහු සඳහා මෙය කියන ලදී. **අගාරසමා** ගෙයින්. **අනගාරියං** පැවිද්ද. පැවිද්ද වනාහි යම්හෙකින් ගෙයට හිත පිණිස වූ කෘෂි ගව රක්ෂා ආදී ක්‍රියාවක් එහි නැද්ද, ඒ නිසා අනගාරිය යයි කියනු ලැබේ. **පබ්බජති** ළඟට එළඹෙයි. **තතොපරං නානුස්සරති** ඒ පෙර විසූ නිවසින් බැහැර නොසිතයි. සිහිකරන්ට නොහැක්කේ එහි සිට දෘෂ්ටිය ගනී. නිච්චා ආදී තන්හි එහි උපත නොදක්නේ නිත්‍යයයි කියයි. මරණය නොදක්නේ තිරයයි සිතයි. සදාකල් බැවින් ශාස්වත නම්. ජරා වශයෙන්ද විපරිණාමයක් නැති බැවින් අපරිණාම ධර්මයයි කියයි. මෙහි සෙස්ස ප්‍රථම වාරයෙහි කියූ ක්‍රමයමැයි.

දෙවැනිවර විනෝදයෙන් දූෂණය වෙතියි, විනාශවෙතියි = **ඛිඩ්ඩා පදොසිකා, ඛිඩ්ඩා පදූසිකා** යනුවෙන් ද පෙළ ලියති. එය අටුවාවෙහි නැත. **අතිවෙලං** අතිකාලයක්, බොහෝ කලක් යන අර්ථයි. **හසස ඛිඩ්ඩා රතිධම්ම සමාපන්නා** හාස්‍ය රති ස්වභාවයෙහිද විනෝදරති ස්වභාවයෙහිද යුක්තව අනුයුක්තව සිටිති. ක්‍රීඩා හාස්‍ය සුඛයෙහිද කායික වාචසික ක්‍රීඩා සුඛයෙහිද අනුයුක්ත, කියන ලද පරිදි රති ස්වභාවයෙන් යුක්තවූවාහු වී වාසය කරත් යන අර්ථයි. **සති පමුස්සති** කෑයුතු දැයෙහි බියයුතු දැයෙහි සිහිය මුළාවන්නේය. ඔවුහු පුණ්‍ය විශේෂයෙන් ලද තමාගේ මහත් වූ ශ්‍රී සම්පත්තියෙන් නැකැත් කෙළි කෙළින්නාහු ඒ සම්පත් මහත් වූ බැවින් ආහාර අනුභව කෙළෙමුද, නොකෙළෙමුදැයි කියාවත් නොදනිති. ඉක්බිති එක් ආහාරයක් ඉක්මවා ගිය තැන් පටන් නිතර නිතර කමින් ම බොමින්ම චුතවන්නාහුමය. නොසිටින්නාහුය. කුමක් නිසාද යත් කර්මජ තේජෝ ධාතුවෙහි බලවත් බව නිසාය. කර්මයෙන් හටගත් කයෙහි මඳ බැවින් මනුෂ්‍යයින්ගේ කර්මජ තේජෝධාතුව මඳය. කරජකාය බලවත්ය. ඔවුන්ගේ තේජෝධාතුව මඳ බැවින්ද කරජ කායයෙහි බලවත් බැවින්ද, සත්දවසක් ඉක්මවා උණුදිය කැඳවතුර ආදියෙන් සිරුර උපස්තම්භ කිරීමට හැකිය. දෙවියන්ගේ තේජෝ ධාතුව බලවත්ය. කරජකාය මඳය. ඔවුහු එක් ආහාර වේලක් ඉක්මවාද සිටීමට නොහැක්කෝය. යම්සේ ගිම්හානයේ මද්දහනේ රත්වූ ගල මත තැබූ පියුමක් හෝ උපුලක් හෝ සවස් යාමයෙහි දියකළ සියයක් ඉස්සත් ප්‍රකෘතිමත් නොවේද විනාශ වන්නේම වේද, එසේම පසුව නිරතුරුව කෑවද බීවද චුත වන්නේමය. නොසිටියි. එහෙයින් කීහ. **සති සම්මොසා දෙවා තම්හා කායා චවන්ති** යනුවෙන්. මේ දෙවියෝ කවරහුද? 'මොවුහුමයැයි අටුවාවෙහි විවරණයක් නැත.

'දෙවියන්ගේ කර්මජ තේජෝධාතුව බලවත්ය. කරජ කායය මඳයයි විශේෂයක් නොමැතිව කියූ බැවින් යම් කබලීකාර ආහාරයෙන් ජීවත් වන්නා වූ දෙවියෝ මෙසේ කරත්. ඔවුහු මෙසේ චුතවෙති'යි දතයුතුය. සමහරු මෙසේ කීහු. නිර්මාණරතී පරනිර්මිත වසවර්තී ඒ දෙවියෝය. විනෝදයෙන් දූෂණය වන මතින්ම ඔවුහු ඛිඩ්ඩා පදොසික යයි කියන ලදහ. මෙහි සෙස්ස පෙර ක්‍රමයෙන්ම දතයුතුය.

තෙවැනිවර සිතින් දූෂණය වන්නාහුය. විනාශ වන්නාහුයයි = මනොපදොසිකා. ඔවුහු කවරහුද? චාතුර්මහා රාජිකයෝය. ඔවුන්ගෙන් එක් දේවපුත්‍රයෙක් 'නැකැත් කෙළින්නෙමියි පිරිවර සහිතව රියෙන් වීදියට පිවිසෙයි. ඉක්බිති අනෙකෙක් ද නික්මෙන්නේ ඔහු ඉදිරියෙන් යනු දැක, කිමෙක්ද පින්වත්නි, මේ දුප්පතා නොදුටුවිරූවකු මෙන් ඔහු දැක ප්‍රීතියෙන් පිම්බුණාක් මෙන් ගර්ජනය කරන්නා සේ යතියි කෝපයට පත්වෙයි. පෙරටුව යන්නාද නැවතී ඔහු කිපී ඇති බව දැක 'කිපුණවුන් හොඳින් හඳුනාගත හැකියි. ඔහුගේ කිපුණු බව දැක 'ඔබ කිපුණාට මම කුමක් කරන්නද? මේ සම්පත්තිය මා විසින් දන් සිල් නිසා ලබන ලදී. ඔබ නිසා නොවේ යයි කෝපයට පත්වෙයි. එකකු කිපුණු විට අනිකා නොකිපුණහොත් ආරක්ෂා වෙයි. දෙදෙනාම කිපුණුවිට එකකුගේ කෝපය අනිකාට හේතුවෙයි. ඔහුගේද කෝපය අනිකාට ප්‍රත්‍යවෙතියි දෙදෙනාම අන්තඃපුර වාසීන් හඬද්දී චුත වෙති. මේ මෙහි ස්වභාවයයි. සෙස්ස කියූ පරිදිම දතයුතුය.

තර්කවාදයෙහි මොහු චක්ඛු ආදියෙහි භේද රකී. සිත යම්හෙයකින් පෙර පෙර වූ දෙය පසු පසු වූ දෙයට ප්‍රත්‍යයක් දීමැ නිරුද්ධ වෙයිද ඒ නිසා චක්ඛු ආදීන්ගේ භේදයෙන් සිතෙහි බලවත්තර වූ භේදයක් නොදකී. හේ එය නොදක්නේ 'යම් සේ පක්ෂීහු එක් ගසක් අත්හැර අන් ගසක සැඟවෙත්ද, එසේම මේ ආත්ම භාවය බිඳුණු කල්හි සිත අන්තැනකට යතියි ගෙන මෙසේ කීහ. මෙහි සෙස්ස කියූ පරිදි දතයුතුය.

**අනන්තානන්තිකා** යනු අනන්තානන්තික වාද අන්තය හෝ අනන්තය හෝ අන්තානන්තය හෝ ආත්මයක් නැත නානා ආත්ම ඇත යන්න හෝ අරබයා පැවති වාදයෝය යන අර්ථයි. **අන්තසඤ්ඤී ලොකස්මිං විහරති** ප්‍රතිභාග නිමිත්ත සක්වළ කෙළවර තෙක් නොවඩා එය ලෝකයැයි ගෙන ලෝකයෙහි අන්තසංඥීව වාසය කරයි. සක්වළ කෙළවර කොට

වැඩූ කසිණය අනන්තසංඥී වෙයි. උඩටත් යටටත් නොවඩා සරසට වඩා උඩයට අන්තසංඥී වෙයි. සරස අනන්තසංඥී වෙයි.

තක්කීවාදය කියන ලද පරිදි දතයුතුය. මේ සතරද තමා විසින් දුටු විරූ අනුසරින්ම දෘෂ්ටිය ගත් බැවින් පුබ්බනතකපපිකයන් අතරට පිවිසියාහුය.

නොමැරේනුයි අමරා. ඒ කවරීද? මට මෙසේනම් අපටද මෙසේය ආදී ක්‍රමයෙන් දෘෂ්ටි ගතිකයාගේ දෘෂ්ටියද වචනද කෙළවර රහිතය. ඛෙපය (ව්‍යාකුල බව) විවිධනුයි = විකෙඛපො. අමර වූ දෘෂ්ටියෙන් හා වචනයෙන්ද හෝ වික්ෂේප වූයේනුයි = අමරා විකෙඛපො. එය මොවුන්ට ඇත්තේනුයි = අමරා විකෙඛපිකා. තවත් ක්‍රමයක් ඇත. අමරා නම් මත්ස්‍ය ජාතියක් ඇත. එම මත්ස්‍යයා ගිලීම මතුවීම් වශයෙන් ජලයෙහි දුවනවිට අල්ලාගන්ට නොහැකිය. එසේම මේ වාදයද ඔබමොබ දුවයි. ග්‍රහණයට නොපැමිණේ. අමරා විකෙඛපයයි කියනු ලැබේ. එය මොවුන්ට ඇත්තේනුයි අමරා විකෙඛපිකා.

**ඉදං කුසලනති යථාභූතං නප්පජානාති** දශකුශල කර්මපථයන් යථා පරිදි නොදනී යන අර්ථයි. **අකුසලෙ** දශඅකුශල කර්මපථද අදහස් කරන ලදී. **සො මමසස විඝාතො** මා විසින් මුසාවක් කියන ලද්දේ යයි විපිළිසර ඉපදවීම නිසා මට විනාශය වන්නේය. දුකක් වන්නේය යන අර්ථයි. **යො මමසස අනතරායො** යනු එය මාගේ ස්වර්ගයටද මාර්ගයටද අනතුරක් වන්නේය. **මුසාවාද භයා මුසාවාද පරිජෙගුචඡා** යනු මුසාවාදයෙහි භයෙන්ද ලජ්ජාවෙන්ද. **වාචාවිකෙඛපමා පජ්ජති** යනු වචනයෙන් වික්ෂේපයට පැමිණේ. කෙසේද? අමරා විකෙඛපං. කෙළවරක් නැති ව්‍යාකුලත්වය යන අර්ථයි. මට මෙසේ නොවේ. ආදී තන්හි **එවමපි මෙනො** යනු නොමෙහෙයවන ලද වික්ෂේපයයි. **තථාතිපිමෙනො** 'ආත්මයද ලෝකයද ශාස්වතයයි කියූ ශාස්වතවාදය ප්‍රතික්ෂේප කරයි. **අඤඤථාතිපි මෙනො** ශාස්වතයට වෙනස්ව කියූ එකච්ච ශාස්වතය ප්‍රතික්ෂේප කරයි. **නොතිපි මෙනො** 'තථාගත තෙමේ මරණින් මතු නොවේ යයි කියූ උච්ඡේදය ප්‍රතික්ෂේප කරයි. **නො නො තිපි මෙනො** නොවේ. නොවන්නේ නොවේ යයි කියූ තර්කවාදය ප්‍රතික්ෂේප කරයි. තමා මෙය කුසලයක්ද අකුසලයක්දැයි විමසන ලදුයේ කිසිවක් නොකියයි. මෙය කුසලයක්දැයි විමසූවිට මෙයද මට නැතැයි කියයි. ඉන්පසු කුසලය කිමැයි කීකල්හි

එහෙමත් මට නැතැයි කියයි. මේ දෙකින් වෙනත් අයුරකින්දැයි කීකල්හි අන් අයුරකින්වත් මට නොවේයයි කියයි. ඉන්පසු කිමෙක්ද ඔබගේ ලබ්ධිය නො නො දැයි කීකල්හි 'නො නො ද මට නැතැයි මෙසේ ව්‍යාකූලත්වයටම පැමිණේ. මෙසේ එක් පක්‍ෂයකවත් නොසිටී.

ඡන්දොවා රාගොවා නොදන්නේ වහා කුසලය කුසලයයිද අකුසලය අකුසලයයි ද කියා 'මා විසින් අසුවලාට මෙසේ කියන ලදී. එය හොඳ කීමක්දැයි අන් පඬුවන්ගෙන් අසා ඔවුන් විසින්, සොඳුරු මුව ඇත්තව, හොඳ කීමක්, ඔබ විසින් කුසලය කුසලයයිද, අකුසලය අකුසලයයිද කියන ලදී යයි කීකල්හි 'මා වැනි පණ්ඩිතයෙක් නැතැයි මෙසේ මට එහිදී ඡන්දයක් හෝ රාගයක් හෝ වන්නේය යන අර්ථයි. මෙහි ඡන්දය දුර්වල රාගය වේ. රාගය ප්‍රබල රාගයයි. දොසොවා පටිඝොවා යනු කුසලය අකුසලයයිද, අකුසලය කුසලයයිද කියා අන් පඬුවන්ගෙන් අසා ඔවුන් විසින් 'ඔබ විසින් නරක දෙයක් කියන ලදී යයි කියූ කල්හි 'මෙපමණක්වත් නොදනිමි. මෙහි මට දෝෂයක් හෝ පටිඝයක් හෝ යන අර්ථයි. මෙහිද දෝෂය දුර්වල ක්‍රෝධයයි. පටිඝය ප්‍රබල ක්‍රෝධයයි. තං මමස්ස උපාදානං, සො මමස්ස විඝාතො යනු ඒ ඡන්දරාග දෙක මට උපාදානයක් වන්නේය. දෝස පටිඝ දෙක විනාශයක් වන්නේය. ඒ දෙකම ග්‍රහණ වශයෙන් උපාදානයි. නසන අර්ථයෙන් විඝාතයි. රාගය වනාහි නොමිදෙනු කැමති බැවින් අරමුණු ගනී. කුඩැල්ලන් මෙන් දෝසය විනාශ කරනු කැමැත්ත නිසා සර්පයකු වැන්න. මේ දෙකම කවන අර්ථයෙන් නසත්මය. උපාදානයයිද විඝාතයයිද කියන ලදී. සෙස්ස පළමුවර හා සමානය.

මන්දො යනු මඳ වූ ප්‍රඥා ඇත්තේ. මෝඩයාට නමකි. මොමූහො යනු අතිශයින් මුළාවූයේ. හොති තථාගතො යන ආදී තන්හි සත්ත්වයා තථාගතයයි අදහස් කරන ලදී. මෙහි ඉතිරිය නොගැඹුරුය. මේ සතරදෙනාද පෙර පැවති ස්වභාවානුරූපව දෘෂ්ටියෙන් ගන්නා ලද බැවින් පූර්වාන්ත කල්පිතයන් අතරට පිවිසියාහුය.

අධිච්ච සමුප්පන්නා - ආත්මයද ලෝකයද අධීත්‍ය සමුත්පන්නයයි දර්ශනය නිසා හටගත්තකි. එය මොවුන්ට ඇත්තේනුයි - අධිච්ච සමුප්පන්නිකා. අධිච්ච සමුප්පන්නං යනු කරුණක් නැතිව හටගත්.

**අසඤ්ඤසත්තා** යනු දේශනා ශීර්ෂයයි. අචිත්ත රූප උත්පාද මාත්‍ර ආත්මභාව ඇත්තේ යන අර්ථයි. මෙසේ ඔවුන්ගේ උත්පත්තිය දතයුතුය. සමහරු තීර්ථායතනයෙහි පැවිදිව වායෝ කසිණයෙහි පිරියම්කොට චතුර්ථධ්‍යානය උපදවා ධ්‍යානයෙන් නැගී සිතෙහි දොස් දකී. සිත ඇතිකල්හි අත්සිඳීම් ආදී දුකද සියලු බියද වෙයි. මේ සිතින් කම් නැත. අචිත්තක (සිත් නැති) අත් බවම ශාන්ත යැයි මෙසේ සිතෙහි දොස් දැක නොපිරිහුණු ධ්‍යාන ඇත්තේ කලුරියකොට අසංඥතලයන්හි උපදී. ඔහුගේ සිත චුතිචිත්ත නිරෝධයෙන් මෙහිම නවතී. රූපස්කන්ධය පමණක් එහි පහළවෙයි. ඔවුහු එහි දුනුදියෙහි වේගයෙන් යවන ලද ඊතලය දුනුදියෙහි වේගය ඇතිතාක් අහසෙහි යන්නේද, එසේම ධ්‍යානවේගයෙන් යවන ලද්දාහු යයිද ධ්‍යානවේගය පවතිනතාක් කල් සිටිත්. ධ්‍යානවේගය පිරිහුණු කල එහිදී රූපස්කන්ධය අතුරුදහන් වෙයි. මෙහි ප්‍රතිසන්ධි සංඥාව උපදී. යම්හෙයකින් ඒ මෙහි උපන් සංඥාවෙන් ඔවුන්ගේ එහි චුතිය පැනේද ඒ නිසා **සඤ්ඤුප්පාදා ච පන තෙ දෙවා තම්හා කායා චවන්ති** යනුවෙන් කියන ලදී. මෙහි ඉතිරිය නොගැඹුරු අරුත් ඇත්තේය. තර්කීවාදයද කියූ පරිදිම දතයුතුය.

මෙසේ දහඅටක් පූර්වාන්ත කල්පිකයන් දක්වා දැන් සතළිස් සතරක් අපරාන්ත කල්පිකයන් දක්වන්ට **සන්ති භික්ඛවෙ** ආදිය කීහ. එහි අනාගත කොටස සංඛ්‍යාත වූ අපරාන්තය සිතා ගනිත්තුයි **අපරන්ත කප්පිකා.** අපරන්ත කල්පයක් මොවුනට ඇත්තේනුයි හෝ **අපරන්ත කප්පිකා.** මෙසේ ඉතිරියද පෙර කියූ පරිදිම දතයුතුය. **උද්ධමාඝතනිකා** යනු ආඝාතය යනු මරණයයි. තමන් උද්ධමාඝාතනා යයි කියතියි උද්ධමාඝාතනිකා. සංඥැසී පැවති වාදය සඤ්ඤීවාදයයි. එය ඔවුනට ඇත්තේනුයි **සඤ්ඤීවාදා රූපී අත්තා** යන ආදී තන්හි කසිණ රූපය ආත්මයැයි එහි පැවති සඤ්ඤාවද සඤ්ඤායයි ගෙන හෝ ආජීවික ආදීන් මෙන් තර්ක මාත්‍රයෙන් හෝ.

**රූපී අත්තාහොති අරොගො පරම්මරණා සඤ්ඤීති තං පඤ්ඤාපෙන්ති** එහි අරොගො යනු නිත්‍ය වූ. අරූප සමාපත්ති නිමිත්ත ආත්මයැයි, සමාපත්ති සඤ්ඤාව සඤ්ඤායයි ගෙන හෝ නිගණ්ඨාදීන් මෙන් තර්කමාත්‍රයෙන් හෝ **අරූපී අත්තා සඤ්ඤීති තං පඤ්ඤාපෙන්ති.** අරූපී ආත්මය සඤ්ඤී යැයි පනවත්.

තෙවැන්න මිශ්‍රකග්‍රාහ වශයෙන් පැවති දෘෂ්ටියයි.

සිව්වැන්න තර්කග්‍රාහයෙන්මැයි.

දෙවැනි චතුෂ්කය අන්තානන්තික වාදයෙහි කියූ පරිදි දතයුතුය.

තුන්වැනි චතුෂ්කයෙහි සමවැදුණු වශයෙන් **එකත්ත සඤ්ඤී**. සමනොවැදුණු අර්ථයෙන් **නානත්ත සඤ්ඤී**. කුඩා කසිණ වශයෙන් **පරිත්ත සඤ්ඤී** මහා කසිණ වශයෙන් **අප්පමාණ සඤ්ඤී** යයි දතයුතුය. සිව්වැනි චතුෂ්කයෙහි දිවැසින් තික චතුෂ්ක ධ්‍යාන භූමියෙහි උපදිනු දැක **එකන්ත සුඛී** යයි ගනී. නිරයෙහි උපදිනු දැක **එකන්ත දුක්ඛී** යයි ද, මිනිසුන් අතර උපදිනු දැක **සුඛ දුක්ඛී** යයිද, වෙහප්ඵලයන්හි උපදිනු දැක **අදුක්ඛමසුඛී** යයි ගනී. විශේෂ වශයෙන් පූබ්බේනිවාසානුස්සති ලාභීහු පුබ්බන්ත කප්පිකයෝ වෙති. දිවැස් ඇත්තෝ අපරන්තකප්පිකයෝ ය.

අසඤ්ඤීවාදො සඤ්ඤීවාදයෙහි කියූ චතුෂ්ක දෙකෙහි අයුරින් දතයුතුය.

**නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදො** ද එසේය. හුදෙක් එහි 'සංඥී ආත්මයයි ගත්තවුන්ට ඒ දෘෂ්ටීහු මෙහි **අසඤ්ඤී** කියාද, **නෙවසඤ්ඤී නාසඤ්ඤී** කියාද, එහි ඒකාන්ත වශයෙන් කරුණක් නොසෙවිය යුතුය. දෘෂ්ටිගතිකයාගේ ග්‍රාහය උන්මත්තකයාගේ පසුම්බිය මෙනැයි මෙය කියන ලදී.

උච්ඡේදවාදයෙහි **සතො** යනු විද්‍යමාන වන දෙයෙහි. **උච්ඡෙද** යනු උපච්ඡෙදයයි. **විනාසං** යනු නොදැක්මයි. **විභවං** යනු භවයෙන් ඉවත්වීමයි. මේ සියල්ල අන්‍යොන්‍යව සමාන වචනයෝය. එහි ලාභී සහ අලාභී යන දෙදෙන උච්ඡේද දෘෂ්ටිය ගනිති. ලාභියා රහත්බවෙහි දිවැසින් චුතිය දැක උත්පත්තිය නොදක්නේ, යමෙක් චුතිමාත්‍රයම දකින්ට හැක්කේද උත්පත්තිය නොවේද, ඔහු උච්ඡේද දෘෂ්ටිය ගනී. අලාභියාද 'පරලොව කවරෙක් දනීදැයි කම්සුවෙහි ගිජු බැවින්' යම්සේ වැටුණු රුක් කොළ නැවත නොවැඩේද, සත්ත්වයෝද එසේයයි ආදී වශයෙන් තර්කයෙන් හෝ උච්ඡේදය ගනී. මෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් එහෙමද මෙහෙමදැයි කල්පනාකොට මේ සප්ත දෘෂ්ටීහු උපන්නෝ යයි දතයුතුය

එහි **රූපී** යනු රූප ඇත්තේ. **චතුම්මහාභූතිකො** යනු සතර මහාභූතයන්ගෙන් සැදුණු. මවුපියන්ගේ මෙය යැයි මාතාපෙත්තිකං. ඒ කුමක්ද? ශුක්‍ර ශ්‍රෝණිත. මව්පියන්ට උපන්නේ - **මාතාපෙත්තික සම්භවො** මෙසේ රූපකාය ශීර්ෂයෙන් මනුෂ්‍යාත්මභාවය **අත්තා** (ආත්ම) යැයි කියයි. **ඉත්ථෙකෙ** යනු ඇතැමෙක් මෙසේය යන අර්ථයි. දෙවැන්නා එය ප්‍රතික්ෂේප කොට දිව්‍යාත්මභාවය කියයි. **දිබ්බො** යනු දෙව්ලොව හටගත්. **කාමාවචරො** කාමාවචර ලෝක සයට පැමිණියේ. කබලිංකාර (පිඬු) භක්ෂණය කරතියි - **කබලිංකාර භක්ඛො.**

**මනොමයො** යනු ධ්‍යාන මනසින් උපන්. **සබ්බංගපච්චංගී** යනු සියලු අඟපසඟින් යුත්. **අහිනින්ද්‍රියො** යනු පිරිපුන් ඉඳුරෝ. යමක් බ්‍රහ්ම ලෝකයෙහි ඇත්ද, ඔවුන්ගේ වශයෙන් අන්‍යයන්ගේද සලකුණු වශයෙන් මෙය කියන ලදී.

**සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා** - මේ ආදියෙහි අර්ථය විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. **ආකාසානඤ්චායතනූපගො** යන ආදී තන්හි ආකාසානඤ්චායතන බවට පැමිණි යයි මෙම අර්ථය දතයුතුය. මෙහි සෙස්ස නොගැඹුරුය.

**දිට්ඨධම්ම නිබ්බාණ** වාදයෙහි දිට්ඨධම්ම යනු ප්‍රත්‍යක්ෂධර්ම යයි කියනු ලැබේ. ඒ ඒ තැන ලැබුණු ආත්ම භාවයට සමාන වචනයකි. දිට්ඨ ධර්මයෙහි නිබ්බාණය - දිට්ඨ ධම්ම නිබ්බාණයයි. මේ ආත්මභාවයෙහිම දුක් ව්‍යපසමනය යන අර්ථයි. එය කියත්නුයි = දිට්ඨ ධම්ම නිබ්බාණ වාදා. **පරම දිට්ඨධම්ම නිබ්බාණං** යනු උතුම් වූ දිට්ඨධම්ම නිබ්බාණයයි. උත්තම යන අර්ථයි.

**පඤ්චහි කාම ගුණෙහි** යනු මනාප වූ රූප ආදී පංචකාම කොටස්වලින් හෝ බන්ධනවලින් හෝ. **සමාපිතො** මනාසේ අර්පණය කරන ලද්දේ ඇලුණේ වී **සමංගිභූතො** යුක්ත වූයේ. **පරිචාරෙති** යනු ඒ කාම ගුණයන්හි සැපසේ හසුරුවයි. ඇවිදුවයි. ඔබමොබ පමුණුවයි. නැතහොත් නැලවෙයි. ඇලෙයි. සෙල්ලම් කරයි. එහි දෙවැදෑරුම් කාමගුණයෝ මානුෂිකද දිව්‍යද වෙත්. මානුසක කාමගුණ මන්ධාතු රජුගේ කාමගුණ සමානයයි දතයුතුයි. දිව්‍ය කාමගුණ පරනිම්මිත වසවත්ති

දෙව්රජුගේ කාමගුණ සමානය. මෙබඳු කාමයන්ට පැමිණියවුන්ට ඔවුහු දිට්ඨධම්ම නිර්වාණයට පැමිණීම පනවත්.

දෙවැනි වාදයෙහි සිදුවී නැතිවන අර්ථයෙන් **අනිච්චා** නැවත පෙළන බැවින් **දුක්ඛා**. ප්‍රකෘතිය අත්හරින බැවින් **විපරිණාම ධම්මා** යයි දතයුතුය. **තෙසං විපරිණාමඤ්ඤථාභාවා** යනු ඒ කාමයන්ගේ විපරිණාම සංඛ්‍යාත වෙනස් බවට පැමිණීම. යමක් මට තිබුණේද එයද මට නැතැ'යි කියූ පරිදි. **උපපජ්ජන්ති සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා** යනු එහි ඇතුළත දැවෙන ලක්‍ෂණය ශෝකයයි. ඒ ආශ්‍රිතව දොඩවන ලක්‍ෂණය පරිදේව නම්. සිරුර නැවත පෙළන ලක්‍ෂණය දුකයි. මනස ව්‍යාකුල කරන ලක්‍ෂණය දෝමනස්සයි. විෂාද ලක්‍ෂණය උපායාසයි. **විවිච්චෙව** කාමෙහි ආදීන්ගේ අර්ථය විශුද්ධි මාර්ගයෙහි කියන ලදී.

**විතක්කිතං** ආරෝපණ වශයෙන් පැවති විතර්කය. **විචාරිතං** මර්දනය කිරීම් වශයෙන් පැවති විචාරය. **එතෙනෙතං** යනු මේ විතර්කයෙන්, මර්දනයෙන් ද මේ ප්‍රථමධ්‍යානය **ඕළාරිකං** කටුවක් ඇතිකල්හි මෙන් තැවෙයි. **පීතිගතං** යනු ප්‍රීතියයි. **චෙතසො උබ්බිල්ලාවිතත්තං** යනු සිතෙහි ප්‍රමෝදය ඇතිකරන.

**චෙතසො ආභොගො** යනු ධ්‍යානයෙන් නැගිට එම සැපයෙහි නැවත නැවත සිත වෙළාගැනීම, මනසිකාරය. එක්තැන් කිරීම මෙහි ඉතිරිය දිට්ඨධම්ම නිබ්බාණවාදයෙහි මෙන් නොගැඹුරු අර්ථ ඇත්තේය.

මෙපමණකින් සියලු දෙසැට මිසදිටු කියන ලද්දේ වෙයි. ඔවුන්ගෙන් සතක් උච්ඡේද දෘෂ්ටීහුය. සෙස්ස ශාස්වත දෘෂ්ටීහුය.

දැන් **ඉමෙ ඛො තෙ භික්ඛවෙ** යනු මේ වාරයෙන් ඒ සියලු අපරන්ත කප්පිකයන් එක්තැනකට පමුණුවා සර්වඥතාඥානය විසඳන සේක. නැවත **ඉමෙ ඛො තෙ භික්ඛවෙ** ආදී වශයෙන් වාරයෙන් ඒ සියලු පුබ්බන්ත අපරන්ත කප්පිකයන් පමුණුවා එම ඥානයම විසඳන සේක. මෙසේ **කතමෙචතෙ භික්ඛවෙ ධම්මා** යන ආදියෙහි විමසනු ලබන්නේ සර්වඥතා ඥානයම අසා විසඳනු ලබන්නේද සතුන්ගේ අදහස් තුලාවෙන් කිරන්නාක් මෙන් මහමෙර පතුලෙන් වැලි මතු කරන්නාක් මෙන් දෙසැටක් මිසදිටු

උඩට ගෙන සර්වඥතා ඥානයම විසඳූ සේක. මෙසේ මෙය යථානුසන්ධි පළමු දේශනාවේ හා පසුව කළ දේශනාවේ යන දෙකෙහි කාරණා ගැලපීම අනුව දේශනාවෙහි ආයේය.

අනුසන්ධි තුනෙකි. පුච්ඡානුසන්ධි, අජ්ඣාසානුසන්ධි, යථානුසන්ධි යනුවෙන්. එහි මෙසේ කීකල්හි නන්ද ගෝපාලයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. ස්වාමීනි, මෙතෙර යනු කුමක්ද? එතෙර කුමක්ද? මැද කවරෙක් ගිලී සිටීද? ගොඩබිම කුමක් පාවේද? මනුෂ්‍යභාගය කුමක්ද? අමනුෂ්‍යභාගය කුමක්ද? ආවර්තභාගය කුමක්ද? ඇතුළත කුණු බව කුමක්දැ'යි මෙසේ විමසන්නවුන්ට භාග්‍යවතුන් වහන්සේ විසින් විසඳන ලද සූත්‍ර වශයෙන් පුච්ඡානුසන්ධිය දතයුතුය.

ඉක්බිති එක්තරා භික්ෂුවකගේ සිතෙහි මෙබඳු විතර්කයක් පහළවිය. පින්වත, මෙසේ රූපය අනාත්මය. වේදනා-සංඥා-සංඛාර-විඤ්ඤාණ අනාත්මය. කර්මයෝ අනාත්මයෙන් කරන ලද්දෝය. මොවුන්ගෙන් කවරක් ආත්මය ස්පර්ශ කරන්නේද? ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුවගේ සිතෙහි විතර්කය දැන භික්ෂූන් ආමන්ත්‍රණය කළ සේක. මහණෙනි, ඔබ කුමක් සිතන්නහුද? මෙහි එක් හිස් පුරුෂයෙක් නොදැන අවිද්‍යාවට පැමිණියේ තෘෂ්ණාධිපති සිතින් ශාස්තෘ ශාසනය ඉක්මවා යා යුතුයයි සිතන්නේය. මෙසේ පින්වත්නි, රූපය අනාත්මය. -පෙ- ස්පර්ශ කරන්නේද? මහණෙනි, ඔබ කුමක් සිතන්නාහුද? රූපය නිත්‍යද? අනිත්‍යද? මෙසේ අන්‍යයන්ගේ අදහස දැන භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද සූත්‍ර වශයෙන් අජ්ඣාසායානුසන්ධිය දතයුතුය.

යම් ධර්මයකින් ආදියෙහි දේශනාව පැන නැගුණේද, ඒ ධර්මයට අනුරූප ධර්ම වශයෙන් හෝ ප්‍රතිපක්ෂ ධර්ම වශයෙන් හෝ යම් සූත්‍රයන්හි මත්තෙහි දේශනාවක් පැමිණේද, ඔවුන්ගේ වශයෙන් අනුසන්ධිය අනුව දතයුතුය. ඒ කෙසේද යත්, ආකංඛෙය්‍ය සූත්‍රයෙහි යට සීලයෙන් දේශනාව පැන නැගිණ. මත්තෙහි අභිඥාසය පැමිණියේය. වත්‍ථ සූත්‍රයෙහි යට ක්ලේශයෙන් දේශනාව පැන නැගිණ. මත්තෙහි බ්‍රහ්මවිහාර ආයේය. කොසම්බක සූත්‍රයෙහි යට කලහයෙන් පැන නැගිණ. මත්තෙහි සාරාණීය ධර්ම ආයේය. කකචූපම සූත්‍රයෙහි යට නොඉවසීමෙන් පැන නැගිණ. මත්තෙහි කකචූපමය (කතුරෙහි උපමාව) ආයේය. මේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි යට දෘෂ්ටි වශයෙන් දේශනාව පැන නැගිණ. මත්තෙහි ශූන්‍යතා ප්‍රකාශනය

පැමිණියේය. එහෙයින් කියන ලදී. මෙසේ මෙය අනුසන්ධි පිළිවෙළ වශයෙන් දේශනාව පැමිණියේය.

දැන් සීමා විභාග දක්වනු පිණිස **තත්‍ර භික්ඛවෙ** ආදිකොට දේශනාව අරඹන ලදී. **තදපි තෙසං භවතං සමණබ්‍රාහමණානං අජානතං අපස්සතං වෙදයිතං තණ්හාගතානං පරිතසිත විප්ඵන්දිත මෙව** යනු යම් දෘෂ්ටි ආස්වාදයකින් දෘෂ්ටි සැපයකින් දෘෂ්ටි වෙදයිතයකින් යමෙක් සොම්නස් ඇත්තාහු ආත්මයද ලෝකයද ශාස්වතයයි කරුණු හතරකින් පනවත්ද, එයද ඒ පින්වත් වූ යථා පරිදි ධර්මයන්ගේ ස්වභාවය නොදන්නා වූ නොබලන්නා වූ වේදයිතයට තෘෂ්ණාවෙන් පැමිණියා වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට හුදෙක් එහ වේදයිතයක් වන්නේ තෘෂ්ණාවෙන් පැමිණියවුන්ට පමණි. එයද බියට පත්ව අසහනයට පත්වීමක්මය. දෘෂ්ටි සංඛ්‍යාතයෙන්, තෘෂ්ණා සංඛ්‍යාතයෙන් බියට පත්ව අසහනයට පත්වීමකි. සැලීමක්මය. කම්පනයක්මය. දහයියා ගොඩක සිටවූ කණුවක් මෙන්. සෝවාන් පුද්ගලයාගේ දර්ශනය මෙන් නිශ්චලයයි දක්වයි. එකච්ච සස්සත ආදියෙහිද මේ ක්‍රමයයි.

නැවත **තත්‍ර භික්ඛවෙ යෙතෙ සමණ බ්‍රාහ්මණා සස්සතවාදා** යනු ආදියෙහි පරප්‍රත්‍යය දැකීම පිණිස අරඹන ලදී. එහි **තදපි ඵස්ස පච්චයා** යනු යම් දෘෂ්ටි ආස්වාදයකින් දෘෂ්ටි සැපයකින් දෘෂ්ටි වේදයිතයකින් සොම්නසට පත් ඔවුහු ආත්මයද ලෝකයද කරුණු සතරකින් ශාස්වත යයි පනවත්. එයද තෘෂ්ණා දෘෂ්ටියෙන් පැනනැගුණු වේදයිතය ස්පර්ශ ප්‍රත්‍යයෙන් යයි දක්වයි. සියලු තැන මේ ක්‍රමයයි.

දැන් ඒ ස්පර්ශ ප්‍රත්‍යයෙහි දෘෂ්ටි වේදයිතයෙහි බලවත් බව දක්වනු පිණිස නැවත **තත්‍ර භික්ඛවෙ යෙතෙ සමණබ්‍රාහමණා** යනු ඒ මහණ බමුණෝ ඒ වේදයිතයෙන් වෙන්ව ස්පර්ශයෙන් **පටිසංවෙදිස්සන්ති** දැනගන්නාහුය යන කරුණක් නැත. යම් සේ කඩාවැටෙන ගෙයට උපස්තම්භ පිණිස කණුව නම් බලවත් ප්‍රත්‍යයක් වේද, එය කණුවෙන් උපස්තම්භිත නොවී සිටින්නට නොහැකි වේද, මෙසේම ස්පර්ශයද වේදනාවට බලවත් ප්‍රත්‍යයක් වේ. එය හැර මේ දෘෂ්ටි වේදයිතය නැතැයි දක්වයි. සියලු තැන මේ ක්‍රමයයි.

**දැන් තත්‍ර භික්ඛවෙ සමණ බ්‍රාහමණා සස්සතවාදා සස්සතං අත්තානංච ලොකංච පඤ්ඤාපෙන්ති, චතූහි වත්ථූහි, යෙපි තෙ සමණ බ්‍රාහමණා එකච්චසස්සතිකා** යයි ආදී ක්‍රමයෙන් සියලු දෘෂ්ටි වේදයිතයන් සම්පිණ්ඩනය කරයි. කුමක් නිසාද? මත්තෙහි ස්පර්ශයන් ප්‍රක්ෂේපනය කිරීම පිණිසය. කෙසේද? **සබ්බෙ තෙ ඡහි ඵස්සායතනෙහි ඵුස්ස ඵුස්ස පටිසංවෙදෙන්ති.** එහි ඵස්සායතන හය නම් ඇස ඵස්සායතනයකි. කන -පෙ- නාසය, දිව, ශරීරය, සිත, ඵස්සායතනයි. මේ හය සඤ්ජාති, සමොසරණ, කාරණ, පණ්ණත්ති මාත්‍රයන්හි මේ ආයතන ශබ්දය පවතී. එහි කාම්බෝජය අශ්වයන්ට ආයතනයකි. ගොනුන්ට දක්ෂිණාපථය ආයතනයකි යන්න සංජාතියෙහි පවතී. උපන් ස්ථානය යන අර්ථයි. 'මනොරමෙ ආයතනෙ සෙවන්තීනං විහංගමා' යනු හැසිරෙන ස්ථානයෙහි. 'ආයතනය ඇති කල්හි' යනු කාරණයෙහි. 'අරණ්‍යාතනයෙහි පත්කුටිවල නිසලව වෙසෙත් යනු ප්‍රඥප්ති මාත්‍රයෙහි මෙය මෙහි සංජාති ආදී අර්ථ තුනෙහිම යෙදේ. චක්ෂු ආදීන්හි ඵස්සය පස්වැනිකොට ඇති ධර්ම හටගනී. හැසිරේ. ඒවාද ඒවාට කාරණයැයි ආයතන නම් වේ. මෙහි චනාහි ඇසද රූපද නිසා චක්ඛු විඤ්ඤාණය උපදී. තුනෙහි එකතුව ඵස්සයයි යන මේ ක්‍රමයෙන් ස්පර්ශ ශීර්ෂයෙන්ම දේශනාව ආරෝපණය කොට ඵස්සය ආදිකොට පච්චය පරම්පරාව දක්වන්ට 'ඡඵස්සායතනානි' යයි කියන ලදී.

**ඵුස්ස ඵුස්ස පටිසංවෙදෙන්ති** යනු ස්පර්ශකොට දැනගනිත්. මෙහිද යම්කිසි ආයතනයන්ගේ ස්පර්ශ කෘත්‍යය මෙන් කියන ලදී. එසේ වුවත් ඔවුන්ගේ ස්පර්ශ කෘත්‍යය නොදත යුතුය. ආයතන ස්පරශ නොකරත්. ස්පර්ශයම ඒ ඒ අරමුණු ස්පර්ශ කරයි. ආයතන ස්පර්ශයෙහි ළඟ තබා දක්වන ලදී. ඒ නිසා ඒ සියල්ල ෂට් ස්පර්ශ ආයතන නිසා හටගන්නා ස්පර්ශයෙන් රූපාදී අරමුණු ස්පර්ශ කොට ඒ දෘෂ්ටි වේදනාව දැනගනිත් යයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. **තෙසං වෙදනා පච්චයා තණ්හා** යන ආදීන්හි වෙදනා යනු ස්පර්ශ හයෙන් හටගත් වේදනාවයි. එය රූප තණ්හා ආදී භේද ඇති තණ්හාවෙහි උපනිශ්‍රය කෙළවරින් ප්‍රත්‍ය වේ. එහෙයින් කියන ලදී. ඔවුන්ගේ වේදනා ප්‍රත්‍යයෙන් තණ්හා යි එය සිව්වැදෑරුම් වූ උපාදානයාගේ උපනිශ්‍රය කෙළවරින් ද සහජාත කෙළවරින්ද ප්‍රත්‍ය වෙයි. උපාදානය භවයට ප්‍රත්‍යය වන්නේද එසේය. භවය ජාතියෙහි උපනිශ්‍රය කෙළවරින් ප්‍රත්‍ය වෙයි. ජාති යනු මෙහි විකාර සහිත පංචස්කන්ධයෝ දතයුත්තාහ. ජාතිය ජරාමරණයටද

සෝකාදීන්ටද උපනිශ්‍රය කෙළවරින් ප්‍රත්‍ය වෙයි. මේ මෙහි සංක්ෂේපයයි. විස්තර වශයෙන් පටිච්ච සමුප්පාද කථාව විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. මෙහිදි එහි සෘද්ධි මාත්‍රයම දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ සංසාර කථා කියන සේක් 'මහණෙනි, අවිද්‍යාවෙහි පෙර කෙළවර නොපෙනේ. මින් පෙර අවිද්‍යාව නොවීය. ඉක්බිති පසුව හටගති. මහණෙනි, මෙය මෙසේද කියනු ලැබේ. එහෙත් ඒ හේතුවෙන්ම හටගත් අවිද්‍යාව වෙයි. මෙසේ අවිද්‍යා ශීර්ෂයෙන් හෝ 'මහණෙනි, භව තෘෂ්ණාවෙහි පෙර කෙළවර නොපෙනේ. භව තෘෂ්ණාවෙහි -පෙ- ඉන් හටගත් භව තෘෂ්ණාව වෙයි. මෙසේ තෘෂ්ණා ශීර්ෂයෙන් හෝ 'මහණෙනි, භව දෘෂ්ටියෙහි පෙර කෙළවර නොපෙනේ. -පෙ- ඉන් හටගත් භව දෘෂ්ටිය වේ. මෙසේ දෘෂ්ටි ශීර්ෂයෙන් හෝ කියන සේක. මෙහි වනාහි දෘෂ්ටි ශීර්ෂයෙන් කියන සේක් වේදනා රාගයෙන් උපදින්නා වූ දෘෂ්ටීන් කියා වේදනා මූලක පටිච්ච සමුප්පාදය කී සේක. එයින් මෙය දක්වයි. මෙසේ මේ දෘෂ්ටිගතිකයෝ මේ දර්ශනය ගෙන භවත්‍රයෙහි, සිව්යෝනියෙහි, පංච ගතීන්හි, සත් විඥාන ඨිතීන්හි නව සත්තාවාසවල එතැනින් මෙතැනටත් මෙතැනින් එතැනටත් දුවන්නාහු සරන්නාහු යන්ත්‍රයෙහි යෙදූ ගොනු මෙන් ටැඹෙහි බැඳි බල්ලන් මෙන්, වාතයෙන් නැසුණු නැව මෙන්ද සංසාර දුඃඛයෙහිම පෙරළෙත්. සංසාර දුඃඛයෙන් හිස ඔසවන්ට නොහැකි වෙත්.

මෙසේ දෘෂ්ටිගතික ස්ථාන වූ සංසාරය කියා දැන් උත්සාහයෙහි යෙදුණු භික්ෂුව අදිටන්කොට නිර්වාණය දක්වන සේක් **යතො ඛො භික්ඛවෙ භික්ඛු** යනාදිය කී සේක. එහි **යතො** යනු යම්කලෙක **ඡන්නං ඵස්සායතනානං** යනු යම් ඵස්සායතනයන්ගෙන් ස්පර්ශකොට දැනගන්නා දෘෂ්ටිගතිකයන්ට සංසාරය පවතී. ඒ ඵස්සායතන සයෙහි. **සමුදයං** යනාදීනන්හි අවිද්‍යා සමුදයෙන් චක්ඛු සමුදයයි ආදි ක්‍රමයෙන් වේදනා කර්මස්ථානයෙහි කියන ලද පරිදි ඵස්සායතනයන්ගේ සමුදය දතයුතුය. යම්සේ ඒ ඒ තැන 'ඵස්ස සමුදයා ඵස්ස නිරොධා' යයි කියන ලද ද එසේ මෙහි ඒ චක්ෂු ආදීන්හි 'ආහාර සමුදයා ආහාර නිරොධා' යයි දතයුතුය. මනායතනයෙහි 'නාමරූප සමුදයා නාමරූප නිරොධා' යයි දතයුතුය. **උත්තරීතරං පජානාති** යනු දෘෂ්ටිගතිකයා දෘෂ්ටියම දනී. මෙය වනාහි දෘෂ්ටියත් දෘෂ්ටියට වැඩිතරම් වූ ශීලය සමාධිය ප්‍රඥාව විමුක්තිය යනුවෙන් අර්හත්වය තෙක් දනී. මෙසේ කවරෙක් දනීද? **ක්ෂීණාශ්‍රව** තෙමේ දනී. අනාගාමී, සකෘදාගාමී, සෝතාපන්න, බහුශ්‍රැත, ග්‍රන්ථධර භික්ෂුව දනී.

ඇරඹූ විදර්ශනා ඇති තැනැත්තේ දනී. දේශනාව අර්හත්වය කුළුගැන්වීමෙන් නිමවන ලදී.

මෙසේ නිර්වාණය කියා දැන් 'දේශනා ජාලයෙන් විමුක්ත වූ දෘෂ්ටිගතිකයෙක් නම් නැතැ'යි දැක්වීම පිණිස නැවත **යෙහි කෙචි භික්ඛවෙ** යනුවෙන් ඇරඹූ සේක. එහි **අන්තොජාලිකතා** යනු මාගේ මේ දේශනා ජාලයෙහි ඇතුළත් කරන ලදී. **එත්ථසිතාව** මාගේ ඒ දේශනා ජාලයෙහි ඇලිණ. ගැලිණ. රැඳිණ. **උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති** යනුවෙන් කුමක් කියන ලද්දේ වේද, යටට කිමිදෙන්නෝද උඩට පැමිණෙන්නෝද මාගේ දේශනා ජාලයෙහි ඇලුණෝමැ කිමිදෙත්. උඩට පැමිණෙත්. **එත්ථපරියාපන්නා** යනු මෙහි මාගේ දේශනා ජාලයෙහි බැසගත්තාහුය. එයින් බැඳුණාහුය. ජාලය ඇතුළට පැමිණියාහුව උඩට එන්නාහු උඩට එන්නාහුමය. මෙහි නොපිළිගත් දෘෂ්ටිගතිකයෙක් නම් නැත.

**සුඛුමච්ඡිකෙන** යනු කුඩා ඇස් ඇති, සියුම් සිදුරු ඇති යන අර්ථයි. භාග්‍යවතුන් වහන්සේ කෙවටෙටා මස් මරන්නකු මෙනි. දේශනාව ජාලං විය. දැලවැන්න. **පරිත්ත උදකං** මඳ ජලය දසදහසක් ලෝකධාතු වැනිය. **ඔළාරිකපාණා** දෙසැටක් මිසදිටු ගත්තෝ ඕළාරික ප්‍රාණීන් වැන්න. එහි ඉවුරෙහි සිට බලන්නහුට ඕළාරික ප්‍රාණීන් දැල තුළට ගිය බව දැකීම සියලු දෘෂ්ටිගතිකයන් භාග්‍යවතුන් වහන්සේගේ දේශනාජාලය තුලට ඇතුල් වූ බව දැකීම මෙනි. මෙසේ මෙහි උපමා සංසන්දනය දතයුතුය.

මේ මේ දෙසැට මිසදිටුවල සියලු මිසදිටු සංග්‍රහ වූ බැවින් සියලු දෘෂ්ටිගතිකයන් මෙම දේශනා ජාලයෙහි ඇතුළට පැමිණි බව දක්වා දැන් තමා කිසියම්තැනක ඇතුළත් නොවූ බව දක්වන සේක් **උච්ඡින්න භවනෙත්තිකො භික්ඛවෙ තථාගතස්ස කායො** යනාදිය කී සේක. එහි, මෙයින් ගෙනයාතුයි **නෙත්ති**, නයන්තී යනු බෙල්ලෙන් බැඳ අදින රැහැන මෙනම් වේ. මෙහි අදින රැහැනක් වැනි බැවින් භව **තෘෂ්ණාව නෙත්ති** යැයි අදහස් කරන ලදී. එය මහජනයා බෙල්ලෙන් බැඳගෙන මෙන් ඒ ඒ භවයට පමුණුවතියි එළඹවතියි භවනෙත්ති වේ. එය අර්හත් මාර්ගය නමැති ආයුධයෙන් සිඳින ලද්දේනුයි **උච්ඡින්න භවනෙත්තිකො කායස්ස භෙදා උද්ධං** යනු කය බිඳීමට පසු. **ජීවිත පරියාදානා** යනු **ජීවිතය** සර්වාකාරයෙන් හිස්කර ඇති බැවින් **ක්ෂීණ** වූ බැවින් නැවත පිළිසිඳ ගැනීමක් නැති බව යන අර්ථයි. **නතං දක්ඛින්ති** යනු දෙවියෝ

හෝ මනුෂ්‍යයෝ හෝ තථාගතයන් නොදකිති. නමක් නැති බවට යන්නේය යන අර්ථයි.

**සෙය්‍යථාපි භික්ඛවෙ** යනු උපමාවෙහි මෙය සැසඳීමයි. තථාගතයන් වහන්සේ ගේ සිරුර අඹරුකක් මෙනි. රුකෙහි හටගත් මහා නටුව මෙනි. ඒ ඇසුරුකොට පෙර පැවති තෘෂ්ණාව, ඒ නටුවෙහි බැඳුණු ගෙඩි පහක්, දොළොසක්, දහඅටක් ගෙඩි ඇති අඹවලු මෙනි. තෘෂ්ණාව ඇතිකල්හි තෘෂ්ණාවෙහි බැඳී නැවත උපදනා පංචස්කන්ධ ද්වාදස ආයතන අටළොස් ධාතු යම් සේ ඒ නටුව සිඳ දැමූවිට ඒ සියලු අඹ ඒ අනුව යන්නේ වේද, ඒ නටුවම අනුව ගියේය. නටුව සිඳ දැමීමෙන් සිඳදමන ලද්දේම වෙයි යන අර්ථයි. **එවමෙව** භවනෙත්ති නටුව නොසිඳින ලද බැවින් පංචස්කන්ධ, ද්වාදසායතන, අටළොස් ධාතූහු නැවත උපදින්නාහුය. ඒ සියලු ධර්මයෝ ඒ අනුව යන්නෝම වෙති. භව නෙත්තියව අනුගත වෙත්. එය සිඳින ලද බැවින් සිඳුණාහුම වෙති යන අර්ථයි. යම්සේ එම රුක සර්පයන්ගේ විෂ ගැවී පිළිවෙළින් වියළී මළ කල්හි 'මෙතැන මෙබඳු රුකක් වීයැයි යන ව්‍යවහාර මාත්‍රයම වේද, ඒ රුක කිසිවෙක් නොදකීද, එසේ ආර්යමාර්ග විෂ ගැවී තෘෂ්ණා ස්නේහය නැතිවූ බැවින් පිළිවෙළින් වියළීගොස් මෙන් බිඳුණු කල්හි මේ කයෙහි කය බිඳීමෙන් මත්තෙහි ජීවිත පැවැත්මක් නො දකිත්ද, දෙවියෝද මනුෂ්‍යයෝද තථාගතයන් නොදකිති. 'මේ 'සසුන එබඳු වූ ශාස්තෘවරයකුගේ යැයි ව්‍යවහාර මාත්‍රයක්ම වන්නේය. අනුපාදිසේස නිර්වාණ ධාතුවට පමුණුවා දේශනාව නිමවා වදාළ සේක.

**එවං වුත්තෙ ආයසමා ආනන්දො** යනු මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය දේශනා කරන ලද කල්හි තෙරුන්වහන්සේ මුලපටන් සියලු සූත්‍රය ගෙනහැර දක්වා මෙසේ බුද්ධබලය විස්තර කොට කියන ලද සූත්‍රයට භාග්‍යවතුන් වහන්සේ විසින් නමක් නොදෙන ලදී. ඒ නිසා එයට නමක් ගන්වන්නෙමියි සිතා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ.

**තසමාතිහ ත්‍වං** ආදී තන්හි මේ අර්ථ යෙදුමයි. 'ආනන්ද, මෙහි යම් හේතුවක් නිසාද මේ ධර්ම පර්යායෙහි මෙලොව අර්ථයත් පරලොව අර්ථයත් බෙදා දක්වන ලදී. **තසමාතිහ ත්‍වං මෙ ධම්ම පරියායං අත්ථජාලනත්තිපි නං ධාරෙහි** යම්හෙයකින් මෙහි බොහෝ පාලි ධර්මය කියන ලද්දේ ද, ඒ නිසා **ධම්මජාලනත්තිපි තං ධාරෙහි** = ධර්ම ජාලයයි

කියාද දරහි. මෙහි ශ්‍රේෂ්ඨාර්ථයෙන් බ්‍රහ්ම වූ සර්වඥතාඥානය විභාග කරන ලද්දේ ද ඒ නිසා **බ්‍රහමජාලන්තිපි තං ධාරෙහි** බ්‍රහ්මජාල කියාද දරහි. යම්හෙයකින් මෙහි දෙසැට මිසදිටු විභාග කරන ලද්දේ ද ඒ නිසා **දිට්ඨි ජාලන්ති පි තං ධාරෙහි** දෘෂ්ටි ජාලය කියාද දරහි. යම්හෙයකින් මේ ධර්ම පර්යාය අසා දේවපුත්‍ර මාරයාද, මෘත්‍යුමාරයාද ක්ලේශ මාරයාද මර්දනය කිරීමට හැක්කේද ඒ නිසා **අනුත්තරො සංගාම විජයොතිපි තං** ධාරෙහි අනුත්තර වූ සංග්‍රාම විජය යයි කියාද එය දරහි.

**ඉදමවොච භගවා** යනු නිදාන අවසානයෙහි සිට අනුත්තරො සංගාම විජයොතිපි තං ධාරෙහි යනුවෙන් සකල සූත්‍රාන්තය භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොලැබිය හැකි පරමගම්භීර වූ සර්වඥතා ඥානය ප්‍රකාශ කරන සේක්, දෘෂ්ටිගත ගනඳුර දුරලන සූර්යයා මෙන් වදාළ සේක. **අත්තමනා තෙ භික්ඛු** යනු සතුටට පත්වූවාහු, තම මනසින් බුදුන් වෙත ගිය ප්‍රීතියෙන් උද්දාම වූ සිත් ඇත්තෝ යයි කියන ලද්දේ වෙයි. **භගවතො භාසිතං** යනු මෙසේ විචිත්‍රනය දේශනා විලාසයෙන් යුත් මේ සූත්‍රය කෝකිල නාදයක් වැනි මිහිරි වූ කන් පිනවන නුවණැත්තන්ගේ හදවත් තුළට අමෘතය ඉසින්නාක් වැනි බ්‍රහ්ම ස්වරයෙන් බබලන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය **අභිනන්දුං** යනු ප්‍රමෝදයට පත්වූවෝද මැනවින් පිළිගත්තෝද වූහ.

මේ අභිනන්දන ශබ්දය අභිනන්දති අභිවදති ආදී තන්හි තෘෂ්ණාවටද කියන ලද්දේය. 'අන්නමෙවාභි නන්දන්ති උභයෙ දෙවමානුසා' ආදී තන්හි පැමිණීම යන අර්ථයෙහි ද යෙදේ.

**චිරප්පවාසිං පුරිසං දූරතො සොත්ථි මාගතං**
**ඤාතිමිත්තා සුහජ්ජාච අභිනන්දන්ති ආගතං**

බොහෝ කල් බැහැර වැස - දුරුරට සිට සපැමිණියකු
. නෑමිතුරෝ සහෘදයෝ - සතුටු සිතින් පිළිගනිති.

ආදී තන්හි පිළිගැනීමෙහිද වේ. අභිනන්දිත්වා අනුමොදිත්වා ආදී තන්හි අනුමෝදනාවෙහි. එය මෙහි අනුමෝදනාවෙහිද පිළිගැනීමෙහිද යෙදේ. ඒ නිසා අභිනන්දුං යනුවෙන් කියන ලදී. අනුමෝදන් වූවාහුද, පිළිගත්තාහුද වෙති.

**සුභාසිතං සුලපිතං - සාධු සාධූති තාදිනො**
**අනුමොදමානා සිරසා - සමපටිච්ඡිංසු භික්ඛවො**

තාදී බුදුරදුන්ගේ - සුභාෂිතය සුලපිතය
සාධු සාධුයි අනුමෝදන්ව - මුදුනින් පිළිගත්හ භික්ෂූහු.

**ඉමස්මිංචපන වෙය්‍යාකරණස්මිං** යනු මේ ගාථා රහිත සූත්‍රයෙහි. ගාථා රහිත බැවින් මෙය වෙය්‍යාකරණයයි කියන ලදී. **සහස්සී ලොකධාතු** දහසක් සක්වළින් පරිමිත වූ ලෝකධාතුව **අකම්පිත්ථ** සූත්‍රය අවසානයේදීම කම්පා විය යි දතයුතුය. **සඞ්කම්පමානෙ** යනු කියන ලදී. ඒ නිසා දෙසැටක් මිසදිටු ලිහා ලිහා දේශනා කරනු ලබන කල්හි ඒ ඒ දෘෂ්ටිගතය අවසානයේදී දෙසැටක් තැන්හි කම්පා වීයයි දතයුතුය.

එහි අටතැනක පෘථුවි කම්පාව දතයුතුය. ධාතු ක්ෂෝභයෙන්, ඍද්ධිමතුන්ගේ ආනුභාවයෙන්, බෝසතුන් මව්කුසට එළඹීමෙන්, මව්කුසින් නික්මීමෙන්, බුද්ධත්වයට පත්වීමෙන්, දම්සක් පැවැත්වීමෙන්, ආයු සංස්කාරය හැරීමෙන්, පරිනිර්වාණයෙන්, ඔවුන්ගේ විනිශ්චය ආනන්ද, මහා භූචලනයක් පහළවීමට හේතුප්‍රත්‍ය අටක් ඇතැයි මහා පරිනිර්වාණ සූත්‍රයෙහි ආ පෙළෙහි වර්ණනාව කෙරෙන කල්හිම කියමි.

මේ මහා පෘථුවිය තවත් අටතැනකදී කම්පා විය. මහාබිනික්මනෙහි, බෝමැඩට එළැඹීමෙහි, පංශුකූලය ගැනීමෙහි, පාංශුකූලය දෙවීමෙහි, කාලකාරාම සූත්‍රය දේශනා කිරීමෙහි, ගොතමක සූත්‍රය දේශනා කිරීමෙහි, වෙස්සන්තර ජාතකය දේශනා කිරීමෙහි, මේ බ්‍රහ්මජාල සූත්‍රය දේශනා කිරීමෙහි පොළොව කම්පා විය. එහි මහබිනික්මනෙහි, බෝමැඩට එළඹීමෙහි වීර්ය බලයෙන් කම්පා විය. පාංශුකූලය ගැනීමේදී දෙදහසක් දිවයින් පිරිවර කොට ඇති සිව්මහ දිවයින් හැර පැවිදිව සොහොනට ගොස් පාංශුකූලය ගන්නා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් දුෂ්කර කාර්යයක් කරන ලද්දේයැයි ආශ්වර්ය වේගයෙන් පහරනු ලැබ කම්පා විය. පාංශුකූල ධෝවනයෙහි වෙස්සන්තර ජාතක දේශනාවෙහි අකාල කම්පනයෙන් කම්පා විය. කාලකාරාම, ගොතමක සූත්‍ර දේශනාවලදී භාග්‍යවතුන් වහන්ස, මම සාක්ෂි දරමියි ඇසින් දුටු බැවින් කම්පා විය. මේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි දෙසැට මිසදිටු බිඳ දමා කටුකොහොල හැර දේශනා කරනු ලබන කල්හි සාධුකාර දීම් වශයෙන් කම්පා වී යයි දතයුතුය.

හුදෙක් මේ තැන්වල පමණක් පොළොව කම්පා නොවීය. ඉක්බිතිව සංගායනා තුනෙහිද මහා මහින්ද තෙරුන් මේ දිවයිනට පැමිණ ජෝති වනයෙහි හිඳ ධර්මය දේශනා කළ දිනයෙහි ද කම්පා විය. කැලණි විහාරයෙහිද පිණ්ඩපාතිය තෙරුන් සෑමළුව හැමද එහිම හිඳ බුද්ධාරම්මණය ප්‍රීතිය කොටගෙන මේ සූත්‍රාන්තය අරඹා සූත්‍රය අවසානයෙහි ජලය කෙළවරකොට කම්පා විය. ලෝහ ප්‍රාසාදයෙහි පෙරදිගින් අම්බලට්ඨික නම් තැනක් විය. එහි හිඳ දීඝභාණක තෙරුන්වහන්සේලා බ්‍රහ්මජාල සූත්‍රය කීම ආරම්භ කළහ. උන්වහන්සේලාගේ සජ්ඣායනය අවසානයෙහි ද ජලය කෙළවර කොට පෘථුවිය කම්පා විය.

එවං යසසානු භාවෙන අකමපිත්‍ථ අනෙකසො
මේදිනී සුතත සෙට්ඨසස - දෙසිතසස සයමභුනා
බ්‍රහමජාලසස තසසිධ - ධමමං අත්‍ථඤච පණ්ඩිතා
සකකචචං උගගහෙත්‍වාන පටිපජජනතු යොනිසො

බුදුරදුන් දෙසූ සේම මේ බඹදැල් සුතුරෙහි
අනුහසින් සැලිණ මහපොළොව නොයෙක් ලෙස
නැණැතියෝ එහි දහමද අරුතද උගෙන මැනවින්
නුවණින් පිළිපදිත්වා.

බ්‍රහ්මජාල සූත්‍ර වර්ණනාව නිමියේ ය.

# සාමඤ්ඤඵල සූත්‍ර වර්ණනාව

**එවං මෙ සුතං -පෙ- රාජගහෙ** යනු සාමඤ්ඤඵල සූත්‍රයයි. මේ මෙහි අපූර්ව පද වර්ණනාවයි. **රාජගහෙ** යනු එනම් නගරයෙහි. එය වනාහි මන්ධාතු ගෝවින්ද ආදීන් විසින් අධිගෘහිත බැවින් රාජගහ යයි කියනු ලැබේ. අන්‍යයෝද මෙහි ප්‍රකාරය වර්ණනා කරති. කුමකින්ද? මේ නගරයෙහි නම ගැන. එය බුද්ධ කාලයෙහි ද චක්‍රවර්ති කාලයෙහිද නගරයක් වෙයි. සෙසු කල්හි ශූන්‍ය වෙයි. යක්ෂයන් විසින් අරක්ගන්නා ලද්දේ වෙයි. ඔවුන් වාසය කරන වනයක් වී සිටියි. **විහරති** අවිශේෂයෙන් ඊරියාපථ දිව්‍ය බ්‍රහ්ම ආර්ය විහාරයන්හි එක්තරා විහාරයක් හා සබැඳි බව දැක්වීමයි. මෙහි වනාහි සිටීම, ගමන, හිඳීම, නිදාගැනීම යන ප්‍රභේද ඇති ඉරියව්වල එක්තරා ඉරියව්වක් සම්බන්ධයෙන් විස්තර කිරීමයි. එයින් සිටිමින් යමින් හිඳිමින් සැතපෙමින් භාග්‍යවතුන් වහන්සේ වාසය කරන සේකැයි දතයුතුයි. උන්වහන්සේ එක් ඉරියව්වකින් ඇතිවන බාධාව තවත් ඉරියව්වකින් පිරිසිඳ නොසිඳෙන ආත්මභාවය ගෙනයන සේක. පවත්වන සේක. ඒ නිසා **විහරති** යයි කියනු ලැබේ. **ජීවකසස කොමර භච්චසස** අම්බවනෙ ඔහුගේ යම් ගොඩුරුගමක් ඇසුරුකොට වසන සේක්ද, ඒ සමීපයෙහි වෙසෙන තැන දැක්වීමයි. ඒ නිසා **රාජගහෙ විහරති ජීවකසස කොමාර භච්චසස අම්බවනෙ** යනු රජගහ සමීපයෙහි ජීවක කෝමාරභච්චගේ අඹවනයෙහි වසන සේකැයි මෙහි අර්ථය දතයුතුය. මෙය සමීපාර්ථයෙහි ආධාර වචනයකි. එහි ජීවත් වෙනුයි **ජීවකො** කුමාරයා විසින් පෝෂණය කරන ලද්දේනුයි **කොමාර භච්චො** කියන ලද පරිදි කොල්ලනි. කපුටන් විසින් වටකරනු ලැබූ මෙය කුමක්ද? දේවයන් වහන්ස, දරුවෙකි. ජීවත්වේද කොල්ලනි, ජීවත් වෙයි දේවයන් වහන්ස. එසේනම් කොල්ලනි, ඒ දරුවා අන්තඃපුරයට ගෙනගොස් පෝෂණය කරන්ට කිරිමවුන්ට දෙවු. ජීවත්වන බැවින් ඔහුට ජීවකයයි නමක් කළහ. කුමාරයා විසින් පෝෂණය කරවන ලද්දේනුයි කෝමාර භච්ච යයි නමක් තැබූහ. මේ මෙහි සංක්ෂේපයයි. විස්තර වශයෙන් ජීවක වස්තුව ඛන්ධකයෙහි ආයේය. ඔහුගේ විනිශ්චය කථාව ද සමන්තපාසාදිකා විනයට්ඨ කථාවෙහි කියන ලදී.

මේ ජීවක තෙමේ එක් කලෙක භාග්‍යවතුන් වහන්සේගේ දොසින් පිරුණු සිරුර විරේක කර සීවෙය්‍යක රෙදි දෙකක් දී වස්ත්‍ර අනුමෝදනාවෙහි කෙළවර සෝවාන් පෙලෙහි පිහිටා මෙසේ සිතීය. 'මා දවසට දෙතුන්වරක් බුදු උවටැනට යායුතුය. මේ වේළුවනය ඉතා ඈතය. මාගේ අඹඋයන නුදුරේය. එහි භාග්‍යවතුන් වහන්සේට වෙහෙරක් කරන්නෙම් නම් මැනවැයි හේ අඹවනයෙහි රාත්‍රීස්ථාන දිවාස්ථාන ලෙන්කුටි මණ්ඩප ආදිය සාදවා භාග්‍යවතුන් වහන්සේට සුදුසු ගඳකිළියක් කරවා අඹවනය අටළොස් රියන් ලෙසට තඹපටෙහි වර්ණයෙන් යුත් පවුරකින් වටකරවා බුද්ධප්‍රමුඛ භික්‍ෂුසංඝයා සිවුරින් බතින් සතප්වා පැන් වඩා විහාරය පවරා දුන්නේය. **ජීවකසස කොමාරා භචචසස අමබවනෙ** යයි ඒ නිසා කියන ලදී. **අඩඪ තෙළසෙහි භිකඛුසතෙහි** හය දහස් පන්සියයක් පමණ භික්‍ෂූන් සමග.

රාජා යන ආදී තන්හි රාජා යනු තමාගේ ඓශ්වර්ය සම්පත්තියෙන් සිව් සඟරාවතින් මහජනයා රංජනය කෙරෙතියි රකිතියි රාජා. මගධයන්ට ප්‍රධානනුයි = මාගධො. නූපන්නේම රජුට සතුරු වන්නේ යයි නිමිත්ත පාඨකයන් විසින් නිර්දේශ කරන ලද්දේනුයි **අජාතසතතු.**

ඔහු කුසට පැමිණි කල්හි දේවියට මෙබඳු දොළදුකක් ඇතිවිය. මම රජුගේ දක්‍ෂිණ බාහුවෙන් ලේ බොන්නේ නම් මැනවි' ඇයට බැරෑරුම් තැනක මෙම දොළදුක උපන. කිසිවකුට කියන්ට නොහැකි යයි එය කියන්ට නොහැකි වන්නී කෘශ වී දුර්වර්ණ වූවාය. රජ ඇයගෙන් මෙසේ ඇසීය. සොඳුර, ඔබගේ ආත්මභාවය ප්‍රකෘති වර්ණය නොවේ. කවර කරුණකින්ද? මහරජතුමනි, නොඅසනු මැනවි. සොඳුර, ඔබගේ අදහස මට නොකියන්නී කාහට කියන්නෙහිද? එසෙ එසේ ඇවිටිලිකොට කියවා ගත්තේය. අසා නුවණ මඳ තැනැත්තිය තී මෙහිදී බැරෑරුම් හැඟීමක් ඇත්තී වන්නේ කුමක් නිසාද? වෙදකු කැඳවා රන් ආයුධයකින් අත පළවා රන් බඳුනකින් ලේ ගෙන ජලය සමග කලතා පෙව්වේය. නිමිත්ත පාඨකයෝ ඒ අසා 'මේ ගැබ රජුට සතුරු වන්නේය. මොහු විසින් රජ මරනු ලබන්නේ' යයි ප්‍රකාශ කළහ. දේවිය ඒ අසා 'මාගේ කුසයෙන් නික්මෙන තැනැත්තා රජු මරන්නේ'යයි ගැබ හලනු කැමැත්තී උයනට ගොස් කුස මර්දනය කරවූවාය. ගැබ නොහැලෙයි. ඈ නැවත නැවත ගොස් එසේ කරවයි. රජතෙමේ 'මැ කුමක් නිසා නිතර උයනට යන්නීදැ'යි සොයා බලන්නේ ඒ කරුණ අසා 'සොඳුර, තීගේ කුසෙහි

පුත්‍රයෙක්ද දුවක්ද යන්න නොපැනේ. තමාට උපන් දරුවාට මෙසේ කළේයයි මහත් අගුණ රැසක් දඹදිව් තලයෙහි පහළ වන්නේය. එසේ නොකරන්නැ'යි වළක්වා ආරක්ෂාව ලබා දුන්නේය. ඈ ගැබින් නැගිටින කල්හි ඔහු මරන්නෙමියි සිතුවාය. එදා ද ආරක්ෂක මනුෂ්‍යයෝ දැක කුමරු ඉවතට ගෙන ගියහ. පසුකලෙක වැඩිවයසට පත් කුමරු දේවියට පෙන්වූහ. ඈ ඔහු දැකම පුත්‍ර ස්නේහය උපදවා ගත්තාය. එයින් ඔහු මැරීමට නොහැකි විය. රජතෙමේද අනුක්‍රමයෙන් පුත්‍රයාට යුවරජ තනතුර දුන්නේය. ඉක්බිති එක් කලෙක දේවදත්ත රහසිගතව මෙසේ සිතීය. ශාරිපුත්‍රගේ පිරිස විශාලය මෞද්ගල්‍යානගේ පිරිස මහා කාශ්‍යපගේ පිරිස යැයි මොවුහු වෙන වෙනම තනතුරු දරන්නෝය. මම ද එක් තනතුරක් පැහැර ගනිමියි හේ ලාභයෙන් තොරව පිරිස් උපදවන්ට නොහැකිය. මම දැන් ලාභ උපදවා ගන්නෙමියි සිතා බන්ධකයෙහි ආ ක්‍රමයෙන් අජාත සත්ත කුමාරයා ඍද්ධි ප්‍රාතිහාර්යයෙන් පහදවා උදේ සවස රිය පන්සියයකින් උපස්ථානයට එන කුමරු අතිශයින් විශ්වාසී බව දැන එක් දවසක් ළඟට ගොස් මෙසේ කීය. කුමරුනි, පෙර මිනිස්සු දීර්ඝායුෂ්ක වූහ. දැන් අල්පායුෂ ඇත්තෝය. -පෙ- ඒ නිසා කුමරුනි, ඔබ පියා මරා රජ වන්න. මම බුදුන් මරා බුදුවන්නෙමි'යි කුමරු පියා මැරීමට පෙළඹවීය. හේ දේවදත්ත හිමියෝ මහානුභාව ඇත්තෝ ය. ඔහු නොදන්නා දෙයක් නම් නැතැයි කලවෙහි පිහියක් බැඳ උදෑසන බියට පත්ව, කලබලයට පත්ව, සැක ඇතිව, ත්‍රාසයට පත්ව ඇතුළු නුවරට පිවිස කියන ලද පරිදි විප්‍රකාර කළේය. ඉක්බිති ඇමතියෝ ඔහු අල්ලාගෙන ලුහුබැඳ කුමාරයා මැරිය යුතුය. දේවදත්ත ද මැරිය යුතුයයි සියලු භික්ෂූහු ද මැරිය යුතුයයි කැමති කරවාගෙන රජුගේ අණ අනුව කරන්නෙමුයි රජුට දැන්වූහ.

රජ තෙමේ යමෙක් මරනු කැමති වූවාහුද ඔවුන්ගේ තනතුරු සිඳ යමෙක් නොමරනු කැමති වූවාහුද ඔවුන් උසස් තනතුරුවල තබා කුමාරයාගෙන් මෙසේ ඇසීය. 'කුමාරය, ඔබ මා මරනු කැමැත්තේ කුමක් නිසාද? දේවයන් වහන්ස, මට රාජ්‍යය අවශ්‍යය. රජ ඔහුට රාජ්‍යය දුන්නේය. හේ මාගේ මනෝරථය සපිරුණෝ යයි දේවදත්තට දැන්වීය. ඉක්බිති හේ ඔහුට මෙසේ කීය. ඔබ මීයකු ඇතුළට දමා බෙරය වසා බඳනා මිනිසකු මෙන් කටයුතු කරමි'යි සිතහි. කිහිප දවසකින් ඔබගේ පියා ඔබ විසින් කරන ලද අවමානය ගැන සිතා තමාම රජ වන්නේය. එසේනම් ස්වාමීනි කුමක් කරම්ද? සමූලඝාතනයට පමුණුවන්න. ස්වාමීනි

මාගේ පියා ආයුධයකින් මැරිය යුතුද? ආහාර නොදී ඔහු මරන්න. හේ පියා දුම්ගෙයි දැම්මවීය. තාපන ගෙහ නම් වැඩකිරීම පිණිස තැනූ දුම්ගෙයයි. මාගේ මවට හැර අන් කිසිවකුට දකින්ට නොදෙවු යයි කීය. දේවිය රන්බඳුනෙක බත් තබා උකුළෙන් ගෙන පිවිසෙයි. රජ එය අනුභව කොට යැපෙයි. හෙතෙමේ මාගේ පියා කෙසේ යැපේදැයි අසා එපුවත අසා මාගේ මවට උකුලෙහි තබා පිවිසෙන්ට නොදෙවු යයි කීය. එතැන්පටන් දේවිය හිස්වැස්මෙහි බහා පිවිසෙයි. එයද අසා හිස්වැස්ම බැඳ පිවිසෙන්ට නොදෙවු යයි කීය. ඉන්පසු රන් මිරිවැඩිවල බත් තබා වසා මිරිවැඩි දමාගෙන පිවිසෙයි. රජ එයින් යැපෙයි. නැවත කෙසේ යැපේදැයි අසා ඒ බව අසා 'මිරිවැඩි නැග පිවිසෙන්ට නොදෙවු' යයි කීය. එතැන් පටන් දේවිය සුවඳ දියෙන් නහා සිරුර චතුමධුර ගල්වා පොරවාගෙන පිවිසෙයි. රජ ඇයගේ සිරුර ලෙවකා යැපෙයි. නැවත අසා එපුවත අසා මෙතැන් පටන් මාගේ මවගේ පිවිසීම වළක්වවු යයි කීය. දේවිය දොර ළඟ සිට 'හිමියනි, මොහු ළදරු කල මරවන්ට නුදුන්නේය. තමාගේ සතුරා තමා විසින්ම පෝෂණය කළේය. දැන් මේ ඔබතුමාගේ අවසාන දැක්මයි. මම මින්පසු ඔබතුමා දක්නට නොලබමි. මාගේ දොසක් ඇත්නම් කමනු මැන දේවයන් වහන්ස යැයි හඬා වැළපී නැවතුණාය.

එතැන් පටන් රජුට අහරක් නැත. රජතෙමේ මගපල සුවයෙන් සක්මනින් යැපෙයි. ඔහුගේ ආත්මභාවය අතිශයින් බබලයි. කොල්ලනි, මාගේ පියා කෙසේ යැපේදැයි අසා දේවයන් වහන්ස, සක්මනින් යැපෙයි. ඔහුගේ ආත්මභාවය අතිශයින් බබලතියි අසා දැන් ඔහුගේ සක්මන නවත්වන්නෙමියි සිතා මාගේ පියාගේ පාද දැලිපිහියෙන් පළා ලුණු තෙලින් අතුල්ලා කිහිරගුරුවලින් විටි විටි ගා පුළුස්සවු යයි කරණවැමියන් යැවීය. රජ ඔවුන් දැක 'එක්නාත්යෙන් මාගේ පුත්‍රයා කවුරුන් හෝ විසින් දන්වන ලද්දේ වන්නේය. මොවුහු මාගේ රැවුල කැපීම පිණිස පැමිණියාහු යයි සිතීය. ඔවුහු ගොස් වැඳ සිටියහ. 'කුමක් නිසා ආවහුදැ'යි විමසන ලද්දාහු ඒ හසුන දැන්වූහ. තොපගේ රජුගේ අණ කරවු යයි කියන ලද්දාහු 'හිඳිනු මැනවි දේවයන් වහන්සැ'යි කියා රජු වැඳ 'දේවයන් වහන්ස, අපි රජ අණ කරමු. අපට නොකිපෙනු මැනවි. මේ නම් ඔබවහන්සේ වැනි දහම් රජුනට නුසුදුසු යැයි කියා වම් අතින් ගොප් මස ගෙන දකුණතින් දැලිපිහිය ගෙන පතුල් පළා ලුණු තෙල් ගා කිහිරි අඟුරින් විටි විටි යයි පිළිස්සූහ.

රජතෙමේ පෙර සෑමළුවෙහි පාවහන් සහිතව ගියේය. හිඳ ගැනීම පිණිස පනවන ලද පැදුර ද නොසේදූ පයින් පෑගීය. මේ එහි විපාකයයි කියත්. රජුට මහත් වේදනා උපන. හේ බුදුරජාණන් වහන්සේ ආශ්චර්යයි ධර්මය ආශ්චර්යයි යනුවෙන් සිහිකරන්නේ සෑමළුවෙහි දැමූ මල්දමක් මෙන් මැලවී චාතුර්මහාරාජික දෙව්ලොව වෙසවුණුගේ පරිවාරක ජනවසභ නම් යක්‍ෂයකු වී උපන්නේය. එදවසම අජාතසත්තුට පුතෙක් උපන්නේය. පුතා උපන් බවද රජු මළ බවද දන්වන්ට ලිපි දෙකක් එකම වේලාවට ආවේය. ඇමතියෝ පළමුව පුතු උපන් බව දන්වන්නෙමුයි ඒ ලිපිය රජු අත තැබූහ. රජුට එකෙණෙහිම පුත්‍රස්නේහය ඉපදී සියලු සිරුර කළඹා ඇටමිදුළුවල හැපී සිටියේය. එකෙණෙහි පියාගේ ගුණ දත්තේය. 'මා උපන් කල්හිද මාගේ පියාටද මෙබඳුම සෙනෙහසක් උපන්නේ වනැ. හේ කොල්ලනි, යවු මාගේ පියා මුදාහරිවු මුදාහරිවු යයි කීය. දේවයන් වහන්ස, කුමක් මුදාහරින්නේ දැයි ඉතිරි ලිපිය අත තැබූහ. හේ එපුවත අසා හඬමින් මව් වෙත ගොස් 'මෑණියනි, මාගේ පියාට මා කෙරෙහි සෙනෙහසක් වීදැයි ඇසීය. ඈ මෙසේ කීවාය. මෝඩපුත්‍රය, කුමක් කියහිද? ඔබ ළමා කල්හි ඇඟිල්ලෙහි ගෙඩියක් නැගිණ. ඉක්බිති ඔහුට ඔබ හඬනු දරාගන්ට නොහැකිව අල්ලාගෙන අධිකරණ අසුනෙහි සිටි ඔබගේ පියා වෙත ගියාහුය. පියා ඔබගේ ඇඟිල්ල මුවෙහි තැබීය. ගෙඩිය මුව තුළදීම පුපුරා ගියේය. ඉක්බිති ඔබගේ පියා ඔබට ඇති සෙනෙහස නිසා ඒ ලේ මුසු සැරව එළියට නොදමා ගිල්ලේය. ඔබගේ පියාගේ සෙනෙහස එබඳුය. හේ හඬා වැළපී පියාගේ සිරුරු කිස කළේය.

දේවදත්තද අජාත සත්තු වෙත එළඹ 'මහරජතුමනි, ශ්‍රමණ ගෞතමයන් ජීවිතයෙන් වෙන්කළ හැකි මිනිසුන් අණකරන්නැයි කියා ඔහු විසින් දෙන ලද මිනිසුන් යවා තමාම ගිජුකුළු පව්වට නැග යන්ත්‍රයෙන් ගල්ගසා, නාලාගිරි ඇතු මුදාහරවාද කිසියම් උපායෙකින් භාග්‍යවතුන් වහන්සේ මරවන්ට නොහැක්කේ ලාභසත්කාරයෙන් පිරිහුණේ පංච වස්තුන් ඉල්ලා නොලබන්නේ ඒවා ජනයාට දන්වන්නෙමියි සංඝභේද කොට සැරියුත් මුගලන් තෙරවරුන් පිරිස් රැගෙන ගියකල්හි උණු ලේ මුවෙන් දමා නවමසක් ගිලන් ඇඳෙහි වැදහෙව උපන් විපිළිසර ඇත්තේ 'දැන් ශාස්තෲන් වහනස්සේ වසනසේක්දැයි විමසා දෙව්රමෙහි යයි කීකල්හි 'ඇඳ පිටින් මා ගෙනගොස් ශාස්තෲන් වහන්සේ පෙන්වවු යයි කියා ගෙනයනු ලබන්නේ භාග්‍යවතුන් වහන්සේ දැකීමට සුදුසු කර්මයක් නොකරන ලද බැවින් දෙව්රම්හි පොකුණ සමීපයෙහිම දෙබෑ වූ

පොළොවට පිවිස මහා නිරයෙහි පිහිටියේය. මේ මෙහි සංක්ලේෂයයි. විස්තර කථා ක්‍රමයෙන් ඛන්ධකයෙහි ආ බැවින් සියල්ල නොකියන ලදී. මෙසේ 'නූපන්නේම රජුට සතුරු වන්නේ යයි' නිමිත්ත පාඨකයන් විසින් නිර්දේශ කරන ලද්දේනුයි අජාත සත්තු.

වෙදෙහි පුත්තො යනු මේ කොසොල් රජුගේ දුවගේ පුත්‍රයා. විදේහ රජුගේ නොවේ. වෙදෙහි යනු පණ්ඩිත යන්නට සමාන වචනයකි. යම්සේ කීවේද වෙදෙහිකා ගහපතානී (නුවණැති ගෘහපතිනි) අයෙයා ආනන්‍දො වෙදෙහමුනි' ආනන්ද ආර්යයන් වහන්සේ වෙදෙහ (නුවණැති) මුනිවරයෙකි. මේ මෙහි වචනාර්ථයයි. එයින් කියානුයි = වෙදො ඥානයට මෙය සමාන වචනයකි. වේදයෙන් යත්න දරානුයි, ගටානුයි, වෑයම් කරානුයි = වෙදෙහී. වෙදෙහියගේ පුත්‍රයා = වෙදෙහි පුත්තො.

තදහු යන ඒ දවසෙහි, එදින යන අර්ථයි. මෙහි එළඹ වෙසේනුයි උපොසථො. උපාසනති යනු ශීලයෙන් හෝ උපවාසයෙන් යුතුව වසත් යන අර්ථයි. මේ මෙහි අරුත් උපුටනයයි. 'ආයුෂ්මත් කප්පින උපොසථයට යන්නෙමු' ආදි තන්හි පාමොක් උදෙසන උපොසථයයි. විසාඛාවෙනි, මෙසේ අෂ්ටාංගයකින් යුත් උපෝසථය වැසුයේ යන තන්හි ශීලයයි. 'සුද්ධසස වෙ සදා ඵග්ගු සුද්ධසසුපොසථො සදා - සුපිරිසුදු පුද්ගලයාට හැමදා උපවාසයයි. හැමදා උපෝසථයයි යන තන්හි උපවාසයයි. 'උපෝසථ නම් නාරජ' යන තන්හි ප්‍රඥප්තියයි. 'නහිඛවෙ තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා' - මහණෙනි, උපෝසථ දිනයෙහි ආවාස භික්ෂූන් සහිත නොවේ යන තන්හි උපවාස කළයුතු දවසයි. මෙහිද එය අදහස් කරන ලදී. එය වනාහි අටවක, තුදුස්වක පසළොස්වක භේදයෙන් තෙවැදෑරුම් වේ. ඒ නිසා ඉතිරි දෙක වළක්වනු පිණිස පණ්ණරසෙ යනුවෙන් කියන ලදී. එහෙයින් කියන ලදී. මෙහි එළඹ වෙසෙතියි උපොසථො.

කොමුදියා කුමුදු මල් ඇති, එකල කුමුදුමල් මැනවින් පිපුණේ වෙයි. ඒවා මෙහි ඇත්තේනුයි = කොමුදී. චාතුමාසිනියා යනු සිව්මස් ඇති. එය සිව්මසක් අවසන් වූ = චාතුමාසී. මෙහි චාතුමාසිනී යයි කියනු ලැබේ. මා යනු චන්ද්‍රයා යයි කියනු ලැබේ. එය මෙහි පිරුණේනුයි පුණ්ණමා. මෙසේ පුණ්ණාය පුණ්ණාමාය යැයි මේ පද දෙකෙහි අර්ථය දතයුතුය. රාජාමච්ච පරිවුතො යනු මෙබඳු රිදී කළයෙන් නික්මුණු

කිරිදහරාවන්ගෙන් දෝවනය කරනු ලබන දිශා භාගයක් මෙන් රිදී විමනින් විසිරීගිය මුතුවැල් සමන්මල්දම් සුදු දුහුල් කුමුදු සමූහයෙන් ගැවසී ගත්තාක් මෙන්ද සිව් උපක්ලේශයන්ගෙන් මිදුණු පුන්සඳ පැහැය ගැනීමෙන් බබලන රාත්‍රියෙහි රජ ඇමතියන්ගෙන් පිරිවරන ලද්දේ යන අර්ථයි.

**උපරිපාසාද වරගතො** යනු උතුම් පහයෙහි මතට ගියේ. මාහැඟි එසවූ සේසත් ඇති රන් අසුනෙහි. **නිසිනෙනාහොති** හුන්නේ වෙයි. කුමක් නිසා හුන්නේද? නිදිවැරීම පිණිසයි. මේ රජ පියාට පහරදෙනු ලැබූ දිනයෙහි පටන් 'නින්දට යන්නෙමියි ඇස් පියවුණු මතින් සැත් සියයකින් පහරදෙනු ලැබූ කලෙක මෙන් හඬමින් බියෙන්ම පුබුදී. 'මේ කිමෙක්දැ'යි කියූ කල්හි 'කිසිවක් නැතැ'යි කියයි. එහෙයින් ඔහුට නින්ද ප්‍රිය නැත. මෙසේ නිදිවැරීම පිණිස හුන්නේය. තවද එදවස නැකැත්කෙළි දන්වන ලද්දේ වෙයි. මුළු නගරයම සමතලා කරන ලද්දේය. විසිරවූ වැලි ඇත්තේය. පස්වණක් මල්, විළඳ පිරුණු කළයෙන් ගෙදොර අලංකාර කරන ලද්දේය. ඔසවන ලද ධජ පතාකාදියෙන් විසිතුරු කරන ලද්දේය. දැල්වෙන පහන්වැලි විසිතුරු සියලු දිශාභාග ඇත්තේය. වීදිබැස රියට නැග නැකැත්කෙළි විඳිනා මහජනයාගෙන් ගැවසුණේ වෙයි. මෙසේ නැකැත් දවස බැවින්ද හුන්නේ යයි කියත්. මෙසේ කියාද රජ කුලයට නම් හැමදා නැකැත්ය. මොහු නිදිවැරීම පිණිසම හුන්නේයයි සනිටුහන් කරන ලදී.

**උදානං උදානෙසි** යනු උදාන වාක්‍යයක් කීය. යම්සේ තෙලක් මිම්මක් ගැනීමට නොහැක්කේ ද වැගිරී යන්නේ ද එය ගලා යාමක් යයි කියනු ලැබේ. යම් ජලයක් පොකුණකට ගැනීමට නොහැක්කේද උතුරා යන්නේද එය ඔස යයි කියනු ලැබේ. එසේම යම් ප්‍රීති වචනයක් හදවතට ගන්ට නොහැක්කේද වැඩිවී ඇතුළත නොරැඳී පිටතට නික්මේද එය උදානයයි කියනු ලැබේ. එබඳු ප්‍රීතිමය වූ වචනයක් නිකුත් කළේය යන අර්ථයි. **දොසිනා** යනු දොස් පහවූ වලාකුළ, මීදුම, දුම, රැ ධූලි රාහු යන මේ උපක්ලේශයන්ගෙන් වියුක්ත යයි කියන ලද්දේ වෙයි. ඒ නිසා **රමණීයාති** ආදී ස්තුති වචන පස. ඒවා මහජනයාගේ සිත පිනවානුයි = රමණීයා කියන ලද දොසින් මිදුණු බැවින් සඳරැසින් බැබලුණු බැවින් අතිශයින් සුරූපීනුයි අභිරූපා. දැකිය යුත්තේනුයි - දසසනීයා. සිත පහදානුයි පාසාදිකා. දවස් මාස් ආදීන්ගේ ලකුණ වන්නට යුත්තේනුයි ලක්ඛඤ්ඤා. **කනනුබවජ්ජා** යනු අද කුමක්ද? **සමණංවා බ්‍රාහමණංවා** යනු

පව් සමනය කළ බැවින් සමණා. පව් බැහැර කළ බැවින් බ්‍රාහ්මණා. යං නො පයිරුපාසතො යනු මෙය වචන ව්‍යක්ත බවයි. අපගේ ප්‍රශ්න විචාරීම් වශයෙන් ඇසුරු කරන්නන්ගේ මිහිරි දහම් අසා චිත්තං පසීදෙය්‍ය සිත පැහැදෙන්නේය යනු අර්ථයි.

මෙසේ රජ මේ සියලු වචනයෙන් ඕභාස නිමිත්ත කර්මයක් කළේය. කවරකුට කළේද? ජීවකට. කුමක් සඳහාද? භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස. භාග්‍යවතුන් වහන්සේ දැකීමට තමාම යාමට නොහැක්කේද? එසේය. නොහැකිය. කුමක් හෙයින්ද? මහා අපරාධ කළ බැවිනි. භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක වූ ආර්ය ශ්‍රාවක වූ තමන්ගේ පියා වූ බිම්බිසාර රජු තමන් විසින් ම මරවන ලද්දේය. එබැවිනි. දේවදත්තද ඔහුම නිසා භාග්‍යවතුන් වහන්සේට බොහෝ අනර්ථ කළේය. මෙසේ එය මහා අපරාධයකි. ඒ මහා අපරාධ ඇති බැවින් තමාම යාමට නොහැක්කේය. ජීවක වනාහි භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයාය. ඔහුගේ පිට සෙවනැල්ලෙන් ඔහුගේ මුවාවෙන් භාග්‍යවතුන් වහන්සේ දකින්නෙමියි ඕභාස නිමිත්ත කර්මය කළේය. කිමෙක්ද ජීවක තෙමේ 'මාගේ මේ ඕභාස නිමිත්ත කර්මය දනීද? එසේය දනී. ඉක්බිති කුමක් හෙයින් නිහඬ වීද? වික්ෂේපය බිඳදමන පිණිසය. ඔවුන්ගේ එළඹ සිටි සිහිය වැඩී ඇත. ශාස්තෲන්ගේ බොහෝ උපස්ථායකයෝ රැස්ව සිටියාහ. ඔවුහු නොහික්මුණවුන් ඇසුරු කිරීමෙන් තුමූද නොහික්මුණෝය. ඔවුහු මා භාග්‍යවතුන් වහන්සේගේ ගුණකථාව ඇරඹූකල්හි වරින්වර නැගිට තමතමන්ගේ ශාස්තෲන්ගේ ගුණකථාව කියන්නාහුය. මෙසේ මාගේ ශාස්තෲ ගුණකථාව අවසානයට නොයන්නේය. රජතෙමේ මේ කුලුපගයන් වෙත එළඹ ගන්නා ලද ස්ථවිරභාව ඇති හෙයින් ඔවුන්ගේ ගුණකථාවෙන් නොසතුටු වී මා විචාරන්නේය. එවිට මම විකෂේප නොවී ශාස්තෲ ගුණ කියා රජු ශාස්තෲන් සමීපයට ගෙන යන්නෙමියි දන්නේම විකෂේපය සිඳදැමීම පිණිස නිහඬ විය. ඒ ඇමතියෝද මෙසේ සිතුහ. අද රජතුමා පස් පදයකින් රාත්‍රිය වර්ණනා කරන්නේය. ඒකාන්තයෙන් කිසියම් ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු කරා එළඹ ප්‍රශ්න අසා ධර්මය අසනු කැමැත්තේය. ඔහු ධර්මය අසා පැහැදෙන අයකුට මහත් සත්කාර කරන්නේය. කුලුපග ශ්‍රමණයෙක් වේනම් හේ රාජ කුලුපග වෙයි. එය ඔහුට යහපතකි. මෙසේ සිතා 'මම මාගේ කුලුපග ශ්‍රමණයාගේ ගුණ කියා රජු ගෙන යන්නෙමි. මම යන්නෙමියි තම තමාගේ කුලුපගයන්ගේ

ගුණ කියන්ට ඇරඹූහ. එහෙයින් කීහ. **එවං වුත්තෙ අඤ්ඤතරො රාජාමච්චො** මෙසේ කී කල්හි එක්තරා රජ ඇමතියෙක්.

එහි **පූරණො** යනු ශාස්තෘ ප්‍රතිඥාත වූ ඔහුගේ නමයි. **කස්සපො** යනු ගෝත්‍රයයි. ඔහු එක්තරා කුලයක අනූනවයක් වූ ද දාසයන් සම්පූර්ණ කරමින් උපන්නේය. එයින් ඔහුට පූරණ යයි නමක් තැබූහ. මඟුල් දාසයා බැවින් ඔහු කළ දෙය දුෂ්කෘත යයි කියන්නෙක් නැත. නොකළ දෙය නොකළ දෙයකැයි කියන්නෙක්ද නැත. හේ මා මෙහි වසන්නේ කුමටදැයි පලාගියේය. ඉක්බිති සොරු ඔහුගේ වස්ත්‍ර උදුරාගත්හ. හේ කොළවලින් හෝ තණවලින් වසාගන්ට නොදන්නේ උපන් අයුරින්ම එක් ගමකට පිවිසියේය. මිනිස්සු ඔහු දැක 'මේ ශ්‍රමණයා අල්පේච්ඡය. රහත්ය. මොහු හා සමානයෙක් නැතැයි කැවුම් බත් ආදිය ගෙන ඔහු වෙත එළඹුණහ. හේ මා වස්ත්‍ර නොහැඳි බැවින් මෙය උපන්නේ යැයි එතැන්පටන් රෙද්දක් ලැබද නොහැන්දේය. එයම පැවිද්ද සේ ගත්තේය. ඔහුගේ සමීපයෙහි තව තවත් පන්සියයක් මිනිස්සු පැවිදි වූහ. ඒ සඳහා කීය. පූරණ කස්සප යනුවෙන් පැවිදි සමූහයයි කියන ලද සංඝයා ඔහුට ඇත්තේනුයි = සංඝී. එම ගණයම ඔහුට ඇත්තේනුයි = ගණී. ආචාර හික්මීම් වශයෙන් ඒ ගණයාට ආචාර්යයානුයි - ගණාචරියො. **ඤාතො** යනු ප්‍රසිද්ධ, ප්‍රකට. 'අල්පේච්ඡය. ලද දෙයින් සතුටු වන්නේය. අල්පේච්ඡතාව නිසා වස්ත්‍රයක්වත් නො හඳිතියි මෙසේ නැගුණු යසසක් ඔහුට ඇත්තේනුයි = යසස්සී. **තිත්ථකරො** ලද්ධි ඇති කරන්නේ. **සාධු සම්මතො** 'මොහු යහපත් සොඳුරු සත්පුරුෂයෙකැයි මෙසේ සම්මත වූයේ. **බහුජනස්ස** යනු නූගත් අඳබාල පෘථග්ජනයාට පැවිද්දෙහි පටන් ඉක්මීගිය බොහෝ රාත්‍රී දනිතියි, **රත්තඤ්ඤූ** දිගුකල් පැවිද්දක් ඔහුට ඇත්තේනුයි **චිරපබ්බජිතො**. පැවිදිවැ නොබෝකල් ඇත්තහුගේ කථාව විශ්වාස කළයුතු නොවේ. එහෙයින් කීහ. **චිරපබ්බජිතො** යනුවෙන්. **අද්ධගතො** දිගුකල් ගිය. රාජ පරම්පරා දෙකතුනක් ඉක්මගිය අදහසයි. **වයො අනුප්පත්තො** පශ්චිම වයසට පත්. මේ දෙකම 'තරුණයාගේ කථාව විශ්වාස කළයුතු නොවේ' යන්න සඳහා කියන ලදී.

**තුණ්හී අහොසි** යනු රත්වන් මිහිරි රසයෙන් යුත් අඹ පලයක් කනු කැමැති පුරුෂයා ගෙනවුත් අත තබන ලද කදුරු ගෙඩියක් දැක මෙන් ධ්‍යාන අභිඥා ආදී ගුණයෙන් යුතු ත්‍රිලක්ෂණයෙන් මුසු මිහිරි දහම් කථාව අසනු කැමැත්තේ පෙර පූරණගේ දසුනෙන්ද නොසතුටට පත්

තැනැත්තේ දැන් ගුණකථාවෙන් නොසතුටට පත්වූයේ වී නිහඬ විය. නොසතුටට පත්වූයේම 'යම්හෙයකින් මොහුට තර්ජනය කොට බෙල්ලෙන් ගන්වා ඇද දමන්නෙමියි. යමෙක් යමෙක් කථා කරයිද, රජතෙමේ ඒ ඒ අයට මෙසේ කරතියි බිය වූයේ අන් කිසිවෙක් කිසිවක් නොකියන්නේ යයි අමනාප වූයේ කථාව ඉවසා නිහඬ වූයේම ය.

ඉක්බිති තවකෙක් 'මම තමාගේ කුලුපගයාගේ ගුණ කියන්නෙමියි සිතා කියන්ට පටන් ගත්තේය. එහෙයින් කියන ලදී. අඤ්ඤතරොපිඛො ආදිය. ඒ සියල්ල කියන ලද පරිදි දතයුතුය. මෙහි මක්ඛලී යනු ඔහුගේ නමයි. ගවහලක උපන් බැවින් ගොසාල යනු දෙවැනි නමයි. ඔහු මඩ සහිත බිමෙහි තෙල් කළයක් රැගෙන යනවිට 'දරුවා මා බලි - වැටෙන්න එපා' යයි ස්වාමියා කීය. ඔහු පමාවෙන් පැකිලී වැටී ස්වාමියාට බියෙන් පළායාමට පටන් ගත්තේය. ස්වාමියා පසුපසින් දුවගොස් රෙදි කොනින් අල්ලා ගත්තේය. හේ සළුව අතහැර දමා නිර්වස්ත්‍රව පළාගියේය. සෙස්ස පූරණ හා සමානය.

අජිතො යනු ඔහුගේ නමයි. කෙස් කම්බිලියක් දරානුයි කෙස කම්බලී මෙසේ නම් දෙක සසඳ අජිත කෙසකම්බල යයි කියනු ලැබේ. එහි කෙස් කම්බිලිය මිනිස් කෙසින් කරන ලද්දකි. ඊට වැඩි ගනකමක් ඇති වස්ත්‍රයක් නම් නැත. යම්සේ කීය. මහණෙනි, යම් නූලෙන් වියන ලද වස්ත්‍රයෝ වෙත්ද, කෙස් කම්බිලිය ඒ අතර ඝනයයි කියනු ලැබේ. මහණෙනි, කෙස් කම්බිලිය සීත කාලයට ශීතලය. උෂ්ණ කාලයට උෂ්ණය. අගය අඩුය. රළු පහස ඇත්තේය. දුර්වර්ණය. දුර්ගන්ධය.

පකුධො යනු ඔහුගේ නමයි. කච්චායනො යනු ගෝත්‍රයයි. මෙසේ නම්ගොත් සසඳ පකුධ කච්චායන යයි කියනු ලැබේ. මොහු සිසිල් ජලය ප්‍රතික්ෂේප කර ඇත්තේය. මලපහකොට ජලයෙන් සේදීමක් නොකරයි. උණුදිය හෝ කැඳ හෝ ලැබ කරයි. නදියක් හෝ මහමග ඇති ජලයක් හෝ පාගා 'මාගේ ශීලය බිඳුණේය'යි වැල්ලෙන් ස්තූපයක් කොට සිල් අධිෂ්ඨාන කොට යයි. මොහු මෙබඳු අගයක් නැති ලබ්ධියක් ඇත්තෙකි.

සංජයො යනු ඔහුගේ නමයි. බෙලට්ඨගේ පුත්‍රයානුයි - බෙලට්ඨපුත්ත. 'අපට සුවඳ කෙලෙස් හෝ බාධා කරන කෙලෙස් හෝ නැත. අපි කෙලෙස් ගැට නැත්තෝ වෙමුයි මෙවන් වාදයක් ඇත්තකු

බැවින් ලද නම් වශයෙන් නිගණ්ඨ විය. නාතගේ පුත්‍රයානුයි නාත පුතෙතා.

අථඛොරාජා යනු රජතෙමේ ඔවුන්ගේ වචන අසා මෙසේ සිතීය. 'මම යම් යම් අයකුගේ වචන නොඅසනු කැමැත්තෙම්ද, ඒ ඒ පුද්ගලයෝම අදහස් දක්වති. යමකුගේ වචන අසන්ට කැමැත්තෙම්ද හෙතෙමේ නාග භවනට පත්ව සිටි ගුරුළා මෙන් නිහඬය. මෙය මට ඒකාන්තයෙන් අනර්ථයෙකි. ඉක්බිති ඔහුට මෙසේ අදහසක් පහළවිය. ජීවක උපශාන්ත වූ බුදු වූ භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයෙකි. මම උපශාන්ත වෙමි. ඒ නිසා වත්සම්පන්න භික්ෂුව මෙන් නිශ්ශබ්දවම සිටියේ මොහු මා නොකියන කල්හි කියන්නේය. ඇතා පාගන කල්හි ඇතාගේම කකුල අල්ලා ගතයුතුයයි ඔහු සමග මන්ත්‍රණය කිරීමට පටන් ගත්තේය. එහෙයින් කියන ලදී. අථඛොරාජා -පෙ- කිංතුණ්හී යනුවෙන්. එහි කිංතුණ්හී යනු කුමන කරුණක් නිසා නිහඬව සිටීද? තම තමන්ගේ කුලූපග ශ්‍රමණයාගේ ගුණ කියන මේ ඇමතියන්ගේ මුව ප්‍රමාණවත් නොවේ. යම්සේ මොවුන්ට මෙසේ නම් ඔබට කුලූපග ශ්‍රමණයකු නැත්තේ ඇයි? ඔබ දිළින්දෙක්ද? මාගේ පියා විසින් ඔබට ධනය නොදෙන ලද්දේ ද නැතහොත් ශ්‍රද්ධාව නැත්තේදැ'යි විචාරයි.

ඉක්බිති ජීවකට මෙසේ සිතිණ. මේ රජ මාගේ කුලූපග ශ්‍රමණයාගේ ගුණ කියවයි කියයි. දැන් මා නිහඬව සිටිය යුතු වේලාව නොවේ. මොවුහු රජු වැඳ හුන්නේම තමාගේ කුලූපග ශ්‍රමණයාගේ ගුණ කියැවූ සේ මාගේ ශාස්තෲන් වහන්සේ ගේ ගුණ කීම යුතු නොවේයයි හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඩවසන වෙහෙර දෙස බලා පසඟ පිහිටුවා වැඳ නිය දහය එක් කිරීමෙන් බබලන දිලෙන ඇඳිලිය බැඳගෙන 'මහරජතුමනි, මා ගැන මෙසේ නොසිතනු මැනවි. මොහු ඕනෑම ශ්‍රමණයකු කරා එළඹෙයි. මාගේ ශාස්තෲන් වහන්සේ මව්කුසට බස්නා කල, මව්කුසින් නික්මෙන කල, මහබිනික්මන් කරන කල, සම්බෝධියට පත්වන කල, දම්සක් පවත්වන කල, දසදහසක් ලෝකධාතු කම්පා විය. යමක මහා ප්‍රාතිහාර්යය කළ සේක. දේවෝරෝහණයද එසේය. මාගේ ශාස්තෲන් වහන්සේගේ ගුණ කියන්නෙමි. එකඟ කර ගත් සිතින් අසව මහරජ යයි කියා අයං දෙව භගවා අරහං සමමා සමබුධො යනාදිය කීය.

**එහි තං ඛොපන භගවන්තං** යනු ඉත්‍ථම්භූතාර්ථයෙහි කර්මපදයයි. ඒ භාග්‍යවතුන් වහන්සේගේ යන අර්ථයි. **කල්‍යාණො** යනු කලණ ගුණයෙන් යුත්. ශ්‍රේෂ්ඨ යයි කියන ලද්දේ වෙයි. **කිත්තිසද්දො** යනු කීර්තියමය. ස්තුති ඝෝෂාව හෝ වෙයි. **අබ්භුග්ගතො** යනු දෙවියන් සහිත ලෝකය වසාගෙන නැගේය. කුමක්ද? **ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො -පෙ- බුද්ධො භගවා** යනුවෙන්. මේ එහි පද සම්බන්ධයයි. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද අරහං නම් වන සේක. මෙසේද සම්මා සම්බුද්ධ වන සේක. -පෙ- මෙසේද භාග්‍යවත් වන සේකැයි මේ මේ කාරණයෙන් යැයි කියන ලද්දේ වෙයි.

එහි 'කෙලෙස් සතුරන්ගෙන් ඈත් වූ බැවින්, කෙලෙස් අර නැසූ බැවින්, ප්‍රත්‍යයන්ට සුදුසු බැවින්, රහසින්වත් පව් නොකරන බැවින් භාග්‍යවත් වෙතියි මේ කරුණුවලින් ඒ භාග්‍යවතුන් වහන්සේ අරහං යයි දතයුතුයයි ආදී ක්‍රමයෙන් මාතෘකාව බහා මේ සියලුපද විශුද්ධි මාර්ගයෙහි බුද්ධානුස්සති නිර්දේශයෙහි කියන ලදී. එහි විස්තර එතැනින් දතයුතුය. ජීවක එක් එක් පදයෙහි අරුත් නිමවා 'මහරජ, මාගේ ශාස්තෘන් වහන්සේ මෙසේ අරහං වෙති. මෙසේ සම්මා සම්බුද්ධ වෙති. -පෙ- මෙසේ භගවා නම් වෙතියි කියා **තං දෙවො භගවන්තං පයිරුපාසතු අප්පෙව නාම දෙවස්ස භගවන්තං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍ය** දේවයන් වහන්සේ ඒ භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කළ මැනවි. භාග්‍යවතුන් වහන්සේ ඇසුරුකරන දේවයන් වහන්සේගේ සිත පහදවා ගන්නේ නම් මැනවි'යි කීය. මෙහි ද **තංදෙවො පයිරුපාසතු** යි කියන්නේ, 'මහරජතුමනි, ඔබ වැන්නවුන්ට ප්‍රශ්න සියයක් දහසක් දසදහසක් ඇසුවත් මාගේ ශාස්තෘන් වහන්සේට සියල්ල සිතට ගෙන කියන්ට ශක්තියද බලයද ඇත. විශ්වාස සහිතව එළඹ අසනු මැනව මහරජතුමනි'යි කීය.

භාග්‍යවතුන් වහන්සේගේ ගුණකථාව අසන රජුගේ සියලු සිරුර පස්වණක් ප්‍රීතියෙන් නිරතුරුව පිරී ගියේය. හේ එකෙණෙහිම යනු කැමැත්තේ වී 'මේ වේලාවෙහි මා දසබලධාරීන් වහන්සේ හමුවට යනවිට ජීවක හැර අන්කිසිවෙක් රිය යෙදවීමට නොහැකිය'යි සිතා **තෙනහි සම්ම ජීවක හත්‍ථියානානි කප්පාපෙහි** මිත්‍ර ජීවක එසේනම් ඇත් යානා සදවයි කීය.

එහි තෙනහි යනු යෙදවීමේ අර්ථයෙහි නිපාතයකි. 'මිත්‍ර ජීවක, යන්නැ'යි කියන ලද්දේ වෙයි. **හත්ථියානානි** යනු නොයෙක් අශ්වරථ ආදී යානාවන් තිබුණත් හත්ථියානය උතුම්ය. උත්තමයකු හමුවට උතුම් යානයෙන්ම යා යුතුමය. අශ්වයාන රථයාන ශබ්ද සහිතය. ඒවායෙහි ශබ්දය දුරට ඇසෙයි. හත්ථියානය පසුපසින් යන්නෝද ශබ්දය නොඇසත්. නිවුණා වූ භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයට නිහඬ යානයන්ගෙන් යා යුතුයයි සිතා **හත්ථියානානි** යයි කීය.

**පඤ්ච මත්තානි හත්ථිකාසතානි** යනු ඇතින්නන් පන්සියයක් **කප්පාපෙත්වා** නැගීමට සුදුසුකොට පිළියෙල කරවා. **ආරෝහණීයං** යනු නැගීමට සුදුසු රාජකීය හස්තියා යන අර්ථයි. මොහු රජු විසින් කියන ලද දේ කළේද. අවුත්තං යනු? නොකියූ දේ. කුමක් හෙයින්ද? පණ්ඩිත වූ බැවින්. ඔහුට මෙසේ සිතිණ. රජ මේ වේලාවේ යම්'යි කියයි. රජවරු නම් බොහෝ සතුරන් ඇත්තෝය. යම් හෙයකින් අතරමග කිසියම් අනතුරක් වේද, මම ද ගරහන්නෝය. 'ජීවක තෙමේ රජු මට කී දේ ගනී යයි නොකල්හිද රජු ගෙන නික්මෙයි'. භාග්‍යවතුන් වහන්සේටද මෙසේ ගරහන්නෝය.' ශ්‍රමණ ගෞතමයන් වහන්සේ 'මට කථාවක් පවතී' යයි කල් නොසලකාම කථා කරති'යි ඒ නිසා 'මට වත් භාග්‍යවතුන් වහන්සේටවත් ගර්හාවක් නූපදින සේ රජුගේ ආරක්ෂාව මනා සේ ඇතිවේද එසේ කරන්නෙමි'යි එයින් 'ස්ත්‍රීන් නිසා පුරුෂයින්ට බියක් නම් නැත. ස්ත්‍රීන් පිරිවරා සැපසේ යන්නේ යයි ඇතින්නන් පන්සියයක් සරසවා පන්සියයක් ගැහැණුන් පිරිමි වෙස් ගන්වා 'කඩු තෝමර ගත් අත් ඇතිව රජු පිරිවරා සිටිවු' යයි කියා නැවත මෙසේ සිතීය. 'මේ රජුට මේ ආත්මභාවයෙහි මාර්ගඵල උපනිශ්‍රය සම්පත් නැත. බුදුවරුද උපනිශ්‍රය බලාම දහම් දෙසති. මම දැන් මහජනයා රැස් කරවමි. මෙසේ ඇතිකල්හි කාගේ හෝ උපනිශ්‍රයෙන් දහම් දේශනා කරන සේක. එය මහජනයාට උපකාර පිණිස වන්නේය. ඔහු ඒ ඒ තැනට හසුන් යැවීය. බෙර හැසිරවීය. 'අද රජතුමා භාග්‍යවතුන් වහන්සේ හමුවට යයි. සියලුදෙන තම තමාට හැකි අයුරින් රජුට ආරක්ෂාව සපයත්වා' යනුවෙන්. ඉක්බිති මහජනයා මෙසේ සිතූහ. 'රජතුමා භාග්‍යවතුන් වහන්සේ දැකීමට යයි. ධර්ම දේශනාව කෙබන්දක් වන්නේද. අපට නැකැත්කෙළියෙන් කම්නැතැ'යි සියලුදෙන ගඳමල් ආදිය ගෙන්වාගෙන රජුගේ පැමිණීම අපේක්ෂාවෙන් මහමග සිටියාහුය. ජීවකද රජුට මෙසේ දැන්වීය. **කප්පිතානි බො තෙ දෙව හත්ථියානානි. යස්සදානි කාලං මඤ්ඤසි** එහි **යස්සදානි කාලං මඤ්ඤසි**

යනු මෙය උපචාර වචනයකි. මෙය කියන ලද්දේ වෙයි. යමක් ඔබ විසින් අණ කරන ලද්දේ ද, එය මා විසින් කරන ලදී. දැන් යාමට හෝ ඒමට කාලයයි සිතා නම් එයම තමාගේ කැමැත්තට අනුව කරන්න.

**පචෙචකා ඉත්ථියො** යනු ස්ත්‍රීහු වෙන් වෙන්ව. එක් එක් ඇතින්නට එක් එක් ස්ත්‍රියක් යයි කියන ලද්දේ වෙයි. **උක්කාසු ධාරියමානාසු** දඬුවැට පහන් දරනු ලබන කල්හි. **මහච්චරාජානුභාවෙන** මහත් රාජ ආනුභාවයෙන්. **මහච්චා** යනුද පෙළක් ඇත. මහත් වූ යන අර්ථයි. එය ලිංග විපර්යාසයයි. **රාජානුභාවො** යනුවෙන් කියැවෙන්නේ රාජ සෘද්ධියයි. මේ රාජසෘද්ධිය කාගේද? තුන්සියයක් යොදුන් රාජ්‍ය දෙකක ඓශ්වර්ය ශ්‍රීයයි. ඔහුට අසුවල් දිශාවෙන් රජතුමා තථාගතයන් වහන්සේ වෙත එළඹෙන්නේ යයි පළමුව සංවිධානයක් නැතිකල්හිද එකෙණෙහිම පන්සියයක් ස්ත්‍රීන් පිරිමි වෙස් ගෙන හිස් වැසුමෙන් වෙන්ව, අංශයෙහි තබාගත් කඩු ඇතිව, මිණිදඬු පැහැගත් තෝමර ගෙන නික්මුණාහුය. ඒ සඳහා කියන ලදී. **පචෙචකා ඉත්ථියො. ආරොපෙත්වා** යනුවෙන්. තවද සොළොස් දහසක් ක්‍ෂත්‍රිය නාටක ස්ත්‍රීහු රජු පිරිවරා සිටියහ. ඔවුන්ගේ කෙළවර කුදු මිටි වැදි ආදීහු සිටියහ. ඔවුන්ගේ කෙළවර අන්තඃපුර රක්නා විශ්වාසවත් පුරුෂයෝ සිටියහ. ඔවුන්ගේ කෙළවර විචිත්‍ර වෙස් ගත් සැටදහසක් පමණ මහ ඇමතිවරු ඔවුන්ගේ කෙළවර විවිධ අලංකාරයන්ගෙන් යුක්ත නානාප්‍රකාර ආයුධ ගත් ඇත් ඇති විද්‍යාධර තරුණයන් වැනි අනූදහසක් පමණ රාෂ්ට්‍රපුත්‍රයෝ ඔවුන්ගේ කෙළවර සියදහසක් අගනා ඇඳුම් හැඳ පන්සියයක් අගනා උතුරුසළු ඒකාංශකොට නහා සුවඳ ගැල්වූ රන්දම් ආදී නානා ආභරණයෙන් සෝභමාන වූ දසදහසක් පමණ බ්‍රාහ්මණයෝ දකුණු අත ඔසවා ජය ඝෝෂා කරමින් යති. ඔවුන්ගේ කෙළවර පංචාංග තූර්ය භාණ්ඩය. ඔවුන්ගේ කෙළවර දුනුපෙළින් වටකරන ලද්දේය. ඔවුන්ගේ කෙළවර ඇත් සමූහය. ඇතුන්ගේ කෙළවර ගෙලෙන් ගෙල ගැටෙන අශ්ව පන්තියයි. අශ්වයන්ගේ කෙළවර එකටෙක ඇඳුණු රථ. ඔවුන්ගේ කෙළවර තම තමන් අනුරූප වූ අබරණ සම්පතින් බබලන දහඅටක් සේනා නායකයෝ. මෙසේ යම්සේ පර්යන්තයෙහි සිට විදි ඊතලය රජු වෙත නො පැමිණේද මෙසේ ජීවක කෝමාර භච්ච රජුගේ පිරිස සංවිධානකොට තමා රජුට නුදුරින් යයි. කිසියම් උවදුරක් වේනම් සියල්ලට පළමුව රජුගේ ජීවිත දානය දෙන්නෙමියි. පන්දම් සියයක්ය දහසක්ය. සියදහසක්ය යනුවෙන් වෙන් කිරීමක් නැත. එබඳු රාජසෘද්ධිය සඳහා

කියන ලදී. මහච්ච රාජානුභාවෙන යෙන ජීවකස්ස කොමාර භච්චස්ස අම්බවනං තෙනුපායාසි යනුවෙන්.

අහුදෙව භයං යනු මෙහි සිතෙහි භය ඤාණ භය, ආරම්මණ භය, ඔත්තප්ප භය යයි භය සිව් වැදෑරුම්ය. එහි ජාතිය නිසා ඇතිවන භය භයානකය'යි කී ක්‍රමයෙන් කියන ලද සිතෙහි භය නම්. 'ඔවුහුද තථාගතයන් වහන්සේගේ ධර්මදේශනාව අසා බෙහෙවින් භයට සංවේගයට සන්ත්‍රාසයට පැමිණෙත් යනුවෙන් පැමිණි භය ඤාණ භය නම්. මෙසේ ඒකාන්තයෙන් 'භයානකත්වය පැමිණේ' යයි මෙහි කියන ලද ආරම්මණ භය නම්.

හිරිං පසංසන්ති නහි තත්‍ථ සූරං
භයාහි සන්තො නකරොන්ති පාපං

නිවටයා පසසති - සූරයා නොපසසති
නිවුණු ඉඳුරන් ඇත්තෝ - බිය නිසා පව් නොකරති.

මෙය ඔත්තප්ප භය නම්. ඒ අතර මෙහි චිත්ත සන්ත්‍රාස භයයි. අහු විය යන අර්ථයි. ඡම්භිතත්තං යනු තැතිගත් බව. සියලු සිරුර සසලවීම යන අර්ථයි. මේ රෝමෝද්ගමය ධර්මශ්‍රවණ ආදී තන්හි ප්‍රීතිය උපන්විට ප්‍රීතියෙන්ද වෙයි. භයස්වරූප ඇත්තවුන්ට යුද්ධ පිශාච ආදීන් දැක්මෙහිදී ඇතිවන බියෙන්ද වෙයි. මෙහි බය නිසා ඇතිවන රෝමෝද්ගමය දතයුතුය.

මේ භීතො යනු කුමක් නිසාද? අන්ධකාරයෙන් යැයි සමහරු කියති. රජගහ නුවර මහදොර තිස්දෙකක් ඇත. කුඩා දොර හැටහතරක් ඇත. ජීවකගේ අඹ වනය ප්‍රාකාරයටද ගිජ්ඣකූටයද අතර වෙයි. හෙතෙමේ පෙරදිගු දොරින් නික්ම පර්වතයෙහි සෙවනට පැමිණියේය. එහි පර්වත මුදුනින් චන්ද්‍රයා වැසී තිබිණ. පර්වතයෙහි සෙවනින්ද රුක් සෙවනින්ද අන්ධකාරය විය. එය කරුණක් නොවේ. එදින සියදහසකැයි පන්දම් ගණනක් නැත. මෙය වනාහි අල්ප ශබ්ද ඇති බැවින් ජීවක කෙරෙහි සැක ඇති බැවින් බියට පත්විය. ජීවක ඔහුගේ පහයෙහි ඉහළ මහලෙහිදීම දැන්විය. 'මහරජතුමනි, භාග්‍යවතුන් වහන්සේ අල්ප ශබ්දයට කැමති සේක. අල්ප ශබ්ද ඇතිවම එළඹිය යුතුය.' ඒ නිසා රජ තූර්ය

ශබ්දය වැළැක්වීය. තූර්යභාණ්ඩ හුදෙක් ගැනීම පමණක්ම විය. වචනද උස්හඬින් උච්චාරණය නොකරමින් අසුරු සංඥාවෙන් එත්. අඹ වනයෙහිද කිසිවකුගේ කහින ශබ්දයක්වත් නොඇසේ. රජවරු ද ශබ්දයෙහි ඇලුණෝම වෙති. හෙතෙමේ එම අල්ප ශබ්ද ඇති බව නිසා කලකිරුණේ ජීවක කෙරෙහිද සැක ඉපදවීය. 'මේ ජීවක මාගේ අඹ වනයෙහි භික්ෂූහු හයදහස් පන්සියයක් ඇතැයි කීය. මෙහිද කහින ශබ්ද මාත්‍රයක්වත් නොඇසේ. මෙය නොවිය හැකි දෙයකැයි සිතමියි කියා මා නගරයෙන් පිටකරවා පෙරටුව බලකාය රඳවා මා අල්ලාගෙන තමාගේ සේසත ඔසවනු කැමැත්තේය. මොහුද ඇතුන් පස්දෙනෙකුගේ බලය දරයි. මාගේ ළඟින්ම යයි. මාගේ සමීපයෙහි ආයුධ ගත් ඇති එක් පුරුෂයෙක්වත් නැත. 'අහෝ මා හට අනර්ථයෙකැයි මෙසේ බියට පත්ව නොබිය වූවකු ලෙස සිටීමටද නොහැකි විය. තමා බිය බව ඔහුට කීය. එහෙයින් කියන ලදී. අථඛො රාජා -පෙ- නි නිගෙඝාසො යැයි.

එහි සමම යනු මිත්‍ර සල්ලාපයකි. මට මිත්‍රයාට කවරෙක්ද යනු කියන ලද්දේ වෙයි. න පලමෙහසි යමක් නැද්ද එය ඇතැයි කියා මා නොරවටන්නේද? නිගෙඝාසො යනු කථා සල්ලාපයෙහි නිහඬ බවයි. මාභායි මහාරාජ යනු ජීවක තෙමේ 'මේ රජ මා නොදනී. මොහු අනුන් ජීවිතයෙන් වෙන් නොකරයි' කියා යම්හෙයකින් අස්නොවැසුවොත් විනාශයට පත් වන්නේ යයි සිතා දැඩිකොට අස්වසන්නේ මාභායි මහාරාජ යයි කියා නතංදෙව ආදිය කීය.

අභික්කම යනු ඉදිරියට යන්න. යන්න පිවිසෙන්න යන අර්ථයි. වරක් කියූවිට දැඩි නොවේ යයි තදින් දෙවරක් කීය. එතෙ මණ්ඩලමාලෙ දීපා ඣායන්ති යනු මහරජ, චෝර බලය පහන් දල්වා නොසිටියි. මේ මණ්ඩල මාලයෙහි පහන් දැල්වෙයි. මේ පහන් සංඥාවෙන් යන්න මහරජ'යි කියයි.

නාගසස භූමි යනු යම්තැනක ඇතුපිට නැගී යාහැකිද එය නාගභූමි නම්. නාගා පච්චොරොහිත්වා යනු විහාරයෙහි පිටත දොර කොටුවෙහි ඇතුපිටින් බැස බිම පිහිටි සම කාලයෙහිම භාග්‍යවතුන් වහන්සේගේ තේජස රජුගේ සිරුර පුරා පැතිර ගියේය. ඉක්බිති එකෙණෙහිම මුළු සිරුරින් ඩහදිය වැගිරිණ. ඇඳුම් තෙමී ඉවත් කළයුතු සේ විය. තමාගේ අපරාධය සිහි කළේය. මහ බියක් උපන. හේ සෘජුව භාග්‍යවතුන් වහන්සේ

සමීපයට යන්ට නොහැක්කේ ජීවකයා අල්ලා ගෙන ආරාම චාරිකාවෙහි හැසිරෙන්නාක් මෙන් 'මිත්‍ර ජීවක මෙය ඔබ කළ හොඳ දෙයකි. හොඳ දෙයකියි විහාරයෙහි ගුණ කියමින් අනුක්‍රමයෙන් **යෙන මණ්ඩල මාලසස ද්වාරං තෙනුපසංකම් පැමිණියේය** යන අර්ථයි. **කහං පන සමම** යනු කෙසේ ඇසීද? සමහරු 'නොදැන' යයි කියති. 'මොහු තරුණ කල්හි පියා සමග පැමිණ භාග්‍යවතුන් වහන්සේ දුටු විරූය. පසුව පාපමිත්‍ර ආශ්‍රයෙන් පියා මැරීම සිදුකොට සොරුන් යවා ධනපාල හස්තියා මුදාහරවා මහා අපරාධකාරයකු වී භාග්‍යවතුන් වහන්සේ හමුවීමට නොආ විරූයයි නොහැඳින විචාරයි. එය කරුණක් නොවේ. භාග්‍යවතුන් වහන්සේ උතුම් ලක්ෂණයන්ගෙන් ආකීර්ණව අනුබ්‍යඤ්ජනයෙන් සැරසී සවණක් රැසින් මුළු ආරාමය බබුළුවා තරු ගණයා පිරිවැරූ පූර්ණ චන්ද්‍රයා මෙන් භික්ෂු ගණයා පිරිවරා මණ්ඩල මාලය මැද වැඩහුන් සේක. එය කවරෙක්නම් නොදනීද? මොහු වනාහි තමාගේ ඓශ්වර්ය ලීලාවෙන් අසයි. මෙය රාජකුලයන්ගේ ස්වභාවයයි. යමක් දැනගෙනද නොදන්නවුන් මෙන් අසත්.

ජීවක ඒ අසා 'මේ රජ පොළොවේ සිටගෙන පොළොව කොහේදැයි අසයි. අහස දෙස බලා සඳහිරු කොහිදැයිද, මහමෙර පාමුල සිට කියන්නාක් මෙන් දසබලධාරීන් වහන්සේ ඉදිරියේ සිට භාග්‍යවතුන් වහන්සේ කොහිදැයි අසයි. මොහුට දැන් භාග්‍යවතුන් වහන්සේ දක්වමියි භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට ඇඳිලි ප්‍රණාමය කොට **එසො මහාරාජ** ආදිය කීය. **පුරකඛතො** යනු පිරිවරා හුන්නහුගේ ඉදිරියේ හුන්නේය.

**යෙන භගවා තෙනුපසංකමි** යනු භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට ගියේය. භාග්‍යවතුන් වහන්සේ සමීපයට එළැඹියේය යන අර්ථයි. **එකමනතං අටඨාසි** භාග්‍යවතුන් වහන්සේ හෝ භික්ෂු සංඝයා හෝ නොගටමින් තමන්ට සිටීමට නුසුදුසු එක් පෙදෙසක භාග්‍යවතුන් වහන්සේ වැඳම සිටියේය.

**තුණහී භූතං තුණහීභූතං** යනු යම් යම් තැනක් බලයිද ඒ ඒ තැන නිහඬ බව යන අර්ථයි. එහි එක් භික්ෂුවකගේවත් අත් සෙලවීමක් හෝ පා සෙලවීමක් හෝ නැත. සර්වාලංකාරයෙන් සැරසී නළුවන් පිරිවරා, භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සිටි රජු හෝ රජ පිරිස හෝ දෙස එක්

භික්ෂුවක්වත් නොබැලීය. සියල්ලෝ භාග්‍යවතුන් වහන්සේ දෙසම බලමින් හුන්හ. රජතෙමේ ඔවුන්ගේ උපසමයෙහි පැහැදී මඩ පහවීම නිසා පැහැදුණු පොකුණ මෙන් ප්‍රසන්න ඉඳුරන් ඇති භික්ෂු සංඝයා දෙස යලි යලිත් බලා උදානං උදානෙසි එහි ඉමිනා යනු යම් කායික වූද වාචසික වූද මානසික වූද ශීල උපසමයෙන් භික්ෂු සංඝයා උපශාන්තය ඉමිනා උපසමෙන යයි දක්වයි. එහි 'මාගේ පුත්‍රයා පැවිදිව මේ භික්ෂූන් මෙන් උපශාන්ත වන්නේ නම් මැනවැයි ඔහු මෙසේ කීවේ ඒ සඳහා නොවේ. මොහු භික්ෂු සංඝයා දැක පැහැදුණේ පුත්‍රයා සිහි කළේය. දුලබ දෙයක් ලැබ ආශ්වර්යවත් දෙයක් දැක ප්‍රිය වූ ඥාති මිත්‍රයන් සිහිවීම ලෝකයාගේ ස්වභාවයයි. මෙසේ භික්ෂු සංඝයා දැක පුත්‍රයා සිහිකරමින් ඔහු මෙසේ කීය. කුමක් නිසා මෙසේ කීයේද? පුත්‍රයා කෙරෙහි සැකයෙන් ඔහුගේ උපසමය කැමැත්තෙන් ඔහු මෙසේ කීය. ඔහුට මෙසේ සිතිණ. 'මාගේ පුතා මෙසේ අසන්නේය. 'මගේ පියා තරුණය. මාගේ මුත්තා කොහිද? හේ ඔබගේ පියා විසින් ඔහු මරන ලද්දේ යයි අසා 'මම ද පියා මරා රජය කරන්නෙමියි හඟින්නේය' මෙසේ පුත්‍රයා කෙරෙහි සැකයෙන් ඔහුගේ උපසමය කැමැත්තෙන් ඔහු මෙසේ කීය. මෙසේ කීවේ ඇයි? පසුව පුත්‍රයා ඔහු ඝාතනය කළේමය. ඒ වංශයෙහි පියා මැරීම පරම්පරා පහක්ම ගියේය. අජාත සත්තු බිම්බිසාර මැරීය. උදය අජාත සත්තු මැරීය. ඔහුගේ පුත්‍රයා වූ මහාමුණ්ඩ උදය මැරීය. අනුරුද්ධ මහාමුණ්ඩ මැරීය. ඔහුගේ පුත්‍රයා වූ නාගදාස අනුරුද්ධ මැරීය. මේ රජවරු වංශය විනාශ කරන්නෝය. මොවුන්ගෙන් ඇති ප්‍රයෝජනය කුමක්දැයි රටවැසියෝ කිපී නාගදාස ඝාතනය කළහ.

අගමා බො ත්වං යනු කුමක් නිසා මෙසේ කීවේද? භාග්‍යවතුන් වහන්සේ රජු කථා නොකර සිටියදී මෙසේ සිතූ සේක. මේ රජ මෙහි පැමිණ කථා නොකර නිහඬව කුමක් සිතමින් සිටීද? ඉක්බිති ඔහුගේ සිත දැන 'මොහු මා සමග කථා කිරීමට නොහැකිව භික්ෂු සංඝයා දෙස බලා පුත්‍රයා සිහි කළේය. මොහු මා කථා නොකළහොත් කිසිවක් කියන්ට අසමත්ය. ඔහු සමග කථා කරමියි ඒ නිසා රජුගේ වචන අතර අගමා බො ත්වං මහරාජ, යථාපෙමං යයි කී සේක. එහි අර්ථය : මහරජ, යම්සේ උස් තැනකට වට වැසි ජලය යම්තැනක නිම්නයක් වේද එතැනට යයිද, එසේ ඔබ භික්ෂු සංඝයා දෙස බලා යම්තැනක ප්‍රේමය වේද එතැනට පැමිණියේය.

ඉක්බිති රජුට මෙබඳු අදහසක් ඇතිවිය. 'බුදුගුණ ආශ්චර්යය. පුදුමයි. භාග්‍යවතුන් වහන්සේට මා වැනි අපරාධකාරයෙක් නම් නැත. මම උන්වහන්සේගේ අග්‍ර උපස්ථායකගේ ඝාතකයා වෙමි. දේවදත්තගේ බස් ගෙන සොරු එවන ලදහ. නාළාගිරි මුදාහරින ලදී. මා නිසා දේවදත්ත විසින් ගල් විදින ලදී. මෙසේ මහා අපරාධකාරයකු වූ මා හට කථා කරන දසබලධාරීන් වහන්සේගේ මුව නොපොහොනේය. 'භාග්‍යවතුන් වහන්සේ පස් අයුරකින් තාදී ලක්ෂණයෙහි පිහිටි සේක. මෙබඳු ශාස්තෘවරයකු හැර පිටතින් නොසොයන්නෙමියි සොම්නසට පත්ව භාග්‍යවතුන් වහන්සේට අමතන්නේ **පියො මෙ භනෙත** යනාදිය කීය.

**භිකඛු සංඝසස අඤ්ජලිං පණාමෙතවා** යනු ඔහුට මෙසේ අදහසක් ඇතිවිය. භාග්‍යවතුන් වහන්සේ වැඳ ඔබමොබ ගොස් භික්ෂු සංඝයා වඳින්නහු විසින් භාග්‍යවතුන් වහන්සේ පිටුපසට කළයුතුය. මෙය ගරුකිරීමක් නොවේ. රජුන් වැඳ යුවරජුන් වඳින්නාහු විසින් රජුට අගෞරවයක් කරන ලද්දේ වෙයි. ඒ නිසා සිටි තැනම භික්ෂු සංඝයාට අංජලී ප්‍රණාමය කොට එකත්පසෙක හුන්නේය.

**කඤචිදෙව දෙසං** යනු කිසියම් අවකාශයක්.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට ප්‍රශ්න ඇසීමේ උත්සාහ ඇතිකරමින් මෙසේ කියූ සේක. **පුචඡ මහාරාජ යදාකංඛසි** එහි අර්ථය : කැමැත්තේ නම් අසන්න. ප්‍රශ්න විසඳීමේ දී මට බරක් නැත. නැතහොත් යමක් කැමතිනම් අසන්න. ඒ සියල්ල විසඳලන්නෙමියි සර්වඥ පවාරණය කළ සේක. පසේබුදු අගසව් මහසව්වන්ට එය අසාධාරණය. ඔවුහු 'කැමතිනම්' යයි නොකියති. 'අසා කියන්නෙමුයි කියති. බුදුවරු නම් 'ඇවැත්නි, කැමතිනම් අසන්න' කියා හෝ මහරජ, කැමතිනම් අසන්න කියා හෝ.

**පුචඡ වාසව මං පඤහං - යං කිඤචි මන සිචඡසි**
**තසස තසෙසව පඤහසස - අහං අනතං කරොමි තෙ**

අසව වාසව මගෙන් පැනයක්
යමක් කැමැතිනම් සිතට
ඒ ඒ පැනයෙහි
අවසනක් කරනෙමි මම

'එසේනම් භික්ෂුව තම අසුනෙහි හිඳ යමක් කැමතිනම් අසව' කියා හෝ'

**බාවාරියසස තුමහංචා සබෙබසං සබබ සංසයං**
**කතාවකාසා පුචඡවෙහා - යං කිඤචි මනසිචඡථ**

බාවාරියගේ ඔබගේ - සැමගේ සියලු සැකයට
අවසර ඇත අසවු - යමක් මනසට රිසිනම්

**පුචඡමං සභිය පඤහං - යං කිඤචි මනසිචඡමපි**
**තසස තසෙසව පඤහසස - අහං අනතං කරොමි තෙ**

අසව සභිය මගෙන් පැනයක්
යමක් කැමතිනම් සිතට
ඒ ඒ පැනයෙහි අවසනක් කරනෙම් මම

ඒ ඒ යක්ෂ රාජ දේව ශ්‍රමණ බ්‍රාහ්මණ පරිව්‍රාජකයන්ට සර්වඥ ප්‍රවාරණය කරත්. භාග්‍යවතුන් වහන්සේ බුද්ධ භූමියට පත්ව මෙම ප්‍රවාරණය කිරීම ආශ්චර්යයක් නොවේ. බෝධිසත්ත්ව භූමිහි ප්‍රදේශ ඥානයෙහිද සිටි සේක් :

**කොණඩඤඤ පඤහානි වියාකරොහි**
**යාචනති තං ඉසයො සාධුරූපා**
**කොණඩඤඤ එසො මනුජෙසු ධමෙමා**
**යං වඩ්ඪමාගචඡති එස භාරො**

කොණ්ඩඤ්ඤ පැන විසඳන්න
සාධු ගුණ ඇති ඉසිවරු අයදිති
මෙය මිනිසුන් අතර දහමකි
යමක් යේනම් දියුණුවට
එය ඔබටම බාරය

මෙසේ ශක්‍ර ආදීන්ගේ ප්‍රයෝජනය පිණිස ඍෂීන් විසින් ඉල්ලා සිටින ලද්දේ.

කතාවකාසා පුච්ඡන්තු හොන්තා
යංකිඤ්චි පඤ්හං මනසාභි පත්‍ථිතං
අහං හි තං තං වො වියාකරිස්සං
ඤත්වා සයං ලොකම්මං පරඤ්ච

පැතූ යම් පැනයක්
අසවු පින්වතුනි එයට ඉඩ ඇත
හැම එකක් විසඳම්
මෙලෝ පරලෝ තමා දැන

මෙසේ සරභංග කාලයෙහි

සම්භව ජාතකයෙහි ද සියලු දඹදිව තෙවරක් හැසිර ප්‍රශ්නයන්ගේ අවසන් කිරීමක් නොදැක සුචීරත බමුණා විසින් ප්‍රශ්නයක් අසන්ට අවකාශ ලබාදුන්විට උපතින් සත්වස් වූයේ වීදියෙහි වැලි කෙළින්නේ පළක් බැඳ ඇතුළු වීථියෙහි හුන්නේම

තස්ස තෙ අහමක්ඛිස්සං - යථාපි කුසලො තථා
රාජාච බො තං ජානාති - යදිකාහති වා නවා

සැබෑවම පවසම් - නිපුණයකු සේ ඔබට මම
කළයුතුද නැද්දැයි - රජද එය දන්නේය

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සර්වඥ ප්‍රවාරණයෙන් ප්‍රවාරණය කළ කල්හි සතුටට පත් රජ ප්‍රශ්නයක් අසන්නේ යථානු බො ඉමානි භන්තෙ ආදිය කීය. එහි ශිල්පයම = ශිල්පායතනයයි. පුථුසිප්පායතනං යනු බොහෝ ශිල්ප. සෙය්‍යථීදං හත්‍ථාරොහා ආදියෙන් යමෙක් ඒ ඒ ශිල්පය නිසා ජීවත්වෙත්ද ඔවුන් දක්වයි. මේ මෙහි අදහසයි. යම්සේ මේ ශිල්පයන් නිසා ජීවත් වන්නවුන්ගේ ඒ ඒ ශිල්පය ඇසුරුකොට සාන්දෘෂ්ටික ශිල්පවල පෙනේද මේ අයුරින් සාන්දෘෂ්ටික සාමඤ්ඤඵල පනවන්ට හැකිදැ'යි මෙසේ ශිල්පායතන ගෙනවිත් ශිල්පයන් නිසා ජීවත් වන්නවුන් දක්වයි.

එහි හත්‍ථාරොහා යනු සියලු ඇත් ඇදුරෝ, ඇත්වෙදුන් ඇත් බඩු ආදීන් දක්වයි. අස්සාරොහා සියලු අස් ඇදුරන් අස්වෙදුන් අස්වඩු ආදිහු.

රථිකා යනු සියලු රියැදුරෝ රථයෝධයෝ රිය රකින්නෝ ආදීහු. ධනුගගහා දුනු ඇදුරෝ දුනුවායෝ චලකා යමෙක් යුද්ධයෙහිදී ජයකොඩිය ගෙන පෙරටුව යත්ද ඔවුහු චලකා යනු මෙහි රජුගේ තැනය. මෙහි අසුවල් මහා මාත්‍රයාගේ තැනයයි මෙසේ සේනා සංවිධානය කරන්නෝ. පිණ්ඩදායිකා යනු සාංඝික මහා යෝධයෝ. ඔවුහු සතුරුසෙන් මැදට පිවිස පිඬුවක් මෙන් කපා කොටා ගිනිතබත්ද, පැන පැන පිටව යත්ද යන අර්ථයි. යමෙක් හෝ යුද මැද යෝධයන්ට බත් පැන් ගෙන පිවිසෙත්ද, ඔවුන්ටද මේ නම යෙදේ. උගගාරාජ පුත්තා කැපී පෙනුණු සංග්‍රාමයට බැසගත් රාජපුත්‍රයෝ. පකඛන්දිනො යමෙක් 'කවරකුගේ හිසක් ගෙන එමුද ආයුධයක් හෝ ගෙන එමුදැයි කියා 'අසවලාගේ' යයි කියනු ලැබ යුදයට පැන එයම ගෙන එත්ද, මොවුහු පනිතියි = පකඛන්දිනො. මහ ඇතුන් මෙන් = මහානාගා ඇතුන් ආදීන් ඉදිරියට එනකල්හි නොනැවතුණු යෝධයන්ට මේ තවත් වචනයකි. සූරා ඒකාන්තයෙන් ශූරයෝ. යුද හැට්ට හැඳගත්තෝ ද.

චමම යොධිනො සම් සැට්ටයක් හැඳ හෝ ඊවරන හමක් හෝ ගෙන යුදකරත්ද ඔවුහු. දාසක පුත්තා මහත් සෙනෙහෙ ඇති ගෘහ දාස යෝධයෝ. ආළාරිකා බත් පිසන්නෝ. කපපකා කරණවෑමියෝ. නහාපකා නහවන්නෝ. සූදා අහර පිසන්නෝ. මාලාකාරාදයො ප්‍රකටමය. ගණකා (ගණකයෝ) මුද්දිකා හස්ත මුද්‍රාවෙන් ගණන් සෑදීම නිසා ජීවත් වන්නෝ. යානිවා පනඤ්ඤානිපි කම්මල්කරුවෝ දත් සාදන්නෝ චිත්‍රකාරයෝ ආදීහු. එවංගතා මෙසේ පැවති. තෙ දිටෙඨව ධමෙම ඒ ඇතරු ආදීහු ඒ බොහෝ ශිල්ප දක්වා රජමැදුරෙන් මහ සම්පත් ලබමින් සාන්දෘෂ්ටික වූම ශිල්ප ඵලය නිසා ජීවත් වන්නෝ. සුඛෙනති සැපවත් කරත්. පීණෙනත සතුටුවූවහු ශක්ති සම්පන්න කරති. ආධ්‍යාත්මික සුහසාධන ආදියෙහි ඉහළ පල උපදින බැවින් උඩු අග් මොවුන්ට ඇත්තේනුයි - උඪගගිකා. ස්වර්ගයට සුදුසුනුයි = සොවගගිකා. සුඛවිපාක ඇත්තෝනුයි = සුඛවිපාකා. යහපත් අග්‍ර රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ආයුෂ වර්ණ සුඛ යසස් අධිපති බව ආදී දසධර්මයන් පවත්වයි නිපදවයිනුයි = සගග සංවතතනිකා. මෙබඳු දකඛිණං දන් පිහිටුවත් යන අර්ථයි. සාමඤ්ඤඵලං යනු මෙහි පරමාර්ථ වශයෙන් මාර්ගය සාමඤ්ඤය. ආර්යඵලය සාමඤ්ඤඵලය. යම්සේ කීද? 'මහණෙනි, සාමඤ්ඤය කුමක්ද? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයමය. කෙසේද යත්? සමමා දිටඨි -පෙ- සමමා සමාධි. මහණෙනි, මෙය සාමඤ්ඤ යයි කියනු ලැබේ. මහණෙනි, සාමඤ්ඤඵලය යනු

කුමක්ද? සෝවාන්පලය -පෙ- අරහත්පලය' මේ රජ එය නොදනී. ඉහත පැමිණි දාස ගොවි උපමාව සඳහා අසයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නොවිසඳම මෙසේ සිතූ සේක. 'මේ බොහෝ අන්‍ය තීර්ථක ශ්‍රාවක වූ රාජ අමාත්‍යයෝ මෙහි පැමිණ ඇත. ඔවුහු කෘෂ්ණ පක්‍ෂය ශුක්ල පක්‍ෂයද දක්වා කියනු ලබන්නාහු අපගේ රජතුමා මහත් උත්සාහයෙන් මෙහි පැමිණියේය. ඔහු පැමිණිතැන් පටන් ශ්‍රමණ ගෞතම තෙමේ ශ්‍රමණ කෝලාහළයම ශ්‍රමණ සොරකමම කියතියි උද්ඝෝෂණය කරත්. සකසා දහම් නොඅසවත්. රජුට කියන කල්හි උද්ඝෝෂණ කිරීමට නොහැකි වෙත්. රජුටම අනුවර්තනය වන්නාහුය. ලෝකය ධනයට අනුවර්තනය වන්නකි. මම දැන් රජුටම බාරදෙමි'යි රජුට බාර දෙන සේක. **අභිජානාසි නො ත්වං** ආදිය කී සේක. එහි **අභිජානාසි නො ත්වං** යනු ඔබ දන්නවා නේද? මේ 'නො' ශබ්දය අනුන්ගෙන් ඇසූහ යන පදය සමග යෙදිය යුතුය. මෙය කියන ලද්දේ වෙයි. **මහාරාජ ත්වං ඉමං පඤ්හං අඤ්ඤෙ සමණ බ්‍රාහමණෙ පුච්ඡිත්ථානු** = මහරජ, ඔබ මේ ප්‍රශ්නය වෙනත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගෙන් ඇසුවා නේද? එසේ ඇසූ බව හොඳින් දනිහි. ඔබට එය අමතක නැත.

**සචෙතෙ අගරු** = ඔබට ඔවුහු යම් අයුරකින් කියූද, එසේ මෙහි කීමට බැරිකමක් නැත. ඉදින් අපහසු බවක් නැත්නම්, කියන්න. **භාසස්ස** යන අර්ථයි.

**නඛො මෙ භනෙත** යනු කුමක් සඳහා කීයේද? පණ්ඩිත ප්‍රතිරූපකයන් හමුවෙහි කියන්ට දුකක් වෙයි. ඔවුහු පදයෙන් පදය අකුරින් අකුර දොස්ම කියති. ඒකාන්ත පඬිවරු නම් කථාව අසා හොඳින් කියූ දෙය පසසත්. නරකට කියූ කල්හි පාලි අර්ථපද ව්‍යංජනයන්හි යම් යම් දෙයට විරුද්ධ වෙත්. ඒ ඒ දෙය නිවරද කොට කියත්. භාග්‍යවතුන් වහන්සේ හා සමාන ඒකාන්ත පඬිවරයෙක් නැත. එහෙයින් කීහ. **නඛො මෙ භනෙත ගරු යත්ථස්ස භගවා වා නිසිනෙනා භගවනතරූපාවා** යනුවෙන්.

**එකමිදාහං** යනු මෙහි එක් දවසක්. මෙහි **සමෙමාදනීයං කථං සාරාණියං වීතිසාරෙත්වා** යනු සතුට දනවන සිහිකටයුතු කථාවක් සම්පූර්ණ කොට.

**කරතො බො මහාරාජ කාරයතො** ආදී තන්හි **තරතො** යනු තම අතින් කරන්නාට. **කාරයතො** අණ කිරීමෙන් කරවන්නහුට. **ඡින්දතො** අනුන්ගේ අත් ආදිය කපන්නාට. **පචතො** අනුන් දඬුවෙන් පෙළන්නාට. **සොචයතො** අනුන්ගේ භාණ්ඩ පැහැර ගැනීම් ආදියෙන් තමාම ශෝක උපදවන්නටද අනුන් ලවා කරවන්නාට. **කිලමථො** ආහාර නොදීමෙන් බන්ධනාගාර ගතකිරීම් ආදියෙන් තමාම වෙහෙසට පත්කරන, අනුන් ලවා වෙහෙස කරවන්නාට **ඵන්දතො ඵන්දාපයතො** අනුන් වෙව්ලුවා වෙව්ලන කල්හි තමාම වෙව්ලන්නහුට ඔහු අනුන් ලවා වෙව්ලවන්නාට, **පාණමතිමා පාපතො** ප්‍රාණය නසන්නහුටද අනුන් ලවා නසවන්නට මෙසේ සියලු තැන කිරීම් කරවීම් වශයෙන්ම යන අර්ථයයි දතයුතුය. **සන්ධිං** ගෘහ සන්ධි. **නිලෙලාපං** මහා විනාශය. **එකාගාරිකං** යනු එකම ගෙය වටකොට කොල්ලකෑම. **පරිපන්ථෙ** යනු යන එන්නවුන් පැහැරීම පිණිස මග රැක සිටින්නහුට. '**කරතො න කරීයති පාපං** යනු යම් පාපයක් කරමියි හැඟීමක් ඇතිකර ගන්නාට පාපයක් නොකරනු ලැබේ. පවක් නැත. 'සත්ත්වයෝ කරමුයි' මෙසේ හැඟීම් ඇත්තෝ වෙතියි දක්වයි. **ඛුර පරියනෙතන** යනු දැලිපිහි මුවෙන්. දැලිපිහයක වැනි මුවෙන් හෝ වෙයි. **එකමංසඛලං** එක් මස් රැසක්. **පුඤ්ජං** එයටම තවත් වචනයකි. **තතො නිදානං** යනු එක් මස් රැසක් කරන හේතුව.

**දක්ඛිණං** යනු දකුණු තෙර මිනිස්සු කර්කශය. දරුණුය. ඔවුන් සඳහා **හනන්තො** ආදිය කීහ.

උතුරු තෙර සත්ත්වයෝ ශ්‍රද්ධා ඇත්තෝ ද ප්‍රසන්න වූවෝ ද බුද්ධ මාමකයෝ ද ධර්ම මාමකයෝ ද සංඝ මාමකයෝද වෙති. ඔවුන් සඳහා **දදන්තො** ආදිය කීහ. එහි **යජන්තො** යනු මහා යාග කරන්නෝ. **දමෙන** ඉන්ද්‍රිය දමනයෙන් උපෝසථ කර්මයෙන් හෝ. **සංයමෙන** ශීල සංයමයෙන්. **සච්චවජ්ජෙන** නිත්‍ය වචනයෙන්. **ආගමො** පැමිණීම, පැවැත්ම යන අර්ථයි. සැම අයුරින්ම පව්පින් කිරීමම ප්‍රතික්ෂේප කරයි.

**අම්බං පුට්ඨො ලබුජං ව්‍යාකරොති** නම් යමෙක් අඹ කෙවැනිද අඹයෙහි කඳ කොළ මල් පල කෙවැනිදැයි කී කල්හි 'ලබු මෙවැනිය. ලබ්බෙහි කඳ කොළ මල් පල මෙවැනි යයි' කියයි.

**විජිතෙ** අණ පවත්නා දේශයෙහි. **අපසාදෙතබ්බං** යනු වෙහෙස කළ යුතු.

**අනභිනන්දිත්වා** යනු මැනව මැනවැයි මෙසේ ප්‍රශංසා නොකොට.

**අප්පටික්කොසිත්වා** බොළඳ නොකිය යුත්තක් ඔබ විසින් කියන ලද්දේ යයි පිළිකෙව් නොකොට. **අනුග්ගණ්හනෙතා** හර වශයෙන් නොගන්නෝ. **අනික්කුජ්ජනෙතා** යනු හර වශයෙන්ම 'මෙය නිස්සරණය. මෙය පරමාර්ථයයි හදවතෙහි තබා නොගන්නේ. මෙයින් ගන්නා ලද්ද ප්‍රතික්ෂේප කරන ලද්ද ද හැඟවීමයි.

මක්ඛලී වාදයෙහි **පච්චයො** යනු හේතුවට වෙනත් වචනයකි. දෙකින්ම විද්‍යමාන වුම කය දුශ්චරිත ආදි කිලිටි කරන හේතුය. කාය දුශ්චරිත ආදියද විශුද්ධි හේතුවද ප්‍රතික්ෂේප කරයි.

**අත්තකාරෙ** තමාම කිරීම. තමා විසින් කරන ලද කිසියම් කර්මයකින් මේ සත්ත්වයෝ දෙවත්බවටද, මාරබවටද, බ්‍රහ්ම බවටද, ශ්‍රාවක බෝධියට ප්‍රත්‍යෙක බෝධියට සර්වඥ බවට පැමිණෙත්ද එය ප්‍රතික්ෂේප කරයි. දෙවැනි වාදයෙන් යම් පරකාරයක් අනුන්ට අවවාද අනුශාසනා කිරීම නිසා බෝසතුන් හැර අවශේෂ ජනයා මනුෂ්‍ය සෞභාග්‍යය ආදිකොට අර්හත්වය තෙක් පැමිණේද ඒ පරකාරය ප්‍රතික්ෂේප කරයි. මෙසේ මේ බාලයා ජින චක්‍රයට පහරදෙයි. **නත්ථි පුරිසකාරෙ** යනු යම් පුරුෂ කාර්යයකින් සත්ත්වයෝ කියන ලද ආකාරයේ සම්පත්තීන්ට පැමිණෙත්ද, එයද ප්‍රතික්ෂේප කරයි. **නත්ථිබලං** යනු තමාගේ බලයෙහි පිහිටා සත්ත්වයෝ වීර්යකොට යම් ඒ සම්පත්තීන්ට පැමිණෙත්ද ඒ බලය ප්‍රතික්ෂේප කරයි. **නත්ථි විරියං** ආදි සියල්ල පුරුෂ කාර්යයට වෙනත් වචනමය. 'මෙය අපගේ වීර්යයෙන්, මෙය පුරුෂ ශක්තියෙන්, මෙය පුරුෂ පරාක්‍රමයෙන් පැවතිණැයි මෙසේ පැවති වචන ප්‍රතික්ෂේප කිරීම් වශයෙන් මේවා වෙන්කොට ගනී. **සබ්බෙ සත්තා** යනු ඔටුවන් ගොනුන් කොටළුවන් ආදීන් අනවශේෂයෙන් පිළිගනී. **සබ්බෙ පාණා** යනු එක් ඉන්ද්‍රියයක් ඇති ප්‍රාණියා ඉන්ද්‍රිය දෙකක් ඇති ප්‍රාණියා ආදි වශයෙන් කියයි. **සබ්බෙ භූතා** අණ්ඩකෝෂ වස්තිකෝෂයන්හි හටගත්තවුන් සඳහා කියයි. **සබ්බෙජීවා** හැල් යව තිරිඟු ආදිය සඳහා කියයි. ඒවාහි වැඩෙන බැවින් ජීවයක් ඇත යන සංඥා ඇත්තේ. **අවසා අබලා අවිරියා** ඒවාට

තමාගේ වසඟ බවක් හෝ බලයක් හෝ වීර්යයක් නැත. **නියති සංගති භාව පරිණතා** මෙහි නියති යනු තම බව. **සංගති** යනු සැඟැවුණු නැවත උපදින්නන්ගේ ඒ ඒ තැන යාම. **භාවො** යනු ස්වභාවයමය. මෙසේ නියතියෙන්ද, සංගතියෙන්ද භාවයෙන්ද **පරිණතා** නානාප්‍රකාර බවට පත්. 'යමක් නිසා යම්සේ විය යුතුද එය එසේම වෙයි. යමක් නිසා නොවිය යුතුනම් එය නොවෙයි යයි දක්වයි. **ඡසෙසවාභි ජාතිසු** අභිජාතීන් සයකම සිට **සුඛංච දුක්ඛංචපටිසං වෙදෙනති** අන් සුඛ දුක්ඛ භූමියක් නැතැයි දක්වයි.

**යොනි පමුඛ සතසහසසානි** යනු ප්‍රමුඛ යෝනීන්ගේ උත්තම යෝනීන්ගේ චුද්දස **සතසහසසානි**, අනෙක් **සටඨිසතානි** හයදහසක් තවත් **ඡසතානි** හයසියයක්. **පඤ්ච ච කම්මුනො සතානි** කර්ම පන්සියයක් යැයි හුදෙක් තර්ක මාත්‍රයෙන් නිරර්ථක වූ දෘෂ්ටියක් දක්වයි. **පඤ්චච කම්මානි තීණිච කම්මානි** ආදී තන්හිද මේ ක්‍රමයයි. සමහරු මෙසේ කීහ. **පඤ්චකම්මානි** යනු පංච ඉන්ද්‍රිය වශයෙන් කියයි. **තීණි** කාය කර්ම වශයෙන්. **කම්මෙච අඩ්ඪකම්මෙච** මෙහි ඔහුගේ කාය කර්මයද වචී කර්මයද. **කම්මං** යනු ලබ්ධියයි. මනෝ කර්මය කර්මයෙන් හතරෙන් එකක්. **ද්වට්ඨි පටිපදා** යනු දෙසැට ප්‍රතිපදා යයි කියයි. **ද්වට්ඨනතර කප්පා** එක් කල්පයක අන්තර කල්ප හැටහතරක් වෙයි. මෙය වනාහි අනිත් දෙක නොදැන මෙසේ කීය.

**ඡලාභිජාතියො** යනු **කණ්හ** අභිජාති, 'නීල අභිජාති, ලොහිත අභිජාති, හළිද්ද අභිජාති, **සුක්ක** අභිජාති **පරමසුක්ක** අභිජාති යයි මේ ජාති සය කියයි. එහි ඕරබ්භකා (බැටළුවන් **මරන්නෝ**) **සූකරිකා** (ඌරන් මරන්නෝ) සාකුනතිකා (කුරුල්ලන් මරන්නෝ) මාගවිකා (මුවන් මරන්නෝ) ලුද්දා (වැද්දෝ) මච්ඡඝාතකා (මසුන් මරන්නෝ) චොරා (සොරු) චොරඝාතකා (සොරුන් මරන්නෝ) බන්ධනාගාරිකා (සිරයේ රකින්නෝ)ද තවත් කෲර කර්මාන්ත කරන්නෝ. මෙය **කණ්හ** අභිජාති යයි කියයි. භික්ෂුව නීලාභි ජාතියයි කියයි. ඔවුහු **සිව්** පසයෙහි කටු බහා කති. 'භික්ෂූහුද කටුක පැවතුම් ඇත්තෝය' යන්න මෙහි පාලිය වෙයි. නැතහොත් කටුක වෘත්තිකයෝ නම් සමහර පැවිද්දෝ යයි කියයි. ලොහිතාභි ජාතී නම් නිගණ්ඨයෝය. එකසාටක යැයි කියයි. මොවුහු වනාහි පෙර කිදූ දෙවර්ගයෙන් වඩා සුදු වූවෝය. සුදු වස්ත්‍ර හඳින ගිහියෝ. අචෙලක සාවකයෝ. හලිද්දාභිජාතී යයි කියයි. මොහු තමාගේ ප්‍රත්‍යදායකයන් නිගණ්ඨයින්ට වඩා ජ්‍යෙෂ්ඨතර කරයි. ආජීවිකා තමාම ආහාර සොයා

ගත්තෝ. මෙය සුක්කාභිජාතී යයි කියයි. ඔවුහු වනාහි පෙර කියූ සතරදෙනාට වඩා සුදුය. නන්ද, වච්ඡ කිස, සංකිච්ච මක්ඛලිගෝසාල පරමසුක්කාභිජාති යයි කියයි. ඔවුහු සියල්ලන්ට වඩා සුදුය. අට්ඨපුරිසභූමියො යනු මන්‍දභූමි, ඛිඩ්ඩාභූමි, වීමංසනභූමි, උජුගතභූමි, සෙඛභූමි, සමණභූමි, ජිනභූමි, පණ්ණභූමි මේවා අට්ඨපුරිස භූමියයි කියයි. එහි උපන්දා පටන් සත්දවසක් බාධා ඇති තැනින් නික්මුණු හෙයින් සත්ත්වයෝ මන්දමෝච වෙති. මෙය මන්‍ද භූමියයි කියයි. යමෙක් දුගතියෙන් ආවෝ වෙත්ද ඔවුහු නිතර හඬති. කෑගසති. සුගතියෙන් ආවාහු එය සිහිකොට සිනාසෙත්. මෙය ඛිඩ්ඩාභූමි නම්. මව්පියන්ගේ අත හෝ පා හෝ ඇඳ හෝ පුටුව හෝ අල්ලාගෙන බිම පා එබීම වීමංසා භූමි නම් වේ. පයින් යන්ට හැකි කාලය උජුගතභූමි නම්. ශිල්ප උගන්නා කාලය සෙඛභූමි නම්. ගෙන් නික්ම පැවිදිවන කාලය සමණභූමි නම්. ගුරුවරයා සේවනය කොට දැනගන්නා කාලය ජිනභූමි නම්. භික්ෂුවද පණ්ණක වූයේ ජින වූයේ කිසිවක් නොකීවේ යයි මෙසේ ලැබීම් නැති ශ්‍රමණයා පණ්ණභූමියයි කියයි. හාරදහස් නවසියයක් ආජීවක වෘත්ති. පරිබ්බාජක සතෙ සියයක් පරිව්‍රාජක පැවිදි. නාගාවාස සතෙ යනු නාගමණ්ඩල සියයක්. වීසෙ ඉන්‍ද්‍රියසතෙ ඉන්‍ද්‍රිය දෙදහසක්. තිංසෙ නිරය සතෙ නිරය තුන්දහසක්. රජෝ ධාතුයො ධූලි වැකුණු තැන්. අත් පුටු පා පුටු ආදිය සඳහා කියයි. සත්ත සඤ්ඤීගබ්භා යනු ඔටුවන්, ගොනුන්, කොටළුවන්, එළුවන්, ගවයන්, මීහරකුන් ආදීන් සඳහා කියයි. අසඤ්ඤීගබ්භා යනු හැල් යව තිරිඟු මුං මෙනේරි මෑ කුරහන් සඳහා කියයි. නිගණ්ඨී ගබ්භා යනු ගැටයෙහි හටගත් ගැබ් ඇති. උක් උණ බට ආදිය සඳහා කියයි. සත්ත දෙවා යනු බොහෝ දෙවියෝ. ඔහු සත්තා යයි කියයි. මානුසාපි අන්තයක් නැත්තෝ. හේ සත්තා යයි කියයි. සත්ත පෙසාචා යනු පිශාචයෝ මහත් මහත් සත්තා යයි කියයි. සරා මහවිල්. කණ්ණමුණ්ඩ, රථකාර, අනොතත්ත, සීහපපාත, තියගල, මුචලින්‍ද, කුණාල විල්ගෙන කියයි. පවුටා ගැට ඇති. පපාතා මහා ප්‍රපාත. පපාතසතානි කුඩා ප්‍රපාත සියයක්. සුපිනා මහා ස්වප්න. සුපිනසතානි කුඩා ස්වප්න සියයක්. මහා කප්පුනො යනු මහා කල්පයන්ගේ. එහි එක් විලකින් වර්ෂ සියයකින් සියයකින් කුසතණ අගින් එක් දිය බිඳුවක් ගෙන සත්වරක් ඒ විල නිරුදක කළ කල්හි එක් මහා කල්පයෙකැයි කියයි. එබඳු මහා කල්ප අසූහතර ලක්ෂයක් ගෙවා බාලොච පණ්ඩිතොච දුක්ඛස්සන්තං කරොන්ති මේ මොහුගේ ලබ්ධියයි. පණ්ඩිතයාද අතරතුරු පිරිසිදු වන්නට නොහැක්කේය. බාලයාද එයින් උඩට නොයයි.

**සීලෙනවා** යනු අචෙලක සීලයෙන් හෝ අන් කිසිවකින්. **වතෙන** එබන්දකින්ම. **තපෙන** තපස් කර්මයෙන්. **අපරිපක්කං පරිපාචෙති** නම් යමෙක් 'මම පණ්ඩිතයෙමි'යි අතරතුර පිරිසිදු වෙයි. **පරිපක්කං ඵුසස ඵුසස ව්‍යනති කරොති** නම්. යමෙක් 'මම බාලයෙක්මියි කියන ලද පමණ කාලය ඉක්මවා යාද, **හෙවං නත්‍ථි** යනු එසේ නැත. ඒ දෙකම කරන්ට නොහැක්කේ යයි දක්වයි. **දොණ මිතෙ** යනු ද්‍රෝණයෙන් මිනූ කල්හි, ද්‍රෝණයෙන් මිනූ මෙන්. **සුඛ දුක්ඛ** යනු සුවදුක්. **පරියනත කටෙ** යනු කියන ලද කාල පරිමාණයෙන් පැදුර කෙළවර. **නත්‍ථි හායන වඩ්ඪනෙ** යනු පිරිහීම හා වර්ධනය නුවණැත්තාගේ සංසාරය නොවේ. බාලයාගේ සංසාරය නොවැඩේ යන අර්ථයි. **උක්කංසාවකංසෙ** යනු උසස් වීම් පහළ යෑම් හා යන වර්ධනයන්ට මෙය තවත් වචනයකි.

දැන් ඒ අර්ථය උපමාවෙකින් සාධනය කරන්නේ. **සෙය්‍යථාපි** නාම ආදිය කීය. එහි **සුතත ගුලෙ** යනු වෙළා කළ නූල් බෝලය. **නිබ්බෙඨියමාන මෙව එලෙති** පර්වතයක හෝ රුක් මුදුනක සිට දැමූ නූලෙහි ප්‍රමාණයට ලිහෙමින්ම යයි. නූල අවසන් වූ විට එතැනම සිටී. නොයයි. එසේම කියන ලද කාලයෙන් උඩට නොයේ යැයි දක්වයි.

අජිත වාදයෙහි **නත්‍ථි දිනනං** යනු දුන් දෙයෙහි ඵලයක් නැති බව සඳහා කියයි. **යිට්ඨං** යනු මහා යාගයයි කියනු ලැබේ. **හුතං** යනු රසකැවිලි සත්කාරය අදහස් කරන ලදී. ඒ දෙකම ඵලයක් නැති බවම සඳහා ප්‍රතික්ෂේප කරයි. **සුකට දුක්කටානං** හොඳ නරක දෙකෙහි, කුසල අකුසල යන අර්ථයි. **ඵලං විපාකො** යමක් ඵලයක්ය කියා හෝ විපාකය කියා හෝ කියනු ලැබේද එය නැතැයි කියයි. **නත්‍ථි අයං ලොකො** පරලොව සිටියහුටද මේ ලොව නැත. **නත්‍ථි පරලොකො** යනු මෙම ලොවෙහි සිටියහුටද පරලොව නැත. 'සියලු දෙන ඒ ඒ තැනම සිඳලන්නෝය' යයි දක්වයි. **නත්‍ථි මාතා නත්‍ථිපිතා** ඔවුන් අතර සම්‍යක් ප්‍රතිපත්ති මිථ්‍යා ප්‍රතිපත්තිවල ඵල නැති බව වශයෙන් කියයි.

**නත්‍ථි සතතා ඔපපාතිකා** යනු චුතවී උපදින සත්ත්වයෝ නම් නැතැයි කියයි.

**චාතුමමහා භූතිකො** යනු සතර මහා භූතයන්ගෙන් සැදුණු. **පඨවී පඨවිකායං** යනු ආධ්‍යාත්මික පෘථුවිය බාහිර පෘථුවි ධාතුව. **අනුපෙති**

යනු අනුව යයි. **අනුපගච්ඡන්ති** යනු එයටම සමාන වචනයකි. අනුව යයි යන අර්ථයි. දෙකෙත්ම ළංවෙයි. ළඟට යතියි දක්වයි. ජලය ආදියෙහිද මේ ක්‍රමයයි. **ඉන්ද්‍රියානි** යනු මනස සවැනිකොට ඇති ඉන්ද්‍රියයෝ. **ආකාසං** පනිත්. **ආසන්දිපංචමා** යනු වැදහොත් ඇඳෙන් පස්වැනි. ඇඳ ද ඇඳෙහි පා සතර ගෙන සිටි මිනිසුන් සතරදෙන යනු ද අර්ථයි. **යාව ආලාහනා** යනු සොහොන තෙක්. **පදානි** යනු මෙතෙමේ මෙසේ සිල් ඇත්තෙක් විය. මෙසේ දුසිල් ඇත්තෙක් විය. ආදී ක්‍රමයෙන් පැවති ගුණ අගුණ පද. ශරීරයම මෙහි පද යැයි අදහස් කරන ලදී. **කාපොතකානි** යනු පරෙවියන්ගේ වර්ණය. පරෙවි පියාපත්වල වර්ණ යන අර්ථයි. **භස්සන්තා** අළු කෙළවරකොට ඇති. මෙයම පෙළ හෝ වෙයි. **ආහුතියො** යනු යම් රසකැවිලි සත්කාර ආදී භේදයෙන් දුන් දානය සියල්ල අළුවලින් අවසන් වේද, ඉන් එපිටට පලදෙන්නක් වී නොයයි යන අර්ථයි. **දත්තු පඤ්ඤත්තං** මෝඩයන්, බාල මිනිසුන් විසින් පනවන ලද, මෙය කියන ලද්දේ වෙයි. බාලයන්, බුද්ධිය නැත්තවුන් විසින් පනවන ලද දානය පණ්ඩිතයන් විසින් නොවේ. බාලයෝ දෙති. පණ්ඩිතයෝ ගනිත් යයි දක්වයි.

එහි පූරණ පාපය කරන්නහුගෙන් නොකෙරේ. යයි කියමින් කර්මය ප්‍රතික්ෂේප කරයි. අජිත කය බිඳීමෙන් කැඩී යයි කියමින් විපාකය ප්‍රතික්ෂේප කරයි. මක්ඛලී හේතුත් නැතැ'යි දෙකම ප්‍රතික්ෂේප කරයි. එහි කර්මය ප්‍රතික්ෂේප කරන්නා විසින් විපාකය ප්‍රතික්ෂේප කරන ලද්දේ වෙයි. විපාකය ප්‍රතික්ෂේප කරන්නා විසින් කර්මය ප්‍රතික්ෂේප කරන ලද්දේ වෙයි. මෙසේ මේ සියල්ල අර්ථ වශයෙන් උභය පටිබාහක - අහේතු වාදයෝද අකිරිය වාදයෝද නත්ථික වාදයෝද වෙති. යමෙක් මොවුන්ගේ ලබ්ධි ගෙන රාත්‍රී ස්ථානයෙහි දිවාස්ථානයෙහි හිඳ සජ්ඣායනය කරත්ද, විමසා බලත්ද ඔවුන්ට 'කරන්නාගෙන් පව් නොකෙරේ. හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. මළවිට බිඳී යයි යන ඒ අරමුණෙහි මිච්ඡා සතිය පිහිටයි. සිත එකඟ වෙයි. ජවන දුවයි. ප්‍රථම ජවනයෙහි පිළියම් කළහැකි වෙයි. දෙවැනි ජවන ආදියෙහිද එසේය. සත්වැන්නෙහි දී බුදුවරුන්ටද පිළියම් කළ නොහැකිය. නොනවත්නා අරිටු කටුවක් හා සමානය. එහි කිසිවෙක් එක් දර්ශනයකට බසී. සමහරු දෙකකට බසිති. සමහරු තුනකටදැයි එකකු බැසගත්විට දෙදෙනකු තිදෙනකු බැසගත් විටද නියත මිථ්‍යාදෘෂ්ටියම වේ. පැමිණියේ සහමග අවුරා ගැනීමද, මොක්මග අවුරා ගැනීමද කරගනී. ඒ ආත්මභාවයට අනතුරුව ස්වර්ගයට පවා යාමට අභව්‍යය. මෝක්ෂය ගැන කියනුම කවරේද? වටකණුවා නමැති මේ

සත්ත්වයා පොළෝ පල්ලෙකි. බෙහෙවින් මෙබන්දෙකුට භවයෙන් නැගිටීමක් නැත.

**තසමා අකල්‍යාණ ජනං - ආසිවිස සමොරගං**
**ආරකා පරිවජෙජ්ජය්‍ය - භූතිකාමො විචක්ඛණො**

එහෙයින් නොකලණ දන - විසකුරු සපෙකු මෙන්
දුරින් දුරු කළයුතුය - සැප කැමති වූ හපනා

පකුධ වාදයෙහි : **අකටා** යනු නොකළ. **අකටවිධා** යනු නොකළ විධාන ඇති. 'මෙසේ කරවයි' කිසිවකු විසින් කරවන ලද්දේ ද නොවෙත් යන අර්ථයි. **අනිම්මිතා** යනු ඍද්ධියෙන් ද නිර්මාණය නොකරන ලද. ඇතැමෙක් 'නිර්මාණය නොකළ යුතු' යන පදය කියත්. එය පාලියෙහිවත් අටුවාවෙහි වත් නොපෙනේ. **වඤ්ඣා** පද තුන කියන ලද්දේමය. **න ඉඤ්ජන්ති** උළුවහු කඳ මෙන් සිටි බැවින් නො සැලෙත්. **න විපරිණමන්ති** යනු ප්‍රකෘතිය අත් නොහරිත්. **න අඤ්ඤමඤ්ඤං බ්‍යාබාධෙන්ති** යනු ඔවුනොවුන් නොමරාගනිත්. **නාලං** යනු නොසමත්. **පඨවි කායො** යනාදී තන්හි පෘථුවියම පඨවි කායද, පෘථුවි සමූහයද, **තත්‍ර** යනු ජීවය සත්වැනි කොට ඇති කායයන්හි. **සත්තන්නං යෙව කායානං** යනු යම්සේ මුගුරු කඩු ආදිය අතර පහරදුන් ආයුධය මුගුරු ආදිය අතරින් පිවිසේද, මෙසේ කාය සත අතරින් සිදුරු වූ විවරයෙන් ආයුධය පිවිසෙයි. එහිදී 'මම මේ ජීවිතය නැතිකරමි'යි හුදෙක් සංඥා මාත්‍රයක්ම වේයැයි දක්වයි.

නාත පුත්‍රවාදයෙහි **චතුයාම සංවරසංවුතො** යනු සංවර කොටස් හතරින් සංවර වූ. **සබ්බවාරි වාරිතොවා** යනු වාරණය කරන ලද සියලු ජලය ප්‍රතික්ෂේප කරන ලද සියලු සීතල ජලය යන අර්ථයි. හෙතෙමේ වනාහි සීතල ජලයෙහි සත්ත්වයෝ ඇත යන හැඟීම ඇත්තේ වෙයි. ඒ නිසා එය පාවිච්චි නොකරයි. **සබ්බවාරි ධුතො** යනු සියලු පාප වාරණයෙන් සිඳ දැමූ පාප ඇත්තේය. **සබ්බවාරි පුටො** යනු සියලු පාප වාරණයෙන් ස්පර්ශ කරන ලද්දේ. **ගතතෙතා** යනු කෙළවරට පත් සිත් ඇත්තේ. **යතතෙතා** යනු සන්සුන් සිත් ඇත්තේ. **ඨිතතෙතා** යනු සුපිහිටි සිත් ඇත්තේ. මොහුගේ වාදයෙහි කිසියම් ශාසනානුලෝම බවක් ඇත. අශුද්ධ ලබ්ධිය නිසා සියලු දෘෂ්ටීහු හටගත්හ.

සංජයවාදය අමරා වික්ඛෙපවාදයෙහි කියන ලද පරිදිමය. **සොහං භන්තෙ** යනු ස්වාමීනි, ඒ මම 'වැලි මිරිකා ජලය නොලබන්නාක් මෙන් තීර්ථකවාදයන්හි හරයක් නොලබන්නේ භාග්‍යවතුන් වහන්සේ විමසමි' යන අර්ථයි.

**යථාතෙ ඛමෙය්‍ය** යනු ඔබ යම්සේ කැමතිද එසේ. **දාසො** යනු අන්තොජාත, ධනක්කීත, කරමරානීත දාස භාවයට පැමිණියවුන් අතර කෙනෙක්. **කම්මකරො** යනු නොලස් කටයුතුකරන සුලු. දුරදීම දැක පළමුවම නැගිටීනුයි **පුබ්බුට්ඨායී.** මෙසේ නැගිට ස්වාමියාට අසුනක් පනවා පාදෙවීම් ආදී කළයුතු දෙයක් කොට පසුව වැදහොවී. හිඳීනුයි **පච්ඡානිපාතී** ස්වාමියා සයනයෙන් නොනැගිටි කල්හිම පළමුව නැගිටීනුයිද **පුබ්බුට්ඨායී.** උදෑසන කාලයෙහි සිට ස්වාමියා රාත්‍රියෙහි නින්දට යාම දක්වා සියලු කිස නිමවා පසුව වැදහොවී. නින්දට යන්නේනුයිද පච්ඡානිපාතී 'කුමක් කරම්ද, කුමක් කරම්දැයි' මෙසේ කළ යුතු දේ විමසමින් හැසිරේනුයි. **කිංකාර පටිස්සාවී** - මනාප වූ ක්‍රියාවක්ම කරානුයි **මනාපචාරී,** ප්‍රිය වූ දෙයක්ම කියතියි **පියවාදී** ස්වාමියාගේ තුටුපහටු වූ, මුව දෙස බලමින් හැසිරේනුයි **මුඛුල්ලොකකො, දෙවො මඤ්ඤෙ** යනු දෙවියෙකු මෙන්.

**සොවතස්සාහං පුඤ්ඤානි කරෙය්‍යං** යනු ඒ මම මෙබන්දකු වන්නෙම් නම් පින් කරන්නෙමි යන අර්ථයි. **සෙවතස්සායං** යනුවෙන්ද පාඨයක් වෙයි. අර්ථය මෙයමය. **යනූනාහං** යනු 'දන් දෙන්නෙම් නම්, රජතුමා එක් දවසක් දෙන දානයෙන් සියයෙන් පංගුවක්වත් දිවි ඇති තෙක් දුන්නත් නොහැකි වන්නෙම්'යි පැවිද්දෙහි උත්සාහ කොට මෙසේ සිතන බව දක්වයි. **කායෙන සංවුතො** යනු කයින් වැසී අකුසල් පිවිසෙන දොර වසා යන අර්ථයි. සෙසු පද දෙකෙහිද මෙම ක්‍රමයයි. **ඝාසච්ඡාදන පරමතාය** යනු ආහාර ගැනීමේ හා ඇඳුම් ඇඳීමේ පරම බැවින් උතුම් බැවින් මේ සඳහාද උපවාසය අත්හැර අග්‍ර වූ ධූතාංගයෙන් සන්තුෂ්ටියට පත්වූයේ යන අර්ථයි. **අභිරතො පවිවෙකෙ** යනු කාය විවේකය කයින් ඉවත්වූවන්ටය. චිත්ත විවේකය නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණු උතුම් පවිත්‍රත්වයට පත්වූන්ටය. උපධි විවේකය සංස්කාර නැති උපධි රහිත පුද්ගලයන්ට යැයි මෙසේ කී කල්හි ත්‍රිවිධ වූ විවේකයෙහි ඇලුණු සමූහ වාසය හැර කයින් හුදෙකලාව වාසය කරයි. සමූහ චිත්තය හැර අටසමවත් වශයෙන් හුදෙකලාව වාසය කරයි. ඵල සමාපත්තියට හෝ නිරෝධයට

හෝ පිවිස නිවනට පැමිණ වාසය කරයි යන අර්ථයයි. **යගෙඝ** යනු චෝදනා කිරීම් අර්ථයෙහි නිපාතයකි.

**ආසනෙනපි නිමනෙතයාාම** යනු හුන් අසුන ගසා දමා 'මෙහි හිඳිනු මැනවැ'යි කියන්නෙමු. **අභි නිමනෙතයාාමපින** යනු කැඳවා ගෙනවුත් ඔහුට ඇරයුම් කරන්නෙමු. එහි අභිහාරය (කැඳවා ගෙන ඒම) දෙයාකාරයි. වචනයෙන් ද කයින්ද යනුවෙන් ඔබට කැමති කැමතිවිට සිවුරු ආදිය ප්‍රයෝජනවත් වේනම් අපට කියනු මැනවියි කියන්නේ වචනයෙන් කැඳවාගෙන වුත් ආරාධනා කරයි නම් චීවර වෛකල්‍යය සලකා 'මෙය ගනු මැනවැ'යි ඒවා දෙන්නේ කයින් කැඳවා ආරාධනා කරයි නම් ඒ දෙකම සඳහා 'අභිනිමනෙතයාාමනං' යැයි ආදිය කීය. මෙහිද **ගිලානපපචචය හෙසජජ පරිකඛාරො** යනු ගිලන් වූවහුට සත්ප්‍රාය වූ ඖෂධ. වචනාර්ථය විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. **රකඛාවරණ ගුතතී** යනු රක්ෂා සංඛ්‍යාත වූද ආවරණ සංඛ්‍යාත වූද ආරක්ෂාව. එය ආයුධ ගත් අත් ඇති පුරුෂයන් තැබීමෙන් නොව ධාර්මිකව කරන සංවිධානය වෙයි. නොකල්හි දර ගෙන යන්නවුන් කොළ ගෙන යන්නවුන් විහාරයට නොපිවිසෙන අයුරින්. මුව වැදි ආදීන්. විහාර සීමාවෙහි මුවන් හෝ මසුන් නොමරන අයුරින් කෙරෙන සංවිධානය ධාර්මික සංවිධානය නම් වෙයි. ඒ සඳහා **ධමමිකං** යන්න කීහ. **යදි එවං සනෙත** යනු 'යම් හෙයකින් ඔබගේ දාසයා ඔබගේ සමීපයෙන් වැඳීම් ආදිය ලබන්නේද මෙසේ ඇති කල්හි. **අදධා** යනු එකංස වචනයකි. (නිශ්චිතාර්ථයෙහි)

**පඨමං** යනු කථා කරන්නේ අන්‍යයාටද ප්‍රයෝජනවත් බව දක්වයි. ඒ නිසාම රජතෙමේ **සකකා පන භනෙත අඤඤමපි** ආදිය කීය. ගොවිතැන් කරතියි **කසසකො**. ගෘහයෙහි ප්‍රධානයා, එක් ගෙයක පමණක් ජ්‍යෙෂ්ඨයා. **ගහපතිකො**, බලි සංඛ්‍යාත ආගමික කාර්ය කරානුයි **කාරකාරකො**, ධාන්‍ය රාශියද ධන රාශියද වැඩිකරානුයි **රාසි වඩඪකො**.

**අපපංවා** සුළුදෙයක්. යටත් පිරිසෙයින් සහල්නැළියක් පමණවත්. **භොගකඛනධං** යනු භෝගරාශිය. **මහනතංවා** විශාල වූ. මහත් වූ දේ අත්හැර පැවිදිවන්ට දුෂ්කර වන්නාක් මෙන් අල්පමාත්‍ර වූ දෙයක් දීම පිණිස දෙකම කීය. දාසවාරයෙහි යම්හෙයකින් දාසයා තමාටද අධිපතියකු නොවන විට භෝගයන් ගැන කියනුම කවරේද? ඔහුට යම් ධනයක් වේනම් එය ස්වාමීන්ටම වෙයි. ඒ නිසා භෝග ගැනීම නොකරන ලදී.

ඥාතියෝ ඤාති පරිවට්ටො සකකා පන භන්තෙ අඤ්ඤම්පි දිට්ඨෙවධම්මෙ යනු මෙහි එවමෙව යනු නොකියන ලදී. ඒ කුමක් නිසාද? එවමෙවං යනුවෙන් කියනු ලබනවිට භාග්‍යවතුන් වහන්සේ දිවාරාත්‍රී දෙකටම සහ ඉන් වැඩිපුරත් මෙබඳු උපමාවන්ගෙන් සාමඤ්ඤඵලය දක්වන්ට ප්‍රමාණවත් වන සේක. කෙසේවුවද භාග්‍යවතුන් වහන්සේගේ වචන ඇසීමෙහි පර්යාප්තියක් නම් නැත. එසේ වුවත් අර්ථය ඒ අයුරුම වන්නේ යයි සිතා මත්තෙහි විශේෂයක් අසන්නේ එමමෙව යයි නොකියා මත්තෙහි **අභික්කන්තතරඤ්චපණීත තරඤ්ච** යයි කීය. එහි **අභික්කන්තතරං** යනු ශ්‍රේෂ්ඨය. අතිශයින් මන වඩන සුලුය යන අර්ථයි. **පණීත තරං** උතුම්ය. තෙනහි යනු පෙළඹවීම් අර්ථයෙහි නිපාතයකි. ඇසීමෙහි පොළොඹවන්නේ ඔහුට මෙසේ කීය. **සුණාහි** ශ්‍රේෂ්ඨ වූද උත්තරී වූද සාමඤ්ඤඵලය අසව. **සාධුකං මනසිකරොහි** මෙහි සාධුකං සාධු පද දෙකම එකම අර්ථය ගනී. මේ සාධු ශබ්දය ආයාචන සම්පටිච්ඡන, සම්පහංසන, සුන්දර, දළ්හී කර්ම ආදී තන්හි පෙනේ. 'සාධු මෙ භන්තෙ භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු' යන තන්හි ආයාචනයෙහි (අයැදීමෙහි) පෙනේ. 'සාධු භන්තෙති බො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා' ආදී තන්හි සම්පටිච්ඡනයෙහි (පිළිගැනීමෙහි) පෙනේ. 'සාධු සාධු සාරිපුත්ත' ආදී තන්හි සම්ප්‍රහර්ෂණයෙහි (අනුමතියෙහි) යෙදේ.

සාධු ධම්මරුචී රාජා සාධු පඤ්ඤාණවා නරො
සාධු මිත්තාන මද්දුබ්භො - පාපස්ස අකරණංසුඛං

දහමට කැමති රජද - පැණවත් නරයාද
මිතුරන් නොබිඳුවන්නාද - මැනවි පව් නොකිරීම සැපතකි.

ආදී තන්හි සොඳුරු බවෙහි 'තෙනහි බ්‍රාහමණ සාධුකං සුණාහි' ආදී තන්හි සාධුක ශබ්දයට දළ්හී කර්මයෙහි (දැඩිව ගැනීමෙහි) හා ආණත්තියෙහි (අණ කිරීමෙහි) ද කියනු ලැබේ. මෙහිද මෙය දළ්හී කර්මයෙහිද ආණත්තියෙහි ද අර්ථය යැයි දතයුතුය. සොඳුරු බවෙහිද වටී. දළ්හිකර්ම කරණ අර්ථයෙන් 'දළ්හම්මං ධම්මං සුණාහි. සුග්ගහිතං ගණ්හන්තො' ආණත්ති අර්ථයෙන් මාගේ අණින් අසව. සුන්දර අර්ථයෙන් 'සුන්දරම්මං ධම්මං සුණාහි' යනුවෙන් මෙය පැහැදිලි කරන ලද්දේ වෙයි. **මනසි කරොහි** යනු ආවර්ජන එක්තැන් කොටගන්න යන අර්ථයි. වික්ෂිප්ත

නොවූ සිතින් අසව. සිතෙහි තබාගනුව යන අදහසයි. තවද මෙහි **සුණාහි** යනු ශ්‍රෝත ඉන්ද්‍රිය වික්ෂේප වාරණයයි. **සාධුකං මනසි කරොහි** යනු මනසිකාරයෙහි, දළ්හිකර්ම නියෝජනයෙන් මනින්ද්‍රිය වික්ෂේපය වාරණය කිරීමයි. පළමුවැන්නද මෙහි ව්‍යඤ්ජන විපර්යාස ග්‍රාහයෙන් වැළැක්වීමයි. පළමුවැන්නෙන් ධර්මශ්‍රවණයෙහි යෙදවීමයි. පසුව ආ දෙයින් ඇසූ ධර්මයන් ධාරණ උප පරීක්ෂා ආදියෙහි යෙදිණ. පළමුවැන්නෙන් 'ව්‍යඤ්ජන සහිත මේ ධර්මය ඇසිය යුත්තකියි දක්වයි. පසුපදයෙන් 'අර්ථ සහිතය. ඒ නිසා සිතෙහි තබා ගතයුතුයයි දක්වයි. **සාධුකං** පදං සාධුක පදය ද දෙපදයෙහි යොදා 'යම්හෙයකින් මේ ධර්මය ධර්ම ගම්භීරය, දේශනා ගම්භීරය. ඒ නිසා සාධුකං (මැනවින්) අසව. යම්හෙයකින් අර්ථ ගම්භීරද ප්‍රතිවේධ ගම්භීරද ඒ නිසා මැනවින් සිතෙහි තබාගනුවයි මෙසේ යෙදීම දතයුතුය. **භාසිස්සාමි** යනු 'මහරජ' යැයි හැකියයි මෙසේ ප්‍රතිඥාත වූ සාමඤ්ඤඵල දේශනාව විස්තර වශයෙන් කියන්නෙමි. දේශනා කරන්නෙමි යන්න සංක්ෂේපයෙන් දැක්වීම වෙයි. භාසිස්සාමි (කියන්නෙමි) විස්තර දේශනාවයි. එහෙයින් වංගීස තෙරහු මෙසේ කීහ.

සංඛිත්තෙනපි දෙසෙති - විත්ථාරෙනපි භාසති
සාළිකායිව නිගෙඝාසො - පටිභාණං උදීරති

කෙටියෙන් දෙසයි - විසිතුරෙන් කියයි
නිහඬ සැළලිහිණියකු මෙන් - මුඛරිව කියයි

මෙසේ කීකල්හි උත්සාහවත්ව **එවං භන්තෙති ඛො රාජා මාගධො අජාත සත්තු වෙදෙහි පුත්තො භගවතො පච්චස්සොසි** භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගත්තේය. බාරගත්තේ යයි කියන ලද්දේ වෙයි. ඉක්බිති ඔහුට භගවා **එතදවොච** මෙය කී සේක. දැන් කිවයුතු මෙහි මහරජ ආදී සියලු සූත්‍රාන්තය කියූ සේක යන අර්ථයි.

එහි ඉධ යනු දේශය සඳහන් කිරීමේ නිපාතයකි. එයම සමහර තැනක ලෝකය සඳහා කියනු ලැබේ. යම්සේ කීයේද? 'ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති' සමහර තැන ශාසනය සඳහා යම්සේ කීයේද, ඉධෙව භික්ඛවෙ සමණො. ඉධ දුතියො සමණො' සමහර තැනක අවකාශය ගැනේ. යම්සේ කීයේද?

ඉධෙව තිට්ඨමානස්ස - දෙවභූතස්ස මෙ සතො
පුනරායුච මෙ ලද්ධො - එවං ජානාහි මාරිස

මෙතැනස සිටිනා -සත්පුරුෂ දෙවියකු වූ මට
නැවත ආයුෂ ලැබිණ - දනුව නිදුකාණනි මෙසේ

සමහර තැනක පද පූරණ මාත්‍රයකි. යම්සේ කීයේද? 'ඉධාහං භික්ඛවෙ භූතනාවී අසසං පවාරිතො' මෙහි ලෝකය සඳහා කියන ලද්දේ යයි දතයුතුය. මහාරාජ යනු ප්‍රතිඥාත වූ පරිදි දේශනාව පවත්වන්ට නැවත මහාරාජ යයි අමතති. මෙය කියන ලද්දේ වෙයි. **මහාරාජ ඉමස්මිං ලොකෙ තථාගතො උප්පජ්ජති අරහං -පෙ- බුද්ධො භගවා යි.** එහි තථාගත ශබ්ද බ්‍රහ්ම ජාලයෙහිද, අරහං ආදිය විශුද්ධි මාර්ගයෙහි ද විස්තර කරන ලදී. **ලොකෙ උප්පජ්ජති** මෙහි වනාහි ලොකො යනු අවකාශ ලෝකය, සත්ත්ව ලෝකය, සංස්කාර ලෝකයයි ත්‍රිවිධ වෙයි. මෙහි සත්වලෝකය අදහස් කරන ලදී. සත්ව ලෝකයෙහි උපදින්නා වූද තථාගතයන් වහන්සේ දෙව්ලොව බඹලොව නූපදින සේක. මිනිස්ලොවද උපදින සේක. මිනිස්ලොවත් අන් සක්වළක නොවේ. මෙම සක්වළෙහිම උපදින සේක. එහිද සැමතැනම නොවේ. 'පෙරදිගින් කජංගලනම් නියම්ගමය. ඊට බටහිරින් මැද ශාලාය. ඉන් එහාට ප්‍රත්‍යන්ත ජනපදයෝය. මෙගොඩ මැද නිරිතදිගින් සල්ලවතී නම් මහා නදියයි. ඉන් එපිට ප්‍රත්‍යන්ත ජනපදය මෙගොඩ මැද දකුණුදිගින් සේත කණ්ණික නම් නියම්ගමය. ඉන් එපිට ප්‍රත්‍යන්ත ජනපදය. මෙගොඩ මැද, බටහිරදිගින් ථූණ නම් බමුණුගමය. ඉන් එපිට ප්‍රත්‍යන්ත ජනපදය. මෙගොඩ මැද උතුරුදිගින් උසීරද්ධජ නම් පර්වතය. ඉන් එපිට ප්‍රත්‍යන්ත ජනපදය. මෙගොඩට මැද යයි මෙසේ පිරිසිඳුණු දිගින් යොදුන් තුන්සියයක්ද පුළුලින් යොදුන් එකසිය පනසක්, වටින් යොදුන් නවසියයක් ද වූ මධ්‍යම ප්‍රදේශයෙහි උපදින සේක. තථාගතයන් වහන්සේ පමණක් නොව පසේබුදුවරු අගසව්වෝ අසූ මහ තෙරහු බුද්ධ මාතාව බුද්ධ සක්විති රජ සහ අනෙකුත් යසසට පත් බ්‍රාහ්මණ ගෘහපතියෝද මෙහිම උපදිත්. එහි තථාගතයන් වහන්සේ සුජාතාව විසින් දෙන ලද මධුපායාස භෝජනයෙහි සිට අර්හත් මාර්ගය තෙක් උපදිති නම් වෙති. රහත්පෙලෙහි ඉපදුණු නම් මහබිනික්මනෙහි සිට රහත්මග තෙක්, තුසිත භවනයෙහි සිට රහත්මග තෙක්, දීපංකර පාදමූලයෙහි සිට රහත්මග තෙක් **උප්පජ්ජති** නම්. රහත් පලයෙහි උප්පන්න නම්. මෙහි සියල්ලට පළමුව උප්පන්නභාවය සඳහා **උප්පජ්ජති** යයි

කියනු ලැබේ. තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපන්නාහු වෙතියි මේ මෙහි අර්ථයයි.

**සොඉමං ලොකං** යනු ඒ භාග්‍යවතුන් වහන්සේ මේ ලෝකය. දැන් කිවයුතු දෙය දක්වති. **සදෙවකං** යනු දෙවියන් සහිත මෙසේ මාරයා සහිත **සමාරකං**. බ්‍රහ්මයා සහිත **සබ්‍රහමකං** ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත **සසසමණ බ්‍රාහමණිං**. ප්‍රජනනය වූ බැවින් **පජා** ඒ ප්‍රජාව. දෙව් මිනිසුන් සහිත **සදෙවමනුසසං** එහි සදෙවක වචනයෙන් පංච කාමාවචර දේව ගහණය දතයුතුය. සමාරක වචනයෙන් ෂට් කාමාවචර දේව ගහණයයි. සබ්‍රහ්මක වචනයෙන් බ්‍රහ්මකායික ආදී දේවගහණයයි. සස්සමණ බ්‍රාහ්මණ වචනයෙන් ශාසනයට සතුරු වූ අමිත්‍ර වූ ශ්‍රමණ බ්‍රාහ්මණ ගහණයයි. සමිතපාප, බාහිතපාප ශ්‍රමණ බ්‍රාහ්මණ ගහණයද වෙයි. පජා වචනයෙන් සත්ව ලෝක ගහණයයි. සදෙව මනුස්ස වචනයෙන් සම්මුතිදේව අවශේෂ මනුෂ්‍ය ගහණයයි. මෙසේ මෙහි තුන්පදයෙන් අවකාශ ලෝකය සමග සත්වලෝකය ගැනේ. ප්‍රජාවන් දෙක වශයෙන් සත්ව ලෝකයට ගන්නා ලද්දේ යයි දතයුතුය. තවත් ක්‍රමයක්, සදේවක ගහණයෙන් අරූප ලෝකය ගන්නා ලදී. සමාරක ගහණයෙන් කාමාවචර දේවලෝකද සබ්‍රහ්මක ගහණයෙන් රූපී බ්‍රහ්ම ලෝකයද, සස්සමණ බ්‍රාහ්මණ ගහණයෙන් සිව්පිරිස් වශයෙන් සම්මුති දෙවියන් සමග මනුෂ්‍ය ලෝකයද අවශේෂ සත්ව ලෝකය හෝ ගන්නා ලද්දේය. තවද මෙහි සදේවක වචනයෙන් උඩත් පිරිසෙයින් සියලු ලොව සාක්‍ෂාත් කළ බව කීහ. එයින් යමකුට මෙසේ සිතිණිද? මාරයා මහානුභාව ඇත්තේය. කාමාවචර සයට ප්‍රධානය. වශවර්තීය. එයද මොහු විසින් සාක්ෂාත් කරන ලද්දේද? ඔවුන්ගේ විමතිය දුරලමින් සමාරක යයි කීහ. යමකුට මෙසේ සිතිණිද? 'බ්‍රහ්මයා මහානුභාව ඇත්තේය. එක් ඇඟිල්ලකින් එක් සක්වළ දහසක් ආලෝකය පතුරුවයි. දෙකකින් -පෙ- දසයකින් සක්වළ දස දහසක් ආලෝකය පතුරුවයි. අනුත්තර වූ ධ්‍යාන සමාපත්ති සුඛය විඳියි. ඔහුද සාක්‍ෂාත් කරන ලද්දේද? ඔවුන්ගේ විමතිය දුරලමින් සබ්‍රහමකං ආදිය කීහ. ඉන්පසු යමෙක් මෙසේ සිතුද. බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ශාසනයට සතුරෝය. ඔවුහුද සාක්‍ෂාත් කරන ලද්දෝ ද? ඔවුන්ගේ විමතිය දුරලමින් සස්සමණ බ්‍රාහ්මණිං පජං යනුවෙන් කීහ. මෙසේ උත්කෘෂ්ට උත්කෘෂ්ට වූවන් සාක්ෂාත් කළ බව ප්‍රකාශකොට ඉක්බිති සම්මුති දෙවියන්, අවශේෂ මනුෂ්‍යයන්ද සඳහා උඩත් පිරිසෙයින් සත්ව ලෝකය සාක්ෂාත්

කළ බව ප්‍රකාශ කරන සේක් **සදේව මනුසසං** යනුවෙන් කීහ. මේ මෙහි භාවානු ක්‍රමයයි. (සිදුවීම් පිළිවෙළයි.)

පොරාණයෝ මෙසේ කීහු : **සදෙවකං** යනුවෙන් දෙවියන් සමග අවශේෂ ලෝකය. **සමාරකං** යනුවෙන් මාරයා සමග අවශේෂ ලෝකයද, **සබ්‍රහමකං** යනුවෙන් බ්‍රහ්මයන් සමග අවශේෂ ලෝකයද, මෙසේ තුනින් පැමිණි සත්ත්වයන් තුන් අයුරකින් පද තුනක බහා නැවත දෙපදයකින් අවසන් කරමින් **සසසමණ බ්‍රාහමණිං පජං සදෙව මනුසසං** යයි කීහ. මෙසේ පද පහකින්ද පද දෙකකින්ද ඒ ඒ ආකාරයෙන් ත්‍රෛධාතුක වූම ලෝකය අවසන් කරන ලද්දේ යයි කීහ. **සයං අභිඤ්ඤා සචඡිකත්වා පවෙදෙති** යනු, මෙහි සයං යනු තමාම, තවත් ගතයුත්තක් නැතිව (අපරනෙයෙය්‍ය) මෙහි සයං යනු තමාම, තවත් ගතයුත්තක් නැතිව (අපරනෙයෙය්‍ය) දනිති. දැන අධික ඥානයෙන් දැන යන අර්ථයි. **සචඡිකත්වා** යනු ප්‍රත්‍යක්‍ෂකොට, මෙයින් අනුමාන ආදිය ප්‍රතික්‍ෂේප කරන ලද්දේ වෙයි. **පවෙදෙති** යනු අවබෝධ කරවති. දැනුවත් කෙරෙති. ප්‍රකාශ කෙරෙති.

**සො ධමමං දෙසෙති ආදි -පෙ- පරියොසාන කලයාණං** යනු ඒ භාග්‍යවතුන් වහන්සේ සත්ත්වයන් කෙරෙහි කාරුණ්‍යය නිසා අනුත්තර වූ විවේක සුවය පවා අත්හැර දමා දහම් දෙසන සේක. එයද අල්පයක් හෝ බොහෝවක් හෝ දේශනා කරන සේක් ආදිකලයාණ ආදී ප්‍රකාරයෙන්ම දේශනා කරන සේක. ආදියෙහිදීම කලයාණ, භද්‍රක අනවද්‍ය කොට දේශනා කරන සේක. මධ්‍යයෙහිද අවසානයෙහිද කලයාණ භද්‍රක අනවද්‍යකොට දේශනා කරන සේකැයි කියන ලද්දේ වෙයි.

එහි දේශනාවෙහි ආදි මධ්‍ය අවසානයක් ඇත. ශාසනයටද ඇත. දේශනාවෙහි සිව්පදයක් ඇති ගාථාවක ප්‍රථම පාදය ආදි නම්. ඉන්පසු පාද දෙක මධ්‍ය නම්. අන්තයෙහි පදය පරියොසාන නම්. එක් අනුසන්ධියක් ඇති සූත්‍රයක නිදානය ආදි නම්. **ඉදමවොච** යනු පරියොසානයයි. දෙක අතර ඇත්තේ මජ්ඣ නම්. නොයෙක් අනුසන්ධි ඇති සූත්‍රයක ප්‍රථම අනුසන්ධිය ආදි නම්. අන්තයෙහි අනුසන්ධිය පරියොසාන නම්. මධ්‍යයෙහි එකක් හෝ දෙකක් හෝ බොහෝ ගණනක් හෝ මජ්ඣිමය. ශාසනයාගේ ශීල සමාධි විදර්ශනා ආදි නම්. මෙය කියන ලද්දේය. කුසල්දහම් ගැන කවර වාදියෙක්ද? ශීලයද සුවිශුද්ධය

දෘෂ්ටිය සෘජුය. **අත්‍රීහික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා'** යනුවෙන් කියන ලද්දේ ආර්ය මාර්ගය මජ්ඣ නම්. ඵලයද නිර්වාණයද පරියෝසාන නම්. 'තසමාතිහ ත්වං බ්‍රාහමණ බ්‍රහමචරියං එකංසාරං එතං පරියොසානං' යන මෙතැන ඵලය පරියෝසානයයි කියන ලදී. 'නිබ්බාණොගධං හි ආවුසො විසාඛ බ්‍රහමචරියං වුසසති නිබ්බාණ පරායනං නිබ්බාණ පරියොසානං' යන මෙහි නිර්වාණය පරියොසාන යයි කියන ලදී.

මෙහි දේශනාවෙහි ආදි මජ්ඣ පරියොසානය අදහස් කරන ලදී. භාග්‍යවතුන් වහන්සේ ධර්මදේශනා කරන සේක් ආදියෙහි ශීලය දේශනා කොට මධ්‍යයෙහි මාර්ගයද, අවසන්හි නිර්වාණය දක්වන සේක. එහෙයින් කියන ලදී. **සොධම්මං දෙසෙති ආදිකල්‍යාණං පරියොසාන කල්‍යාණං** යනුවෙන්. ඒ නිසා වෙනත් ධර්ම කථිකයෙක් දහම් දෙසන්නේ :

**ආදිම්හි සීලං දසෙසය්‍ය - මජ්ඣෙ මග්ග විභාවයෙ**<br>
**පරියොසානම්හි නිබ්බාණං - එසා කථික සණ්ඨිති**

මුලින් සිල් දක්වා - මැදදී මගද පහදා<br>
අවසන්හි නිවනද - දෙසුම කථිකයෙකුගේ සිරිතයි

**සාත්‍ථං සබ්‍යඤ්ජනං** යනු යමකුගේ කැඳ බත් ස්ත්‍රී පුරුෂ ආදීන්ගේ වර්ණනා ආශ්‍රිත දේශනාවක් වේද, හෙතෙමේ අර්ථ සහිතව නො දෙසයි. භාග්‍යවතුන් වහන්සේ වනාහි එබඳු දේශනාව හැර සතර සතිපට්ඨාන ආදිය නිශ්‍රිත වූ දේශනාවක් දේශනා කරන සේක. ඒ නිසා **සාත්‍ථං දෙසෙති** යි කියනු ලැබේ. යමකුගේ දේශනාව එකව්‍යඤ්ජන ආදියෙන් යුක්ත නම්, සියල්ල නැති කරන ව්‍යඤ්ජනයෙන් යුක්තනම්, සියල්ල විශ්‍රැතවන සියල්ල වළක්වන ව්‍යඤ්ජනයෙන් යුක්තනම්, ඔහුගේ දමිළ කිරාත යවන ආදී විදේශිකයන්ගේ භාෂා මෙන් ව්‍යඤ්ජන පරිපූර්ණත්වයක් නොමැති බැවින් අබ්‍යඤ්ජන නම් දේශනාවක් වෙයි. භාග්‍යවතුන් වහන්සේ වනාහි

**සිථිලධනිතංච දීඝ රසසං - ලහුක ගරුකංච නිග්ගහිතං**<br>
**සම්බන්ධං වවත්‍ථිතං විමුත්තං - දසධා බ්‍යඤ්ජන බුද්ධියාප්පභෙදො**

සිථිල ධනිත දීඝ රසස ලහුක ගරුක
නිගගහි සමබනධ වවත්‍ථීත විමුතත යනුවෙන්
දසවැදෑරුම් ව්‍යඤ්ජන බුද්ධියෙහි ප්‍රභේදයෝ ය.

මෙසේ කියන ලද දශවිධ ව්‍යඤ්ජන නොමකා පිරිපුන් ව්‍යඤ්ජන ඇත්තක් කොට ධර්මය දේශනා කරන සේක. ඒ නිසා සබ්‍යඤ්ජනං දෙසෙති යයි කියනු ලැබේ. **කෙවල පරිපුණ්ණං** යනු මෙහි **කෙවල** යනු සියල්ලට අධිවචනයකි. **පරිපුණ්ණං** අනූන අනධික වචනයි. මෙය කියන ලද්දේ වෙයි. සියල්ල පරිපූර්ණව දේශනා කරති. එක් කොටසකින්වත් අඩු නොවේ. (පිටතින් ගතයුතු ඉවත් කළයුතු කිසිවක් නැති බැවින් සියල්ල පරිපූර්ණ යයි දතයුතුයි) **පරිසුද්ධං** උපක්ලේශ නැති. යමෙක් මේ ධර්මදේශනාව නිසා ලාභයක් හෝ සත්කාරයක් හෝ ලබන්නෙමියි දේශනා කරයිද, ඔහුගේ දේශනාව අපරිශුද්ධ දේශනා වෙයි. භාග්‍යවතුන් වහන්සේ ලෝක ආමිෂය අපේක්ෂාවක් නැතිව යහපත පතුරුවාලන මෛත්‍රී භාවනාවෙන් මොළොක් වූ හදවත ඇතිව, උපකාරී ස්වභාවයෙන් සලකුණු කරන ලද සිතින් දේශනා කරන සේක. ඒ නිසා **පරිසුද්ධං** පරිශුද්ධව දේශනා කරන සේකැයි කියනු ලැබේ. **බ්‍රහමචරියං පකාසෙති** මෙහි වනාහි මේ බ්‍රහ්මචරිය ශබ්දය දානයෙහි උපස්ථානයෙහි පංච ශික්ෂාපද ශීලයෙහි අප්පමඤ්ඤාවන්හි මෛථුන විරතියෙහි ස්වදාර සන්තෝෂයෙහි වීර්යයෙහි උපෝසථ අංගයන්හි ආර්ය මාර්ගයෙහි ශාසනයෙහි යන මේ අර්ථයන්හි දක්නා ලැබේ.

**කිං තෙ වතං කිමපන බ්‍රහමචරියං**
**කිසස සුචිණණසස අයං විපාකො**
**ඉද්ධි ජුතිබල විරියූපපතති**
**අකඛාහි මෙ නාග මහාවිමානං**

මේ මහ විමානය
කවර වතක කවර බඹසරක
කවරක් පුරුදු කොට ලැබූවක්ද
ඉදුපැහැ බලවිරිය උපන් හැටි
නාගය මට කියව.

අහංච භරියාච මනුසස ලොකෙ
සද්ධා උභො දානපතී අහුමහ
ඔපානභූතං මෙ ඝරං තදාසී
සන්තප්පිතා සමණා බ්‍රාහමණාච

බිරිය ද මම ද දෙදෙන මනුලොව
සැදැහැති දානපතියෝ වීමු.
එදා මාගේ ගෙය පොකුණකි
මහණ බමුණන් සැනැහුණු

තං මෙ වතං තංපන බ්‍රහමචරියං
තසස සුචිණණසස අයං විපාකො
ඉද්ධී ජුතී බල විරියූප පත්ති
ඉදංච මෙ ධීර මහාවිමානං

මේ මාගේ වතය බඹසරය
එය පුරුදුකොට ලැබූ විපාකය
ඉඳුපැහැ බල විරිය උපදන
පැණැත්තව මේ මහ විමනය

මේ පුණ්ණක ජාතකයෙහි දානය බ්‍රහ්මචර්ය යයි කියන ලදී.

කෙන පාණි කාමදදො ? කෙනපාණි මධුසසවො?
කෙන තෙ බ්‍රහමචරියෙන - පුඤ්ඤං පාණිමහි ඉජ්ඣති

අත කැමති දේ දෙන්නේ - අතින් මී වැහෙන්නේ කෙසේද?
කවර බඹසරකින් - අතෙහි පින් සපිරෙන්නේ

තෙන පාණි කාම දදෙ තෙන පාණි මධුසසවො
තෙන මෙ බ්‍රහමචරියෙන පුඤ්ඤං පාණිමහි ඉජ්ඣති

එයින් අත කැමති දේ දෙයි
එයින් අත මී වැගිරෙයි
ඒවා බඹසරින්
අතැ පින් ඉටුවෙයි.

මේ අංකුර පෙතවත්ථුවෙහි වෙය්‍යාවච්චය (වතාවත් කිරීම) බ්‍රහ්මචර්යයයි කියන ලදී. 'ඉදං බො තං භික්ඛවෙ තිත්තිරියං නාම බ්‍රහ්මචරියං අහොසි' යනුවෙන් මේ තිත්තිර ජාතකයෙහි පංච ශික්ෂා පද ශීලය බ්‍රහ්ම චරිය යයි කියන ලදී. 'තං බො පන පංචසිඛ බ්‍රහ්ම චරියං නෙව නිබ්බිදාය, නවිරාගාය යාවදෙව බ්‍රහ්මලොකුප්පත්තියා' යනුවෙන් මේ මහා ගෝවින්ද සූත්‍රයෙහි අප්පමඤ්ඤා සතර බ්‍රහ්මචරිය යයි කියන ලදී. 'පරෙ අබ්‍රහ්මචාරී භවිස්සන්ති මය මෙත්ථ බ්‍රහ්මචාරිනො භවිස්සාම' යනුවෙන් සල්ලේඛ සූත්‍රයෙහි මෛථුන විරතිය බ්‍රහ්මචර්ය යයි කියන ලදී.

මයංච භරියා නාතික්කමාම
අම්හෙච භරියා නාතික්කමන්ති
අඤ්ඤත්‍රතාහි බ්‍රහ්මචරියං චරාම
තස්මා අම්හං දහරා නමීයරෙ

අපිදු බිරියන් නොඉකුම්වමු
බිරියෝ අප නොඉකුම්වති
ඔවුන් නැති තැන බඹසර වසමු
එහෙයින් අපේ දරුවෝ නොමැරෙති

මහා ධර්මපාල ජාතකයෙහි ස්වදාර සන්තෝෂය බ්‍රහ්මචර්යයයි කියන ලදී. 'අභිජානාමි බො පනාහං සාරිපුත්ත චතුරංග සමන්නාගතං බ්‍රහ්මචරියං චරිතා තපස්සිස්සුදං හොමි' යනුවෙන් ලෝමහංසන සූත්‍රයෙහි වීර්යය බ්‍රහ්මචර්ය යයි කියන ලදී.

හීනෙන බ්‍රහ්මචරියෙන - ඛත්තියෙ උපපජ්ජති
මජ්ඣිමෙනච දෙවත්තං - උත්තමෙන විසුජ්ඣති

හීන වූ බඹසරින් - කැත්කුලෙහි උපදිත්
මැද බඹසරින් දෙවත් බව ලබත්
උතුම් බඹසරින් පිරිසිදු වේ

මෙසේ නිමි ජාතකයෙහි ආත්මදමන වශයෙන් කරන ලද අෂ්ටාංග උපෝසථය බ්‍රහ්මචර්යා යයි කියන ලදී. 'ඉදංබොපන පංචසිඛ බ්‍රහ්මචරියං එකන්ත නිබ්බිදාය විරාගාය -පෙ- අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො'

යනුවෙන් මහා ගෝවින්ද සූත්‍රයෙහිම ආර්යමාර්ගය බ්‍රහ්මචර්යා යයි කියන ලදී. 'තයිදං බ්‍රහමචරියං ඉද්ධංචෙවඑීතංච විත්ථාරිතං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුසෙසහි සුප්පකාසිතං' යනුවෙන් පාසාදික සූත්‍රයෙහි ශික්ෂාත්‍රයෙහි සංගෘහිත වූ සකල ශාසනය බ්‍රහ්මචර්යා යයි කියන ලදී. මෙතැන්හිත් මෙයම බ්‍රහ්මචර්යා යැයි අදහස් කරන ලදී. ඒ නිසා **බ්‍රහමචරියං පකාසෙති** යනු උන්වහන්සේ ආදිකල්‍යාණ වූ -පෙ- පිරිසිදු ධර්මය දෙසන සේක. එසේ දෙසන සේක් ශික්ෂාත්‍රයයට සංගෘහිත වූ සකල ශාසන බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරන සේක. මේ මෙහි අර්ථයයි දතයුතුයි. බ්‍රහ්මචර්යා යනු ශ්‍රේෂ්ඨාර්ථයෙන් බ්‍රහ්මභූත වූ චර්යාව බ්‍රහ්ම වූවන්ගේ සහ බුද්ධාදීන්ගේ චර්යාව යයි කියන ලද්දේ වෙයි.

**තං ධම්මං** යනු ඒ කියන ලද පරිදි වූ සම්පදා ඇති ධර්මය. **සුණාති ගහපති වා** යනු කුමක්හෙයින් පළමුකොට ගෘහපතියා නිර්දේශ කෙරේද? නිහතමාන බව නිසාද, උසස් නිසාද වෙයි. බෙහෙවින් ක්ෂත්‍රිය කුලයෙන් පැවිදි වූවෝ ජාතිය නිසා මානය ඇතිකර ගනිත්. බ්‍රාහ්මණ කුලයෙන් පැවිදි වූවෝ මන්ත්‍ර නිසා මානය ඇතිකර ගනිති. හීන ජාතික කුලයන්ගෙන් පැවදි වූවෝ තමන්ගේ විජාති ඇති බැවින් පිහිටා සිටින්ට නොහැක්කෝය. ගෘහපති දරුවෝ එබඳු මානයක් නැති බැවින් නැසූ මාන දර්ප ඇත්තෝ වෙති. ඔවුහු පැවිදිව මානයක් හෝ දර්පයක් නොකොට ශක්ති ප්‍රමාණයෙන් බුද්ධවචනය උගෙන විදර්ශනාව සඳහා කටයුතු කරත්නාහු රහත්බවෙහි පිහිටන්ට සමත් වෙති. ඉතිරි කුලයන්ගෙන් පැවිදි වූවෝ බොහෝ දෙනෙක් නොවෙති. ගෘහපති කුල ඇත්තෝ ම බහුලය. මෙසේ නිහතමාන බව නිසාද උසස් නිසාද පළමුකොට ගෘහපතියා නිර්දේශ කරති.

**අඤ්ඤතරසමිංවා** යනු ඉතිරි කුලයන්ගෙන් එක්තරා කුලයක. **පච්චාජාතො** යනු අනුව උපත්. **තථාගතෙ සද්ධං පටිලභති** යනු පිරිසිදු දහම් අසා ධර්මස්වාමී වූ තථාගතයන් වහන්සේ කෙරෙහි 'භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධයැයි ශ්‍රද්ධාව ලබයි. **ඉතිපටිසංචික්ඛති** යනු මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරයි. **සම්බාධො ඝරාවාසො** යනු හැටරියන් ගෙයි යොදුන් සියයක් තරම් ඇතින් අඹුසැමියෝ වසත්නම් ඒ අයුරින්ද ඔවුන්ගේ බැඳීම් සහිත බව සහ පළිබෝධ සහිත බව යන අරුතින් ගෘහවාසය සම්බාධකයක්මය. **රජොපථො** යනු රාග රජස් නැගෙන තැනයයි මහටුවායෙහි කියන ලදී. පැමිණෙන මාර්ගය යන්නද වටී. නොලැගෙන අර්ථයෙන් අභ්‍යවකාශයක් මෙනැයි = **අබ්භොකාසො පැවිද්දා** වනාහි

වැසූ දොර කවුළු ඇති, සැඟැවුණු කුළුගේ. රුවන්පහ, දෙව් විමන්හි විසුවද නොලගී. නොඇලේ. නොබැඳේ. එහෙයින් කියන ලදී. **අබ්භොකාසො පබ්බජ්ජා** යනුවෙන්. තවද, **සම්බාධො ඝරාවාසො** කුසල් කිරීමට අවසරයක් නැති බැවිනි. **රජොපථො** නොවැඩූ කසලගොඩක් මෙන් දූවිලිවල කෙලෙස් දූවිලිවල එක්රැස්වන තැනක් බැවින්. **අබ්භොකාසො** පැවිද්ද කුසල් කිරීමට සැපසේ අවකාශ ඇති බැවින්.

**න ඉදං සුකරං -පෙ- පබ්බජෙය්‍ය** යනු මේ මෙහි කෙටි කථාවයි. යම්හෙයකින් මේ ශික්ෂාත්‍රය බ්‍රහ්මචර්යාව එක් දවසක්වත් නොකඩ කොට හැසිරෙන සිත පමුණුවා ගතයුතු හෙයින් **එකන්තපරිපුණ්ණං.** හැසිරිය යුතු එක් දවසක්වත් කෙලෙස්මලින් කිළිටිනොකොට හැසිරෙන සිත පමුණුවා ගතයුතු බැවින් **එකන්ත පරිසුද්ධං. සංඛලිඛිතං** ලියවූ සකක් සමානව සේදූ සකක් මෙන් හැසිරිය යුතුය. **ඉදං න සුකරං අගාරං අජ්ඣාවසතා** යනු ගෙයි වසන්නා විසින් ඒකාන්ත පරිපූර්ණ වූ -පෙ- හැසිරෙන්ට. යනනූනාහං කෙසෙච **මස්සුච ඔහාරෙත්වා** කසට දියෙන් පෙවූ බැවින් කාසායානි (සිවුරු) බඟසර හැසිරෙන්නන්ට සුදුසු **වත්ථානි අච්ඡාදෙත්වා අනගාරියං පබ්බජෙය්‍යං** යනුවෙන්. මෙහිද යම්හෙයකින් ගෙදොරට හිතවූ කෘෂි වාණිජ්‍ය කටයුතු අගාරිය යයි කියනු ලැබේ. එය පැවිද්දෙහි නැත. ඒ නිසා පැවිද්ද අනගාරිය යයි දතයුතුය. ඒ අනගාරිය පබ්බජෙය්‍යං යනු, පිළිපදින්නෙමි.

**අප්පංවා** යනු දහසකින් යට හෝගස්කන්ධය අප්ප නම් වේ. දහසේ සිට මහා වෙයි. බන්ධන අර්ථයෙන් ඤාතියාම = ඤාති පරිවට්ට නම්. එයද විස්සට යට අප්ප වෙයි. විස්සේ සිට මහා වෙයි.

**පාතිමොක්ඛ සංවර සංවුතො** යනු ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වූ. **ආචාරගොචර සම්පන්නො** යනු ආචාරයෙන්ද ගෝචරයෙන්ද යුක්ත වූ. **අණුමත්තෙසු** යනු අල්පමාත්‍ර වූ. **වජ්ජෙසු** යනු අකුශල ධර්මයන්හි. **භයදස්සාවී** යනු බය දකින. **සමාදාය** යනු මැනවින් ගෙන. **සික්ඛති සික්ඛාපදෙසු** ශික්ෂාපදයන්හි ඒ ඒ ශික්ෂාපදය සමාදන්ව හික්මෙයි. මේ මෙහි සංක්ෂේපයයි. විස්තර විශුද්ධි මාර්ගයෙහි කියන ලදී.

**'කාය කම්ම වචී කම්ම සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො** යනු මෙහි ආචාර ගෝචර ග්‍රහණයෙන්ම කුශලයන් වචීකර්මයන් ගන්නා

ලද්දේ ද, යම්හෙයකින් මේ ආජීව පාරිශුද්ධි ශීලය නම් අහසෙහිවත් රුක් මුදුන්වලවත් නූපදියිද, කාය වචී ද්වාරවලම උපදී ද, එහෙයින් එහි උත්පත්ති ද්වාර දක්වනු පිණිස 'කාය කම්ම, වචීකම්මෙන සමන්නාගතො කුසලෙන' යයි කියන ලදී. යම්හෙයකින් එයින් යුක්ත වූයේද එයින් පිරිසිදු ආජීව ඇත්තේ වෙයි. මෙණ්ඩිය පුත්ත සූත්‍රය වශයෙන්ද මෙය කියන ලදී. එහි කුසලශීලය ගොඩනගන්නේ කුමක්ද? කුසල් කායකර්මය වචීකර්මයයි. පිරිසිදු ආජීවය මම ශීලය ගොඩනගන්නා යයි කියමි යි කියන ලදී. ඒ නිසා ඒ දේශනාවෙහි මෙම පරියාදාන අර්ථයම කියන ලදැයි දතයුතුය.

**සීල සම්පන්නො** යනු බ්‍රහ්මජාලයෙහි කියන ලද ත්‍රිවිධ ශීලයෙන් සීල සම්පන්න නම් වෙයි. **ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො** යනු මනස සයවැනිකොට ඇති ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තේ වෙයි. **සති සම්පජඤ්ඤෙන සමන්නාගතො** පැමිණීම පිටවී යාම ආදී තැන් සතෙහි සිහියෙන් සම්ප්‍රජානයෙන්ද යුක්තවූයේ වෙයි. **සන්තුට්ඨො** යනු සිව්පසයෙහි ත්‍රිවිධ සන්තුෂ්ටියෙන් තුටු වූයේ වෙයි.

මෙසේ මාතෘකාව නිමවා අනුපිළිවෙළින් බෙදන සේක් **කථඤ්ච මහාරාජ භික්ඛු සීලසම්පන්නො** යන ආදිය කී සේක. එහි **ඉදම්පිස්ස හොති සීලස්මිං** යනු මෙයද ඒ භික්ෂුවගේ ප්‍රාණඝාතයෙන් වැළැකීමේ එක් ශීලයක් වෙයි යන අර්ථයි. වර්තමාන වචනාර්ථයෙහිද එය ආධාර අර්ථයයි. මහටුවාවෙහි මෙයද ඒ භික්ෂුවගේ ශීලයැයි මෙම අර්ථයම කියන ලදී. සෙස්ස බ්‍රහ්මජාලයෙහි කියන ලද ක්‍රමයෙන් දතයුතුය. **ඉදමස්ස හොති සීලස්මිං** යනු මෙය ඔහුගේ ශීලය වෙයි යන අර්ථයි.

**න කුතො චි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො** යනු අසංවරය මුල්කොට යම් බියක් උපදීද, ඒ අතර යම් මේ බිය සීල සංවරයෙන් වන්නේද, එය කිසි තැනකින් ඒක සංවරයෙන් අසංවර මූලක බියක් නැති බැවිනි.

**මුද්ධාවසිත්තො** යනු විධානයන්ගෙන් නියම කරන ලද ක්‍ෂත්‍රිය අභිෂේකයෙන් හිස අභිෂේක කරන ලද්දේ මෙන්. **යදිදං පච්චත්ථිකතො** යනු කිසියම් තැනකින් එක් සතුරකු ඇත්තකුගෙන් බියක් වේද, එය නොදක්නෙමි. කුමක් හෙයින්ද යත්? පසමිතුරන් නසාලූ බැවිනි. **අජ්ඣත්තං**

යනු තමාගේම අධ්‍යාත්මය. තමාගේ සන්තානයෙහි යන අර්ථයි. **අනවජ්ජ සුඛං** යනු නිවරද වූ නින්දිත නොවූ කුශලශීල පදනම් කරගත්, විපිළිසර නොවූ ප්‍රමුදිත ප්‍රීති ශාන්ති ධර්මයන් විසින් අරක්ගන්නා ලද කායික චෛතසික සුවය විඳගනී. **එවංඛො මහාරාජ භික්ඛු සීලසම්පන්නො හොති** යනු. මෙසේ නිරන්තරයෙන් විස්තරකොට දක්වන ලද ත්‍රිවිධ ශීලයෙන් යුත් භික්ෂුව සීලසම්පන්න නම් වෙතියි සීලකථාව නිමවා වදාළ සේක.

ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාර බෙදුමෙහි **චක්ඛුනා රූපං** යනු මේ චක්ඛු ශබ්දය කිසියම් තැනෙක බුද්ධ චක්ෂුසෙහි පවතී. යම්සේ කීයේද? 'බුදුඇසින් ලොව බැලූ සේකැ'යි කිසියම් තැනෙක සර්වඥතා ඥාන සංඛ්‍යාත වූ සමන්ත චක්ඛුවෙහි පවතී. යම්සේ කීයේද? සුමේධ, ධර්මයෙන් සෑදූ ප්‍රසාදයට නැග සමන්තචක්ෂු මෙන් යැයි සමහරතැනක ප්‍රඥා චක්ෂුසෙහි යෙදේ. 'කෙලෙස් නැති මල නැති ධම්මචක්ඛුව උපන්නේය යනුවෙන් මෙහි පූර්වේනිවාස ආදී ඥානය පඤ්ඤාචක්ඛු යයි කියන ලදී. 'දිවැසින්' යැයි ආ තැන්වල දිබ්බචක්ඛුවෙහි වෙයි. 'ඇස හා රූපයන් නිසා' (චක්ඛුං පටිච්ච රූපෙ) යන මෙහි ප්‍රසාද චක්ෂුසෙහි පවතී.

මෙහි වනාහි මෙය ප්‍රසාද චක්ෂු ව්‍යවහාරයෙන් චක්ෂු විඥානයෙහි පවතී. ඒ නිසා චක්ෂු විඥානයෙන් රූපයක් දැක යනු මෙහි අර්ථයි. සෙසු පදවල යමක් කිවයුතුනම් ඒ සියල්ල විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. **අබ්‍යාසෙක සුඛං** යනු ක්ලේශයන්ගෙන් මිශ්‍රවීමක් නැති බැවින් නිරවුල් අසම්මිශ්‍ර පරිශුද්ධ අධිචිත්ත සුඛය විඳගනී.

**ඉන්ද්‍රිය සංවර කථාව නිමියේ ය.**

සති සම්පජඤ්ඤ බෙදීමෙහි **අභික්කන්තෙ පටික්කන්තෙ** යනු මෙහි අභික්කන්ත යනුවෙන් කියැවෙන්නේ ගමනයි. පටික්කන්ත යනු නැවතීමයි. ඒ දෙකම සිව් ඉරියව්හි ලැබේ. ගමනෙහි ඉදිරියෙන් කය ගෙනෙමින් යන්නේ අභික්කමති නම්. නවතින්නේ පටික්කමති නම්. නැවතුණු තැන සිටියේම කය පෙරට නමමින් යාම අභික්කමති නම්. පසුපසට දිගහරින්නේ පටික්කමති නම්. හිඳීමෙහි හුන්නේම ආසන්නයේ සිටි තැනැත්තාගේ ඉදිරි අංගයට අභිමුඛව ඇවිද යන්නේ අභික්කමති නම්. පසුපස පෙදෙස පසුපසින් ඇවිද යන්නේ පටික්කමති නම්. වැද හෙවීමෙහිද මෙම ක්‍රමයයි.

සම්පජාන කාරීහොති යනු සම්ප්‍රජානනයෙන් සියලු කටයුතු කරන සම්ප්‍රජානනය සඳහා හෝ කරන, හෙතෙමේ ගමන ආදියෙහි සම්ප්‍රජානනයෙන් කරන්නේම ය. කිසිදුතැනක සම්ප්‍රජානනයෙන් තොර නොවේ. එහි සාර්ථක සම්ප්‍රජානනය, සත්ප්‍රාය සම්ප්‍රජානනය, ගෝචර සම්ප්‍රජානනය, අසම්මෝහ සම්ප්‍රජානනය යනුවෙන් සම්ප්‍රජානනය චතුර්විධ වේ. එහි යාමේ සිතක් උපන්කල්හි චිත්ත වශයෙන්ම නොගොස් මෙහි මා යාමෙන් ඇති ප්‍රයෝජනයක් ඇත්තේද නැත්තේද යනුවෙන් අර්ථ අනර්ථ විමසා අර්ථය පරිග්‍රහණය සාර්ථක සම්ප්‍රජානනයයි. එහිද අත්‍ථො යනු චෛත්‍ය දර්ශන, බෝධි දර්ශන, සංඝ දර්ශන, ස්ථවිර දර්ශන, අසුභ දර්ශන ආදි වශයෙන් ස්වභාවයෙන් වර්ධනයයි. චෛත්‍යයක් දැක ද බුද්ධාරම්මණ වූද, සංඝදර්ශනයෙහි සංඝාරම්මණ වූද ප්‍රීතිය උපදවා එයට ක්‍ෂය වශයෙන් සම්මර්ශනය කරන්නේ අර්හත්වයට පැමිණේ. තෙරුන් දැක ඔවුන්ගේ අවවාදයෙහි පිහිටා අසුභ වූ දෙයක් දැක එහි ප්‍රථමධ්‍යානය උපදවා එයට ක්‍ෂය වශයෙන් සම්මර්ශනය කරන්නේ අර්හත්වයට පැමිණේ. ඒ නිසා ඒවා දැකීම සාර්ථකය.

ඇතැම්හු 'ආමිෂයෙන් ද වර්ධනය අර්ථයයි ද, ඒ නිසා බ්‍රහ්මචර්යාවට. අනුග්‍රහ පිණිස පිළිපන් බැවින්' යයි කියත්. ඒ ගමනෙහි සත්පාය අසත්ප්‍රාය ගැන බලා සත්ප්‍රාය පරිග්‍රහණය සත්ප්‍රාය සම්ප්‍රජානන යයි කියති. කෙසේද යත්, චෛත්‍ය දර්ශනය සාර්ථකය. යම්හෙයකින් චෛත්‍ය පූජාව සඳහා දසදොළොස් යොදුන්හි සිට පිරිස රැස්වෙති. තමාට හැකි අයුරින් ස්ත්‍රීහුද පුරුෂයෝද අලංකාර ලෙස පිළියෙල කරන ලද සිත්තම් රූ මෙන් හැසිරෙත්. එහි ඔහුට ඉටු අරමුණෙහි ලෝභයද, අනිටු අරමුණෙහි පටිඝයද අපරීක්‍ෂ්‍යකාරීව බැලීමෙහි මෝහයද උපදී. කාය සංසර්ග ආපත්තියටද පැමිණේ. ජීවිත බ්‍රහ්මචර්යාවන්ට ද අනතුරු වෙයි. මේ ඒ තැන අසත්ප්‍රාය වෙයි. කියන ලද ආකාරයේ අන්තරාය නැති තැන සත්ප්‍රාය වේ. සංඝ දර්ශනයද සාර්ථකය. යම්හෙයකින් ඇතුළුගම මහා මණ්ඩපයක් කරවා මුළු රැම මිනිසුන් ධර්මශ්‍රවණය කරවන කල්හි කියන ලද අයුරින්ම ජනසන්නිපාතයක්ද අන්තරායද වෙයි. මෙසේ එතැන අසත්ප්‍රායය. අන්තරාය නොවූ කල සත්ප්‍රායය. මහ පිරිස් පිරිවරාගත් තෙරුන් දැකීමෙහිද මේ ක්‍රමයයි. අසුභ දර්ශනයද සාර්ථකය. ඒ අරුත දැක්වීම පිණිස මේ කථාවස්තුව දැක්වේ.

එක් තරුණ භික්ෂුවක් සාමණේරයකු ගෙන දැහැටි පිණිස ගියේය. සාමණේර තම මගින් පිටතට ගොස් පෙරටුව යන්නේ අසුභ වූ දෙයක් දැක ප්‍රථමධ්‍යානය උපදවා එයට පාදකකොට සංස්කාරයන් සම්මර්ශනය කරන්නේ ඵලත්‍රය සාක්‍ෂාත් කොට ඉහළ මාර්ග සඳහා කමටහන් ගෙන සිටියේය. තරුණ භික්‍ෂුව ඔහු නොදක්නේ සාමණේර යැයි කැඳවීය. හෙතෙමේ 'මා පැවිදි වූ දවස පටන් භික්‍ෂුව සමග කථා දෙකක් නම් නොකී විරූය. වෙනත් දවසක මත්තෙහි විශේෂයක් උපදවා ගන්නෙමියි සිතා 'කිමෙක්ද ස්වාමීනි යි පිළිවදන් දුන්නේය. එන්නැයි කියන ලද්දේ එක් වචනයෙන්ම පැමිණ ස්වාමීනි, මේ මගින් ගොස් මා සිටි තැන මොහොතක් පෙරදිග බලා සිට බලන්නැයි කීය. හේ එසේ කොට ඔහු විසින් පැමිණෙන ලද විශේෂයටම පැමිණියේය. මෙසේ එකම අසුභය දෙදෙනෙකුගේ අර්ථය පිණිස විය. මෙසේ මෙයද සාර්ථකය. පුරුෂයාට ස්ත්‍රිය අසුභය. අසත්ප්‍රායය. ස්ත්‍රියට පුරුෂයා අසුභය. සභාගයම සත්ප්‍රායය. මෙසේ සත්ප්‍රාය පරිග්‍රහණය සත්ප්‍රාය සම්ප්‍රජානනය නම් වේ. මෙසේ ගන්නා ලද සාර්ථක සත්ප්‍රායට අටතිස් කමටහන් අතුරින් තම සිතට රුචි වූ කර්මස්ථාන සංඛ්‍යාත ගෝචරයක් උගෙන පිඬුසිඟා වඩනා ගොදුරු ගමෙහි එය රැගෙන යාම ගෝචර සම්ප්‍රජානනය නම් වේ. එය පැහැදිලි කිරීම පිණිස මේ චතුෂ්කය දතයුතුයි. මෙහි ඇතැම් භික්‍ෂුවක් ගෙනයයි ගෙන නොඑයි. එක් භික්‍ෂුවක් ගෙනඑයි. ගෙන නොයයි. එක් භික්‍ෂුවක්, ගෙන නොයයි. නොගෙන එයි. එක් භික්‍ෂුවක් ගෙන යයි. ගෙන එයි.

එහි යම් භික්‍ෂුවක් දවසක් සක්මනින් හිඳීමෙන් ආවරණීය ධර්මයන්ගෙන් සිත පිරිසිදු කොට, එසේම රාත්‍රියෙහි ප්‍රථම යාමයද, මධ්‍යම යාමයෙහි සයනයකොට පශ්චිම යාමයෙහි හිඳීම් සක්මනින් කල්ගෙවා උදෑසනම සෑමළු බෝමළු වත් කොට බෝරුකෙහි ජලය ඉස පැන් බොජුන් එළවා ආචාර්ය උපාධ්‍යාය වත් ආදී සියලු කඳුවත් සමාදන්ව සිටී. හේ සිරුරු පිරියම්කොට සෙනසුනට පිවිස (දෙව තයො පලලංකො) උණුසුම් කරමින් කමටහන්හි යෙදී පිඬු පිණිස හැසිරෙන වේලාවෙහි නැගිට කමටහන් හිසින්ම පාසිවුරු ගෙන සෙනසුනින් නික්ම කමටහන් සිහි කරන්නේම සෑමළුවට ගොස් යම්හෙයකින් බුද්ධානුස්සති කමටහනක් වේද එය අත්නොහැරම සෑමළුවට පිවිසෙයි. අන් කමටහනක් වේනම්, හිණි පාමුල අතින් ගත් භාණ්ඩයක් මෙන් එය තබා බුදුන් අරමුණු කොටගත් ප්‍රීතියෙන් සෑමළුවට නැග චෛත්‍ය මහත් නම් තෙවරක් පැදකුණුකොට සිව්තැනෙක වැඳිය යුතුය. චෛත්‍යය කුඩානම් එසේම

පැදකුණු කොට අටතැනෙක වැඳිය යුතුය. චෛත්‍යය වැඳ බෝමළුවට පැමිණියහු විසින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ හමුවෙහි මෙන් වැදහෙව බෝධිය වැඳිය යුතුය. හේ මෙසේ චෛත්‍යයද බෝධියද වැඳ පිළියෙල කළ තැනට ගොස් පිළියෙල කළ භාණ්ඩය අතින් ගන්නාක් මෙන් තැබූ කමටහන ගෙන ගම සමීපයෙහි කමටහන් හිසින්ම සිවුර පොරවා ගමට පිඬු පිණිස පිවිසෙයි.

ඉක්බිති මිනිස්සු දැක 'අපගේ ආර්යයා පැමිණියේ යැයි පෙරගමන්කොට පාත්‍රය ගෙන අසුන් හලෙහි හෝ ගෙයි හෝ වඩා හිඳවා කැඳ දී බත් සෑදෙන තෙක් පා දොවා පිසදා ඉදිරියෙන් හිඳ ප්‍රශ්නයක් හෝ අසති. ධර්මය අසනු කැමැත්තෝ හෝ වෙති. යම්හෙයකින් නොකියවත්නම්, ජනයාට සංග්‍රහ පිණිස දහම් කථාවක් හෝ කළයුතුම යයි අටුවා ඇදුරෝ කියති. කමටහනින් මිදුණු ධර්ම කථාවක් නම් නැත. ඒ නිසා කමටහන් හිසින්ම දහම් කථාවක් කොට කමටහන් හිසින්ම අහර වළඳ අනුමෙවෙනි කියා මිනිසුන් නවත්වනු ලබන කල්හිද, අනුගතවම ගමින් නික්ම එහි ඔවුන් වළක්වා මගට එයි. ඉක්බිති ඔහුට පෙරාතුව නික්මී ගමින් පිටතදී බත්කිස කොට සාමණේර තරුණ භික්ෂුව දැක පෙරගමන්කොට ඔහුගේ පාසිවුරු ගනිති. පොරාණක භික්ෂූහු අපගේ උපාධ්‍යායයන් වහන්සේ ආචාර්යයන් වහන්සේ නොවෙත් යයි මුහුණ බලා වත් කරත්. පැමිණි ප්‍රමාණයෙන්ම කරත්. ඔවුහු ඔහුගෙන් අසති. ස්වාමීනි, මේ මිනිස්සු ඔබවහන්සේගේ කිනම්හුද? මව්පස නැයෝද? පියපස නැයෝද? කුමක් දැක අසවුද? ඔබවහන්සේලා කෙරෙහි මොවුන්ගේ ප්‍රේමය බහුමානය නිසයි. ඇවැත්නි, යමක් මව්පියන් විසින්වත් කළ නොහැකිද? මොවුහු ඒ දේ අපට කරති. අපගේ පාසිවුරුද මොවුන් සතුය. මොවුන්ගේ ආනුභාවයෙන් බියෙන් බියක් ද කුසගින්නෙහි කුසගින්නක් ද නොදනිමු. අපට උපකාරී වූ මෙබඳු අන් කවුරුවත් නැතැයි ඔවුන්ගේ ගුණ කියමින් යයි. මෙය ගෙනයයි ආපසු ගෙන නොඑයි යනුවෙන් කියනු ලැබේ.

උදෑසනම කියූ ආකාරයෙන් වත්පිළිවෙත් කරන්නහුගේ කර්මජ තේජෝ ධාතුව දිලිසෙයි. අල්ලා නොගත් දෙය මුදා අල්ලාගත් දෙය ගනී. සිරුරින් දහදිය ගලයි. කමටහන වීථියට නොනැගේ. හේ උදෑසනම පාසිවුරු ගෙන ඉක්මනින් චෛත්‍යය වැඳ හරකුන් නික්මෙන වේලාවෙහිම කැඳ අහර පිණිස ගමට පිවිස කැඳ ලැබ අසුන්හලට ගොස් පානය කරයි.

ඉක්බිති ඔහු දෙතුන්වරක් අනුභව කළ පමණින්ම කර්මජ තේජෝ ධාතුව අල්ලාගත් දෙය මුදා අල්ලා නොගත් දෙය ගනී. කළ සියයකින් ස්නානය කළාක් මෙන් තේජෝ ධාතු දාහය නිවීමට පැමිණ කමටහන් හිසින් කැඳ වළඳ පාත්‍රයද මුවද සෝදා බත අතරතුර කමටහන මෙනෙහිකොට අවශේෂ ස්ථානයෙහි පිඬු පිණිස හැසිර කමටහන් හිසින් අහර වළඳ එතැන් පටන් නොකඩවා එළඹෙන කමටහන ගෙනම ආපසු එයි. මෙය ගෙන එයි. ගෙන නොයයි නම්. මෙබඳු භික්ෂූහු කැඳ බී විදර්ශනා අරඹා බුදු සසුනෙහි රහත්බවට පත්වූවෝ ගණන පථය ඉක්මවා ගියෝය. සිංහල ද්වීපයෙහිද ඒ ඒ ගම්වල අසුන්හලෙහි ඒ ආසනය නැත. කැඳ බී රහත්බවට පත් භික්ෂූහුද නැත.

යමෙක් වගකීම් තබා ප්‍රමාද විහාරී වේද, සියලුවත් බිඳ පස්වැදෑරුම් චේතෝ විනිබන්ධයන්ගෙන් බැඳුණු සිත් ඇත්තේ වසන්නේ 'කමටහනක් ඇතැයි' යන හැඟීමක්වත් නොකොට ගමට පිඬු පිණිස පිවිස අනුලොම් නොවූ ගිහි සංසර්ගයෙන් බැඳී හැසිර වළඳ හිස් අතින් නික්මෙයි. මෙය ගෙන නොයයි. නොගෙන එයි නම් වේ.

යමෙක් ගෙනයයි ගෙනඑයි යයි කියන ලද ඔහු ගතපච්චාගත වත්ත වශයෙන් දතයුතුය. ආත්මාර්ථකාමී කුලපුත්‍රයෝ සසුනෙහි පැවිදිව දහයක් විස්සක් පනහක් සියයක් සමග එක්ව වසන්නාහු කතිකාවත් කොට වාසය කරත්. ඇවැත්නි, තෙපි ණයට වැටුණෝ නොවෙති. අසුට බැඳුණෝ නොවෙති. ජීවිකාව සපයා ගැනීමට පැවිදි වූවෝ නොවෙත්. දුකින් මිදෙනු කැමැත්තාහු මෙහි පැවිදි වූවෝය. ඒ නිසා ගමනෙහිදී උපන් කෙලෙස් ගමනෙහිදීම අත්හරිවු. එසේම සිටීමෙහි, හිඳීමෙහි සයනයෙහි උපන් කෙලෙස් අත්හරිවු. ඔවුහු මෙසේ කතිකාවත් කොට පිඬු පිණිස යන්නාහු. අඩ බඹයක්, බඹයක්, අඩ ගව්වක් ගව්වක් අතරතුර පාෂාණයෝ වෙති. ඒ සංඥාවෙන් කමටහන් මෙනෙහි කරමින්ම යති. යම්හෙයකින් යමකුට ගමනේදී ක්ලේශය උපදීද එහිදීම එය අත්හරී. එසේ නොහැකිවන්නේ සිටී. ඉක්බිති ඔහුට පසුපසින් එන්නාද සිටී. හෙතෙමේ 'මේ භික්ෂුව ඔබට උපන් විතර්කය දනී. ඔබට එය නුසුදුසුය'යි තමාට ප්‍රතිචෝදනාකොට එහිදීම විදසුන් වඩා ආර්යභූමියට බැසගනී. එසේ නොහැකි වන්නේ හිඳී. ඉක්බිති ඔහුට පසුපසින් එන්නාද හිඳී. මේ ක්‍රමයමැයි. ආර්යභූමියට බැසගැනීමට නොහැකි වන්නේ වුවද ක්ලේශය ඉවතට දමා කමටහන මෙනෙහි කරන්නේම යයි. කමටහනක් නැති

සිතින් පියවරක් නොඔසවයි. ඔසවන්නේ නම් හැරී පෙරසිටි තැනටම එයි. ආලින්දකවාසී මහා ඵුස්ස තෙරුන් මෙන්.

උන්වහන්සේ වසර දහනවයක් ගතපච්චාගත වත පුරන්නේම වාසය කළහ. මිනිස්සුද අතරමග කුඹුරු කොටන්නාහු, වපුරන්නාහු කොළ මඩින්නාහු කර්මාන්ත කරන්නාහු තෙරුන් එසේ යනු දැක 'මේ තෙරුන් වහන්සේ නැවත නැවත නැවතී යති. කිමෙක්ද, මංමුළා වූද, කිසිවක් අමතක වෙලාදැයි කථාබහ කරත්. උන්වහන්සේ එය ගණනකට නොගෙන කමටහන් යුත් සිතින්ම මහණදම් කරන්නාහු විසිවසරක් තුළ රහත්බවට පැමිණියහ. රහත්බවට පත් දවසෙහි උන්වහන්සේගේ සක්මන කෙළවර අරක්ගත් දේවතාවා ඇඟිලිවලින් පහනක් දල්වාගෙන සිටියේය. සිව්වරම් දෙවියෝ ද දෙවියන්ට නායක ශක්‍රයාද සහම්පතී බ්‍රහ්මයාද උපස්ථානයට පැමිණියහ. ඒ දීප්තිය දැක වනවාසී මහාතිස්ස තෙරුන්වහන්සේ දෙවැනි දවසෙහි ඒ බව විමසූහ. 'රාත්‍රී කාලයෙහි ආයුෂ්මතුන් ළඟ දීප්තියක් විය. කුමක්ද ඒ දීප්තිය? තෙරුන්වහන්සේ අවුලට පත් කරන්නාහු 'දීප්තියක් නම් පහන් එළියක් විය හැකියි. මැණිකක එළියක් විය හැකියි. මේ ආදිය කීහ. ඉන්පසු 'ඔබවහන්සේ එය වසන්නාහු යයි පෙරැත්ත කළහ. එසේයයි පිළිගෙන දැන්වූහ. කාලි වල්ලි මණ්ඩප (කලුවැල් මඩුව) වාසී මහානාග තෙරුන් මෙන්.

උන්වහන්සේ වනාහි ගතපච්චාගත වත පුරන්නාහු පළමුවෙන්ම භාග්‍යවතුන් වහන්සේගේ මහා ප්‍රධානය පුදන්නෙමියි සත්වසක් සිටම සක්මන අධිෂ්ඨාන කළහ. නැවත සොළොස් වසක් ගතපච්චාගත වත පුරා රහත්බවට පත්වූහ. උන්වහන්සේ කමටහන් යුතු සිතින්ම පා ඔසවන්නාහු කමටහන නැතිව එසවූ කල්හි ආපසු හැරී ගම අසලට ගොස් එළදෙනක්ද පැවිද්දෙක්දැයි සැක කළ නොහැකි පෙදෙසක සිට සිවුර පොරවා කිසිල්ලෙහි ගසාගත් බඳුනෙන් ගත් ජලයෙන් පාත්‍රය සෝදා කට පුරවා ගනී. කුමක් නිසාද? මා හට භික්ෂාව දීමට හෝ වඳින්ට වත් පැමිණි මිනිසුන්ට දීර්ඝායුෂ ඇත්තෝ වෙත්වායි වචන මාත්‍රයෙන් වුවද කමටහන් අවුල් වීයයි. ස්වාමීනි, අද කවදාදැයි දවස හෝ භික්ෂූන් ගණන හෝ ගැන ප්‍රශ්න කළවිට හෝ ජලය ගිල දන්වති. යම්හෙයකින් දවස ගැන අසන්නෝ නොවෙත්නම් නික්මෙන වේලාවෙහි ගම්දොර කෙළගසා යති. කොළොම්තොට විහාරයෙහි වස් එළඹගත් පනසක් භික්ෂූන් මෙන්.

උන්වහන්සේලා ඇසළ පුණු පොහෝදා කතිකාවතක් කළාහුය. රහත්බවට නොපැමිණ ඔවුනොවුන් කතා නොකරන්නෙමු'යි ගමට පිඬු පිණිස පිවිසෙන්නාහු කටෙහි දිය පුරවා පිවිසියාහුය. දවස් ආදිය ඇසූකල්හි කියූ පරිදිම පිළිපැද්දාහ. එහි මිනිස්සු කටින් දිය ඉවත දමනු දැක දැනගත්හ. 'අද එක්නමක් ආවේය. අද පස්නමක් ආහ'යි මෙසේද සිතූහ. මුන්වහන්සේලා අප සමග පමණක් කථා නොකරන්නාහුද නැතහොත් ඔවුනොවුන් කථා නොකරන්නාහුද? ඔවුනොවුන් කථා නොකරත්නම් ඒකාන්තයෙන් විවාද ඇත්තෝ වන්නාහුය. එනු, අපි ඔවුනොවුන් කමා කරවන්නෙමුයි සියල්ලෝ විහාරයට ගොස් පනසක් භික්ෂූන් අතර භික්ෂූන් දෙනමක් එක්තැනක නොදුටහ. ඉන්පසු ඔවුන් අතර විමසිලිමත් පුරුෂයෙක් මෙසේ කීය. පින්වත්නි, කලහකාරීන් වසන තැන මෙසේ නොවේ. සෑමළුව බෝමළුව මැනවින් හැමද ඇත. මුසුන් තැන්පත්කොට ඇත. බොන ජලය, පරිභෝජනය කරන ජලය මැනවින් තබා ඇතැයි ඔවුහු එතැනින් නැවතුණහ. ඒ භික්ෂූහුද තෙමස ඇතුළතදීම රහත්බවට පත්ව මහා පවාරණයෙන් විසුද්ධි පවාරණය කළහ. මෙසේ කාළවල්ලි මණ්ඩපවාසී මහානාග තෙරුන් මෙන්, කොළොම්තොට විහාරයෙහි වස් වැසූ භික්ෂූන් මෙන්ද, කමටහන් යුතු වූ සිතින්ම පා ඔසවන්නාහු ගම අසලට ගොස් මුවෙහි ජලය පූරවා වීථි සලකා යම්තැනක සුරාසොඬ ආදීහු, කලහකරුවෝ, සැඩ ඇත් අස් ආදීහු නැත්ද ඒ වීථියට පිවිසෙත්. එහිද පිඬු පිණිස හැසිරෙමින් ඉක්මනින් ඉක්මනින් වේගයෙන් නොයති. ජවනපිණ්ඩපාතික ධුතාංගයයි දෙයක් නම් නැත. විෂම භූමිභාගයක තැබූ දිය කළයක් මෙන් නිශ්චලව යති. ගෙපිළිවෙලින් පිවිසියාහුද දෙනු කැමති බව හෝ නොදෙනු කැමැති බව සලකන්ට සුදුසුකල් අපේක්ෂාවෙන් භික්ෂුව ගෙන ඇතුළුගම හෝ පිටගම හෝ විහාරයට හෝ පැමිණ පහසු සුදුසු අවකාශයක හිඳ කමටහන් මෙනෙහි කරන්නාහු ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව එළඹවාගෙන ඇස් අඳුන් වණ ආලේපන කුණුමස් උපමා වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරමින් අට අඟකින් යුතු අහර අනුභව කරති. විනෝදය පිණිස නොව, මදය පිණිස නොව, සැරසීම පිණිස නොව, අලංකාරය පිණිස නොව, අහර අනුභවකොට ජලකිස කොට මොහොතක් බතින් ඇතිවන ක්ලාන්තය, මැඩපවත්වා පෙරබත් කල්හි මෙන් පසුබත් කල්හිද, පෙරයමද පසුයමද කමටහනම මෙනෙහි කරත්. මෙය හරති පච්චාහරති නමැයි කියනු ලැබේ. මේ හරණ ප්‍රත්‍යාහරණ සංඛ්‍යාත වූ ගතපච්චාගත වත පුරමින් උපනිශ්‍රය සම්පන්න වේනම් ප්‍රථම වයසෙහිදීම රහත්බවට පැමිණෙයි. ප්‍රථම වයසෙහි නොපැමිණේ නම් මධ්‍යම වයසේදී පැමිණෙයි.

මධ්‍යම වයසෙහිදී නොපැමිණේනම් මරණ සමයෙහි පැමිණෙයි. මරණ සමයෙහි නොපැමිණේ නම් දේවපුත්‍රයකු වී පැමිණෙයි. දේවපුත්‍රයෙක්වැ බුදුන් නූපන් කල්හි ඉපද පච්චෙක බෝධිය සාක්‍ෂාත් කරයි. පච්චෙක බෝධිය සාක්‍ෂාත් නොකෙරේ නම් බුදුවරුන් හමුවෙහි වහා අභිඥාලාභී හෝ වෙයි. බාහිය දාරුචීරිය තෙරුන් මෙන්, සාරිපුත්‍ර තෙරුන් මෙන් මහා ප්‍රාඥව වෙයි. මහා මොග්ගල්ලාන තෙරුන් මෙන් මහා ඍද්ධි ඇත්තේව වෙයි. මහා කස්සප තෙරුන් මෙන් ධූතවාදීව වෙයි. අනුරුද්ධ තෙරුන් මෙන් දිවැස් ඇත්තේව වෙයි. උපාලි තෙරුන් මෙන් විනයධරව වෙයි. පුණ්ණ මන්තානි පුත්ත තෙරුන් මෙන් ධර්මකථිකව වෙයි. රේවත තෙරුන් මෙන් ආරණ්‍යකව වෙයි. ආනන්‍ද තෙරුන් මෙන් බහුශ්‍රැතව වෙයි. රාහුල බුද්ධ පුත්‍රයා මෙන් ශික්‍ෂාකාමීව වෙයි. මෙසේ මේ චතුෂ්කයෙහි යමෙක් ගෙනයාද ආපසු ගෙනඒද ඔහුට ගෝචර සම්ප්‍රජානනය මුදුන්පත් වෙයි.

අභික්කන්තං ආදී තන්හි මුළානොවීම අසම්මූළ්හ සම්ප්‍රජානනය. එය මෙසේ දතයුතුය. මෙහි භික්‍ෂුව යන්නේ හෝ නවතින්නේ හෝ යම්සේ අන්ධ පෘථග්ජනයා යාම් ආදියෙහිදී ආත්මයයි. ආත්මය විසින් ගමනක් උපදවන ලදී කියා හෝ 'මම යමි. මා විසින් ගමනක් උපදවන ලදී කියා හෝ මුළාවට පත්වෙයි. එසේම මුළාවට පත්නොවන්නේ 'යමි'යි සිතක් උපදිනවිට එම සිත සමගම සිතින් හටගන්නා වායෝ ධාතුව විඥප්තිය ඇතිකරමින් උපදී. මෙසේ චිත්ත කිරිය වායෝ ධාතුව පැතිර යාම් වශයෙන් මේ කාය සම්මත ඇටසැකිල්ල ඉක්මවා යයි. මෙසේ ගමන් කරන ඔහුගේ එක් එක් පාදයක් එසවීමේදී පඨවි ධාතුව ආපෝ ධාතුව යන ධාතු දෙක පහත් වෙයි. මද වෙයි. ඉතිරි දෙක වැඩි වෙයි. බලවත් වෙයි. ගෙන ඒම් පා එසවීම් වලදී මෙන්. දීමේදී තේජෝ ධාතුව වායෝ ධාතුව යන දෙක අඩුවෙයි. මඳ වෙයි. ඉතිරි දෙක ඉවත් කිරීම් බාධා කිරීම් ආදියෙහිදී මෙන් වැඩි වෙයි. බලවත් වෙයි. එහි ගෙනඒමෙහි පැවති රූපාරූප ධර්ම ගෙනඒමට නොපැමිණේ. එසේම ගෙනඒමෙහි පැවති රූපාරූප ධර්ම පා එසවීමට නොපැමිණේ. පා එසවීමෙහි පැවති රූපාරූප ධර්ම දීමට නොපැමිණේ. දීමෙහි පැවති රූපාරූප ධර්ම ඉවත්කිරීමට නොපැමිණේ. ඉවත්කිරීමෙහි පැවති රූපාරූප ධර්ම බාධා කිරීමට නොපැමිණේ. ඒ ඒ තැන පුරුක් පුරුක්ව, හන්දි හන්දිව, ඉරි ඉරිව රත්වූ කබලෙහි දැමූ අමු තල ඇට මෙන් තට තට අනුකරණයෙන් බිඳෙයි. එහි කවර එකෙක් යාද? කවර එකකුගේ ඒමක්ද?

පරමාර්ථ වශයෙන් නම් ධාතූන්ගේම ගමනය. ධාතූන්ගේ සිටීමය. ධාතූන්ගේ හිඳීමය. ධාතූන්ගේ සයනයය. රූපය සමග ඒ ඒ කොටසෙහි:

අඤ්ඤං උපපජ්ජතෙ චිත්තං - අඤ්ඤං චිත්තං නිරුජ්ඣති
අවිච්මනු සම්බන්ධො නදීසොතොව වත්තති

අන් සිතක් උපදී - අන් සිතක් වැනසී යයි
අවීචියට සබැඳිව - ගං දහර මෙන් පවතී

මෙසේ අභික්කම ආදී තන්හි මුළානොවීම අසම්මූළ්හ සම්ප්‍රජානනය නම් වේ.

**අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති යන පදයෙහි අර්ථය නිමියේ ය.**

ආලොකිතෙ විලොකිතෙ යනු මෙහි ආලොකිතං යනු ඉදිරිපස බැලීමයි. විලොකිතං යනු අනුදිශාවන් බැලීමයි. අනිත් යට උඩ පසුපස බැලීම් වශයෙන් ඔලොකිත බැලීම. උල්ලොකිත (උඩ බැලීම) පලොකිත (පසුපස බැලීම) නම් වෙයි. ඒවා මෙහිදී නොගන්නා ලදී. සාරූප්‍ය වශයෙන් මේ දෙකම ගන්නා ලදී. මේ අයුරින් ඒ සියල්ල ගන්නා ලද්දේමය. එහි 'බලන්නෙමි'යි සිතක් උපන්කල්හි සිත් වශයෙන්ම බලා අර්ථ පරිග්‍රහණය වේ. සාර්ථක සම්ප්‍රජානනය ආයුෂ්මත් නන්ද තෙරුන් කාය සාක්ෂිකොට දතයුතුය. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දේය. 'මහණෙනි, නන්දට පෙරදිග බැලිය යුතුයයි සිතක් වේනම්, සියලු චෛතසික වශයෙන් එක්තැන්කොට නන්ද පෙරදිග බලයි. 'මෙසේ පෙරදිග බලන්නා වූ මාගේ ක්‍රෝධය දොම්නස යන පාපී අකුශල ධර්මයෝ ගලා නොඑත් යනුවෙන්. මෙසේ සාර්ථක සම්ප්‍රජානනය වෙයි. මහණෙනි, නන්දට පශ්චිම දිශාව -පෙ- උතුරු දිශාව, දකුණු දිශාව, උඩ, යට, අනුදිශාවන් බැලිය යුතුයයි සිතක් වේනම් සියලු චෛතසික වශයෙන් එක්තැන්කොට නන්ද අනුදිශාව බලයි. මෙසේ අනුදිශාව බලන්නා වූ මාගේ -පෙ- සම්ප්‍රජානනය වෙයි. තවද, මෙහිද පෙර කියූ චෛත්‍ය දර්ශන ආදී වශයෙන් සාර්ථක බවද, සත්ප්‍රාය බවද දතයුතුය.

කමටහන අත්නොහැරීමම ගෝචර සම්ප්‍රජානනය නම් වේ. ඒ නිසා ස්කන්ධ ධාතු ආයතන කර්මස්ථානිකයන් සමග තමාගේ කර්මස්ථාන වශයෙන්ම කසිණ ආදී කර්මස්ථානිකයන් සමග හෝ කර්මස්ථාන ශීර්ෂයෙන්ම බැලීම විමසීම කළයුතුය. අභ්‍යන්තරයෙහි ආත්මය නම් බලන්නෙක් හෝ විමසන්නෙක් නැත. 'බලන්නෙමි' යන සිත උපදිනවිට ඒ සිත සමගම සිතෙහි හටගන්නා වායෝ ධාතුව විඤ්ඤප්තිය දනවමින් උපදී. මෙසේ චිත්ත, කිරිය වායෝ ධාතුව පැතිරීම් වශයෙන් යට ඇස් පිහාටුව යටට ගිලෙයි. උඩ ඇස් පිහාටුව උඩ එල්ලෙයි. යන්ත්‍රයෙන් හැසිරෙන්නෙක් නම් නැත. එයින් දර්ශන කෘත්‍යය සිදුකරන චක්ඛු විඤ්ඤාණය උපදීනුයි මෙසේ ප්‍රජානනය මෙහි අසම්මෝහ සම්ප්‍රජානනය නම් වේ. තවද මූල පරිඥාව, ආගන්තුක බව තාවකාලික බව වශයෙන් මෙහි අසම්මෝහ සම්ප්‍රජානනය දතයුතුය. මූලපරිඥා වශයෙන්:

භවංගා වජ්ජනං චෙව දස්සනං සම්පටිච්ඡනං
සන්තීරණං වොත්ථපනං - ජවනං භවති සත්තමං

එහි භවාංගය උත්පත්ති භවයාගේ අංග කෘත්‍යය සිදුකරමින් පවතීනුයි එය වටකොට කිරිය මනෝධාතු ආවර්ජන කෘත්‍යය සිදුකරමින්, එය නිරුද්ධ වීමෙන් චක්ඛු විඤ්ඤාණය දර්ශන කෘත්‍යය සිදුකරමින්, එය නිරුද්ධ වීමෙන් විපාක මනෝ ධාතුව සම්පටිච්ඡන කෘත්‍යය සිදුකරමින්, එය නිරුද්ධවීමෙන් කිරිය මනෝවිඤ්ඤාණ ධාතුව සන්තීරණ කෘත්‍යය සිදුකරමින්, එය නිරුද්ධවීමෙන් කිරිය මනෝ විඤ්ඤාණ ධාතුව වොත්ථපන කෘත්‍යය සිදුකරමින්, එය නිරුද්ධ වීමෙන් සත්වරක් ජවනය දුවයි. එහි ප්‍රථම ජවනයෙහිද 'මේ ස්ත්‍රියකි. මේ පුරුෂයෙකියි ඇලෙන, දූෂණය වන, මුළාවන වශයෙන් ආලෝකිත විලෝකිතයක් නොවේ. දෙවැනි ජවනයෙහිද -පෙ- සත්වැනි ජවනයෙහිද නොවේ. මේ යුදබිමෙහි යෝධයන් යට උඩ වශයෙන් කැපී වැටුණු කල්හි මෙන් 'මේ ස්ත්‍රියකි. මේ පුරුෂයෙකි'යි ඇලීම ආදී වශයෙන් ආලෝකිත විලෝකිතයක් ඇත. මෙසේ මෙහි මූල පරිඥා වශයෙන් අසම්මෝහ සම්ප්‍රජානනය දතයුතුය.

චක්ෂු ද්වාරයෙහි රූපයක් පහළවූ කල්හි භවාංග චලනයෙන් උඩ තම තමාගේ කෘත්‍ය නිෂ්පාදන වශයෙන් ආවර්ජන ආදිය ඉපිද නිරුද්ධ වූ කල්හි අවසන ජවනය උපදී. එය පළමුව උපන් ආවර්ජන ආදීන්ට ගෙය වූ චක්ෂු ද්වාරයෙහි ආගන්තුක පුරුෂයකු වැනි වෙයි. අනුන්ගේ

ගෙයි කිසිවක් ඉල්ලන්ට ආ ආගන්තුක පුරුෂයාට ගෙහිමියන් නිහඬව සිටිකල්හි අණකිරීම යුතු නැත්තේ යම්සේද, එසේ ආවර්ජන ආදීන්ට ගෙය වූ චක්ෂු ද්වාරයෙහි ආවර්ජන ආදීන් නොඇලෙන කල්හි, දූෂණය නොකරන කල්හි, මුළා නොකරන කල්හි ඇලීම දූෂණය මුළාවීම යුතු නැත. මෙසේ ආගන්තුක භාව වශයෙන් අසම්මූඪ සම්ප්‍රජානනය දතයුතුයි.

තවද, ස්කන්ධ ධාතු ආයතන ප්‍රත්‍යය, ප්‍රත්‍යවේක්ෂණ වශයෙන්ද මෙය දතයුතුය. මෙහි චක්ෂුවද රූපයද රූපස්කන්ධයයි. දර්ශනය විඥාන ස්කන්ධයයි. ඒ හා බැඳුණු වේදනාව වේදනා ස්කන්ධයයි. සංඥාව සංඥා ස්කන්ධයයි. ස්පර්ශය ආදිකොට ඇත්තේ සංස්කාර ස්කන්ධයයි. මෙසේ මේ පංචස්කන්ධයන්ගේ එකතුව ඇතිකල්හි බැලීම විමසීම දක්නට ලැබේ. එහි බැලීමෙහි කවර එකද? විමසීමෙහි කවර එකද? එසේ ඇස චක්ඛු ආයතනයි. රූප රූපායතනයයි. දර්ශනය මනායතනයයි. වේදනා ආදී සම්ප්‍රයුක්ත ධර්මයෝ ධර්මායතනයි. මෙසේ මේ ආයතන සතරෙහි එකතුවෙහි බැලීම විමසීම දක්නට ලැබේ. එහි බැලීමෙහි කවර එකද? විමසීමෙහි කවර එකද? එසේ ඇස චක්ඛු ධාතුවයි. රූපය රූප ධාතුවයි. දර්ශනය චක්ඛු විඤ්ඤාණ ධාතුවයි. ඒහා බැඳුණු වේදනා ආදී ධර්මයෝ ධම්මධාතුය. මෙසේ මේ ධාතූන් සතරෙහි එකතුවෙහි ආලෝකනයෙහි එකද? විලෝකනයෙහි කවර එකද? එසේ ඇස නිශ්‍රය ප්‍රත්‍යයයි. රූපය ආරම්මණ ප්‍රත්‍යයයි. ආවර්ජනය අනන්තර සමනන්තර උපනිශ්‍රය නත්‍ථිවිගත ප්‍රත්‍යයයි. ආලෝකය නිශ්‍රය ප්‍රත්‍යයයි. වේදනා ආදිය සහජාත ප්‍රත්‍යයයි. මෙසේ මේ ප්‍රත්‍යයන්ගේ එකතුවෙහි ආලෝකන විලෝකන දක්නට ලැබේ. එහි ආලෝකනයෙහි කවර එකද? විලෝකනයෙහි කවර එකද? මෙසේ මෙහි ස්කන්ධ ධාතු ප්‍රත්‍යය ප්‍රත්‍යවේක්ෂණ වශයෙන්ද අසම්මූඪ සම්ප්‍රජානනය දතයුතුය.

**සමිඤ්ජිතෙ පසාරිතෙ** යනු පුරුක්වල හැකිළීමෙහි දිගහැරීමෙහි එහි චිත්ත වශයෙන්ම හැකිළීම දිගහැරීම නොකොට අත්පා හැකිළීම දිගහැරීම ප්‍රත්‍යයෙන් අර්ථානර්ථ ගැන බලා අර්ථ පරිග්‍රහණය සාර්ථක සම්ප්‍රජානනයයි. එහි අත්පා බොහෝ වේලාවක් හකුළුවා හෝ දිගහැරම සිටියහුට ක්ෂණයෙන් ක්ෂණය වේදනා උපදී. සිත ඒකාග්‍රතාව නොලබයි. කමටහන පැටලෙයි. විශේෂයක් අවබෝධ නොකරයි. සුදුසුකල්හි හැකිලෙන අවස්ථාවෙහි දිගහරින්නාට ඒ වේදනා නූපදී. සිත එකඟ බව

ලබයි. කමටහන වර්ධනයට යයි. විශේෂය අවබෝධ කරයි. මෙසේ අර්ථානර්ථ පරිග්‍රහණය දතයුතුය.

අර්ථය ඇතිකල්හිද සත්ප්‍රාය අසත්ප්‍රාය ගැන බලා සත්ප්‍රාය පරිග්‍රහණය සත්ප්‍රාය සම්ප්‍රජානනයයි. මේ එහි ක්‍රමයයි. මහා චෛත්‍යයෙහි මළුවෙහි තරුණ භික්ෂූහු සජ්ඣායනා කරති. ඔවුන්ගේ පිටුපස තරුණ භික්ෂුණීහු ධර්මශ්‍රවණය කරති. එහි එක් තරුණයෙක් අත දිගහරින්නේ කාය සංසර්ගයට පැමිණ ඒ කරුණින්ම ගිහි වූයේය. තවත් භික්ෂුවක් පා දිග හරින්නේ ගින්නෙහි දිගහැරීය. ඇටය හැපී පාදය දැවුණේය. තවෙකෙක් තුඹසක දිගහැරියේය. හේ සර්පයකු විසින් දෂ්ට කරන ලදී. තවෙකෙක් සිවුරුකුටි දඬුවෙහි දිගහැරියේය. එය මාපිලකු විසින් දෂ්ට කරන ලදී. ඒ නිසා මෙබඳු අසත්ප්‍රාය තන්හි දිගනොහැර සත්ප්‍රාය තන්හි දිගහැරිය යුතුය. මේ මෙහි සත්ප්‍රාය සම්ප්‍රජානනයයි.

ගෝචර සම්ප්‍රජානනය මහාථෙර වත්‍ථුවෙන් දැක්විය යුතුය. මහ තෙරණුවෝ දිවාස්ථානයෙහි හුන්නාහු අතවැසියන් සමග දහම් කියමින් වහා අත නමා නැවත තිබුණු තැන තබා හෙමින් නැමූහ. අතවැසි භික්ෂූහු උන්වහන්සේගෙන් ඇසූහ. 'ස්වාමීනි, අත වහා නමා නැවත තිබුණු තැන තබා හෙමින් කුමක් නිසා නැමූ සේක්ද?' 'ඇවැත්නි, මම යම්තැනක පටන් කමටහන් මෙනෙහි කිරීම ඇරඹූයෙම්ද, කමටහන මුදා අත් නමා නැත. දැන් ඔබ සමග කථා කරමින් සිටින මා විසින් කමටහන මුදා නමන ලද්දේය. ඒ නිසා නැවත තිබුණු තැන තබා නැමුවෙමියි කීහ. 'මැනවි ස්වාමීනි. භික්ෂුවක් විසින් මෙසේ විය යුතුය'යි මෙසේ මෙහිද කමටහන අතහැරීමම ගෝචර සම්ප්‍රජානන යැයි දතයුතුය.

අභ්‍යන්තරයෙහි ආත්මය නමැති නැමෙන දිගහැරෙන කිසිවක් හෝ නැත. කියන ලද අයුරු චිත්ත කිරිය වායෝ ධාතු පැතිරීමෙන් නූල් ඇදීමෙන් දාරු යන්ත්‍රයෙහි අත්පා නැටවීම මෙන් නැමීම දිගහැරීම වෙයි. මෙසේ ප්‍රජානනය මෙහි අසම්මූඪ සම්ප්‍රජානනයයි දතයුතුය.

**සංඝාටි පත්තචීවර ධාරණෙ** යනු මෙහි සඟල සිවුරු හැඳීම් පෙරවීම් වශයෙන් පාත්‍රයට භික්ෂා ප්‍රතිග්‍රහණ ආදී වශයෙන් කරන පරිභෝගය ධාරණ නම්. එහි සඟල සිවුරු දැරීමෙහි වනාහි හැඳ පෙරව පිඬු පිණිස හැසිරෙන්නහුගේ ආමිෂ ලාභය 'සීතල නැතිකිරීම පිණිස' ආදී ක්‍රමයෙන්

භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද ආකාර අර්ථය අර්ථ නම්. ඒ වශයෙන් සාර්ථක සම්ප්‍රජානන යයි දතයුතුය.

උෂ්ණ ප්‍රකෘති ඇත්තහුට හා දුර්වල වූවහුට සියුම් සිවුර සත්ප්‍රාය වේ. ශීත ප්‍රකෘති ඇත්තහුට ඝන වූ දෙපට සිවුර සත්ප්‍රාය වේ. වෙනස් වූ සිවුර අසත්ප්‍රායය. අණ්ඩ දැමීම ඔහුට කරදරකාරී වෙයි. එසේම පට දුහුල් ආදී භේද ඇති සිවුරු ආශා ඇතිකරයි. එබඳු සිවුර අරණ්‍යයෙහි තනිව නිවැසීමට අන්තරාය ගෙනදෙන සුලුය. ජීවිතය අනතුරට පැමිණීම හෝ වෙයි. අපිළිවෙළින් යමක් නිමිති කීම් වැනි මිථ්‍යා ආජීව වශයෙන් උපන්නේ වේද, යමක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද කුශල ධර්මයෝ පිරිහෙත්ද, එය අසත්ප්‍රායය. එයින් වෙනස් වූ දෙය සත්ප්‍රායය. ඒ වශයෙන් මෙහි සත්ප්‍රාය සම්ප්‍රජානනය කමටහන් අත්හැරීම් වශයෙන්ම ද ගෝචර සම්ප්‍රජානනය දතයුතුය.

අභ්‍යන්තරයෙහි ආත්මය නම් පාත්‍රය ගන්නා කිසිවෙක් නැත. කියන ලද පරිදි චිත්ත කිරිය වායෝධාතු පැතිරීම් වශයෙන් ම පාත්‍රය ගැනීමක් නම් නැත. එහි පාත්‍රය ද අචේතනිකය. අත් ද අචේතනිකය.' මම අතින් ගන්නා ලද්දෙම්'යි පාත්‍රය නොදනී. අප විසින් පාත්‍රය ගන්නා ලද්දේ යයි අත්ද නොදනී. ධාතුහුම ධාතුන් ගනිති. අඬුවෙන් ගිනිවත් පාත්‍ර ග්‍රහණයක් මෙනැයි මෙසේ පැවති විනිශ්චය වශයෙන් අසම්මූඪ සම්ප්‍රජානනය දතයුතුය.

තවද, සිඳුණු අත්පා ඇති, වණමුඛයෙන් වැගිරෙන ලේ සැරවයෙහි පණු කුලයන් ඇති නිලමැස්සන් විසින් ගැවසුණු, අනාථ ශාලාවෙහි අනාථ මිනිසුන් දැක දයාබහුල පුරුෂයෝ ඔවුන්ට වණ පට රෙදිද වලං කබල් ආදියෙහි තබා බෙහෙත් පිරිනමති. එහි රෙදි ආදිය සමහරක් තුනීය. සමහරක් ඝනය. බෙහෙත් ගෙනඑන කබල් ආදිය සමහරක් විසිතුරුය. සමහරක් අවලස්සනය. ඔවුහු එහිදී සොම්නස් හෝ දොම්නස් නොවෙති. වණ ඔතා බැඳීම් මාත්‍රයෙන් රෙද්දෙන් ද කබලෙන් බෙහෙත් පිළිගැනීම් මාත්‍රයෙන්ද ඔවුන්ට ප්‍රයෝජන වේ. මෙසේ ඒ භික්ෂුව සිවුර වණය ඔතන රෙද්ද සේද, පාත්‍රය බෙහෙත් කබල මෙන්ද, කබලෙහි බෙහෙත් මෙන් පාත්‍රයෙහි ලද භික්ෂාවද සලකයි. මෙය සඟල පාසිවුරු දැරීමෙහි අසම්මූඪ සම්ප්‍රජානනයෙන් උතුම් වූ සම්පජාන කාරීයයි දතයුතුය.

අසිත ආදී තන්හි අසිතෙ යනු පිණ්ඩපාත භෝජනයෙහි. පීතෙ යනු කැඳ ආදී පානයෙහි, ඛායිතෙ යනු පිටිකැවුම් ආදිය වැළඳීමෙහි. සායිතෙ යනු මීපැණි හකුරු ආදිය රසබැලීමෙහි. එහි නෙවදවාය යන ආදී ක්‍රමයෙන් කියන ලද අටවැදෑරුම් අර්ථය අත්‍ථො නම්. ඒ වශයෙන් සාර්ථක සම්ප්‍රජානනය දතයුතුය.

කටුක ප්‍රණීත තිත්ත මිහිරි ආදීන්හි යම් බොජුනකින් යමකුට අපහසුවක් වේද, එය ඔහුට අසත්ප්‍රායය. යමක් නිමිති කර්ම වශයෙන් ලැබුවක් නම්, යමක් බුදින්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද එය ඒකාන්තයෙන් අසත්ප්‍රායමය. වෙනස් වූ දෙය සත්ප්‍රායය. ඒ වශයෙන්ද මෙහි සත්ප්‍රාය සම්ප්‍රජානනයද, කමටහන් අත්හැර දැමීම් වශයෙන් ද ගෝචර සම්ප්‍රජානනයද දතයුතුය.

අභ්‍යන්තරයෙහි ආත්ම නම් කිසිදු අනුභව කරන්නෙක් නැත. කියන ලද ආකාර චිත්ත කිරිය වායෝ ධාතු පැතිරවීමෙන්ම පාත්‍ර ප්‍රතිග්‍රහණය නම් වෙයි. චිත්ත කිරිය වායෝ ධාතු පැතිරවීමෙන්ම අතට පාත්‍රයෙහි බැසීම සිදුවෙයි. චිත්ත කිරිය වායෝ ධාතු පැතිරවීමෙන්ම පිඬු කිරීම, පිඬු උඩට ගැනීම, මුව විවර කිරීම වෙයි. කිසිවෙක් යතුරෙන් යන්ත්‍රයකින් හකුපාඩා විවර නොකරයි. චිත්ත කිරිය වායෝධාතු පැතිරවීමෙන්ම පිඬුව මුවෙහි තැබීමද, උඩ දත් වල මොහොල කටයුත්ත සිදුකිරීම, යට දත්වල වංගෙඩියක කටයුත්ත සිදුකිරීමද, දිවෙන් අතින් කෙරෙන කටයුත්ත කිරීමද සිදුවෙයි. මෙසේ එහි දිවගින් සිහින් කෙල දිවමුලින් මහ කෙල මැකෙයි. එය යටදත් වංගෙඩියෙහි දිව අතින් පෙරලේ. කෙල ජලයෙන් තෙමේ. උඩ දත් මොහොලින් සුණු වූයේ වෙයි. කිසිවෙක් හැන්දෙන් හෝ අළුවෙන් ඇතුළත පෙරලෙන්නෙක් නැත. වායෝ ධාතුවෙන්ම පිවිසෙයි. පිවිස පිවිසි දෙය කිසිවෙක් පරඬැල් පඳුරක් කොට දරන්නේ නැත. වායෝ ධාතු වශයෙන්ම සිටී. සිටි සිටි දෙය කිසිවෙක් උදුන තනා ගිනිදල්වා පිසන්නේ නැත. තේජෝ ධාතුවෙන්ම පිසේ. පැසුණු පැසුණු දෙය කිසිවෙක් දඬුවකින් හෝ යටිකයින් පිටතට ගෙනයන්නේ නැත. වායෝ ධාතුවෙන්ම ගෙනයේ. මෙසේ වායෝ ධාතුවම ගෙන එයි. හසුරුවයි. දරයි. පෙරලයි. සුණු කරයි. වියලවයි. පිටතට ගෙන යයි. පඨවී ධාතුව දරයි. පෙරලයි. සුණු කරයි. වියලවයි. ආපෝ ධාතුව තෙත් කරයි. තෙත්බව පාලනය කරයි. තේජෝ ධාතුව ඇතුළට පිවිසි දේ පැසවයි. ආකාස ධාතුව මාර්ගය වෙයි. විඤ්ඤාණ ධාතුව ඒ ඒ

තැන මනා යෙදුම නිසා තුටුකරයි. මෙසේ පැවති විනිශ්චය වශයෙන් මෙහි අසම්මූඪ සම්ප්‍රජානනය දතයුතුය.

තවද 'ගමනින්, සෙවීමෙන්, පරිභෝගයෙන්, ආශයෙන්, නිධානයෙන්, නොපැසුණු බැවින්, පැසුණු බවින්, ඵලයෙන් වැගිරෙන බැවින්, මකන බැවින්' යයි මෙසේ දශවැදෑරුම් පිළිකුල් බව ප්‍රත්‍යවේක්ෂාවෙන් මෙහි අසම්මූඪ සම්ප්‍රජානනය දතයුතුයි. විස්තර කථාව විශුද්ධි මාර්ගයෙහි ආහාරෙ පටික්කූල සඤ්ඤා නිද්දේසයෙන් ගතයුතුයි.

**උච්චාර පස්සාව කම්මෙ** යනු මුත්‍ර කිරීමද මලපහ කිරීමද සිදුකිරීමෙහි එහි පැමිණිකල මුත්‍රමල පහ නොකරන්නාගේ සකල ශරීරයෙන් ඩහදිය මිදෙයි. ඇස් කැරකේ. සිත එකඟ නොවේ. වෙනත් රෝගද උපදී. කරන්නාට මේ සියල්ලම නොවේ. මේ මෙහි අර්ථයයි. ඒ වශයෙන් සාර්ථක සම්ප්‍රජානනය දතයුතුය.

නොතැන මුත්‍රමල පහ කරන්නාට ඇවතක් වේ. අයස වැඩේ. ජීවිත අන්තරාය වෙයි. සුදුසු තැන කරන්නාට ඒ සියල්ල නොවේ. මේ මෙහි සත්ප්‍රාසයයි. ඒ වශයෙන් සත්ප්‍රාය සම්ප්‍රජානනය වේ. කමටහන අත්හැරීම් වශයෙන්ද ගෝචර සම්ප්‍රජානනය දතයුතුය.

අභ්‍යන්තරයෙහි ආත්මයැයි මුත්‍රමල කාර්යය සිදුකරන්නෙක් නැත. චිත්ත කිරිය වායෝ ධාතු පැතිරීමෙන්ම මුත්‍ර මල පහකිරීමේ කාර්යය වේ. යම්සේ පැසුණු ගඩුවෙහි ගඩුව කැඩීමෙන් සැරව ලේ කැමැත්තක් නැතිව නික්මේද, එසේම බර වැඩි ජල බඳුනින් ජලය කැමැත්තක් නැතිව නික්මෙයි. මෙසේ පක්වාශයෙන් මිදුණු වස්තිවල රැස්වූ මුත්‍රමල වාතවේගයෙන් පෙළනු ලැබුවේ කැමැත්තක් නැතිවම නික්මෙයි. මෙසේ නික්මෙන මුත්‍රමල ඒ භික්ෂුවට නොවේ. අන්‍යයාටද නොවේ. හුදෙක් සිරුර ගලා යාමම වෙයි. කෙසේද? යම්සේ දිය කළයෙන් පැරණි ජලය ඉවත ලන්නහුට එය තමාගේ නොවේ. අන්‍යයන්ගේ ද නොවේ. හුදෙක් පිළිදැගුම් මාත්‍රයම වේ. මෙසේ පැවති විනිශ්චය වශයෙන් අසම්මූඪ සම්ප්‍රජානනය දතයුතුය.

**ගත ආදී** තත්හි **ගතෙ** යනු ගමනෙහි. **ඨිතෙ** සිටීමෙහි. **නිසින්නෙ** හිඳීමෙහි. **සුත්තෙ** සයනයෙහි. **ජාගරිතෙ** නිදිවැරීමෙහි. **භාසිතෙ** කීමෙහි.

තුණ්හීභාවෙ නොකීමෙහි යන්නේ හෝ යමියි දනී. සිටියේම සිටියෙමියි දනී. හුන්නේ හුන්නෙමියි දනී. නිදන්නේ නිදාගතිමියි දනී. මේ සූත්‍රයෙහි මාර්ග ඊර්යාපථ කියන ලදී. අභික්කන්තෙ, පටික්කන්තෙ, ආලොකිතෙ, විලොකිතෙ, සමිඤ්ජිතෙ. පසාරිතෙ යනුවෙන්. මෙහි ඇත්තේ මධ්‍යම ඒවාය. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ යනු මෙහි කුඩා කැඩුණු ඉරියව් කියන ලදී. ඒ නිසා මේවායෙහිද කියන ලද පරිදිම සම්ප්‍රජාන කාරිතාව දතයුතුය.

තිපිටක මහාසිව තෙරණුවෝ මෙසේ කීහ. යමෙක් දිගුකලක් ඇවිද හෝ සක්මන්කොට හෝ අපරභාගයෙහි සිටියේ මෙසේ සිතාබලයි. සක්මන් කරන කල්හි පැවති රූප රූපධර්ම මෙහිදීම නිරුද්ධය. මෙය ගතෙ සම්පජානකාරී නම් වෙයි. යමෙක් සජ්ඣායනය හෝ කරන්නේ ප්‍රශ්න හෝ විසඳන්නේ කමටහන් හෝ මෙනෙහි කරන්නේ බොහෝකල් සිට අපරභාගයෙහි හුන්නේ මෙසේ සිතා බලයි. සිටිකල්හි පැවති රූපාරූප ධර්ම මෙහිදීම නිරුද්ධ විය. මෙය ඨිතෙ සම්පජානකාරී නම්. යමෙක් සජ්ඣාය ආදී ග්‍රහණ වශයෙන්ම බොහෝකල් හිඳ පසුකලෙක වැදහොත්තේ මෙසේ සිතා බලයි. හුන්කල්හි පැවති රූපාරූප ධර්ම මෙහිම නිරුද්ධය. මෙය නිසින්නෙ සම්පජානකාරී නම්. යමෙක් වැදහෙව සජ්ඣාය හෝ කරන්නේ කමටහන් හෝ මෙනෙහි කරන්නේ නින්දට බැස පසුකලෙක නැගිට මෙසේ සිතා බලයි. 'නිදනකල්හි පැවති රූපාරූප ධර්ම මෙහිම නිරුද්ධය. මෙය සුත්තෙ සහ ජාගරිතෙ සම්පජානකාරී නම්. කිරියමය සිත්වල නො පවත්නේ සොප්ප නම්. පැවැත්ම ජාගරිත නම්. යමෙක් කථා කරමින් 'මේ ශබ්දය නම් තොල් නිසා, දත් නිසා, දිව නිසා, තල්ල නිසා සිතෙහි තදනුරූප වූ ප්‍රයෝගය නිසා උපදී' යයි සිහි ඇත්තේ සම්ප්‍රජානන ඇත්තේ කියයි බොහෝකලක් සජ්ඣාය හෝ කොට ධර්මය හෝ කියා කමටහන් හෝ පෙරලා පැන හෝ විසඳ පසුකලෙක නිහඬව සිට මෙසේ සිතා බලයි. 'කියූකල්හි උපන් රූපාරූප ධර්ම මෙහිම නිරුද්ධය. මෙය භාසිතෙ සම්පජාන කාරී නම්. නිහඬව සිට බොහෝකලක් ධර්මය හෝ කමටහන හෝ මෙනෙහිකොට පසුකලෙක මෙසේ සිතා බලයි. 'නිහඬව සිටිකල්හි පැවති රූපාරූප ධර්ම මෙහිම නිරුද්ධය. උපාදා රූප පැවැත්ම ඇතිවිට භාසති නම් වේ. නැතිවිට නිහඬව සිටී නම්. මෙය තුණ්හී භාවෙ සම්පජානකාරී නම් වේ. මේ මහාසිව තෙරුන් කියූ දෙයයි. අසම්මොහ ධුරය මහා සතිපට්ඨාන සූත්‍රයෙහි අදහස් කරන ලදී. මේ සාමඤ්ඤඵලයෙහි සියලු සිව්වැදෑරුම්

සම්ප්‍රජානනය ලැබේ. ඒ නිසා කියන ලද පරිද්දෙන් මෙහි සම්ප්‍රජානන සතරෙහි වශයෙන් සම්පජානකාරිතාව දතයුතුය. සම්පජානකාරී යනුද සියලු පදයන්හි සතියෙන් යුක්ත වූ සම්ප්‍රජානනය වශයෙන් අර්ථය දතයුතුය.

**සති සමපජඤ්ඤෙන සමන්නාගතො** යනු මේ පදයාගේ මේ විස්තරයයි. විභංගප්පකරණයෙහි, සිහි ඇතිව සම්ප්‍රජානනයෙන් යුතුව යයි සම්ප්‍රජානනයෙන් යුතුව නවතියි' මෙසේ මේ පද බෙදා ඇත්තේය.

**එවං ඛො මහාරාජ** යනු සතියෙන් යුක්ත වූවහුට ම සම්ප්‍රජානන වශයෙන් යාම් ආදිය පවත්වන්නේ සති සම්ප්‍රජානනයෙන් යුක්ත වූයේ නම් වෙතියි අර්ථයි.

**ඉධමහාරාජ භික්ඛු සන්තුට්ඨොහොති** යනු මෙහි **සන්තුට්ඨො** යනු එකක් හෝ තවත් ප්‍රත්‍යය සන්තෝෂයෙන් යුත්. ඒ සන්තෝෂය දොළොස් වැදෑරුම් වේ. ඒ කෙසේද යත්. චීවරෙ යථාලාභ සන්තෝෂය, යථාබල සන්තෝෂය, යථා සාරුප්ප සන්තෝෂය යැයි තෙවැදෑරුම් වේ. මෙසේ පිණ්ඩපාත ආදියෙහි මේ ප්‍රභේද වර්ණනාවයි. මෙහි භික්ෂුව සුන්දර වූ හෝ අසුන්දර වූ සිවුරක් ලබයි. හේ එයින්ම යැපෙයි. අනිකක් නොපතයි. ලැබුණත් නොගනී. මේ ඔහුගේ චීවරෙ යථාලාභ සන්තෝෂයයි. එහෙත් ප්‍රකෘතියෙන් දුර්වල වූයේ හෝ ආබාධයන්ගෙන් ජරාවෙන් මිරිකුණේ බර සිවුරක් පොරවන්නේ වෙහෙසට පත්වෙයි. හේ සභාග භික්ෂුවක සමග පරිවර්තනය කොට සැහැල්ලු සිවුරකින් යැපෙන්නේ වුවත් සතුටට පත්වූයේ වෙයි. මේ ඔහුගේ චීවරෙ යථාබල සන්තෝෂයයි. අනික් තැනැත්තා ප්‍රණීත ප්‍රත්‍යය ලාභියෙකි. හේ පාසිවුරුවලට අමතරව මාහැඟි සිවුරක් හෝ බොහෝ සිවුරු ලැබ 'මෙය පැවිදි වී බොහෝකල් ගිය තෙරුන්ටය. මෙය බහුශ්‍රැතයන්ට සුදුසුය. මෙය ගිලනුන්ට සුදුසුය. මෙය අල්ප ලාභීන්ට වේවායි දී ඔවුන් පැරණි සිවුරක් හෝ කසලගොඩ ආදි තැනකින් වැරහැලි එකතුකොට සඟල සිවුරක් කොට දරන්නේද සතුටුවූයේම වෙයි. මෙය ඔහුගේ චීවරෙ යථාසාරුප්ප සන්තෝෂයයි.

මෙහි භික්ෂුව කටුක වූ හෝ ප්‍රණීත වූ හෝ පිණ්ඩපාතය ලබයි. හේ එයින්ම යැපෙයි. අනිකක් නොපතයි. ලැබුණත් නොගනී. මෙය ඔහුගේ පිණ්ඩපාතෙ යථාලාභ සන්තෝෂයයි. යමෙක් තමාගේ ප්‍රකෘතියට විරුද්ධ

වූ හෝ රෝගයට විරුද්ධ හෝ පිණ්ඩපාතය ලබයි. වැළඳූවිට ඔහුට අපහසු වෙයි. හේ සභාග භික්ෂුවකට එය දී ඔහුගේ අතින් සත්ප්‍රාය භෝජනයක් වළඳ මහණදම් කරන්නේ වුවද සතුටට පත්වූවෙක්ම වෙයි. මේ ඔහුගේ පිණ්ඩපාතෙ යථාබල සන්තෝෂය වෙයි. තවත් භික්ෂුවක් බොහෝ ප්‍රණීත පිණ්ඩපාතය ලබයි. හේ ඒ සිවුර මෙන් පැවිදි වී බොහෝකල් ගිය බහුශ්‍රැත, අල්පලාභී, ගිලන් යන භික්ෂූන්ට දී ඔවුන්ගෙන් ඉතිරිවන අහර හෝ පිඬු පිණිස හැසිර හෝ මිශ්‍ර ආහාරයක් වළඳන්නේ වුවද සතුටට පත්වූයේම වෙයි. මේ ඔහුගේ පිණ්ඩපාතෙ යථාසාරුප්ප සන්තෝෂයයි.

මෙහි භික්ෂුව මනාප වූ හෝ අමනාප වූ හෝ සෙනසුනක් ලබයි. හේ එයින්ම සොම්නස උපදවයි. ක්‍රෝධය නූපදවයි. අඩු තරමින් තණ ඇතිරියකින් වුවද ලද පරිදි තුටු වෙයි. මේ ඔහුගේ සේනාසෙනෙ යථාලාභ සන්තෝෂයයි. යමෙක් තමාගේ ප්‍රකෘතියට විරුද්ධ වූ හෝ රෝගයට විරුද්ධ වූ හෝ සෙනසුනක් ලබයි. එහි වසන්නහුට අපහසුවක් වේනම් හේ එය සභාග භික්ෂුවකට දී උන්වහන්සේ සමීපයෙහි සත්ප්‍රාය සෙනසුනෙහි සතුටුවූයේම වෙයි. මේ ඔහුගේ සෙනාසනෙ යථාබල සන්තෝෂයයි. තවත් භික්ෂුවක් මහා පින් ඇත්තේ ලෙන්, මණ්ඩප, කූටාගාර ආදී බොහෝ ප්‍රණීත සේනාසන ලබයි. හේ ඒවා සිවුර මෙන් පැවිදි වූ බොහෝකල් ඇති, බහුශ්‍රැත අල්පලාභී ගිලන් භික්ෂූන්ට දී යම්තැනක වසන්නේද සතුටට පත්වූයේම වෙයි. මේ ඔහුගේ සේනාසනෙ යථා සාරුප්ප සන්තෝෂයයි. හෙතෙමේද 'උතුම් සෙනසුන නම් ප්‍රමාදස්ථානයකි. එහි හුන්නහුටත් ථීනමිද්ධය බැසගනී. නින්දෙන් මැඩගනු ලැබ නැවත පිබිදුණහුට පාප විතර්කයෝ පහළවෙත් යයි සිතා බලා එබඳු සෙනසුනක් ලැබුණද නොපිළිගනී. හේ එය පිළිකෙව් කොට එළිමහනෙහි රුක්මුල්හි ආදී තන්හි වසන්නේ වුවද සතුටට පත්වූයේම වෙයි. මෙයද සෙනාසනෙ යථාසාරුප්ප සන්තෝෂයයි.

මෙහි භික්ෂුව කටුක වූ ප්‍රණීත වූ හෝ බෙහෙතක් ලබයි හේ යමක් ලබයිද එයින්ම සතුටු වෙයි. අනිකක් නොපතයි. ලැබුණත් නොගනී. මෙය ඔහුගේ ගිලානපච්චය යථාලාභ සන්තෝෂයයි. යමෙක් තෙලෙන් ප්‍රයෝජනයක් ඇත්තේ හකුරු ලබයි. හේ එය සභාග භික්ෂුවකට දී ඔහුගේ අතින් තෙල්ගෙන හෝ අනිකක් හෝ සොයා බෙහෙත් කරන්නේද සතුටට පත්වූයේම වෙයි. මේ ඔහුගේ ගිලානපච්චය යථාබල

සන්තෝෂයයි. තවත් භික්ෂුවක් මහ පින් ඇත්තේ බොහෝ තෙල් මීපැණි හකුරු ආදී ප්‍රණීත බෙහෙත් ලබයි. හේ ඒ සිවුර මෙන් පැවිදි වී බොහෝකල් ගිය, බහුශ්‍රැත, අල්පලාභී, ගිලන් භික්ෂූන්ට දී ඔවුන්ට ගෙන එන ලද කිසියම් දෙයකින් යැපෙන්නේ වුවද සතුටට පත්වූයේම වෙයි. යමෙක් එක් බඳුනක මුත්‍ර අරළු තබා එක් බඳුනක චතුමධුර තබා 'කැමතිනම් ගන්න ස්වාමීනි'යි කියනු ලබන්නේ වෙනත් බෙහෙතකින් රෝගය සමනය වුවත් 'මුත්‍ර අරළුව බුද්ධාදීන් විසින් වර්ණිතයැයි චතුමධුර පිළිකෙව් කොට මුත්‍ර අරළුවෙන් බෙහෙත් කරන්නේ පරම සන්තෝෂයට පත්වූවෙක්ම වෙයි. මෙය ඔහුගේ ගිලානපච්චයෙ යථාසාරුප්ප සන්තෝෂයයි.

මේ දොළොස්වැදෑරුම් එකක් හෝ අනිකක් වූ ප්‍රත්‍ය සන්තෝෂයෙන් යුතු භික්ෂුවට අටපිරිකර වටනේය. තුන්සිවුර, පාත්‍රය දැහැටි කපන දැලිපිහිය, එක් ඉඳිකටුවක්, කායබන්ධනය පෙරහන්කඩ යන අට.

මෙයද කියන ලදී.

**තිචීවරඤ්ච පත්තොච - වාසි සූචිච බන්ධනං**
**පරිස්සාවනෙන අට්ඨෙ තෙ - යුත්ත යොගස්ස භික්ඛුනො**

තුන් සිවුර පාත්‍රය - දැලි පිහිය ඉඳිකටුව කා බහන
පෙරහන යන මේ අට - යෝගී භික්ෂුවට සුදුසුය.

ඒ සියල්ල සිරුර ආරක්ෂා කරන්නේද උදරය ආරක්ෂා කරන්නේද වෙයි. කෙසේද? තුන්සිවුර හැඳ පෙරවා හැසිරෙන කල්හි ශරීරය ආරක්ෂා වෙයි. පෝෂණය කරයි නුයි කාය පරිහාරියං වෙයි. සිවුරු කොනින් දියපෙරා බොන කල්හි කැයුතු ගඩා ගෙඩි ගන්නා කල්හිද කුස ආරක්ෂා කරයි. පෝෂණය කරයිනුයි = කුච්ඡි පරිහාරියං වෙයි. පාත්‍රයද එයින් ජලය ගෙන ස්නානය කරන කල්හි කුටියෙහි භාණ්ඩ කරන කල්හිද කාය පරිහාරික වෙයි. අහර ගෙන වළඳ කල්හි වළඳන කල්හි කුච්ඡි පරිහාරිය වේ. දැලිපිහියද දැහැටි කපන කල්හි ඇඳ පුටුවල කොටස් පාද සිවුරු එල්ලා දඬු සදන කල්හිද කාය පරිහාරිකා වෙයි. උක්ගස් කපන පොල් ආදිය බිඳින කල්හි කුච්ඡි පරිහාරික වෙයි. ඉඳිකටුව සිවුර මසන කල්හි

කාය පරිහාරික වෙයි. කැවුම් හෝ ගෙඩි හෝ විද අනුභව කරන කල්හි කුච්ඡි පරිහාරිකා වෙයි. කාය බන්ධනය බැඳ හැසිරෙන කල්හි කාය පරිහාරිකා වෙයි. උක් ආදිය බැඳ ගන්නා කල්හි කුච්ඡිපරිහාරිය වෙයි. පෙරහන්කඩ එයින් ජලය පෙරා නහනකල්හි සෙනසුන් භාණ්ඩ කරන කල්හි කාය පරිහාරික වෙයි. හැන්දෙන් ප්‍රාණීන් පෙරන කල්හි එයින්ම තල සහල් වී කරල් ආදිය ගෙන අනුභව කරන කල්හිද කුච්ඡි පරිහාරිය වෙයි. මෙය වනාහි අටපිරිකර දරන්නහුට පිරිකරක් පමණි.

නව පිරිකර දරන්නහු නිදන්ට පිවිසෙන කල්හි එහි තිබෙන ඇතිරිල්ල හෝ කෙණ්ඩිය හෝ වටී. දස පිරිකර දරන්නහුට හිඳින සම්කඩ වටී. එකොළොස් පිරිකර දරන්නහුට සැරයටිය හෝ තෙල් කුලාව හෝ වටී. දොළොස් පිරිකර දරන්නාට කුඩය හෝ පාවහන හෝ වටී. මොවුන් අතරද අටපිරිකර දරන්නාම සතුටට පත්වූයේ වෙයි. ඉතිරි අය අසතුටු සිත් ඇත්තෝ මහා ආශා ඇත්තෝද මහබර ඇත්තෝ යයිද නොකිය යුත්තෝය. මොවුහුද අල්පේච්ඡ වූවෝද සතුට ඇත්තෝද පහසුවෙන් පෝෂණ කළ හැක්කෝද සැහැල්ලු පැවතුම් ඇත්තෝ ද වෙති. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය ඔවුන් වශයෙන් නොකී සේක. අටපිරිකර දරන්නාගේ වශයෙන් කී සේක. හේ කුඩා දැලිපිහිය ද ඉඳිකටුවද පෙරහන්කඩෙහි බහා පාත්‍රය ඇතුළෙහි තබා පාත්‍රය උරෙහි එල්ලා තුන්සිවුර සිරුරට සම්බන්ධ කොට යමෙකින් කැමතිවන්නා වූ සැපයකට යයි. නැවත හැරී ගතයුත්තක් ඔහුට නැත. මෙසේ මේ භික්ෂුවගේ සැහැල්ලු පැවැත්ම දක්වන සේක් භාග්‍යවතුන් වහන්සේ **සනතුට්ඨොහොති කාය පරිහාරිකෙන චීවරෙන** යනාදිය කී සේක. එහි **කාය පරිහාරිකෙන** යනු කය ආරක්ෂා කිරීම් මාත්‍රයෙන්. **කුච්ඡි පරිහාරිකෙන** යනු කුස ආරක්ෂා කිරීම් මාත්‍රයෙන්.

**සමාදායෙව පක්කමති** යනු ඒ අටපිරිකර පමණක්ම වූ සියල්ල ගෙන සිරුර ප්‍රතිබද්ධ කොටම යයි. 'මාගේ විහාරය, පිරිවෙන, උපස්ථායකයෝ යන ඇලීමක් හෝ බැඳීමක් හෝ නැත. හේ දුනුදියෙන් මිදුණු ඊයක් මෙන්ද, රැලෙන් ඉවත්ව ගිය මතැතකු මෙන් ද කැමති කැමති සෙනසුනක් වනලැහැබක් රුක්මුලක්, අලුත් අලුත් පර්වත බෑවුමක් පරිභෝග කරමින් තනිව සිටී. තනිව හිඳී. සියලු ඉරියව්වල තනිය. දෙවැන්නෙක් නැත.

චාතුද්දිසො අප්පටිඝොච හොති
සන්තුස්සමානො ඉතරීතරෙන
පරිස්සයානං සහිතා අඡම්භී
එකොචරෙ ඛග්ගවිසාණ කප්පො

සිව්දිග නොගැටෙමින්
ලද දෙයින් තුටුවෙමින්
නොසැලී අනතුරින්
නොසැලී අනතුරින්
තනිව හැසිරෙනු කඟවෙහෙණු මෙන්

මෙසේ වර්ණනා කරන ලද කඟවේණකු සමාන තත්ත්වයට පැමිණේ. දැන් ඒ අරුත උපමාවෙකින් සාධනය කරන සේක් **සෙය්‍යථාපි** ආදිය කීහ. එහි **පක්ඛිසකුණො** යනු පියාපත් ඇති කුරුල්ලා. **ඩෙති** උඩපනී. මේ මෙහි කෙටි අරුතයි. කුරුල්ලෝ නම් අසුවල් පෙදෙසෙහි ගසක් පැසුණු ගෙඩි ඇත්තේ යයි දැන නන් දෙසින් අවුත් නිය තුඩු ආදියෙන් ඒ ගසෙහි ගෙඩි විදිමින් සොලවන්නාහු කා දමති. 'මෙය අදටය මෙය හෙටටය' යැයි ඔවුන්ට සිතක් නැත. ගෙඩි අවසන්ව ගියකල ගසට ආරක්ෂාවක් නොතබත්. එහි පියාපතක් හෝ කොළයක් හෝ නියපොත්තක් හෝ තුඩක් හෝ නොතබත්. ඉක්බිති ඒ රුක පිළිබඳව අපේක්ෂා නැතිව යම් දිශාභාගයක් කැමතිද හේ එතැනින් පියාපත් බරින් යුතුව උඩට නැගී යයි. මෙසේම මේ භික්‍ෂුව ඇල්මක් නැත්තේ අපේක්ෂා නැත්තේම යයි. එහෙයින් කියන ලදී. **සමාදායෙව පක්කමති** යනුවෙනි.

**සො ඉමිනාවා** යන ආදියෙන් කුමක් දක්වාද? අරණ්‍යවාසයෙහි ප්‍රත්‍ය සම්පත්තිය දක්වයි. යමකුට මේ සිව්පසය නැත්ද ඔහුට අරණ්‍යවාසය ඉටු නොවේ. තිරිසන්ගතිකයන් හෝ වනචාරීන් සමග වැසිය යුතු බවට පත්වේ. අරණ්‍යයෙහි අරක්ගත් දෙවියෝ 'මෙබඳු පාපී භික්‍ෂුවකට අරණ්‍යවාසයෙන් කම් කිමැයි බැරෑරුම් හඬ අස්වත්. අත්වලින් හිසට ගසා පැනයන ආකාරයක් දක්වති. අසුවල් භික්‍ෂුව අරණ්‍යයට පිවිස මේ මේ පාපකර්මය කළේයයි අපකීර්තිය පැතිරේ. යමකුට ඒ සිව්පසය ඇත්ද, ඔහුට අරණ්‍යවාසය ඉටුවෙයි. හේ තමාගේ ශීලය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේ කිසි කැළලක් හෝ පැල්ලමක් නොදක්නේ ප්‍රීතිය උපදවා එය ක්‍ෂය ව්‍යය වශයෙන් සිහිකරන්නේ ආර්ය භූමියට බැසගනී. අරණ්‍යයෙහි

අරක්ගත් දෙවියෝ සතුටට පත්ව ගුණ කියත්. මෙසේ දියෙහි දැමූ තෙල්බිඳුවක් මෙන් ඔහුගේ කීර්තිය පැතිරී ගියේ වෙයි.

එහි විවිත්ත යනු ශූන්‍ය. අල්ප ශබ්ද ඇති, නිහඬ යන අර්ථයි. මෙයම සඳහා විභංගයෙහි විවිත්තං යනු එහි අසල සෙනසුනක් වෙයි. එයද ගිහියන්ගෙන් පැවිද්දන්ගෙන් නොගැවසුණේ වෙයි. ඒ නිසා එය 'විවිත්ත' යයි කියන ලදී.

මෙහි නිදානුයි හිඳීනුයි = සෙනාසනං. ඇඳපුටුවලට මෙය සමාන වචනයෙකි. එහෙයින් කීය. සේනාසනය යනු ඇඳ ද සෙනසුනකි. පුටුවද, කොට්ටයද, මෙට්ටයද, විහාරයද, අඩ්ඪ යෝගයද ප්‍රාසාදයද, ගබඩා ගෙයද, ගුහාවද, අට්ටාලයද, මහල්ගෙයද, ලෙනද, උණපඳුරද, රුක්මුලද, මඩුවද සේනාසනයයි. යම්තැනක භික්ෂූහු පැමිණෙත්ද මේ සියල්ල සේනාසනයයි. එහෙත් 'විහාරය, අඩ්ඪයෝගය ප්‍රාසාදය ගබඩාගෙය ගුහාව යන මෙය විහාර සේනාසන නම්. 'ඇඳ පුටුව කොට්ටය මෙට්ටය' මෙය මඤ්චපීඨ සේනාසන නම්' 'චිලිමිකාව' 'සම්කඩ, තණ ඇතිරිය, කොළ ඇතිරිය' යන මෙය සන්ථත සේනාසන නම්. යම්තැනක භික්ෂූහු යත්ද එය ඕකාස සේනාසන නමැයි මෙසේ සිව්වැදෑරුම් සේනාසනය වෙයි. ඒ සියල්ලද සේනාසන ග්‍රහණයෙන් ගන්නා ලද්දේමය. මේ කුරුල්ලකු බඳු සිව්දිග භික්ෂුවට සුදුසු දෙය දක්වන සේක. අරඤ්ඤං රුක්ඛමූලං යන ආදිය කීහ.

එහි අරඤ්ඤං යනු ඉන්ද්‍රඛීලයෙන් පිටත නික්මී මේ සියල්ල අරණ්‍යය'යි යන මෙය භික්ෂුණීන්ගේ වශයෙන් පැමිණි අරණ්‍යයයි. ආරණ්‍යක සේනාසනය නම දුනුසියයකට එහාය යන මෙය මේ භික්ෂුවට අනුරූපය. එහි ස්වභාවය විශුද්ධිමාර්ගයෙහි ධුතංග නිද්දේසයෙහි කියන ලදී.

රුක්ඛමූලං යනු යම්කිසි ඝන සෙවන ඇති ශූන්‍ය වූ රුක්මුල. පබ්බතං යනු ගල. එහි දියහෙබවල දියකිස කොට සිසිල් රුක් සෙවනෙහි හුන් නන්දෙස හමන සිසිල් වාතයෙන් පවන් සලනු ලබන්නහුගේ සිත එකඟ වෙයි. කන්‍දරං යනු කං යනු ජලයයි. එයින් පලන ලද, ජලයෙන් බිඳුණු පර්වත ප්‍රදේශය එයට නිතඹ යයිද ගංදෙණියයිද කියති. එහි රිදී පටක්වන් වැලි ඇත. මත්තෙහි මැණික් වියනක් වැනි වන ගහණයයි.

මැණික් කඳක් වැනි දිය ගලාබසී. මෙබඳු කඳුරකට බැස පැන් බී ගත සිසිල්කොට වැලි තංවා පංසුකූල චීවරය පනවා හිඳ මහණදම් කරන්නහුගේ සිත එකඟ වෙයි. ගිරිගුහං යනු පර්වත දෙකක් අතර, එකක උමගක් වැනි මහා විවරයක් ඇත. **සුසාණ** ලක්ෂණය විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. **වනපත්ථං** යනු ග්‍රාමාන්තය ඉක්මවා මිනිසුන් නොහැසිරෙන තැන යම්තැනෙක නොසාත්ද නොවපුරත්ද එතැන. එහෙයින් කීහ. **වනපත්ථං** යනු දුර පිහිටි සේනාසන යන්නට තවත් වචනයකි ආදි වශයෙන්. **අබ්භොකාසං** යනු නොවැසුණු, කැමති වූවෙක් මෙහි සිවුරින් කුටියක් කොට වසයි. **පලාලපුඤ්ජං** යනු වියලි කොළ ගොඩ. විශාල කොළ ගොඩින් වියලි කොළ ඇදගෙන බැවුමෙහි ලෙන් බඳු ගෙවල් තනත්. පඳුරු ආදීන්ගේ මත වියලි කොළ තබා යට හිඳ මහණදම් කරත්. ඒ සඳහා කියන ලදී.

**පච්ඡාභත්තං** යනු බතට පසු. **පිණ්ඩපාත පටික්කන්තො** යනු පිඩු සෙවීමෙන් පැමිණියේ. **පල්ලංකං** යනු හාත්පසින් කලවා බැඳුණු අසුන. ආභුජිත්වා බැඳ. **උජුංකායං පණිධාය** යනු උඩුකය කෙළින් තබා. දහඅටක් පිටකටු අගින් අග පිළියෙලකොට. මෙසේ හුන්නහුගේ සම් මස් නහර නොනැමේ. ඉක්බිති ඔහුට ඒවා නැමීම හේතුවෙන් ක්ෂණයෙන් ක්ෂණය වේදනා උපදීද ඒ වේදනා නූපදී. ඒවා නොඉපදෙනවිට සිත එකඟ වෙයි. කමටහන අවුල් නොවේ. වැඩිවීමට පිම්බීමට පැමිණේ. **පරිමුඛං සතිං උපට්ඨපෙත්වා** යනු කමටහන් අභිමුව සිහිය පිහිටුවා මුව සමීපයෙහි හෝ තබා යන අර්ථයි. එහෙයින්ම විභංගයෙහි කියන ලදී. 'මේ සතිය නැහැ අග හෝ මුඛ නිමිත්තෙහි හෝ එළඹියේ වෙයි. මැනවින් එළඹියේ වෙයි. එහෙයින් පරිමුඛං සතිං උපට්ඨපෙත්වා යයි කියනු ලැබේ යනුවෙන්. නැතහොත් **පරි** යනු පරිග්‍රහ අර්ථ ඇත්තේය. මුඛං යනු ගෙනයන අර්ථ ඇත්තේය. **සති** යනු උපස්ථාන (ළඟින් සිටීම) අර්ථ ඇත්තේය. එහෙයින් කියන ලදී. පරිමුඛං සතිං යනු මෙසේ පටිසම්භිදාවෙහි කියන ලද ආකාරයෙන් මෙහිද අර්ථය දතයුතුය. මේ මෙහි සංක්ෂේපයයි. 'ගත් දෙය ගෙනයන සිහිය ඇතිකොට' යනුයි.

**අභිජ්ඣං ලොකෙ** යනු මෙහි කැඩී යන අර්ථයෙන් පංච උපාදාන ස්කන්ධ ලෝකයයි. ඒ නිසා පංච උපාදාන ස්කන්ධයන්හි රාගය අත්හැර කාමච්ඡන්දය විනාශකොට යනු මෙහි අර්ථයයි. **විගතාභිජ්ඣෙන** යනු විෂ්කම්භන වශයෙන් ප්‍රහීණ බැවින් පහව ගිය අභිධ්‍යාවෙන්. **චක්ඛු**

විඥානය හා සමාන යන අර්ථයි. **අභිජ්ඣාය චිත්තං පරිසොධෙති** යනු අභිධ්‍යාවෙන් සිත මුදවයි.

යම්සේ එය සහමුලින් මුදා නැවත නොගනීද, එසේ කරයි යන අර්ථයි. **බ්‍යාපාද පදොසං පහාය** යන ආදී තන්හිද මේ ක්‍රමයමැයි. මෙයින් සිත අවුල් කෙරේනුයි පිළුණු පිට්ටු ආදිය මෙන් මුල් ස්වරූපය හරිතියි = **ව්‍යාපාදො** නම්. විකාරයට පැමිණීමෙන් දූෂණය වෙයි. අනුන් හෝ දූෂණය කරවයි. විනාශ කරානුයි **පදොසො.** මේ දෙකම ක්‍රෝධයට සමාන වචනය. ථීනං සිතෙහි ගිලන් බව. **මිද්ධං** චෛතසික ගිලන් බව. ථීනයද, මිද්ධයද = ථීනමිද්ධං. **ආලොකසඤ්ඤී** රාත්‍රියෙහිද දවල් කාලයෙහිද දුටු ආලෝකය හඳුනා ගැනීමට සමත් නීවරණයන්ගෙන් පහවූ පිරිසිදු ප්‍රඥාවෙන් යුත්. **සතො සම්පජානො** යනු සිහියෙන් ද ඥානයෙන් ද යුත්. මේ දෙක ආලෝක සංඥාවට උපකාරී බැවින් කියන ලදී. උද්ධච්චයද කුක්කුච්චයද = **උද්ධච්ච කුක්කුච්චං තිණ්ණා විචිකිච්ඡො** යනු විචිකිච්ඡාව තරණයකොට ඉක්මවා ගොස් සිටියේ. මෙය කෙසේද මෙය කෙසේදැයි මෙසේ නොපවතීනුයි = **අකථංකථී කුසලෙසු ධම්මෙසු** යනු නිවරද ධර්මයන්හි. මෙය කුශලයද, මෙය කුසල වන්නේ කෙසේදැයි මෙසේ නො පැකිලේ. සැක නො කෙරේ යන අර්ථයි. මේ මෙහි සංක්ෂේපයයි. මේ නීවරණයන්හි වචනාර්ථ ලක්ෂණ ආදී භේද වශයෙන් යමක් කිවයුතුද ඒ සියල්ල විශුද්ධි මාර්ගයෙහි කියන ලදී.

**සෙය්‍යථාපි මහාරාජ** යනුවෙන් යම් උපමාවක් කියන ලද්දේද, **ඉනංආදාය** යනු පොලියට ධනය ගෙන. **ව්‍යන්ති කරෙය්‍ය** = කෙළවර කරන්නේය. යම්සේ එහි අඩ මස්සක පමණකින්වත් ඉතිරි නොවේද එසේ කරන්නේය. හැමඅතින්ම ආපසු දෙන්නේය යන අර්ථයි. **තතො නිදානං** යනු ණය නැති හේතුව. හෙතෙමේ ණයගැති නොවෙමියි ආවර්ජනය කරන්නේ මහත් ප්‍රමෝදයක් ලබයි. සොම්නසට පැමිණෙයි. එහෙයින් කියන ලදී. **ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙ සොමනස්සං** යනුවෙන්.

අසාමාන්‍ය වේදනා ඉපදීමෙන් කතුරෙන් සිඹ ඉරියව් සිඳලන්නාක් මෙන් බාධා කරතියි = **ආබාධො.** එය ඔහුට ඇත්තේනුයි = **ආබාධිකො.** ඉන් ඇතිවන දුකින් **දුක්ඛිතො** (දුකට පත්වූයේ) අතිශයින් ගිලන් වූයේ = **බාළ්හගිලානො. නච්ඡාදෙය්‍ය** යනු අතිශයින් රෝගයෙන් පෙළෙන බැවින් රුචි නොකරන්නේය. **බලමත්තා** යනු බලයමය. ඔහුගේ සිරුරෙහි බලය

නොවන්නේය යන අර්ථයි. **තතො නිදානං** යනු ආරෝග්‍යයට හේතුව රෝග නැත්තෙමියි ආවර්ජනය කරන ඔහුට මේ දෙකම වෙයි. එහෙයින් කියන ලදී. **ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙ සොමනසසං නචසස කිඤ්චි භොගානං වයො** යනු අඩමස්සක් තරම්වත් භෝගයන්ගේ වැයවීමක් නොවන්නේය. **තතොනිදානං** යනු බැඳුමෙන් මිදීමේ හේතුව. **සෙස්ස** කියන ලද පරිදි සියලු පදයන්හි යෙදිය යුතුය.

**අනත්තාධීනො** යනු තමා කෙරෙහි අධීන නොවූ. තමාගේ කැමැත්තෙන් කිසිවක් කරන්ට නොලබයි. **පරාධීනො** අනුන් කෙරෙහි අධීන. අනුන්ගේම කැමැත්තෙන් පවතියි. **නයෙන කාමංගමො** යනු යම් දිසාවකින් යනු කැමැත්තේ වේද, ගමනට කැමැත්තද උපදියි. එයින් යාමට නොලබයි. **දාසව්‍යං** යනු දාසභාවය. **භුජිස්සො** යනු තමා සතු. **තතොනිදානං** තමා සතු දෙයෙහි හේතුව.

**කන්තාරද්ධාන මග්ගං** යනු කාන්තාරයෙහි දිගු මග දිය නැති දිගු මග යන අර්ථයි. **තතොනිදානං** යනු ක්ෂේමභූමියක් අන්තකොට ඇති හේතුව.

**ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීණෙ** යනු මෙහි භාග්‍යවතුන් වහන්සේ කාමච්ඡන්ද නීවරණය ණයක් සේද, සෙසු දේ රෝග ආදියට සමානකොට දක්වන සේක. එහි මේ සදෘශතාව යමෙක් අනුන්ගේ ණය ගෙන වැනසේද, හේ ඔවුන් විසින් ණය දෙවැයි චෝදනා කරනු ලබන්නේද පරුෂ වචන කියනු ලබන්නේද තර්ජන කරනු ලබන්නේද මරනු ලබන්නේද විරුද්ධව නැගී සිටීමට නොහැකි වෙයි. සියල්ල ඉවසයි. ඔහුගේ ඉවසා සිටීමේ කාරණය ඒ ණය වෙයි. මෙසේ යමෙක් යමක් කෙරෙහි කාමච්ඡන්දයෙන් ඇලේ. ඒ වස්තුව තෘෂ්ණා ග්‍රහණයෙන් ගනී. හේ ඔහු විසින් පරුෂ වචන කියනු ලබන්නේද, තර්ජනය කරනු ලබන්නේද, මරනු ලබන්නේද සියල්ල ඉවසයි. ඔහුගේ ඉවසීමේ කාරණය ඒ කාමච්ඡන්දය වෙයි. ගෙහිමියන් විසින් මරනු ලබන ස්ත්‍රීන්ට මෙන් වේ. මෙසේ කාමච්ඡන්දය ණය මෙනැයි දතයුතුය.

යම්සේ පිත්ත රෝගයෙන් ආතුර වූවෙක් මීපැණි හකුරු ආදිය දුන් කල්හිද පිත්ත රෝගයෙන් පෙළෙන බැවින් රස නොවිඳීද, තිත්තයි තිත්තයි කියමින් වමනය කරන්නේමය. මෙසේ ව්‍යාපාදයට පත් සිත්

ඇත්තේ හිතකාමී ආචාර්ය උපාධ්‍යායයන් විසින් අල්පමාත්‍ර වූද අවවාදයක් දෙනු ලබන්නේ අවවාද නොගනීද, ඔබලා මට අතිශයින් උපද්‍රව කරන්නාහු යයි ආදිය කියා සිවුරු හැර යයි. පිත්ත රෝගයෙන් පෙළෙන බැවින් ඒ පුරුෂයා මීපැණි හකුරු ආදී රස මෙන් ක්‍රෝධයෙන් පෙළෙන බැවින් ධ්‍යානසුඛ ආදී භේද ඇති ශාසන රසය නොවිඳී. මෙසේ ව්‍යාපාදය රෝගයක් මෙනැයි දතයුතුය.

යම්සේ නැකැත්කෙළි දවසෙහි බන්ධනාගාරයෙහි බැඳුණු පුරුෂයා නැකැත් කෙළියෙහි මුල මැද අග නොදකීද, හේ දෙවැනි දවසෙහි මුදාහරිනු ලැබුයේ අනේ ඊයේ නැකැත් කෙළිය මනාප විය. අනේ නැටුම අනේ ගීතය'යි ආදිය අසාද පිළිවදන් නොදෙයි. කවර කරුණකින්ද යත්? නැකැත්කෙළිය ගැන දැනුමක් නැති බැවිනි. මෙසේ ථීනමිද්ධයෙන් මඩිනු ලැබූ භික්ෂුව විසිතුරු නයින් ධර්මශ්‍රවණය පවතිද්දී එහි මුල මැද අග නොදනී. හේ ධර්මශ්‍රවණය අවසන් වූ කල 'අනේ ධර්මශ්‍රවණය අනේ කරුණ අනේ උපමා යැයි ධර්මශ්‍රවණයෙහි ගුණ කියන්නවුන් අසාද පිළිවදන් නොදෙයි. කවර කරුණකින්ද යත්? ථීනමිද්ධ වශයෙන් ධර්මකථාවෙහි දැනුමක් නැති බැවිනි. මෙසේ ථීනමිද්ධය බන්ධනාගාරය මෙනැයි දතයුතුය.

යම්සේ නැකැත්කෙළි කෙළනා දාසයා මෙනම් නොවරදවා කළයුත්තක් ඇත. වහා එහි යව. නොයන්නෙහි නම් අත්පා හෝ කන් නාසා හෝ කපා දමමුයි කීකල්හි වහා යන්නේමය. නැකැත් කෙළියෙහි මුල මැද අග විඳගන්ට නොලබයි. කුමක් හෙයින්ද? පරාධීන බැවිනි. මෙසේ විනයෙහි අකෘතඥව විවේකය පිණිස අරණ්‍යයට පිවිසියහු විසින් කිසියම් යටත්පිරිසෙයින් කැප මසෙහිද අකැප සංඥාවක් උපන් කල්හි උපන් විවේකය අත්හැර සිල් පිරිසිදු කිරීම පිණිස විනයධරයකුගේ සමීපයට යායුතු වෙයි. විවේකසුව විඳීමට නොලබයි. කුමක් හෙයින්ද? උද්ධච්ච කුක්කුච්චයෙන් මැඩගනු ලැබූ බැවිනි. මෙසේ උද්ධච්ච කුක්කුච්චය දාසබව මෙනැයි දතයුතුය.

යම්සේ කාන්තාරයෙහි දිගුමගට පිළිපන් පුරුෂයා සොරුන් විසින් මිනිසුන් පහරන ලද තැනද, ගියතැනද දැක දඬු කැබැල්ලක ශබ්දයෙන්ද කුරුළු ශබ්දයෙන්ද 'හොරු ආවෝ' යැයි බිය හා සැක ඇත්තේ වෙයි. ගියත් සිටියත් නැවතුණත් ගියතැනට වඩා නොගිය තැන් බහුතර වෙයි.

හේ කරදරයෙන් අසීරුවෙන් කෙම්බිමට පැමිණෙයි හෝ නොපැමිණෙයි. මෙසේ යමකුට අටතැනක විචිකිච්ඡාව උපන්නේ වෙයි. හේ බුදුවීද, බුදු නොවීද? ආදි ක්‍රමයෙන් සැක කරන්නේ මුළාවට පැමිණ ශ්‍රද්ධාවෙන් ගැනීමට නොහැකිවෙයි නොහැකි වන්නේ මාර්ගයකට හෝ ඵලයකට හෝ නොපැමිණේ. මෙසේ යම්සේ කාන්තාර මාර්ගයෙහි හොරු ඇත නැතැයි නැවත නැවත සැකය, බැසනොගැනීම තැතිගත් බව සිතෙහි උපදවන්නේ කෙම්බිමට පැමිණීමට අනතුරක් කරගනී. මෙසේ විචිකිච්ඡාව බුදුවීද නොවීද ආදී ක්‍රමයෙන් නැවත නැවත සැකය, බැස නොගැනීම තැති ගැනීම සිතෙහි උපදවමින් ආර්යභූමියට පැමිණීමට අන්තරායක් කරගනීයයි කාන්තාර දිගුමගක් මෙන් දතයුතුය. දැන් **සෙය්‍යථාපි මහාරාජ ආනණ්‍යං** යනු මෙහි භාග්‍යවතුන් වහන්සේ ප්‍රහීණ කරන ලද කාමච්ඡන්ද නීවරණය ණය නැති බව හා සමානය. සෙස්ස ආරෝග්‍යය හා සමානයයි දක්වන සේක. මේ එහි සදෘශතාවයි. යම්සේ පුරුෂයෙක් ණය ගෙන කර්මාන්තයෙහි යොදා සමෘද්ධිමත් වූ කර්මාන්ත ඇත්තේ 'මේ ණයනම් කරදරවලට මුලැ'යි සිතා පොලී සහිත ණය බේරා ලියුම ඉරවා දමන්නේය. ඉක්බිති ඔහුට එතැන්පටන් කිසිවෙක් දූතයකු නොඑවයි. හසුනක් නොඑවයි. හේ ණය හිමියා දැකද කැමතිනම් අසුනින් නැගිටියි. නැතිනම් නොනැගිටියි. කුමක් නිසාද? ඔවුන් සමග පැහැදීමක් බැඳීමක් නැති බැවිනි. එසේම භික්ෂුව මේ කාමච්ඡන්දය නම් කරදරවලට මුල'යයි සිතා ධර්ම සය වඩා කාමච්ඡන්ද නීවරණය අත්හැර දමයි. ඒ ධර්ම සය මහා සතිපට්ඨානයෙහි වර්ණනා කරන්නෙමු. මෙසේ ප්‍රහීණ කාමච්ඡන්ද ඇති ඔහුට ණයෙන් මිදුණහුට ණය හිමියන් දැක බියක් හෝ තැති ගැනීමක් නොවන්නා සේ අන්සතු වස්තුවෙහි ඇලීමක් හෝ බැඳීමක් නොවේ. දිව්‍යමය රූප බලන්නහුට කෙලෙස් ඉදිරිපත් නොවේ. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ කාමච්ඡන්දය ප්‍රහාණය ණය නැති බව මෙනැයි කී සේක.

යම්සේ පිත්ත රෝගයෙන් ආතුර වූ පුරුෂයා බෙහෙත් කිරීමෙන් ඒ රෝගය සංසිඳුවා එතැන්පටන් මීපැණි හකුරු ආදියෙහි රස විඳී ද මෙසේ ඒ භික්ෂුව 'මේ ව්‍යාපාදය අනර්ථයක් කරන්නෙකැ'යි ධර්ම සය වඩා ව්‍යාපාද නීවරණය අත්හැර දමයි. ඒ ධර්ම සය මහා සතිපට්ඨානයෙහි වර්ණනා කරන්නෙමු. ඒවා පමණක් නොව, යමක් ථීනමිද්ධ ආදීන් ප්‍රහාණය පිණිස වැඩිය යුතුද ඒවාද එහිම වර්ණනා කරන්නෙමු. හේ මෙසේ ප්‍රහීණ කරන ලද ව්‍යාපාද ඇත්තේ පිත්ත රෝගයෙන් මිදුණු පුරුෂයා මෙන් මීපැණි හකුරු ආදිය ආශාවෙන් අනුභව කරයි. මෙසේ

ආචාර ප්‍රඥප්ති ආදිය හික්මවනු ලබන්නේ හිසින් පිළිගෙන ආසාවෙන් නික්මෙයි. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ ව්‍යාපාද ප්‍රහාණය ආරෝග්‍යය මෙනැයි වදාළ සේක.

නැකැත්කෙළි දවසෙහි බන්ධනාගාරයට යවන ලද පුරුෂයා වෙනත් නැකැත් දවසක 'පෙර මම ප්‍රමාද දෝෂයෙන් බැඳුණේ වෙමි. එයින් නැකැත් කෙළි නොවින්දෙමි. දැන් අප්‍රමාදී වන්නෙමියි ඔහුගේ සතුරෝ අවකාශ නොලබත්ද, මෙසේ අප්‍රමාදී වී නැකැත් කෙළි විඳ 'අනේ නැකැත් කෙළියැ'යි උදන් අනයි. එසේම භික්ෂුව මේ ථීනමිද්ධය නම් මහා අනර්ථ කරන්නෙකියි ධර්ම සය වඩා ථීනමිද්ධ නීවරණය අත්හැර දමයි. හේ මෙසේ ප්‍රහීණ ථීනමිද්ධ ඇත්තේ බැඳුමෙන් මිදුණු පුරුෂයා සත්දිනක් නැකැත් කෙළියෙහි මුල මැද අග විඳගන්නාක් මෙන්, ධර්ම නක්ෂත්‍ර ක්‍රීඩාවෙහි මුල මැද අග විඳින්නේ පටිසම්භිදා සසහිත රහත් බවට පැමිණෙයි. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ ථීනමිද්ධ ප්‍රහාණය බන්ධනයෙන් මිදීම සේ වදාළ සේක. දාසයා කිසියම් මිතුරකු නිසා ස්වාමීන්ගේ ධනය දී තමා නිදහස් වී එතැන්පටන් යමක් කැමතිනම් එය කරන්නේය. යම්සේද එසේ භික්ෂුව 'මේ උද්ධච්ච කුක්කුච්චය නම් මහා අනර්ථකරයයි ධර්මසය වඩා උද්ධච්ච කුක්කුච්චං අත්හැර දමයි. හේ මෙසේ ප්‍රහීණ වූ උද්ධච්ච කුක්කුච්ච ඇත්තේ නිදහස් පුරුෂයා යමක් කැමති වේද, එය කරයි. කිසිවෙක් ඔහු බලාත්කාරයෙන් එයින් නොවළක්වයිද මෙසේ සුවසේ නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදාව පිළිපදී. එය උද්ධච්ච කුක්කුච්චය බලාත්කාරයෙන් නවතන්නේ නොවේ. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ උද්ධච්ච කුක්කුච්ච ප්‍රහාණය නිදහස් පුරුෂයා මෙනැයි වදාළ සේක. යම්සේ බලවත් පුරුෂයෙක් හස්තසාර වස්තුව ගෙන ආයුධ සන්නද්ධව සහපිරිවරින් කාන්තාරයට යන්නේය. හොරු දුරදීම ඔහු දැක පළා යති. හේ නිරුපද්‍රිතව ඒ කතර තරණයකොට කෙම්බිමට පැමිණියේ සතුටු වන්නේද, එසේ භික්ෂුව මේ විචිකිච්ඡාව නම් අනර්ථකාරී යැයි ධර්ම සය වඩා විචිකිච්ඡාව අත්හැර දමයි. හේ මෙසේ ප්‍රහීණ විචිකිච්ඡා ඇත්තේ බලවත් පුරුෂයා ආයුධ සන්නද්ධව සහපිරිවරින් නිර්භයව සොරුන් තණ සුලකටවත් ගණන් නොගෙන යහතින් නික්ම කෙම්බිමට පැමිණේද එසේ භික්ෂුව දුශ්චරිත නමැති කාන්තාරයෙන් එතෙරව පරම ක්ෂේමභූමිය නම් වූ අමෘතමහා නිර්වාණයට පැමිණේ. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ විචිකිච්ඡා ප්‍රහාණය ක්ෂේමභූමිය සේ වදාළ සේක.

**පාමුජ්ජං ජායති** තුටු වූ අයුරක් හටගනී. **පමුදිතසස පීති** යනු සතුටු වූවහුගේ සියලු සිරුර කළඹවමින් ප්‍රීතිය උපදී. **පීති මනසස කායො පසසමහති** ප්‍රීති සම්ප්‍රයුක්ත සිත් ඇති පුද්ගලයාගේ ශරීරය සංසුන් වෙයි. පහවූ කාංසාව ඇත්තේ වෙයි. **සුඛං වෙදෙති** කායික වූද චෛතසික වූද සැප විඳී. **චිතතං සමාධියති** යනු මේ නෛෂ්ක්‍රම්‍ය සුඛයෙන් සුවපත් වූවහුගේ උපචාර වශයෙන්ද අර්පණා වශයෙන්ද සිත සමාධිගත වේ.

**යො විවිචෙචව කාමෙහි -පෙ- පඨමජඣානං උපසමපජජ විහරති** ආදියෙන් උපචාර සමාධියෙන් සිත සමාහිත වූ කල්හි ඔහුට සමාධියෙහි ප්‍රභේද දර්ශනය පිණිස කියන ලදැයි දතයුතුය.

**ඉමමෙව කායං** යනු මේ කරජ කය. **අභිසනෙදති** යනු තෙමෙයි. තෙත්වෙයි. සියලු තැන පැවති ප්‍රීතිසුඛය ඇතිකරයි. **පරිසනෙදති** යනු හාත්පසින් ගලා බසී. **පරිපූරෙති** යනු වායුවෙන් හස්ත්‍රාව මෙන් පිරෙයි. **පරිඵරති** යනු හාත්පසින් ස්පර්ශ කරයි. **සබබාවතො කායසස** යනු සියලු කොටස් සහිත කයක් ඇති ඒ භික්ෂුවගේ කිසියම් උපාදින්නක සන්තතියක් පැවති තැන සම් මස් ලේ අනුව ගිය අණුමාත්‍ර වූ ස්ථානයක්වත් ප්‍රථමධ්‍යාන සුඛයෙන් නොගෑවුණේ නම් වෙයි.

**දකෙඛා** යනු නහන සුණු තනන්නටද යොදන්නටද සම්මිශ්‍රණය කරන්නටද දක්ෂ ප්‍රතිබල ඇති. **කංසථාලෙ** යනු කිසියම් ලෝහයකින් කරන ලද බඳුන්. මැටි බඳුන ස්ථිර නැත. මිශ්‍රකිරීමේදී බිඳෙයි. ඒ නිසා එය නොදැක්විය.

**පරිපෙඵාසකං පරිපෙඵාසකං** යනු ඉස ඉස. **සනෙනයය** යනු වම් අතින් ලෝහ භාජනය ගෙන දකුණු අතින් ප්‍රමාණවත් ජලය ඉස ඉස මඩින්නේ පිඬුවක් කරන්නේය. **සෙනහානුගතා** දිය තෙතමනය සමග අනුගතව. **සෙනහපරෙතා** දිය තෙතමනයෙන් අල්ලාගෙන. **සනතරබාහිරං** ඇතුළත පෙදෙස සහ පිටත පෙදෙස සමග සැමතැනම දිය තෙතමනයෙන් ස්පර්ශ කරන ලද්දේය යන අර්ථයි.

**නච පගඝරණී** යනු බිඳුව බිඳුව ජලය නොවැගිරේ. අතින් හෝ ඇඟිලි දෙකකින් ගන්ට හැකිවෙයි. බඳපටියක් කරන්නටද හැකිය යන අර්ථයි.

ද්විතීය ධ්‍යාන සුඛ උපමාවෙහි **උබ්භිදොදකො** යනු උඩින් බිඳී ආ ජලය. යටින් බිඳී උඩට එන ජලය නොවේ. ඇතුළතම උපදින ජලය යන අර්ථයි. **ආයමුඛං** යනු එන මග. **දෙවො** යනු වැසි වලාකුළ. **කාලෙන කාලං** යනු කලින්කල. අඩමසක් හෝ දින දසයකට වරක් යන අර්ථයි. **ධාරං** යනු වෘද්ධිය. **නානුපවෙච්ඡෙය්‍ය** යනු ප්‍රවේශ නොවන්නේය. නොවසවනු ලබන්නේය යන අර්ථයි.

**සීතවාරිධාරා උබ්භජ්ජිත්වා** යනු සිහිල් ජලය ඒ පොකුණ පුරවමින් ඉපිද, යටින් උඩට එන ජලය උඩට නැග නැග බිඳෙන ජලය කළඹයි. සිව්දෙසින් ඇතුළුවන ජලය පැරණි කොළ තණ දරදඬු ආදියෙන් ජලය කළඹයි. හුන්නාක් මෙන් වී ඍද්ධියෙන් නිර්මිත වූවක් මෙන් උපදින ජලය මේ ප්‍රදේශය පුරා පැතිරෙයි. මෙය නොපැතිරෙයි කියා දෙයක් නැත. එයින් නොපැහැසුණු අවකාශයක් නම් නැත. එහි කරජකාය පොකුණ මෙනි. ද්විතීය ධ්‍යාන සුඛය ජලය මෙනි. සෙස්ස පෙර ක්‍රමයෙන්ම දතයුතුය.

තෘතීයධ්‍යාන සුඛ උපමාවෙහි, උපුල් මෙහි ඇත්තුයි = උප්පලිනී. සෙසු පද දෙකෙහි ද මේ ක්‍රමයමැයි. මෙහිද සුදු රතු නිල් අතුරින් කිසියම් උපුලක් **උප්පලමෙව**. පෙති සියයට අඩු **පුණ්ඩරීකං** පෙති සියයක් ඇත්තේ **පදුමං**. පෙති නියමයක් ඇතිව හෝ නැතිව සුදු **පදුමං**. රතු පුණ්ඩරීක යන්න මෙහි විනිශ්චයයි. **උදකානුග්ගතානි** යනු ජලයෙන් නොනැගුණු. **අන්තො නිමුග්ග පොසිනී** යනු ජලතලය අතර ගිලුණේ ම වී පෝෂණය වෙත් වැඩෙත් යන අර්ථයි. සෙස්ස පෙර ක්‍රමයෙන් දතයුතුය.

චතුර්ථ ධ්‍යානසුඛ උපමාවෙහි **පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන** යනු මෙහි උපක්ලේශ නොවන අර්ථයෙන් පිරිසිදු. ප්‍රභාස්වර කරන අර්ථයෙන් පරියොදාත යයි දතයුතුය. **ඔදාතෙනවත්ථෙන** මෙය ඍතු පැතිරෙන අර්ථයයි කියන ලදී. කිලිටි වස්ත්‍රයෙන් ඍතු පැතිරීමක් සිදු නොවේ. එකෙණෙහි සේදූ පිරිසිදු වස්ත්‍රයෙන් ඍතු පැතිරීම බලවත් වෙයි. මේ උපමාවෙන් කරජකාය වස්ත්‍රය මෙනි. චතුර්ථධ්‍යාන සුඛය ඍතු ව්‍යාප්තිය මෙනි. ඒ නිසා මැනවින් ස්නානය කරන ලද පිරිසිදු වස්ත්‍රය හිසෙහි සිට පොරවා සිටි පුරුෂයාගේ සිරුරින් ඍතුව මුළු වස්ත්‍රය පුරා පැතිරෙයි. වස්ත්‍රයෙහි නොගැවුණු කිසි තැනක් නැත.

මෙසේ චතුර්ථධ්‍යාන සුඛයෙන් භික්‍ෂුවගේ කරජකායෙහි නොගැවුණු කිසි තැනක් නැත. මෙසේ මෙහි අර්ථය දතයුතුය.

මේ ධ්‍යාන සතරෙහි පදානුගත වර්ණනාවද භාවනා ක්‍රමයද විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. මෙහි විස්තර වශයෙන් නොවේ. මෙපමණකින් ඔහු රූපධ්‍යාන ලාභියෙක්මය. අරූපධ්‍යාන ලාභියෙක් නොවේ යයි දතයුතුය. අෂ්ට සමාපත්තීන්හි දහහතර ආකාරයෙන් වශීභාවයක් හැර මත්තෙහි අභිඥා අධිගමයක් නොවේ. පාලියෙහි රූපධ්‍යාන ම ආයේය. අරූපධ්‍යාන ගෙනවුත් කිය යුතුය.

**සො එවං සමාහිතෙ චිත්තෙ -පෙ- ආනෙඤ්ජප්පත්තෙ** යනු දහහතර ආකාරයකින් අෂ්ට සමාපත්තීන්හි පුරන ලද වශීභාව ඇති භික්‍ෂුව යයි දක්වයි. මෙහි සෙස්ස විශුද්ධි මාර්ගයෙහි කියූ ක්‍රමයෙන් දතයුතුය.

**ඤාණදස්සනාය චිත්තං අභිනීහරති** යනු මෙහි ඤාණදස්සනං යනු මාර්ග ඥානයයි කියනු ලැබේ. ඵල ඥානයද සර්වඥතා ඥානයද ප්‍රත්‍යවේක්‍ෂණ ඥානයද විදර්ශනා ඥානයද කියනු ලැබේ. ඇවැත්නි, ඥාන දර්ශන විශුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙහිද යනු මෙහි මාර්ගඥානය ඥාන දර්ශන යැයි කියනු ලැබේ. අයමඤ්ඤො උත්තරි මනුස්ස ධම්මා අලමරිය ඤාණ දස්සන විසෙසො අධිගතො ඵාසුවිහාරො යනුවෙන් මෙහි ඵලඥානයයි. 'භගවතොපි ඛො ඤාණං උදපාදි, සත්තාහ කාලකතො ආළාරො කාලාමො' යනු මෙහි සර්වඥතා ඥානයයි. 'ඤාණංච මෙ දස්සනං උදපාදි. අකුප්පාමෙ චෙතො විමුත්ති, අයමන්තිමා ජාති' යනු මෙහි ප්‍රත්‍යවේක්‍ෂණ ඥානයයි. මෙහි **ඤාණ දස්සනාය චිත්තං** යනු මේ විදර්ශනා ඥානය ඥාන දර්ශනයයි කියනු ලැබේ. **අභිනීහරති** යනු විදර්ශනා ඥානය ඉපදවීම පිණිස එයම නිමනයද, එයම බෑවුමද එයම බෙයද කරයි.

රූපී ආදීන්ගේ අර්ථය කියන ලද්දේමය. **ඔදන කුම්මාසූපචයො** යනු බතින්ද පිට්ටුවෙන්ද රැස්කළ වර්ධනය කළ. **අනිච්චුච්ඡාදන පරිමද්දන භෙදන විද්ධංසන ධම්මො** යනු වී අභාවයට යන අර්ථයෙන් අනිත්‍ය දුගඳ නැසීම පිණිස සිරුරු ආලේපයෙන් ඉලීමේ ස්වභාවය. අඟපසඟවල ආබාධ නැතිකිරීම පිණිස සෙමින් මිරිකීමෙන් පිරිමදින ස්වභාවය. කුඩාකල කලවයන්හි නිදිකරවා ගැබෙහි වැසීමෙන් මනාව නොපිහිටි අංගයන්ගේ

පිහිටීම සැදීම පිණිස තැවරීම් තදකිරීම් ආදී වශයෙන් මර්දනය කිරීමේ ස්වභාවය. මෙසේ පරිහරණය කරන්නහුගේ ද බිඳීම් විනාශවීම් ස්වභාවය බිඳෙයි. විසිරෙයි. මෙබඳු ස්වභාවය යන අර්ථයි.

එහි රූපී චාතුමමහා භූතිකො යන ආදී තන්හි පද හයෙන් සමුදය කියන ලදී. අනිත්‍ය පදය සමග පසු පද දෙකෙන් අස්තයට යාම. **එත්‍ථ සිතං එත්‍ථ පටිබද්ධං** යනු මෙහි චාතුර්මහා භූතයන්ගෙන් සැදුණු සිරුරෙහි පිහිටි හෝ බැඳුණු.

**සුභො** යනු සොඳුරු. **ජාතිමා** පිරිසිදු ලෙස පැනනැගුණු. **සුපරිකමමකතො** යනු මැනවින් කළ පිරියම් ඇති. ගල් බොරළු ඉවත්කළ. **අචෙඡා** සිනිඳු හම. **විපපසනෙනා** යනු මැනවින් පහන් වූ. **සබ්බාකාර සමපනෙනා** යනු සේදීම් සෙලවීම් ආදී වූ සියලු ආකාරයෙන් යුතු.

නීලං ආදී තන්හි වර්ණ සම්පත්තිය දක්වයි. එබඳු දෙය ඇමිණී ප්‍රකට වෙයි. එවමෙව බො යනු මෙහි උපමා සංසන්දනය දතයුතුයි. කරජ කාය මණී විය. මැණිකක් මෙනි. **ආවුතසුතතං** ඇමුණු හුය. මෙහි විදර්ශනා ඥානය විදර්ශනාලාභී භික්‍ෂුව **චකඛුමා පුරිසො** ඇස් ඇති පුරුෂයා මෙනි. **හත්‍ථෙකරිත්‍වා** ප්‍රත්‍යවේක්‍ෂණයෙන් **අයංඛො මණී** යනුවෙන් මැණික පහළ වූ කාලය මෙනි. විදර්ශනා ඥානය පමුණුවාගෙන හුන් භික්‍ෂුවගේ චාතුර්මහා භූතික කය පහළ වූ කාලය. **තත්‍රිදං සුතතං ආවුතං** යනු විදර්ශනා ඥානය පමුණුවා හුන් භික්‍ෂුවගේ තදාරම්මණ වූ එස්සය පස්වැනි කොට ඇති සියලු චිත්ත චෛතසිකයන්ගේ හෝ විදර්ශනා ඥානයෙහි හෝ පහළවූ කාලය තුල පහළ වූ කාලය මෙනි. මේ විදර්ශනා ඥානය මාර්ගයට අනතුරුව වේ. මෙසේ ඇතිකල්හිද යම්හෙයකින් අභිඥාවාරය ඇරඹුණු කල එයට අන්තර් වාරයක් නැත්ද, ඒ නිසා මෙහිම දක්වන ලදී. යම්හෙයකින් අනිත්‍යාදි වශයෙන් සම්මර්ශනය නොකළ දිව්‍ය ශ්‍රෝත ධාතුවෙන් බිරම් හඬ අසන්නහුට පූර්වේනිවාස අනුස්මෘතියෙන් බිරම් කඳ (ස්කන්ධ) සිහි කරන්නහුට දිවැසින් බිරම් රූ බලන්නහුට භය සන්ත්‍රාසය උපදීද, අනිත්‍යාදි වශයෙන් සම්මර්ශනය නොකළහුට නැද්ද, ඒ නිසා අභිඥා ප්‍රාප්තයාගේ බිය නැතිකරන හේතු සම්පාදනය සඳහාද මෙය මෙහිම දක්වන ලදී. තවද, යම්හෙයකින් විදර්ශනා සුඛය නමැති මෙය මාර්ගඵල සුඛ සමාන වෙන්වූ සාන්දෘෂ්ටික

සාමඤ්ඤඵලයක් වේද, ඒ නිසා ආදියෙහිදීම මෙය මෙහිදී දක්වන ලද්දේ යයි දතයුතුය.

**මනොමයං** යනු සිතින් උපදවාගත්. **සබ්බංග පච්චංගී** යනු සියල් අඟපසඟින් යුතු. **අහිනනින්ද්‍රියං** යනු පිහිටීම් වශයෙන් විකල් නොවූ ඉන්ද්‍රිය ඇති. ඍද්ධි ඇත්තකු විසින් නිර්මාණය කරන ලද රූපය ඍද්ධිමතා සුදුනම් එයද සුදුය. කන් විද නැත්නම් එය ද නොවිදි කන් ඇත්තේය. මෙසේ සියලු ආකාරයන්ගෙන් එය හා සමානම වෙයි.

**මුඤ්ජමහා ඉසිකං** යන ආදී උපමා තුනද සමාන බව දැක්වීම පිණිසම කියන ලදී. කණ කොළයක් වැනි එහි ඇතුළත සිදුරක් වෙයි. කඩුව කොසිය කොපුව වැනිමය. වට වූ කොපුවෙහි වටවූ කඩුවක්ම බහත්. පැතලි වූවක පැතලි වූවක්ම බහත්.

**කරණ්ඩා** යනු මෙයද සර්ප හැවට නමකි. උණ පතුරින් තැනූ කරඬුවට නමකි. සර්ප හැව සර්පයා හා සමානම වේ. එහි පුරුෂයෙක් කිසියම් **අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය** යනු අතින් ගලවත්තක් මෙන් දක්වන ලදී. ඉක්බිතිව සිතින්ම එය ගැලවීම දතයුතුය. මේ සර්පයා ස්වජාතියෙහි සිට දරකැබලි අතර හෝ රුක් අතර ආශ්‍රයකොට හැවයෙන් ශරීරය ඉවත්කරන ප්‍රයෝග සංඛ්‍යාත වූ ශක්තියෙන් ශරීරය කාදමන්නාක් මෙන් පැරණි හැව පිළිකුල් කරන්නේ යයි මේ සිව් සරුණින් තමාම හැව අත්හැර දමයි. අනිකකු විසින් එයින් ගලවත් නොහැකිය. ඒ නිසා සිතින් ඉදිරීම සඳහා මෙය කියන ලදැයි දතයුතුය. මෙසේ මේ භික්ෂුවගේ සිරුර තණපත් ආදිය හා සමානය. නිර්මිතරූපය ඇතුළත සිදුර මෙනි. මේ මෙහි උපමා සංසන්දනයයි.

මෙහි නිර්මාණ විධානය අනුන්ගෙන්ද ඉද්ධිවිධාදි පංච අභිඥා කථා සියලු අයුරින් විශුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලදී. එහි කියූ පරිද්දෙන්ම දතයුතුය. මෙහි උපමා මාත්‍රයම අධිකය.

**එහි ඡෙක කුම්භකාර ආදයො** මෙන් ඉද්ධිවිධ ඤාණලාභී භික්ෂුව දතයුතුය. මැනවින් පිරියම් කළ මැටි ආදිය මෙන් ඉද්ධිවිධ ඤාණය දතයුතුය. කැමති කැමති භාජන විකෘති කරණය මෙන් ඒ භික්ෂුවගේ විකුර්වණය චිත්ත බලය දතයුතුය.

දිබ්බසොත ධාතු උපමාවෙහි යම්හෙයකින් කාන්තාර දිගු මග සැක සහිතද භය සහිතද වේද, එහි සැක සංකාවෙන් මේ බෙර හඬය, මේ මිහිඟු බෙර හඬය යයි වෙසෙසා හඳුනා ගැනීමට නොහැක්කේද, ඒ නිසා කාන්තාර ග්‍රහණය නොකොට ක්ෂේම මාර්ගය දක්වන්නේ, අද්ධාන මග්ග පටිපන්නො යයි කීය. බියක් නැති ක්ෂේම මාර්ගය ශීර්ෂ සාටකය කොට සෙමින් පිළිපන්නේ කියන ලද ආකාර ඇති ශබ්ද පහසුවෙන් ව්‍යවස්ථාපනය කරයි. ඔහුට ඒ ශබ්ද පහළ වූ කාලය මෙන් යෝගියාට දුර ළඟ භේද ඇති දිව්‍යමය වූද මානුෂික වූද ශබ්ද පහළවූ කාලය දතයුතුය.

චෙතොපරිය ඤාණ උපමාවෙහි දහරො යනු තරුණයා. යුවා යනු යෞවනයෙන් යුත්. මණ්ඩන ජාතිකො යනු යෞවනයෙක්ව අලස නොවූයේ නොකිලිටි ශරීර ඇත්තේ. තවද සැරසෙන ස්වභාව ඇත්තේ දවසකට දෙතුන් වරක් නහා පිරිසිදු වස්ත්‍ර හඳින අලංකාර කරන ස්වභාව ඇත්තේ යන අර්ථයි. සකණිකං යනු කළු කැලැල් ඇද වූ මුව කුරුලෑ ආදීන්ගෙන් එකකින් දොස් සහිත. එහි යම්සේ ඔහුගේ මුඛ නිමිත්ත ප්‍රත්‍යවේක්ෂණයෙන් මුහුණෙහි දොස් ප්‍රකට වේද, මෙසේ චේතෝපරිය ඤාණයෙන් සිත පමුණුවා සිටි භික්ෂුවට අනුන්ගේ සොළොස් වැදෑරුම් සිත ප්‍රකට වේයයි දතයුතුය.

පුබ්බෙනිවාස ඤාණ උපමාවෙහි තං දිවසං කත කිරියා පාකටා හොති යනු එදවස ගිය ගම් තුනම ගන්නා ලද්දේය. එය ගම් තුනකට ගිය පුරුෂයා මෙන් පුබ්බෙනිවාස ඤාණලාභියා දතයුතුය. ගම් තුන මෙන් භවත්‍රය දතයුතුය. ඒ පුරුෂයාට ගම් තුනෙහිදී එදවස කළ කාර්යය පහළවීම මෙන් පුබ්බෙනිවාසයෙන් සිත පමුණුවා හුන් භික්ෂුවගේ භවත්‍රයයෙහි කරන ලද කාර්යය පහළවීම දතයුතුය.

දිබ්බචක්ඛු උපමාවෙහි වීතිසංචරනෙත යනු ඔබමොබ හැසිරෙන වීදි සඤ්චරනෙත යනුවෙන්ද පාඨයක් වෙයි. අර්ථය මෙයමය. එහි නගරය මැද මංසන්ධියෙහි ප්‍රාසාදය මෙන් මේ භික්ෂුවගේ කරජ කායය දතයුතුය. ප්‍රාසාදයෙහි සිටි ඇස් ඇති පුරුෂයා මෙන් දිවැස් ඇති බවට පත්ව සිටි භික්ෂුව දතයුතුය. ප්‍රතිසන්ධි වශයෙන් මව්කුසට පිවිසෙන්නවුන් මෙන් ගෙන් නික්මෙන්නෝ ගතයුත්තෝය. වීදියෙහි ඔබමොබ හැසිරෙන්නෝ ඔබමොබ හැසිරෙන සත්ත්වයෝ දතයුත්තෝය. ඉදිරියෙහි එළිමහන්

තැන මැද මංසන්ධියෙහි සිටින්නෝ භවත්‍රයයෙහි ඒ ඒ තැන උපන් සත්ත්වයෝ දතයුත්තෝය. ප්‍රාසාද තලයෙහි සිටි පුරුෂයාගේ ඒ මිනිසුන් පහළවූ කාලය මෙන් දිබ්බචක්ඛු ඤාණයෙන් සිත ඉවත්කොට හුන් භික්ෂුවගේ භවත්‍රයයෙහි උපන් සත්ත්වයන් පහළවූ කාලය දතයුතුය. මෙය දේශනා පහසුව පිණිසම කියන ලදී. අරූප ලෝකයෙහි දිවැසට ගොදුරුවන දෙයක් නැත.

**යො එවං සමාහිතෙ චිත්තෙ** යනු මෙහි විදර්ශනා පාදක චතුර්ථධ්‍යාන චිත්තය දතයුතුය. **ආසවානං ඛය ඤාණාය** යනු ආශ්‍රවයන් ක්ෂය කිරීමේ ඥානය ඉපදවීම පිණිස. මෙහි ආශ්‍රවයන් ක්ෂය කිරීම, ඵලයද නිර්වාණයද භංගයද කියනු ලැබේ. 'ඛයෙ ඤාණං අනුප්පාදෙ ඤාණං' යනු මෙහි මාර්ගය ආශ්‍රවක්ෂය යයි කියන ලදී. 'ආසවානං ඛයා සමණො හොති' යනු මෙහි ඵලයයි.

පරවජ්ජානු පස්සිස්ස - නිච්චං උජ්ඣාන සඤ්ඤිනො
ආසවා තස්ස වඩ්ඪන්ති - ආරා සො ආසවක්ඛයා

අනුන් දොස් දක්නා - නිති කිපෙන සුල්ලහුගේ
කෙලෙස් ඔහුගේ වැඩේ - නිවනින් හේ ඈත්වේ

මෙහි නිර්වාණයයි. 'ආසවානං ඛයො වයො භෙදො අනිච්චතා අන්තරධානං' යන මෙහි භංගයයි. මෙහි නිර්වාණය අදහස් කරන ලදී. අර්හත් මාර්ගයද වටී.

**චිත්තං අභිනීහරති** යනු විදර්ශන චිත්තය එයට නිම්නයද, එය බෑවුම ද එයම බෙයද ද කරයි. සො ඉදං දුක්ඛං යන ආදී තන්හි එත්තකං දුක්ඛං න ඉතො භීයෝ‍යා - එපමණ දුකක් මින් වැඩි නොවේ' යනුවෙන් සියලු දුක්ඛ සත්‍යය ස්වරස ලක්ෂණ ප්‍රතිවේධයෙන් යථා පරිදි දනී. ඒ දුක්ඛයාගේ උත්පත්ති තෘෂ්ණාව අයං දුක්ඛසමුදයො යනු ඒ දෙතැනට පැමිණ නිරුද්ධ වෙයි. එය ඔවුන්ගේ පැවැත්මක් නැති නිර්වාණයයි. **අයං දුක්ඛසමුදයො** යනු ඒ දෙතැනට පැමිණ නිරුද්ධ වෙයි. එය ඔවුන්ගේ පැවැත්මක් නැති නිර්වාණයයි. **අයං දුක්ඛනිරොධො** යනු එහි පමුණුවන්නා වන ආර්ය මාර්ගයයි. **අයං දුක්ඛ නිරොධ ගාමිනී පටිපදා** යනු ස්වරස ලක්ෂණ ප්‍රතිවේධයෙන් යථා පරිදි දනී යන අර්ථයි. මෙසේ ස්වරූප වශයෙන් සත්‍යයන් දක්වා නැවත ක්ලේශ වශයෙන් පිළිවෙළින් දක්වන්නේ

ඉමෙ ආසවා ආදිය කීය. තසසමං ජානතො එවං පසසතා යනු මෙසේ දන්නා වූ, මෙසේ බලන්නා වූ ඒ භික්‍ෂුවගේ විදර්ශනාව සමග කෙළවරට පත් මාර්ගය කියයි. කාමාසවා යනු කාම ආශ්‍රවයන්ගෙන්. විමුච්චති යනු මෙයින් මාර්ගක්‍ෂණය දක්වයි. විමුත්තසමිං යනු මෙයින් ඵල ලක්‍ෂණය දක්වයි. විමුත්තමිති ඤාණංහොති යනු මෙයින් ප්‍රත්‍යවේක්‍ෂණ ඥානය කියයි. ඛීණාජාති ආදිය එහි භූමියයි. ඒ ඥානයෙන් ප්‍රත්‍යවේක්‍ෂා කරන ආශ්‍රවයන් නැසූ තැනැත්තේ ඛීණාජාති ආදිය දනී.

ඔහුගේ ක්‍ෂීණ වූ ජාතිය කවරක්ද? එය කෙසේ දනීද? පූර්වයෙහිම ක්‍ෂීණ වූ බැවින් ඔහුගේ අතීත ජාතිය ක්‍ෂීණ වූයේ නොවේ. අනාගතයෙහි ව්‍යායාමයක් නැති බැවින් අනාගත ජාතිය ක්‍ෂීණ වීමෙක්ද නැත. වර්තමාන ජාතිය විද්‍යමාන බැවින් ක්‍ෂීණවීමක් නැත. මාර්ගය අභාවිත බැවින් එක හතර පස් වෝකාර භවයන්හි ඉපදුණද එක් හතර පංචස්කන්ධ ප්‍රභේද ඇති යම් ජාතියක් වේද එය මාර්ගය භාවිත කළ බැවින් නැවත නූපදින ස්වභාවයට පැමිණීමෙන් ක්‍ෂීණය. එය ඔහු මාර්ග භාවනාවෙන් ප්‍රහීණ වූ ක්ලේශයන් ප්‍රත්‍යවේක්‍ෂණය කොට 'කෙලෙස් අභාවය ඇතිකල්හි විද්‍යමාන වූ ද කර්මය නැවත ප්‍රතිසන්ධි ගන්නේ නොවේ යයි දන්නේ දනියි.

වුසිතං යනු වසන ලදී. කලක් නැවතී සිටින ලදී. බ්‍රහමචරියං යනු මාර්ග බ්‍රහ්මචර්යාව. පෘථග්ජන කල්‍යාණයකු සමග සප්ත සේඛයෝ බ්‍රහ්මචර්ය වාසය වසත් නම්. ක්‍ෂීණාශ්‍රවයා වසන ලද වාස ඇත්තේය. ඒ නිසා හේ තමාගේ බ්‍රහ්මචර්ය වාසය ප්‍රත්‍යවේක්‍ෂණය කරන්නේ වුසිතං බ්‍රහමචරියං බ්‍රහ්මචර්ය වසන ලදී යයි දනී.

කතං කරණීයං යනු සත්‍ය සතරෙහි සතර මාර්ගයෙන් පරිඤ්ඤා පහාණ සච්ඡිකිරිය භාවනා වශයෙන් සොළොස් වැදෑරුම් කාර්යය නිමකරන ලදී. ඒ මගින් ප්‍රහාණය කළයුතු ක්ලේශයෝ ප්‍රහීණ කරන ලද්දෝය. දුක්ඛමූලය සම්පූර්ණයෙන් සිඳ දමන ලද්දේය යන අර්ථයි. පෘථග්ජන කල්‍යාණ ආදීහු ඒ කෘත්‍යය කරති. ක්‍ෂීණාශ්‍රවයා කළයුත්ත කළ තැනැත්තේය. ඒ නිසා හේ තමාගේ කළයුතු දෙය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේ කතං කරණීයං යයි දනී.

නාපරං ඉත්ථත්තායා යනු දැන් නැවත මෙසේ වූ බැවින් මෙසේ සොළොස් කෘත්‍ය ඇති බැවින් කෙලෙස් ක්‍ෂය කිරීමෙන් හෝ මාර්ග භාවනා කෘත්‍යයක් මට නැතැයි දනී. නැතහොත් ඉත්ථත්තාය යනු මෙසේ

වූ බැවින්. ඉමසමා - මේ අයුරින් 'දැන් වර්තමාන ස්කන්ධ සන්තානයෙන් අන්‍ය වූ ස්කන්ධ සන්තානයක් මට නැත. මේ පංචස්කන්ධයෝ මුල් සිඳලූ රුකක් මෙන් හොඳින් දැන සිටිති. ඒවා අවසන් චිත්ත නිරෝධයෙන් ඉන්ධන නැති ගින්නක් මෙන් නිවීමට යන්නේය. නමක් නැති බවට යන්නේය යයි දනී.

**පබ්බත සංඛෙපෙ** යනු පර්වත මස්තකයෙහි. අනාවිලො යනු මඩ නැති. සිප්පිද හක්ගෙඩිද = **සිපපි සම්බුකා**. ගල්කැටද බොරළුද = **සක්ඛර කඨලං**, මසුන්ගේ අහිත සමූහය = **මච්ඡගුම්බං**, **තිට්ඨන්තම්පි චරන්තම්පි** යනු මෙහි ගල්කැට බොරළු නැවතී සිටීමය. ඉතිරි ඒවා හැසිරෙයි. සිටියි. යම්සේ අතරින් පතර සිටින්නා වූද හුන්නා වූද ගමන් කරන්නා වූද එවුන් අතර 'මේ ගවයෝ හැසිරෙති'යි හැසිරෙන්නවුන් සඳහා ඉතිරි අයද හැසිරෙත් යයි කියත්ද, මෙසේ සිටින්නා වූම ගල්කැට බොරලු සඳහා ඉතිරි දෙකද සිටීයයි කියන ලදී. හැසිරෙන ඉතිරි දෙක සඳහා ගල්කැට බොරලු හැසිරේ යයි කියන ලදී.

එහි ඇස් ඇති ඉවුරෙහි සිට බලන පුරුෂයාගේ සිප්පි හක්ගෙඩි ආදීන් හටගත් කාලය මෙන්, ආශ්‍රවක්ෂය පිණිස සිත ඉවත්කොට හුන් භික්ෂුවගේ සත්‍ය සතරෙහි හටගත් කාලය දතයුතුය.

මෙපමණකින් විපස්සනා ඤාණය, මනෝමය ඤාණය, ඉද්ධිවිධ ඤාණය, දිබ්බසෝත ඤාණය, චේතෝපරිය ඤාණය, පුබ්බේනිවාස ඤාණය, දිබ්බචක්ඛු වශයෙන් නිපන්. අනාගත යථාකම්මූපග ඤාණ දෙක දිබ්බචක්ඛු ඤාණය, ආසවක්ඛය ඤාණය යන ඤාණ දසය නිර්දේශ කරන ලද්දේ වෙයි. ඔවුන්ගේ ආරම්මණ විභාගය දැනගත යුතුය. එහි විපස්සනා ඤාණය, පරිත්ත, මහග්ගත, අතීත අනාගත, පච්චුප්පන්න අජ්ඣත්ත බහිද්ධා වශයෙන් සත්වැදෑරුම් අරමුණු ඇත්තේය. මනෝමය ඤාණය නිර්මාණය කළයුතු රූපායතන මාත්‍රයට අරමුණු කරතියි පරත්ත පච්චුප්පන්න බහිද්ධා රම්මණ ඇත්තේය. ආසවක්ඛය ඤාණය අප්පමාන බහිද්ධා නොකිවයුතු ආරම්මණ ඇත්තේය. අවශේෂ වූ ඤාණයන්හි ආරම්මණ භේදයද විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. **උත්තරීතරංච පණීතතරංවා** යනු කිසියම් පිළිවෙළකින් මීට වඩා ශ්‍රේෂ්ඨතර වූ සාමඤ්ඤඵලයක් නැතැයි භාග්‍යවතුන් වහන්සේ අර්හත්වය කුළුගැන්වීමෙන් දේශනාව නිමැවූ සේක. රජ තෙමේ ඒ ඒ තැනදී සාධුකාර

පවත්වන්නේ මුල මැද අග සකසා අසා 'මම මේ ප්‍රශ්න බොහෝ මහණ බමුණන්ගෙන් බොහෝ කලක් ඇසුවත් දහයියා කොටන්නාක් මෙන් කිසි හරයක් නොලැබුවෙමි. භාග්‍යවතුන් වහන්සේගේ ගුණ සම්පදාව පුදුමයි. උන්වහන්සේ පහන් දහසක් දල්වන්නාක් මෙන් මහත් ආලෝකයක් කොට මේ ප්‍රශ්න විසඳූ සේක. දශබලධාරීන් වහන්සේගේ ගුණානුභාවය නොදන බොහෝකලක් වංචාකරනු ලැබීමි'යි සිතා බුද්ධගුණ අනුස්මරණයෙන් හටගත් පස්වණක් ප්‍රීතියෙන් පැහැසුණු සිරුරු ඇත්තේ තමාගේ ප්‍රසාදය හෙළි කරන්නේ උපාසක බව දන්විය. එය දක්වන්නට එවංවුතෙත රාජා ආදිය අරඹන ලදී. එහි අභික්කන්තං භන්තෙ යනු මේ අභික්කන්ත ශබ්දය ක්‍ෂය සුන්දර ඇති රූප, අනුමෝදන අර්ථයන්හි දක්නට ලැබේ. 'ස්වාමීනි, රාත්‍රිය ඉක්මගියේය. ප්‍රථමයාමය නික්ම ගියේය. භික්ෂු සංඝයා බොහෝ වේලා හුන්නේය. 'ආදී තන්හි ක්‍ෂයවීමෙහි දක්නට ලැබේ. මෙතෙමේ මේ සව් පුග්ගලන් අතර සුන්දරතරය ප්‍රණීතතරය ආදී තන්හි සොඳුරු බවෙහි දක්නට ලැබේ.

කොමෙ වන්‍දති පාදානී - ඉද්ධියා යසසාජලං
අභික්කන්තෙන වණ්ණෙන - සබ්බා ඔභාසං දිසා

කවරෙක් මා පා වඳීද - ඉද්ධුවෙන්යසසින් දිලෙමින්
සොඳුරු පැහැයෙන් - සියලුදෙස් එළිකරවා

ආදී තන්හි අභිරූපයෙහි. අභික්කන්තං ගො ගොතම ආදී තන්හි අනුමෝදනයෙහි අනුමෝදනයෙහි යෙදෙන බැවින් 'සාධු සාධු භන්තෙ'යි කියන ලද්දේ වෙතියි දතයුතුයි.

භයෙ කොධෙ පසංසායං - තුරිතෙ කොතුහලච්ඡරෙ
හාසෙ සොකෙ පසාදෙච - කරෙ ආමෙණ්ඩිතං බුධො

බියෙහි කොවෙහි පැසසුමෙහි - ඉක්මනෙහි කුහුලෙහි පුදුමයෙහි
සිනාවෙහි සෝකයෙහි පහන්බැව්හි-නුවණැත්තේ ආමෙණ්ඩිතය කරයි.

මේ ලක්‍ෂණයෙන්ද මෙහි ප්‍රසාද වශයෙන් ප්‍රශංසා වශයෙන් ද මෙය දෙවරක් කියන ලදැයි දතයුතුය. නැතහොත් අභික්කන්තං යන්න සුන්දරය. අතිශයින් ප්‍රසන්නය. අතිශයින් මනාපය. අතිශයින් සුන්දර යයි

කියන ලද්දේ වෙයි. මෙහි එක් අභික්කන්ත ශබ්දයකින් දේශනාවට ස්තුති කරයි. එකකින් තමාගේ ප්‍රසාදය පළකරයි. මේ මෙහි අදහසයි.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සුන්දරය. භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාවට පැමිණ මාගේ ප්‍රසාදය සුන්දරය. භාග්‍යවතුන් වහන්සේගේ ම වචනය අර්ථ දෙකක් සඳහා ස්තුති කෙරේද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ වචනය දොස් නසන හෙයින් අභික්කන්තය. ගුණ අවබෝධ කරන හෙයින් අභික්කන්තය.

එසේම ශ්‍රද්ධාව ඇතිකරන හෙයින්, ප්‍රඥාව ඇතිකරන හෙයින්. අර්ථ ඇති බැවින්, ව්‍යඤ්ජන සහිත බැවින්, පැහැදිලි පද ඇති බැවින්, ගැඹුරු අර්ථ ඇති බැවින්, කර්ණ සුඛ ඇති බැවින්, හෘදයංගම බැවින් තමා උසස් නොකරන බැවින්, අනුන්ට අවමන් නොකරන බැවින්, කරුණාවෙන් සිසිල් වූ බැවින්, ප්‍රඥාවෙන් පිරිසිදු බැවින්, පෙනුම රමණීය බැවින්, මර්දනයෙහි දක්ෂ වූ බැවින්, ඇසෙන සුව ඇති බැවින් විමර්ශනය කරනු ලැබීමට යහපත් බැවින් ආදිය සමග යෙදිය යුතුය. ඉන් ඔබ්බටද උපමා සතරකින් දේශනාවටම ස්තුති කරයි.

එහි **නික්කුජ්ජිතං** යනු මුනින් තමා තැබූ හෝ යටින් මුව ඇති හෝ **උක්කුජ්ජෙය්‍ය** යනු උඩුකුරු කරන්නේය. **පටිච්ඡන්නං** යනු තණකොළ ආදියෙන් වැසූ. **විවරෙය්‍ය** විවර කරන්නේය. **මූළ්හස්ස** යනු දිශාව මුළා වුවහුට **මග්ගං ආචික්ඛෙය්‍ය** යනු අතින් ගෙන 'මේ මගයැ'යි කියන්නේය. **අන්ධකාරෙ** යනු අමාවක තුදුස්වක මැදියම ගන වනලැහැබ වැහි වලාකුළු පටලයෙන් අංග සතරකින් යුතු අන්ධකාරයෙහි. මෙය නොපැහැදිලි පදාර්ථයි. මේ අදහස් යෙදුමයි. යම්සේ යටිකුරු වූවක් උඩුකුරු කරන්නේද මෙසේ සද්ධර්මයට විරුද්ධ අසද්ධර්මයෙහි පිහිටි මා වැසුණු දෙයක් විවර කරන්නාක් මෙන් අසද්ධර්මයෙන් නැගිටුවන්නාහු විසින් මෙසේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය අතුරුදහන් වීමේ සිට මිථ්‍යාදෘෂ්ටි ග්‍රහණයෙන් වැසුණු සසුන විවර කරන්නාහු විසින්, යම්සේ මුළා වූවකුට මග කියා දෙන්නේද මෙසේ වැරදි මගට මිථ්‍යා මාර්ගයට පිළිපන්නා වූ මා හට සගමොක් මග හෙළි කරන්නහු විසින්, යම්සේ අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේද මෙසේ මොහඳුරෙහි ගිලුණු බුද්ධාදී රත්නරූප නොදක්නා මා හට එය වසාලන, මෝහාන්ධකාරය දුරලන දේශනා නමැති පහන දරන මා හට භාග්‍යවතුන් වහන්සේ විසින් මේ

ක්‍රමවලින් ප්‍රකාශ කරන ලද බැවින් අනෙක පරියායෙන ධම්මො පකාසිතො යනු මෙසේ දේශනාවට ස්තුතිකොට මේ දේශනාවෙන් රත්නත්‍රයෙහි පහන් සිතැත්තේ ප්‍රසන්නාකාරයක් කරන්නේ එසාහං ආදිය කීය.

එහි එසාහං යනු ඒ මම. භගවන්තං සරණං ගච්ඡාමි යනු භාග්‍යවතුන් වහන්සේ මාගේ සරණයයි. පිහිටය. දුක නැති කරන්නා යහපත ඇති කරන්නා ය යන මේ අදහසින් භාග්‍යවතුන් වහන්සේ වෙත යමි. උන්වහන්සේ භජනය කරමි. සේවනය කරමි. පයිරුපාසනය කරමි. මෙසේ දනිමි. අවබෝධ කරමි. යම් ධාතූන්ගේ ගති අර්ථයක් වේද, බුද්ධියද ඔවුන්ගේ අර්ථයයි. ඒ නිසා ගච්ඡාමි යනු දනිමි. අවබෝධ කරමි යන මේ අර්ථය කියන ලදී.

ධම්මඤ්ච භික්ඛු සංඝඤ්ච යනු මෙහි අවබෝධ කරගත් මාර්ග ඇති සාක්ෂාත් කරන ලද නිරෝධය ඇති, අනුශාසනා කරන ලද පරිදි පිළිපදින සතර අපායන්හි නොවැටෙන්නවුන් දරතියි = ධම්මො එය අර්ථ වශයෙන් ආර්ය මාර්ගය ද නිර්වාණය ද වෙයි. මෙය කියන ලදී. මහණෙනි, ධර්මයෝ යම්තාක් සංඛත වෙත්ද ආර්ය අෂ්ටාංගික මාර්ගය ඔවුන් අතර අග්‍රයයි කියනු ලැබේ. විස්තරය හුදෙක් ආර්ය මාර්ගය ද නිර්වාණය ද නොවේ. තවද ආර්යඵලයන් සමග පර්යාප්ති ධර්මයද වෙයි. මෙය ඡත්තමානවක විමානයෙහි කියන ලදී.

රාග විරාග මනෙජ මසොකං
ධම්ම මසංඛත මප්පටි කූලං
මධුරමිමං පගුණං සුවිභත්තං
ධම්මමිං සරණාතත මුපෙමි

ආර්ය මාර්ගය වූ, ආර්ය ඵලය වූ
පරමාර්ථ ධර්මය වූ, හේතුවක් නිසා හට නොගන්නා වූ,
අප්‍රිය නොවන්නා වූ මිසදිටු සර්වඥතා ඥානය ඇසුරුකොට
පවතින්නා වූ, ධර්මය සරණ යන්න.

මෙහි රාග විරාගො යනු මාර්ගය කියන ලදී. අනෙජ මසොකං යනු ඵලයයි. ධම්ම මසංඛතං යනු නිර්වාණයයි. අප්පටිකූලං මධුරමිමං සුවිභත්තං යනු පිටකත්‍රයෙන් බෙදන ලද සියලු ධර්මස්කන්ධයෝ.

දෘෂ්ටිශීල සංඝාතයෙන් (නැසීමෙන්) නසන ලද්දේනුයි = සංඝො. එය අර්ථ වශයෙන් අෂ්ට ආර්ය පුද්ගල සමූහයයි. එම විමානයෙහිම මෙය කියන ලදී.

**යත්ථච දින්න මහප්ඵල මාහු**
**චතුසු සුචීසු පුරිස යුගෙසු**
**අට්ඨ ච පුග්ගල ධම්මදසා තෙ**
**සංඝම්මං සරණත්ත මුපෙමි**

යම්බඳු ආර්ය සංඝරත්නයක් වෙත දෙනලද දෙය
මහත්ඵල මහානිසංස වේද, නිකෙලෙස් බවින් පිරිසිදු වූ
යුගල වශයෙන් සතරක් වූ පුද්ගලයන් වශයෙන් අටක් වූ
සංඝරත්නය සරණ යන්න.

භික්ෂූන්ගේ සංඝයා = භික්ඛු සංඝො. මෙපමණකින් රජ තෙමේ තිසරණගමනය දැන්වීය.

දැන් ඒ සරණාගමනයන්හි කුශලතාව සඳහා, සරණය, සරණාගමනය, සරණ යන්නා, සරණාගමන ප්‍රභේද, සරණාගමන ඵල, සංකිලෙස, භේද යනුවෙන් මේ විධිභේදය දතයුතුය. ඒ කෙසේද යත්? පදාර්ථ වශයෙන් හිංසා කෙරේනුයි = සරණං සරණ ගියවුන්ගේ ඒ සරණාගමනයෙන් බිය, සන්ත්‍රාසය, දුක, දුගතියට යාමේ දණ්ඩනය නසයි. විනාශ කරයි යන අර්ථයි. රත්නත්‍රයයට මෙය සමාන වචනයකි. නැතහොත් යහපත පිණිස පැවතීමෙන්, අයහපත නැවැත්වීමෙන් සත්ත්වයන්ගේ බය නැතිකරානුයි = බුද්ධො. භවය නමැති කාන්තාරයෙන් තරණය කරවීමෙන් ආස්වාස දානයෙන් ද ධම්මො. සුළු දෙයක් කරන්නවුන්ට පවා විපුලඵල ප්‍රතිලාභය ලබාදීමෙන් සංඝො. ඒ නිසා මේ ක්‍රමයෙන්ද රත්නත්‍රය සරණය. එහි පැහැදුණු එයට ගරු කළාහු, පහ වූ කෙලෙස් ඇත්තේ එය පිහිටකොට ගැනීමේ ආකාරයෙන් පැවති සිත් ඉපදීම සරණාගමනයයි. එයින් යුක්ත වූ සත්ත්වයා සරණ යයි. කියන ලද ආකාර ඇති සිත් ඉපදවීමෙන් 'මේ තෙරුවන මට සරණය. මේවා මට පිහිටය' යැයි මෙසේ පැමිණේ යන අර්ථයි. මෙසේ සරණය, සරණාගමනය, සරණ යන්නා යන මේ තුන දතයුතුය.

සරණාගමන ප්‍රභේදය වනාහි ලෞකික සරණාගමනය, ලෝකෝත්තර සරණාගමනය යනුවෙන් දෙවැදෑරුම් වේ. එහි ලෝකෝත්තර සරණාගමනය. දක්නා ලද සත්‍යයන්ගේ මාර්ගක්‍ෂණයෙහි සරණාගමන උපක්ලේශයන් සිඳදැමීමෙන් අරමුණු වශයෙන් නිර්වාණ ආරම්මණය වී කෘත්‍ය වශයෙන් මුළු තෙරුවනෙහි ප්‍රතිඵල ලැබේ. ලෞකික සරණාගමනය වනාහි පෘථග්ජනයන්ගේ සරණාගමන උපක්ලේශ විනාශ කිරීමෙන්, අරමුණු වශයෙන් බුද්ධාදී ගුණ අරමුණුකොට එල දේ. එය අර්ථ වශයෙන් බුද්ධාදී වස්තුන්හි ශ්‍රද්ධා ප්‍රතිලාභයද, ශ්‍රද්ධාව මුල්කොටගත් සම්‍යක් දෘෂ්ටිය, දස පින්කිරියවත්හි දෘෂ්ටිය ඍජු කිරීම යයි කියනු ලැබේ.

එය සිව් අයුරකින් පවතී. තමා මනාසේ පැමිණීමෙන්, එය පිහිටකොට ගැනීමෙන්, ශිෂ්‍යභාවයට පැමිණීමෙන් වන්දනා කිරීමෙන් යනුවෙන්. එහි අත්තනියාාතනය නම් 'අද සිට මම තමා බුදුන්ට ධර්මයට සංඝයාට වෙන්වෙමියි මෙසේ බුද්ධාදීන්ට ආත්ම පරිත්‍යාග කිරීමයි. තප්පරායණතා නම් අද සිට මම බුදුන් පිහිට කොටගනිමි. ධර්මය පිහිටකොට ගනිමි. සංඝයා පිහිට කොටගනිමියි මෙසේ මා පිළිගනු මැනවි' යනුවෙන් තප්පරායණ භාවයයි. ශිෂ්‍යභාවයට පැමිණීම නම් 'අද සිට මම බුදුන්ගේ අතවැසියෙක්මි. ධර්මයෙහි, සංඝයාගේ අතවැසියෙක්මි. එසේ මා පිළිගනු මැනවැයි මෙසේ සිසසභාව උපගමො පණිපාත නම්, 'අද සිට මම වැඳීම, නැගිටීම, ඇඳිලි බැඳීම, ගරුකිරීම බුද්ධාදී වස්තු තුනට කරමි. මෙසේ මා පිළිගනු මැනවැයි, මෙසේ බුද්ධාදීන් කෙරෙහි පරම ගෞරවය දැක්වීම. මේ සිව් ආකාරයට වෙනත් ආකාරයක් කරන්නහු විසින්ද සරණ ගන්නා ලද්දේ ම වෙයි.

තවද, භාග්‍යවතුන් වහන්සේට ආත්මභාවය පරිත්‍යාග කරමි. ධර්මයට, සංඝයාට ආත්මභාවය පරිත්‍යාග කරමි. මාගේ ආත්මභාවය පරිත්‍යාග කරන ලද්දේමය. මාගේ ජීවිතය පරිත්‍යාග කරන ලද්දේමය. දිවි කෙළවර තෙක් බුදුන් සරණ යමි. බුදුන්වහන්සේ මාගේ සරණයයි. ආරක්ෂාවයි. ආරක්ෂක ස්ථානයයි. පිහිටයි යනුවෙන් මෙසේද ආත්මභාවය වෙන් කිරීම දතයුතුය. 'මම ශාස්තෘන් වහන්සේම දකිමි. භාග්‍යවතුන් වහන්සේම දකිමි. සුගතයන් වහන්සේම දකිමි. භාග්‍යවතුන් වහන්සේම දකිමි. සම්මා සම්බුදුන් වහන්සේම දකිමි. භාග්‍යවතුන් වහන්සේම දකිමියි මෙසේද මහා කාශ්‍යප තෙරුන්ගේ සරණාගමනයේදී මෙන් ශිෂ්‍ය භාවයට පැමිණීම දතයුතුය.

සො අහං විචරිස්සාමි - ගාමා ගාමං පුරා පුරං
නමස්ස මානො සම්බුද්ධං - ධම්මස්සච සුධම්මතං

සම්බුදු රදුන් සහ - දහමෙහි සුදම් බව
නමදිමින් හැසිරෙමි - ගමින් ගම නුවරින් නුවර

මෙසේද ආලවක ආදීන්ගේ සරණාගමනය මෙන්. තප්පරායණතාව දතයුතුයි. 'ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණයා හුනස්නෙන් නැගී උතුරුසළුව එකස්කොට භාග්‍යවතුන් වහන්සේගේ පාමුල හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේගේ පා මුවින් සිපගතී. අතින් පිරිමදියි. නමද අස්වයි. භවත් ගෞතමයන් වහන්ස, මම බ්‍රහ්මායු බ්‍රාහ්මණයාය. භවත් ගෞතමයන් වහන්ස, මම බ්‍රහ්මායු බ්‍රාහ්මණයා වෙමි'යි මෙසේද ප්‍රණිපාතය දතයුතුයි.

එය වනාහි ඥාති, භය, ආචාර්ය, දක්ෂිණෙය්‍ය වශයෙන් සිව් වැදෑරුම් වේ. එහි දක්ෂිණෙය්‍ය ප්‍රණිපාතයෙන් සරණාගමනය වේ. අන් අයුරින් නොවේ. ශ්‍රේෂ්ඨ වශයෙන්ම සරණ ගනු ලැබේ. ශ්‍රේෂ්ඨ වශයෙන් බිඳේ. ඒ නිසා යම් ශාක්‍යයෙක් හෝ කෝලියයෙක් හෝ 'බුදුන් වහන්සේ අපගේ ඥාතියෙක් යයි වඳී. සරණය නොගන්නා ලද්දේම වේ. යමෙක් 'ශ්‍රමණ ගෞතම රාජ පූජිතය, මහානුභාව ඇත්තේය.
නො වැන්දොත් අනර්ථයක් වුවත් කරන්නේ යැයි බියෙන් වඳිති.
සරණය නොගන්නා ලද්දේම වෙයි. යමෙක් බෝධිසත්ත්ව කාලයෙහි හෝ බුද්ධකාලයෙහි හෝ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි උගත් දෙයක් සිහිකරමින් වඳියි.

චතුධා විභජෙ භොගෙ - පණ්ඩිතො සර මාවසං
එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය - ද්වීහි කම්මං පයොජයෙ
චතුත්ථංච නිධාපෙය්‍ය ආපදාසු භවිස්සති

ගිහිගෙයි වසන නුවණැත්තේ
දනය සිව් කොටසක් කොට
එකක් යැපුම පිණිසද
දෙකක් යෙදවුම පිණිස ද යොදා
එකක් ආපදා සඳහා තැන්පතුවක් සේ තබයි.

මෙබඳු අනුශාසනයක් උගෙන 'මාගේ ගුරුවරයා යයි වදියි. සරණය නොගන්නා ලද්දේ ම වෙයි. යමෙක් 'මුන් වහන්සේ ලෝකයෙහි දක්ෂිණාවට සුදුසු අග්‍ර පුද්ගලයා යයි වදියි. එයින්ම සරණ ගියේ වෙයි. මෙසේ ගත් සරණ ඇති උපාසකයකුගේ හෝ උපාසිකාවකගේ අන්‍ය තීර්ථකයන් වෙත පැවිදි වුවද 'මොහු මාගේ ඥාතියෙකැයි වැන්දත් සරණාගමනය නොබිඳේ. පැවිදි නොවූවන් ගැන කියනුම කවරේද? එසේ භය වශයෙන් රජු වදින්නහුගේ 'මෙතෙමේ රටින් පූජා ලබන්නකු බැවින් නොවැන්දොත් අනර්ථයක් කරන්නේ යයි. 'මොහු මාගේ ගුරුවරයෙකැයි ශිල්ප හදාරවන තීර්ථකයකු වදින්නකුගේ සරණාගමනය නොබිඳේ. මෙසේ සරණාගමන ප්‍රභේදය දතයුතුය.

මෙහි ලෝකෝත්තර සරණාගමනයෙහි සතර සාමඤ්ඤඵල විපාක ඵලයයි. සියලු දුක් නැතිකිරීම ආනිසංස ඵලයයි කියන ලද්දේ වෙයි.

යොච බුද්ධංච ධම්මංච සංඝංච සරණං ගතො
චත්තාරි අරිය සච්චානි - සම්මප්පඤ්ඤාය පස්සති

බුදුන් දහම් සඟුන් සරණගියේ
සිව් අරිසස්, දුක, දුක හටගැන්ම නිරෝධ
දුක් නසන අරි අටඟි මග
නුවණින් දක්නේය.

දුක්ඛං දුක්ඛ සමුප්පාදං - දුක්ඛස්සච අතික්කමං
අරියං ඡට්ඨංගිකං මග්ගං - දුක්ඛූපසම ගාමිනං

දුක දුක හටගැන්ම - දුක ඉක්මවීම
දුක් නැතිකරන අරි අටඟි මග

එතං ඛො සරණං ඛෙමං - එතං සරණ මුත්තමං
එතං සරණ මාගම්ම - සබ්බ දුක්ඛා පමුච්චති

මේ සරණය කෙම්බිමය - මේ උතුම් සරණය
මේ සරණයට පැමිණ - සියලු දුකින් මිදෙයි

තවද, නිත්‍ය වශයෙන් නොයාම් ආදි වශයෙන් ද එහි ආනිසංස ඵලය දතයුතුය. එය කියන ලදී. මහණෙනි, දෘෂ්ටි සම්පන්න පුද්ගලයෙක්

කිසියම් සංස්කාරයකට නිත්‍ය වශයෙන් පැමිණෙන්නේය. සුඛ වශයෙන් පැමිණෙන්නේය. කිසියම් ධර්මයකට ආත්ම වශයෙන් පැමිණෙන්නේය. මව, පියා, රහත් කෙනෙකු මරණයට පත් කරන්නේය. දූෂිත වූ සිතින් තථාගතයන් වහන්සේගේ ලේ සොලවන්නේය. සංඝයා බිඳුවන්නේය. අන් ශාස්තෘවරයකු උදෙසන්නේය යන දේ සිදුවිය නොහැක්කකි. එයට ඉඩක් නැත. මේ කරුණ නොපැනේ' යනුවෙන්.

ලෞකික සරණාගමනයෙහි භව සම්පදාවද, භෝග සම්පදාවද ඵලයම යැයි කියන ලදී.

**යෙකෙචි බුද්ධං සරණං ගතාසෙ - නතෙ ගමිස්සනති අපායං**
**පහාය මානුසං දෙහං - දෙවකායං පරිපූරෙස්සනති**

බුදු සරණ ගියාහු - අපායට නොයන්නෝය.
මිනිස් කය අත්හැර - දෙව් කය පුරවන්නෝ ය.

තවත් කරුණක් කියන ලදී. ඉක්බිති ශක්‍රදේවේන්ද්‍ර තෙමේ අසූදහසක් දෙවියන් සමග ආයුෂ්මත් මහා මෞද්ගල්‍යාන තෙරුන්වහන්සේ යම්තැනකද එතැනට එළැඹියේය. -පෙ- එකත්පසක සිටි ශක්‍රදේවේන්ද්‍රයාට ආයුෂ්මත් මහා මෞද්ගල්‍යාන තෙරණුවෝ මෙසේ කීහ. දේවේන්ද්‍රය, බුදුන් සරණ යාම මැනවි. බුදුන් සරණ යාම හේතුවෙන් දේවේන්ද්‍රය, එක්තරා සත්ව කෙනෙක් කය බිඳීමෙන් මරණයට පත්වීමෙන් පසු සුගතියක් වූ ස්වර්ග ලෝකයට යති. ඔවුහු අන් දෙවිවරුන් කරුණු දසයකින් අබිබවා සිටිති. ආයුෂයෙන්, දේව වර්ණයෙන්, සැපයෙන්, යසසින්, අධිපතිභාවයෙන්, දිව්‍යමය රූපයෙන්, ශබ්දයෙන්, ගන්ධයෙන් රසයෙන් ස්පර්ශයෙන් ධර්මයෙහිද සංඝයා කෙරෙහිද මේ ක්‍රමයමැයි. තවද, වෙලාම සූත්‍ර ආදි වශයෙන් සරණාගමනයෙහි ඵලවිශේෂය දතයුතුය. මෙසේ සරණාගමන ඵලය දතයුතුය.

එහි සරණාගමනය කරුණු සතරකදී අඥාන, ශංසය, මිථ්‍යාඥාන ආදීන්ගෙන් කිළිටි වේ. මහා ශෝභාවක් ඇති දෙයක් නොවේ. මහා පැතිරීමක් නොවේ. ලෝකෝත්තර සරණාගමනයෙහි කිළිටි වීමක් නැත. ලෞකික සරණාගමනයෙහි දෙවැදෑරුම් භේදයක් ඇත. සාවද්‍ය අනවද්‍ය යනුවෙන්. එහි සාවද්‍ය සරණාගමනය අන්‍ය ශාස්තෘන් කෙරෙහි

ආත්මභාවය පැමිණවීම් ආදියෙහිදී වෙයි. එය අනිටු පලයකි. ලෝකෝත්තර සරණාගමනයට භේද නැත. භවාන්තරයෙහිද ආර්ය ශ්‍රාවකයා අන්‍ය ශාස්තෘවරයකු නොඋදෙසයි. මෙසේ සරණාගමනයෙහි සංකිලෙසයද භේදයද දතයුතුය.

**උපාසකං මං භනෙත භගවා ධාරෙතු** යනු භාග්‍යවතුන් වහන්සේ මේ උපාසකයෙකැයි මා මෙසේ පිළිගනු මැනවි. දැනගන්නා සේක්වා යන අර්ථයි. උපාසක විධි පිළිබඳ කුශලතාව පිණිස මෙහි උපාසකයා කවරෙක්ද? කුමක් නිසා උපාසකයෙකැයි කියනු ලැබේද? ඔහුගේ ශීලය කුමක්ද? ආජීවය කවරේද? විපත්තිය කුමක්ද? සම්පත්තිය කුමක්ද? මේ ප්‍රකීර්ණකය දතයුතුය.

එහි උපාසක යනු කවරෙක්ද? කිසියම් සරණ ගිය ගිහියෙක් එය කියන ලදී. මහානාම යම් කරුණකින් බුදුසරණ ගියේ වේද දහම් -පෙ- සඟ සරණ ගියේ වේද, මහානාම එපමණකින් උපාසකයෙක් වෙයි.

කවරහෙයින් උපාසක වේද? තෙරුවන් වෙත එළඹෙන බැවින් හෙතෙමේ බුදුන් කරා එළඹෙතියි = උපාසකො. ධර්මය කරා සංඝයා කරා එළඹෙතියි උපාසක නම්.

ඔහුගේ ශීලය කුමක්ද? වෙන්වීම් පස. යම්සේ කීද? මහානාම උපාසක තෙමේ පාණාතිපාතයෙන් වෙන්වූයේ වේද, අදින්නාදානයෙන් -පෙ- කාමෙසුමිච්ඡාචාරයෙන්, මුසාවාදයෙන්, සුරාමේරය මජ්ජපමා දට්ඨානයෙන් වෙන්වූයේ වේද, මහානාම එපමණකින් උපාසක තෙමේ සිල්වත් වෙයි.

ආජීවය කවරේද? මිථ්‍යා වෙළඳම් පස හැර දැහැමෙන් සෙමෙන් ජීවිකාව කිරීම කියන ලදී. මහණෙනි, උපාසකයකු විසින් නොකළයුතු වෙළඳම් පසෙකි. කවර පසෙක්ද යත්, සත්ථවණිජ්ජා (ආයුධ වෙළඳම) සත්ත වණිජ්ජා (සතුන් වෙළඳම) මංසවණිජ්ජා (මාංශ වෙළඳම) මජ්ජ වණිජ්ජා (මත්පැන් වෙළඳම) විසවණිජ්ජා (විෂ වෙළඳම) මහණෙනි උපාසකයකු විසින් නොකළයුතු මේ වෙළඳම් පසයි.

කවර විපත්තියක්ද? එම ශීලයටද ආජීවයටද යම් විපත්තියක් වේද, එයම මෙයටද විපත්තියයි. තවද යමකින් මොහු සැඩොලෙක්

වේද (මලංච පතිකිටෙඨාච) එය ඔහුට විපත්තියයි දතයුත්තේය. අර්ථ වශයෙන් ඒවා අශ්‍රද්ධාව ආදී ධර්ම පහක් වෙයි. යම්සේ කීද? 'මහණෙනි, කරුණු පහකින් යුක්ත වූ උපාසක තෙමේ චණ්ඩාලයෙක් වෙයි. උපාසක කැළලක්ද, උපාසක බවින් ඇද දමන ලද්දේ ද වෙයි. කවර පසෙකින්ද යත්, ශ්‍රද්ධා නැත්තේ වෙයි. දුස්සීල වෙයි. උත්සව පවත්වන්නේ වෙයි. කර්මයට නොව මංගලයට නැවත එයි. මින් බැහැර දක්ෂිණාවට සුදුස්සන් සොයයි. එහිද විශ්වාස කරයි.

කවර සම්පත්තියක්ද? ඔහුට යම් ශීල සම්පදාවක් වේද, ආජීව සම්පදාවක් වේද එය ඔහුගේ සම්පත්තියයි. ඔහුට යම් රත්නභාව ආදී කරන ශ්‍රද්ධා ආදී පංච ධර්මයෝ වෙත්ද ඒවා. යම්සේ කීද? මහණෙනි, කරුණු පසකින් යුත් උපාසක තෙමේ උපාසක රත්නයක්ද, උපාසක රත්පියුමක්ද, උපාසක සුදු පියුමක්ද වෙයි. කවර පසෙකින්ද යත්, ශ්‍රද්ධා ඇත්තේ වෙයි. සිල් ඇත්තේ වෙයි. උත්සව පවත්වන්නේ නොවෙයි. මංගලයට නොව කර්මයට ආපසු එයි. මින් බැහැර දක්ෂිණාවට සුදුස්සන් නොසොයයි. මෙහිද විශ්වාස කරයි.

අජ්ජතගෙග යනු මෙහි අගග ශබ්දය මුල, කෙළවර, කොටස, ශ්‍රේෂ්ඨ යන තන්හි දක්නට ලැබේ. 'යහළු දොරටුපාල, මම අද පටන් නිගණ්ඨයන්ටත් නිගණ්ඨ ස්ත්‍රීන්ටත් දොර වසමි' ආදී තන්හි මුල දක්නට ලැබේ. 'ඒ ඇඟිලි අගින්ම ඒ ඇඟිලි අග අත ගාමි. උක්ගසෙහි අගද, උණගසෙහි අගද අතගාමි. ආදී තන්හි කෙළවරය. ඇඹුල් රස, මිහිරි රස, තිත්ත රස හෝ මහණෙනි, විහාර අනුව හෝ පිරිවෙන අනුව බෙදීම අනුදනිමි' ආදී තන්හි කොටසෙහි 'මහණෙනි, යම්පමණ පානැති හෝ -පෙ- සත්වයෝ වෙත්ද, තථාගත තෙමේ ඔවුන් අතර අග්‍රයයි කියනු ලැබේ' ආදී තන්හි ශ්‍රේෂ්ඨ බවෙහි. මෙය වනාහි මෙය ආදියෙහි දතයුතුය. ඒ නිසා අජ්ජතගෙග යනු අද ආදිකොට යනුයි. මෙසේ මෙහි අර්ථය දතයුතුය. අජ්ජතං යනු අද බව. අජ්ජදගෙග යනුවෙන්ද පාඨයක් වෙයි. ද කාරය පද සන්ධි කරන්නකි. අද ප්‍රධානකොට යන අර්ථයි.

පාණුපෙතං යනු ප්‍රාණයෙන් යුතු. 'යම්තාක් මාගේ ජීවිතය පවතීද, ඒ තාක් එළඹ සිටි, වෙනත් ශාස්තෘ කෙනෙකු නැති, සරණාගමනයෙන් සරණ ගිය. කැපකරු උපාසකයකු ලෙස භාග්‍යවතුන් වහන්සේ මා පිළිගනු මැනවි. දැනගන්නා සේක්වා. මම වනාහි තියුණු අසිපතකින් හිස සිඳ

දැමුවත් බුදු නොවූවකු බුද්ධ කියාද, ධර්මය නොවූවක් ධර්මය කියාද, සංඝ නොවූවක් සංඝයා කියාද නොකියන්නෙමි.

මෙසේ ආත්මභාවය පමුණුවාලීමෙන් සරණගොස් තමා විසින් කරන ලද අපරාධය ප්‍රකාශ කරන්නේ **අච්චයො මං භන්තෙ** ආදිය කීය.

එහි **අච්චයො** යනු අපරාධයයි. **මං අච්චගමා** යනු මා ඉක්මවා අභිබවා පැවති. **ධම්මිකං ධම්ම රාජානං** යනු, මෙහි ධර්මයෙහි හැසිරේනුයි = ධම්මිකො. ධර්මයෙන්ම රජ වූයේ, පියා මැරීම ආදි අධර්මයෙන් නොවේනුයි = ධම්මරාජා. **ජීවිතා වොරොපෙසිං** යනු ජීවිතයෙන් වෙන් කෙළෙමි. **පතිගණ්හාතු** කමා කරන සේක්වා. **ආයතිං සංවරාය** යනු අනාගතයෙහි සංවරවීම පිණිස. නැවත මෙබඳු අපරාධයක් දෝෂයක් ප්‍රමාදයක් නොකරනු පිණිස.

**තග්ඝ** යනු නිශ්චිතව. **යථාධම්මං පටිකරොසි** යනු ධර්මයෙහි පිහිටියාක් මෙන් එසේම කරව. කමා කරවීය යයි කියන ලද්දේ වෙයි. **තං තෙ මයං පතිගණ්හාම** ඔබගේ ඒ අපරාධය අපි කමා කරමු. **වුඩ්ඩි හෙසා මහාරාජ අරියස්ස විනයෙ** යනු මහරජ, මෙය ආර්ය විනයෙහි භාග්‍යවත් බුදුරදුන්ගේ ශාසනයෙහි වැඩීම නම් වේ. කවරක්ද? අපරාධය අපරාධය සේ දැක ධර්මයට අනුව ප්‍රතිකර්ම කොට අනාගතයෙහි සංවරයට පැමිණීම. දේශනාව පුද්ගලාධිෂ්ඨාන කරනසේක් **'යො අච්චයං අච්චයතො දිස්වා යථා ධම්මං පටිකරොති ආයතිං සංවරං ආපජ්ජති'**යි වදාළ සේක.

**එවං වුත්තෙ** යනු භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ කියන ලද කල්හි. **හන්‍ද ච දානි මයං භන්තෙ** යනු, මෙහි **හන්‍ද** යනු ඉවත්කිරීම් අර්ථයෙහි නිපාතයකි. හෙතෙමේ උත්සාහකොට මෙසේ කීය. **බහුකිච්චා** යනු බලවත් කෘත්‍ය. **බහුකරණීයා** යනු එයටම වෙනත් වචනයකි. **යස්සදානි ත්වං** යනු යම් ගමනකට දැන් ඔබ **මහාරාජ** මහරජ, **කාලං මඤ්ඤසි** කාලය යයි දනීනම්, එයට කාලය ඔබම දැනගන්න යයි කියන ලද්දේ වෙයි.

**පදක්ඛිණං කත්වා පක්කාමි** යනු තෙවරක් පැදකුණු කොට නියදසය එක් කිරීමෙන් බබලන ඇඳිලිය සිරසෙහි පිහිටුවා පෙනෙන තෙක් මානයේ භාග්‍යවතුන් වහන්සේට මුහුණ හරවා ගොස් දර්ශනය අත්හැරෙන තැන බිම පසඟ පිහිටුවා වැඳ නික්ම ගියේය.

ඛතායං භිකඛවෙ මහාරාජා යනු මහණෙනි, මේ රජ මුල සිඳගත්තේය. උපහතාය යනු මොහු විනාශ විය. මෙය කියන ලද්දේ වෙයි. මහණෙනි, මේ රජ මුල සිඳගත්තෙකි. නැසුණෙකි. ප්‍රතිෂ්ඨාව බිඳගත්තෙකි. එසේම මොහු විසින් තමා විසින්ම ආත්මභාවය මුලින් සිඳගත්තේද එහෙයින් තමාටද ප්‍රතිෂ්ඨාවක් නූපදවා ගත්තේය.

විරජං යනු රාග රජස් ආදියෙන් විරහිත. රාගමල ආදීන් බැහැර වූ බැවින් වීතමලං ධම්ම චක්ඛුං යනු ධර්මයන්හි ඇස් ඇති හෝ ධර්මමය ඇස් ඇති. අන් තන්හි මාර්ගත්‍රය මේ තවත් වචනයකි. මෙහි වනාහි සෝවාන් මගටම කියන ලද්දේ වෙයි. යම්හෙයකින් මොහු විසින් පියා ඝාතනය නොකරන ලද්දෙක් වීනම්, දැන් මෙහිම හුන්නේ සෝවාන් මගට පැමිණියෙක් වන්නේය. පාපමිත්‍ර ආශ්‍රයෙන් මොහුට අපරාධයක් ඇතිවිය. මෙසේ ඇති කල්හිත්, යම්හෙයකින් මොහු තථාගතයන් වෙත එළඹ තෙරුවන් සරණ ගියේද ඒ නිසා මාගේ ශාසනයාගේ මහත්බව නිසා, යම්සේ කිසිවෙක් පුරුෂයකු මරා මල්මිටක් පමණ දඬුවමින් මිදෙන්නේද, එසේම මොහු ලෝකුම්භ නිරයෙහි ඉපදී වසර තිස්දහසක් යටටම වැටෙන්නේ පතුලටම පැමිණ වසර තිස්දහසක් උඩට එන්නේ නැවත මුදුනට පැමිණ මිදෙන්නේය. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරන ලද්දකි. පෙළට නගා නැත.

මේ සූත්‍රය අසා රජු විසින් කුමන ආනිසංසයක් ලබන ලද්දේ ද? මහා ආනිසංසයක් ලබන ලද්දේය. මොහු පියා මැරූ තැන් පටන් රෑ හෝ දවල් හෝ නින්ද නොලබයි. ශාස්තෲන් කරා එළඹ මේ මධුර වූ ඕජස් සහිත ධර්මදේශනාව ඇසූකල් පටන් නින්ද ලැබීය. තෙරුවනට මහා සත්කාර කළේය. පෘථග්ජන ශ්‍රද්ධාවෙන් යුක්ත වූවෙක් මේ රජු හා සමාන වූවෙක් නොවීය. අනාගතයෙහි 'විදිත විසෙස' නම් පසේ බුදුවරයකු වී පිරිනිවන් පාන්නේය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටට පත් භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අනුමත කළහ.

**සාමඤ්ඤඵල සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

# අම්බට්ඨ සූත්‍ර වර්ණනාව

මා විසින් මෙසේ අසන ලදී. කොසලෙසු යනු අම්බට්ඨ සූත්‍රයයි. මේ එහි අපූර්ව පද වර්ණනාවයි. කොසලෙසු යනු කෝසල නම් ජනපදයෙහි උපන් කුමාරයෝය. ඔවුන්ගේ නිවාසය වූ එක් ජනපදයක් රූඪී ශබ්දයෙන් කෝසලයයි කියනු ලැබේ. ඒ කොසොල් ජනපදයෙහි, පොරාණයෝ මෙසේ කීහු. යම්හෙයකින් පෙර මහාපනාද රජකුමරා නානා නාටක ආදිය දැක සිනාමාත්‍රයක්වත් නොකරන බව අසා රජතුමා මෙසේ කීය. 'යමෙක් මාගේ පුත්‍රයා සිනාගන්වයිද ඔහු සර්වාභරණයෙන් සරසමි.' ඉන්පසු නඟුල් ආදිය අතහැර මහා ජනකාය රැස්වූ කල්හි මනුෂ්‍යයෝ තවත් සත් වසක් නොයෙක් ක්‍රීඩා පෙන්වාද ඔහු සිනා ගස්වන්නට නොහැකි වූහ. ඉන්පසු ශක්‍රයා දිව්‍යනාටක එවීය. හේ දිව්‍යනාටක දැක සිනා ගැන්විය. ඉක්බිති මිනිස්සු තම තමන්ගේ වසන තැන් බලා ගියහ. ඔවුහු අතරමග මිත්‍ර සහෘදයන් ආදීන් දැක පිළිසඳර කරන්නාහු 'පින්වත්නි, කුසල්ද (හොඳද) පින්වත්නි, කුසල්දැයි ඇසූහ. ඒ නිසා ඒ කුසල කුසල වචනය නිසා ඒ ප්‍රදේශය කෝසලයයි කියනු ලැබේ.

චාරිකං චරමානො යනු දිගු ගමනක් යන්නේ. භාග්‍යවතුන් වහන්සේගේ චාරිකාව දෙවැදෑරුම් වෙයි. තුරිත චාරිකා, අතුරිත චාරිකා යනුවෙන්. එහි අවබෝධ කළයුතු පුද්ගලයකු දැක ඔහුට අවබෝධ කරනු පිණිස වහා ගමන තුරිත චාරිකා නම් වේ. එය මහා කාශ්‍යප තෙරුන්ගේ පෙරගමන් ආදියෙහිදී දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ මහකසුප් තෙරුන් පෙරගමන් කරද්දී මොහොතින් ගවු තුනක මගක් වැඩි සේක. ආලවක සඳහා තිස්යොදුනක් වැඩි සේක. අංගුලිමාල සඳහාද එසේය. පුක්කුසාති සඳහා යොදුන් හතළිස්පහක්ද, මහා කප්පින සඳහා යොදුන් දෙදහසක්ද, ධනිය සඳහා යොදුන් සත්සියයක්ද වැඩි සේක. ධර්ම සේනාපතිගේ සද්ධිවිහාරික වනවාසි තිස්ස සාමණේරයන් සඳහා ගවු තුනක් සහ යොදුන් දෙදහසක් වැඩි සේක.

එක් දවසක් සැරියුත් තෙරණුවෝ ස්වාමීනි, තිස්ස සාමණේරයන් සමීපයට යමියි කීහ. භාග්‍යවතුන් වහන්සේ මම ද එන්නෙමියි කියා ආයුෂ්මත් ආනන්ද ඇමතූ සේක. 'ආනන්ද විසිදහසක් ෂඩ් අභිඥාලාභීන්ට දන්වන්න. භාග්‍යවතුන් වහන්සේ තිස්ස සාමණේරයන් සමීපයට වඩින

සේකැ'යි ඉන්පසු දෙවැනි දවසෙහි විසිදහසක් රහතුන් පිරිවරා අහසට නැගී යොදුන් දෙදහසක් එපිට ඔහුගේ ගොදුරුගම්දොර බැස සිවුර පෙරවූ සේක.

කර්මාන්ත සඳහා යන මිනිස්සු දැක 'අපගේ ශාස්තෘන් වහන්සේ පැමිණි සේක. කර්මාන්ත සඳහා නොයන්නැයි කියා අසුන් පනවා කැඳ දී පාවත් කරන්නාහු 'භාග්‍යවතුන් වහන්සේ කොහි වඩනා සේක්දැයි තරුණ භික්ෂූන්ගෙන් විමසූහ. 'උපාසකවරුනි, භාග්‍යවතුන් වහන්සේ අන් තැනක නොවඩනා සේක. මෙහිම තිස්ස සාමණේරයන් දකිනු පිණිස වැඩි සේක. ඔවුහු අපගේ කුලූපග තෙරුන් දක්නට ශාස්තෘන් වහන්සේ වැඩිසේකැ, අපගේ තෙරණුවෝ සුළුපටු කෙනෙක් නොවෙති යි සොම්නස් ඇත්තෝ වූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගේ බත්කිස කෙළවර සාමණේරයන් වහන්සේ ගමෙහි පිඬු පිණිස හැසිර උපාසකවරු 'භික්ෂු සංඝයා මහත්දැයි ඇසූහ. ඉක්බිති ඔවුහු උන්වහන්සේට 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වැඩිසේකැයි දැන්වූහ. උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ පිණ්ඩපාතයෙන් පිළිවිසූහ. ශාස්තෘන් වහන්සේ තිස්සගේ පාත්‍රය අතින් ගෙන 'අවශ්‍ය නැත තිස්ස, බත්කිස නිමියේ යැයි කියූ සේක. ඉන්පසු උපාධ්‍යායන් වහන්සේ විමසා තමාට පැමිණි අසුනෙහි හිඳ බත්කිස කළහ. ඉක්බිති ඔහුගේ බත්කිස අවසන ශාස්තෘන් වහන්සේ යහපත් දෙයක් කියා නික්ම ගම්දොර සිට 'තිස්ස ඔබගේ වසන තැනට යන මග කුමක්දැයි ඇසූ සේක. 'භාග්‍යවතුන් වහන්ස, මෙය යැයි මග කියනවිට 'තිස්ස පෙරටුව යන්න' යැයි කී සේක. භාග්‍යවතුන් වහන්සේ වනාහි සදේවක ලෝකයට මාර්ගය පෙන්වන්නකු වුවද සියලු තුන්ගවු මග සාමණේරයන් දක්නට ලබමියි ඔහු මාර්ග දේශකයා කළ සේක. හේ තමාගේ වසන තැනට ගොස් උන්වහන්සේට වත් කළේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'තිස්ස ඔබගේ සක්මන කුමක්දැයි අසා එහි ගොස් සාමණේරයන් හිඳින පහණෙහි හිඳ 'තිස්ස මෙතැන සුවසේ විසීදැයි ඇසූ සේක. 'එසේය ස්වාමීනි, මෙතැන වසන මට සිංහයන්ගේ ව්‍යාඝ්‍රයන්ගේ හස්තීන්ගේ මෘගයන්ගේ සොරුන්ගේ හඬ අසනවිට අරණ්‍ය සංඥාව උපදී. එයින් සැපසේ වෙසෙමි.' ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'තිසස මහා සංඝයා රැස්කරවන්න. බුද්ධ දායාදය

ඔවුන්ට පෙන්වමියි කියා භික්ෂු සංඝයා රැස්වූ කල්හි උන්වහන්සේ උපසම්පදා කොට තමා වසන තැනට වැඩි සේක. මෙය තුරිත චාරිකාවයි.

ගම් නියම්ගම් පිළිවෙළින් දිනපතා යොදුනක් අඩයොදුනක් වශයෙන් පිඬු පිණිස හැසිරීම් ආදියෙන් ලෝකයාට අනුග්‍රහ කරන ගමන. මෙය අතුරිත චාරිකා නම්. මේ චාරිකාවෙහි හැසිරෙන භාග්‍යවතුන් වහන්සේ මහා මණ්ඩලය, මධ්‍ය මණ්ඩලය අන්‍යතා මණ්ඩලය යන මේ මණ්ඩල තුනෙන් එකක හැසිරෙන සේක. එහි මහා මණ්ඩලය නවසියයක් යොදුන්ය. මධ්‍යම මණ්ඩලය හයසියයක් යොදුන්ය. අන්‍යතා මණ්ඩලය තුන්සියයක් යොදුන්ය. යම්කලෙක මහා මණ්ඩලයෙහි චාරිකා කරන්ට කැමති සේක්ද මහා පවාරණයෙන් පවරා ශුක්ල පක්ෂයෙහි පළමුවන දිනයෙහි මහා භික්ෂු සංඝයා පිරිවරා නික්මෙන සේක. හාත්පස යොදුන් සියයක් එකම කෝලාහලයක් වෙයි. කලින් කලින් ආවාහු ආරාධනා කරන්ට ලබති. ඉතිරි මණ්ඩල දෙකෙහි සත්කාරය මහා මණ්ඩලයට ගලා එයි. එහි භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ ගම් නියමගම්හි දවසක් දෙකක් වසන සේක් මහජනයාට ආමිෂ පිළිගැනීමෙන් අනුග්‍රහ දක්වමින් ධර්මදානයෙන් ඔවුන්ට නිර්වාණයට උපනිශ්‍රය වූ කුසල් වඩමින් නව මසකින් චාරිකාව අවසන් කරන සේක.

ඉදින් ඇතුළු වස භික්ෂූන්ගේ සමථ විදර්ශනා තරුණ වේනම් මහා පවාරණයෙන් නොපවරා පවාරණ සංග්‍රහ දී ඇසල පුන් පොහෝදින පවාරණය කොට නිකිණිමස පළමුවන දින මහා භික්ෂු සංඝයා පිරිවරා නික්ම මධ්‍ය මණ්ඩලයට බසින සේක.

තවත් කරුණකින්ද මධ්‍ය මණ්ඩලයෙහි චාරිකා කරන්ට කැමති සේක්. සිව්මසක් වැස ම නික්මෙන සේක. කියන ලද පරිද්දෙන්ම ඉතිරි මණ්ඩල දෙකෙහි සත්කාරය මධ්‍ය මණ්ඩලයට ගලා එයි. භාග්‍යවතුන් වහන්සේ පෙර ක්‍රමයෙන්ම ලෝකයට අනුග්‍රහ දක්වමින් අටමසකින් චාරිකාව නිමකරන සේක.

ඉදින් සිව්මසක් විසූ වස් ඇති වුවත් භාග්‍යවතුන් වහන්සේ හික්මවිය යුතු සත්ත්වයෝ මුහුකුරා නොගිය ඉඳුරන් ඇත්තෝ නම්, ඔවුන්ගේ ඉඳුරන් මුහුකුරා යාම අපේක්ෂාවෙන් තවත් එක්මසක්, දෙමසක් තුන්මසක් සිව්මසක් වුවද එහිම වැස මහා භික්ෂු සංඝයා පිරිවරා නික්මෙන සේක.

කියන ලද පරිද්දෙන්ම ඉතිරි මණ්ඩල දෙකෙහි සත්කාරය අනෙතා මණ්ඩලයට ගලා එයි. භාග්‍යවතුන් වහන්සේ පෙර ක්‍රමයෙන්ම ලෝකයාට අනුග්‍රහ දක්වමින්, සත් මසකින් හෝ සමසකින් හෝ පස් මසකින් හෝ සිව් මසකින් හෝ චාරිකාව අවසන් කරන සේක.

මෙසේ මේ මණ්ඩල තුනෙහි යම්තැනෙක චාරිකා කරනුයේ චීවර ආදී හේතුවකින් නොවේ. ඉක්බිති දුප්පත්, බාල දිරූ රෝගී වූවෝ කවදා තථාගතයන් වහන්සේ වෙත පැමිණ බලන්නෝද, මා චාරිකාවෙහි හැසිරෙනවිට මහජනයා තථාගත දර්ශනය ලබන්නේය. එහිදී කිසිවෙක් සිත් පහන් කරත්. කෙනෙක් මල්දම් ආදියෙන් පුදන්නෝය. සමහරු හැන්දෙන් භික්ෂාව දෙති. ඇතමෙක් මිථ්‍යා දර්ශනය අත්හැර සම්‍යක් දෘෂ්ටිකයෝ වන්නෝය. එය ඔවුන්ට බොහෝකලක් හිතපිණිස සුඛ පිණිස පවතී යැයි මෙසේ ලෝකයාට අනුකම්පාවෙන් චාරිකා කරන සේක.

තවද කරුණු හතරකින් භාග්‍යවත් බුදුවරු චාරිකාවෙහි හැසිරෙති. ජංඝා විහාර වශයෙන්, ශරීර පහසුව පිණිස, අර්ථ උත්පත්ති කාලයක් කැමති බැවින්, භික්ෂූන්ට සිකපද පනවනු පිණිස ඒ ඒ තැන මුහුකුරා ගිය ඉන්ද්‍රිය ඇති අවබෝධ කළයුතු සතුන්ට අවබෝධය ලබාදෙනු පිණිස යනුවෙති.

තවත් කරුණු සතරකින් භාග්‍යවත් බුදුවරු චාරිකාවෙහි හැසිරෙති. 'බුදුන් සරණ යන්නාහුය කියා හෝ' දහම් සරණ යන්නාහුය කියා හෝ 'සඟ සරණ යන්නාහුය කියා හෝ 'මහත් වූ දහම් වැස්සෙන් සිව්පිරිස සන්තර්පණය කරන්නෙමුයි. තවත් කරුණු පසකින් භාග්‍යවත් බුදුවරු චාරිකාවෙහි හැසිරෙති. 'ප්‍රාණාතිපාතයෙන් වෙන් වන්නාහුය. අදින්නාදානයෙන්, කාමෙසු මිච්ඡාචාරයෙන්, මුසාවාදයෙන්, සුරාමෙරය මජ්ජපමාදට්ඨානයෙන් වෙන් වෙන්නාහුය කියා හෝ.

තවත් කරුණු අටකින් භාග්‍යවත් බුදුවරු චාරිකාවෙහි හැසිරෙති. 'ප්‍රථමධ්‍යානය ලබන්නාහුය කියා හෝ ද්විතීය -පෙ- නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය ලබන්නාහුය කියා හෝ.

තවත් අට කරුණකින් භාග්‍යවත් බුදුවරු චාරිකාවෙහි හැසිරෙති. 'සෝවාන් මාර්ගය අවබෝධ කරන්නාහුය. සෝවාන්ඵලය -පෙ- අරහතත ඵලය සාක්ෂාත් කරන්නාහුය කියා හෝ.

මේ අතුරිත චාරිකාව මෙහි චාරිකායැයි අදහස්කරන ලදී. එය දෙවැදෑරුම් වෙයි. 'අනිබද්ධ චාරිකා නිබද්ධ චාරිකා යනුවෙන්. එහි ගම් නියම්ගම් නගර පිළිවෙළ වශයෙන්ම හැසිරේ. මෙය අනිබද්ධ චාරිකා නම්. එකම අවබෝධ කළයුතු සත්ත්වයකු පිණිස හැසිරේ. මෙය අනිබද්ධ චාරිකා නම්. මෙහි මෙය අදහස් කරන ලදී. එකල්හි පැසුළුයම්කිස අවසන්හි දසදහසක් ලෝකධාතුවෙහි ඤාණ මණ්ඩලය පතුරුවා අවබෝධ කළයුතු බන්ධුවරයකු බලන්නා වූ උන්වහන්සේගේ සර්වඥතා ඥාන ජාලයට පොක්ඛරසාතී බමුණා පිවිසියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ බමුණා මාගේ ඥාන ජාලයෙහි පෙනේ. මොහුට උපනිශ්‍රයක් ඇත්දෝයි විමර්ශනය කරන සේක් සෝවාන් මගට උපනිශ්‍රය ඇතිබව දැක 'මොහු මා ඒ ජනපදයට ගියකල්හි ලකුණු සොයා බලන්ට අම්බට්ඨ නමැති අතවැසියා එවන්නේය. ඔහු මා සමග වාද ප්‍රතිවාද කොට නානාප්‍රකාර අසභ්‍ය වාක්‍ය කියයි. මම ඔහු දමනය කොට හීලෑ කරන්නෙමි. හේ ගුරුවරයාට කියන්නේය. ඉක්බිති ඔහුගේ ගුරුවරයා ඒ කථාව අසා පැමිණ මාගේ ලකුණු සොයා බලන්නේය. මම ඔහුට ධර්මය දේශනා කරන්නෙමි. හේ දේශනාව කෙළවර සෝවාන්පෙලෙහි පිහිටන්නේය. දේශනාව මහජනයාට සඵල වන්නේ යයි පන්සියයක් භික්ෂූන් පිරිවරා ඒ ජනපදයට පිළිපන් සේක. එහෙයින් කියන ලදී. කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛු සංඝෙන සද්ධිං පංචමත්තෙහි භික්ඛු සතෙහි යනුවෙන්.

**යෙන ඉච්ඡානංගලං** යනු යම් දිශාභාගයකින් ඉච්ඡානංගලයට යායුතුද, යම් පෙදෙසක ඉච්ඡානංගලය වේද, ඉච්ඡානංකල යනුවෙන්ද පාඨයක් වෙයි.

**තදවසරි** යනු යම් දෙසකින් ගියේද, එයට හෝ ගියේද, යම් දිසාවකින් ගියේද, ඒ ප්‍රදේශයට හෝ ගියේද යන අර්ථයි.

**ඉච්ඡානංගලෙ විහරති ඉච්ඡානංගල වන සණ්ඩෙ** යනු ඉච්ඡානංගලය නිසා ඉච්ඡානංගල වන ලැහැබෙහි, සිල් කඳවුර බැඳ. සමාධි කුන්තය ඔසවා සර්වඥතාඥාන ස්වරය පරිවර්තනය කරමින් ධර්මරාජයන් වහන්සේ කැමති විහාරයකින් වැඩවසන සේක.

**තෙන බොපන සමයෙන** යනු යම්කලෙක භාග්‍යවතුන් වහන්සේ එහි වසන සේක්ද ඒ කාලයෙහි යන අර්ථයි. බ්‍රහ්මය කියානුයි. බ්‍රාහමණො මන්ත්‍ර සජ්ඣායනය කරයි යන අර්ථයි ආර්යයෙෝ වනාහි පව් ඉවත්කළ බැවින් බ්‍රාහ්මණයෝ යයි කියනු ලබත්.

**පොකඛරසාදී** යනු මේ ඔහුගේ නමයි. පොක්ඛරසාතී යයිද කියනු ලැබේ. ඔහුගේ සිරුර සුදු නෙලුමක් මෙන්ද දෙව්නුවර ඔසවන ලද රිදී තොරණක් මෙන්ද බබලයි. ඔහුගේ හිස ඉන්ද්‍රනීල මැණිකෙන් සැදුවාක් වැනි කාලවර්ණ ඇත්තේය. යටි රැවුල සඳමඬලෙහි වැසිවලාකුළක් මෙන් පෙනේ. ඇස් නිලුපුල් බඳුය. නාසය රිදී නළයක් මෙන් වටය සුපරිසුද්ධය. අතුල් පතුල්ද මුහුණද ලාරසයෙන් පිරියම් කළාක් මෙන් බබලයි. බ්‍රාහ්මණයාගේ ආත්මභාවය සෝභාවෙන් අගතැන්පත්ය. රජු නැති තැන රජ කළයුතු මේ බ්‍රාහ්මණයා මෙසේ සශ්‍රීකය. මෙසේ ඔහු නෙලුමක් බඳු බැවින් පොක්ඛරසාදී යයි හඳුනා ගනිති.

මොහු වනාහි කාශ්‍යප සම්බුදුන් කල ද ත්‍රිවේදයෙහි පරතෙරට ගියේ දසබලධාරීන් වහන්සේට දන් දී ධර්මදේශනාව අසා දෙව්ලොව උපන්නේය. හේ එයින් මිනිස්ලොවට එන්නේ මව්කුස විසීම පිළිකුල්කොට හිමවත් පෙදෙසෙහි මහවිලෙක පියුම්ගැබක උපන්නේය. ඒ විල තුදුරෙහි තවුසෙක් පන්සලක වසයි. හේ ඉවුරෙහි සිටියේ ඒ පද්මය දැක 'මේ පද්මය අනිකුත් පද්මයන්ට වඩා විශාලය. පිපුණු කල්හි එය ගන්නෙමියි සිතීය. එය සතියකින්වත් නොපිපෙන්නේ කුමක් නිසාද? දැන් එය ගන්නෙමියි බැස ගත්තේය. එය ඔහු විසින් නටුවෙන් කැඩූ පමණින්ම පිපුණේය. ඉක්බිති එහි අභ්‍යන්තරයෙහි රන්සුණු පිඬක් වැනි රිදී වන් සිරුරක් ඇති පියුම් රේණු පිඬක් වන් සුදුවන් දරුවකු දුටුවේය. 'හේ මොහු මහපින් ඇත්තේ වන්නේ යයි දැන් මොහු පෝෂණය කරන්නෙමියි පන්සලට නොගොස් පිළිදැගුම් කොට සත්වස් කල්හි පටන් ත්‍රිවේදය ඉගැන්විය. දරුවා ත්‍රිවේදයෙහි පරතෙරට ගොස් පණ්ඩිත වූයේ ව්‍යක්ත වූයේ දඹදිව අග්‍ර බ්‍රාහ්මණයා විය. හේ පසුකලෙක කොසොල් රජුට ශිල්ප දැක්වීය. ඉක්බිති ඔහුගේ ශිල්පයෙහි පහන් වූ රජතෙමේ උකකට්ඨා නම් මහා නගරය බ්‍රහ්ම දායාදයක් කොට දුන්නේය. මෙසේ ඔහු පියුමෙහි සයනය කළ බැවින් පොක්ඛරසාතී යයි හඳුනති.

**උක්කට්ඨං අජ්ඣාවසති** යනු උක්කට්ඨ නම් නගරයෙහි වසයි. අභිභවනය කොට හෝ වසයි. ඒ නගරයෙහි හිමියා වී යම් සීමාවක වැසිය යුතුනම් ඒ සීමාවෙහි වසයි. ඒ නගරයෙහි බිම පන්දම් තබා පන්දම් දැල්වෙන කල්හි අල්ලාගත්හ. ඒ නිසා උක්කට්ඨා යයි කියනු ලැබේ. ඔක්කට්ඨං යනුවෙන්ද පාඨයක් වෙයි. එම අර්ථයයි. උපසර්ග වශයෙන් මෙහි ආධාර අර්ථයෙහි ද්විතියා වචනයයි දතයුතුය. එය නොයෙදෙන බැවින් සෙසු පදයන්හි එහි ලක්‍ෂණය ශබ්දශාස්ත්‍ර අනුව සෙවිය යුතුය.

**සත්තුස්සදං** යනු සත්වයන්ගෙන් උසස්. උත්සන්න බොහෝ ජනයා ඇත. මිනිසුන්ගෙන් ආකීර්ණය. පෝෂණය කළයුතු ඇත් අස් මොනර මුව ආදී නොයෙක් සතුන්ගෙන් ගහණ වූ යන අර්ථයි. යම්හෙයකින් මේ නගරය පිටතින් වටකොට හටගත් ඇත් අස් ආදීන් උලාකන තණපත් වලින්ද, ගෙවල් හොයන තණපත්වලින්ද යුක්ත වූ, එසේම දර හා ගෙවල් තැනීමට අවශ්‍ය ලීවලින්ද යුත්, යම්හෙයකින් එහි අභ්‍යන්තරයෙහි වට හතරැස් ආදී හැඩරුව ඇති බොහෝ පොකුණු ජලජ කුසුමයන්ගෙන් විචිත්‍ර වූද පිටත නොයෙක් තඩාගයෝ ජලයෙන් නිතර පිරී පවතිත්. ඒ නිසා **සතිණ කට්ඨෝදකං** යයි කියන ලදී. ධාන්‍ය සහිත = **සධඤ්ඤං** යනු පූර්වාහ්න අපරාහ්න භේද ඇති බොහෝ ධාන්‍ය එකතුවක් යන අර්ථයි. මෙපමණකින් යම් නගරයක බ්‍රාහ්මණයෙක් සේසත් නංවා රාජශ්‍රීයෙන් වාසය කරයිද එහි සමෘද්ධි සම්පත්තිය දක්වන ලද්දේ වෙයි. රජුගෙන් ලද අයිතිය **රාජභොග්ගං**. කා විසින් දෙන ලද්දේ ද **රඤ්ඤා පසෙනදිනා කොසලෙන දින්නං** ප්‍රසේනජිත් කොසොල් රජු විසින් දෙන ලද. **රාජදායං** යනු රජුගේ දායාදය වූ. දායාදය යන අර්ථයි. **බ්‍රහ්මදෙය්‍යං** යනු ශ්‍රේෂ්ඨ ත්‍යාගය. ඡත්‍රය ඔසවා රජකු මෙන් අනුභව කළයුතු යන අර්ථයි.

නැතහොත් රාජ භොග්ග යනු සියලු **ඡෙජ්ජ භෙජ්ජං** වධ දඬුවම් අනුශාසනය කරමින් තොටුපොළ පර්වත ආදී තැන්වල සුංගම් ගනිමින් සේසත ඔසවා රජ වී අනුභව කළයුතු. **රඤ්ඤා පසෙනදිනා කොසලෙන දින්නං රාජදායං** යනු මෙහි ඒ නගරය රජු විසින් දෙන ලද බැවින් රාජ දායාදය, දායක රජු දැක්වීම පිණිස ප්‍රසේනජිත් කොසොල් රජු විසින් දෙන ලද යන්න සඳහා මෙය කියන ලදී. **බ්‍රහ්මදෙය්‍යං** ශ්‍රේෂ්ඨ ත්‍යාගය. දුන් අයුරින් නැවත ගතයුතු නොවන්නේ වෙයි. ඉවත්කොට පරිත්‍යාග කරන ලද්දේ මෙසේ දෙන ලදී යන අර්ථයි.

**අස්සොසි** යනු ඇසීය. ලැබීය. සෝතද්වාරයට පැමිණි වචන ශබ්ද අනුසාරයෙන් දැන ගත්තේය.

**ඛො** යනු අවධාරණ අර්ථයෙහි හෝ පදපූරණ මාත්‍රයෙහි හෝ නිපාතයකි. එහි අවධාරණ අර්ථයෙන් ඇස්වීය. එයට කිසිදු ශ්‍රවණ අන්තරායක් නොවීය යත්න මෙහි අර්ථය දතයුතුයි. පද පූරණයෙන් පදව්‍යඤ්ජන සිලිට්බව පමණක්ම වේ. දැන් යම් අර්ථයක් පොක්ඛරසාතී බ්‍රාහ්මණයා ඇස්වීද එය ප්‍රකාශ කරන්නේ **සමණො ඛලු භො ගොතමො** ආදිය කීය. එහි සංසිඳවූ පාප ඇති බැවින් **සමණො** යි දතයුතුය. මෙය කියන ලදී. 'උන්වහන්සේගේ පාපක අකුශල ධර්මයෝ සමනය කරන ලදහ' ආදිය. භාග්‍යවතුන් වහන්සේද අනුත්තර වූ ආර්ය මාර්ගයෙන් සමනය කරන ලද පාප ඇති සේක. එහෙයින් උන්වහන්සේ යථාභූත ඥානයෙන් මෙය අවබෝධ කරන ලද බැවින් සමණ නම් වෙති. **ඛලු** අනුශ්‍රවණ අර්ථයෙහි නිපාතයකි. **භො** යනු බ්‍රාහ්මණයාගේ ජාතියෙන් පැමිණි ඇමතීම් මාත්‍රයකි. මෙය කියන ලදී. ඔහු හෝ වාදී වෙයි. ලෞකික බැඳීම් ඇත්නම්.

**ගොතමො** යනු භාග්‍යවතුන් වහන්සේ ගෝත්‍ර වශයෙන් ප්‍රශංසා කරනු ලබත්. ඒ නිසා **සමණො ඛලු භො ගොතමො** යනු ගෞතම ගෝත්‍රයෙහි පින්වත් ශ්‍රමණයා යනුවෙන් මෙහි අර්ථය දතයුතුය.

**සක්‍ය පුත්තො** යනු මෙය වනාහි භාග්‍යවතුන් වහන්සේගේ උසස් කුලය දැක්වීමයි. **සක්‍යකුලා පබ්බජිතො** යනු ශ්‍රද්ධාවෙන් පැවිදි වූ බව දැක්වීමයි. කිසියම් දුර්වලකමකින් යටපත් නොකරන ලද සේක් පිරිහීමට හසු නොවූ ඒ කුලය හැරදමා ශ්‍රද්ධාවෙන් පැවිදි වූ සේකැයි කියන ලද්දේ වෙයි. ඉන් එහා කියන ලද අර්ථ ඇත්තේමය. **තං ඛොපන** යනු පළමුවෙන් සාමඤ්ඤඵලයෙහි කියන ලද්දේමය. **සාධු ඛොපන** යනු සුන්දරය. අර්ථ ගෙන දෙන්නේය. සැප එළවන්නේය යනුවෙන් කියන ලද්දේ වෙයි. **තථාරූපානං අරහතං** යනු ඒ භවත් ගෞතමයන් වහන්සේ යම්සේ වෙත්ද, එබඳු යථා පරිදි ගුණ අවබෝධයෙන් ලෝකයෙහි අරහත් යයි ලද නම් ඇති රහතන්ගේ. **දස්සනං හොති** යනු ප්‍රසාදයෙන් සෞම්‍ය වූ ඇස් දල්වා දැකීම් මාත්‍රයද යහපත් වෙතියි මෙසේ අදහස් කොට.

අජ්ඣායකො යනු මෙය, මොවුහු දැන් පමණක් මන්ත්‍ර කියන්නාහු නොවෙති. දැන් පමණක් මන්ත්‍ර කියන්නෝ නොවෙතියි වාසෙට්ඨයෝ අජ්ඣායක අජ්ඣායකය යනුවෙන් දෙවැනි අකුර හටගත්තේය යනුවෙන් ප්‍රථම කල්පය ඇතිකල්හි මන්ත්‍ර නොකියන බමුණන්ට ගර්හා කිරීමේ වචනය උපන්නේය. දැන් මන්ත්‍ර කියන්නේ නුයි අජ්ඣායක වෙයි. මන්ත්‍ර පිරිවහයි යන අර්ථයෙන් ප්‍රශංසා වචනයක් කොට ව්‍යවහාර කරති. මන්ත්‍ර දරානුයි මන්තධරෝ.

තිණ්ණං වෙදානං යනු ඍග්වේද යජුර්වේද සාමවේදයන් තොල ගෑවීම කිරීම් වශයෙන් පරතෙරට ගියේනුයි පාරගූ නිඝණ්ඩු කෙටුභ සහිත බැවින් සනිඝණ්ඩු කෙටුභානං නිඝණ්ඩු යනු නාම නිඝණ්ඩුවයි. රුක් ආදීන්ගේ විවිධ වචන ප්‍රකාශ කරන ශාස්ත්‍රය. කෙටුභ යනු කාර්ය කිරීම හා නොකිරීම. කවීන්ට උපකාරී වන ශාස්ත්‍රය. අක්ෂර ප්‍රභේද සහිත භේදයෙන් සාක්ඛරප්පභෙදානං. අක්ඛරප්පභේද යනු ශික්‍ෂාව සහ නිරුක්තිය.

ඉතිහාස පඤ්චමානං යනු අථර්ව වේදය සිව්වැනි කොට, මෙසේ විය මෙසේ වීයයි මේ සමාන වචන ප්‍රතිසංයුක්ත වූ පුරාණ කථා සංඛ්‍යාත වූ ඉතිහාසය පස්වැනි වූයේ මොවුන්ට නුයි = ඉතිහාස පඤ්චමා. ඔවුන්ගේ ඉතිහාස පඤ්චමානං.

පදය සහ ඉන් අවශේෂ වූ ව්‍යාකරණය හදාරයි දනීනුයි පදකො වෙය්‍යාකරණො. ලොකායතං යනු විතණ්ඩවාද ශාස්ත්‍රයයි කියනු ලැබේ.

මහාපුරිස ලක්ඛණං යනු බුද්ධ ආදී මහා පුරුෂයන්ගේ ලක්‍ෂණ දක්වන දොළොස් දහසක් ග්‍රන්ථ ප්‍රමාණයක ඇති ශාස්ත්‍රය. යම්තැනෙක සොළොස් දහසක් ගාථා පද පරිමාණ වූ බුද්ධමන්ත්‍ර වීද, යමකගේ වශයෙන් මේ ලකුණින් යුක්ත වූවෝ බුදුවරු නම් වූද, මෙයින් පසේබුදුවරු අගසව් දෙනම අසූමහ සව්වෝ බුදු මව බුදුපියා අග්‍ර උපස්ථායකයා, අග්‍ර උපස්ථායිකාව චක්‍රවර්ති රජ යන මේ විශේෂය පැනේ.

අනවයො යනු මේ ලෝකායත මහා පුරුෂ ලක්‍ෂණයන්හි නොඅඩුව පුරවන්නා. අඩුවක් නොවේයැයි කියන ලදී. යමෙක් ඒවා අර්ථ වශයෙන්ද

ග්‍රන්ථ වශයෙන්ද නොකඩ කොට පවත්වා ගැනීමට නොහැකි වේද ඒ අවයො නම්.

**අනුඤ්ඤාත පටිඤ්ඤාතො** යනු අනුදන්නා ලද්දේද, ප්‍රතිඥාත වූයේද ගුරුවරයා විසින් 'මම යමක් දනිම්ද, ඔබ එය දැන ගනුව'යි ආදී ක්‍රමයෙන් අනුදන්නා ලද්දේ. 'එසේය ගුරුතුමනි'යි තමා විසින් එයට පිළිවදන් දෙන ප්‍රතිඥාවෙන් ප්‍රතිඥාත වූ යන අර්ථයි. කුමන අධිකාරයකද? **සකෙ ආචරියකෙ තෙවිජ්ජකෙ පාවචනෙ** තම ආචාර්ය පරම්පරාවේ ත්‍රිවිද්‍යා සංඛ්‍යාත ධර්මයෙහි.

**අයං තාතා** යනු මේ බමුණා මෙසේ සිතීය. 'මේ ලෝකයෙහි මම බුද්ධය. මම බුද්ධයැයි පැන නැගුණු නම ගෙන බොහෝ දෙනා හැසිරෙති. ඒ නිසා ආරංචි මාත්‍රයෙන්ම මා විසින් එළඹෙන්ට යුතු නොවේ. එක් අතකින් එළඹෙන්නාගේ ඉවත්වීමද ගෞරවයකි. අනර්ථයක්ද උපදී. මම මාගේ අතවැසියා යවා බුද්ධද නැත්දැයි දැනගෙනම එළඹෙන්නෙම් නම් මැනවැයි. මාණවයා අමතා යයි ආදිය කීය.

**තං භවනතං** යනු ඒ පින්වතාගේ. **තථා සනතං යෙව** යනු එසේ ඇත්තහුගේම. මෙහිද ඉත්ථම්භූත ආඛ්‍යාත අර්ථ වශයෙන්ම ද්විතීයා වචනයි.

**යථාකථං පනාහං භොතං** යනු මෙහි **කථං පනාහං භො තං භවනතං ගොතමං ජානිස්සාමි**. ඔහු යම්සේ දැනගැනීමට හැකි වේද එසේ කියව යන අර්ථයි. **යථා** යනු නිපාත මාත්‍රයක්මය. **කථං** යනු මෙය ආකාර විමසීමයි. 'කිනම් අයුරකින් මම ඒ භවත් ගෞතමයන් දැන ගන්නෙම්ද' යන අර්ථයි.

මෙසේ කී කල්හි උපාධ්‍යාය තෙමේ 'දරුව තෝ පෘථුවියෙහි සිටගෙන පොළොව නොදකිම් කියාද, චන්ද්‍ර සූර්යයන්ගේ ආලෝකයෙහි සිට චන්ද්‍ර සූර්යයන් නොදක්මියි කියාද කියහි යි ආදිය කියා දැනගන්නා ආකාරය දක්වන්නේ **ආගතානි බො තාත** ආදිය කීය.

**එහි මන්තෙසු** යනු වේදයන්හි. 'තථාගත කෙනෙක් උපදින්නෝ යයි කල්තබාම සුද්ධාවාසයෙහි දෙවියෝ වේදයන්හි ලක්ෂණ බහා 'මේවා

බුද්ධ මන්ත්‍රයැයි බ්‍රාහ්මණ වේශයෙන් වේද කියවති. ඒ අනුසාරයෙන් මහේශාක්‍ය සත්වයෝ තථාගතයන් දැනගන්නෝ යැයි. ඉන්පෙර වේදයන්හි මහා පුරුෂ ලක්‍ෂණ එත්. තථාගතයන් පිරිනිවි කල්හි අනුක්‍රමයෙන් අතුරුදහන් වෙයි. එහෙයින් මෙය දැන් නැත.

**මහා පුරිසසස** යනු ප්‍රණිධි සමාදාන ඥාන කරුණා ආදී ගුණමහත් වූ පුරුෂයාගේ. **දෙවච ගතියො** යනු නිෂ්ඨා දෙක.

මේ ගති ශබ්දය 'ශාරිපුත්‍ර, මේ ගති පසෙක් වෙයි' ආදී තන්හි භව භේදයෙහි පවතී. 'මහ වනය මෘගයන්ගේ ගති'යැයි ආදී තන්හි නිවසන තැන. 'මෙසේ අධිමාත්‍ර ගති ඇත්තේ' ආදී තන්හි ප්‍රඥාවෙහි යෙදේ. 'ගති ගත' ආදී තන්හි විෂම බවෙහි. මෙහි වනාහි නිෂ්ඨාවෙහි පවතීනුයි දතයුතුය. එහි යමෙකින් යුත් අයෙක් රජ වේද එයින් බුද්ධ නොවේ. ජාති සමතාවෙන් ඒවා වෙතියි කියති. එහෙයින් යෙහි **සමනනාගතසස** යනුවෙන් කියන ලදී.

**සචෙ අගාරං අජඣාවසති** යනු ඉදින් ගෙයි වෙසේ නම්. **රාජා හොති චකකවතති** යනු සතර ආශ්චර්ය ධර්මයන්ගෙන්ද සතර සංග්‍රහ වස්තූන්ගෙන්ද ලෝකය රංජනය කරන බැවින් **රාජා**. චක්‍රරත්නය පවත්වයි. සතර සම්පත්ති චක්‍රයන් සහිතව පවතී. ඒවායින් පෙරලයි. පරහිත පිණිසද ඉරියව් චක්‍රයන්ගේ පැවැත්ම ඔහු කෙරෙහි ඇත්තේනුයි **චකකවතති**. මෙහි **රාජා** යනු ශ්‍රමණ භාවයයි. **චකකවතති** යනු විශේෂණයයි. දැහැමින් හැසිරේනුයි = **ධමමිකො**. න්‍යායයෙන් සමසේ පවත්වයි යන අර්ථයි. දැහැමින් රාජ්‍යය ලැබ රජ වූයේ නුයි = **ධමමරාජා** පරහිත දහම් කිරීමෙන් හෝ **ධමමිකො**. ආත්ම හිත දහම් කිරීමෙන් **ධමමරාජා**.

අන්ත සතරෙහි ප්‍රධානයා නුයි = **චාතුරනෙතා** සතර සාගර අන්තකොට ඇති සිව් වැදෑරුම් ද්වීපයන්හි අන්තයන් බබුළුවන හෙයින්ද පොළොවෙහි අධිපතියා යන අර්ථයි.

අභ්‍යන්තරයෙහි ක්‍රෝධ ආදී සතුරන්ද බැහැර සියලු රජුන්ද ජය ගත්තේනුයි = **විජිතාවී. ජනපදත්ථාවරියපපතෙතා** යනු ජනපදයෙහි ස්ථිර බවට තහවුරු බවට පැමිණියේ. කිසිවකු විසින් වත් සෙලවිය නොහැකිය. ජනපදය හෝ එහි ස්ථාවර බවට පත්. උත්සාහයක් නැතිව ස්වකීය

කාර්යයන්හි නිරතව නොසැලී නොවෙවුලන හෙයින් ජනපදයෙහි ස්ථාවර බවට පත්. සෙය්‍යථීදං යනු නිපාතයකි. මෙහි එය ඒ කුමක්ද යන අර්ථයි. චක්කරතනං ආදී තන්හි චක්‍රයද එම රතිය උපදවන අර්ථයෙන් රතන වූයේද චක්කරතනං. සියලු තැන මේ ක්‍රමයයි. මේ රත්නයන්හි මේ චක්‍රවර්තී රජ චක්‍රරත්නයෙන් නොදිනුවකු දිනයි. හස්ති අශ්ව රත්නයන්ගෙන් විජිතයෙහි සුවසේ හැසිරෙයි. පුත්‍ර රත්නය සමග විජිතය රැකගනී. සෙස්සෙන් උපභෝග සැප විඳී. පළමුව ඔහුගේ උත්සාහ ශක්ති යෙදීම වෙයි. පසුව මන්ත්‍ර ශක්තිය වෙයි. හස්ති අශ්ව ගෘහපති රත්නයන් විසින් ප්‍රභු ශක්ති යෝගය පිරිපුන් වෙයි. ස්ත්‍රී මණි රත්නයන්ගෙන් ත්‍රිවිධ ශක්ති යෙදීමේ ඵල වෙයි. හෙතෙමේ ස්ත්‍රීමණි රත්නයන්ගෙන් භෝග සුඛය වළඳයි. සෙස්සෙන් ඓශ්වර්ය සුඛ වළඳයි. විශේෂ වශයෙන් ඔහුගේ පූර්වයෙහි වූ තුන් අදෝස කුසල මූලයන්ගෙන් ජනිත වූ කර්මානුභාවයෙන් සැපයේ. මධ්‍යම වූ අලෝභ කුසල මූලයන්ගෙන් ජනිත වූ කර්මානුභාවයෙන් සැපයේ. පශ්චිම වූ එකම අමෝහ කුසල මූලයෙන් ජනිත වූ කර්මානුභාවයෙන් සැපයේ යැයි දතයුතුය. මේ මෙහි සංක්ෂේපයයි. විස්තර බොජ්ඣංග සංයුත්තයෙහි රතන සූත්‍රයෙහි උපදේශ වශයෙන් ගතයුතුය.

**පරෝ සහස්සං** යනු අතිරේක දහසක්. **සූරා** යනු බිය නැති ජාතිකයෝ. **වීරංගරූපා** යනු දිව්‍ය පුත්‍රයන්ට හා සමාන ශරීර ඇති. මෙසේ සමහරු වර්ණනා කරති. මේ මෙහි ස්වභාවයයි. වීරා යනු උතුම් සූරයෝ යයි කියනු ලබත්. වීරයන්ගේ අංගය - වීරංගං. වීර කාරණය විරිය යයි කියන ලදී. වීරංග රූපය මොවුන්ට නුයි = වීරංග රූපා. වීර්යමය ශරීර මෙනැයි කියන ලද්දේ වෙයි. **පරසෙනප්පමද්දනා** යනු යම්හෙයකින් ප්‍රතිමුඛව සිටීනම් පර සේනාවෝ ඔහු මඩින්ට සමර්ථ වෙති යන අදහසයි. **ධම්මෙන** යනු ප්‍රාණය නොනැසිය යුතුය ආදී වූ පංචශීල ධර්මයෙන්.

**අරහං හොති සම්මා සම්බුද්ධො ලොකෙ විවත්තච්ඡද්දො** යනු මෙහි රාග දෝස මෝහ මාන දිට්ඨි අවිජ්ජා දුශ්චරිත සිඳලන සතින් සැඟවුණු කෙලෙස් අඳුරින් යුතු ලෝකයෙහි ඒ වැස්ම ඉවත් කොට හාත්පසින් හටගත් ආලෝක ඇතිව සිටියේ නුයි = විවත්තච්ඡද්දො. එහි පළමු පදයෙන් පූජාවට සුදුසු බව. දෙවැන්නෙන් එයට හේතුව, යම්හෙයකින් සම්මා

සම්බුදුන් වහන්සේ තෙවැන්නෙන් බුද්ධත්වයට හේතුභූත වූ ඉවත්කළවැස්ම කියන ලදැයි දතයුතුය. නැතහොත් ඉවත් කළ හෝ වැස්මක් නැති යනුයි = විවත්තච්ඡදො. සසරක් නැති වැස්මක් නැති හෝ යයි කියන ලද්දේ වෙයි. වට්ටය (සසර) නැති බැවින් ද, වැස්මක් නැති බැවින් සම්බුද්ධ වෙයි. මෙසේ පෙර පද දෙකෙහි හේතු දෙක කියන ලද්දේ වෙයි. දෙවැන්නෙහි වෙසරද බැවින් මෙහි පෙර සිද්ධිය වෙයි. පළමුවැන්නේ දෙවැනි සිද්ධිය වෙයි. තෙවැන්නෙන් හා සිව්වැන්නෙන් තෙවැනි සිද්ධිය වෙයි. පළමුවැන්න ධම්මචක්ඛුවද, දෙවැන්න බුද්ධචක්ඛුවද, තෙවැන්න සමන්ත චක්ඛුවද සදයිනුයි දතයුතුය. **තවං මනතානං පටිගගහෙතා** යනු මෙයින් ඔහුගේ මන්ත්‍රයෙහි සූරභාවය ඇතිකරයි. හෙතෙමේද ඒ ගුරුවරයාගේ කථාවෙන් ලක්‍ෂණයන්හි පහවූ මුළාව ඇත්තේ ඒකාලෝක වූවාක් මෙන් බුද්ධිමතුන් දක්නේ **එවමෙභා** යයි කීය. පින්වත ඔබ යම්සේ කියහිද එසේ කරන්නෙමි යනු එහි අර්ථයයි.

**වළවා රථ මාරුයහ** යනු වෙළඹක බැඳි රථයක නැග බ්‍රාහ්මණයා තමා යම් රථයකින් හැසිරේද එයම දී මාණවකයා යැවීය. මාණවයෝ පොක්ඛරසාදිගේ අතවැසියෝය. ඔහු ඔවුන් අම්බට්ඨ සමග යවූ යයි සංඥාවක් දුන්නේය. **යාවතිකා යානසස භූමි** යනු යම් පමණ දුරක් යානයෙන් යා හැකිද

**යානා පචෙචාරොභිත්වා** යනු බිමට නොබැස දොරකොටුව සමීපයට ගොස් යානයෙන් බැස.

**තෙන ඛො පන සමයෙන** යනු යම් අවස්ථාවක අම්බට්ඨ ආරාමයට පිවිසියේද ඒ අවස්ථාවෙහි මධ්‍යාහ්න වේලාවෙහි කුමක් හෙයින් ඒ අවස්ථාවේ සක්මන් කරත්ද? ප්‍රණීත භෝජන හේතුවෙන් හටගත් ථීනමිද්ධය නැතිකිරීම පිණිසය. දිවාකාලයෙහි ප්‍රධන් වීර්ය කරන්නෝ ද බතින් පසු සක්මන්කොට නහා ශරීරය සෘතු ගන්වා හිඳ මහණදම් පුරන්නා වූ එබන්දන්ගේ සිත එකඟ වෙයි. **යෙන තෙ භිකඛු** යනු. ඔහු 'ශ්‍රමණ ගෞතම කොහිදැයි පිරිවෙනින් පිරිවෙනට පැමිණ විචාරාම පිවිසෙන්නෙමියි වටපිට බලන්නේ ආරණ්‍යයෙහි ඇතකු මෙන් මහ සක්මනෙහි සක්මන් කරන පංශුකූලික භික්‍ෂූන් දැක සමීපයට ගියේය. ඒ සඳහා **යෙන භිකඛු** ආදිය කියන ලදී.

දස්සනාය යනු දැකීමට. දකිනු කැමැත්තෝවැ යන අර්ථයි.

**අභිඤ්ඤාත කොලඤ්ඤා** යනු ප්‍රකට කුලයන්හි උපන්. එකල දඹදිව අම්බට්ඨ කුලය යනුවෙන් පතළ කුලයක් විය.

**අභිඤ්ඤාතස්ස** යනු රූපය ජාතිය මන්ත්‍රය කුලය ප්‍රදේශය යන කරුණුවලින් ප්‍රකට. අගරු යනු ගෙනයා නොහැක්කේය. යමෙක් අම්බට්ඨට දන්වන්ට නොහැකි වන්නේද ඔහු ඔහු සමග කථා සල්ලාපය ගරුත්වය පිණිස වන්නේය. 'භාග්‍යවතුන් වහන්සේට එබඳු මාණවකයන් දහසක් විසින් වුවද ප්‍රශ්න අසනු ලැබුවද විසඳීමෙහි දන්ධ බවක් (මෝඩකමක්) නැතැයි හඟින්නාහු අගරු බො පන අගෞරවයක් යයි සිතූහ.

**විහාරො** යනු ගඳකිළිය සඳහා කීහ. **අතරමානො** යනු ඉක්මන් නොකොට සෙමින් පියවරක් පමණ තැන පියවර තබමින් වත් දක්වා සුමට මුතුදැල් සිඳුවර ඇතිරුවාක් වැනි වැල්ල විනාශ නොකරන්නේ යන අර්ථයි.

**ආළින්දං** යනු ඉදිරිපස. **උක්කාසිත්වා** යනු කසින ශබ්දයක් කොට. **අග්ගලං** යනු දොර. **ආකොටෙහි** යනු නියගින් සෙමින් යතුරු සිදුර සමීපයෙහි ගසවයි කියන ලද්දේ වෙයි. දොර ඉතා උඩින් පිහිටියේය. අමනුෂ්‍යයෝ ඉතා යටින් සිටිති. සර්පයෝ කොටති. එසේ නොකොටා මැද සිදුර සමීපයෙහි කෙටිය යුතුය. මෙය දොර කොටන වත යැයි දක්වන්නෝ කියති.

**විවරි භගවා ද්වාරං** යනු භාග්‍යවතුන් වහන්සේ නැගිට දොර විවර නොකළ සේක. ඇරේවා'යි අත දිගුකළ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නොයෙක් කල්පකෝටි ගණනක් දන් දෙන ඔබවහන්සේ විසින් දොර විවෘත කිරීමේ කාර්යයක් නොකරන ලද්දේ යයි තමාම දොර විවර විය. භාග්‍යවතුන් වහන්සේ ගේ සිතින් විවර විය. ඒ නිසා විවරි භගවා ද්වාරං යයි කියන්ට වටී.

**භගවතා සද්ධිං සම්මොදිංසු** යනු යම්සේ නිහතමානී ලෙස විචාරන්නේ භාග්‍යවතුන් වහන්සේ ඔවුන් සමගද ඔවුහු භාග්‍යවතුන් වහන්සේ සමගද සමව පැවති සතුට ඇත්තෝ වූහ. සීතල ජලය උණුසුම්

ජලය සමග සංකලනය වී එකක් බවට යන්නාක් මෙන් ඒකීය භාවයට ගියාහුය. 'භවත් ගෞතමයිනි, සැකයෙන් සිටීද, යැපෙන දේ ලැබේද, භවත් ගෞතමයන්ටද ගෞතම ශ්‍රාවකයන්ටද අසනීපයක් නැද්ද රෝගයක් නැද්ද සැහැල්ලුවෙන් සිටීද, දුර්වල බවක් නැද්ද පහසුවෙන් වෙසේද, ආදීකොට ඇති කථාවෙන් සතුටු වූහ. ප්‍රීති ප්‍රමෝද සංඛ්‍යාත සතුට ඇතිවීමෙන් සතුටුවීමට යුතු බව නිසාද සම්මොදනීයං. අර්ථ ව්‍යඤ්ජන මිහිරි බැවින් බොහෝ දිගුකලක් කල්ගෙවීමට නිතර පැවැත්වීමට සුදුසු බැවින් සිහිකටයුතු බැවින්ද සාරාණීයං. අසනු ලබන සුඛයෙන් සම්මොදනීයං. සිහිකරනු ලබන සුඛයෙන් සාරාණීයං. එසේම ව්‍යඤ්ජන පරිශුද්ධතාවෙන් සම්මොදනීයං, අර්ථ පරිශුද්ධතාවෙන් සාරාණීයං. මෙසේ නොයෙක් ආකාරයෙන් සම්මොදනීය සාරාණීය කථාවක් හුවමාරු අවසන්කොට නිමාකොට එකත්පසක හුන්හ. අම්බට්ඨොපන මාණවො යනු හේ භාග්‍යවතුන් වහන්සේගේ රූසපුවෙහි සිත් පැහැදවීම පමණවත් නොකොට දශබලධාරීන් වහන්සේට අවමන් කරන්නෙමියි බඩ බැඳි සළුව මුදා බෙල්ලෙහි එල්ලාගෙන එක් අතකින් රෙදි කොන අල්ලාගෙන සක්මනට නැගී වරෙක උරයද, වරෙක බාහුවද වරෙක පිටද පෙන්වමින්, වරෙක හස්තවිකාරද, වරෙක ඇස්බැම විකාරද කරන්නේ, භවත් ගෞතමයෙනි, ඔබගේ ධාතු සමතාව කෙසේද, භික්ෂාහාරයෙන් වෙහෙසක් නැද්ද, ඔබ බෙහෙවින් වෙහෙසට පත්වූ බවක් පෙනේ. ඔබගේ අඟපසඟ මහත්ය. පාසාදිකත්ථ ප්‍රසාදයෙන් සිටීද?

ඔබ ගිය ගිය තැන්වල බොහෝ ජනයා රජකුලයෙන් පැවිදි වූවෙකැයිද, බුද්ධයයිද උපන් බුහුමන් ඇත්තාහු ප්‍රණීත වූ ඕජස් සහිත අහර දෙති. පින්වත්නි, ගෙය දෙස බලන්න. විසිතුරු ශාලාවක් වැන්න. දිව්‍ය ප්‍රාසාදයක් වැන්න. මේ ඇඳ දෙස බලන්න. මෙට්ටය දෙස බලන්න. මෙබඳු තැනක වසන්නකුට මහණදම් පුරන්ට දුෂ්කර නැද්දැයි මෙබඳු විහිළුවට ලක්කෙරෙන අනාචාර භාවයෙන් අපිරිසිදු දෙයක් කියයි. එහෙයින් කියන ලදී. අම්බට්ඨොපන මාණවො අම්බට්ඨ මාණවකයා. චංකමනෙතාපි නිසිනෙනන භගවතා සක්මන් කරමින් වැඩහුන් භාග්‍යවතුන් සමග. කඤ්චි කඤ්චි කථං සාරාණීයං වීතිසාරෙති මොන මොනවාදෝ සාරණීය කථාවක් හුවමාරු කරගනී.

අථඛො භගවා යනු ගුරුවරුන් විසින්, ඔවුන්ගේ ගුරුවරුන් විසින්, ගච්ඡනෙතාවා යනු මෙහි කැමති පරිදි තුන් ඉරියව්වෙහි බ්‍රාහ්මණයා

ආචාර්ය බ්‍රාහ්මණයා සමග කථා කිරීමට සුදුසුය. මේ තරුණයා මානයෙන් තද වූ බැවින් කථා කරන්නේ සිව් ඉරියව්වෙහි යොදවන්නෙමියි සයානොවා භො ගොතම සයානෙන යනු කීය. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ ඔහුට 'අම්බට්ඨ යන්නාට යන්නා විසින්ද, සිටියහුට සිටියකු විසින්ද, හුන්නහුට හුන්නා වූ ගුරුවරයා සමග කථාකිරීම සියලු ආචාර්යවරුන් අතර ලැබෙන්නේය. ඔබ නිදාගනිමින් සැතපෙන ගුරුවරයා සමග කථා කරහි. කිම ඔබගේ ගුරුවරයා ගොනෙක්ද නැතහොත් ඔබ ගොනෙක්දැ'යි ඇසූ සේක. යේ කිපි යෙව බො භො ගොතම මුණ්ඩකා යන ආදිය කීය. එහි මුඩු කළහු කෙරෙහි මුණ්ඩ කියාද, ශ්‍රමණයකු කෙරෙහි සමණ කියාද කියන්ට වටී. මෙතෙමේ නින්දා කරන්නේ 'මුණ්ඩකා සමණකා' යයි කීය.

ඉබ්භා යනු ගෘහපතියෝ. **කිණ්හා** කළු. කළුවන් යන අර්ථයි. **බන්ධුපාදාපච්චා** යනු මෙහි බන්ධු යනුවෙන් බ්‍රහ්මයා අදහස් කරන ලදී. ඔහුට බ්‍රාහ්මණයෝ පිතාමහ යයි ව්‍යවහාර කරත්. පාදයන්ගේ දරුවෝ පාදපච්චා. බ්‍රහ්මයාගේ පිටිපතුලෙන් උපන්නේ යන අදහසයි. ඔහුගේ මේ ලබ්ධියයි. බ්‍රාහ්මණයෝ බ්‍රහ්මයාගේ මුඛයෙන් උපන්නෝය. ක්‍ෂත්‍රියයෝ උරයෙන්ද, වෛශ්‍යයෝ නාභියෙන්ද, ශුද්‍රයෝ දණින්ද, ශ්‍රමණයෝ පිටිපසින්ද යනුවෙන් කියන්නා වූ මොහු කිසිවක් නියම නොකොට කියයි. ඉක්බිති 'භාග්‍යවතුන්ටම කියමි'යි කියයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'මේ අම්බට්ඨයා පැමිණි කල්පටන් මා සමග කථා කරන්නේ මානයම නිසා කථාකරයි. සර්පයකු ගෙලෙන් ගන්නාක් මෙන්ද, ගිනිකඳක් වැළඳගන්නාක් මෙන්ද මතැතකු සොඬෙහි පිරිමදින්නාක් මෙන්ද තමාගේ පමණ නොදනී. දැන් ඔහුට දන්වාලන්නෙමියි සිතා 'අත්‍ථිකවතො බො පන තෙ අම්බට්ඨ' යනාදිය කී සේක.

එහි පැමිණ කළයුතු කෘත්‍ය සංඛ්‍යාත අර්ථය මොහුට ඇත්තේනුයි අත්‍ථිකං. ඒ මාණවයාගේ සිත, අත්‍ථික ඔහුට ඇත්තේනුයි අත්‍ථිකවා. අත්‍ථික ඇති ඔබගේ මෙහි පැමිණීම විය යන අර්ථයි. බොපන යනු නිපාත මාත්‍රයකි.

**යා යෙව බො පන අත්‍ථාය** යනු යම්කිසි අර්ථයකින් එන්නේය. මාගේ හෝ අන්‍යයකුගේ සමීපයට කවදා හෝ එන්නහුය තමෙවඅත්‍ථං යනු මෙය පුරුෂලිංග වශයෙන්ම කියන ලදී.

මනසි කරෙය්‍යාථ යනු මෙනෙහි කරන්නාහුය. මෙය කියන ලදී. 'ඔබ ගුරුවරයා විසින් තමාගේ කාර්යයකට එවන ලද්දේය. අපට පරිභව කිරීමට නොවේ. ඒ නිසා ඒ කාර්යයම මෙනෙහි කරව.' මෙසේ ඔහුට අන්‍යයන්ගේ සමීපයට ආවුන්ගේ වත් පෙන්වා මානයට නිග්‍රහ පිණිස අවුසිතවා යෙව බො පන ආදිය කී සේක. එහි අර්ථය. පින්වත්නි, බලන්න මේ අම්බට්ඨයා ගුරුකුලයෙහි නොවැස අශික්ෂිතව අල්පශ්‍රැතව විසූවෙකැයි මන් ඇත්තේය. මම වැසූවෙක්මි. ශික්ෂිතයෙක්මි. බහුශ්‍රැතයෙක්මියි තමා ගැන සිතයි. මොහුගේ මෙසේ පරුෂවචන කථා කිරීමෙහි හේතුව නොවැසූ බව මිස අන් කිමෙක්ද? ගුරුකුලයෙහි නොවැඩී අශික්ෂිත අල්පශ්‍රැතයෝම මෙසේ කියත්.

කුපිතො යනු කිපියේ. අනත්තමනො යනු තමාගේ නොවන සිත් ඇත්තේ. භාග්‍යවතුන් වහන්සේ ඔහු කිපෙන බව දැන මෙසේ කීසේක්ද නැතහොත් නොදැනද? දැනය. දැනගෙන කුමක් හෙයින් ඇසූසේක්ද? මානය මර්දනය කරනු පිණිසය. භාග්‍යවතුන් වහන්සේ 'මොහු කිපී මාගේ නෑයන්ට අක්‍රෝශ කරන්නේය. ඉක්බිති යම්සේ දක්ෂ වෛද්‍යවරයෙක් දොස් ඉවතට ගෙන ඇද දමයිද, එසේම ගෝත්‍රයෙන් ගෝත්‍රයද කුල ප්‍රදේශයෙන් කුල ප්‍රදේශයද නංවා භවාග්‍රය පමණට මෙන් නැගුණු මාන නමැති ඕජය මුලින් සිඳ හෙලන්නෙමි. ඛුංසෙනෙතා යනු ගටන්නේ. වමෙහනෙතා යනු පිළිකුල් කරන්නේ පාපිකො භවිස්සති යනු සැඬ බව ආදී දොසින් පාපියෙක් වන්නේය. චණ්ඩා යනු මාන නිශ්‍රිත කෝපයෙන් යුතු. ඵරුසා යනු කෘෂර, ලහුසා යනු ලඝු. සුළුදෙයින් තුටුවෙත් හෝ කෝප වෙත් හෝ ජලය මතුපිට ලබු කබලක් මෙන් සුළු දෙයින් පා වෙති. රභසා බොහෝ කථා කරන්නහුට. ශාක්‍යයන්ගේ මුව විවර වූවිට අනිකාට කථා කිරීමේ අවකාශයක්වත් නැත යන අදහසින්ම කියයි. සමානා ඇති. පළමු පදයටම වෙනත් වචනයකි. න සක්කරොන්ති යනු බමුණන්ට සොඳුරු දේ නොකරත්. නගරුකරොන්ති යනු බමුණන් කෙරෙහි ගෞරව නොකරත්. න මානෙන්ති සිතින් ප්‍රිය නොකරත්. නපූජෙන්ති යනු මල්දම් ආදියෙන් පූජා නොකරත්. න අපචායන්ති යනු වැඳීම් ආදියෙන් අපචායන කර්ම නමැති පහත් පැවැත්ම නොදක්වත්. තයිදං යනු ඒ මෙය. යදිමෙ සක්‍යා යනු මේ ශාක්‍යයෝ බ්‍රාහ්මණයන්ට සත්කාර නොකරත්. -පෙ- වැඳීම් ආදිය නොකරත්. එය ඔවුන්ට අසත්කාර කිරීම් ආදී සියල්ල යුතු නොවේ. අනුලොම් නොවේ යන අර්ථයි. අපරද්ධුං යනු අපරාධ කළහ.

**එකමිදාහං** යනු මෙහි ඉදං යන්න නිපාත මාත්‍රයකි. එක් දිනක් යන අර්ථයි. **සන්ථාගාරං** යනු රාජ්‍ය අනුශාසනා කරන ශාලාව. **සක්‍යා** යනු අභිෂේක කරනු ලැබූ රජවරු. **සක්‍ය කුමාරා** අභිෂේක නොකරන ලද. **උච්චෙසු** යනු සුදුසු පර්යංක පුටු වේවැල් අසුන් චලක විසිතුරු ඇතිරිලි ආදි ප්‍රභේද ඇති. **සංජග්ඝන්තා** යනු පිළිකුල් කිරීම් වශයෙන් මහ සිනා පාන්නාහු. **සංකිලන්තා** යනු සිනා මාත්‍රයක් ඇතිකරන අසුර ගැසීම් අත්පුඩි ගැසීම් ආදිය කරන්නාහු. **මමඤ්ඤෙව මඤ්ඤෙ** යනු මම මෙසේ හඟිමි. අනිකකට සිනාවෙතියි හඟිමි. ඔවුහු කුමක්හෙයින් මෙසේ කළාහුද? ඔවුහු අම්බට්ඨගේ කුලවංශය දනිති. මොහුද එසමයෙහි පාදාන්තය තෙක් එල්ලා හැඳි සාටකයෙහි කොනක් එක් අතකින් අල්ලාගෙන කොඳුඇටය නමා මාන මදයෙන් මත්වූයේ මෙන් එයි. ඉන්පසු 'පින්වත්නි, අපගේ දාසයා වූ කණ්හායන ගෝත්‍රයෙහි අම්බට්ඨ පැමිණෙන ආකාරය බලන්න යැයි කියන්නාහු මෙසේ කළහ. හෙතෙමේද තමාගේ කුලවංශය දනී. ඒ නිසා **මමඤ්ඤෙව මඤ්ඤෙයි** තර්ක කළේය. **ආසනෙන** යැයි.

**ආසනෙන** යනු 'මේ අසුන මෙහි හිඳින්න'යි මෙසේ ආසනයෙන් නිමන්ත්‍රණය නම් වෙයි. එසේ කිසිවෙක් නොකළේය.

**ලටුකිකා** යනු කෙතෙහි ගල්කැට අතර වසන කුඩා කිරිල්ලිය.

**කුලාවකෙ** යනු වසන තැන. **කාමලාපිනී** යනු තමා කැමති අයුරින් කථා කරන්නීය. යමක් කැමති නම් එය දොඩයි. කිසි හංසයෙක් හෝ කොස්වාලිහිණියෙක් හෝ මොනරෙක් හෝ ඇය කරා පැමිණ 'තී කුමක් දොඩයිදැයි නොවළක්වයි.

**අභිසජ්ජිතුං** යනු ක්‍රෝධ වශයෙන් ඇලී සිටීමට මෙසේ කියන ලද කල්හි 'මේ ශ්‍රමණයෝ තමන්ගේ ඥාතීන් කැටකිරිල්ල හා සමකොට අප හංසයන් කොස්වාලිහිණියන් මොනරුන්ට සම කරති. දැන් මාන රහිත බවට පැමිණියෝයැයි හඟිමින් තවත් චතුර්වර්ණ දක්වති. **නිම්මාදෙති** මද නැති කරති. මානය නැත්තන් කරති. **යනනූනාහං** යනු ඉදින් මට **කණ්හායනො හමස්මි භො ගොතම** යනු මේ වචනය අම්බට්ඨ තෙවරක් මහ හඬින් කීය. කුමක් නිසා කීවේද? කිම අශුද්ධභාවය නොදනීද? දනී. දැන දැනත් 'මේ කරුණ භවයෙන් වැසී ගියේය. එය මොහු විසින් නොදක්නා ලද්දේය. නොදක්නේ මහා ශ්‍රමණයා කුමක් කියයිදැ'යි හඟිමින්

මානයෙන් තද වූ බැවින් කීය. මාතාපෙත්තිකං යනු මව්පියන් සතු. නාමගොත්තං යනු ප්‍රඥප්ති වශයෙන් නාමය. ප්‍රවේණි වශයෙන් ගෝත්‍රය. අනුස්සරතො යනු සිහි කරන්නහුට, කුල කෙළවර සෝදා හරින්නහුට.

අයය්‍යපුත්තා යනු ස්වාමියාගේ පුත්‍රයෝ දාසිපුත්තො යනු ගෘහදාසියගේ පුත්‍රයා. ඒ නිසා දාසයා විසින් ස්වාමීන් කරා එළඹිය යුත්තේ යම්සේද, මෙසේ නොඑළඹෙන ඔහු දැක ශාක්‍යයෝ හාස්‍යයට ලක් කළාහු යයි දක්වයි. ඉන්පසු ඔහුගේ දාසභාවයද, ශාක්‍යයන්ගේ ස්වාමිභාවයද ප්‍රකාශකොට තමාගේද අම්බට්ඨගේ ද කුලවංශය ගෙනහැර දක්වන සේක් සක්‍යා බො පන ආදිය කීහ.

එහි දහනති යනු තබත්. ඔක්කාක අපගේ පූර්ව පුරුෂයාය. මෙසේ කියත් යන අර්ථයි. ඒ රජු කථාකරන කල්හි උල්කාවක් මෙන් මුඛයෙන් ප්‍රභාවක් නික්මෙයි. ඒ නිසා ඔහු ඔක්කාක යයි හැඳින්වූහ. පබ්බාජෙසි යනු ඉවතට ඇද දැමීය. දැන් ඔවුන් නම් වශයෙන් දක්වන්නේ ඔක්කාකමුඛං ආදිය කීය. මේ එහි අනුපූර්ව කථාවයි. ප්‍රථම කල්පිකයන්ගේ මහාසම්මත රජුගේ රෝජ නම් පුත්‍රයෙක් විය. රෝජගේ වරරෝජද, වරරෝජගේ කල්‍යාණද, කල්‍යාණගේ වරකල්‍යාණද, වරකල්‍යාණගේ මන්ධාතුද, මන්ධාතුගේ වරමන්ධාතුද, වරමන්ධාතුගේ උපෝසථද, උපෝසථගේ වරද, වරදගේ උපවරද, උපවරදගේ මඛාදේවද, මඛාදේවගේ පරම්පරාවෙහි අසූහාර දහසක් ක්‍ෂත්‍රියයෝ වූහ. ඔවුන්ට පසුව ඔක්කාක වංශ තුනක් විය. ඔවුන්ගේ තුන්වැනි ඔක්කාකට මෙහෙසියෝ පස්දෙනෙක් වූහ. හත්තා, ජත්තා, ජන්තු, ජාලිනී, විසාඛා යනුවෙන්. එක් එක් මෙහෙසියට ස්ත්‍රීහු සියයක් පිරිවර වූහ. සියල්ලන්ගෙන් දෙටු මෙහෙසියට ඔක්කාමුඛ, කරකණ්ඩු, හත්ථිනි, කාසිනීපුර නම් පුත්‍රයෝ සිව්දෙනෙකි. පියා, සුප්පියා, ආනන්ද, විජිතා, විජිතසේනා නමැති දූවරු පස්දෙනෙකි. මෙසේ ඈ දූ පුතුන් නවදෙනෙකු වදා කලුරිය කළාය. ඉක්බිතිව රජතෙමේ වෙනත් තරුණ අභිරූපී වූ රජදූවක් ගෙනවුත් අගමෙහෙසි තනතුරෙහි තැබීය. ඈ ජන්තු නම් පුතකු වැදූවාය. ඉක්බිති පස්වැනි දවසෙහි සරසා රජුට දැක්වූවාය. රජ සතුටුව ඇයට වරයක් දුන්නේය. ඈ නෑයන් සමග මන්ත්‍රණය කොට පුත්‍රයාට රාජ්‍යය ඉල්ලා සිටියාය. රජ තෙමේ, වසලිය නැසී යව. මාගේ පුත්‍රයන්ට අනතුරක් කැමති වෙහිදැයි තර්ජනය කළේය. ඈ රහසින් යලි යලිත් රජු සතුටු කරවා 'මහරජතුමනි, මුසාවාදය නම් නොවටී' යයි ආදිය කියා ඉල්ලා සිටියාමය. ඉක්බිති රජතුමා පුතුන්

අමතා 'දරුවෙනි, මම ඔබලාගේ කණිටු ජන්තු කුමරා දැක ඔහුගේ මවට වහා වරයක් දුනිමි. ඈ පුත්‍රයාට රාජ්‍යය පිරිනමන්ට කැමැත්තීය. උඹලා මගුලැතා මගුලසු මගුල් රිය හැර යම් පමණක් කැමැත්තහු නම් එපමණක් ඇතුන් අස්රිය ගෙන යන්න. මාගේ ඇවෑමෙන් පැමිණ රජ කරන්නැයි ඇමතියන් අටදෙනෙකු සමග පිටත්කර හැරියේය. ඔවුහු නොයෙක් ලෙස හඬා වැළප 'පියාණනි, අපගේ වරදට කමා කරනු මැනවැ'යි රජුද රජුගේ අන්තඃපුරයද කමා කරවා 'අපිද සහෝදරයන් සමග යමු'යි රජුගෙන් විමසා නැගණිවරුන්ද ගෙන සිව්රඟ සෙනග සමගින් නුවරින් නික්මුණාහුය.

'කුමාරවරු පියාගේ ඇවෑමෙන් පැමිණ රාජ්‍යය කරන්නාහුය. යමු ඔවුන්ට උපස්ථාන කරමු යයි සිතා බොහෝ මිනිස්සු පසුපස ගියහ. පළමු දවසෙහි යොදුනක් පමණ සෙනගක් විය. දෙවැනි දවසෙහි යොදුන් දෙකක්ද, තෙවැනි දවසෙහි තුන් යොදුනක්ද විය. කුමාරවරු මන්ත්‍රණය කළහ. 'මේ මහා බලකායකි. ඉදින් අපි කිසියම් සාමන්ත රජකු මර්දනය කොට ජනපද ගන්නෙමු නම් එයටද අපගේ බලය යෙදිය යුතු නොවන්නේය. අනුන්ට පීඩා කිරීමෙන් ඇති ඵලය කිම? දඹදිව විශාලය. වනාන්තරයෙහි නගරයක් නිර්මාණය කරන්නෙමුයි හිමවත දෙසට ගොස් නගර සඳහා සුදුසු බිමක් සෙවූහ

එසමයෙහි අපගේ බෝධිසත්ත්වයෝ බමුණු මහසල් කුලයෙක ඉපිද කපිල බ්‍රාහ්මණ නම් වී නික්ම සෘෂි පැවිද්දෙන් පැවිදිව හිමවත පසෙක පොකුනු තෙරක අතුපතර පන්සලක් සදාගෙන වසයි. හෙතෙමේ භූමිචාල නම් විද්‍යාවක් දනී. එයින් උඩට අසූරියනක් අහසෙහිද යට බිමද ගුණ දොස් දකී. මේ පෙදෙසෙහි තණපඳුරු වැල් දක්ෂිණාවර්තව පෙරදිග බලා හටගනී. සිංහ, ව්‍යාඝ්‍ර ආදීහු මුවන් ඌරන්ද, බලල්ලු, ගෙම්බන්, මීයන්ද, ලුහුබැඳ යන්නාහු ඒ පෙදෙසට පැමිණ ලුහුබැඳ යන්ට නොහැකි වෙති. නැතහොත් ඔවුන් විසින් බියට පත්කරනු ලැබ නවතිත්. 'හේ' මෙය පෘථුවියෙහි අග්‍ර ප්‍රදේශ යැයි දැන එහි තමාගේ පන්සල තැනවීය. ඉක්බිති නගරයට සුදුසු බිමක් සොයමින් කුමාරවරුන් තමා වසන තැනට පැමිණයවුන් දැක විචාරා එපුවත දැන ඔවුන් කෙරෙහි අනුකම්පාව උපදවා මෙසේ කීය. මේ පන්සල තිබෙන තැන මැවූ නගරය දඹදිව අගනුවර වන්නේය. මෙහි උපන් පුරුෂයන් අතරින් එක් එක් පුරුෂයා පුරුෂයන් සියයක් හෝ දහසක් හෝ වුවද අභිභවනය කරන්ට සමත්

වන්නේය. මෙහි නගරය නිර්මාණය කරන්න. පන්සල පිහිටි තැන රජුගේ මැදුර කරන්න. මේ ස්ථානයෙහි සිට චණ්ඩාල පුත්‍රයෙක් වුවද සක්විති රජකු බලයෙන් මැඩගන්නේය. 'ස්වාමීනි, මෙය ඔබගේ වසන තැන නොවේද? 'මාගේ වසන තැන යයි නොසිතන්න.' මාගේ එක්පසෙක පන්සලක් කරවා නුවරක් මවා කපිලවත්ථු යයි නමක් තබන්න. ඔවුහු එසේකොට එහි නැවතුණාහුය.

ඉක්බිති ඇමැතියෝ 'මේ දරුවෝ වයසට පැමිණියෝය. ඉදින් ඔවුන්ගේ පියා ළඟක සිටීනම් ඔහු ආවාහ විවාහ සිදුකරනු ඇත. දැන් එය අපට බාරයයි සිතා කුමාරවරුන් සමග කතිකා කළහ. කුමාරවරු 'අප හා සමාන ක්‍ෂත්‍රිය කුල දූවරුන් නොදකිමු. සොහොයුරියන්ට සුදුසු ක්‍ෂත්‍රිය කුමාරවරුන්ද නොදකිමු. නුසුදුසු එකතුවෙන් අපට උපන් පුත්‍රයෝ මව්පසින්ද පියපසින්ද අපිරිසිදු වූවාහු දැ බිඳීමට පැමිණෙන්නාහුය. ඒ නිසා අපි සොහොයුරියන් සමගම සංවාසය කැමැත්තෙමු. ඔවුහු ජාතිය බිඳෙතැයි බියෙන් දෙටු සොහොයුරිය මව් තන්හි තබා සෙසු සොහොයුරියන් සමග සංවාස කළහ. ඔවුන් දූ පුතුන් සමග වැඩෙන කල පසුකලෙක දෙටු සොහොයුරියට කුෂ්ට රෝගයක් වැළඳිණ. සිරුර කොබෝලීල මලක් මෙන් විය. රාජ කුමාරවරු 'මැය සමග එක්ව නිදාගැනීම සිටීම ආහාර ගැනීම කිරීම කරන්නවුන් වෙතද මේ රෝගය සංක්‍රමණය වෙතියි සිතා එක් දවසක් උයන්කෙළියට යන්නාක් මෙන් ඇය යානයට නංවා කැලයට පිවිස බිම්ගෙයක් අයුරින් පොකුණක් කණවා එහි කැයුතු පිය යුතු දැය සමග ඇය එහි නවත්වා උඩ වසා පස් දමා ආපසු ගියහ.

එකල්හිම රාම නම් බරණැස් රජ කුෂ්ට රෝගී වී අන්තඃපුරවාසීන් විසින්ද නළුවන් විසින්ද පිළිකුල් කරනු ලබන්නේ ඒ සංවේගයෙන් දෙටු පුතුට රජය දී කැලයට පිවිස එහි කැලෑ කොළ ගඩාගෙඩි අනුභව කරන්නේ නොබෝ කලකින් සුවපත්ව රන්වන්ව ඔබමොබ හැසිරෙන්නේ විශාල ගස් බෙනයක් දැක එහි ඇතුළත සොළොස් රියන් පමණ ප්‍රදේශයක් සුද්ධ පවිත්‍රකොට දොරක්ද වාකවුළුවක්ද යොදා ඉණිමගක් බැඳ එහි වාසය කළේය. හෙතෙමේ අඟුරු වළෙහි ගිනි දල්වා රාත්‍රියෙහි මෘග පක්ෂි ආදීන්ගේ හඬ අසමින් නිදයි. හෙතෙමේ අසුවල් පෙදෙසෙහි සිංහයෙක් ශබ්ද කළේය. අසුවල් තැන ව්‍යාඝ්‍රයෙක් ශබ්ද කළේයයි සලකා උදෑසන එහි ගොස් ඉඳුල් මස් ගෙනවුත් පිස කයි.

ඉක්බිති එක් දවසක් ඉතා උදෑසන වේලාවෙහි ගිනිදල්වා හුන්නේ රජදියණියගේ සිරුරු .ගඳින් අවුත් ව්‍යාඝ්‍රයෙක් ඒ පෙදෙසෙහි පස් අවුස්සමින් ලෑලි ඉවත් කළේය. ඒ විවරයෙන් ඒ ව්‍යාඝ්‍රයා දැක බියවූ ඈ කෑගැසුවාය. හෙතෙමේ ඒ ශබ්දය අසා 'මේනම් ස්ත්‍රී ශබ්දයකැයි සලකා උදෑසනම එහි ගොස් 'මෙහි කවුදැ'යි ඇසීය. ස්වාමීනි, ගැහැණියක්මි. 'කවර ජාතියකට අයත්ද? ඔක්කාක මහරජුගේ දුව වෙමි. පිටතට එන්න. නොහැකිය ස්වාමීනි. කවර කරුණකින්ද? මට සමේ රෝගයක් ඇත. හේ සියලු පුවත් අසා ක්ෂත්‍රිය මානයෙන් නොනික්මෙන ඇයට 'මම ද ක්ෂත්‍රියයෙක් වෙමියි තමාගේ ක්ෂත්‍රිය බව දන්වා ඉණිමග තබා උඩට ගෙන තමාගේ වසන තැනට පමුණුවා තමා පරිභෝග කළ බෙහෙත්ම දී නොබෝ කලකින්ම නිරෝගීද රන්වන්ද කොට ඇය සමග සංවාස කළේය. ඈ ප්‍රථම සංවාසයෙන්ම ගැබ්ගෙන පුතුන් දෙදෙනකු වැදුවාය. මෙසේ ඔවුහු දෙතිසක් සහෝදරයෝ වූහ. අනුපිළිවෙළින් වැඩිවිය පත් ඔවුන්ට පියා සියලු ශිල්ප ඉගැන්වීය. ඉක්බිති එක් දවසක් රාම රජුගේ නගරවැසි එක් වනචරයෙක් පර්වතයෙහි මැණික් සොයන්නේ රජු දැක හඳුනා ගත්තේය.

'දේවයන් වහන්ස, මම ඔබතුමා දනිමි'යි කීහ. ඉක්බිති රජතෙමේ සියලු පුවත් ඇසීය. එකෙණෙහිම ඒ දරුවෝ එහි ආහ. හෙතෙමේ ඔවුන් දැක 'මේ කවුදැ'යි ඇසීය. 'මගේ පුත්‍රයෝ යයි කී කල්හි ඔවුන්ගේ මව්පස වංශය අසා 'මට දැන් පඬුරක් ලැබිණැයි නගරයට ගොස් රජුට දැන්වීය. හෙතෙමේ 'පියා ගෙන එන්නෙමියි සිව්රඟ සෙනග සමග එහි ගොස් පියා වැඳ 'දේවයන් වහන්ස, රාජ්‍යය බාරගනු මැනවැයි ඉල්ලා සිටියේය. හේ 'එපා දරුව, එහි නොයමි. මෙහි මේ ගස ඉවත්කොට නුවරක් තනවයි කීය. හේ එසේ කොට ඒ නගරයට කොලගස ඉවත්කොට කළ බැවින් කෝල නගරයැයි ද ව්‍යාඝ්‍රයන්ගේ මාර්ගයෙහි කළ බැවින්ද, ව්‍යග්ඝපජ්ජ කියාද නම් දෙකක් තබා පියා වැඳ තම නගරයට ගියේය. ඉන්පසු වැඩිවිය පත් කුමාරවරුන්ට මව මෙසේ කීවාය. 'දරුවනි, කිඹුල්වත් පුරවැසි ශාක්‍යකුල ඔබලාගේ මාමලා සිටිති. ඔබලාගේ මාමලාගේ දූවරුන්ගේ හිසකෙස් බැඳීම මෙසේය. ඇඳුම් ඇඳීම මෙසේය. යම්කලෙක ඔවුහු නාන තොටට එද්ද එදාට එහි ගොස් යමකුට යමකු කැමතිද ඇය ගන්න යැයි ඔවුහු එසේම ගොස් ඔවුන් නහා හිස වියලවන කල කැමති කැමති කෙනා අල්ලාගෙන නම් අස්වා ගියාහුය. ශාක්‍ය රජවරු ඒ අසා 'එසේ වේවා. ඔවුහු අපේ නෑයෝ'යයි නිහඬ වූහ.

මේ කෝලියයන්ගේ උත්පත්තියයි. මෙසේ ශාක්‍ය කෝලියයන් ඔවුනොවුන් ආවාහ විවාහ කිරීම නිසා බුද්ධකාලය තෙක් නොකඩවා වංශය පැමිණියේය. එහිදී භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය වංශය දක්වන්ට **තෙ රට්ඨාසමා පබබජිතා හිමවනත පසෙස පොකඛරණියා තීරෙ** ආදිය කී සේක. එහි **සමමනති** යනු වසත්. **සක්‍යාවත භො** යනු රටින් පිටකරනු ලැබුවාහු කැලෑවෙහි වැසුවද ජාතිය බිඳීමක් නොකොට කුල වංශය රැකගන්ට හැක්කෝය. සමර්ථයෝය. ප්‍රතිඵල ඇත්තෝය යන අර්ථයි. **තදගෙග** යනු එය මුල්කොට. එතැන්පටන් යන අර්ථයි. **සොච තෙසං පුබබ පුරිසො** යනු ඒ ඔක්කාක රජ මොවුන්ගේ ආදි පුරුෂයාය. ඔවුන්ට ගෘහපති වංශය සමග සබැඳියාවක්වත් නැතැයි මෙසේ ශාක්‍යවංශය පවසා දැන් අම්බට්ඨ වංසය ප්‍රකාශ කරන සේක් **රඤ්ඤොඛොපන** ආදිය කීහ. **කණහං ජනෙසි** යනු කළුපැහැති කුස තුළදීම හටගත් දත් ඇති කෙස් දැලි රැවුල් දිගට වැඩුණු පුත්‍රයකු වැදූවාය. **පබබාහාසි** යනු 'යකෙක් උපන්නේ'යයි බියෙන් පළාගොස් දොර වසා ගෙදර මිනිසුන් සිටිකල්හි එහා මෙහා යමින් මා සෝදවු යන ආදිය කියමින් උස්හඬ නැගීය.

**තෙ මාණවකා භගවනතං එතදවොචුං** යනු තමාගේ චෝදනා මුදනු පිණිස 'මෙය නොවේවායි ආදී වචන කීහ. ඔවුන්ට මෙසේ සිතිණ. 'අම්බට්ඨ අපගේ ගුරුවරයාගේ දෙටු අතවැසියාය. ඉදින් අප මෙබඳු තැනක එක වචනයක් නොකියමු නම්, මෙතෙමේ ගුරුවරයා හමුවෙහි බිඳෙන්නේ යයි චෝදනාවෙන් මුදනු පිණිස මෙය කීහ. සිතින් මොහුගේ මානය නැති බව අපේක්ෂා කරති. මොහු මාන නිශ්‍රිත බැවින් ඔවුන්ටද අප්‍රියය.

**කලාහාණ වාකකරණො** යනු මිහිරි වදන් ඇත්තේ. **අසමිං වචනෙ** යනු තමා උගත් වේදත්‍රයෙහි වචන. **පතිමනෙතතු** යනු අසන ලද ප්‍රශ්නය නැවත කියන්ට, විසඳන්ට යන අර්ථයි. මේ දාසි පුත්‍රයාගේ වචන **පටිමනෙතතුං** යනු පිළිතුරු කියන්ට.

**අථඛො භගවා** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'ඉදින් මේ මාණවකයෝ මෙහි හිඳ මෙසේ උස්හඬ නගන්නෝ නම් මොහු කථාවේ කෙළවරකට නොයන්නෝය. දැන් මොවුන් නිශ්ශබ්ද කොට අම්බට්ඨ සමගම කථාකරමියි ඒ මාණවකයන්ට මෙසේ කී සේක. එහි **මනතවෙහා** යනු මන්ත්‍රණය කරවු. **මයා සදධිං මනෙතතු** යනු මා සමග කථා කරනු.

මෙසේ කීකල්හි මාණවකයෝ මෙසේ සිතූහ. 'අම්බට්ඨ දාසී පුත්‍රයෙකැයි කී කල්හි නැවත හිස ඔසවන්ට නොහැකි විය. මේ ජාතිය දැනගැනීම අපහසුය. ඉදින් ශ්‍රමණ ගෞතමයන් ඔබ දාසයෙකැයි තවත් වරක් කිවහොත් කවරෙක් නම් ඔහු සමග තර්ක කරන්නේද? අම්බට්ඨ තමා විසින්ම බැඳගන්නා ලද පොදිය තමා විසින්ම ලිහා ගත්තා වේයි තමත් මිදී ඔහු මතම දමන්නාහු **සුජාතො වත භො ගොතමා** ආදිය කීහ.

**සහධම්මිකා** යනු සහේතුක සකාරණ. **අකාමා ව්‍යාකාතබ්බා** යනු තමා අකමැති වුවත් ප්‍රකාශකළ යුතුය. අවශ්‍යයෙන්ම විසඳලිය යුතුය යන අර්ථයි. **අඤ්ඤෙනවා අඤ්ඤං පටිචරිස්සසි** යනු වෙනත් වචනයකින් හෝ වෙනත් වචනයක් වළක්වන්නේය. ආවරණය කරන්නේය. වසා දමන්නේය යන අර්ථයි. යමෙක් 'ඔබ කවර ගෝත්‍ර ඇත්තෙහිදැයි අසන ලද්දේ 'මම ත්‍රිවේදය දනිමි' ආදී කියන්නේ නම් මෙය වෙනකකින් වෙනෙකක් වසයි නම් වේ. **පක්කමිස්සසි** වා යනු අසන ලද ප්‍රශ්නය දන්නේම නොකියනු කැමති බැවින් හුනස්නෙන් නැගිට හෝ යන්නේය.

**තුණ්හී අහොසි** යනු ශ්‍රමණ ගෞතම තෙමේ මා ලවා හොඳින්ම දාසිපුත්‍ර භාවය කියවනු කැමැත්තේ හොඳින්ම කියන ලද්දේ දාසයෙක්ම වූයේ වෙයි. මෙය දෙතුන්වරක් චෝදනා කොට නිහඬ වන්නේය. මම එයින් හැරී ආපසු යන්නෙමියි සිතා නිහඬව සිටියේය.

අතෙහි වජ්‍රය ඔහුගේ නුයි = වජිරපාණී. **යක්ඛො** යනු යක්ෂයා ඕනෑ කෙනෙක් වේවා, ශක්‍රදේවරාජයා යයි දතයුතුය. **ආදිත්තං** යනු අග්නිවර්ණ. **සම්පජ්ජලිතං** යනු මැනැවින් දැල්වුණු. **සජොති භූතං** යනු හාත්පසින් ජෝතිමත් වූ. එකම ගිනි ජාලාවක් වූ යන අර්ථයි.

**ධීතො හොති** යනු නෙළුම් පොහොට්ටු වැනි දළ ඇති, භයානක ඇස් නාසා ආදිය ඇති මෙසේ විරූපී රූපයක් මවා සිටියේ. මොහු කුමක් නිසා පැමිණියේද? දෘෂ්ටිය අත්හැරවීම පිණිස. තව ද, 'මම ධර්මය දේශනා කරන්නෙමි. අන්‍යයෝ මා නොහඳුනා ගනිත්වා'යි මෙසේ භාග්‍යවතුන් වහන්සේට ධර්මය දේශනා කිරීමේ අල්ප උත්සුක භාවයක් උපන් කල්හි, ශක්‍රයා මහා බ්‍රහ්මයා සමග අවුත් භාග්‍යවතුන් වහන්සේ ධර්මදේශනා කරන සේක්වා, ඔබවහන්සේගේ අණ නොපවත්නා කල්හි

අපි අණ පවත්වන්නෙමුයි ප්‍රතිඥා කළේය. ඒ නිසා 'අද අම්බට්ඨයා බයකොට ප්‍රශ්න විසඳලන්නෙමියි ආයේය.

**භගවා චෙව පස්සති අම්බට්ඨො චා** යනු ඉදින් ඔහු අන්‍යයෝද දකිත් නම් ඒ කරුණ අගෞරවයක් වනු ඇත. ශ්‍රමණ ගෞතමයෝ අම්බට්ඨ තමාගේ තම වාදයෙහි බැස නොගන්නා බව දැන යක්‍ෂයකු කැඳවා දැක්වූහ. ඉන්පසු අම්බට්ඨ බියෙන් කීවේ යයි කියන්නාහුය. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේද අම්බට්ඨද ඔහු දකිතියි බලන්නේ කිසිවකුගේ රෝමෝද්ගමනයක් වත් නොදැක්කේය. 'මේ බිය මටම උපන්නේය. ඉදින් මම යක්‍ෂයෙක්මියි කියම් නම්, ඇස් ඇත්තේ ඔබට පමණක්ද? ඔබම යක්‍ෂයා දක්නෙහි, පළමුව යක්‍ෂයා නොදැක ශ්‍රමණ ගෞතමයන් විසින් වාද ගැටය දැමූ කල්හිම යක්‍ෂයා දක්නෙහි යයි කියන්නාහු යයි සිතා 'දැන් මට මෙහි ශ්‍රමණ ගෞතමයන් හැර අන් සරණක් නැතැයි හඟින්නේ **අථඛො අම්බට්ඨො මාණවො -පෙ- භගවන්තං එතදවොච** ඉක්බිති අම්බට්ඨ මාණවයා -පෙ- භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

**තාණගවෙසී** යනු ආරක්ෂක ස්ථානයයි සොයන්නේ,

**ලෙන ගවෙසී** යනු සෙවනක් සොයන්නේ, **සරණගවෙසී** යනු පිහිටයයි සොයන්නේ. මෙහි බේරාගනියි. රකීනුයි = තාණං මෙහි සැඟවෙත්නුයි = ලෙණං. සිහිකරානුයි = සරණං. බිය ඉවත්කරයි. විනාශ කරයි යන අර්ථයි. **උපනිසීදිත්වා** යනු ළඟට පැමිණ පහත් අසුනක හිඳ. බ්‍රෑවෙතු = කියනු මැනවි. **දක්ඛිණ ජනපදං** යනු දක්ෂිණාපථයයි ප්‍රකට වූ ගංගාවෙන් දකුණෙහි ප්‍රකට ජනපදය. එකල්හි දක්ෂිණාපථයෙහි බොහෝ තවුසෝ වෙති. හෙතෙමේ එහි ගොස් එක් තවුසකු වත්පිළිවෙතින් සතුටු කරවීය. හේ ඔහුගේ උපකාරය දැක මෙසේ ඇසීය. 'පින්වත් පුරුෂය, මන්ත්‍රය දෙමි. කැමතිනම් ඒ මන්ත්‍රය ගනුව' හේ මෙසේ කීය. 'ගුරුතුමනි, මට අන් මන්ත්‍රයකින් වැඩක් නැත. යම් මන්ත්‍රයකින් ආයුධයක් නොවැදේද ඒ මන්ත්‍රය දෙන්න. හෙතෙමේ 'මැනවි පින්වතැයි ඔහු දුනු නොවදින අම්බට්ඨ නම් විද්‍යාව දුන්නේය. හේ ඒ විද්‍යාව උගෙන එහිදීම පරීක්‍ෂා කොට 'දැන් මාගේ මනදොළ පුරවන්නෙමියි ඍෂි වෙස් ගෙන ඔක්කාක සමීපයට පැමිණියේය. එහෙයින් කියන ලදී. **දක්ඛිණ ජනපදං ගන්ත්වා බ්‍රහෙම මන්තෙ අධීයිත්වා** රාජානං **ඔක්කාකං උපසංකමිත්වා** යනුවෙන්. ආනුභාව ඇති බැවින් ශ්‍රේෂ්ඨ මන්ත්‍රය. **කොනෙවරෙ මයං දාසි පුත්තො** යනු කොල්ලනි, මාගේ දාසි පුත්‍රයා කවරෙක්ද? හෙතෙමේ ඒ රජු මරනු

කැමති බැවින් මැනූ හීය ඔහුගේ මන්ත්‍රානුභාවයෙන්ම විදීමටද ඉවත් කිරීමටද නොහැකි විය. එකෙණෙහි සිරුර පුරා හටගත් දහදිය ඇත්තේ බියෙන් වෙව්ලමින් සිටියේය. **අමච්චා** යනු මහ ඇමතියෝ. **පාරිසජ්ජා** යනු ඉතිරි පිරිස සමග ගැවසෙන්නෝ. **එතදවොචුං** යනු කිසවච්ඡ තවුසාට අපරාධ කළ දණ්ඩකී රජුගේ ආයුධ වැස්සෙන් මුළුරට නැසුණේය. අංගීරස ඍෂිවරයාටද අපරාධ කොට පොළොව බිඳී නිරයට පිවිසියේ යයි සිතන්නාහු බියෙන් 'එතං **සොත්ථි භදනෙත** යනාදි වචන කීහ. **සොත්ථි භවිස්සති රඤ්ඤො** යනු කණ්හ බොහෝ වේලාවක් නිහඬව සිට ඉන්පසු නොයෙක් ආකාරයෙන් අයැදිනු ලබන්නේ 'අප වැනි ඍෂිවරයකුට ඊතලය මානන ඔබගේ රජු විසින් බැරෑරුම් කාර්යයක් කරන ලද්දේ යැයි ආදිය කිය පසුව කීය.

**උද්‍රියිස්සති** යනු බිඳෙන්නේය. දහයියා මිටක් මෙන් විසිරී යන්නේය. මෙය ඔහු ජනයා බය කරන්නෙමියි. මුසා කියයි. ඔහුගේ විද්‍යාවෙහි ආනුභාවය ඊතල නවතන මන්ත්‍රයෙහි මිස අන්තැනක නොවේ. මින් පසුව එන වචනවල මේ ක්‍රමයමැයි.

**පලෙලාමො** යනු පියාපතෙහි ලොම් රෝමෝද්ගමන මාත්‍රයක් වන්නේය. මෙය ඔහු 'ඉදින් රජතුමා ඒ දැරිය දෙන්නේ යයි ප්‍රතිඥාවක් කොට කීය.

**කුමාරෙ ඛුරප්පං පතිට්ඨාපෙසි** යනු එහි ඊතලය බසීවායි මන්ත්‍ර පිරිවැහු කල්හි කුමාරයාගේ නාභියෙහි පිහිටුවීය. **ධීතරං අදාසි** යනු හිස් සෝදා මුහුණ බලන කණ්ණාඩිය මෙන් පිරිසිදු කොට දුව දුන්නේය. ඔහු උසස් තැනකද තැබීය.

**මා ඛො තුමෙහ මාණවකා** යනු මෙය භාග්‍යවතුන් වහන්සේ එක් පසෙකින් අම්බට්ඨ ශාක්‍යයන්ගේ ඥාතියෙක් වෙමියි ප්‍රකාශ කරන සේක් ඔහු අස්වසනු පිණිස කී සේක. ඉන්පසු අම්බට්ඨ දිය කළ සියයකින් අභිෂේක කළාක් මෙන් සංසුන් වූ දාහ ඇත්තේව අස්වසා 'ශ්‍රමණ ගෞතම තෙමේ මා නොනසන්නෙමියි එක් පසකින් ඥාතියකු කරයි. මම ක්‍ෂත්‍රියයෙක්මි'යි සිතීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'මේ අම්බට්ඨ ක්‍ෂත්‍රිය වෙමියි සංඥාවක් කරයි. තමාගේ ක්‍ෂත්‍රිය බව නොදනී. දැන් ඔහු දන්වාලම්යි ක්‍ෂත්‍රිය වංශය දක්වන්ට තවදුරටත් දේශනාව වර්ධනය කරමින් **තං කිං මඤ්ඤසි** අම්බට්ඨ ආදිය කී සේක.

එහි ඉධ යනු මේ ලෝකයෙහි. **බ්‍රාහමණෙසු** යනු බමුණන් අතර **ආසනංවා උදකංවා** යනු අග්‍ර ආසනය හෝ අග්‍රෝදකය හෝ. **සද්ධෙ** මළවුන් උදෙසා කළ බතෙහි. **ථාලිපාකෙ** මගුල් ආදියෙහිදී දෙන බතෙහි **යඤ්ඤෙ** යනු යාග බතෙහි. **පාහුනෙ** යනු ආගන්තුකයන් සඳහා කළ බතෙහි. පඬුරු බතෙහි හෝ. **අපිනුසස** යනු මේ ක්‍ෂත්‍රිය පුත්‍රයාට නොවේද. **ආවාටංවා අසස අනාවටංවා** යනු බ්‍රාහ්මණ කන්‍යාවන් කෙරෙහි වැළැක්වීමක් වේවා හෝ නොවේවා. බ්‍රාහ්මණ දැරිය ලැබේවා හෝ නොලැබේවා හෝ යන අර්ථයි. **අනුපපතෙතා** යනු ක්‍ෂත්‍රිය භාවයට නොපැමිණේ. අපිරිසිදු යන අර්ථයි.

**ඉත්ථියාවා ඉත්ථිං කරිත්වා** යනු ස්ත්‍රියක විසින් ස්ත්‍රිය පරීක්‍ෂා කොට **කිසමිංචි දෙව පකරණෙ** යනු යම් කෙනෙක් ඔහු කෙරෙහි ගෝත්‍රය විමසත්ද 'මම ගෞතමය, මම කාශ්‍යපය යනුවෙන්. ලෝකයෙහි ගෝත්‍ර විමසන්නවුන් අතර ක්‍ෂත්‍රියයා ශ්‍රේෂ්ඨය. **අනුමතා මයා** යනු මාගේ සර්වඥතා ඥානය සමග සන්සන්දනය කොට දේශනා කරන ලද්දේ යයි මා විසින් අනුදන්නා ලද්දේය.

මේ ගාථාවෙහි **විජ්ජාචරණ සමපනෙනා** යනු මේ පදය අසා අම්බට්ඨ මෙසේ සිතීය. 'විද්‍යාව නම් ත්‍රිවිද්‍යාවයි. චරණය පංචශීලයයි. එය අපටද ඇත. ඉදින් විජ්ජාචරණ නම් ශ්‍රේෂ්ඨය. අපිම ශ්‍රේෂ්ඨයෝය. යයි නිෂ්ඨාවට ගොස් විජ්ජාචරණං අසන්නේ '**කතමං හො ගොතම චරණං කතමාසා විජ්ජා** යයි ඇසීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහු බමුණ එය සාමය සිද්ධ. ජාතිවාද ආදියෙන් යුක්ත විජ්ජාචරණය ප්‍රතික්ෂේප කොට විජ්ජාචරණය දෙසනු කැමති සේක් **නඛො** අම්බට්ඨ ආදිය කී සේක. එහි **ජාතිවාදො** යනු ජාතිය අරභයා වූ වාදය. බ්‍රාහ්මණයාටම මෙය වටී ශුද්‍රයාට නොවේ යන ආදි වචනය යන අර්ථයි. සියලුතැන මේ ක්‍රමයයි. **ජාතිවාද විනිබද්ධා** යනු ජාතිවාදයෙහි බැඳුණු සියලු තැන මේ ක්‍රමයයි.

ඉන්පසු අම්බට්ඨ 'අපි දැන් කොතැනක ඇලෙන්නෙමුදැ'යි සිතුවෙමු ඉන්පසු ශ්‍රමණ ගෞතම තෙමේ අප මහා වාතයෙහි දහයියා පොළන්නාක් මෙන් දුරට විසිකළේය. යම්තැනක අපි (එහි අප නියෝජනය කළේය) නොඇලුණෝ වෙමුද, අප විජ්ජාචරණ සම්පදාව දැනගන්ට වටී යයි සිතා නැවත විජ්ජාචරණය ඇසීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට පිළිගත් තැන පටන් විජ්ජා චරණය දක්වන්ට **ඉධ අම්බට්ඨ තථාගතො** ආදිය කී සේක. මෙහි භාග්‍යවතුන් වහන්සේ චරණයට ඇතුළත් ත්‍රිවිධ ශීලය බෙදන සේක් 'චරණයෙහි මෙය වෙයි' යයි නොපවරා **ඉදම්පිස්ස හොති චරණස්මිං** යනුවෙන් ශීල වශයෙන්ම පවරා දුන් සේක. කුමක් නිසාද? **කස්මා** ඔහුටද කිසියම් ශීලයක් ඇත. එහෙයින් චරණ වශයෙන්ම පවරාදෙනු ලබන කල්හි 'අපිද චරණ සම්පන්න යයි' ඒ ඒ තැන ලබන්නේය. යමක් ඔහු සිහිනෙන් පවා නුදුටුවිරූද, එහි වශයෙන්ම පවරා දෙන සේක් **පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, ඉදං පිස්ස හොති චරණස්මිං -පෙ- චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති ඉදම්පිස්ස හොති චරණස්මිං** යි කී සේක. එපමණකින් අටසමවත් චරණ යයි පවරා දෙන ලද්දේ වෙයි. විදර්ශනා ඥානයෙහි පටන් අටවැදෑරුම් ප්‍රඥාව විද්‍යාව යයි පවරා දෙන ලදී.

**අපායමුඛානි** යනු විනාශ මුඛ. **අනභිසම්භුණමානො** යනු නොපැමිණෙන්නේ. නොඉවසන්නේ හෝ. **ඛාරිවිධ මාදාය** යනු ගිනිගල කෙණ්ඩිය ඒතල ආදී තවුස් පිරිකර, විධ යනු කඳයි. ඒ නිසා තවුස් පිරිකර ආදියෙන් බර වූ කද ගෙන යන අර්ථයි. යමෙක් ඛාරි විවිධං යයි හදාරත්ද, ඔවුහු ඛාරී යනු කදට නමැයිද, විවිධං යනු බොහෝ කෙණ්ඩි ආදී පිරිකර යයි වර්ණනා කරත්.

**පවත්තඵල භොජනො** යනු වැටුණු ගෙඩි ආහාරයට ගන්නේ, **පරිචාරිකො** යනු කැප දේ කරන, පාත්‍රය පිළිගන්නා, පා දෙවීම ආදී වත් කිරීම් වශයෙන් සේවාකම් කරන්නේ, ස්වභාවයෙන් ම ගුණාධික වූ ක්ෂීණාශ්‍රව සාමණේරයන් වහන්සේ පෘථග්ජන භික්ෂුවට කියූ ක්‍රමයෙන්ම පරිවාරකයෙක් වෙයි. මොහු එවැන්නෙක් නොවේ. ගුණ වශයෙන් වතාවත් කිරීම් වශයෙන්ද ලාමකයෙක්මය. කුමක් හෙයින් තවුස් පැවිද්ද ශාසනයාගේ විනාශමුඛ යයි කියන ලද්දේද, සසුන කල්යත් යත්ම තවුස් පැවිද්ද වශයෙන් පිරිහෙන්නේය. මේ සසුනෙහි පැවිදිව ශික්ෂාත්‍රය පුරන්ට නොහැකි වන්නාහු ලජ්ජී ශික්ෂාකාමී භික්ෂූහු 'ඔබ සමග උපෝසථයක්වත්

පවාරණයක්වත් සංඝ කර්මයක්වත් නැතැයි පිළිකුල් කොට අත්හැර දමති. හෙතෙමේ සසුනෙහි ප්‍රතිපත්ති පිරීම දැලිපිහි මුවාතක් වැනි දුෂ්කර වූවකි. තවුස් පැවිද්ද වනාහි සුකර වන්නාක් සේම බහුජන සම්මතයැයි සිවුරු හැර තාපසයෙක් වෙයි. අනිකා ඒ දැක 'තා විසින් කරන ලද්දේ කුමක්දැයි අසයි. හේ සසුනෙහි ඔබගේ කාර්යය බරපතලය. මෙහි අපි කැමති සේ හැසිරෙන්නෝ වෙමුයි හෙතෙමේද 'එසේනම් මම ද මෙහිම පැවිදි වෙමියි ඔහුට අනුව හික්මෙන්නේ තවුසෙක් වෙයි. මෙසේ අනිකෙක් අනිකෙක්දැයි ක්‍රමයෙන් තාපසයෝ බොහෝ වෙති. ඔවුන් උපන්කල ශාසනය පිරිහුණේ නම් වන්නේය. ලෝකයෙහි එබඳු බුදුවරයෙක් උපන්නේය. උන්වහන්සේගේ මෙබඳු සසුනක් වී යයි ඇසීම් මාත්‍රයක්ම වන්නේය. මේ සඳහා භාග්‍යවතුන් වහන්සේ තවුස් පැවිද්ද ශාසනයාගේ විනාශ මුඛයයි කී සේක.

**කුද්දාල පිටකං** යනු කඳමුල් පල ගැනීම පිණිස උදැල්ලද පැසද ගම අසල්වැසි බව යන විජ්ජාචරණ සම්පදා ආදිය නොහැකි වන්නේ කෘෂිකර්ම ආදියෙන් ජීවිතය සාදාගැනීම දුකයයි හඟින්නේ, බොහෝදෙන රැවටීම පිණිස ගම අසල හෝ නියම්ගම අසල හෝ ගිනිහල් ගෙයක් කොට ගිතෙල් තෙල් දීකිරි මීපැණි තල සහල් ආදියෙන්ද නොයෙක් දරවලින්ද හෝම කිරීම් වශයෙන් ගිනි පුදන්නේ දවසරියි.

**චතුද්වාරං අගාරං කරිත්වා** යනු දොර සතරක් ඇති දන්ගෙයක් කොට එහි දොරටුවෙහි මඩුවක් තනා එහි පැන් එළවා ආ ආවුන්ගෙන් පැන් අවශ්‍යදැයි අසයි. මගියෝ ක්ලාන්ත වූවාහු පැන් බී තුටු වූවාහු බත් ගොටුවක් හෝ සහල් ආදිය හෝ දෙති. ඒ සියල්ල ගෙන ඇඹුල්කැඳ ආදිය සාදා බොහෝ කොට ආමිස ගැනීම පිණිස සමරුන්ට ඒවා දෙයි. සමහරුන්ට බත් පිසින භාජන ආදිය දෙයි. ඔවුන් විසින් දෙන ලද ආමිසය හෝ පූර්වාහ්නයෙහි හෝ අපරාහ්නයේදී ගනියි. ඒවා පොලියට යොදවයි. මෙසේ වර්ධනය වන සම්පත් ඇත්තේ ගවමහිස දාසි දාස පරිග්‍රහණය කරයි. විශාල පවුලක් පිහිටුවයි. මේ සඳහා **චතුද්වාරං** අගාරං කරිත්වා දවසරියි' යයි කියන ලදී.

**තමහං යථාසත්ති යථාබලං පටිපූජෙස්සාමි** යනු මෙය ඔහුගේ ප්‍රතිපත්ති මාර්ගයයි. මේ මාර්ගයෙන් ඔහු මෙසේ පිළිපදියි.

මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් සියලු තවුස් පැවිද්ද නිර්දේශ කරන ලද්දේ වෙයි. කෙසේද? තාපසයෝ අටවැදෑරුම්ය. සපුත්තභරියා, උඤ්ඡාචරිය, අනග්ගිපක්කික, අසාමපාකික, අසමමුට්ඨික, දන්තවක්කලික, පවත්තඵලභොජී, පණ්ඩුපලාසික. එහි යමෙක් කෙනිය ජටිලයා මෙන් පවුලක් තබා ගෙන වසත්ද ඔවුහු සපුත්තභරිය නම්. යමෙක් 'සකල ආත්මභාවය පැවිද්දාට අයුතුයැයි ගොයම් කපන, මඩින තැන්වල වී, මුං, මෑ, තල ආදිය ඇදගෙන පිස අනුභව කරත්ද, ඔවුහු උඤ්ඡාචරිය නම්. යමෙක් කමතින් කමත හැසිර වී ගෙනවුත් කොටා අනුභව කිරීම නුසුදුසු යයි ගම් නියම්ගම්හි සහල් භික්ෂාව ගෙන පිස අනුභව කරත්ද ඔවුහු අනග්ගිපක්කික නම්. යමෙක් 'පැවිද්දාට තමාම පිසූ අහරින් කවර ප්‍රයෝජනයක්දැයි ගමට පිවිස පිසූ භික්ෂාව ගනිත්ද ඔවුහු අසාම පාකික නම්. යමෙක් දින දින භික්ෂාව සොයා යාම පැවිද්දාට දුක් යයි ගල්ගෙඩියකින් අඹ ආදී ගස්වල පොතු කොටා කත්ද ඔවුහු අසමමුට්ඨික නම්. යමෙක් 'ගලින් පොතු කොටා හැසිරීම දුක් යැයි දත්වලින්ම පොතු ගලවා කෑම පැවිද්දාට දුක් යයි ගල්කැට දඬු කැබලි ආදියෙන් ගසා වැටුණු ගෙඩි අනුභව කරත්ද ඔවුහු පවත්තඵල භෝජී නම්. යමෙක් ගල්කැට දඬුකැබලි ආදියෙන් හෙළා පරිභෝගය පැවිද්දාට අසාරුප්‍යයයි ඉබේ වැටුණු මල්පල වියලි කොළ කමින් යැපෙත්ද ඔවුහු පණ්ඩු පලාසික නම්. ඔවුහු තෙවැදෑරුම් වෙති. උසස් (උක්කට්ඨ) මැද (මජ්ඣිම) මෘදු (මුදුක) යනුවෙන්. එහි යමෙක් හුන් තැනින් නොනැගිට අතපොවන තැනම වැටුණු දේ ගෙන කත්ද ඔවුහු උක්කට්ඨ නම්. යමෙක් එක් ගසකින් තවත් ගසකට යත්ද ඔවුහු මැද නම්. යමෙක් ඒ ඒ රුක්මුලට ගොස් සොයාගෙන කත්ද ඔවුහු මෘදුක නම්.

මේ තවුස් පැවිදි මෙම සතරින්ම සංග්‍රහයට යයි. කෙසේද? මේවා අතරින් සපුත්තභරියා, උඤ්ඡාචරිය, කොටස් දෙක දන්ගෙන ආශ්‍රය කරති. අනග්ගිපක්කික අසාමපාකිකයෝ ගිනිහල්ගෙය භජනය කරති. අනග්ගි අසමමුට්ඨික දන්ත වක්කලිකයෝ කඳමුල්පල බොජුන් බුදිති. පණ්ඩුපලාසිකයා පවත්තඵල භෝජනය ඇසුරු කරයි. එහෙයින් කියන ලදී. 'භාග්‍යවතුන් වහන්සේ විසින් මෙපමණකින් සියලු තවුස් පැවිද්ද නිර්දේශ කරන ලද්දේ වෙයි' යනුවෙන්.

දැන් භාග්‍යවතුන් වහන්සේ ගුරුවරයා සහිත අම්බට්ඨයාට විජ්ජාචරණ සම්පදාවෙහි අපාය මුඛයටවත් නොපැමිණි බව දක්වන්ට

තං කිං මඤ්ඤසි අම්බට්ඨ ආදිය කී සේක. එය නොගැඹුරු අරුත් ඇත්තේමය.

අත්තනා අපායිකොපි අපරිපූරයමානො යනු තමා විසින් විජ්ජාචරණ සම්පදාවෙහි දුක් සහිත පක්ෂයවත් නොපුරමින්.

දත්තිකං යනු දුන් දෙය. සම්මුඛීභාවං නදපිදාති යනු. කුමක් හෙයින් නොදෙයිද? හේ සම්මුඛා ආවජ්ජනී නම් විද්‍යාවක් දනී. යම්කලෙක රජ මාහැඟි අබරණින් අලංකාර වූයේ වේද, එකල්හි රජුගේ සමීපයෙහි සිට ඒ අබරණවල නම් සොයාගනී. නම් සොයාගත්විට 'නොදෙමියි' කියන්ට නොහැකිය. දී නැවත උත්සව දිනයෙහි ආභරණ ගෙනෙවයි කියා 'නැත දේවයන් වහන්ස, ඔබතුමා විසින් දෙන ලද්දේ යයි කී කල්හි 'කුමක් නිසා මා විසින් දෙන ලද්දේදැයි ඇසීය. ඒ ඇමතියෝ 'ඒ බමුණා සම්මුඛා ආවජ්ජනී නම් මායාවක් දනී. එයින් ඔබතුමා රවටාගෙන යතියි කීහ. රජු සමග අතිමිත්‍ර බව නොඉවසන අන්‍යයෝ මෙසේ ඇසූහ. 'දේවයන් වහන්ස, මේ බමුණාගේ සිරුරෙහි සංඛපලිත නමැති කුෂ්ට රෝගයක් ඇත. ඔබවහන්සේ ඔහු දැකම බදාගනු ඇත. ස්පර්ශ කරනු ඇත. මේ කුෂ්ටය කාය සංසර්ග වශයෙන්ම බෝ වෙයි. එසේ නොකරනු මැනවි' එතැන්පටන් රජ ඔහුට හමුවීමක් නොදෙයි.

යම්හෙයකින් ඒ බමුණා නුවණැත්තේ, දේශපාලන විද්‍යාවෙහි දක්ෂයෙකි. ඔහු සමග මන්ත්‍රණය කොට කරන ලද කාර්යය නොවරදී. ඒ නිසා තිර කොටුව ඇතුළත සිට පිටත සිටි ඔහු සමග මන්ත්‍රණය කරයි. ඒ සඳහා කියන ලදී. තිරොදුස්සෙන මන්තෙති යනුවෙන්, එහි තිරොදුස්සෙන යනු තිර රෙද්දෙන්. මෙයම හෝ පාඨය විය හැකියි.

ධම්මිකං යනු අනවජ්ජං (නිවැරදි) පයතං යනු ගෙනවුත් දුන් කථන්තස්ස රාජා යනු බමුණා යම් රජකුගේ මෙබඳු භික්ෂාවක් පිළිගන්නේ නම් ඒ රජ බමුණාට හමුවීමක්වත් නො දෙන්නේ කෙසේද? මොහු නොදුන් දෙය මායාවෙන් ගනී. ඒ නිසා රජ ඔහුට හමුවීමක් නොදෙයි යන නිෂ්ඨාවම මෙහිදී ගතයුතුය යන්න මෙහි අදහසය. මේ කරුණ රජවරුන් ද බමුණන්ද හැර අන් කිසිවෙක් නොදනී. එය මෙසේ ඒකාන්තයෙන් සර්වඥ වූ ශ්‍රමණ ගෞතම තෙමේ රහසේ සැඟවුණු

දෙයද දනී යැයි නිශ්චාවට ගන්නේ යයි භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළ සේක.

දැන් මේ අම්බට්ඨයාද ඔහුගේ ගුරුවරයාද මන්ත්‍ර නිසා අතිශයින් මාන ඇත්තෝය. එහෙයින් ඔවුන්ගේ මන්ත්‍ර නිසා හටගත් මානය බිඳදැමීම පිණිස ඉහළට දේශනාව වර්ධනය කරන සේක් **තං කිම්මඤ්ඤසි අම්බට්ඨ** ඉධ රාජා යනාදිය කී සේක. එහි **රථූපත්ථරෙ** යනු රථයෙහි රජුගේ අසුන පිණිස අතුරා සැදූ පෙදෙසෙහි. **උග්ගෙහිවා** යනු ඉහළ ඉහළ ඇමතිවරුන් විසින් **කඤ්චි දෙවමන්තණං** යනු අසුවල් ප්‍රදේශයෙහි තඩාග හා ඇලක් කරන්ට වටී. අසුවල් පෙදෙසෙහි ගමක් නියම්ගමක් හෝ නගරයක් පිහිටුවීමට වටී' යන මෙබඳු ප්‍රකට මන්ත්‍රණයක් වේද එයම මන්ත්‍රණය කරති. රජු විසින් මෙබඳු මන්ත්‍රණය කළ දෙයක් එය එබඳු ම වූ හිස එසවීම බැම එසවීම ආදී ආකාරයකින් මන්ත්‍රණය කරන්නේය.

**රාජ භණිතං** යනු යම්සේ රජු ගණනය කළ දෙය ඒ ඒ කරුණ සාධනය කිරීමෙහි සමත්ය. ඔහුද ඒ ඒ තරුණ සාධනය කිරීමෙහි සමත් වූ දෙයම ගණනයකොට කියයි යන අර්ථයි.

**පවත්තාරො** යනු පවත්වන්නෝ. **යෙසං** යනු යමකු සතු.

**මන්තපදං** යනු වේද සංඛ්‍යාත මන්ත්‍රයම. **ගීතං** යනු අෂ්ටක ආදී පුරාණ බමුණන් දසදෙන විසින් ස්වර සම්පත්ති වශයෙන් සජ්ඣායනා කරන ලද.

**පවුත්තං** යනු අන්‍යයන්ට කියන ලද. කියවන ලද යන අර්ථයි.

**සමීහිතං** යනු එකතු වූ, එකතු කළ කළ දෙය පිඬු කොට තබන ලද යන අර්ථයි. **තදනුගායන්ති** යනු දැන් බමුණෝ තතින් පෙර ගැයූ දෙය අනුව ගායනා කරති. ඒ අනුව සජ්ඣායනා කරති.

**තදනු භාසන්ති** යනු මෙය කලින් කියූ දෙයටම සමාන වචනයකි.

**භාසිත මනුභාසන්ති** යනු ඔවුන් විසින් කියන ලද දෙය සජ්ඣායනය කළ දෙය ඒ අනුව සජ්ඣායනා කරති. **වාචිත මනුවාචෙන්ති** යනු ඔවුන්

විසින් අන්‍යයන්ට කියවන ලද දෙය ඒ අනුව කියවති. සෙය්‍යථීදං යනු ඒවා මොනවාද යන අර්ථයි.

අට්ඨකො යන ආදිය ඔවුන්ගේ නම්ය. ඔවුහු දිවැසින් බලා අනුන් නැසීමක් නොකොට, කාශ්‍යප සම්බුදුන් වහන්සේගේ ධර්මය හා සසඳ මන්ත්‍ර රචනා කළහ. කලින් කල බමුණෝ සත්ත්ව ඝාතන ආදිය බහා ත්‍රිවේදයයි බෙදා බුද්ධවචනයට විරුද්ධ කළහ.

**නෙතං ඨානං විජ්ජති** යනු යමකින් ඔබ ඍෂි වන්නෙහිද යන මේ කාරණය නොපැනේ. මෙහි භාග්‍යවතුන් වහන්සේ 'මොහු අසනු ලබන්නේද තමාගේ පිළිවෙළක් නැති බව දැන පිළිවදන් නොදෙයි යයි දනී. ඒ නිසා ප්‍රතිඥාවක් නොගෙනම ඍෂිභාවය ප්‍රතික්ෂේප කළේය.

දැන් යම්හෙයකින් ඒ පැරණි බමුණෝ දසදෙන මස්මාංශයෙන් වැළකී, ස්ත්‍රී ගන්ධ රහිතව, මඩ තවරාගෙන, අරණ්‍යායතනයෙහි, පර්වත පාමුල, වනමුල්පල අහරකොට විසූද, යම්කලෙක කිසියම් තැනකට යනු කැමැත්තෝ වෙත්ද, ඍද්ධියෙන් අහසින්ම යෙත්ද, ඔවුන්ට යානාවකින් කාරියක් නැත. සියලු දිසාවන්හි ඔවුන්ට මෛත්‍රී භාවනාවම ආරක්ෂාව වෙයි. ඔවුන්ට ප්‍රාකාරයන්ගෙන් පුරුෂයන්ගේ ආරක්ෂාවෙන් ප්‍රයෝජනයක් නැත. මෙයින්ද අම්බට්ඨ විසින් ඔවුන්ගේ ප්‍රතිපත්තිය ගැන ඇසූවිරූය. එහෙයින් ගුරුවරයා සහිත මොවුන් ඔවුන්ගේ ප්‍රතිපත්තියෙන් ඈත්වූ බව දක්වන්ට තං කිං මඤ්ඤසි අම්බට්ඨ ආදිය කී සේක.

එහි **විචිතකාලකං** යනු විමසා ඉවත්කළ කළු ලප ඇති. **වෙධ්කතපසසාහි** යනු රෙදිපට රෙදි වෙළු ආදියෙන් වෙලුම්වලින් නැමුණු ඉලඇටවලින්. **කුත්තවාලෙහි** යනු හැඩගන්වනු පිණිස සැරසිය යුතු තැන්වල සැරසූ වල්ගාවලින්. මෙහි වෙළඹුන් හේම වලිගවලින් සැදූණෝය. රථවල නොවේ. වෙළඹුන්ගෙන් යුතු බැවින් රථ කුත්තවාලා යයි කියන ලදී.

**උක්කිණ්ණ පරිඛාසු** යනු කැණ සෑදූ දියඅගල්. **ඔක්ඛිත්ත පලියාසු** මෙහි උපකාරිකා යනු අන්‍යයන්ගේ නැගීම වැළැක්වීම පිණිස හාත්පස නගර ප්‍රාකාරයෙහි යට කොටසෙහි කළ සුණුකම් යයි කියනු ලැබේ.

මෙහි ඒ උපකාරිකයන්ගෙන් යුත් නගරම නගරූපකාරිකයයි අදහස් කරන ලදී.

**රක්ඛාපෙනති** එබඳු නගරවල වසන්නෝද තමන් ආරක්ෂා කරවා ගනිති.

**කංඛා** යනු සර්වඥද, නැද්ද යන මේ සැකය. **විමති** යනු එයටම සමාන වචනයකි. විකෘති මතය. විනිශ්චය කිරීමට අසමර්ථ බව යන අර්ථයි. මෙය භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨයාට මේ ආත්මභාවයෙන් මාර්ග පහළවීමක් නැත. හුදෙක් දවස ගෙවාදමයි. මොහු ලක්ෂණ සෙවීම පිණිස පැමිණියේය. ඒ කාර්යය සිහි නොකරයි. දැන් මොහුගේ සිහිඑළවීම පිණිස න්‍යායයක් දෙමියි කී සේක.

මෙසේ කියා යම්හෙයකින් හුන්නා වූද වැදහොත්තා වූද බුදුවරුන්ගේ ලක්ෂණ සොයන්ට කිසිවෙක් සමත් නොවේ. සිටි හෝ සක්මන් කරන බුදුවරුන්ගේ හැකිය. පලපුරුද්දෙන් බුදුවරුන්ගේ ලක්ෂණ සෙවීම පිණිස ආ බව දැන හුනස්නෙන් නැගී සක්මන් අධිෂ්ඨානය නම්. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ හුනස්නෙන් නැගී පිටතට නික්ම ගිය සේක. ඒ නිසා අථඛො භගවා ආදිය කියන ලදී.

**සමන්නෙසි** යනු සෙවීය. එක දෙක කියා හෝ ගණන් කරන්නේ එකතු කළේය. **යෙභුය්‍යෙන** යන පාඨයෙන් බොහෝවක් දුටුවේය. අල්ප වූවක් නොදැක්කේය යන අර්ථයි. එයින් නුදුටු දේ දැක්වීම පිණිස ඨපෙත්වා ද්වෙ යයි කියන ලදී. **කංඛති** යනු 'බලන්නෙම් නම් මැනවි'යි ප්‍රාර්ථනයක් උපදවයි. **විචිකිච්ඡති** යනු අතනින් මෙතනින් සොයන්නේ සැක කරයි. දකින්ට නොහැකි වෙයි. **නාධිමුච්චති** යනු ඒ විචිකිච්ඡාවෙන් නිගමනයකට නොයයි. **න සම්පසීදති** යනු එයින් 'මොහු පරිපූර්ණ ලක්ෂණ ඇත්තෙකැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රසාදයට නොපැමිණේ. සැකයෙන් දුර්වල වූ විමතිය යයි කියන ලදී. විචිකිච්ඡාවෙන් මැදහත්. අවබෝධ නොවූ බැවින් බලවත්. නොපැහැදීමෙන් ඒ ධර්ම තුනෙන් සිතෙහි කිලිටි බව.

**කොසොහිතෙ වත්ථි** කෝෂයෙන් වැසුණු. **වත්ථගුය්හෙ** යනු අංග ජාතයෙහි. භාග්‍යවතුන් වහන්සේගේ ඇතකුගේ මෙන් කෝෂයෙන් වැසුණු

අංගජාතය රන්වන්ය. පියුම්ගැබක් හා සමානය. වස්ත්‍රයෙන් වැසුණු බැවින් එය නොදක්නේ, දිව මුව තුළට ගිය බැවින් පුළුල් බව නොසලකන්නේ ඒ ලක්‍ෂණ දෙකෙහි සැක ඇත්තේ විය. නිගමනයට නොපැමිණියේය.

**තථාරූපං** යනු රූපය කෙසේද, මෙහි අනෙකකු විසින් කුමක් කිවයුතුද? මිලින්ද රජු විසින් විචාරන ලද නාගසේන තෙරුන් විසින් මෙය කියන ලදී. 'ස්වාමීනි, නාගසේනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අතිශයින් දුෂ්කර දෙයක් කරන ලදී. 'කුමක්ද මහරජ, ස්වාමීනි, මහජනයා විසින් ලජ්ජා ඇතිකරන අවස්ථාවක් බ්‍රහ්මායු බ්‍රාහ්මණයාගේ අතවැසි උත්තරටද, බාවාරියගේ අතවැසි සොළොස් බමුණන්ට, සේල බ්‍රාහ්මණයාගේ අතවැසි තුන්සියයක් මාණවකයන්ට දැක්වූ සේක. මහරජ, භාග්‍යවතුන් වහන්සේ අංගජාතය නොදැක්වූ සේක. භාග්‍යවතුන් වහන්සේ ඡායාවක්ම දැක්වූ සේක.

ඍද්ධියෙන් නැගී අඳනය හැඳි බඳපටිය බැඳි සිවුර පෙරවූ ඡායාරූප මාත්‍රය දැක්වූ සේක. ඡායාව දුටු කල්හි දක්නා ලද්දේම නොවේද ස්වාමීනි? නවතින්න මහරජතුමනි, ඔබගේ හෘදය රූපය දැක අවබෝධ කරගන්නා සත්ත්වයෙක් වන්නේය. සම්‍යක් සම්බුදුන් වහන්සේ හෘදය මාංශය ඉදිරිපත්කොට දක්වන සේක. නාගසේන හිමියනි, දක්‍ෂයෙක් වෙහි.

**නින්නාමෙත්වා** යනු ඉදිරිපත් කරමින්, **අනුමසි** යනු ඉදිකටුවක් මෙන් කොට පිරිමැදි සේක. එසේ කිරීමෙන් ද එහි මෘදුබව, කර්ණශ්‍රෝතය පිරිමැදීමෙන් දිගු බව, නාසිකා ශ්‍රෝතය පිරිමැදීමෙන් සිහින් බව, නළල වැසීමෙන් පුළුල් බවද ප්‍රකාශකරන ලද්දේ යයි දතයුතුය.

**පතිමානෙන්තා** යනු බලා සිටින්නේ, පැමිණීම ප්‍රාර්ථනා කරන්නේ, අපේක්‍ෂා කරන්නේ යන අර්ථයි. **තථා සල්ලාපො** යනු කතාවද සල්ලාපයද, කථනය ප්‍රතිකථනය යන අර්ථයි. **අහොවත** යනු මෙය ගර්හා වචනයකි. **රෙ** යනු අවමන් වශයෙන් ආමන්ත්‍රණය. **පණ්ඩිතකා** යනු එයම පිළිකුල් කරමින් කීය. ඉතිරි දෙකෙහිද මේ ක්‍රමයයි.

**එවරූපෙන කිරභො පුරිසො අත්ථචරකෙන** යනු යම්බඳු වූ ඔබ එබඳු අර්ථයෙහි හැසිරෙන යහපත කරන්නකු ඇතිකල්හි පුරුෂයා නිරයටම යන්නේය. අන් තැනකට නොවේ.' මේ අර්ථය සඳහා කියයි.

**ආසජ්ජ ආසජ්ජ** යනු ගටා ගටා. **අමෙහපි එවං උපනියා උපනියා** යනු අම්බට්ඨ බ්‍රාහ්මණයා පොක්ඛරසාතී යැයි ආදිය කියා මෙසේ දක්ව දක්වා පිළිසත් කරුණ හෙළිකොට ශුද්‍ර දාස ආදී බව ආරෝපණය කොට කීය. 'ඔබ විසින් අපි ආක්‍රෝශ කරනු ලැබුවෙමු' යයි අදහස් කරන ලදී.

**පදසායෙව පවතෙනසි** යනු පයින් පහරදී බිමහෙළීය. ඔහු පෙර ගුරුවරයා සමග රියට නැගී ගියේද, ඔහුගේ ඒ තැන නොසිඳ රියට ඉදිරියෙන් පයින්ම ගමන් කළේය.

**අතිවිකාලො** යනු සාමාන්‍ය නොකාලයයි. සතුටු සල්ලාපයටද කාලයක් නැත. **ආගමානු බොධතො** යනු පින්වත, ඔබ මෙහි ආවේ නොවේද?

**අධිවාසෙතු** යනු පිළිගනු ලැබේවා. **අජ්ජතනාය** යනු ඔබවහන්සේ කෙරෙහි සත්කාර කරන මාගේ පිනද ප්‍රීති ප්‍රමෝදයද අද ඒ පිණිස වන්නේය.

**අධිවාසෙති භගවා තුණ්හී භාවෙන** යනු භාග්‍යවතුන් වහන්සේ කායාංගය හෝ වාක් අංගය නොසොලවා අභ්‍යන්තරයෙහිම ක්ෂාන්තිය කැමතිසේක් නිශ්ශබ්ද භාවයෙන් ඉවසූ සේක. බමුණාට අනුග්‍රහ පිණිස මනසින්ද පිළිගත් සේකැයි කියන ලද්දේ වෙයි.

**පණීතෙන** යනු උත්තම වූ, **සහත්ථා** යනු තමාගේ අතින්. **සනතපෙපත්වා** යනු මැනවින් තර්පණය කොට, පිරිපුන් මැනවින් යහපත් ඇතිතාක් කොට. **සමපවාරෙත්වා** යනු මැනවින් පවරා. 'ඇති ඇති'යි හස්ත සංඥාවෙන් ප්‍රතික්ෂේප කරවා, **භුතතාවී** යනු අනුභව කළ, **ඔණීත පතතපාණී** යනු පාත්‍රයෙන් ඉවතට ගත් අත් ඇතිව ඉවත්කළ අත යයි කියන ලද්දේ වෙයි. ඔනිතත පතතපාණිං කියාද පාඨයක් ඇත. එහි අර්ථයඃ අතින් වෙන් කරගත් පාත්‍රය ඔහුට ඇත්තුයි = ඔනිතත පතතපාණී.

එය ඔනිත්ත පත්තපාණිං. අත්ද පාත්‍රයද සෝදා එකත්පසෙක පාත්‍රය තබා හුන් යන අර්ථයි.

එකමන්තං නිසීදි යනු භාග්‍යවතුන් වහන්සේ මෙසේ වූ බව දැන එක් තැනක හුන්නේය යන අර්ථයි. ආනුපුබ්බිකථං යනු අනුපිළිවෙළ කථාව. ආනුපුබ්බී කථා නම් දානයන්ට පසුව සීලය. සීලයන්ට පසුව සග්ග. සග්ගයන්ට පසුව මග්ග යනුවෙන්. එයින්ම සෙය්‍යථීදං දානකථං යනාදිය කීය. ඔකාරං පහත්බව ලාමක බව.

සාමුක්කංසිකා යනු තමාම උසස් වූ තමා විසින්ම උපුටා ගත් ස්වයංභූ ඥානයෙන් දක්නාලද අන්‍යයන්ට සාධාරණ නොවූ යන අර්ථයි. කුමක්ද මේ ආර්යසත්‍ය දේශනාව? එහෙයින් කීය. දුක්ඛං සමුදයං නිරොධං මග්ගං යනුවෙන්.

ධම්මචක්ඛුං යනු මෙහි සෝවාන් මග අදහස් කරන ලදී. එහි උත්පත්ති ආකාර දැක්වීම පිණිස යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං යයි කීහ. නිරෝධය අරමුණු කොට කෘත්‍ය වශයෙන් මෙසේ සියලු සංඛත ධර්මවල ප්‍රතිවේධ බව උපදී.

ආර්ය සත්‍ය ධර්මය දක්නා ලද්දේ මොහු විසිනියි = දිට්ඨධම්මො. සෙසු පදවලද මේ ක්‍රමයමැයි. තරණය කළ විචිකිච්ඡාව මොහු විසිනැයි = තිණ්ණ විචිකිච්ඡො විශාරද බවට පැමිණියේ කොහිද? ශාස්තෘ ශාසනයෙහි. ඔහුට පරප්‍රත්‍යයක් නැත. අනුන්ගේ ශ්‍රද්ධාවෙන් මෙහි නොපවතීනුයි = අපරප්පච්චයො. සෙස්ස සියලුතැන පෙර කියූ ක්‍රමය බැවින්ද, නොගැඹුරු බැවින්ද ප්‍රකටමය.

**අම්බට්ඨ සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

# සොණදණ්ඩ සූත්‍ර වර්ණනාව

**එවංමෙසුතං -පෙ- අංගෙසු** යනු සොණදණ්ඩ සූත්‍රයයි. මේ මෙහි අපූර්ව පද වර්ණනාවයි. අංගෙසු යන අංග නම් ගල් ඇති බැවින්. මෙසේ ලද ව්‍යවහාර ඇති ජනපදවාදී රජකුමරුවෝ. ඔවුන්ට නිවාස වූ එක් ජනපදයක් රූඪී ශබ්දයෙන් අංගයයි කියනු ලැබේ. ඒ අංග ජනපදයෙහි.

**චාරිකං** යනු මෙහිද අතුරිත චාරිකාවයි. නිබද්ධ චාරිකාවද අදහස් කරන ලදී. එකල්හි දසදහසක් ලෝකධාතුන් දෙස බලන භාග්‍යවතුන් වහන්සේගේ ඥාන ජාලය තුළ සෝණදණ්ඩ බමුණා පෙනිණ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'මේ සොණදණ්ඩ බමුණා මාගේ ඥාන ජාලයෙහි පැනෙයි. ඔහුට උපනිශ්‍රයක් ඇත්දෝ'යි විමසන සේක්' මා එහි ගියවිට ඔහුගේ අතවැසියෝ දොළොස් අයුරකින් බමුණාගේ ගුණ කියා මාගේ සමීපයට එන්නට ඉඩ නොදෙන්නේය. හේ ඔවුන්ගේ වාද බිඳ විසිනව අයුරකින් මාගේ ගුණ කියා මා වෙත එළඹ ප්‍රශ්නයක් අසන්නේය. ප්‍රශ්නය විසඳුම අවසානයෙහි හේ සරණ යන්නේ යයි දුටු සේක. පන්සියයක් භික්ෂූන් පිරිවරා ඒ ජනපදයට පිළිපන් සේක. එහෙයින් කියන ලදී. අංගෙසු චාරිකං චරමානො -පෙ- යෙන චම්පා තදවසරි යනුවෙන්.

**ගගරාය පොක්ඛරණියා තීරෙ** යනු මෙහි ඒ රජ තෙමේ මගධයන්ට ප්‍රධාන හෙයින් මාගධ විය. මහා සේනාවකින් යුක්ත බැවින් සේනියො විය. බිම්බි යනු රත්රන්ය. ඒ නිසා සාර සුවර්ණ වර්ණ ඇති බැවින් බිම්බිසාර යයි කියනු ලබන්නේ යයි දතයුතුය.

බොහෝ බොහෝ වී රැස් වූ = සංඝ, එක් එක් දිසාවක සංඝයා එයට ඇත්තේනුයි = සංඝී. පෙර නගරය ඇතුළත ගණ නොවී පිටත නික්මී ගණ සහිත වූයේනුයි = ගණීභූතා.

**ඛත්තං ආමන්තෙසි** යනු ඛත්ත කියනු ලබන්නේ ඇසූ ප්‍රශ්නය විසඳීමෙහි සමර්ථ වූ මහා මාත්‍රයාය. ඔහු ඇමතීය. ආගමෙන්තු යනු මොහොතක් ගරු කරත්වා, පැමිණෙත්වායි කියන ලද්දේ වෙයි.

**නානාවෙරජ්ජකානං** යනු නානාවිධ රාජ්‍යයන්හි අනික් අනික් කාශි කෝශල ආදී රාජ්‍යයන්හි උපන්, ඒවා ඔවුන්ගේ නිවාසද වෙයි. එයින් ආවේනුයි නානා වෙරජ්ජකා. ඔවුන්ගේ නානාවෙරජ්ජකානං.

**කෙනචිදෙව කරණීයෙන** යනු ඒ නගරයෙහි බමුණෝ කාර්ය දෙකක් හේතුවෙන් රැස්වෙති. යඥය අනුභව කිරීම සඳහා සහ මන්ත්‍ර සජ්ඣායනය සඳහා යනුවෙන්. එකල ඒ නගරයෙහි යාග නැත. සොණදණ්ඩගේ සමීපයෙහි මන්ත්‍ර සජ්ඣායනය සඳහා මොවුහු රැස්වූහ. ඒ සඳහා කියන ලදී. **කෙනචිදෙව කරණීයෙන** යනුවෙන්. ඔවුහු ඔහුගේ ගමන ගැන අසා මෙසේ සිතූහ. 'මේ සෝණදණ්ඩ බමුණා උසස් බමුණෙකි. බොහෝවිට අනිත් බමුණෝ ශ්‍රමණ ගෞතමගේ සරණ ගියාහුය. මොහු පමණක් නොගියේය. මොහු එහි ගියහොත් ඒකාන්තයෙන් ශ්‍රමණ ගෞතමගේ ආවට්ටනී මායාවෙහි පැටලී ඔහු සරණ යන්නේය. ඉන්පසු ඔහුගේ ගෙදර බමුණන්ගේ හමුවීමක් නැත. දැන් ඔහුගේ ගමනට අන්තරාය කරමුයි මන්ත්‍රණය කොට එහි ගියහ. ඒ සඳහා අථඛො තෙ බ්‍රාහමණා යනාදිය කියන ලදී.

එහි **ඉමිනා පංගෙන** යනු මේ කාරණයෙන්ද, මෙසේ මේ කරුණ කියා නැවත තමාගේ ගුණ කියනු ලබන කල්හි තමා ඔසවා නොසිතන සත්ත්වයෙක් නම් නැත. මොහුගේ ගුණ කීමෙන් ගමන වළක්වමුයි සිතා **භවංහි සොණ දණ්ඩො උභතො සුජාතො** ආදී කරුණු කීහ.

**උභතො** යනු දෙපසින්. මව්පසින්ද, පියපසින්ද, ඔබතුමාගේ මව් බැමිණිය මාතුමාතා බැමිණියයි. ඇයගේ මව් බැමිණිය. පියා බමුණෙකි. පියාගේ පියා බමුණෙකි. ඔහුගේ පියාත් බමුණෙකි. මෙසේ ඔබතුමා උභතො සුජාතො මාතිතොච පිතිතොච.

**සංසුද්ධ ගහණිකො** යනු ඔබතුමාගේ මාතෘ ග්‍රහණිය සුපිරිසුදුය. කුස යන අර්ථයි. 'ග්‍රහණය සමවිපාක දෙන්නේය'. මෙහි කර්මජ තේජෝ ධාතු ග්‍රහණයයි කියනු ලැබේ.

**යාව සත්තමා පිතාමහයුගා** යනු පියාගේ පියා පිතාමහයැ. පිතාමහගේ යුගය පිතාමහ යුගයයි. යුගය යනු ආයුෂ ප්‍රමාණයයි කියනු ලැබේ. මෙය කතාවක් පමණි. අර්ථ වශයෙන් පිතාමහම පිතාමහ යුගයයි.

ඉන් උඩ සියලු ආදි පුරුෂයෝ පිතාමහ ග්‍රහණයෙන්ම ගන්නා ලද්දාහු වෙති. මෙසේ සත්වැනි පුරුෂයා දක්වා සංසුද්ධ ග්‍රහණිකයෝය. ඉක්බිති අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන යයි දක්වයි.

අක්ඛිත්තො යනු 'මෙය ඉවත්කරවු. මෙයින් කුමන ප්‍රයෝජනයක්දැයි විසි නොකරන ලද අවමන් නොකරන ලද. අනුපක්කුට්ඨො යනු අක්‍රෝශ නොකරන ලද්දේ. අක්‍රෝශයක් හෝ නින්දාවක් හෝ නොලද විරූ කවර කරුණකින්ද? ජාතිවාදයෙන්. 'මෙයින්ද මොහු හීන ජාති ඇත්තෙකි'යි එබඳු වචනයෙන් යන අර්ථයි.

අඩ්ඪො යනු ඉසුරුමත්. මහද්ධනො යනු මහත් වූ ධනයකින් යුත්. ඔබතුමාගේ ගෙයි පොළොවෙහි පස්වැලි මෙන් බොහෝ ධනය ඇත. ශ්‍රමණ ගෞතම නිර්ධනය. භික්ෂාවෙන් බඩ පුරවාගෙන යැපෙයි යනුවෙන් දක්වත්. මහා භොගො යනු පංචකාම ගුණ වශයෙන් මහත් උපභෝග සම්පත් ඇත. මෙසේ යම් යම් ගුණයක් කියත්ද, ඒ ඒ දෙයට ප්‍රතිපක්ෂ වශයෙන් භාග්‍යවතුන් වහන්සේගේ අගුණයම දක්වමු'යි හඟිමින් කියත්.

අභිරූපො යනු අන් මිනිසුන්ට වඩා අධික රූපයෙන් යුත්. දස්සනීයො යනු දවසක් බලා සිටින්නවුන්ට වුවද අතෘප්තියක් ඇති නොකරන බැවින් දැකීමට සුදුසු දැක්මෙන්ම චිත්ත ප්‍රසාදය දනවන හෙයින් පාසාදිකො.

පොක්ඛරතා යයි කියනු ලබන්නේ සොඳුරු බවයි. වර්ණයෙහි සොඳුරු බව = වණ්ණ පොක්ඛරතා. ඒ වණ්ණ පොක්ඛරතාවෙන් වර්ණ සම්පත්තියෙන් යන අර්ථයි. පොරාණයෝ පොක්ඛර යයි ශරීරයට කියති. වර්ණය වර්ණයමය. ඔවුන්ගේ මතයට අනුව වණ්ණයද පොක්ඛරයද = වණ්ණ පොක්ඛර වේ. ඔවුන්ගේ බව වණ්ණ පොක්ඛරතා. මෙසේ පරමාය වණ්ණ පොක්ඛරතාය යනු උතුම් පිරිසිදු වර්ණයෙන් ද ශරීර ලක්ෂණ සම්පත්තියෙන් ද යන අර්ථයි.

බ්‍රහම වණ්ණී යනු ශ්‍රේෂ්ඨ වර්ණ ඇති පිරිසිදු වර්ණයන් අතරින් ශ්‍රේෂ්ඨ වර්ණය වූ සුවර්ණ වර්ණයෙන් යුත් යන අර්ථයි. බ්‍රහමවච්ඡසී යනු මහා බ්‍රහ්මයාගේ ශරීරයට සමාන ශරීරයකින් යුත්. අක්ඛුද්දාවකාසො දස්සනාය යනු ඔබතුමාගේ සිරුරෙහි දර්ශනයට අවකාශයක් නැති තරම් මහත්ය. සියලු අඟපසඟ දර්ශනීයය. ඒවාද විශාලයයි දක්වති.

ඔහුට සිල් ඇත්තේ නුයි = සීලවා. වැඩුණු වර්ධනය කළ සීලය ඔහුගේ නුයි = වුද්ධසීලී. වුද්ධසීලෙන යන වැඩුණු වර්ධනය කළ ශීලයෙන්. සමන්නාගතො යනු යුත්. මෙය වුද්ධසීල පදයටම සමාන වචනයකි. මේ සියලු පංචශීල මාත්‍රයම සඳහා කියත්. කල්‍යාණ වාචො යන ආදී තන්හි කල්‍යාණ සුන්දර පරිමණ්ඩල පද ව්‍යඤ්ජන වචන මොහුට ඇත්තේනුයි = කල්‍යාණ වාචො, කල්‍යාණ, මධුර කථාව ඔහුට ඇත්තේනුයි = කල්‍යාණ වාක්කරණො වාක්කරණං යනු ගුණයෙන් පිරිපුන් බැවින් ඒ කථා සෝෂාව නගරයෙහි පවතීනුයි පොරී. නුවරෙහි පැවති බැවින් හෝ පුරයෙහි නාගරික ස්ත්‍රීන්ගේ සුකුමාල භාවය හා සමාන නුයි පොරී. එයින් පොරියා.

විසසට්ඨා යනු පළිබෝධ නැති බැවින්, සන්දිට්ඨ විලම්බිත ආදී දෝෂයන් රහිත බැවින්. අනෙලගලාය යන කෙලගැලීම්වලින් විරහිත බැවින්. සමහරුන් කථා කරනවිට සෙම ගලයි. කෙල වැගිරෙයි. කෙලබිඳු හෝ නික්මෙයි. ඔහුගේ වචන එලගල නම් වෙයි. එයින් විපරීත වූ යන අර්ථයි.

අත්ථසස විඤ්ඤාපනියා යනු ආදි මධ්‍ය අවසානය ප්‍රකට කොට කියූ අර්ථය දැක්වීමේ සමත්.

ජිණ්ණා යනු ජරාජීර්ණ බැවින් දිරාපත් වූ වුද්ධා අඟපසඟ වැඩුණු බවට කෙළවරට පැමිණියේ. මහල්ලකො යනු උපතින් මහලු බැවින් යුතු, බොහෝ කල් ගෙවූයේ යයි කියන ලද්දේ වෙයි. අද්ධගතො යනු දිගුකල් ගියේ, රාජ පරම්පරා දෙක තුනක් ඉක්ම ගියේ යන අදහසයි. වයො අනුප්පතො යනු පශ්චිම වයසට පැමිණියේ, පශ්චිම වයස නම් වර්ෂ සියයකට පසුව එන තුන්වැනි භාගය. තවද ජිණ්ණා යනු පැරණි, බොහෝකල් පැවති කුල පරපුර යයි කියන ලද්දේ වෙයි. වුද්ධා යනු ශීලාචාර ආදී ගුණයෙන් වෘද්ධියට පත්. මහල්ලකො යනු සම්පත් මහත් බැවින් යුතු. අද්ධගතො යනු මාර්ගයට පිවිසි බමුණන්ගේ ව්‍රත චර්යා ආදී සීමාව නො ඉක්මවා සිටි චරණ සීලය. වයො අනුප්පත්තො ජාතියෙන් වෘද්ධ බවද, අන්තිම වයසට පැමිණි.

එවං වුත්තෙ යනු මෙසේ ඒ බමුණන් විසින් කියන ලද කල්හි සොණදණ්ඩ 'මේ බමුණෝ ජාති ආදියෙන් මාගේ ගුණ කියති. තමාගේ ගුණයෙහි ඇලීම මට සුදුසු නැත. මම මොවුන්ගේ වාද බිඳ ශ්‍රමණ

ගෞතමයන්ගේ මහත් බව පෙන්වා මොවුන් එහි යාම කරමි'යි සිතා, **තෙනහි භො මමපි සුණාථ** ආදිය කීය. එහි දෙපසින් සුජාතය ආදි ගුණයක් වේද, ඒවා තමාගේ ගුණයන්ට සමාන ගුණය. ශ්‍රමණ ගෞතමයන්ගේ ජාති සම්පත්ති ආදි ගුණයට මම කවරෙක්දැයි ඒ ගුණ තමාගේ ගුණයන්ට වඩා උත්තරීතරයයි හඟිමින්, ඒකාන්තයෙන්ම භාග්‍යවතුන් වහන්සේගේ මහත් බව දැක්වීම පිණිස ප්‍රකාශ කරයි.

**මයමෙව අරහාම** යනු මෙසේ නියම කරන්නේ මෙහි මෙය දක්වයි. ඉදින් ගුණමහත් බව නිසා එළඹිය යුතු නම්, මහමෙර හා සසඳ අබඇටයද, මහා සමුද්‍රය හා සසඳ ගවකුර වළද, සප්ත මහා විල්හි ජලය හා සසඳ පිණිබිඳුවද, කුඩාය ලාමකය. මෙසේම ශ්‍රමණ ගෞතමයන්ගේ ජාති සම්පත්ති ආදී ගුණයන් සමග සසඳ අපගේ ගුණ අඩුය. ලාමකය. ඒ නිසා **මයමෙව අරහාම තං භගවන්තං ගොතමං දස්සනාය උපසංකමිතුං** යනුවෙන්.

**මහන්තං ඤාති සංඝං ඔහාය** යනු මව්පසින් කුල අසූ දහසක්ද, පියපසින් අසූවක්දැයි මෙසේ හැටදහසක් අධික වූ කුල සියදහසක් අත්හැර පැවිදි වූයේය.

**භූමිගතංච වෙහාසට්ඨංච** යනු රාජාංගනයෙහිද උයනෙහිද සුණුවලින් මට කළ පොකුණු සත්රුවනින් පුරවා බිම තැබූ ධනය භූමිගත නමි. ප්‍රාසාද කුළුණු ආදිය පුරවා තැබූ ධනය වෙහාසගත නමි. මෙය නම් කුල පිළිවෙළින් පැමිණියේය. තථාගතයන් වහන්සේ දවසෙහිම සංඛ, එල, උත්පල, පුණ්ඩරීක යන සතර මහනිධාන එළඹියේය. ඔවුන්ගෙන් සංඛය ගවුවක් පමණය. එලය අඩයොදුනක් පමණ වේ. උත්පල ගව් තුනක් පමණය. පුණ්ඩරීකය යොදුනක් පමණ වේ. ඒවා ගත් ගත් තැන පිරේමය. මෙසේ **භගවා පහූතං හිරඤ්ඤ සුවණ්ණං ඔහාය පබ්බජිතො** යයි දතයුතුය.

**දහරොව සමානො** යනු තරුණයෙක්වැ. **සුසුකාල කෙසො** යනු මනා කළු කෙස් ඇත්තේ, අඳුන්වන් කෙස් ඇත්තේවැ යන අර්ථයි. **භද්‍රෙන** යනු ලස්සන. **පඨමෙන වයසා** යනු වයස් තුනෙන් පළමු වයසෙහි **අකාමකානං** යනු අකමැති වන. අනාදර අර්ථයෙහි ෂෂ්ටි වචනයි. මුවෙහි කඳුළු මොවුන්ගේ නුයි = අසසුමුඛා. ඒ මුවෙහි කඳුළු ඇත්තා වූ, කඳුළින්

කිලිටි මුහුණු ඇති යන අර්ථයි. රුදනතානං යනු හඬා වැළපෙන අකබුද්දාවකාසො යනු මෙහි භාග්‍යවතුන් වහන්සේගේ අප්‍රමාණ වූ දර්ශන අවකාශයයි දතයුතුය. එහි මේ කථාවයි. රජගහනුවර එක්තරා බමුණෙක් ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රමාණය ගන්නට නොහැකි යයි අසා භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස පිවිසෙන කල්හි හැටරියන් උණගසක් ගෙන නුවර දොර පිටත සිට භාග්‍යවතුන් වහන්සේ පැමිණි විට උණගස ගෙන සමීපයෙහි සිටියේය. උණගස භාග්‍යවතුන් වහන්සේගේ දණ පමණට පැමිණියේය. දෙවැනි දවසෙහි උණගස් දෙකක් එකට බැඳ සමීපයෙහි සිටියේය. භාග්‍යවතුන් වහන්සේද උණගස් දෙකම උඩින් උණගස් දෙක පමණටම පෙනෙමින් 'බමුණ, ඔබ කුමක් කෙරෙහිදැයි ඇසූ සේක. ඔබගේ ප්‍රමාණය ගනිමි. 'බමුණ, ඔබ මුළු සක්වළ ගැබ පුරවා සිටි උණගස් එකට බැඳ පැමිණෙන්නේ වුවත්, මාගේ ප්‍රමාණය ගැනීමට නොහැක්කෙහිය. මම අසංඛෙය්‍ය සතරක් හා කල්ප සියදහසක් යම්සේ පෙරුම් පිරුවේ නොවේද, යම්සේ අනෙකෙක් මාගේ ප්‍රමාණය ගන්නේද, බමුණ තථාගතයන් වහන්සේ අතුල්‍යයය. අප්‍රමාණයයි කියා ධම්මපදයෙහි ගාථාවක් කී සේක. ගාථාවගේ කෙළවර අසූහාර දහසක් ප්‍රාණීහු අමාව පානය කළහ. තවත් කථාවක් වෙයි. රාහු අසුරේන්ද්‍රයා යොදුන් හාරදහස් අටසියයක් උසය. ඔහුගේ බාහු අන්තරය යොදුන් එක්දහස් දෙසියයකි. අතුල් පතුල් වල පුළුල් බවින් යොදුන් තුන්සියයකි. ඇඟිලි පුරුක් යොදුන් පනසකි. ඇස් බැම් අතර යොදුන් පනසකි. (මුඛය යොදුන් දෙසියයකි. ගැඹුර යොදුන් තුන්සියයකි. පරිධිය යොදුන් තුන්සියයකි. ගෙල යොදුන් තුන්සියයකි.) නළල යොදුන් තුන්සියයකි. ඇස යොදුන් නවසියයකි. ඒ මම උස් වෙමි. නැමී ශාස්තෲන් වහන්සේ බැලීමට නොහැක්කෙමියි නොයයි. හෙතෙමේ එක් දවසක් භාග්‍යවතුන් වහන්සේගේ ගුණ අසා කෙසේ හෝ බලන්නෙමියි පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ අදහස දැන. සිටියේ නම් මිටි තැනැත්තාද උස මෙන් පැනෙයි. වැදහෙව ඔහුට තමා දක්වන්නෙමි. 'ආනන්ද ගඳකිළි මිදුලෙහි කුඩා ඇඳක් පනවන්නැයි කියා එහි සිංහසෙය්‍යාව කළ සේක. රාහු පැමිණ වැදහොත් භාග්‍යවතුන් වහන්සේ ගෙල නමා ගුවන්තලය මැද පුන්සඳ මෙන් බලයි. 'කිමෙක්ද අසුරේන්ද්‍රය යයි කී කල්හි 'නැමී භාග්‍යවතුන් වහන්සේ බැලීමට නොහැක්කෙමියි නොපැමිණියෙමි. අසුරේන්ද්‍රය, මා විසින් බිම බලාගෙන පාරමිතා නොපුරන ලදී. උඩුකුරු කොටම දානය දෙන ලදී. එදවස රාහු සරණ ගියේය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ දර්ශනය පිණිස අප්‍රමාණ අවකාශ ඇති සේක.

චතු පාරිශුද්ධි ශීලයෙන් **සීලවා** ඒ ශීලය වනාහි ආර්යය. උත්තමය. පරිශුද්ධය. එහෙයින් **අරියසීලි** යයි කීය. එය නිවරද අර්ථයෙන් කුසලය. එහෙයින් **කුසලසීලි** යයි කීය. **කුසලෙන සීලෙන** යනු මෙයට සමාන වචනයකි.

**බහුනනං ආචරිය පාචරියො** යනු, භාග්‍යවතුන් වහන්සේගේ එක් එක් දේශනාවෙන් සුවාසූ දහසක් ප්‍රාණීහුද අප්‍රමාණ දෙව් මිනිස්සු ද මාර්ගඵල නමැති අමාව පානය කළහ. ඒ නිසා **බහුනනං ආචරියො**. ශ්‍රාවකයන් විනයනය කරන්නවුන්ගේ **පාචරියො**.

**ඛීණ කාමරාගො** යනු මෙහි භාග්‍යවතුන් වහන්සේගේ සියලු කෙලෙස් නැසුණේය. බ්‍රාහ්මණයා ඒවා නොදනී. තමා දන්නා තැනම ගුණ කියයි.

**විගතචාපලෙලා** යනු පාත්‍රය හැඩගැන්වීම්, සිවුරු හැඩගැන්වීම්, සෙනසුන් හැඩගැන්වීම්, මේ කුණු කය කෙරෙහි ආශා කිරීම් නැවත ආශා කිරීම්, යනුවෙන් කියූ චපලත්වයෙන් වෙන්වුණු.

**අපාප පුරෙක්ඛාරො** යනු පාපී නොවූ නව ලෝකෝත්තර ධර්මයන් පෙරටුකොට හැසිරේ. බ්‍රහමඤ්ඤායපජාය සාරිපුත්ත මොග්ගල්ලාන මහා කස්සප ආදී ප්‍රභේද ඇති බ්‍රාහ්මණ ප්‍රජාවට (මේ ප්‍රජාවටද) පෙරටුව යන්නේය. මේ ප්‍රජාව ශ්‍රමණ ගෞතමයන් පෙරටුකොට හැසිරේ යන අර්ථයි.

තවද පාප නොවන දේ පෙරටු කොට යයි. පාපය පෙරටුකොට හැසිරේ. පාපය නොකැමති වේ යන අර්ථයි. කවර බ්‍රාහ්මණ ප්‍රජාවකටද? තමා සමග ප්‍රතිවිරුද්ධ වූ බ්‍රාහ්මණ ප්‍රජාවට විරුද්ධ නොවූ හිතසුව කැමති වූයේ ම යැයි කියන ලද්දේ වෙයි.

**තිරොරට්ඨා** පිටරටින්. **තිරොජනපදා** යනු පිට ජනපදයෙන්, **සම්පුච්ඡිතුං ආගච්ඡන්ති** යනු ක්ෂත්‍රිය පණ්ඩිතයෝද, දේව බ්‍රහ්ම නාග ගාන්ධර්ව ආදීහුද ප්‍රශ්න එක්රැස් කොටගෙන අසන්නෙමුයි පැමිණෙති. එහි ඇතමෙක් විචාරීමෙහි දෝෂයක් හෝ විසඳීමෙහි පිළිගැනීමෙහි අසමත් බව හෝ සලකා නො විචාරාම නිහඬව හිඳිත්. ඇතමෙක් විචාරත්.

ඇතමුන්ගේ ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේම විචාරීමට උත්සාහ ඇතිකොට විසඳන සේක. මෙසේ සියල්ලන්ගේ ඒ විමතීහු වෙරළට පැමිණ මහා සමුද්‍රයෙහි රළ මෙන් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ බිඳී යති.

**එහි සාගතවාදී** යනු දෙව් මිනිස් පැවිදි ගිහියන් අතර තමා සමීපයට පැමිණි දේ 'සාගත එන්නැයි මෙසේ වාද ඇත්තේ යන අර්ථයි.

**සඛිලො** යනු එහි සාඛල්‍යය (මෘදු බව) කුමක්ද? යම් වචනයක් නොකිලිටි කර්ණ සුඛ ආදී ක්‍රමයෙන් කියන ලද මෘදු බවින් යුත් මෘදු වචනය යන අර්ථයි.

**සමෙමාදකො** යනු පිළිසඳරෙහි දක්ෂ, ආ ආවුන්ට 'භික්ෂුව සැප දුක් කෙසේද? ආදී ක්‍රමයෙන් සියලු ගමන් විඩාව නිවාලන්නාක් මෙන් පළමුකොට සතුටුසාමීචි කථා කරන්නේ යන අර්ථයි.

**අබ්භාකුටිකො** යනු යම්සේ ඇතැම්හු පිරිස මැදට පැමිණ තද වූ මුව ඇත්තේ හැකිළුණු මුව ඇත්තෝ වෙත්ද, එසේ නොවූයේ, පිරිස දැකීමෙන් බාල සූර්යයා දැකීමෙන් පද්මය පිපේද මුවපියුම පිපෙයි. පුන්සඳෙහි සිරියාව ඇත්තක් වෙයි.

**උත්තාන මුඛො** යනු යම්සේ ඇතැම්හු මුනිත් නැමූ මුව ඇත්තාහු මෙන් පිරිස පැමිණි කල කිසිවක් නොකියත්ද, අතිශයින් දුලබ කතා ඇත්තෝ වෙත්ද, එසේ නොවේ. ශ්‍රමණ ගෞතමයෝ සුලභ කථා ඇත්තෝය. එතුමාගේ සමීපයට පැමිණියවුන්ට අප මෙතැනට ආවේ කුමකටදැයි විපිළිසරක් නූපදී. දහම් අසා සතුටට පත්වූවාහුම වෙත් යයි දක්වයි.

**පුබ්බභාසී** යනු කථා කරන්නේ පළමුවම කථා කරයි. එයද කලට ඔබී. ප්‍රමාණයෙන් යුතුය. අර්ථනිශ්‍රිත දෙයක්ම කියයි. නිරර්ථක දෙයක් නොකියයි.

**නතසම්ං ගාමෙවා** යනු යම්තැනෙක භාග්‍යවතුන් වහන්සේ වසන සේක්ද එහි මහේශාඛ්‍ය දෙවියෝ අරක් ගනිති. ඒ නිසා මිනිසුන්ට උපද්‍රවයක් නැත. පාංශුපිශාච ආදීහුම මිනිසුන් වෙහෙසට පත් කරති. ඔවුහු

දෙවියන්ගේ ආනුභාවයෙන් දුරට පසුබැස යති. එතකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේගේ මෛත්‍රී බලයෙන් න අමනුස්සා මනුස්සෙ විහෙඨෙන්ති - අමනුෂ්‍යයෝ මනුෂ්‍යයන් වෙහෙසට පත් නොකරති.

**සංඝී** ආදී තන්හි අනුශාසනා කළයුතු තමාම උපදවා ගන්නා ලද සංඝයා ඔහුට ඇත්තේ නුයි = සංඝී. එබඳු ගණයක් ඔහුට ඇත්තේනුයි **ගණී.** පෙර පදයට සමාන වචනයක්ද වේ. ආචාර ශික්ෂා වශයෙන් ගණයාට ආචාර්ය වූයේ = **ගණාචරියො. පුථුතිත්ථකරානං** යනු බොහෝ තීර්ථකයන්ට.

**යථාවා තථාවා** යනු කිසියම් අචේලක ආදී පමණ වූ කරුණකින් **සමුදාගච්ඡති** යනු සැදී උඩට එයි. අභිවර්ධනය වෙයි. **අතිථිනො තෙ භොන්ති** යනු ඔවුහු අපගේ ආගන්තුකයෝය. නවකයෝය. සැලකුම් ලැබිය යුත්තෝය යන අර්ථයි. එබඳුම වූ සර්වඥයන්විසින්ද ප්‍රමාණ කළ නොහැකි ගුණ ඇත්තේය. 'මා ගැන කියනුම කවරේද? යයි දක්වයි. එහෙයින් කීය.

**බුද්ධොපි බුද්ධස්ස භණෙය්‍යවණ්ණං**
**කප්පම්පි චෙ අඤ්ඤමභාසමානො**
**ඛීයෙථ කප්පො චිර දීඝ මන්තරෙ**
**වණ්ණො න ඛීයෙථ තථාගතස්ස**

බුදු කෙනෙක් බුදුකෙනෙකුගේ ගුණ
අන්කිසිවක් නොකියාම
කල්පයක් කියත්මුත්
කල්පය ගෙවී ගියද
තථාගත ගුණ නොගෙවේ.

මේ ගුණ කථාව අසා ඒ බමුණෝ මෙසේ සිතූහ. **යථා සොණදණ්ඩො බ්‍රාහ්මණො සමණස්ස ගොතමස්ස වණ්ණ භාසති.** භවත් ගෞතමයෝ උසස් ගුණ ඇත්තෝය. මෙසේ උන්වහන්සේගේ ගුණ දන්නා ගුරුවරයා විසින් බොහෝ කලක් ඉවසන ලදී. දැන් ඔහුට අනුවර්තනය වෙමුයි අනුව පැවතුණාහ. ඒ නිසා **එවං වුත්තෙ තෙ බ්‍රාහ්මණා** යනාදිය කියන ලදී.

**තස්ථ** අලමෙව යනු යුතුමය. අපි පුටංසෙන යනු පුටංසං යනු මාර්ගෝපකරණයි. මාර්ගෝපකරණ ගෙන වුවත් එළඹෙන්ට යුතුය යන අර්ථයි. පුටංසන යනුවෙන්ද පාඨයක් ඇත. එහි අර්ථය : පොදියක් උරෙහි ඇත්තේ මොහුගේනුයි පුටංසො. එයින්, අංශයෙන් මාර්ග උපකරණ පොදිය උසුලන්නහු විසින් යන්නද කියන ලද්දේ වෙයි.

**තිරො වන සණ්ඩගතසස** යනු වනලැහැබ ඇතුළට ගියහුට, විහාරය ඇතුළට පිවිසියහුට යන අර්ථයි.

**අඤ්ජලිං පනාමෙත්වා** යනු ඒ උභය පාක්ෂිකයෝම මෙසේ සිතූහ. 'ඉදින් අපට මිසදිටුවෝ චෝදනා කරත්ද, ඒ නිසා ඔබලා ශ්‍රමණ ගෞතමයන් වැන්දාහුද? ඔවුන් ඇඳිලි බැඳීම් මාත්‍රයෙන්ම වඳින ලද්දේ වේදයි කියමුද? ඉදින් අපට සම්‍යක් දෘෂ්ටිකයෝ චෝදනා කරන්නාහුද, කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේට නොවැන්දාහුද? ඔවුන් විසින් හිසින් පැහැරීමෙන් වඳින ලද්දේ වේද, ඇඳිලි බැඳීම වැඳීමක් නොවේදැයි කියමුද?

**නාමගොත්තං** යනු 'භවත් ගෞතමයෙනි, මම අසුවලාගේ පුතා වූ දත්ත නම් වෙමි. මිත්‍රනම් වෙමි. මෙහි පැමිණියේ වෙමි යි කියන්නෝ වෙති. අස්වන්නෝ වෙති. 'භවත් ගෞතමයෙනි, මම වාසෙට්ඨ වෙමි, මම කච්චායන වෙමි. මෙහි පැමිණියේ වෙමි යි කියන්නාහු ගෝත්‍රය අස්වත් නම් වෙති. මොවුහු දිළින්දෝය. දිරාගිය කුලපුත්‍රයෝය. පිරිස් මැද නම්ගොත් වශයෙන් ප්‍රකට වන්නෙමුයි මෙසේ කළහ.

**යෙපන තුණ්හී භූතනිසීදිංසු** ඔවුහු කෛරාටිකයෝය. අඥබාලයෝය. එහි කෛරාටිකයෝ කථා සල්ලාප එකක් හෝ දෙකක් කරන්නෝද විශ්වාස ඇත්තෝ වෙති. ඉක්බිති විශ්වාසය ඇතිකල්හි භික්ෂා එකක් දෙකක් නොදීම යුතු නොවේ යයි එයින් තමා මිදී නිහඬව හිඳිත්. අඥබාලයෝ නොදන්නා කමින්ම ඉවත දැමූ මැටි පිඬක් මෙන් කොතැනක හෝ නිහඬව හිඳිත්.

**චෙතසා චෙතොපරි විතක්කං** යනු භාග්‍යවතුන් වහන්සේ 'මේ බමුණා ආ තැන් පටන් මුව බිමට හරවා තද ගතින් යුතුව කිසිවක් සිතමින් හුන්නේය. කුමක් සිතයිදැයි ආවර්ජනය කරන්නේ තමාගේ

සිතින් ඔහුගේ සිත දැනගත්තේය. එහෙයින් කියන ලදී. චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය' යනුවෙන්.

**විහඤ්ඤති** යනු විනාශයට පැමිණේ. **අනුවිලොකෙත්වා පරිසං** යනු භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වකීය සමයයෙහි ප්‍රශ්න ඇසීමෙන් මිය යන්නකු ඔසවා ගොඩතැබුවාක් මෙන් අස්වැසුණු කාය චිත්ත ඇත්තේවැ පිරිසට සංග්‍රහ පිණිස දෘෂ්ටි සංවරයෙන්ම 'භවත්හු මාගේ වචනය සලකා බලත්වායි කියන්නාක් මෙන් පිරිස දෙස බලා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

**සුජං පග්ගණ්හන්තානං** යනු යාග පැවැත්වීම පිණිස කෙණෙස්ස අල්ලාගෙන සිටින බමුණන් අතර පළමුවැන්නා හෝ දෙවැන්නා හෝ යන අර්ථයි. කෙණෙස්සෙන් දෙනු ලබන මහායාගය පිළිගන්නවුන්ගේ යනුවෙන් පොරාණයෝ කීහ.

මෙසේ බ්‍රාහ්මණයා ස්වකීය සමය වශයෙන් මනාසේ ප්‍රශ්න විසඳීය. භාග්‍යවතුන් වහන්සේ විශේෂ වශයෙන් උතුම් බමුණා දකිනු පිණිස **ඉමෙසං** යන ආදිය කී සේක.

**එතදවොචුං** යනු ජාතියෙන් වර්ණයෙන් මන්ත්‍රයෙන් යුත් බමුණෙක් නොවේද? ඉක්බිති කවරෙක් ලෝකයෙහි බමුණෙක් වන්නේද? මේ සෝණදණ්ඩ අප නසන්නේය. ඔහුගේ වාදය ප්‍රතික්ෂේප කරමුයි සිතා මෙසේ කීහ.

**අපවදති** යනු ප්‍රතික්ෂේප කරයි. **අනුපක්ඛන්දති** යනු අනුව පිවිසෙයි. මෙය ඉදින් ප්‍රසාද වශයෙන් ශ්‍රමණ ගෞතමයන් සරණ යනු කැමැත්තේ නම් යච. බ්‍රාහ්මණ සමය බිඳින්ට එපා යයි අදහසින් කීහ.

**එතදවොච** යනු මේ බමුණන් මෙසේ එකපැහැර කෑගසන කල්හි මේ කථාව කෙළවරට නොයයි. ඔවුන් නිශ්ශබ්ද කොට සොණදණ්ඩ සමගම කථාකරමියි සිතා **මේ සචෙබො තුම්හාකං** ආදී වචන කී සේක.

**සහධම්මෙන** යනු කරුණු සහිතව. **සමසමො** යනු ඒකදේශ සමතාව හැර යථා පරිදි සම. සර්වාකාරයෙන් සම යන අර්ථයි.

අහමසස මාතා පිතරෝ ජානාමි යනු සොහොයුරියගේ පුත්‍රයාගේ මව්පියන් කුමක් නිසා නොදන්නේද? කුල කෙළවර දැක්වීම සඳහා මෙසේ කියයි.

මුසාපි භාසෙයය යනු යහපත බිඳින මුසාවාද කරන්නේය. කිං වණ්ණා කරිසසති යනු අභ්‍යන්තර ගුණ නැතිකල කුමක් කරන්නේද? මොහුට බ්‍රාහ්මණ ස්වභාවය රකින්ට හැකිය යන අර්ථයි. එසේ වුවත් 'ප්‍රකෘති ශීලයෙහි සිටියහුට බ්‍රාහ්මණ භාවය සැදේද? මෙසේ ශීලයම සැදෙන්නේය. එයද ඔහුට නැතිකල බ්‍රාහ්මණභාවය නොවීයයි වර්ණ ආදිය මුළාවක් පමණි.

මෙය අසා ඒ බමුණෝ 'ගුරුතුමා ඇත්තක් කීවේය. අපි නිකරුණේ කෑගැසුවෙමු'යි නිහඬ වූහ. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ බමුණා විසින් ප්‍රශ්නය කියන ලදී. මෙහි පිහිටා සිටීමට හැකිවන්නේද, නොහැකි වන්නේදැයි එය විමසනු පිණිස ඉමෙසං පන බ්‍රාහමණා යනාදිය කී සේක.

සීලපරිධොතා යනු සිල් පිරිසිදු. යත්ථසීලං තත්ථපඤ්ඤා යනු යම් පුද්ගලයකු තුළ සිල් ඇත්ද එහිම ප්‍රඥාවද ඇත. දුස්සීලයා තුළ ප්‍රඥාවක් කොයින්ද, ප්‍රඥාවක් නැති හෝ මෝඩයා තුළ, ගොළුවා සහ බිහිරා තුළ සීලයක් කොයින්ද? සීලපඤ්ඤාණං යනු සීලයද ප්‍රඥාවද සීලපඤ්ඤාණං පඤ්ඤාණ යනු ප්‍රඥාවමය.

එවමෙතං බ්‍රාහමණා යනු භාග්‍යවතුන් වහන්සේ බමුණාගේ වචනය අනුමත කරමින් කී සේක. සීල පරිධොතා පඤ්ඤා යනු චතුපාරිශුද්ධි ශීලයෙන් සෝදා හරින ලද. සීලයෙන් ප්‍රඥාව සෝදා හරින්නේ කෙසේද? යමකුගේ පෘථග්ජන ශීලය සැටවසක් අසූවසක් අඛණ්ඩව පවතීද හේ මියයන කල්හිද සියලු කෙලෙස් නසා ශීලයෙන් ප්‍රඥාව සෝදා හැර රහත්බව ලබාගනී. කන්ථක සාල පිරිවෙන්හි මහා සට්ඨිවසස තෙරුන් මෙන්. තෙරුන් වහන්සේ මරණ මංචකයෙහි හෙව බලවත් වේදනාවෙන් පෙළෙන කල්හි වසභ මහරජතුමා 'තෙරුන් බලන්නෙමියි ගොස් පිරිවෙන් දොර සිටියේ ඒ ශබ්දය අසා මෙසේ ඇසීය. මේ ශබ්දය කුමක්ද? තෙරුන් වහන්සේ වේදනාවෙන් කෑගසන ශබ්දයයි. 'පැවිද්දෙන් සැටවසකින් වේදනා පරිග්‍රහ මාත්‍රයක්වත් නොකරන ලදී. දැන් නොවඳින්නෙමියි

නැවතී මහාබෝධිය වඳින්ට ගියේය. ඉන්පසු උපස්ථායක තරුණයා තෙරුන්ට මෙසේ කීය. ස්වාමීනි, අපට ලජ්ජා කරවන්නේ ඇයි? ශ්‍රද්ධාවන්ත රජතුමා විපිළිසරව නොවඳින්නෙමියි ගියේය. 'කුමක් නිසාද ඇවැත්නි? ඔබවහන්සේ කැගසන හඬ අසා. එසේනම් මට අවකාශයක් කරවයි කියා වේදනාව මැඩපවත්වා රහත්බවට පත්ව තරුණයාට සංඥාවක් කළහ. ඇවැත්නි යන්න. දැන් රජු ලවා මා වන්දවනු මැනව. තරුණයා ගොස් 'දැන් තෙරුන් වඳිනු මැනවැ'යි කීය. රජතෙමේ සුංසුමාර පතිතයෙන් (බිම දිගාවී) තෙරුන් වඳින්නේ 'මම ආර්යයන්ගේ රහත්බවට නොවඳිමි. පෘථග්ජන භූමියෙහි සිට රක්නාලද ශීලයම වඳිමි'යි කීය. මෙසේ සීලයෙන් ප්‍රඥාව සෝදාහරී නම්. යමකුගේ අභ්‍යන්තරයෙහි ශීල සංවරය නැත්ද, උද්ඝටිතඥතාව නිසා (වහා අවබෝධ වීම) සිව්පද ගාථාවක කෙළවර ප්‍රඥාවෙන් ශීලය සෝදාහැර සිව්පිළිසිඹියා සහිත රහත්බවට පැමිණේ. මෙය ප්‍රඥාවෙන් ශීලය සෝදාහරී නම්. සන්තති මහාමතයායා මෙන්.

**කතමං පන තං බ්‍රාහමණ** යනු කුමක් නිසා කී සේක්ද? භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතූ සේක. 'බමුණන්ගේ දහමෙහි පන්සිල් ශීලයයි පනවත්. වේදත්‍රය ඉගෙනීමෙහි ප්‍රඥාව පැනේ. මත්තෙහි විශේෂයක් නොදනිත්. මම බමුණාට මත්තෙහි විශේෂභූත වූ මාර්ගශීලය, ඵල ශීලය, මාර්ග ප්‍රඥාව ඵල ප්‍රඥාවද දක්වා අර්හත්වය කුළුගන්වමින් දේශනාව නිම කරන්නෙම් නම් මැනවැයි ඉක්බිති එය කියනු කැමැත්තෙන් විචාරණ සේක් **කතමං පන තං බ්‍රාහමණ සීලං කතමා පඤ්ඤා** යයි කී සේක.

ඉක්බිති බමුණා 'මා විසින් ස්වකීය දහම අනුව ප්‍රශ්නය විසඳන ලදී. ශ්‍රමණ ගෞතමයෝ මා නැවත නවත්වා විචාරති. දැන් උන්වහන්සේ සිත සතුටුකොට විසඳීමට හැකිවේවා හෝ නොවේවා. හැකිනම් පළමුවෙන් උපන් මාගේ ලජ්ජාව බිඳී යන්නේය. නොහැකි වුවත් නොහැක්කෙමි යයි කීමෙහි දොසක් නැතැයි නැවතී භාග්‍යවතුන් වහන්සේටම බර තබමින් **එත්තක පරමාවමයං** ආදිය කීය.

**එහි එත්තකපරමා** යනු මෙපමණ ශීලප්‍රඥා යයි කීමම අපට උතුම්ය. ඒ අපි එත්තක පරම වෙමු. ඉන්පසුවට කියූ මෙහි අර්ථය නොදනිමු යන අර්ථයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ශීල ප්‍රඥාවට මුල් වූ තථාගතයන්ගේ උත්පත්තියෙහි සිට ශීලප්‍රඥාව දක්වන්ට **ඉධබ්‍රාහමණ තථාගතො** ආදිය කී සේක.

එහි අර්ථය සාමඤ්ඤඵල සූත්‍රයෙහි කියන ලද පරිද්දෙන් දතයුතුය. මේ විශේෂයයි. මෙහි ත්‍රිවිධ ශීලය 'මෙය ශීලයෙහි වෙයි' මෙසේ ශීලයම යයි පමුණුවන ලදී. ප්‍රථමධ්‍යාන ආදී චතුර්ථධ්‍යාන අර්ථ වශයෙන් ප්‍රඥා සම්ප්‍රදාවයි. මෙසේ ප්‍රඥා වශයෙන් නොපමුණුවා විදර්ශනා ආදී ප්‍රඥාවෙන් පදස්ථාන භාව මාත්‍රයෙන් දක්වා විදර්ශනා ප්‍රඥාවෙහි පටන් ප්‍රඥාව පමුණුවන ලදී.

**සවාතනාය** යනු පදයෙහි අර්ථය අද සඳහා යයි මෙහි කියූ ක්‍රමයෙන්ම දතයුතුය.

**තෙන මං සා පරිසා පරිභවෙය්‍ය** යනු ඒ නිසා ඔබ දුරදීම දැක අසුනින් නැගී සිටි කරුණින් පිරිස 'මේ සොණදණ්ඩ වයස්ගතව සිටියේ මහල්ලෙකි. ගෞතම වනාහි තරුණය. යෞවනයෙකි. මුනුබුරා තරමටවත් පමණ නොවේ. මුනුබුරු බවටවත් නොපැමිණි තමාට අසුනින් නැගී සිටියි යයි පරිභව කරන්නේය.

**ආසාතමෙතං වුට්ඨානං** යන ආදී තත්හි අවස්ථානුකූල ධර්මකථාවෙන් මෙලෝ පරලෝ අර්ථය **සන්දස්සෙත්වා** සසඳ කුසල්දහම්හි **සමාදපෙත්වා** සමාදන් කරවා ගන්වා එහි ඔහු **සමුත්තෙජෙත්වා** උත්සාහ සහිත කොට ඒ උත්සාහ අතිකුත් විද්‍යමාන ගුණයන්ගෙන් **සම්පහංසෙත්වා** සතුටුකොට දහම්රුවන් වැසි වස්වා **උට්ඨායාසනා පක්කාමි** හුනස්නෙන් නැගී ගිය සේක.

බමුණා තමා කුහක බැවින් මෙසේද භාග්‍යවතුන් වහන්සේ දම්රුවන් වැසි වස්වන කල්හි විශේෂයක් නිපදවාගන්ට නොහැකි විය. හුදෙක් ඔහුට මත්තෙහි නිර්වාණය පිණිස වාසනාභාගී වීම සඳහා සියලු පෙර පසුකථා විය.

**සොණදණ්ඩ සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

# කූටදන්ත සූත්‍ර වර්ණනාව

**එවං මෙසුතං -පෙ- මගධෙසු** යනු කූටදන්ත සූත්‍රයයි. මේ එහි අපූර්ව පද වර්ණනාවයි.

**මගධෙසු** යනු මගධ නම් ජනපදයෙහි රාජ කුමාරවරු ඔවුන්ගේ නිවාස වූ එක ජනපදයක් රූඪී ශබ්දයෙන් මගධා යයි කියනු ලැබේ. ඒ මගධ ජනපදයෙහි. මින් මතු පළමු සූත්‍ර දෙකෙහි කියන ලද ක්‍රමයමැයි.

**අම්බලට්ඨිකා** බ්‍රහ්මජාලයෙහි කියන ලද පරිදිමය. **කූටදන්තො** ඒ බමුණාගේ නම. **උපක්ඛටො** යනු සරසනු ලැබූ. **වච්ඡතර සතානි** යනු වසු පැටවුන් සියගණන්. **උරබ්භා** යනු තරුණ බැටළු පැටවු යයි කියනු ලබත්. ඔවුහු පාළියෙහි ආහ. පාළියෙහි අනාගත නොයෙක් මෘග පක්ෂීන් සත්සියය සත්සියය එක්තැන් කරන ලද්දාහු යයි දතයුතුය. සර්වසප්ත ශතික යාගය සදනු කැමැත්තේ වෙයි.

**ථූනූපනීතානි** යනු බැඳ තබනු පිණිස යූප සංඛ්‍යාත වූ යාගස්තම්භය වෙත ගෙනඑනු ලැබුවාහුය.

**පටිවසන්ති** යනු යාගය අනුභව කරනු පිණිස වාසය කරත්.

**තිවිධං** යනු මෙහි විධා යනු තැබීමයි. නිමකිරීම යන අර්ථයි.

**සොළස පරික්ඛාරං** යනු සොළොසක් පිරිවර. **භූතපුබ්බං** යනු මෙය භාග්‍යවතුන් වහන්සේ පෘථුවියේ තැබූ නිධානයක් උඩට ගෙන ඉදිරියෙහි රැස් කරන්නාක් මෙන් භවයෙන් වැසුණු පූර්ව චරිතය දක්වමින් කී සේක.

**මහාවිජිතො** යනු එය සයුර කෙළවර කොට ඇති මහා පෘථුවි මණ්ඩලය දිනීය. මෙසේ මහත් වූ විජිතය ඔහුගේනුයි මහා විජිත යයි ප්‍රකට විය.

**අඩ්ඪො** යන ආදී තන්හි යමෙක් තමා සතු වස්තුවෙන් ආඪ්‍ය වේද, මෙය හුදෙක් අඩ්ඪො පමණක් නොව මහද්ධනො ද වෙයි. මහත්

වූ අප්‍රමාණ සංඛ්‍යාත වූ ධනයෙන් යුත්. පංචකාම ගුණ වශයෙන් මහත් වූ උදාර වූ භෝග මොහුට ඇත්තේ නුයි - මහා භොගො, පිඩු පිඩු වශයෙන්ද රන්මසු රිදීමසු ආදී වශයෙන් ද මිල මුදලින් මහත් වූ බැවින් පහූත ජාතරූප රජතො. නොයෙක් කෝටි සංඛ්‍යාත වූ මිලමුදලින් යුතු යන අර්ථයි.

**විතති** යනු සන්තුෂ්ටියයි. විත්තියට උපකරණ විතතූපකරණ. තුටුකිරීම යන අර්ථයි. බොහෝ වූ නානාවිධ අලංකාර රන් රිදී ආදී භේදයෙන් යුත් විත්ත උපකරණ මොහුට ඇත්තේනුයි **පහූත විත්තූපකරණො** නම්. නිදන්කොට තැබූ සත්රුවන් සංඛ්‍යාත සියලු පූර්වාහ්න අපරාහ්න සංගෘහිත වූ ධනයෙහි මහත් බැවින් **පහූත ධන ධඤ්ඤො** මෙය ඔහුගේ දෛනික පිරිවැය දීම් ගැනීම් වශයෙන් සංසරණය වන ධන ධාන්‍ය වශයෙන් කියන ලදී. **පරිපුණ්ණ කොස කොට්ඨාගාරො** යනු කොස යයි කියනු ලබන්නේ භාණ්ඩාගාරයයි. නිදන්කොට තැබූ ධනයෙන් පිරිපුන් භාණ්ඩාගාරය. හස්ති අශ්ව රථ යනුවෙන් කෝෂ්ඨාගාරය ත්‍රිවිධය. නැතහොත් භාණ්ඩාගාරය සිව්වැදෑරුම්ය. ධන කෝෂ්ඨාගාරය, ධඤ්ඤ කෝෂ්ඨාගාරය වස්ත්‍ර කෝෂ්ඨාගාරයයි ත්‍රිවිධ වේ. ඒ සියල්ල පිරිපුන්ව ඔහුට ඇත්තේ නුයි - **පරිපුණ්ණ කොසකොට්ඨාගාර** වේ.

**උදපාදි** යනු උපන්නේය. මේ රජ එක් දවසක් රත්නාවලෝකන නමැති චර්යාවක් සඳහා නික්මී ගියේය. හේ භාණ්ඩාගාරිකගෙන් මෙසේ ඇසීය. දරුව, මේ මහා ධනය කා විසින් එකතු කරනු ලැබීද? ඔබතුමාගේ මුත්තණුවන් ආදීන් විසිනි. සත්කුල පරම්පරාවක් දක්වා මේ ධන එකතුකොට ඒ අය කොහි ගියාහුද? දේවයන් වහන්ස, ඒ සියලුදෙන මරුවසඟයට ගියාහුය. තමාගේ ධනය නොගෙනම ද දරුව? දේවයන් වහන්ස, කුමක් කියන සේක්ද? මේ ධනය හැර යායුතුමය. රැගෙන යාමක්ද නැත.

ඉක්බිති රජතෙමේ නැවතී ශ්‍රීයහන් ගබඩාවෙහි හුන්නේ අධිගතා බො මෙ ආදිය සිතීය. එහෙයින් කියන ලදී. **එවං චෙතසො පරිවිතක්කො උදපාදි.**

**බ්‍රාහමණිං ආමනෙතත්වා** යනු කුමක් නිසා ඇමතීද? මොහු මෙසේ සිතීය. 'දානය දෙන එක් පණ්ඩිතයකු සමග සාකච්ඡාකොට දෙන්ට වටී.

සාකච්ඡා කොට කරන ලද කර්මය පසුව තාපයක් ඇති නොකරයි. ඒ නිසා ඇමතීය. ඉක්බිති බමුණා මෙසේ සිතීය. මේ මහරජ දානයක් දෙනු කැමැත්තේය. ඔහුගේ ජනපදයෙහි බොහෝ හොරු සිටිති. ඔවුන් සමනය නොකොට දානය දෙනවිට කිරි ගිතෙල් සහල් ආදී දාන උපකරණ ගෙන එන්නවුන්ගේ පුරුෂයන් නැති ගෙවල් සොරු කොල්ල කති. ජනපද සොරබියෙන් ම ආකුල වන්නේය. ඉන්පසු රජුගේ දානය බොහෝකල් නොපවත්නේය. එය ඔහුට දන්වමියි ඉන්පසු ඒ බව දන්වන්නේ **භොතො ඛො රඤ්ඤො** ආදිය කීය.

එහි **සකණ්ටකො** යනු සොර කරදරයෙන් කරදර සහිත වූයේ. **පන්ථදූහනා** මංපැහැරීම, මහමග විනාශය යන අර්ථයි. **අකිච්චකාරී අස්ස** යනු නොකටයුත්තක් කරන්නෙක් අධර්මයක් කරන්නෙක් වන්නේය. **දස්සුඛීලං** යනු සොර උවදුර වධෙනවා මරණයෙන් හෝ කෙටීමෙන් හෝ බන්ධනවා දම්වැලෙන් බැඳීමෙන් හෝ ජානියා රාජසන්තක කිරීමෙන්. 'සියයක් ගනුව, දහසක් ගනුවයි මෙසේ පැවති දණ්ඩනයෙන් යන අර්ථයි. ගරහාය පන්සිළු මුඩු කිරීම, ගොමගෑම, ගෙල හිරකර බැඳීම ආදිය කොට ගර්හාවට පත් කිරීමෙන් **පබ්බජනාය** රටින් නෙරපීමෙන්, **සමූහනිස්සාම** යහපත් හේතු ඇති නීතිමය කරුණකින් ඉවතට ගෙන යන්නෙමු.

**හතාවසෙසකා** යනු මෘතාවශේෂක. **උස්සහන්ති** උත්සාහ කරති. **අනුප්පාදෙතුං** දුන් දෙය ප්‍රමාණවත් නොවන කල්හි නැවත බීජ ද බත් ද කෘෂි භාණ්ඩ ද සියල්ල දේවා යන අර්ථයි. **පාභතං අනුප්පාදෙතු** යනු සාක්ෂි නැතිව කොළයක නොලියා මූලපෙජ්ජ වශයෙන් බඩුමිල දේවා යන අර්ථයි. බඩුමිලට **පාභත** යනුවෙන් නමක් වේ.

යම්සේ කීද?

**අප්පකෙනපි මෙධාවී පාභතෙන විචක්ඛණො**
**සමුට්ඨාපෙති අත්තානං - අණුං අග්ගිංව සන්ධමං**

නුවණැති දක්ෂයා - ඉතා සුළු මුදලකින්
තමා ඔසවා තබයි - ගින්න පිඹ වැඩිකරන මෙන්

**භත්තවෙතනං** යනු දිනපතා බත් ද මාසික ආදී පිරිවැයද ඒ ඒ කුලයට කාර්යශූරත්වයට අනුව තනතුරු ගම් නියම්ගම් ආදිය දානය සමග දේවා යන අර්ථයි.

**සකම්ම පසුතා** යනු කෘෂි වාණිජ්‍ය ආදී තම කටයුතුවල යෙදුණු නියැලුණු, **රාසිකො** යනු ධනධාන්‍ය රාශිය, **ඛෙමධීතා** සොර උවදුරු රහිත, **මුදා මොදමානා** තුටුපහටු වෙමින්, පාඨය මෙයම විය හැකිය. ඔවුනොවුන් ප්‍රමුදිත සිත් ඇත්තාහු අදහස් කරන ලදී. **අපාරුත** සරා සොරුන් නැති බැවින් දොර නොවසා. විවෘතද්වාර ඇති යන අර්ථයි.

**එතදවොච** ජනපදය සර්වාකාරයෙන් සමෘද්ධිමත් බව දැන මෙය කීය. **තෙනහි භවං රාජා** බමුණා මෙසේ සිතීය. 'මේ රජ මහ දනක් දෙන්ට අතිශයින් උත්සාහ ඇත්තේය. ඉදින් තමාගේ සේවයෙහි යෙදුණු ක්‍ෂත්‍රිය ආදීන් නොවිමසා දෙන්නේ නම් ඔවුහු සතුටට පත් නොවන්නාහුය. දැන් ඔවුහු යම්සේ සතුටුවෙත්ද, එසේ කරන්නෙමි. ඒ නිසා **තෙනහි භවං** යයි කීය.

**තත්‍ථ** නෙගමා නියම්ගම් වැසියෝ. **ජානපදා** ජනපද වැසියෝ. **ආමන්තයතං** විමසාවා. දන්වාවා. **යං මමඅසස** මට ඔබගේ අනුදැනුම වන්නේය. **අමච්චා** ප්‍රිය සහායකයෝ. **පාරිසජ්ජා** සෙසු අණ කරන්නෝ. **යජතං භවං රාජා**. ඔබ යාග කරන්න. ඔවුහු මේ රජ මම ප්‍රධානියා යයි බලය යොදා දන් නොදී අපට දැන්වී යයි, කළ දේ මැනවැයි සතුටට පත්වූවාහු මෙසේ කීහ. 'නොදන්වනු ලැබූ' අය ඔහුගේ යාගස්ථානයක් බැලීමටවත් නොපැමිණියහ.

**යඤ්ඤකාලො මහාරාජ** දිය යුතු දෙයක් නැතිකල්හි මහලුකලද මෙබඳු දානයක් දෙන්ට නොහැකිය. ඔබතුමා මහා ධන ඇත්තේය. තරුණය. එයින් ඔබගේ යඥ කාලයයි දක්වමින් කියත්.

**අනුමති පක්ඛා** අනුමතියෙන් පක්‍ෂ වූවෝ. අනුමති දායකයෝ යන අර්ථයි. **පරික්ඛාරා භවන්ති** පිරිවර වෙත්. රථය ශීල පරිෂ්කාරයයි. ධ්‍යානාක්‍ෂිය චක්‍රවීර්ය යි මෙහි අලංකාර පරිෂ්කාර යයි කියන ලදී.

**අට්ඨහි අංගෙහි** දෙපසින් සුජාතයන් විසින්. **යසස** අණ තබන දක්‍ෂතාවෙන්, **සද්ධො** දානයෙහි ඵල ඇතැයි අදහයි. **දායකො** දීමෙහි ශූරයා. ශ්‍රද්ධා මාත්‍රය සමග නොසිට පරිත්‍යාග කිරීමටද හැක්කේ යන අර්ථයි.

**දානපති** යම් දානයක් දේද එහි ප්‍රධානියා වී දෙයි. දාසයකු නොවී සහායකයකු නොවී යමෙක් තමා මිහිරි දේ අනුභව කොට අනුන්ට අති මිහිරි දේ දෙයිද හේ දාන සංඛ්‍යාත දිය යුතු දෙයෙහි දාසයෙක්වැ දෙයි. යමෙක් යමක් තමා අනුභව කරයිද, එයම දෙයි. හේ සහායකයකු වී දෙයි. යමෙක් තමා කුමකින් හෝ යැපී අනුන්ට මිහිරි දේ දෙයි. හේ ජ්‍යෙෂ්ඨ ප්‍රධානියා වී, ස්වාමියා වී දෙයි. මොහු එවැන්නෙකි යන අර්ථයි.

**සමණ බ්‍රාහමණ කපණද්ධික වණිබ්බක යාචකානං** මෙහි පව් සමනය කළ ශ්‍රමණයෝ, බැහැර කළ පව් ඇති බ්‍රාහ්මණයෝ, කපණා දුගියෝ. දිළිඳු මිනිස්සු. අද්ධිකා මහමග යන්නෝ. වණිබ්බකා කැමති කාන්ත වූ මනාප වූ දෙය දුන්, සුදුසු කල්හි නිවැරදි දේ දුන්, දෙමින් සිත් පහදවයිද ඔබ බඹලොව යේවායි ආදී ක්‍රමයෙන් දානයෙහි ගුණ ස්තුති කරමින් හැසිරෙත්ද ඔවුහු.

**යාචකා** මිටක් පමණ දෙන්න, හැන්දක් පමණ දෙන්න යනාදිය කියා හිඟමින් හැසිරෙත්ද ඔවුහු, **ඔපානභූතො** දිය පොකුණක් වූ, සියලු දෙනාගේ සාධාරණ පරිභෝගය පිණිස සිව්මංසලෙහි කැණූ පොකුණක් මෙන් වී යන අර්ථයි.

**සුතජාතසස** ඇසූ දෙයම සුතජාතය. **අතීතානාගත පච්චුප්පනෙන අත්‍ථෙ ජනෙතුං** මෙහි අතීතයෙහි පින් කළ බැවින්ම මාගේ මේ සම්පත්තිය යැයි මෙසේ සිතමින් අතීතාර්ථ සිතන්ට ප්‍රතිබල ඇත්තේ නම් වෙයි. දැන් පින් කරම සම්පත්තියට පැමිණීමට හැකියයි සිතමින් අනාගත අර්ථය සිතන්ට ප්‍රතිබල ඇත්තේ වෙයි. මේ පින්කම නම් සත්පුරුෂයන් විසින් පුරුදු කරන ලද්දකි. මාගේද භෝගයෝ ඇත. දෙනු කැමති සිතද ඇත. දැන් මම පින් කිරීම මැනවැයි සිතමින් වර්තමාන අර්ථය සිතන්ට ප්‍රතිබල ඇත්තේ වෙතියි දතයුතුය.

**ඉති ඉමානි** මෙසේ මේවා කියූ පරිදිම වේ. මේ අටඟින් යුතු වූවහුගේ දානයට සියලු දෙසින් මහජනයා එළඹෙති. මොහු අපිරිසිදු ජාතිකයෙකි. කොපමණ කලක් දන් දේද? දැන්ම විපිළිසරව කඩාබිඳ දමන්නේය. මේ ආදිය සිතා කිසිවකු නොඑළඹිය යුතුයයි හඟියි. ඒ නිසා මේ අටඟ පිරිකර වෙතියි කියන ලදී.

**සුජං පගඞ්හනතානං** මහා යාගය පිළිගන්වන තැන දන් හැන්ද අල්ලා ගන්නවුන්ට **ඉමෙහි චතුහි** මේ සුජාත බව ආදියෙන් මේවා ඇතිකල්හි මෙසේ අපිරිසිදු ජාති ඇත්තකුගේ සංවිධානයෙන් පැවති දානය කොපමණ කලක් පවතින්නේදැයි ආදිය කියා එළඹෙන්නෝ නැත. ගර්හා කටයුතු බැවින් එළඹෙත්මය. ඒ නිසා **ඉමානිපි පරික්ඛාරානි භවන්ති** යයි කියන ලදී.

**තිසෙසා විධා දෙසෙසි** අවධාන තුනක් දේශනා කළ සේක. හේ මෙසේ සිතීය.. දන් දෙන්නෝ තුන් තැනකින් එක්තැනක සැලෙත්. මම රජු ඒ තැන්වලින් පළමුවැන්නේ දීම නිශ්චල කරමි. එහෙයින් ඔහුට තුන් ක්‍රමයක් දේශනා කළ සේක.

**සො භොතො රඤ්ඤෝ** මෙය කරණාර්ථයෙහි ෂෂ්ටි වචනයි. **භොතා රඤ්ඤා** යනුවෙන් ද පාඨයක් වෙයි.

**විප්පටිසාරො න කරණීයො** භෝග විගමනය හේතුකොට ගත් පසුතැවිල්ල නොකළ යුතුය. පූර්ව චේතනාව නො සොල්වා පිහිටුවාගත යුතුය. මෙසේ දාන මහපල දෙන්නක් වේ යයි දක්වයි. ඉතිරි දෙතැනද මේ ක්‍රමයමැයි. මුඤ්චන චේතනාව ද පසුව අනුස්මරණය කරන චේතනාවද නිශ්චලවම කළ යුතුය. එසේ නොකරන්නහුගේ දානය මහපල ගෙන දෙන්නේ නොවේ. උදාර භෝගයන්හි සිත නොනැමේ. මහා රෝරුව නිරයෙහි උපන් සෙට්ඨි ගහපතියා ගේ මෙන්.

**දසහාකාරෙහි** කරුණු දහයකින් ඔහුට මෙසේ සිත්විය. ඉදින් මේ රජ දුසිලුන් දැක 'මෙවැනි දුසිලුන් අනුභව කරන මාගේ දානය නැසෙන්නේ යයි සිල්වතුන් කෙරෙහිද විපිළිසර උපදවා ගත්තේ ය. දාන මගපල දෙන්නේ නොවේ. විපිළිසර නම් ප්‍රතිග්‍රාහකයාගෙන් දායකයන්ට

උපදින්නේය. මොහුගේ විපිළිසර පළමුවම නැතිකරමි. ඒ නිසා එය දස අයුරකින් උපදින්ට යුතුයයි ප්‍රතිග්‍රාහකයන් කෙරෙහි විපිළිසර නැති කළ සේක.

**තෙසං යෙව තෙන** ඔවුන්ට ඒ පවින්ම අනිටු විපාක වන්නේය. අන්‍යයන්ට නොවේ යයි දක්වයි. **යජතංභව** පින්වත දෙව. **යජතු** යනු බෙදා දෙනු මැනව. **අනතරං** අභ්‍යන්තරය.

**සොළසහි ආකාරෙහි විතතං සන්දසෙසසි** මෙහි බමුණා රජුගේ මහා දානයෙහි අනුමෝදනාව ඇරඹීය. එහි **සන්දසෙසසි** 'මේ දානය දෙන්නා මෙබඳු සම්පත් ලබති'යි දක්වා දක්වා කීය.

**සමාදපෙසි** ඒ අර්ථය ගෙන්වා ගන්වා ගන්වා කීය.

**සමුතෙතජෙසි** විපිළිසර නැතිකිරීමෙන් ඔහුගේ සිත සෝදා හළ සේක. **සමපහංසෙසි** මහරජ දන් දෙන ඔබ විසින් සොඳුරු දෙයක් කරන ලද්දේ යයි ස්තුති කරමින් කීය. **වතතා ධමමතො නත්‍ථි** දැහැමෙන් සෙමෙන් කරුණු දක්වා කියන්නෙක් නැත.

**නරුකඛා ඡිජ්ජිංසු යූපත්‍ථාය නදබ්බා ලූයිංසු බරිහිසත්‍ථාය** යූප නමැති මහටැම් ඔසවා අසුවල් රජ, අසුවල් ඇමතියා, අසුවල් බ්‍රාහ්මණයා, මෙබඳු මහා යාගයක් කළේ යයි නම ලියා තබත්. කුසතණ කපා වනමල්ය යන හැඟීමෙන් යාග ශාලාව වට කරත්. බිම ද අතුරත්. ඔවුහු ගස් නොකැපූහ. කුසතණ නොකැපූහ. කෙසේ වුවත් හරකුන් හෝ එළුවන් ආදීන් හෝ මරන්නාහු යයි දක්වයි.

දාසා අනෙතාජාත ආදීහු **පෙසසා** පළමුව මුදල් ගෙන වැඩ කරන්නෝ. **කමමකරා** බත් වැටුප් ගෙන වැඩ කරන්නෝ.

**දණ්ඩතජ්ජිතා** දඬු යටි මුගුරු ආදිය ගෙන 'වැඩ කරවු කරවු' යයි මේ අයුරින් තර්ජනය කරනු ලැබුවෝ. **භයතජ්ජිතා** 'වැඩ කරනවා නම් කරව, නොකරනවා නම් කපන්නෙමි. බැඳ දමන්නෙමි. මරන්නෙමි ආදි වශයෙන් භයෙන් තර්ජනය කරනු ලැබුවෝ. මොවුහු දඬුවෙන් තර්ජනය කරනු ලැබුවෝ නොවෙති. භයෙන් තර්ජනය කරනු ලැබුවෝය. **නඅසසුමුඛා**

රුදමානා පරිකම්මානි අකංසු, ඉක්බිති ප්‍රිය වචනයෙන්ම කථා කරමින් කළාහුය. එහි දාසයා දාසයෙකැයි ද පෙසසයා පෙසසා කියාද, කම්කරුවා කම්කරුවා කියාද කථා නොකරත් නම් වශයෙන්ම ප්‍රිය වචනයෙන්ද කථාකොට ස්ත්‍රීපුරුෂ ශක්තිමත් දුර්වල වූවන්ට සුදුසු වූම වැඩක් පෙන්වා මේ මේ දේ කරන්න යයි කියත්. ඔවුහුද තමන්ට රිසි පරිදි කරත්. එහෙයින් කියන ලදී. **යෙ ඉච්ඡිංසු තෙ අකංසු යෙ නඉච්ඡිංසු නතෙ අකංසු. යං ඉච්ඡිංසු තං අකංසු. යං නඉච්ඡිංසු නතං අකංසු** යැයි.

**සපපි තෙල නවනීත දධි මධු ඵාණිතෙන චෙව සො යඤ්ඤො නිට්ඨානං අහමාසි** රජතෙමේ බිහි නුවර සිව්දොරද ඇතුළු නුවරද නගර මධ්‍යයේද යන පස්තැන මහදන් හල් කරවා එක් එක් ශාලාවට සියදහසක් සියදහසක් කොට දිනපතා පන්සිය දහසක් වියදම්කොට හිරු උදාවෙහි සිට ඒ ඒ කලට අනුරූප වූ දෙයින් සියතින් රන් හැන්දක් ගෙන ප්‍රණීත වූ ගිතෙලින් තෙලින් ආදියෙන් සම්මිශ්‍රණය වූ කැඳ කැවුම් බත් ව්‍යඤ්ජන පාන ආදියෙන් මහජනයා සන්තර්පණය කළේය. භාජන ආදිය පුරවාගෙන යාමට කැමැත්තවුන්ට එසේ දෙවීය. සවස් කාලයෙහි වස්ත්‍ර ගන්ධමාලා ආදියෙන් පූජා කළේය. ගිතෙල් ආදියෙන් මහසැළි පුරවා යමෙක් අනුභව කරනු කැමැත්තේ නම් හේ අනුභව කෙරේවායි නොයෙක් සියගණන් තැන්වල තැබ්බවීය. ඒ සඳහා කියන ලදී. **සපපිතෙලනවනීත දධිමධු ඵාණිතෙන චෙව සො යඤ්ඤො නිට්ඨානමගමාසි** යනුවෙන්.

**පහූතං සාපතෙය්‍යං ආදාය** බොහෝ ධනය ගෙන, ඔවුහු මෙසේ සිතූහ. මේ රජ ගිතෙල් තෙල් ජනපදයෙන් නොගෙන්වා තමා සතු වූ දෙයටම ඉවතට ගෙන මහදන් දෙයි. රජ අප ලවා කිසිවක් නොගෙන්වයි. නිහඬව සිටීම යුතු නැතැයි රජුගේ මැදුරෙහි ධනය ක්‍ෂය නොවන ස්වභාව ඇත්තේ නොවේ. අප දන් නොදෙන කල්හි කවරෙක් රජුට දෙන්නේද අපි ඔහුට ධනය ගෙනයමුයි ඔවුහු ගමින් නියම්ගමින් නගරයෙන් ධනය එකතුකොට ගැල් පුරවා රජුට ගෙනවුත් දුන්හ. ඒ සඳහා **පහූතං සාපතෙය්‍යං** ආදිය කීය.

**පුරත්ථිමෙන යඤ්ඤවාටසස** පෙරදිග නුවර දොර දන්හලෙහි පෙරදිග කොටසෙහි, යම්සේ පෙරදිගින් එන ක්‍ෂත්‍රියයෝ දන්හලෙහි කැඳ බී රජුගේ දන්හලෙහි අහර අනුභවකොට නුවරට පිවිසෙත්ද, එබඳු තැනක තැබූහ.

**දක්ඛිණේන යඤ්ඤාවාටස්ස** දකුණු නුවර දොර දන්හලෙහි කියන ලද ක්‍රමයෙන්ම දකුණුදිග කොටසෙහි තැබූහ. බටහිර උතුරු දිසාවන්හිද මේ ක්‍රමයමැයි.

**අහෝ යඤ්ඤා** බමුණෝ ගිතෙල් ආදියෙහි අවසානයට යන බව අසා ලෝකයෙහි යමක් මිහිරිද එයම ශ්‍රමණ ගෞතමයෝ කියති. ඔහුගේ යාගය පසසමුයි තුටු සිතැත්තෝ පසසමින් මෙසේ කීහ.

**තුණ්හී නිසිනෙනා හොති** මත්තෙහි කිවයුතු අර්ථය සිතමින් නිහඬවම හුන්නේ වෙයි. **අභිජානාති පන භවං ගොතමො** මෙය බමුණා ගෞරවයෙන් අසන්නේ කීය. අන් අයුරකින් 'පින්වත් ගෞතමයෙනි, ඔබ එකල්හි රජ වීද, නැතහොත් පුරෝහිත බමුණෙක් වීදැයි මෙසේ කෙළින්ම අසනවිට අගෞරවයක් මෙන් වෙයි.

**අත්‍ථිපන භො ගොතම** මෙය බමුණා සියලු දඹදිව් වැසියන් උනන්දුවෙන් දන්දීම ගෞරවයකි. මුළු ජනපදයම තම කටයුතු නොකරන්නේ නැසෙන්නේය. අපටත් මේ යාගය හැර අල්ප උත්සාහයක් ඇති වඩා මහත්ඵල දෙන අන් යාගයක් ඇත්දැයි මේ කරුණ අසන්නේ කීය.

**නිච්චදානානි නිතර** දෙන දානය, නිතිබත්. **අනුකුලයඤ්ඤානි** අපගේ පියමුතු ආදීන් විසින් පවත්වන ලද්දක් කොට පසුව දුගී පුරුෂයන් විසින්ද වංශ පරම්පරාවෙන් පැවැත්විය යුතු යාග මෙවැනි දන් සිල්වතුන් උදෙසා දෙන නිබඳ දන්ය. පවුල්වල දිළින්දෝ ද කඩ නොකරති. මේ මෙහි කථාවකි. අනේපිඬුගේ ගෙයි පන්සියයක් නිති බත් දෙනු ලැබීය. ඇත් දතින් කළ සලාක පන්සියයක් විය. ඉක්බිති ඒ පවුල ක්‍රමයෙන් දිළිඳු බැවින් මිරිකිණ. ඒ පවුලෙහි එක් දැරියක් එක් සලාකයකට වඩා දීමට නොහැකි වූවාය. ඇයද පසුව කමත පිරිසිදුකොට ලබාගත් ධාන්‍යයෙන් ඒ සලාකය දුන්නාය. එක් තෙර කෙනෙක් රජුට දැන්වීය. රජ ඇය ගෙන්වා අගමෙහෙසුන් තනතුරෙහි තැබීය. එතැන් පටන් නැවතත් සලාක පන්සියයක් පැවැත්වූවාය.

**දණ්ඩප්පහාරා** පිළිවෙළට සිටිවු. සිටුවා. කෙළින් ගොස් ගනිවු ගනිවු ආදිය කියා දෙනු ලබන දන. **දණ්ඩප්පහාරාපි ගලග්ගාහාපි දිස්සන්ති.**

**අයං ඛො බ්‍රාහමණ හෙතු -පෙ- මහානිසංස තරා** මෙහි යම්හෙයකින් මහා යාගය මෙන් මේ සලාක බතින් බොහෝ වතාවත් කරන්නවුන්ගෙන් හෝ උපකරණවලින් ප්‍රයෝජනයක් ඇත්ද ඒ නිසා එය අඩු කරදර ඇත්තකි. යම්හෙයකින් මෙහි බොහෝදෙනෙකුට කාර්ය නැවැත්ම වශයෙන් පීඩා සංඛ්‍යාත හානියක් ඇත්ද, ඒ නිසා එය අල්ප හානි ඇත්තකි. යම්හෙයකින් මෙය සංඝයාට පූජා කරන ලද්දකි. පරිත්‍යාග කරන ලද්දකි. ඒ නිසා යාගයයි කියන ලදී. යම්හෙයකින් අංග සයකින් යුත් දක්ෂිණාවෙන් මහ සමුද්‍ර ජලය මෙන් පුණ්‍ය විපාකය ප්‍රමාණ කිරීමට නොහැකිද, මෙයද එබඳුය. ඒ නිසා **මහප්ඵලතරංච මහානිසංස තරංච** යනුවෙන් දතයුතුය.

මෙය අසා බමුණා මෙසේ සිතීය. මේ නිති බත උනන්දුවෙන් කරන්නහුගේ දිනෙන් දින කර්මාන්ත නැසේ. අලුතින් අලුතින් උත්සාහ කළයුත්තේ වෙයි. මීට වඩා අඩු කරදර ඇති අල්පහානි ඇති වෙනත් යාගයක් ඇත්ද, ඒ නිසා **අත්ථිපන භොගොතම** ආදිය කීය. එහි සලාක බතෙහි කටයුතුවල කෙළවරක් නැති බැවින් එකකු විසින් උනන්දුවෙන් වෙනත් කටයුත්තක් නොකොට සංවිධානය කළයුතුමය. විහාර දානයෙහි කාර්යවල කෙළවරක් ඇත. පන්සලක් කරවන්ට කෝටිගණන් ධනය වියදම්කොට මහා විහාරයක් හෝ එක්වරක් ධන පරිත්‍යාග කර කරන කරවන්ට හත්අට වසක්, වස් සියයක්, වස් දහසක් යේමය. හුදෙක් දිරාගිය තැන් ප්‍රතිසංස්කරණය කිරීම් මාත්‍රයක්ම කළයුතු වෙයි. ඒ නිසා මේ විහාර දානය සලාක දානයට වඩා අඩු කරදර ඇත්තකි. අල්ප හානි ඇත්තකි. යම් හෙයකින් මෙහි සූත්‍ර අවසානයෙහි 'සීතසස පටිඝාතාය' ආදි ආනිසංස නවයක් කියන ලදී. ඛන්ධක පිළිවෙළින්,

**සීතං උණ්හං පටිහනති - තතොවාල මිගානිච**
**සිරිංසපෙච මකසෙ - සිසිරෙචාපි වුට්ඨියො**

සිසිලද උණුසුමද - නපුරුවන සතුන්ද
උරගයන් මකුණන් - සිසිරයෙහි වැසිද වළක්වයි.

**තතො වාතා තපො සොරො - සඤ්ජාතොපටිහඤ්ඤති**
**ලෙනත්ථංච සුඛත්ථංච - ඣායිතුංච විපස්සිතුං**

හටගත් දරුණු කුණාටු හිරුකිරණ නසයි
රැකුම හා සුව පිණිස - සිතන්නට දකින්නට

විහාරදානං සංඝස්ස - අග්ගං බුද්ධෙන වණ්ණිතං
තස්මාහි පණ්ඩිතො පොසො - සම්පස්සං අත්ථමත්තනො

සඟුනට වෙහෙර දානය - බුදුන් විසින් පැසැසිණ
එහෙයින් තම දියුණුව දකින - නුවණැති පුරුෂයා

විහාරෙ කාරයෙ රම්මෙ - වාසයෙත්ථ බහුස්සුතෙ
තෙසං අන්නංච පානඤ්ච - වත්ථසෙනාසනානිච

මනරම් වෙහෙර කරවා - උගතුන් එහි වසවන්න
ඔවුනට අහර පැන් - වත් සෙනසුන්

දදෙය්‍ය උජු භූතෙසු විප්පසන්නෙන චෙතසා
යෙතස්ස ධම්මං දෙසෙන්ති - සබ්බදුක්ඛා පනූදනං
යං සො ධම්මං ඉධඤ්ඤාය - පරිනිබ්බාති අනාසවො

පැහැදුණු සිතින් - ඉඳු ගති ඇති භික්‍ෂූන්ට දෙන්න
ඔව්හු එහි වැස - සියලු දුක් නසන දහම් දෙසත්
ඒ දහම් දැන කෙලෙසුන් නසා පිරිනිවනට යයි

ආනිසංස දහ හතක් කියන ලදී. ඒ නිසා මෙසේ සලාක බතට වඩා මහප්ඵලතරංච - මහපල ඇති බවද, මහානිසංසතරංච - මහ අනුසස් ඇති බවද දතයුතුය. සංඝයාට පරිත්‍යාග කරන ලද බැවින් යාගයැයි කියනු ලැබේ.

මෙයද අසා බමුණා මෙසේ සිතීය. ධනය පරිත්‍යාගකොට විහාර දානය දුෂ්කරය. තමා සතු අඩ මස්සක් පවා අනුන්ට පරිත්‍යාග කිරීම අමාරුය. මම දැන් ඊටත් වඩා අඩු කරදර ඇති යාගයක් ගැන අසන්නෙමියි ඉන්පසු එය විමසන්නේ අත්ථිතෙ භො ආදිය කීය.

එහි යම්හෙයකින් එක්වරක් විහාරය පරිත්‍යාග කළවිට නැවත නැවත කැඩුණු බිඳුණු තැන් ප්‍රතිසංස්කරණය ආදි වශයෙන් කළයුතු දෙයක් ඇත. සරණය වනාහි එක් භික්ෂුවක හමුවෙහි සංඝයාගේ හෝ ගණයා හමුවෙහි එක්වරක් ගත් දෙය ගන්නා ලද්දේම වෙයි. එහි නැවත නැවත කළයුත්තක් නැත. ඒ නිසා එය විහාර දානයට වඩා අඩු කරදර ඇත්තේය. අල්ප හානි ඇත්තේය. යම්හෙයකින් සරණාගමනය නම් තෙරුවනට ජීවිත පරිත්‍යාගයෙන් හටගත් පින ශක්‍ර සම්පත් දෙයිද ඒ නිසා මහප්ඵලතරංච මහානිසංස තරංච යැයි දතයුතුය. තෙරුවනට ජීවිත පරිත්‍යාග වශයෙන් යාග යයි කියනු ලැබේ.

මෙය අසා බමුණා මෙසේ සිතීය. තමාගේ ජීවිතය පරිත්‍යාග කිරීම දුෂ්කරය. මීටත් වඩා අඩු කරදර ඇති යාගයක් ඇත්ද? ඉන්පසු එය විචාරන්නේ නැවත අත්‍ථිපන භෝ ආදිය කීය.

එහි පාණාතිපාතා වෙරමණී ආදී තන්හි වෙරමණී යනු වෙන්වීමයි. එය තෙවැදෑරුම් වෙයි. සම්පත්ති විරති සමාදාන විරති, සෙතුඝාත විරති යනුවෙන්. එහියමෙක් සිල් පද නොගෙන වුවත් හුදෙක් තමාගේ ජාති ගෝත්‍ර කුල ප්‍රදේශ ආදිය සිහිකොට 'මෙය මට සුදුසු නොවේ' යැයි ප්‍රාණඝාත ආදිය නොකරයි. පැමිණි දෙයක් ප්‍රයෝජනයට ගනී. එයින් දුරින් දුරුවෙයි. ඔහුගේ ඒ විරතිය සම්පත්ත පටිවිරතියයි දතයුතුය. 'අද පටන් ජීවිතය ගියත් පණ නොනසමියි හෝ ප්‍රාණඝාතයෙන් වෙන් වෙමි කියා හෝ 'විරමණය සමාදන් වෙමි කියා හෝ මෙසේ සිකපද ගන්නහුගේ විරතිය සමාදාන විරති යි දතයුතුය. ආර්ය ශ්‍රාවකයන්ගේ මාර්ග සම්ප්‍රයුක්ත විරතිය සෙතු ඝාත විරති නම් වේ. එහි මුලින් කී විරති දෙක ජීවිතයෙන් වෙන්කිරීම් ආදී වශයෙන් ඉක්මවා යා යුතු ජීවිතේන්ද්‍රිය වස්තුව අරමුණුකොට පවතී. පසුව කියූ විරතිය නිර්වාණය අරමුණු කොට ඇත්තේය.

මෙහිද යමෙක් සිකපද පස එකට ගනීද, ඔහුට එකක් බිඳුණු කල්හි සියල්ල බිඳුණේ වෙයි. යමෙක් එක එක වෙනම ගනීද, ඔහු යමක් ඉක්මවා යාද එයම බිඳෙයි. සෙතුඝාත විරතියෙහි බිඳීමක් නැත. භවාන්තරයෙහිද ආර්ය ශ්‍රාවකයා ජීවිතය ගියත් ප්‍රාණයක් නොනසයි. සුරාපානය නොකරයි. ඉදින් සුරාවද කිරිද මිශ්‍රකොට මුවෙහි බහාලුවත් කිරිම පිවිසෙයි. සුරාව නොවේ. එසේ වන්නේ ඇයි? යම්සේ

කොස්වාලිහිණියන්ට කිරිමිශ්‍ර ජලයෙහි ජලය නොව කිරීම පිවිසේද මෙය උපතේදීම සිදුවන්නක් නම් මෙයද ස්වභාව ධර්මයෙන්ම සිදු වූවකැයි දතයුතුයි.

යම්හෙයකින් සරණාගමනයෙහි දෘෂ්ටිය ඍජු කිරීම බැඳුරුම් වන්නේද, ශික්ෂාපද සමාදානයෙහි විරති මාත්‍රයක්ම වේද, ඒ නිසා ඒ වූ පරිදි ගන්නහුට යහපත් සේ ගන්නහුටද අඩු කරදර ඇත්තක්ද, අල්ප හානි ඇත්තක්ද වේ. පන්සිල් සමාන දානයක් නැති බැවින් මෙහි මහත්ඵල ඇති බවද, මහානිසංස ඇතිබවද දතයුතුය. මෙය කියන ලදී. මහණෙනි, දාන පසක් වෙයි. අග්‍ර වූද දිගුකල් පැවතියා වූද වංශ පරම්පරාවෙන් ආවා වූද පැරණි වූද අසංකීර්ණ වූද අසංකීර්ණ නොවූ විරූද, සැක නොකෙරේ ද සැක නොකරවාද, ශ්‍රමණයන් විසින්ද, බ්‍රාහ්මණයන් විසින්ද, ඥානවන්තයන් විසින්ද, පිළිකුල් නොකරන ලද්දා වූද මහාදාන පසකි. ඒ පස මොනවාද? මහණෙනි, මෙහි ආර්ය ශ්‍රාවකයා ප්‍රාණඝාතය හැරදමා ප්‍රාණඝාතයෙන් වෙන් වූයේද, ප්‍රාණඝාතයෙන් වෙන් වූ ආර්ය ශ්‍රාවකයා අප්‍රමාණ වූ සත්ත්වයන්ට අභයදානය දෙයි. අවෛරය දෙයි. අව්‍යාපාදය දෙයි. අප්‍රමාණ වූ සත්ත්වයන් අභය දී අවෛරය දී අව්‍යාපාදය දී අප්‍රමාණ වූ අභයට, අවෛරයද, අව්‍යාපාදයට කොටස් කරුවෙක් වෙයි. මහණෙනි, මෙයද ප්‍රථමදානයයි. මහාදානයයි. -පෙ- ඥානවන්තයන් විසින් නැවතද මහණෙනි, ආර්ය ශ්‍රාවකයා අදින්නාදානය අත්හැර -පෙ- කාම මිථ්‍යාචාරය අත්හැර -පෙ- මුසාවාදය අත්හැර -පෙ- සුරාමේරය මජ්ජපමාදට්ඨානය අත්හැර -පෙ- මහණෙනි, මේ පංචදානයෝ මහා දානයෝ -පෙ- ඥානවන්තයන් විසින්.

මේ ශීල පංචකය 'ආත්ම ස්නේහයද, ජීවිතයද පරිත්‍යාග කොට රකින්නෙමියි සමාදන් වූ බැවින් යාගයයි කියනු ලැබේ. එහි පංචශීලයට වඩා සරණාගමනය ජ්‍යෙෂ්ඨ වේද, මෙය සරණයයි පිහිටා රක්නා ශීල වශයෙන් මහත්ඵල ඇත්තේ යයි කියන ලදී.

බමුණා මෙයද අසා මෙසේ සිතීය. පංචශීලය රැකීම ගරුය. අන් කිසිවක් මෙබඳුම වී ඊට වඩා අඩු කරදර ඇති මහත්ඵල ඇත්තේද? ඉන්පසු එය විචාරන්නේ නැවතද අත්ථිපන හොති ආදිය කීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධශීල පාරිශුද්ධියෙහි සිටියහුගේ ප්‍රථමධ්‍යාන ආදී යාගයන්ගේ අඩු කරදර බවද මහත්ඵල බවද දක්වනු කැමති සේක් බුද්ධෝත්පාදයෙහි පටන් දේශනාව අරඹමින් ඉධ බ්‍රාහ්මණ ආදිය කී සේක.

එහි යම්හෙයකින් යට කියන ලද ගුණයන්ගෙන් යුක්ත වූයේ ප්‍රථමධ්‍යානය ප්‍රථමධ්‍යානාදියෙහි සිටියේ, දෙවැනි ධ්‍යානාදිය උපදවන්නේ වෙහෙසට පත් නොවේද ඒ නිසා ඒවා අඩු කරදර ඇත්තේද අල්පහානි ඇත්තේද වේ. යම්හෙයකින් ප්‍රථමධ්‍යානය එක් කල්පයක් බ්‍රහ්මලෝකයෙහි ආයුෂ දේද, දෙවැන්න කල්ප අටකද, තෙවැන්න කල්ප හැටහතරකද, සිව්වැන්න කල්ප පන්සියයකද දෙයි. ආකාසානඤ්චායත ආදි සමාපත්ති වශයෙන් භාවිතා කරන ලද්දේ කල්ප විසිදහසකද, හතළිස් දහසකද, සැටදහසකද අසූහතර දහසකද ආයුෂ දෙයිද ඒ නිසා මහත්ඵලද මහානිසංසද වේ. නීවරණ ආදීන්ගේ සතුරුධර්ම පරිත්‍යාග කරන ලද බැවින් එය ත්‍යාගයැයි දතයුතුය. විදර්ශනා ඥානයද යම්හෙයකින් චතුර්ථධ්‍යාන අවසාන ගුණයන්හි පිහිටා උපදවන්නේ වෙහෙසට පත් නොවේද ඒ නිසා අඩු කරදර ඇත්තේය. අල්ප හානි ඇත්තේය. විදර්ශනා සුඛය හා සමාන සුඛය නැතිවීමෙන් මහත්ඵලය. සතුරු කෙලෙස් අත්හැරීමෙන් යඥ වේ. යම්හෙයකින් මනෝමය ඍද්ධියද විදර්ශනා ඥානයෙහි පිහිටා උපදවන්නේ වෙහෙසට පත්නොවේද ඒ නිසා අඩු කරදර ඇත්තේය. අල්පහානි ඇත්තේය. තමා හා සමාන රූප නිර්වාණය කිරීමට සමර්ථ බැවින් මහත්ඵලය. එයම සතුරු කෙලෙස් අත්හැර දැමීමෙන් යඥ වෙයි. යම්හෙයකින් ඍද්ධිවිධ ඥාන ආදියද මනෝමය ඥාන ආදියෙහි පිහිටා උපදවන්නේ වෙහෙසට පත් නොවේද ඒ නිසා අඩු කරදර ඇත්තේය. අල්ප හානි ඇත්තේය. තම තමාගේ සතුරු කෙලෙස් ප්‍රහාණයෙන් යඥ වේ. මෙහි ඍද්ධිවිධ ඥානය නානාවිධ විකුර්වණ දැකීමෙහි සමත් බැවින්ද, දිබ්බසෝතය දෙව් මිනිසුන්ගේ ශබ්ද ශ්‍රවණය කිරීමෙහි සමත් බැවින්ද, චෙතොපරිය ඤාණය අනුන්ගේ දහසය වැදෑරුම් සිත් දැනීමෙහි සමත් බැවින්ද, පුබ්බෙ නිවාස අනුසසති ඤාණය කැමති කැමති තැන් සිහි කිරීමෙහි සමත් බැවින්ද, දිබ්බචක්ඛු ඤාණය කැමති කැමති රූප දැක්මෙහි සමත් බැවින්ද, ආසවක්ඛය ඤාණය අතිප්‍රණීත ලෝකෝත්තර මාර්ග සුඛ ඉපදවීමෙහි සමත් බැවින්ද මහත්ඵලයයි දතයුතුය.

යම්හෙයකින් රහත්බවට වඩා විශිෂ්ටතර වූ අනෙක් යාගයක් නම් නැත්ද එබැවින් රහත්බව කුළුගැන්වීමෙන්ම දේශනාව සමාප්ත කරන සේක් **අයං බො බ්‍රාහමණ** ආදිය කී සේක.

**එවං වුතෙත** මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද කල්හි දේශනාවෙහි පැහැදී සරණ යාමට කැමති කූටදන්ත බමුණා මෙය **අභික්කන්තං භොගොතම** ආදී වචන කීය.

**උපවායනං** එළඹ සිරුරු වෙහෙස නිවාගන්නේ සිහින් සිසිල් වාතය හමාවා. මෙය කියා බමුණා පුරුෂයකු යැවීය. 'යව දරුව, යාග වළට බැස ඒ සියලු ප්‍රාණීන් බන්ධනයෙන් මුදව' හේ මැනැවැයි පිළිවදන් දී එසේ කොට පැමිණ පින්වත ඒ ප්‍රාණීහු මුදාහරින ලද්දාහු යයි දැන්වීය.

බමුණා එපුවත නොඇසූ තාක් කල් භාග්‍යවතුන් වහන්සේ ධර්මදේශනා කළ සේක. කුමක් නිසාද යත්, බමුණාගේ සිතෙහි අවුල් බවක් ඇත්තේ යයි අසා ඔහුගේ 'මා විසින් බොහෝ ප්‍රාණීහු මුදාහරින ලද්දෝ යයි චිත්තවාරය ප්‍රසාදයට පත්විය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ මනස ප්‍රසන්න වූ බව දැන ධර්මදේශනාව ආරම්භ කළ සේක. ඒ සඳහා **අථබො භගවා** ආදිය කියන ලදී. නැවත **කලල චිත්තං** ආදී අනුපූර්ව කථා ආනුභාවයෙන් විෂ්කම්භනය වූ නීවරණ ඇති බව සඳහා කියන ලදී. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේම ය.

**කූටදන්ත සූත්‍ර වර්ණනාව මෙසේ නිමියේ ය.**

# මහාලි සූත්‍ර වර්ණනාව

**එවං මෙ සුතං -පෙ- වෙසාලියං** යනු මහාලි සූත්‍රයයි. මේ එහි අපූර්ව පද වර්ණනාවයි.

**වෙසාලියං** නැවත නැවත විශාලභාවයට පැමිණෙන බැවින් වෙසාලී යයි ලදනම් ඇති නගරයෙහි. **මහාවනෙ** පිටනුවර හිමාලය සමග ඒකාබද්ධව සිටි ඉබේ හටගත් වනයක් ඇත. යමක් මහත් බව නිසාම මහා වනයයි කියනු ලැබේද ඒ මහා වනයෙහි. **කූටාගාර සාලායං** ඒ වනලැහැබෙහි සංඝාරාමයක් පිහිටවූහ. එහි කර්ණිකාවක් යොදා ටැම් මත කූටාගාර ශාලා එක්කොට දෙව් විමනක් බඳු ප්‍රාසාදයක් කළාහුය. ඒ සඳහා මුළු සංඝාරාමයම කූටාගාර ශාලායයි හැඳින්විණ. භාග්‍යවතුන් වහන්සේ ඒ වෙසාලි නගරය ආශ්‍රය කොට ඒ සංඝාරාමයෙහි වැඩවසන සේක. එහෙයින් කියන ලදී. **වෙසාලියං විහරති මහාවනෙ කූටාගාර සාලායං** යනුවෙන්.

**කොසලකා** කොසොල්රට වැසියෝ. **මාගධකා** මගධ රටවැසියෝ. **කරණීයෙන** අවශ්‍යයෙන් කළයුතු කාර්යයකින් යමක් නොකිරීමට ද වටීද එය කිච්ච යයි කියනු ලැබේ. යමක් අවශ්‍යයෙන්ම කළයුතුනම් එය කරණීය නම්.

**පතිසල්ලානො** භගවා නොයෙක් අරමුණු හැසිරීමෙන් ඉවත්ව ක්‍රියාශීලීව සැඟවුණේ. හුදෙකලා බවට පැමිණ හුදෙකලා අරමුණෙහි ධ්‍යාන රතිය අනුභව කරයි යන අර්ථයි. **තත්ථෙව** ඒ විහාරයෙහිම. **එකමන්තං** උණුසුම් තැනින් ඉවත්ව ඒ ඒ රුක්සෙවනවල හුන්නාහුය.

**ඔට්ඨද්ධො** තොලින් අඩක් ඇති බැවින් මෙසේ ලද නම් ඇති.

**මහතියා ලිච්ඡවි පරිසාය** පෙරබත බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට දන් දී භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි උපෝසථ අංග අධිෂ්ඨාන කොට ගඳමල් ආදිය ගෙන්වාගෙන උද්ඝෝෂණය පිණිස විශාල ලිච්ඡවීන් පිරිසක්

රැස්කරවා ඒ නීල පීත ආදී වර්ණ ඇති වස්ත්‍රාභරණ විලේපනයන්ගෙන් අලංකාර වූ තව්තිසා පිරිසක් වැනි මහත් ලිච්ඡවී රජ පිරිසක් සමග එළඹියේය.

අකාලො බො මහාලි ඒ අඩතොල්ලාගේ මහාලී නම් මුල් නමයි. එයින් තෙරුන්වහන්සේ ඔහුට කථා කරත්. **එකමනතං** සුදුසු රුක් සෙවනැලිවල ඒ ලිච්ඡවී පිරිස සමග තෙරුන් ගුණ කියමින් හුන්නේය.

**සීහො සමනුදෙදසො** ආයුෂ්මත් නාගිත හිමියන්ගේ බෑනණුවෝ සත්වස් කල්හි පැවිදිව සසුනෙහි යෝග්‍යව සීහ නම් ඇති සාමණේරයෝ. උන්වහන්සේ ඒ මහ පිරිස දැක මේ පිරිස විශාලය. මුළු වෙහෙර පුරා හුන්නේය. ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ අද මේ පිරිසට මහත් උත්සාහයකින් දහම් දෙසන සේක. මම ද උපාධ්‍යායයන්ට කියා භාග්‍යවතුන් වහන්සේට මහපිරිස රැස්වූ බව දන්වන්නෙම් නම් මැනවැයි සිතා නාගිත හිමියන් සිටි තැනට එළඹියෝය.

**භනෙත කසසප** තෙරුන් ගෝත්‍රයෙන් ආමන්ත්‍රණය කරයි. **එසාජනතා** මේ ජන සමූහය. **තවසොඤව භගවතො ආරොචෙහි** සීහ භාග්‍යවතුන් වහන්සේගේ විශ්වාසවන්තයෙකි. මේ තෙරුන් වහන්සේ ස්ථූල ශරීර ඇත්තෝය. එහෙයින් උන්වහන්සේට ශරීරය බර බැවින් නැගිටීම් හිඳීම් ආදියෙහි අලස බව මඳක් හීන නොවූයේ මෙන් වෙයි. ඉක්බිති මේ සාමණේරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට කලින් කල වත් සපයති. ඒ නිසා තෙරුන්වහන්සේ ඔහුට 'ඔබද දසබලධාරීන් වහන්සේට විශ්වාසවන්තයෙකි'යි කියා 'යව ඔබම දන්වවයි' කීහ.

**විහාර පචඡායාය** විහාර සෙවනෙහි කූටාගාර මහා ගෘහයෙහි සෙවනින් පැතිරුණු අවකාශයෙහි යන අර්ථයි. ඒ කූටාගාර ශාලාව දකුණු උතුරුදෙසට දිගය. පෙරදිග බලා සිටී. ඒ නිසා එහි ඉදිරියෙහි මහා සෙවනක් පැතිරී තිබේ.

සිංහ භාග්‍යවතුන් වහන්සේට එහි අසුනක් පැනවීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දොර අතුරින්ද වාකවුළු අතරින්ද නික්ම ඔබමොබ දුවන්නා වූද පැතිරෙන්නා වූද සවණක් බුදුරැසින් වලාකුළු අතරින් නික්මෙන පූර්ණචන්ද්‍රයා මෙන් කූටාගාර ශාලාවෙන් නික්ම පැනවූ බුදු

අසුනෙහි වැඩහුන් සේක. එහෙයින් කියන ලදී. අථඛො භගවා විහාරා නික්ඛමම විහාර පච්ඡායායය පඤ්ඤතෙත ආසනෙ නිසිදි යනුවෙන්

පුරිමානි භනෙත දිවසානි පුරිමතරානි මෙහි ඊයේ දවස පුරිම නම්. ඉත්පසු පුරිමතරය. එතැන්පටන් සියල්ල පුරිමද පුරිමතරද වෙයි.

යදගෙග මුල් දවසෙහි පටන් යම් දවසක් අග්‍රකොට එහා කොන කොට වසම් යන අර්ථයි. යම්තාක් වාසය කළසේක්දැයි කියන ලදද දූන් එහි පරිමාණය දක්වන්නේ නචිරං තීණි වස්සානි යි කීය. නැතහොත් යදගෙග යනු යම් දවසක් අගකොට නොබෝකලක් තුන්වසක් වසම් යන අර්ථයි. යම් දවසක් ආදිකොට නොබෝ කලක් තුන්වසක් වැසුවෙම් යි කියන ලද්දේ වෙයි.

මොහු භාග්‍යවතුන් වහන්සේගේ පාසිවුරු ගෙන තුන්වසක් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කෙළේය. ඒ සඳහා මෙසේ කියයි.

පියරූපානි ප්‍රිය වූ දේ ප්‍රසන්න වූ දේ. කාමූප සංහිතානි කාමාස්වාද ඇති. රජනීයානි රාගය ඇතිකරන, නොවඛො දිබ්බානි සද්දානි කුමක් නිසා සුනක්ඛත්ත ඒවා නොඅසයිද? හේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ දිබ්බචක්ඛු පරිකර්මය ඉල්ලා සිටියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට එය කියා දුන් සේක. ඔහු අනුශාසනා කළ පරිදි පිළිපන්නේ දිවැස් උපදවා දෙවියන්ගේ රූප දැක මෙසේ සිතීය. මේ සිරුරු පැවැත්වීමෙහි ශබ්දය මිහිරි විය යුතුය. එය කෙසේ අසන්නෙම්ද? භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ දිබ්බසොත පරිකර්මය ඇසීය. මොහු අතීතයේ දී එක් සිල්වත් භික්ෂුවකගේ කන්සිදුරට පහරදී බිහිරි කළේය. ඒ නිසා පරිකර්ම කරන්නේ වුවද දිබ්බසෝත අධිගමයට අභව්‍ය විය. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ ඔහුට පරිකර්මය කියා නුදුන් සේක. හේ එපමණකින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෛර බැඳ මෙසේ සිතීය. ඒකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන්ට මෙසේ සිතෙනු ඇත. මම ද ක්ෂත්‍රියයෙම්. මොහුද ක්ෂත්‍රියය. ඉදින් මම මොහුගේ ඥානය මැඩුණොත් මොහුද සර්වඥ වන්නේ යයි ඊර්ෂ්‍යාවෙන් මට නොකියයි. හේ ක්‍රමයෙන් ගිහි බවට පත්ව ඒ බව මහා ලිච්ඡවීට කියන්නේ මෙසේ කීවේය.

**එකංස භාවිතො** එක් අංශයකින්, එක් කොටසකින් භාවිත කරන ලද්දේ දිව්‍යමය රූප දැකීම පිණිස දිව්‍යමය ශබ්ද ඇසීම පිණිස භාවිත කරන ලද්දේය යන අර්ථයි.

**තිරියං** අනුදිශාව. **උභයංස භාවිතො** අංශ දෙකක් සඳහා කොටස් දෙකක් සඳහා භාවිත කරන ලද්දේය යන අර්ථයි. **අයංඛො මහාලිහෙතු** මොහු දිව්‍යමය රූප දැකීම පිණිස එක් අංශයක් භාවිතා කරන ලද්දේ සමාධියට හේතුවෙයි. මේ කරුණ අසා ඒ ලිච්ඡවියා මෙසේ සිතීය. මේ දිවකනින් ශබ්ද ඇසීම මේ සසුනෙහි උතුම් වූවක් යයි සිතමි. මේ අර්ථය සඳහා මේ භික්ෂූහු වර්ෂ පනහක් හැටක් අපණ්ණක බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙත්. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේගෙන් අසන්නෙමි නම් මැනවි.'

ඉන්පසු ඒ කරුණ විමසන්නේ **එතාසංනූන භනෙත** ආදිය කීය. **සමාධි භාවනාහං** මෙහි සමාධියම සමාධි භාවනාවය. අංශ දෙකින් භාවිත කළ සමාධීන්ගේ යන අර්ථයි. එසේනම් යම්හෙයකින් ශාසනයෙන් බැහැර මේ සමාධි භාවනාව ආධ්‍යාත්මික නොවේනම්, ඒ නිසා එය පිළිකෙව් කොට යම් අර්ථයක් සඳහා භික්ෂූහු බ්‍රහ්මචර්යය හැසිරෙත්ද එය දක්වන්ට භාග්‍යවතුන් වහන්සේ **නඛො මහාලි** ආදිය කී සේක.

**තීණි සංයොජනානි** සක්කාය දිට්ඨි ආදී බන්ධන තුනෙහි, ඒවා සංසාර දුඃඛයෙන් සැදූ රථයෙහි සත්ත්වයන් යොදයි. ඒ නිසා සංයෝජනයයි කියනු ලැබේ. **සොතාපනෙනා හොති** මාර්ග ශ්‍රෝතසයට පැමිණියේ වෙයි. **අවිනිපාත ධමෙමා** සතර අපායෙහි නොවැටෙන ධර්ම. **නියතො** ධර්මනියාමයෙන් නියත වූ **සමෙබාධිපරායනො** මත්තෙහි මාර්ගත්‍රය සංඛ්‍යාත සම්බෝධියට එකම මාර්ගය මොහු විසින් පැමිණිය යුතු වන්නේයයි **සමෙබාධිපරායනො**. **තනුතතා** අධික උත්සාහය මඳ බැවින් ඉඳහිට උපනින්ද සිහිත් බව. **ඔරමහාගියානං** යට කොටස, මෙයින් බැඳුණෝ මත්තෙහි සුද්ධාවාස භූමියෙහි උපදින්ට නොහැකි වෙති. **ඔපපාතිකො** සෙසු යෝනි පිළිකෙව් කරන වචනයකි මෙය. **තතථ පරිනිබබායි** ඒ මතු භවයෙහිම පිරිනිවන්පාන ස්වභාවය ඇති. **අනාවතති ධමෙමා** එතැනින් එහා නැවත ප්‍රතිසන්ධි වශයෙන් බ්‍රහ්මලෝක නොපවත්නා ස්වභාවය. **චෙතො විමුතති** චිත්ත විමුක්තිය. සියලු කෙලෙස් බැඳුම්වලින් මිදුණු අර්හත්ඵල චිත්තයට මෙය සමාන වචනයකි. **පඤඤාවිමුතති** මෙහිද

සියලු කෙලෙස් බැඳුම්වලින් මිදුණු අර්හත්ඵල ප්‍රඥාව පඤ්ඤා විමුත්ති යයි දතයුතුය. දිට්ඨෙව ධම්මෙ මේ ආත්මභාවයෙහිම සයං තමාම. අභිඤ්ඤා මැනවින් දැන. සච්ඡිකත්වා ප්‍රත්‍යක්ෂ කොට, නැතහොත් අභිඤ්ඤා සච්ඡිකත්වා මැනවින් දැන අති විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට යන අර්ථයි. උපසම්පජ්ජ පැමිණ, ලැබ. මේ අසා ලිච්ඡවී මෙසේ සිතීය. මේ උතුම් ධර්මයෙකි. පක්ෂියකු මෙන් උඩට නැග ගොයකු මෙන් බඩගා අවබෝධ කිරීමට නොහැකිය. ඒකාන්තයෙන් මෙය අවබෝධ කරන්නාට පූර්වභාග ප්‍රතිපදාව තිබිය යුතුය. එහෙත් එය විමසමියි ඉක්පසු භාග්‍යවතුන් වහන්සේගෙන් විමසන්නේ අත්ථිපන භන්තෙ ආදිය කීය.

අට්ඨංගිකො පංචාංග තූර්යය මෙන් කුටි අටක් ඇති ගමක් මෙන් හෝ අෂ්ටාංග මාත්‍රයක්ම වී අට්ඨංගිකො අංගයන්ගෙන් අන්‍ය වූ මාර්ගයක් නම් නැත. එහෙයින් සෙය්‍යථීදං -පෙ- සම්මා දිට්ඨි -පෙ- සම්මා සමාධි යනුවෙන්.

එහි මනා දර්ශන ලක්ෂණ සම්මාදිට්ඨි යයි මනා සිත පිහිටුවීමේ ලක්ෂණය සම්මා සංකප්පො. මනා පරිග්‍රහ ලක්ෂණය සම්මා වාචා මනාසේ කිරීමේ ලක්ෂණය සම්මා කම්මන්තො. මනාසේ පිරිසිදු කරන ලක්ෂණය සම්මා ආජීවො මැනවින් අල්ලාගන්නා ලක්ෂණය සම්මා වායාමො. මැනවින් නැගිටීමේ ලක්ෂණය සම්මා සමාධි. මේ එක එකකට කෘත්‍ය තුන බැගින් තිබේ. ඒ කෙසේද යත්, සම්මා දිට්ඨිය තමාගේ අන් කෙලෙස් සමග මිච්ඡා දිට්ඨිය අත්හරී. නිරෝධයද අරමුණු කරයි. එය වසාදමන මෝහය නැතිකිරීම් වශයෙන් ඉවත්කරන ලද මෝහයෙන්. සම්ප්‍රයුක්ත ධර්මයන්ද දකී. සම්මා සංකප්ප ආදියද එසේම මිච්ඡාදිට්ඨි සංකප්ප ආදීන්ද අත්හැර දමයි. නිරෝධයද අරමුණු කර ගනී. විශේෂ වශයෙන් මෙහි සම්මා සංකප්පය සහජාත ධර්මයන්ද පිහිටුවාගනී. සම්මා වාචා මනාසේ ලබාගනී. සම්මා කම්මන්තය මනාසේ ඔසවා තබයි. සම්මා ආජීවය, මනාසේ සෝදා හරියි. සම්මා වායාමය මනාසේ අල්ලා ගනී. සම්මා සතිය මනාසේ එළඹ සිටී. සම්මා සමාධිය මනාසේ වැළඳ ගනී. තවද මේ සම්මා දිට්ඨිය නම් පූර්ව භාගයෙහි නානාක්ෂණ නානා ආරම්මණ ඇත්තේ වෙයි. මාර්ග කාලයෙහි එක් ක්ෂණයක් ඇත. එක් අරමුණක් ඇත. කෘත්‍ය වශයෙන් දුක්ඛෙ ඤාණං ආදී නම් සතරක් ලබයි. සම්මා සංකප්ප ආදියද පූර්වභාගයෙහි නානාක්ෂණ ඇත්තේය. නානා ආරම්මණ ඇත්තේය. මාර්ග කාලයෙහි එක් ක්ෂණයක් ඇත. එක් අරමුණක් ඇත.

ඒවා අතර සම්මා සංකප්පය කෘත්‍ය වශයෙන් නෙක්ඛම්ම සංකප්ප ආදී නම් තුනක් ලබයි. සම්මා වාචා ආදියද විරති තුනද වෙයි. චේතනාද මාර්ගක්ෂණයෙහි විරතියමය. සම්මා වායාම සම්මා සති යන මේ දෙක කෘත්‍ය වශයෙන් සම්මප්පධාන, සතිපට්ඨාන වශයෙන් නම් සතරක් ලබයි. සම්මා සමාධිය වනාහි මාර්ගක්ෂණයෙහි ද සම්මා සමාධියමය.

මෙසේ ධර්ම අට අතර භාග්‍යවතුන් වහන්සේ විසින් නිර්වාණ අධිගමය පිණිස පිළිපන් යෝගියාට උපකාරී බැවින් පළමුව සම්මා දිට්ඨිය දේශනා කරන ලදී. මෙය ප්‍රඥා ප්‍රදීපයයිද, ප්‍රඥා ආයුධය යයිද කියන ලදී. ඒ නිසා මේ පූර්වභාගයෙහි විදර්ශනා ඥාන සංඛ්‍යාත සම්මා දිට්ඨියෙන් අවිද්‍යාන්ධකාරය දුරුකොට කෙලෙස් සතුරන් ඝාතනය කරමින්, යහතින් යෝගාවචරයා නිවනට පැමිණේ. එහෙයින් කියන ලදී. නිර්වාණ අධිගමය පිණිස පිළිපන් යෝගියාට උපකාරී බැවින් පළමුව සම්මා දිට්ඨිය දේශනා කරන ලදී යනුවෙන්, සම්මා සංකප්පය එයට බොහෝ උපකාරීය. ඒ නිසා ඉන් අනතුරුව කියන ලදී. යම්සේ රන්කරුවා අතින් පෙරළ පෙරළා ඇසින් කහවණුව බලමින් 'මෙය කූටය. මෙය නියම යයි දනීද මෙසේ යෝගාවචරයාද පූර්වභාගයෙහි විතර්කයෙන් විතර්කකොට විතර්කකොට විදර්ශනා ප්‍රඥාව දෙස බලමින් මේ ධර්මයෝ කාමාවචරය. මේවා රූපාවචර ආදී යයි දනියි. යම්සේ පුරුෂයකු විසින් කොනින් අල්ලාගෙන පෙරළා පෙරළා දුන් මහා වෘක්ෂය වඩුවෙක් වෑයෙන් කප කපා කාර්යයට ගෙනඑයිද එසේ විතර්කයෙන් විතර්ක කොට විතර්ක කොට දුන් ධර්මයන් යෝගාවචරයා ප්‍රඥාවෙන් 'මේ කාමාවචරය. මේ රූපාවචරය ආදී ක්‍රමයෙන් පිරිසිඳ කාර්යයට ගෙන එයි. එහෙයින් කියන ලදී. සම්මා සංකප්පය එයට බොහෝ උපකාරීය. ඒ නිසා ඉන් අනතුරුව කියන ලදී.

මෙය සම්මා දිට්ඨියට යම්සේද සම්මා වාචාවටද උපකාරකය. යම්සේ කීයේද? ගෘහපතිය, පළමුව විතර්කකොට විචාරා පසුව වචන කියයි. එහෙයින් ඉන් අනතුරුව සම්මා වාචා කියන ලදී. යම්හෙයකින් මේ මේ දේ කරන්නෙමියි පළමුව සංවිධානකොට ලෝකයෙහි කර්මාන්ත යොදවති. ඒ නිසා සම්මා වාචාව කාය කර්මයට උපකාරී යයි සම්මා වාචාවට අනතුරු සම්මා කම්මන්තය කියන ලදී. සිව්වැදෑරුම් වූ වචී දුශ්චරිතයද තෙවැදෑරුම් වූ කාය දුශ්චරිතයද, අත්හැර සුචරිත දෙක පුරන්නහුටම යම්හෙයකින් ආජීව අෂ්ටමක ශීලය පිරේද අනිකට නොවේද

ඒ නිසා ඒ දෙකට අනතුරුව සම්මා ආජීවය කියන ලදී. මෙසේ විශුද්ධ ආජීවයෙන් 'මාගේ ආජීවය පිරිසිදු යයි එතෙකින් සන්තෝෂයට නොපැමිණ නිද්‍රා ප්‍රමාදයෙන් වාසයකිරීම යුතු නැත. නැවත සියලු ඉරියව්වල මේ වීර්යය ආරම්භ කළයුතුයයි දක්වන්ට ඉන් අනතුරුව සම්මා වායාමය කියන ලදී. ඉන්පසු ආරම්භ කරන ලද වීර්යයෙන්ද කාය ආදී වස්තූන් සතර කෙරෙහි සිහිය මැනවින් පිහිටියක් කළ යුතුයයි දැක්වීම පිණිස ඉන් අනතුරුව සම්මා සතිය දේශනා කරන ලදී. යම් හෙයකින් මෙසේ සුපිහිටි සතිය සමාධියට උපකාර අපකාර ධර්මයන්ගේ ගති පරීක්‍ෂාකොට හුදෙකලා අරමුණෙහි සිත පිහිටුවා ගැනීමට ප්‍රමාණවත් වේද, එනිසා සම්මා සතියට අනතුරුව සම්මා සමාධිය දේශනා කරන ලද්දේ යයි දතයුතුය.

**එතෙසං ධම්මානං සච්ඡිකිරියාය** මේ සෝවාන්ඵල ආදිය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස.

**එකමිදාහං** මෙය කුමක් නිසා අරඹන ලද්දේ ද? මේ රජ 'රූපය ආත්මය'යි යන ලබ්ධි ඇත්තෙකි. එහෙයින් ඔහුගේ සිත දේශනාවට නොනැමෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් ඔහුගේ ලබ්ධිය හෙළිදරව් කිරීම පිණිස එක් කරුණකට ගෙන ඒමට මෙය අරඹන ලදී. මේ මෙහි සංක්‍ෂේප අර්ථයයි. 'මම එක් කලෙක ඝෝෂිතාරාමයෙහි වසමි. එහිදී ඒ පැවිද්දෝ දෙදෙන මාගෙන් මෙසේ ඇසූහ. ඉක්බිති මම ඔවුන්ට බුද්ධෝත්පාදය දක්වා තන්ති ධම්ම නම් ධර්මයක් කියමින් මෙසේ කීවෙමි. ඇවැත්නි, ශ්‍රද්ධාවත් කුලපුත්‍රයා මෙබඳු ශාස්තෘ ශාසනයෙහි පැවිදි වූයේ මෙසේ ත්‍රිවිධ ශීලය පුරා ප්‍රථමධ්‍යාන ආදියට පැමිණ සිටියේ, එය ජීවයයි කියන්නේය. ඔහුට මෙය සුදුසුද? ඉන්පසු ඔවුන් සුදුසු යයි කියන ලද කල්හි 'ඇවැත්නි, මම මෙසේ දනිමි. මෙසේ දකිමි. එහෙත් මම නොකියමියි ඒ වාදය ප්‍රතික්‍ෂේප කොට තවදුරටත් ක්‍ෂීණාශ්‍රවයා දක්වා මොහුට මෙසේ කීම නුසුදුසු යයි කීවෙමි. ඔවුහු මාගේ වචනය අසා සතුටු සිත් ඇත්තෝ වූහ.

මෙසේ කී කල්හි ඔහුට සතුටු සිත් ඇත්තේ විය. එහෙයින් කීය. **ඉදමවොච භගවා අත්තමනො ඔට්ඨද්ධො භගවතො භාසිතං අභිනන්දි** ෙ

**මහාලි සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

# ජාලිය සූත්‍ර වර්ණනාව

**එවං මෙ සුතං -පෙ- කොසම්බියං** යනු ජාලිය සූත්‍රයයි. මේ එහි අපූර්ව පද වර්ණනාවයි.

**ඝොසිතාරාමෙ** ඝෝෂිත සිටුවරයා විසින් කරන ලද ආරාමයෙහි පෙර අජිත නම් රටක් විය. ඉන්පසු කොතුහලික නම් දිළින්දෙක් සාගතයට බියෙන් අඹුදරුවන් සමග අනතුරු රටකට යන්නේ පුත්‍රයා දරාගන්නට නොහැක්කේ අත්හැර දමා ගියේය. මව නැවතී ඔහු ගෙන ගියාය. ඔවුහු එක්තරා ගොපලු ගමකට පිවිසියාහුය. ගොපල්ලන්ට එකල්හි බොහෝ පායාස පිළියෙල කරන ලද්දේ වෙයි. ඔවුහු එතැනින් පායාසය ලැබ අනුභව කළහ. ඉක්බිති ඒ පුරුෂයා බලවත් පායාසය අනුභවකොට දිරවන්නට නොහැකි වන්නේ රාත්‍රී කාලයෙහි කලුරියකොට එහිම බැල්ලකගේ කුසෙහි පිළිසිඳ ගෙන බලුපැටියෙක් විය. ඌ ගොපල්ලාට ප්‍රිය වෙයි. ගොපල්ලාද පසේබුදුවරයකුට උපස්ථාන කරයි. පසේබුදුන් වහන්සේද බත්කිස කරන කල්හි බලුපැටියාට පිඬු දෙන සේක. ඌ පසේබුදුන් කෙරෙහි ස්නේහය උපදවා ගොපල්ලා සමග පන්සලටද යයි. ගොපල්ලා නොපැමිණි කල්හි බත් වේලාවෙහි තමාම ගොස් කල් දැන්වීම පිණිස පන්සල් දොර ළඟදී බුරයි. අතරමගදී ද චණ්ඩ මෘගයන් දැක බුරා එලවා දමයි. ඌ පසේබුදුන් කෙරෙහි මෘදු සිතින් කලුරියකොට දෙව්ලොව උපන්නේය. ඔහුට ඝෝසක දිව්‍යපුත්‍රයා යයි නමක් විය.

ඔහු දෙව්ලොවින් චුතව කොසඹෑ නුවර එක් කුලගෙයක උපන්නේය. දරුවන් නැති සිටුවරයා මාපියන්ට ධනය දී ඔහු පුත්‍රයා කොට ගත්තේය. අනතුරුව දරුවන් උපන් කල සත්වරක් ඝාතනය කිරීමට උපක්‍රම යෙදීය. ඔහු පින්වත් බැවින් සත් තැනකදීම මරණයට නොපැමිණ අවසන එක් සිටුදුවකගේ දක්‍ෂතාව නිසා ජීවිතය ලැබ පසුකලෙක පියාගේ ඇවෑමෙන් සිටු තනතුරට පත්ව ඝෝසක සිටු නම් විය. කොසඹෑ නුවර තවත් කුක්කුට සිටුය. පාවාරික සිටුයයි සිටුවරු දෙදෙනෙක් වෙති. මොහු සමග තිදෙනෙක් වෙති. එසමයෙහි හිමාලයේ සිට පන්සියයක් තවුසෝ ශරීරය සන්තර්පනය කිරීම පිණිස නිරන්තරයෙන් කොසඹෑවට එති. ඔවුන්ට ඒ සිටුවරු තිදෙන තමන්ගේ උයන්වල කොළකුටි

තනා උවටැන් කරති. ඉක්බිති එක් දවසක් ඒ තවුසෝ හිමවතින් එන්නාහු මහා කාන්තාරයෙහි පිපාසිත වූවාහු ක්ලාන්ත වූවාහු එක් විශාල ඇසතු රුකක් වෙත පැමිණ එහි අධිගෘහිත දේවතාවා සමීපයෙන් සංග්‍රහ අපේක්ෂා කරන්නාහු හිඳගත්හ. දේවතාවා සර්වාලංකාරයෙන් අලංකාර කරන ලද අත දිගුකොට ඔවුන්ට පානය කරන නහන ජලය ආදිය දී විඩාව නැති කළේය. ඔවුහු දේවතාවාගේ ආනුභාවයෙන් විස්මයට පත්වූවාහු මෙසේ ඇසූහ. දේවතාවනි, කුමන ක්‍රියාවක් කොට ඔබ විසින් මේ සම්පත් ලබන ලද්දේ ද? දේවතාවා මෙසේ කීය. ලෝකයෙහි බුද්ධ නම් භාග්‍යවතුන් වහන්සේ උපන් සේක. උන්වහන්සේ දැන් සැවැත්නුවර වැඩවසති. අනේපිඬු ගෘහපතියා උන්වහන්සේට උපස්ථාන කරයි. හෙතෙමේ උපෝසථ දිනයන්හි තමාගේ සේවකයන්ට පියෙවි බත් වැටුප් දී පෙහෙවස් සමාදන් කරවයි. ඉක්බිති එක් මධ්‍යාහ්නයෙහි උදේ ආහාරය සඳහා පැමිණියේ කිසිදු මෙහෙකාරකමක් නොකෙරෙනු දැක අද මිනිස්සු කුමක්හෙයින් වැඩ නොකරත්දැයි ඇසුවෙමි. මට ඔවුහු ඒ කරුණ දැන්වූහ. ඉන්පසු මම මෙසේ කීමි. දැන් උපෝසථ දිනය ගොස්ය. උපෝසථයෙන් අඩක් කරන්ට හැකිද? ඉන්පසු සිටුවරයාට දන්වා 'කළහැකියයි කීහ. ඒ මම අඩපොහොය සමාදන්ව එදවසම කලුරියකොට මේ සම්පත්තිය ලැබුවෙමි.

ඉක්බිති ඒ තවුසෝ බුදුකෙනෙක් උපන්නේය යි හටගත් ප්‍රීති ප්‍රමෝදය ඇත්තාහු එතැනින් සැවැත්නුවරට යනු කැමැත්තාහු වුවද අපට උපස්ථායක සිටුවරු බොහෝ උපකාරීය. ඔවුන්ටද මේ කරුණ දන්වන්නෙමුයි කොසඹෑවට ගොස් සිටුවරුන් විසින් කරන ලද සත්කාර බහුකාර ඇත්තාහු අදම අපි යන්නෙමුයි කීහ. ස්වාමීනි, කුමක් නිසා ඉක්මන් වූද? ඔබලා පෙර හතර පස්මසක් වැස යන්නෝ නොවන්නාහුදැයි කියනු ලැබුවාහු ඒ පුවත දැන්වූහ. එසේනම් ස්වාමීනි එක්වම යමුයි කීකල්හි 'අපි යමු. ඔබ හෙමින් එන්නැයි සැවැත්නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිදිව රහත්බවට පැමිණියාහුය. ඒ සිටුවරුද පන්සියය බැගින් ගැල් පිරිවර ඇත්තාහු සැවැත්නුවරට ගොස් දන් දී කොසඹෑවට පැමිණීම පිණිස භාග්‍යවතුන් වහන්සේගෙන් ඉල්ලා නැවත අවුත් වෙහෙර තුනක් කරවූහ. ඒ අතරින් පාවාරිය සිටු විසින් කරවන ලද්දේ පාවාරික අම්බවන නම් විය. ඝොසිත සිටු විසින් කරවන ලද්දේ ඝොසිතාරාමය නම් විය.

ඒ සඳහා කියන ලදී. 'කොසම්බියං විහරති ඝොසිතාරාමෙ වණ්ඩිසෙසා මෙය ඔහුගේ නමයි. ජාලියො මෙය අනිකාගේ නමය. ඔහුගේ උපාධ්‍යායන් වහන්සේ ලීයෙන් සෑදූ පාත්‍රය සහිතව පිඬු පිණිස හැසිරෙන බැවින් දාරුකපත්තිකනෙතවාසී යයි කියනු ලැබේ.

එතදවොචුං දොස් නැගීමේ අදහසින් වාදයක් ඇතිකරනු කැමැත්තෝව මෙසේ කීහ. ඔවුන්ට මෙසේ සිතිණ. යම්හෙයකින් ශ්‍රමණ ගෞතම ජීවය ශරීරයයි කියුවහොත් අපි ඔහුට මේ වාදය නගන්නෙමු. භවත් ගෞතමයෙනි, ඔබගේ ලබ්ධියට අනුව සත්වයා මෙහිදීම බිඳී යයි. එයින් අපගේ වාදය වන උච්ඡේදවාදය වෙයි. ඉදින් ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියයිද, ඉක්බිති ඔහුට මේ වාදය නගන්නෙමු. ඔබගේ වාදයෙහි රූපය බිඳෙයි. සත්වයා නොබිඳේ. එයින් අපගේ වාදයෙහි සත්ත්වයා ශාස්වත බවට පැමිණේ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මොවුහු වාදාරෝපණය පිණිස ප්‍රශ්න අසත්. මාගේ සසුනෙහි මේ අන්ත දෙකට නොපැමිණ මජ්ඣිම පටිපදාවක් ඇතැයි නොදනිත්. ඔවුන්ගේ ප්‍රශ්නය නොවිසඳා ඒ ප්‍රතිපදාව හෙළිදරව් කිරීම පිණිස ධර්මය දේශනා කරමියි සිතා තෙනහාවුසො ආදිය කී සේක. එහි කල්ලනනුබො තසෙසතං වචනාය මෙසේ ශ්‍රද්ධාවෙන් පැවිදි වූ ඔහුට ත්‍රිවිධ ශීලය පුරා ප්‍රථමධ්‍යානයට පත්වූවහුට මෙය කීම සුදුසුද, මෙය කීම සුදුසුය යන අර්ථයි. ඒ අසා පරිබ්‍රාජකයෝ පෘථක්ජනයා යම්හෙයකින් විචිකිච්ඡාව නැත්තෙක් නොවේ නම්, එයින් කවදා හෝ මෙසේ කියන්නේ යයි සිතන්නාහු කල්ලං තසෙසතං වචනං යයි කීහ.

අථච පනාහං නවදාමි මම මෙය මෙසේ දනිමි. එසේ නොකියමි. කිසුණු පිරියම්කොට වඩන්නහුගේ ප්‍රඥා බලයෙන් උපන් මහග්ගත සිත මෙය යයි සංඥාවක් තැබූ සේක.

න කල්ලං තසෙසතං ඒ පරිබ්‍රාජකයෝ 'යම් හෙයකින් ක්ෂීණාශ්‍රව තෙමේ පහ වූ මෝහ ඇත්තේ, තරණය කළ විචිකිච්ඡා ඇත්තේද ඒ නිසා ඔහුට මෙසේ කීම යුතු නොවේ යයි සිතමින් කියති. සෙස්ස සියලු තැන නොගැඹුරු අරුත් ඇත්තේමය.

**ජාලිය සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

# කස්සප සීහනාද සූත්‍ර වර්ණනාව

එවමෙ සුතං -පෙ- උජුඤ්ඤායං විහරති යනු සීහනාද සූත්‍රයයි. මේ එහි අපූර්ව පද වර්ණනාවයි.

උජුඤ්ඤාය උජුඤ්ඤා යනු ඒ ඒ රටෙහිද නගරයෙහිද නමයි. භාග්‍යවතුන් වහන්සේ උජුඤ්ඤා නගරය ඇසුරුකොට වාසය කරන සේක. කණ්ණා කත්ථලෙ මිගදායෙ ඒ නගරය නුදුරෙහි කණ්ණ කබල නම් එක් රමණීය බිම්කඩක් ඇත. එය මුවන්ට අභය පිණිස දුන් බැවින් මිගදාය යයි කියනු ලබයි. ඒ කණ්ණකත්ථල මිගදායෙහි.

අචෙලො නග්න පරිබ්‍රාජකයා. කසසපො ඔහුගේ නම. තපසසී යනු තපස ඇසුරුකළ. ලූඛාජීවී නිර්වස්ත්‍රව සිටීම, මුත්‍ර කිරීමේදී හැසිරෙන ආකාර ආදි වශයෙන් රළු ජීවිතයක් මොහුට ඇත්තේ නුයි = ලූඛාජීවී, ඒ ලූඛාජීවය උපකෙකාසති අක්‍රෝශ කරයි. උපවදති පහත්කොට අවමන් කරයි. ධමමසසචානුධමමං ව්‍යාකරොනති භවත් ගෞතමයන් විසින් කියන ලද කරුණට අනුකරුණක් කියත්. සහධම්මිකො වාදානුවාදො අනෙකා විසින් කියන ලද කරුණින් කරුණු ගෙන තොපගේ වාදය හෝ අනුවාදය හෝ වේවා, නුවණැත්තන් විසින් ගැරහිය යුතු කරුණකි. අල්පමාත්‍රයක්වත් නොඑයි. මෙය කියන ලද්දේ වෙයි. කිමෙක්ද සියලු ආකාරයෙන් ඔබගේ වාදයෙහි ගැරහිය යුතු කරුණක් නැත. අනබභකඛාතුකාමො බොරුවෙන් කියනු නොකැමැත්තාහු.

එකචචං තපසසිං ලූඛවාජීවිං ආදී තන්හි මෙහි ඇතැම් අචේලක පැවිද්ද ආදී තපසින් යුතු බැවින් තපස්සී. රළු දිවියෙන් ජීවත් වන්නෙමියි තණකොළ ගොම ආදිය කෑම ආදි නානා ප්‍රකාරයෙන් තමා වෙහෙසට පත්කර ගනී. අඩු පින් ඇති බැවින් ද සැපවත් ජීවන වෘත්තියක්වත් නොලබයි. හේ තුන් දුසිරිත් පුරා නිරයෙහි උපදී.

තවෙකෙක් එබඳු තපස ඇසුරු කළද පිනැත්තේ වෙයි. ලාභසත්කාර ලබයි. ඔහු දැන් මා වැන්නෙක් නැතැයි තමා උසස් තැනක

සම්භාවනාකොට බොහෝසෙයින් ලාභ උපදවන්නෙමියි නොහොබිනා ලෙස තුන් දුසිරිත් පුරා නිරයෙහි උපදී. මේ දෙදෙනා සඳහා පළමු ක්‍රමය කියන ලදී.

අනෙකා තපසින් යුතුය. රළු දිවි ඇත්තේය. මඳ පින් ඇත්තේය. ජීවිකා වෘත්තිය සැපසේ නොලබයි. හේ මට පෙරත් පින් නොකළ බැවින් සැප දිවියක් නූපදී. දැන් පින් කරමියි තුන් සුසිරිත් පුරා ස්වර්ගයෙහි උපදී.

අනෙකෙක් රළු දිවි ඇත්තේය. පින්වත්ය. ජීවිකා වෘත්තිය සැපසේ ලබයි. හේ මට පෙරද කළ පින් ඇති බැවින් සැප දිවියක් උපදී යයි සිතා නොහොබිනා දේ අත්හැර තුන් සුසිරිත් පුරා ස්වර්ගයෙහි උපදී. මේ දෙදෙනා සඳහා දෙවැනි ක්‍රමය කියන ලදී. එකෙක් තපස් ඇත්තේය. අඩු දුකින් වසන්නේ වෙයි. බැහැරි පැවතුම් ඇත්තේ, තවුසෙක් හෝ සැඟවුණු පිරිවැජියෙක් හෝ මඳ පින් ඇති බැවින් කැමති ප්‍රත්‍ය නොලබයි. හේ නොහොබිනා දේ වශයෙන් තුන් දුසිරිත් පුරමින් තමා සැපයෙහි තබා නිරයෙහි උපදී. තවෙකෙක් පින් ඇත්තේය. හේ 'දැන් මා වැන්නෙක් නැතැයි මානය උපදවාගෙන නොහොබිනා දේ වශයෙන් ලාභසත්කාර උපදවන්නේ මිථ්‍යාදෘෂ්ටි වශයෙන් 'මේ තරුණ මුදුමොළොක් පරිබ්‍රාජිකාවගේ ලොම් සහිත බාහුවෙන් ලැබෙන ස්පර්ශය සැපයයි ආදිය සිතා කාමයන්හි ගොදුරු බවට පැමිණෙන්නේ තුන් දුසිරිත් පුරා නිරයෙහි උපදී. මේ දෙදෙන සඳහා තෙවැනි ක්‍රමය කියන ලදී. අනෙකෙක් මඳ දුකින් වසයි. මඳ පින් ඇත්තේය. හේ පෙරදීද නොකළ පින් ඇති බැවින් සැපසේ ජීවිතය නොලබමියි තුන් සුසිරිත් පුරා ස්වර්ගයෙහි උපදී.

තවෙකෙක් පින් ඇත්තේය. හෙතෙම මම පෙරදී කළ පින් ඇති බැවින් සැප ලබමි. දැනුදු පින් කරන්නෙමි යි තුන් සුසිරිත් පුරා ස්වර්ගයෙහි උපදී. මේ දෙදෙන සඳහා සිව්වැනි ක්‍රමය කියන ලදී. මෙය තීර්ථක වශයෙන් ආවකි. සසුනෙහිද ලැබේ. ඇතමෙක් ධුතාංග සමාදාන වශයෙන් රළු දිවි ඇත්තෝ වෙති. අල්ප වූ පින් ඇති බැවින් මුළු ගම පුරා ඇවිද කුස පිරුමක් නොලබති. හේ ප්‍රත්‍ය උපදවන්නෙමියි වෙදකම් ආදී වශයෙන් හෝ නොහොබිනා දේ කොට රහත්බව හෝ හඟවා අනුන් රවටන කරුණු ප්‍රයෝජනයට ගෙන නිරයෙහි උපදිත්.

තවෙකෙක් ඒ අයුරින්ම පින්වත්ය. හේ ඒ පුණ්‍ය සම්පත්තියෙන් මානය උපදවා උපන් ලාභ ස්ථාවර කරනු කැමැත්තේ නොහොබිනා දේ වශයෙන් තුන් දුසිරිත් පුරා නිරයෙහි උපදී.

තවෙකෙක් සමාදන් වූ ධුතාංග ඇත්තේ වුවද මඳපින් ඇත්තේය. ජීවිකා වෘත්තිය සැපසේ නො ලබයි. හෙතෙමේ පෙරත් මම නොකළ පින් ඇති බැවින් කිසිවක් නො ලබමි. ඉදින් දැන් නොහොබිනා දේ කරන්නෙමි නම් අනාගතයේදී ද ලැබිය නොහැකි සැප ඇත්තේ වන්නෙමියි තුන් සුසිරිත් පුරා රහත්බවට පත්වීමට නොහැකිව ස්වර්ගයෙහි උපදී.

තවෙකෙක් පින් ඇත්තේය. හේ පෙරදීද කරන ලද පින් ඇති බැවින් දැන් සුවපත්ව සිටිමි. දැනුත් පින් කරන්නෙමියි නොහොබිනා දේ අත්හැර තුන් සුසිරිත් පුරා රහත්බවට පත්වන්නට නොහැකිව ස්වර්ගයෙහි උපදී.

ආගතිංවා මොවුහු අසුවල් තැන සිට ආවෝ යැයි මෙසේ පැමිණි. **ගතිංවා** දැන් යා යුතු තැන. **චුතිංවා** ඉන් චුතවීම. **උපපත්තිංවා** ඉන් චුත වූවන්ගේ නැවත ඉපදීම. **කිං සබ්බං තපං ගරහිස්සාමි** කිනම් කරුණක් නිසා ගරහම්ද, ගර්හා කළයුතු දෙයම ගරහමි. පැසසිය යුතු දෙය පසසමි. පොදියක් බඳින මහාරජකයා මෙන් සේදූ රෙදි ද නොසේදූ රෙදි ද එක්තැන් නොකරමුයි දක්වයි. දැන් ඒ කරුණ දක්වන්නේ **සන්තිකස්සප එකෙ සමණ බ්‍රාහමණා** ආදිය කීය.

**යනෙත එකච්චං** පස්වැදෑරුම් ශීලය. එය ලෝකයෙහි කිසිවෙක් නොමැනවැයි නොකියයි. නැවත **යනෙත එකච්චං** පස්දොර අසංවර වූ, ඔවුහු ඇස නොනැසිය යුතුය. ඇසින් මනාප රූප දැකිය යුතුයයි කියත්. සෝත ආදි තන්හිද මේ ක්‍රමයයි. නැවත **යනෙත එකච්චං** පස්දොර සංවර වූ, මෙසේ අනුන්ගේ වාදය සමග තමාගේ වාදයෙහි සමානකම් අසමානකම් දක්වා දැන් තමාගේ වාදය සහ අනුන්ගේ වාදයෙහි ඇති සමානකම් අසමානකම් දක්වන්නේ **යං මයං** ආදිය කීය. එහිද පංචශීල ආදී වශයෙන්ම අර්ථය දතයුතුය.

**සමනු යුඤ්ජන්තං යෙදෙත්වා.** මෙහිද ලබ්ධිය විමසන්නේ **සමනුයුඤ්ජති** නම්. කාරණය විමසන්නේ **සමනුගාහති** නම්. දෙකම

විමසන්නේ සමනුභාසති නම්. සත්ථාරාවා සත්ථාරං ශාස්තෲන් වහන්සේ විසින් හෝ ශාස්තෲන් වහන්සේම උදාහරණ සේ ගෙන, ශාස්තෲන් වහන්ස, ඔබවහන්සේගේ ධර්ම සැම අයුරින්ම අත්හැර පවතීද, නැතහොත් ශ්‍රමණ ගෞතමයන්ද? දෙවැනි පදයෙහි ද මේ ක්‍රමයමැයි. දැන් ඒ කරුණ යොදා දක්වන්නේ යෙ ඉමෙසං භවතං ආදිය කීය.

එහි අකුසලා අකුසල සංඛාතා අකුසල්ද අකුසල් යයි ප්‍රකට වූ දත්තා වූ කොටසක් කොට තබන ලද යන අර්ථයි. සියලු පදයන්හි මේ ක්‍රමයයි.

තවද මෙහි සාවජ්ජා සදොස්. න අලමරියා නිර්දෝෂාර්ථයෙන් ආර්යයෝ වන්නට නොසමත්.

යං විඤ්ඤූ සමනුයුඤ්ජනතා යමෙකින් නුවණැත්තෝ 'අපිද අන්‍යයෝද අසන්නාහු මෙසේ කියත්. එබඳු කරුණක් විද්‍යමාන නොවේ. ඒ කරුණ ඇත යන අර්ථයි. යංවා පන භොනෙතා පරෙ ගණාචරියා අන්‍යයෝ වනාහි ඔබගේ ගණාචාර්යයෝ හෝ ඒ අල්පමාත්‍ර වූ දෙය අත්හැර පවතිත් යන අර්ථයි.

අමෙහව තත්ථ යෙභුයොයන පසංසෙය්‍යුං මෙය ශාස්තෲන් වහන්සේ ශාස්තෲන් සමග ශාස්තෲන් එකතු කිරීමෙහිද කියූ සේක. සංඝයා සමග සංඝයා යෙදීමෙහි ද කී සේක. කුමක් හෙයින්ද යත්, සංඝයා පැසසීමෙහිදී ශාස්තෲන් වහන්සේට ද ප්‍රශංසාව සිදුවන බැවින් පැහැදෙන්නාහුද බුද්ධ සම්පත්තියෙහි සංඝයා කෙරෙහි සංඝ සම්පත්තියෙන් ද බුදුන් කෙරෙහි පහදිති. එසේම භාග්‍යවතුන් වහන්සේගේ ශරීර නිෂ්පත්තිය දැක ධර්මදේශනාවද අසා කියන්නෝ වෙති. යමෙක් මෙබඳු වූ ශාස්තෲන් සමීපයෙහි හැසිරෙන ශ්‍රාවකයන්ට ලාභයක්මය යැයි මෙසේ බුද්ධ සම්පත්තිය නිසා සංඝයා කෙරෙහි පහදිත්. භික්ෂූන්ගේ ආචාර ගෝචර පැමිණීම පිටවී යාම ආදිය දැක කියන්නෝ වෙති. සන්තිකාවචරයන්ගේ උපසමය මෙසේනම් ශාස්තෲන් වහන්සේගේ කෙබඳු වේදැයි මෙසේ සංඝ සම්පත්තිය නිසා බුදුන් කෙරෙහි පහදිත්. සංඝයාගේ ශාස්තෲ ප්‍රශංසාව මෙසේය. යම් ප්‍රශංසාවක් සංඝයාට කෙරේද එය ශාස්තෲන්ටද, සංඝ ප්‍රශංසාව නිසා ශාස්තෲන් වහන්සේටද ප්‍රශංසාව සිදුවන බැවින් භාග්‍යවතුන් වහන්සේ ක්‍රම දෙකෙහිදීම අමෙහව තත්ථ යෙභුයොයන

**අනවසෙසං පසංසෙය්‍යුං යයි කී සේක. සමණො ගොතමො ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තති, යංවා පන භොන්තො පරෙ ගණාචරියා** ආදි තන්හි ද මේ අදහසමය.

සම්පත්ත, සමාදාන, සෙතුඝාත වශයෙන් විරති තුනකි. ඒ අතුරින් සම්පත්ත සමාදාන විරති මාත්‍රයම අන්‍යයන්ට වෙයි. සෙතුඝාත විරතිය මුළුමනින්ම නැත. තදංග, වික්ඛම්භණ, සමුච්ඡෙද, පටිප්පස්සද්ධි නිස්සරණ පහාණයන්හි අටසමවත් වශයෙන්ද විදර්ශනා මාත්‍ර වශයෙන් ද තදංග, වික්ඛම්භණ, පහාණ මාත්‍රයම අන්‍යයන්ට වෙයි. ඉතිරි ප්‍රහාණ තුන මුළුමනින්ම නැත.

එසේම සීල සංවරය, ඛන්ති සංවරය, ඤාණ සංවරය, සති සංවරය, විරිය සංවරය යැයි සංවර පසෙකි. ඒ අතුරින් පංචශීල මාත්‍රයද, අධිවාසන ඛන්ති මාත්‍රයද අන්‍යයන්ට වෙයි. සෙස්ස මුළුමනින්ම නැත.

උපෝසථ උද්දේස පසෙකි. ඒ අතුරින් පංචශීල මාත්‍රයම අන්‍යයන්ට වෙයි. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය කැලම නැත. මෙසේ අකුශල ප්‍රහාණයෙහිද, කුශල සමාදානයෙහිද, විරති තුනෙහිද, ප්‍රහාණ පසෙහිද, සංවර පසෙහිද, උද්දේශ පසෙහිද 'මම ම ද මාගේ ශ්‍රාවක සංඝයාද ලෝකයෙහි පැනේ. මා හා සමාන ශාස්තෘවරයෙක් හෝ මාගේ ශ්‍රාවක සංඝයා හා සමාන සංඝයක් නැතැ'යි භාග්‍යවතුන් වහන්සේ සිංහනාද පවත්වන සේක. මෙසේ සිංහනාද කොට ඒ සිංහනාදයෙහි වෙනසක් නැති බව අවබෝධ කිරීම පිණිස **අත්ථි කස්සප මග්ගො** ආදිය කී සේක.

එහි මග්ගො යනු ලෝකෝත්තර මාර්ගයයි. **පටිපදා** පූර්වභාග ප්‍රතිපදාවයි. කාලවාදී ආදිය බ්‍රහ්මජාලයෙහි වර්ණනා කරන ලදී. දැන් දෙවැදෑරුම් මාර්ගයද ප්‍රතිපදාවද එක්තැන්කොට දේශනා කරන සේක් අයමෙව අරියො ආදිය කී සේක.

මෙය අසා අචේල මෙසේ සිතීය. 'ශ්‍රමණ ගෞතම මට ම මාර්ගයද ප්‍රතිපදාවද ඇත්තේය, අන්‍යයන්ට නැත්තේ යයි හඟියි. ඔහුට අපගේ මාර්ගය කියමියි ඉන්පසු අචේලක ප්‍රතිපදාව කීය. එහෙයින් කීය. **එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච -පෙ- උදකො රොහනානුයොග මනුයුත්තො විහරති** යනුවෙන්.

එහි **තපොපක්කමා** තපස ආරම්භ කිරීම්, තපස් කර්ම යන අර්ථයි. **සාමඤ්ඤ සංඛාතා** ශ්‍රමණකර්ම සංඛ්‍යාත, **බ්‍රහ්මඤ්ඤ සංඛාතා** බ්‍රාහ්මණ කර්ම සංඛ්‍යාත. **අචෙලකො** නිර්වස්ත්‍ර නග්න. **මුත්තාචාරො** පිටකිරීමේ ආචාරය. මුත්‍ර කිරීම් ආදියෙහි ලෞකික කුල පුත්‍රයන්ගේ ආචාරයක් නැතිව සිටියේම මුත්‍ර කරයි. මලපහ කරයි. කයි. අනුභව කරයි. **හත්ථාවලෙඛනො** අතෙහි බත්පිඩ ඇතිකල්හි දිවෙන් අත ලෙවකයි. අතෙහි මුත්‍රකොට දඬුවක්ය යන හැඟීමෙන් අතින් පිසදමයි. 'ස්වාමීනි, භික්‍ෂාව ගැනීමට එන්නැයි කී කල්හි නොවන්නේ නුයි **න එහි භදන්තිකො** නම් වේ. එසේනම් සිටින්න ස්වාමීනියි කියූ කල්හිද නොසිටීනුයි **නතිට්ඨභදන්තිකො** නම් ඔහුගේ වචන දෙකම කරන ලද්දේ වන්නේ යයි නොකරයි. **අභිහටං** පෙරාතුව ගෙන ආ භික්‍ෂාව. **උද්දිස්සකටං** 'මේ ඔබතුමා සඳහා කරන ලදැයි මෙසේ දන්වන ලද භික්‍ෂාව. **නිමන්තණං** අසුවල් නම් කුලයට, වීදියට ගමට පිවිසෙන්නැයි මෙසේ ආරාධනා කරන ලද භික්‍ෂාවද නොඉවසයි. නොගනියි. **නකුම්භිමුඛා** හට්ටියෙන් ගෙන දෙනු ලබන භික්‍ෂාව නොගනී. **න කලොපිමුඛා** කලොපි යනු පැස එයින්ද නොගනී. කුමක් හෙයින්ද යත්, හට්ටි පැස් ආදිය මා නිසා හැන්දෙන් පහර ලබතියි, **නඑළක මන්තරං** එළිපත්ත මැදිකොට දෙනු ලබන දෙය නොගනී. කුමක් හෙයින්ද යත්, මෙය මා නිසා මැදිකිරීමක් ලබතියි, දඬු මොහොල් ආදියෙහිද මේ ක්‍රමයයි.

**ද්විනංං** දෙදෙනකු අනුභව කරන කල්හි එකකු නැගිට දෙනකල්හි නොගනී. කුමක් හෙයින්ද යත්, ආහාරයට අනතුරක් වෙතියි. **න ගබ්භිනියා** ආදී තන්හි ගැබිනියගේ කුසයෙහි දරුවා වෙහෙසට පත්වෙතියි 'කිරි පොවන්නියගෙන් කිරට අනතුරක් වෙති'යි පුරුෂයා සමග සිටින්නියගෙන් රතියට අන්තරායක් වෙති'යි නොගනී.

**සංකිත්තීසු** එකතුකොට කළ බතෙහි දුර්භික්‍ෂ සමයෙහි අචේලක ශ්‍රාවකයෝ අචේලකයන් සඳහා තැනින් තැනින් සහල් ආදිය එකතුකරවා බත් පිසත්. උසස් අචේලකයෝ එය නොපිළිගනිති.

**න යත්ථසා** යම්තැනක සුනඛයා 'පිඬු ලබම්'යි එළඹ සිටින්නේ වේද, එහි ඌට නොදී ගෙන ආ භික්‍ෂාව නොගනී. කුමක් හෙයින්ද යත්, උගේ ආහාරයට අනතුරක් වෙතියි.

**නමක්ඛණා සණ්ඩ සණ්ඩචාරිනී** සමූහ සමූහ වශයෙන් හැසිරෙන, අචේලකයකු දැක 'මොහුට පිඬු දෙමි'යි මනුෂ්‍ය ගති ඇත්තෝ බත්ගෙයට පිවිසෙත්. ඔවුන් පිවිසෙන කල්හි සැළි මුව ආදී තන්හි සැඟවී දුන් මැස්සෝ උඩට නැගී සමූහ සමූහව හැසිරෙත්. එයින් ගෙන ආ භික්ෂාව නොගනී. කුමක් හෙයින්ද යත්, මා නිසා මැස්සන්ගේ ගොදුරට අනතුරක් වූයේ යැයි.

**ථුසොදකං** සියලු ශස්‍ය ගොඩවලින් (කතංසුවීරකනං) මෙහි සුරාපානයද සාවද්‍යය. මොහු වනාහි සියල්ලෙහි සාවද්‍ය සංඥා ඇත්තෙකි. **එකාගාරිකො** යමෙක් එකම ගෙයක භික්ෂාව ලැබ නවතීද ඔහු. **එකාලොපිකො** එකම බත් පිඩකින් යැපෙයි. ගෙවල් දෙකක් ආදි තන්හිද මෙම ක්‍රමයයි.

**එකිසසාපි දත්තියා** එක් කුඩා බඳුනකින්. දත්ති නම් එක් කුඩා බඳුනකි. යම්තැනෙක අග්‍ර භික්ෂාව බහා තබත්ද. **එකාහිකං** එක් දවසක් ඇතුළත **අඩමාසිකං** අඩමසක් ඇතුළත.

**පරියාය භත්තභොජනං** අලුත් කොළ භක්ෂක. **සාමාකභක්ඛො** සාමාක සහල් කන. **නීවාර** ආදී තන්හි නීවාර නම් වනයෙහි ඉබේ හටගත් වී වර්ගයකි. **දද්දුලං** සම්කරුවන් විසින් සම් කපා විසිකරන ලද කසල. **හටං** සෙමද සෙවලද. **කණං** සහල් නිවුඩු **ආචාමො** බත්සැළියෙහි ලැගුණු දඬුබත් (දංකුඩ) එය ඉවත දැමූ තැනින් ගෙන කයි. කැඳ බත් යයිද කියත්. **පිඤ්ඤාකාදයො** (තල පුන්නක්කු) ප්‍රකටමය. **පවත්තඵලභොජී** වැටුණු ගෙඩි අනුභව කරන. **සාණානි** හණ කෙන්දෙන් වියූ රෙදි. **මසාණානි** මිශ්‍ර රෙදි. **ඡවදුසසානි** මළසිරුරින් ඉවත් කරගත් රෙදි. **ඒරක** තෘණ ආදිය වියා කළ රෙදි. **පංසුකුලානි** පොළොවෙහි දැමූ රෙදි කොන්. **තිරීටකානි** තිරීටක ගසේ පොත්තෙන් කළ වස්ත්‍ර. **අජිනං** අඳුන් දිවිසම. **අජිනක්ඛිපං** එයම මැදින් පැලූ සම. **කුසචීරං** කුසතණ වියා කළ සිවුර. **වාකචීර** **ඵලකචීර** ආදී තන්හිද මේ ක්‍රමයමැයි.

**කෙස කම්බලං** මිනිස් කෙසින් කළ කම්බිලිය, යමක් සඳහා කියන ලද ද, මහණෙනි, යම් කෙන්දෙන් වියූ යම් වස්ත්‍රයක් වේද ඒවා අතර කේසකම්බලය පිළිකුල් යයි කියනු ලැබේ. මහණෙනි, කේසකම්බලය සීත කාලයට සීතලය. උෂ්ණ කාලයට උණුසුම්ය. දුර්වර්ණය. දුර්ගන්ධය.

දුස්පර්ශය. **වාලකම්බලං** අශ්ව වලිගයෙන් කළ කම්බිලිය. **උලුකපක්ඛිකං** උකුස්සන්ගේ පියාපත්වලින් කළ රෙදි. **උක්කුටිකප්පධාන මනුයුත්තො** උක්කුටික වීර්යයෙහි යෙදුණේ යන්නේ ද උක්කුටිකව උඩ පැන පැන යයි. **කණ්ටකාපස්සයිකො** යකඩ ඇණ හෝ කටු හෝ බිම ඇණ එහි සමක් අතුරා සිටීම් ඇවිදීම් ආදිය කරයි. **සෙය්‍යං** නිදන්නේ ද එහිම නිදයි. **ඵලකසෙය්‍යං** ලෑලිවල නිදයි. **ථණ්ඩිලසෙය්‍යං** උස්බිමක නිදයි. **එකපස්සයිකො** එක් පසෙකින්ම නිදයි. **රජොජල්ලධරො** සිරුර තෙල් ගල්වා ධූලි ඇති තැන්වල සිටී. එවිට සිරුරේ ධූලි බැඳේ. නොදරයි. **යථා සන්ථතිකො** ලැබුණු අසුන නොසොල්වා යමක් ලබයිද එහිම හිඳිනසුලු. **වෙකටිකො** විකට කන සුලු, විකට යනු වර්චස් යයි කියනු ලැබේ. **අපානකො** ප්‍රතික්ෂේප කරන ලද ශීතල ජල පානය ඇත්තේ. **සායතතියකං** සායන්තියක. උදේ මද්දහන සවස යන දවසට තෙවරක් පව් සෝදා හරින්නෙමියි ජලයට බැසීමෙහි යෙදීමෙන් වාසය කරයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සීල සම්පදා ආදිය හැර ඔවුන්ගේ තපස් උපක්‍රමවල නිරර්ථක බව දක්වන සේක් **අචෙලකො චෙපි කස්සප හොති** ආදිය කී සේක.

එහි ආරකාවා දුරින්ම **අවෙරං** දෝෂ වෛර නැති. **අබ්‍යාපජ්ඣං** දෝමනස්ස ව්‍යාපාද නැති.

**දුක්කරං හො ගොතම** මෙය කාශ්‍යප 'අපි පූර්වයෙහි ශ්‍රමණ භාවයත්, බ්‍රහ්ම භාවයත් මෙපමණකැයි කීවෙමු. ඔබතුමා අන්‍ය වූම ශ්‍රමණ භාවයකුත් බ්‍රහ්ම භාවයකුත් කියතියි දක්වන්නේ කීය. **පකති බො එසා** මෙය ප්‍රකෘති කථාවකි. **ඉමාය ච කස්සප මත්තාය** කාශ්‍යප, ඉදින් මේ ප්‍රමාණයෙන්, මෙසේ සුළු ප්‍රතිපත්ති ක්‍රමයකින් ශ්‍රමණ බව හෝ බමුණු බව දුෂ්කර, අති දුෂ්කර විය හැකිය. ඉන්පසු මහණ බව දුෂ්කර යයි සුදුසු වචනයක් නොවන්නේ දැයි මෙහි පද සම්බන්ධය සමග අර්ථයයි. මේ ක්‍රමයෙන් සියලු තැන පද සම්බන්ධය දතයුතුය.

**දුජ්ජානො** මෙයද ඔහු 'අපි පූර්වයේදී මෙපමණකින් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වේයයි කීවෙමු. ඔබතුමා වෙනත් අයුරකින් කියතියි යන්න සඳහා කීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ ප්‍රකෘතිවාදය ප්‍රතික්ෂේප කොට ස්වභාවයෙන් දැනීම දුෂ්කර බව හෙළිදරව් කරන සේක් නැවතද **පකතිකො** ආදිය කී සේක. එහිද කියන ලද ක්‍රමයෙන්ම පද සම්බන්ධ කොට අර්ථය දතයුතුය. **කතමාපන සා භොගොතම** කුමක් නිසා අසයිද මේ පණ්ඩිතයා භාග්‍යවතුන් වහන්සේ කථා කරද්දීම කථාව අල්ලාගත්තේය. ඉක්බිති තමාගේ ප්‍රතිපත්තියෙහි නිරර්ථක බව දැන **සමණො ගොතමො තසස චායං සීලසමපදා චිතත සමපදා පඤ්ඤා සමපදා අභාවිතා හොති අසචඡිකතා අථබො සො ආරකාව සමඤ්ඤා** ආදිය කී සේක.

**හඥානි නං තා සමපතතියො පුචඡාමි** සීල සම්පදා ආදිය දැනගනු පිණිස විචාරයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට බුදු උපත දක්වා ශුද්ධ ධර්මය කියනසේක් ඒ සමාපත්තීන් දැක්වීමට **ඉධකසසප** ආදිය කී සේක. **ඉමාය ච කසසප සීල සමපදාය** මෙය රහත්බව සඳහාම කියන ලදී. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය අර්හත්වය අවසන්කොට ඇත්තේය. ඒ නිසා අර්හත් ඵලයෙන් යුත් අන්‍ය උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ සීලසම්පදා ආදී සම්පදා නැතැයි කී සේක. මෙසේද කියා දැන් අනුත්තර වූ බුද්ධ සිංහනාදය පවත්වන සේක් **සනති කසසප එතෙ සමණ බ්‍රාහමණා** ආදිය කී සේක.

එහි අරියං උපක්ලේශ නැති පරම විශුද්ධ. **පරමං** උත්තම පංචශීලය ආදිකොට ප්‍රාතිමෝක්ෂ ශීලය තෙක් ශීලයමය. ලෝකෝත්තර මාර්ග ඵල සම්ප්‍රයුක්ත වූයේ පරම ශීල නම්. **නාහංතත්‍ථ** එහි ශීලයද පරම ශීලයද මම තමාට සම සමය. මාගේ ශීලය හා සමාන ශීලයෙන් මා හා සමාන පුද්ගලයකු නොදකිමි යන අර්ථයි.

**අහමෙව තතථ භියෙ‍‍ය්‍යා** මම ම ඒ ශීලයෙහි උත්තමය. කවර ශීලයකද, **යදිදං අධිසීලං** ඒ උත්තම ශීලය යන අර්ථයි. මෙසේ මේ පළමුවැනි සිංහනාදය පවත්වන සේක.

**තපො ජිගුචඡවාදා** යමෙක් තපසෙහි පිළිකුල කියත්ද, එහි දවානුයි = තපො. කෙලෙස් තවාලන වීර්යයට මෙය නමකි. ඒ කෙලෙස් පිළිකුල් කරානුයි **ජිගුචඡා. අරියාපරමා** මෙහි නිර්දෝෂ බැවින් අරිය නම්. අෂ්ට ආරම්භක වස්තු වශයෙන් ද උපන් වීර්ය සංඛ්‍යාත විදර්ශනාව තපස පිළිකුල් කරන්නකි. තපස පිළිකුල් කිරීමට මාර්ගඵල සම්ප්‍රයුක්ත පරම

නම් වේ. අධිජෙගුච්ඡං ජිගුච්ඡාවෙහි භාවය - ජෙගුච්ඡං. උතුම් වූ ජෙගුච්ඡාව = අධිජෙගුච්ඡං. ඒ නිසා අධිජෙගුච්ඡ වේ. එහි අහමෙව භීයෙ‍්‍යා යයි මේ මෙහි අර්ථයයි දතයුතුයි.

ප්‍රඥාධිකාරයෙහිද කම්මස්සකතා පඤ්ඤාවද, විපස්සනා පඤ්ඤාවද පඤ්ඤා නම්. මාර්ගඵල සම්ප්‍රයුක්ත වූයේ පරම පඤ්ඤා නම්. අහමෙව එත්ථ භියෙ‍්‍යා විමුක්ති අධිකාරයෙහි තදංග වික්ඛම්භණ විමුක්තීහු විමුත්ති නම්. සමුච්ඡෙද පටිප්පස්සද්ධි නිස්සරණ විමුක්තීහු පරම විමුත්ති යයි දතයුතුය.

මෙහිද **යදිදං අධිමුත්ති** යම් මේ අධි මුත්තියක් වේද, මම මෙහි උසස්ය යන අර්ථයි. **සුඤ්ඤාගාරෙ** හිස් ගෘහයෙහි. හුදෙකලාව හිඳ යන අදහසයි.

**පරිසාසුවා** අට පිරිස්හි. මෙය කියන ලදී. සාරිපුත්ත, තථාගතයන්ගේ වෛශාරද්‍ය සතරකි. යම් වෛශාරද්‍යයන්ගෙන් යුත් තථාගත තෙමේ උතුම් තැන දනී. පිරිස් මැද සිංහනාද කරයි යනුවෙන් සූත්‍රය විස්තර කළ යුතුය.

**පඤ්හංච නං පුච්ඡන්ති** පණ්ඩිතයෝ දෙව් මිනිසුන්ගේ ප්‍රශ්න එකතුකොට අසත්. **ව්‍යාකරොති** එකෙණෙහිම විසඳයි. **චිත්තං ආරාධෙති** ප්‍රශ්න විසඳීමෙන් මහජනයාගේ සිත සන්තෝෂ කෙරේමය.

**නොච බො සොතබ්බං මඤ්ඤන්ති** සිත් සතුටුකොට කියන්නහුගේ වචනය අන්‍යයන් ඇසිය යුතුයයි හඟිත්. මෙසේ කියන්නාහුය යන අර්ථයි. **සොතබ්බඤ්චස්ස මඤ්ඤන්ති** දෙවියෝ ද මනුෂ්‍යයෝ ද මහත් උත්සාහයෙන් ඇසිය යුතුයයි හඟිත්. **පසීදන්ති** සුප්‍රසන්න යහපත් සිත් ඇත්තාහු මෘදු සිත් ඇත්තාහු වෙත්. **පසන්නාකාරං කරොන්ති** මුළුමනින්ම පැහැදුණෝ වෙත්. ප්‍රණීත වූ සිවුරු ආදිය වේළුවන විහාර ආදියද මහා විහාරයෙහි පරිත්‍යාග කරන්නෝ ප්‍රසන්න ආකාරයක් කරති. **තථත්තාය** උන්වහන්සේ යම් ධර්මයක් දේශනා කරන සේක්ද, තථාභාවය නිසා ධර්මානුධර්ම ප්‍රතිපත්ති පිරීම පිණිස පිළිපදිත් යන අර්ථයි. **තථත්තාය ච පටිපජ්ජන්ති** තථාභාවය ද පිළිපදිත්. භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්මය අසා සමහරු සරණයන්හිද සමහරු පංචශීලයෙහිද පිහිටත්.

ඇතමෙක් නික්මී පැවිදි වෙති. **පටිපනනාව ආරාධෙනති** ඒ ප්‍රතිපදාවට පිළිපන්නෝ නොපුරන්නට නොහැකිවෙත්. සර්වාකාරයෙන් පුරත්. ප්‍රතිපත්ති පිරීමෙන් භවත් ගෞතමයන්ගේ සිත සතුටු කරත්යයි කිවයුතුය. මේ අවකාශයෙහි සිට සිංහනාද ගැළපිය යුතුය.

**එකචචං තපසසිං නිරයෙ නිබබතතං පසසාමි** මෙය භාග්‍යවතුන් වහන්සේගේ එක් සිංහනාදයකි. ස්වර්ගයෙහි උපන්නාහු දකිමියි එකකි. අකුශල ධර්මයන් ප්‍රහාණයේදී මම ම ශ්‍රේෂ්ඨ වෙමි යි එකකි. කුශලධර්ම සමාදානයෙහි මම ම ශ්‍රේෂ්ඨ වෙමි යි එකකි. අකුශල ධර්මයන් ප්‍රහාණයේදී මාගේම ශ්‍රාවක සංඝයාම ශ්‍රේෂ්ඨයයි එකකි. කුශල ධර්මයන් සමාදානයෙහි මාගේම ශ්‍රාවක සංඝයාම ශ්‍රේෂ්ඨයයි එකකි. ශීලයෙන් මා හා සමාන වූවෙක් නැතැයි එකකි. වීර්යයෙන් මා හා සමාන වූවෙක් නැතැයි එකකි. ප්‍රඥාවෙන් මා හා සමාන වූවෙක් නැතැයි එකකි. විමුක්තියෙන් මා හා සමාන වූවෙක් නැතැයි එකකි. සිංහනාද කරන්නේ පිරිස් මැද හිඳ කරමියි එකකි. විශාරදව නාද කරමියි එකකි. මාගෙන් ප්‍රශ්නයක් අසත් යනු එකකි. ප්‍රශ්නයක් අසන ලද්දේ විසඳමියි එකකි. විසඳීමෙන් අන්‍යයන්ගේ සිත් සතුටු කරමියි එකකි. ඇසිය යුත්තක් මාගේ යයි හඟිත් යනු එකකි. අසා මා කෙරෙහි පහදිත් යනු එකකි. පහන් වූවෝ පහන් වූ ආකාරයක් දක්වත් යනු එකකි. යම් ප්‍රතිපත්තියක් දෙසම්ද, තථ බවම පිළිපදිත් යනු එකකි. පිළිපන්නාහු මා සතුටු කෙරෙති යනු එකකි.

මෙසේ පළමු දහය අතුරින් එක එකක් පිරිස් මැදම කරයි ආදී පරිවාර දහයකි. මෙසේ ඒ දහය පළමු දහයට පරිවාර වශයෙන් සියයකි. පළමු දහයද ඇතුළුව සිංහනාද එකසිය දහයකි. මින් අන් සූත්‍රයක මෙපමණ සිංහනාද දුර්ලභය. ඒ නිසා මේ සූත්‍රය මහා සීහනාද යයි කියනු ලැබේ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ **සීහනාදං ඛො සමණො ගොතමො** නදති. **තඤචඛො සුඤඤාගාරෙ** නදති මෙසේ වාදයන්ගේ වාදය ප්‍රතික්ෂේප කොට දැන් පරිසතිං නද කරන ලද විරූ සිංහනාදය දක්වන සේක් **එකමිදාහං** ආදිය කී සේක.

**එහි තත්‍ර මං අඤඤතරො තපබ්‍රහමචාරී** එහි රජගහනුවර ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කරන මාගෙන් එක්තරා තප බ්‍රහ්මචාරී නිග්‍රෝධ නම්

පරිබ්‍රාජකයෙක් අධිජෙගුච්ඡ වීර්යයෙන් පාපයන් පිළිකුල් කරන ආකාරයේ ප්‍රශ්නයක් ඇසීය. මෙය භාග්‍යවතුන් වහන්සේ ගිජ්ඣකූට මහා විහාරයෙහි හුන් සේක් උදුම්බරිකා දේවියගේ උයනෙහි හුන් නිග්‍රෝධ පරිබ්‍රාජකයාගේ සහ සන්ධාන උපාසකයාගේ කථා සල්ලාපය දිබ්බසෝත ධාතුවෙන් අසා අහසින් ගොස් ඔවුන් අසල පැනවූ අසුනෙහි හිඳ නිග්‍රෝධ විසින් අධිජෙගුච්ඡ ගැන අසන ලද ප්‍රශ්නය විසඳූ සේක. ඒ සඳහා කියන ලදී.

**පරංවිය මත්තාය** පරම මාත්‍රයෙන්. ඉතා මහත් ප්‍රමාණයකින් යන අර්ථයි. **කොහි** භනෙත අඥබාල දෘෂ්ටිගතිකයා හැර අනික් පණ්ඩිත ජාතිකයෙක්. භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා කවරෙක් නම් සතුටු නොවේදැ'යි කියයි. **ලභෙය්‍යාහං** භේ අනෛර්යාණික පක්‍ෂයෙහි යොදා ආත්මය වෙහෙසට පත්කරන මා හට දැන් බොහෝකල්ය. වියලි ගංතෙර නහන්නෙමියි පෙරළෙන්නාක් මෙන්, දහයියා කොටන්නාක් මෙන් කිසි ප්‍රයෝජනයක් ලැබුණේ නැත. දැන් තමා යොදන්නෙමියි සිතා ඇසීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඛන්ධකයෙහි යම් තීර්ථක පරිවාසයක් පනවා ඇත්ද, යමෙක් අන්‍ය තීර්ථකයකුව සාමනේර භූමියෙහි සිටියේ, ස්වාමීනි, මම අසුවල් නම් ඇති අන්‍ය තීර්ථකයකු වූ විරුම්. මේ ශාසනයෙහි උපසම්පදාව අපේක්‍ෂා කරමි. ස්වාමීනි, ඒ මම සංඝයාගෙන් සිව්මසක පරිවාසය ඉල්ලා සිටිමියි ආදී ක්‍රමයෙන් සමාදන්ව වසයි. ඒ සඳහා **යො ඛො කසසප අඤ්ඤතිත්ථිය පුබ්බෙ** ආදිය කී සේක.

**එහි පබ්බජ්ජං** වචන සිලිටි බව සඳහාම කියන ලදී. පරිවාස නොවසාම පැවිද්ද ලබයි. උපසම්පදාව අපේක්‍ෂා කරන්නකු විසින් මහදවල් කාලයෙහි, ගම් නොවැදීම ආදී වත් අටක් පුරා පරිවාස විසිය යුතුය. **ආරද්ධචිත්තා** අටවත් පිරීමෙන් තුටු වූ සිත් ඇත්තේ, මේ මෙහි සංක්‍ෂේපයයි. මේ තිත්ථිය පරිවාසය විස්තර වශයෙන් සමන්ත පාසාදිකා විනයට්ඨ කථාවෙහි පබ්බජ්ජාක්ඛන්ධකයෙහි කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය.

**අපිචමෙත්ථ** තවද මට මෙහි. **පුග්ගල වෙ මත්තතා විදිතා** පුද්ගල නානාත්වය දන්නා ලදී. මේ පුද්ගලයා පරිවාසයට සුදුසුය. මොහු සුදුසු නොවේ යැයි මෙය මට ප්‍රකටයැයි දක්වයි. ඉන්පසු කාශ්‍යප මෙසේ සිතීය. බුද්ධ ශාසනය ආශ්චර්යයි. යම්තැනක මෙසේ ගටා කොටා යුතු

දෙයම ගනිත්ද, අයුත්ත ඉවතලයිදැයි ඉන්පසු බෙහෙවින් පැවිද්ද කෙරෙහි හටගත් උත්සාහ ඇත්තේ සචෙ භනෙත ආදිය කීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ තියුණු කැමැත්ත දැන 'කාශ්‍යප පරිවාසයට නුසුදුසුයැයි එක්තරා භික්ෂුවක් ඇමතූ සේක. භික්ෂුව යන්න. කාශ්‍යප නහවා පැවිදිකොටගෙන එන්න. හේ එසේ කොට ඔහු පැවිදි කරවා භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහු සඟමැද හිඳුවා උපසම්පදා කළ සේක. එහෙයින් කියන ලදී. **අලත්ථ ඛො අචෙලො කසසපො පබ්බජ්ජං අලත්ථ උපසමපදං** යනුවෙන්.

**අචිරූපසමපනෙනා** උපසපන්ව නොබෝ කලෙකින්. **වූපකටෙඨා** වස්තු කාම ක්ලේශ කාමයන්ගෙන් කයින්ද සිතින්ද වෙන් වූයේ. **අපපමතෙතා** කමටහනෙහි සිහිය අත්නොහරින්නේ. **ආතාපී** කායික චෛතසික සංඛ්‍යාත වූ වීර්ය නැමති අව්වෙන් තැවෙන. **පහිතතෙතා** කයෙහිද දිවියෙහිද අපේක්ෂා නැති බැවින් මෙහෙයවන ලද්දා වූද විසිරුණු ආත්මභාවය. **යසසත්ථාය** යම් ප්‍රයෝජනයක් සඳහා. **කුල පුතතා** ආචාර කුලපුත්‍රයෝ. **සමමදෙව** හේතු ඇතිවද කරුණු ඇතිවද, **තදනුතතරං** ඒ අනුත්තර වූ **මගග බ්‍රහමචරිය පරියොසානං** මාර්ග බ්‍රහ්මචර්යයෙහි අවසානය වූ අර්හත් ඵලය. ඒ අර්ථය සඳහා කුලපුත්‍රයෝ පැවිදි වෙති. **දිටෙඨව ධමෙම** මේ අත්බැවෙහිම. **සයං අභිඤ්ඤා සචඡිකතවා** තමාගේම ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂකොට අපර ප්‍රත්‍යකොට යන අර්ථයි. **උපසමපජ්ජ විහාසි** පැමිණ හෝ සම්පාදනය කොට හෝ වාසය කළේය. මෙසේ වාසය කරන්නේ ද **ඛීණාජාති -පෙ- අමහඤ්ඤාසි** මෙසේ මොහුට ප්‍රත්‍යවේක්ෂණ භූමිය දක්වා රහත් බව කුළුගැන්වීමෙන්ම දේශනාව නිමවන්නට **අඤ්ඤතරො පනායසමා කසසපො අරහතං අහොසි** යි කියන ලදී.

**තත්ථ අඤ්ඤතරො** යනු එක්කෙනෙක්. **අරහතං** භාග්‍යවතුන් වහන්සේගේ රහත් බව ලැබූ ශ්‍රාවකයන්ගේ අභ්‍යන්තරයෙක් වීයයි මෙහි අදහසයි. යම් යම් දෙයක් අතරින් පතර නොකියන ලද්දේ ද ඒ ඒ දෙය ඒ ඒ තැනදී කියන ලද බැවින් ප්‍රකටමය.

**කස්සප සීහනාද සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

# පොට්ඨපාද සූත්‍ර වර්ණනාව

**එවං මෙ සුතං -පෙ- සාවත්ථියං** යනු පොට්ඨපාද සූත්‍රයයි. මේ එහි අපූර්වපද වර්ණනාවයි.

**සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ** සැවැත්නුවර නිසා ජේත කුමරුගේ වනයෙහි අනාථ පිණ්ඩික ගෘහපතියා විසින් ආරාමයක් කරවන ලදී. එහි වාසය කරන සේක. **පොට්ඨපාදො පරිබ්බාජකො** නමින් පොට්ඨපාද නම් ඡන්න පරිබ්‍රාජකයා ඔහු වනාහි ගිහිකල බ්‍රාහ්මණ මහාසාරයෙකි. කාමයන්හි ආදීනව දැක සතළිස් කෙළක් පමණ භෝග රාශිය අත්හැර පැවිදිව තීර්ථකයන්ගේ ගණාචාර්ය විය. සමය මෙහි කියත්නුයි **සමයප්පවාදකො**. මේ ස්ථානයෙහි චංකිතාරුක්ඛ, පොක්ඛරසාති ආදීන්ගේ පටන් බ්‍රාහ්මණයෝ නිගණ්ඨයෝ අචේලක පරිබ්‍රාජක ආදීහු පැවිදි වූවෝ එක්රැස්ව තම තමාගේ සමය ගැන කියති. කථා කරති. විස්තර කරති. ඒ නිසා ඒ ආරාමය **සමයප්පවාදක** යයි කියනු ලැබේ. තින්දුකාචීර සංඛ්‍යාත වූ තිඹිරි රුක් පෙලකින් වටවූ බැවින් **තින්‍දුකාචීරො** මෙහි පළමුවෙන් එකම ශාලාවක් වූ හෙයින් මහා පුණ්‍ය පරිබ්‍රාජකයා නිසා පසුව බොහෝ ශාලා කරවන ලදී. ඒ නිසා ඒ එකම ශාලාව නිසා ලැබුණු නම වශයෙන් **එකසාලක** යයි කියනු ලැබේ. ප්‍රසේනජිත් කෝසල රජුගේ දේවිය වූ මල්ලිකාවගේ උයන වූ මෙය මල්පලයෙන් යුතු ආරාමය මල්ලිකාගේ ආරාමයයි ප්‍රසිද්ධියට ගියේය. ඒ නිසා **සමයප්පවාදකෙ තින්‍දුකාචීරෙ එකසාලකෙ මල්ලිකාය ආරාමෙ පටිවසති** විසීම් පහසුව නිසා වාසය කරන සේක.

ඉක්බිති එක් දවසක් භාග්‍යවතුන් වහන්සේ අලුයම් වේලෙහි සර්වඥතා ඥානය පතුරුවා ලෝකය දෙස බලන සේක් ඥාන ජාලය තුළට පැමිණි පරිබ්‍රාජකයා දැක 'මේ පොට්ඨපාද මාගේ ඥාන ජාලයෙහි පෙනේ. කුමක් වන්නේදැයි පරීක්ෂාකොට බලන සේක් 'මම අද එහි යන්නෙමි. එවිට පොට්ඨපාද මාගෙන් නිරෝධයද නිරෝධයෙන් නැගී සිටීමද අසන්නේය. මම ඔහුට සියලු බුදුවරුන්ගේ ඥානය සමග සසඳ ඒ දෙකම කියන්නෙමි. දවස් කිහිපයක ඇවෑමෙන් චිත්තහත්ථි සාරිපුත්ත

රැගෙන මා සමීපයට එන්නේය. මම ඔවුන්ට දහම් දෙසන්නෙමි. දේශනාව අවසන පොට්ඨපාද මා සරණ යන්නේය. හත්ථි සාරිපුත්ත චිත්ත මා සමීපයෙහි පැවිදිව රහත්බවට පැමිණෙන්නේ යයි දුටු සේක.

ඉන්පසු උදෑසන සිරුරු පිළිදැගුම් කොට සුරත් දෙපට සිවුර හැඳ විදුලිය වන් කාබහන බැඳ යුගඳුරු පව්ව වටකොට සිටි වැසි වලාකුළක් බඳු මේවන් පසුල් සිවුර ඒකාංශකොට අලුත් සෙල්වූවා පාත්‍රය වම් උරහිස එල්ලාගෙන සැවැත්නුවර පිඬු පිණිස පිවිසෙන්නෙමියි හිමවත් පාමුලින් එන සිංහයකු මෙන් විහාරයෙන් නික්මුණු සේක. මේ අර්ථය සඳහා 'අථඛො භගවා' ආදිය කීය.

එතදහොසි නුවර දොර සමීපයට ගොස් තමාට රිසි පරිදි සූර්යයා දෙස බලා කල්වැඩි බවම දැක මෙසේ සිතිණ. **යනූනාහං** සැකය ප්‍රකාශ කෙරෙන නිපාතයකි. බුදුවරුන්ට සැකයක් නම් නැත. මෙය කරන්නෙමි. මෙය නොකරන්නෙමි. මොහුට ධර්මය දේශනා කරන්නෙමි. මොහුට ධර්මය දේශනා නොකරන්නෙමියි මෙසේ විතර්කයක් පූර්වභාගයෙහි සියලු බුදුවරුන්ට ලැබේ. එහෙයින් කීය. **යනූනාහං** යනුවෙන් ඉදින් මම යන අර්ථයි.

උන්නාදිනියා උස්හඬ නගන. මෙසේ හඬනගන අයගේ උඩින් ගමන් කිරීම් වශයෙන් උච්ච නම්. දිශාවන්හි පැතිරීම් වශයෙන් මහා ශබ්ද වේ. උස්හඬ පැතිරුණු හඬ ඇති බැවින් උච්චාසද්ද මහාසද්ද වේ. ඒ පරිබ්‍රාජකයන්ට උදෑසන නැගිට කළයුතු සැවත් හෝ බෝමළුවත් හෝ ආචාර්ය උපාධ්‍යායවත් හෝ යෝනිසෝ මනසිකාරයක් හෝ නැත. ඒ නිසා ඔවුහු උදෑසනම නැගිට ළාහිරු රැසෙහි හුන්නාහු මොහුගේ අත ලස්සනය. මොහු පා ලස්සනය. මෙසේ ඔවුනොවුන්ගේ අත්පා හෝ අරබයා ස්ත්‍රීපුරුෂ දාරක දාරිකාවන්ගේ ගුණ හෝ අනික් කාමාස්වාද උපදවා අනුපිළිවෙළින් රාජකථා ආදී අනේකවිධ වූ තිරිසන් කථා කියත්. එහෙයින් කියන ලදී. **උන්නාදිනියා උච්චාසද්ද මහා සද්දාය අනෙක විහිතං තිරච්ඡාන කථං කථෙන්තියා** යනුවෙන්.

ඉන්පසු පොට්ඨපාද පරිබ්‍රාජකයා ඒ පරිබ්‍රාජකයන් දෙස බලා මේ පරිබ්‍රාජකයෝ අතිශයින් ඔවුනොවුන්ට අගෞරව ඇත්තෝ ය. අපිද ශ්‍රමණ ගෞතමයන්ගේ පහළවීමේ පටන් හිරු නැගෙනවිට කණාමැදිරියන්

හා සමාන වීමු. අපගේ ලාභසත්කාරද පිරිහිණ. ඉදින් මෙතැනම ශ්‍රමණ ගෞතම හෝ ගෞතමගේ ශ්‍රාවකයෙක් හෝ ඔහුගේ ගිහි උපස්ථායකයෙක් හෝ එන්නේ නම් අතිශයින් ලජ්ජා වියයුතු වන්නේය. පිරිසගේ දොසක් වේනම් එය පිරිස් දෙටුවාගේම මත නැගෙන්නේ යයි ඔබමොබ බලන්නේ භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. එහෙයින් කියන ලදී. **අද්දසා ඛො පොට්ඨපාදො පරිබ්බාජකො -පෙ- තුණ්හී අහෙසුං** යනුවෙන්.

එහි **සණ්ඨපෙසි** හික්මවීය. ඇයගේ වරද වැසුවේය. යම්සේ මැනවින් පිහිටියාද එසේ ඇය තැබීය. යම්සේ පිරිස් මැදට පිවිසෙන පුරුෂයා වරද වසාගැනීම සඳහා ඇඳුම සකස් කරයිද, පොරෝනය සකසයිද, දූවිලි වැකුණු තැන් පිස දමයිද, මෙසේ ඇයගේ වරද වැසීම පිණිස **අප්පසද්දා භොන්තො** යනුවෙන් හික්මවන්නේ යම්සේ මනාව පිහිටියේද එසේ තැබීය යන අර්ථයි.

**අප්පසද්දකාමො** අල්ප ශබ්ද කැමති වෙයි. එකෙක් හිඳගනී. එකෙක් නැගිට සිටී. ගණ සංගණිකාවෙන් නොගැසේ. **උපසංකමි තබ්බං මඤ්ඤෙය්‍ය** මෙහි ආයුතු යයි හඟින්නේය. කුමක්හෙයින් මොහු භාග්‍යවතුන් වහන්සේගේ පැමිණීම අපේක්ෂා කරයිද? තමාගේ වෘද්ධිය ප්‍රාර්ථනා කරමින් පරිබ්‍රාජකයෝ වනාහි බුදුවරුන් හෝ බුදුසව්වන් හෝ තමා සමීපයට පැමිණිවිට අද අපේ ළඟට ශ්‍රමණ ගෞතම ආවේය. ශාරිපුත්‍ර ආවේය. ඔවුහු එක් එක් අය ළඟට යන්නෝ නොවෙති. අපගේ උතුම් බව බලවූ යයි තමාගේ උපස්ථායකයන් හමුවෙහි තමන් ඔසවා තබාගනිත්. උස්තැනක තබත්. භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයන් අල්ලාගන්ට වෑයම් කරත්. ඔවුහු භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයන් දැක මෙසේ කියත්. 'ඔබලාගේ ශාස්තෘ වූ භවත් ගෞතමයෝද ගෞතම ශ්‍රාවකයෝද අපගේ ළඟට එති. අපි ඔවුනොවුන් සමගියෙන් සිටිමු. ඔබලා නම් අප ඇසින් බැලීමටද නොකැමැතිය. සුහද කථාවක්වත් නොකරහුය. ඇයි ඔබලා අප සමග තරහද, ඉක්බිති සමහරු මිනිස්සු බුදුවරුද මොවුන්ගේ ළඟට පැමිණෙති. අපගේ සමීපයට කිම නොඑත්දැයි එතැන්පටන් ඔවුන් අත ප්‍රමාද නොවෙති. **තුණ්හී අහෙසුං** යනු පොට්ඨපාද පිරිවරා නිහඬව හුන්නාහුය.

**සවාගතං භනෙත** ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ සුභ ආගමනයක් විය. භාග්‍යවතුන් වහන්සේ පැමිණිවිට අපට ආනන්දයක්

වෙයි. ගියවිට ශෝකයක් වෙයි යයි දක්වයි. **චිරස්සං ඛො භන්තෙ** යනු කුමක් නිසා පැමිණියේද? භාග්‍යවතුන් වහන්සේ මීට පෙරත් මෙහි පැමිණි විරූද? නොගිය විරූද? මනුෂ්‍යයන්ගේ කොහේ යන ගමන් මෙහේ ආවේද? මංමුළා වුණාද? බොහෝ කලකින් ආවේ. මේ ආදී ප්‍රිය ව්‍යවහාරයක් වෙයි. ඒ නිසා මෙසේ කීය. මෙසේ කියා මානයෙන් තදව හුන්නේය. නැගිට භාග්‍යවතුන් වහන්සේට පෙරගමන් කළේය. භාග්‍යවතුන් වහන්සේ පැමිණිබව දැක ආසනයකින් නොපවරන්නේ හෝ ගෞරව නොකරන්නේ හෝ දුර්ලභය. කුමක් නිසාද? උසස් කුල ඇති බැවිනි. මේ පරිබ්‍රාජකයාද තමාගේ හුන් අසුන ගසා දමා භාග්‍යවතුන් වහන්සේට ආසනය පවරන්නේ **නිසීදතුභන්තෙ භගවා ඉදමාසනං පඤ්ඤත්තං** යයි කීය.

**අන්තරා කථා විප්පකථා** හිඳින්නා වූ ඔබගේ ආදියෙහි පටන් මාගේ පැමිණීම තෙක් මේ අතරතුර කවරනම් කථාවක් අවසන් නොවීද? මාගේ පැමිණීම හේතුවෙන් කවර කථාවක් අවසානයට නොගියේද? කියන්න එය අවසානයට ගෙනයම්'යි සර්වඥ පවාරණයෙන් පැවරූ සේක. ඉක්බිති පරිබ්‍රාජකයා ඒ කථාව නිරර්ථකය. නිස්සාරය සංසාර පැවැත්ම ඇසුරුකොට ඇත. ඔබතුමාගේ ඉදිරියෙහි කීමටවත් නොහොබී යයි දක්වන්නේ **තිට්ඨතෙසා භන්තෙ** යි ආදිය කීය.

ස්වාමීනි, ඒවා එහි තිබුණාවේ. ඉදින් භාග්‍යවතුන් වහන්සේ අසනු කැමතිනම් පසුවට වුවත් ඒ කථාව දුර්ලභ නොවන්නේය. අපට මේ කථාවෙන් ප්‍රයෝජනයක් නැත. භාග්‍යවතුන් වහන්සේගේ ආගමනයක් ලැබ අපි වෙනත් යහපත් කරුණක් අසමු යයි දක්වයි. ඉන්පසු එය විමසන්නේ **පුරිමානි භන්තෙ** ආදිය කීය.

එහි **කුතුහල සාලයං** යනු, කුතුහල ශාලාව නමින් වෙනම ශාලාවක් නැත. යම් තැනක නොයෙක් තීර්ථකයෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නොයෙක් කථා පවත්වත්ද, එය බොහෝ දෙනකුට 'මොහු කුමක් කියාද, මොහු කුමක් කියාදැයි කුහුලක් පවත්නා නිසා **කුතුහල සාලා** යයි කියනු ලැබේ. **අභිසඤ්ඤා නිරොධෙ** මෙහි අභි යනු උපසර්ගයක් පමණි. **සඤ්ඤා නිරොධෙ** චිත්ත නිරෝධයෙහි **ඛණික** නිරෝධයෙහි කථාවක් හටගත්තේය යන අර්ථයි.

මෙය එහි උත්පත්ති කාරණයයි. එකල භාග්‍යවතුන් වහන්සේ ජාතකයක් හෝ කියන සේක. ශික්‍ෂාපදයක් හෝ පනවන සේක. එකල මුළු දඹදිව භාග්‍යවතුන් වහන්සේගේ කිත්ගොස පැතිරෙයි. තීර්ථකයෝ එය අසා භවත් ගෞතමයෝ පෙර සිරිතක් කීහ. එබඳු කිසිවක් කියන්ට අපට නොහැක්කේ ඇයි දැයි භාග්‍යවතුන් වහන්සේට සමාන කාර්යයක් කරන්නාහු එක් භවාන්තර සමයක් ගැන කියති. 'භවත් ගෞතමයෝ ශික්‍ෂාපද පනවති. පනවන්ට අපට නොහැක්කේ ඇයි යයි තමාගේ ශ්‍රාවකයන්ට කුමක් හෝ සිකපදයක් පනවති.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ අටවැදෑරුම් පිරිස මැද වැඩහිඳ නිරෝධ කථාව කී සේක. තීර්ථකයෝ එය අසා 'භවත් ගෞතමයෝ නිරෝධ නම් දෙයක් කීහ. අපිදු එය කියන්නෙමුයි රැස්ව කියූහ. එහෙයින් කියන ලදී. අභිඤ්ඤා නිරොධෙ කථා උපදි යනුවෙන්.

තත්‍රෙකච්චෙ ඔවුන් අතරින් ඇතැමෙක් පළමුවැන්නාද මෙහි මොහු බාහිර තීර්ථායතනයක පැවිදි වූයේ සිත් පැවැත්මෙහි දොස් දැක සිත් නැති බව ශාන්ත යැයි සමාපත්තිය වඩා මෙයින් චුතව කල්ප පන්සියයක් සංඥී භවයෙහි සිට නැවත මෙහි උපදී. ඔහුට සංඥා ඉපදවීමෙහිද නිරෝධයෙහිද හේතුව නොදක්නේ අහෙතු අප්පච්චයො යයි කීය. දෙවැන්නා එය නිෂේධකොට මිගසිංග තාපසයාගේ අසංඥක බව ගෙන උපෙති පි අපෙතිපි ආදිය කීය.

මිගසිංග[1] තාපසයා ආත්මය තවන්නෙකි. ඝෝර තපස් ඇත්තේය. දමනය කරගත් ඉන්ද්‍රිය ඇත්තේ විය. ඔහුගේ සිල් තෙදින් ශක්‍ර විමානය උණුසුම් විය. ශක්‍ර දේවේන්ද්‍රයා 'තාපසයා ශක්‍රස්ථානය ප්‍රාර්ථනා කරන්නේ දෝයි අලම්බුසා නම් දේව කන්‍යාව' තවුසාගේ තපස බිඳ එව'යි යැවීය. ඈ එහි ගියාය. තවුසා පළමු දවසෙහි ඇය දැක පළාගොස් පන්සලට පිවිසියේය. දෙවැනි දවසෙහි කාමච්ඡන්ද නීවරණයෙන් බිඳුණේ ඇය අතින් අල්ලා ගත්තේය. හේ එම දිව්‍ය ස්පර්ශයෙන් පහසන ලද්දේ විසංඥව තෙවසරක් ඇවෑමෙන් සංඥාව ලැබීය. හෙතෙමේ දෘෂ්ටිගතිකව තෙවසරක් ඇවෑමෙන් නිරෝධයෙන් නැගී සිටියෙමියි හඟින්නේ මෙසේ කීය.

1. ජාතක පොතේ සඳහන් වන්නේ ඉසිසිංග වශයෙනි.

තෙවැන්නා එය නිෂේධකොට අථර්වන ප්‍රයෝගය සඳහා **උපකඩ්ඪන්ති පි අපකඩ්ඪන්තියි** යයි කීය අථර්වනය වනාහි අථර්වනය යොදා හිස සුන් සතකු මෙන්ද අත්පා සිඳලූවකු මෙන්ද මියගිය එකකු මෙන්ද කොට දක්වත්. ඔහුගේ නැවත ප්‍රකෘතිමත් බව දැක ඒ දෘෂ්ටිගතිකයා 'නිරෝධයෙන් මොහු නැගී සිටියේ යයි හඟිමින් මෙසේ කීය.

සිව්වැන්නා එය නිෂේධකොට යක්ෂ දාසීන්ගේ මදයෙන් නිදාගැනීම සඳහා **සන්තිහි හො දෙවතා** යයි කීය. යක්ෂ දාසීහු මුළු රැයම දෙවියන්ට උපහාර කරමින් නටා ගයා අරුණු නැගෙන වේලාවෙහි එක් සුරා බඳුනක් බී පෙරලී නිදා දවල් කල නැගිටිත්. ඒ දැක ඒ දෘෂ්ටිගතිකයා නිදන කල නිරෝධයට සමවැද පිබිදි කල නිරෝධයෙන් නැගිටියාහු යැයි හඟින්නේ මෙසේ කීය.

මේ පොට්ඨපාද පරිබ්‍රාජකයා පණ්ඩිතයෙකි. ඒ නිසා ඔහුට මේ කථාව අසා විපිළිසර උපන්නේය. 'මොවුන්ගේ කථාව ගොළු බිහිරි කථා මෙන් මොවුහු නිරෝධ සතරක් පනවති. මේ නිරෝධය එකක් විය යුතුය. බොහෝ නිරෝධයන්ගෙන් නොවේ. එයින්ද අනෙකක් විය යුතුය. හේ අනික්කින් දැනගන්ට සර්වඥ කෙනෙකුට හැර නොහැකිය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ මෙහි එන සේක්නම් මේ නිරෝධයයි. ඉමි නිරෝධයයි පහන් දහසක් දල්වා මෙන්. අද මට ප්‍රකට කරන සේකැයි දසබලධාරීන් වහන්සේම සිහි කළේය. ඒ නිසා **තසස මයහං හනෙත** ආදිය කීය.

එහි **අහොනූන** යනු සිහිකිරීම් අර්ථයෙහි නිපාත දෙකකි. එයින් භාග්‍යවතුන් වහන්සේ සිහිකරන ඔහුට මෙසේ සිතිණ. **අහොනූන භගවා අහොනූන සුගතො** යනුවෙන්. **යොඉමෙසං** යමෙක් මේ නිරෝධ ධර්මයන්හි **සුකුසලො** මැනවින් දක්ෂ ද නිපුණ ද අතිදක්ෂ ද ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් කියනු ඇත. ඒ සුගතයන් වහන්සේ ඒකාන්තයෙන් කියනු ඇත යනු මෙහි අදහසයි.

**පකතඤ්ඤූ** පුරුදු කළ වශීබව ඇති බැවින් ප්‍රකෘතිය ස්වභාවය දනීනුයි පකතඤ්ඤූ **කථනනුබො** මෙය පරිබ්‍රාජකයා 'අපි භාග්‍යවතුන් වහන්ස, නොදනිමු. ඔබවහන්සේ දනිති. අපට කියනු මැනවැයි අයැදින්නේ

කියයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කියන සේක් තත්‍ර පොට්ඨපාද ආදිය කියූ සේක.

එහි **තත්‍ර** යනු ඒ මහණ බමුණන් අතර. ආදිතොව තෙසං අපරද්ධං ඔවුන්ගේ ආදියෙහි සිටම විරුද්ධ වූ. ගෙයි මැදම පැකිළුණු යයි දක්වයි. **සහෙතු සප්පච්චයා** මෙහි හේතු යනු ද පච්චයො යනු ද කාරණයටම නමය. කරුණු සහිතව යන අර්ථයි.

එහි **සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති** ශික්ෂාවෙන් ඇතැම් සංඥා උපදියි යන අර්ථයි. **කාච සික්ඛාති** භගවා අවොච ඒ ශික්ෂාව කවරක්දැයි භාග්‍යවතුන් වහන්සේ විස්තර කැමැත්තෙන් විමසීම් වශයෙන් කී සේක.

ඉක්බිති යම්හෙයකින් අධිශීල සික්ඛා, අධිචිත්ත සික්ඛා අධිපඤ්ඤා සික්ඛා යනුවෙන් සික්ඛා තුනක් වෙයි. ඒ නිසා ඒවා දක්වන සේක් භාග්‍යවතුන් වහන්සේ සංඥාවෙන් සහේතුකව උපදනා නිරෝධය දක්වන්ට බුද්ධෝත්පාදයෙහි පටන් ශුද්ධ වූ ධර්මය තබන සේක් **ඉධ පොට්ඨපාද තථාගතො ලොකෙ** ආදිය කී සේක.

එහි අධිසීල සික්ඛාව සහ අධිචිත්ත සික්ඛාව යන ශික්ෂා දෙක ශික්ෂා ස්වරූපයෙන් ආයේය. තෙවැන්න මේ දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාව යැයි පොට්ඨපාද මා විසින් ඒකාංශික ධර්මය දේශනා කරන ලද්දේය. මෙහි සම්මා දිට්ඨි සම්මා සංකප්ප වශයෙන් ඇතුල්කරන ලද බැවින් ආයේ යයි දතයුතුය.

**කාමසඤ්ඤා** පංචකාමගුණික රාගයද නූපන් කාමාවචරයද, එහි පංචකාම ගුණික රාගය අනාගාමි මාර්ගයෙන් විනාශයට යයි. නූපන් කාමචාරය මෙතැන වටී. එනිසා **තස්ස සා පුරිමා කාම සඤ්ඤා** ප්‍රථමධ්‍යානය හා යෙදුණු යමක් පෙර උපන් පූර්ව කාම සංඥාවට සමාන බැවින් පුරිම කාමසඤ්ඤා යයි කියානම්, එය විනාශවී යයි. නූපන් සංඥාව නූපදී යන අර්ථයි.

**විවේකජ පීතිසුඛ සුඛුම සච්ච සඤ්ඤී යෙව තස්මිං සමයෙ හොති** ඒ ප්‍රථමධ්‍යාන සමයෙහි විවේකජ ප්‍රීතිසුඛ සංඛ්‍යාත සූක්ෂම සංඥාව සත්‍ය වෙයි. වූයේ වෙයි යන අර්ථයි.

නැතහොත් කාමච්ඡන්ද ආදී ඕලාරික අංග ප්‍රහාණ වශයෙන් සූක්‍ෂමද වූ බැවින් සත්‍ය වුව සංඥානුයි = සුඛුම සච්ච සඤ්ඤා විවේකජ ප්‍රීති සුඛයන්ගෙන් යුතු සුඛුම සච්ච සඤ්ඤානුයි - විවේකජ පීතිසුඛ සුඛුම සච්ච සඤ්ඤා. එය ඔහුට ඇත්නුයි විවේක පීතිසුඛ සුඛුම සච්ච සඤ්ඤී යනු මෙහි අර්ථයයි දතයුතුය. සියලුතැන මේ ක්‍රමයයි. **එවම්පි සික්ඛා** මෙහි යම්හෙයකින් ප්‍රථමධ්‍යානයට සමවදින්නේ අදිටන් කරන්නේ නැගිටින්නේ ම හික්මෙයි. ඒ නිසා මෙසේ හික්මිය යුතු බැවින් සික්ඛා යයි කියනු ලැබේ. ඒ ශික්‍ෂා සංඛ්‍යාත ප්‍රථමධ්‍යානයෙන්, මෙසේ එකම විවේකජ ප්‍රීතිසුඛ සූක්‍ෂම සත්‍ය සංඥාව උපදී. මෙසේ එකම කාම සංඥාවද නිරුද්ධ වෙයි යන අර්ථයි.

**අයං සික්ඛාති භගවා අවොච** මෙය වනාහි ප්‍රථමධ්‍යාන සංඛ්‍යාත එක්ම ශික්‍ෂාව යයි භාග්‍යවතුන් වදාළ සේක. මේ ක්‍රමයෙන් සියලු තැන අර්ථය දතයුතුය.

යම්හෙයකින් අෂ්ට සමාපත්තියෙහි අංග වශයෙන් සම්මර්ශනය බුදුවරුන්ට පමණක් වේද, ශ්‍රාවකයන් අතර ශාරිපුත්‍ර වැනි කෙනෙකුටවත් නැත. කලාප වශයෙන් සම්මර්ශනයම ශ්‍රාවකයන්ට වෙයි. මෙම සංඥාව සංඥාව යැයි මෙසේ අංශ වශයෙන් සම්මර්ශනය ඉවත් කරන ලදී. ඒ නිසා ආකිඤ්චඤ්ඤායතනය ප්‍රධානකොට ඇති සංඥාව දක්වා නැවත ඒ සංඥාවම අග්‍රයයි දැක්වීමට **යතො ඛො පොට්ඨපාද භික්ඛු -පෙ- සඤ්ඤග්ගං ඵුසති** යනුවෙන් කී සේක.

එහි **යතො ඛො පොට්ඨපාද භික්ඛු** පොට්ඨපාද යම් භික්‍ෂුවක් **ඉධ සකසඤ්ඤී හොති** මෙහි සසුනෙහි සක සඤ්ඤී වේද, මෙයම හෝ පාඨයයි. තමාගේ ප්‍රථමධ්‍යාන සංඥාවෙන් සංඥා ඇත්තේ වෙයි යන අර්ථයි.

**සො තතො අමුත්‍ර තතො අමුත්‍ර** ඒ භික්‍ෂුව ඒ ප්‍රථමධ්‍යානයෙන් මෙතැන ද්විතීය ධ්‍යානයෙහිය. එයින් ගිය තැන තෘතීය ධ්‍යානයෙහි යැයි ඒ ඒ ධ්‍යාන සංඥාවෙන් **එකසඤ්ඤී, සකසඤ්ඤීව** පිළිවෙළින් සංඥා අග්‍රය ස්පර්ශ කරයි. සංඥාග්‍රය යනු ආකිඤ්චඤ්ඤායතනයයි කියනු ලැබේ. කුමක් නිසාද යත්, ලෞකික වූ කෘත්‍යකාරී සමාපත්තීන්ට අග්‍ර වූ බැවිනි. **ආකිඤ්චඤ්ඤායතන** සමාපත්තියෙහි සිට **නෙවසඤ්ඤා**

නාසඤ්ඤාායතනයටද නිරෝධයටද සමවදිත්. මෙසේ එය ලෞකික කෘත්‍යකාරී සමාපත්තීන්ට අග්‍ර වූ බැවින් සංඥාග්‍රයයි කියනු ලැබේ. එය ස්පර්ශ කරයි. එයට පැමිණේ යන අර්ථයි. දැන් අභිඥා නිරෝධය දක්වන්ට **තසස සඤ්ඤගෙග ඨිතසස** ආදිය කී සේක.

එහි **චෙතෙයාං අභිසංඛරෙයාං** යනු පද දෙකෙහිම ධ්‍යානයට සමවදින්නේ සිතයි. නැවත නැවත කරයි යන අර්ථයි. මත්තෙහි සමාපත්ති සඳහා ආශා කරමින් රැස්කරයි නම්. **ඉමාච මෙ සඤ්ඤා නිරුජෙඣයුං** මේ ආකිඤ්චඤ්ඤාායතන සංඥා නිරුද්ධ වන්නේය. **සො නචෙව චෙතෙති නාභිසංඛරොති** මෙහි කැමැත්තෙන් සිතන්නේද නොසිතයි. රැස් කරන්නේද රැස් නොකරයි. මේ භික්ෂුවට ආකිඤ්චඤ්ඤාායතනයෙන් නැගී නේවසඤ්ඤා නාසඤ්ඤාායතනයට සමවැදී චිත්තවාර එකක දෙකක සිටින්නෙමියි අදහසක් හෝ කල්පනාවක් නැත. මත්තෙහි නිරෝධ සමාපත්තිය පිණිසම නැවත අදහසක් කල්පනාවක් ඇත. මේ අර්ථය පුත්‍රයාගේ ගෙය ඇසීමෙන් පැහැදිලි කළයුතුය. පියාගේ ගෙය මැදින් ගොස් පසුපස පුත්‍රයාගේ ගෙය ඇත. එයින් පිණ්ඩබොජුන් ගෙන ආසන ශාලාවට පැමිණි දරුවාගෙන් තෙරණුවෝ මනාප වූ පිණ්ඩපාතය කොහින් ගෙනඑන ලද්දේදැයි ඇසූහ. අසුවලාගේ ගෙයිනැයි ලැබුණු ගෙයම කීය. පියාගේ ගෙය මැදින් ගියේද එහි අදහසක්ද නැත. එහි ආසන ශාලාව මෙන් ආකිඤ්චඤ්ඤාායතන සමාපත්තිය දතයුතුය. පියාගේ ගෙය මෙන් නේවසඤ්ඤා නාසඤ්ඤාායතනය දතයුතුය. පුත්‍රයාගේ ගෙය මෙන් නිරෝධ සමාපත්තිය දතයුතුය. ආසන ශාලාවෙහි සිට පියාගේ ගෙය සිහිනොකර පුත්‍රයාගේ ගෙය ඇසීම මෙන් අකිඤ්චඤ්ඤාායතනයෙන් නැගී නේවසඤ්ඤා නාසඤ්ඤාායතනයට සමවැදී චිත්තවාර එකක දෙකක සිටින්නෙමියි සිහිනොකරම මත්තෙහි නිරෝධ සමාපත්තිය සඳහාම සිහිකිරීමයි. මෙසේ මෙය සිතන්නේද නොසිතයි. රැස්කරන්නේම රැස් නොකරයි. **තාචෙව සඤ්ඤා** ඒ ධ්‍යාන සංඥා නිරුද්ධ වෙයි. **අඤ්ඤා** වා අන් ඕලාරික භවංග සංඥා නිරුද්ධ වෙයි. **සො නිරොධං ඵුසති** ඒ මෙසේ පිළිපන් භික්ෂුව සඤ්ඤාවෙදයිත නිරෝධය ස්පර්ශ කරයි. විඳගනී. ලබයි.

**අනුපුබබාභි සඤ්ඤා නිරොධ සමපජාන සමාපතති** මෙහි අභි යනු උපසර්ගයක් පමණි. සම්පජාන පදය නිරෝධ පදයෙන් ඇතුළත්කොට කියන ලදී. අනුපිළිවෙළින් සමපජාන සඤ්ඤා නිරෝධ සමාපත්තියයි. මේ මෙහි අර්ථයයි.

මෙහිද සම්පජාන සඤ්ඤා නිරොධ සමාපත්ති යනු සම්පජානයෙහි අන්තයෙහි සඤ්ඤානිරෝධ සමාපත්තියයි. සම්පජානය ඇති නුවණැති භික්ෂුවගේ නිරෝධ සමාපත්තියයි. මෙය විශේෂ අර්ථයයි. දැන් මෙහි සිට නිරෝධ සමාපත්ති කථාව කිවයුතුය. එය සියලු ආකාරයෙන් විශුද්ධි මාර්ගයෙහි පඤ්ඤා භාවනානිසංස අධිකාරයෙහි කියන ලදී. ඒ නිසා එහි කියූ පරිද්දෙන්ම ගතයුතුයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ පොට්ඨපාද පරිබ්‍රාජකයාට නිරෝධ කථාව කියා ඉක්බිති ඔහුට එබඳු කථාවක් අන්තැනක නැති බව දන්වන්ට තං කිංමඤ්ඤසි ආදිය කී සේක.

පරිබ්‍රාජකයාද භාග්‍යවතුන් වහන්සේ අද තොපට කථාවක් තබා මා විසින් එබඳු කථාවක් නොඇසූ විරූ යැයි දන්වන්නේ නොහෙතං භනෙත යි කියා නැවත සකසා භාග්‍යවතුන් වහන්සේගේ කථාව උගත් බව දක්වන්නේ එවං බො අහං භනෙත ආදිය කීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔබ විසින් මැනවින් ඉගෙන ගන්නා ලද්දේයයි අනුදන්නා සේක් එවං පොට්ඨපාද යයි කී සේක.

ඉක්බිති පරිබ්‍රාජකයා 'භාග්‍යවතුන් වහන්සේ විසින් ආකිඤ්චඤ්ඤායතනය සංඥාග්‍රයයි කියන ලදී. සංඥාග්‍රය එයමද නැතහොත් අවශේෂ සමාපත්තීන්හිද සංඥාග්‍රයක් ඇත්දැයි සිතා ඒ බව විමසන්නේ එකඤ්ඤෙවනුඛො ආදිය කීය.

භාග්‍යවතුන් වහන්සේද ඔහුට විසඳ දුන් සේක. පුථුපි බොහෝ. යථා යථා බො පොට්ඨපාද නිරොධං ඵුසති පඨවි කසිණ ආදියෙහි යම් යම් කසිණයකින් ප්‍රථමධ්‍යානාදීන්ගේ හෝ යම් යම් ධ්‍යානයකින්, මෙය කියන ලද්දේ වෙයි. ඉදින් පඨවි කසිණයෙන් කරණය වූ පඨවි කසිණ සමාපත්තිය එක්වරක් සමවදින්නේ පෙර සඤ්ඤා නිරෝධය ස්පර්ශ කරයි. එක් සංඥාග්‍රයකි. ඉක්බිති දෙවරක් තෙවරක් සියවරක් දහස්වරක් සියදහස් වරක් සමවදින්නේ පෙර සඤ්ඤා නිරෝධය ස්පර්ශ කරයි. සංඥාග්‍ර සියදහසකි. සෙසු කසිණයන්හිද ධ්‍යානයන්හිද මේ ක්‍රමයයි.

ඉදින් කරණභූත වූ ප්‍රථමධ්‍යානයෙන් පෙර සඤ්ඤා නිරෝධය ස්පර්ශ කරයිද එක් සංඥාග්‍රයකි. ඉක්බිති දෙවරක් තෙවරක් සියවරක් දහස්වරක්, සියදහස් වරක් සමවදින්නේ පෙර සඤ්ඤා නිරෝධය ස්පර්ශ කරයිද සංඥාග්‍ර සියදහසකි. සෙසු ධ්‍යාන සමාපත්තීන්හිද මේ ක්‍රමයයි. මෙසේ එක්වරක් සමවැදීම් වශයෙන් හෝ සියලු සඤ්ජානන ලක්‍ෂණයෙන් සංග්‍රහකොට හෝ එක් සංඥාග්‍රයක් වෙයි. පසුපසුව සමවැදීම් වශයෙන් බොහෝය.

**සඤ්ඤානුබො භනෙත** ස්වාමීනි, නිරෝධයට සමවදින භික්‍ෂුවට පළමුව සඤ්ඤාව උපදනේ නොවේදැයි අසයි. ඔහුට භාග්‍යවතුන් වහන්සේ **සඤ්ඤාබො** පොට්ඨපාද යැයි ප්‍රකාශ කළ සේක. එහි **සඤ්ඤා** යනු ධ්‍යාන සංඥාවයි. **ඤාණං** යනු විදර්ශනා ඥානයයි. තවත් ක්‍රමයක්, **සඤ්ඤා** යනු විදර්ශනා සංඥාවයි. **ඤාණං** යනු මාර්ග ඥානයයි. තවත් ක්‍රමයක් **සඤ්ඤා** යනු මාර්ග සංඥාවයි. **ඤාණං** යනු ඵල ඥානයයි.

ත්‍රිපිටක මහාසිව තෙරණුවෝ මෙසේ කීහ. මේ භික්‍ෂුහු කුමක් කියත්ද? පොට්ඨපාද, භාග්‍යවතුන් වහන්සේගෙන් නිරෝධය ගැන ඇසීය. දැන් නිරෝධයෙන් නැගී සිටීම ගැන අසන්නේ භාග්‍යවතුන් වහන්ස, නිරෝධයෙන් නැගී සිටින්නහුට අර්හත්ඵල සංඥාව උපදීද නැතහොත් ප්‍රත්‍යවේක්‍ෂණ ඥානයදැයි කියයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට යම්හෙයකින් ඵලසංඥාව පළමුව උපදීනම් පසුව උපදින්නේ ප්‍රත්‍යවේක්‍ෂණ ඥානයයි. ඒ නිසා **සඤ්ඤාබො** පොට්ඨපාද යයි ආදිය කී සේක.

එහි **සඤ්ඤුප්පාදා** අර්හත්ඵල සංඥාවගේ ඉපදීමෙන් පසුව අර්හත්ඵලය වේයයි මෙසේ ප්‍රත්‍යවේක්‍ෂණ ඥානයාගේ ඉපදීම වෙයි. **ඉධපපච්චයා** කිරමෙ ඵලසමාධි සංඥාව හේතුකොටගෙන මාගේ ප්‍රත්‍යවේක්‍ෂණ ඥානය උපන්නේය. දැන් පරිබ්‍රාජකයා යම්සේ ගම්ඌරෙක් සුවඳ දියෙන් නහවා සුවඳ ගල්වා මල්දමක් පළඳවා සිරියහනෙහි තැබුවද සැපයක් නොවිඳීද, වේගයෙන් අසූචි ඇති තැනට ගොස් සැප විඳීද, මෙසේම භාග්‍යවතුන් වහන්සේ විසින් මුදුසුමුදු තිලකණු ගැබ්වූ දේශනාවෙන් නහවනු ලැබ තෙල්ගල්වා සැරසුණේ ද නිරෝධකථා නමැති සිරියහනෙහි තැබුයේද එහි සැපයක් නොවිඳින්නේ අසූචි පිරි තැනක් බඳු තමාගේ ලබ්ධිය ගෙන එයම විමසන්නේ **සඤ්ඤානුබො භනෙත පුරිසසස අතතා** යනාදිය කීය.

ඉක්බිති ඔහුගේ අවසරය ගෙන ප්‍රකාශකරනු කැමති සේක් භාග්‍යවතුන් වහන්සේ **කංපනත්‍වං** ආදිය කී සේක. ඉක්බිති ඔහු 'ආත්මය අරූපී යයි ලබ්ධි ඇත්තේම භාග්‍යවතුන් වහන්සේ දේශනා සුඛුමාල වූයේ, පළමුකොටම මාගේ ලබ්ධිය විනාශ නොකරාවායි සිතා තමාගේ ලබ්ධිය ගන්නේ **ඔළාරිකං ඛො** ආදිය කීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එහි දොස් දක්වන සේක් **ඔළාරිකො චහි තෙ** ආදිය කී සේක. එහි **එවං සනතං** යනු මෙසේ ඇතිකල්හි ආධාර විභක්තියෙහි ද්විතියා වචනයි. මෙසේ ඇති කල්හි තමා වෙත එන්නේද නැත්ද යනු මෙහි අර්ථයි. ඛන්ධ සතරෙහි ඒකුප්පාද එකනිරොධ ඇති බැවින් කිසියම් සංඥාවක් උපදීද එය නිරුද්ධ වෙයි. පසු නැවත නැවත උදෙසා අන් සංඥාවෝද උපදිති. අන් සංඥාවෝ නිරුද්ධ වෙතියි කියන ලදී. දැන් අන් ලබ්ධියක් දක්වන්නේ **මනොමයං ඛො අහං භනෙත** ආදිය කියා මෙහිදී ද දෝෂය දුන්කල්හි යම්සේ උන්මත්තකයා ඔහුගේ සංඥාව නොපිහිටාද ඒතාක් අනිකක් ගෙන අනිකක් විසඳයි. සංඥාව පිහිටන කල කිවයුතු දේම කියයි. මෙසේ අනිකක් ගෙන අනිකක් විසඳ දැන් තමාගේ ලබ්ධියම කියන්නේ **අරූපිං ඛො** ආදිය කීය. එහිද යම්හෙයකින් ඔහු සඤ්ඤාවෙන් උත්පාද නිරෝධය කැමති වේද තමා ශාස්වතයයි හඟියිද ඒ නිසා එසේම ඔහුගේ දොස් දක්වන්නේ භාග්‍යවතුන් වහන්සේ **එවං සනතං** යනාදිය කී සේක.

ඉන්පසු පරිබ්‍රාජකයා මිථ්‍යා දර්ශනයෙන් මැඩුණු බැවින් භාග්‍යවතුන් වහන්සේ විසින් කියනු ලබද්දිත් එය නානත්ත බව නොදන්නේ **සක්කාපනෙතං භනෙත මයා** ආදිය කීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට යම්හෙයකින් සංඥාවෙහි උත්පාද නිරෝධය දකින්නේද සඤ්ඤාමය ආත්මය නිතරම හඟියිද ඒ නිසා **දුජ්ජානං ඛො** ආදිය කී සේක. එහි මේ සංක්ෂේප අර්ථයයි. 'ඔබගේ අන්‍ය දෘෂ්ටිය, අන්‍ය ක්‍ෂාන්තිය, අන්‍ය රුචිහු අන් අයුරකින්ම ඔබගේ දර්ශනය පැවතියේය. අන්‍යයක්ම ඔබට විශ්වාසය. රුචි වෙයි. ඔබගේ බැඳීම අන් තැනකය. අන් ප්‍රතිපත්තියක සැදීපැහැදී ඇති බවය. ඔබගේ ආචාර්යක ධර්මය අන්තැනකය. ආචාර්යභාවය අන් තීර්ථායතනකය. ඒ නිසා මෙසේ අන්‍යදෘෂ්ටික වූ, අන්‍ය විශ්වාසයක් ඇති, අන්‍ය රුචියක්

ඇති අන් තැනක යෙදී සිටින ආචාර්යවරයා අන් තැනක සිටින ඔබ විසින් මෙය දැනගැනීම අපහසුය.

ඉක්බිති පරිබ්‍රාජකයා 'පුරුෂයාගේ ආත්මය සංඥාව හෝ වේවා අන් සංඥාවක් හෝ වේවා එහි ශාස්වතභාවයම අසන්නෙමියි නැවත **කිංපන භනෙත** ආදිය කීය. එහි **ලොකො** යනු තමා සඳහා කියයි. **නහෙතං පොට්ඨපාද අත්ථසංහිතං** පොට්ඨපාද මෙය දෘෂ්ටිගතයකි. මෙලොව පරලොව ඇසුරුකළ දෙයක් නොවේ. ආත්මාර්ථ පරාර්ථ නිශ්‍රිත වූවක්ද නොවේ. **නධම්ම සංහිතං බ්‍රහමචරියකං** ශික්‍ෂාත්‍රය සංඛ්‍යාත වූ ශාසන බ්‍රහ්මචර්යයට ආදි මාත්‍රයක් නොවේ. අධිශීල ශික්‍ෂා මාත්‍රයක්ද නොවේ. **න නිබ්බිදාය** සංසාර වට්ටයෙහි කලකිරීම නොපවතී. **න විරාගාය** වට්ට විරාගය පිණිස නොපවතී. **න නිරොධාය** සංසාරය නිරෝධකරණය පිණිස නොපවතී. **න උපසමාය** සංසාරයෙහි ව්‍යුපසමනය සඳහා නොපවතී. **න සමෙබාධාය** සංසාරය අවබෝධය පිණිස නොපවතී. **න නිබ්බාණය** අමාමහ නිවන් පසක් කිරීම පිණිස නොපවතී.

**ඉදං දුකබං** ආදී තන්හි තෘෂ්ණාව හැර ත්‍රෛභූමක පංචස්කන්ධ දුක්ය. ඒ දුක ඇතිකරන හේතු සහිත තෘෂ්ණාව **දුකබ සමුදයො** දෙකෙහි නොපැවැත්ම **දුකබ නිරොධො** ආර්ය අෂ්ටාංගික මාර්ගය. **දුකබ නිරෝධගාමිනී පටිපදා** යයි මා විසින් ප්‍රකාශ කරන ලද්දේය යන අර්ථයි.

මෙසේද කියා භාග්‍යවතුන් වහන්සේ මේ පරිබ්‍රාජකයාට මාර්ග පහළවීමක් හෝ ඵල සාක්‍ෂාත් කිරීමක් හෝ නැත. මාගේද පිඬු පිණිස හැසිරෙන වේලාව යැයි සිතා නිහඬ වූ සේක. පරිබ්‍රාජකයාද ඒ ආකාරය දැන භාග්‍යවතුන් වහන්සේට යාමට කාලය දන්වන්නාක් මෙන් **එවමෙතං** ආදිය කීය.

**වාචාසතති තොදකෙන** යනු වචන නමැති කෙවිටෙන්. **සංජමහරිං** අකංසු එකතු කරගත් දෙය නිරන්තරයෙන් පතුරුවා හළහ. උඩට උඩට විද්දාහු යයි කියන ලද්දේ වෙයි. **භූතං** ස්වභාවයෙන් පෙනෙන. **තචඡං තථං** එයටම සමාන වචනයකි. **ධම්මට්ඨිතකං** නව ලෝකෝත්තර ධර්මයෙහි සිටි ස්වභාවය. **ධම්ම නියාමකං** නව ලෝකෝත්තර ධර්ම නියාම ස්වභාවය. බුදුවරුන්ගේ චතුරාර්ය සත්‍යයෙන් විනිර්මුක්ත කථාවක් නම් නැත. ඒ නිසා එය එබඳු වෙයි. **චිතෙතා ච හත්ථි සාරිපුතෙතා**

හෙතෙමේ සැවැත්නුවර ඇත්ගොව්වකු ගේ පුත්‍රයාය. භාග්‍යවතුන්ගේ සමීපයෙහි පැවිදිව ත්‍රිපිටකය උගෙන සූක්ෂම අර්ථාන්තරයෙහි දක්ෂ වූයේය. පෙර කරන ලද පාපකර්මයක් වශයෙන් සත්වරක් සිවුරු හැර ගිහි වූයේය. කාශ්‍යප බුදුරදුන්ගේ සසුනෙහි යහළුවෝ දෙදෙනෙක් වූහ. ඔවුනොවුන් එක්ව එකට සජ්ඣායනා කරති. ඔවුන්ගෙන් එකෙක් නො ඇලුණේ ගිහිබවෙහි සිත් උපදවා අනෙකාට දැන්වීය. ඔහු ගිහි බවෙහි ආදීනවද පැවිද්දෙහි ආනිසංසද දක්වා ඔහුට අවවාද කළේය. ඔහු ඒ අසා ආශාකොට නැවත එක් දවසක් එබඳු සිතක් උපන්කල්හි ඔහුට මෙසේ කීය. ඇවැත්නි, මට මෙබඳු සිතක් ඇතිවෙයි. මම මේ පාසිවුරු ඔබට දෙමි. ඔහු පාසිවුරු ලොබින් ඔහුට ගිහිබවෙහි ආනිසංස දක්වා පැවිද්දෙහි ආදීනව කීවේය. ඉක්බිති එය අසාම ගිහිබවෙහි සිත නොඅලවා පැවිද්දෙහිම ඇලුණේය. මෙසේ මොහු එකල සිල්වත් භික්ෂුවකට ගිහිබවෙහි ආනිසංස කියූ බැවින් දැන් සයවරක් සිවුරු හැර සත්වැනි වර පැවිදි වූයේය. මහා මොග්ගල්ලාන තෙරුන්ද මහා කොට්ඨිත තෙරුන්ද අභිධර්ම කථා කියනවිට අතරින් පතර කථාව විසඳීය. ඉක්බිති මහාකොට්ඨිත තෙරුන්වහන්සේ ඔහු ප්‍රතික්ෂේප කළහ. ඔහු මහා ශ්‍රාවකයන් වහන්සේ කියූ දෙයෙහි පිහිටා සිටින්නට නොහැක්කේ ගිහි වූයේය. මොහු පොට්ඨපාදගේ ගිහි සහායකයා වෙයි. ඒ නිසා සිවුරු හැර දෙතුන් දිනක් ඇවෑමෙන් පොට්ඨපාදගේ සමීපයට ගියේය. ඉක්බිති හේ ඔහු දැක යහළුව, ඔබ විසින් කුමක් කරන ලද්දේද, එබඳු ශාස්තෘ ශාසනයෙන් ඉවත් වූයෙහිය. එව නැවත ඔබ නැවත පැවිදි කිරීමට වටී යයි ඔහු ගෙන භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගියේය. එහෙයින් කියන ලදී. **හත්ථිසාරිපුත්ත චිත්තද පොට්ඨපාද පරිබ්‍රාජකයාද** යනුවෙන්.

අන්ධා ප්‍රඥා චක්ෂුස නැති බැවින් අන්ධ වූ. එය නැති බැවින් **අචක්ඛුකා. ත්වමෙවෙකො තෙසං එකො චක්ඛුමා** සුභාෂිත දුර්භාෂිත දන්නා ස්වභාව මාත්‍රයෙන් ප්‍රඥා චක්ෂුසින් චක්ෂුමත්. **එකංසිකා** එක් කොටසකට අයත් **පඤ්ඤත්තා.** තබන ලද. **අනෙකංසිකා** එක් කොටසකට අයත් නොවන. එකම කොටසකින් ශාස්වත යැයිද අශාස්වත යයිද නොකියන ලද්දේ යන අර්ථයි.

**සන්තිඛො පොට්ඨපාද** මෙය භාග්‍යවතුන් වහන්සේ කුමක් නිසා ආරම්භ කළ සේක්ද? බාහිරිකයන් විසින් පනවන ලද නිෂ්ඨාවෙහි

අනෛර්යාණික බව දැක්වීම පිණිස, සියලු තීර්ථකයෝ භාග්‍යවතුන් වහන්සේ යම්සේද මෙසේ අමාමහ නිවන තම තමාගේ සමයෙහි, ලෝකය ථූපිකාව ආදි වශයෙන් නිෂ්ඨාව පනවත්. එයද නෛර්යාණික පැනවීමක් වී ගෙන නොයයි. පණ්ඩිතයන් විසින් ප්‍රතික්‍ෂේප කරන ලද්දේ නවතී. එය දක්වන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ කී සේක. එහි **එකන්තසුඛං ලොකං ජානං පස්සං** පෙරදිගින් ඒකාන්ත සුඛ ලෝකයයි. පැසුළු ආදී දිශාවන්ගෙන් එක්තරා දිශාවක යයි මෙසේ දන්නාහු දක්නාහු වාසය කරවු, ඔබලා විසින් ඒ ලෝකයෙහි මිනිසුන්ගේ සිරුරු පැවැත්ම ඇසින් දුටු විරූද, **අප්පාටිහීර කතං** නැවත නොවදනා සේ කරන ලද, නැවත පහරදීමක් නැති. අනෛර්යාණික යයි කියන ලද්දේ වෙයි. **ජනපද කල්‍යාණී** ජනපදයෙහි අන් ස්ත්‍රීන්ට වඩා වර්ණය හැඩය විලාසය හැඩවැඩ ගැන්වීම් ආදියෙන් අසදෘශ, මෙසේ භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන්ගේ නිෂ්ඨාවෙහි අනෛර්යාණික බව දක්වා තමාගේ නිෂ්ඨාවෙහි නෛර්යාණික බව දක්වන්ට 'තයො බො මෙ පොට්ඨපාද ආදිය කී සේක.

එහි **අත්තපටිලාභො** ආත්මභාව ප්‍රතිලාභය. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ ආත්මභාව ප්‍රතිලාභ තුනෙන් භවත්‍රය දැක්වූ සේක. ඖලාරික වූ ආත්මභාවයක් ලැබීමෙන් අවීචියෙහි පටන් පරනිම්මිත වසවත්ති අවසන්කොට ඇති කාමභවය දැක්වූ සේක. මනෝමය ආත්මභාව ප්‍රතිලාභයෙන් ප්‍රථමධ්‍යාන භූමියේ සිට අකනිට්ඨා බඹලොව අවසන්කොට ඇති රූපභවය දැක්වූ සේක. අරූප ආත්මභාව ප්‍රතිලාභයෙන් ආකාසානඤ්චායතන බ්‍රහ්මලෝකයෙහි පටන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන බ්‍රහ්මලෝකය අවසන්කොට ඇති අරූප භවය දැක්වූ සේක. **සංකිලෙසිකො ධම්මා** නම් දොළොස් අකුසල චිත්ත උත්පාදයයි. **වොදානියා ධම්මා** නම් සමථ විදර්ශනාය. **පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තං** මාර්ගඵල ප්‍රඥා ඵල ප්‍රඥාවන් සම්පූර්ණ කිරීම සහ මහත්බව. **පාමුජ්ජං** තරුණ ප්‍රීතිය. **පීති** බලවත් තුෂ්ටිය කුමක් කියන ලද්දේද? යමක් කීමුනම් 'තමාම හොඳින් දැන සාක්‍ෂාත් කොට පැමිණ වාසය කරයි' යනුවෙන්, එහි එසේ වසන ඔහුට තරුණ ප්‍රීතියද, වන්නේය. ප්‍රීතිය නම් කාය පස්සද්ධියද සතියද මැනවින් පිහිටියා වූ උත්තම ඥානයද සැපයද වාසය කිරීමද වේ. සියලු විහාරයන් අතර මෙම විහාරය සැපයයිද, උපශාන්ත යයිද පංචමධුර යයි කියන්ට සුදුසුය. එහි ප්‍රථමධ්‍යානයෙහි ප්‍රමෝදය ආදි ධර්ම සයක් ලැබෙයි. ද්විතීය ධ්‍යානයෙහි දුර්වල ප්‍රීතිසංඛ්‍යාත ප්‍රමෝදය නවතී. සෙසු පස

ලැබෙයි. තෘතීය ධ්‍යානයෙහි ප්‍රීතියද නවතී. සෙසු සතර ලැබේ. චතුර්ථ ධ්‍යානයෙහිද එසේය. මේ ධ්‍යාන සතරින් සම්පසාද සූත්‍රයෙහි මාර්ග සතර සමග විදර්ශනාව කියන ලදී. දසුත්තරිය සූත්‍රයෙහි චතුර්ථධ්‍යානික ඵල සමාපත්තිය කියන ලදී. මේ පොට්ඨපාද සූත්‍රයෙහි ප්‍රමෝද ප්‍රීතියට සමාන වචනයක් කොට ද්විතීය ධ්‍යානිකයාගේ ඵලසමාපත්තිය කියන ලදැයි දතයුතුය.

අයංවාසො මෙහි වා ශබ්දය පැහැදිලි කිරීම් අර්ථ ඇත්තේය. මේ ඔහු යයි පැහැදිලිකොට ප්‍රකාශකොට ප්‍රකාශ කරන්නෙමු. යම්සේ අන්‍යයෝ ඒකාන්ත සුඛ ආත්මය හඳුනහු දැයි විචාරන ලද්දාහු නැතැයි කියති. එසේ නොකියමු යන අර්ථයි.

මොඝො හොති තුච්ඡ වෙයි. ඔහු එසමයෙහි නැත යන්න අදහසයි. සච්චොහොති වූයේ වෙයි. එයම එසමයෙහි සත්‍ය වන්නේය යන අර්ථයි. මෙහි මේ සිත තමාගේ අසර්වඥ බැවින් ආත්මලාභ තුන කියා ආත්ම ප්‍රතිලාභය නම් ප්‍රඥප්ති මාත්‍රයකැයි ගැනීමට නොහැකි විය. ආත්ම ප්‍රතිලාභයම පැමිණවීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙහි රූපාදී ධර්මයෝ ආත්ම ප්‍රතිලාභ යන නාම මාත්‍රයකි. ඒ ඒ රූපාදිය ඇතිකල් මෙබඳු ව්‍යවහාර ඇතිවේයැයි දක්වනු කැමතිව එහිම කථාව ගෙන නාම ප්‍රඥප්ති වශයෙන් ගෙනඑනු පිණිස 'යස්මිං චිත්ත සමයෙ' ආදිය කී සේක. මෙසේ කියා නැවත අසා හික්මවීම පිණිස නැවත සචෙපන තං චිත්තං එවං පුච්ඡෙය්‍යුං ආදිය කී සේක.

එහි යොමෙ අහොසි අතීත අත්තපටිලාභො, සෙ වච මෙ අත්ත පටිලාභො තස්මිං සමයෙ සච්චො අහොසි, මොඝො අනාගතො මොඝො පච්චුප්පන්නො මෙහි මේ අර්ථය දක්වයි. යම්හෙයකින් මේ අතීත ධර්මනම් ඒවා දැන් නැත්තේය. 'විය' යන ව්‍යවහාරයට ගොස්ය. ඒ නිසා එයද මාගේ ආත්ම ප්‍රතිලාභයයි. එසමයෙහි සත්‍යයක් විය. අනාගත වර්තමාන ධර්මයක් එදා නොතිබීමෙන් එසමයෙහි මෝඝය අනාගතය, මෝඝය වර්තමානයැයි මෙසේ අර්ථ වශයෙන් නාම මාත්‍රයම ආත්ම ප්‍රතිලාභයයි පිළිගනී. අනාගත වර්තමානයන්හිද මේ ක්‍රමයමැයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ ප්‍රකාශය සමග තමාගේ ප්‍රකාශය සංසන්දනය කරන්ට

'සිත මෙහෙම තමා' යනාදිය කියා නැවත උපමා වශයෙන් ඒ අර්ථය සාධනය කරන සේක් සෙය්‍යථාපි චිත්ත ගවා ඛීරං' ආදිය කීය.

මේ එහි සංක්ෂේප අර්ථයයි. යම්සේ දෙනගෙන් කිරිද, කිරි ආදියෙන් දීකිරි ආදිය වේද, එහි යම්කලෙක කිරි වේද, එසමයෙන් එය දීකිරි කියා හෝ වෙඬරු ආදියෙන් එකක් යයි ප්‍රසිද්ධියක් බවට, නිරුක්තියක් බවට, නාමයක් බවට ව්‍යවහාරයක් බවට යයි. කුමක් නිසාද යත්, යම් හේතූන් නිසා දීකිරි ආදී ව්‍යවහාරයක් වේද, ඒවා නැති වූ විට කිරීම යයි එසමයෙහි ප්‍රසිද්ධියට යයි. කුමක් නිසාද යත්, යම් හේතූන් නිසා කිරියයි ප්‍රසිද්ධියක්, නිරුක්තියක්, නාමයක් ව්‍යවහාරයක් වේද, ඒවා තිබෙන බැවිනි. සියලු තැන මේ ක්‍රමයයි. ඉමා ඛො චිත්ත ඕලාරික ආත්ම ප්‍රතිලාභ යැයිද, මනෝමය ආත්ම ප්‍රතිලාභයැයිද, අරූප ආත්ම ප්‍රතිලාභ යැයිද මෙසේ මේවා චිත්ත, ලෝකයා දෙන නම්ය. මේවා ලෝකයෙහි නම් පමණකි. පිළිගැනීම් පමණකි. එසේම ලෝකයෙහි නිරුක්ති පමණකි. වචන මාර්ග පමණි. ව්‍යවහාර පමණි. නාම ප්‍රඥප්ති පමණි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ යට ආත්ම ප්‍රතිලාභ තුනක් කියා දැන් මේ සියල්ල ව්‍යවහාර මාත්‍රයක් පමණකැයි කියන සේක. කුමක් හෙයින්ද යත්, පරමාර්ථ වශයෙන් සත්ත්වයෙක් නම් නැති නිසාය. මේ ලෝකය ශූන්‍යය. තුච්ඡය. බුද්ධවරුන්ගේ සම්මුති කථායැ. පරමාර්ථ කථා යැයි කථා දෙකක් තිබේ. එහි සත්ත්වයා, පුරුෂයා, දෙවියා, බ්‍රහ්මයා ආදිය සම්මුති කථාය. අනිත්‍යය, දුක්ඛය, අනාත්මය, ඛන්ධ, ධාතු, ආයතන, සතිපට්ඨාන සම්මප්පධාන ආදිය පරමත්ථ කථා නම්. එහි යමෙක් සම්මුති දේශනාවෙන් සත්ත්වයෙක්ය, පුරුෂයෙක්ය, දෙවියෙක්ය, බ්‍රහ්මයෙක් යැයි කී කල්හි ඔවුන් දැනගන්ට, අවබෝධ කරගන්ට ගෙනඒමට අර්හත්වය ජයග්‍රහණය කරන්ට හැකිවේද, ඔහුගේ භාග්‍යවතුන් වහන්සේ පළමුවෙන්ම සත්ත්වයෙක්ය. පුරුෂයෙක්ය. දෙවියෙක්ය. බ්‍රහ්මයෙක්යැයි කියන සේක. යමෙක් පරමත්ථ දේශනාවෙන් අනිත්‍යය, දුක්ඛය යන ආදීන් අතුරින් එකක් අසා දැනගන්ට අවබෝධ කරගන්ට ගෙනඒමට අර්හත්වය ජයග්‍රහණය කිරීමට හැක්කේද ඔහුට අනිත්‍යය, ආදීන් අතර එකක්ම කියන සේක.

එසේම සම්මුති කථාවෙන් අවබෝධ කරගන්නා අයකුට පළමුව පරමත්ථ කථාව නොකියන සේක. සම්මුති කථාවෙන් අවබෝධ කොට පසුව පරමත්ථ කථාව කියන සේක. පරමත්ථ කථාවෙන් අවබෝධ කොට

පසුව සම්මුති කථාව කියන සේක. ප්‍රකෘතියෙන්ම පළමුකොට පරමත්‍ථ කථාව කියන්නහුට දේශනාව රළු වන්නේය. ඒ නිසා බුදුවරු පළමුව සම්මුති කථාව කියා පසුව පරමත්‍ථකථාව කියන සේක. සම්මුති කථාව කියන්නාහුද සත්‍යයම ස්වභාවයම මුසා නොවූවක්ම කියන සේක. පරමත්‍ථ කථාව කියන්නාහුද සත්‍යයම ස්වභාවයම මුසා නොවූවක්ම කියන සේක.

දුවෙ සච්චානි අක්ඛාසි - සම්බුද්ධො වදතං වරො
සම්මුතිං පරමත්‍ථංච - තතියං නූපලබ්භති

කථා කරන්නවුන් අතර උතුම් වූ - සම්බුදුන් වහන්සේ
සත්‍ය දෙකක් කියූ සේක
සම්මුති පරමාර්ථ යනුවෙන්. තෙවැන්නක් නොලැබේ.

සංකෙත වචනං සච්චං - ලොක සම්මුතිකාරකං
පරමත්‍ථ වචනං සච්චං - ධම්මානං භූත ලක්ඛණං

සංකේත වචනය සත්‍යය - ලෝක සම්මුතිකාරකය
පරමාර්ථවචනය සත්‍යය - ධර්මයන්ගේ භූත ලක්‍ෂණය

යාහි තථාගතො වොහරති අපරාමසං යමක් ලෝක නම්වලින් ලෝක නිරුක්තීන්ගෙන් තථාගතයන් වහන්සේ තෘෂ්ණා මාන දෘෂ්ටි පරාමර්ශනයක් නැති බැවින් පරාමර්ශනයක් නොකරන්නේම ව්‍යවහාර කරන සේක. දේශනාව නැවත දේශනාකොට රහත්බව කුළුගන්වා නිමවා වදාළ සේක. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේමය.

පොට්ඨපාද සූත්‍ර වර්ණනාව නිමියේ ය.

# සුභ සූත්‍ර වර්ණනාව

**එවං මෙසුතං** යනු සුභ සූත්‍රයයි. මේ එහි ගැඹුරුපද වර්ණනාවයි. **අචිර පරිනිබ්බුතෙ** පිරිනිවනින් නොබෝ කලකින්. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑ කල්හි පරිනිර්වාණයට මසකින් පමණ පසුකාලයෙහි නිදාන වර්ණනාවෙහි කියන ලද ක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාසිවුරුගෙන පැමිණ කිරි විරේකය පානය කොට විහාරයෙහි වැඩහුන් දවස සඳහා මෙය කියන ලදී. **තොදෙය්‍ය පුතෙතා** තොදෙය්‍ය බමුණාගේ පුත්‍රයා. ඔහු සැවැත්නුවරට නුදුරෙහි තුදී නම් ගමක් ඇත. එහි අධිපති බැවින් තොදෙය්‍ය නමින් ප්‍රසිද්ධියට පත්විය. මහාධන ඇත්තේය. පන්සාළිස් කෙළක් විභව සම්පත් ඇත්තේය. අතිශයින් මසුරුය. දෙන්නාගේ භෝගයන්හි ක්ෂය නොවීමක් නැතැයි සිතා කිසිවකුට කිසිවක් නො දෙයි.

කියන ලද්දේ මැයි :

අජනානං ඛයං දිසවා - වම්මිකානංච සංචයං
මධූනංච සමාහාරං - පණ්ඩිතො සරමාවසෙ

මෙසේ නොදීමට පුරුදුකොට කය බිඳීමෙන් පසු ඒ ගෙයිම සුනඛයකු වී උපන්නේය. සුභ ඒ සුනඛයාට අතිශයින් ප්‍රිය ය. තමා බුදින බතම කවයි. ඔසවාගෙන උතුම් සයනයෙහි නිදිකරවයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක් දවසක් මාණවකයා ගෙන් පිටගිය කල්හි ඒ ගෙයට පිඬු පිණිස පිවිසි සේක. සුනඛයා භාග්‍යවතුන් වහන්සේ දැක බුරන්තේ භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඌට මෙසේ කී සේක.

'තොදෙය්‍ය, ඔබ පෙරදී ද මට භො භො කියා පරිභවකොට සුනඛයෙක් වූයෙහිය. දැනුදු බුරා අවීචියට යන්නෙහිය. සුනඛයා ඒ අසා විපිළිසරව උදුන අතරෙහි අළුමත වැදහොත්තේය. මිනිස්සු ඔසවා නිදි කරවන්ට නොසමත් වූහ. සුභ පැමිණ කවරකු විසින් මේ සුනඛයා සයනයෙන් බස්සනු ලැබීදැයි ඇසීය. මිනිස්සු කිසිවකු විසින් නොවේයයි ඒ පුවත දැන්වූහ. මාණවක එය අසා මාගේ පියා බ්‍රහ්මලෝකයෙහි

උපන්නේය. ශ්‍රමණ ගෞතම මාගේ පියා සුනඛයකු කරයි. මොහු කටට ආ දෙයක් කියතියි කිපී භාග්‍යවතුන් වහන්සේට මුසාවාදයෙන් චෝදනා කරනු කැමැත්තේ විහාරයට ගොස් එපුවත ඇසීය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට එසේම කියා විසංවාද නොකරනු පිණිස කී සේක. තරුණය, ඔබගේ පියා විසින් නොකියන ලද ධනයක් ඔබට ඇත්ද, භවත් ගෞතමයෙනි, සියදහසක් අගනා රන්දමක්, සියදහසක් අගනා මිරිවැඩියක්, සියදහසක් අගනා රන් තැටියක්, කහවණු සියදහසක් ඇත. යව ඒ සුනඛයා ජලය අඩු මධුපායාසය කවා සයනයට නංවා මඳ නින්දට බැසගත් කල අසව. සියල්ල ඔබට ඌ කියනු ඇත. එවිට මේ මාගේ පියා යයි දැනගන්නෙහිය. හේ එසේ කළේය. සුනඛයා සියල්ල පෙන්වීය. එදින ඌ මාගේ පියා යයි දැන භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පහන් සිත් ඇත්තේ ගොස් භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්න දාහතරක් අසා විසඳූ කල්හි භාග්‍යවතුන් වහන්සේ සරණ ගියේය. ඒ සඳහා කියන ලදී. 'සුභො මාණවො තොදෙය්‍ය පුත්තො' යනුවෙන්.

**සාවත්ථියං පටිවසති** තමාගේ භෝග ග්‍රාමයෙන් පැමිණ වසයි. **අඤ්ඤතරං මාණවං ආමන්තෙසි** ශාස්තෲන් වහන්සේ පිරිනිවි සේක. ආනන්ද තෙරණුවෝ උන්වහන්සේගේ පාසිවුරු ගෙන පැමිණියහ. මහජනයාද එය බලනු පිණිස පැමිණෙතියි අසා විහාරයට ගොස් මහජනයා මැද සැපසේ පිළිසඳර කථාකිරීමට හෝ ධර්මකථාවක් ඇසීමට හෝ නොහැකිය. ගෙට පැමිණි උන්වහන්සේ දැක පිළිසඳර කථා කරන්නෙමි. මට එක් සැකයක් ඇත. එයද අසන්නෙමියි සිතා එක්තරා තරුණයකු ඇමතීය. **අප්පාබාධං** ආදී තන්හි ආබාධො යනු අසාමාන්‍ය වේදනාවයි කියනු ලැබේ. එක් තැනක හටගෙන සිව් ඉරියව්වම යකඩ පටියකින් එකට බැඳ තැබුවාක් මෙන් ගනියි. එහි අභාවය විමසවයි කියයි. **අප්පාතංකං** බො ජීවිතය කරදකාරී කරන රෝගයක් යයි කියනු ලැබේ. එහි අභාවයද අසවයි කියයි. ගිලන් වූ තැනැත්තාගේ නැගිටීම බරකි. කයෙහි ශක්තිය නැත. ඒ නිසා නොගිලන් බව ගැනද ශක්තිය ගැනද අසව. **ඵාසු විහාරං** යාම, සිටීම, හිඳීම, නිදීම යන සිව් ඉරියව්වල සැප විහරණය ගැන අසවයි කියයි. ඉක්බිති ඔහුට ඇසිය යුතු ආකාරය දක්වන්නේ සුභ ආදිය කීය.

**කාලංච සමයංච උපාදාය** කාලයද සමයද නුවණින් ගෙන සලකා බලා යන අර්ථයි. යම්හෙයකින් හෙට අපගේ යන කාලය වන්නේ නම්

කයෙහි ශක්ති මාත්‍රයම පැතිරෙන්නේය. ගමන හේතුවෙන් අන් අපහසු බවක් නොවන්නේය. ඉක්බිති මේ කාලයද, ගමනෙහි හේතුවද එක්වීම් සංඛ්‍යාත සමයද සලකා බලා එසේනම් හෙට එන්නෙමුයි කියන ලද්දේ වෙයි. **චෙතකෙන භික්ඛුනා** චේතිය රටෙහි උපන් බැවින් චේතක යයි ලද නම් ඇති. **සම්මොදනීයං කථං සාරාණීයං** භවත් ආනන්ද, දසබලධාරීන් වහන්සේට කවරනම් රෝගයක් වීද, භාග්‍යවතුන් වහන්සේ වැළඳුවේ මොනවාද, ශාස්තෘන් වහන්සේගේ පිරිනිවීම ඔබට පමණක් නොව සදේවක ලෝකයාටම මහා විපතකි. දැන් කවරෙක් මරණයෙන් මිදෙන්නේද, සදේවක ලෝකයට අග්‍ර පුද්ගලයා පිරිනිවි කල දැන් අන් කවරකු දැක මාරයා ලජ්ජා වන්නේද, ආදී ක්‍රමයෙන් මරණ ප්‍රතිසංයුක්ත සතුටු සාමීචි කථාකොට තෙරුන්වහන්සේට ඊයේ පානය කළ බෙහෙතට සුදුසු අහර දී බත්කිස අවසන එකත්පසෙක හුන්නේය. **උපට්ඨාකො සන්තිකාවචරො** උපස්ථායක වී ළඟ හැසිරෙන්නා සිදුරු සොයන්නේ නොවේ. **සම්පචාරී** මෙම පළමු පදයට සමාන පදයකි. **යෙසං සො භවං ගොතමො** කුමක් නිසා අසයිද? ඔහුට මෙසේ සිතිණ. භවත් ගෞතමයෝ යම් ධර්මයන්හි මේ ලෝකය පිහිටුවාහුද, ඒවා ඔහුගේ ඇවෑමෙන් නැසුණේද, පවතීද ඉදින් පවතීනම් ආනන්ද දන්නේය. ඔහුගෙන් අසමි. ඒ නිසා අසයි. ඉක්බිති තෙරණුවෝ තුන්පිටකය බන්ධයන් සමග සංග්‍රහකොට දක්වන්නාහු **තිණ්ණං** ඛො ආදිය කීහ. තරුණයා කෙටියෙන් කියූ දෙය නොසලකන්නේ විස්තර වශයෙන් අසන්නෙමියි සිතා **කතමෙස තිණ්ණං** ආදිය කීය. ඉන්පසු තෙරුන් විසින් **අරියසස සීලක්ඛන්ධසස** යනුවෙන් ඒවා දැක්වූ කල්හි නැවත 'භවත් ආනන්ද, කිමෙක්ද ඒ ආර්ය ශීලස්කන්ධය? යැයි එකඑකක් ඇසීය. තෙරණුවෝද බුද්ධෝත්පාදය දක්වා ත්‍රිපිටක ධර්මය දේශනා කරන්නාහු අනුක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේ කියන ලද ක්‍රමයෙන්ම සියල්ල විසඳලූහ.

එහි **අත්ථි චෙවෙත්ථ උත්තරිං කරණීයං** මෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි සීලය පමණක් හරය නොවේ. ඉන් මත්තෙහි තවත් කළයුත්තක් ඇත්තේම යයි දක්වයි. **ඉතො** බහිද්ධා බුදු සසුනින් බාහිර. **කථඤ්ච මාණව භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති** ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භවත් ආනන්ද කුමක් ඒ සමාධි ස්කන්ධයයි මෙසේ සමාධි ස්කන්ධය විමසනු ලැබුවේද යමෙක් සීල සම්පන්න වූයේ ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තේ සති සම්ප්‍රජානනයෙන් යුක්ත වූයේ සතුටු වූයේ යයි මෙසේ ශීලයන්ට අන්තර්ගත වූ ඉන්ද්‍රිය සංවර ආදිය,

ශීල සමාධීන් අතර දෙකටම උපකාරී වූ ධර්මයක් උදෙසන ලදී. ඒවා නිර්දේශකොට සමාධි ස්කන්ධය දක්වනු කැමැත්තේ ආරම්භ කළහ. මෙහිද රූපධ්‍යාන ආදියම ආයේය. අරූපධ්‍යාන නොවේ. ගෙනවුත් පැහැදිලි කළයුතුය. චතුර්ථධ්‍යානය සමග සංග්‍රහ නොවූ අරූප සමාපත්තියක් නම් නැත. **අත්‍ථිචෙවත්‍ථ උත්තරිං** මෙහිද භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි චිත්තෛකාග්‍රතා මාත්‍රයෙන්ම අවසානයට පැමිණීමක් නැත. එයිනුත් මත්තෙහි කළයුතු තවත් දෙයක් ඇත්තේම යයි දක්වයි. **නත්‍ථිචෙවත්‍ථ උත්තරිං කරණීයං** මෙහිද භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි එයිනුත් මත්තෙහි කළයුත්තක් නම් නැත්තේමය. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය රහත්බව කෙළවරකොට ඇත්තේයයි දක්වයි. සෙස්ස සියලු තැන නොගැඹුරු අරුත් ඇත්තේමය.

**සුභ සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

# කෙවට්ට සූත්‍ර වර්ණනාව

**එවං මෙ සුතං -පෙ- නාලන්‍දාය** යනු කේවට්ට සූත්‍රයයි. මේ එහි ගැඹුරුපද වර්ණනාවයි. **පාවාරිකම්බවනෙ** පාවාරිකගේ අඹවනයෙහි. **කෙවට්ටො** මෙය ඒ ගෘහපති පුත්‍රයාගේ නමයි. ඔහු සතළිස් සතර කෝටියක් ධන ඇති අතිශයින් ශ්‍රද්ධාසම්පන්න ගෘහපති මහා සාලයෙක් විය. ඔහු ශ්‍රද්ධාව අධික බැවින්ම ඉදින් එක් භික්‍ෂුවක් අඩමසකට වරක් හෝ මාසයකට වරක් හෝ අවුරුද්දකට වරක් අහසට පැන නැගී විවිධ ප්‍රාතිහාර්ය දක්වන්නේ නම්, සියලු ජනයා අතිශයින් පැහැදෙනු ඇත. මම භාග්‍යවතුන් වහන්සේගෙන් ඉල්ලා ප්‍රාතිහාර්ය දැක්වීම සඳහා එක් භික්‍ෂුවක් අනුදන්වා ගන්නෙම් නම් මැනවැයි සිතා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ මෙසේ කීය. එහි **ඉද්ධා** යනු සමෘද්ධිමත්. **ඵීතා** නොයෙක් භාණ්ඩ බෙහෙවින් ඇති බැවින් අභිවෘද්ධියට පත්. **ආකිණ්ණ මනුස්සා**

උරෙනුර පැහැර හැසිරෙන්නාක් මෙන් මිනිසුන්ගෙන් ආකීර්ණ වූ. **සමාදියතු** අණකරනු මැනවි. තනතුරෙහි තබනු මැනවි. **උත්තරිමනුස්ස ධම්මා** උසස් මනුෂ්‍යයන්ගේ ස්වභාවයෙන් හෝ දශකුශල සංඛ්‍යාතයෙන් හෝ මනුෂ්‍ය ධර්මයෙන් උසස්. **භියෙ‍්‍යාසොමත්තාය** ප්‍රකෘතියෙන්ම දැල්වෙන පහන තෙල් වත් කිරීමක් ලැබ මෙන් අතිරේක ප්‍රමාණයෙන් අතිශයින් පැහැදෙන්නේය. **නඛො අහං** භාග්‍යවතුන් වහන්සේ රජගහ සිටුවරයාගේ කථාවෙහි ශික්ෂාපදයක් පැනවූ සේක. **ධංසෙමි** ගුණ වනසන විනාශයෙන් විනාශ කරමි. ශීලභේදයට පමුණුවා පිළිවෙළින් උස්තැන සිට බස්සවා පහත් තැනක තබමි. බුද්ධ ශාසනයෙහි අභිවෘද්ධිය අපේක්ෂා කරන්නේ කියමියි දක්වයි. **තතියම්පි ඛො** තෙවරක් බුදුවරුන්ගේ කථාව බැහැරකොට කියන්ට උත්සාහ කරන්නෙක් නම් නැත. මොහු භාග්‍යවතුන් වහන්සේ සමග විශ්වාසවන්තයෙකි. විශ්වාසය වර්ධනය කොට වල්ලභයෙක්ව යහපත කැමැත්තෙක්මියි තෙවරක් කීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ උපාසකයා මා බැහැරකරන කල්හිත් නැවත නැවත ඉල්ලා සිටින්නේමය. ඔහුට ප්‍රාතිහාර්ය කිරීමෙහි ආදීනවය පෙන්වන්නෙමියි සිතා **තීණිඛො** ආදිය කී සේක.

එහි **අමාහං භික්ඛුං** මම අසුවල් භික්ෂුව. **ගන්ධාරී** ගන්ධාර නම් ඍෂිවරයා විසින් කරන ලද. ගන්ධාර රටෙහි උපන් විද්‍යාව. එහි බොහෝ ඍෂිවරු විසූහ. ඔවුන්ගෙන් එක් අයකු කළ විද්‍යාව යන අදහසයි. **අට්ටියාමි.** වේදනාවෙන් පෙළුණේ මෙන් වෙමි. **හරායාමි** ලජ්ජා වෙමි. **ජිගුච්ඡාමි** අසූචි දැක මෙන් පිළිකුල උපදවමි. **පරසත්තානං** අන්‍යයන්ගේ සන්තානය. දෙවැන්න එයටම සමාන වචනයකි. **ආදිසති** කියයි. **චෙතසිකං** දොම්නස සොම්නස අදහස් කරන ලදී. **එවම්පිතෙ මනො** මෙසේ ඔබගේ සිත සොම්නස් වූයේද දොම්නස් වූයේද හෝ කාම විතර්ක ආදියෙන් යුක්ත වූයේද. දෙවැන්න එයටම සමාන වචනයකි. **ඉතිපි චෙ චිත්තං** මෙසේ ඔබගේ සිත මේ මේ අර්ථය ගැන සිතමින් පවතී යන අර්ථයි. **මණිකා නාම විජ්ජා** චින්තාමණී යනුවෙන් මෙසේ ලද නම් ඇති එක් විද්‍යාවක් ලෝකයෙහි ඇත. එයින් අනුන්ගේ සිත් දනී යයි දක්වයි. **එවං විතක්කෙථ** මෙසේ නෛෂ්ක්‍රම්‍ය විතර්ක ආදිය පවත්වමින් විතර්ක කරන්නහු. **මාඑවං විතක්කයිත්ථ** මෙසේ කාමවිතර්ක ආදිය පවත්වමින් විතර්ක නොකරන්නාහු. **එවං මනසිකරොථ** මෙසේ අනිත්‍ය සංඥාවම දුක්ඛ සඤ්ඤා ආදීන් අතරින් එකක් මෙනෙහි කරහු. **මාඑවං** නිත්‍යය ආදී ක්‍රමයෙන් මෙනෙහි නොකරනු. මෙයැයි මේ පංචගුණ රාගය අත්හරිනු.

ඉදං උපසම්පජ්ජ මේ චතුර්මාර්ගඵල භේද ඇති ලෝකෝත්තර ධර්මයටම එළඹ පැමිණ, එයම නිපදවා වසතු. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඉද්ධිවිධ ප්‍රාතිහාර්ය යයි දක්වන සේක. අනුන් සිත දැන කීම ආදේසනා ප්‍රාතිහාර්ය යැයි ද ශ්‍රාවකයන්ගේද බුදුවරුන්ගේ ද නිරතුරු ධර්මදේශනාව මහා මොග්ගල්ලාන තෙරුන්ට පුරුදු අනුසාසනී ප්‍රාතිහාර්යයැයිද ධර්ම සේනාපති තෙරුන්ගේ ආදේසනා ප්‍රාතිහාර්යයෙන් අනුසාසනී ප්‍රාතිහාර්යයෙන් අනුසාසනී ප්‍රාතිහාර්යය දක්වයි. දෙව්දත් සංඝභේදය කොට පන්සියයක් භික්ෂූන් ගෙන ගයා ශීර්ෂයෙහි බුද්ධ ලීලාවෙන් ඔවුන්ට ධර්මය දේශනාකරන කල්හිද භාග්‍යවතුන් වහන්සේ විසින් යවන ලද අගසවු දෙනමගෙන් ධර්ම සේනාපති තෙරණුවෝ ඔවුන්ගේ චිත්තාචාරය දැන ධර්මය දේශනා කළහ. තෙරුන්ගේ ධර්ම දේශනාව අසා පන්සියයක් භික්ෂූහු සෝවාන් පෙලෙහි පිහිටියාහුය. ඉක්බිති ඔවුන්ට මහ මුගලන් තෙරණුවෝ විකුර්වණය දක්ව දක්වා ධර්මය දෙසූහ. එය අසා සියල්ලෝ රහත් පෙලෙහි පිහිටියාහුය. ඉක්බිති මහා නාගයෝ දෙනම පන්සියයක් භික්ෂූන් රැගෙන අහසට පැන නැගී වේළුවනයටම වැඩියාහුය. අනුසාසනී ප්‍රාතිහාර්යය වනාහි බුදුවරුන්ගේ නිරන්තර ධර්මදේශනාවය. ඔවුන් අතරින් ඍද්ධි ප්‍රාතිහාර්යය සහ ආදේසනා ප්‍රාතිහාර්යය උපාරවත සහිතය. දොස් සහිතය. දිගුකලක් නොසිටී. දිගුකලක් නොසිටිනා බැවින් ඉදිරියට නොයයි. අනුසාසනී ප්‍රාතිහාර්යය උපාරම්භ රහිතය. නිදොස්ය. බොහෝ කලක් සිටී. බොහෝ කලක් සිටිනා බැවින් ඉදිරියට යයි. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ ඍද්ධි ප්‍රාතිහාර්යයද ආදේශනා ප්‍රාතිහාර්යය ද ගරහන සේක. අනුසාසනී ප්‍රාතිහාර්යය පමණක් ප්‍රශංසා කරන සේක.

භූතපුබ්බං මෙය කුමක් හෙයින් අරඹන ලද්දේ ද? ඍද්ධි ප්‍රාතිහාර්යයෙහි හා ආදේසනා ප්‍රාතිහාර්යහෙි අනෛර්යාණික බව දැක්වීම පිණිසය. එසේ වුවත් සියලු බුදුවරුන්ට මහාභූත පරියෙසක නම් එක් භික්ෂුවක් සිටීමය. හේ මහාභූතයන් පර්යේෂණය කරන්නේ බඹලොව තෙක් හැසිර විසඳන අයකු නොලැබ අවුත් බුදුවරුන්ම විචාරා නිසැක වෙයි. කුමක් හෙයින්ද යත්, බුදුවරුන්ගේ මහත් බව දක්වනු පිණිසය. මේ කරුණ සැඟවී තිබෙන්නකි. ඉක්බිති එය විවරකොට දක්වන සේක් භාග්‍යවතුන් වහන්සේ භූතපුබ්බං ආදිය කී සේක.

එහි කත්ථනුඛො කවර තැනෙක්හි කුමක් නිසා පැමිණ, කුමක් නිසා ආ. ඒවා නිරවශේෂයෙන් නොපවත්නා වශයෙන් නිරුද්ධ වේ. මේ

මහාභූත කථාව සර්වාකාරයෙන් විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. ඒ නිසා එය එතැනින් ම ගතයුතුය. **දෙවයානියො මග්ගො** දෙව්ලොවට යන තනි මගක් නම් නැත. ඉද්ධිවිධ ඤාණයට මෙය තවත් වචනයකි. ඒ නිසා මෙය බඹලොව තෙක් කයින් වශයෙහි පවතින්නේ දෙව්ලොව යයි. ඒ නිසා එය දෙවයානියො මග්ගො යයි කියන ලදී. **යෙන චාතුම්මහාරාජිකා** සමීපයෙහි සිටියා වූද, භාග්‍යවතුන් වහන්සේ නොවිමසා ස්වභාවයෙන් චෝදනා කරන ලද්දේ දේවතාවෝ මහානුභාව ඇත්තෝ යයි එළඹියේය. **මයංහිඛො භික්ඛු නජානාම** බුද්ධවිෂය පිළිබඳ ප්‍රශ්න අසනු ලැබූ දෙවියෝ නොදනිති. එහෙයින් ඇසූහ. ඉක්බිති ඒ භික්ෂුව මට මේ ප්‍රශ්නය නොකියන්ට නොලැබෙයි. වහා කියන්නැයි දේවතාවා ආවරණය කරයි. නැවත නැවත අසයි. දේවතාවා ආවරණය කරයි. මේ භික්ෂුව නොවේ. ඔහු අතින් මුදමුයි සිතා 'භික්ෂුව සිව්මහ රජවරු ඇතැයි ආදිය කීහ. එහි **අභික්කන්තතරා** වඩා කාන්ත බව ඉක්මවා. **පණීතතරා** වර්ණ යසස් ඓශ්වර්ය ආදියෙන් වඩා උතුම්. මේ ක්‍රමයෙන් සියලු වාරයන්හි අර්ථය දතයුතුය.

මේ විශේෂයයි. ශක්‍ර දේවරාජයා මෙසේ සිතීය. මේ ප්‍රශ්නය බුද්ධ විෂයට අයත්ය. අන්‍යයකු විසින් විසඳන්ට නොහැකිය. මේ භික්ෂුව ගිනි අත්හැර කදෝපැණියකු පිඹින්නාක් මෙන්ද බෙරය අත්හැර උදරය වයන්නාක් මෙන්ද ලෝකයෙහි අග්‍ර පුද්ගලයා වූ සම්බුදුන් අත්හැර දේවතාවන් විචාරමින් හැසිරේ. මොහු ශාස්තෲන් සමීපයට යවමි. ඉන්පසු නැවතත් මෙසේ සිතීය. බොහෝදුරක් ගොස් හෝ ශාස්තෲන් සමීපයෙන්ම නිශ්ශංක වන්නේය. මොහු ඇට වෙව්ලන පුද්ගලයෙකි. මඳක් ඇවිදින්නේ වෙහෙස වේවා. පසුව දැනගන්නේ යයි ඉන්පසු ඔහුට 'අහමපි ඛො' ආදිය කීය.

**එකමන්තං අපක්කම්ම** කුමක් නිසා මෙසේ කෙළේද? කුහක බැවින්.

**බහිද්ධා පරියෙට්ඨී** තෙලින් ප්‍රයෝජන ඇත්තකු වැලි මිරිකන්නාක් මෙන් බඹලොව තෙක් පිටත සෙවීමට පැමිණේ.

**සකුණං** කපුටකු හෝ උකුස්සකු හෝ. **නඛො එසො භික්ඛු පඤ්හො එවං පුච්ඡිතබ්බො** මෙය භාග්‍යවතුන් වහන්සේ යම්හෙයකින් ප්‍රදේශ වශයෙන් ප්‍රශ්නය ඇසිය යුතුද, මේ භික්ෂුව අල්ලා නොගත් දේ ගෙන

ප්‍රදේශ නැතිව අසයිද ඒ නිසා ඉවත් කරයි. මෙය බුදුවරුන්ට පුරුදු දෙයකි. ප්‍රශ්න ඇසීමෙන් මුළා වූ ජනයාට ප්‍රශ්න ඇසීමේ දොස් දක්වා ඇසීම හික්මවා ප්‍රශ්න විසඳීමය. කුමක් හෙයින්ද යත්, අසන්ට නොදැන අසන්නේ විඥාපනයට අපහසු වූවෙක් වෙයි. ප්‍රශ්නය හික්මවන්නේ 'කත්ථ අපොවා' යයි ආදිය කීය.

එහි තගාධති නොපිහිටයි. මේ සතරමහාභූතයෝ කුමක් අරබයා ප්‍රතිෂ්ඨා නැත්තෝ වෙති ද යන අර්ථයි. උපාදින්න සඳහාම ඇසීමයි. දීඝරසසං පැවතුම් වශයෙන් උපදා රූපය කියන ලදී. අණුං මූලං කුඩා හෝ මහත්. මෙයින්ද උපාදා රූපයෙහි වර්ණ මාත්‍රයම කියන ලදී. සුභාසුභං සුභද අශුභද උපාදා රූපයමය. උපාදා රූපය සුභ අසුභ බවක් ඇත්තේද නැති ඉෂ්ටාරම්මණයක්ම කියන ලදී. නාමඤ්ච රූපඤ්ච නාමයද දිග ආදී භේද ඇති රූපයද. උපරුජ්ඣති නිරුද්ධ වෙයි. කුමක් අරබයා මෙය ශේෂයක් නැතිව නොපවත්නේදැයි මෙසේ ඇසිය යුතුය. තිබුණේය. ඇසීම දක්වා දැන් විසඳීම දක්වන්නේ 'තත්‍ර වෙය්‍යාකරණං භවති'යි කියා විඤ්ඤාණං ආදිය කීය.

එහි දැන්විය යුතුනුයි විඤ්ඤාණං. නිර්වාණයට නමකි. එය නිදර්ශන නැති බැවින් අනිදස්සනං උපදවන්නේ හෝ වැයවන්නේ හෝ සිටියහුගේ අන්‍යථාත්වයක් හෝ මෙයට නැතැයි අනන්තා පහ මෙය තීර්ථයට නමකි. මෙහි බොත්තුයි පපං. ප කාරයට භ කාරය කරන ලදී. හැම අතින්ම ජලය මොහුට ඇත්තේනුයි සබ්බතො පභං. යම්තැනකින් මහා සමුද්‍රය මෙන් නිවනට බසිනු කැමැත්තෝද ඒ ඒ තැනම තීර්ථය වෙයි. තීර්ථ නොවන තැනක් නැත. මෙසේ තිස්අටක් කර්මස්ථාන අතුරින් යම් යම් දොරකින් නිවනට බැසගැනීමට කැමැත්තෝ වෙත්ද, ඒ ඒ දොරටුවම තීර්ථයයි. නිවනට තීර්ථයක් නොවන කර්මස්ථාන නැත. එහෙයින් කියන ලදී. පබ්බතොපභං යනුවෙන්. එත්ථ ආපොචා මෙහි නිවනෙහි. මේ නිවනට පැමිණ මේ සියල්ල ජලයයි ආදි ක්‍රමයෙන් කියන ලදී. උපාදින්නක ස්වරූපයෙන් උපන් දෙය නිරුද්ධ වෙයි. නොපැවතුණේ වෙයි. දැන් එහි නිරුද්ධවන උපාය දක්වන්නේ 'විඤ්ඤාණයාගේ නිරෝධයෙන් එය නැවත විනාශ වේයයි කීය. එහි විඤ්ඤාණං චරිම විඤ්ඤාණය ද අභිසංඛාර විඤ්ඤාණයද චරිම විඤ්ඤාණයාගේ නිරෝධයෙන් එහි එය විනාශ වේ. පිංගල පහන් සිළුවක් මෙන් නොපවත්නා බවට යයි. අභිසංස්කාර

විඥානයාගේ අනුප්පාද නිරෝධයෙන් අනුප්පාද වශයෙන්ම විනාශ වේ. යම්සේ කීවේද, සෝතාපත්ති මග්ග විඤ්ඤාණයෙන් අභිසංඛාර විඤ්ඤාණයාගේ නිරෝධයෙන් භව සතක් හැර අක්මුල් නැති සසර උපදිත්. නාමයද රූපයද නිරුද්ධ වෙයි. සියල්ල මහා නිද්දේසයෙහි කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේමය.

**කේවට්ට සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

# ලොහිච්ච සූත්‍ර වර්ණනාව

එවං මෙ සුතං -පෙ- කොසලෙසු යනු ලොහිච්ච සූත්‍රයයි. මේ එහි ගැඹුරුපද වර්ණනාවයි. **සාලවතිකා** ඒ ගමෙහි නම. එය වැටක් මෙන් හාත්පසින් සල්ගස් පෙලකින් වටකරන ලද්දේය. ඒ නිසා සාලවතිකා යයි කියනු ලැබේ. ලොහිච්චො බමුණාගේ නම. **පාපකො** පරානුකම්පාවෙන් විරහිත බැවින් ලාමකය. උච්ඡේද ශාස්වතයන්ගෙන් එකෙක් නොවේ. **උප්පන්නං හොති** උපන්නේ වෙයි. හුදෙක් සිතෙහි උපන් මාත්‍රයක්ම නොවේ. ඔහු ඒ අනුව පිරිස මැද වුවද මෙසේ කියයි. **කිංහි පරො පරස්ස** යමෙක් අන්‍යයාට අනුශාසනා කරනු ලබයිද ඒ අනුශාසකයාට කුමක් කරන්නේද, තමා ලබාගත් කුසල ධර්මය තමාම සත්කාරකොට ගරුකාර කොට විහාතබ්බන්ති අතහැර දැමිය යුතුයයි කියයි. **භෙසිකං නහාපිතං ආමන්තෙසි** හෙසිකා යනු ස්ත්‍රීලිංග වශයෙන් ලද නම් ඇති කරණවෑමියා ඇමතීය. හේ භාග්‍යවතුන් වහන්සේගේ පැමිණීම අසා මෙසේ සිතීය. විහාරයට ගොස් දතයුත්තක් නම් බැරෑරුම්ය. ගෙට කැඳවා බලන්නෙමියි ද ඇති අයුරින් ආගන්තුක භික්ෂාවක් දෙන්නෙමි. ඒ නිසා ඒ කරණවෑමියාට ඇමතීය. **පිට්ඨිතො පිට්ඨිතො** කථා කිරීමේ පහසුව පිණිස පසුපසින් ලුහුබඳනා ලද්දේ වෙයි. **විවෙචතු** මුදවන්න. ඒ දෘෂ්ටිගතය නැතිකරනු

මැනවැයි කියයි. මේ උපාසකයා ලොහිච්ච බමුණාගේ ප්‍රිය සහායකයාය. ඒ නිසා යහපත කැමැත්තෙන් මෙසේ කීය. **අපෙපවනාමසියා** මෙහි ප්‍රථම වචනයෙන්ම භාග්‍යවතුන් වහන්සේ ගර්ජනය කරන සේක. දෙවැනි වචනයෙන් අනුගර්ජනය කරන සේක. මේ මෙහි අභිප්‍රායයි. හේසිකා මේ අර්ථය පිණිසම මා විසින් සාර අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් විවිධ දුෂ්කර දේ කරමින් පාරමී පුරන ලදී. ඒ සඳහා සර්වඥතා ඥානය අවබෝධ කරන ලදී. ලොහිච්ච බමුණාගේ දෘෂ්ටිගතය බිඳීම මට බරක් නොවේ යයි මේ අර්ථය දක්වන සේක් ප්‍රථම වචනයෙන් භාග්‍යවතුන් වහන්සේ ගර්ජනය කරන සේක. හේසිකා, හුදෙක් ලොහිච්චගේ මා සමීපයට පැමිණීම හෝ හිඳීම හෝ අල්ලාප සල්ලාපයක් හෝ වේවා, ලොහිච්ච වැනි සියදහසකට සැක ඇතිවෙයි. මම එය නැති කිරීමට ශක්තිය ඇත්තෙම් වෙමි. ලොහිච්චගේ එකම දෘෂ්ටිය නැතිකිරීමේලා මට කවර බරක්ද, මේ අර්ථය දක්වන සේක් දෙවැනි වචනයෙන් භාග්‍යවතුන් වහන්සේ අනුගර්ජනය කරනසේකැයි දතයුතුය.

**සමුදය සජාති** සමුදයෙහි සජාතික වූ භෝග උත්පාදය එයින් ගොඩනගාගත් ධන ධාන්‍ය යන අර්ථයි. **යෙතං උපජීවනති** යම් ඥාති පිරිවර දාස කම්කරු ආදි ජනයා ඔහු නිසා ජීවත්වෙත්ද, **අනතරාය කරො** ලාභයට අන්තරාය කරන, **හිතානුකමපී** මෙහි හිතං යනු දියුණුවයි. අනුකම්පා කෙරේනුයි අනුකමපී. කැමති වේ යන අර්ථයි. වෘද්ධිය කැමති වේ හෝ නොවේ යයි කියන ලද්දේ වෙයි. **නිරයං වා තිරච්ඡාන යොනිංවා** ඉදින් ඒ මිථ්‍යාදෘෂ්ටිය උපදීද නියත වේද ඒකාන්තයෙන් නරකයෙහි උපදී. නැතහොත් තිරිසන් යෝනියෙහි උපදී යන අර්ථයි. දැන් යම්හෙයකින් යම්සේ තමාගේ ලාභය නැතිවීමෙන් සන්ත්‍රාසය විද්‍යමාන වේද අනුන්ට එසේ නොවේ. ඒ නිසා වැඩි වශයෙන් බ්‍රාහ්මණයා සංවේගයට පත්කරනු කැමති සේක් 'ඔබ කුමක් සිතන්නෙහිද' යන දෙවැනි උත්පත්තිය කී සේක. **යෙචිමෙ** තථාගතයන් වහන්සේගේ ධර්මදේශනාව අසා ආර්යභූමියට බැසගැනීමට නොහැකිවන කුලපුත්‍රයෝ **දිබ්බා ගබ්භා** ද්විතියාර්ථයෙහි **පඤ්චමී** වචනයි. දිව්‍ය ගර්භයෙහි යන අර්ථයි. දිබ්බා ගබ්භා සැඟැවුණු දිව්‍යලෝකයන්ට තවත් වචනයකි. **පරිපාචෙනති** දිව්‍යලෝකයට යන ප්‍රතිපදාව පුරන, දානය දෙන, සිල් රකින, ගඳමල් ආදියෙන් පූජාකරන, භාවනා වඩන අය ඉදිරියට යති. පල දරත්. මුහුකුරා යත්. පරිණාමයට යත්. **දිබ්බානං භවානං අභිනිබ්බතතියා**

දිබ්බාභවා නම් දෙවියන්ගේ විමාන, එහි ඉපදීම පිණිස යන අර්ථයි. නැතහොත් දිබ්බාගබ්භා යනු දානාදී පුණ්‍ය විශේෂ දිබ්බා ගබ්භා යනු දෙව්ලොව විපාකස්කන්ධ, එහි ඉපදීම පිණිස පින් කරත් යන අර්ථයි. **තෙසං අන්තරායකරො** ඒ මාර්ග සම්පත්ති, ඵල සම්පත්ති දිව්‍ය භව විශේෂයන්ට අන්තරායකර යයි මෙසේ භාග්‍යවතුන් වහන්සේ මෙපමණකින් අනියාමිත උපමා විධියකින් භවාග්‍රය තෙක් උඩට නැගුණු බමුණාගේ මානය බිඳ දැන් චෝදනාවන්ට සුදුසු ශාස්තෘන් තිදෙන දැක්වීමට තයො ඛො මෙ ලොහිච්චා යනාදිය කී සේක.

එහි **සා චොදනා** ඒ ශාස්තෘන්ට චෝදනා කෙරෙන ඒ චෝදනාව. **න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති** අනිකක් නොදැනගනු පිණිස සිත නොඑළවත්. **වොක්කම්මා** නිරතුරුව ඔහුගේ අනුශාසනය නොකොට එයින් ඉවත්වී පවතී යන අර්ථයි. **ඔසක්කන්ති යාවා උස්සුක්කෙය්‍ය** ඉවත් වන්නහු වෙත යන්නේය. අකමැති වන්නහුට කැමති වන්නේය. එකක හමුවීම අකමැති වන්නහුගෙන් එකෙක් කැමති වන්නේ යයි කියන ලද්දේ වෙයි. **පරම්මුඛිං වා ආලිංගෙය්‍ය** දක්නට පවා අකමැතිවන පරාම්මුඛව සිටියහු පසුපසින් ගොස් වැළඳ ගන්නේය. **එවං සම්පදං** මාගේ මේ ශාස්තෘවරයාගේ ශ්‍රාවකයෝ යැයි ශාසනයෙන් ඉවත්ව පවත්නා කල්හිද මෝහයෙන් අනුශාසනා කරන්නහුගේ මේ ලෝභී ස්වභාවය මෙසේ පැමිණියේ යයිද ඒහා සමාන යයිද කියමි. මෙසේ ඒ මෙබඳු ඔබගේ ලෝභ ස්වභාවය පසුපසට යන්නකු උත්සාහ කරන්නාක් මෙන් පරාංමුඛ වූවකු වැළඳගන්නාක් මෙන් විය යන චෝදනාවට සුදුසුය. **කිංහි පරො පරස්ස කරිස්සති** යම් ධර්මයකින් අනුන්ට අනුශාසනා කරහිද, තමාම සම්පාදනය කරව ඍජු කරව අන්‍යයාට කුමක් කරන්නේද යන චෝදනාවට සුදුසුය. **නිච්චායිතබ්බං** ශස්‍යය දූෂණය කරන තණ උදුරා පිරිසිදු කළයුතුය. දෙවැනි චෝදනාවෙන් **කිංහි පරො පරස්ස** අනුශාසනය නොපිළිගන්නා කාලයෙහි පටන් අන්‍යයා අනුන්ට අනුශාසනා කරන්නාට අනුශාසනා කළයුතුය. **කිං කරිස්සති** යනු එහි අල්ප උත්සාහ ඇති බවට පැමිණ තමා විසින් අවබෝධ කරන ලද ධර්මය තමාම ගරුකොට පූජාකොට අවබෝධ කළයුතුය යන චෝදනාවට සුදුසුය යන අර්ථයි. **න චොදනාරහො** මොහු යම්හෙයකින් තමා සුදුසු තැනක පිහිටුවා ශ්‍රාවකයන්ට ධර්මය දෙසයි. ශ්‍රාවකයෝද ඔහුට කීකරුව අනුශාසනා කරන ලද පරිදි පිළිපදිත්. ඒ ප්‍රතිපත්තියෙහි මහත්වූ විශේෂයක් අවබෝධ

කරගනිති. ඒ නිසා චෝදනාවට සුදුසු නොවේ. **නරකපපාතංපපතනෙතා** මා ගත් දෘෂ්ටියෙන් මම නරක ප්‍රපාතයට වැටෙන්නෙමි. **උඬරිත්වා ථලෙ පතිට්ඨාපිතො** ඒ දෘෂ්ටිය බිඳ ධර්මදේශනා නමැති අතින් අපාය ප්‍රපාතයෙන් උඩට ගෙන ස්වර්ගමාර්ග නමැති ගොඩබිමෙහි තැබුවෙමියි කියයි.

**ලොහිච්ච සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

# තෙවිජ්ජ සූත්‍ර වර්ණනාව

**එවං මෙසුතං** යනු තෙවිජ්ජ සූත්‍රයයි. මේ එහි ගැඹුරුපද වර්ණනාවයි. **මනසා කටං** ඒ ගමෙහි නම. **උත්තරෙන මනසා කටස්ස** මනසාකට ගමට නුදුරෙහි උතුරු පස. **අම්බවනෙ** තරුණ අඹරුක් ලැහැබෙහි. ඒ භූමිභාගය රමණීයය. යට රිදීපටවන් වැලි විසුරුවන ලද්දේය. මත්තෙහි මැණික් වියනක් බඳු ඝනට වැඩුණු ශාඛා පත්‍ර ඇති අඹවනයයි. ඒ බුදුවරුන්ට සුදුසු විවේක සුව ඇති අඹවනයෙහි වාසය කරන සේක යන අර්ථයි.

**අභිඤ්ඤාතා** අභිඤ්ඤාතා කුලචාරිත්‍ර ආදී සම්පත්තියෙන් ඒ ඒ තැන ප්‍රසිද්ධ වූ. චංකී ආදිය ඔවුන්ගේ නමය. එහි චංකී ඔපසාද වැසියෙකි. තාරුක්ඛ ඉච්ඡානංගල වැසියෙකි. පොක්ඛරසාති උක්කට්ඨා වැසියෙකි. ජාණුසෙසාණි සැවැත්නුවර වැසියෙකි. තොදෙය්‍ය තුදී ගමෙහි වැසියෙකි. **අඤ්ඤෙච** අන් බොහෝ ජනයෝ තම තමාගේ නිවාසස්ථානවලින් පැමිණ මන්ත්‍ර සජ්ඣායනය පිණිස එහි වාසය කරත්. මනසාකටයෙහි රමණීය බව නිසා ඒ බමුණෝ එහි නදීතෙර ගෙවල් කරවා වටකරවා අන් බොහෝ දෙනාගේ ප්‍රවේශය වළක්වා අතරින් පතර එහි පැමිණ වසත්.

**වාසෙට්ඨ භාරද්වාජානං** වාසෙට්ඨගේ සහ පොක්ඛරසාතිගේ අතවැසියාගේ, භාරද්වාජගේද තාරුක්ඛගේ ද අතවැසියාගේ ද මේ දෙදෙන ජාති සම්පන්න ත්‍රිවේදයෙහි පරතෙරට ගියාහු වූහ. **ජංඝා විහාරං** බොහෝ කලක් හිඳගෙන සිටීමේ හේතුවෙන් වෙහෙස නැතිකිරීම පිණිස පයින් ඇවිදීම. ඔවුහු දිවාකල්හි සජ්ඣායනා කොට සවස නැගිට නෑම සඳහා අවශ්‍ය බඩු ගඳමල් සේදූ ඇඳුම් ගෙන්වාගෙන තමාගේ පිරිවරින් පිරිවරන ලදුව නහනු කැමැත්තාහු නදීතෙරට ගොස් රිදීපටක වර්ණය ඇති වැලිමැද ඔබමොබ සක්මන් කළහ. එකකු සක්මන් කරනවිට අනිකා ඔහු අනුව සක්මන් කළේය. නැවත අනිකා අනුව සක්මන් කළේය. එහෙයින් කියන ලදී. අනුචංක මනතානං අනුවිචරනතානං' යනුවෙන් **මග්ගා මග්ගෙ** මාර්ගයෙහිද අමාර්ගයෙහිද, කුමක් හෝ ප්‍රතිපත්තියක් පුරා කුමන මගකින් සුවසේ බඹලොවට යාමට හැකිදැයි මෙසේ මගනොමග අරබයා කථාවක් නැංවූහ යන අර්ථයි.

**අඤ්ජසායනො** ඍජු මාර්ගයට සමාන වචනයකි. කෙළින් මාර්ගයද ඍජු මාර්ගයකි. මෙයින් අයනති - යත්නුයි අඤ්ජසායනො. **නීය්‍යාණිකො නිය්‍යාති** යන්නේ යයි යන අර්ථයි. කොහි යයිද? තක්කර බ්‍රහ්මයාගේ සහභාවයට යමෙක් ඒ මාර්ගය කරයිද පිළිපදීද ඔහුගේ බ්‍රහ්මයා සමග එක්වීමෙන් එක්තැනක පහළවීම පිණිස යයි යන අර්ථයි. **යවායං** නම් වේ. **අක්ඛාතො** කියන ලද්දේ දක්වන ලද්දේ **බ්‍රාහ්මණෙන පොක්ඛරසාතිනා** තමාගේ ආචාර්යවරයා පෙන්වයි. මෙසේ වාසෙට්ඨ තමාගේම ආචාර්ය වාදයට ස්තුතිකොට තදින් ගෙන හැසිරේ. භාරද්වාජද තමාගේ ආචාර්යවාදය ගෙන හැසිරේ. එහෙයින් කියන ලදී. 'නෙව ඛො අසක්ඛි වාසෙට්ඨො' ආදිය.

ඉක්බිති වාසෙට්ඨ අප දෙදෙනාගේම කථාව අනෛර්යාණිකය. මේ ලෝකයෙහි භවත් ගෞතමයන් හා සමාන මාර්ග කුශලතා ඇත්තෙක් නැත. භවත් ගෞතමයෝ ද නුදුරෙහි වසති. උන්වහන්සේ තුලාවක් ගෙන හුන් වෙළෙන්දකු මෙන් සැක සිඳින්නෝ යයි සිතා ඒ බව භාරද්වාජට දන්වා දෙදෙනාම ගොස් තමාගේ කථාව භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. එහෙයින් කියන ලදී. ඉක්බිති වාසෙට්ඨ -පෙ- තාරුක්ඛ බ්‍රහ්මණයා විසින් යමක් කියන ලද්දේ ද යනුවෙන්. **එත්ථ භො ගොතමො** මේ මගනොමගෙහි. **විග්ගහො** ආදී තන්හි කලින් හටගත්තා බැවින් විග්‍රහ වෙයි. පසුව විවාදයයි.

විවිධ වූ එය නොයෙක් ඇදුරන්ගේ වාදයෙන් නානාවාද වෙයි. **අථ කිඤ්චාපි පන** වෝ ඔබද මෙයම මාර්ගය යැයි තමාගේ ආචාර්යවාදයම තදින් අල්ලාගෙන සිටින්නෙහිය. භාරද්වාජද තමාගේ ආචාර්යවාදය තදින් අල්ලාගෙන සිටී. එකකුට එකකු කෙරෙහි සැකයක් නැත. මෙසේ ඇතිකල අපගේ කුමන විග්‍රහයක් දැයි අසයි.

**මගගාමගෙග හො ගොතමො** භවත් ගෞතමයෙනි, මගෙහිද නොමගෙහිද, ඍජු මාර්ගයෙහිද වක්‍ර මාර්ගයෙහි ද යන අර්ථයි. මොහු එක් බමුණෙකුගේවත් මාර්ගය අමාර්ගයයි නොකියයි. යම්සේ තමාගේ ආචාර්යවරයාගේ මාර්ගය ඍජු මාර්ගය වේද, එය අන්‍යයන්ට නො අනු දනී. ඒ නිසා ඒ අරුත දක්වන්නේ 'කිඤ්චාපි හො ගොතම' යනාදිය කීය. **සබ්බානි තානි** ලිංග විපර්යාසයෙන් කියයි. ඒ සියල්ල යයි කියන ලද්දේ වෙයි. **බහූනි** අටක් හෝ දහයක් හෝ **නානා මගගා** මහත් නොමහත් පා මග, ගැල්මහ ආදි වශයෙන් නානා විධ හාත්පස ගම් ගංගා පොකුණු කෙත් ආදී අතරින් පැමිණ ගමට පිවිසෙන මාර්ග.

**නීයනති ති වාසෙට්ඨ වදෙසි** භාග්‍යවතුන් වහන්සේ තෙවරක් කථා කරවා ප්‍රතිඥාවක් කරවූ සේක. කුමක් නිසාද යත්, තීර්ථකයෝ පිළිගෙන පසුව නිග්‍රහ කරමින් අවමත් කරති. එසේ කිරීමට නොහැකි වන්නාහුය.

**තෙවතෙවිජ්ජා** ඒ තෙවිජ්ජයෝ. ව කාරය ආගම සන්ධි මාත්‍රයකි. **අන්ධවෙණි** අන්ධ ප්‍රවේණිය. එක් ඇස් ඇති අයකු විසින් ගන්නා ලද යෂ්ටියෙහි කොන එක් අන්ධයෙක් ගනී. ඔහු තවෙකෙක් අල්ලා ගනී. ඔහු තවෙකෙක් අල්ලා ගනී. මෙසේ පනහක් හැටක් අන්ධයෝ පිළිවෙළින් ගැටුණෝ අන්ධවේණී යයි කියනු ලැබේ. **පරමපරං සංසත්තා** ඔවුනොවුන් ලැගුණාහු. යෂ්ටිය ගන්නා ඇස් ඇත්තකු නැති යන අර්ථයි. එක් ධූර්තයෙක් අඳ පිරිස දැක අසුවල් ගමෙහි කෑම් බීම සුලභයයි උත්සාහ ඇතිකොට ඔවුන් විසින් 'ස්වාමීනි, එතැනට ගෙන ගෙන යන්න ඔබට මෙනම් දෙයක් දෙමු'යි කී කල්හි අල්ලස් ගෙන අතරමග මගින් ඉවතට ගොස් මහා පඳුරක් වටකොට පළමුවැන්නාගේ අතින් පසුව එන්නාගේ කිසිල්ල අල්ලවා මට වැඩක් ඇත. උඹලා පලයල්ලා යයි කියා පළා ගියේය. ඔවුහු දවසම ගොස් මග නොදැන ඇස් ඇත්තා කොහිද, මග කොහිදැයි හඬා වැලපී මග නොදැන එහිම හැසිරුණාහුය. ඒ සඳහා කියන ලදී. 'පරම්පර සංසත්තා' යනුවෙන්. **පුරිමොපි** ආචාර්ය ප්‍රාචාර්යයන් මැද

එකෙක්. **පචඡිමොපි** දැන් තෙවිජ්ජයන් අතර එකෙක්. **හසසකඤෙඤව** සිනාසිය යුතු අන්‍යයෝ. **නාමකඤෙඤව** ලාමක අන්‍යයෝ. මෙය අර්ථයක් නැති බැවින් රික්තයකි. රික්තක බැවින්ම තුච්ඡ කොට සලකන ලද්දේය. දැන් බ්‍රහ්මයා සිටියා වේ. හේ තෙවිජ්ජයන් විසින් නොදක්නා ලද විරූය. යම් තෙවිජ්ජයෝ සඳහිරු බලත්ද ඔවුන්ගේ සහභාවයව යාමට මාර්ගය දෙසන්ට නොපොහොසත් වෙතියි දක්වන්ට තංකිං මඤ්ඤසි ආදිය කීය.

එහි **යතථ චනදිම සූරියා උගගචඡනති** එකල උඩට නගී. **යතථච ඔගගචඡනති** යම්කලෙක අස්තයට යයිද නගින කල්හිද බසින කල්හිද දකිත් යන අර්ථයි. **ආයාචනති** භාග්‍යවත් චන්ද්‍රය උදාවන්න. සූර්යය උදාවන්න යයි මෙසේ අයැද සිටිත්. **ථොමයනති** චන්ද්‍රයා සෞම්‍යය. චන්ද්‍රයා පරිමණ්ඩල ඇත්තේය. චන්ද්‍රයා තල්ලුවී යන්නෙකියි ආදිය කියමින් ප්‍රශංසා කරති. **පඤජලිකා** බැඳගත් ඇඳිලි ඇත්තාහු. **නමසසමානා** නමො නමො යයි කියමින්.

**යං පසසනති** මෙහි යං යනු නිපාත මාත්‍රයකි. **කිංපන න කිර** මෙහි යම්තැනෙක තෙවිජ්ජ බමුණන් විසින් බ්‍රහ්මයා ඇසින් නොදුටුකල මෙහිදී කුමක් කියන්නද මෙසේ අර්ථය දතයුතුය.

**සමතිතතිකා** සමබර වූවාහු. **කාකපෙයයා** ඉවුරෙහි කොතැනක හෝ සිටි කපුටාට බීමට හැක්කේනුයි කාකපෙය්‍යා. **පාරං තරිතුකාමො** නදිය ඉක්මවා පරතෙරට යනු කැමැත්තේ. **අවෙහයය** කැඳවන්නේය. එහි **පාරාපාරං** පින්වත් එතෙර, මෙතෙරට එන්න. එවිට මා වහාම ගෙන යන්නෙහිය. මට හදිසි කටයුත්තක් ඇත යන අර්ථයි.

**යෙධමමා බ්‍රාහමණකරණා** මෙහි පංචශීල, දශකුශල කර්මපථ යනුවෙන් බෙදුණු ධර්ම බ්‍රාහ්මණකරණයයි දතයුතුය. එයින් වෙනස් වූ ධර්ම අබ්‍රාහ්මකරණ නම්. **ඉනදමවහයාම** ඉන්ද්‍රයාට කතා කරමු. ඉන්ද්‍රයා කැඳවමු. මෙසේ බමුණන්ගේ ආහ්වානයෙහි (කැඳවීමෙහි) අරුත් රහිත බව දක්වා නැවතද භාග්‍යවතුන් වහන්සේ මුහුදු කුස තුළ සූර්යයා මෙන් බබලමින් පන්සියයක් භික්ෂූන් පිරිවරා අචිරවතී නදී තීරයෙහි හුන් සේක් තවත් නදී උපමාවක් ම ගෙනඑන සේක් 'සෙය්‍යථාපි' ආදිය කී සේක.

**කාමගුණා** - කැමති වියයුතු අර්ථයෙන් කාමා. බන්ධන අර්ථයෙන් ගුණා 'මහණෙනි, තුනී රෙද්දෙන් දෙපට සිවුර අනුදනිමි' - අනුජානාමි භික්ඛවෙ අහතානං වත්ථානං දිගුණං සංඝාටිං - මෙහි පටල අර්ථය සහ ගුණ අර්ථය 'කාලය ගෙවේ. රාත්‍රිය දැඩි වේ. වයස් ගුණ පිළිවෙළින් අත්හරී. අච්චෙනතිකාලා තරයනති රත්තියො වයො ගුණා අනු පුබ්බං ජහනති - මෙහි රාශී අර්ථය සහ ගුණ අර්ථයයි. දක්ෂිණාව ආනිසංස සියයක් ඇත්තෙකැයි අදහස් කෙරේ. සත ගුණා දක්ඛිණා පාටිකංඛිතබ්බා මෙහි ආනිසංස අර්ථය සහ ගුණ අර්ථයයි. 'බඩවැල මහබඩවැල බොහෝ මල්දම් කරන්නේය. අනතං අනතගුණං, කයිරා මාලාගුණෙ බහු - මෙහි බන්ධන අර්ථය සහ ගුණ අර්ථයයි. මෙහිද එයම අදහස් කරන ලදී. බන්ධන අර්ථයෙන් ගුණ යයි ඒ නිසා කියන ලදී. **චක්ඛු විඤ්ඤෙයයා** චක්ඛු විඤ්ඤාණයෙන් බැලිය යුතුය. මේ උපායයෙන් සොතවිඤ්ඤාණ ආදියෙහිද අර්ථය දතයුතුය. **ඉට්ඨා** ඉෂ්ට වූයේ හෝ වේවා නොවේවා ඉෂ්ට ආරම්මණ වූ යන අර්ථයි. **කනතා** කමනීය, **මනාපා** මන වඩන. **පියරූපා** ප්‍රිය ඇතිකරන. **කාමූපසංහිතා** අරමුණුකොට උපදනා කාමයෙන් යුතු. **රජනීයා** රංජනය කළ යුතු රාගය ඉපදීමට කරුණු වූ යන අර්ථයි. **ගධිතා** ලෝභයෙන් යටපත් කරන ලද්දෝවැ. **මුච්ඡිතා** මූර්ජා ආකාර බවට පත් අධිමාත්‍ර වූ තෘෂ්ණාවෙන් යටපත් කරන ලද්දෝවැ. **අජ්ඣොපනනා** ගිලී කිමිදී. මෙය හරයයි නිෂ්ඨාවට පැමිණියෝව. **අනාදීනව දස්සාවිනො** ආදීනව නොදක්නාහු. **අනිස්සරණ පඤ්ඤා** මෙය මෙහි නිස්සරණං යනු මෙසේ පරිඥාන ප්‍රඥාවෙන් විරහිත වූ. ප්‍රත්‍යවේක්ෂණයෙන් පරිභෝගයක් නැති යන අර්ථයි. **ආවරණා** ආදී තන්හි ආවරණය කරත්නුයි ආවරණං නිවාරණය කරත්නුයි නීවරණං දවටත්නුයි ඕනහා. හාත්පසින් දැවටෙත්නුයි පරියොනහා. කාමච්ඡන්ද ආදීන්ගේ විස්තර කථාව විශුද්ධි මාර්ගයෙන් ගතයුතුය. **ආවටා නිවුතා ඔඵුටා පරියොනද්ධා** පද ආවරණ ආදීන්ගේ වශයෙන් කියන ලදී.

**සපරිග්ගහො** ස්ත්‍රී පරිග්‍රහයෙන් පරිග්‍රහ සහිතදැයි විමසයි.

**අපරිග්ගහො භො ගොතමො** ආදී තන්හිද කාමච්ඡන්දය නැති බැවින් ස්ත්‍රී පරිග්‍රහයෙන් පරිග්‍රහ නැත්තේ. ව්‍යාපාදය නැති බැවින් කවරකු හෝ සමග වෛර සිතින් වෛර නැති. ථීනමිද්ධය නැති බැවින් සිතෙහි ගිලන් බව සංඛ්‍යාත වූ ව්‍යාපාදයෙන් අව්‍යාපජ්ඣවූ. උද්ධච්චකුක්කුච්චය නැති බැවින් උද්ධච්ච කුක්කුච්ච ආදි කෙලෙස්වලින් නොකිලිටි සිත්

ඇත්තේ සුපිරිසිදු මනසක් ඇත්තේ විචිකිච්ඡාව නැති බැවින් සිත වසඟයෙන් පවතී. යම්සේ බමුණෝ චිත්ත ගතිකයෝ වෙත්ද, සිතෙහි වසඟ බවෙහි පවතිත්ද, වසවත්ති යනු එබන්දෙක් නොවේ.

ඉධ ඛො පන මෙහි බ්‍රහ්මලෝක මාර්ගයෙහි. **ආදිසිත්වා** නොමග මගැයි එළඹ. **සංසීදන්ති** සමතලයක්ය යන හැඟීමෙන් මඩට බැසගත්තාක් මෙන් පිවිසෙති. **සංසීදිත්වා විසාදං පාපුණන්ති** මෙසේ මඩෙහි මෙන් හිඳ දුර්මුඛ බව අඟපසඟ බිඳීමට පැමිණෙති. **සුක්ඛතරං මඤ්ඤෙ පතරං** මිරිඟුවෙන් මුළාවී කාකපෙය්‍ය නදියක් යයි හැඟීමෙන් තරණය කරන්නෙමුයි අතින් පයින් වෑයම් කරමින් පැල්ම වඩා වියලි යයි හඟිමි. ඒ නිසා ඔවුහු අත්පා බිඳීමක් කැමක් වේද එසේ අපායයන්හි බිඳීම් කෑමවලට පැමිණෙත්. මෙලොවද සැපයක් හෝ සතුටක් නොලබත්. **තස්මා ඉදං තෙවිජ්ජානං බ්‍රාහමණානං** ඒ නිසා මෙය තෙවිජ්ජ බ්‍රාහ්මණයන්ට බ්‍රහ්ම සහව්‍යතාව සඳහා මගපෙන්වන තෙවිජ්ජක ධර්මය වෙයි. **තෙවිජ්ජා ඊරිනං** තෙවිජ්ජ අරණ්‍යයකි. ඉරණ යනු ගමක් නැති මහා අරණ්‍යයයි කියනු ලැබේ. එහි මාර්ගයෙන් ඉවත්ව හැරෙන්නට පවා නොහැක්කේය. ඒ සඳහා කීය. තෙවිජ්ජා විපිනං යයි ද කියනු ලැබේ.

**තෙවිජ්ජා ව්‍යසනං** මෙය තෙවිජ්ජයන්ගේ පංචවිධ ව්‍යසනයන්ට සමානය. යම්සේ ඥාති රෝග භෝග දෘෂ්ටි ශීල ව්‍යසනයන්ට පත්වූවහුට සැපයක් නම් නැද්ද, මෙසේ තෙවිජ්ජයන්ට තෙවිජ්ජක ධර්මයට පැමිණ සැපයක් නම් නැතැයි දක්වයි.

**ජාතවද්ධෙ** උපන්නේද වැඩුණේද, යමෙක් හුදෙක් එහි උපන්නේ වෙයිද අන්තැනක වැඩුණේ වෙයි. ඔහුට හාත්පස ග්‍රාම මාර්ග සර්වාකාරයෙන් ප්‍රත්‍යක්ෂ නොවේද, ඒ නිසා ජාතවද්ධා යයි කීය. ජාතවද්ධයකු වුවද යමෙක් බොහෝ කලක් ගමෙන් නික්ම සිටියේද ඔහුට සර්වාකාරයෙන් ප්‍රත්‍යක්ෂ නොවේ. ඒ නිසා එකෙණෙහි නික්මුණේයයි කීය. එකෙණෙහි නික්මුණු යන අර්ථයි. **දන්ධායිතත්තං** මාර්ගය මෙයද, මාර්ගය මෙයදැයි සැක වශයෙන් කල්යන බව. **විත්ථායිතත්තං** යම්සේ සියුම් දෙයක් වහා අසනු ලැබූවහුගේ ශරීරය තදබවක් ගනීද එසේ තදබව, අලස බව ගැනීමයි. **නත්වෙව** මෙයින් සර්වඥතා ඥානයෙහි අදූෂිත බව දැක්වේ. ඒ පුරුෂයාගේ මාරාවේශ වශයෙන් ඥානයෙහි විනාශයක් වේද, ඒ නිසා ඔහු අලස හෝ වන්නේය.

පැකිළෙන්නේ හෝ වෙයි. සර්වඥතාඥානය අදූෂිත බැවින් එයට කවරකු විසින් හෝ අන්තරායක් කිරීමට නොහැකි යයි දක්වයි.

**උල්ලුම්පතු භවං ගොතමො** භවත් ගෞතමයන් වහන්සේ ඔසවා තබන සේක්වා. **බ්‍රාහ්මණිංපජං** බමුණු දරුවා. භවත් ගෞතමයන් වහන්සේ බ්‍රාහ්මණ පුත්‍රයකු වූ මා අපාය මාර්ගයෙන් උඩට ඔසවා බ්‍රහ්මලෝක මාර්ගයෙහි පිහිටුවන සේක්වා යන අර්ථයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බුද්ධෝත්පාදය දක්වා පූර්වභාග ප්‍රතිපදාව සමග මෛත්‍රී විහාර ආදී බ්‍රහ්මලෝකයට යන මාර්ගය දේශනා කරනු කැමති සේක් 'තෙනහි වාසෙට්ඨ' ආදිය කී සේක. එහි 'ඉධ තථාගතො' ආදිය සාමඤ්ඤඵලයෙහි විස්තර කරන ලදී. 'මෙත්තා සහගතෙන' ආදී තන්හි යමක් කිවයුතුද ඒ සියල්ල විශුද්ධි මාර්ගයෙහි බ්‍රහ්මවිහාර කම්මට්ඨාන කථාවෙහි කියන ලදී.

සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සංඛධමො ආදිය මෙහි පෙර නො ආයේය. එහි **බලවා** යනු බලසම්පන්න. **සංඛධමො** සක් පිඹින්නෙක්. **අප්පකසිරෙන** කරදර නැතිව, දුකක් නැතිව, දුර්වල සක් පිඹින්නා සක පිඹින්නේ වුවද සිව්දෙස ශබ්දයෙන් දන්වන්ට නොහැක්කේ වෙයි. ඔහුගේ සක්හඬ සැමතැන නොපැතිරේ. බලවත්තයාගේ හඬ පැතිරී යන්නක් වේ. ඒ නිසා බලවා යයි කීය. **මෙත්තාය චෙතො විමුත්තියා** මෙහි මෙත්තා යයි කීවිට උපචාරයද, අර්පණාවද වටී. චෙතො විමුත්ති යයි කීවිට අර්පණාව පමණක් වටී. **යං පමාණ කතං කම්මං** පමාණ කතං කම්මං යනු කාමාවචරයයි කියනු ලැබේ. **අප්පමාණ කතං කම්මං** යනු රූපාවචර අරූපාවචරයි. එය ප්‍රමාණය ඉක්මවා නියත අනියත දිශාවන්හි පැතිරීම් වශයෙන් වර්ධනයකොට කරන ලද බැවින් **අප්පමාණ කතං** යයි කියනු ලැබේ. **න තං තත්‍ර වසිස්සති න තං තත්‍රාවතිට්ඨති** ඒ කාමාවචර කර්මය එහි රූපාවචර අරූප්‍ය කර්මයෙන් සෝදා හරී. නොසිටී. කුමක් කියන ලද්දේ ද? ඒ කාමාවචර කර්මයට ඒ රූපාවචර අරූපාවචර කර්මය අතර ලගින්ට හෝ සිටින්ට හෝ රූපාවචර අරූපාවචර කර්මය පතුරුවා අභිභවා සිටින්ට තමාගේ අවකාශයක් ගෙන පිහිටා සිටීමට නොහැකිය. නැවතද, රූපාවචර අරූපාවචර කර්මයම කාමාවචරය මහා දියකඳක් මෙන් මඳ දියක් පතුරුවා අභිභවා තමාගේ අවකාශයක් ගෙන සිටී. එහි විපාකය ඉවත්කොට තමාම බ්‍රහ්ම සහව්‍යතාවට ගෙනයයි.

**එවං විහාරී** මෙසේ මෛත්‍රී ආදි විහාර ඇත්තේ. **එතෙමයං භගවන්තං ගොතමං සරණං** මෙය ඔවුන්ගේ දෙවැනි සරණාගමනයයි. පළමුවෙන්ම ඔවුහු මජ්ඣිම පණ්ණාසකයෙහි වාසිට්ඨ සූත්‍රය අසා සරණ ගියහ. මේ තෙවිජ්ජ සූත්‍රය අසා දෙවැනිව සරණ ගොස් කිහිප දිනක් ඇවෑමෙන් පැවිදි වී අග්ගඤ්ඤ සූත්‍රයේදී උපසම්පදාවද රහත්බවද ලැබූහ. සෙස්ස සියලු තැන කියන ලද අර්ථ ඇත්තේමය.

**තෙවිජ්ජ සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

**සීලක්ඛන්ධ වර්ණනාවද මෙසේ නිමියේ ය.**

# මහාපදාන සුත්ත වර්ණනාව

**එවමෙමසුතං -පෙ- කරෙරිකුටිකාය** යනුවෙන් ආරම්භ වන මහාපදාන සූත්‍රයයි. මේ එහි අපූර්ව වූ පද වර්ණනාවයි. **කරෙරිකුටිකාය** යන්නෙහි කරෙරි යනු ලුණුවරණ ගසට නමකි. කරෙරි මණ්ඩපය ඒ කුටියෙහි දොරටුව ලඟ පිහිටියේය. ඒ නිසා කරෙරු කුටිකා යැයි කියනු ලැබේ. යම්සේ කොසඹ රුක් අබියස පිහිටි බැවින් කොසම්බකුටිකා යැයි කියන්නාක් මෙනි. දෙව්රම් වෙහෙරෙහි වනාහි කරෙරි කුටිය, කොසම්බ කුටිය, ගන්ධකුටිය, සලළ ගෘහය කියා මහා ගෘහ සතරක් ඇත. ඒ එකිනෙක ගෘහය ශතසහශ්‍ර ගණන් ධන පරිත්‍යාගයෙන් ගොඩනගන ලදී. ඒවා අතරින් සලළ ඝරය වනාහි පසේනදී කොසොල් රජු විසින් කරවන ලදී. ඉතිරි ඒවා අනේපිඬු ගෘහපතියා විසින් කරවන ලදී. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අනේපිඬු ගෘහපතියා විසින් ටැම් මත කරවන ලද, දිව්‍ය විමානයක් බඳු කරෙරි කුටියෙහි වැඩ වසයි.

**පච්ඡා භත්තං** යනු ඒකාසනිකාංගය සමාදන් වූ අලුයම වළඳන ඇත්තාට මධ්‍යාහ්න ආහාරය පච්ඡා භත්ත වේ. මෙහි වනාහි ස්වාභාවික ආහාර වේලට පසුව යන අදහස ගැනේ. **පිණ්ඩපාත පටික්කන්තානං** පිණ්ඩපාතයෙන් ඉවත් වූ ඇත්තන්ට, බත්කිස නිමවා නැගිට සිටිය ඇත්තන්ට යන අර්ථයි. **කරෙරි මණ්ඩල මාලෙ** යනු එම කරෙරි මණ්ඩපයේම අසලින් කරන ලද හිඳිනා ශාලා වෙහි. ඒ කරෙරි මණ්ඩපය වනාහි ගඳකිළියටත් ශාලාවටත් අතරෙහි පිහිටියේය. ඒ නිසා ගඳකිළියද කරෙරි කුටිකා යැයි ද ශාලාව කරෙරි මණ්ඩල මාලය යැයිද කියනු ලැබේ. **පුබ්බෙනිවාස පටිසංයුත්තා** යනු එක් ජාතියක් ජාති දෙකක් ආදී ලෙස පෙර වසන ලද ස්කන්ධ සංඛ්‍යාත පෙර විසූ ආත්මභාවයන් සමග යෙදී පැවතියා වූ ධම්මී ධර්මයෙන් යුක්ත වූ. **උදපාදි** යනු අහෝ පුදුමයි. බුදුරජාණන් වහන්සේගේ පෙර විසූ ආත්මභාවයන් දැනගැනීමේ නුවණ පුදුමය. පෙර විසූ කඳපිළිවෙළ කවරෙක් නම් සිහි කරන්නේද? කවරෙක් නම් සිහි නොකරන්නේද?

තීර්ථකයෝ සිහිකරති. ශ්‍රාවකයෝත් පසේබුදුවරයන් වහන්සේලාත්, බුදුරජාණන් වහන්සේලාත් සිහි කරත්. කවරනම් තීර්ථකයෝ සිහිකරත්ද? යම් ඒ කර්මවාදී වූ අගතැන්පත් වූවාහු ද කල්ප හතලිහක් සිහිකරත්. ශ්‍රාවකයන් වහන්සේලා කල්ප ශතසහස්‍රයක් සිහිකරත්. අගසව් දෙදෙනා වහන්සේ අසංඛෙය්‍ය වූ කල්ප ශත සහස්‍රයක් සිහිකරත්. පසේබුදුවරයන් වහන්සේලා කල්ප ශතසහස්‍ර අසංඛ්‍ය දෙකක්ද සිහිකරත්. බුදුවරයන් වහන්සේලාට මෙපමණයැයි සීමාවක් නැත. යම්තාක් කැමැති වෙත්ද ඒතාක් සිහි කරත්. යම් ඒ අගතැන්පත් කර්මවාදී තීර්ථකයෝ වෙත්ද ඔවුහු කඳපිළිවෙලින් සිහිකරත්. පිළිවෙල සිඳ දමා නොහැකි වෙත්. පිළිවෙලින් සිහිකරන්නාහු නමුත් අසඤ්ඤභවයට පැමිණ ස්කන්ධ පැවැත්ම නොදකිත්. දැලෙහි බැඳුනු පක්ෂීන් මෙනි. මොට වූවත් මෙන් කොරුන් මෙන් වෙත්. ඔවුහු එහි සිට මෙය පමණයි. මින් එහා නැත යන දෘෂ්ටිය ගනිත්. මෙසේ තීර්ථකයන් පෙරවිසූ කඳපිළිවෙල සිහිකිරීම වනාහි අන්ධයාගේ කණවැල අල්ලාගෙන යාම වැනිය. යම්සේ අන්ධයෝ සැරයටිය අග අල්වා ගත්තවුන් ඇතිකල්හි යත්. නැතිකල්හි එහිම හිඳිත්. මෙපරිද්දෙන් තීර්ථකයෝ කඳපිළිවෙලින් සිහිකරන්නට හැකිවෙත්. පිළිවෙල හැර නොහැකි වෙත්. ශ්‍රාවකයෝ ද කඳපිළිවෙලින් සිහිකරත්. අසඤ්ඤ භවයට පැමිණ ස්කන්ධයන්ගේ පැවැත්ම නොදකිත්. මෙසේ ඇතිකල්හිද සසර සැරිසරන සත්ත්වයන්ගේ ස්කන්ධයක් නොමැති කාලයක්ද නැත.

අසඞ්ඛ්‍ය භවයෙහි වනාහි කල්ප පන්සියයක් පවතීයැයි එපමණ කාලයක් ඉක්මවා බුදුවරයන් වහන්සේලා විසින් දෙන ලද ක්‍රමයෙහි පිහිටා එයින් එහා සිහිකරත්. යම්සේ ආයුෂ්මත් සොසිත තෙරුන් මෙනි. අගසව් දෙනමද පසේබුදුවරයන් වහන්සේලා ද චුති ප්‍රතිසන්ධි බල බලා සිහිකරත්. බුදුවරයන් වහන්සේලාට චුති, ප්‍රතිසන්ධි දෙකම නැත. යම් යම් ස්ථානයක් දකිනු කැමැතිද ඒ ඒ දේම දකිත්. තීර්ථකයෝ ද පෙර අත්බැව් සිහිකරන්නාහු තමා විසින් දකින ලද අසන ලද කරන ලද දෙයම සිහිකරත්. ශ්‍රාවකයෝද එසේම වෙත්. පසේබුදුවරයන් වහන්සේලාත්, බුදුවරයන් වහන්සේලාත් තමන් විසින් හෝ අනුන් විසින් දකින ලද අසන ලද කරන ලද සියල්ලම සිහිකරත්. තීර්ථකයන්ගේ පෙර විසූ අත්බැව් දැනීමේ නුවණ කදෝපැණියකුගේ ආලෝකය බඳුය. ශ්‍රාවකයන්ගේ වනාහි ප්‍රදීපයක ආලෝකය බඳුය. අග්‍ර ශ්‍රාවකයන්ගේ වනාහි ඕෂධී තාරකාවගේ ආලෝකය මෙනි. පසේබුදුවරයන් වහන්සේලාගේ වනාහි චන්ද්‍රයාගේ ආලෝකය වැනිය. බුදුවරයන් වහන්සේලාගේ වනාහි සරත් කාලයේ සූර්යයාගේ ආලෝකය බඳුය. උන්වහන්සේට මෙපමණ ජාති සියය ජාති දහසක් ජාති ලක්ෂයක් හෝ කල්ප සියයක් කල්ප දහසක් කල්ප ලක්ෂයක් කියා නැත. යමක් සිහි කරන්නේ ද එහි පැකිලීමක් හෝ ගැටීමක් නැත.

ආවර්ජනය හා බැඳුනේම වන්නේ ය. කැමැත්ත, මෙනෙහි කිරීම හා සිතිවිල්ල පහළවීම හා බැඳී පවතී. දුබල පරඬලාවක හෙළන ලද රත්වූ යකඩයක් මෙන් සිනේරු පර්වතයෙහි විදින ලද වජ්‍රයක් මෙන් නොරැඳී ගමන් කරයි. අහෝ! බුදුවරයන් වහන්සේගේ පෙර විසූ කඳපිළිවෙල දන්නා නුවණ පුදුම සහගතය. මහත්ය. මෙසේ බුදුරජාණන් වහන්සේ අරබයා උපන්, පැවති යන අර්ථයි. ඒ සියල්ල ද ලුහුඩින් දක්වන්නට මෙයද පෙරවිසූ අයුරුය. මෙයද පෙරවිසූ අයුරුය යන්න පමණක් පෙළෙහි දක්වන ලදී. එහි මෙසේය.

**අසෙසාසි බො -පෙ- අථ භගවා අනුපපතෙතා යනු මෙහි යමක් කිවයුතුද? එය බ්‍රහ්මජාල සූත්‍ර වර්ණනාවේ කියන ලදී. මෙයම විශේෂයයි. එහිදී සර්වඥතා ඥානයෙන් අසන ලදී. මෙහි දිවකනින් අසන ලදී. එහිද වර්ණනාව, වර්ණනා කථාව නිමකළේ නැත. මෙහි පෙර අත්බැව් පිළිබඳ කථාය. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ, මේ භික්ෂූන් මාගේ පෙරවිසූ අත්බැව් දැනගැනීමේ නුවණ පිළිබඳව ගුණ කථා කරන්නේ යැයි ද**

මාගේ එම නුවණ ලබාගත් ආකාරය නොදනිත් යැයි ද සිතා දැන් ඔවුන්ට එහි නිෂ්පත්තිය කියා දෙන්නෙමියි වැඩමකර සාමාන්‍ය බුද්ධාසනයේ වැඩසිට ඒ මොහොතේම ධර්මදේශනාව සඳහා භික්ෂූන් විසින් පිළියෙල කරන ලද උතුම් බුද්ධාසනයෙහි වැඩහිඳ මහණෙනි! කවර කථාවකින් යුක්තව සිටියේදැයි විචාරා ස්වාමීනි! මෙහිදී ආදී වූ පිළිතුරු දීමෙන් පසුව ඔවුන්ට පෙර විසූ කඳපිළිවෙල හා සම්බන්ධ වූ ධර්මදේශනාව පවත්වනු කැමැත්තේ ඔබලා කැමැත්තහුද ආදිය වදාළහ.

එහි **ඉච්ඡෙය්‍යාථ නො** යනු කිම කැමැති වන්නාහුද? ඉක්බිති සතුටු සිත් ඇති භික්ෂූහු උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්නේ **එතසස භගවා** (භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මදේශනාව සඳහා) ආදිය පැවසූහ. එහි **එතසස** යනු මේ ධර්මකථාව කරණු පිණිස. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ ඉල්ලීම පිළිගෙන දේශනාකරනු කැමැත්තේ එසේනම් මහණෙනි, අසව්! යැයි ඔවුන්ගේ කන් මනාව සිහියෙහි පිහිටුවා අන්‍යයන්ට අසමාන වූ සිඳිගිය මාර්ගය සිහිපත් කිරීම කරනු කැමැත්තේ **ඉතො සො භික්ඛවෙ** ආදිය වදාළහ.

එහි **යං විපසසී** යනු යම් කල්පයක විපස්සී නම් බුදුරජාණන් වහන්සේ අයං යන්න යං ශබ්දයෙන් කියැවේ. ස්වාමීනි! මෙය තව්තිසාවේ දෙවියන් වෙතින් අසන ලදී. ඉදිරියෙහිදී පිළිගන්නා ලද ද මෙය ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට සැළ කරමු ආදියෙහි ප්‍රත්‍යක්ෂ වචනයෙහි දක්නට ලැබේ. 'යං තං අපුච්ඡිමහ අකිත්තයිනො අඤ්ඤං යං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රූහි යන තැන්වල උපයෝග වචනයෙහි ද අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං එකිස්සා ලොකධාතුයා යන තැන්වල කරණ අර්ථයෙහි ද, මෙහි වනාහි නුඹලා විසින් දතයුතුයි. ඒ නිසා යසමිං කපෙප (යම් කල්පයක) යැයි කියන ලදී. උදපාදි යනු දස සහශ්‍රී ලෝකධාතුව නාද කරමින් පැන නැංගේය. **භද්ද කපෙප** යනු බුදුවරයන් වහන්සේලා පස්නමක් පහළවන බැවින් සුන්දර වූ කල්පයෙහි සාරවත් වූ කල්පයෙහි මෙසේ භාග්‍යවතුන් වහන්සේ මෙහිදී කල්පය වර්ණනා කරමින් මෙසේ වදාළ සේක. යම්තැනක පටන් අපගේ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රාර්ථනා කරන ලද්දේ වන්නේද, ඒ අතර එක් කල්පයකදීවත් බුදුවරයන් පස්නමක් පහළවීමක් නම් නැත. අපගේ භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රාර්ථනාවට පෙර තණ්හංකර, මෙධංකර, සරණංකර, දීපංකර යන බුදුවරයන් සිව්නමක් එක් කල්පයක පහළ වූහ. එයට මෙහා එක් අසංඛෙය්‍යයක් බුද්ධශූන්‍ය විය. කල්ප අසංඛ්‍යයක්

අවසානයේ කොණ්ඩඤ්ඤ නම් එකම බුදුරජාණන් වහන්සේ එක කල්පයක පහළ වූ සේක. එයින් ද අසංඛ්‍ය කල්පයක් බුද්ධශූන්‍ය විය. අසංඛෙය්‍ය කල්පයක අවසානයේ මංගල, සුමන, රේවත, සෝභිත යන බුදුවරයන් සතර නම එක් කල්පයක පහළ වූහ. එයින්ද කල්ප අසංඛ්‍යයක් බුද්ධශූන්‍ය විය.

කල්ප අසංඛෙය්‍ය අවසානයෙහි වනාහි මෙයින් කල්ප ශතසහස්‍රයකට අධික කල්ප අසංඛ්‍යයට පෙර අනෝමදස්සී, පදුම, නාරද යන බුදුවරු තුන් නම එක් කල්පයක පහළ වූහ. එයින් කල්ප අසංඛෙය්‍යයක් බුද්ධශූන්‍ය විය.

කල්ප අසංඛෙය්‍යයක් අවසානයෙහි වනාහි මෙයින් කල්ප ශතසහස්‍රයකට මත්තෙහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පමණක් එක් කල්පයක පහළ වූහ. එයින් මෙහා මෙයින් කල්ප තිස්දහසකට පෙර සුමේධ, සුජාත කියා බුදුවරු දෙනමක් එක් කල්පයක පහළ වූහ. එයින් මෙහා මෙයින් කල්ප දහඅට දහසකට පෙර අත්ථදස්සී, පියදස්සී, ධම්මදස්සී යැයි බුදුවරු තුන් නමක් එක් කල්පයක පහළ වූහ. ඉක්බිති මෙයින් අනූහතරවන කල්පයෙහි සිද්ධාර්ථ නම් බුදුරජාණන් වහන්සේ පමණක් එක් කල්පයක පහළ විය. මෙයින් අනූදෙවන කල්පයෙහි තිස්ස, ඵුස්ස කියා බුදුවරු දෙනමක් එක් කල්පයක පහළ වූහ. මෙයින් අනූ එක්වන කල්පයෙහි විපස්සී නම් භාග්‍යවතුන් වහන්සේ පහළ වූහ. මෙයින් තිස්එක්වන කල්පයෙහි සිඛී, වෙස්සභූ යැයි බුදුවරු දෙනමක් පහළ වූහ. මේ භද්‍ර කල්පයෙහි කකුසඳ, කෝනාගම, කස්සප හා අපගේ භාග්‍යවතුන් වහන්සේ වන ගෞතම යන බුදුවරයන් වහන්සේලා සතරනමක් පහළ වූහ. මෛත්‍රිය බුදුරජාණන් වහන්සේ අනාගතයේ පහළ වන්නේය. මෙසේ මේ කල්පය බුදුවරයන් පස්නමකින් සමන්විත බැවින් සුන්දර කල්පය කියාද, සාර කල්පය කියාද යන ලෙසින් බුදුරජාණන් වහන්සේ මේ කල්පය වර්ණනා කරමින් මෙසේ වදාළහ.

මේ කල්පයෙහි මෙපමණ බුදුවරු පහළ වූහ. පහළ වන්නාහ යන මේ කරුණ බුදුවරයන් වහන්සේලාට පමණක් දැනෙන්නේ ඇයි? නැත්නම් අන් අයටත් පෙනේද? එසේය. අන් අයටද පෙනෙයි. කවර අයටද? ශුද්ධාවාස බ්‍රහ්මයන්ට.

කල්පය පිහිටන කල්හි එක් අසංඛෙයාෳයක් එක් අංගනයක් ලෙස පිහිටි කල්හි ලෝකයාට පිළියෙල වීම පිණිස වැස්ස වසින්නට පටන් ගනී. ආරම්භයේදී අතරෙහි පිහිටි හිමපතනයක් මෙන් වෙයි. එයින් නිවුඩු, සහල්, මුං, මෑ, බජිරි, නෙල්ලි, කැකිරි, කොමඩු, ලබු ආදිය දිය ධාරාවක් මෙන් වී පිළිවෙලින් බඹය, දෙක, අට, අඩගව්වක්, අඩ යොදුනක්, යොදුනක්, දෙකක්, -පෙ- යොදුන් සියයක්, යොදුන් දහසක් පමණ වී අකනිටා බඹලොව දක්වා කෝටි සතසහස්‍රයක් සක්වල ගැබ පුරවා සිටී. ඉක්බිති ඒ ජලය අනුපිළිවෙලින් පහත බසී. ජලය පහත බසින කල්හි ස්වාභාවික දිව්‍යලෝක පිහිටිය යුතු තැන්වල දිව්‍යලෝක පිහිටයි. ඒවා පිහිටන ආකාරය විශුද්ධි මාර්ගයෙහි පුබ්බෙනිවාස කථා කොටසෙහි කියන ලදී. මිනිස්ලොව පිහිටන තැනට ජලය පත්කල්හි පෙරහන්කඩයක මුව වැසුවාක් මෙන් වායු බලයෙන් ඒ ජලය ස්ථිරව පිහිටා සිටියි. ඒ ජලය මතුපිට නෙලුම්පතක් මෙන් මහපොළව පිහිටයි. ලෝකය විනාශවන විට මහබෝමැඩ පසුව විනාශ වෙයි. පිහිටනවිට පළමුවෙන් පිහිටයි. එහි පෙරනිමිත්තක් වී නෙලුම්ගසක් පහළවෙයි. ඉදින් ඒ කල්පයෙහි බුදුවරුන් පහළවන්නේ නම් මලක් හටගනී. නොවේනම් මලක් හටගන්නේ නැත. එසේ මල් හටගන්නා විට එක් බුදුවරයෙක් පහළ වන්නේ නම් එක් මලක් ද, දෙකක්, තුනක්, හතරක් ආදී වශයෙන් බුදුවරයන් වහන්සේලා පස්නමක් පහළ වන්නේ නම් මල් පහක් හටගනී.

ඒ මල්ද එක් දණ්ඩක කර්ණිකා එකට බැඳී හටගනී. ශුද්ධාවාස දෙවිවරු, යමු. පෙරනිමිති බලමු යැයි මහබෝමැඩ පිහිටි තැනට එක් බුදුවරයන් පහළනොවන කල්පයකදී මල් හටගන්නේ නැත. ඒ ශුද්ධාවාස දෙවිවරු මල් නැති ගස බලා ලෝකය වනාහි අඳුරු වන්නේය. මැරෙන මැරෙන සත්ත්වයෝ අපායේ පිරෙත්. සදෙව්ලොවත් බ්‍රහ්මලෝක නවයත් හිස් වන්නේ යැයි අසතුටු සිත් ඇත්තෝ වෙත්. මල් පිපුණු කල්හි වනාහි මල් දැක සර්වඥ වූ බෝධිසත්ත්වයන් මව්කුසට පිවිසෙන විටත්, මව්කුසින් බිහිවන විටත් සම්මා සම්බෝධියට පත්වනවිටත් දම්සක් පවත්වන විට යමක ප්‍රාතිහාර්ය පවත්වන කල්හි දේවාරෝහණය කරන කල්හිද ආයු සංස්කාර කරන කල්හිද පිරිනිවන්පානා විටත් දසදහසක් සක්වල කම්පා වීම ආදී ප්‍රාතිහාර්යයන් දකින්නෙමු යැයි ද සතර අපාය පිරිහෙන්නේය. සදෙව්ලොවත් බ්‍රහ්මලෝක නවයත් පිරෙන්නේ යැයි සතුටු සිත් ඇත්තාහු උදන් අනමින් තම තමන්ගේ බ්‍රහ්මලෝකවලට යත්. මේ කල්පයෙහි

වනාහි නෙලුම්මල් පහක් හටගත්තේය. ඒ නිමිතිවල අනුභාවයෙන් බුදුවරු සතරනමක් පහළ වූහ. පස්වැනි බුදුහිමියෝ පහළ වන්නාහ. ශුද්ධාවාස බ්‍රහ්මයෝද ඒ මල් දැක මේ කාරණය දැනගත්හ. ඒ නිසා කියන ලදී. 'අන් අයටද පෙනී යයි' මෙසේ භාග්‍යවතුන් වහන්සේ **ඉතො සො භික්ඛවෙ** (මහණෙනි! මෙයින් ඒ.) ආදී ක්‍රමයෙන් කල්ප බෙදා වෙන්කිරීම් වශයෙන් පුබ්බ නිවාසය (පෙර වාසය) දක්වා දැන් ඒ බුදුවරයන්ගේ ජන්ම බෙදා පෙන්වීම් ආදිය දක්වන්නට 'විපස්සී භික්ඛවෙ' ආදිය කීය.

එහි ආයු පරිච්ඡේදයේදී **පරිත්තං ලහුකං** යන මෙය ස්වල්පය යන අර්ථය සඳහාමය. යමක් වනාහි (අප්පකං) අල්පද එය (පරිත්තං) ස්වල්පය. සැහැල්ලුද වෙයි. (ලහු) **අප්පං වා භීයො** යනු වර්ෂ සියයකට පෙර අල්ප වූ වෙනත් වර්ෂ සියයකට පත්නොවී විස්සක්, තිහක්, හතලිහක් හෝ පනහක් හෝ හැටක් හෝ වර්ෂ ජීවත්වෙයි. මෙසේ දීර්ඝායුෂ ඇත්තන් වනාහි අතිශයින් දුර්ලභය. අසවලා වනාහි මෙසේ බොහෝ කල් ජීවත් වන්නේ යැයි ඒ ඒ තැන්වල ගොස් දතයුත්තේ වෙයි. එහිදී විශාඛා මහෝපාසිකාව වර්ෂ එකසිය විස්සක් ජීවත් විය. එපරිද්දෙන් පොක්ඛරසාදි බ්‍රාහ්මණයා බ්‍රහ්මායු බ්‍රාහ්මණයා සෙල බ්‍රාහ්මණයා, පාවාරිය බ්‍රාහ්මණයා, ආනන්ද තෙරුන් වහන්සේ, මහාකාශ්‍යප තෙරුන් වහන්සේ වනාහි වර්ෂ එකසිය පනහක්ද බක්කුල තෙරුන් වහන්සේ එකසිය සැට වසක්ද ජීවත් වීය. සියල්ලන්ටම වඩා දීර්ඝායුෂ වින්ද නමුත් වර්ෂ දෙසීයයක් ජීවත්වූයේ නැත. විපස්සී ආදී සියලු බෝසත්වරු මෛත්‍රී පෙරටු කරගත් සෝමනස්ස සහගත ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික චිත්තයෙන් මව්කුස පිළිසිඳ ගත්හ. ඒ සිතින් ප්‍රතිසන්ධිය ගත්තහුගේ ආයුෂ අසංඛෙය්‍යකි. මෙසේ සියලු බුදුවරු අසංඛ්‍යයක් ආයු ඇත්තන් වන නමුත් කුමක් නිසා අසංඛෙය්‍යයක් ජීවත් නොවූවාහුද? ඍතු භෝජන වශයෙන් ආයුෂ වැඩිවෙයි. එසේම පිරිහෙයි.

එහිදී යම්කලෙක රජවරු අධාර්මික වෙත්ද එකල්හි යුවරජ, සෙන්පති, සිටුවරු මෙන්ම මුළු නගරයත් මුළු රටත් අධාර්මික වෙයි. ඉක්බිති ඔවුන්ගේ ආරක්ෂක දේවතාවෝද ඔවුන්ගේ මිත්‍ර වූ භූමිය ආශ්‍රිත දෙවියෝ ද ඒ දෙවියන්ගේ මිත්‍ර ආකාසස්ථ දෙවියෝ ද ඔවුන්ගේ මිත්‍ර උණුවළා දෙවියෝ ද ඔවුන්ගේ මිත්‍ර වළාකුළු ආශ්‍රිත දෙවියෝ ද ඔවුන්ගේ මිත්‍ර ශීත වළාහක දෙවියෝ ද ඔවුන්ගේ මිත්‍ර වස්ස වලාහක දෙවියෝද

ඔවුන්ගේ මිත්‍ර චාතුර්මහා රාජික දෙවියෝ ද ඔවුන්ගේ මිත්‍ර තාවතිංස දෙවියෝ ද ඔවුන්ගේ මිත්‍ර යාම දෙවියෝ ද යන ලෙසට භවාග්‍රය දක්වා ආර්ය ශ්‍රාවකයන් හැර සියලු දෙව් බඹ පිරිස් ද අධාර්මික වෙත්. ඔවුන්ගේ අධාර්මික බව හේතුවෙන් විෂම ලෙස ඉරහඳ පවතිත්. වායුව නියම මගෙහි ගමන් නොකරයි. වැරදි මගින් හඹා යාම නිසා ආකාසසථ විමානයන් කැළඹේ. විමානයන් කැළඹෙනවිට ක්‍රීඩා සඳහා සිත නොනැමේ. දෙවියන්ගේ සිත් ක්‍රීඩා සඳහා නොනැමෙන බැවින් ශීත, උණුසුම ආදී භේදයන් ඍජු ආදිය නියම කලට නොපැමිණේ. නියම කල්හි ඍතු නොපැමිණීමෙන් මනාව වර්ෂාව නොලැබේ. විටක වැසි වසී. විටක නොවසී. තැනකට වසී. තැනකට නොවසී. වැසි වැස්සත් වපුරණ ලද කල්හිද අංකුර හටගන්නා කල්හිද බණ්ඩි කාලයේ ද මල් හටගන්නා කල්හිද කිරිවදින කාලයෙහිද යම් යම් ආකාරයකින් අස්වැන්නට සහායක් නොවන්නේ ද ඒ ඒ ආකාරයට වසී. වර්ෂාව පහව යයි.

එයින් අස්වැන්න නියම අයුරින් නොපැසෙයි. ගන්ධ, රස, වර්ණ ආදියෙන් තොරවූයේ වෙයි. එකම භාජනයෙහි දමන ලද සහල්වලින් පිසූ සමහර බත් නියම ලෙස නොපැසී තිබේ. සමහර කොටසක බත් අතිශයින් තෙත්ය. සමහර තැනක හොඳින් පැසී ඇත. එය අනුභව කළවිට කුස තුළදී තුන් ආකාරයකින් පැසෙයි. එයින් සත්ත්වයෝ බොහෝ ආබාධ ඇත්තෝ වෙත්. අල්ප ආයුෂ ඇත්තෝ වෙත්. මෙසේ පළමුව ඍතු හා අනුභව කිරීම් හේතුවෙන් ආයුෂ හීන වෙයි.

යම්කලෙක්හි රජවරු ධාර්මික වෙත්ද පෙර පරිදිම බ්‍රහ්මලෝකය තෙක් සියල්ලෝම ධාර්මික වෙත්. ඔවුන්ගේ ධාර්මික බව නිසා ඉරහඳ සම ලෙස පායයි. නියම මගෙන් වායුව හමයි. නියම මගින් සුළං හමනවිට ආකාසසථ විමාන නොකැළඹෙයි. මේවා නොකැළඹීම නිසා දෙවියන්ගේ සිත් ක්‍රීඩාව සඳහා යොමු වේ. මෙසේ නියම කාලයට ඍතු ආරම්භ වේ. වැස්ස මනාව වසී. වැපුරූ කාලයේ පටන් අස්වැන්නට උපකාර කරමින් නියම කලට වැසි වසී. නියම කලට වැස්ස පහව යයි. එයින් ධාන්‍ය මනාව පැසී මනා සුවඳ ඇතිව, මනා වර්ණ ඇතිව මනා රස ඇතිව ඕජස් සහිත වේ. එයින් පිළියෙල කළ ආහාරය අනුභව කළවිට මනාව දිරවයි. එයින් සත්ත්වයෝ නීරෝගීව දීර්ඝායුෂ ඇත්තෝ වෙත්. මෙසේ ඍතු, භෝජන වශයෙන් ආයුෂ වැඩෙයි.

එහිදී විපස්සී භාග්‍යවතුන් වහන්සේ වර්ෂ අසූදහසක් ආයු ඇති කාලයක පහළ වූ සේක. සිඛී භාග්‍යවතුන් වහන්සේ හැත්තෑදහසක් වර්ෂ ආයු ඇති කාලයකද පහළ වූ සේක. මෙය පිළිවෙලින් පිරිහෙන තත්ත්වයට පත්වෙයි. මෙසේ පිරිහීමට පත් නොවෙයි. ක්‍රමයෙන් වැඩිවී පරිහානියට පත්වේයැයි දතයුතුයි.

මේ කල්පයෙහි කකුසඳ භාග්‍යවතුන් වහන්සේ වර්ෂ හතලිස් දහසක් ආයු ඇති කාලයක පහළ වූහ. ආයු ප්‍රමාණය කොටස් පහකට බෙදා සතරක් හැර පස්වන කොටස පවත්නා කල්හිම පිරිනිවන් පෑ සේක. ඒ ආයුෂ පිරිහීම වර්ෂ දහය දක්වා පහත බැස නැවත වර්ධනය වී අසංඛෙය්‍ය දක්වා වැඩිවී අනතුරුව පිරිහීගොස් තිස්දහසට පත්ව සිටියේය. කෝණාගම බුදුරජාණන් වහන්සේ එකල පහළවූ සේක.

උන්වහන්සේද එසේම පිරිනිවන්පෑ කල්හි ඒ වයස වර්ෂ දහයට පත්ව නැවත වර්ධනය වී අසංඛෙය්‍යට පත්ව පිරිහී ගොස් විසිදහසට පත්ව සිටී. එකල්හි කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලොව පහළවූ සේක. උන්වහන්සේද එසේ පිරිනිවන්පෑ කල්හි ආයුෂ දස වර්ෂයක ප්‍රමාණයට පත්ව නැවත වර්ධනය වී අසංඛෙය්‍යට පත්ව පිරිහී වර්ෂ සියයට පත්ව සිටියේය. ඉක්බිති අපගේ භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සේක. මෙසේ පිළිවෙළින් අඩුවී, වැඩිවී පිරිහී, නොපිරිහී අඩු බවට පත්වූයේ යැයි දතයුතුයි. එහිදී යම් යම් ආයු ප්‍රමාණයන්හි මිනිසුන් සිටිකල්හි බුදුවරු පහළවෙත්ද උන්වහන්සේලාට ද ඒ ආයු ප්‍රමාණයම වන්නේ ය.

**ආයු පරිච්ඡේදය නිමියේ ය.**

බෝධි පරිච්ඡේදයෙහි වනාහි පාටලියා මූලෙ යනු පාටලික ගසෙහි යට, ඒ පළොල් ගසෙහි කඳ ඒ දවසේ පනස් රියනක් වී හටගත්තා වූ ශාඛා පනස්රියනක් විය. පළලින් රියන් සියයක් විය. ඒ දවසේ ද ඒ පළොල් ගස කර්ණිකාවකින් බැන්දාක් මෙන් මුලසිටම මල්වලින් ගැවසී ගත්තේය. දිව්‍යමය සුවඳ හමයි. එකල්හි මේ පළොල් ගස පමණක් මල් පිපුණේ නොවේ. දස දහසක් සක්වල සියළු ගස්වල කඳෙහි කඳමල් ද අතුවල ශාඛා පුෂ්පයන් ද වැල්වල ලතා පුෂ්පයන් ද අහසෙහි ආකාස

පුෂ්පයන්ද පිපී ගියේය. මහපොළොව ද පැලී මහා පද්මයන් පැන නැංගේය. මහා සමුද්‍රයද පංචවර්ණ පද්මයන්ගෙන් ද නිලුපුල් රතුපුල් ආදියෙන් ගැවසී ගත්තේය. සියලු දසදහස් සක්වළ කොඩිවැල්වලින් ගැවසී ගත්තේය. ඒ ඒ තැන මල්දම් හා විසුරුණු නොයෙක් වර්ණ මල් සමූහයෙන් බබලන නන්දන වනය, චිත්තලතා වනය, මිස්සක වනය හා ඵාරුසක වනය හා සමවිය. පෙරදිග සක්වල මුවවිටෙහි ඔසවන ලද කොඩි බටහිර සක්වල මුවවිටෙහි ගැටෙත්. බටහිර, උතුර, දකුණ සක්වල මුවවිටෙහි ඔසවන ලද ධජ දක්ෂිණ චක්‍රවාටයේ මුවවිටෙහි ගැටේ. මෙසේ චක්‍රවාට නොයෙක් ආකාර ශ්‍රී සම්පත්තියෙන් යුක්ත විය.

අභිසම්බුද්ධො යනු සියළු බුදුගුණ සම්පත්තිය වටහා ගන්නේ චතුරාර්ය සත්‍යය වටහාගත්තේ වෙයි. 'මහණෙනි, සිඛී භාග්‍යවතුන් වහන්සේ අර්හත් සම්මා සම්බුද්ධ වූයේ පුණ්ඩරීක වෘක්ෂ මූලයෙහි බුද්ධත්වයට පත්වූ සේක යනාදී තැන්වල මේ ක්‍රමයෙන්ම වර්ණනාව දතයුතුයි.

මෙහි වනාහි පුණ්ඩරීකො යනු එහිද එම ප්‍රමාණ විය. එදවස ඒ වෘක්ෂයද දිව්‍යමය සුවඳින් යුත් මලින් ගැවසී ගත්තේය. හුදෙක් මල්වලින් පමණක් නොවෙයි. ගෙඩිවලින් ද පිරී ගියේය.

එහි එක් පැත්තක ලාගෙඩිය. එක් පැත්තක ළපටි ගෙඩිය. එක් පැත්තක මධ්‍යම ප්‍රමාණයට පැසුණු ගෙඩිය. එක පැත්තක සාමාන්‍යයෙන් පැසුණු ගෙඩිය. එක්පසෙක දිව්‍ය ඕජස් බහාලූවක් වැනි රසවත්ව මනාව පැසී එල්බෙන ගෙඩිය. යම්සේ ඒ වෘක්ෂය මෙන් සියළු දසදහස් සක්වල මල් හටගැනීමට සුදුසු ගස් මලින් ද ගෙඩි හටගැනීමට යෝග්‍ය ගස් ගෙඩිවලින් ද සමන්විත විය.

සාලො යනු සල්ගස, එය ද එම ප්‍රමාණම විය. මල්වලින් ඇතිවූ ශ්‍රී ශෝභාව එපරිද්දෙන්ම දතයුතුයි. මහරී ගස පිළිබඳවද මෙසේමය. දිඹුල් ගසේ මල් නොවීය. ඵල සම්පත්තිය වනාහි මෙහි අඹගස පිළිබඳව කියූ ආකාරයෙන්මය. නිග්‍රොධ වෘක්ෂය පිළිබඳවත් ඇසතු වෘක්ෂය පිළිබඳවත් එසේමය. මෙසේ සියළු බුදුවරයන් වහන්සේලාට එකම පර්යංකයකි. වෙනත් වෘක්ෂයෝ ද වෙත්. ඒවා අතරින් යම් යම් වෘක්ෂ

මූලයක සිට බුදුවරු සිව්මග නුවණ නම් වූ බෝධිය අවබෝධ කර ගනිත්ද ඒ ඒ වෘක්ෂය බෝධිය යයි කියනු ලැබේ.

**මේ බෝධි පරිච්ඡේදයයි.**

සාවක යුග පරිච්ඡේදයේ වනාහි **ඛණ්ඩතිස්ස** යනු ඛණ්ඩය. තිස්සය. ඔවුනතුරෙන් ඛණ්ඩ තෙමේ එකම පියකු ඇත්තේ කණිටු සොහොයුරාය. තිස්ස යනු පුරෝහිතගේ පුත්‍රයාය. ඛණ්ඩ තෙමේ ප්‍රඥා පාරමිතාවේ මස්තකප්‍රාප්ත වූයේය. තිස්ස තෙමේ සමාධි පාරමිතා වේ. අග්ගං යනු විපස්සී බුදුරජාණන් වහන්සේ හැර ඉතිරි ඇත්තන් සමග අසමාන වූ ගුණයෙන් උතුම් වූ. භද්දයුගං යනු අග්‍රස්ථානයට පත් බැවින් භද්‍රයුග නම් වී.

**අභිභූ සම්භවං** යනු අභිභූ හා සම්භව. ඒ අතරෙන් අභිභූ ප්‍රඥා පාරමිතාවේ මස්තකප්‍රාප්ත වූයේ සිඛී බුදුන් සමග අරුණවතියෙන් බඹලොවට ගොස් බඹපිරිසට නොයෙක් ප්‍රාතිහාර්යයන් දක්වා ධර්මදේශනාකොට සහශ්‍රී ලෝකධාතුවේ අන්ධකාරය පතුරුවා, මේ කුමක්දැයි හටගත් සංවේග ඇත්තන්ට ආලෝකය පතුරුවා සියල්ලෝම මාගේ රූපය දකිත්වා. ශබ්දය අසත්වායි අධිෂ්ඨාන කොට 'ආරභථ' ආදී ගාථා දෙකක් කියමින් ඒ හඬ ඇස්සවීය. ඛොහෝදෙනා සමාධි පාරමිතාවේ මස්තකප්‍රාප්ත වූවෝ වූහ.

**සොණුත්තර** යනු සොණ හා උත්තර. ඔවුනතුරෙන් 'සොණ ප්‍රඥාව සම්පූර්ණත්වයට පත්කළේය. උත්තර වනාහි සමාධිය සම්පූර්ණත්වයට පත්වූයේ විය.

**විධුර සජ්වං** යනු විධුර ද සජීව ද වෙති. ඔවුනතුරෙන් විධුර ප්‍රඥාව සම්පූර්ණත්වයට පත්කළේය. සජීව සමාධිය සම්පූර්ණත්වයට පත්කළේය. සමවැදීම් බහුල වූයේ රාත්‍රීස්ථාන, දිවාස්ථාන, කුටි, ලෙන්, මණ්ඩප ආදියෙහි සමාපත්ති බලයෙන්ම යැපෙන්නේ, එක්දිනක් අරණ්‍යයෙහි නිරෝධ සමාපත්තියට සමවැදුනේය. ඉක්බිති ඔහු මළේයයි සළකා වනයේ වැඩකරන ජනයා දවා දැමූහ. හෙතෙම පිළිවෙළින්

සමාපත්තියෙන් නැගිට සිවුරු ගසාදමා ගමට පිඬු පිණිස ගියේය. ඒ හේතුකොටගෙනම ඔහු සංජීව යයි හැඳින්වූහ.

**භියොසුත්තරං** යනු භියොසො ද උත්තරද ඔවුනතුරෙන් භියොසො ප්‍රඥාවෙන් උසස්ය. උත්තර සමාධියෙන් උසස් විය.

**තිසස භාරද්වාජ** යනු තිස්ස ද භාරද්වාජ ද ඔවුනතුරෙන් තිස්ස ප්‍රඥාවෙන් සම්පූර්ණත්වයට පත්විය. භාරද්වාජ සමාධියෙන් සම්පූර්ණත්වයට පත්විය.

**සාරිපුත්තමොග්ගල්ලානං** සාරිපුත්ත ද මුගලන් ද ඔවුනතුරෙන් සාරිපුත්‍ර ප්‍රඥා විෂයෙහි ද මොග්ගල්ලාන සමාධි විෂයෙහි ද අග්‍රප්‍රාප්ත වූහ.

**මේ ශ්‍රාවකයුග පරිච්ඡේදයයි.**

ශ්‍රාවක සන්නිපාත පරිච්ඡේදයේදී විපස්සී බුදුන්ගේ පළමු රැස්වීම සතරවැදෑරුම් විය. සියල්ලෝම එහිභික්ෂුභාවයෙන්, සියල්ලෝම ඍද්ධියෙන් ලැබුනු පාත්‍රා සිවුරු ඇතිව, සියල්ලෝම ඇමතීමකින් තොරව පැමිණියාහ. ඔවුහුද පසලොස්වක් උපෝසථ දවසෙහි. ඉක්බිති ශාස්තෲන් වහන්සේ වටාපත ගෙන හුන්නේ උපෝසථය ප්‍රකාශ කළේය. දෙවන තුන්වන ඒවායේ ද මේ ක්‍රමයයි. එසේම ඉතිරි බුදුවරයන්ගේ සැම එක්රැස් වීමේදී.

යම්හෙයකින් වනාහි අපගේ භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රථම බෝධියේදීම එක්රැස්වීමක් විය. මේ සූත්‍රය ද පසුභාගයෙහි කියන ලදී. ඒ නිසා මහණෙනි, දැන් එක් ශ්‍රාවක රැස්වීමක්යැයි නිම නොකොට වීයැයි කියන ලදී. එහි **අඩ්ඪතෙළසානි භික්ඛුසතානි** යනු පුරාණ ජටිලයන්ගේ දහසකුත් අගසව් දෙනමගේ පිරිවර දෙසියපනහක් යන එක්දහස් දෙසිය පනහක්, එහි අගසව් දෙනමගේ ප්‍රාර්ථනාවේ පටන් කථාවස්තුව දක්වා පැවිද්ද දැක්විය යුතුය.

පැවිදි වූ උන්වහන්සේලා දෙනමගෙන් මහමුගලන් තෙරුන්වහන්සේ සත්වන දිනයෙහි රහත්බවට පත්වූයේය. ධර්ම

සේනාපතීන් වහන්සේ පසළොස්වවන දින ගිජුකූළුපව්ව මැද හූරන් සැරූ ලෙන්දොරදී තම බෑනණුවන් වූ දීඝනඛ පරිබ්‍රාජකයා විසින් සූදානම් කළ ධර්මයාගයේදී වේදනා පරිග්‍රහ සූත්‍රාන්තය දේශනා කරන කල්හි දේශනාව හා බැඳී සිටින ඤාණය යොදවා ශ්‍රාවකපාරමී ඥානය ලබාගත්තේය. භාග්‍යවතුන් වහන්සේ තෙරුන් රහත්බවට පත්වීම දැනගෙන අහසට පැනනැගී වේළුවනාරාමයේ පහළ වූ සේක. තෙරුන්වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ කොහි වැඩියේදැයි ආවර්ජනාකර බලන්නේ වෙළුවනයෙහි වැඩසිටින බව දැනගෙන තමන්ද අහසට පැන නැගී වෙළුවනයට පැමිණියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ප්‍රාතිමෝක්ෂය සවිස්තරව වදාළ සේක. මේ රැස්වීම පිණිස භාග්‍යවතුන් වහන්සේ 'අඩ්ඪතෙළසානි භික්ඛුසතානි' යැයි වදාළහ.

**මේ ශ්‍රාවක සන්නිපාත පරිච්ඡේදයයි.**

උපට්ඨාක පරිච්ඡේදයෙහි වනාහි ආනන්දො යැයි නිරන්තර උපස්ථායක බව පිණිස කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයට පත් අලුත ස්ථිර උපස්ථායකවරයෙක් සිටියේ නැත. එක් දිනක නාගසමාල පාසිවුරු ගෙන ගියේය. එක් දිනක් නාගිත තෙරුන්, එක් දිනක් උපවාන, එක්දිනක් සුනක්ඛත්ත, එක්දිනක් චුන්ද සාමණේර, එක් දිනක් සාගත, එක් දිනක් මෙඝිය මෙසේ කළහ. එහිදී එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ නාගසමාලා තෙරුන් සමග මහමගට පිවිසියේ දෙමංසන්ධියකට පැමිණියේය. තෙරුන් වහන්සේ මගින් ඉවත්ව භාග්‍යවතුන් වහන්ස, මම මේ මගින් යන්නෙමියි කීහ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ, එන්න මහණ, මේ මාර්ගයෙන් යමුයැයි වදාළහ. හෙතෙම ස්වාමීනි! ඔබවහන්සේගේ පාත්‍රා සිවුරු ගන්න. මම මේ මාර්ගයෙන් යමි යි කියා පාත්‍රාසිවුරු බිම තබන්නට පටන් ගත්තේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට, මෙහෙ ගෙනෙන්න යැයි තම පාත්‍රා සිවුරු ගෙන වැඩියේය. වෙනත් මගකින් යන්නා වූ ඔහුගේ පාත්‍රා සිවුරු ද පැහැරගත්හ. හිස ද පැලූහ. මට දැන් පිහිටවන්නේ බුදුරජාණන් වහන්සේමය. වෙන කෙනෙක් නැතැයි සිතා ලේ ගලමින් භාග්‍යවතුන් වහන්සේ ලඟට පැමිණියේය. ඇයි මහණ, මේ කුමක්දැයි විචාළ කල්හි ඒ පුවත දන්වා සිටියේය. ඉක්බිති ඔහුට භාග්‍යවතුන් වහන්සේ, මහණ, ඒ ගැන නොසිතන්න. මේ කරුණෙන් ඔබව නිදහස් කරන්නෙමියි ඔහුව අස්වැසීය.

එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ මෙඝිය තෙරුන් සමග ප්‍රාචීනවංස මිගදායෙහි ජන්තුගමට වැඩි සේක. එහිදී ද මෙඝිය ජන්තු ග්‍රාමයෙහි පිඬුසිඟා හැසිර ගංතෙර පැහැපත් අඹවනයක් දැක භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේගේ පාත්‍රා සිවුරු ගන්න. මම මේ අඹවනයෙහි මහණදම් පුරමියි කියා භාග්‍යවතුන් වහන්සේ විසින් තුන්වරක් වළක්වන ලද්දේ නමුත් ගොස් අකුසල චිත්තයන්ගෙන් යුක්ත වූයේ ආපසු ඇවිත් ඒ බව දන්වා සිටියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට මේ කරුණ ගැන සළකා ඔබව වැළැක්වූයෙමි යයි පිළිවෙලින් සැවැත්නුවරට වැඩි සේක. එහි ගන්ධකුටි පිරිවෙණෙහි පනවන ලද උතුම් බුද්ධාසනයෙහි වැඩසිටියේ භික්ෂු සංඝයා පිරිවරාගෙන භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, දැන් මම මහලු වෙමි. ඇතැම් භික්ෂූහු මේ මගින් යමුයැයි කී කල්හි වෙනත් මගකින් යත්. තවත් කෙනෙක් මාගේ පාත්‍රාසිවුරු බිම තබත්. මට ස්ථිර උපස්ථායකයක භික්ෂුවක ගැන සිතා බලන්න. භික්ෂූන්ට ධර්ම සංවේගය පහළ විය. ඉක්බිති සැරියුත් මහතෙරුන් වහන්සේ නැගිට බුදුන් වැඳ ස්වාමීනි, මම ඔබවහන්සේවම ප්‍රාර්ථනා කරමින් කල්ප ශතසහස්‍රයක් පෙරුම් පිරූයෙමි. මා වැනි මහා ප්‍රාඥයකු උපස්ථායක වීම සුදුසු නොවේද? මම උපස්ථාන කරන්නෙමියි කීය. භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්‍රය, අවශ්‍ය නැත. ඔබ යම් දිශාවක වාසය කරන්නේද ඒ දිශාව හිස් නොවේ. ඔබගේ අවවාදය බුදු කෙනෙකුගේ අවවාදය මෙනි. ඔබ විසින් මට උපස්ථාන කිරීමක් අවශ්‍ය නැතැයි ප්‍රතික්ෂේප කළ සේක. මේ ආකාරයට මහ මුගලන් තෙරුන් වහන්සේ ප්‍රමුඛ කොට අසූමහා ශ්‍රාවකයෝ නැගී සිටියාහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ලන් ප්‍රතික්ෂේප කළ සේක. ආනන්ද තෙරුන් වහන්සේ නිහඬව සිටියේය. ඉක්බිති භික්ෂූහු උන්වහන්සේට මෙසේ පැවසූහ. ඇවැත්නි! භික්ෂු සංඝයා උපස්ථායක තනතුර ඉල්ලා සිටිති. ඔබද ඉල්ලුම් කරන්න යැයි කීහ.

උන්වහන්සේ මෙසේ පැවසූහ. ඇවැත්නි, ඉල්වා ලබාගන්නා ලද තනතුර කෙබඳු වන්නේද? කිම! ශාස්තෲන් වහන්සේට මා නොපෙනේද? ඉදින් මා කැමැති නම් ආනන්දය! මට උපස්ථාන කරන්න යැයි වදාරන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහණෙනි! අන්‍යයන් විසින් ආනන්දයන් උනන්දු කරවිය යුත්තේ නොවේ. තෙමේම දැනගෙන මා හට උවටැන් කරන්නේ යැයි වදාළ සේක. ඉක්බිති භික්ෂූහු ඇවැත්නි, ආනන්දය, නැගී සිටින්න. ආනන්දය, දශබලධාරීන් වහන්සේගේ උපස්ථාන

තනතුර ඉල්වන්න යැයි කීහ. තෙරුන් වහන්සේ නැගිට පිළිකෙව් සතරකුත් ඉල්ලීම් සතරකුත් යන වර අටක් ඉල්ලා සිටියේය.

සතර පිළිකෙව් මොනවාද? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ලබන ලද ප්‍රණීත වූ සිවුරු මට නොදිය යුතුයි. පිණ්ඩපාතය මට නොදිය යුතුයි. එකම ගඳකිළියේ වාසය නොකළ යුතුයි. ආරාධනා භාරගෙන යායුතු නැත. මෙසේ නම් මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නෙමියි කියූවිට, කිම ආනන්දය, ඔබ මෙහිදී යම් ආදීනවයක් දුටුවේදැයි ඇසීය. ස්වාමීනි! ඉදින් මම මේ ලාභයන් ලබන්නෙම් නම් ආනන්ද තෙරුන් බුදුරජාණන් වහන්සේට ලැබුණු වටිනා සිවුරු පරිභෝග කරයි. පිණ්ඩපාතය වළඳයි. එකට ගඳකිළියේ වාසය කරයි. එකම ආරාධනාවට දානය සඳහා වඩියි. මේ ලාභ ලැබෙන නිසා බුදුරජාණන් වහන්සේට උපස්ථාන කරයි කියා කියන්නෝ ඇතිවන්නාහ. මෙසේ උපස්ථාන කිරීම කෙසේ නම් කරදරයක්ද? මේ නිසා මේ පිළිකෙව් සතර ඉල්ලා සිටියෙමි.

සතරවැදෑරුම් ඉල්ලීම් කවරේද? ඉදින් ස්වාමීනි! භාග්‍යවතුන් වහන්සේ මා විසින් ගන්නා ලද ආරාධනයකට වඩීද, ඉදින් මම රට හරහා ජනපද හරහා භාග්‍යවතුන් වහන්සේව දැකීමට ආ ජනයාට පැමිණිවිටම භාග්‍යවතුන් වහන්සේව මුනගස්වන්නට හැකිවෙම්. යම්විටක මට සැකයක් පහළවන්නේද ඒ මොහොතේම භාග්‍යවතුන් වහන්සේ ලඟට යාමට හැකිවෙම්. එසේම මා නැති තැනක භාග්‍යවතුන් වහන්සේ යම් ධර්මයක් දේශනා කළ සේක්ද, ආපසු වැඩියවිට මට නැවත දේශනා කරයි. මෙසේ මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරමි.

කිම ආනන්ද, ඔබ මෙහි ආනිශංස දකින්නෙහිදැයි විචාර කල්හි මෙසේ පැවසීය. මෙහිදී ස්වාමීනි! ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයෝ භාග්‍යවතුන් වහන්සේ හමුවීමට අවකාශයක් නොලැබ මට මෙසේ කියත්. ආනන්ද හිමියනි! හෙට භාග්‍යවතුන් වහන්සේ සමග අපගේ නිවසෙහි දානය වළඳන්න කියා. ඉදින් භාග්‍යවතුන් වහන්සේ එහි නොවඩීද සිතූ වේලාවේම පිරිස දකින්නට, සැක දුරුකර ගන්නට අවස්ථාවක් නොලබමි. එවිට භාග්‍යවතුන් වහන්සේ තමන්ට උපස්ථාන කරන ආනන්ද හිමියන්ට මෙතරම් වූ උපකාරයක් නොකරන්නේ යැයි කියන්නෝ ඇතිවන්නාහ.

භාග්‍යවතුන් වහන්සේ නැති තැන්වලදී මගෙන් මෙසේ විචාරත්. ඇවැත්නි, ආනන්ද, මේ ගාථාව, මේ සූත්‍රය මේ ජාතකය කවර තැනකදී දේශනාකරන ලද්දේ ද? ඉදින් මම ඒවාට පිළිතුරු නොදෙන්නේ නම් මෙසේ කියන්නෝ ඇති වෙත්. ඇවැත්නි, කිම ඔබ නොදන්නෙහිද? කවර හෙයකින් ඔබ සෙවනැල්ලක් මෙන් භාග්‍යවතුන් වහන්සේව අත් නොහැර බොහෝකලක් හැසුරුනෙහිය. ඒ නිසා මා නැති තැන දේශනා කළ ධර්මය නැවත අසනු කැමැත්තෙමි. මේ ඉල්ලීම් සතර ඉල්ලා සිටියෙමි. භාග්‍යවතුන් වහන්සේද ඒවා ඔහුට ලබාදුන් සේක. මෙසේ මේ වර අට ගෙන නිරන්තර උපස්ථායකයා විය. මේ තනතුර සඳහාම කල්ප ශතසහස්‍රයක් පුරණ ලද පෙරුම් සඵලත්වයට පත්විය. මේ මොහුගේ ස්ථිර උපස්ථායක බව සඳහා 'මහණෙනි, දැන් ආනන්ද භික්ෂුව මාගේ උපස්ථායකයා අග්‍ර උපස්ථායකයා' යැයි වදාළ සේක.

**මේ උපට්ඨාන පරිච්ඡේදයයි.**

පිතු පරිච්ඡේදය කියන ලද අර්ථ ඇත්තේම ය.

විහාරං පාවිසි යන්නෙහි කුමක් නිසා පිවිසියේද? භාග්‍යවතුන් වහන්සේ වනාහි මෙපමණක් කියා මෙසේ සිතීය. මා විසින් සත්බුදුවරයන් වහන්සේලාගේ වංසකථාව නිරන්තරයෙන් මස්තකප්‍රාප්ත කොට කියන ලද්දේ නොවෙයි. අද මා විහාරයට පිවිසි අවස්ථාවේදී මේ භික්ෂූහු බොහෝසෙයින් පෙරවිසූ ජීවිත දන්නා නුවණ පිළිබඳව වර්ණනා කරත්. ඉක්බිති මම අවුත් නිරන්තරයෙන් බුද්ධවංසය කියා මස්තකප්‍රාප්තකොට දක්වන්නෙමියි භික්ෂූන්ට කථාවට ඉඩ සළසා අසුනෙන් නැගිට විහාරයට වැඩි සේක.

භාග්‍යවතුන් වහන්සේ යම් මේ පෙළ වදාළේද එහි කල්ප පරිච්ඡේදය, ජාති පරිච්ඡේදය, ගෝත්‍ර පරිච්ඡේදය, ආයු පරිච්ඡේදය, බෝධි පරිච්ඡේදය, සාවක යුග පරිච්ඡේදය, සාවක සන්නිපාත පරිච්ඡේදය, උපට්ඨාක භික්ෂු පරිච්ඡේදය, ප්‍රීති පරිච්ඡේදය යන නව වාරයක් ආයේය.

සම්බහුල වාරය ආවේ නැත. එය අධ්‍යාහාරකොට වනාහි දැක්විය යුතුය. සියළුම බෝධිසත්ත්වයන්ගේ එකම කුලවංශානුරූප වූ පුත්‍රයන් උපන් කල්හි ගිහිගෙයින් නික්මගොස් පැවිදිවිය යුතුය. මෙයම වංසයයි.

මේ ප්‍රවේණියයි. කුමක් නිසා සර්වඥතාවට පත්වන බෝසතුන් මව්කුස පිළිසිඳ ගැනීමේ පටන් පෙර කියන ලද පරිදි අනේක ප්‍රාතිහාර්යයෝ සිදුවෙත්ද? එහිදී මොවුන්ගේ ජාත නගරය පියා භාර්යාව පුත්‍රයා පෙන්නුම් කරන්නේ නැත. මොහු දෙවියෙක් හෝ ශක්‍රයෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ වේයැයි හැඟේ. දෙවියන්ට ද මෙබඳු ප්‍රාතිහාර්යයක් පුදුමයක් නොවේයැයි සිතන ජනයා නො අසන්නේය. විශ්වාස නොකරන්නේ යැයි හඟිමි. එයින් අවබෝධය නොවන්නේය. අභිසමය නැතිකල්හි බුද්ධෝත්පාදය නිරර්ථක වෙයි. සසුන නෛර්යාණික නොවන්නේය. ඒ නිසා සියළු බෝධිසත්ත්වවරුන් එකම කුලවංශයන්ට අනුරූප වූ දරුවන් උපන් කල්හි ගිහිගෙයින් නික්ම පැවිදිවිය යුතුයි යන මෙය වංශයයි. ප්‍රවේණියයි. ඒ නිසා පුත්‍රාදීන් වශයෙන් බොහෝ වාරයක් ගෙන දැක්විය යුතුයි. එහිදී සමවත්තක්ඛන්ධ - අතුල - සුප්පබුද්ධ, උත්තර, සත්ථවාහ, විජිතසෙන හා සත්වෙනි රාහුල නම් වන්නේය.

මොව්හු වනාහි සත්බුදුවරයන්ගේ පිළිවෙළින් පුත්‍රයන් යයි දතයුතුයි. එහිදී රාහුල භද්ද උපන්කල්හි පණිවිඩයක් ගෙනවුත් මහා පුරුෂයාණන්ගේ අතෙහි තැබූහ. ඉක්බිති එකෙණෙහිම ඔහුගේ මුළු සිරුර කැළඹී දරු සෙනෙහසක් ඇතිවූයේ විය. එතුමා සිතීය. එක් දරුවෙක් උපන් කල්හි මෙබඳු වූ දරු සෙනෙහසක් හටගත්තේය. මට දහස් ගණනකට වැඩි දරුවෝ වන්නාහ. ඔවුන් එකිනෙකා උපන්කල්හි මේ ආදර බැම්ම මෙසේ වැඩෙනවිට එයට පිළියමක් කළ නොහැකි වන්නේය. රාහුල උපන්නේය. බන්ධනයක් ඇතිවිය කියා කීය. එදිනම රාජ්‍යය අතහැර නික්ම ගියේය. සියලු දරුවන්ගේ උත්පත්ති කථාවේදී මේ ක්‍රමයමය.

**මේ පුත්‍ර පරිච්ඡේදයයි.**

සුධනා, සබ්බකාමා, සුචිත්තා, රොචනී, රුචගත්තී, සුනන්දා ද බිම්බා සත්වෙහිද වන්නීය.

මේ අය සත් දරුවන්ට මව්වරු වූවාහ. බිම්බා දේවිය වනාහි රාහුල කුමාරයන් උපන් කල්හි රාහුල මාතා යැයි හැඳින්වූහ.

**මේ භාර්යා පරිච්ඡේදයයි.**

විපස්සී, කකුසඳ යන මේ බෝධිසත්ත්වයෝ දෙදෙන ආජඤ්ඤ අශ්වයන් සයදෙනෙක් යොදන ලද රථයකට නැඟී මහාභිනිෂ්ක්‍රමණයට පිටත්ව ගියහ. සිඛී, කෝණාගමන යන බුදුවරු දෙනම ඇතුන් පිට නැඟී නික්මුණාහ. වෙස්සභූ බුදුහු රන්සිවි ගෙයක හිඳ නික්මුණේය. කාශ්‍යපයන් වහන්සේ උඩුමහල් තලයෙහි සිටියේම ආනාපාන චතුර්ථධ්‍යානය නිපදවාගෙන ධ්‍යානයෙන් නැගිට ප්‍රාසාදයට ගොස් බෝමැඩට බසීවායි අධිෂ්ඨාන කළහ. ප්‍රාසාදය අහසින් අවුත් බෝමැඩ වැතිරී ගියේය. මහා පුරුෂයාණෝ ද එයින් බැස භූමියෙහි සිට ප්‍රාසාදය නියම තන්හිම පිහිටාවායි සිතීය. එය නියම තැන පිහිටියේය. මහා පුරුෂයෝ ද දින සතක් ප්‍රධන් වීර්යය කොට බෝමැඩ වැඩසිට සර්වඥතා ඥානය අවබෝධ කරගත් සේක. අපගේ බෝධිසත්ත්වයෝ වනාහි උතුම් කන්ථක අසුපිට නැගී නික්ම ගියේය.

## මේ සාන පරිච්ඡේදය යි.

විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ විහාරය යොදුනක් පමණ ප්‍රදේශයෙහි පිහිටා තිබින. සිඛී බුදුන්ට ගව් තුනක් ද වෙස්සභූ බුදුන්ට යොදුන් අටක් ද කකුසඳ බුදුන්ට ගව්වක් ද කෝණාගමන බුදුන්ට අඩ ගව්වක් කාශ්‍යප බුදුන්ට උසභ විස්සක් ද අපගේ භාග්‍යවතුන් වහන්සේට වනාහි ප්‍රකෘති මිම්මෙන් කරීස දහසයක් රාජ මිම්මෙන් කරීස අටක ප්‍රදේශයේ විහාරය පිහිටියේය.

## මේ විහාර පරිච්ඡේදය යි.

විපස්සී භාග්‍යවතුන් වහන්සේට රියනක් දිග වියනක් පළල අඟල් අටක් උස රන් උළු කරවා වසා විහාර ස්ථානය මිළට ගත්හ. සිඛී බුදුන්ට රන්උළු තහඩුවලින් වසා මිළට ගත්හ. වෙස්සභූ බුදුන්ට ස්වර්ණමය ඇත් පා කරවා ඒවා වසා මිළට ගත්හ. කකුසඳ බුදුන්ටද කියන ලද ආකාරයෙන්ම රන්උළුවලින් වසා මිළට ගත්හ. කෝණාගමන බුදුන්ට කියන ලද අයුරින්ම ස්වර්ණමය කැස්බෑවන්ගෙන් වසා මිළට ගත්හ. කාශ්‍යප බුදුන්ට වනාහි රන් උළුවලින්ම වසා මිළට ගත්හ. අපගේ භාග්‍යවතුන් වහන්සේට වනාහි කහවනු ලක්ෂයක් වසා මිළට ගත්හ.

## මේ විහාර භූමි මිළදී ගැනීමේදී ධනය වියදම් කළ ආකාරය දක්වන පරිච්ඡේදය යි.

එහිදී විපස්සී බුදුන්ට එබඳු භූමියක් මිළට ගෙන විහාරයක් කොට දෙනලද උපාසක තැන පුනබබ සුමිත්ත නම් විය. සිඛී බුදුන්ගේ උපාසක තැන සිරිවඩ්ඪ නම් වී. වෙස්සභූ බුදුන්ගේ සොත්ථිය නම් වී. කකුසඳ බුදුන්ගේ අච්චුත නම්, කෝණාගමන බුදුන්ගේ උග්ග නම්. කාශ්‍යප බුදුන්ගේ සුමන නම්. අපගේ භාග්‍යවතුන් වහන්සේගේ වනාහි සුදත්ත නම් විය. මේ සියළුම ගෘහපතියෝ මහාසාළ සිටුවරු වූහ.

## මේ උපට්ඨාක පරිච්ඡේදය යි.

තවත් අත්නොහරින ලද ස්ථාන සතරක් වේ. සියලු බුදුවරයන්ගේ බෝධි පර්යංකය අත්නොහළ තැනකි. එකම තැනක වෙයි. ඉසිපතන මිගදායෙහි දම්සක් පැවැතුම් දේශනය අත්නොහළේමය. දේවාරෝහණ කාලයෙහි සංකස්ස නගර දොරටුවේ පළමු පා ගැටීම අත්නොහළේම වෙයි. ජේතවනයෙහි ගඳකිලියෙහි ඇඳෙහි පාද සතර පිහිටි තැනද අත්නොහළ තැනකි. විහාරය ලොකුද කුඩාද වෙයි. විහාරයද අත්නොහරියි. නගරය අත්හරියි. යම්කලෙක නගරය පෙරදිග පැත්තෙන් වෙයිද විහාරය පශ්චිම දිශාවෙන් ද යම්විටක නගරය දකුණු පැත්තෙන්ද එවිට විහාරය උතුරු පැත්තෙන් යම්විටක නගරය එවිට විහාරය පෙරදිගින් යම්විටක නගරය උතුරෙන් එවිට විහාරය දකුණින්. දැන් වනාහි නගරය උතුරින් විහාරය දකුණින්. සියළුම බුදුවරයන්ට ආයුෂ, ප්‍රමාණ, කුල, වීර්ය, රශ්මිය යනුවෙන් වෙනස්කම් පසක් ඇත. ආයුෂ පිළිබඳ වෙනස නම් කෙනෙක් දීර්ඝායුෂ ඇත්තාහ. කෙනෙක් අල්පායුෂ්ක වෙති. එසේම දීපංකර බුදුන්ට වර්ෂ ශතසහස්‍රයක් ආයු ප්‍රමාණයක් විය. -පෙ- අපගේ භාග්‍යවතුන් වහන්සේට වනාහි වර්ෂ සියයකි. ප්‍රමාණයේ වෙනස නම් ඇතැම් බුදුකෙනෙක් උසය. කෙනෙක් මිටිය. එසේම දීපංකර බුදුහු රියන් අසූවක් විය. සුමන බුදුන් අනූ රියනක් විය. අපගේ ශාස්තෘන් වහන්සේ වනාහි දහඅට රියනක් වූහ. කුලයෙහි වෙනස නම් කෙනෙක් ක්ෂත්‍රිය කුලයෙහි උපදිත්. කෙනෙක් බ්‍රාහ්මණ කුලයෙහි උපදිත්. වීර්ය පිළිබඳ වෙනස යනු ඇතැමුන්ගේ වීර්යය සුළුකලක් පවතී. යම්සේ කාශ්‍යප බුදුන්ගේ මෙනි. ඇතැමුන්ගේ දිගුකල් පවත්නේ වේ. අපගේ භාග්‍යවතුන් වහන්සේගේ මෙනි.

රශ්මියෙහි වෙනස නම් මංගල බුදුන්ගේ ශරීර රශ්මිය දසසහශ්‍රී ලෝකධාතුව පමණ විය. අපගේ භාග්‍යවතුන් වහන්සේගේ වනාහි

හාත්පසින් බඹයක් පමණ විය. එහි රශ්මිය පිළිබඳ විශේෂත්වය අධ්‍යාත්මය හා සම්බන්ධය යමෙක් යම්පමණ කැමැතිවෙයිද ඔහුගේ එපමණ වූ ශරීර ප්‍රභාවක් පැතිරෙයි. මංගල බුදුන්ගේ වනාහි නිතරම දසදහසක් ලෝකධාතුවෙහි පැතිරේවායි බලාපොරොත්තුව විය. අවබෝධ කරගත් ගුණයන්හි කිසිදු විශේෂත්වයක් නම් නැත.

තවද අපගේ භාග්‍යවතුන් වහන්සේගේ වනාහි සහජාත පරිච්ඡේදයක් හා නැකැත් පරිච්ඡේදයක් ද දැක්වූහ. සර්වඥ බෝධිසත්ත්වයන් සමග වනාහි රාහුල මාතාවත් ආනන්ද තෙරුන්, ඡන්න, කන්‍ථක, ධන නිධාන, මහාබෝධිය, කාළුදායී යන මේ සප්ත සහජාත වස්තුන්ද මහා පුරුෂයෝ වනාහි උතුරුසළ නැකතින් මව්කුසට පිවිසියේය. මහාබිනික්මන කළේය. දම්සක් පැවැත්වූහ. යමකප්‍රාතිහාර්ය දැක්වූහ. විශාඛ නැකතින් උපන්නේය. බුදු වූයේය. පිරිනිවන් පෑවේය. මාඝ නැකතින් උන්වහන්සේගේ ශ්‍රාවක සන්නිපාතය සිදුවිය. ආයු සංස්කාර කිරීමද සිදුවිය. අස්විද නැකතින් දේවාරෝහණයද යන මෙපමණක් කරුණු ගෙනහැර දැක්විය යුතුයි.

මේ සමබහුල පරිච්ඡේදය යි.

දැන් ඉක්බිති ඒ භික්ෂූන්ට ආදියෙහි ඒ භික්ෂූහු ඇවැත්නි! පුබ්බනිවාසය නම් වූ මේ ගතිය චුතියේ පටන් ප්‍රතිසන්ධිය දක්වා යම් මේ පිළිසිඳ ගැනීමේ පටන් ආපස්සට නුවණ මෙහෙයවා චුතිය ගත්තේය. මේ ඉතා බැරෑරුම් වූ මෙය අහසෙහි පිය දක්වන්නාක් මෙන් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළේ යැයි අතිශයින් පුදුම වී (අච්ඡරියං ආවුසො) ඇවැත්නි, පුදුමයි. ආදිය කියා නැවත තවත් කාරණයක් දක්වමින් යම්තැනක වනාහි තථාගතයන් වහන්සේ ආදිය පැවසූහ.

එහි යත්‍රහි නාමා යනු ආශ්චර්ය අර්ථයෙහි නිපාතයකි. යමෙක් නම් තථාගතයන් වහන්සේය යන අර්ථයි. ඡිනනපපංචෙ යනු මෙහි පපංච නම් තණ්හා, මාන, දිට්ඨි යන කෙලෙස් තුනයි. ඡිනනවටුමෙ යනු මෙහි වටුම යනු කුසල් කුසලකර්ම රාශිය යන අර්ථයි. පරියාදිනන වට්ටෙ යනු එයටම සමාන වචනයකි. හාත්පසින් මඩනා ලද සියළු කර්ම සමූහය යන අර්ථයි.

**සබ්බ දුක්ඛ වීතිවත්තෙ** යනු සියළු කර්මවිපාක සමූහ සංඛ්‍යාත දුක ඉක්මවූ කල්හි **අනුස්සරිස්සති** මෙය යම්තැනක නිපාත වශයෙන් අනාගත වචනයි. මෙහි අර්ථය වනාහි අතීත ලෙස ගතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ ඒ බුදුවරුන් සිහිකළේය. දැන් සිහිකරන්නේ නැත.

**එවං සීලා** මාර්ග ශීලයෙන්, ඵල ශීලයෙන්, ලෞකික ලෝකෝත්තර ශීලයෙන් මෙබඳු සිල් ඇති. **එවං ධම්මා** යනු මෙහි සමාධි පාක්ෂික ධර්මයෝ අදහස් කරන ලදහ. මාර්ග සමාධියෙන්, ඵල සමාධියෙන්, ලෞකික ලෝකෝත්තර සමාධියෙන් මෙසේ සමාධියෙන් යන අර්ථයි. **එවං පඤ්ඤා** යනු මාර්ග ප්‍රඥාදි වශයෙන් මෙබඳු ප්‍රඥා ඇති. **එවං විහාරී** මෙහි වනාහි පහත සමාධි පාක්ෂික ධර්මයන් ගත් බැවින් වාසය (විහාරො) ගන්නා ලදී. නැවත කුමක් නිසා ගත් දෙය නැවත ගන්නා ලද්දේ ද? මෙය ගන්නා ලද්දේ නොවේ. මෙය වනාහි නිරෝධ සමාපත්තිය දැක්වීම පිණිස කියන ලදී. මේ නිසා මෙසේ නිරෝධ සමාපත්ති විහාරී වූ ඒ බුදුවරු වූහ යැයි මෙහි අර්ථ දතයුතුයි.

**එවං විමුත්තා** යනු මෙහි විෂ්ඛම්භන විමුක්තිය, තදංග විමුක්තිය, සමුච්ඡේද විමුක්තිය, පටිප්පස්සද්ධි විමුක්තිය, නිස්සරණ විමුක්තිය කියා විමුක්තිය පස් ආකාරය. එහි අෂ්ට සමාපත්ති තමා මැඩපවත්වන ලද නීවරණ ආදියෙන් මිදුණු බැවින් වික්ඛම්භන විමුක්ති යැයි සැකයට පත්වෙත්. අනිච්චානුපස්සනා ආදී වූ සප්ත අනුපස්සනා ඒ ඒ විරුද්ධ අංග වශයෙන් අත්හැර දමන ලද නිත්‍ය සඤ්ඤාදියෙන් මිදුණු බැවින් තදංග විමුක්තිය යැයි සැක කරත්.

ආර්ය මාර්ග සතර තථා මුලිනුපුටා දමන ලද කෙලෙස්වලින් මිදුනු බැවින් සමුච්ඡේද විමුක්තිය කියා සැකයට පත්වෙති. සාමඤ්ඤඵල සතර මාර්ගානුභාවයෙන් කෙලෙසුන් සංසිඳුනු බව උපන් බැවින් සංසිඳුනු විමුක්තිය යයි සැක කරත්.

නිර්වාණය සියළු කෙලෙසුන්ගෙන් තොර බැවින්, පහව ගිය බැවින්, දුරු වූ බැවින් නිස්සරණ විමුක්තිය කියා සැකයට පත්වෙයි. මෙසේ මේ පස්වැදෑරුම් විමුක්ති වශයෙන් මෙසේ මිදුනේ යැයි මෙහි අර්ථ දතයුතුයි.

**පටිසල්ලාන වුට්ඨිතො** යනු එකතු වී නැගී සිටිය බැවින් **ඉතො සො භික්ඛවෙ** යනු කවර නම් ගැලපීමක් ද? මේ සූත්‍රය වනාහි, මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් මේ ධර්මධාතුව මනාව අවබෝධ කරගන්නා ලදී. දෙවියෝ ද තථාගතයන් වහන්සේට මේ කාරණය දන්වා සිටියහ යන මේ දෙපදයන් හා බැඳී පවතී. එහිදී දෙවියන් විසින් දන්වා සිටිය දෙය සූත්‍රාන්ත දේශනාව අවසානයේ දේව චාරිකාව පිළිබඳ සෝෂාව දක්වමින් විචාරන්නේය. ධර්මධාතුව වනාහි පදයන්ගේ සන්ධි ගැලපීම් වශයෙන් මේ දේශනාව ආරම්භ කරන ලදී.

එහි '**ජාතියෙන් ක්‍ෂත්‍රියයෙක්ය**' යනාදිය එකොළොස් පදයක් නිදාන කාණ්ඩයෙහි කියන ලද ආකාරයෙන්ම දතයුතුයි.

'**ඉක්බිති මහණෙනි, විපස්සී බෝධිසත්ත්වයන් වහන්සේ**' යනාදියෙහි වනාහි විපස්සී යනු උන්වහන්සේගේ නමය. එයද විවිධ අර්ථයන්හි යෙදිය හැකි බැවින් ලබන ලදී. බෝධිසත්ත්වයන් යනු පණ්ඩිත සත්ත්වයෙකි. අවබෝධ කරගත හැකි සත්ත්වයෙකි. බෝධි සංඛ්‍යාත වූ සිව්මගෙහි යෙදුනේ, ඇලුනේ නුයි බෝධිසත්ව නම් වෙයි.

**සතො සම්පජානො** යන මෙහි 'සතො' යනු සිහියයි. සම්පජානො යනු නුවණයි. සිහිය මනාව පිහිටුවා නුවණින් පිරිසිඳ දැන මව්කුසට වදීය යන අර්ථයි.

**ඔක්කමී** යනු මෙයින් ඔහුගේ මව්කුසට එළඹීම පෙළෙහි දක්වන ලදී. බසින ක්‍රමය නොවේ. එය වනාහි යම්හෙයකින් අට්ඨකථාවට නගන ලද්දේ ද ඒ නිසා මෙසේ දතයුතුයි. සියලු බෝධිසත්ත්වවරු සමතිස් පාරමිතාවන් පුරා පස්මහා පරිත්‍යාගයන් කොට, ඥාතීන්ගේ අභිවෘද්ධිය සඳහා ලෝකයාගේ අභිවෘද්ධිය සඳහාය යන බුද්ධි චර්යාවන්ගේ පරතෙරට ගොස් වෙස්සන්තර සමාන තුන්වන ආත්මභාවයේ සිට සප්තමහා දානයන් දී සත්වරක් මහපොළොව කම්පාවී කලුරිය කොට දෙවන චිත්ත වාරයෙහි තුසිත පුරයෙහි උපදිත්. විපස්සී බෝධිසත්ත්වයන් වහන්සේ ද එසේම කොට තුසිත පුරයෙහි ඉපිද හැටදහසක් අධිකකොට ඇති පනස්හත් කෝටියක් වර්ෂ එහි සිටියේය.

වෙනත් කලක වනාහි දීඝායුක දෙව්ලොව උපන්නාහු දිවි ඇති තෙක් නොසිටිත්. කුමක් හෙයින්ද? එහි පාරමිතාවන් පිරීමට නොහැකි බැවිනි. ඔව්හු අධිමුත්ති කාලක්‍රියාවකොට මිනිස් පියසෙහිම උපදින්නාහ. පාරමිතාවන් පුරමින් දැන් එකම ආත්මභාවයකින් සර්වඥතා බවට පත්වීමට හැකිවෙත්. මෙසේ සර්වප්‍රකාරයෙන් පරිපූර්ණ බැවින් එකල්හි විපස්සී බෝධිසත්ත්වයන් වහන්සේ එහි දිවි ඇතිතෙක් වැඩ සිටියේය. දෙවියන්ගේ වනාහි, මිනිස්ලොව ගණන් ගැනීම් ලෙස දැන් සත්දිනකින් චුතිය වන්නේ යැයි පස්මහ පෙරනිමිති පහළ වේ. මල්මාලා මැලවී යයි. වස්ත්‍ර කිළිටි වෙයි. කිසිලිවලින් දහඩිය ගලයි. සිරුරෙහි දුර්වර්ණයක් ඇතිවෙයි. දෙවියෝ දේවාසනයේ සිටින්නට නොහැකි වෙත්. එහි මාලා යනු පිළිසිඳ ගන්නා දවසෙහි පැළඳි මල්දම්ය. ඒවා වනාහි, වර්ෂ හැටදහසක්, පනස්හත් කෝටියක් කල් නොමැලවී තිබී එකල්හි මැලවී යයි. වස්ත්‍ර පිළිබඳවද මේ ක්‍රමයයි. එතෙක් කල් දෙවියන්ට සීතලක් හෝ උණුසුමක් නොදැනෙයි. එකල්හි සිරුරින් බිංදු බිංදු වශයෙන් දහඩිය වැගිරෙයි. එතෙක් කල් ඔවුන්ගේ සිරුරේ කැඩීම්, පැසීම් ආදියක් වශයෙන් විවර්ණ බවක් නොපෙනෙයි. දෙව්දූවරු සොළොස්විය ඇත්තියන් මෙන්ද දේවපුත්‍රයෝ විසිවයස් ඇත්තන් මෙන්ද පෙනෙත්. මරණ කාලයෙහි වනාහි ඔවුන්ගේ මළානික වූ ආත්මභාවයක් ඇත්තේ වෙයි. මෙතෙක් කල් ඔවුන්ට දෙව්ලොව පිළිබඳ කලකිරීමක් නම් නැත. මරණ කාලයෙහි වනාහි ඇඹුම් හරිත්. සුසුම් හෙළත්. තම අසුන ප්‍රිය නොකරත්. යම්සේ ලෝකයෙහි මහා පින්වත් රාජරාජ මහාමාත්‍යාදීන්ට ම උල්කාපාත, භූමිකම්පා, චන්ද්‍රග්‍රහණ ආදී වූ නිමිති පෙනෙත්ද සියල්ලන්ටම නොපෙනේද එපරිද්දෙන් මහේශාක්‍ය දෙව්වරුන්ටම පෙනෙයි. සියල්ලන්ම නොවේ. යම්සේ වනාහි මිනිසුන් අතර නැකැත් කියන්නෝ ආදීහුම පෙරනිමිති දකිත්ද සියල්ලෝ නො දකිත්ද එපරිද්දෙන් ඒ නිමිති සියළු දෙවියෝ නොදනිත්. පණ්ඩිතයෝම දනිත්. එහි යම් ඒ මද කුසලයකින් උපන් දේවපුත්‍රයෝ වෙත්ද ඔවුහු උපන්කල්හි දැන් කවරෙක් දනිත්ද? කොහි උපදින්නේ දැයි බියවෙත්. යම් ඒ මහා පුණ්‍යවන්ත දෙවියෝ සිටිත්ද ඔවුහු අප විසින් දෙන ලද දන්, රකින සිල්, වඩන ලද භාවනාවල පිං ලැබ ඉහළ දෙව්ලොවවල සම්පත් අනුභව කරන්නෙමු යැයි බිය නොවෙත්.

විපස්සී බෝධිසත්ත්වයෝද ඒ පෙරනිමිති දැක දැන් අනතුරු ආත්මභාවයෙහි බුදුවන්නෙමියි බිය වූයේ නැත. ඉක්බිති ඔහුට ඒ නිමිති

පහළ වූ කල්හි දසදහසක් දෙව්ලොවවල දෙවියෝ රැස්වී, ස්වාමීනි, දසපාරමිතාවන් පූරන්නා වූ ඔබවහන්සේ විසින් ශක්‍ර සම්පත්තිය හෝ මාර සම්පත්තිය හෝ බ්‍රහ්ම සම්පත්තිය හෝ චක්‍රවර්ති සම්පත්තිය ප්‍රාර්ථනා කරමින් පූරණ ලද්දේ නොවේ. ලෝක සත්ත්වයාව සසරින් එතෙර කිරීමේ අදහසින් බුදුබවම ප්‍රාර්ථනා කළ සේක. උතුමාණනි! මේ දැන් එයට සුදුසු කාලයයි. උතුමාණෙනි, එයට දැන් කාලයයි. ඉක්බිති මහා සත්ත්වයන් වහන්සේ ඒ දෙවියන්ට පොරොන්දුවක් නොදීම කාලය, දීපය, කුලය, මාතාව, ආයු කාලය වශයෙන් පස්මහ බැලුම් බැලූයේය.

එහිදී සුදුසු කාලය ද නැද්ද කියා පළමුව කාලය බැලුවේය. එහි වර්ෂ ශත සහස්‍රයක් දක්වා වැඩුනු ආයු කාලය කාලය නම් නොවේ. කුමක් නිසාද? එකල්හි වනාහි සත්ත්වයන්ට ජාති, ජරා, මරණ නොවැටහෙයි. බුදුවරයන්ගේ ධර්මය වනාහි ත්‍රි ලක්ෂණයෙන් යුක්ත වූයේය. ඒ ජනයාට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යැයි බණ දෙසනවිට මේ කුමක් කියන්නේ දැයි අසන්නට හෝ විශ්වාස කරන්නට නො සිතත්. එයින් ධර්මාවබෝධයක් සිදුවන්නේ නැත. එසේ ඇතිකල්හි ශාසනය නෛර්යාණික නොවේ. ඒ නිසා එය නුසුදුසු කාලයයි. වර්ෂ සියයකට අඩු ආයු කාලයද කාලය නොවේ. කුමක් නිසාද? එකල්හි සත්ත්වයෝ උත්සන්න වූ කෙලෙස් ඇත්තෝ වෙත්. උත්සන්න වූ කෙලෙස් ඇත්තන්ට දෙන ලද අවවාදය අවවාදයක් ලෙස නොපිහිටයි. ජලයෙහි දඬු සමූහයක් මෙන් වහා ඉවත්ව යයි. ඒ නිසා එයද අකාලයයි. ශතසහස්‍රයේ පටන් යටත්පිරිසෙයින් වර්ෂ සියයේ පටන් ඉහළ ආයු කාලය කාල නම් වේ. එකල්හිද මනුෂ්‍යයෝ අසූදහසක් ආයු ඇත්තෝය. ඉක්බිති මහාසත්ත්වයෝ ඉපදිය යුතු කාලය බැලීය.

අනතුරුව දීපය (රට) බලන්නේ සපිරිවරින් දිවයින් සතර බලා එයින් දිවයින් තුනක බුදුවරු නූපදිත්. දඹදිව ම උපදින්නාහයි දීපය බැලීය.

ඉක්බිති දීපය නම් විශාලය. යොදුන් දසදහසක ප්‍රමාණයයි. කවරනම් ප්‍රදේශයක බුදුවරු උපදිත්දැයි දේශය ගැන බලන්නේ මධ්‍යදේශය බැලීය. මැදුම් දේශය වනාහි පූර්වදිශාවෙන් කජංගල නම් නියම්ගමය යනාදී ලෙස විනයෙහි කියන ලදී. එම ප්‍රදේශය දිගින් යොදුන් තුන්සියයකි. පළලින් යොදුන් දෙසියපනහකි. හාත්පසින් යොදුන් නවසියයකි. මේ

ප්‍රදේශයේ වනාහි බුදුවරු, පසේබුදුවරු, අගසව්වෝ, අසූමහා ශ්‍රාවකයෝ, සක්විති රජ ද අන්‍ය වූ මහේශාක්‍ය ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, මහාසාල ඇත්තෝ උපදිත්. මෙහි වනාහි බන්ධුමතී නම් නගරයයි. මා එහි ඉපදිය යුතු යයි තීරණය කළේය.

අනතුරුව කුලය ගැන බලන්නේ, බුදුවරු වනාහි ලෝකසම්මත කුලයක උපදින්නාහ. දැන් ද ක්‍ෂත්‍රිය කුලය ලෝක සම්මතය. එහි උපදින්නෙමි. බන්ධුමා නම් රජු මාගේ පියා වන්නේ යැයි කුලය බැලීය.

ඉක්බිති මව ගැන බලන්නේ, බුද්ධ මාතාව නම් ලොල්බැවින් සුරාවට ගිජු වූ කෙනෙක් නොවේ. කල්ප ශත සහස්‍රයක පටන් පුරන ලද පාරමී ඇත්තී උපතේ පටන් නොසිඳි සිල් ඇත්තීය. මේ බන්ධුමතී නම් දේවිය ද මෙබඳුය. මැය මාගේ මව වන්නීය. ඇගේ වයස කොපමණ වන්නේ දැයි ආවර්ජනා කොට බලන්නේ මාස දහයකුත් දවස් සතක් බව දුටුවේය.

මෙසේ මේ පස්මහ බැලුම් බලා දෙවිවරුනි, බුදුබව පිණිස මට දැන් කාලයයි. දෙවිවරුන්ට සංග්‍රහ කරන්නේ ප්‍රතිඥා දී දෙවිවරුනි, නුඹලා යන්න යැයි පිටත්කර යවා තුසිත දෙවියන් විසින් පිරිවරන ලද්දේ තුසිත පුරයෙහි නන්‍දන වනයට පිවිසියේය. සියළුම දිව්‍යලෝකවල නන්‍දන වනයක් ඇත්තේමය. එහිදී දෙවියෝ මෙයින් චුතව සුගතියට යන්න. මෙයින් චුතවී සුගතියට යන්න යැයි කරන ලද කුසලයට අවස්ථාවක් සොයමින් හැසිරෙත්. හෙතෙම මෙසේ කුසලයට අවස්ථාවක් සොයන දෙවියන් විසින් පිරිවරන ලද්දේ එහි ඇවිදින්නේම එයින් චුත විය.

මෙසේ චුත වූයේ චුතවෙමියි දනියි. නමුත් ච්‍යුති නිමිත්ත නොදනී. පිළිසිඳ ගෙනද දනියි. පටිසන්ධි සිත නොදනී. මේ ස්ථානයේ පිළිසිඳ ගත්තේ යැයි මෙසේ වනාහි දැනගනී. ඇතැම් තෙරවරු ආවර්ජන පිළිවෙල නම් ලබන්නට සුදුසුය. දෙවන තුන්වන චිත්ත වාරයෙහි මෙසේ දැනගන්නේ යැයි කියත්. ත්‍රිපිටක මහාසීව තෙරුන් වහන්සේ වනාහි, මහා සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය අන්‍යයන්ගේ ප්‍රතිසන්ධිය හා සමාන නොවේ. අවසානයට පත් ඔවුන්ගේ සිහිය හා නුවණ ඇත්තේය. යම්හෙයකින් ඒ සිතෙන්ම ඒ සිත දැනගන්නට නොහැකිය. ඒ නිසා ච්‍යුති චිත්තය නොදනී. ච්‍යුතිය සිදුවන මොහොතේම ච්‍යුත වෙමියි

නොදනී. ප්‍රතිසන්ධිය චිත්තය නොදනී. අසවල් තැන මාගේ ප්‍රතිසන්ධිය ඇතිවී යයි දනියි. ඒ කාලයේ සතසහස්‍රී ලෝකධාතුව කම්පා වෙයි. මෙසේ සිහිකල්පනා සහිතව මව්කුසට පිවිසෙන්නේ වනාහි එකූන්විසි ප්‍රතිසන්ධි චිත්තයේදී මෛත්‍රී පූර්වභාග සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික කුසල් සිතට සමාන මහා විපාක චිත්තයෙන් ප්‍රතිසන්ධිය ගත්තේය. මහාසීව තෙරුන් වහන්සේ වනාහි උපේක්‍ෂා සහගත සිතින් යැයි කීය.

යම්සේ අපගේ භාග්‍යවතුන් වහන්සේ මෙසේ ඇසළ මස පුන් පොහෝ දා උතුරුසළ නැකතින්ම ප්‍රතිසන්ධිය ගත්තේය. එදා වනාහි පූර්ව පුණ්ණමී සත්වන දවසේ පටන් සුරාපානයෙන් තොරව මල්ගඳ සුවඳ ආදී සම්පත්තියෙන් යුත් නැකැත්කෙළි උත්සවයේ සතුට විඳිමින් බෝසත් මව සත්වන දිනයේ අලුයම පිබිද සුවඳ දියෙන් ස්නානය කොට සියලු අලංකාරයන්ගෙන් සැරසී උතුම් භෝජනයක් වළඳ උපෝසථ ශීලාංගයන් අධිෂ්ඨාන කොට ශ්‍රීයහන් ගබඩාවට පැමිණ උතුම් සයනයෙහි වැද නින්දට පිවිසියේ මේ සිහිනය දුටුවාය.

සතරවරම් රජදරුවෝ ඇයව සයනයත් සමග උසුලාගෙන අනෝතත්ත විලට ගෙනගොස් නහවා දිව්‍යමය වස්ත්‍ර හඳවා දිව්‍යමය සුවඳ ගල්වා දිව්‍යමය මල් පැළඳ එයින් නුදුරෙහි එහි රිදී පර්වතය තුළ තිබෙන රන්විමනෙහි පෙරදිග පැත්තට හිස සිටින සේ හොවාලූහ. ඉක්බිති බෝධිසත්ත්වයෝ උතුම් සුදු ඇතකු වී එයින් නුදුරෙහි ඇති සුවර්ණ පර්වතයෙහි හැසිර එයින් බැස රිදී පර්වතයට නැගී රන්විමනට පිවිස මවට ප්‍රදක්ෂිණාකොට දකුණු පැත්ත පලාගෙන කුසතුළට පිවිසියාක් මෙන් විය. ඉක්බිති ප්‍රබුද්ධ දේවිය ඒ සිහිනය රජුට සැළකළාය. රජු රාත්‍රිය පහවගිය කල්හි හැටහතරක් බ්‍රාහ්මණ නායකයන් කැඳවා කොළපාට පත්‍ර හා විළඳ ආදී මංගල වස්තූන්ගෙන් සරසන ලද භූමියෙහි ඉතා වටිනා ආසන පනවා එහි සිටියා වූ බ්‍රාහ්මණයන්ට ගිතෙල්, මී, උක්සකුරු ආදිය යොදා පිළියෙල කරන ලද උතුම් කිරිබත්වලින් ස්වර්ණමය හා රිදීමය පාත්‍රා පුරවා සුවර්ණ, රජත පියන්වලින්ම වසා පිළිගැන්වීය. අන්‍ය වූද අලුත්වස්ත්‍ර හා දුඹුරු වර්ණ දෙනුන් දීම ආදියෙන් ඔවුන්ට සංග්‍රහ කළේය.

ඉක්බිති සියල්ලෝ සන්තර්පණය වූ ඔවුන්ට ඒ සිහිනය පවසා කුමක් වන්නේදැයි විචාළේය. බ්‍රාහ්මණයෝ පැවසූහ. මහරජතුමනි! කිසිවක් නොසිතන්න. ඔබගේ දේවියගේ කුසෙහි ගැබක් පිහිටියේය. ඒ ද වනාහි මහා පුරුෂ ගැබකි. කාන්තා ගැබක් නොවේ. ඔබට පුතෙක් ලැබෙන්නේය. ඉදින් හෙතෙම ගිහිගෙයි වසන්නේ නම් සක්විති රජ වන්නේය. ඉදින් ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේද ලෝකයෙහි දුරුකළ මෝහ ආදිය ඇති බුදුබවට පත්වන්නේය. මේ පළමු මව්කුසට ඒමය. මෙසේ මෙහි වර්ණනා ක්‍රමයයි.

අයමෙත්ථධම්මතා යනු මේ මෙහි මව්කුසට ඒමේ ස්වභාවයයි. මේ නියාමයැයි කියන ලදී. මේ නියාමය වනාහි කම්මනියාම, උතුනියාම, බීජනියාම, චිත්ත නියාම, ධම්මනියාම යැයි පස්වැදෑරුම්ය. එහිදී කුසලයට යහපත් වූ විපාකයක් දීමත් අකුසලයට අයහපත් විපාකයක් දීමත් යන මෙය කර්ම නියාමයයි. එය පැහැදිලි කිරීම සඳහා 'න අන්තලික්ඛෙ' ආදී ගාථාවන් කිවයුතුයි. තවද එක් ස්ත්‍රියක් වනාහි ස්වාමියා සමග භේද වී කලකිරී දිවි නසාගන්නට සිතා ගෙලට ලනු දමාගත්තේය. එක්තරා පුරුෂයෙක් පිහියක් සොයන්නේ එය දැක ලණුව කපනු කැමැත්තේ බිය නොවන්න. බිය නොවන්න ඇයව සනසා එහා මෙහා ගියේය. ලණුව සර්පයෙක් මෙන් වී නැගී සිටියේය. හෙතෙම බිය වී පළා ගියේය. අනික් තැනැත්තිය එතනම මළාය. මේ ආදී වූ කථාවස්තූන් මෙහි දැක්විය යුතුයි. ඒ ඒ ජනපදවල ඒ ඒ කාලවලදී එක්පහරින්ම ගස්වල මල්ගෙඩි සමූහයක් සුළං හැමීම නතරවී ආ හිරුඑළියේ තදබව අඩුවීම, වර්ෂාව නොවැටීම, නෙලුම්මල් දවල් විකසිතවීම රාත්‍රියෙහි පරවීම මේ ආදිය උතුනියාමය.

යම් මේ වනාහි හැල් බීජයෙන් හැල් ඵලයක් ද මිහිරිබවෙන් මිහිරි රසයන්ට තිත්ත බවෙන් තිත්ත රසයක්ම ඵලය වෙයි. මේ බීජ නියාමයයි. කලින් කලට ඇතිවන චිත්ත චෛතසික ධර්මයන් පසුව ඇතිවන චිත්ත චෛතසිකයන්ට ආධාර වන හෙයින් ප්‍රත්‍යය නම් වේද මෙසේ චක්ෂුර්විඥාන ආදීන්ට අනතුරුව පිළිගැනීම් ආදියේ හටගැනීමත් යන මෙය චිත්ත නියාමයයි. යම් මේ බෝධිසත්ත්වයන් මව්කුසට පැමිණීම ආදියෙහිද දසදහසක් ලෝකධාතුව කම්පාවීම ආදිය ධර්මනියාමයයි. ඒවා අතුරෙන් මෙහිදී ධර්මනියාමය අදහස් කරන ලදී. ඒ නිසා එම කාරණයම දක්වන්නේ මහණෙනි, මේ වනාහි ධර්මතාවයැයි' ආදිය දෙසූ සේක.

එහි **කුච්ඡිං ඔක්කමති** යන තැන කුසට පිවිසෙන්නේ වෙයි යන මේ අර්ථයයි. පැමිණිකල්හි වනාහි එහිදී මෙසේ වෙයි. බැසගන්නා කල්හි නොවෙයි. **අප්පමාණො** යනු වැඩුණු ප්‍රමාණය මහත්‍ය යන අර්ථයි.

**උළාරො** යනු එයටම සමාන වචනයකි. විශාල වූ කෑයුතු දේ අනුභව කරත් යනාදී තැන්වල මධුරං උළාරං යැයි කියන ලදී. උළාරාය ඛඩ්ඩ භවං වච්ඡායනො සමණං ගොතමං පසංසාය පසංසති' (ශ්‍රේෂ්ඨ වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේට පැසසුම් සඳහා පැසසීම් කරයි) මෙතැන උළාර යැයි කීවේ ශ්‍රේෂ්ඨ යන අර්ථයමයි. **දෙවානං දෙවානුභාවං** මෙහි දෙවියන්ගේ ආනුභාවයයි. අඳින ලද ඇඳුම්වල ආලෝකය දොළොස් යොදුනක් පැතිරෙයි. ශරීරයේ දී එසේය. අලංකාරව ලද එසේය. විමානයෙහිද එසේය. එය ඉක්මවා යන අර්ථයි.

**ලොකනතරිකා** යනු චක්‍රවාට තුනක් අතර එක එක ලෝකන්තරිකයක් වෙයි. රියසක තුනක් හෝ පාත්‍රා තුනක් හෝ එකිනෙකට ගැටෙන සේ තබන ලදුව ඒ මැද ඇති අවකාසය මෙනි. එය වනාහි ලෝකන්තරික නරකයයි. ප්‍රමාණයෙන් යොදුන් අටදහසකි. **අඝා** යනු නිරන්තර විවෘත වූ **අසංවුතා** යනු යටින්ද නොපිහිටි. **අන්ධකාරා** අඳුරු වූ **අන්ධකාර තිමිසා** යනු චක්ඛු විඤ්ඤාණය පහළවීම වැළැක්වීමෙන් අන්ධ බව ඇතිකරන අඳුරින් යුක්ත. එහි වනාහි චක්ඛු විඤ්ඤාණය පහළ නොවේ. **එවං මහිද්ධිකා** යනු ඉරහඳ වනාහි එක්වරම ද්වීප තුනක පෙනේ. එපරිද්දෙන් මහා ඍද්ධි ඇති. එක එක දිශාවෙන් යොදුන් ශතසහස්‍ර නවයක් අන්ධකාරය දුරුකොට ආලෝකය දක්වමින් මෙබඳු මහානුභාව ඇති **ආභාය නානුභොනති.** තමන්ගේ ප්‍රභාවෙන් සමර්ථ නොවෙත්. ඒවා වනාහි සක්වල පව්වේ මැදින් ගමන්කරත්. සක්වළ පව්වද ඉක්මවා ලෝකන්තරික නිරය වේ. ඒ නිසා ඒවා එහිදී ආලෝකයෙන් නොබබළත්. **යෙපි තත්‍ථ සත්‍තා** යම්කෙනෙක් ඒ ලෝකන්තරික මහා නිරයේ උපන්නාහුද? කුමන නම් කර්මයක් කොට එහි උපන්නාහුද?

භාර්යාවන් කෙරෙහි දරුණු බව මව්පියන්ට ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට අපරාධ කිරීමත් දිනපතා ප්‍රාණ වධකිරීම ආදී වූ සාහසික වැඩද කර එහි උපදිත්. තම්බපණ්ණි දිවයිනෙහි අභය චෝරනාග වැනි සොරුන් මෙනි. ඔවුන්ගේ ආත්මභාවයන් ගව්තුනක් පමණ වෙයි. වවුලන්ගේ මෙන් දිග නිය ඇත්තේ වෙයි. ඔවුහු වවුලන් මෙන් නියවලින්

සක්වල පාදයෙහි එල්ලෙත්. යම්විටක හෙමින් හෙමින් යන්නාහු ඔවුනොවුන්ගේ අත් එකට බැඳෙත්. අපට අහරක් ලැබුනේ යැයි සිතමින් එහි යෙදී සිටියාහු පෙරළී පොළව දරා සිටින ජලයේ වැටෙත්. සුලං වදිනවිට මීගෙඩි මෙන් කැඩී ජලයට වැටෙත්. වැටෙනවිටම අතිශයින්ම ක්‍ෂාර වූ ජලයෙහි පිටිපිඩක් මෙන් දිය වේ. **අඤ්ඤෙපි කිර භො සන්ති සත්තා** යනු යම්සේ අපි මහා දුකක් විඳිමුද එපරිද්දෙන් අන්‍ය සත්ත්වයෝද මේ දුක විඳීම පිණිස මෙහි උපන්නාහු යැයි ඒ දවස බලත්. මේ ආලෝකය වනාහි එක මොහොතකුදු නොසිටී. අසුරුගසන තරම් සුළු වේලාවක් විදුලිය එළියක් මෙන් පැතිරී මේ කුමක්දැයි කියනවිටම අතුරුදහන් වෙයි.

**සංකම්පති** යනු හාත්පසින් කම්පා වෙයි. ඉතිරි දෙක කලින් පදයටම පර්යාය වචනයි. නැවත අප්පමාණො ච (අප්‍රමාණ ද) යන්න නිගමනාර්ථය සඳහා කියන ලදී.

**චත්තාරො නං දෙවපුත්තා චතුද්දිසං රක්ඛාය උපගච්ඡන්ති** යන තැන චත්තාරො යනු සිව්මහරජාණන් සඳහා කියන ලදී. දසදහසක් සක්වලද වනාහි සතර සතර බැගින් කොට සතළිස් දහසක් වෙත්. එහි මේ සක්වල මහරජවරු කඩුගත් අත් ඇතිව බෝධිසත්ත්වයන්ගේ ආරක්ෂාව පිණිස එළඹ සිරියහන් ගබඩාවට පිවිසියාහ. ඉතිරි අය යහන් ගබඩාවේ දොර ලඟ සිට යටත් ප්‍රාංශු **පිශාච** ආදී යක්‍ෂ ගණයාව ඉවත්කර සක්වල ගල දක්වා ආරක්ෂා යෙදූහ.

මේ ආරක්ෂාව කුමක් සඳහාද? කෝටි සත සහස්‍රයක් මාරයෝ, ප්‍රතිසන්ධි ග්‍රහණය කළ කාලයේ පටන් කෝටි සතසහශ්‍රයක් සිනේරුව ඔසවා බෝධිසත්ත්වයන්ට හෝ බෝධිසත්ව මෑණියන්ට අනතුරක් කිරීම සඳහා එන්නාහු නම්, සියළු අන්තරාවන් අතුරුදන් කරන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේද දේශනා කරන ලදී. රුධිර උප්පාද වස්තුවෙහිදී මහණෙනි, යම්කිසි උපක්‍රමයකින් තථාගතයන් වහන්සේගේ ජීවිතය තොර වන්නේය යන කාරණය සිදුනොවන්නකි. මෙසේ මේ අන්‍ය උපක්‍රමයකින් තථාගතයන් පිරිනිවන් පාන්නේ නැත. මහණෙනි! වෙනසක් නොසිතා වඩින්න. තථාගතයන් වහන්සේලාව ආරක්ෂා කළයුතු නැත. මෙසේ මේ බාහිර උපද්‍රවයකින් තථාගතයන් වහන්සේලාට කරදරයක් වන්නේ නැත. විරූප වූ දැකීමට අප්‍රිය, බියජනක දර්ශන ඇති

මෘගයන්ගේ හා පක්ෂීන්ගේ බියජනක රූප දැක ශබ්ද අසා බෝසත් මැණියන්ට යම්කිසි බියක් හෝ සන්ත්‍රාසයක් ඇතිවන්නේද ඒවා වැලැක්වීම සඳහා ආරක්ෂාව යෙදූහ.

තවද බෝසතුන්ගේ පින් තේජසින් හටගත් ගෞරව ඇතිව එයින් මෙහෙයවන ලද ඔවුහු මෙසේ කළහ. කුමක් නිසා ඔවුහු ඇතුල් ගැබට පිවිස සිටියා වූ සතරවරම් රජදරුවෝ බෝසත් මැණියන්ට තමන්ව පෙන්වත්ද? නැද්ද? ස්නානය, සැරසීම, භෝජනය යන අවස්ථාවලදී වූ ශරීර කෘත්‍යයන් කරන කල්හි නොපෙනෙත්. ශ්‍රී යහන් ගබඩාවට පිවිස උතුම් ස්ථානයෙහි හොත් අවස්ථාවේදී පෙනෙත්. එහිදී කිසියම් අමනුෂ්‍ය දර්ශනයක් සිදුවූයේ නම් එය මිනිසුන්ට බිය උපදවන්නේය. බෝසත් මැණියෝ වනාහි තමාගේ ද දරුවාගේ ද පින් බලයෙන් ඔවුන් දැක බිය නොවෙත්. සාමාන්‍ය අන්තඃපුර පාලකයන් කෙරෙහි මෙන් ඔවුන් කෙරෙහි සිත් උපදවා ගනිත්.

**පකතියා සීලවතී** ස්වභාවයෙන් ම සිල්වත්ය. බුදුන් නූපන් කල්හි මිනිස්සු තාපස පරිබ්‍රාජක ආදීන් ලඟ වැඳ ඇණ තබාගෙන හිඳ සිල් ගනිත්. බෝසත් මැණියෝද කාලදේවල ඍෂිවරයා ලඟ සිල්ගතී. බෝසතුන් කුස පිළිසිඳගත් කල්හි වෙන කෙනෙකුගේ පාද මූලයක සිටින්නට නොහැකිය. සම අසුනෙහි සිට ගන්නා ලද ශීලයද අවමානයට හේතුවක් පමණි. ඒ නිසා තමාම සිල් සමාදන් වූයේ යැයි කියන ලදී. **පුරිසෙසු** යනු බෝසත් පියා ආදීකොට කිසියම් මිනිසුන් කෙරෙහි පුරුෂාධිපත්‍ය පිළිබඳ සිතක් නූපදී. බෝසත් මවගේ රූපය වනාහි දක්ෂ ශිල්පීන් විසින් පුස්තකර්ම ආදියේ කරන්නට අසමත් වේ. ඇය දැක පුරුෂයාට රාගය නූපදී යැයි කිව නොහැක. ඉදින් කාමාශාවෙන් එනු කැමැත්තේ වේද පාදයෝ නුසුලත්. දිව්‍යමය හැකිල්ලෙන් බැඳෙයි. ඒ නිසා අනතික්කමනීය ආදිය කියන ලදී.

**පංචන්නං කාමගුණානං** යනු පෙර කාමගුණයන් එක්තැන් කරන ලද්දේ යැයි මේ පුරුෂයන් පිළිබඳ අභිප්‍රායයෙන් වස්තු ප්‍රතික්ෂේපය කියන ලදී. මෙහි අරමුණු ප්‍රතිලාභය කියන ලදී. එකල්හි වනාහි දේවියට මෙබඳු පුතකු කුස උපන්නේ යැයි අසා හාත්පස රජවරු බොහෝ වටිනා ආභරණ, තූර්යභාණ්ඩ ආදිය දොරටු පසට අරමුණුවන පණිවිඩ යවත්.

බෝධිසත්ත්වයන්ගේද බෝධිසත්ව මෑණියන්ගේ ද කරන ලද කර්මය බලවත් බැවින් ලාභසත්කාරයන් ලැබීමේ සීමාවක් නම් නැත.

**අකිලන්තකායා** යනු යම්සේ අන් ස්ත්‍රීහු ගැබ්බරින් වෙහෙසට පත්වෙති. අත් පා ඉදිමෙයි. ඇයට මෙබඳු කිසිම පීඩාවක් ඇතිවූයේ නැත. **තිරොකුච්ඡිගතං** යනු කුස තුළට ගිය. **පස්සති** යනු කලල අවස්ථාව ආදිය පසුකර හටගත් අඟපසඟවල යහපත් බවම දකී. කුමක් නිසා දකීද, සුව වාසය සඳහාය. යම්සේ වනාහි මව පුතා සමග සිටියා හෝ ඔහුගේ අතක් හෝ පාදයක් පහතට වැටී තිබේනම් එය ඔසවා තබන්නෙමියි සුවපහසුව සඳහා පුත්‍රයාව බලයි. මෙසේ බෝධිසත්ත්වයන්ගේ මව ද යම් ඒ මවගේ නැගීසිටීම, ගමන, පෙරළීම, හෙවීම ආදියෙහිත් උෂ්ණ, සීත, ලවණ, තිත්ත, කටුක ආහාර ගන්නා කල්හි ගැබට දුකක් ඇතිවෙයි. කිම මාගේ පුත්‍රයා සතුටින් සුවසේ සිටීදැයි බෝධිසත්ත්වයන්ව බලන්නී පළඟක් බැඳ සිටින්නා වූ බෝධිසත්ත්වයන්ව දකියි. යම්සේ වනාහි කුසතුළට ගිය අන්‍යයෝ පක්වාශය වසාගෙන ආමාශය ඔසවා උදර පටලය පිටුපසට කොට පිටිකොන්ද ආධාර කරගෙන උක්කුටිකයෙන් සිට දෙමිටෙහි හකුව තබාගෙන, වැසි වසින කල්හි ගස් බෙනයක වඳුරන් මෙන් සිටිත්. බෝධිසත්ත්වයෝ එසේ නොවේ. බෝධිසත්ත්වයෝ වනාහි පිටකොන්ද පිටුපසට කොට ධර්මාසනයක සිටින ධර්මකථිකයකු මෙන් පළඟක් බැඳ පෙරදිගට අභිමුඛව සිටී.

මොහු විසින් පෙර කරන ලද කර්මය හදවත පිරිසිදු කරයි. හදවත පිරිසිදු වූ කල්හි සියුම් ඡවි ලක්‍ෂණ පහළ වෙයි. ඉක්බිති ඒ කුසෙහි සම බෝසතුන්ව වසන්නට නොහැකි වෙයි. බලන්නියට පිටත සිටියාක් මෙන් පෙනෙයි. ඒ කාරණය උපමාවකින් දක්වන භාග්‍යවතුන් වහන්සේ 'සෙය්‍යථාපි' (යම්සේ වනාහි) ආදියෙන් පැවසූ සේක. බෝසතාණන් වහන්සේ වනාහි මව්කුස සිටියේ නමුත් මව ම දකියි. කුස තුළදී චක්ඛු විඤ්ඤාණය පහළ නොවෙයි.

**කාලං කරොති** යනු ප්‍රසූත කළ පමණින් නොවේ. ආයුෂ ගෙවීමෙන්මය. බෝසතුන් විසින් වාසය කළයුතු තැන වනාහි චෛත්‍යයක ගර්භය මෙනි. වෙන අයට පරිභෝග කිරීමට යෝග්‍ය නොවේ. බෝසත් මව ඉවත්කර අන් කතක් අගමෙහෙසුන් තනතුරේ තබන්නට නොහැකිය.

එපමණක්ම බෝධිසත්ව මෑණි කෙනෙකුගේ ආයුෂ වන්නේය. ඒ නිසා එකල්හි කලුරිය කරන්නේය. කවරනම් වයසකදී කලුරිය කරන්නීද, මධ්‍යම වයසේදී. සත්ත්වයන්ගේ පළමු වයසේදී වනාහි ඡන්දරාග රාගය බලවත්ය. එකල්හි හටගත්තා වූ ගර්භය ස්ත්‍රී ගර්භයකි. ආරක්ෂා කරගැනීමට නොහැකි වෙයි. ගැබට බොහෝ කරදර ඇතිවෙයි. මධ්‍යම වයසේදී වනාහි දෙකොටසක් ඉක්ම තුන්වන කොටසේදී හෘදය වස්තුව විෂම වෙයි. හදවත විෂම ඇතිකල්හි උපන් දරුවෝ රෝගීහු වෙත්. ඒ නිසා බෝසත් මවද පළමු වියේදී සම්පත් අනුභව කර මධ්‍යම වයසේ තුන්වන භාගයේ දී දරුවකු ප්‍රසූත කර මිය යන්නේය යන්න මෙහි ධර්මතාවයයි.

**නව වා දස වා** යනු මෙහි 'වා' ශබ්දය විකල්ප අර්ථයෙහිය. සතක් හෝ අටක් හෝ එකොළොසක් හෝ දොළොසක් හෝ යනාදී ලෙස ගතයුතුයි. සත්මසකින් උපන්නහු ජීවත් වෙයි. ශීතල, උණුසුම දරන්නට සමත් නොවෙයි. අටමසින් උපන්නහු ජීවත් නොවෙයි. සෙස්සෝ ජීවත් වෙති. **දෙවා පඨමං පතිගණ්හන්ති** යනු ක්ෂීණාශ්‍රව ශුද්ධාවාස බ්‍රහ්මයෙක් පිළිගනියි. කෙසේ පිළිගනී ද?

ඒ අදහස ප්‍රතික්ෂේප කොට මෙය කියන ලදී. එකල්හි බෝධිසත්ත්ව මාතාව රන්වැඩ දැමූ වස්ත්‍රයක් හැඳ මත්ස්‍ය ඇසක් සමාන දුහුල් වස්ත්‍රයක් දෙපා පෙරහන්කඩයකින් ජලය නික්මෙන්නාක් මෙනි. ඉක්බිති ඔවුහු ප්‍රකෘති බ්‍රහ්ම විලාශයෙන්ම පැමිණ පළමුව රන්දැළකින් පිළිගත්හ. ඔවුන්ගේ අතින් සතරවරම් රජදරුවෝ අඳුන්දිවි සමින් ද එයින් මනුෂ්‍යයෝ දුහුල් කුඩා කොට්ටයකින් පිළිගත්හ. ඒ නිසා කියන ලදී. දෙවියෝ පළමුව පිළිගනිත්. පසුව මනුෂ්‍යයෝ.

**චත්තාරො නං දෙවපුත්තා** සතරවරම් මහරජවරු. **පටිග්ගහෙත්වා** අඳුන් දිවිසමකින් පිළිගෙන **මහෙසක්ඛා** යනු මහා තේජස් ඇති, මහා යසස් ඇති ලක්ෂණයන්ගෙන් යුක්ත වූ.

**විසදො ව නික්ඛමති** යම්සේ අනික් සත්ත්වයෝ යෝනි මාර්ගයේ ගැටෙන්නාහු නික්මෙත්. එසේ නික්මෙන්නේ නැත. නොඇලී සිටම නික්මෙන්නේ යැයි අර්ථයි. **උදෙන.** ජලයෙන් **කෙනචි අසුචිනා** යනු යම්සේ අන්‍ය සත්ත්වයෝ කර්මජ වාතයෙන් පා උඩට හා හිස යටට යෝනි මාර්ගයට වැටෙන්නාහු පුරුෂ ප්‍රමාණ සියයක් තරම් වූ නරකයකට

වැටෙන්නාක් මෙන් තල් සිදුරකින් අදිනු ලබන ඇතින්නියක මෙන් මහත් දුක්වේදනාවක් විඳින්නී නොයෙක් අපිරිසිදු ද්‍රව්‍යයන් වැකී නික්මෙත්. බෝධිසත්ත්වයෝ එසේ නොවෙති. බෝධිසත්ත්වයන් වනාහි පා උඩටත් හිස පහතටත් කරන්නට නොහැකි වේ. හෙතෙම ධර්මාසනයකින් බසින්නා වූ ධර්මකථිකයෙක් මෙන් හිනිමඟකින් බසින පුරුෂයෙක් මෙන්ද අත්පා දෙකද දිගහැර සිටියේම මව්කුස හටගත් කිසිම අපිරිසිදු ද්‍රව්‍යයක් නොතැවරී නික්මෙයි.

**උදක ධාරා** ජලධාරාව, ඒවායින් සීතල ජලය ස්වර්ණමය දෙනෙහි වැටෙයි. උණු ජලය රිදී දෙනෙහි වැටෙයි. මහපොළවෙහි කිසිම අපවිත්‍ර දෙයක් මිශ්‍ර නොවී ඔවුන්ගේ පානීය හා පරිභෝජනීය ජලය අන්‍යයන්ට සමාන නොවූ ක්‍රීඩා සඳහා ජලයද දැක්වීමම කියන ලදී. අනික් රන් රිදී කලවලින් ගෙනෙන ලද ජලය ද හංස වලල්ල ආදී පොකුණට ගිය ජලය පිළිබඳවද බෙදීමක් නැත.

**සමපති ජාතො** යනු ඒ මොහොතෙහි හටගත්. පෙළෙහි වනාහි මව්කුසින් නික්මීම් මාත්‍රයක් මෙන් දැක්වීය. එය මෙසේ නොගතයුතුයි. කුමාරයාව පළමුව බ්‍රහ්මයෝ රන්දැලකින් පිළිගත්හ. ඔවුන්ගේ අතින් සතරවරම් රජදරුවෝ අඳුන් දිවි සමකින් පිළිගත්හ. ඔවුන්ගේ අතින් මනුෂ්‍යයෝ දුහුල් කොට්ටයකින්ද මිනිසුන්ගේ අතින් මිදී මහපොළොවෙහි පිහිටා සිටියේය.

**සෙතම්හි ඡතෙත අනුහීරමානෙ** යනු දිව්‍යමය සේසතක් දරාසිටින කල්හි, මෙහි ඡත්‍රයට පිරිවර කඩු ආදී පස්මහ කකුධ භාණ්ඩයන්ද අයත්ය. පෙළෙහි වනාහි, රජකුගේ ගමනෙහිදී රජු මෙන් ඡත්‍රයම කියන ලදී. ඒවා අතර ඡත්‍රයම පෙනෙයි. ඡත්‍රය අල්වාගෙන සිටින්නා නොපෙනෙයි. එපරිද්දෙන් කඩු, තල්වැට, මොණර අත්, වල්විදුනා, නළල්පට ආදිය පෙනේ. ඒවා දරා සිටින්නන් නොපෙනේ. ඒ සියල්ල නොපෙනෙන ලෙස දේවතාවෝ දැරුවාහ. මෙයද කියා ඇත.

නොයෙක් ශාඛා ඇති දහසක් මඩුලු ඇති ඡත්‍රයන් දෙවියෝ අහසෙහි දැරූහ. රන්දඬු ඇති චාමර සෙල්වේ. නමුත් චාමර, ඡත්‍ර, දරා සිටින්නන් නොපෙනේ.

සබ්බාවදිසා යනු මේ සත් පියවරක් තබනවිට සියළු දිසාවන් විලෝකනය කිරීම කියන ලදී. මෙය වනාහි මෙසේ නොදත යුතුයි. මහා සත්ත්වයෝ වනාහි මිනිසුන්ගේ අතින් මිදී පෙරදිග බැලීය. නොයෙක් සියදහස් ගණන් සක්වලවල් එකම මිදුලක් මෙන් විය. එහිදී දෙව් මිනිස්සු ගඳමල් ආදියෙන් පුදන්නාහු මහා පුරුෂයාණෙනි! මේ ලෝකයේ ඔබවහන්සේට සමාන කෙනෙක් නැත. ඊට වඩා උසස් කෙනෙක් නැත්තේමයයි කීහ. මෙසේ සතර දිශාවත් සතර අනුදිශාවත් මත්තෙහිද දස දිශාවන්ද බලා තමාට සමානයකු නොදැක මේ උතුරු දිසාව යැයි සත්පියවරක් ඉදිරියට ගමන් කළේය. මෙහිදී මෙසේ අර්ථ දතයුතුයි.

ආසභිං යනු උතුම්. අග්ගො යනු ගුණයන්ගෙන් සියල්ලන්ට පළමු. ඉතිරි දෙපදය මෙයටම සමාන පදය. අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවො යන පද දෙකින් මේ ආත්මභාවයෙහි පත්විය යුතු රහත්බව ප්‍රකාශ කළේය. මෙහිද සමපාදයන්ගෙන් පොළවෙහි පිහිටා සිටීම සතර ආකාර ඍද්ධිපාදයන් ලැබීමේ පෙරනිමිත්තකි. උතුරුදෙසට යොමුවීම මහාජනයා යටපත්කර ඉදිරියට යාමේ පෙරනිමිත්තකි. දිව්‍යමය ශ්වේතඡත්‍ර දරාසිටීම නිර්වාණය නමැති උතුම් ඡත්‍රය ලැබීමේ පෙරනිමිත්තකි. පංචරාජ කකුධ භාණ්ඩයන් ලැබීම පස්මහා විමුක්තීන්ගෙන් මිදීමේ පෙරනිමිත්තය. සියළු දිශාවන් බැලීම අනාවරණ ඥාණය ලැබීමේ පෙරනිමිත්තය. ශ්‍රේෂ්ඨ වාක්‍යයක් ප්‍රකාශ කිරීම වෙන කවරකු විසින්වත් පැවැත්විය නොහැකි උතුම් දම්සක් සූත්‍ර දේශනා පැවැත්වීමේ පෙරනිමිත්තය. අයමන්තිමා ජාති (මේ මාගේ අන්තිම ජාතියයි) යන සිංහනාදය අනුපාදිසෙස නිර්වාණධාතුවෙන් පිරිනිවන්පානා බවට පෙරනිමිත්තය කියා දතයුතුයි.

මේ පිළිවෙල පෙළෙහි ආවේය. විස්තර පිළිවෙල සඳහන් වන්නේ නැත. එබැවින් අධ්‍යාහාරකොට දැක්විය යුතුයි. මහා පුරුෂයන් උපන් දිනයෙහි දසසහශ්‍රී ලෝකධාතුව කම්පා විය. දසසහශ්‍රී ලෝකධාතුවෙහි දේවතාවෝ එක් සක්වළකට රැස්වූහ. පළමුව දෙවියෝ පිළිගත්හ. පසුව මනුෂ්‍යයෝ පිළිගත්හ. තත් බැඳි වීණා සම්බැඳි බෙර කිසිවකු විසින් වාදනය නොකොට තමන්ම වාදනය විය. මිනිසුන්ගේ දම්වැල් බැඳීම් ආදිය කඩකඩව් බිඳී ගියේය. සියළු රෝග ඇඹුලෙන් මදින ලද තඹ ලෝහය මෙන් ඉවත්ව ගියේය. ජාති අන්ධයෝ රූප දුටුවාහ. ජාති බිහිරෝ ශබ්ද ඇසූහ. කොරු ජවසම්පන්න වූහ. විදෙස්වලට පිටත්ව ගිය

නැව් ස්වකීය පටුනට පැමිණියාහ. අහසෙහිත් බිමත් ඇති මාණික්‍ය තවතේජසින් බැබලුනාහ. වෛරී පුද්ගලයන්ට මෛත්‍රී සිත් පහළවිය. අවීචි නරකයේ ගිනි නිවුනේය. ලෝකන්තරයේ ආලෝකය පහළවිය. ගංගාවල ජලය ගලාගියේ නැත. මහ මුහුදෙහි මිහිරි රස ජලය විය. වායුව හමා ගියේ නැත. ආකාසයෙහි, පර්වතවල ගස්වල සිටි පක්ෂීහු බැස බිම සිටියාහ. සඳ අතිශයින් බැබලුනේය. සූර්යයා උණුසුම් නොවීය. සීතල නොවීය. නිර්මල ඍතුවලින් යුක්ත විය. දෙවියෝ තම තමන්ගේ විමන් දොරටුවල සිට අත්පොළසන් දීම, ප්‍රීති සෝෂා, පිලිහිස සීසැරීම් ආදියෙන් මහත් ක්‍රීඩා කළහ. සිව්දිග වැසි වැස්සේය. මහාජනයා බඩසයින් හෝ පිපාසයෙන් නොපෙළෙයි. දොරකවුළු තමන්ම විවෘත විය. මල් හටගන්නා, ගෙඩි හටගන්නා ගස්වල මල් ගෙඩි හටගත්තේය. දසසහශ්‍රී ලෝකධාතුව එකම කොඩිවැලක් මෙන් විය.

එහිදී දසසහශ්‍රී ලෝකධාතුව කම්පාවීම මොහුගේ සර්වඥතා ඥානය ලැබීමේ පෙරනිමිත්තකි. දෙවියන් එක් සක්වලකට රැස්වීම දම්සක් පැවතුම් පවත්වන කාලයෙහි එක්වරටම රැස්වී ධර්මය පිළිගැනීම පිළිබඳ පෙරනිමිත්තකි. පළමුව දෙවියන් විසින් පිළිගැනීම සතරවැදෑරුම් රූපාවචර ධ්‍යානයන් ලබන බවට පෙරනිමිත්තකි. පසුව මිනිසුන් පිළිගැනීම අරූප ධ්‍යාන සතර ලැබීමේ පෙරනිමිත්තකි. තත්බැඳි වීණාවන් තමන්ම වාදනය වීම අනුපිළිවෙලට විහාර ලාභයට පෙරනිමිත්තකි. සම්බැඳි බෙර වාදනය වීම මහත් වූ දහම් බෙරයට සවන්දීමේ පෙරනිමිත්තකි. අනුබන්ධ ආදිය බිඳදැමීමත් අස්මිමානය සිඳදැමීමත් පිළිබඳ පෙරනිමිත්තකි.

මහාජනයාගේ රෝග පහව යාම චතුරාර්ය සත්‍යය ප්‍රතිලාභයාගේ පෙරනිමිත්තකි. ජාත්‍යන්ධයන් රූප දැකීම දිවැස් ලැබීම පිළිබඳ පෙරනිමිත්තය. බිහිරන් ශබ්ද ඇසීම දිවකන ලැබීමේ පෙරනිමිත්තයි. කොරුන් ජවසම්පන්නයන් වීම ඍද්ධිපාද සතර ලැබීමේ පෙරනිමිත්තයි. කෙලතොල්ලන්ට සිහිය ලැබීම සතිපට්ඨාන සතර ලැබීමේ පෙරනිමිත්තය. විදේශවලට පිටත්ව ගිය නැව් තමන්ගේ තොටුපලවලට පැමිණීම සිව්පිළිසිඹියා අවබෝධයට පෙරනිමිත්තකි. මාණික්‍යයන් තමන්ගේ තේජසින් ආලෝකමත් වීම ලෝකයාට යම් ධර්මාලෝකයක් දක්වත්ද එයට පෙරනිමිත්තකි. වෛරීන්ට මෙත්සිත් පහළවීම සතර බඹවිහරණ

ලැබීමේ පෙරනිමිත්තකි. අවීචියෙහි ගිනි නිවීම එකොළොස් ගින්න නිවීමේ පෙරනිමිත්තය.

ලෝකන්තරික නරකයේ ආලෝකය පහළවීම අවිද්‍යා අඳුර නැතිකර ඥාණාලෝකය දැක්වීමේ පෙරනිමිත්තය. ගංගාවන්හි ජලය ගලානොයාම සිව් විශාරද බැව් ලැබීමේ පෙරනිමිත්තය. මහා සමුද්‍රයේ ජලය මිහිරිබවට පත්වීම නිර්වාණයෙහි ඇති එකම රසය බවට පෙරනිමිත්තය. සුළං හමා නොයාම දෙසැටක් මිථ්‍යාදෘෂ්ටි බිඳදැමීමේ පෙරනිමිත්තය. පක්ෂීන් භූමියෙහි ගමන්කිරීම මහාජනයා අවවාද අසා සත්ත්වයන් තෙරුවන් සරණයාමේ පෙරනිමිත්තය. චන්ද්‍රයා අතිශයින් බැබලීම බොහෝ ජනයාගේ සිත් ගන්නා බවට පෙරනිමිත්තකි. සූර්යයාගේ උණුසුමත් සීතලත් දෙකින්ම තොරවීම සෘතු පිළිබඳ යහපත්බවෙන් කායික හා චෛතසික සුවපත් බව ලැබීමේ පෙරනිමිත්තය. දෙවියන් විමන් දොරටුවල අත්පොළසන් දීමාදියෙන් ක්‍රීඩාකිරීම බුදුබව ලබා උදන් අනන බවට පෙරනිමිත්තකි. සිව් දිවයින්වලට මහා වැසි වැස්ම මහත් වූ ධර්ම නමැති මහාමේඝය වසින බවට පෙරනිමිත්තකි. බඩසයින් පීඩා විඳීමක් නැතිවීම කායගතා සති අමාව ලැබීමේ පෙරනිමිත්තය. පිපාසයෙන් පෙළීමක් නොමැතිවීම විමුක්ති සුවයෙන් සුවපත්වීම පිළිබඳ පෙරනිමිත්තය. දොරකවුළු ස්වයංක්‍රීයව විවෘතවීම ආර්ය අෂ්ටාංගික මාර්ගය විවෘතවීමේ පෙරනිමිත්තය. වෘක්ෂයන්හි මල්පල හටගැනීම විමුක්තිය නමැති මල් පිපෙන බවටත් සාමඤ්ඤඵල නමැති බරෙන් බරවන බවටත් පෙරනිමිත්තකි.

දසසහශ්‍රී ලෝකධාතුව එකම ධජ පන්තියක් මෙන් වීම අරිය ධජ මාලාවෙන් යුක්ත බවට පෙරනිමිත්තකියි දතයුතුයි. මේ සම්බහුල වාරය නම් වේ.

මෙහි ප්‍රශ්න අසත්. යම්විටක මහා සත්ත්වයෝ භූමියෙහි සිට උතුරු දෙස බලා ගොස් ශ්‍රේෂ්ඨ වූ වචනයක් ප්‍රකාශ කළේද එවිට පොළවෙහි ගමන් කළේ ද නැතහොත් අහසින් ගියේද? පෙනෙන්නට ගියේද? නොපෙනී ගියේද? ඇඳුම් රහිතව ගියේද, නැතිනම් මනාව හැඳ පැළඳ ගෙනද? කුඩා කල්හි ගියේ ද නැත්නම් මහළුව ද? පසුවද එබඳුම වීද? නැතහොත් නැවත බාල දරුවෙක් වීද? මේ ප්‍රශ්නය වනාහි පහත

ලෝහප්‍රාසාදයේ වැඩසිටින ත්‍රිපිටක චූලාභය තෙරුන් විසින් විසඳන ලදී. තෙරුන් වහන්සේ වනාහි මෙහිදී නියති පෙර කරන ලද කර්ම හා ඊශ්වර නිර්මාණවාද වශයෙන් ඒ ඒ බොහෝ දේ කියා අවසානයේ මෙසේ විස්තර කළේය. මහා පුරුෂයන් වහන්සේ බිම පොළොවෙහි ගමන් කළ සේක. එය මහාජනයාට අහසෙන් යන්නාක් මෙන් විය. පෙනෙන්නට ගියේය. මහාජනයාට නොපෙනෙන්නාක් මෙන් විය. ඇඳුම් නැතිව ගියේය. මහජනයාට වැටහී ගියේ මනාව හැඳ පැළඳ සිටි ලෙසිනි. බාලයෙක්ව ගියේය. මහාජනයාට පෙනුනේ සොළොස්වස් වූවකු ලෙසය. පසුව වනාහි බාල දරුවකු මෙන් විය. එබන්දෙක් නොවීය. බුදුවීමෙන් තෙරුන් විසින් ප්‍රශ්නය විසඳන ලදැයි ඔහුගේ පිරිස සතුටු සිත් ඇත්තේ විය.

ලෝකන්තරික වාරය කියන ලද පරිදිමය. මේ මුලපටන් කියන ලද සියළු ධර්මතාවයන් සැම බෝධිසත්ත්වයන් වහන්සේ නමකටම වන්නේ යැයි දතයුතුයි.

**අද්දසා ඛො** යනු දුහුල් සුමුඟක තබා ගෙනෙන ලද බව දකින ලදී. **මහා පුරිසස්ස** යනු ජාති ගෝත්‍ර කුල, ප්‍රදේශ වශයෙන් මහත් වූ පුරුෂයාට. **ද්වෙ ගතියො** යනු නිමාවන් දෙකකි. නිෂ්පත්ති දෙකකි. මෙහි 'ගති' ශබ්දය සාරිපුත්‍රය! මෙහි පංචගති නම් මේවාය' යන තැන නිරය ආදී භේදයෙන් සත්ත්වයන් විසින් යායුතු ගති පිළිබඳවය. 'මේ සිල්වත් යහපත් පැවැත්මෙන් යුත් භික්ෂූන්ගේ ගතිය හෝ අගතිය නොදනිමි' යන තැන අදහස යන අර්ථයෙහිය. 'නිර්වාණය රහතන්ගේ ගතියයි' යන තැන පිළිසරණෙහිය.

තවද මම මෙහි බ්‍රහ්මයන්ගේ ගතියද දනිමි. ච්‍යුතියද දනිමි. උත්පත්තියද දනිමි. මේ බ්‍රහ්මයා මෙබඳු මහා සෘද්ධි ඇත්තේය කියා 'මෙතැන නිෂ්පත්ති අර්ථයේ වේ. මෙහිදී නිෂ්පත්ති අර්ථයේ වන්නේ යැයි දතයුතුයි. **අනඤ්ඤා** යනු වෙනත් ගතියක් හෝ නිෂ්පත්තියක් නම් නැත.

**ධම්මිකො** යනු දස කුසල ධර්මයන්ගෙන් යුක්ත වූ අගතියට යාමෙන් වැලකුණු ධම්ම රාජා යන මෙය පෙර පදයටම පර්යාය වචනයකි. දැහැමි ලෙස ලබන ලද රාජ්‍යය බැවින් ධම්මරාජ නම් වේ. **චාතුරන්තො**

පෙරදිග සමුද්‍රාදීන්ගේ සිව් සමුදුර වශයෙන් සතරකට මැදි වූ මහපොළවට අධිපති විජිතාවී දිනන ලද සංග්‍රාම ඇති, ජනපදය - මෙහි ස්ථිර බවට පත්වූ **ජනපදත්ථාවරිය සමපනෙනා** සැඩපරුෂ රජුගේ බලිකර්ම ආදියෙන් ලෝකයා පීඩාවට පත්වන විට ජනයා මධ්‍යම ජනපදය අතහැර දමා පර්වත, සමුද්‍ර තීර ආදිය ඇසුරුකොට ප්‍රත්‍යන්තයෙහි වාසය කරත්. රජු දරුණු නැතිවනවිට සොරුන් හා සාහසිකයන් විසින් ජනපද පීඩාවට පත්කරනවිට ජනයා ප්‍රත්‍යන්තය අතහැර ජනපද මධ්‍යයෙහි වාසය කරත්. මෙසේ මෙබඳු රජකෙනෙක් රාජ්‍යය කරන කල්හි ජනපදය ස්ථිරභාවයකට පත්නොවෙයි. මේ කුමාරයා රාජ්‍යය කරවන කල්හි මොහුගේ ජනපදය ගලක් මත තබා ලෝහමය පියනකින් වසන ලද්දාක් මෙන් ස්ථිරසාර වන්නේ යැයි දක්වන්නේ **ජනපදත්ථාවරියප්පතෙන** යැයි කියන ලදී. **සත්තරතන සමන්නාගතො** යන මෙහි රතිය වඩවන බැවින් රතන නම් වේ. තවද

ගෞරව කරන ලද බොහෝ වටිනා අසහාය වූ දැකීමට දුර්ලභ වූ උසස් පුද්ගලයන් විසින් පරිභෝග කරන නිසා රතන යැයි කියනු ලැබේ.

චක්‍රරත්නය පහළ වූ කාලයේ පටන් අන් දේවස්ථානයක් නොවීය. සියල්ලෝම සුවඳ, මල් ආදියෙන් එයට ම පූජා පවත්වත්. ගෞරව කරත්නුයි. ගෞරව කිරීම් අර්ථයෙන් රතන නම් වේ. චක්‍රරත්නයට වනාහි මෙපමණ මිලක් අගනේයැයි වටිනාකමක් කිවනොහැක. මෙහි බොහෝ වටිනා බැවිනුත් රතන නම් වේ. චක්‍රරත්නය ද ලෝකයෙහි විද්‍යමාන අනිත් චක්‍රයන්ට වඩා වෙනස්ය. මේ නිසා අසාමාන්‍ය බැවින් ද රතන නම් වේ. යම්හෙයකින් වනාහි, යම් කල්පයක බුදුවරු උපදිත්ද, ඒ කාලයේම සක්විති රජවරු, පසේබුදුවරු, බුදුවරු කවදා හෝ කොහේ හෝ උපදිත්ද,

ඒ නිසා දැකීමට දුර්ලභ යන අර්ථයෙන්ම රතන නම් වේ. ඒ මේ ජාති, රූප, කුල, ඓශ්වර්ය ආදිය උතුම් වූ උදාර වූ පුද්ගලයාටම උපදී. අන් අයට නොවේ. ඒ නිසා ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ පරිභෝග කිරීම යන අර්ථයෙන් ද රතන නම් වේ. චක්‍රරත්නය යම්සේද සෙසු රත්නයන්ද එසේම යැයි ද යන මේ සප්ත රත්නයන්ගෙන් පිරිවරාගත් බැවින් ද පරිභෝග කරන බැවින් ද යුක්ත බැවින් සත්ත රත්නයෙන් යුත් යැයි කියයි.

දැන් ඒවායේ ස්වරූපය දැක්වීම පිණිස 'තසසිමානි' යනාදිය කියන ලදී. එහි චක්කරතනං ආදියෙහි මේ කෙටි අදහසයි. දෙදහසක් දිවයින් පිරිවරකොට ඇති සතරමහා දිවයින්වල සම්පත් ගෙනදීමට සමර්ථ චක්‍රරත්නය පහළ වෙයි. එපරිද්දෙන් දවසේ පූර්වභාග කාලයේදී සාගරය අවසන්කොට ඇති මහපොළොවෙහි සංචාරය කරන්නට සමර්ථ අහසින් යා හැකි හස්ති රත්නය, එබඳුම වූ අශ්ව රත්නය, අංග සතරකින් සමන්විත අඳුරෙහි යොදුනක් පමණ අන්ධකාරය නැතිකොට ආලෝකය දැකීමට සමර්ථ මාණික්‍ය රත්නය, සයවැදෑරුම් දෝෂයන්ගෙන් තොර මනා හැසිරීම් ඇති ස්ත්‍රීරත්නය, යොදුනක් පමණ ඇතුළත පිහිටි නිධාන දැකීමට සමර්ථ ගෘහපති රත්නයත්, අගමෙහෙසියගේ කුසෙහි ඉපිද මුළු රාජ්‍යයටම අනුශාසනා කිරීමට සමර්ථ දෙටු පුත් වූ පරිනායක රත්නයක් පහළ වෙයි.

**පරොසහස්සං** යනු අමතර සහස්‍රයක් **සූරා** යනු බියසුළු නොවූ **වීරංගරූපා** යනු වීරයන්ගේ ලක්‍ෂණ මේ වීර්යටම නමකි. වීරයන්ගේ අංග ලක්‍ෂණ ඇත්තේ මොවුන්ටනුයි වීරංගරූපා වීර්ය ඇති, වීර්ය ස්වභාව කොට ඇති, වීර්යමය වූවන් මෙන් වෙහෙසට පත්නොවූ දවසක්ම යුද්ධ කරන්නාහු වෙහෙසට පත්නොවන යැයි කියන ලදී.

**සාගර පරියන්තං** යනු සක්වල පව්ව සීමාකොට සිටියා වූ සමුද්‍රය අවසන්කොට ඇති. **අදණ්ඩෙන** යනු අපරාධ කළ ජනයාගෙන් සියයක්, දහසක් අයකර ගනිත්ද ඔවුහු ධනදණ්ඩන (දඩ ගැසීමෙන්) රාජ්‍ය පාලනය කරත්. යම්කෙනෙක් වරදකරුවන්ට තලාපෙළා පාලනය කරත්. ඒ ආයුධ දඬුවම්න්ය. මේ දෙයාකාර වූද දඬුවම් අත්හැර අදණ්ඩයෙන් පාලනය කරත්. **අසත්ථෙන** යනු යමෙක් එක් අතකින් තියුණු ආයුධයකින් අනුන්ට හිංසා කරත්. ඔවුහු ආයුධයෙන් රාජ්‍යය කරන්නෝය. මොහු වනාහි ආයුධයකින් කුඩා මැස්සකු බොන ලේ බිඳකුදු කිසිවකුගෙන් නූපදවා ධර්මයෙන්ම මහරජවරුනි! එන්න. මෙසේ සතුරු රජවරුන් සමග පිළිගැනීම් ඇතිව **අභිවිජියා** අභිභවනය කොට ස්වාමිත්වයට පත්ව වසයි යන අර්ථයි.

**මෙසේ එක නිෂ්පත්තියක් කියා දෙවැන්න කියන්නට 'ඉත් වනාහි' ආදිය කියන ලදී.** එහි රාග, දෝස, මෝහ, මාන, දිට්ඨි, කෙලෙස්, තණ්හා ආදී වූ ආවරණ විවෘත කරන ලද්දේ මොහු විසිනුයි 'විවත්තච්ඡද' නම් වේ.

(විවෘත කරන ලද ආවරණ ඇත්තේ වේ.) විවතතච්ඡදෙදා කියාද පාඨයක් ඇත.

මෙසේ දෙවෙනි නිෂ්පත්තිය කියා ඒවාට නිමිති වූ, හේතු වූ ලක්‍ෂණ දක්වන්නට 'අයං හි දෙව කුමාරො' (දේවයිනි, මේ කුමාරයා ආදිය කියන ලදී.

**එහි සුපපතිට්ඨිත පාදො** යනු යම්සේ අන් අය භූමියෙහි පා තබනවිට පාදයේ ඉදිරි කොටස හෝ විලුඹ හෝ පැත්තක් හෝ පළමුවෙන් පොළවේ ස්පර්ශ වෙයි. මැද සිදුරක් ඇතිවෙයි. පාදයේ ඉදිරි කොටස ඔසවනවිට එක් කොටසක් පමණක් එසවෙයි.

මෙය මෙසේ නොවේ. බෝසතාණන්ගේ වනාහි ස්වර්ණමය පාදුකාවක් මෙන් එක්වරම මුළු පාදතලයම බිම ස්පර්ශ වෙයි. එක්වරටම පොළවෙන් උඩට එසවෙයි. ඒ නිසා මොහු මනාව පිහිටි පා ඇත්තේ වෙයි.

**චක්කානි** යනු පාදතල දෙකේ චක්‍ර දෙකක් ඇත. ඒවායේ නිම් වළල්ල ද ගරාදි ද නාභියද පෙළෙහි කියන ලදී.

**සබ්බාකාර පරිපූරාණි** යනු මෙයින් වනාහි මේ විශේෂය දතයුතුයි. ඒ චක්‍රවල පාද තලයේ මැද නාභිය දිස්වේ. නාභිය හාත්පස රවුම් වළල්ල දිස්වේ. නැබ මුල වටවූ වලල්ල දිස්වේ. රෝද දැති දිස්වේ. එහි වටරේඛා දිස්වේ. රෝද පට්ටම දිස්වේ. නිම් වළලු පෙනේ. මෙය පෙළෙහි දක්නට ලැබෙන වැඩි විස්තර සඳහන් නොවේ. එය මෙසේ දතයුතුය.

සත්‍රය, සිරිවස, ස්වස්තිකය, මුදුන්මල්කඩ, වැඩෙන මත්ස්‍ය යුගලයන්, භද්‍ර පීඨය, අංකුසයක්, ප්‍රාසාදය, තොරණ, සේසත, කඩුව, තල්වැට, මොණර අත වල්විදුනාව, නළල්පට, පාත්‍රය, සමන්මල්දම, නිලුපුල් රතුපුල් සුදු උපුල්, පද්ම, පුණ්ඩරීක, පූර්ණසට, පූර්ණපාත්‍ර, සමුද්‍රය සක්වල, හිමාලය, මහාමේරුව, ඉරහඳ, තරු ආදිය, සතරමහා දිවයින් දෙදහසක් ආරක්‍ෂක ප්‍රදීප, අඩුතරමින් සක්විති රජුගේ පිරිස සඳහා සියල්ලම චක්‍ර ලක්‍ෂණයේ පරිවාරයයි.

**ආයතපණ්හී** යනු දිග විලුඹ පිරිපුන් විලුඹ යන අර්ථයි. යම්සේ වනාහි අන් අයගේ පා අග දිගය. විලුඹ මත කෙණ්ඩාව පිහිටා ඇත. විලුඹ ඇස දමා තැබුවාක් මෙන් වෙයි. මහා පුරුෂයන්ගේ එසේ නොවේ. මහා පුරුෂයාගේ වනාහි කොටස් සතරෙන් දෙකක්ම පාදයේ ඉදිරි කොටස වෙයි. තුන්වන කොටසේ කෙණ්ඩය පිහිටියේය. සතරවන කොටසෙහි ඉඳිකටුවකින් මසා තබන ලද රත්කම්බිලි පන්දුවක් වැනි විලුඹ වෙයි.

**දීඝංගුලි** යනු යම්සේ අන් අයගේ ඇතැම් ඇඟිලි දිග් වේ. සමහර ඒවා කෙටිය. මහා පුරුෂයාගේ එසේ නොවේ. මහාපුරුෂයාගේ වනාහි වඳුරකුගේ මෙන් දිග අත්පා ඇඟිලි මුලින් මහත්ව පිළිවෙලින් අග සිහින්ව ලාටුතෙලින් අඹරා රවුම්කරන ලද හිරියල් වළලු මෙන් වේ. ඒ නිසා දීඝංගුලී යැයි කියන ලදී.

**මුදුතළුණහත්‍ථපාදො** යනු ගිතෙල්වල බහාතබන ලද සත්වරක් පොලන ලද කපුරොදක් මෙන් මෘදුය. යම්සේ දැන් උපන් අලුතය. මෙසේ වැඩුනු කල්හිද තරුණවම සිටිත්. මෘදු වූ තරුණ වූ අත්පා ඇත්තේ මොහුටනුයි = මුදුතළුණ හත්‍ථපාදො.

**ජාලහත්‍ථපාදො** සමෙන් වැසුනා වූ ඇඟිලි අතර ඇත්තේ නොවෙයි. මෙබඳු තැනැත්තා වනාහි පෙණයක් බඳු අත් ඇතිව උපන් පුරුෂ දෝෂයෙන් යුක්ත වූයේ පැවිද්ද පවා නොලබයි.

මහා පුරුෂයාගේ වනාහි අතේ ඇඟිලි හතරක් පාදයෙහි ඇඟිලි පසක් එකප්‍රමාණ වේ. ඒවායේ සමානතාවය නිසා දැලක් බඳු ගතිය එකිනෙක මැඩගෙන සිටී. ඉක්බිති ඔහුගේ අත්පා දක්ෂ වඩුවකු විසින් සකස් කරන ලද දැල් වා කවුළුවක් මෙන් වෙයි. ඒ නිසා ජාලහත්‍ථපාදො කියා කියන ලදී.

උඩින් පිහිටි වළලුකර ඇති බැවින්, උත්සංකපාද මොහුට ඇත්තේනුයි **උස්සංකපාදො** අන් අයගේ වනාහි පාදයේ පිටුපස ගොප්ඇටය තිබේ. එයින් ඔවුන්ගේ පාදයෝ ඇණගැසුවාක් මෙන් තදය. පහසුවෙන් පෙරළිය නොහැක. ගමන් කරන්නහුගේ යටිපතුල් මත්තෙහි ගොප්ඇට පිහිටියේය. එබැවින් ඔහුගේ නාභියේ පටන් උඩුකය සෙලවෙයි. පහසුවෙන්

පාදයෝ පෙරළෙත්. ඉදිරියෙන්ද පසුපසින්ද දෙපැත්තෙන්ද සිට බලන්නන්ට යටිපතුල් පෙනේ. ඇතුන්ගේ මෙන් පසුපසින් පමණක් නොවේ.

**එණිජංඝො** එණි මුවන්ට සමාන කෙණ්ඩා ඇති මසින් පිරුණු කෙණ්ඩා එකට බැඳුනු මස්පිඩු නොවේ. හාත්පසින් සමානව පිහිටි මසින් වට වූ මනාව වට වූ හැල්ගොබ සමාන කෙණ්ඩාවලින් යුක්ත වූයේය යන අර්ථයයි.

**අනොනමනෙතා** නො නැමෙන - මෙයින් ඔහුගේ කුදු නැති, මිටි නැති බව දක්වන ලදී. අනික් ජනයෝ කුදු හෝ වෙත්. මිටි වෙත්. කුදු අයගේ සිරුරේ උඩ කොටස සම්පූර්ණ නැත. මිට්ටන්ගේ කයේ පහත කොටසය. ඔවුහු සම්පූර්ණ නොවූ කය ඇති බැවින් නොනැමී දන පිරිමදින්නට නොහැකි වෙත්. මහා පුරුෂයා වනාහි පිරිපුන් උභය කාය ඇති බැවින් එසේ කරන්නට හැකිවෙයි. **කොසොහිත වත්‍ථගුය්හො** යනු වෘෂභයන්ගේ, ඇතුන්ගේ මෙන් ස්වර්ණමය පියුම් කර්ණිකාවක් මෙන් කෝසයකින් වැසුනා වූ පුරුෂලිංගය මොහුට ඇත්තෙනුයි **කොසොහිතවත්‍ථගුය්හො**. වත්‍ථගුය්හං යනු වස්ත්‍රයෙන් වැසිය යුතු ලිඟුව කියනු ලැබේ. **සුවණ්ණවණ්ණො** යනු දෑහිඟුලෙන් අඹරා දිවියන්ගේ දත්වලින් ගලගා, ගුරුගල් පිරියම්කොට තබන ලද ඝන රන්වන් රූපයක් සමාන යන අර්ථයි. මෙයින් ඔහුගේ ඝන, සිනිඳු, මෘදු ශරීරයක් ඇතිබව දක්වා ඡවි වර්ණය දැක්වීම පිණිස **කංචනසන්නිභත්තචො** යැයි කියන ලදී. මෙයද පෙර කියන ලද්දටම පර්යාය වචනයකි. **රජොපලල** යනු රජස් හෝ කිලුටු හෝ **න උපලිම්පති** නොතැවරෙයි. නෙලුම් කොළයක ජලබින්දුවක් මෙන් පෙරළී යයි. අත් සේදීම ආදිය ඍතුගැන්වීම පිණිසද දායකයන්ට පින්ඵල සඳහාද බුදුවරු එසේ කරත්. චාරිත්‍රයක් ලෙස ද කරත්. සෙනසුන්ට පිවිසෙන භික්ෂුව පා සෝදා පිවිසිය යුතුයි' යනුවෙන් මෙය වතාවතකි.

**උද්ධග්ගලොමො** යනු අග කැරකැවී අග් උඩට සිටින මුහුණේ ශෝභාව බලන්නවුන් මෙන් සිටියා වූ ලොම් ඇත්තේනුයි උද්ධග්ගලොමො නම් වේ. **බ්‍රහ්මුජ්ජුගත්තො** බ්‍රහ්මයා මෙන් ඍජු ශරීර ඇත්තේ, ඍජුව උඩට නැගුණු ශරීරය වන්නේය. බොහෝ සෙයින් සත්ත්වයෝ කඳ, තුණටිය, දණ යන තුන් තැනකින් නැමෙත්. ඔව්හු තුනටියෙන් නැමෙන්නාහු පස්සට නැමෙත්. ඉතිරි දෙතැනින් නැමෙන්නේ ඉදිරියටය.

දිගු ශරීර ඇත්තන් එක් පැත්තකින් ඇදය. ඇතැමෙක් උඩට නැමී තරු ගණින්නාක් මෙන් ඇවිදිත්. කෙනෙක් අල්ප වූ මස් ලේ ඇත්තාහු උල් මෙන් වෙත්. තව කෙනෙක් ඉදිරියට නැමී සිටිත්. වෙවුළමින් යත්. මොහු වනාහි ඍජුව මතුවී දිග්ප්‍රමාණ වූයේ දෙව්පුර ඔසවන ලද තොරණක් මෙන් වන්නේ යැයි දක්වත්. යම්සේ මෙය උපන් තැනැත්තාට අප්‍රමාණ වූ මහා පුරුෂ ලක්ෂණ ඇත්තේ වෙයිද ඒ ඒ ඉදිරියට වන්නා වූත් එසේම භාවිතය සඳහාත් කියන ලදැයි දතයුතුයි.

**සත්තුස්සදො** යනු අත්පිටි දෙකක් පාපිටි දෙකත් දෙඇලයත්, කඳ යන මේ සත්තැන පිරිපුන් මාංශ ඇත්තේ මොහුටය. සත්තුස්සදො නම් වෙයි. අන් අයගේ අත් පා පිටිවල නහරදැල් පෙනෙයි. දෙඇලයන්හි ඇට අග් ඇත. ඒ මිනිස්සු ප්‍රේතයන් මෙන් පෙනෙත්. මහා පුරුෂයා එසේ නොවේ. මහා පුරුෂයා වනාහි එක්තැනක පිරිපුන් උස්ව වැඩුනු මස් ඇති නිසා සැඟවුණු ශිරා ජාලයන් ඇති අත්පිටු ආදියෙන් අඹරා තබන ලද රන් මිහිගු බෙරයක් මෙන් කඳෙන් යුක්ත වූයේ ගල්රූපයක් මෙන් පෙනෙයි. සිතුවම් කළ රූපයක් මෙන් පෙනෙයි.

සිංහයකුගේ පූර්වාධර්ය මෙන් කයක් මොහුට ඇත්තේනුයි **සීහපුබ්බංකායො** නම් වේ. සිංහයාගේ වනාහි කයෙහි ඉදිරිකොටස පිරිපුන්ය. ශරීරයේ පසුපස කොටස සම්පූර්ණ නැත. මහා පුරුෂයාගේ වනාහි සිංහයාගේ පූර්වකාය මෙන් මුළු සිරුරම සම්පූර්ණය. ඔහුද සිංහයාගේ මෙන් ඒ ඒ තැන්වල උස්පහත් වශයෙන් නුසුදුසු ලෙස විෂම ලෙස පිහිටියේ නොවේ. දිග්විය යුතු තැන දිගය. කෙටි, මහත්, කෙට්ටු, පළල් ආදී ගැලපෙන තැන්වල ඒ ආකාරයම වෙයි. මෙසේ කියන ලදී.

'මහණෙනි, මනාප වූ කර්මවිපාකයක් එළඹසිටි කල්හි යම් අංගයකින් දික්ව හොබනේද, ඒ අංග දිගට පිහිටත්. යම් අංගයකින් කෙටිව හොබනේද, එය කෙටිව පිහිටයි. යම් අංගයකින් මහත්ව හොබීද, එය මහත්ව පිහිටයි. යම් අංගයකින් කෘශව හොබනේද එය කෘශව පිහිටයි. යම් අංගයකින් පළල්ව හොබනේද එය පළල්ව පිහිටයි. යම් අංගයකින් වටකුරුව හොබනේද එය වටකුරුව පිහිටයි.

**මහා පුරුෂයාගේ ආත්මභාවය මෙසේ දාන චේතනාවෙන්ද පුණ්‍ය චේතනාවෙන් ද සිතන ලද්දේ දස පාරමිතාවන්ගෙන් සැදුනේ වෙයි.**

ලෝකයෙහි සියලු ශිල්පීන් හෝ සියළු ඍද්ධිමතුන් හෝ ඒ හා සමාන ප්‍රතිරූපයක් කරන්නට නොහැකි වෙත්.

**චිතන්තරංසො** යනු අන්තරංස යනු කොටස් දෙකක් අතර, පිරිපුන් අන්තරංසයක් මොහුට ඇත්තේය. චිතන්තරංසො යි අන්‍යයන්ගේ වනාහි ඒ ස්ථානය පහත්ය. පිටෙහි දෙපැත්ත වෙන වෙනම පෙනෙයි. මහා පුරුෂයාගේ වනාහි තුනටියේ පටන් මාංශපේශිය දක්වා කඳෙන් මතුවී ඔසවන ලද ස්වර්ණමය ඵලකයක් මෙන් පිට වසාගෙන පිහිටියේය.

**නිග්‍රොධ පරිමණ්ඩලො** යනු නුග ගසක් මෙන් අතුපතර ඇත්තේය. යම්සේ වනාහි රියන් පනහක් හෝ රියන් සියයකින් හෝ සමාන කඳෙහි අතුවලින් යුත් නුග ගස දිගින් පළලින් එකම ප්‍රමාණයකි. යම්සේ කයින්ද බඹයෙන් ද එක ප්‍රමාණයකි. යම්සේ අන්‍යයන්ගේ කය දිගය. නැතහොත් බඹය දිගය. මෙසේ වෙනස් වූ ප්‍රමාණ ඇත්තේ නොවෙයි. එයින්ම 'ඔහුගේ කය යම් පමණද යනාදිය කියන ලදී. එහි යාවතකො+අසස යන්න යාවතක්වසස කියා වේ. **සමවත්තක්ඛන්ධො** යනු සමාන වැඩුනු කඳ යම්සේ කෙනෙක් කොස්වාලිහිණියන් මෙන් කොකුන් මෙන් ඌරන් මෙන්ද වෙත්. දික්වූ ගෙල, ඇද වූ ගෙල, පළල් වූ ගෙල හෝ වේ. කථාකරනවිට නහර මතුවී පෙනෙයි. මඳ හඬක් නික්මෙයි. මහා පුරුෂයාගේ එසේ නොවේ. මහා පුරුෂයාගේ වනාහි මනාව වටවූ ස්වර්ණමය මිහිඟු බෙරයක් මෙන් කඳ පිහිටියේ වෙයි. කථාකරනවිට නහරවැල් නොපෙනේ. මේඝය මෙන් ගර්ජනාවක් බඳු මහත් ස්වර ඇත්තේ වෙයි.

**රසග්ගසග්ගී** මෙහි රසය විඳින්නේ නුයි රසග්ගසා. රසය ගැනීමට මේ නමකි. ඒ අග්‍රභාවය මොහුට ඇත්තේනුයි රසග්ගරග්ගී, මහා පුරුෂයාට වනාහි සත්සියයක් රසනහර උඩට ආ අග් ඇතිව බෙල්ලෙහි ඇලී සිටී. තල ඇටයක් පමණ වූද ආහාරයක් දිවෙහි තබන ලද්දේ මුළු සිරුරෙහිම පැතිර යයි. ඒ නිසාම මහා වීර්ය වඩන්නහුගේ ජීවිතය එක හාල් ඇටයකින්ද යූෂ නැලියකින් දහසයෙන් පංගුවකින්ද යැපුනේය. අන්‍යයන්ට වනාහි එසේ නොවීමෙන් සියළු සිරුරෙහි ඕජාව පැතිරෙන්නේ නැත. එයින් ඔව්හු බොහෝ ආබාධ ඇත්තෝ වෙත්.

සිංහයාට බඳු හනු මොහුට ඇත්තේය යැයි **සීහ හනු** නම් වේ. එහි සිංහයාගේ යටි හක්ක පමණක් සම්පූර්ණ වූයේ වෙයි. උඩ කොටස එසේ නොවේ. මහා පුරුෂයාගේ වනාහි සිංහයාගේ යටිහනුව මෙන් කොටස් දෙකම සම්පූර්ණය.

දොළොස්වක දා චන්ද්‍රයා මෙනි.

ඉක්බිති නිමිති දන්නෝ හකු අවසන තෙක් බලන්නාහු මේ හනුවලින් පහත හනුවේ විස්සක්ද උඩහනුවේ විස්සක්ද කියා දත් සතළිහක් සමානව විවර නැතිව පිහිටන්නේ යැයි සලකා දේවයිනි! මේ කුමාරයා **චත්තාලීස දන්තා** (දත් සතළිසක් ඇත්තේ) ආදිය කීවාහුය. එහි මේ අර්ථයයි.

පිරිපුන් දත් ඇති අන්‍යයන්ට වනාහි දත් තිස්දෙකක් වේ. මොහුට වනාහි සතළිසක් වේ.

අන්‍යයන්ගේ ඇතැම් දත් උසය. සමහර ඒවා පහත්ය යන ලෙස විසමව පිහිටා ඇත. මොහුගේ වනාහි ලෝහමය පත්‍රයක සව්කළ සක්පෙළක් මෙන් සමාන වන්නේය.

අන් අයගේ වනාහි කිඹුලන්ගේ මෙන් දත් විරල වේ. මස්මාළු කන අයගේ දත් අතර පිරෙයි. මොහුගේ වනාහි රන්වැලක එල්වන ලද වජ්‍ර පන්තියක් මෙන් හිඩැස් නැතිව පින්සලකින් ඇඳ දක්වන ලද්දාක් මෙන් දක්වන්නේය.

වෙන අයගේ නරක් වූ දත් ඇතිවේ. ඒ නිසා සමහර දත් කළු ද විවර්ණද වේ. මේ වනාහි මනා සුදුපාටින් යුත් දත්ය. ඔසධී තාරකාවද පරදන බබලන ප්‍රභාවකින් යුක්ත දත් වන්නේය. **පහූතජිව්හා** යනු පළල් දිවක්. අන් අයගේ දිව මහතද වෙයි. කෘශ ද කෙටි ද තද හා විෂම ද වේ. මහා පුරුෂයාණන්ගේ වනාහි දිව මෘදුය. දිගය. පළල්ය. වර්ණ සම්පන්නය. ඔහු ඒ ලක්ෂණ බලන්නට ආවා වූ අයගේ සැක දුරුකිරීම සඳහා මෘදු බැවින් ඒ දිව තද තූලක් මෙන් කරකවා නාසය හා දෙකන් ස්පර්ශ කරයි. දිග බැවින් කන්දෙක පිරිමදී. පළල් බැවින් හිසේ කෙස් දක්වා සම්පූර්ණ නළල් තලය වසාගනී. මෙසේ ඔහුගේ මෘදු හා දිග, පළල බව ප්‍රකාශ කරන්නේ ඔවුන්ගේ සැකය දුරුකරයි. ඒ නිසා ත්‍රිලක්ෂණ සංඛ්‍යාත දිව ගැන 'පහූතජිව්හා' යැයි කියන ලදී.

බ්‍රහ්මස්සරෝ යනු අන් අයගේ බිඳුනු ස්වර ඇත්තේය. කාක ස්වර ඇත්තේය. මොහු වනාහි මහා බ්‍රහ්මයාගේ ස්වරයට සමාන ස්වරයෙන් යුක්ත වන්නේය. මහා බ්‍රහ්මයාගේ ද සෙම්පිත් ආදියෙන් බාධා නැති බැවින් ස්වරය පිරිසිදුය. මහා පුරුෂයා විසින්ද කරන ලද කර්මයෙන් ඔහුගේ හදවත පිරිසිදු කරයි. හදවත පිරිසිදු බැවින් නාභියේ පටන් හටගන්නා ස්වරය පිරිසිදුය. අංග අටකින් සමන්විතව හටගනී. කොවුලෙක් මෙන් කථා කරයි. ඒ නිසා **කරවිකභාණී** නම් වේ. මත් කොවුලකුගේ මිහිරි හඬ යන අර්ථයි.

**අභිනීල නෙත්තො** යනු සම්පූර්ණ නිල් ඇස. ඔහුගේ ඇසේ නිල්විය යුතු තැන 'උමමා' යන වල්වලට සමාන වූ අතිශයින් විශුද්ධ වූ නිල්පාටින් යුත් ඇස් වේ. කහපාට තිබිය යුතු තැන කිණිහිරියා මල් සමාන කහපාටින්ද ලේපාට තිබිය යුතු තැන බඳු වදමල් සමාන රතුපාටින්ද සුදුපාට පිහිටිය යුතු තැන ඔසධී තාරකාවට සමාන සුදුපාටින්ද කලුපාට තිබිය යුතු තැන අමු කොහොඹ ඇට සමාන කාලවර්ණයෙන් ද යුක්ත වූයේ රන් විමනක විවෘත කරන ලද මාණික්‍යමය සීමැදුරු කවුළුවක් සේ පෙනේ.

**ගොපඛුමො** යනු, මෙහි පඛුම යනු මුළු ඇස්ගඩුවම අදහස් කරන ලදී. එය කළු වස්සකුගේ ඝන වූයේය. රතු වස්සකුගේ ඉතා පැහැදිලිය. එවේලේම උපන් තරුණ වස්සකුගේ බඳු ඇස්ගඩුව යන අර්ථයි. අන් අයගේ ඇස්ගඩු වනාහි අසම්පූර්ණ වේ. ඇත්, මී, කාක ආදී සතුන්ගේ ඇස්වලට සමාන එළියට නෙරා ආ ගාම්භීර වූ ඇස්වලින් යුත්, මහා පුරුෂයාගේ වනාහි සෝදා අඹරා තබන ලද මැණික් ගුලි මෙන් මෘදු, සිනිඳු, නීල සියුම් ඇස්පිහාටු ඇති ඇස්. **උණ්ණා** යනු ඌර්ණරෝමය, **භමුකන්තරෙ** බැම දෙක මැද නහය මැදම පිහිටි උඩට නැගී නළල මැද පිහිටි. **ඔදාතා** පිරිසිදු. ඔසධී තාරකාවට සමාන වර්ණ ඇති. **මුදු** යනු ඉතා පිරිසිදු ගිතෙල්වල දමා තබන ලද සියවරක් පොලන ලද කපුරොදක් හා සමාන වූ **තූලසන්නිභා** යනු ඉඹුල් ගසේ පුළුන්, වැල්වල පුළුන් හා සමාන වූ මේ මෙහි සුදු බවට උපමාය. එය වනාහි අගින් අල්ලාගෙන අදිනු ලබන කල්හි බාහුවෙන් අඩකට කිට්ටු ප්‍රමාණ වේ. දිගහැරියවිට දකුණු පැත්තට කැරකී අග් උඩට සිටින සේ පිහිටයි. රන් එලකයක් මත තබන ලද රිදී බුබුලක් මෙන් රන්කලයකින් නික්මෙන කිරි ධාරාවක් මෙන් අරුණාලෝකයෙන් ප්‍රභාමත් වූ අහස්තලයේ ඔසධී තාරකාවක් මෙන්ද අතිශයින් මනහර ශ්‍රියාවෙන් බබලයි.

උණ්හීසසීසො යනු පිරිපුන් නලල් තලය ඇතිබවද පිරිපුන් ශීර්ෂයද යන දෙකරුණ අරභයා කියන ලදී. මහා පුරුෂයාගේ වනාහි දකුණු කන් සිලුවේ පටන් මස්පිඩක් උඩට නැගී සියලු නළල වසා පරිපූර්ණව ගොස් වටකන්සිළුවේ පිහිටි රජු විසින් බඳින ලද උරහිස් පටියක් මෙන් බබලයි. මහාපුරුෂයාගේ වනාහි මේ ලක්ෂණය දැක රජවරුන්ට නළල්පට කළේය. මේ එක් අර්ථයක් පමණි. අන්‍ය ජනයා වනාහි අසම්පූර්ණ හිස් ඇත්තාහ. කෙනෙක් කපාදැම්මාක් වැනි හිස් ඇත්තාහ. කෙනෙක් ඇට මතුවූ හිස් ඇත්තාහ. තව කෙනෙක් පර්වතයක් වැනි හිස් ඇත්තාහ. මහාපුරුෂයාගේ වනාහි හිදිකටු තුඩෙන් වටකර තැබූවාක් වැනි සම්පූර්ණ ජලබිඳුවක් බඳු හිසක් ඇත්තේ වෙයි. එහි පෙර පරිද්දෙන් නළල්පටකින් වෙළන ලද්දාක් වැනි හිස් ඇත්තේය. උණ්හීසසීසො නම් වේ. දෙවන ක්‍රමයට නළල්පටක් මෙන් සියළු තන්හි මනාව මට්ටම් වූ හිසය යන අර්ථයෙහි උණ්හීසසීසො.

සබ්බකාමෙහි යනු මේ ලකුණු පිළිගන්වා පසුව කරන ලද්දාක් මෙන් යැයි කියන ලදී. මෙසේ තේරුම් නොගත යුතුයි. නිමිති දන්නවුන්ට සංග්‍රහ කර පසුව ලකුණු විමසා බැලීම කරන ලදැයි දතයුතුයි.

ඒ පිළිබඳ විස්තර ගැබට පිවිසීම ගැන කියනවිට කියන ලදී. **පායෙන්ති** තනයෙන් පොවත්. ඔහුට වනාහි දොස් රහිත මිහිරි කිරි ඇති කිරිමවුන් සැටක් යොදන ලදී. එපරිද්දෙන්ම ඒ ඒ කටයුතුවල දක්ෂයන් හැට බැගින් යොදන ලදී. ඔවුන් පිටත්කර හැරීමේ කාර්යයේ පුරුෂයන් සැටක් ඒ ඒ තැනැත්තා තමන්ගේ කටයුතු කළ නොකළ බව සොයාබැලීමට ඇමැතියන් සැටදෙනෙක් යෙදවීය. මෙසේ සැටසතරක් කාන්තාවන් හා හැටදෙකක් පුරුෂයන් සේවකයන් ලෙස යෙදවූහ.

**සෙතච්ඡත්තං** යනු දිව්‍යමය සේසත කුල පරපුරෙන් ආ එක සිරියහන් ගබඩාවේම තිබේ. **මා නං සීතං** වා ආදියෙහි අභිභවනය නොකරන්න යන අර්ථය දතයුතුයි. **සවාස්සුදං** -සො- හෙතෙම - සුදං යනු පද පූර්ණයේ නිපාතයකි. අන් තැනැත්තියකගේ අතින් අන් තැනැත්තියකගේ අතට අන් කෙනෙකුගේ දසරුවෙන් වෙන අයකුගේ දසරුවට. **පරිහරියති** පමුණුවයි යන අර්ථයි. **මඤ්ජුස්සරො** යනු මිහිරි හඬ - **වග්ගුස්සරො** දක්ෂ වූ නිපුණ වූ ස්වරය. **මධුරස්සරො** යනු මිහිරි ස්වරය. **පෙමනීයස්සරො** ප්‍රිය උපදවන ස්වරය, මේ එහි කොවුලන්ගේ මිහිරිස්වර ඇති බැවින්. **කොවුලන්** වනාහි මිහිරි රසැති අඹගෙඩියකට තුඩින් ඇණ වැගිරෙන

රසය බී පියාපත් සලා කූජනය කරන කල්හි මාත්‍රා සතරක් ඇති පදයක් මෙන් මිහිරි ලෙස අරඹයි. ගොදුරු ගනිමින් සිටින සිව්පාවෝ ද මුවින් ගත් තණකොළ අතහැර දමා ඒ හඬ අසත්. ව්‍යාල මෘගයෝ කුඩා සතුන් ලුහුබඳින්නෝ ඔසවන ලද පාදය බිම නොතබා සිටිත්. ලුහුබඳින ලද මුවාද මරණ භය හැර සිටිත්. අහසෙහි පියාසර කරන පක්ෂීහු පියාපත් දිගහැරගෙන සිටිත්. ජලයේ සිටින මත්ස්‍යයෝ ද කන්පටලය නොසොල්වා ඒ හඬ අසමින්ම සිටිත්. මෙසේ මිහිරි ස්වර ඇති කොවුලෝය. ධර්මාශෝකයන්ගේ දේවිය වූ අසන්ධිමිත්‍රාව, ස්වාමීනි, බුදුරජාණන් වහන්සේගේ හඬට සමාන හඬක් කවරකුහුට ඇත්තේදැයි සංඝයාගෙන් විචාළාය. ඇත. කොවුලාගේ හඬය. ස්වාමීනි! ඒ පක්ෂීහු කොහි සිටිත්ද? හිමවතැයයි කීහ. ඕ තොමෝ රජතුමාට මෙසේ කීවාය. මම කොවුල් පක්ෂියකු දකිනු කැමැත්තෙමි. රජතෙමේ මේ කුඩුවෙහි හිඳ කොවුලකු පැමිණේවායි රන්කුඩුවක් යැවීය. මැදිරිය ගොස් එක කුරවීකයකු ඉදිරියේ සිටියේය. ඒ රජුගේ අණින් ආවා වූ මැදිරියයි. නොගොස් සිටින්නට බැරියයි එහි සිටියේය. මැදිරිය අවුත් රජු ඉදිරියේ පෙනී සිටියේය. කොවුලා හඬවන්නට නොහැක්කාහ. ඉක්බිති රජතුමා, හිතවත, මේ ජනයාට කථාකරන්න යැයි කීය. දේවයන් වහන්ස, නෑයන් දැක හඬලමියි කීය. ඉක්බිති රජු ඔහුව කැඩපත්වලින් ආවරණය කරවීය. ඔහු තමාගේම ඡායාවන් දැක නෑයන් පැමිණියේ යැයි සිතා පියාපත්වලින් තාලයක් නගා මිහිරි ස්වරයකින් මැණික්මය බටනළාවක් පිඹින්නාක් මෙන් නාද කළේය. මුළු නගරයේම ජනයා මත්වූවාක්හු මෙන් වූහ. අසන්ධිමිත්‍රාව මෙසේ සිතුවාය. මේ තිරිසන් සත්ත්වයාගේ මෙබඳු මිහිරි හඬක් වන්නේද සර්වඥතාඥානය ලැබූ භාග්‍යවතුන්ගේ හඬ කෙබඳු වූයේදැයි ප්‍රීතිය උපදවා ප්‍රීතිය අත්නොහැරම සත්සියයක් ප්‍රභේද ඇති සෝවාන්ඵලයෙහි පිහිටියේය. කොවුල්නාදය මෙසේ මධුර විය. විපස්සී කුමාරයාගේ හඬ ඊට වඩා සියක් ගුණයක් දහස් ගුණයක් මිහිරි විය.

**කම්ම විපාකජ** යනු භාවනාමය නොවන, කර්මවිපාක වශයෙන් වනාහි දෙවියන්ට ඇසට සමාන මසැස විය. යමක් අරමුණු කරගෙන තලඇට ගොඩකින් එක් තලඇටයක් මේ එයයයි තෝරා දෙන්නට හැකිවෙයි.

**විපස්සී** යනු මෙහි මේ වචනාර්ථයයි. අතරින් පතර වහා හටගත් අඳුර නැතිවීමෙන් එළිය දකී. විවෘත වූ ඇස්වලින් දකීනුයි විපස්සී නම්

වේ. දෙවෙනිවර සොයන්නේය. දකින්නේය කියා විපස්සී නම් වේ. තෝරාගෙන දකීය යන අර්ථයි. එක් දවසක් වනාහි විනිශ්චය ආසනයේ සිට අර්ථයෙන් අනුශාසනා කරන රජුට මනාව අලංකාර කොට සූදානම් කළ මහා පුරුෂයන්ට ගෙනවිත් අතෙහි තැබුවාහ. ඔහුව උකුලේ තබාගෙන නලවනවිට ඇමතිවරු එක් ස්වාමියකු අස්වාමික කළහ. බෝධිසත්ත්වයෝ නොසතුටු හඬක් නිකුත් කළේය. රජු මේ කුමක්ද කියා සොයා බලන්නට නියෝග කළේය. සොයා බලන්නාහු වෙන කරුණක් නොදැක අසාධාරණ විනිශ්චයක් කරන ලද බැවින් මෙසේ කරන ලදැයි වටහාගෙන නැවත හිමිකරු හිමිකරු බවටම පත්කොට කුමාරයා මෙය දැනගෙන මෙසේ කරන්නේයැයි ස්වාමියා අස්වාමික කළහ. නැවතද බෝධිසත්ත්වයෝ එබඳුම හඬක් නිකුත් කළේය. ඉක්බිති රජතුමා මහා පුරුෂයෝ දනීතියි එතැන් පටන් අප්‍රමාදී විය. මේ ගැන මෙසේ කියන ලදී. 'කුමාරයා අර්ථයන් විමසන්නේය. විමසන්නේය.'

**වස්සික** යනාදියෙහි යම්තැනක වැහිකාලයේ වසින්නට පහසු වෙයිද මෙය වස්සික නම් වේ. අන් ඒවාද මේ ක්‍රමයටමය. මේ මෙහි වචනාර්ථයයි. වස්කාලයේ වසන්නට සුදුසුයි. වස්සිකො. අන් ඒවායේ ද මේ ක්‍රමයයි. එහි වාසය කරන ප්‍රාසාදය බොහෝ පහත් ද නැත. බොහෝ උස්ද නැත. දොරවල්, වාකවුළු ආදිය බොහෝ නොවේ. අඩුද නොවේ. බිමතුරුණු, පසතුරුණු ආදියත් ඛාද්‍ය භෝජ්‍ය ආදියත් මිශ්‍රකිරීම සුදුසුය. හේමන්තයෙහි කණු ද බිත්ති ද පහත්විය යුතුය. දොරවල් වාකවුළු අඩුවිය යුතුය. සියුම් විවර ඇත්තේය. උණුසුම ඇතුල්වීම පිණිස උස බිත්ති ඉවත් කෙරේ. බුමුතුරුණු, පසතුරුණු හැඳීම පෙරුවීම ආදිය වනාහි මෙහිදී උණුසුම ඇතිකරන කම්බිලි ආදිය සුදුසු වේ. ඛාද්‍ය, භෝජ්‍ය, සිනිඳු, කටුක, සම්මිශ්‍ර වූ ගිම්හානයේ කණු ද භිත්තිද උස්ය. දොර වාකවුළු වනාහි බොහෝ විශාල දැල් ඇතිව වන්නේය. බිම් ඇතිරිලි ආදිය දුහුල් ඒවා වීම සුදුසුය. ඛාද්‍ය භෝජ්‍ය ආදිය මිහිරි රස සීත වීර්ය වඩවන්නේය. වාකවුළු සමීපයෙහි අළුත් සැලි තබා ජලයෙන් පුරවා නිලුපුල් ආදියෙන් යුක්ත කරත්. ඒ ඒ ප්‍රදේශවල ජල යන්ත්‍ර සාදත්. එයින් වර්ෂාව ඇතිකල්හි මෙන් ජලධාරා වැගිරේ.

**නිප්පුරිසෙහි** පුරුෂයන් නැති, භුදෙක් තූර්ය භාණ්ඩම නොවේ. පුද්ගලයන් නැති සියළු ස්ථානයන්ම පුරුෂයන් නැති. දොරටුපාලකයන්ද ස්ත්‍රීහුය. නෑවීම ආදී කටයුතු කරන්නේ ද ස්ත්‍රීන්මය. රජු වනාහි එබඳු වූ

ඓශ්වර්ය සම්පත්තියක් අනුභව කරන්නහුට පුරුෂයාව දැක සැකයක් උපදී. එය මාගේ පුත්‍රයාට නොවේවායි සියලු කාර්යයන්හි ස්ත්‍රීන්වම යෙදූහ.

## පළමු බණවර වර්ණනාව නිමියේ ය.

දෙවන බණවරෙහි **ගොපානසිවංකං** යනු ගොනැස්සෙහි මෙන් ඇද වූ **භොගග** යනු කඳද තුනටිය, දන යන තුන් තැන නැමෙන ඇද ඇති. **දණ්ඩපරායනං** දඬුවම් දෙන, දඬුවට පිළිසරණ වූ. **ආතුරං** ජරාවෙන් ආතුර වූ. **ගතයොබ්බනං** ඉක්මගිය යොවුන් බව ඇති පශ්චිම වයසෙහි සිටියා වූ **දිස්වා** අඩයොදුන, යොදුනක් පමණ වූ බලකාය පිරිවරාගත් මනාව යොදන ලද ආරක්ෂා ඇතිව යන්නේ යම්සේ රථය පෙරටුකොට යයිද පසුව බලකාය යන්නේද එබඳු අවස්ථාවකදී ශුද්ධාවාස, ක්ෂීණාශ්‍රව බ්‍රහ්මයන් විසින් තමන්ගේ ආනුභාවයෙන් රථයට පෙරටුව දක්වන ලද ඒ පුරුෂයාව දැක, සුද්ධාවාස දෙවියෝ වනාහි, මහා පුරුෂයා වනාහි මඩෙහි හස්තියකු මෙන් පස්කම් ගුණයෙහි ඇලුනේ වෙයි. මොහුට සිහිය උපදවන්නෙමියි ඔහුව දැක්වූහ. මෙසේ දක්වන ලද ඔහුව බෝධිසත්ත්වයෝද දකිති. රථාචාර්යයාද දකියි. බ්‍රහ්මයෝද බෝධිසත්ත්වයන්ගේ අප්‍රමාදී බව සඳහාද රථාචාර්යයාගේ කථා සල්ලාපය සඳහාද ඔහුව දැක්වූහ. **කිං පනෙසො** යනු මෙතෙමේ දිරා ගියේය. කුමක් කියන ලද්දේ ද? මම මීට පෙර මෙබන්දක් නුදුටුවෙමියි විචාරයි. **තෙනහි** යනු ඉදින් මගේ ද මෙබඳු කෙස් මෙබඳු කයක් වන්නේය. **තෙනහි සම්ම සාරථී අලංදානජ්ජ උය්‍යානභූමියා** අද යම් උයන්බිමක් දකින්නෙමියි යන්නෙමුද ඒ උද්‍යානභූමියෙන් වැඩක් නැතැයි කලකිරුණු හදවතක් ඇත්තේ සංවේගානුරූපව මෙසේ කීය. **අනෙතපුරගතො** යනු ස්ත්‍රීජනයාව ඉවත්කර සිරියහන් ගැබෙහි හුදෙකලාව සිටියේ **යත්‍රහි නාමා** යම් ජාතියක් ඇතිකල්හි ජරාව පෙනෙයිද ඒ ජාතිය. ධිරත්‍ථු තින්දා වේවා! මේ ජාතිය පිළිකුල් කරමියි, ජාතියෙහි මුල කනින්නේ පළමු හුලෙන් හෘදයේ විද්දාක් මෙන් හුන්නේය.

**සාරථිං ආමනතාපෙත්වා** රජු වනාහි නිමිතිකරුවන් විසින් කියන ලද කාලයේ පටන් කන් යොමාගෙනම ඇවිදියි. ඒ කුමාරයා උයනට යන්නේ අතරමග නතර වූයේ යැයි අසා රථාචාර්යයාට කථා කළේය.

මාහෙව ඛො යනාදියෙහි රාජ්‍යය කෙරේවා. පැවිදි නොවේවායි බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍යයක් නොවේවායි මෙසේ සිතීය යන අර්ථයි. අද්දසා ඛො පෙර කියන ලද පරිදිම ශුද්ධාවාස දෙවියන් විසින් දක්වන ලද්ද දුටුවේය. ආබාධිකං යනු ඉරියව් බිඳීමෙන් ද අසමාන වූ ආබාධයෙන් ද රෝගී වූ. දුක්ඛිතං යනු රෝගවීමේ දුකින් දුකට පත්වූ. බාළ්හගිලානං දැඩි ලෙස ගිලන් වූ. පළිපනන ගිලුනා වූ. ජරා පඤ්ඤායිසසති ව්‍යාධි පඤ්ඤායිසසති මෙහිද යම් ජාතියක සිටියදී මේ දෙක පෙනීයයි ද ඒ ජාතියට නින්දා වේවා. නුපන්නේ නම් ආරක්ෂාකාරීය යනාදි ලෙස ජාතියේ මුල කනින්නේ දෙවෙනි ආයුධයෙන් ඇන්නාක් මෙන් සිටියේය.

විලාතං යනු දෝලාව. පෙතං යනු මෙයින් නික්මගිය. කාලකතං මියගිය. යම්තාක් කල් ජීවත්විය යුතුද ඒ සියල්ල කොට නිමවා මළේය යන අර්ථයි. ඔහුට පෙරසේම මෙය බ්‍රහ්මයෝ දැක්වූහ. යත්‍ර හි නාමා යනු මෙහිද යම් ජාතියක සිටින කල්හි මේ භය පෙනෙයි. ඒ ජාතියට නින්දා වේවා. නූපන් දේ ක්ෂේමයි. මෙසේ ජාතියේ මුල කනින්නාක් මෙන් තුන්වන ආයුධයෙන් විදින ලද්දාක් මෙන් හුන්නේය. භණ්ඩුං මුඩු. පෙරසේම බ්‍රහ්මයෝ ඔහුට පෙන්වූහ. සාධු ධම්මචරියා ආදියෙහි මේ දේවධර්මයන්හි හැසිරෙන බව යහපත් යැයි පැවිදි වූයේයැයි මෙසේ එක එක පදයාගේ යෙදීම දතයුතුය. සියළුම මේ දස කුසලයන්ට පර්යාය වචනයන්ය. අවසානයෙහි වනාහි අවිහිංසා කරුණාවේ පූර්ව අවස්ථාවකි. අනුකම්පා මෛත්‍රීයෙහි පූර්ව අවස්ථාවයි. තෙනහි නම් උනන්දු කරවීම් අර්ථයෙහි නිපාතයයි. පැවිද්දකු දැක මොහුගේ සිත වනාහි පැවිද්දට නැමුනේය. ඉක්බිති ඔහු සමග කියනු කැමැත්තේ වී රථාචාර්යයා උනන්දු කරවන්නේ 'තෙනහි' (එසේනම්) ආදිය කීය.

අථඛො භික්ඛවෙ පැවිද්දහුගේ මනා වූ ධර්මචරියාව ආදියද අනිත් බොහෝ මහා බලකායකින් රකිනු ලබන්නා වූ දරුවන් හා භාර්යාවන් නිසා ඇතිවන සම්බාධ සහිත ගෘහයෙහි වසන්නහුට ආදීනවයන්ගෙන් යුත් ගොලු වූ සිතින් සුවසේ වනයෙහි වසන්නා වූ පැවිද්දාගේ විවේකය ආදියෙන් සමන්විත ධර්මකථා අසා පැවිදිවනු කැමති වී ඉක්බිති මහණෙනි! විපස්සී කුමාරයා රියදුරා ඇමතීය. මේ සතර කාරණා දැක පැවිදිවීම නම් සියළු බෝසත්වරුන්ගේ වංශයයි. පිළිවෙලයි. ප්‍රවේණියයි. අන් බෝසත්වරු ද යම්සේ මේ 'විපස්සී කුමාරයා මෙසේ බොහෝකල්, බලත්. අපගේ බෝධිසත්ත්වයෝ වනාහි කරුණු සතරම එක දවසේදීම

දැක මහාබිනික්මන් නික්මැ අනෝමා ගං ඉවුරේ පැවිදි වූයේ, එයින්ම රජගහ නුවරට පැමිණ එහිදී බිම්බිසාර රජු විසින් පණ්ඩිතය! කුමක් නිසා පැවිදි වූයෙහිදැයි විචාරණ ලද්දේ මෙසේ කීය.

ජරාවට පත්වූවකු, දුකට පත්වූවකු, රෝගී වූවකු, ආයුෂ අවසන් වී මළ තැනැත්තකු, කාසාය වස්ත්‍රයක්, පැවිද්දෙක් ද දැක රජතුමනි! මම පැවිදි වූයෙමි.

**සුත්වාන තෙසං** යනු අසුභාර දහසක් ප්‍රාණීන්ට එය අසා මෙබඳු සිතක් ඇතිවිය. **ඔරකො** අඩු, ලාමක වූ. **අනුපබ්බජිංසු** අනුව පැවිදි වූහ. මෙහිදී කුමක් නිසා, ඛණ්ඩතිස්ස ආදීන්ගේ අනුපැවිද්ද පිණිස බන්ධුමතී රාජධානියෙන් නික්ම යැයි කියන ලදද? මෙසේ නොකීවේද? නික්මී අසන ලද බැවින්, මේ සියළු දෙනා වනාහි විපස්සී කුමාරයාගේ උපස්ථායක පිරිසය. ඔව්හු උදයේම උපස්ථානය පිණිස අවුත් කුමාරයා නොදැක උදේ ආහාරය පිණිස ගොස් උදේ ආහාරය වළඳ අවුත් කුමාරයා කොහේදැයි අසා උයනට ගියේ යැයි අසා එහිදීම ඔහුව හමුවන්නෙමුයි නික්ම ගියාහු රථාචාර්යයා නතරවනු දැක කුමාරයා පැවිදි වූයේය යන ඔහුගේ වචනය අසා, ඇසූ තැනදීම සියළු ආභරණ ගලවා දමා වෙළඳසැළකින් කසාවත් වස්ත්‍ර ගෙන්වාගෙන කෙස්රැවුල් කපා පැවිදි වූහ. මෙසේ නගරයෙන් නික්ම නගරයෙන් පිටතදී අසන ලද බැවින් 'මෙහි බන්ධුමතී රාජධානියෙන් නික්ම' යැයි නොකියන ලදී.

**චාරිකං චරති** යනු ගිය ගිය තැන මහා මණ්ඩපයක් කොට දානය සූදානම් කර අවුත් පසුදා දානය සඳහා ආරාධනා කරන්නා වූ ජනයාගේ ඉල්වා සිටින ලද භික්ෂාවට පිළිගන්නේ මාස හතරක් චාරිකාවේ හැසිරෙයි. **ආකිණ්ණො** මේ සමූහයා විසින් පිරිවරන ලද්දේ මේ විතර්කය බෝධිසත්ත්වයන්ට කවදා නම් පහළවීද? හෙට වෙසක් පුන් පොහොය වන්නේයැයි දාහතරවන දිනයේ, එදා වනාහි හෙතෙම, යම්සේ මේ අය ගිහිව සිටිය මා පිරිවරාගෙන හැසිරෙත්ද දැනුදු එසේමය. මේ පිරිසෙන් කවර වැඩෙක්දැයි සමූහයක් සමග ජීවත්වීම කෙරෙහි කලකිරී අදම යන්නෙමියි සිතා නැවත අද සුදුසු නැත. ඉදින් දැන් යන්නෙම් නම් මේ සියල්ලෝම දැනගනිත්. එනිසා හෙට යන්නෙමියි සිතීය. එදවසටද උරුවේලගමට සමාන ගමක ගම්වැසියෝ පසුදා දානය පිණිස ආරාධනා

කළහ. ඔවුහු අසූහාරදහසක් පැවිද්දන්ට ද මහාපුරුෂයාණන්ටද උදෑසන දානය පිළියෙල කර දුන්හ. ඉක්බිති මහා පුරුෂයා පසුවදා ඒ ගමෙහි ඒ පැවිද්දන් සමග බත්කිස නිමවා වාසය කරන තැනටම ගියේය. එහිදී ඒ පැවිද්දෝ මහා පුරුෂයාණන්ට වත් දක්වා තම තමන්ගේ රාත්‍රී නතරවන තැන්වලට, දවල් නතරවන තැන්වලටම පිවිසිය අතර බෝධිසත්ත්වයෝ පන්සලට පිවිස හුන්නේ :-

මධ්‍යාහ්න වේලාවේදී පක්ෂීන් නිහඬව හුන් කල්හි මහා වනය හඬ නගන්නාක් මෙන්ය. මට එය බියක් ඇතිකරයි. මෙබඳු උතුම් විවේකයෙහි ඇලුනවුන්ට භයක් ඇතිකල්හි සියළු සත්ත්වයන්ට මේ සිත්තැවුල් ඇතිකරන කාලයයි, නික්ම පන්සලේ දොර වසා බෝමැඩ දෙසට ගියේය. වෙන දිනවල මෙතැන හැසිරෙන්නේ බෝමැඩ දකියි. හිඳින්නට මොහුගේ සිතක් ඇතිවූයේ නැත. ඒ දවස වනාහි ඔහුගේ ඤාණය මේරීමට ගියේය. ඒ නිසා අලංකාර කළ බෝමැඩ දැක එයට නැගීමට සිතක් පහළවිය. ඔහු දකුණුදිසාව පැත්තෙන් පැමිණ පැදකුණුකොට පෙරදිග පැත්තෙහි දාහතර රියනක් ප්‍රමාණ පර්යංකයක් පනවාගෙන අංග සතරකින් යුත් වීර්ය අධිෂ්ඨාන කරගෙන බුදුවන තෙක් මෙතැනින් නො නැගිටිමි යි පොරොන්දු වී හුන්නේය. මේ ඔහුගේ හුදෙකලා බව නිසා 'හුදෙකලාව ගණයාගෙන් තොරව වාසය කෙළෙමි' කියා කියන ලදී.

**අඤ්ඤෙනෙවතානි** ඔව්හු වනාහි සවස බෝධිසත්ත්වයන්ට උපස්ථාන පිණිස අවුත් පන්සල වටකරගෙන සිටියාහු බොහෝවේලා ඉක්ම ගියේය. විමසිලිමත් වන්නයැයි පන්සල් දොර විවරකොට ඔහුව නොදක්නාහු කොහේ ගියේද, කොහේ ගියේද කියා පසුපස සොයා නොගියහ. මහා පුරුෂයන් වහන්සේ සමූහයා සමග ජීවත්වීම කෙරෙහි කලකිරුනේ හුදෙකලාව වාසය කරන්නට කැමැති වූයේ විය යුතුයයි සිතේ. බුදුවීම උන්වහන්සේව හමුවන්නෙමුයි දඹදිව අභ්‍යන්තරයට අභිමුඛව චාරිකාවේ ගියහ.

**වාසූපගතසස** යනු බෝමැඩ එක් රැයක් වාසය කරන්නට ගිය තැනැත්තාට, **රහොගතසස** රහසිගතව සිටියහුට **පතිසලලීනසස** හුදෙකලාව සැඟවී සිටින්නහුට, **කිචඡං දුක චවති ච උපපජ්ජති** ච යනු මේ දෙක වනාහි භවයෙන් භවයට යනු ච්‍යුති-ප්‍රතිසන්ධි දෙක සඳහා කියන ලදී. **ජරාමරණසස** යන මෙහි යම්හෙයකින් පැවිදි වන්නාහු ජරාවට පත්,

රෝගී, මළ අයම දැක පැවිදි වූවාහුය. ඒ නිසා ඔහුට ජරාමරණ දෙකම වැටහේ. ඒ නිසා කියන ලදී. (ජරා මරණසස) කියා, මෙසේ ජරාමරණ මුල්කොටගෙන ඇතුළට පිවිස සිටියා වූ භවාග්‍රයෙන් ඉවතට බසින්නහුට මෙනි.

ඉක්බිති මහණෙනි! විපස්සී බෝධිසත්ත්වයන් වහන්සේට මෙබඳු අදහසක් ඇතිවිය. **යොනිසො මනසිකාරො** - උපාය මනසිකාර හා පථ මනසිකාර (උපාය හා මාර්ග) අනිත්‍ය ආදිය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහු, එය යොනිසෝ මනසිකාර නම් වේ. මෙයද කුමක් ඇතිකල්හි ජාති ආදිය වේද කුමක් නැතිකල්හි නොවේද? හටගැනීම හා අභාවයට යාම සිහිකිරීම් වශයෙන් පැවති බැවින් එයින් අන්‍ය වූ, ඒ නිසා මොහුට මේ යෝනිසෝ මනසිකාරයෙන් මේ උපාය මනසිකාරයෙන් ප්‍රඥාවගේ අවබෝධය විය. බෝධිසත්ත්වයන්ගේ ප්‍රඥාවෙන්, යමක් ඇතිකල්හි ජරාමරණ දෙක සිදුවේද ඒ ජරාමරණ කාරණය සමග එක්වීම විය. එය වනාහි කුමක්ද? උපතයි. ඒ නිසා කීය. **ජාතියා ඛො සති ජරාමරණං හොති** (උපත ඇතිකල්හි ජරාමරණ වේ.) ජරාමරණ දෙකට හේතුකාරණ විමසන ප්‍රඥාව. ඒ ප්‍රඥාව සමග බෝධිසත්ත්වයන්ගේ එක්වීමක් විය යනු මෙහි අර්ථයි. මේ ආකාරයට සියළු පද දැනගත යුතුයි.

**නාමරූපෙ ඛො සති විඤ්ඤාණං** මෙහි වනාහි සංස්කාරයන් ඇතිකල්හි විඥානයද අවිද්‍යාව ඇතිකල්හි සංස්කාරයන් ද ඇතිවන්නේ යයි කිවයුතුය. ඒ දෙකම නොගන්නා ලදී. ඒ නිසා අවිජ්ජා සංඛාර දෙක අතීත භවයයි. ඒවා සමග මේ විදර්ශනාව නොගැටෙයි. මහා පුරුෂයන් වහන්සේ වනාහි වර්තමාන කාල වශයෙන් යෙදුනේ වෙයි. නොදක්නා ලද අවිජ්ජා සංඛාර ආදී වූ නොදුටු දෙයකින් අවබෝධයක් ලබන්නට නොහැක. සත්‍යයි. නොහැක. මොහු විසින් ඒ භව උපාදාන තණ්හා වශයෙන්ම දකින ලදැයි මෙතැන විස්තර වශයෙන් පටිච්ච සමුප්පාද කථාව කිවයුතුයි. මේ කාරණය විශුද්ධිමාර්ගයෙහි කියන ලදී. **පච්චුදාවත්තති** ආපසු හැරෙයි. කවරනම් වූ විඤ්ඤාණයක් මෙහිදී ආපසු හැරෙයි ද? පටිසන්ධි විඤ්ඤාණයත් විපස්සනා විඤ්ඤාණයත්ය. එහිදී ප්‍රතිසන්ධි විඤ්ඤාණය හේතු වශයෙන් ආපසු හැරෙයි. විදර්ශනා විඤ්ඤාණය අරමුණු වශයෙන් දෙකම නාමරූප ඉක්මවා නොයයි. නාමරූප දෙකින් ඉදිරියට නොයයි. මෙපමණක් හටගත්තේය යනාදියෙහි විඤ්ඤාණය නාමරූප දෙකට හේතුවන කල්හි නාමරූප දෙක

විඤ්ඤාණයට හේතුවේ. මේ දෙතැනට එකිනෙකට හේතුවීමෙන් මෙපමණකින් හටගත්තේය. හෝ උපදින්නේය. මෙයින් මතු අනිකෙක් කුමක් උපදවන්නේද, හටගන්නේද මෙයම හටගන්නේ උපදින්නේ නොවේද? මෙසේ එකිනෙක සමග එකට බැඳුනු ච්‍යුති ප්‍රතිසන්ධි ආදියෙන් පද පසක් යම් මේ නාමරූප හේතුවෙන් විඤ්ඤාණයත්, විඤ්ඤාණය හේතුවෙන් නාමරූපත් ඇතිවේයැයි කියා ඊට අනතුරුව අනුලෝම වශයෙන් ප්‍රත්‍යවන ආකාරයට විඤ්ඤාණය හේතුවෙන් නාමරූප මූලිකව ඉදිරියටත් ජරාමරණ දක්වන්නට නාමරූප පච්චයා සළායතනං (නාමරූප හේතුවෙන් ෂඩායතන පහළ වේ.) ආදිය කීය. එයින් සම්පූර්ණ දුක්ඛස්ඛන්ධය හටගනී යනුවෙන් සියළු ජාති ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්සුපායාස (ජාති-ජරා-මරණ-ශෝක-වැළපීම්-දුක-දොම්නස-සිත්තැවුල) යන භේද ඇති දුක් සමූහයේ හටගැනීම වන්නේය. මෙසේ මහා පුරුෂයාණෝ සියලු සසර දුකෙහි හටගැනීම දුටුවහ.

**සමුදයො සමුදයොති** ඛො උපත. උපත කියා හෝ අනනුස්සුතෙසු නොඇසූ, නොඇසූ විරූ, චක්ඛුං උදපාදි (ඇස පහළ විය.) ආදියෙහි මේ හටගැනීම දැකීමේ ප්‍රඥාවයි. දැකීම් අර්ථයෙන් චක්ඛු නම් වේ. නුවණ ඇතිකරන අර්ථයෙන් ඤාණ නම් වේ. වටහාගැනීමේ අර්ථයෙන් පඤ්ඤා වේ. කලකිරි, අවබෝධ කරගෙන හටගත් යන අර්ථයෙන් විජ්ජා නම් වේ. බැබලීම් යන අර්ථයෙන් ආලෝකයැයි කියන ලදී. මෙසේ කීය. චක්ඛුං උදපාදි - දැකීම් අර්ථයෙන් ඤාණං උදපාදි - නුවණ යන අර්ථයෙන්. වටහාගැනීමේ අර්ථයෙන් ප්‍රඥාවයි. විජ්ජා උදපාදි (විද්‍යාව පහළ විය) යන තැන අවබෝධ කිරීමේ අර්ථයෙන් ආලොකො උදපාදි යන තැන බැබලීම යන අර්ථයෙන් - චක්ඛුං යනු ධර්මය දකී යන අර්ථයි. ඤාණය ස්වභාවය වූයේ ඤාණයේ ප්‍රඥා ස්වභාවය දැනගන්නට යන අර්ථය. විජ්ජා යනු අවබෝධ කරගැනීමේ අර්ථය. ආලෝක ස්වභාවය බැබලීම් අර්ථයි. මෙපමණ පදවලින් කුමක් කියන ලද ද? මෙය ඇතිකල්හි මෙය වෙයි. හේතුව වටහාගැනීම් මාත්‍රය කියන ලදී. එසේ නැත්නම් මාර්ගයට පිළිපන් තරුණ විදර්ශනාව කියන ලදී.

**අධිගතො ඛො ම්‍යායං** යනු මා විසින් මෙය අවබෝධ කරගන්නා ලදී. **මග්ගො** යනු විදර්ශනා මාර්ගයයි. **බොධාය** චතුරාර්ය සත්‍ය අවබෝධ කරගැනීම **පිණිස**, නැත්නම් නිර්වාණය අවබෝධ කරගැනීම සඳහා **තවද බුජ්ඣතී** - අවබෝධ කරගන්නේනුයි බෝධි නම් වේ. මේ ආර්ය

මාර්ගයට නමකි. ඒ සඳහාය කියාද කියා ඇත. මෙසේ මහා පුරුෂයා සියලු සසර දුක නැවත නූපදින නිරෝධය දුටුවේය.

නිරොධො - නිරොධොති ඛො නූපදීම නොඉපදීම කියා චක්ඛුං ආදිය කියන ලද අර්ථයමය. මෙහි වනාහි මේ සියලුම පදවලින් මෙය නැතිකල්හි මෙය නොවේ. නිරෝධය හඳුනා ගැනීම් මාත්‍රයම කියන ලදී. නැත්නම් ඉහළට යන බලවත් විදර්ශනාව කියන ලදී.

අපරෙන සමයෙන යනු මෙසේ හේතුවද හේතුවේ නිරෝධයද දැනගෙන ඊට පසුව **උපාදානක්ඛන්ධෙසු** උපාදානයට හේතුව වූ ස්කන්ධයන්හි. **උදයබ්බයානුපස්සී** එයට පළමුව දකින ලදී. හටගැනීමද අභාවයද යන දෙකම බලන්නේ. **විහාසි** යනු මුදුන්පත් ඉහළට යන විදර්ශනාව වඩමින් වාසය කරයි. කුමක් නිසා මෙය කීවේද? ආත්මභාවයේදී දරුවකු උපන් දවසේ මහාබිනික්මන් කොට පැවිදිව කෙලෙසුන් නැසීමේ උත්සාහයේ යෙදී බෝමැඩට නැග මාරබලය නසා පළමුයාමයෙහි පෙරවිසූ කඳපිළිවෙල සිහිකරත්. දෙවෙනි යාමයෙහි දිවැස පිරිසිදු කරත්. තුන්වන යාමයෙහි ප්‍රත්‍යාකාරය (පටිච්ච සමුප්පාදය) විමසා බලා ආනාපාන සිව්වන ධ්‍යානයෙන් නැගිට පංචස්කන්ධයන්හි අභ්‍යන්තරයට පිවිස හටගැනීම අභාවය වශයෙන් පනසක් ලකුණු දැක ගොත්‍රභූ ඤාණ සංඛ්‍යාත විදර්ශනා වඩා ආර්යමාර්ගයෙන් සියළු බුද්ධ ගුණයන් අවබෝධ කරගතිත්.

මේ මහා පුරුෂයාණෝ ද පුරණ ලද පාරමී ඇත්තේ කියන ලද පරිදි සියල්ල පිළිවෙලින් නිමවා පශ්චිම යාමයේදී ආනාපාන චතුර්ථ ධ්‍යානයෙන් නැගිට පංච ස්කන්ධයන්හි පිවිස බලා කියන ලද ආකාර ඇති හටගැනීම හා විනාශ අරමුණු කරගත් විදර්ශනාව පටන් ගත්තේය. එය දැක්වීමට මෙය කියන ලදී.

එහි **ඉතිරූපං** යනු මේ රූපය - මෙපමණක් රූපය - මෙයින් උඩට රූපයක් නැත යන වෙනස්වන ස්වභාවය නිසාම මහාභූත දැඩිව ගැනීම ආදී භේද මුල්කොට **ලක්ඛණ** - ලකුණ - රස - රසය **පච්චුපට්ඨාන** වැටහීම - **පදට්ඨාන** - ආසන්න කාරණය ආදී වශයෙන් සියලු රූපයන් ගැනීම කියන ලදී.

**ඉති රූපසස සමුදයො** යනු මෙයින්, මෙසේ ගන්නා ලද රූපයේ හටගැනීම පිළිබඳ විදර්ශනාව කියන ලදී. එහි **ඉති** යනු මෙසේ හටගැනීම වන්නේය යන අර්ථයි. එහි විස්තරය අවිද්‍යාව හටගැනීමෙන් රූප හටගැනීමත්, තණ්හාව ඇතිවීමෙන් රූප හටගැනීමත්, කර්ම හටගැනීමෙන් රූප හටගැනීමත් ආහාර හටගැනීමෙන් රූප හටගැනීමත් යන ලෙස උපතට හේතුව දකින්නේද රූප ස්කන්ධයාගේ හටගැනීම දකීනුයි මෙසේ දතයුතුයි. විනාශයට යාමේදී අවිජ්ජාව නැතිවීමෙන් රූප නිරෝධය වේ. -පෙ- වෙනස්වන ලක්‍ෂණ දකින්නේ රූපස්කන්ධයාගේ නිරෝධය දකින්නේය. මේ විස්තරයයි.

**ඉතිවෙදනා** යනු ආදියෙහි මේ වේදනාව, මෙපමණක් වේදනාව මෙයින් උඩට වේදනාවක් නැත. මේ සඤ්ඤාවයි. මේ සංස්කාරයෝය. මේ විඤ්ඤාණයයි. මෙපමණක් විඤ්ඤාණය. මෙයින් උඩට විඤ්ඤාණයක් නැතය යන දැනගන්නා ලද හඳුනා ගන්නා, කර්ම රැස්කරගන්නා, දැනගැනීමේ ස්වභාවය සැපය ආදී රූප සඤ්ඤාවන්, ස්පර්ශය, චක්ඛු විඤ්ඤාණය ආදී භේදයන්ද මුල්කොට ලකඛණ රස පච්චුපට්ඨාන පදට්ඨාන වශයෙන් සියළුම වේදනා, සඤ්ඤා - සංඛාර විඤ්ඤාණ සමූහය කියන ලදී.

**ඉති වෙදනා සමුදයො** ආදියෙන් වනාහි මෙසේ අල්ලාගන්නා ලද වේදනාවන්ගේ සඤ්ඤා සංඛාර විඤ්ඤාණ ලක්‍ෂණයන් කියන ලදී. සමුදය දර්ශනය කියන ලදී. එහි ද **ඉති** යනු මෙසේ සමුදය (හටගැනීම) වන්නේය යන අර්ථයි. ඒවායේ ද විස්තර අවිජ්ජාව හටගැනීමෙන් වේදනා හටගනී යැයි රූපයෙහි කියන ලද ආකාරයෙන්ම දතයුතුය. මෙය වනාහි විශේෂයයි. ස්කන්ධ තුනක ආහාර සමුදයෙන් යැයි නොකියා එසස සමුදයා (ස්පර්ශය හටගැනීමෙන්) යැයි කිවයුතුයි. විඤ්ඤාණ ස්කන්ධයෙහි නාමරූප හටගැනීමෙන් කියා අර්ථ ගැනීමට අවශ්‍ය පදය ද යෙදිය යුතුයි. මේ මෙහි කෙටි අර්ථයි. විස්තර වශයෙන් හටගැනීම හා විනාශය පිළිබඳ විනිශ්චය සියලු ආකාරයෙන් පරිපූර්ණව විශුද්ධි මාර්ගයෙහි කියන ලදී.

**තසස පඤ්චා සුපාදානකඛන්ධෙසු උදයබ්බයානු පසසිනො විහරතො** ඒ විපස්සි බුදුන්ගේ මේ රූපාදි පංච උපාදාන ස්කන්ධයන්හි සමප්‍රඥා, සලක්‍ෂණ වශයෙන් හටගැනීම හා අභාවය බලමින් වාසය කරන්නහුගේ

පිළිවෙලින් වැඩුනු විදර්ශනා ඥානය නැවත නූපදවීමෙන්, නිරෝධයෙන් නැතිව යන්නා වූ ආශ්‍රව සංඛ්‍යාත වූ කෙලෙස් දැඩිව නොගෙනම සිත මිදුනේය. ඒ මෙය මාර්ගක්‍ෂණයෙහි මිදෙයි නම් වේ. ඵලක්‍ෂණයෙහි මිදුනු නම් වේ. මිදෙයි. ඵලක්‍ෂණයෙහි මිදුනු. මෙපමණකින් මහා පුරුෂයෝ සියළු බැඳීම්වලින් මිදුනේ සූර්යරශ්මිය වැදුනු පියුමක් මනාව පිපුණාක් මෙන් මනාව පිපුණු චිත්ත සන්තාන ඇත්තේ චාතුර්මාර්ග සත්‍යයන්ද චතුර් ඵලඥානයන් ද පටිසම්භිදා සතරද සිව්යෝනි පිළිසිඳ දැනගැනීමේ නුවණ ද පංචගති චෙත්කර දැනගැනීමේ නුවණ ද සයවැදෑරුම් අසාධාරණ ඤාණයන් ද සියළු බුදුගුණයන් අත්පත් කරගෙන සම්පූර්ණ වූ බලාපොරොත්තු ඇත්තේ බෝමැඩ හුන්නේ.

**අනෙකජාති සංසාරං - සන්‍ධාවිසසං අනිබ්බිසං**
**ගහකාරකං ගවෙසනෙතා - දුක්ඛා ජාති පුනප්පුනං**

**ගහකාරක දිට්ඨොසි - පුනගෙහං න කාහසි**
**සබ්බා තෙ ඵාසුකා - භග්ගා ගහකූටං විසංඛිතං**
**විසංඛාර ගතං චිත්තං - තණ්හානං ඛය මජ්ඣගා**

**අයො ඝන හතසෙසව - ජලතො ජාතවෙද සො**
**අනුපුබ්බූපසනතසස - යථා න ඤායතෙ ගති**

**එවං සම්මා විමුත්තානං කාම බන්‍ධො සතාරිනං**
**පඤ්ඤාපෙතුං ගති නත්ථි පත්තානං අචලං සුඛං**

ගෙය සදන්නා වූ තැනැත්තාව සොයමින් සොයාගත නොහැකිව අනන්ත වූ ආත්ම ගණනාවක් සසර ඇවිද්දෙමි. පුනර්භවය නම් වූ ජාතිය දුකය.

ගෙය සාදන්නා දුටුවෙහිය. නැවත ගෙය නොකරන්නෙහිය. සියළු පරාළ ආදී උපකරණ බිඳ දමන ලදී. කැණිමඬල විනාශ කරන ලදී. ලෞකිකත්වයෙන් වෙන් වූ සිත තණ්හාවේ ක්‍ෂය බවට පත්කළේය.

යකඩ මුගුරකින් පහරකන ලද්දහු ගිනිජාලාවෙන් දැවුනහු මෙන් පිළිවෙළින් උපශාන්ත වූවහුගේ ගතියක් නොපෙනේ.

මෙසේ කාම බන්ධන නමැති ඕසය තරණය කළ මනාව මිදුනා වූ අචල වූ සැපයට පැමිණි උතුමන්ගේ ගතියක් පෙන්විය නොහැක.

තුන්වන බණවරෙහි යනනූනාහං ධම්මං දෙසෙයාං යදින් වනාහි මම ධර්මය දේශනා කරන්නෙම්ද, මේ විතර්කය කවදා ඇතිවීද? බුදුබව ලබා අටවන සතියෙහි උන්වහන්සේ වනාහි බුදු වී දවස් හතක් බෝමැඩ හුන්නේය. එතැන් පටන් දින හතක් බෝධි පල්ලංකය බලමින් සිටියේය. දින හතක් රුවන් සක්මනෙහි සක්මන් කළේය. දින හතක් රුවන්ගබෙහි ධර්මය සිහිකරමින් වැඩසිටියේය. සත්දිනක් අජපල් නුගරුක මුල සිටියේය. සත්දිනක් මුචලින්ද නාගදරණයේ සිටියේය. සත්දිනක් රාජායතනයේ සිටියේය. එයින් නැගිට අටවන සතියෙහි නැවත අවුත් අජපාල නිග්‍රොධ මූලයේ හුන් සියළු බුදුවරයන්ට පුරුදු මෙයමය. මෙයට අමතර විතර්කයක් ද පහළවිය.

එහි අධිගතො යනු අවබෝධ කළ ධම්මො යනු චතුරාර්ය සත්‍ය ධර්මය. ගම්භීරො නොගැඹුරු බව ප්‍රතික්ෂේප කරන වචනයකි. දුද්දසො ගැඹුරු බව නිසා දැකීමට අපහසු දුකසේ දැකිය යුතු, ලෙහෙසියෙන් දකින්නට අමාරු, දැකීමට අපහසු බැවින්ම දුරනුබොධො දුකසේ අවබෝධ කරගත යුතු, පහසුවෙන් අවබෝධ කරගන්නට නොහැකි. සනෙතා නිවුණු. පණීතො තෘප්තියට පත්කළ නොහැකි. මේ දෙකට ලෝකුත්තර බව සඳහාම කියන ලදී.

අතක්කාවචරො තර්කයෙන් අවබෝධ කළ නොහැකි, බැසගත නොහැකි. නුවණින්ම අවබෝධ කළයුතු. නිපුණො සියුම් වූ. පණ්ඩිත වෙදනීයො මහා ප්‍රතිපදාවට පිළිපන් පණ්ඩිතයන් විසින් දතයුතුය. ආලයරාමා සත්ත්වයෝ පස්කම් ගුණයන්හි ඇලෙත්. ඒ නිසා ඔවුහු ආලයා යැයි කියති. අටසියයක් තණ්හාසේවිතවලට ආලය කරත්. ඒ නිසා ආලයා යැයි කියත්. ඒ ආශා කරන දෙයින් සතුටු වේනුයි ආලය රාමා. ආශාකරන දෙයෙහි ඇලුනු ආලයරතා ආශාකරන වස්තූන්හි මනාව සතුටුවෙත්ද, ඒ ආලය සම්මුදිතා යම්සේ වනාහි මනාව සකස්කළ මල්ගෙඩිවලින් බර වූ උයනට පිවිසි රජතුමා ඒ ඒ සැපතින් සතුටු වෙයි. සතුටට, ප්‍රමුදිත බවට පත්වෙයි. කලකිරෙන්නේ නැත. සවසද ඉන් නික්ම යන්නට අකමැති වෙයි. මෙසේ මේ කාමවස්තූන් කෙරෙහි ඇලී සතුටු

වෙත්. සසරෙහි ප්‍රීති සොම්නස් බවට පැමිණ කලකිරීමක් නැතිව වාසය කරත්. ඒ නිසා ඔවුන්ට භාග්‍යවතුන් වහන්සේ දෙවැදෑරුම් ආලය ඇතිකරන උයන්බිමක් මෙන් දක්වන්නේ 'ආලයරාමා' ආදිය කීය. **යදිදං** යනු නිපාතයකි. ඒ තැන සඳහා යම් මේ දෙයයැයි පටිච්ච සමුප්පාදය සඳහාය යන අර්ථය දතයුතුය.

**ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො** මොවුන්ගේ හේතුවෙන් යනු ඉදප්පච්චයා. ඒ බවම ඉදප්පච්චයතා පටිච්ච සමුප්පාදයයි. සංස්කාර ආදි ප්‍රත්‍යයන් වූ අවිජ්ජා ආදියට මේ තවත් නමකි. **සබ්බ සංඛාරසමථො** ආදී සියල්ල නිර්වාණයමය. යම්හෙයකින් එයට පැමිණ සියළු සංස්කාරයන්ගේ දැගලීම් සංසිඳේ. ඒ නිසා සබ්බසංඛාර සමථ යැයි කියයි. යම්හෙයකින් එයට පැමිණ සියළු උපධීන් දුරුකළා වේ. සියළු තණ්හාවන් ක්‍ෂය වී යයි. සියළු කෙලෙස් රාගයන්හි නොඇලෙත්. සියළු දුක් නැතිව යයි. ඒ නිසා සියළු උපධීන් දුරුකිරීම තණ්හාව ක්‍ෂය කිරීම, විරාගය, නිරෝධය යනුවෙන් කියති.

ඒ මේ තෘෂ්ණාව වනාහි භවයෙන් භවයට හෝ ඵලය සමග හෝ කර්මය නම්මවා ගනී. වසා ගනී යන ලෙස 'වාන' (තෘෂ්ණාව) කියා කියති. ඒ වානයෙන් (තෘෂ්ණාවෙන් නික්ම ගියේය) යන අර්ථයෙන් නිබ්බාණං (නිවන) යැයි කියයි. **සො මමස්ස කිලමථො** යම් ඒ නොදන්නවුන්ගේ දේශනාවක් වේද එය මට පීඩාවක් වන්නේය. එය මට වෙහෙසක් වන්නේය යන අර්ථයි. සිරුරට පීඩාවීම මෙන්ම කයට වෙහෙසවීමද වන්නේ යැයි කියන ලදී. බුදුවරයන් වහන්සේලාගේ සිතෙහි වනාහි මේ දෙකම නැත. **අපිස්සු** යනු වැඩීම් අර්ථයෙහි නිපාතයකි. හුදෙක් මෙබඳු අදහසක් පමණක් නොවීය. මේ ගාථාවන්ද කීවේයැයි දක්වයි.

**විපස්සී** යනාදියෙන් භාග්‍යවත්, අර්හත්, සම්මා සම්බුද්ධ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ. **අනච්ඡරියා** යනු පුදුමවිය යුත්තක් නොවේ. **පටිභංසු** වැටහීම් සංඛ්‍යාත ඥාණයට ගොදුරු විය. විමසා බැලිය යුතු තත්ත්වයට පත්විය. **කිච්ඡෙන** දුකෙන්, දුක්ඛ ප්‍රතිපදාවෙන් නොවේ. බුදුවරයන්ගේ වනාහි සිව්මග සුඛ ප්‍රතිපදාවක්ම වන්නේය. පාරමිතාවන් පුරන කල්හි රාග සහිත, දොස් සහිත, මෝහ සහිතවම ඇතිකල්හි ආවා වූ යාචකයන්ට, සරසා පිළියෙල කළ හිස කපා වැගිරෙන ලේ බැහැරකොට,

ඇස් උපුටා කුලවංශයට පහනක් බඳු පුත්‍රයාවත්, ප්‍රියමනාප වූ භාර්යාවත්, මේ ආදීන් දන් දෙන්නහුගේත් ක්ෂාන්තිවාදී සමාන ආත්මභාවවලදී සිඳීම් බිඳීම් ආදියට පමුණුවන්නහුගේ පැවති ප්‍රතිපදාව සඳහා මෙය කියන ලදී. හලං මෙහි 'හ' කාරය නිපාත මාත්‍රයකි. ප්‍රයෝජනයක් නැත යන අර්ථයි. **පකාසිතුං** දේශනා කරන්නට මෙසේ අපහසුවෙන් අවබෝධ කරගත් ධර්මය දේශනා කිරීමක් අවශ්‍ය නැත. දේශනා කිරීමෙන් කවරනම් ප්‍රයෝජනයක්ද, කවර අර්ථයක් ද යැයි කියන ලදී. **රාගදොසපරෙතෙහි** රාගයෙන් හා ද්වේෂයෙන් ස්පර්ශ වූ රාග දෝස දෙකින් අනුගත වූ **පටිසොතගාමිං** නිත්‍ය ආදීන්ට විරුද්ධ වූ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අසුභ යන ලෙස කොටස් වූ චතුරාර්ය සත්‍යය ධර්මය, **රාගරත්තා** කාමරාගයෙන්, භව රාගයෙන්, දිට්ඨි රාගයෙන් රත්වූ **න දක්ඛින්ති** අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අසුභ යන මේ ආකාරයෙන් නොබලත්. ඔවුන් මෙසේ නොදකින කල්හි මේ ආකාරයෙන් අවබෝධ කරවන්නට කවරෙක් නම් සමත් වන්නේද?

**අප්පොස්සුක්කතාය** යනු උත්සාහය නැතිව දේශනා නොකරනු කැමැත්තෙන් යන අර්ථයි. කුමක් නිසා මොහුගේ සිත නැමුනේද? මිදුනා වූ මෙතෙම මුදවන්නෙමි. එගොඩට ගියෙම් එගොඩ කරවන්නෙමි නොවේද?

මෙහි නොදන්නා වේශයකින් ධර්මය වටහාගැනීමෙන් ඇති ඵලය කුමක්ද? සර්වඥ බවට පත්ව දෙවියන් සහිත ලෝකයාව එතර කරන්නෙමි.

මෙසේ ප්‍රාර්ථනා කර පාරමිතා පුරා සර්වඥ බවට පත්වූයේය කියායි. මෙය සත්‍යයකි. ප්‍රත්‍යවේක්ෂා කිරීමේ අනුභාවයෙන් වනාහි ඔහුගේ සිත මෙසේ නැමුනේය. සර්වඥ බවට පැමිණ සත්ත්වයන් කෙලෙස්වලින් පිරී ඇති බවත් ධර්මයෙහි ගැඹුරුබවද මෙනෙහි කරන්නා වූ ඔහුට සර්වප්‍රකාරයෙන්ම ප්‍රකට විය. ඉක්බිති මේ සත්ත්වයෝ කැඳ පිරවූ ලබුකැටයක් මෙන් ද මෝරු පිරූ සැළියක් මෙන් ද වසාතෙල් පෙඟවූ රෙදිකඩක් මෙන් ද අඳුන් තවරා ගත් අත් ඇත්තකු මෙන් ද කෙලෙස්වලින් හරිතව අතිශයින් කිළිටි බවට පත්වූවාහු රාගයෙන් රත්වූවාහු ද්වේෂයෙන් දූෂිත වූවාහු මෝහයෙන් මුලා වූවාහු කෙසේ නම් අවබෝධ කරගන්නාහුදැයි සිතන්නා වූ ඔහුට කෙලෙස්වලින් ගහණ බව ප්‍රත්‍යවේක්ෂා කිරීමේ අනුභාවයෙන් මෙසේ සිත නැමුනේය. මේ ධර්මයද පොළව දරාසිටින ජලකඳක් මෙන් ගැඹුරුය.

පර්වතයකින් වසාතබන ලද්දාක් මෙන් දුකසේ දැකිය යුතු කොටස් සියයකට බිඳීගිය අශ්ව ලොමක අග මෙන් වටහාගත නොහැකි, මේ ධර්මය වටහා ගන්නට උත්සාහ කරන්නා වූ මා විසින් නුදුන් දනක් නම් නැත. නොරැකි ශීලයක් නම් නැත. නොපිරූ විරූ පාරමිතාවක් නම් නැත. ලෙහෙසියෙන් මෙන් මාරබලය පරදවා ලූ කල්හිද පොළව කම්පා නොවීය. පළමු යාමයෙහි පූර්වේනිවාසය අනුස්මරණය කරනවිටත් කම්පා නොවීය. මධ්‍යම යාමයෙහි දිවැස පිරිසිදුකරන කල්හිත් කම්පා නොවීය. පශ්චිම යාමයෙහි වනාහි පටිච්ච සමුප්පාද ධර්මය මා විසින් වටහාගන්නා කල්හි දසසහශ්‍රී ලෝකධාතුව කම්පා විය. මෙසේ මා වැනි සියුම් නුවණක් ඇත්තහු විසින් ද මේ ධර්මය ඉතා අපහසුවෙන් අවබෝධ කරගන්නා ලදී. ඒ ධර්මය ලෞකික මහාජනයා කෙසේනම් අවබෝධ කරගන්නාහුදැයි ධර්මයෙහි ගැඹුරුබව මෙනෙහි කිරීමේ අනුභාවයෙන් සිත නැමුනේ යයි දතයුතුයි. තවද බ්‍රහ්මයා විසින් අයැදි කල්හි දේශනාකරනු කැමැත්තහුගේ සිත මෙසේ නැමුනේය. උනන්දුවක් නැති තත්ත්වයට මගේ හිත යොමුවන කල්හි මහා බ්‍රහ්මයා ධර්මදේශනාව සඳහා අයදින්නේය යැයි භාග්‍යවතුන් වහන්සේ දනියි. මේ සත්ත්වයෝද බ්‍රහ්මයාට ගරු කරන්නෝය. ඉක්බිති ඔවුහු මෙසේ සිතත්. ශාස්තෲන් වහන්සේ වනාහි ධර්මය දේශනා නොකරන්නට සිතීය. ඉක්බිති ඔහුට මහා බ්‍රහ්මයා ඉල්ලීමක් කර ධර්මය දේශනා කරවීය. ඒ ධර්මය වනාහි ශාන්තය. ප්‍රණීතය කියා හඟින සත්ත්වයෝ ඇහුම්කන් දෙනු කැමැත්තාහු වෙත්. මේ කාරණය නිසා ධර්මය දේශනා කිරීමට උනන්දුවක් නැතිවීයැයි දතයුතුයි.

**අඤ්ඤතරස්ස** යනු මෙහි කිසිවෙක් යැයි කීය. ඉක්බිති මේ සක්වල ප්‍රධාන මහා බ්‍රහ්මයා මොහුයැයි දතයුතුයි. **නස්සතිවතභො** යම්සේ දසසහශ්‍රී ලෝකධාතුවේ බ්‍රහ්මයෝ අසා සියල්ලෝම රැස්වූවාහුද එපරිද්දෙන් මේ හඬ නිකුත් කළේය. **යත්‍රහි නාම** යනු යම් ඒ ලෝකයක. **පුරතො පාතුරහොසි** ඒ දසදහසක් බ්‍රහ්මයන් සමග පහළ විය. **අප්පරජක්ඛජාතිකා** ප්‍රඥාමය ඇසෙහි අල්ප වූ, සුළු වූ රාග දෝස මෝහ රජස් මොවුන්ට ඇත්තේනුයි මෙබඳු ස්වභාව ඇත්තේනුයි අප්පරජක්ඛජාතිකා නම් වේ. **අස්සවනතා** නොඅසන බව. **භවිස්සනති** වන්නාහ. කලින් බුදුවරයන් වහන්සේලාගේ කාලවලදී දසපුණ්‍ය ක්‍රියා වශයෙන් කරන ලද ප්‍රාර්ථනා ඇත්තාහු මේරූ පද්මයන් මෙන් හිරුඑලියේ ස්පර්ශය නමැති ධර්මදේශනාවම බලාපොරොත්තු වන්නාහු පේළි සතරක ගාථාවසානයේ

ආර්යමාර්ගයට බසිනු කැමැති එක්කෙනෙක් නොවෙයි. දෙදෙනෙක් නොවෙයි. නොයෙක් සියදහස් ගණන් ධර්මය වටහා ගත්තෝ වන්නාහුයැයි දක්වයි. **අජ්ඣෙසනං** මෙසේ තුන්වරක් ඉල්ලා සිටීම. **බුද්ධචක්ඛුනා** ඉන්ද්‍රිය පරොපරිය ඤාණයෙන්ද ආසයානුසය ඤාණයෙන්ද යන මේ ඤාණ දෙක බුද්ධචක්ඛු නම් වේ. සර්වඥතා ඥානය සමන්තචක්ඛු නම් වේ. මාර්ග ඥාන තුන ධම්මචක්ඛු නම් වේ.

**අප්පරජක්ඛෙ** යනාදියෙහි යමකුට කියන ලද පරිද්දෙන් ප්‍රඥා චක්ෂුසෙහි රාගාදි රජස් අල්පවේද ඔව්හු **අප්පරජක්ඛා** නම් වෙත්. යමෙක් හට ඒවා බොහෝ වේද, ඔවුහු **මහා රජක්ඛා** නම් වේ. යමකුගේ ශ්‍රද්ධා ආදී ඉන්ද්‍රියයන් තියුණු වේද ඔවුහු **තික්ඛින්ද්‍රියා** ය. යමකුගේ ඒවා මෘදු වේද, ඔවුහු **මුදින්ද්‍රියා** වේ. යමකුගේ යම් ඒ ශ්‍රද්ධා ආදී ස්වභාවයන් සුන්දර වේ ද ඔව්හු **සවාකාරා** නම් වේ. යමෙක් කියන ලද කාරණය සළකත්ද පහසුවෙන් දන්වන්නට හැකිවෙත්ද ඔව්හු **සුවිඤ්ඤාපයා** නම් වේ. යමෙක් පරලොවත් වරදත් භය ලෙස දකිත්ද ඔවුහු **පරලොකවජ්ජභය දස්සාවිනො** නම් වෙති. මේ වනාහි මෙහි පෙළයි. ශ්‍රද්ධාවන්ත පුද්ගලයා අල්ප රජක්ෂ නම් වේ. ශ්‍රද්ධා නැති පුද්ගලයා මහා රජක්ෂ වේ. පටන් ගන්නා ලද වීර්ය ඇති, කම්මැලි. එළඹසිටි සිහි ඇති මුලා වූ සිහි ඇති, එක්තැන් වූ, සිත එක්තැන් නොවූ, ප්‍රඥාවන්ත, ප්‍රඥාවන්ත නොවූ පුද්ගලයා මහාරජක්ෂ නම් වේ. එපරිද්දෙන් ශ්‍රද්ධාවන්ත පුද්ගලයා සියුම් ඉන්ද්‍රියන් ඇත්තේ -පෙ- ප්‍රඥාවන්ත පුද්ගලයා පරලොව වරදෙහි බිය දකින්නේ - ප්‍රඥාව අඩු පුද්ගලයා පරලොව වරදෙහි බිය නොදකී.

**ලොකො** යනු ස්කන්ධ ලෝකය - ධාතු ලෝකය, ආයතන ලෝකය, සම්පත්ති සම්භව ලෝකය, විපත්ති භව ලෝකය, සම්පත්ති ලබන ලෝකය, විපත් හටගන්නා ලෝකය, එක ලෝකයක් සියලු සත්ත්වයෝ ආහාර මුල්කරගෙන සිටින්නාහ. ලෝක දෙකක් නාමරූප නම් වේ. ලෝක තුනක් වේදනාත්‍රය ලෝක සතර සතරාකාර ආහාරය. ලෝකපස පංච උපාදාන ස්කන්ධ, ලෝක සය නම් ආධ්‍යාත්මික ආයතන සය. සප්ත ලෝක නම්. සත් විඤ්ඤාණයන්ගේ පිහිටීම, ලෝක අට, අෂ්ටලෝක ධර්මයයි. ලෝක නවය සත්තාවාස නවයයි. ලෝකදසය නම් ආයතන දසයයි. ලෝක දොළස නම් ආයතන දොළසයි. අටළොස් ලෝකනම් අටළොස් ධාතුන්ය.

වජ්ජං සියළු කෙළෙස් වැරදිනම් වේ. සියළු දුශ්චරිත වැරදිය. සියළුම කර්ම රැස්කිරීම වැරදිය. සියළු භවගාමී කර්ම වැරදිය. මේ ලෝකයෙහි මෙසේ මේ වරදෙහි බලවත් භය සංඥාවක් එළඹ සිටියේ වෙයිද යම්සේ වධකයන් කඩුව ඔසවා සිටි කල්හි මෙන් මේ ක්‍රම පනහකින් මේ පංච ඉන්‍ද්‍රියන් දනියි ද දකී ද දැනගනීද අවබෝධ වේද, මේ තථාගතයන් වහන්සේගේ ඉන්‍ද්‍රිය පරොපරියත්ත ඤාණය නම් වේ.

උප්පලිනියං උපුල් වනයෙහි අන් ඒවායේද මේ ක්‍රමයටමය. අනෙකා නිමුග්ග පොසිනී යම් යම් අනික් පද්මයෝ ඇතුලෙහි ගිලුනාහු පෝෂණය කරත්. උදකං අච්චුග්ගම්ම තිට්ඨනති ජලය ඉක්මවා සිටිත්. එහි යම් ඒ උඩට නැගී සිටියා වූ ඒවා හිරුඑළිය වැදීම බලාපොරොත්තුවෙන් සිටියේද අද පිපෙන්නේ ද යම් ඒ හැකිළී තිබෙන ඒවා හෙට පිපෙන ඒවාය. යම් ඒ ජලය තුළ රැඳී තිබෙන එයින් පෝෂණය වන ඒවා වේද ඒ තුන්වන දවසෙහි පිපෙන ඒවාය. යම් ඒ ජලයේ ගිලී ඇති අනිකුත් පියුම් උපුල් ආදිය වේ. ඒවා පිපෙන්නේ නැත. මත්ස්‍යයන්ට, කැසුබුවන්ට ආහාර වේ. ඒවා පෙළෙහි නොනැගුනේය. පිටතින් ගෙනවුත් දැක්විය යුතුය.

යම්සේ වනාහි ඒ සිව්ආකාර මල් වේද එපරිද්දෙන් උග්ඝටිතඤ්ඤ, විපචිතඤ්ඤ, නෙය්‍ය, පදපරම යැයි පුද්ගලයෝ සතර දෙනෙකි. මෙහි, යම් පුද්ගලයකු හට කියන ලද වේලෙහිම ධර්මය වැටහීම වන්නේද, මේ පුද්ගලයා උග්ඝටිතඤ්ඤ වේ. යම් පුද්ගලයකු හට කෙටියෙන් කියන ලද්ද විස්තර වශයෙන් අර්ථය බෙදා බලන කල්හි ධර්මාවබෝධය වන්නේද මේ පුද්ගලයා විපචිතඤ්ඤ යැයි කියැවේ. යම් පුද්ගලයකුට අසන කියන නුවණින් මෙනෙහි කරන කල්‍යාණ මිත්‍රයන් සේවනය කරන භජනය කරන ඇසුරුකරන පිළිවෙලින් ධර්මාවබෝධය වන්නේද මේ පුද්ගලයා නෙය්‍ය නම් වේ. යම් පුද්ගලයකුට ඇසුවත්, බොහෝකොට කීවත් බොහෝකොට ධාරණය කරගත්තත්, බොහෝකොට කියත්නහුම ඒ ජාතියේදී ධර්මාවබෝධය නොවෙයි. මේ පුද්ගලයා පදපරම නම් වේ. එහිදී භාග්‍යවතුන් වහන්සේ උපුල්වනය හා සමාන දසදහසක් ලෝකධාතුව දෙස බලන්නේ අද පිපෙන මල් වැනි උග්ඝටිතඤ්ඤ පුද්ගලයන්ද හෙට පිපෙන මල්වැනි විපචිතඤ්ඤ පුද්ගලයන්ද තුන්වන දවසේ පිපෙන නෙය්‍ය පුද්ගලයන්ද මත්ස්‍යයන්ට කැස්බාවන්ට ගොදුරුවන මල් වැනි පදපරම පුද්ගලයන්ද දුටුවේය. එසේ බලන්නේ මෙපමණක් ජනයා අල්ප වූ කෙලෙස්

ඇත්තෝය. මෙපමණක් බොහෝ කෙලෙස් ඇත්තෝය. එහිද මෙපමණක් උගඝටිතඤ්ඤූ ආදි ලෙස සියළු ආකාරයෙන්ම දුටුවේය.

එහිද පුද්ගලයන් තුන් දෙනෙකුට මේ ආත්මභාවයේදී භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාවෙන් රහත්බව ලැබේ. පදපරම පුද්ගලයන්ට අනාගතය පිණිස වාසනා ඇත. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ පුද්ගලයන් තුන්දෙනාටම ප්‍රයෝජනවත් ධර්මදේශනාව දැනගෙන දේශනා කිරීමට කැමැත්තක් ඇතිකරගෙන නැවත භවත්‍රයේ සියළුම සත්ත්වයන් භබ්බ, අභබ්බ (යෝග්‍ය - අයෝග්‍ය) වශයෙන් කොටස් දෙකකට බෙදීය. කවුරුන් සඳහා කියන ලද්දේ ද? යම් ඒ සත්ත්වයෝ කර්මබාධාවෙන් යුක්තද. විපාක බාධාවෙන් යුක්තද කෙලෙස් බාධාවෙන් යුක්තද ශ්‍රද්ධාව නැති, කැමැති බවක් නැති, දුෂ්ප්‍රාඥ වූ කුසල් දහම්හි නිවැරදි ස්වභාවයට පත්වන්නට නොහැකි මේ සත්ත්වයෝ අභබ්බ නම් වෙති.

භබ්බ සත්ත්වයෝ කවරහුද? යම් ඒ සත්ත්වයෝ කර්මයාගේ ආවරණයෙන් යුක්ත නොවූයේ වෙත්ද -පෙ- මේ සත්ත්වයෝ භබ්බ නම් වෙත්. මෙහිදී සියළුම අභබ්බ පුද්ගලයන් හැර භබ්බ පුද්ගලයන්ම ඤාණයෙන් විමසා, මෙහි මෙපමණක් රාග චරිතයන්ය. මෙපමණක් දෝස, මෝහ, විතර්ක, සද්ධා, බුද්ධි යන කොටස්වලට බෙදන ලදී. මෙසේ කොට ධර්මය දේශනා කරන්නෙමියි සිතීය. බ්‍රහ්මයෝ ඒ බව දැනගෙන සොම්නස් සහගතව භාග්‍යවතුන් වහන්සේට ගාථාවන්ගෙන් ප්‍රකාශ කළේය. මේ වෙනුවෙන් 'අථ ඛො සො භික්ඛවෙ බ්‍රහ්මා' (මහණෙනි, ඉක්බිති ඒ බ්‍රහ්මයා) ආදිය කියන ලදී. එහි **අජ්ඣභාසි** ප්‍රකාශ කළේය. ආරභයා ප්‍රකාශ කළේය යන අර්ථයි.

**සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො** ශෛලමය වූ ඒකඝන වූ පර්වත මුදුනෙහි හිටි ලෙසට, එහි සිටියහුට දැකීම පිණිස බෙල්ල උස්කිරීම, දිග්කිරීම ආදී කටයුතු ඇත. **තථූපමං** යනු එයට සමාන වූ, ශෛල පර්වතයක් බඳු වූ, මේ වනාහි මෙහි කෙටි අර්ථයි. යම්සේ ශෛල පර්වතය මුදුනේ සිටියා වූ ඇස් ඇති පුරුෂයා හාත්පස ජනයාව දකින්නේය. එපරිද්දෙන් ඔබ ද නුවණැති, මහාප්‍රාඥ වූ සර්වඥතා ඤාණයෙන් යුත් සමන්තචක්ඛු වූ භාග්‍යවතුන් වහන්සේ ධර්මමය ප්‍රඥාමය ප්‍රාසාදයට නැගී තෙමේ පහ වූ ශෝක ඇත්තේ ශෝකයෙන් පීඩාවට පත් ජාතිජරාවෙන් මඩනා ලද ජනතාව බලන්න. සළකාගන්න. පරීක්ෂාකර

බලන්න. මේ වනාහි මෙහි බලාපොරොත්තු අර්ථයයි. යම්සේ පර්වතය පාමුළ හාත්පස මහත් වූ කුඹුරක් කොට එහි නියරවල කුටි සාදවා රාත්‍රියෙහි ගිනි දැල්වූහ. චතුරංග සමන්විත අන්ධකාරය වන්නේය. ඉක්බිති මේ පර්වතය මුදුනෙහි සිට බිම බලන්නා වූ ඇස් ඇති පුරුෂයකු කුඹුර හෝ නියරවල් හෝ පැල්පත් හෝ එහි නිදාගත් මිනිසුන් හෝ නොපෙනෙන්නේය. පැල්වල ගිනිදැල් පමණක් පෙනේ. මෙසේ ධර්මප්‍රාසාදයට නැග සත්ත්වයන් බලන්නා වූ තථාගතයන් වහන්සේට යම් ඒ යහපත් දෙය නොකළ එකම විහාරයෙහි දකුණු දන පැත්තේ සිටියාවූත් සත්ත්වයන් බුදුරජාණන් වහන්සේගේ නේත්‍රයට යොමු නොවේ. රාත්‍රියෙහි විදින ලද ඊයක් මෙන් වෙයි. යම් ඒ යහපත් දේ කළා වූ හික්මවීමට සුදුසු පුද්ගලයෝ වෙත්ද, ඔවුහු උන්වහන්සේට ඈතින් සිටියත් නේත්‍රයට හසුවෙත්. ඔව්හු හිමාලය පර්වතයෙන් ගින්නක් මෙනි. මෙයද කියන ලදී.

දූර සිටියාහුද හිමාලය පර්වතය මෙන් පෙනෙත්. ලඟ සිටියත් රාත්‍රියෙහි විදින ලද ඊයක් මෙන් නොපෙනේ.

**උට්ඨෙහි** යනු භාග්‍යවතුන් වහන්සේට ධර්මදේශනා සඳහා චාරිකාවේ වඩින්නට ඉල්ලා සිටිමින් කියයි. **වීරා** ආදියෙහි, භාග්‍යවතුන් වහන්සේ වීර්ය ඇති බැවින් වීර නම් වේ. දේවපුත්ත, මච්චු, කිලෙස යන මාරයන් පරාජය කළ බැවින් දිනන ලද සංග්‍රාම ඇත්තේය. ජාතිය ආදී කාන්තාරවලින් එගොඩවීම සඳහා හික්මවිය යුතු ජනයාව කැඳවාගෙන යාමට සමර්ථ බැවින් සත්ථවාහ නම් වේ. කාමච්ඡන්ද නමැති ණය නොමැති බැවින් අණන යැයි දතයුතුයි.

**අපරුතා** යනු විවෘත. **අමතසසද්වාරා** ආර්ය මාර්ගය - යමෙක් වනාහි අමෘත සංඛ්‍යාත නිර්වාණයට දොරටුව වේද, එය මා විසින් විවෘත කර තබන ලදී යැයි දක්වයි. **පමුඤ්චනතු සංඛං** යනු සියල්ලෝම තමන්ගේ ශ්‍රද්ධාව මුදත්වා. පතුරුවා හරිත්වා. පසුපද දෙකෙහි මේ අර්ථයයි. මම වනාහි තමා විසින් ප්‍රගුණ කරන ලද මනාව පවත්වාගන්නා ලද මේ ප්‍රණීත, උතුම් ධර්මය, කය, වචනය දෙකේ පීඩාවට පත්වීමකින් ප්‍රකාශ නොකෙළෙමි. දැන් වනාහි සියළු ජනයා ශ්‍රද්ධා නමැති භාජනය යොමු කරන්න. ඔවුන්ගේ බලාපොරොත්තු පුරවන්නෙමි. **බොධිරුකඛමූලෙ** බෝරුකට නුදුරෙන් අජපල් නුගරුක මුල අතුරු නැතිව යන අර්ථයි.

**බෙමෙ මිගදායෙ** - ඉසිපතනය ඒ කාලයේ බෙම නම් උයනක් ඇත. මුවන්ට නිර්භයව වාසය කිරීමට දුන් බැවින් මිගදාය යැයි කියනු ලැබේ. ඒ සඳහා කියන ලදී. 'බෙමෙ මිගදායෙ' කියා විපස්සී බුදුරජාණන් වහන්සේ යම්සේද එසේම අන්‍ය බුදුවරු ද ප්‍රථම ධර්මදේශනාව පිණිස යන්නාහු අහසින් ගොස් එහිම පහතට බසිත්. අපගේ භාග්‍යවතුන් වහන්සේ උපක ආජීවකයාගේ වාසනා සම්පත්තිය දැක, උපක තෙමේ මේ මාර්ගයට පිවිසියේය. ඔහු මා දැක කථාබහකොට යන්නේය. ඉක්බිති නැවත කලකිරී පැමිණ රහත්බව සඵල කරගන්නේ යැයි දැනගෙන දහඅට යොදුන් මාර්ගය පයින්ම වැඩියේය. **දායපාලං ආමන්තෙසි** දැකද නැවත නැවත බලා ස්වාමීනි! අපගේ ආර්යයන් වහන්සේ පැමිණියේ යැයි පැමිණි සිටියහුට ඇමතීය.

**ආනුපුබ්බී කථා** දානයට අනතුරුව ශීලය ශීලයට අනතුරුව ස්වර්ගය, ස්වර්ගයට අනතුරුව මාර්ගය මෙසේ අනුපිළිවෙලින් කරන කථාව. එහි **දානකථං** මේ දානය වනාහි සැපයන්ට නිදානයකි. සම්පත්වලට මූලය.

භෝග සම්පත්වලට පිහිටය. වැරදි මග ගියහුට ආරක්ෂා සහිත ලෙණකි. මෙලොව පරලොව දෙකට පිහිටකි. දානයට සමාන නැයෙක්, පිහිටක්, ආධාරකයක් ආරක්ෂාවක්, සසර ගමනට පිහිටක් නැත. මෙය වනාහි පිහිටවීම් අර්ථයෙන් රතනමය වූ සිංහාසනයකට සමානය. ස්ථාවර අර්ථයෙන් මහපොළව හා සමානය. එල්බසිටීමෙ අර්ථයෙන් එල්ලී සිටීමට රැහැණක් බඳුය. මෙය වනාහි දුක නැති කිරීම යන අර්ථයෙන් නැවක්, සැනසීම් අර්ථයෙන් සංග්‍රාම සූරයෙක්, භයෙන් ආරක්ෂා කිරීමේ අර්ථයෙන් මනාව සකස්කළ නගරයක්, මසුරුමල ආදියෙන් කිලිටි නොවූ යන අර්ථයෙන් පද්මයකි. ඔවුන්ගේ දැවීම් අර්ථයෙන් ගින්නකි. ලංවීමට අපහසු අර්ථයෙන් ආසීර් විසයකි. බිය නොවන අර්ථයෙන් සිංහයෙකි. බලවත්කම යන අර්ථයෙන් හස්තියෙකි. උතුම් මංගල සම්මත බැවින් සුදු වෘෂභයෙකි. ක්ෂේම භූමියකට පැමිණීම් අර්ථයෙන් වළාහක අශ්වරාජයෙකි. 'දානය වනාහි ලෝකයෙහි ශක්‍ර සම්පත්තිය ලබාදෙයි. මාර සම්පත්තිය, බ්‍රහ්ම සම්පත්තිය, චක්‍රවර්තී සම්පත්තිය, ශ්‍රාවක පාරමී ඥාණය, පසේබුදු නුවණ, බුද්ධත්වය ලබාදෙයි. මේ ආදී වූ දානය බැඳී පවත්නා කථාවයි.

යම්හෙයකින් වනාහි දන් දෙන්නහු ශීලය සමාදන් වන්නට හැකිවෙයි. ඒ නිසා එයට අනතුරුව සීල කථාව කරයි. සීලකථාව සීලය නම් වූ මෙය නැයෙකි. පිහිටකි. එල්බ ගැනීමට ආධාරකයකි. ආරක්ෂාවකි. මෙලොව පරලොව ගමනට පිහිටකි. මෙලොව පරලොව සම්පත්වලට සීලය සමාන පිහිටක් ශීලය සමාන ආධාරකයක්, උදව්වක්, ශීලයට සමාන අලංකාරයක් නැත. සීලය නමැති පුෂ්පයට සමාන පුෂ්පයක් නැත. සීලයට සමාන සුවඳක් නැත. ශීල නමැති අලංකාරයෙන් අලංකාර කරන ලද ශීලය නමැති මල් පැළඳි සීල නමැති සුවඳ තැවරුණු දෙවියන් සහිත ලෝකයා බලන්නේ තෘප්තියකට පත් නොවේ.

මේ ශීලය නිසා වනාහි මේ ස්වර්ගය ලබන්නේය යන්න දැක්වීමම ශීලයට අනතුරුව ස්වර්ග පිළිබඳ කථාව කියයි. සගගකථං යනු මේ සර්ගය නම් ඉටුය. සිත්කළුය. මනාපය. මෙහි නිතරව ක්‍රීඩාවෝය. නිරතුරු සැපසම්පත් ලබත්. චාතුර්මහාරාජික දෙවිවරු වර්ෂ අනූදහසක් දෙව්සැප හා සම්පත් ලබත්. තව්තිසා දෙවියෝ වර්ෂ කෝටිතුනක් හා වර්ෂ හැටදහසක් ආදී සියළු ස්වර්ගය හා සම්බන්ධ කථාව ස්වර්ග සම්පත්තිය කියන්නවුන්ට බුදුවරයන් වහන්සේලාගේ ශ්‍රී මුඛය ප්‍රමාණවත් නැත. මෙයද කියා ඇත. මහණෙනි! මට නොයෙක් ආකාරයෙන් ස්වර්ග කථාව කියන්නේය ආදියයි. මෙසේ ස්වර්ග කථාවට, පොළඹවා නැවත හස්තියකු සරසා සොඬය සිඳින්නාක් මෙන් මේ ස්වර්ගයද අනිත්‍යයි. ස්ථිර නැත. මෙහි ඡන්දරාගය ඇතිකරගත යුතු නොවේය යන්න දැක්වීම සඳහා කාමයෝ වනාහි අල්ප වූ ආශ්වාද ඇත්තෝය. බොහෝ දුක් සහිතය. බලවත් සිත්තැවුල් ඇති කරන්නේය. ආදීනව මෙහි බොහෝය. යනාදී ක්‍රමයෙන් කාමයන්ගේ ආදීනව ළාමක බව කිළිටි බව දේශනා කළේය.

එහි ආදීනවො යනු දොස්. ඔකාරො යනු විසිරෙන, ලාමක බව, සංකිලෙසො ඒවායින් සත්ත්වයන්ව සසර කෙළෙසත්. යම්සේ කියන ලදී. පින්වත් සත්ත්වයිනි! කිළිටි වන්නාහ. මෙසේ කාම ආදීනවවලින් තර්ජනයකොට නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිශංස ප්‍රකාශ කළේය. පැවිද්දේ ගුණ ප්‍රකාශ කළේය යන අර්ථයි. ඉතිරිය අම්බට්ඨ සූත්‍ර වර්ණනාවේ කියූ ආකාරයෙන්මය. අර්ථය කියන ලදමැයි.

අලත්ථුං කෙසේ ලැබුවාහුද? භාග්‍යවතුන් වහන්සේ ඍද්ධිමය පාත්‍රාසිවුරු ඔවුන්ට ලැබීමේ වාසනාව බලා නොයෙක් ජාතීන්හි සිවුරු

දන්දීම් ආදිය දැක මහණෙනි! මෙහි එන්න' යනාදිය වදාළ සේක. ඔව්හු එකෙනෙහිම හිස මුඩුවී කසාවත් පිළිපොරවා අටපිරිකරවලින් සැරසී සියවස් ගිය තෙරවරුන් මෙන් භාග්‍යවතුන් වහන්සේට වඳිමින් සිටියහ.

**සන්දසෙසසි** ආදියෙහි මෙලොව පරලොව අර්ථය දැක්වීය. මෙලොව අර්ථය දක්වන්නේ අනිත්‍යයැයි පෙන්වීය. දුකයැයි දැක්වීය. අනාත්මයැයි දැක්වීය. ස්කන්ධයන් දැක්වීය. ධාතු දැක්වීය. ආයතන දැක්වීය. පටිච්ච සමුප්පාදය දැක්වීය. රූප ස්කන්ධයාගේ හටගැනීම දක්වන්නේ ලක්ෂණ පහක් දැක්වීය. වේදනා ස්කන්ධ ආදීන්ගේ වැයවීම දක්වන්නේ යැයි හටගැනීම හා අභාවය වශයෙන් ලකුණු පනසක් දැක්වීය. පරලොව පිණිස දක්වන්නේ නිරය දැක්වීය. තිරිසන්යෝනිය ප්‍රේත විෂය, අසුරකාය, තුන් කුසලයන්ගේ විපාකය. දිව්‍යලෝක සයෙහිත් බ්‍රහ්මලෝක නවයෙහිත් සම්පත් පෙන්වීය. **සමාදපෙසි** චතුපාරිශුද්ධි ශීලය, තෙළෙස් ධුතාංග දසකථා වස්තු ආදී වූ යහපත් ධර්මයන් ගැන්වීය. **සමුත්තෙජෙසි** මනාව උනන්දු කරවූයේය. මෙහි ලෝකාර්ථයද පරලෝකාර්ථයද තව තවා අවබෝධ කරගත්තාක් මෙන් පැවසීය.

තිස්දෙකක් කර්ම කිරීමත් විසිපස් වැදැරුම් මහා බියත් මේ ලෝක අභිවෘද්ධිය පිණිස බුද්ධ, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි තව තවා කියවන්නේ බාහු පසුපසට තබා බැඳ සිව්මංසල පහර සියයකින් තළා දකුණු දොරටුවෙන් ගෙනයන්නාක් මෙන් දංගෙඩියෙහි තබන ලද හිසක් මෙන්ද උලතබන ලද්දක්හු මෙන්ද මත් ඇතකු විසින් මඩින්නාක් මෙන් වෙයි. පරලොව අර්ථය කියනකල්හි නිරය ආදියෙහි උපන්නෙක් මෙන් දෙව්ලොව සැපය අනුභව කරන්නාක් මෙන්ද වෙයි. **සම්පහංසෙසි** ලබන ලද ගුණයෙන් සතුටු විය. මහත් වූ ආනිශංස ලෙස කොට කීවේය යන අර්ථයි.

**සංඛාරානං ආදීනවං** යට පළමු මාර්ග අධිගමය පිණිස කාමයන්ගේ ආදීනව ප්‍රකාශ කළේය. මෙහිදී වනාහි මතු මාර්ග අධිගමය පිණිස **'මහණෙනි, සංස්කාරයෝ අනිත්‍යයි. ස්ථිර නැත. සැනසුමක් නැත. මහණෙනි! සියළු සංස්කාරයන්හි කලකිරිය යුතුයි. ඒවායේ නොඇලිය යුතුය. ඒවායින් මිදිය යුතුයි ආදි ක්‍රමයට සංස්කාරයන්ගේ ආදීනවද ලාමක බවද එයට හේතුවද පීඩාවට පත්වීම ද ප්‍රකාශ කළේය. යම්සේ වනාහි නෛෂ්ක්‍රම්‍යයෙහිද මෙසේ මෙහිදී මහණෙනි, නිර්වාණය නම්**

ශාන්තය. ප්‍රණීතය. ආරක්ෂාවකි. පිහිටකි ආදි ක්‍රමයට නිර්වාණයෙහි ආනිශංසද ප්‍රකාශ කළේය.

මහාජනකායො ඒ කුමාරයන් දෙදෙනාට උපස්ථාන කරන ජනයා. භගවන්තං සරණං ගච්ඡාම ධම්මං ච සංඝරත්නය පරිපූර්ණ නොමැති බැවින් ද්වේවාචික සරණ ගියහ. අලත්හුං පෙර කියන ලද ආකාරයෙන්ම ඒහි භික්ෂුභාවයෙන්ම පැවිද්ද ලැබූහ. මීට අනතුරුව පැවිද්ද ලැබීමේ වාරයේදී ද මේ ක්‍රමයමයි. පරිචිතකෙකා උදපාදි යනුවෙන් කවදා පහළ වීද? සම්බෝධියෙන් සංවත්සර හතක් මාස හතක් හා සත් දවසක් ඉක්මගොස් පහළ විය. භාග්‍යවතුන් වහන්සේ වනාහි පියාට සළකමින් වාසය කළේය. රජු මෙසේ සිතීය. මගේ දෙටු පුතා නික්මගොස් බුදුවිය. මාගේ දෙවෙනි පුත්‍රයා නික්ම ගොස් අග්‍රශ්‍රාවක විය. පුරෝහිත පුත්‍රයා දෙවෙනි ශ්‍රාවක විය. මේ ඉතිරි භික්ෂූහු ගිහි කල්හිද මගේ පුත්‍රයාව පිරිවරාගෙන හැසුරුනාහ. මොව්හු වනාහි පෙරද දැන්ද මට ම භාරය. මම ම ඔවුන්ට සිව්පසයෙන් උපස්ථාන කරන්නෙමි. අන් අයට ඉඩක් නොදෙන්නෙමියි විහාරයේ දොරටුවේ පටන් රජගෙදර දොරටුව දක්වා දෙපැත්තේ කිහිරිවැටක් සාදවා පැදුරුවලින් ආවරණය කරවා වස්ත්‍රවලින් වසා උඩින්ද ආවරණය කොට රන්තරුවලින් විසිතුරු වූ එල්ලෙන තල්කඳන් පමණ විවිධ වූ මල්දම්වලින් වියනක් සාදවා පහත බිම විසිතුරු ඇතිරිළි අතුරවා ඇතුළත දෙපැත්තේ මල් පිරුණු පුන්කලස් මුළුමග වැසෙන සේද විවිධ සුවඳ වර්ගද තබා භාග්‍යවතුන් වහන්සේට කාල් දැන්වීය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා වටතිර මැදින් රජගෙදරට වැඩ දන් වළඳ ආපසු විහාරයට වඩියි.

අන් කෙනෙකුට දකින්ටවත් දන්දීමටවත් පූජා කරන්නටවත්, බණ අසන්නටවත් නොලැබේ. නාගරිකයෝ මෙසේ සිතූහ. ශාස්තෘන් වහන්සේ ලොව පහළවී වර්ෂ හතක් හා මාස හතක් අදට ගතවී ඇත. අපි දකින්නටවත් ඉඩක් නොලබමු. දානයක් දීම, පූජාවක් පැවැත්වීම, ධර්මය ඇසීම ගැන කවර කථාද? රජු බුදුරජාණන් වහන්සේ මගේමය. ධර්මය මගේමය. සංඝයා මගේමය කියා මමත්වයෙන් තෙමේම උපස්ථාන කරයි. ශාස්තෘන් වහන්සේ නමක් ලොව උපදින්නේ දෙවියන් සහිත ලෝකයාට යහපත පිණිසය. නරකය උණුසුම් වන්නේ රජුට පමණක් නොවේ. අන්‍යයන්ට නිලුපුල් වනයක් නොවේ. ඒ නිසා රජුට කියමු. ඉදින් ශාස්තෘන් වහන්සේව අපට දෙන්නේද එය කුසලයකි. ඉදින්

නොදෙන්නේ නම් රජු සමග යුදකර හෝ සංඝයාව ලබාගෙන දානාදී පිංකම් කරමු. නාගරිකයන් සමග පමණක් යුද්ධයක් කළ නොහැක. එක් උසස් පුද්ගලයකු ද අල්ලාගත යුතුය. ඔව්හු සේනාපතියා ලඟට ගොස් ඔහුට මේ කාරණය දන්වා, ස්වාමීනි, කිම ඔබතුමා අපගේ පක්‍ෂයේද? නැතහොත් රජුගේ පක්‍ෂයේදැයි ඇසූහ. හෙතෙම මම නුඹලාගේ පක්‍ෂයේ වෙමි. තවද එනාහි පළමු දවස මට දිය යුතුයි. ඔව්හු එකඟ වූහ. ඔහු රජු වෙතට ගොස් දේවයන් වහන්ස! නගරවැසියෝ ඔබවහන්සේ කෙරෙහි කිපුනාහ. දරුව, කුමක් නිසාද? ස්වාමීනි! ශාස්තෘන් වහන්සේට ඔබ පමණක් උපස්ථාන කරයි. අපි නොලබමු. ඉදින් දැන් නමුත් ලබන්නේ නම් නොකිපෙත්. නොලබන්නාහු නුඹලා සමග යුදකරනු කැමැත්තාහ. දරුව, යුධ කරන්නෙමි. භික්‍ෂු සංඝයා නොදෙමි. ස්වාමීනි! ඔබවහන්සේගේ දාසයෝ ඔබ සමග යුද කරන්නෙමු යැයි කියති. නුඹවහන්සේ කවුරුන් රැගෙන යුද කරන්නේද? සේනාපතිය ඇයි නුඹ? ස්වාමීනි, නුවරවැසියන් නොමැතිව මටද නොහැකිය. ඉක්බිති රජු නුවරවැසියෝ බලවත්ය. සේනාපතියාද ඔවුන්ගේ පක්‍ෂයේ යැයි දැනගෙන තවත් අවුරුදු සතක් හා මාස හතක් මට භික්‍ෂු සංඝයා දෙත්වයි කීය. නුවර වැසියෝ පිළිනොගත්හ. රජු වර්ෂ හයක්, වර්ෂ පහක් යැයි අඩුකළත් එයට එකඟ නොවූහ. තවත් දින සතක් ඉල්වීය. නුවරවැසියෝ දැන් රජු සමග අතිශයින් ගැටීම සුදුසු නැතැයි කැමැති වූහ.

රජු සත් අවුරුදු සත්මාසයකට සකස්කළ දානය දවස් හතකට සූදානම් කර දවස් හයක් කිසිවකුටත් නොපෙනෙන සේ දන් දී සත්වන දවසෙහි නුවරවැසියන් කැඳවා දරුවෙනි! මෙබඳු දානයක් දෙන්නට හැකිවන්නහුදැයි ඇසීය.

ඔව්හුද අප නිසාම මේ අදහස රජුට ඇතිවීයැයි හැකිය ස්වාමීනියි කීහ. රජු පිටු අතින් කඳුළු පිසදමමින් භාග්‍යවතුන් වහන්සේට වැඳ ස්වාමීනි! මම හැටඅට දහසක් භික්‍ෂූන්ව වෙන අයට නොපවරා දිවි ඇතිතෙක් සිව්පසයෙන් උපස්ථාන කරන්නෙමියි සිතුවෙමි. දැන් මම නුවරවැසියන්ටද ඉඩ දුනෙමි. නුවරවැසියෝ එනාහි කිම, අපි දන් දෙන්නට ඉඩක් නොලබමු යැයි කිපෙත්. හෙට පටන් ඔවුන්ට අනුග්‍රහ කරන්න යැයි කීය. ඉක්බිති පසුදා සේනාපතියා මහදන් සූදානම් කර අද යම්සේ වෙන කෙනෙක් එක් භික්‍ෂාවක්වත් නොදෙන ලෙස ආරක්ෂා යෙදිය යුතු යැයි හාත්පස පුරුෂයන් යෙදූහ. ඒ දවසේ සිටුභාර්යාව හඬමින් දුවණියට

මෙසේ කීවාය. ඉදින් දුවණියනි, ඔබගේ පියා ජීවත්වන්නේ නම් අද මම පළමුවෙන්ම භාග්‍යවතුන් වහන්සේට වළඳවමි. ඉක්බිති ඕ තොමෝ ඇයට මෙසේ කීවාය. මෑණියනි! නොසිතන්න. බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයා පළමුවෙන්ම අපෙන් වළඳන ලෙස මම කටයුතු යොදන්නෙමි. ඉක්බිති ලක්ෂයක් වටිනා රන් පාත්‍රයක ජලය රහිතව පිසූ කිරිබතක් පුරවා ගිතෙල්, මී, හකුරු ආදිය යොදා එය වෙනත් පාත්‍රයකින් වසා එය සමන් මල් මාලාවන්ගෙන් වටකර මල්ගොටුවක් ලෙස කර භාග්‍යවතුන් වහන්සේ ගමට වඩින වේලාවෙහි තෙමේම ඔසවාගෙන දාසි ජනයා පිරිවරාගෙන ගෙදරින් නික්මුනාය. අතරමග සේනාපතියාගේ ආරක්ෂකයෝ මෑණියනි! මෙතනින් මෙහා නොඑන්න යැයි කියත්. මහපිණැත්තෝ වනාහි ප්‍රියමනාප කථා ඇත්තෝ වෙති. ඔවුන්ට නැවත නැවතත් කීමෙන් කථාව ප්‍රතික්ෂේප කරන්නට නොහැකි වේ. ඕ තොමෝ කිම සුළුපියා, පියා, මාමා යන කවරනම් කෙනෙකුන්ට තෙපි යන්නට අවසර නොදෙන්නහුදැ'යි කීවාය. මෑණියනි! වෙන කිසිවකු විසින් ආහාරපාන දීමට ඉඩ නොදිය යුතුයැයි සේනාපතියා විසින් අපට මෙහි තබන ලදී.

කිම ඔබලා මාගේ අතෙහි කෑමබීම ආදි කිසිවක් දකින්නහුදැයි ඇසුවාය. නැත. මල්ගොඩක් දකිමු යැයි කීහ. කිම ඔබලාගේ සේනාපතියා, අන් අයට මල් පූජාකරන්ටවත් ඉඩ නොදෙන්නේදැයි ඇසුවාය. මෑණියනි! ඉඩ දෙමු. එසේනම් යන්නට ඉඩදෙන්න කියා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ භාග්‍යවතුන් වහන්ස! මල් සමූහය පිළිගන්න යැයි කීවාය. භාග්‍යවතුන් වහන්සේ එක් සේනාපති ආරක්ෂකයකු ලවා මල්ගොඩ ගත්තේය. භාග්‍යවතුන් වහන්සේට වැඳ ඕ තොමෝ ස්වාමීනි! භවයක් පාසා උපන්නා වූ මට ආශාවන්ගෙන් පීඩාවට පත්නොවන ජීවිතයක්ම ලැබේවා! මේ සමන්මල් මාලාව මෙන් උපනුපන් තැන්වල ප්‍රියමනාප වෙමි. නමින් 'සුමනා'ම වේවායි ප්‍රාර්ථනාකොට ශාස්තෲන් වහන්සේ විසින් සුවපත් වේවායි ආශිර්වාද කරන ලද්දී වැඳ ප්‍රදක්ෂිණා කොට නික්ම ගියාය.

භාග්‍යවතුන් වහන්සේ ද ගෙට පිවිස පනවන ලද අසුනෙහි වැඩසිටි සේක. සේනාපතියා ද කැඳ රැගෙන එළඹියේය. ශාස්තෲන් වහන්සේ පාත්‍රය වැසූ සේක. ස්වාමීනි, භික්ෂූන් වහන්සේලා වැඩිසිටියහ කීය. අපට අතරමගදී ලැබුණු පිණ්ඩපාතයක් ඇත. මල් සමූහය ඉවත්කර පිණ්ඩපාතය දුටුවේය. සුළු සේවකයෙක් මෙසේ කීය. ස්වාමීනි! එක් කාන්තාවක් මල්

මාලාවක්යැයි මා රැවටුවාය. කිරිබත භාග්‍යවතුන් වහන්සේ ඇතුළු සියළු භික්ෂූන්ට ප්‍රමාණත් විය. සේනාපතියාද තමන්ගේ ද දානවස්තුව පිළිගැන්විය. ශාස්තෲන් වහන්සේ ද දන් වළඳ ආශිර්වාද කොට නික්ම වැඩි සේක. සේනාපතියා, කවරනම් තැනැත්තියක් පිණ්ඩපාතය දුන්නීදැයි විචාළේය. ස්වාමීනි! සිටු දූවණිය යැයි කීය. ගෙදර වසන්නා වූ ප්‍රඥාවන්ත මෙබඳු ස්ත්‍රියකගේ පුරුෂයාට ස්වර්ග සම්පත්තිය නම් දුර්ලභ නොවේ. ඇයව ගෙනවුත් දෙටු තනතුරෙහි තැබුවේය. පසුදා නගරවැසියෝ දන් දුන්හ. ඊලඟ දිනයේ රජතුමාය. මෙසේ එකක් හැර එකක් දන් දෙන්නට පටන් ගත්හ. රජු ද චරපුරුෂයන් තබා නාගරිකයන් දෙන ලද දානයට වඩාත් දන්දෙයි. නාගරිකයෝ ද එසේම කොට රජු විසින් දෙන ලද දානයට වඩා අතිරේක දේ දන් දුන්හ. රජගෙදර නාටක ස්ත්‍රීහු බාල සාමණේරවරුන්ට මෙසේ කියත්. දරුවෙනි! ගෘහපතියන්ගේ බත් පිළිනොගන්න. වස්ත්‍ර ආදියෙහි පිසදමා කුඩා දරුවන්ගේ කෙළසොටු ආදිය සේදූ අත්වලින් කරන ලද පිරිසිදුව, ප්‍රණීතව කරන ලදී. පසුදා නාගරිකයෝ ද දෙන්නාහු මෙසේ කියත්. දරුවෙනි, ගම්නියම්ගම්වල එකතුකරන ලද සහල්, කිරි, දීකිරි, ගිතෙල් ආදියෙන් අනුන්ගේ දණ, හිස, පිට, ආදිය බිඳ ගෙනෙන ලද ද, ඒවායින් කරන ලද ගිතෙල් කිරි ආදියෙන් කරන ලද. මෙසේ දින සතක් ගතවිය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මේ විතර්කය ඇතිවිය. බුද්ධත්වයෙන් වර්ෂ හතක් සත් මාසයක්, දින හතක් ඉක්මගිය කල්හි පහළවිය යනුවෙන් කියන ලදී.

**අඤ්ඤතරො මහාබ්‍රහ්මා** යනු ධර්මදේශනාව ඉල්වා සිටි බ්‍රහ්මයා **චතුරාසීතියා ආවාස සහස්සානි** විහාර අසූහාර දහසක් ඒ සියළු දොළොස් දහසක් පමණ වූ මහාවිහාර, අභයගිරි චෛත්‍ය, සිතුල්පව් ආදී පර්වත මහාවිහාර සමාන විය.

**ඛන්තී පරමං තපො** අධිවාසනා ක්ෂාන්තිය නම් පරම තපසය. **තිතික්ඛා** යනු ක්ෂාන්තිය යන වචනයට සමාන වචනයකි. ඉවසීම් සංඛ්‍යාත ක්ෂාන්තිය - උතුම් තපසය යන අර්ථයි. **නිබ්බාණං පරමං** සර්වප්‍රකාරයෙන් නිර්වාණය උතුම් යැයි බුදුවරු වදාරත්. **නහි පබ්බජිතො පරූපඝාති** යනු යමෙක් අධිවාසන නම් වූ ඉවසීම නැති බැවින් අනුන් නසයි. වනසයි. හිංසා කරයි ද ඔහු පැවිද්දෙක් නම් නොවන්නේය. සතරවන පාදය එයටම සමාන වචනයකි. **න හි පබ්බජිතො** යනු මොහු ශ්‍රමණයෙක් නොවේය යන සමාන වචනයයි. **පරූපඝාති** යනු අනුන්ට හිංසා කරයි

යන සමාන වචනයයි. නැතහොත් සීලය නසන්නෙකි. ශීලය වනාහි උතුම් යන අර්ථයෙන් පරං යැයි කියයි. යම් ශ්‍රමණයෙක් වෙන කෙනෙකු යම්කිසි සත්ත්වයකු හිංසාවට පත් කරන්නේද හේ පරූපඝාතී නම් වේ. තමන්ගේ ශීලය නසන්නෙකි. ඔහු පැවිද්දෙක් නොවේය යන අර්ථයි. එසේ නැතහොත් යමෙක් අධිවාසනා සංඛ්‍යාත ඉවසීම නැතිකමෙන් අනුන් නසන්නේ වේද, අනුන් යටත්පිරිසෙයින් මැසි මදුරුවකු ජීවිතයෙන් පහ කරයිද ඔහු පැවිද්දෙක් නොවේ. කුමක් නිසාද? කෙලෙස්මල පහ නොකළ බැවිනි. තමාගේ කෙලෙස්මල පහ කරන්නේ තුයි 'පබ්බජිතො' යැයි කියනු ලැබේ. මේ පැවිද්දේ ලක්‍ෂණයයි. යමෙක් වනාහි නොමරයි. ඝාතනය නොකරවයි. එසේ නමුත් දඬු ආදියෙන් හිංසාවට පත්කරයි. අනුන්ට හිංසා කරන ඔහු ද පැවිද්දෙක් නොවේ. කුමක් නිසාද? හිංසාවෙන් තොර නොවූ බැවින්. පාපයන් සමනය කළ බැවින් 'සමණො' යැයි කියනු ලැබේ. මේ ශ්‍රමණ ලක්‍ෂණයෝය.

දෙවෙනි ගාථාවේ **සබ්බ පාපස්ස** යනු සියලු අකුසලයන්ගේ **අකරණං** නොඉපදවීම. **කුසලස්ස** යනු සිව්භූමියට අයත් කුසල්. **උපසම්පදා** යනු ලැබීමයි. **සචිත්ත පරියොදපනං** තමන්ගේ සිත බබලවන. එය වනාහි රහත්බවෙන් වෙයි. මෙසේ සීල සංවරයෙන් සියළු පාපයන් හැරදමා සමථ විපස්සනාවන්ගෙන් කුසල් උපයාගෙන රහත්ඵලයෙන් සිත පිරිසිදු කරගත යුත්තේය යන මෙය බුදුවරයන්ගේ අනුශාසනයයි. අවවාදයයි.

තුන්වැනි ගාථාවෙහි **අනූපවාදො** වචනයෙන් කිසිවකුට හෝ අපවාද කිරීමකි. **අනූපඝාතො** යනු කයින් ඝාතනය නොකිරීම. **පාතිමොක්ඛ** යම් ඒ උතුම් මෝක්‍ෂය, උතුම් මිදී යාම, උත්තමශීලය, සුගතියට බාධාකර ධර්මයන්ගෙන් ආරක්ෂා කරයි. දුගති බියවලින් මුදවා ගනී. යමක් වනාහි ඔහුව ආරක්ෂා කෙරේද ඔහුව මුදවාගනීද යන අර්ථයෙන් පාතිමොක්ඛයැයි කියනු ලැබේ. ඒ ප්‍රාතිමෝක්‍ෂයෙහි සංවර වූයේ. **මත්තඤ්ඤුතා** පිළිගැනීම හා පරිභෝජනය පිළිබඳ ප්‍රමාදය දන්නා. **පන්තඤ්චසයනාසනං** සයනාසනයද සම්බන්ධයෙන් තොරවූ යන අර්ථයි. මෙහිද ප්‍රත්‍ය දෙකකින් සිව්පසයෙහි සතුටුවීම දක්වන ලදැයි දතයුතුයි. **එතං බුද්ධානසාසනං** මෙසේ අනුන්ට අවමාන නොකිරීම, උපඝාතනය නොකිරීම, ප්‍රාතිමෝක්‍ෂයෙහි සංවරවීම පිළිගැනීම හා පරිභෝජනය පිළිබඳ පමණ දන්නා බව හා අෂ්ට සමාපත්තීන්හි වසීභාවයෙන් විවේක සේනාසන

සේවනයද බුදුවරයන්ගේ අවවාදයයි. අනුශාසනයයි. මේවා වනාහි සියළු බුදුවරයන්ගේ ප්‍රාතිමෝක්ෂ උද්දේස ගාථාවන්නේ යැයි දතයුතු.

මෙපමණකින් මේ විපස්සී බුදුන්ගේ චරිතාපදාන කථා විස්තරයෙන් 'මහණෙනි! තථාගතයන් වහන්සේගේම ඒ ධර්මධාතුව මනාසේ අවබෝධ කළ 'මෙසේ කීමෙන් ධර්මධාතුව මනාලෙස අවබෝධ කරගත් බව ප්‍රකාශ කොට දැන් 'දෙවියෝ ද තථාගතයන් වහන්සේට මේ කාරණය සැලකළහ යනුවෙන් කියන ලද දෙවියන්ගේ ඉල්ලීම ප්‍රකාශ කරන්නට 'එකමිදාහං' ආදිය පැවසීය. **සුභගවනෙ** යනු සුභග නම් වූ වනයෙහි **සාලරාජමූලෙ** දෙටු වනස්පතී වෘක්ෂයක මුල. **කාමච්ඡන්දං විරාජෙත්වා** යනු අනාගාමී මාර්ගයෙන් මුලිනුපුටා දැමීම් වශයෙන් විරාගයට පත් මෙසේ විපස්සී බුදුන්ට මෙන් සෙසු බුදුවරයන් වහන්සේලාගේ ශාසනයෙහි කියන ලද බ්‍රහ්මචරියාව දෙවියෝ සැළ කළහ. පෙළෙහි වනාහි විපස්සී බුදුන්ගේත් අපගේ භාග්‍යවතුන් වහන්සේගේත් යනාදී ලෙස ආවා වූ එහි තමන්ගේ සම්පත්තියෙන් නොපිරිහෙත්. හැර නොදමත් යන අර්ථයෙන් 'අවිහා' නම් වේ. කිසිම සත්ත්වයකු නොතවයිද ඒ නිසා අතප්පා මනා දැකුම් ඇති මනහර, ප්‍රසාදජනක යන අර්ථයෙන් සුදස්සනා නම් වේ. මනාව දකිත්. මොවුන්ගේ දර්ශනය සුන්දරය. මනාව දකිත්. මොවුන්ගේ දැක්ම සුන්දරය යනුවෙන් සුදස්සී නම් වේ. සියලුම ගුණයන්ගෙන් භව සම්පත්තියෙන් ද ජ්‍යෙෂ්ඨය. මෙහි කනිටු වූවෝ නැත යන අර්ථයෙන් අකනිට්ඨා බ්‍රහ්මයන් විසින් සියල්ලම බණවර දෙදහස් හයසීයක් වෙයි. එය ත්‍රිපිටක බුද්ධ වචනයෙහි අන්‍ය සූත්‍රයක් බණවර දෙදහස් හයසීයක් නම් නැත. මේ සූත්‍රාන්තය සූත්‍රාන්ත රාජයැයි දතයුතුයි. මීට පසුව අනුසන්ධි දෙකම දක්වමින් ඉති ඛො භික්ඛවේ 'මහණෙනි! මෙසේ වනාහි ආදිය කීය. ඒ සියල්ලම ප්‍රකට අර්ථ ඇත්තේමය.

**මහාපදාන සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

# මහානිදාන සූත්‍ර වර්ණනාව

එවං මෙසුතං -පෙ- කුරුසු යනුවෙන් ආරම්භ වන මහා නිදානයයි. මේ එහි ගැඹුරු පද වර්ණනාවයි. කුරු නම් ජනපද වැසි රාජකුමාරවරු ඔවුන්ගේ වාසස්ථානය එකම ජනපදයකි. ආරෝපණය කළ ශබ්දයාගේ අර්ථයෙන් 'කුරුසු' කියා (කුරු ජනපදවල) කියනු ලැබේ. ඒ කුරු ජනපදවල අටුවාචාරීන් වහන්සේලා මෙසේ කීහ. මහා මන්ධාතු රජ කාලයේ දිවයින් තුනේ ජනයා, දඹදිව නම් බුදු පසේ බුදු මහා ශ්‍රාවක චක්‍රවර්තී රජුන්ටත් උත්තම පුරුෂයන්ටත් උත්පත්ති ස්ථාන වූ උතුම් දිවයිනක් යැයි ද එය අති රමණීය යැයි ද අසා චක්‍රරත්නය පෙරටු කොටගෙන දිවයින් සතරෙහි ඇවිදින්නා වූ මහා මන්ධාතු සක්විති රජතුමා සමග ආවාහ. ඉක්බිති රජු පරිනායක රත්නය ගැන ඇසුවේය. මනුෂ්‍ය ලෝකයට වඩා රමණීය තැනක් ඇත්තේ ද? දේවයන් වහන්ස! කුමක් නිසා මෙසේ කියන්නේද? ඉරහඳ දෙකේ ආනුභාවය නොදකින්නෙහිද? මොවුන්ගේ තැන මෙයට වඩා රමණීයතර නොවන්නේ ද? රජු චක්‍රරත්නය පෙරටුකොට එහි ගියේය. සතරවරම් මහ රජවරු මන්ධාතු මහරජතුමා ආවේ යැයි අසාම රජු මහානුභාව සම්පන්නය. මහා ඍද්ධි ඇත්තේය. මේ රජු යුද්ධයෙන් පරාජය කළ නොහැක. තමන්ගේ රාජ්‍යය පවරා දුන්හ. ඔහු එයද ගෙන නැවත විචාළේය. මීට වඩා රමණීය තැනක් තිබේද? ඉක්බිති ඔහුට තාවතිංස භවනය ගැන කීහ. දේවයන් වහන්ස, තව්තිසා දෙව්ලොව රමණීයයි. සතරවරම් රජදරුවෝ එහි ශක්‍ර දේවේන්ද්‍රයාගේ පරිචාරකයෝ වෙති. දොරටුව ලඟ සිටිත්. සක්දෙව් රජු මහා ඍද්ධි ඇත්තේය. මහානුභාව ඇත්තේය. මේ ඔහුගේ උපභෝග ස්ථානයන්ය. වෛජයන්ත ප්‍රාසාදය ස්ථානයන්ය. වෛජයන්ත ප්‍රාසාදය යොදුන් දහසක් උසය. සුධර්මා දේව සභාව යොදුන් පන්සියයක් උසය. වෛජයන්ත රථය යොදුන් එකසිය පනහකි. එසේම ඓරාවණ හස්තියා දිව්‍යමය වෘක්ෂයන් දහසකින් සැරසීගත් නන්දන වනය, චිත්තලතා වනය, ඵාරුසක වනය, මිස්සක වනය, යොදුන් සියයක් උසය. පරසතු රුක යට යොදුන් සැටක් දිග යොදුන් පනහක් පළල යොදුන් පහළොවක් පළල, ජයසුමන මල්වල වර්ණයට සමාන පඬුපුල් අස්න. එහි මොළොක් බව නිසා හිඳගත්තා වූ ශක්‍රයාගේ සිරුරෙන් හරි අඩක් ගිලෙයි. එය අසා රජු එහි යනු කැමැත්තේ චක්‍රරත්නය එසවීය. එය අහසෙහි නැගී සිටියේය.

චතුරංගනී සේනාව සමග දෙදෙව්ලොවට මැදින් චක්‍රරත්නය බැස පරිනායක රත්නය ප්‍රමුඛ සිව්රඟ සෙනඟ සමග පොළවෙහි පිහිටියේය. රජු හුදෙකලාව තව්තිසා භවනයට ගියේය. ශක්‍රයා මහා මන්ධාතු ආවේයැයි අසාම ඔහුට පෙරගමන්කොට, මහරජතුමනි, සුබ ගමන්. මහරජතුමනි ! අනුශාසනා කරන්න යැයි කියා නළුවන් සමග රාජ්‍යය දෙකට බෙදා එක් කොටසක් දුන්නේය. රජු තාවතිංස භවනයෙහි පා තැබූ විගසම ඔහුගේ මනුෂ්‍යාත්ම භාවය ඉවත්විය. දේවත්වයක් පහළ විය. ශක්‍රයා සමග පඬුපුල්සල අස්නෙහි හුන්නා වූ රජුට ඇසිපිය හෙළන වේලාවකින් විවිධත්වයක් පෙනෙයි. එය නොසළකා හැරිය දෙවිවරු ශක්‍රයාගේත් ඔහුගේත් වෙනසෙහි මුළාවෙත්. හෙතෙම එහි දිව්‍ය සම්පත්තිය අනුභව කරමින් යම්තාක් ශක්‍රයන් තිස්හය දෙනෙක් ඉපිද චුතව ගියාහු ද ඒ තාක් ශක්‍රරාජ්‍යය කොට කාම වස්තූන්හි තෘප්තියක් නොලබා එයින් චුතව තමන්ගේ උයනට වැටුනේ වායුවෙන් හා අව්වෙන් පීඩාවට පත්වූයේ මිය ගියේය. චක්‍රරත්නය නැවත පොළවෙහි පිහිටියේ පරිනායක රත්නය රන් තහඩුවක මන්ධාතු රජුගේ පාවහන් යැයි ලියවා, මේ මන්ධාතු රාජ්‍යයයි රජකළේය. දිවයින් තුනෙන් ආවා වූ ජනයා නැවත ආපසු යන්නට අපොහොසත් වූවාහු පරිනායක රත්නය ළඟට පැමිණ දේවයන් වහන්ස! අපි රජුගේ ආනුභාවයෙන් පැමිණියෙමු. දැන් ආපසු යන්නට නොහැක්කෙමු. අපට වාසය කරන්නට තැනක් දෙන්නයැයි ඉල්වා සිටියහ. හෙතෙම ඔවුන්ට එක එක ජනපද දුන්නේය. එහි පූර්ව විදේහයෙන් ආවා වූ ජනයා විසින් වාසය කරන ලද ප්‍රදේශය එම පෙර නමින්ම විදේහ රට යැයි නම ලැබුවේය. අපර ගොයානයෙන් ආවා වූ මනුෂ්‍යයන් වාසය කළ ප්‍රදේශය අපරන්ත ජනපදයයි නම් ලැබීය. උතුරුකුරු දිවයිනෙන් පැමිණි මිනිසුන් වාසය කළ ප්‍රදේශය කුරු රට යයි නම් ලැබීය. බොහොමයක් ගම් නියම්ගම් ආදිය බහුවචනයෙන් ව්‍යවහාර කරත්. ඒ නිසා කියන ලදී. (කුරුසු විහරති. කම්මාසසධම්මං නාම කුරූනං නිගමො) කම්මාසස ධම්මං යන මෙහි, කෙනෙක් 'ධ' කාරයට 'ද' කාරයෙන් අර්ථ දක්වත්. කම්මාසයාව' මෙහිදීදමනය කළ නිසා කම්මාසදම්ම වී කම්මාසො යන්නෙන් කබර සහිත පා ඇති පෝරිසාදයා ගැනේ. ඔහුගේ වනාහි පාදයෙහි උලක් ඇණීමෙන් හටගත් වනය සුවවීමේදී සිතියම් කළ ලීයක් මෙන් වී සුව විය. ඒ නිසා කම්මාසපාද (කබරපාද) යැයි හැඳින්වූහ. ඔහුද ඒ අවස්ථාවේදී දමනය කරන ලද්දේ පෝරිසාද යන නමින් නිදහස් විය. කවරනම් මහා සත්ත්වයකු විසින් කවරනම් ජාතකයදී ද? මහාසුතසෝම ජාතකයේදී යැයි කෙනෙක් කියති. සමහර

තෙරවරු ජයද්දිස ජාතකයේදී යැයි කියත්. එකල්හි වනාහි මහා සත්ත්වයන් විසින් කම්මාසපාදව දමනය කරන ලදී. යම්සේ කීවේද?

යම්කලෙක පංචාල රටේ අධිපති ජයද්දිස රජුගේ පුත්‍රයා වීමි. ප්‍රාණය හැර පියාව මුදවා ගත්තෙමි. මම කම්මාස ජනයාවද සතුටු කළෙමි.

ඇතැමෙක් 'ධ' කාරයෙන්ම අර්ථය වර්ණනා කරත්. කුරුරට වැසියන්ගේ වනාහි කුරුවතාවත්, එහි හටගත් මිශ්‍ර පැහැය. ඒ නිසා ඒ ස්ථානය කම්මාස නම් වී. මෙහි ධර්මයෙහි හටගත් නිසා කම්මාසධම්ම යැයි කියනු ලැබේ. එහි පදිංචි වූ නියම්ගමටද එම නාමයම ලැබින. භූමිය යන වචනයෙන් කුමක් නිසා නොකියන ලද ද? වාසය කරන්නට ඉඩක් නොලත් බැවින්, භාග්‍යවතුන් වහන්සේට වනාහි ඒ නියම්ගමෙහි වැඩසිටින්නට ඉඩකඩ ඇති කිසිම විහාරයක් නොවීය. ඒ නියම්ගමින් බැහැරව වෙනත් ජලපහසුකම් ඇති රමණීය වූ භූමිභාගයක විශාල වනරොදක් විය. භාග්‍යවතුන් වහන්සේ ඒ ගම ගොදුරුගම කොට එහි වැඩසිටියේය. ඒ නිසා මෙසේ මෙහි අර්ථය දතයුතුයි. කුරූසු විහරති කම්මාසධම්මං නාම කුරූනං නිගමො. කුරුන්ගේ නියම්ගමක් වූ කම්මාසස ධම්මයෙහි වැඩවසයි. එය ගොදුරුගම කොට යැයි අර්ථ ගතයුතුයි. ආයසමා මේ ප්‍රියවචනයකි. මේ ගරුකළයුතු වචනයකි. ආනන්දො යනු ඒ තෙරුන්ගේ නමය. එකමන්තං මෙය භාව නපුංසක නිර්දේශයකි. ඉරහඳ දෙක විෂම ලෙස පරිහරණය කරත්' යනාදියෙහි මෙනි. ඒ නිසා යම්සේ එකත්පසෙක සිටියේද එපරිද්දෙන් හිඳියි කියා මෙහි අර්ථ ගතයුතුයි. මෙය භූමි අර්ථයෙහි උපයෝග වචනයකි. නිසීදි යනු වාඩිවිය. පණ්ඩිතයෝ වනාහි ගරුකළයුතු තැනකට පැමිණ වාඩිවීමේ කුසලතාවයෙන් එකත්පසෙක හිඳගනිත්. මෙයද ඔවුන්ගේ අනිකකි. ඒ නිසා එකත්පසෙක හුන්නේය. කෙසේ හිඳගතහොත් එකත්පසෙක හිඳගත්තේ යැයි කියන්නේද? වාඩිවීමේ දොස් සයක් අත්හැර ඒ කෙසේද? බොහෝ දුර, බොහෝ ලඟ, උඩ, පහත් තැන. කෙලින්ම අබියසව - බොහෝ පිටුපස යනුවෙනි.

බොහෝ දුර සිටියහු ඉදින් කථා කරනු කැමැත්තේ නම් උස්හඬින් කථා කළයුතුයි. ඉතා ලඟින් සිටියහු ගැටීම් ඇතිවෙයි. උඩින් සිටියහු ශරීර ගන්ධයෙන් බාධා ඇතිවෙයි. උස්තැනක සිටියහු අගෞරවයක් ප්‍රකාශ කරයි. බොහෝ ලඟ සිටියහු ඉදින් දකිනු කැමැත්තේ වෙයිද

ඇසින් ඇස ගැටී දැකිය යුතුයි. බොහෝ පිටුපසින් සිටියේ ඉදින් දකිනු කැමැත්තේ වෙයිද බෙල්ල දිගුකර දැකිය යුතුයි. ඒ නිසා මොහුද තුන්වරක් භාග්‍යවතුන් වහන්සේම ප්‍රදක්ෂිණා කර මනාව වැඳ මේ හිඳගැනීමේ දොස් හය අත්හැර දකුණු දණමඬලට ඉදිරිපස ෂඩ්වර්ණ බුද්ධරශ්මිය තුළට පිවිස පැහැදිලි ලාක්ෂා රසයක් තවරාගන්නාක් මෙන් රුවන් පටක් පොරවන්නාක් මෙන් රතුපුල් මල්මාලා වියනක් මැදට පිවිසෙන්නාක් මෙන් ධර්ම භාණ්ඩාගාරික ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ වැඩ සිටියේය. ඒ නිසා එකත්පසෙක සිටියේයැයි කියන ලදී.

කවර වේලාවක කුමන කරුණකින් මේ ආයුෂ්මතුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ලඟට පැමිණියේද? සවස් වේලාවේ ප්‍රත්‍යාකාර ප්‍රශ්නයක් විචාරීම පිණිස ඒ දවස මේ ආයුෂ්මතුන් වහන්සේ කුල සංග්‍රහය පිණිස ගෙදොරක් ගෙදොරක් පාසා දහසක් බැඳි පියල්ලක් තබන්නාක් මෙන් කම්මාසසධම්මයේ පිඬුසිඟා ඇවිද පිණ්ඩපාතයෙන් වැළකුනේ ශාස්තෘන් වහන්සේට වත් සපයා ශාස්තෘන් වහන්සේ ගඳකිළියට පිවිසි කල්හි බුදුන් වැඳ තමන් දවල් වසන තැනට ගොස් අතවැසි භික්ෂූන්ට වත් සපයා පිටත්වන කල්හි දිවා විහාරස්ථානය හැමද සම්කඩ අතුරා කලයේ ජලයෙන් අත්පා සිහිල්කොට පළඟක් බැඳ සිටියේ සෝතාපත්තිඵල සමාපත්තියට සමවැද වෙන්කළ කාල වශයෙන් සමාපත්තියෙන් නැගිට ප්‍රත්‍යාකාරය කෙරෙහි ඥාණය පිවිසවීය. හෙතෙම 'අවිජ්ජා පච්චයා සංඛාරා' යනාදිය මුලපටන් අගට, අගපටන් මුලට දෙකෙළවරේ සිට මැදට මැදපටන් දෙකෙළවරට පමුණුවන්නේ තුන්වරක් දොළොස්පදයක් ප්‍රත්‍යාකාරයෙන් සම්මර්ශනය කළේය. මෙසේ සම්මර්ශනය කරන්නහුට ප්‍රත්‍යාකාරය ප්‍රකට වී වැටහෙයි.

ඉක්බිති මෙසේ සිතීය. මේ ප්‍රත්‍යාකාරය සියළු බුදුවරයන් විසින් ගැඹුරුව, ගැඹුරු ආලෝකයක් යැයි කියන ලදී. ප්‍රදේශ ඥාණයක පිහිටි ශ්‍රාවකයකු වූ මා හට උසස්ව මහත් ආලෝකයක් ලෙස ප්‍රකට වී වැටහේ. මටම උස්පහත්ව වැටහේ. නැතහොත් අන් අයටත් එසේමද? ඉක්බිති ඔහුට මෙබඳු අදහසක් ඇතිවිය. දැන් මම මේ ප්‍රශ්නය ගෙන භාග්‍යවතුන් වහන්සේගෙන් අසමි. ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ මෙය හේතුසාධක කරගෙන සම්පූර්ණ මහමෙර ඔසවන්නාක් මෙන් එක් සූත්‍රාන්ත කථාවක් කියා දක්වන්නේය. බුදුවරයන් වහන්සේලාගේ වනාහි විනය ප්‍රඥප්තිය, භුම්මන්තර, පච්චයාකාර, සමයන්තර යන මේ ස්ථාන සතර

තැනට පත්ව මහත් වූ ගර්ජනා ඇතිවෙයි. මහත් වූ ඥාණය ලබයි. බුද්ධ ඥාණයේ මහත්බව පෙනෙයි. දේශනාව ගැඹුරු වෙයි. ත්‍රිලක්ෂණයේ ගැටුනු ශූන්‍යතාවෙන් සමන්විත හෙතෙම ස්වභාවයෙන් එක් දවසකට සියවරක් දහස්වරක් භාග්‍යවතුන් වහන්සේ සමීපයට පැමිණෙන්නේ හේතුරහිතව, අකාරණව නොඑළඹෙයි. එදවස වනාහි මේ ප්‍රශ්නය ගෙන ප්‍රඥා නමැති කුංචනාද කරන බුද්ධ නමැති ගන්ධ හස්තියා ලඟට පැමිණ, බුද්ධ නමැති සිංහරාජයා ලඟට පැමිණ ඥාණ නමැති සීහනාදය අසමි. බුද්ධ නමැති උතුම් අශ්වයා වෙත පැමිණ ඥාණ නමැති පද වික්‍රමය දකින්නෙමි යි සිතා දවල් සිටි තැනින් නැගිට සම්කඩ හකුලාගෙන සවස්වේලාවේ භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණියෙමි. එබැවින් කියන ලදී. සවස්වේලාවේ ප්‍රත්‍යාකාර වූ ප්‍රශ්නයක් විමසීමේ ආකාරයෙන් එළඹෙන්නේ.

යාවගම්භීරො යනු මෙහි යාව ශබ්දය ප්‍රමාණය ඉක්මවා යාමෙහි ඉක්මගිය ප්‍රමාණය ගැඹුරුය. අතිශයින් ගැඹුරුය යන අර්ථයි. ගම්භීරාවභාසො යනු ගැඹුරුව සිට බබලයි. දකියි යන අර්ථයි. එකක් වනාහි නොගැඹුරුව, ගැඹුරු ආලෝකය වෙයි. කිළිටි කොළ ඇති කාලවර්ණ පැරණි ජලය මෙන්, එය වනාහි දනක් පමණ වූ නමුත් පුරුෂ ප්‍රමාණ සියයක් මෙන් පෙනෙයි. එකක් ගැඹුරු උස් වූ ආලෝකයක් වෙයි. මැණික් ගඟක පැහැදිලි ජලය මෙන්, එය වනාහි පුරුෂ ප්‍රමාණ සියයක් නමුත් දණක් පමණ මෙන් පෙනෙයි. එක් නොගැඹුරු එකක් නොගැඹුරු ආලෝකයක් දක්වයි. හැළි ආදියෙහි ජලය මෙනි. ගැඹුරු එකක් ගැඹුරු ආභාසය ඇත්තේ වෙයි. මහමෙර යට මහා සමුද්‍රයේ ජලය මෙනි. මෙසේ ජලයම නම් සතරක් ලබයි.

පටිච්ච සමුත්පාදයෙහි වනාහි එසේ නොවේ. මෙය වනාහි ගැඹුරුමය. ගැඹුරු ආභාසයක් ඇත. එකම නමක් ලබයි.

මෙසේ සමාන වූයේ වෙයි. තවද වනාහි මට නොගැඹුරු සේ පෙනෙයි. ස්වාමීනි! මෙය ආශ්චර්යයකි. අද්භූතය. මෙසේ තමාගේ පුදුමය ප්‍රකාශ කරන්නේ ප්‍රශ්නය විචාළේය. ප්‍රශ්නය අසා නිහඬව සිටියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ වචනය අසා ආනන්ද තෙරුන් භවාග්‍රය අල්ලා ගන්නට අත් දිගු කරන්නාක් මෙන් මහමෙර සිඳ දමා මිදුළු පිටතට ගන්නට උත්සාහ කරන්නෙක් මෙන් නැවක් නැතිව මහා සමුද්‍රය

තරණය කරන්නට බලාපොරොත්තු වන්නකු මෙන් මහපොළව පෙරළා පෘථිවි ඕජස ගන්නට උත්සාහ කරන්නකු මෙන් බුදුන්ට විෂය වූ ප්‍රශ්නයක් තමාට නොගැඹුරු යයි කියයි. දැන් මොහුට මෙහි ගැඹුරු බව කියන්නෙමියි සිතා 'මා හෙවං' යනාදිය පැවසීය.

එහි මාහෙවං යන්නෙහි 'හ' කාරය නිපාත මාත්‍රයකි. මෙසේ නොකියවයි යන අර්ථයි. 'මාහෙවං' යන මේ වචනය වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට ප්‍රශංසා කරමින් ද දෝෂාරෝපණය කරමින්ද කථා කරයි. එහි ප්‍රශංසාත්මක ලෙස ආනන්දය! නුඹ මහා ප්‍රඥා ඇත්තේය. තියුණු නුවණ ඇත්තේය. ඒ නිසා පටිච්ච සමුප්පාදය ගැඹුරු වුවත් නොගැඹුරු ලෙස පෙනෙයි. අන් අයට වනාහි මෙය නොගැඹුරු යයි නොසැළකිය යුතුය. එය ගැඹුරුමය. ගැඹුරු ආලෝකය ඇත්තේමය. එහිදී උපමා සතරක් කියත්. හයමාසයක් රසබොජුන් අනුභව කළ, යෝග්‍ය තත්ත්වයට පත් පුහුණු වූ, උත්සව සමයේ මල්ලවපොර තරඟයට යන මල්ලවපොරකරුට අතරමගදී උසුලන පාෂාණයක් පෙන්වූහ. මේ කුමක්දැයි ඔහු ඇසීය. මේ උසුලන පාෂාණයකියි කීහ. එය ගෙනෙව්යැයි කීය. එය අපට ඉසිලිය නොහැක යයි කී කල්හි තෙමේ ගොස් මෙය කොහේ දැමිය යුතුදැයි අසා අත් දෙකට පාෂාණ දෙකක් උසුලාගෙන ක්‍රීඩා පන්දු මෙන් එහි දමා ගියේය. එහිදී මල්ලවපොර ශූරයාට ඒ පාෂාණය සැහැල්ලු වුවත් අන්‍යයන්ට සැහැල්ලු නැතැයි කිවයුතුයි. සයමාසයක් මනා භොජුන් රස විඳි මල්ලවපොරකරු මෙන් කල්ප ශතසහස්‍රයක් ප්‍රාර්ථනා සහිත ආනන්ද තෙරුන් වහන්සේ, යම්සේ වනාහි බර උසුලන්නාට තමා බලසම්පන්න බැවින් උසුලන පාෂාණය සැහැල්ලු විය. මෙසේ තෙරුන්වහන්සේට මහා ප්‍රඥා බැවින් පටිච්ච සමුප්පාද ධර්මය නොගැඹුරුය. එය අන්‍යයන්ට නොගැඹුරු යයි නොකිව යුතුයි. මහා සමුද්‍රයේද 'තිමි' නම් මත්ස්‍යයා යොදුන් දෙසීයකි. තිමිංගල නම් මත්ස්‍යයා යොදුන් තුන්සියයකි. තිමිපිංගල නම් මත්ස්‍යයා යොදුන් හාරසීයකි. තිමිරිපිංග නම් මත්ස්‍යයා යොදුන් පන්සියයකි. ආනන්ද - තිමිනඳ - අජ්ඣාරොහ මහා තිමි යන මේ මත්ස්‍යයෝ යොදුන් සාරදහසකි. එහිදී තිමිරපිංගලයන් වට දක්වති. ඒ මත්ස්‍යයාගේ දකුණු කන සොලවනවිට යොදුන් පන්සියයක් ප්‍රදේශයේ ජලය සෙලවෙයි. වම් කනද නගුටද හිස ද එසේමය. කන්දෙක සොළවා නගුටින් පහරදී හිස එහෙ මෙහෙ සොලවා ක්‍රීඩා කරන්නට ආරම්භ කළවිට යොදුන් සත්සියයක් ප්‍රමාණ භාජනයක දමා උදුනක් මත තබන ලද ජලය මෙන්,

තුන්සියයක් යොදුන් ප්‍රමාණ පිට වසන්නටවත් නොහැකි වෙයි. ඔහු මෙසේ කියන්නේය. මේ මහා සමුද්‍රය ගැඹුරුය, ගැඹුරුය කියා කියත්. එහි මොන ගැඹුරක්ද? අපි පිට වසාගන්නට තරම්වත් ජලය නොලබමු. මෙසේ තම ශරීරය අනුව තිමිර පිංගලයාට මහා සමුද්‍රය නොගැඹුරුය. අනිත් කුඩා මත්ස්‍යයන්ට ගැඹුරුය කියා නොකිව යුතුයි. එපරිද්දෙන්, ඤාණයෙන් උසස් වූ තෙරුන්ට පටිච්ච සමුප්පාදය නොගැඹුරුය. අනිත් අයටද නොගැඹුරුය කියා නොකිව යුතුයි.

ගුරුළු රාජයාද යොදුන් එකසිය පනහකි. ඔහුගේ දකුණු පියාපත යොදුන් පනහකි. එපරිද්දෙන්ම වම්පසත් වේ. පිල්කලඹ හැටයොදුනක්ද බෙල්ල තිස් යොදුනක්ද වේ. මුඛය යොදුන් නවයකි. පාද දොළොස් යොදුනකි. ඒ ගුරුළා වාතය දක්වන්නට පටන්ගත් කල්හි හත්අට සියයක් යොදුන් ප්‍රමාණවත් නොවේ. ඔහු මෙසේ කියන්නේය. මේ ආකාශය අනන්තය. අනන්තය කියා කියත්. මෙහි අනන්ත බවක් කොහිද? අපි පියාපත්වලින් නැගෙන සුළං ප්‍රහාරයකටවත් ඉඩක් නැත. එහි ගුරුළුරාජයාට ආකාශය කුඩාය. අනිත් කුඩා පක්ෂීන්ට කුඩාය කියා නොකිව යුතුයි. එපරිද්දෙන් ඤාණයෙන් යුක්ත තෙරුන්ට පටිච්ච සමුප්පාදය නොගැඹුරුය. අන් අයටද නොගැඹුරු යැයි නොකිවයුතුය. රාහු අසුරේන්ද්‍රයා වනාහි පාදාන්තයේ පටන් කේසාන්තය දක්වා යොදුන් හාරදහස් පන්සියයකි. ඔහුගේ බාහු දෙක අතර යොදුන් එක්දහස් දෙසීයකි. ඝනකමින් යොදුන් හයසියයකි. අත්පා තලයන් යොදුන් තුන්සියයකි. මුඛයද එසේමය. එක එක ඇඟිලි පුරුක යොදුන් පනසකි. එසේම දෙබැම අතර නළල යොදුන් තුන්සියයකි. හිස යොදුන් නවසීයකි. මහා සමුද්‍රයට බැසගත් ඔහුට යොදුන් දහසක් පමණ තැන ගැඹුරු ජලය දණක් පමණ වෙයි. හෙතෙම මෙසේ කියන්නේය. මේ මහා සමුද්‍රය ගැඹුරුය, ගැඹුරුය කියා කියත්. එහි ගැඹුරු බවක් කොයින්ද? අපි දණහිස වැසෙන තරම්වත් ජලය නොලබමු. එහි රාහුගේ ශරීරයට මහා සමුද්‍රය පහත්ය. අනිත් අයටද පහත්යැයි නොකිව යුතුයි. එපරිද්දෙන් ඤාණයෙන් යුක්ත තෙරුන්ට පටිච්ච සමුප්පාදය පහත්ය අන් අයටද පහත්ය කියා නොකිව යුතුයි. මේ කාරණය පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ, ආනන්දය මෙසේ නොකියන්න. මෙසේ නොකියන්න' යැයි වදාළ සේක. තෙරුන්වහන්සේට වනාහි කාරණ සතරක් නිසා ගැඹුරු වූද පටිච්ච සමුප්පාදය නොගැඹුරු යැයි වැටහේ. කවර කරුණු සතරක්ද? පෙර

පැවැති වාසනා සම්පත්තිය, ශුද්ධ ස්ථානයක වාසය සෝවාන් බවට පත්වීම හා බහුශ්‍රැත භාවයෙන් යුක්ත වීම යන සතරයි.

මෙයින් කල්ප ශතසහස්‍රයකට පෙර පදුමුත්තර නම් ශාස්තෲන් වහන්සේ ලොව පහළවිය. එතුමන්ට හංසවතී නම් නගරය විය. ආනන්ද නම් රජු පියාය. සුමේධා නම් දේවිය මවය. බෝධිසත්ත්වයෝ උත්තර කුමාරයා නම් වූහ. හෙතෙම දරුවකු උපන් දිනයේම මහාභිනිෂ්ක්‍රමණය කොට පැවිදි වී වීර්යයෙහි යෙදුනේ පිළිවෙලින් සර්වඥ බවට පත්ව 'අනෙකජාති සංසාරං' යනාදී උදානය පවසා දින සතක් බෝමැඩ ගතකර බිම තබන්නෙමියි පය තැබීය. ඉක්බිති මහපොළව පැලී මහත් වූ පද්මයක් පැන නැංගේය. එහි පත්‍රයක් රියන් අනූවකි. කෙසරු රියන් තිහකි. කර්ණිකාව දොළොස් රියනකි. කල නවයක් පමණ රේණු විය. ශාස්තෲන් වහන්සේ වනාභි උසින් අටපනස් රියන් විය. උන්වහන්සේගේ බාහු දෙක අතර දහඅට රියනකි. නළල රියන් පහකි. අත්පා රියන් එකොළොසකි. උන්වහන්සේගේ රියන් එකොළොසක් වූ පාදයෙන් දොළොස් රියන් කර්ණිකාව පිරිමදිනවිට කල නවයක් පමණ රේණු නැගී පනස්අට රියනක් පමණ උසට පැන නැගී ඉසින ලද මනෝසීල කුඩු මෙන් පැතිරුණේය.

ඒ හේතුවෙන්ම භාග්‍යවතුන් වහන්සේ පදුමුත්තර යැයි හැඳින්වූහ. උන්වහන්සේට දෙවල, සුජාත යැයි අගසව් දෙනමක් වූහ. අමිතා අසමා යැයි අග්‍ර ශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. උපස්ථායක සුමන නම් විය. පුදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පියාට සංග්‍රහ කරන්නේ භික්ෂූන් දහසක් පිරිවරා හංසවතී රාජධානියෙහි නම් විය. ඔහුට රජතුමා හංසවතියේ සිට යොදුන් දෙදහසක ප්‍රමාණයේ ගම්වරයක් දුන්නේය. හෙතෙම වරින්වර අවුත් පියාවත් ශාස්තෲන් වහන්සේවත් දකියි. ඉක්බිති එක්දිනක් ප්‍රත්‍යන්තයක ජනයා කිපුනේය කියා රජුට දැන්වීය. රජු කුමක් නිසා මා විසින් ඔබව එහි යොදවන ලදදැයි නැවතත් දන්වා යැවීය. ඔහු සොරුන් යටත්කොට, දේවයන් වහන්ස! ජනපදය සංසිඳුනේ යැයි රජුට දන්වා යැවීය. රජු සතුටුව, වහා මගේ පුත්‍රයා එනු ලැබේවායි කීය. ඔහුට දහසක් පමණ අමාත්‍යවරු සිටිති. හෙතෙම ඔවුන් සමග අතරමගදී සාකච්ඡා කළේය. මාගේ පියා සතුටුවූයේ වෙයි. ඉදින් මට වරයක් දෙන්නේ නම් කුමක් ලබාගන්නෙම්ද? ඉක්බිති ඇතැමෙක් ඇතෙකු ලබාගන්න යැයි කීහ. ඇතැමෙක් අශ්වයකු ගන්න, ජනපදයක් ගන්න,

සප්තරත්නයන් ගන්න යැයි යනාදී ලෙස කීහ. සමහරු ඔබවහන්සේ මහා ධනවත්තයකුගේ පුත්‍රයෙකි. ඔබට ධනය හිඟ නැත. ලැබුවත් ඒ සියල්ල දමා යායුතුයි. එකම පින රැගෙන යා යුතුයි. ඒ නිසා රජතුමා වර දෙන කල්හි තුන්මාසයක් පදුමුත්තර බුදුන්ට උපස්ථාන කිරීමට වරයක් ඉල්ලා ගන්න යැයි කීහ. හෙතෙම නුඹලා වනාහි මාගේ කල්‍යාණ මිත්‍රයෝය. මට එබඳු සිතක් නැත. නුඹලා විසින් ඒ සිත ඇතිකරන ලදී. එසේ කරන්නෙමියි ගොස් පියාට වැඳ පියා විසින් වැළඳ ගන්නා ලද්දේ හිස සිඹ පුත්‍රය, මම ඔබට වරයක් දෙමියි කියන ලද්දේ, මහරජතුමනි! මම තුන්මාසයක් භාග්‍යවතුන් වහන්සේට සිව්පසයෙන් උපස්ථාන කර ජීවිතය සඵල කරගන්නට මට මේ වරය දෙන්න යැයි කීය. දරුව, එය කළ නොහැක. වෙන වරයක් ඉල්වන්නැයි කීය. ක්‍ෂත්‍රියයන්ගේ වනාහි වචන දෙකක් නැත. එබැවින් මෙයම දෙන්න. මට වෙන එකකින් වැඩෙක් නැත. දරුව, බුදුවරයන්ගේ සිත වටහාගන්නට අපහසුය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ කැමැති නොවන්නේ නම් මා දුන් දෙයට කුමක් වන්නේද?

දේවයන් වහන්ස! එසේය. මම භාග්‍යවතුන් වහන්සේගේ සිත දැනගන්නෙමියි විහාරයට ගියේය. ඒ අවස්ථාවේ භාග්‍යවතුන් වහන්සේ දන් වළඳ අවසන් කර ගන්ධකුටියට වැඩියේ වන. ඔහු මිදුලෙහි රැස්ව සිටි භික්‍ෂූන් සමීපයට ගියේය. ඔව්හු ඔහුට මෙසේ කීහ. රාජපුත්‍රය! කුමක් නිසා පැමිණියෙහිද? භාග්‍යවතුන් වහන්සේව හමුවන්නටය. මට උන්වහන්සේව මුනගස්වන්න. රාජපුත්‍රය! අපි සිතන සිතන වේලාවට ශාස්තෘන් වහන්සේව දකින්නට නොහැක්කෙමු. ස්වාමීනි! කවරෙක් එසේ ලබයිද? රාජපුත්‍රය! සුමන නම් තෙරුන් වහන්සේය. ස්වාමීනි! උන්වහන්සේ කොහිදැයි තෙරුන්වහන්සේ හිඳිනා තැන් විමසා ගොස් වැඳ ස්වාමීනි! අපි භාග්‍යවතුන් වහන්සේව දකින්නට කැමැත්තෙමු. අපට මුනගස්වන්න යැයි කීය. තෙරුන්වහන්සේ එවිට එන්න රාජපුත්‍රය! යැයි ඔහුත් සමග ගොස් ඔහුව ගඳකිළි පිරිවෙණෙහි තබා ගඳකිළියට නැංගේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, සුමන! කුමක් නිසා පැමිණියේදැයි ඇසීය. ස්වාමීනි! රාජපුත්‍රයෙක් භාග්‍යවතුන් වහන්සේ දැකීමට පැමිණ සිටීයැයි පැවසීය. එසේනම් භික්‍ෂුව ආසනයක් පනවන්නැයි කියා තෙරුන් වහන්සේ ආසනයක් සූදානම් කළේය. භාග්‍යවතුන් වහන්සේ පනවන ලද අසුනෙහි වැඩසිටි සේක. රාජපුත්‍රයා බුදුන් වැඳ පිළිසඳර කථා කළේය. රාජපුත්‍රයා කවර වේලාවක පැමිණියේදැයි ඇසූවිට ස්වාමීනි! ඔබවහන්සේ ගඳකිළියට පිවිසි අවස්ථාවේ යැයි පැවසීය. සිතූ සිතූ වේලාවට භාග්‍යවතුන්

වහන්සේ දකින්නට අපට නොහැක යයි භික්ෂූහු මා තෙරුන් වහන්සේ සමීපයට යැවූහ. තෙරුන් වහන්සේ වනාහි එක වචනයෙන්ම මුනගැස්වීය. ස්වාමීනි! ඔබවහන්සෙගේ ශාසනයෙහි මේ භික්ෂූන් වහන්සේ අතිශයින් විශ්වසනීයයි සිතමි. එසේය රාජකුමාරයෙනි, මේ භික්ෂුව මාගේ ශාසනයේ අතිශයින් විශ්වසනීය කෙනෙකි. ස්වාමීනි! මම මේ තෙරුන් මෙන් බුද්ධ ශාසනයෙහි විශ්වාසනීය කෙනෙක් වනු කැමැත්තෙමි. තුන් මාසයක් මාගේ වස් ආරාධනය පිළිගන්නා සේක්වායි කීය. භාග්‍යවතුන් වහන්සේ එහි යාමෙන් යම්කිසි ප්‍රයෝජනයක් ඇත්දැයි බලා ඇත යැයි සිතා, රාජකුමාරය! තථාගතයන් වහන්සේලා වනාහි ශූන්‍යාගාරයේ නතරවනු කැමැති වෙත් යැයි කීය. කුමාරයා, භාග්‍යවතුන් වහන්සේව හඳුනා ගත්තෙමි. සුගතයන් වහන්සේව දැනගත්තෙමි යි කියා ස්වාමීනි! මම පළමුවෙන්ම ගොස් විහාරයක් කරමි. මා විසින් යවන ලද සියක් දහසක් භික්ෂූන් සමග වඩින්න යැයි ප්‍රතිඥා ලබාගෙන පියා සමීපයට ගොස් දේවයන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේ විසින් පොරොන්දුවක් දෙන ලදී. මා විසින් දැන්වූ කල්හි භාග්‍යවතුන් වහන්සේව එවන්න යැයි පියාට වැඳ නික්ම යොදුනක් පාසා විහාර කරවන්නේ යොදුන් දෙදහසක් මග ගොස් තමන්ගේ නගරයෙහි විහාරයක් සාදන්නට තැනක් සොයන්නේ 'සෝභ' නම් කෙළෙඹියාගේ උයන දැක ලක්ෂයක් දී මිළට ගෙන ලක්ෂයක් වියදම් කර විහාරයක් කරවීය. එහි භාග්‍යවතුන් වහන්සේට ගඳකිළියක්ද සෙසු භික්ෂූන්ට ද රාත්‍රී ස්ථාන හා දිවා ස්ථාන සඳහා වෙන වෙනම කුටි සාදවා පවුරුවලින් වටකර දොරටුද නිමකර පියාට දන්වා යැවීය. මාගේ කටයුතු නිමාවී ඇත. ශාස්තෲන් වහන්සේව එවන්න. රජු භාග්‍යවතුන් වහන්සේව වළඳවා, භාග්‍යවතුන් වහන්ස! සුමන කුමාරයාගේ කටයුතු නිමාවී ඇත. ඔබවහන්සේගේ වැඩමවීම බලාපොරොත්තුව සිටී යැයි කීය. භාග්‍යවතුන් වහන්සේ ලක්ෂයක් භික්ෂූන් පිරිවරා යොදුනෙන් යොදුන ඒ ඒ විහාරයන්හි නතරවෙමින් වැඩිසේක. කුමාරයා ශාස්තෲන් වහන්සේ වඩින්නේ යැයි අසා යොදුනක් දුර පෙරගමන් කොට ගඳමල් ආදියෙන් පුදමින් විහාරයට වැඩමවාගෙන ගොස්

**සතසහස්සෙන මෙ කීතං සතසහස්සෙන මාපිතං**
**සොභනං නාම උය්‍යානං පතිගණ්හ මහා මුනී**

මා විසින් ලක්ෂයකට මිළදී ගන්නා ලද ලක්ෂයක් වියදම් කර නිර්මාණය කරන ලද සොභන නම් වූ උද්‍යානය මහා මුනීන්ද්‍රයන් වහන්ස! පිළිගනු සේක්වා.

කියා විහාරය පූජා කළේය. හෙතෙම වස්වසනා දිනයෙහි දන් දී තමන්ගේ දරුවන් හා භාර්යාවන් ද ඇමැතිවරුන් ද කැඳවා මෙසේ කීය. මෙ ශාස්තෘන් වහන්සේ දුරක සිට අප ලඟට වැඩි සේක. බුදුවරයන් වහන්සේලා වනාහි ධර්මගරුක වෙත්. ආමිසය ගරු නොකරත්. ඒ නිසා මම මේ තුන්මාසය සළු දෙකක් හැඳපොරවා දසසිල් සමාදන් වී මෙහිම වාසය කරන්නෙමි. නුඹලා රහතන් වහන්සේලා ලක්‍ෂයකට මේ ආකාරයෙන්ම තුන්මසක් දන්දෙව්. හෙතෙම සුමන තෙරුන්ට වාසය කරන සමීපයේම නතරවී සිට තෙරුන් වහන්සේ යම් වතක් භාග්‍යවතුන් වහන්සේට කරයිද ඒ සියල්ල දැක මේ ස්ථානයේ වැඩසිටින එකම විශ්වාස කටයුතු පුද්ගලයා මේ තෙරුන් වහන්සේය.

මුන්වහන්සේගේ තනතුරම ප්‍රාර්ථනා කළයුතුයැයි සිතා වෙන් වෙන් වශයෙන් පවාරණය පිණිස ගමට පිවිස සත්දිනක් මහදන් දී සත්වන දිනයෙහි ලක්‍ෂයක් භික්‍ෂූන් වහන්සේලාගේ පාදමූලයෙහි තුන්සිවුර තබා භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කොට ස්වාමීනි! මාර්ගයෙහි යොදනෙන් යොදුන් විහාර කරවීමේ පටන් යම් පිනක් මා විසින් කරන ලද ද එය ශක්‍ර සම්පත්තිය, මාර සම්පත්තිය, බ්‍රහ්ම සම්පත්තිය පතා කරන ලද්දේ නොවෙයි. බුදුරජාණන් වහන්සේගේ උපස්ථායක තනතුර ප්‍රාර්ථනා කරගෙන කරන ලදී. ඒ නිසා මම ද සුමන තෙරුන් වහන්සේ මෙන් බුදුරජාණන් වහන්සේගේ උපස්ථායකයා වන්නෙමියි පසඟ පිහිටුවා වැන්දේය. භාග්‍යවතුන් වහන්සේ වනාහි කුලපුත්‍රයාගේ පැතුම ඉතා ප්‍රබල වූවකි. එය ඉටුවන්නේ ද නැද්ද කියා බලන්නේ අනාගතයේ මෙයින් කල්ප ලක්‍ෂයක් ගිය තැන ගෞතම නම් වූ බුදුවරයන් වහන්සේ නමක් පහළ වන්නේය. උන්වහන්සේගේ උපස්ථායකයා වන්නේ යැයි දැනගෙන

**ඉච්ඡිතං පත්‍ථිතං තුය්හං, සබ්බමෙව සමිජ්ඣතු**
**සබ්බෙ පූරෙන්තු සංකප්පා චන්දො පණ්ණරසො යථා**

ඔබගේ සියළු සිතුම් පැතුම් ඉටුවේවා. සියළු බලාපොරොත්තු පසළොස්වකදා චන්ද්‍රයා මෙන් පරිපූර්ණත්වයට පත්වේවා.

කුමාරයා එය අසා බුදුවරු නම් කථා දෙකක් නැති ඇත්තෝ යැයි පසුවදාම ඒ භාග්‍යවතුන් වහන්සේගේ පාසිවුරු ගෙන පසුපසින් යන්නාක්

මෙන් විය. හෙතෙම. එම බුද්ධෝත්පාදයේදී වර්ෂ ලක්‍ෂයක් දන් දී සුරලොව ඉපිද කාශ්‍යප බුදුන්ගේ කාලයේද පිඩුසිඟා වඩින තෙරනමකගේ පාත්‍රය තබාගැනීම පිණිස උතුරුසළුව පූජා කළේය. නැවත ස්වර්ගයෙහි ඉපිද එයින් චුතව බරණැස් රජුව පසේබුදුවරයන් වහන්සේලා අටනමකට පන්සල් කරවා දී මාණික්‍යමය ආධාරකයන් පිහිටුවා සිව්පසයෙන් වර්ෂ ලක්‍ෂයක් උපස්ථාන කළේය. මේ ප්‍රකට තැන්ය. කල්ප ලක්‍ෂයක් දන් දෙන්නේ අපගේ බෝධිසත්ත්වයන් සමග තුසිත දෙව්ලොව ඉපිද එයින් චුතව අමිතෝදන ශාක්‍යයාගේ ගෙයි පිළිසිඳ ගෙන පිළිවෙලින් කරන ලද අබිනික්මන් ඇත්තේ බුද්ධත්වයට පත්ව පළමුවෙන් කපිලවස්තු නගරයට වැඩමවා භාග්‍යවතුන් වහන්සේ එතනින් නික්ම යනකල්හි භාග්‍යවතුන් වහන්සේගේ පිරිවර පිණිස රාජකුමාරවරුන් පැවිදිවන කල්හි භද්දිය ආදීන් සමග නික්ම භාග්‍යවතුන් වහන්සේ ලඟ පැවිදිව නොබෝ කලකින්ම ආයුෂ්මත් මන්තානිපුත්ත පුණ්ණ තෙරුන්ගෙන් බණ අසා සෝවාන් පෙළෙහි පිහිටියේය. මේ පරිද්දෙන් මේ තෙරුන්වහන්සේ පෙර වාසනා සම්පත්තිය ඇත්තේ වෙයි. මේ පෙර වාසනා මහිමය නිසා ගැඹුරු වූද පටිච්ච සමුත්පාද ධර්මය මුන්වහන්සේට නොගැඹුරු ලෙස වැටහින. තිත්ථවාසො යනු නැවත නැවතත් ගුරුවරුන් ලඟ ඉගෙනීම, සවන්දීම, විචාරීම, ධාරණය යන මේවා අදහස් කෙරේ.

එය තෙරුන්වහන්සේට වනාහි අතිශයින් පිරිසිදුය. ඒ නිසා මෙ තෙරුන්වහන්සේට ගැඹුරු වූ ද පටිච්චසමුප්පාද ධර්මය නොගැඹුරු ලෙස වැටහෙයි. සෝවාන් වූවන්ට වනාහි ප්‍රත්‍යාකාරය නොගැඹුරු ලෙස වැටහේ. මේ තෙරුන් වහන්සේද සෝවාන් කෙනෙක් බහුශ්‍රැතයන්ට වනාහි රියන් සතරක් වූ කාමරයක පහනක් දල්වෙන විට ඇඳ පුටු මෙන් නාමරූප පරිච්ඡේදය පැහැදිලිව පෙනෙයි. මේ තෙරුන් වහන්සේ ද බහුශ්‍රැතයන් අතර අගතැන්පත් කෙනෙකි. බහුශ්‍රැත බව නිසා මොහුට ගැඹුරු වූ ප්‍රත්‍ය පිළිවෙල නොගැඹුරු ලෙස වැටහේ. එහි අර්ථයෙහි ගැඹුරු බව නිසාත් ධර්මයේ ගැඹුරු බව නිසාත් දේශනාවේ ගැඹුරු බව නිසාත්, අවබෝධයේ ගැඹුරු බව නිසාත් යන සිව් ආකාරයෙන් පටිච්ච සමුප්පාද ධර්මය ගැඹුරුය. එහි ජාති මරණ දෙකෙහි ජාති ප්‍රත්‍ය නිසා හටගත් යන අර්ථය ගැඹුරුය. -පෙ- සංස්කාරවල අවිජ්ජාව නිසා හටගත්තේය. අර්ථය ගැඹුරුය යන මේ අර්ථයෙහි ගැඹුරු බවයි. අවිජ්ජාව සංස්කාරයන්ට ප්‍රත්‍ය වේ යන අර්ථය ගැඹුරුය. කිසියම් සූත්‍රයක පටිච්ච

සමුප්පාදය අනුලෝම වශයෙන් දේශනා කරයි. සමහර තැනක ප්‍රතිලෝම ලෙස තවත් තැනක අනුලෝම ප්‍රතිලෝම වශයෙන්. කිසියම් තැනක මැදසිට, අනුලෝම වශයෙන්, ප්‍රතිලෝම වශයෙන් අනුලෝම පටිලෝම ලෙස, කිසි තැනක ත්‍රිසන්ධි චතුසංඛෙප ලෙස, තවත් තැනක ද්විසන්ධි සංක්ෂේප ලෙස කිසියම් තැනක එකසන්ධි ද්විසංඛෙප ලෙස යන මේ ක්‍රමයන් දේශනා ගම්භීරතාවයයි. අවිජ්ජාව නිසා නොදැනීම, නොදැකීම, සත්‍ය අවබෝධ නොවීම යන ලෙස අර්ථ වශයෙන් ගැඹුරුය. සංස්කාරයන්ගේ සම්පාදනය, රැස්කිරීම, හටගැනීම යන ලෙස නිදාන (හේතු) අර්ථයි. විඤ්ඤාණයේ ශුන්‍ය බව, අව්‍යාපාර, අසංඛත බව යන්න ප්‍රතිසන්ධිය ඇතිවීමේ අර්ථයි. නාමරූපයන්ගේ එකුප්පාද, බෙදා වෙන්කිරීම නම් වූ විනිබ්භාග, අවිනිබ්භාග, අරුප්පන (වෙනස් නොවීම) අර්ථයි. ෂඩායතනයන්ගේ අධිපති, ලෝකද්වාර ඛෙත්තවිසයී භාව අර්ථයයි. ස්පර්ශයේ, ස්පර්ශ වීම, ගැටීම, එක්වීම, රැස්වීමේ අර්ථයි. වේදනාවගේ අරමුණ, රස විඳීම, සැප දුක මධ්‍යස්ථ බව නිජ්ජීවි අවබෝධ අර්ථයි. තණ්හාවගේ සතුටුවීම, බලවත් ඇල්ම, එක්තැන්වීම, තෘෂ්ණා නදිය, තෘෂ්ණා සමුද්‍රය පිරවීමට අපහසු බව යන අර්ථයි. උපාදානයාගේ දැඩි ලෙස ගැනීම, ඇලීම, ස්පර්ශ කිරීම (පරාමාස) ඉවත් කිරීමට අපහසු යන අර්ථයි. භවයාගේ රැස්කිරීම, සකස්කිරීම, යෝනි, ගති, ඨිති, වාස යන මේවායේ හෙළීම යන අර්ථයි.

ජාතියේ, ජාති, සජාති පිහිටීම, උපත පහළවීම යන අර්ථයි. ජරාමරණයාගේ ක්ෂයවීම, වැයවීම, භේදවීම, වෙනසට පත්වීම යන අර්ථ ගම්භීරතාවය ඇත.

මෙසේ යම් යම් අවිද්‍යා ආදීන්ගේ ස්වභාවය යම් ප්‍රතිවේදයකින් අවිජ්ජා ආදී ධර්මයන් ස්වකීය ලක්ෂණයන්ගෙන් අවබෝධ වූයේ වේද එය ගම්භීරය කියා. මේ ප්‍රතිවේධ ගම්භීරතාවයයි. ඒ සියල්ලම තෙරුන්ට සරල ලෙස වැටහින. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ව වලක්වමින් මාහෙවං ආදිය වදාළහ. මේ වනාහි මෙහි බලාපොරොත්තුවයි. ආනන්දය! නුඹ මහා ප්‍රාඥයෙකි. තියුණු නුවණ ඇත්තෙකි. ඒ නිසා නුඹට ගැඹුරු වූ පටිච්චසමුප්පාද ධර්මය නොගැඹුරු ලෙස පෙනෙයි. එබැවින් මෙය මටම නොගැඹුරු ලෙස පෙනෙයි. එබැවින් මෙය මට ම නොගැඹුරු ලෙස වැටහේ. නැතහොත් අන් අයටත් එසේම යැයි මෙසේ නොකියන්න කියා යමක් කියන ලද ද එය

දෝෂාරෝපණයක්ය. එහි අදහස මෙසේය. ආනන්දය, යම්සේ වනාහි ගැඹුරු දෙය නොගැඹුරු ලෙස පෙනේ යයි නොකියන්න. ඉදින් වනාහි ඔබට මේ ගැඹුරු දෙය නොගැඹුරු ලෙස පෙනෙයිද? කුමක් නිසාද? නුඹ තමාගේ ස්වභාවය අනුව සෝවාන් වූයේ නොවේ. මා දුන් න්‍යාය මාර්ගයේ සිට සෝවාන් මාර්ගය අවබෝධ කරගත්තෙහිය. ආනන්දය! මේ නිර්වාණයම ගැඹුරුය. ප්‍රත්‍යාකාරය (පටිච්ච සමුප්පාද) වනාහි බවට නොගැඹුරු එකක් විය. ඉක්බිති කුමක් නිසා ඕලාරික වූ කාමරාග සංයෝජනයත්, පටිඝ සංයෝජනයත් (ව්‍යාපාද) ඕලාරික වූ කාමරාගයත්, පටිඝයත් යන කෙලෙස් සතර නසා සකෘදාගාමී ඵලය අවබෝධකර නොගන්නෙහිද? ඒ අනුසහගත වූ කෙලෙස් සතර මුලිනුදුරා දමා අනාගාමී ඵලය අවබෝධකර නොගන්නෙහිද? රූපරාග ආදී වූ සංයෝජන පස මානයත්, භවරාගයත් අවිජ්ජාවත් යන මේ කෙළෙස් අට මුලිනුපුටා දමා රහත්බව අවබෝධ කර නොගන්නෙහිද? කුමක් නිසා කල්ප ලක්‍ෂයකට අධික ඒකාසංඛ්‍ය කල්පයක් පුරණ ලද පාරමිතාවන් ඇති සැරියුත් මුගලන් දෙනම මෙන් ශ්‍රාවක පාරමී ඥාණය අවබෝධ කර නොගන්නෙහිද? ඉදින් ඔබට මේ සියල්ල සරල ලෙස වැටහේ නම් කුමක් නිසා සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් හෝ අටක් හෝ සොළසක් අසංඛ්‍ය කල්පයක් පාරමිතා පුරන සම්මා සම්බුදුවරයන් වහන්සේලා මෙන් සර්වඥතාඥානය අවබෝධ කර නොගන්නෙහිද? කුමක් නිසා මේ විශේෂ අධිගමයන්ගෙන් වියුක්ත වන්නේද බලන්න. ඥාණයේ කොටසක පමණක් පිහිටි ශ්‍රාවකයකු වන ඔබ වරදකරුවෙකි. කුමක් නිසාද? අතිශයින් ගැඹුරු වූ ප්‍රත්‍යාකාරය (පටිච්ච සමුප්පාදය) මට ඉතා සරල ලෙස වැටහේයැයි කියන්නෙහිය. ඒ ඔබගේ වචනය බුදුවරයන් වහන්සේලාගේ වචනයට විරුද්ධ වූවකි. එබඳු වූ භික්‍ෂුවක විසින් බුදුවරයන්ගේ කථාවට විරුද්ධව කථා කළයුතුයැයි සිතීම සුදුසුද? ආනන්දය! මේ ප්‍රත්‍යාකාරය වටහාගන්නට උත්සාහ කරන වටකල්ප ලක්‍ෂයක් අධිකකොට ඇති සිව් අසංඛ්‍යයක් කල් ගතවිය. මේ ප්‍රත්‍යාකාරය වටහාගැනීම පිණිස නුදුන් දානයක් නම් නැත. නොපිරූ පාරමිතාවක් නැත. ප්‍රත්‍යාකාරය අවබෝධකර ගන්නෙමියි උත්සාහයක් නැති බව මාරබලය පරාජය කරද්දී මේ මහපොළව අඟල් දෙකක්වත් සෙලවූයේ නැත. එසේම ප්‍රථම යාමයේදී පෙරවිසූ කඳපිළිවෙල මධ්‍යම යාමයේදී දිවැස, පිරිසිදු කරන්නා වූ, පශ්චිම යාමයෙහි එසේම ඉතා අළුයම අවිජ්ජා සංඛාර පිළිබඳ නව ආකාරයකින් ප්‍රත්‍ය වන්නේ යැයි දුටු විගසම දස සහශ්‍රී ලෝකධාතුව යකඩයකින් පහරදෙන ලද ලෝහ තැටියක් මෙන් සියවරක් හඬ නගමින් වාතයෙන් පහරලත් නෙලුම් පත්‍රයක

දියබිඳුවක් මෙන් කම්පා විය. ආනන්දය! එපරිද්දෙන් මේ පටිච්ච සමුප්පාද ධර්මය ගැඹුරු ආලෝකයක් ඇත්තේය. ආනන්දය, මේ ධර්මය අවබෝධ නොවීමෙන් -පෙ- ඉක්මවා නොයයි.

**එතසස ධමමසස** මේ ප්‍රත්‍යාකාර ධර්මයට **අනනුබොධා** යනු හඳුනාගැනීම හා වටහාගැනීම වශයෙන් අවබෝධකර නොගැනීම. **අපපටිවෙධා** යනු තීරණ පහාන පරිඤ්ඤා වශයෙන් අවබෝධ නොකිරීම. **තනතාකුලකජාතා** යනු නූලක් මෙන් අවුල් වූ යම්සේ වනාහි ඉවත දමන ලද මීයන් කැපූ පේෂකාර්මිකයන්ගේ නූල් ඒ ඒ තැන අවුල්ය. මේ අගය. මේ මුලය කියා අගින් අගට හෝ මුලින් මුලට හෝ ගැලපීම දුෂ්කරය. මෙපරිද්දෙන් සත්ත්වයෝ මේ ප්‍රත්‍යාකාරයෙහි පැකුළුනාහු අවුල්වියවුල් බවට පත්වූවෝ වෙත්. ඒ ප්‍රත්‍යාකාරය ඍජු කිරීමට අසමත් වෙති. ඒ නූල වෙන වෙනම පුරුෂයන්ගේ ක්‍රියාකාරකම්වලින් ඍජු කිරීමට පුළුවන. බෝධිසත්ත්වයන් දෙදෙනෙක් හැර අනික් සත්ත්වයන් තම තමන්ගේ ධර්මතාවයන්ගෙන් ප්‍රත්‍යාකාරය ඍජු කිරීමට සමර්ථ වන්නේ නැත. යම්සේ වනාහි අවුල් වූ නූලට කැඳ දමා බුරුසුවකින් පිරිමැද්ද නමුත් තැන් තැන්වල ගුලි ගැසී, ගැටගැසී ඇත. එසේම මේ සත්ත්වයෝ ප්‍රත්‍යයන්හි පැකිළී ප්‍රත්‍යයන් ඍජු කිරීමට නොහැක්කාහු දෙසැට මිථ්‍යාදෘෂ්ටි වශයෙන් ගුලිගැසී සිටිත්. ගැටගැසුනාහු යම්කිසි දෘෂ්ටියකින් යුක්ත වූවාහු වෙත්. සියල්ලෝම ප්‍රත්‍යාකාරය ඍජු කිරීමට සමර්ථයෝ නොවෙත්.

**ගුළාගණ්ඨිකජාතා** යනු පේෂ කාර්මිකයන්ගේ කැඳ පෙවූ නූල් කුලා නම් කිරිල්ලිය. ඇගේ කැදැල්ල යයි සමහරු කියති. යම්සේ වනාහි ඒ දෙකම අවුල් සහිතයි. අගින් අගට මුලින් මුලට එකතු කරන්නට අපහසුය යනුවෙන් පෙර පරිද්දෙන්ම යොදාගත යුතුයි. **මුඤ්ජබබජභූතා** තණකොල වර්ගයක්, එබඳු වූ බුබුස් තණ මෙන්, ඒ ආකාර වූ ඒ තණකොල ඒවා තළා කරන ලද නූල දිරාගිය කල්හි යම්තැනක වැටී තිබුනු එය ගෙන ඒ තණකොලවල මේ අගය. මේ මුලය. අගින් අග හෝ මුලින් මුල හෝ ගලපන්නට අපහසුය. එයද වෙනවෙනම පුරුෂ කාර්යයෙහිලා ඍජු කරන්නට හැකිවිය හැක. බෝධිසත්ත්වයන් දෙදෙනෙක් හැර අන් සත්ත්වයෝ තමන්ගේ ස්වභාවයෙන් ප්‍රත්‍යාකාරය. ඍජු කරන්නට සමත් නොවෙත්. එපරිද්දෙන් මේ ප්‍රජාව ප්‍රත්‍යාකාරය ඍජු කරන්නට නොහැක්කාහු දෘෂ්ටිගත වීමෙන් ගැට සහිත වී අපායට. දුගතියට,

විපත්තිකර සංසාරය නොඉක්මවයි. එහි අපායො යනු නරකය, තිරිසන් යෝනිය, ප්‍රේත විෂය හා අසුරකායයි. මේ සියල්ලෝම වර්ධන සංඛ්‍යාත අයක් නොමැතිවීමෙන් අපාය යැයි කියත්. එසේම දුක්ඛයාගේ ගති ස්වභාවයෙන් දුගගති සැප සමූහයෙන් වැටෙන්නේ නුයි විනිපාත නම් වේ. අනික වනාහි.

> ඛන්ධානං පටිපාටි ධාතු ආයතනානිච
> අබ්බොච්ජින්නං වත්තමානං සංසාරොති පවුච්චති

ස්කන්ධයන්ගේ පිළිවෙල ධාතු ආයතන යන මේවා එකට බැඳී පවතින්නේ සංසාරයයි කියනු ලැබේ.

ඒ සියල්ලම නොඉක්මවයි. ඉක්බිති ච්‍යුතියෙන් ප්‍රතිසන්ධියත්, ප්‍රතිසන්ධියෙන් ච්‍යුතියත් යන ලෙස නැවත නැවතත් ච්‍යුති ප්‍රතිසන්ධි ගැනීම් ලබන්නාහු තුන් භවයෙහි යෝනි සතරෙහි, පස් ගතිවල, විඤ්ඤාණඨිති සතෙහි, නව සත්තාවාසවල මහා සමුද්‍රයෙහි වාතයෙන් පහර වැදුනු නැවක් මෙන් යන්ත්‍රයක යොදන ලද ගොනකු මෙන් ද පරිභ්‍රමණය වන්නේය. මෙසේ මේ සියල්ල භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට නින්දා කරමින් පැවසීයයි දතයුතුයි. දැන් යම්හෙයකින් මේ සූත්‍රය 'ගම්භීරොචායං ආනන්ද පටිච්චසමුප්පාදො' ආනන්දය, මේ පටිච්ච සමුප්පාදය ගැඹුරුය කියාද 'තන්තාකුලකජාතා' නූල්වලින් අවුල් වූ යන මේ පද දෙකෙහිම බැඳීමක් ඇත. ඒ නිසා ආනන්දය, මේ පටිච්චසමුප්පාදය ගැඹුරුය යන මේ ගැලපීමෙන් ප්‍රත්‍යාකාරයේ ගැඹුරු බව දේශනා කිරීම පිණිස අරඹමින් 'අත්ථි ඉදප්පච්චයා ජරාමරණං මේ ප්‍රත්‍ය හේතුවෙන් ජරාමරණ ඇතිවේ. ආදිය පැවසීය. එහි අර්ථය මෙයයි. මේ ජරාමරණවලට හේතුව ඉදප්පච්චය ඒ හේතුවෙන් ජරාමරණ ඇතිවේ. ජරාමරණවලට හේතුවක් තිබේද? යම් හේතුවකින් ජරාමරණ සිදුවන්නේද? ආනන්දය! පණ්ඩිත පුද්ගලයකු විසින් මෙසේ විචාරණ ලද කල්හි, ඒ ජීවිතය, ඒ ශරීරයැයි කී කල්හි ප්‍රශ්නය තැබිය යුතු බැවින් නිහඬවිය යුතුයි. මෙය තථාගතයන් වහන්සේ විසින් පහදා දෙන ලද්දේයැයි කිවයුතුයි. මෙසේ පිළිනොපැද යම්සේ චක්ඛු ශාස්වත අශාස්වතද කී කල්හි ස්ථිරවම අශාස්වතයැයි කිවයුතුයි. ඒකාන්ත වශයෙන් කිවයුතු වචනයක් ඇත. නැවත කුමන හේතුවක් නිසා ජරාමරණ ඇතිවේද, යමකින් ජරාමරණ වන්නේද? ඒ ප්‍රත්‍යය කුමක්ද කියා කී කල්හි ජාතිය

හේතුවෙන් ජරාමරණ වන්නේ යැයි කිවයුතුයි. මෙසේ කිවයුතු වන්නේය යන අර්ථයි. සියලු පදයන්හි මේ ක්‍රමයයි. නාමරූපපච්චයා එසෙසා මෙය වනාහි, යම්හෙයකින් ෂට් ආයතන හේතුවෙන් යැයි කී කල්හි චක්ඛු සම්පර්ශන ආදී විපාක ස්පර්ශ සයම ගණන් ගැනේ. මෙහිද ෂඩායතන හේතුවෙන් මේ පදයෙන් ගන්නා ලදී. නොගන්නා ලද ප්‍රත්‍ය උප්පන්න වශයෙන් ද, ස්පර්ශයාගේද ෂඩායතනවලින් ඉතිරි වෙනත් විශේෂ ප්‍රත්‍යයක් දක්වනු කැමැත්තේ ඒ නිසා කියන ලදැයි දතයුතුයි. මේ ක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් කුමක් දේශනා කරන ලදද? ප්‍රත්‍යයන්ගේ හේතුව කියන ලදී. මේ සූත්‍රය වනාහි ප්‍රත්‍යයන් ගැටළු රහිත අවුල් නැතිකොට ප්‍රකාශකරන ලද බැවින් මහානිදාන යැයි කියනු ලැබේ. දැන් ඒ ඒ ප්‍රත්‍යයන්ගේ සත්‍ය බව, අසත්‍ය බව වෙනස් නොවන බව, හේතුවන බව දැක්වීමට 'ජාතිය හේතුකොට ජරාමරණ ඇතිවේ යන්න කියන ලදී' ආදිය කියන ලදී. එහි පරියායෙන කාරණයෙන් සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං මේ නිපාත දෙකකි. එහි අර්ථය නම් සියළු ආකාරයෙන් සියල්ල සියල්ලෙන් ස්වභාවයෙන් සියළු ජාති නාම ඉදින් නොවන්නේය. 'භව' ආදියෙහිද මේ අයුරින්ම අර්ථය දතයුතුයි. කස්සචි මේ අනියම් වචනයකි. දෙව ආදියෙහි යම්කිසිවකුට කිම්හිචි මෙයද අනියම් වචනයකි. කාමභව ආදී භව නවයෙහි යම්කිසි තැනක. සෙය්‍යථීදං මේ මෙහි යොදන ලද අර්ථය බෙදා දැක්වීමේ නිපාතයකි. එහි අර්ථය නම් : කවරකුට හෝ යම්කිසි තැනකදී හෝ යමක් කියන ලද ද එහි ඒ අර්ථය බෙදා වෙන්කර දක්වන්නෙමියි ඉක්බිති එය බෙදා දක්වන්නේ දෙවානං වා දෙවත්තාය' ආදිය කියන ලදී. එහි දෙවානං වා දෙවත්තාය යනු යම් මේ දෙවියන්ගේ දේවත්වයට අයත් කොටස. යම්කිසි කොටසකට අයත් දෙවියෝ යැයි කියත්. ඉදින් වනාහි ජාතිය සියල්ලෙන් සියල්ල නොවන්නේය යනාදී ලෙස සියළු පදයන්හි අර්ථ දතයුතුය. මෙහිද දෙවා යනු උප්පත්ති දෙවියෝ ය. ගන්ධබ්බා යනු මුල, කඳ ආදියේ අධිගෘහිත දෙවියෝය. යක්ඛා යනු අමනුෂ්‍යයෝය. භූතා යනු යම් ඒ බිහි වූ සත්ත්වයෝ. පක්ඛිනො යම්කිසි අස්ථිමය පක්ෂ, සම්මය පක්ෂ, ලෝහමය පක්ෂ හෝ.

සිරිංසපා යම්කිසි පොළවෙහි හැසිරෙන්නාහු යන්නාහු තෙසං තෙසං ඒ ඒ දේවගාන්ධර්ව ආදීන්ට තථත්තාය දේව ගාන්ධර්ව ආදී තත්ත්වයන් සඳහා ජාතිනිරොධා ජාතිය නොරවීමෙන්, ජාතිය නොවීමෙන් යන අර්ථයි. හෙතු ආදී සියලු කාරණා සමානාර්ථ පදයි. කාරණය වනාහි යම්හෙයකින් තමන්ගේ ප්‍රයෝජනය පිණිස පවතී. ඒ නිසා හේතු යැයි

කියනු ලැබේ. යම්හෙයකින් ඵලය එයින් හටගනීද, පහළ වෙයිද එයද ප්‍රත්‍යය වෙයි. පවතී. ඒ නිසා සමුදය කියාද ප්‍රත්‍යය කියාද කියනු ලැබේ. සියලු තත්හිම මේ ක්‍රමයයි. තවද යදිදං ජාති මෙහි යදි-ඉදං යන මේවා නිපාතය. සියළු පදයන්හි ලිංගානුරූප වූ අර්ථය දතයුතුය. මෙහි වනාහි යම් මේ ජාතිය යැයි මෙහි අර්ථ ගැනේ. ජරාමරණ දෙකට ජාතිය උපනිශ්‍රය වශයෙන් ප්‍රත්‍ය වේ. භව පදයෙහි කිසම් (කිසියම් තැනක) මෙයින් ඉඩ සලසන ලදී. එහිදී අවීචිය යටින් සීමාවකොට මත්තෙන් පරනිර්මිත වසවර්ති දෙවියන් ඇතුළත් කොට කාම භවයයි දතයුතුයි. උත්පත්ති භවයෙහි මේ ක්‍රමයයි. මෙහි වනාහි කර්මභවය යොදයි. එය වනාහි ජාතියේ උපනිශ්‍රය කෙළවරින් ප්‍රත්‍යය වේ. උපාදාන පද ආදියෙහි කිසියම් තැනක මෙයින් ඉඩ සලසා ගන්නා ලදැයි දතයුතුයි. **උපාදාන පච්චයා භවො** මෙහි කාම උපාදානය කාමභව තුනටත් උත්පත්ති භව තුනටත් ප්‍රත්‍ය වේ. ඉතිරිවාටද එසේය. උපාදාන ප්‍රත්‍යයෙන් භව විසිහතර දතයුතුයි. මෙහිදී පිළිවෙලකින් තොරව දොළොස් කර්මභවයන් ගැනේ. ඒ උපාදානයන්ට එකට හටගත් හේතුවෙන් උපනිශ්‍රය වශයෙන් ප්‍රත්‍ය වේ. **රූප තණ්හා** රූප අරමුණෙහි තෘෂ්ණාවයි. ශබ්ද තණ්හා ආදියෙහිද මේ ක්‍රමයයි. ඒ මේ තෘෂ්ණාව වනාහි උපාදානයට එකට හටගත් හේතුවෙන්ද උපනිශ්‍රය හේතුවෙන්ද ප්‍රත්‍ය වේ. තණ්හාවේද මේ ක්‍රමයයි. **යදිදං වෙදනා** මෙහි විපාක වේදනාව තණ්හාවට උපනිශ්‍රය වශයෙන් ප්‍රත්‍ය වේ. අනික අනික් අයුරකින් වේ. භාග්‍යවතුන් වහන්සේ මෙපමණකින් සසරට මුල් වූ පළමු තෘෂ්ණාව දක්වා දැන් දේශනාව පිටට පහරදී කෙස්වලින් අල්ලාගෙන කැගසමින් මාර්ගයෙන් ඉවත් කරන්නාක් මෙන් පද නමයකින් නිතර හඳුන්වනු ලබන තෘෂ්ණාව දක්වමින් ඉතිබො ආනන්‍ද වෙදනං පටිච්ච තණ්හා (මෙසේ වනාහි ආනන්දය, වේදනාව හේතුවෙන් තණ්හාව) ආදිය පැවසීය.

එහි **තණ්හා** යනු දෙයාකාර තෘෂ්ණාවයි. සොයන්නා වූ තණ්හාව හා සොයන ලද තණ්හාව යන දෙකයි. යම් තණ්හාවකින් කඳුවල උල්ගසා එල්ලී යන මාර්ගය, එළුවන් යන මාර්ගය ආදියට පිවිස භෝගයන් සොයයිද වේ එසන තණ්හාවයි. යම් ඒ සොයන ලද ලබාගන්නා ලද රැස්කරගන්නා ලද දේ කෙරෙහි ඇති තෘෂ්ණාව එසිතතණ්හා නම් වේ. මේ දෙකට පවත්නා තෘෂ්ණාවට සංඥා නාමයකි. ඒ නිසා මේ දෙකම වේදනාව නිසා ඇතිවන තෘෂ්ණාව නම් වේ. **පරියෙසනා** නම් රූපාදී අරමුණු සෙවීමයි. එය වනාහි තෘෂ්ණාව ඇතිකල්හි සිදුවෙයි.

ලාභො යනු රූප ආදී අරමුණු ලැබීමයි. එය වනාහි සෙවීම ඇතිකල්හි වෙයි. විනිශ්චය වනාහි ඤාණ, තණ්හා, දිට්ඨි, විතක්ක වශයෙන් සතරආකාරය. එහි සුඛ විනිශ්චය දතයුතුයි. සුඛ විනිශ්චය දැනගෙන අභ්‍යන්තර සැපය හා යෙදෙන්නේය යන මෙය ඤාණ විනිශ්චය වේ. විනිශ්චය ද තෘෂ්ණා විනිශ්චය දෘෂ්ටි විනිශ්චය කියා ද විනිශ්චය දෙයාකාරය. මෙසේ ආවා වූ එකසිය අටක් තෘෂ්ණාවේ පැවැත්ම තණ්හා විනිශ්චය නම් වේ. හැටදෙකක් දෘෂ්ටී දිට්ඨි විනිශ්චය නම් වේ.

'ශක්‍ර දේවේන්ද්‍රය! ඡන්දය වනාහි විතර්කයට හේතුව වේ' යනුවෙන් මේ සූත්‍රයෙහි දී මෙහි විනිශ්චය යැයි කියන ලද විතර්කයට ආයේය. ලාභයක් ලැබ වනාහි ඉටු අනිටු සුන්දර අසුන්දර යන විතර්කයෙන්ම විනිශ්චය කරත්. මෙපමණක් මාගේ රූපාරම්මණය සඳහා වන්නේය. මෙපමණක් සද්ද ආදී අරමුණු සඳහා මෙතෙක් මට වන්නේය. මෙතෙක් අනුන්ට වන්නේය. මෙපමණක් පරිභෝග කරන්නෙමි. මෙපමණක් තැන්පත් කරන්නෙමි. ඒ නිසා කියන ලදී. 'ලාභං පටිච්ච විනිච්ඡයො' (ලාභය අරභයා විනිශ්චය) ඡන්දරාගො යනු මෙසේ අකුසල විතර්කයෙන් කල්පනා කළ කල්හි වස්තූන් කෙරෙහි දුර්වල වූ රාගයකුත් බලවත් වූ රාගයකුත් උපදින්නේය. මේ වනාහි මෙහි තණ්හාවයි. ඡන්දො යනු දුර්වල රාගයට සමානාර්ථ පදයකි. අජ්ඣොසාන මම ය, මාය යනුවෙන් බලවත් ලෙස සනිටුහන් කිරීම. පරිග්ගහො යනු තණ්හා දිට්ඨි වශයෙන් තදින් අල්වා ගැනීම. මච්ඡරියං යනු අනුන් හා සමාන තත්වය නොඉවසීම ඒ නිසාම පැරැන්නෝ මෙබඳු කථාවක් කියත්. මේ පුදුමය මටම වේවා. අන් අයට නොවේවායි පැවැත්ම මච්ඡරිය යැයි කියත්.

ආරක්ඛා යන දොර වැසීම, පෙට්ටියක දමා රැකීම ආදී වශයෙන් මනාව ආරක්ෂා කිරීමයි. විවාද කරන්නේනුයි අධිකරණං නම් වේ. මෙය හේතුව යන්නට නමකි. ආරක්ඛාධිකරණං භාවනපුංසක ආරක්ෂක හේතු යන අර්ථයි. දණ්ඩාදානාදීසු අනුන් වැළැක්වීම සඳහා දණ්ඩක් ගැනීම දණ්ඩාදාන නම් වේ. එක් පැත්තක මුවහත ඇති ආයුධයක් ගැනීම සත්ථාදාන නම් වේ. කලහො යනු ශාරීරිකව ඇතිවන කෝලාහලය, වචනයෙන් ඇතිවන කෝලාහලයද පළමු විරෝධය. විග්ගහො පසුව, පසුව. විවාදො තුවං තුවං නුඹ. නුඹ. යන්න අගෞරව වචනයකි. දැන් ප්‍රතිලෝම ක්‍රමයට ඒ නිතර ඇතිවන තණ්හාව දැක්වීමට නැවත ආරක්ඛා, අධිකරණ යනුවෙන් ආරම්භ කරමින් දේශනාව නතර කරයි.

එහි කාමතණ්හා යනු පංචකාම ගුණයෙහි ඇලීම් වශයෙන් ඇතිවන්නා වූ රූපාදී තණ්හාවත්. භවතණ්හා යනු ශාස්වත දෘෂ්ටියෙන් යුත් රාගයයි. විභව තණ්හා යනු උච්ඡේද දෘෂ්ටිමය වූ රාගයයි. ඉමෙ දෙව ධම්මා යනු සසරට මුල වූ තණ්හාවත් නිතර පවත්නා තණ්හාවත් යන මේ ධර්මතාවයන් දෙක. ද්වයෙන තෘෂ්ණා ලක්ෂණ වශයෙන් එකම ස්වභාවය වුවත් වට්ටමූල (සසරට මුල) හා සමුදාචාර (නිතර පවත්නා) වශයෙන් කොටස් දෙකෙන්ම හටගත්තා වූ වේදනාව එකට එක්තැන් වේ. වේදනා හේතුවෙන් එක් හේතුවක් යන අර්ථයි.

සමොසරණය (එකට ගැවසීම) තුන් ආකාරය. එහි 'ඉක්බිති ඒ සියල්ල සමෝසරණ නම් වේ.' යන මෙය ඔසරණ සමොසරණ (එක තැනකට රැස්වීම) නම් වේ. ඇවැත්නි, මේ ධර්මතාවයන් ඡන්දය මුල්කර ගත්තේය. ස්පර්ශය හා වේදනාව එක්ව හැසිරෙන්නේය යන මෙය සහජාත සමොසරණ නම් වේ. වේදනා දෙකින් එකට හැසිරීම යන මෙය චනාහි පච්චය සමොසරණ (හේතුන් එක්රැස්ව පැවැත්ම) නම් වේ.

චක්ඛු සම්ඵස්සො යනාදි සියල්ල විපාක ඵස්සයන්ය. සතර ලෝකෝත්තර (ඵස්ස) ස්පර්ශයන් හැර ඉතිරි තිස්දෙකක් ඵස්සයෝ වෙත්. 'ඉදින් මේ ඵස්ස යන්න - මෙහිදී ඵස්ස (ස්පර්ශය) බොහෝ ආකාරයෙන් වේදනාවට හේතුව වේ.

'යේහි ආනන්ද ආකාරෙහි' (ආනන්දය, යම් ආකාරයකින්) ආදියේදී ක්‍රමයන් කියත්. වේදනාදීන් ගේ ඔවුනොවුන් අතර ඇති අසමාන ස්වභාවය නිසාය. ඒවා ද මනාව දැක්විය යුතුය. ඒ ඒ සැඟවුනු අර්ථය අවබෝධ කරයිනුයි ලිංගානි යැයි කියමි. ඒ ඒ දෙය හඳුනාගැනීමේ හේතුවෙන් නිමිති වේ. ඒ ඒ පරිද්දෙන් නියම කිරීම කළයුතු බැවින් උද්දෙසා නම් වේ. ඒ නිසා මෙහි අර්ථය : ආනන්දය, යම් ආකාරයකින් -පෙ- යම් උද්දේසයකින් නාමකායයාගේ නාම සමූහයම පැණවීම් වෙයි. යම් මෙය වේදනාවෙන් වින්දනය කළයුතු ආකාරයන්, වින්දනය කළයුතු ලක්ෂණයන් වින්දනය කළයුතු නිමිති නියම කළ කල්හි සංඥාවගේ හඳුනාගන්නා ආකාරයන්, හඳුනාගන්නා ලක්ෂණයන්, හඳුනාගන්නා නිමිති සඤ්ඤායැයි නියමයන් ඇතිකල්හි සංස්කාරයන්ගේ චේතනා විලාශයන්, චේතනා ලක්ෂණයන්, චේතනා නිමිති, චේතනා යැයි නියම කළ කල්හි විඤ්ඤාණයාගේ හඳුනාගන්නා ආකාරයන් හඳුනාගන්නා ලක්ෂණයන්

හඳුනාගන්නා නිමිති විඤ්ඤාණයැයි නියම කළ කල්හි මේ නාමකාය යැයි නාම කායයට පැනවීමක් ඇත. ඒ නාමකාය පඤ්ඤත්තිවලට හේතූන් අතර වේදිත ආදී ආකාරයන් නැති කල්හි නමුත් රූපකායයෙහි සඤ්ඤාවගේ ස්පර්ශයක් පෙනෙන්නේය. යම් මේ ස්කන්ධ සතර හේතුකොටගෙන මනෝද්වාරයෙහි සංඥාවට සමාන වචනය වූ මනෝ සම්ඵස්සය උපදී. එසේ නමුත් එය රූප කායයෙහි පෙනෙන්නේය. පස්පැහැදුම් වස්තු කොටගෙන උපදවන්නේය.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ අඹගසක් නැතිව දඹගසෙන් අඹගෙඩියක පහළවීම මෙන් රූපකායයෙන් එහි උපත නොපිළිගනිමින් 'හොහෙතං භන්තෙ' (ස්වාමීනි! මෙය නොවේ.) ආදිය කීය. දෙවෙනි ප්‍රශ්නයේ වෙනස්වන ආකාරය වෙනස්වන ලක්ෂණය, වෙනස්වන නිමිත්ත වශයෙන් රූපයයි නියමකිරීම් වශයෙන් ආකාරාදීන්ගේ අර්ථය දතයුතුයි. **පටිඝසම්ඵස්සො** යනු කෝපය සහිත රූප ස්කන්ධයක් විෂයකොට හටගන්නා වූ ස්පර්ශයයි. මෙහිදී ද තෙරුන් වහන්සේ දඹරුකක් නැතිකල්හි අඹගසකින් දඹ ගෙඩියක් හටගැනීම මෙන් නාමකායයෙන් එහි උපත නොපිළිගනිමින් නොහෙතං භන්තෙ (ස්වාමීනි, මෙය එසේ නොවේ) ආදිය පැවසීය.

තුන්වන ප්‍රශ්නය දෙයාකාරයෙන්ම කියන ලදී. එහිදී තෙරුන් වහන්සේ ආකාසයෙහි අඹ දඹ ගෙඩි හටගැනීමක් මෙන් නාමරූප දෙක නැතිකල්හි දෙයාකාර ඵස්සයන්ගේ හටගැනීම නොපිළිගනිමින් නොහෙතං භන්තෙ ආදිය පැවසීය. මෙසේ ඵසසයන් දෙකට වෙන වෙනම ප්‍රත්‍යයන් (හේතු කාරණ) දක්වා දැන් ඒ දෙකටම විශේෂයක් නැතිව නාමරූප දෙක හේතුවන ආකාරය දක්වන්නට යෙහි ආනන්ද ආකාරෙහි (ආනන්දය! යම් ආකාරයකින් යැයි සතරවන ප්‍රශ්නය පටන් ගත්තේය. යදිදං නාමරූපං යම් මෙය නාමරූපය. යම් මෙය දොරටු සයෙහිද නාමරූප මෙයට හේතුවයි. මෙයට ප්‍රත්‍යයයි යන අර්ථ ඇත්තේය.

චක්ඛුද්වාර ආදියෙහි චක්ඛු ආදියත් රූප අරමුණු ආදියත් රූපයයි. ඒ හා සම්ප්‍රයුක්ත වූ ස්කන්ධයෝ නාමයෝ වෙත්. මෙසේ පංචවිධ වූ ඵය නාමරූප ප්‍රත්‍යය වීමෙන් ඵස්සය මනෝද්වාරයෙහි හෘදයවස්තුවත් යම් රූපයක් අරමුණු වේද මේ රූපය හා එක්වූ ධර්මයෝද යම් අරූප වූවක් අරමුණු වේද, මෙය අරූපය කියාද මෙසේ මනෝ සම්ඵස්සයද නාමරූප

හේතුවෙන් ඵස්සය වන්නේයැයි දතයුතුයි. නාමරූප වනාහි මෙයට බොහෝ ආකාරයෙන් ප්‍රත්‍ය වෙයි. **න ඔක්කමිස්සථ** යැයි පිවිස පවතින්නාක් මෙන් පිළිසිඳ ගැනීම් වශයෙන් නොපවතින්නේය. **සම්මුච්ඡිස්සථ** ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් නැතිකල්හි නමුත් ශුද්ධ වූ ඉතිරි නාමරූප මව්කුස ඇතුළත කලල ආදී වශයෙන් එක්වී මිශ්‍රණය වී පවතින්නේය. **ඔක්කමිත්වා වොක්කමිස්සථ** ප්‍රතිසන්ධි වශයෙන් කියන ලද බැසගත්තා වූ ච්‍යුති වශයෙන් නික්ම යන්නේය. නිරුද්ධ වන්නේය යන අර්ථයි. එය වනාහි එහි නිරෝධයයි. ඒ චිත්තයාගේ නිරෝධයෙන් නොවේ. එහි දෙවන තුන්වන නිරෝධයන්ගෙන් නොවෙයි. ප්‍රතිසන්ධි සිත සමග හටගත්තා වූ සමතිස් කර්මජ රූපයෝ හටගනිත්. ඒවා ඇතිකල්හිම සොළොස් භවාංග සිත් ඉපිද නිරුද්ධ වේ. මේ අතරතුර පිළිසිඳ ගත්තා වූ දරුවාට හෝ මවට හෝ අනතුරක් නැත. මෙය වනාහි 'අනොකාස' නම් වේ. ඉදින් වනාහි ප්‍රතිසන්ධි සිත සමග හටගත් රූප දාහත්වන භවාංගයට ප්‍රත්‍යවන්නට හැකිවේ. පවතී. ප්‍රවේණිය හා ගැලපේ. ඉදින් වනාහි එසේ නොහැකි වන්නේ නම් පැවැත්ම නොපවතීද ප්‍රවේණිය හා නොගැලපේ. වොක්කමනය (ඉවත්වීම) යනු වේ. ඒ සඳහා (ඔක්කමිත්වා වොක්කමිස්සථ) යැයි කියන ලදී. **ඉත්ථත්තාය** මේ සඳහා මෙසේ පරිපූර්ණ පංචස්කන්ධය සඳහාය යන අර්ථයි. **දහරසෙසව සතො** බාලයකුව සිටි කල්හි **වොච්ඡිජ්ජිස්සථ** සිඳ දමන්නේය. **වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං** යනු විඤ්ඤාණයෙහි සිඳුනු කල්හි ශුද්ධ වූ නාමරූපයන් නැගීසිට පළමු වයස් වශයෙන් වැඩීමත් මැදිවයස් වශයෙන් අභිවෘද්ධියත් පශ්චිම වයස් වශයෙන් මහත් බවටත් පත්වන්නේය. දසවස්, විසිවස්, සියවස්, දහස්වස් පැමිණීමෙන්, වැඩිවීමට, වර්ධනයට, මහත්බවට පැමිණෙන්නේය යන අර්ථයි.

**තස්මාතිහානන්ද** යම්හෙයකින් මව්කුසෙහි පිළිසිඳ ගැනීමේදී කුසෙහි වාසය කිරීමේදී ද කුසින් නික්මීමේදී ද පැවැත්මත්, දසවස් ආදී කාලයෙහි විඤ්ඤාණයටම හේතුවේ. ඒ නිසා මෙයට නාමරූපවලට හේතුව ප්‍රත්‍යය වේ. ඒ මේ විඤ්ඤාණයයි. යම්සේ වනාහි රජු තමාගේ පිරිසට අපහාස කරන්නේ මෙසේ කියන්නේය. ඔබ යුවරජුය. ඔබ සේනාපතිය. කවරකු විසින් කරන ලද ද? මා විසින් කරන ලදී. ඉදින් මා නොකරන කල්හි ඔබ තමන්ගේ ධර්මතාවයෙන් යුවරජු හෝ සේනාපති හෝ වන්නෙහිය. තොපගේ බලය දන්නෙමු.

එපරිද්දෙන් විඤ්ඤාණය නාමරූපවලට ප්‍රත්‍ය වෙයි. අර්ථ වශයෙන් මෙසේ නාමරූපයයි කියන්නා වැනිය. ඔබ නාමයයි. ඔබ රූපයයි. ඔබ නාම රූපය කවරකු විසින් කරන ලදද? මා විසින් කරන ලද්දේ ද? ඉදින් මා පෙර ඇවිදින්නෙක්ව මව්කුස පිළිසිඳ නොගන්නා කල්හි ඔබ නාමය හෝ රූපය හෝ නාමරූප දෙකම හෝ වන්නෙහිය. ඔබගේ බලය දැනගන්නෙමු. ඒ මේ විඤ්ඤාණය වනාහි නාමරූප දෙකට බොහෝ සෙයින් ප්‍රත්‍ය' වේ.

**දුක්ඛ සමුදය සමභවො** යනු දුක්ඛ රාශියක හටගැනීම. **යදිදං නාමරූපං** යනු යම් මේ නාමරූපවලට මෙයට හේතුවයි. මෙයට ප්‍රත්‍යයි. යම්සේ වනාහි රාජපුරුෂයෝ රජවරුන්ට නිග්‍රහ කරන්නේ මෙසේ කියන්නාහ. ඔබ රජයැයි කවරකු විසින් කරන ලද ද? මා විසින් කන ලද්දේ නොවේද? ඉදින් වනාහි මා යුවරජ ලෙස ඉදින් සේනාපති ලෙස නොසිටින්නට නුඹ හුදෙකලාවම රජ වන්නෙහිය. ඔබගේ රජබව බලාගන්නෙමු. එපරිද්දෙන් නාමරූප දෙකද අර්ථ වශයෙන් විඤ්ඤාණයට මෙසේ කියන්නාක් මෙනි. නුඹ ප්‍රතිසන්ධි විඤ්ඤාණය යැයි කවරකු විසින් කරන ලද ද? අප විසින් කරන ලද්දේ නොවේද? ඉදින් නුඹ ස්කන්ධ තුනක් හෘදය වස්තුවත් නැතිව ප්‍රතිසන්ධි විඤ්ඤාණය නම් වන්නෙහිය. ඔබගේ ප්‍රතිසන්ධි විඤ්ඤාණභාවය බලන්නෙමු. ඒ නාමරූපයන්ද විඤ්ඤාණයට බොහෝසෙයින් ප්‍රත්‍යය වේ. **එත්තාවතා බො** විඤ්ඤාණය නාමරූපයන්ට ප්‍රත්‍ය වන අතර නාමරූප විඤ්ඤාණයට ප්‍රත්‍යවන අතර ඒ දෙකට එකිනෙකට ප්‍රත්‍ය වී පැවැත්මෙන් මෙපමණකින් හටගනිත්. උපදිත් කියා හෝ ජාති ආදිය පතවන්නාහ. ඔවුනොවුන්ට ච්‍යුති ප්‍රතිසන්ධි වශයෙනි. **අධිවචන පථො** ශ්‍රියාව වඩන, ධනය වඩන ආදියේ අර්ථය නොදැක වචන මාත්‍රය පමණක් ප්‍රධානකොට පැවැති ව්‍යවහාර මාර්ගයයි. **පඤ්ඤත්තිපථො** පණ්ඩිතය, ව්‍යක්තය. ඤාණවන්තය. නිපුණය. අනුන් හා වාදකරන ලද්දේය. ආදියේ නොයෙක් ආකාරයෙන් හැඳින්වීම් වශයෙන් පැවැති ව්‍යවහාර මාර්ගයයි. මෙසේ මේ තුනෙන්ම අධිවචනවලට වස්තු වූ ස්කන්ධයන්ම කියන ලදී. **පඤ්ඤාවචරං** ප්‍රඥාවෙන් වටහාගත යුතු දැනගත යුතු. වට්ටං වට්ටති සංසාර වට්ටය පවතී. **ඉත්ථත්තං** මේ බව, මේ ස්කන්ධ පංචකයට නමකි.

**පඤ්ඤාපනාය** නම්දීම පිණිස. වේදනා සඤ්ඤා ආදී ලෙස නම් පැනවීම පිණිස ස්කන්ධ පංචකයද මෙපමණකින් පෙනේයයි යන අර්ථයි.

යදිදං නාමරූපං සහවිඤ්ඤාණෙන යම් මේ නාමරූප විඤ්ඤාණය සමග අන්‍යෝන්‍ය හේතුප්‍රත්‍යය ලෙස පවතී. මෙපමණක්යැයි කියන ලදී. මෙය වනාහි මෙහි ගෙනෙන ලද අර්ථයයි. 'මෙසේ භාග්‍යවතුන් වහන්සේ, ආනන්දය මේ පටිච්චසමුප්පාදය ගැඹුරුය. ගැඹුරු ආලෝකයක් ඇත්තේය යනුවෙන් පදයාට අනුසන්ධි දක්වා දැන් නූලක් මෙන් අවුල් විය යනාදී ලෙස පදයට අනුසන්ධි දක්වන්නේ කිත්තාවතා වා ආදි වූ දේශනාව ආරම්භ කළේය. එහි ආනන්දය! ස්වල්ප වූ ද රූපය ආත්මයැයි යනාදී තැන්වල යමෙක් නොවඩන ලද කසිණ නිමිත්ත ආත්මය යැයි ගනීද හෙතෙම රූපය ස්වල්ප ලෙස දක්වයි ද යමෙක් වනාහි කසිණලාභියෙක් වේද හෙතෙම එය කිසිවිටක නිල්පාට ලෙසත් කිසිවිටෙක කහපාට ලෙසත් පෙන්වයි. යමෙක් වඩන ලද කසිණ නිමිත්ත ආත්මය යැයි ගනීද හෙතෙම රූපය ආන්තම යැයි දක්වයි. යමෙක් වනාහි නොවඩන ලද ඒ කසිණ නිමිත්ත උගුලුවා නිමිත්ත විසින් ස්පර්ශ අවකාශය හෝ එහි පැවති ස්කන්ධ සතර හෝ ඒවායේ පිහිටි විඤ්ඤාණ මාත්‍රය හෝ ආත්මය යැයි ගනීද හෙතෙම අරූපී බව සුළු ලෙස පෙන්වයි. හෙතෙම වඩන ලද නිමිත්ත උදුරා නිමිත්ත විසින් ස්පර්ශ කළ අවකාශය හෝ එහි පැවැති ස්කන්ධ සතර හෝ ඒවායේ පැවැති විඤ්ඤාණ මාත්‍රයම හෝ ආත්මය යැයි ගනීද හෙතෙම අරූපී වූ අනාත්මයක් පෙන්වයි.

**තත්‍රානන්ද** යන මෙහි තත්‍ර යනු ඒ සතර දෘෂ්ටිගත වූවන් කෙරෙහි **එතරහි වා** දැන්ම මින්පසුව ශනාවේ. මෙය උච්ඡේද වශයෙන් මෙය කියන ලදී. එහි **භාවිං වා** යනු එහි හෝ පරලොව හෝ වන්නා වූ ශාස්වත වශයෙන් මෙය කියන ලදී. **අතථං වා පන සන්තං** අසත්‍ය බව තථත්තාය. සත්‍ය බව පිණිස **උපකප්පෙස්සාමි** පිළියෙල කරන්නෙමි. මෙයින් විවාදය දක්වයි. උච්ඡේදවාදීන් විසින් ශාස්වතවාදියාට තමාගේ සත්‍ය නොවූ ස්වභාවය සත්‍ය පිණිස උච්ඡේද බව පිණිස ලඟා කරන්නෙමි. ශාස්වතවාදයද ඔහුට දන්වා ශාස්වතවාදයම ඔහුට පිළිගන්වන්නෙමියි සිතීය. **එවං සන්තං ඛො** මෙසේ රූප කසිණලාභියා ස්වල්ප වූ ද ආත්මය පෙන්වන්නේ ද යන අර්ථයි. **රූපිං** යනු රූප කසිණ ලාභියා

**පරිත්තත්තානුදිට්ඨි අනුසෙති** ස්වල්පය ද ආත්මය යැයි මේ දෘෂ්ටිය අත්නොහැර පවතී. එය වනාහි වැලක් මෙන් අත්නොහැර පවතී. අප්‍රහීන අර්ථයේ අත්නොහැර පවතීයයි දතයුතුයි. **ඉච්චාලං වචනාය** ඒ පුද්ගලයා මෙබඳු වූ දෘෂ්ටියක් අත්නොහැර සිටී යැයි කියන්නට සුදුසුය. සැමතන්හිම

මේ ක්‍රමයයි. අරූපිං මෙහි වනාහි අරූප කසිණලාභියා අරූප වූ ස්කන්ධයන්ට ගෝචර වූ යන අර්ථ දතයුතුයි. මෙපමණකින් ලබන්නා වූ සතරදෙනෙක්, ඔවුන්ගේ අතවැසි තාර්කිකයෝ සතරදෙනෙක් ඔවුන්ගේ අතවැසි සතරදෙනෙක් මෙසේ අර්ථ වශයෙන් දෘෂ්ටි අල්වාගත් දහසය දෙනෙක් දක්වන ලදහ. මෙසේ යමෙක් ආත්මය දක්වත් ද, ඔවුන් දක්වා දැන් යමෙක් ආත්මය නොපෙන්වත්ද ඔවුන්ව දක්වන්නට 'කිත්තාවතා ච ආනන්ද' (ආනන්දය, කොපමණක්) ආදිය පැවසූහ. එහි වෙදනං වා හි යන්නෙන් වේදනා ස්කන්ධයට වස්තු වූ සක්කායදිට්ඨිය ගැන කියන ලදී. අප්පටිසංවෙදිහොති මෙඅත්තා මෙයින් රූපස්කන්ධය වස්තු වේ. මාගේ ආත්මය දැනෙයි. වේදනාව වනාහි මාගේ ආත්මයයි මෙයින් සඤ්ඤා සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධයන්ට වස්තු වූ මේ ස්කන්ධ තුන වේදනාවෙන් යුක්ත බැවින් දැනෙයි. මෙයටද වේදනාව තොර නොවූ ස්වභාව ඇත්තේය. දැන් එහි දොස් දක්වන්නේ 'තත්‍රානන්ද' ආදිය පැවසීය. එහි තත්‍ර යනු ඒ තුන් ආකාර දෘෂ්ටිගතිකයන් කෙරෙහි යස්මිං ආනන්ද සමයෙ යම් යම් කෙනෙක් යම් යම් වේදනාවක් ආත්මයයි දකීද ඒ ඒ තැනැත්තාට ආත්මය කිසිවිටක ඇති බවද නැති බවද යනාදී දෝෂ දැක්වීම සඳහා කියන ලදී.

අනිත්‍ය ආදියෙහි පිහිටා නොවීමෙන් අනිත්‍ය. ඒ ඒ කාරණාවන්ගෙන් එක්ව කරන ලදැයි සංඛත නම් වේ. ඒ ඒ කාරණය හේතුකොටගෙන යහපත් කරුණින් හටගත්තෝනුයි පටිච්චසමුප්පන්න නම් වේ. ඛයො ආදී සියල්ල අභාවයට බිඳීයාමට සමාන වචනයි. යමක් බිඳෙයිද එය ක්ෂය වෙයි. වැයවෙයි. නොඇලෙයි. නිරුද්ධ වෙයි. ඒ නිසා ඛයධම්මො යැයි කියන ලදී. ව්‍යග්ගා මෙ වි+අග්ග, පහවූ, නිරුද්ධ වූ මාගේ ආත්මය යන අර්ථයි. කුමක් නිසා එක් තැනැත්තකුටම තුන් කාලයේදීම මේ මාගේ ආත්මය වන්නේය. කුමක් නිසා නොවන්නේද? දෘෂ්ටිය ගත්තහුට වනාහි දහයියා ගොඩක සිටවූ කනුවක් මෙන් ස්ථිරබවක් නම් නැත. වානරයකු මෙන් එකක් ගනී. අනිකක් අත්හරියි. අනිච්චං සුඛං දුක්ඛං වොකිණ්ණං විශේෂයෙන් ඒ ඒ වේදනාව ආත්මයැයි බලන්නහු අනිත්‍යයද සැපයද දුකද ආත්මය ලෙස දකී. විශේෂත්වයකින් තොරව වේදනාව ආත්මයැයි දකින්නේ ගැවසීගත්තා වූ හටගැනීම හා අභාවය ආත්මය ලෙස දකී. වේදනාව වනාහි තුන්ආකාරය. උපත හා නැතිවීම ස්වභාවකොට ඇත්තේය. මොහු එය ආත්මය යැයි දකියි. ඉක්බිති ඔහුට අනිත්‍ය ආත්මය බවට පත්වේ. මොහොතින්ම බොහෝ වේදනාවන්ගේ හටගැනීම

වනාහි අනිත්‍ය ආත්මය ලෙස නොපවසමි. එක් ක්‍ෂණයකදී බොහෝ වේදනාවන් හටගැනීමක් නැත. මේ අර්ථය සඳහා 'ඒ නිසා ආනන්‍දය! මේ වේදනාව මාගේ ඇත්මය යැයි නොදකිමි'යි කියා ඇත. **යත්‍ථපනාවුසො** යම් ඒ ශුද්ධ වූ රූපස්කන්ධයක සර්වප්‍රකාරයෙන්ම විඳවීමක් නැත. **අපිනුඛො තත්‍ථ** එසේනම් ඒ වේදනා රහිත තල්වැටක හෝ වාකවුළුවෙහි හෝ සිටිමියි මෙබඳු වූ අහංකාරයක් උපදින්නේය යන අර්ථයි. **තස්මාතිහානන්‍ද** යම්හෙයකින් ශුද්ධ වූ රූපස්කන්ධය නැගිට 'මම වෙමි' කියා නොකියයි. ඒ නිසා මෙයින් ද මෙය ඉවසයි කියා අර්ථ දතයුතුයි.

**අපිනුඛො තත්‍ථ අයමහමස්මීති සියා** ඒ වේදනා ධර්මයන්හි ස්කන්ධ තුනෙහි එක් ස්වභාවයක්වත් මේ නම් මම වෙමි යි මෙසේ කිවයුතු වන්නේය. නැතහොත් වේදනාව නැතිවීමෙන් ස්කන්ධ තුනෙහි වේදනාව නිරුද්ධ වූ කල්හි 'මේ මම වෙමි. මම වෙමි. උපදින්නෙමි'යි යන අර්ථයි. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ සා අඟෙහි තියුණු බව මෙන් එය නොපිළිගනිමින් ස්වාමීනි, මෙය එසේ නොවේයැයි කීය. මෙපමණකින් කුමක් කියන ලද ද? සසර පිළිබඳ කථාව කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ සසර පිළිබඳ කථා කරන්නේ සමහර තැනක අවිජ්ජාව මුල්කරගෙන කථාකරයි. තවත් තැනක තණ්හාව මුල්කරගෙන කථා කරයි. තවත් තැනක දෘෂ්ටිය මුල්කොට කථා කරයි. එහි මහණෙනි! අවිජ්ජාවගේ මුලක් නොපෙනේ. මීට පෙර අවිජ්ජාව නොවීය. ඉක්බිති පසුව හටගත්තේය. මහණෙනි, මෙය මෙසේ කියයි. තවද මෙසේ පෙනෙයි. මෙය ප්‍රත්‍යකොට ඇති බව අවිජ්ජාවය. මෙසේ අවිජ්ජා මාතෘකාවෙන් කියන ලද මහණෙනි! භව තණ්හාවේ මුලක් නොපෙනේ. මීට පෙර භව තණ්හාවක් නොවීය. ඉක්බිති පසුව හටගත්තේය. මහණෙනි, මෙසේද කියයි. තවද වනාහි මේ හේතුවෙන් භව තණ්හාව පෙනෙයි. මෙසේ තණ්හා ශීර්ෂයෙන් කියන ලදී. මෙහිදීද දෘෂ්ටි මාතෘකාවෙන්ම කියන ලදී. දෘෂ්ටි ගත් තැනැත්තා වනාහි සුඛ ආදී වේදනාවන් ආත්මයැයි ගෙන අහංකාරය, මමංකාරය හා පරාමර්ශනය (ස්පර්ශය) වශයෙන් හා සියළු භව, යෝනි, ගති, විඤ්ඤාණඨිති වශයෙන් සත්තාවාසවල ඒ ඒ තැනින් ච්‍යුතව ඒ ඒ තැන්වල උපදින්නේ මහා සමුද්‍රයේ වාතයෙන් ඔසවන ලද නැවක් මෙන් නිරන්තරයෙන් කරකැවෙයි. හිස ඔසවන්නටවත් නොහැකි වෙයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ප්‍රත්‍යාකාරයෙන් මුළා වූ දෘෂ්ටිගත්තා වූ මෙපමණක් කථා මාර්ගයෙන් සසර ගැන කියා දැන් නිවන ගැන කියන්නේ 'ආනන්දය! යම් හෙයකින් භික්‍ෂුව යනාදිය පැවසීය.

භාග්‍යවතුන් වහන්සේ ඒ නිවන් පිළිබඳ කථාව දේශනාවන්හි දක්‍ෂතාවයෙන් විසිරී ගිය කමටහන නවකර්මාදී වශයෙන් වික්‍ෂිප්ත වූ පුද්ගලයාව ස්පර්ශ නොකර සතිපට්ඨානයෙහි පිහිටි පුද්ගලයා වශයෙන් ආරම්භ කරන්නේ නෙව වෙදනං අත්තානං සමනුපසසති (වේදනාව ආත්මය ලෙස නොදකී) ආදිය පැවසීය. මෙබඳු වූ ආකාර වූ භික්‍ෂුව යම්කිසි රූපයක් අතීත, අනාගත, වර්තමාන වශයෙන් හෝ අභ්‍යන්තර හෝ බාහිර වශයෙන් ඕලාරික හෝ සියුම් හෝ හීන හෝ ප්‍රණීත හෝ ලඟ හෝ දුර පිහිටි සියළු රූප අනිත්‍ය ලෙස සලකයි. එකක් සම්මර්ශනය කරන්නේ දුක ලෙස නිවැරදි සිහියෙන් සළකයි. එකක් ගැන සළකන්නේ අනාත්ම ලෙස සළකයි. ආදී ක්‍රමයට කියන ලද නුවණින් සළකා බැලීමේ ඥාණයාගේ වශයෙන් සියළු ධර්මයන්හි පැවැති බැවින් වේදනාව ආත්මය ලෙස නොසලකයි. අනික් ධර්මයක් ද නොවේ. සො එවං අසමනුපසසනෙතා න කිංචි ලොකෙ උපාදියති (ඔහු මෙසේ නුවණින් සළකා නොබලන්නේ ලෝකයෙහි කිසිවක් ආත්මයැයි නොගනී.) ස්කන්ධ ලෝක ආදී ප්‍රභේද ඇති ලෝකයෙහි රූපාදී ධර්මයන්හි කිසියම් ධර්මයක්වත් ආත්මය කියා හෝ ආත්මයට අයත් කියා හෝ අල්ලාගනු නොලැබේ. **අනුපාදිසං න පරිතසසති** අල්ලා නොගන්නේ තණ්හා, දෘෂ්ටි, මාන යන පීඩාවන්ගෙන් පීඩාවට පත් නොවෙයි. **අපරිතසසං** පීඩාවට පත් නොවන්නේ **පච්චත්තංයෙව පරිනිබ්බායති** තමාම කෙලෙස් පරිනිර්වාණයෙන් පිරිනිවන් පායි. මෙසේ පිරිනිවන්පෑවහුගේ ප්‍රත්‍යවේක්‍ෂාවගේ පැවැත්ම දැක්වීම සඳහා **ඛීණාජාති** (ජාතිය ක්‍ෂයවිය) ආදිය කියන ලදී. **ඉති සා දිට්ඨීති** යම් එසේ විදුනාවූ රහතන් වහන්සේගේ දෘෂ්ටිය, ඒ මෙබඳු දෘෂ්ටිය 'ඉතිසසදිට්ඨී' කියාද පාඨයක් ඇත. යම් ඒ එසේ මිදුනා වූ රහතන් වහන්සේ මෙබඳු දෘෂ්ටියක් ඇත්තේය යන අර්ථයි. **තදකලලං** යනු එය සුදුසු නැත. කුමක් නිසා මෙසේ ඇති කල්හි රහතන් වහන්සේ කිසිවක් උපන්නේ නැතැයි කියන්නේය. මෙසේ දැනගෙන විමුක්තියද රහත්බවද පිළිබඳ කිසිවක් නොදන්නේයැයි කියන්නට යෝග්‍ය නැත. එයින්ම ක්‍රම සතර අවසානයේ එයට හේතුව කුමක්ද? යනාදිය කීය. එහි **යාවතා අධිවචනං** යනු යම්පමණ සමාන වචන සංඛ්‍යාත වූ ව්‍යවහාරයක් ඇත.

**යාවතා අධිවචන පථො** යම් පමණ අධිවචනයාගේ මාර්ගයයි. ස්කන්ධ-ආයතන ධාතු හෝ ඇත. සැමතන්හි මේ ක්‍රමයයි. **පඤ්ඤාවචරං** ප්‍රඥාවෙන් හැසිරිය යුතු ස්කන්ධ පංචකය, **තදභිඤ්ඤා** එය දැනගෙන, මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් කුමක් දක්වන ලද ද?

තන්තාකුලක (අවුල් වූ නූල් පංදුව) පදයටම ගැලපීම දක්වන ලදී. දැන් යම් ඒ කෙනෙක් නොදක්වන්නේයැයි කියන ලද ද හෙතෙම යම්හෙයකින් ගමන් කරන්නේ ගමන් කරන්නේ දෙපාර්ශ්වයෙන්ම මිදුනේ නම් වන්නේය. යමෙක් නුවණින් නොබලන්නේයැයි කියන ලදද හෙතෙම යම්හෙයකින් යන්නේ ප්‍රඥාවිමුක්ත යැයි කියනු ලැබේ. ඒ නිසා පහත කියන ලද භික්‍ෂූන් දෙදෙනාගේ නික්මයාමද නාමයද දක්වන්නට 'සත්තඛො ඉමානන්‍ද විඤ්ඤාණඨිතියො (ආනන්දය! මේ විඤ්ඤාණඨිති සතයි) ආදිය කීය. එහි සත්තා යනු පිළිසිඳ ගැනීම් වශයෙන් කියන ලද අරමුණු වශයෙන් සංගීති සූත්‍රයේදී සතරදෙනෙක් දක්නට ලැබේ. විඤ්ඤාණය මෙහි පිහිටියේනුයි විඤ්ඤාණඨිති. විඤ්ඤාණය පිහිටීමට මේ සමානාර්ථ පදයකි. ද්වෙ ආයතනානි නිවාසස්ථාන දෙකකි. නිවාසස්ථාන යන්නෙන් මෙහි ආයතන අදහස් කෙරේ. එයින්ම කියයි. නතරවන ස්ථාන දෙකකි. නතරවන තැන මෙහි ආයතන යන්නෙන් අභිප්‍රේතයි. එයින් ම කියයි 'අසඤ්ඤසත්ත ආයතනය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය කියා දෙකකි. කුමක් නිසා මේ සියල්ලම ගන්නා ලදද? සසර ඉතිරි නොකොට ගැනීමටය. සසර වනාහි ශුද්ධ විඤ්ඤානයාගේ ඨිතිය වශයෙන් හෝ ශුද්ධ ආයතන වශයෙන් එකට නොගැනේ. භව, යෝනි, ගති, සත්තාවාස වශයෙන් ගැනේ. ඒ නිසා මේ සියල්ලම ගන්නා ලදී. දැන් පිළිවෙලින් එම අර්ථය බෙදා දක්වන්නේ කතමා සත්තා (සත්ත්වයෝ කවරහු) ආදිය කීය. එහි සෙය්‍යථාපි යනු නිදර්ශනාර්ථයේ නිපාතයයි. මිනිසුන් මෙහි යන අර්ථයි. අප්‍රමාණ වූ සක්වල අපරිමාන වූ මිනිසුන්ගේ වර්ණය, ස්වරූපය වශයෙන් දෙදෙනෙක් එක සමාන නොවේ. යම් ඒ කිසිතැනක නිවුන් සහෝදරයෝ වර්ණයෙන් හෝ ස්වරූපයෙන් හෝ එකසමාන වෙත්. ඔවුන්ගේද දැකීම, බැලීම, කථාව, සිනහව, ගමන, සිටීම ආදියෙන් විශේෂයක් ඇත්තේමය. ඒ නිසා නානත්තකායා (විවිධ වූ කාය ඇත්තෝ) යැයි කියන ලදී. ප්‍රතිසන්ධි සංඥාව වනාහි ඔවුන්ගේ තිහේතුක, ද්විහේතුක හෝ අහේතුක වෙයි. ඒ නිසා නානත්තසඤ්ඤිනො (වෙනස් වූ සඤ්ඤා ඇත්තෝය) කියා කීය. එකච්චෙ ච දෙවා කාමාවචර සයෙහි දෙවිවරු. ඒවායේ ඇතැමුන්ගේ ශරීර නිල්පාටය. සමහරුන්ගේ කහපාට ආදී වර්ණ ඇත්තේය.

ඔවුන්ගේ සඤ්ඤාව වනාහි ද්විහේතුක හෝ තිහේතුක වෙයි. අහේතුක නැත. එකච්චෙ ච විනිපාතිකා සතර අපායෙන් මිදුනු උත්තර මාතාව, පියංකර මාතා යක්‍ෂනිය පුනබ්බසුමිත්ත ධම්මගොත්ත ආදීහුද අනික් වේමානික ප්‍රේතයෝය. ඔවුන්ගේ වනාහි කහපාට, සුදුපාට, කලුපාට,

කලු රන්වන් සම ඇති ආදී ලෙසත් කෘශ, ස්ථූල, උස, මිටි ආදී වශයෙන් කය විවිධය. මිනිසුන්ට මෙන් ද්විහේතුක තිහේතුක අහේතුක වශයෙන්ද සඤ්ඤාවද වේ. ඔව්හු වනාහි දෙවියන් මෙන් මහේශාක්‍ය නොවෙති. දුප්පත් මිනිසුන් මෙන් අල්පේශාක්‍ය වෙති. ආහාර, වස්ත්‍ර දුර්ලභය. දුකෙන් පීඩා විඳිමින් හැසිරෙත්. සමහරෙක් කාල පක්‍ෂයෙහි දුක්ඛිත වන අතර තවත කෙනෙක් බැබලෙන පක්‍ෂයෙහි සැපවත් වෙත්. ඒ නිසා සුවපහසු ශරීරයෙන් පහත වැටුණු බැවින් විනිපාතිකා යැයි කියත්.

මෙහි යම්කෙනෙක් ත්‍රිහේතුක වන්නේ නම් ඔවුන්ට ධර්මාවබෝධය සිදුවෙයි. පියංකර මාතාව යක්‍ෂණියකි. අලුයම්වේලාවේ අනුරුද්ධ තෙරුන් ධර්මය සජ්ඣායනා කරනු අසා

**මා සද්දං කරි පියංකර භික්ඛු ධම්මපදානි භාසති**
**අපිච ධම්මපදං විජානිය පටිපජ්ජෙව හිතාය නො සියා**

**පාණෙසුච සඤ්ඤමාමසෙ සම්පජානමුසා න භණාමසෙ**
**සික්ඛෙව සුසීලායමත්තනො අපි මුච්චෙව පිසාච යොනියා**

ප්‍රියංකර ශබ්ද නොකරන්න. භික්‍ෂුව දහම්පද කියයි. දහම්පද ඉගෙනගෙන අපගේ යහපත පිණිස පිළිපදිමු.

ප්‍රාණීන්ය යන හැඟීම දැඩිව සිතට ගන්න.
දැන දැන බොරු නොකියමු. අපි ශීලයෙහි මනාව හික්මෙමු.
ප්‍රේත ආත්මයෙන් ද මිදෙන්නෙමු.

මෙසේ පුත්‍රයාට දන්වා එම දවස සෝවාන් ඵලයට පැමිණි උත්තර මාතාව වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසාම සෝවාන් වූවාය. **බ්‍රහමකායිකා** යනු බ්‍රහ්ම පාරිසජ්ජ, බ්‍රහම පුරොහිත හා මහාබ්‍රහ්ම. **පඨමාභි නිබ්බත්තා** යනු ඔව්හු සියල්ලෝම ප්‍රථමධ්‍යානයෙන් බිහිවූහ. ඔවුනතුරෙන් බ්‍රහ්ම පාරිසජ්ජයෝ වනාහි තත්ත්වයෙන් අඩුව පහළ වූවාහුය.

ඔවුන්ට වනාහි කල්පයකින් තුනෙන් කොටසක් ආයු ඇතිවේ. බ්‍රහ්ම පුරෝහිතයෝ තත්ත්වයෙන් මධ්‍යමව පහළ වූහ. ඔවුන්ට කල්පයෙන් හරි අඩක් ආයු ඇත. ඔවුන්ගේ කයද බොහෝ පුළුල් වූයේ වෙයි. මහා

බ්‍රහ්මයෝ උසස් ලෙස පහළ වූහ. ඔවුන්ට කල්පයක් ආයු ඇත. ඔවුන්ගේ කය වනාහි අතිශයින්ම පුළුල් වූයේ වෙයි. කයෙහි නානත්වය නිසා ප්‍රථමධ්‍යාන වශයෙන් සංඥාවෙන් ඒකාකාරය. කයෙන් විවිධය. ඔවුන් එකත්තසඤ්ඤී යයි දතයුතුයි. යම්සේ වනාහි මෙසේ සිව් අපායවලත් නිරයවලත් සමහර සත්ත්වයන්ගේ ගව්වක් පමණ ද සමහරුන්ගේ අඩයොදුනක් පමණද සමහරුන්ගේ යොදුනක් පමණද ආත්මභාව වේ. දෙව්දත්ගේ වනාහි යොදුන් සියයක් විය. තිරිසනුන් අතරද ඇතැමෙක් කුඩාය. ඇතැමෙක් විශාලය. ප්‍රේත ආත්මභාවවලද කෙනෙක් රියන් හැටක්, තව කෙනෙක් රියන් හැත්තෑවක්, ඇතැමෙක් අසූරියන් වෙති. කෙනෙක් මනා වර්ණයෙන් යුක්තය. සමහරු දුර්වර්ණ වෙති. එපරිද්දෙන් කාලකඤ්ජක අසුරයෝ වනාහි මෙහිදී දිග්වූ පිටක් ඇත්තෝය. හැටයොදුන්ද වෙති. සංඥාව වනාහි සියල්ලන්ටම අකුසල විපාක අහේතුක වෙති. මෙසේ අපායගත සත්ත්වයෝද නානත්තකාය, ඒකත්ත සඤ්ඤී නොවේදැයි සැකයක් ඇතිවේ. ආභස්සරා යනු දැවුණු පන්දමකින් පිටවන ආලෝකය මෙන් මොවුන්ගේ ශරීරවලින් ආලෝකය කැඩී කැඩී වැටෙන්නාක් මෙන් පැතිරෙයි. විහිදෙයි නුයි ආභස්සරා නම් වෙත්. ඔවුනතුරෙන් පංචක ක්‍රමයට ද්විතීය හා තෘතීය ධ්‍යානයන් තරමක් වඩා උපන්නාහු පරිත්තාභා නම් වෙත්. ඔවුන්ට කල්ප දෙකක් ආයු ඇත. මධ්‍යම ලෙස වඩා උපන්නාහු අප්පමාණාභා නම් වෙත්. ඔවුන්ට කල්ප සතරක් ආයු ඇත. උසස්ම ලෙස වඩා උපත ලද්දාහු ආභස්සර නම් වෙති. ඔවුන්ට කල්ප අටක් ආයු ඇත. මෙහි වනාහි උත්කෘෂ්ඨ හා පරිච්ඡේද වශයෙන් ඒ සියලුදෙනාව ගන්නා ලදහ. ඒ සියල්ලන්ගේම කය එකම පැතිරීම් ඇත්තේ වෙයි. සඤ්ඤාව වනාහි අවිතර්ක විචාරමාත්‍රය හෝ අවිතක්ක අවිචාර යැයි විවිධයි. සුභකිණ්හා යනු යහපත් බව ගැවසීගත්, පැතිරෙන්නා වූ මනා ශරීර ප්‍රභාවෙන් ඒකඝන වූ යන අර්ථයි. මොවුන්ට වනාහි ආභස්සරයන්ට මෙන් සිඳී සිඳී ආලෝකය ගමන් නොකරයි. පංචකනයෙහි වනාහි සාමාන්‍ය, මධ්‍යම, ප්‍රණීත, චතුර්ථධ්‍යාන වශයෙන් සොළොස් ආකාරය. පරිත්තසුභ අප්පමානසුභ, සුභ කිණ්ණ යන නම්වලින් උපදින්නාහු කල්ප හැටහතරක් ආයු ඇත්තාහ. මෙසේ මේ සියල්ලෝම ඒකත්තකාය වේ. චතුර්ථධ්‍යානයෙන් එකත්තසඤ්ඤීහු වෙත්. වේහප්ඵල බ්‍රහ්මයෝ සතරවන විඤ්ඤාණඨිතියම භජනය කරත්. අසඤ්ඤසත්තකයෝ විඤ්ඤාණය නොමැතිකමින් මෙයට අඩංගු නොවෙත්. සත්තාවාසවලට යෙත්.

ශුද්ධාවාසිකයෝ ද විවට්ට (නිවන) පක්ෂයට අයත් වූවාහු සර්වකාලික නොවෙත්. කල්ප ලක්ෂයක් හෝ අසංඛ්‍යයක් බුදුවරයන්ගෙන් තොර ලෝකයේ නූපදිත්. කල්ප දහසය දහසක් තුළ බුදුවරුන් උපදනා කල්හිම උපදිත්. දම්සක් පැවැත්වූ භාග්‍යවතුන් වහන්සේගේ තාවකාලික නවාතැන්පළවල් මෙන් වේ. ඒ නිසා විඤ්ඤාණඨිතියකට හෝ සත්තාවාසයක් ඇසුරු කිරීමට පත් නොවෙත්. මහාසීව තෙරුන් වහන්සේ වනාහි 'සාරිපුත්‍රය! ඒ සත්තාවාසය සුලභ වූවක් නොවේ. මේ දීර්ඝකාලය තුළ වෙන තැන්වල ශුද්ධාවාස දෙවියන් විසින් නොවසන ලදී. මේ සූත්‍රයෙන් ශුද්ධාවාස දෙවිවරු ද සතරවන විඤ්ඤාණඨිතියත් සතරවන සත්තාවාසයක්ම භජනය කරත් යැයි කියයි. එය නොවැලැක්වූ බැවින් සූත්‍රයට අනුදැන ඇත. **සබ්බසො රූපසඤ්ඤානං** යනාදියේ අර්ථ විශුද්ධි මාර්ගයේදී කියන ලදී. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය වනාහි සඤ්ඤාව මෙනි. මෙසේ විඤ්ඤාණයද ඉතා සියුම් බැවින් විඤ්ඤාණය නොවේ. අවිඤ්ඤාණයද නොවේ. ඒ නිසා විඤ්ඤාණඨිති ආදියෙහි නොකියා ආයතනවලදී කියන ලදී. **තත්‍ර** යනු ඒ විඤ්ඤාණඨිතිවල. **තචපජානාති** ඒ විඤ්ඤාණඨිතියද දැනගනී. **තස්සාච සමුදයං** අවිජ්ජාව හටගැනීමෙන් රූප හටගැනීම වේ ආදී ක්‍රමයෙන් එහි සමුදයද දැනගනී. **තස්සා ච අත්ථගමං** අවිජ්ජාව නිරුද්ධ කිරීමෙන් රූප නිරෝධය වේ ආදී ලෙසින් එහි අභාවයට යාම දැනගනී. **අස්සාදං** යනු රූපය හේතුකොටගෙන -පෙ- යම් විඤ්ඤාණයක් හේතුකොටගෙන සැපය සොම්නස උපදීද මේ විඤ්ඤාණයාගේ අශ්වාදයයි. මෙසේ එහි ආශ්වාදයද දැනගනී. **ආදීනවං** යනු යම් රූපයක් -පෙ- යම් විඤ්ඤාණයක් අනිත්‍ය, දුක්ඛ, වෙනස්වන ස්වභාවය ඇති ලෙස මේ විඤ්ඤාණයාගේ ආදීනවයි කියා එහි ආදීනව දැනගනී. **නිස්සරණං** යමෙක් රූපයෙහි -පෙ- යමෙක් විඤ්ඤාණයෙහි ඡන්දරාගය හික්මවාගනීද, ඡන්දරාගය ප්‍රහාණය කරයිද මෙය විඤ්ඤාණයෙන් නිස්සරණය යැයි මෙසේ එහි නිස්සරණය (නිදහස් වීම, ගැලවීම) ද වටහාගනී. **කල්ලංනු තෙන** ඒ භික්ෂුව විසින් ඒ විඤ්ඤාණඨිතිය තණ්හා මාන දිට්ඨි වශයෙන් මම ය මාගේ ය කියා සතුටුවීමට සුදුසු නොවේද? මේ ආකාරයෙන් සියළු තන්හි අර්ථ දතයුතුයි. යම්තැනක රූපය නැද්ද එහි ස්කන්ධ සතරක් වශයෙන්, යම්තැනක රූපය නැද්ද එහි ස්කන්ධ සතරක් වශයෙන්, යම්තැනක විඤ්ඤාණය නැද්ද එහි එක ස්කන්ධයක් වශයෙන් ද සමුදය ආදිය දතයුතුය. ආහාර සමුදයෙන් ආහාර නිරෝධය යන මේ පදය මෙහි නොයෙදිය යුතුය. **යතො ඛො**

ආනන්ද භික්ඛු ආනන්දය, යම්විටක භික්‍ෂුව දැඩිකොට නොගන්නා ලෙස මිදුනේ වේද යන සිව් උපාදානවලින් නොගෙන මිදුනේය. පඤ්ඤා විමුත්තො යනු ප්‍රඥාවෙන් මිදුනු, අටවැදෑරුම් විමෝක්‍ෂයන් අවබෝධකර නොගෙන ප්‍රඥා බලයෙන්ම නාමකායයාගේත් රූප කායයාගේත් පැවැත්ම නතරකොට විදුනේය යන අර්ථයි. ඒ සුක්ඛ විදර්ශකයාද ප්‍රථමධ්‍යාන ආදියෙහි එක්තරා තැනක සිට රහත්බවට පත්වූයේ යැයි කියා පස්වැදෑරුම් වෙයි. මෙය මෙසේ කියා ඇත. පඤ්ඤා විමුත්ත පුද්ගලයා නම් කවරෙක්ද? මෙලොව එක් පුද්ගලයෙක් අෂ්ට විමෝක්‍ෂයන් කයින් ස්පර්ශනොකර වාසය කරයිද ප්‍රඥාවෙන් දැක ආශ්‍රවයන් ක්‍ෂය කළා වේද මේ පුද්ගලයා ප්‍රඥා විමුක්ත නම් වේ.

මෙසේ එක් භික්‍ෂුවකගේ පිටවීමත්, නාමයත් දක්වා අනිකකුගේ දැක්වීම පිණිස 'අට්ඨකො ඉමෙ' (මේ අට) ආදිය කීය. එහි විමොක්ඛ යනු කවර අර්ථයකින් විමොක්ඛ වන්නේද? මෙය වනාහි ස්ථිරව පිහිටි යන අර්ථයෙන්ය. අධිමුච්චන අර්ථය නම් විරුද්ධ ධර්මතාවයන්ගෙන් මනාව මිදීමේ අර්ථයයි. අරමුණු වශයෙන් ද අභිරති වශයෙන්ද මනාව මිදෙනු කැමැත්තේ පියාගේ ඇකයෙහි අතපය දිගහැර නිදන දරුවකුගේ නින්ද මෙන් නින්දා නොකරන ලද හා සැක රහිත බව නිසා අරමුණෙහි පවතීයයි කියන ලදී. මේ අර්ථය වනාහි පසුව ලබන විමොක්‍ෂයෙහි නැත. පෙර පැවැති සියල්ලෙහි ඇත. රූපීරූපානි පසසති මෙහි අභ්‍යන්තර කේස ආදියෙහි නීලකසිණ ආදි වශයෙන් උපදවන ලද රූප ධ්‍යානයයි. රූපය මොහුට ඇත්තේනුයි රූපී. බහිද්ධාරූපානිපසසති පිටතින්ද නීලකසිණ ආදී රූප ධ්‍යාන ඇසින් බලයි. මෙයින් අධ්‍යාත්මික, බාහිර වස්තු වූ කසිණයන්හි උපදවන ලද ධ්‍යාන ඇති පුද්ගලයාට රූපාවචර ධ්‍යාන සතරක් දක්වන ලදී. අජ්ඣත්තං අරූපසඤ්ඤී තමා පිළිබඳව කේසාදියෙහි රූපසඤ්ඤාවක් නැති නූපදවන ලද රූපාවචර ධ්‍යානයන්හි යන අර්ථයි. මෙයින්ද බාහිර පිරියම්කොට පිටතින්ම උපදවාගත් ධ්‍යාන ඇති පුද්ගලයාගේ රූපාවචර ධ්‍යානයන් දක්වන ලදහ. සුභ න්තෙව අධිමුත්තො හොති මෙයින් ඉතා පිරිසිදු නීල ආදී වූ වර්ණ කසිණයන්හි ධ්‍යානයන් දක්වන ලදහ. එහි කිසිවක් අභ්‍යන්තර අර්පනාවෙහි සුභය කියා සිතාබැලීමක් නැත. යමෙක් වනාහි පරිශුද්ධ වූ සුභ කසිණයක් අරමුණුකොට වාසය කරයිද හෙතෙම යම්හෙයකින් සුභයයි අධික ලෙස ඇලුනේ කිවයුතු බවට පත්වේ. ඒ නිසා මෙසේ දේශනා කරන ලදී. පටිසම්භිදා මාර්ගයෙහි වනාහි කෙසේනම් සුභයැයි අධික ලෙස යෙදුනේ

වේදැයි විමොක්ඛො යැයි දැක්වීය' මේ ලෝකයෙහි භික්ෂුවක් මෛත්‍රී සහගත සිතෙන් එක් දිසාවක් පැතිර වාසය කරයි ද මෛත්‍රී වඩන ලද බැවින් සත්ත්වයෝ පිළිකුල් නැත්තෝ වෙති. කරුණා - මුදිතා - උපෙක්ඛා සහගත සිතෙන් එක් දිසාවක් පැතිර වාසය කරයි. උපෙක්ෂාවෙන් වඩන ලද බැවින් සත්ත්වයෝ පිළිකුල් නැත්තෝ වෙත්. මෙසේ යෙදුනේ වේද, එය විමොක්ඛො යැයි කියන ලදී. **සබ්බසො රූපසඤ්ඤානං** ආදියෙහි යමක් කිවයුතුද ඒ සියල්ල විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. **අයං අට්ඨමො විමොක්ඛො** මේ ස්කන්ධ සතරෙන් සර්වප්‍රකාරයෙන්ම විශුද්ධියට පැමිණි බැවින්, මිදුනු බැවින් අටවැනි උත්තම විමොක්ෂය නම් වේ. **අනුලොමං** යනු මුලපටන් අවසානය දක්වා **පටිලොමං** අගපටන් මුල දක්වා. **අනුලොම පටිලොමං** මේ අතිශයින් ප්‍රගුණ බැවින් සමාපත්තිවල අටවැන්න බැවින්ද එහෙ මෙහෙ ඇවිදීම් වශයෙන් ද කියන ලදී. **යත්ථිච්ඡකං** අවකාස දැක්වීම් යම් යම් අවකාසයක් බලාපොරොත්තු වෙයිද **යදිච්ඡකං** යනු සමාපත්ති දැක්වීමයි. යම් යම් සමාපත්තියක් කැමැතිවෙයිද **යාවතිච්ඡකං** මාර්ග කොටස දැක්වීමයි. යම්තාක් මාර්ගය කැමැති වෙයිද, **සමාපජ්ජති** ඒ ඒ සමාපත්තියට පිවිසෙයි. **වුට්ඨාති** එයින් නැගිට සිටී. **උභතොභාග විමුත්තො** කොටස් දෙකකින් මිදුනේ. අරූප සමාපත්තියෙන් රූප කායයෙන් මිදුනේ, මාර්ගයෙන් නාමකායයෙන් මිදුනේ එය මෙසේ කියා ඇත.

> **අච්චියථා වාතවෙගෙන ඛිත්තා (උපසීවාති භගවා)**
> **අත්ථං එලෙති න උපෙති සංඛ්‍යයං**
> **එවංමුනි නාමකායා විමුත්තො**
> **අත්ථං එලෙති න උපෙති සංඛ්‍යං**

වාත වේගයෙන් පහරන ලද ගිනිසිළක් මෙන් අර්ථය ලඟා කර ගනී. කනස්සල්ලකට පත් නොවේ. මුනිවරයා මෙසේ නාම කායයෙන් මිදුනේ අර්ථය ලඟා කර ගනී. පසුතැවිල්ලකට පත් නොවෙයි.

ඔහු වනාහි මේ දෙපාර්ශ්වයෙන්ම මිදුනේ ආකාසානඤ්චායතන ආදි එකකින් නැගිට රහත් බවට පත් වුවද අනාගාමී වී නිරෝධ සමාපත්තියෙන් නැගිට යැයි පස් ආකාර වේ. කෙනෙක් වනාහි යම්හෙයකින් රූපාවචර චතුර්ථ ධ්‍යානයද අංග දෙකකින් යුත් රූපාවචර චතුර්ථ ධ්‍යානයෙන් නැගිට රහත්බවට පත්වූවහුද උභය භාගයෙන් මිදුනේ නම් වේ. මේ උභතො භාගයෙන් විමුක්තිය පිළිබඳ ප්‍රශ්නය පහත ලෝහ

ප්‍රාසාදයේ හට ගෙන ත්‍රිපිටකධාරී චූල්ලසුමන තෙරුන්ගේ වර්ණනාව නිසා නොබෝ කලකින් විනිශ්චයකට පත්විය. ගිරි විහාරයෙහි වනාහි තෙර නමකගේ අතවැස්සෙක් එක් පිණ්ඩපාතික භික්ෂුවකගේ මුවින්ම ඒ ප්‍රශ්නය අසා කීය. ඇවැත්නි! පහළ ලෝහ ප්‍රාසාදයේ අපගේ ඇදුරුතුමන්ගේ වර්ණනා කරන්නා වූ ධර්මය කිසිවකු විසින් නොඇසූවිරූය. ස්වාමීනි! තෙරුන්වහන්සේ කුමක් කීවේද? රූපාවචර චතුර්ථධ්‍යානය කිසියම් අංග දෙකකින් යුත් උපේක්ෂා සහගත කෙලෙසුන් ද යටපත් කරයි. කෙලෙසුන්ගේ වනාහි ආසන්නයේ වර්ධනය වන තැන නිතර පවතී. මේ ක්ලේශයෝ නම් පංචස්කන්ධයෙහි නීල ආදී වූ වෙනත් අරමුණක් උදෙසා නිතර හැසිරෙත්. රූපාවචර ධ්‍යානයත් අරමුණක් නොඉක්මවයි. ඒ නිසා සැම අයුරින්ම රූපය නතරකර අරූපඣාන වශයෙන් කෙලෙසුන් යටපත් කර රහත්බවට පත්වූයේම උභතොභාග විමුත්ත යැයි තෙරුන්වහන්සේ පැවසීය.

මෙයද කියා මේ සූත්‍රය ගෙනහැර දැක්විය. දෙපාර්ශ්වයෙන්ම මිදුනු පුද්ගලයා නම් කවරෙක්ද? මේ ලෝකයේ එක් පුරුෂයෙක් අටවැදෑරුම් විමොක්ෂයන් කයින් ස්පර්ශ කර වාසය කරයි. ප්‍රඥාවෙන් ද බලා ඔහුගේ ආශ්‍රවයෝ ක්ෂය වූවාහ. උභතො භාගයෙන් මිදුනු පුද්ගලයා මොහුය. ඉතිරිය සැමතන්හි කියන ලදමැයි.

**මහානිදාන සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

# මහාපරිනිබ්බාණ සූත්‍ර වර්ණනාව

**එවං මෙ සුතං යනුවෙන් ආරම්භ වන මහා පරිනිබ්බාණ සූත්‍රයයි. මේ එහි අනුපිළිවෙල කරන පද වර්ණනාවයි. ගිජ්ඣකූටෙ යනු එහි මුදුන්වල ගිජුලිහිණියෝ වාසය කළහ. ගිජුලිහිණියන් බඳු ස්වරූප ඇති මුදුන් ඇත්තේනුයි ගිජ්ඣකූට නම් වේ. ඒ ගිජ්ඣකූටයෙහි. අභියාතුකාමො**

යටත් කිරීම සඳහා යනු කැමැත්තේ වජ්ජි යනු වජ්ජි රජදරුවෝ **එවං මහිද්ධිකො** මෙසේ මහත් වූ රාජ ඍද්ධියෙන් සමන්විත වූ මෙයින් ඔවුන්ගේ සමගි බව කීවේය. **එවං මහානුභාවෙ** මෙසේ මහත් වූ ආනුභාවයෙන් යුක්ත වූ - මෙයින් හස්ති ශිල්ප ආදියේ ඔවුන් ලැබූ ශික්ෂණය පැවසීය. යමක් සඳහා කියන ලදද, යම්තැනක වනාහි සියුම් වූ තල් සිදුරකින් කී තලයේ අග නොවදින සේ ඉලක්කයට ඊතලය විදීද එබඳු වූ ශිල්පයක මේ ලිච්ඡවි කුමාරවරු ශික්ෂණය ලදහ. මනාව ශික්ෂණය ලදහ. **උච්ඡෙජජාමි** යනු සිඳ දමන්නෙමි. **විනාසෙසසාමි** නසන්නෙමි. නොදකින්නට සළස්වමි. **අනයව්‍යසනං** මෙහි අයක් නැත්තේ අනය. වර්ධනයක් නැත යන්නට නමකි. හිතසුව නැතිකරයි. අවුල් කරයි යන අර්ථයෙන් ව්‍යසන නම් වේ. නෑදැයන් හා සම්පත් විනාශවීම යන්නට සමාන වචනයකි. **ආපාදෙසසාමි** පමුණුවන්නෙමි. මෙසේ වනාහි යානාවන්හි හිඳීම් ආදියෙහි මේ යුද්ධකථාවම කියයි. ගමනට සූදානම් වව්. මෙසේ බලකායට අණකළේය. කුමක් නිසාද? ගංගානම් ගඟ ආශ්‍රිත එක් පටුන් ගමකට අයත් අඩයොදුනක ප්‍රමාණයේ අජාසත් රජුගේ අණසකය. අඩයොදුනක් ලිච්ඡවී රජවරුන්ගේය. මෙහි වනාහි අණ පවතින තැනය යන අර්ථයි.

එහිද පර්වත පාදයෙන් බොහෝ වටිනා සුවඳ බඩු මතුවෙයි. ඒ අසා අද යමි. හෙට යමියි අජාත සතතගේ පිරිස සූදානම් වෙද්දී ලිච්ඡවී රජවරු සමගිව සතුටුව පළමුව ගොස් සියල්ල ගනිත්. අජාසත් පසුව අවුත් ඒ පුවත දැනගෙන කිපී යයි ඔවුහු නැවතත් වර්ෂයක්ම එසේ කරත්. ඉක්බිති ඔහු බලවත් ලෙස කෝපයට පත්වූයේ එවිට මෙසේ කළේය. ඉක්බිති මෙසේ සිතීය. කණ්ඩායමක් සමග යුද්ධකිරීම අපහසුය. එකද හිස් ප්‍රහාරයක් නො වන්නේ ය. පණ්ඩිතයකු සමග සාකච්ඡාකොට කරන්නේ නම් නිෂ්ඵල නො වන්නේ ය. ශාස්තෲන් වහන්සේට සමාන පණ්ඩිතයෙක් නම් නැත. ශාස්තෲන් වහන්සේ ද නුදුරු ධුර විහාරයෙහි වැඩවසයි. මම දැන් කෙනෙක් යවා විමසන්නෙමි. ඉදින් මගේ ගමනින් අර්ථයක් වන්නේ නම් ශාස්තෲන් වහන්සේ නිහඬ වන සේක. රජුගේ එහි යාමෙන් අනර්ථයක් වන්නේ නම් රජුගේ එහි යාමෙන් කවර ප්‍රයෝජනයක්දැයි අසයි. මෙසේ සිතා වසසකාර බ්‍රාහ්මණයාව යැවීය. බ්‍රාහ්මණයා එහි ගොස් භාග්‍යවතුන් වහන්සේට ඒ බව සැළ කළේය. ඒ නිසා කියන ලදී. ඉක්බිති රජු -පෙ- වජ්ජීන් විනාශ කරන්නෙමි යි **භගවනතං විජමානො** ආනන්ද තෙරුන් වහන්සේ වතාවත් ලෙස භාග්‍යවතුන්

වහන්සේට පවත්සලයි. භාග්‍යවතුන් වහන්සේට සීතක් හෝ උෂ්ණසුමක් නැත. භාග්‍යවතුන් වහන්සේ බ්‍රාහ්මණයාගේ වචන අසා ඔහු අමතා තෙරුන් සමග කථාකරනු කැමැත්තේ **කින්ති තෙ ආනන්දසුතං** යනාදිය කීය. **අභිණ්හං සන්නිපාතා** දවසට තුන්වරක් රැස්වන්නාහු අතරින් පතර රැස්වන්නාහුද නිතර රැස්වීම නම් වේ. **සන්නිපාත බහුලා** ඊයේ ද රැ ස්වූයෙමු. කලින් දවසේද රැස්වූයෙමු. නැවත කුමකට අද රැස්වෙමුදැයි අවසානයකට නොපැමිණෙන්නාහු සන්නිපාත බහුල නම් වෙති. **යාවකීව ඤ්ච** යම්පමණ කාලයක්. **'වුද්ධියෙව ආනන්ද වජ්ජීනං පාටිකංඛා' නො පරිහානි** නිතර රැස්නොවන්නාහු දිශා අනුදිශාවලින් ආවා වූ පණිවිඩ නොඅසත්. එයින් අසවල් ග්‍රාමසීමාවේ හෝ නියම්ගම් සීමාවේ හෝ අවුල් සහගතය. අසවල් තැන සොරු නැගී සිටිත් යැයි නොදනිත්. සොරු ද රජවරුන් ප්‍රමාදයැයි දැනගෙන ගම්නියම්ගම් පහරමින් ජනපද විනාශ කරත්. මෙසේ රජවරුන්ගේ පිරිහීම ඇතිවෙයි. නිරන්තරයෙන් රැස්වන්නාහු ඒ ඒ පුවත අසත්. ඉක්බිති බලසේනා යවා සතුරු මර්දනය කරත්. රජවරු ප්‍රමාද නැත. අපට කණ්ඩායම් වශයෙන් හැසිරෙන්නට නොහැක කියා සොරු බිඳී පළායත්.

මෙසේ රජවරුන්ගේ දියුණුවක් ඇතිවේ. ඒ නිසා කියන ලදී.

**වුද්ධියෙව ආනන්ද වජ්ජීනං පාටිකංඛා නො පරිහානී ති** 'ආනන්දය, වජ්ජීන්ගේ අභිවෘද්ධියට බලාපොරොත්තු විය යුතුයි. පරිහානිය නොවේ. එහි **පාටිකංඛා** යනු බලාපොරොත්තු විය යුතුය. අවශ්‍යයෙන්ම වන්නේ යැයි මෙසේ දතයුතුයි යන අර්ථයි. **සමග්ගා** ආදියෙහි රැස්වීමේ අණබෙරය නිකුත් වූ කල්හි, අද මට කටයුත්තක් ඇත. අද මංගල්‍යයක් ඇත කියා ප්‍රතික්ෂේප කරමින් සමගිව රැස් නොවෙත්. බෙරහඬ අසාම අනුභව කරන්නාහුද, සැරසෙන්නාහුද වස්ත්‍ර අඳින්නාහු නමුත් අඩක් අනුභව කර, අඩක් සැරසී ඇඳුම් අඳිමින්ම රැස්වන්නාහු සමගියෙන් රැස්වෙත් නම් වේ. රැස්වූවාහු ද සිතාමතා කළයුත්තක් කොට එකටම නො නැගිටින්නාහු සමගියෙන් නැගිට යන්නාහු නොවෙත්. මෙසේ නැගිට යනකල්හි යමෙක් පළමුව යත්ද ඔවුන්ට මෙසේ සිතේ. අප විසින් බාහිර කතාවන් අසන ලදී. දැන් විනිශ්චය කථාව නො වන්නේ ය. එකට නැගිටින්නාහු වනාහි සමගියෙන් නැගිටිත් නම් වේ. තවද අසවල් තැන්වල ග්‍රාමසීමාව හෝ නියම්ගම් සීමාව හෝ අවුල් සහගතය. සොරු හෝ බලවත්ව නැගී සිටිත්යැයි අසා කවරෙක් ගොස් මේ සතුරු මර්දනය

කරන්නේදැයි කී කල්හි මම පළමුව යමි. මම පළමුව යමි කියා යන්නාහු සමගියෙන් නැගී සිටිත් නම් වේ. එකෙකුගේ කටයුතු කර්මාන්ත පහත වැටෙන කල්හි ඉතිරි රජවරු දරුවන් සහෝදරයින් යවා ඔහුගේ කර්මාන්තයන්ට පිහිට වන්නාහු ආගන්තුක රජවරුන්ගෙන් අසවලාගේ ගෙට යන්න. අසවලාගේ ගෙට යන්න යැයි නොකියා සියල්ලෝම එකතුව උපකාර කරන්නාහු ද එකකුගේ මංගල්‍යයකදී හෝ අසනීපයකදී හෝ අනික් එබඳු දුකක් සැපක් ඇතිවූ කල්හි සියල්ලෝම එහි සමගිව එකට යන්නාහු සමගිව වජ්ජීන් විසින් කළයුතු දේ කරත් නම් වේ. **අප්පඤ්ඤත්ත** ආදියෙහි පෙර නොපැනවූ බදු හෝ බලි හෝ දඬුවම් හෝ ගෙන්වා ගත්තාහු නොපැනවූ දේ පනවත්. පෞරාණික පරපුරෙන් ආවා වූ ලබා නොගත්තාහු පනවන ලද්ද සිඳ දමත් නම් වේ. සොරෙක් යැයි අල්වාගෙන පෙන්වූ කල්හි විනිශ්චය නොකොට සිදීම් බිදීම් ආදිය නියම කරන්නාහු පැරණි වජ්ජි ධර්මය අනුව පැවැත්ම නො වන්නේ ය යනුයි. ඔවුන්ට කලින් නොපනවන ලද අලුතෙන් පනවන බදු නිසා පීඩාවට පත් ජනයා, මොවුන්ගේ විජිතයෙහි වාසය කරන්නාහු අතිශයින් පීඩාවට පත්වූවෙමුයි වෙන පළාත්වලට ගොස් සොරුන් හෝ සොරුන්ගේ උදව්කාරයින් වී ජනපද පැහැර ගනිත්. තම පරපුරෙන් නොසිඳී පැවත ආ පනවන ලද අයබදු ආදිය නොගැනීමෙන් භාණ්ඩාගාරය පිරිහෙයි. ඉක්බිති ඇත් අස් බලකායන්ද අන්තඃපුරද යම්සේ නිරන්තරයෙන් වැටුප් නොලබන්නාහු වීර්යයෙන් බලයෙන් පිරිහෙත්. ඔව්හු යුද්ධයට කැමැති නොවෙත්. සේවය කිරීමට අකමැති වෙත්. පැරණි වජ්ජි ධර්මය සමාදන්ව නොපවත්නා වූ රටෙහි මිනිස්සු අපගේ පුතා, පියා, සොයුරා සොරෙක් නොවීත් සොරකු ලෙස හඳුන්වා සින්දාහ. බින්දාහයි කිපී වෙන පළාත්වලට ගොස් සොරුන් හෝ සොර සහායකයන් වී ජනපද පැහැරගනිත්. මෙසේ රජවරුන්ගේ පරිහානිය සිදුවේ. නොපනවන ලද බදු ආදිය නොපනවන්නාහු රජවරු ප්‍රවේණියෙන් ආ දේ පමණක් කරත්යැයි ජනයා තුටුපහටුව ගොවිතැන, වෙළඳම ආදී කර්මාන්තයන්හි යෙදෙත්. පණවන ලද නොසිඳී පවත්වාගෙන ආ අයබදු ආදිය ගැනීමෙන් භාණ්ඩාගාරය වැඩෙයි. එයින් ඇත්, අස් බාලකායනුත් අන්තඃපුර ආදියත් නිරන්තරයෙන් වැටුප් ලබන්නාහු වීර්ය බලයෙන් යුක්ත වූවාහු යුද කටයුතුවලට යනු කැමැත්තාහ රාජකාරිය කරනු කැමැති වෙත්. **පොරාණං වජ්ජිධම්මං** යනු මෙහි පෙර වනාහි වජ්ජි රජවරු මේ සොරෙක් යැයි ගෙනවුත් පෙන්වූ කල්හි ඒ සොරුව අල්වාගන්නයැයි නොකියා විනිශ්චයකාර මහාමාත්‍යයන්ට භාර දෙත්. ඔව්හු විනිශ්චය කර ඉදිත් සොරු නොවෙත්

නම් මුදාහරිත්. ඉදින් සොරෙක් වේනම් තමා විසින් කිසිවක් නොකියා විනිශ්චයකාරයන්ට භාරදෙයි. ඔවුහු ද විනිශ්චයකොට ඉදින් සොරෙක් නොවේ නම් මුදාහරී. ඉදින් සොරෙක් නම් විනය භාරකරුවන්ට භාරදෙත්. ඔව්හු විභාගකොට ඉදින් සොරෙක් නොවේනම් මුදාහරිත්. ඉදින් සොරෙකු නම් කුල අටකට අයත් මණ්ඩලයට භාරදෙත්. ඔව්හුද එසේකොට සේනාපතියාටත්, සේනාපතියා යුවරජුටත්, යුවරජු රජතුමාටත් භාරදෙත්. රජු නැවත විනිශ්චය කොට ඉදින් සොරෙක් නොවේනම් මුදාහරී. ඉදින් වනාහි සොරෙක් නම් පරම්පරා පොත කියවවයි. එහි යමකු විසින් මෙනම් වූ වරදක් කළේද ඔහුට මේ නම් දඬුවම යැයි ලියා ඇත. රජු ඔහුගේ වරද ඒ හා ගලපා බලා ඊට සුදුසු දඬුවමක් කරයි. මෙසේ මෙබඳු පැරණි වජ්ජි ධර්මය සමාදන්ව පවතින්නවුන්ට මහාජනයා උද්ඝෝෂණ නොකරත්. රජවරු පෞරාණිකව ආ කටයුතු කරත්. මොවුන්ගේ දෝෂයක් නැත. අපගේම වරදය කියා අප්‍රමාදීව වැඩ කරත්. මෙසේ රජවරුන්ගේ අභිවෘද්ධිය ඇතිවේ. ඒ නිසා කියන ලදී. ආනන්දය! වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුය. පරිහානිය නොවේ.

**සක්කරොන්ති** ඔව්හු යම්කිසි සත්කාරයක් කරන්නාහු හොඳ දෙයක්ම කරත්. **ගරුකරොන්ති** ගරුබවක් පෙරටු කොටගෙනම කරත්. **මානෙන්ති** මැනීමෙන් ප්‍රිය කෙරෙත්. **පූජෙන්ති** යනු යටත් නොවූ බවක් දක්වති. **සොතබ්බං මඤ්ඤන්ති** දවසට දෙවරක්, තුන්වරක් උපස්ථානයට ගොස් ඔවුන්ට කෙසේ ඇසිය යුතුද, විශ්වාස කළයුතුද කියා දැනගනිත්. එහි මෙසේ යමෙක් මහලු රජවරුන්ට සත්කාරාදියයි නොකරත්. අවවාද සඳහාද ඔවුන්ට උපස්ථානය සඳහා නොයත්. ඔව්හු ඔවුන් විසින් හැරදමන ලද්දාහු කෙළිලොල් වූවාහු රාජ්‍යයෙන් පිරිහෙත්. යමෙක් වනාහි එසේ පිළිපදිත්ද ඔවුන්ට මහලු රජවරු මෙය කළයුතුයි. මෙය නොකළ යුතුයි. පැරණි ක්‍රමය කියත්. යුද්ධය එළඹ සිටි කල්හිද මෙසේ පිවිසිය යුතුය. මෙසේ නතරවිය යුතුයැයි උපාය දක්වත්. ඔවුන් විසින් එසේ අවවාද කරනු. ලබන ඔව්හු යම්සේ අවවාද පිළිපදින්නාහු රාජප්‍රවේණිය කඩනොකර පවත්වයි. ඒ නිසා කියන ලදී. ආනන්දය! වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුයි. පරිහානිය නොවේ.

**කුලිත්ථියො** කුලකාන්තාවෝ **කුලකුමාරියො** කුල කාන්තාවන්ගේ දූවරු. **ඔක්කස්සපසය්හා** මෙහි ඔක්කස්ස හෝ පසය්හ යන දෙකෙන්ම බලහත්කාරයෙන් ගෙනයාමට නමකි. උක්කස්ස කියාද පාඨයකි. එහි

**ඔක්කස්ස** යනු පසෙකට ඇද **පසය්හ** යනු අභිභවනය කොට, යටත්කොට යන මේ වචනාර්ථයි. මෙසේ වනාහි කරන්නවුන්ගේ රටෙහි මිනිස්සු අපගේ නිවසේ දරුවෝ ද මව්වරු ද කෙළ සොටු ආදිය මුවෙන් ඉවත්කර හදාවඩාගත් දූවරුන් ද මේ රජවරු බලහත්කාරයෙන් ගෙන තමන්ගේ ගෙවල්වල නතර කරවාගෙන සිටිත් යැයි කිපියාහු ප්‍රත්‍යන්තයට ගොස් සොරු හෝ සොර සහායකයන් වී ජනපද පහරිත්. මෙසේ නොකරන්නවුන්ගේ රටෙහි මිනිස්සු වැඩිමහන්සියක් නැතිව තමන්ගේ කර්මාන්ත කරන්නාහු රාජ භාණ්ඩාගාරය දියුණු කරත්. එපරිද්දෙන් මෙහි දියුණුවට වන හානි ද දතයුතුයි. **වජ්ජීනං වජ්ජිචෙතියානි** වජ්ජි රජවරුන්ගේ වජ්ජි රටෙහි මනහර සිතියම් කරන ලද බැවින් 'චෙතිය' යන නම ලබන ලද යක්ෂයන්ට පුදන තැන්. **අබ්භන්තරානි** ඇතුල් නගරයෙහි පිහිටි. බාහිරානි නගරයෙන් පිටත සිටියා වූ **දින්නපුබ්බං** පෙර දෙන ලද. **කතපුබ්බං** පෙර කරන ලද **නොපරිහාපෙස්සන්ති** පිරිහීමට පත්නොවී පවත්නා පරිදිම කරත්. දැහැමි බිලියක් කඩ කරන්නවුන්ට වනාහි දෙවියෝ ආරක්ෂාව මනාව නො යොදත්.

නූපන් දුකක් ඇතිකරන්නට නොහැක්කාහු හටගත් කාස, ශීර්ෂ ආදී රෝගාදිය වර්ධනය වෙයි. යුද්ධයක් එළඹි කල්හි සහායකයෝ නැත්තාහ. නොපිරිහෙන්නන්ගේ ආරක්ෂාව මනාව සංවිධානය කරත්. නූපන් සැපයක් උපදවන්නට නොහැක්කාහු නමුත් හටගත් කාස සීස ආදී රෝගයන් බැහැර කරත්. යුද්ධයේදී සහායකයෝ සිටිත්. මෙසේ මෙහි වෘද්ධිහානිය දතයුතුයි. ධම්මිකං **රක්ඛාවරණගුත්තිං** මෙහි ආරක්ෂාව නොපැතූ දෙයක් නොපැමිණෙයි. මෙසේ ආවරණයෙන් ආවරණය, යම්සේ බලාපොරොත්තු දෙය නොනැසේද මෙසේ ආරක්ෂාවෙන් ආරක්ෂාව එහි බලසේනා පිරිවරා ආරක්ෂා කිරීම පැවිද්දන්ට ධාර්මික වූ ආරක්ෂාවරණය නොවේ. යම්සේ වනාහි විහාරය අසල වනයේ ගස් නොකපත් ද වැද්දෝ වරදක් නොකරත්. පොකුණුවල මත්ස්‍යයන් නොඅල්ලති. මෙසේ කිරීම ධර්මකාරක ආරක්ෂා ගුත්තියයි. **කින්ති අනාගතා** ච මෙයින් වනාහි ඔවුන්ගේ මෙසේ පිහිටුවන ලද චිත්ත සන්තාන යැයි සිතේ පැවැත්ම විචාරයි. එහි යමෙක් නොපැමිණි රහතන් වහන්සේලාගේ පැමිණීම අකමැති වෙත්ද ඔව්හු ශ්‍රද්ධාව නැත්තෝ වෙති. අප්‍රසන්න වූවෝය. පැවිද්දන් පැමිණිකල්හි පෙරගමන් නොකරත්ද ගොස් නොබලත් පිළිසඳර කථා නොකරත්. පැන නොවිචාරත්. ධර්මය නාසත්. දන් නොදෙත්. පුණ්‍යානුමෝදනාවන්ට සවන් නොදෙති. වාසයට සුදුසු

තැන් සකස් නොකරත්. ඉක්බිති ඔවුන් පිළිබඳ නුගුණ ප්‍රකට වෙයි. අසවල් නම් රජු ශ්‍රද්ධා හීනයෙකි. අප්‍රසන්නයෙකි. පැවිද්දන් එනවිට පෙරගමන් නොකරයි -පෙ- වාසයට සුදුසු තැන් පිළියෙල කර නොදෙත්. ඒ බව අසා පැවිද්දෝ ඔහුගේ නගර දොරටුවෙන් නොයත්. ගමන් කළත් නගරයට නොපිවිසෙත්. මෙසේ නොපැමිණි රහතන්වහන්සේලාගේ නොපැමිණීමම සිදුවෙයි. පැමිණි අයටද කරදරයක් නැතිව ජීවත්වීමට නොහැකිව තිබියදී යමෙක් ඒ බව නොදැන ආවාහු ඔව්හු මෙහි වාසය කරන්නෙමුයි කියා මෙහි ආවේ නමුත් මේ රජවරුන්ගේ මේ වැඩපිළිවෙල නිසා කවරෙක් නම් වාසය කරන්නේදැයි නික්ම යන්නාහ. මෙසේ නොආ අය නොපැමිණෙන කල්හි පැමිණි අය දුකසේ වාසය කරන කල්හි ඒ දේශය පැවිද්දන්ට නුසුදුසු දේශයක් වෙයි. ඉක්බිති දෙවියන්ගෙන් ආරක්ෂාවක් ඇති නොවේ. දේවතාවන්ගෙන් ආරක්ෂාවක් නැතිකල්හි අමනුෂ්‍යයෝ ඉඩ ලබා ගනිත්. අමනුෂ්‍යයන්ගේ බලය උත්සන්න වනවිට කලින් නුවූ විරූ රෝග හටගනී. ශීලවන්තයන්ගේ දැකීමක් ප්‍රශ්න විචාරීමක් ආදී වූ පිනට හේතුවන කිසිවක් ඇති නොවේ. මේ වෙනස්වීමෙන් කියන ලද පරිදි කාල පක්ෂයේ විපර්යාසයෙන් ශුක්ල පක්ෂයේ හටගැනීම වන්නේ යයි මෙසේ වෙයි. අභිවෘද්ධියේ හානිය සිදුවන සැටි දතයුතුය.

**එකමිදාහං** යනු භාග්‍යවතුන් වහන්සේ මෙය වජ්ජීන්ගේ මේ වජ්ජීන් සන්තක වූ දේශනා කරන ලද අර්ථය සඳහා කීය. එහි **සාරන්‍ද** දෙවෙ මෙනම් වූ විහාරයේ බුදුන් නූපන් කල්හි එහි සාරන්දද නම් වූ යක්ෂයාගේ වාසය කළ තැන ලෙස චෛත්‍යයක් විය. ඉක්බිති එහි භාග්‍යවතුන් වහන්සේට විහාරයක් කරවූහ. එම විහාරය සාරන්‍දද චෙතියෙහි කරවන ලද බැවින් සාරන්දද චෙතියැයි ප්‍රසිද්ධ විය. **අකරණීයා** නොකළ යුතු, නොගතයුතු යන අර්ථයි. **යදිදං** යනු නිපාත මාත්‍රයකි. **යුද්ධස්ස** කරණ අර්ථයේ ස්වාමි වචනයයි. මුහුණට මුහුණලා කරන සටනින් අල්ලාගත නොහැක යන අර්ථයි. **අඤ්ඤත්‍ර උපලා පනාය** යනු චාටු බස්කීම හැර, චාටුබස් කීම නම්, විවාදයෙන් ඵලයක් නැත. දැන් සමගි වෙමු. ඇත්, අස්, රථ, රන්රුවන් ආදිය යවා සංග්‍රහ කිරීම, මෙසේ වනාහි සංග්‍රහ කොට හුදෙක් විශ්වාසයෙන් අල්ලාගන්නට හැකිය යන අර්ථයි. **අඤ්ඤත්‍ර මිථුභෙදාය** මිත්‍රභේදය හැර මේ ඔවුනොවුන් භේද කිරීම කරද මොවුන් අල්ලා ගන්නට හැකියයි දක්වයි. මේ බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ බ්‍රාහ්මණයාගේ මේ කථාවෙන් ක්‍රම පිළිවෙල දැනගනීයැයි. එසේය දනියි. **දන්නා තැනැත්තා කුමක් නිසා කීවේද? අනුකම්පාවෙන්ය.** ඔහුට වනාහි

මෙසේ අදහස් විය. මා විසින් නොකියන ලද කල්හි දවස් කීපයකින් ගොස් සියල්ලන්වම අල්ලා ගන්නේය කියන ලද කල්හි සමගිය බිඳවන්නේ වර්ෂ තුනකින් අල්ලා ගන්නේය. මෙපමණක් වූ ජීවිතයම උතුම්ය. මෙතෙක් ජීවත් වන්නාහු තම තමන්ට පිහිටවන පිං කරන්නේ ය.

අභිනන්දිත්වා සිතින් සතුටු වී අනුමොදිත්වා මේ සුභාෂිත වචනය භගවත් ගෞතමයන් වහන්සේ විසින් බව කියා අනුමෝදන් වී. **පක්කාමි** රජුගේ සමීපයට ගියේය. ඉක්බිති රජු කිම ආචාරීනි! භාග්‍යවතුන් වහන්සේ කුමක් ප්‍රකාශ කළේදැයි ඇසීය. පින්වතුනි, භගවත් ගෞතමයන් වහන්සේගේ වචනය අනුව කිසිවකුටත් වජ්ජීන්ව අල්ලාගත නොහැක. එසේ නමුත් චාටුබස් කීමෙන් හෝ මිත්‍ර භේදයෙන් හැකියැයි කීය. ඉක්බිති රජු මෙසේ කීය. චාටු බස්වලින් අපගේ හස්තීහු හා අශ්වයෝ නැසෙන්නාහ. භේද කිරීමෙන්ම ඔවුන් අල්ලා ගමු. කුමක් කරමුදැයි ඇසීය. එසේනම් මහරජතුමනි! ඔබ වජ්ජීන් පිළිබඳව කථා ඇතිකරන්න. ඉක්බිති මම මහරජතුමනි, තමන් සන්තක දෙයින් කවර ප්‍රයෝජනයක්ද? මේ රජවරු ගොවිතැන්, වෙළඳාම් කිරීමෙන් ජීවත් වෙත්වා යි කියා බැහැර යන්නෙමි. ඉක්බිති නුඹලා, 'කිම මේ බ්‍රාහ්මණයා වජ්ජීන් පිළිබඳව කළ කථාව පරාජය කරයි කියා කියව්. දවල් කාලයේ ද මම ඔවුන්ට පණිවිඩයක් යවන්නෙමි. එයද ගෙන නුඹලා මට දොස් පවරා බැඳීම්, තැලීම් ආදියක් නොකරම හුදෙක් මාගේ හිස මුඩුකර නගරයෙන් බැහැර කරන්න. ඉක්බිති මම, මා විසින් ඒ නගරයන්ද ප්‍රාකාරයන්ද දියඅගල්ද කරවන ලදී. මම වනාහි දුබල තැන් ද පහත් ගැඹුරු තැන් ද දනිමි. නොබෝ කලකින්ම දැන් ඍජු කරන්නෙමියි කියමි. එය අසා නුඹලා යෙත්වායි කියව්. රජු සියල්ල කළේය. ලිච්ඡවී රජවරු ඔහුගේ නික්ම යාම අසා කපටි බ්‍රාහ්මණයාට ගඟින් එගොඩවන්නට ඉඩ නොදෙන්න යැයි කීහ. ඉක්බිති ඇතැමකු විසින් අප අරභයා කියන ලද බැවින් වනාහි ඔහු මෙසේ කරයි යැයි කී කල්හි එසේනම් හිතවත එන්නයැයි කීවාහ. ඔහු ගොස් ලිච්ඡවීන් දැන් කුමක් නිසා ආවේදැයි විචාරන ලදුව ඒ පුවත සැලකළහ. ලිච්ඡවීහු වනාහි අප්‍රමාදී වූවකු විසින් බර දඬුවමක් කරන්නට සුදුසු නැතැයි කියා ඔබ එහි දරණ තනතුර කුමක්දැයි විචාළාහ. මම විනිශ්චය ඇමැතියා වෙමියි කීය. එසේනම් ඔබට ඒ තනතුරම දෙමියි කීහ. හෙතෙම මනාව විනිශ්චය කටයුතු කරයි. රාජකුමාරවරු ඔහු ලඟ ශිල්ප හදාරත්. ඔහු පිහිටි ගුණ ඇත්තෙක් වී එක් දවසක් එක් ලිච්ඡවියකු ගෙන එක පැත්තකට ගොස් කුඹුරක් සී සාන්නේදැයි ඇසීය. එසේය.

ගොනුන් දෙදෙනෙකු යොදා සීසාන්නෙමි. මෙපමණක් කියා නතරවිය. ඉක්බිති තවෙකෙක් ආචාර්යයා කුමක් කීවේදැයි ඔහුගෙන් අසන ලදුව ඔහු විසින් කියන ලදී. එය විශ්වාස නොකර, මොහු මට ඇති තතු නොකියයි කියා ඔහු සමග භේද විය.

බ්‍රාහ්මණයා තවත් දිනක එක් ලිච්ඡවියකු පසෙකට ගෙන ගොස් ඔබ අතිශයින් දුප්පත් නොවේදැයි විචාළේය. කවරෙක් මෙසේ කීවේදැයි ඇසූ කල්හි අසවල් ලිච්ඡවියා යැයි කීය. තව අයකුවද පසෙකට ගෙන ගොස් ඔබ බියගුල්ලෙක් නොවේදැයි ඇසීය. කවරෙක් එසේ කීවේදැයි විචාළ කල්හි අසවල් ලිච්ඡවී විසින් යැයි කීය. මෙසේ අන් අයකු නොකී දෙයක් වෙන කෙනෙකුට කියන්නේ වර්ෂ තුනකදී ඒ රජවරුන්ව ඔවුනොවුන් භේද කර යම්සේ ඔවුන් දෙදෙනෙක් එකමග නොයන ලෙස කර රැස්වීම සඳහා බෙර හැසිරවීය. ලිච්ඡවීහු මහේශාක්‍යයෝ රැස්වෙත්වායි රැස් නොවූහ. ඒ බ්‍රාහ්මණයා, දැන් සුදුසු වේලාවයි. පැමිණෙන්න කියා රජුට පණිවිඩ යැවීය. රජතුමා එය අසා බලය පතුරුවන බෙර යවා නික්මින. විශාලා නුවර වැසියෝ, රජුට ගඟට බසින්නට ඉඩ නොදෙමුයයි බෙරකරුවන් යැවූහ. එයද අසා දක්ෂ රජවරු යෙත්වා යනාදිය කියා රැස් නොවූහ. නගරයට පිවිසෙන්නට ඉඩ නොදෙමු. දොරවල් වසාගෙන සිටිමු යයි බෙර හැසිරවූහ. එක් අයෙක්වත් රැස්වූයේ නැත. විවෘතව පැවැති දොරවලින් පිවිස සියල්ලන්වම විපතට පත්කොට ගියේය.

**අප්පබො භගවා අචිරපක්කනෙත ආදියෙහි සනනිපාතෙත්‍වා** දුරබැහැර පිහිටි විහාරස්ථානවලට ඍද්ධිමතුන් යවා ළඟ පිහිටි විහාරවලට තමන්ම ගොස් ආයුෂ්මතුනි! රැස්වන්න. භාග්‍යවතුන් වහන්සේ ඔබලාගේ රැස්වීම කැමැති වන සේක කියා රැස්කරවා, අපරිහානියෙ පිරිහීමට හේතු නොවන, දියුණුවට හේතුකාරණා වූ යන අර්ථයි. **ධම්මෙ දෙසෙස්සාමි** චන්ද්‍රයන් දහසක් සූර්යයන් දහසක් නැගෙන්නාක් මෙන් බිත්ති සතරක් ඇති ගෙයක පහන් දහසක් දල්වන්නාක් මෙන් ප්‍රකට කර කියන්නෙමි. **එහි අභිණ්හං සනනිපාතා** මෙය වජ්ජි සූත්‍රයෙහි කියන ලද පරිදිමය. මෙහිදී ද නිතර රැස් නොවීමෙන් දිශාවන්ගෙන් ලැබුනා වූ තොරතුරු නොඅසත්. එයින් අසවල් විහාරසීමාව වියවුල් සහිතය. පොහෝ පවාරණ ආදිය නොකරත්. අසවල් ස්ථානයේ භික්ෂූහු වෙදකම් හා දූත කටයුතු කරත්. නොයෙක් දේ ඉඟි කරන්නාහු මල්දීම ආදිය කරමින් ජීවිකාව ගෙනයත්. ආදිය නොදනිත්.

පාප භික්ෂූහු ද භික්ෂු සංඝයා ප්‍රමාද බව දැනගෙන කණ්ඩායම් සෑදී සසුන පසුබස්සවති. නිතර රැස්වන්නාහු වනාහි ඒ ඒ පුවත අසත්. ඉක්බිති භික්ෂු සංඝයා පිටත්කර යවා සීමාව නිවැරදි කරත්. උපෝසථ පවාරණ ආදිය පවත්වවත්. වැරදි දිවිපෙවෙත් ඇත්තෙත් බලවත් වූ තැන ආර්යවංශිකයන් (සිල්වතුන්) යවා ආර්යවංශ ප්‍රතිපදාව කියවවත්. විනයධරයන් ලවා පාප භික්ෂූන්ට නිග්‍රහ කරවවත්. පාප භික්ෂූහුද, සංඝයා අප්‍රමාදීය. අපට කණ්ඩායම් වශයෙන් හැසිරිය නොහැක කියා භේදභින්න වී පලායත්. මෙසේද වනාහි හානිය වැඩිවීම දතයුතුය. සමග්ගා ආදියෙහි චෛත්‍ය පිළිදැගුම් කිරීම් සඳහා හෝ බෝධිගෘහ, පොහෝ ගෙවල් සෙවිලි කිරීම පිණිස කතිකාවතක් ඇතිකිරීම පිණිස අවවාද දීම පිණිස හෝ සංඝයා රැස්වේවා'යි බෙරකරුවන් යවා හෝ ඝණ්ඨාවෙන් හෝ උනන්දු කරවනවිට, මට සිවුරු පිළියෙල කිරීමට ඇත. මට පාත්‍රය පිළිස්සීමට ඇත. මට අළුතින් කළයුතු වැඩකටයුතු ඇතැයි අවුල් ඇතිකරන්නාහු රැස් නොවෙත්. ඒ සියලුම වැඩ අතහැර මා පළමුවෙන්, මා පළමුවෙන් කියා එකවරම රැස්වන්නාහු සමගියෙන් රැස්වන්නාහු නම් වෙත්. රැස්වූවෝ වනාහි සිතා මතා කළයුත්ත කර තනිතනිව නොනැගිටින්නේ නම් එය සමගියෙන් නැගීසිටීම නොවේ. මෙසේ නැගිටි කල්හි යමෙක් පළමුව යත්ද ඔවුන්ට මෙසේ සිතෙයි. අප විසින් බාහිර කථාවට අසන ලදී. දැන් විනිශ්චය කථාව වන්නේය කියා මා පළමුව මා පළමුව එක්වරින්ම නැගී සිටින්නාහු සමගියෙන් නැගී සිටින්නාහු නම් වෙත්. තවද අසවල් තැන විහාර සීමාවේ අවුල් ඇත. පොහෝ පවුරුණු කිරීමට සිටියෝ අසවල් තැන වෙදකම් ආදිය කරත්. මෙසේ පාප භික්ෂූන් උත්සන්න වී ඇතැයි අසා කවරෙක් එහි ගොස් ඔවුන්ට නිග්‍රහ කරන්නේදැයි කියූ කල්හි ද මා පළමුවෙන් මා පළමුවෙන් කියා යන්නාහුද සමගියෙන් නැගී සිටින්නෝ නම් වෙත්. ආගන්තුකයෙකු දැක මේ පිරිවෙණට යන්න. මේ පිරිවෙණට යන්න. අප කවුරුන්දැයි නොකියා සියළු වත් කරන්නාහු නමුත් දිරාගිය පාත්‍රාසිවුරු දැක ඔහුට භික්ෂාචාර වත අනුව පාසිවුරු සොයන්නාහු නමුදු ගිලනුන්ට බෙහෙත් සොයන්නාහු නමුත් අනාථ වූ ගිලනුන්ට අසවල් පිරිවෙණට යන්න අසවල් පිරිවෙණට යන්න' මෙසේ නොකියා තමන්ගේම පන්සල්වලදීම පිළිදැගුම් කරන්නේ නමුත් එක් ගෙන නොගිය පොතක් වෙයි. ප්‍රඥාවන්ත භික්ෂුවකට සංග්‍රහ කර ඔහු ලවා එම ග්‍රන්ථය ලබාගෙන සමගිව සංඝයා විසින් කරනු ලබන විනය කර්මාදිය කරත් නම් වේ. **අපඤ්ඤත්ත** යනාදියෙහි අලුත් ධර්මානුකූල නොවන කතිකාවතක් හෝ ශික්ෂාපදයක් හෝ අලුතින් නිර්මාණය කරමින් කලින්

පනවා නැති දෙයක් පනවත්. පුරාණ සන්ථක වස්තුවේ සැවැත්නුවර භික්ෂුවක් මෙන්, ධර්මයට විරුද්ධ විනය විරෝධී සසුනක් පෙන්වමින් පනවන ලද්ද සිඳ දමත්. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පා වර්ෂ සියයක් ගතවූ තැන විශාලා නුවර වජ්ජිපුත්තක භික්ෂූන් මෙනි. බුද්දානුබුද්දක ශික්ෂාපද කඩකරන්නාහු පනවන ලද ශික්ෂාපදයන්හි සමාදන්ව නොහැසිරෙත්. අස්සජි පුනබ්බසුකයන් මෙනි. අලුත් කතිකාවතක් හෝ ශික්ෂාපදයක් හෝ අළුතින් නිබන්ධනය නොකොට ධර්මානුකූල ලෙස විනයානුකූල ලෙස සසුන දක්වමින් බුද්දානුබුද්දක ශික්ෂාපද උදුරා නොදමමින් නොපනවන ලද්දක් නොපනවත්. පනවන ලද්ද සිඳ නොදමයි. යම්සේ පනවන ලද ශික්ෂාපදවල සමාදන් වී ජීවත්වෙත් යනුයි. ආයුෂ්මත් උපසේන තෙරුන් මෙනි. ආයුෂ්මත් කාකණ්ඩපුත්ත යස තෙරුන් මෙනි. සංඝයා අසනු ලැබේවා. අපට අයත් ශික්ෂාපද ඇත. ඒවා ගිහියන් වූ අපි මේවා ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයන්ට සුදුසුද? මෙය ඔබලාට කැපද? කියා නොදන්නෙමු. ඉදින් අපි බුද්දානුබුද්දක ශික්ෂාපද ඉවත්කර දමන්නෙමු නම් මෙසේ කියන්නෝ ඇතිවෙත්. කුමක්ද? ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට සදාකල්හි පවත්නා පරිදි ශික්ෂාපද පනවන ලද අතර ශාස්තෘන් වහන්සේ ජීවමානව සිටියදී ඒවා ආරක්ෂා කළ බවත් දැන් උන්වහන්සේ පිරිනිවන් පෑකල්හි ශික්ෂාපදයන්හි නොහික්මෙත්. ඉදින් යෝග්‍ය කාලයෙහි මහාසංඝයා නොපැනවූ දෙයක් අළුතින් නො පනවන්නේ ය. පැනවූ දෙය කඩ නො කරන්නේ ය. පැනවූ ශික්ෂාපද සමාදන්ව ජීවත්වන්නේ ය යන මේ තීරණය තබන්නා වූ මහාකාශ්‍යප මහරහතන් වහන්සේ මෙන්. වුඩ්ඪියෙව ශීලාදි ගුණයන්ගෙන් දියුණුවයි. පරිහානිය නොවේ. ථෙරා යනු ස්ථිරභාවයට පත්වූ, තෙරනමක් විසින් පැවැත්විය යුතු ගුණයන්ගෙන් සමන්විත බොහෝ රාත්‍රීන් දනිත්තුයි **රත්තඤ්ඤූ** පැවිදි වී බොහෝ කල්ගත වූ මේ ඇත්තන් **චිර පබ්බජිතා** වේ. සංඝයාගේ පිය තනතුරේ සිටියාහු **සංඝ පිතරො** පිය තනතුරෙහි සිටි බැවින් සංඝයා පෙරටු කරත්. ඉදිරියෙන් සිට ශික්ෂාපද තුනක පවතිත්තුයි **සංඝ පරිණායක** වේ. යමෙක් ඔවුන්ට සත්කාරාදිය නොකරත්ද අවවාද සඳහා දෙතුන් වරක් උපස්ථාන සඳහා නොයත්. ඔව්හුද ඔවුන්ට අවවාද නොදෙත්. පරපුරෙන් ආ කථා නොකියත්. සාරවත් වූ දහම් පිළිවෙත ශික්ෂණය නො කරවත්. ඔව්හු එයින් වෙන්වූවාහු ශීලාදී වූ ධර්ම ස්කන්ධයන්ගෙන් ද සප්ත ආර්ය ධනයෙන් ද යනාදී වූ ගුණයන්ගෙන් පිරිහෙත්. ඔවුන්ට අවවාද දෙත්. මෙසේ ඔවුන් ඉදිරියට යා යුතුයි. මෙසේ ඔවුන් ඉවත්විය යුතුයි. මෙසේ ඔවුන් දැකිය යුතුයි. මෙසේ ඔවුන් බැලිය

යුතුයි. මෙසේ ඔවුන් හැකිලිය යුතුයි. මෙසේ ඔවුන් විහිදී යා යුතුයි. මෙසේ ඔවුන් සඟල සිවුර, පාත්‍රය දැරිය යුතුයි. තෙළෙස් ධුතාංගයන්ගෙන් හා දස කථාවස්තූන්ගෙන් අනුශාසනා කරත්. ඔව්හු ද ඔවුන්ගේ අවවාදයෙහි පිහිටා ශීලාදි ගුණයන්ගෙන් වැඩිදියුණු වන්නාහු ශ්‍රමණ බවට පත්වෙත්. මෙසේ මෙහි පරිහානියත් අභිවෘද්ධියත් දතයුතුයි.

පුනර්භවයක් ලබාදෙන පුනර්භවය පුනර්භවය, මේ ස්වභාවය මොහුටනුයි පොනොභවික නම් වේ. (නැවත ඉපදීම ගෙනදෙන) යන අර්ථයි. එහි පොනොභවිකාය නම් වේ. න වසං ගච්ඡනති මෙහි යමෙක් සිව්පසය හේතුවෙන් උපස්ථායකයන්ගේ පසුපස යන්නන් වී ගමින් ගමට හැසිරෙත්. ඔව්හු ඒ තණ්හාවේ වශයට යත් නම් වේ. අන් අය නොයෙත්. එහි හානිය හා අභිවෘද්ධිය ප්‍රකටය. ආරඤ්ඤකෙසු දුනු පන්සියයකට පසු සාපෙඛා තෘෂ්ණාව සහිතව, ආලය සහිතව, ග්‍රාමන්ත සේනාසනවල ධ්‍යානවලට පැමිණ එයින් නැගීසිටිය පමණින් ස්ත්‍රී පුරුෂ දැරි ආදීන්ගේ ශබ්ද අසයි. ඒ නිසා මොහුට අවබෝධ කරගත් දේද පිරිහී යයි. අරණ්‍යයෙහි වනාහි නිදා සිට පිබිදිවිට සිංහ, ව්‍යාඝ්‍ර, මොණර ආදීන්ගේ ශබ්ද අසයි. යමෙකින් අරඤ්ඤවැසියා ප්‍රීතියක් ලබා එය සම්මර්ශනය කරන්නේ අග්‍රඵලයෙහි පිහිටයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ග්‍රාමාන්ත සේනාසනයෙහිදී ධ්‍යානයට පත්ව හුන්නා වූ භික්ෂුවට අරණ්‍යයෙහි නිදාගන්නහුම පසසයි. ඒ නිසා එම අර්ථය අරභයා 'ආරණ්‍යවල, සේනාසනවල බලාපොරොත්තු ඇත්තෝ වන්නාහ' යැයි කීය.

පච්චතතංයෙව සතිං උපට්ඨපෙසසනති යනු තම තමන්ගේ අභ්‍යන්තරයෙහි සිහිය පිහිටුවත්. පෙසලා යනු ප්‍රිය ස්වභාව ඇති. මෙහිද සබ්‍රහ්මචාරීන්ගේ පැමිණීම බලාපොරොත්තු නොවන්නාහු නේවාසිකයෝ අශ්‍රද්ධාවන්තයෝ වෙත්. අප්‍රසන්න වූවාහු පැමිණෙන භික්ෂූන්ට පෙරගමන් කොට පාත්‍රාසිවුරු පිළිගෙන ආසන පැනවීම තල්වැට ගැනීම් ආදිය නොකරත්. ඉක්බිති ඔවුන්ගේ නුගුණ ඉස්මතු වෙයි. අසවල් විහාරවාසී භික්ෂූහු ශ්‍රද්ධාව නැති අප්‍රසන්න වන අතර විහාරයට පිවිසෙන භික්ෂූන්ට වත්පිළිවෙත් නොකරත්. ඒ අසා පැවිද්දෝ විහාර දොරටුවෙන් යන්නාහු නමුත් විහාරයට නොපිවිසෙත්. මෙසේ නොපැමිණි අයගේ නොඒමම වෙයි. පැමිණි අයට සුවපහසුකම් නැතිකල්හි නොදැන පැමිණි අය වාසය කරන්නෙමුයි සිතා ආවෝ වෙමු. මේ නේවාසිකයන්ට සළකන්නේ මේ ආකාරයෙන් නම් කවරෙක් වාසය කරන්නේදැයි නික්ම යත්. මෙසේ

ඒ විහාරයේ වෙනත් භික්ෂූන්ට නතරවීම සිදු නොවන්නේය. ඉක්බිති නේවාසික භික්ෂූහු සිල්වතුන් දැකීමට අවස්ථාවක් නොලබන්නාහු සැක නැති කරගැනීමක් හෝ ආචාරධර්ම ඉගැන්වීමක් හෝ මිහිරි ධර්මශ්‍රවණයක් නොලබත්ද ඔවුන්ට ඉගෙන නොගත් ධර්මයන් ඉගෙනීමට නොලැබේ. උගත් දේ සජ්ඣායනා කරන්නට නොලැබේ. මෙසේ ඔවුන්ට හානියක් විය. අභිවෘද්ධියක් නොවේ. යමෙක් වනාහි සබ්‍රහ්මචාරීන්ගේ පැමිණීම කැමැති වෙත්ද ඔව්හු ශ්‍රද්ධාවන්ත හා ප්‍රසන්න වූවාහු සබ්‍රහ්මචාරීන්ට පෙරගමන් කිරීම් ආදිය කොට සෙනසුන් පනවා දෙත්. ඒවා ගෙන භික්ෂාචාරයට පිවිසෙත්. සැක දුරුකරත්. මිහිරි දහම් අසන්නට ලැබේ. ඉක්බිති ඔවුන් පිළිබඳ ගුණකථාව පැතිර යයි. අසවල් විහාරයේ භික්ෂූහු මෙසේ ශ්‍රද්ධා සම්පන්න, වතාවත් දන්නා අමුත්තන්ට සංග්‍රහ කරන්නෝය. ඒ අසා භික්ෂූහු දුරසිටද පැමිණෙත්. ඔවුන්ට නේවාසිකයෝ වතාවත් දක්වත්. සමීපයට පැමිණ වැඩිමල් ආගන්තුකයන්ට වැඳ වඩා හිඳුවත්. වයසින් බාල ඇත්තා ලඟ අසුනක් ගෙන හිඳගනී. හිඳ මේ විහාරයේ වාසය කරන්නේ ද? නික්ම යන්නේදැයි අයත් යන්නෙමියි කීකල්හි පහසු සෙනසුන් ඇත. භික්ෂාව සුලභය ආදිය කියා යන්නට ඉඩ නොදෙත්. ඉතින් විනයධර කෙනෙක් වේ නම් ඔහු ලඟ විනය සජ්ඣායනා කරයි. සූත්‍රාන්ත ආදියක් දරන්නෙක් නම් ඔහු ලඟ ඒ ඒ ධර්මය සජ්ඣායනා කෙරේ. ආගන්තුක භික්ෂූන්ගේ අවවාදයේ පිහිටා පටිසම්භිදා සහිත රහත්බවට පත්වෙත්. එක් දවසක් දෙකක් නතරවීමට ආවෙමු. නමුත් මේ ඇත්තන්ගේ යහපත් ඇසුර නිසා දස, දොළොස් වර්ෂයක් වාසය කරන්නෙමුයි කියන්නෝ වෙත්. මෙසේ මෙහි හානිය හා අභිවෘද්ධිය දතයුතුයි.

දෙවන සත්තකයේ කටයුතුවල ඇල්ම මොවුන්ටය යනු කම්මා රාමා යි වැඩෙහි ඇලුනු **කම්මරතා** නම් වේ. **කම්මාරාමතං අනුයුත්තා**, යෙදුනු, අනුයුක්ත වූ - එහි **කම්මං** යනු කළයුත්ත කර්මයැයි කියනු ලැබේ. ඒ කෙසේද යත් චීවර විමසීම, චීවර සැදීම, උදව් වීම, ඉඳිකටු පෙට්ටිය, පාත්‍ර පසුම්බිය, අංසකඩය, බඳපටිය, දැළිපිහිය, පාත්‍ර අඩිය, සෙරෙප්පුව, මුස්න ආදිය සෑදීම.

කෙනෙක් වනාහි මේවා කරන්නාහු මුළු දවසම ඒවා කරත්. ඒවා මෙහි ප්‍රතික්ෂේප කෙරේ. යමෙක් වනාහි මේවා කරන වේලාවෙහිම මේවා කරත්. උදෙසන වේලාවේදී ඉගෙන ගනී. සජ්ඣායනා වේලාවේ

සජ්ඣායනා කරයි. සැම්දුල් ආදිය අමදින වේලාවේ සැම්දුල් ආදියේ කළයුතු වත් සපුරත්. මෙනෙහි කරන වේලාවේ මෙනෙහි කරත්. ඔහු කම්මා රාම නොවේ. **න භස්සා රාමා** යනු මෙහි යමෙක් ස්ත්‍රීන් පිළිබඳ වර්ණනා, පුරුෂයන් පිළිබඳ වර්ණනා කරමින් රැදාවල් ගතකරත්. මෙබඳු තැනැත්තා දෙඩවීමෙහි අවසානයක් කරන්නෙක් නොවේ. මේ භස්සාරාම නම් වේ. දෙඩවීමෙහි නොයෙදුනේ නම් යමෙක් රැ ද දවල් ද ධර්මය කියයිද පැන විසඳයි ද මේ තැනැත්තා වනාහි අප්පභස්ස නම් වේ. දෙඩවීමෙහි අවසානයක් ඇත්තේ වෙයි. කුමක් නිසාද? මහණෙනි! රැස් වූවා වූ තුඹලා විසින් කළයුතු කාරණා දෙකක් ඇත. උතුම් වූ දැහැමි කථාවක් කළයුතුයි. නැත්නම් නිහඬව සිටිය යුතුයැයි කියන ලද බැවිනි. **න නිද්දාරාමා** යනු මෙහි යමෙක් යන්නේද හුන්නේ ද හොත්තේ ද ථීනමිද්ධයෙන් මඩනාලදුව නිදාගනීද මේ 'නිද්දාරාම' නම් වේ. යමකුගේ වනාහි කරජකායෙහි ගිලන්බව නිසා සිත භවාංගයෙහි තබයිද එය නිද්දාරාමතාවය නොවේ. ඒ නිසා කියන ලදී. 'අග්ගි වෙස්සනය, ගිම්හානයේ පසු මාසයේදී දන්වළඳ අවසානයේ, පිණ්ඩපාතයෙන් වැලකුනේ සඟල සිවුර හතරට නමා දකුණු ඇලයෙන් සිහිනුවණින් යුතුව නින්දට බසින්න' **න සංගනිකාරාමා** යනු මෙහි යමෙක් පළමුවැන්නාට දෙවැන්නා දෙවැන්නාට තුන්වැන්නා තුන්වැන්නාට සතරවැන්නා යන ලෙස එකට සම්බන්ධව වාසය කරයි. එක් අයෙක් සතුටක් නොලබයි. මේ සංගණිකාරාමයයි. යමෙක් වනාහි සිව්ඉරියව්වල තනිව ආශ්වාදයක් ලබයිද එය සංගණිකාරාම නොවේ යයි දතයුතුයි. **න පාපිච්ඡා** මෙහි අසත්පුරුෂයාට සම්භාවනා චේතනාවෙන් යුක්ත දුස්සීලයෝ පාපිෂ්ඨයෝ නම් වෙති. පාපමිත්‍රාදියෙහි පව්ටු මිත්‍රයෝ මොහුටය. **පාපමිත්තා.** සිව් ඉරියව්හි එකමග යන්නා වූ පව්ටු මිතුරන් මොවුන්ටය. **පාප සහායා** එයට නැඹුරු වූ, එයට යොමු වූ එයට නැමුණු බැවින් පාපයන්හි නැඹුරු වූ **පාපසම්පවංකා** යි. **ඔරමත්තකෙන** අල්ප ප්‍රමාණයෙන්, සුළු වශයෙන් අනතරා රහත්බවට පත්නොවී මේ අතරතුර **වොසානං** නිමා වූ බව. මෙපමණක් ප්‍රමාණවත් යැයි පසුබැසීම, කෘත්‍ය අවසන් බව. මෙසේ කියා ඇත. යම්තාක් ශීල පාරිශුද්ධි බවෙන් හා විදර්ශනාවෙන් හෝ ධ්‍යානයන්ගෙන් හෝ සෝවාන් බැවින් හෝ සකෘදාගාමී බැවින් හෝ අනාගාමී බැවින් හෝ අවසානයකට පත් නොවෙත්. ඒ අභිවෘද්ධියම භික්ෂුව විසින් බලාපොරොත්තු විය යුතුයි. පරිහානිය නොවේ.

තතිය සත්තකයෙහි සද්ධා යනු ශ්‍රද්ධාවෙන් යුක්ත. ආගමනීය ශ්‍රද්ධාව, අධිගම ශ්‍රද්ධාව, අධිගම ශ්‍රද්ධාව හා ප්‍රසාද ශ්‍රද්ධාව යැයි සතර වැදෑරුම්ය. එහි ආගමනීය ශ්‍රද්ධාව සර්වඥතාවයට පත් බෝධි සත්ත්වයන්ට තිබේ. බුද්ධ, ධර්ම, සංඝ යනුවෙන් කීකල්හි ඇතිවන පැහැදීම ප්‍රසාද ශ්‍රද්ධාවයි. විශ්වාසකොට, සිතා මතා විශ්වාසය ඇතිකර ගැනීම ඔකප්පන ශ්‍රද්ධාවය. එය දෙවැදෑරුම් ලෙස මෙහි අදහස් කෙරේ. එම ශ්‍රද්ධාවෙන් යුක්ත ශ්‍රද්ධාව ස්ථිර කරගත් වක්ඛලී තෙරුන් මෙනි. ඔහුට වනාහි චෛත්‍ය අංගන, බෝධි අංගනයන්හි කළයුතු වත් කළා වන්නේය. උපාධ්‍යායන්ට, ගුරුවරයාට, කළයුතු වතාවත් පුරයි. හිරිමනා යනු පාපය පිළිකුල් කිරීම ලක්‍ෂණකොට ඇති ලජ්ජාවෙන් යුක්ත සිත් ඇති. ඔත්තාපිනො පවට බියවීමේ ලක්‍ෂණයෙන් ඔත්තප්පයෙන් යුක්ත වූයේ. බහුස්සුතා මෙහි වනාහි පර්යාප්ති ධර්මයෙහි බහුශ්‍රැතය, ප්‍රතිවේධයේ බහුශ්‍රැත යයි දෙයාකාරයි. පර්යාප්ති යනු ත්‍රිපිටකයයි. පටිවෙධ යනු සත්‍යය අවබෝධ කරගැනීමයි. මෙහිදී වනාහි පර්යාප්තිය අදහස් කෙරේ. එය යම්දෙයකින් බහුශ්‍රැතද ඔහු බහුශ්‍රැතයෙකි. මෙයද නිස්සය මුච්චනක, පරිසුපට්ඨාපක, භික්ඛුනොවාදක, සබ්බත්‍ථක බහුස්සුත යැයි සතරවැදෑරුම්ය. (ආශ්‍රයෙන් මිදුනු - පිරිසට උපකාර කරන - භික්‍ෂූන්ට අවවාද දෙන - සැමතැනම බහුශ්‍රැත) මේ අතුරින් බහුශ්‍රැතයන් තුන්දෙනෙක් සමන්ත පාසාදිකා විනය අටුවාවේ ඕවාද වර්ගයෙහි කියන ලද ආකාරයෙන් ගතයුතුයි. සබ්බත්‍ථක බහුස්සුතා සියළු තන්හි බහුශ්‍රැතයෝ වනාහි ආනන්ද තෙරුන් හා සමාන වෙත්. ඔවුන් මෙහිදී අදහස් කෙරේ. ආරද්ධවිරියා යනු යමකුට කායික, චෛතසික වීර්ය පටන්ගන්නා ලද්දේ වේද එහි යමෙක් කායික ලෙස එක්තැන් වීමෙන් තොරව සිව් ඉරියව්වල අටවැදෑරුම් වස්තූන් වශයෙන් එකෙක් වෙත්ද ඔවුන්ගේ කායික වීර්ය ආරම්භ කළා වන්නේය.

යමෙක් සිතින් රංචු ගැසීම නතරකර අෂ්ට සමාපත්ති වශයෙන් එක්තැන් වෙයි. ගමනෙහි හටගත් ක්ලේශයාගේ තැනට පත්වන්නට ඉඩ නොදෙත්. ස්ථානයෙහි හටගත් ක්ලේශයාගේ හිඳගැනීම ද හිඳගැනීමේ ක්ලේශයාගේ සයනයට පත්වන්නට ඉඩ නොදෙයි. උපනුපන් තැන්වල කෙලෙස්වලට නිග්‍රහ කරත්. ඔවුන්ට චෛතසික වීර්ය පටන්ගත්තේ වෙයි. උපට්ඨිතසති. බොහෝ කල් කරන ලද දේ සිහිකරන නැවත නැවත සිහිකරන හා ගතිබ්බ අභය තෙර, දීඝභාණක අභය තෙර ත්‍රිපිටක චූලාභය තෙර ආදීන් මෙනි. මහාගතිබ්බ අභය තෙර වනාහි ඉපදී පස්වන

දිනයේදී මංගල කිරිබතෙහි හොට දමන්නා වූ කවුඩකු දැක හුං හුං කියා ශබ්ද කළේය. ඉක්බිති ඔහු ස්ථවිර කාලයෙහි, ස්වාමීනි! කවදා පටන් සිහිකරන්නෙහිදැයි භික්ෂූන් විසින් විචාරණ ලද්දේ, ඇවැත්නි ඉපදී පස්වන දිනයේ කරන ලද හැඬීමේ පටන්ය කියා කීවේය. දීඝභාණක අභය තෙරුන් වහන්සේ ඉපදී නවවන දිනයේදී මව සිපගන්නෙමියි නැමුණා වූ ඇගේ කෙස්කළඹ කැඩී වැටුණේය. තිඹක් පමණ සමන්මල් දරුවාගේ පපුවට වැටී වේදනාවට පත්විය. හෙතෙම ස්ථවිර කාලයෙහි, ස්වාමීනි! කවදා පටන් සිහිකරන්නෙහිදැයි විචාර කල්හි ඉපදී දවස් නවයේ සිට යයි කීය. ත්‍රිපිටක චූලාභය තෙරුන් වහන්සේ අනුරාධපුරයෙහි දොරවල් තුනක් වසවා මිනිසුන්ට එක් දොරකින් පමණක් පිටව යාම සිදුකර ඔබගේ නම කුමක්ද? ඔබගේ නම කුමක්ද? කියා අසා සවස නැවත නොඅසාම ඔවුන්ගේ නම් හඟවන්නට හැකිය ඇවැත්නියි කීය. මෙබඳු වූ භික්ෂූන් ගැන උපට්ඨිතසතී'යැයි කියන ලදී.

**පඤ්ඤාවන්තො** පංචස්කන්ධය පිළිබඳ හටගැනීම, වැයවීම විමසා බලන ප්‍රඥාවෙන් යුක්ත තවද මේ පද දෙකින්ම විදර්ශනා වඩන භික්ෂූන්ගේ විදර්ශනාවට අවශ්‍ය සම්මා සතියත් විදර්ශනා ප්‍රඥාවත් මෙයින් කියන ලදී.

චතුර්ථ සත්තකයේ සිහියම සම්බොජ්ඣංගයක් වූයේ **සති සම්බොජ්ඣංගො** නම් වේ. සියළු තන්හි මේ ක්‍රමයමයි. එහි වැටහීම් ලක්ෂණකොට ඇති සති සම්බොජ්ඣංගය, සෙවීම් ලක්ෂණකොට ඇති ධම්මවිචය සම්බොජ්ඣංගය නැඟීසිටීමේ ලක්ෂණකොට ඇති විරිය සම්බොජ්ඣංගය පැතිර සිටීම ලක්ෂණකොට ඇති ප්‍රීති සම්බොජ්ඣංගය සංසිඳීම ලක්ෂණකොට ඇති පස්සද්ධි සම්බොජ්ඣංගය විසිරී නොයාම ලක්ෂණකොට ඇති සමාධි සම්බොජ්ඣංගය, නුවණින් සළකා බැලීම ලක්ෂණකොට ඇති උපෙක්ඛා සම්බොජ්ඣංගය, **භාවෙස්සන්ති** යනු සති සම්බොජ්ඣංගය කරුණු සතරකින් පිහිටුවා ගන්නාහු කාරණා සයකින් ධර්මවිචය සම්බොජ්ඣංගය උපදවන්නාහු කාරණා නවයකින් වීර්ය සම්බොජ්ඣංගය වඩන්නාහුකාරණ දසයකින් ප්‍රීති සම්බොජ්ඣංගය උපදවන්නාහු කරුණු සතකින් පස්සද්ධි සම්බොජ්ඣංගය වඩන්නාහු කරුණු දසයකින් සමාධි සම්බොජ්ඣංගය උපදවන්නාහු කරුණු පසකින් උපෙක්ඛා සම්බොජ්ඣංගය උපදවන්නාහු වර්ධනය කරන්නාහු යන

අර්ථයි. මෙයින් විදර්ශනා මාර්ගඵල හා එක්වූ ලෞකික හා ලෝකෝත්තර මිශ්‍ර වූ බොජ්ඣංගයන් පැවසීය.

සයවැන්නෙහි **මෙත්තං කායකම්මං** මෛත්‍රී සිතින් කළයුතු කාය කර්මයන්ය. වචීකර්ම ආදී ක්‍රියාවන්හිද මේ ක්‍රමයමයි. මේවා වනාහි භික්ෂූන් සඳහා පැමිණි ඒවාය. මේවා ගිහියන් අතරද දැකිය හැක. භික්ෂූන්ගේ මෛත්‍රී සිතින් උසස් හැසිරීම සම්බන්ධ ධර්මතාවයන් සම්පූර්ණ කිරීම මෛත්‍රී කායකර්ම නම් වේ. ගිහියන්ට චෛත්‍ය වන්දනාව සඳහා බෝධි වන්දනාව සඳහා සංඝයාට දන් වැළඳවීම සඳහා පැමිණීම, ගමට පිඬුසිඟා වැඩි භික්ෂූන් දැක පෙරගමන් කිරීම, පාත්‍රය පිළිගැනීම, ආසන පැනවීම, පසුගමන් කිරීම මේ ආදිය මෛත්‍රී කායකර්ම නම් වේ. භික්ෂූන්ට වනාහි මෛත්‍රී සිතින් ආචාර පැනවීම, ඉගැන්වීම, කමටහන් දීම, ධර්මදේශනාව ත්‍රිපිටක බුද්ධවචනය, මෛත්‍රී වචීකර්මය නම් වේ. ගිහියන්ගේ චෛත්‍ය වන්දනාවට යමු. බෝධි වන්දනාවට යමු. බණ අසන්නෙමු. මල් පහන් පූජා කරන්නෙමි. තුන් සුචරිතය සමාදන්ව පවතිමු. සලාක බත් ආදිය දෙමු. වස්සාවාසික පිරිකර දෙමු. අද සංඝයාට සිව්පසය දෙන්නෙමු. සංඝයාට ආරාධනා කර කෑමබීම ආදිය දීමට සංවිධානය කරන්න. ආසන පනවව්. පැන් පහසුකම් සළසව්. හටගත් කැමැත්ත ඇත්තාහු උත්සාහ ඇත්තාහු වතාවත් කරව් ආදිය කියන කල්හි ඇතිවන්නේ මෛත්‍රී වචී කර්මයයි. භික්ෂූන්ට, උදෑසනම පිබිද සිරුර පිළිදැගුම් කර සැමිදුලට ගොස් වතාවත්කොට විවේක සෙනසුනෙහි සිට මේ විහාරයෙහි භික්ෂූහු සැපවත් වෙත්වා. අවෛරී වෙත්වා. ව්‍යාපාදයෙන් තොරවෙත්වායි සිතීම මෛත්‍රී මනෝකර්මය නම් වේ. ගිහියන්ට, උතුමෝ සැපවත් වෙත්වා. අවෛරී, ව්‍යාපාදයෙන් තොරවූවෝ වෙත්වායි සිතීම මෛත්‍රී මනෝකර්මය නම් වේ. **ආවිචෙච රහොච** අභිමුඛයේ හා අනභිමුඛයේ එහි අලුත් සිවුරු සකස් කිරීම ආදී කටයුතුවලදී සහායවීමට යාම අභිමුඛයේ කරන මෛත්‍රී කායකර්මය නම් වේ. තෙරවරුන්ට වනාහි පා සේදීම වන්දනාව, පවන් සැලීම ආදී සියළු නිවැරදි ක්‍රියාවන් අභිමුඛයේ මෛත්‍රී කායකර්මය නම් වේ. තෙරවරුන්ට වනාහි පා සේදීම වන්දනාව පවන්සැලීම ආදී සියළු නිවැරදි ක්‍රියාවන් අභිමුඛයේ මෛත්‍රී කායකර්ම නම් වේ. දෙපක්ෂය විසින්ම වැරදි ලෙස තබන ලද දැව භාණ්ඩ ආදිය, අවමන් නොකර තමා විසින් වැරදි ලෙස තැබූවාක් මෙන් පිළියෙල කිරීම අනභිමුඛයේ මෛත්‍රී කායකර්මය නම් වේ. දේවතෙරය, තිස්ස තෙරය මෙසේ උස්කොට කථාකිරීම සම්මුඛගේ මෛත්‍රී වචීකර්මය නම්

වේ. විහාරයේ නැති අවස්ථාවක අසා බලනවිට අපගේ දේව තෙරුන් වහන්සේ කොහිද? තිස්ස තෙරුන් වහන්සේ කොහිද? කවදා ආපසු වඩින්නේද? මෙසේ තමන්ගේ කටින් කථාකිරීම අනභිමුඛයේ මෛත්‍රී වචීකර්මයයි. මෛත්‍රී නමැති තෙලින් සිනිඳු වූ ඇස් හකුලුවා ප්‍රසන්න මුහුණින් බැලීම සම්මුඛයේ මෛත්‍රී මනෝකර්මයයි. දේවතෙර තිස්ස තෙර නිරෝගී වෙත්වා. අල්ප වූ ආබාධ ඇත්තෝ වෙත්වා. සිත එක අරමුණක පිහිටුවීම අනභිමුඛයේ මෛත්‍රී මනෝකර්මය නම් වේ. **ලාභා** යනු සිවුරු ආදී ලබන ලද දේ. **ධම්මිකා** කුහක ආදී භේදයන් වැරදි ආජීවයන් අත්හැර දැහැමින් සෙමින් භික්ෂාවේ හැසිරීමෙන් ලැබුනු. **අන්තමසො පත්තපරියාපන්න මත්තම්පි** යටත්පිරිසෙයින් පාත්‍රයේ ඇති හැඳි දෙකක් තුනක් පමණ වූද ආහාරය. **අප්පටිවිභත්තභොගී** යන මෙහි බෙදීම් දෙකකි. ආමිසය බෙදීම හා පුද්ගලයන් බෙදීම යනුවෙනි. එහි මෙපමණ දෙමි. මෙපමණක් නොදෙමි. මෙසේ සිතින් බෙදීම ආමිස බෙදීම නම් වේ. අසවලාට දෙන්නෙමි. අසවලාට නොදෙන්නෙමි. මෙසේ සිතින් බෙදීම පුද්ගල බෙදීම නම් වේ. මේ දෙකම නොකොට යමෙක් නොබෙදා වළඳයිද මෙය අප්පටිවිභත්තභොගී (නොබෙදා වළඳන) නම් වේ. **සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණ භොගී** මෙහි සාධාරණ භෝගී පුද්ගලයාගේ ලක්ෂණ මේවාය. යම් යම් ප්‍රණීත දෙයක් ලබයිද ඒ ඒ දේවල් ලාභාපේක්ෂාවෙන් තොරව බලාපොරොත්තු රහිතව ගිහියන්ට දෙයි. තමා වළඳයි. පිළිගන්නේ ද සංඝයාට පොදුවේ අයත් වේවායි ගෙන ගෙඩිය ගසා (සීනුව නාදකර) වැළඳිය යුතු දේ සංඝසන්තක ලෙස දකියි. මේ සිහිකටයුතු ධර්මය වනාහි කවරෙක් සම්පූර්ණ කරයිද කවරෙක් සම්පූර්ණ නොකරයිද කියා දුස්සීලයා නොපුරයි. සීලවන්තයෝ ඔහු සතු දෙයක් නොගනිත්.

පිරිසිදු සිල් ඇත්තා වත් කඩනොකර පුරයි. ඒ වතාවත් මෙසේය. යමෙක් වනාහි වෙන්කොට දෙමව්පියන්ට හෝ ආචාර්ය උපාධ්‍යායන්ට හෝ දෙයිද හෙතෙම දිය යුතු දේ දෙයි. බලාපොරොත්තුවක් ඔහුට නැත. බාධාවන් බැලීම වෙයි. බලාපොරොත්තු නැතිකම බාධාවන්ගෙන් මිදුනහුටම සුදුසුය. ඔහු විසින් සපයාගත් දෙය දෙනවිට ගිලනුන්ට, ගිලන් උපස්ථායකයන්ට ආගන්තුකයන්ට අලුත පැවිදි වූවන්ටද සඟල සිවුර, පාත්‍රය ගන්නට නොදන්නාටද දියයුතුයි. මොවුන්ට දී අවශේෂ කොටස වැඩිමහල් තැන සිට ස්වල්පය බැගින් නොදී යමෙක් යම් පමණක් ගනීද ඔහුට එපමණ දිය යුතුයි. ඉතිරියක් නැතිකල්හි නැවත

පිණ්ඩපාතයේ ගොස් වැඩිමහල් පිළිවෙලින් ඒ ඒ මිහිරි දේ ඇත්නම් ඒවා දී ඉතිරිය අනුභව කළ යුතුය. (සීලවනෙතහි) සිල්වතුන් විසින් යන වචනය නිසා දුශ්ශීලයාට දීම නොවටී. මේ සාරාණීය ධර්මය මනාව හික්මුණු පුද්ගලයන් විසින්ම පිරිය යුතුය. නොහික්මුණු පිරිසක් විසින් නොවේ. යමෙක් අන් අයුරකින් ලබයිද හෙතෙම නොගනී. අන් අයගෙන් නොලබන්නාහු පවා සුදුසු ප්‍රමාණයක් පමණක් ගතයුතුයි. වැඩිපුර නොවේ. මේ සාරාණීය ධර්මය මෙසේ නැවත නැවත පිණ්ඩපාතයේ ගොස් ලබන ලබන දෙය දෙන්නාටද දොළොස් අවුරුද්දකින් සම්පූර්ණ වෙයි. එසේය. ඊට කලින් නැත. ඉදින් වනාහි දොළොස්වන වර්ෂයෙහි සාරාණීය ධර්ම පුරන්නා පිණ්ඩපාතයෙන් පිරුණු පාත්‍රය ආසන ශාලාවේ තබා නැමට යයි. වැඩිමහල් තෙරුන් වහන්සේද මේ පිරුණු පාත්‍රය කාගේදැයි ඇසූකල්හි සාරාණීය ධර්ම පූරණ ඇත්තාගේ යයි කී කල්හි එය ගන්න යැයි සියලු පිණ්ඩපාතය බෙදා වළඳ හිස් පාත්‍රය තබයි. ඉක්බිති ඒ භික්ෂුව හිස් පාත්‍රය දැක මට ඉතිරි නොකොටම වැළඳූහයි සිතෙහි දොම්නස් උපදවා ගනී. එයින් සාරාණීය ධර්මය බිඳී යයි. නැවත දොළොස් වර්ෂයක් පිරිය යුතු වෙයි. මෙය වනාහි තීර්ථකයන්ගේ පරිවාසයට සමානය. වරක් කඩවූ විට නැවත පිරිය යුතුයි.

යමෙක් වනාහි මට ලාභයක් සිදුවිය. මා විසින් මනාව ලබන ලදී. යම් මේ මාගේ පාත්‍රයේ අඩංගු දේ නොවිමසාම සබ්‍රහ්මචාරීන් විසින් වළඳන ලදී යැයි සිතේ සතුටක් ඇතිකර ගනී. ඔහුට එය පිරුණේ වෙයි. මෙසේ පුරණ ලද සාරාණීය ධර්ම ඇත්තාට වනාහි ඊර්ෂ්‍යාවක් මසුරුකමක් නැත. මිනිසුන්ට ප්‍රිය වෙයි. සිව්පසය සුලභව ලැබෙයි. මොහුගේ පාත්‍රයේ ඇති දේ දෙන කල්හි අඩු නොවේ. භාණ්ඩයන් බෙදන තැනදී වටිනා භාණ්ඩ ලබයි. භයක් හෝ තැතිගැන්මක් ඇතිවූ කල්හි දෙවියෝ වහා ළඟා වෙත්. එහි මේ කථාවස්තූන් ඇත.

ලෙනගිරිවාසී තිස්ස තෙරුන් වහන්සේ මහගිරිගම ඇසුරුකොට ජීවත්වෙයි. මහතෙරවරුන් වහන්සේලා පනස් නමක් නාගදීප චෛත්‍ය වන්දනාව පිණිස යන්නාහු ගිරිගම පිණ්ඩපාතයේ වැඩ කිසිවක් නොලැබ නික්ම ගියහ.

තිස්ස තෙරුන් වහන්සේ පිවිසෙන්නේ ඔවුන් දැක විචාළේය. ස්වාමීනි, පිණ්ඩපාතය ලැබුනේද? ඇවැත්නි, පිණ්ඩපාතයේ ගියෙමු. ඔහු

ඒ ඇත්තන් පිණ්ඩපාතය නොලද බව දැනගෙන, මා එනතෙක් මෙහි රැඳී සිටින්නයැයි කීය. ඇවැත්නි, අපි පනස්දෙනා පාත්‍රය තෙමෙන පමණවත් කිසිවක් නොලැබුවෙමු. ස්වාමීනි, නේවාසික භික්ෂූහු සමර්ථයෝය. නොලැබුනත් භික්ෂාවේ හැසිරෙන මාර්ගය දනිත්. භික්ෂූහු බලාපොරොත්තුව සිටියහ. තෙරුන්වහන්සේ ගමට පිවිසියේය ලඟ ගෙදරක මහා උපාසිකාව කිරිබතක් සූදානම් කර තෙරුන්වහන්සේ වඩිනතෙක් බලාසිට, තෙරුන්වහන්සේ දොර ලඟට වැඩිකල්හි පාත්‍රය පුරවා පිළිගැන්වීය. උන්වහන්සේ එය රැගෙන තෙරවරුන් සමීපයට ගොස් ස්වාමීනි, පිළිගන්න යැයි වැඩිමල් තෙරුන්ට පැවසීය. තෙරුන්වහන්සේ සිතීය. මෙපමණ වූ අප විසින් කිසිවක් නොලබන ලදී. මේ ඇත්තා වහා රැගෙන පැමිණියේය. කිම අන් අයගේ මුහුණ බැලීද? තෙරුන්වහන්සේ ඒ ඇත්තන් බලන ආකාරයෙන්ම දැනගෙන ස්වාමීනි! දැහැමින් සෙමින් ලබන ලද පිණ්ඩපාතය කුකුසක් නැතිව පිළිගන්නයැයි මුලපටන් සියළුදෙනාටම ඇතිතරම් දී තමා විසින්ද ප්‍රමාණවත් ලෙස වැළඳීය. ඉක්බිති දානය වළඳ අවසානයේදී ඔව්හු තෙරුන්වහන්සේගෙන් විචාළහ. ඇවැත්නි! කවදා ලෝකෝත්තර ධර්මය අවබෝධ කරගත්තේද? ස්වාමීනි! මා තුළ ලෝකෝත්තර ධර්මයක් නැත. ඇවැත්නි! ධ්‍යානලාභීද? ස්වාමීනි! මා විසින් සාරාණීය ධර්මය පුරණ ලදී. එය පුරණ ලද කාලයේ පටන් ඉදින් භික්ෂූන් සියදහසක් සිටියත් පාත්‍රයේ ඇති දේ අඩු නොවේ. ඔව්හු ඒ බව අසා සාධු. සාධු සත්පුරුෂය කියා, මෙය ඔබට සුදුසු වූවකි. තවමත් මේ පාත්‍රයේ ඇති දේ අවසන් නොවෙයි. මෙහි කථාවස්තුව.

මේ තෙරුන්වහන්සේට චෛතිය පර්වතයේ ගිරි භණ්ඩ මහා පූජාවේ දන්දෙන තැනට ගොස් මේ දානයෙහි වටිනාම භාණ්ඩය කුමක්දැයි ඇසීය. ස්වාමීනි! සළු දෙකකි. එසේනම් ඒවා මට දෙන්න යැයි පැවසීය. මෙය ඇසූ ඇමතියෙක් ඒ බව රජුට දැන්වීය. එක් තරුණ භික්ෂුවක් මෙසේ කියයි. ඒ දහර භික්ෂුවට මෙබඳු සිතක් ඇත කියා සියුම්සළු ගැලපෙන්නේ මහතෙරවරුන්මය කියා ඒවා මහතෙරවරුන්ට දෙමියි තැබීය.

භික්ෂූන් පිළිවෙලට සිටිකල්හි පූජා කරන්නහුගේ හිසමත තබන ලද ඒ සළු අතට ගත නොහැකි විය. වෙන ඒවාම අතට එයි. තරුණ භික්ෂුවට දෙන වාරය පැමිණිකල්හි වනාහි ඒ සළු ඔහුගේ අතට නැගී හෙතෙම ඔහුගේ අතේ තබා ඇමැතියාගේ මුහුණ බලා තරුණ භික්ෂුවව

වඩාහිඳුවා දන් දී සංසයා පිටත්කර යවා තරුණ භික්ෂුව සමීපයේ වාඩිවී ස්වාමීනි! මේ ධර්මය කවදා අවබෝධකර ගත්තේදැයි ඇසීය.

හෙතෙම දහම් කොටසක් හෝ තමන්ට නැතිබව නොකියා මහරජ! මා තුළ ලෝකෝත්තර ධර්මයක් නැතැයි කීය. ස්වාමීනි! මුලදීම මේ බව ප්‍රකාශ කළා නේද? එසේය මහරජතුමනි, මම සාරාණීය ධර්ම පූරණ කෙනෙක් වෙමි. ඒ ධර්මය පිරූ කාලයේ පටන් බෙදන තැන්වලදී උසස් භාණ්ඩයක්ම ලැබේ. ස්වාමීනි! සාධු. සාධු. ඔබවහන්සේට මෙය සුදුසුය කියා වැඳ නික්ම ගියේය. මේ බෙදන තැන උතුම් භාණ්ඩයක් ලැබෙයි යනුයි මෙහි කථා වස්තුවයි.

බ්‍රාහ්මණතිස්ස සාගතය කල්හි භාකර ගම්වැසියෝ නාග තෙරණියට නොදන්වාම පළා ගියහ. තෙරණිය අළුයම් වේලෙහි අතිශයින් ගම නිහඬය. කුමක්දැයි බලන්නට තරුණ භික්ෂූනීන්ට පැවසීය. ඔව්හු ගොස් ගමේ සියළුදෙනාම ගිය බව දැනගෙන අවුත් තෙරණියට දැන්වූහ. ඕ තොමෝ එය අසා නුඹලා ඔවුන් ගිය බව ගැන නොසිතන්න. තමන්ගේ උද්දේස විචාරීම සිහිනුවණින්ම යෙදෙන්න යැයි කියා පිඬුසිඟා වඩින වේලාවේ සිවුරු පොරවා දොළොස්දෙනෙක් ගම්දොරටුවේ නිග්‍රෝධ වෘක්ෂ මූලයක සිටියාහ. ගසෙහි අධිගෘහිත දේවතාවා භික්ෂුණීන් දොළොස්දෙනාට පිණ්ඩපාතය දී ස්වාමීනි! වෙන තැනකට නොයන්න. නිරන්තරයෙන් මෙහිම එන්න යැයි කීවේය. තෙරණියගේ නාගථෙර නම් කනිටු සොහොයුරෙක් සිටී. ඔහු මහත් බියකි. ජීවත්වන්නට නොහැක. වෙන දේශයකට යන්නෙමියි තමන් දොළොස්වෙනියාව තමන් වසන තැනින් නික්මයන්නේ තෙරණිය දැක යන්නෙමියි සොයුරුගමට ආවේය. තෙරණිය භික්ෂූන් වහන්සේලා වැඩියේයැයි අසා ඔවුන් සමීපයට ගොස් ස්වාමීනි, කෙසේදැයි විචාළාය. ඔහු ඒ පුවත දැන්වීය. ඕ තොමෝ අද එක දවසක් විහාරයේම නතරව සිට හෙට යන්නෙමියි කීවේය. තෙරුන්වහන්සේලා විහාරයට ගියහ. තෙරණිය පසුදා ගසමුල පිඬුසිඟා හැසිර තෙරුන් වෙත පැමිණ මේ පිණ්ඩපාතය වළඳන්න යැයි කීවාය. තෙරුන්වහන්සේ, තෙරණියනි, වටී යැයි කියා නිහඬවිය. පියාණෙනි! පිණ්ඩපාතය ධාර්මිකය. කුකුසක් නැතිව වළඳන්න. තෙරණියනි! සුදුසුද? ඇය පාත්‍රය ගෙන අහසට දැම්මාය. පාත්‍රය අහසේ රැඳින. තෙරුන්වහන්සේද තල්ගස් සතක් පමණ සිටි භික්ෂුණියගේ පාත්‍රය,

තෙරණියයි කියා බියනම් සැමකල්හි නොපවති. භය සංසිඳුනු විට අරියවංස දේශනාව කරමින් පින්වත් පිණ්ඩපාතිකය! ඔබ භික්ෂුනියගේ බත් වළඳ කල්ගත කළෙහි යයි සිතෙන්ම දොස් පවරා ගනිමින් පීඩාවට පත්වන්නට නොහැක්කෙමි. තෙරණිවරුනි, අප්‍රමාදී වන්න යැයි කියා මගට පිළිපන්නේ ය.

වෘක්ෂ දේවතාවා ද ඉදින් තෙරුන් වහන්සේ තෙරණියගේ අතින් පිණ්ඩපාතය වළඳින්නේ ද ඔහුව වළක්වන්නේ නැත. ඉදින් නොවළඳන්නේ නම් නතර කරන්නෙමියි සිතමින් සිටින්නී තෙරුන්ගේ ගමන දැක ගසින් බැස ස්වාමීනි! පාත්‍රය දෙන්නයැයි පාත්‍රය ගෙන තෙරුන්වහන්සේව ගස මුලට කැඳවා ගෙනවිත් අසුනක් පනවා පිණ්ඩපාතය දී දන් වළඳ අවසානයේ පොරොන්දු කරවාගෙන භික්ෂුණීන් දොළොස් දෙනාටත් භික්ෂූන් දොළොස් දෙනාටත් වර්ෂ හතක් උපස්ථාන කළේය. මේ දේවතාවා උනන්දුවට පත්වන්නේය යනු මෙහි වස්තුවයි. එහි වනාහි තෙරණිය සාරාණීය ධර්ම පුරන්නියක් වූවාය.

අඛණ්ඩානි යනාදියෙහි සප්ත ආපත්ති ස්කන්ධයන්හි ආදියේදී හෝ අවසානයෙහි යමකුගේ ශික්ෂාපදය බිඳුනේ වෙයිද ඔහුගේ ශීලය අවසානයේ කැඩුනු සළුවක් මෙනි. ඛණ්ඩං නාම යමකුගේ වනාහි මැද සීලය බිඳුනේද එය මැදින් සිඳුනු සළුවක් මෙනි. ඡිද්දං සිඳුනේ නම් විය. යමකුගේ වනාහි පිළිවෙලින් දෙකක්, තුනක් බිඳුනේද ඔහුගේ පිටෙහි හෝ කුසෙහි නැගුනා වූ වෙනස් වූ වර්ණයන්ගෙන් කළු රතු ආදී එක්තරා වර්ණයකින් යුත් දෙනක් මෙන්. සබලං නම් වේ. යමකුගේ වනාහි අතරින් පතර බිඳුනේද ඔහුගේ අතරින් පතර වෙනස් වෙනස් ලපවලින් විචිත්‍ර වූ දෙනක් මෙන්. කම්මාසං නම් වේ. යමකුගේ වනාහි සියළු ආකාරයෙන් නොබිඳුනේ ද ඔහුගේ ඒ ශීලයන් අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි නම් වෙත්. ඒ මේවා වනාහි තණ්හාවගේ දාස බවෙන් මුදවා නිදහස්කර ගැනීමෙන් භුජිස්සානි නම් වේ. බුද්ධාදී වූ ප්‍රාඥයන් විසින් පසසන ලද බැවින් විඤ්ඤුප්පසත්ථානි තණ්හා දෘෂ්ටි ආදියෙන් ස්පර්ශ නොවූ බැවින් මේ වනාහි නුඹ පැමිණියෙහිය. කිසිවකු විසින් දැඩි ලෙස ස්පර්ශ නොකළ බැවින් අපරාමට්ඨානි වේ. උපචාර සමාධිය අර්පණා සමාධිය පවත්වන්නේ නුයි සමාධි සංවත්තනිකානී යැයි කියනු ලැබේ. සීල සාමඤ්ඤගතා විහරිස්සනති ඒ ඒ දිශා භාගවල

වාසය කරන භික්ෂූන් සමග සමානත්වයට පත් ස්වභාව ඇතිව වාසය කරත්. සෝතාපන්න පුද්ගලාදීන්ගේ ශීලය සමුද්‍රය තුළත් දෙව්ලොවත් වාසය කරන අන් සෝවාන් ආදී පුද්ගලයන්ට සීලයෙන් සමානමය වෙයි. මාර්ග ශීලයෙහි වෙනසක් නැත. ඒ පිළිබඳව මෙය කියන ලදී. **යායං** දිට්ඨි මාර්ග සම්ප්‍රයුක්ත වූ සම්මා දිට්ඨියයි. **අරියා** නිර්දෝෂියි. **නීයාති** නෛර්යානිකයෝ **තක්කරස්සා** යමෙක් තථාකාරී වෙයි. **සබ්බදුක්ඛක්ඛයාය** සියළු දුක් ක්‍ෂය කිරීම සඳහා **දිට්ඨිසාමඤ්ඤගතා** සමාන දෘෂ්ටි තත්ත්වයට පත්ව වාසය කරත්. **වුද්ධියෙව** මෙසේ වාසය කරන්නවුන්ගේ දියුණුව මහණෙනි! බලාපොරොත්තු විය යුතුයි. පරිහානිය නොවේ.

**එතදෙව බහුල** යනු පිරිනිවන්පෑමට ආසන්න බැවින් භික්ෂූන්ට අවවාද කරන්නේ නැවත නැවතත් මේ ධර්මකථාව කරයි. **ඉතිසීලං** ශීලය මෙබඳුය. මෙපමණ ශීලය, මෙහි ශීලය නම් චතුපාරිශුද්ධි ශීලයයි. සිතෙහි එකඟ බව සමාධියයි. මෙහි විදර්ශනා ප්‍රඥාව ප්‍රඥාව යැයි දතයුතුයි. **සීල පරිභාවිතො** ආදියෙහි යම් ශීලයක සිට මාර්ග සමාධිය, ඵල සමාධිය, නිපදවත්. මොහු මේ ශීලය පුරුදු කරන ලද්දේ මහත්ඵල ඇත්තේ වෙයි. මහානිසංස ඇත්තේ වෙයි. යම් සමාධියක සිට මාර්ග ප්‍රඥාව, ඵල ප්‍රඥාව නිපදවත්. ඒ සමාධිය වඩන ලද මහත්ඵල ඇත්තේ වෙයි. මහානිසංස වෙයි. යම් ප්‍රඥාවක සිට මාර්ග චිත්තය, ඵල චිත්තය නිපදවත්. එය භාවිතයෙන් මනාව ආශ්‍රවයන්ගෙන් මිදෙයි. **යථාභිරනත** බුදුවරයන්ට නොඇල්මක් හෝ තැතිගැන්මක් නම් නැත. රුචි පරිදි බලාපොරොත්තු පරිදි යැයි කියන ලදී. **ආයාම** යනු එන්න. යමු. ආයාම කියාද පාඨයක් ඇත. යමු යන අර්ථයි. **ආනන්ද** භාග්‍යවතුන් වහන්සේ ලඟ හැසිරෙන තෙරුන්ට අමතයි. තෙරුන්වහන්සේ වනාහි, ඇවැත්නි! පාත්‍රාසිවුරු ගන්න. භාග්‍යවතුන් වහන්සේ අසවල් තැනට යනු කැමැත්තේ යයි භික්ෂූන්ට දන්වයි. අම්බලට්ඨිකාවට පැමිණීම කියන ලදී.

**අථඛො ආයස්මා සාරිපුත්තො** ආදී වූ පැහැදීමේ විස්තර කරන ලදී. පාටලී ගමට යාම. **ආවසථාගාර** ආගන්තුකයන්ට වාසය කරන්නට ගෙයක් පාටලී ගමෙහි වනාහි නිරන්තරයෙන් රජවරුන් දෙදෙනාගේ සහායකයෝ අවුත් පවුල් ගෙදරින් බැහැරකොට මාසයක්, අඩමාසයක් වාසය කරත්. ඒ මිනිස්සු නිරන්තරයෙන් උවදුරට පත්වූවාහු මොවුන් පැමිණිකල්හි නතර වීමට තැනක් වන්නේ යැයි නගරය මැද විශාල

ශාලාවක් කරවා එහි එක් පෙදෙසක භාණ්ඩ රැස්කිරීමට, එක් ප්‍රදේශයක නතරවීමට තැන් ද කළහ. ඔව්හු භාග්‍යවතුන් වහන්සේ වැඩියේ යැයි අසා අප විසින්ම ගොස් වඩමවාගෙන ආ යුතුව තිබින. උන්වහන්සේ තමන්ම අප වසන තැනට වැඩියේය. අදම භාග්‍යවතුන් වහන්සේව වඩමවා ගැනීමේ මංගල්‍යය ප්‍රකාශ කරවන්නෙමු යි මේ කාරණය සඳහාම පැමිණි බැවින්ය. මෙසේ ප්‍රකාශ කළහ. යෙන ආවසථාගාරං (ආවාස ගෙය යම්තැනකද) ආදියයි. බුදුවරයන් වහන්සේලා වනාහි අරණ්‍යයට කැමැති, අරණ්‍යයෙහි ඇලුනු සිත් ඇතියහ. ඇතුල්ගම වාසය කරන්නේද නැද්ද යන භාග්‍යවතුන් වහන්සේගේ අදහස නොදන්නා ජනයා ආවාස ගෙය පිළියෙල නොකරම ගියහ. දැන් භාග්‍යවතුන් වහන්සේගේ සිත දැනගෙන කල්ඇතිව ගොස් සකස් කරන්නෙමුයි ආවාස ගෙය තිබෙන තැනට ගියහ. **සබ්බසන්ථරි** යනු යම්සේ සියල්ල අතුරන ලද්දේ වෙයි. මෙසේ අතුරන ලදී. බිඳුනා වූ සංවර ඇති. **පමාදාධිකරණං** ප්‍රමාදයට හේතු මේ සූත්‍රය වනාහි ගිහියන් සඳහා ආවේය. පැවිද්දන්ට වනාහි ලැබෙන්නේමය. ගිහියා වනාහි යම් යම් ශිල්පයකින් ජීවිකාව කරයිද, යම්සේ ගොවිතැනින්, වෙළඳමෙන්, සතුන් මැරීම ආදී ක්‍රමයකින් ප්‍රමාදීව ඒ ඒ දෙය නියමිත වේලාවට සම්පාදනය කරගන්ට නොහැකි වෙත්. ඉක්බිති ඔහුගේ මුදල් විනාශ වෙයි. සතුන් නොමැරිය යුතු කාලයෙහි සතුන් මැරීමෙනුත් සොරකම් ආදිය කිරීමෙනුත් දඬුවම් වශයෙන් මහත් වූ ධන හානි සිදුවෙයි. දුස්සීල වූ පැවිද්දා ප්‍රමාද හේතුවෙන් සීලයෙනුත් බුද්ධ වචනයෙනුත් ධ්‍යානයෙනුත් සප්ත ආර්ය ධනයෙනුත් විනාශයට යයි. ගිහියාට වනාහි අසවල් තැනැත්තා වනාහි අසවල් කුලයෙහි උපන්නේය. දුස්සීලය, පාප ධර්මයන්ගෙන් යුක්තය. අත්හරින ලද මෙලොව පරලොව වැඩ ඇත්තේ සලාක බත් පමණක්වත් නොදෙයි දැයි සිව්පිරිස් මැද පවිටෙක්ය යන නරක නාමය ඇතිවෙයි. පැවිද්දාට වනාහි අසවලා නම් ශීලය ආරක්ෂා කරන්නට අසමත් විය. බුද්ධ වචනය ඉගෙනීමට අසමත් විය. වෙදකම් ආදියෙන් ජීවත් වෙයි. අගෞරව කාරණ සයකින් යුක්තය යනාදී ලෙස නරක නාමයක් ඇතිවෙයි.

**අවිසාරදො** ගිහියා වනාහි ඒකාන්තයෙන් බොහෝදෙනා රැස්වන තැන ඇතැමෙක් මාගේ කටයුතු දැනගන්නාහ. ඉක්බිති මට නින්දා කරන්නාහ. හේ රජගෙදරට පෙන්වත් කියා හෝ බියෙන් යුතුව එළඹෙයි. නිහඬව, බිම බලාගෙන කොන්ද නමාගෙන මාපටැඟිල්ලෙන් බිම සාරමින් හිඳියි. නිර්භයව කිසිවක් කියන්නට නොහැකි වෙයි. පැවිද්දා ද බොහෝ

භික්ෂූන් රැස්ව ඇත. ඒකාන්තයෙන් යම් කෙනෙක් මාගේ කටයුතු දැනගන්නේය. ඉක්බිති මාගේ උපෝසථයද පවාරණයද තබා ශ්‍රමණ බවෙන් ඉවත්කර ඇද දමන්නේ යැයි බිය සහිතව එළඹෙයි. විසාරදව සිට කථා කරන්නට අපොහොසත් වෙයි.

තව කෙනෙක් වනාහි දුශ්ශීල නමුත් ආඩම්බරයෙන් මෙන් හැසිරෙයි. ඔහු අභ්‍යන්තරයෙන් මකු කෙනෙක්මය. **සම්මූළ්හො කාලං කරොති** යනු මරණ මංචකයේ සිටියා වූ ඔහුට දුස්සීල කර්මයෙහි සමාදන්ව යිටි තැනක් ඉදිරිපත් වේ. ඔහු ඇස් හැර මේ ලෝකයත් ඇස් පියාගෙන පරලෝකයත් බලයි. ඔහුම සතර අපායවල් උපස්ථාන කරයි. තියුණු ආයුධවලින් හිසට ගසන්නාක් මෙන් වෙයි. ඔහු නවතන්න. නවතන්න කියා හඬගසා කෑගසද්දීත් පහරදෙයි. ඒ නිසා කියන ලදී. (සම්මූළ්හො කාලං කරොති) මුලාවී කළුරිය කරයි. පස්වන පදය කියන ලදමැයි. ආනිසංස කථාව කියූ අයුරින්ම දතයුතුයි.

**බහුදෙව රත්තිං ධම්මියා කථාය** අනික් පෙළ නැති දහම් කථාවකින්ම ආවාස අනුමෝදනාවෙන්ද අහස්ගඟ ගලන්නාක් මෙන් යොදුනක් පමණ මහා පැණි ප්‍රමාණයක් අඹරා මධුපානයක් පොවන්නාක් මෙන් බොහෝ කලක් දක්වා සතුටුකර උනන්දු කරවීය. **අභික්කන්තා** යනු ඉක්ම ගිය ක්ෂය වූ වැය වූ **සුඤ්ඤාගාර** යනු වෙන් වෙන් වූ ශූන්‍යාගාර නැත. එහිම වනාහි එක් පැත්තක් තාප්පයකින් වට කර මෙහි ශාස්තෘන් වහන්සේ විවේක ගනීයැයි ඇඳක් සූදානම් කළහ. භාග්‍යවතුන් වහන්සේ සිටි ඉරියව්වලින් පරිභෝග කළේනම් මොවුන්ට මහත්ඵල වන්නේ යැයි එහි සිංහ සෙය්‍යාවෙන් වැඩ සිටියේය. ඒ නිසා කියන ලදී. (සුඤ්ඤාගාරං පාවිසි) ශූන්‍යාගාරයට පිවිසියේය කියා. **සුනිධ වස්සකාරා** සුනීධය වස්සකාරය යන බමුණන් දෙදෙන. **මගධ මහාමත්තා** මගධ රජුගේ මහාමාත්‍යවරු මගධ රටෙහි හෝ මහාමාත්‍යවරු මහත් වූ සැප සම්පත් සමූහයකින් යුක්ත වූවාහු මගධ මහා මත්තා නම් වෙත්. **පාටලී ගාමෙ නගරං** පැලලුප් ගම නගරයක් කොට මවත්. **වජ්ජීනං පටිබාහාය** වජ්ජී රජ දරුවන්ගේ ආර්යමාර්ග සිඳ දැමීම පිණිස. **සහස්ස සහස්සෙව** එක් එක් කාණ්ඩය ලෙස දහසක් දහසක් වී. **වත්ථූනි** යනු ගෘහවස්තූන් **චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතු** රජුටද රාජමහා මාත්‍යාදීන්ටද නිවාස මවන්නට වාස්තුවිද්‍යා දන්නවුන්ගේ සිත් නැමෙත්. ඔව්හු වනාහි තමන්ගේ ශිල්ප බලයෙන් පොළව යට තිස්රියනක් පමණ තැන මෙහි නාගයන් අධිගෘහිතය. මෙහි යක්ෂයන් අධිගෘහිතය. මෙහි භූතයන් අධිගෘහිත

පර්වතයක් හෝ කණුවක් හෝ ඇතැයි බලත්. ඔවුහු එවිට මන්ත්‍ර මතුරා දෙවියන් සමග කථා කරමින් සිටින්නාක් මෙන් පෙන්වත්. නැතහොත් ඔවුන්ට ඇඟට දෙවියන් ආරූඪ වී ඒ ඒ තැන්වල වාසස්ථාන සාදන්නට සිත් යොමුකරත්. ඔව්හු සිව්කොණෙහි කණු සිටුවා ගෙවල් සෑදූවිට ඉවත්ව යත්.

ශ්‍රද්ධාවෙන් යුක්ත වූවන්ගේ ශ්‍රද්ධාවන්ත දෙවිවරු එසේ කරත්. ශ්‍රද්ධාවක් නැති අයගේ ශ්‍රද්ධාවන්ත නොවූ දෙවිවරු ද එසේ කරත්. කුමක් නිසාද? ශ්‍රද්ධාවන්ත දෙවිවරුන්ට මෙසේ සිත්වෙයි. මෙහි මිනිස්සු නිවෙස් සාදා පළමුව භික්ෂු සංඝයා වඩාහිඳුවා යහපත වැඩිදියුණු කරත්. ඉක්බිති අපි සිල්වතුන් දකින්නටත්, ධර්මකථා අසන්නටත්, දහම්පැණ විසඳා ගන්නටත්, පින් අනුමෝදනාව අසන්නටත් ලබන්නෙමු. මිනිස්සු දන් දී අපට පින් දෙත්. තාවතිංසෙහි යනු යම්සේ එක් කුලයක එක් පණ්ඩිත මනුෂ්‍යයෙක් එක් විහාරය එක් බහුශ්‍රැත භික්ෂුවක් අරහයා අසවල් ගෙදර මිනිස්සු පණ්ඩිතයෝය. අසවල් විහාරයේ භික්ෂූහු බහුශ්‍රැතයෝය යන හොඳ නාමය පැතිර යයි. එපරිද්දෙන් ශක්‍ර දේවේන්ද්‍රයාත් විශ්වකර්ම දිව්‍ය පුත්‍රයාත් අරහයා තව්තිසා වැසියෝ පණ්ඩිතයෝ යැයි හඬක් ඇතිවිය. ඒ නිසා කීය තාවතිංසභී කියා. තව්තිසා වැසියන් සමග කථාකොට සාදත් යන අර්ථයි. යාවතා අරියං ආයතනං යම්පමණ ආර්ය මිනිසුන්ට රැස්වීමට තැනක් නැත. යාවතා වණිප්පථො යම් පමණ වෙළඳුන්ට ගෙනෙන ලද බඩු එක්රැස් කර තැබීම පිණිස හෝ විකිණීමට හා මිළට ගැනීමට යනාදී ලෙස වෙළඳුන්ට වාසය කරන්නට තැනක් නැත. ඉදං අග්ගනගරං ඒ ආර්ය ආයතන, වාණිජ ව්‍යාපාර ආදියට මේ අගනුවර ප්‍රධාන ප්‍රමුඛ වන්නේය. පුටභෙදනං බඩු පොදි ලිහන තැන, බඩු මිටි බඳින තැන, බඩු මුද්‍රාහරින තැන ආදිය කියන ලදී. සියළු දඹදිව සොයාගත නොහැකි භාණ්ඩයක් වුවත් මෙහිදීම ලබාගත හැක. වෙන තැනක විකිණීමෙන් නොයන්නාහුද මෙහිම යන්නේය. කුමක් නිසා මෙහිම ගොටුව සිඳින්නේද යන අර්ථයි. දොරටු සතරෙහි සතර බැගින් මෙසේ දවස ගානේ පන් ලක්ෂයක් නැගිටීත් යැයි දක්වයි. අග්ගිතොවා ආදියෙහි 'වා' ශබ්දය ච කාරයේ අර්ථය සඳහාය. ගින්නෙන් හෝ ජලයෙන් මිත්‍ර භේදයෙන් ද නසින්නේය යන අර්ථයි. එක් කොටසක් ගින්නෙන් ද නසින්නේ ය. නිවා දමන්නටත් නොහැකි වෙත්. එකක් ගංගාවට ගසාගෙන යයි. එකෙක් මොහු විසින් මොහුට නොකියන ලද මොහු විසින් නොකියන

ලද්ද මොහුට යැයි කියන්නා වූ කේලාම් කීම් වශයෙන් බිඳුනා වූ මිනිසුන් ඔවුනොවුන් භේදවීමෙන් නසින්නේය යන අර්ථයි. මෙසේ කියා භාග්‍යවතුන් වහන්සේ අළුයම්කාලයේ ගංතෙරට වැඩ මුහුණ සෝදා පිණ්ඩපාතයේ වඩින වේලාව එනතෙක් බලාසිටි සේක. **සුනීධ** වස්සකාරද අපගේ රජතෙමේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ උපස්ථායකයෙකි. ඔහු අපගෙන් විමසයි.

ශාස්තෲන් වහන්සේ වනාහි පාටලීගමට වැඩියේය. උන්වහන්සේ සමීපයට පැමිණියෙමුයි කීකල්හි ආරාධනා කළහුද නැද්ද කියා අසන්නේය. ආරාධනා කළේ නැතැයි කීකල්හි අපට දෝෂාරෝපණය කොට නින්දා කරන්නේ ය. මෙයද වනාහි අපි පැමිණි තැන නගරයක් මවමු. ශ්‍රමණ ගෞතමයන් වහන්සේට ගිය ගිය තැන්වල අවාසනාවන්ත සත්ත්වයෝ නික්ම යත්. අපි නගරයට ගෙවදීමේ මංගල්‍යය නියම කරගන්නෙමුයි සිතා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ ආරාධනා කළහ. ඒ නිසා 'සුනීධ වසසකාරාදිය' කියන ලදී. **පුබ්බණ්හසමයං** පෙරවරුවේ **නිවාසෙත්වා** ගමට පිවිසෙන ආකාරයෙන් වස්ත්‍රයක් හැඳගෙන පටිය බැඳ **පත්තචීවරං ආදාය** පාත්‍රයද සිවුරද ගෙන, කයට සම්බන්ධ කර.

**සීලවන්තෙත්ථ** මෙහි ශීලවන්තයෙක්. **සඤ්ඤතෙ** කය, වචනය හා මනසින් හික්මුනු. **තාසං දක්ඛිණමාදිසෙ** සංඝයාට සිව්පසය දුන් කල්හි ඒ ගෘහ දේවතාවන්ට අනුමෝදන් කරන්නේය. පින් දෙන්නේය. **පූජිතා පූජයන්ති** යනු මේ මනුෂ්‍යයෝ අපගේ නෑයෝ නොවෙත්. සාරමසක් සයමාසයක් අපට බලිකම් කරත්යැයි පුදත්. ඇතිවූ කරදරය ගෙනයත්. **තතොනං** ඉක්බිති ඒ පණ්ඩිත වූ මිනිසකු **ඔරසං** ළයේ තබා වඩන ලද. යම්සේ මව ඖරස පුත්‍රයකුට අනුකම්පා කරයි. හටගත් කරදරය නැතිකිරීම පිණිස උත්සාහ කරයි. මෙසේ අනුකම්පා කරත්ය යන අර්ථයි. **භද්‍රානි පස්සති** යහපත් දේ දකියි. **උළුම්පං** පරතෙරට යාම පිණිස ලීකඳන් හාරා කරන ලද **කුලලං** වැල් ආදියෙන් බැඳ කරන ලද යෙ **තරන්ති අණ්ණවං** ගාථාවගේ **අණ්ණවං** මේ මුළු පරිච්ඡේදයෙන්ම යොදුනක් පමණ ගැඹුරු වූ ද පළල් වූ ද ජලය ඇති තැනට මේ ස්ථානාර්ථ වචනයකි. **සරං** මෙහිදී ගංගාව අදහස් කරන ලදී. මෙය කියා ඇත. යමෙක් ගැඹුරු පළල් තණ්හා නමැති විල තරණය කරත් ද ඔව්හු ආර්ය මාර්ග සංඛ්‍යාත වූ පාලම සාදා **විසජ්ජ පල්ලලානි** ස්පර්ශ නොකොට, ජලය පිරුණු පහත්

තැන්. මේ වනාහි මේ අප්‍රමාණ වූ ජලකඳ තරණය කරන්නට කැමැති වන්නේද,

**කුලලංහි ජනො පබන්‍ධති - බුද්‍ධා ච බුද්‍ධසාවකා ච**
**විනායෙව කුලෙලන තිණ්ණා - මෙධාවිනො ජනා**

ජලය, පහුරක් සාදයි. බුදුවරු ද බුද්ධශ්‍රාවකයෝ ද ඥාණවන්තයෝද පහුරක් නැතිව එතර වූහ.

**පළමු බණවර වර්ණනාව නිමියේ ය.**

**කොටිගාමො** මහාපනාද රජුගේ ප්‍රාසාදය කෙළවර කරන ලද ගම, **අරිය සච්චාන** ආර්යභාවය ඇතිකරන සත්‍යයන්ගේ **අනනුබොධා** නොවැටහීමෙන්. **අප්පටිවෙධා** අවබෝධ කර නොගැනීමෙන්. **සන්‍ධාවිතං** භවයෙන් භවයට යාම් වශයෙන් හැසිරෙන ලද **මමං චෙව තුම්හාකංච** මා විසින් ද නුඹලා විසින් ද නැත්නම් **සන්‍ධාවිතං සංසරිතං** හැසිරීම, සංචාරය මට ද නුඹලාට ද වූයේ යැයි මෙසේ මෙහි අර්ථ දතයුත්තේය. **භවනෙත්ති සමූහතා** භවයෙන් භවයට ගෙනයාමට හැකි තෘෂ්ණාව නමැති ලනුව මනාව නසන ලද, සිඳින ලද නොපවත්නා ලෙස කළ.

**නාදිකා** එක් විලක් උදෙසා - සුළු පියා හා මහ පියා යන දෙදෙනාගේ දරුවන්ගේ ගම් දෙකක්. **නාදිකෙ** යි එක් ඥාති ගමක. **ගිඤ්ජකා වසථෙ** ගඩොලින් කළ නිවාසයේ. **ඕරම්භාගියානං** යට කොටස අයත් වූවන්ගේ කාම භවයෙහිම පිළිසිඳ ගන්නවුන්ගේ යන අර්ථයි. ඔරං යනු ලබන ලද නමින් හෝ තුන් මගින් ප්‍රහාණය කළ යුතු නිසාත් ඔරම්භාගිය නම් වේ. එහි කාමච්ඡන්දය, ව්‍යාපාදය යන මේ දෙක සමාපත්තියෙන් හෝ යටපත් කරන ලද්දේ ද මාර්ගයෙන් හෝ මුළිනුපුටා නොදැමූ බැවින් උත්පත්ති වශයෙන් උඩ කොටසේ හෝ රූප භවයට හෝ අරූප භවයට යන්නට ඉඩ නොදෙත්. සක්කායදිට්ඨි ආදී තුන එහි උපන්නහුද ගෙනවුත් නැවත මෙහිම උපදවත් යන ලෙස සියල්ලම ඔරම්භාගිය නම් වේ. **අනාවත්ති ධම්මා** ප්‍රතිසන්ධි වශයෙන් නැවත නොඑන ස්වභාව ඇති. **රාග දෝස මොහානං තනුත්තා** මෙහි කවදා හෝ උත්පත්තියෙන් ද නැඟීසිටීමේ මන්දභාවය නිසාද යන

දෙයාකාරයෙන් කෘශ බව දතයුතුයි. සකෘදාගාමියාට වනාහි පෘථග්ජනයාට මෙන් නිතර රාගාදිය හටනොගනී. කොහේ හෝ කවදා හෝ උපදනේද, උපදින්නාහු පෘථග්ජනයන්ගේ මෙන් ඝන ඝනව නූපදිත්. මාලුදැල මෙන් තුනීව උපදිත්. දීඝභාණක ත්‍රිපිටක මහාසීව තෙරුන්වහන්සේ වනාහි මෙසේ කීය.

යම්හෙයකින් සකෘදාගාමී පුද්ගලයාට දූදරුවෝ සිටිත්. අන්තඃපුරද වේ. ඒ නිසා කෙලෙස් සහිතය. මේ වනාහි භවතනුක (භවයෙහි තුනී) වශයෙන් කියන ලදී. එය අටුවාකථාවේ සෝවාන් පුද්ගලයාට භව සතක් හැර අටවන භවයෙහි භවතනුක (භවය තුනීවීම) බවක් නැත. සකෘදාගාමියා හට භව දෙකක් හැර භවයන් පසක භවතනුක බව නැත. අනාගාමියාට රූප අරූප භව හැර කාමභවයෙහි භවතනුක බවක් නැත. රහතන් වහන්සේට කිසිම භවයක භව තනුක බවක් නැතැයි කියන ලද බැවින් ප්‍රතික්ෂේප වෙයි. **ඉමං ලොකං** මේ කාමාවචර ලෝකය ගැන කියන ලදී. මේ මෙහි බලාපොරොත්තුවයි. ඉදින් වනාහි මනුෂ්‍යයන් අතර සකෘදාගාමී ඵලයට පත් තැනැත්තා දෙවියන් අතර ඉපිද රහත්බව සාක්ෂාත් කරගනී. මෙයද කුසලයකි. නොහැක්කා වනාහි අනිවාර්යයෙන් මනුෂ්‍ය ලෝකයට අවුත් අවබෝධ කරගනී. දෙවියන් අතර සකෘදාගාමී ඵලයට පත්වූයේද ඉදින් මිනිසුන් අතර ඉපිද රහත්බව සඵල කරගනී. මෙයද කුසලයකි. නොහැකි වන්නා වනාහි අනිවාර්යයෙන් දෙව්ලොව ගොස් අවබෝධ කරගනී. **අවිනිපාත ධම්මො** මෙහි විනිපතනං නපුරු ලෙස වැටීම, මොහුට වැටීමේ ස්වභාවයක් නැත්තේනුයි අවිනිපාත ධම්ම නම් වේ. සතර අපායෙහි නොවැටෙන ස්වභාව ඇති යන අර්ථයි. **නියතො** යනු ධර්ම නියමයෙන් ස්ථිර වූ **සම්බොධිපරායණො,** මත්තේ මාර්ගත්‍රය සංඛ්‍යාත වූ සම්බෝධි නම් වූ උතුම් මාර්ගය මොහුගේ ගමනට අවශ්‍ය පිළිසරණ බවට පත්විය යනුයි. සම්බොධිපරායණ නම් වේ. **විහෙසා වෙසා** ඔවුනොවුන්ගේ ගති, උත්පත්ති හා පරලෝකය පිළිබඳව දක්නා නුවණ බලන්නා වූ ආනන්දය, මේ තථාගතයන් වහන්සේගේ කයෙහි වෙහෙසකි. බුදුවරයන් වහන්සේලාට සිතෙහි වෙහෙසක් නැත. **ධම්මාදාසං** ධර්මමය වූ කැඩපත. **යෙන** යනු යම් ධර්ම නමැති කැඩපතින් යුක්ත වූ. **ඛීණාපාය දුග්ගති විනිපාතො** මෙයද නිරය ආදියට ම සමානාර්ථ වශයෙන් කියන ලදී. නිරය ආදිය වනාහි අභිවෘද්ධි සංඛ්‍යාත අය වශයෙන් තොර වූ බැවින් අපාය නම් වේ. දුකට පත්වීම පිළිසරණ වන්නේනුයි දුග්ගති නම්

වේ. පච්කළ අය මෙහි වැටෙත්නුයි විනිපාත නම් වේ. **අවෙච්චප්පසාදෙන** බුදුගුණ ඇති පරිදි දත් බැවින් නොසෙල්වෙන නිර්වාණ ප්‍රසාදයෙන්.

මතු පද දෙකෙහි ද මේ ක්‍රමයමය. **ඉතිපි සො භගවා** ආදීන්ගේ විස්තර විශුද්ධි මාර්ගයෙහි කියන ලදී. **අරියකන්තෙහි** ආර්යයන්ට ප්‍රිය වූ, මනාප වූ, පංචසීලයෝ වනාහි ආර්ය ශ්‍රාවකයන්ට ප්‍රියමනාප වෙත්. භවාන්තරයේද අත්නොහළ යුතු බැවිනි. ඒ සඳහා මෙය කියන ලදී. මෙහි වනාහි සියල්ල සංවරය ලබයි. **සොතාපන්නො හමස්මි.** මේ දේශනාවගේ ශීර්ෂයයි. සකෘදාගාමී ආදීහු වනාහි මම සකෘදාගාමී වන්නෙමියි ආදී ක්‍රමයෙන් විස්තර කරත්. සියල්ලන්ටම ශික්ෂා පද විරෝධයෙන් සුදුසු තැන විවරණය අනුදැන ඇත.

**වෙසාලියං විහරති** මෙහි එසමයෙහි වේසාලිය සමෘද්ධිමත්‍ය. සම්පත් සහිතය' යනාදියෙන් ඛන්ධකයෙහි කියූ ආකාරයෙන් වේසාලිය සම්පත්වලින් පිරිපුන් බව දතයුතුයි. **අම්බපාලිවනෙ** අම්බපාලි ගණිකාවගේ උද්‍යානය වූ අඹවනයෙහි - **සතො භික්ඛවෙ** භාග්‍යවතුන් වහන්සේ අම්බපාලිය දැක්මෙහි සිහිය පිහිටුවීම පිණිස විශේෂයෙන් මෙහිදී සතිපට්ඨාන දේශනාව පටන් ගත්තේය. එහි සිහිකෙරේනුයි **සතො** නම් වේ දන්නේනුයි **සම්පජානො** සිහියෙන් ද විමසා බැලීමේ නුවණින් ද යුක්ත වූයේ වී වාසය කරන්නේ යන අර්ථයි. **කායෙ කායානුපස්සී** ආදියෙහි යමක් කිවයුතු ද එය මහා සතිපට්ඨානයෙහි කියමු. **නීලා** යන මෙයට සියල්ල අඩංගුය. **නීල වණ්ණා** යනු එහිම විස්තර දැක්වීමෙන්, එහි ඔවුන්ගේ ප්‍රකෘති වර්ණය නිල්ය. නිල්පාට ආලේපන තැවරීම නිසා මෙය කියන ලදී. **නීලවත්ථා** ඔවුන්ගේ පාට, දුහුල්, කසී සළු ආදිය නිල්පාටම වේ. **නීලා ලංකාර** නිල්මිණිවලින්, නිල් පුෂ්පවලින් අලංකාර කරන ලද ඔවුන්ගේ රථයෝ ද නිල්මිණි ඔබ්බන ලද නිල් වස්ත්‍රවලින් ආවරණය කරන ලද නිල්පාට ධජයන්ගෙන් යුක්ත නිල්පාට යුද ඇඳුමෙන් සැරසුනා වූ නිල් ආභරණවලින් නිල් අශ්වයන්ගෙන් යුක්ත කෙවිටි ද නිල්පාටමය. මේ ආකාරයෙන් සියළු පදයන්හි අර්ථ දතයුතුයි. **පතිවට්ටෙසි** පහර දුන්නේය. **කිං ජෙ අම්බපාලි** මෙහි 'ජෙ' යනු ආලපනයි. එම්බා අම්බපාලිය, කුමන කරුණක් නිසාදැයි කියන ලදී. **කිංචෙතපි** කියාද පාඨයක් ඇත. මේ අර්ථයමය. **සාහාරං** ජනපදය සමග **අංගුලිං පොඨෙසුං** ඇඟිල්ල සෙලවූහ. **අම්බකායා** යනු ස්ත්‍රී ශරීරයෙන් **යෙසං** යනු කරණාර්ථයේ සාමි වචනයි. යම් අධිෂ්ඨානයකින් කියන ලදී. **ඔලොකෙථ** බලව්.

අවලොකෙථ නැවත නැවතත් බලව්. උපසංහරථ මේ ලිච්ඡවී පිරිස ඉදිරිපත් කරව්. නුඹගේ සිතින් තව්තිසා පිරිස ඉදිරිපත් කරන්න අලවවව්. යම්සේ වනාහි තව්තිසා දෙව්වරු සිත්කළුය. ප්‍රසන්නය. නිල් ආදී විවිධ වර්ණයන්ගෙන් යුක්තය. එපරිද්දෙන් මේ ලිච්ඡවි රජදරුවෝ ද තව්තිසා දෙවියන් හා සමකොට බලව් යන අර්ථයි. කුමක් නිසා වනාහි භාග්‍යවතුන් වහන්සේ නොයෙක් සියගණන් සූත්‍රවලින් චක්‍ෂු ආදී රූපයන්හි නිමිති ගැනීම වළක්වා මෙහි මහත් උත්සාහයෙන් නිමිති ගැනීමෙහි යොදන්නේද? හිතවත්කම නිසාය. එහිදී වනාහි ඇතැම් භික්‍ෂූහු රැස්වූ වීර්යයෙන් ඔවුන්ගේ සම්පතෙන් පොළඹවන ලබන්නාහු අප්‍රමාදීව ශ්‍රමණ ධර්මය කරන්නවුන්ගේ මෙබඳු වූ ඓශ්වර්ය සම්පත්තියක් සුලභය යනුවෙන් ශ්‍රමණ ධර්මයෙහි උත්සාහය වර්ධනය කිරීම සඳහා කීය. අනිත්‍ය ලක්‍ෂණය පැහැදිලි කිරීම සඳහා ද මෙසේ කීය. නොබෝ කලකින්ම වනාහි මේ සියලු දෙනාම නුපන් සතුරාට යටත් වීමෙන් විනාශයට පත්වෙත්. ඉක්බිති ඔවුන්ගේ රාජ්‍යශ්‍රී සම්පත්තිය දැක සිටියා වූ භික්‍ෂුව එබඳු ආකාර වූ ශ්‍රී සම්පත්තියේද විනාශය පෙනෙන්නේ යැයි අනිත්‍ය ලක්‍ෂණය වඩා සිව්පිළිසිඹියා සමග රහත්බවට පැමිණෙන්නාහ යි අනිත්‍යතා ලක්‍ෂණයද පැහැදිලි කිරීම සඳහා කියන ලදී. අධිවාසෙතු යනු අම්බපාලිය ආරාධනා කළබව දැනගෙන ද කුමක් නිසා ආරාධනා කරත්ද? විශ්වාස නොකරන නිසාත් චාරිත්‍රයක් නිසාත්ය. ඇය ධූර්ත ස්ත්‍රියකි. ආරාධනා නොකරත්. ඇය ආරාධනා කළේයැයි කියන්නේය යන අදහස ඔවුන්ට විය. බණ අසා යන කල්හිද ආරාධනාකොට යාම වනාහි මිනිසුන්ගේ සිරිතයි.

බෙළුව ගාමකො විශාලා නුවරට සමීප ගමකි. යථාමිත්තං ආදියෙහි මිතුරු. පසමිතුරු. සන්දිට්ඨා ඒ ඒ තැන්වල හමුවී දැකීම් මාත්‍රයක් ඇත්තාහු අතිශයින් දැඩි මිතුරෝ නොවෙත්. යම් යම් තැන්වල මෙබඳු වූ භික්‍ෂුවක් සිටීද ඔවුනොවුන් ඒ ඒ තැන්වල වස් එළඹිය යුතුය යන අර්ථයි. කුමක් නිසා මෙසේ කීවේද? ඔවුන්ගේ සුවපහසුව සඳහාය. ඔවුන්ට වනාහි බෙළුව ගමෙහි සෙනසුන ප්‍රමාණවත් නොවෙයි. භික්‍ෂාවද හිඟය. විශාලා නුවර හාත්පස බොහෝ සෙනසුන් ඇත. භික්‍ෂාවද සුලභය. ඒ නිසා මෙසේ කීය. ඉක්බිති කුමක් නිසා සුවසේ යන්නය කියා පිටත්කර නොහැරියේ ද ඔවුන්ට අනුකම්පා පිණිසය. ඔහුට මෙසේ සිතින. මම මාස දහයක් පමණ සිට පිරිනිවන් පාන්නෙමි. ඉදින් මොවුන් දුරබැහැරකට යන්නේද පිරිනිවන්පානා කාලයෙහි මා දැකීමට නොහැකි වේ. ඉදින් බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පාන්නේ අපට යම්තමින් සිහිපත්

කිරීමක්වත් කළේ නැත. ඉදින් දන්නෙමු නම් මෙසේ දුරබැහැර වාසය නොකරන්නෙමුයි කළකිරීමක් ඇතිවන්නේය.

විශාලා නුවර හාත්පස සිටින්නෝ වනාහි මාසයකට අටවරක් පැමිණ බණ අසන්නාහ. බුදුරජාණන් වහන්සේගේ අවවාද ලබන්නාහු යයි පිටත්කර හැරියේ නැත.

ඛරො යනු එරුස, ආබාධො විෂම වූ රෝග. **බාළ්හා** බලවත්, **මාරණන්තිකා** මරණය සමීපයට පැමිණවීමට සමර්ථ. **සතො සම්පජානො අධිවාසෙසි** සිහිය මනාව පිහිටුවා ඥානයෙන් පිරිසිඳ ඉවසීය. **අවිහඤ්ඤමානො** වේදනාවට අවනතවීම් වශයෙන් එකිනෙක පරිවර්තනය නොකොට පීඩාවට පත් නොකර, දුක් නොවී ඉවසීය. **අනාමන්තෙත්වා** යනු නොකැඳවා, **අනපලොකෙත්වා** නොදන්වා අවවාද අනුශාසනා නොදී යයි කියන ලදී. **විරියෙන** පූර්වභාග වීර්යයෙන්ද ඵලසමාපත්ති වීර්යයෙන් ද **පටිපණාමෙත්වා** දුරුකොට. **ජීවිත සංඛාරං** මෙහි ජීවිතයද ජීවිත සංඛාරයයි. යමකින් ජීවිතය සකස් කෙරේද, සිඳෙන දෙය ගලපා තබයිද ඒ ඵලසමාපත්ති ධර්මයත් ජීවිත සංඛාර නම් වේ. මෙහිදී එය අදහස් කෙරේ. **අධිට්ඨාය** යනු ඉහළින් සිට පවත්වා, ජීවිතය පවත්වා ගැනීමට සමර්ථ ඵලසමාපත්තියකට සමවදින්නේය යනු මෙහි කෙටි අර්ථයි. කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ මෙයින් පෙර ඵලසමාපත්තියට සමවදින්නේ නැද්ද? සමවදියි. එය වනාහි ක්‍ෂණික සමාපත්තියයි. ක්‍ෂණික සමාපත්තියද අභ්‍යන්තර සමාපත්තියක්මය. වේදනාව පහකරයි. සමාපත්තියෙන් නැඟී සිටියහුගේ වනාහි ලීදඬු වැටීමෙන් හෝ කැබිලිති වැටීමෙන් හෝ සිඳීගිය දියසෙවෙල් ඇති ජලය මෙන් නැවත ශරීර වේදනාව වසාගෙන පැතිරේ. යම් ඒ වනාහි රූප සත්තකද අරූප සත්තකයද අවුල් නැති ගැටළු නැතිකොට මහා විදර්ශනා වශයෙන් සමවත් සමාපත්තිය වනාහි, එය මනාව ඉවත්කර දමයි. යම්සේ වනාහි පුරුෂයකු විසින් පොකුණට බැස අත්වලින් ද පාවලින් ද මනාව ඉවත්කරන ලද දියසෙවෙල් නොබෝ වේලාවකින් ජලය වසාගෙන පැතිරේ. එපරිද්දෙන් එයින් නැගිටියහුට බොහෝ කලකින් වේදනාව හටගනී.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒ දවස මහා බෝ මැඩ අලුත් විදර්ශනාවක් පිහිටුවන්නාක් මෙන් රූප සත්තකයත් අරූප සත්තකයත්

අවුල් නැති ගැටළු නැතිකොට සතළොස් ආකාරයකින් එකට හනා මහා විදර්ශනාවෙන් වේදනාව ඉවත්කර දසමාසයක් නූපදීවායි සමාපත්තියට සමවැදුනේය. සමාපත්තියෙන් පහ වූ වේදනාව මාස දහයක් උපන්නේ නැත.

**ගිලානා වුට්ඨිතො** ගිලන්ව නැවත එයින් නැගී සිටියේ **මධුරකජාතො** විය හටගත් බර බව, හටගත් තද බව, උලෙහි හිඳුවන ලද්දකු මෙනි. **න පක්ඛායන්ති** ප්‍රකාශ නොකරත්. නොයෙක් හේතූන් නිසා නොඑළඹෙත්. **ධම්මාපි මං නප්පටිභන්ති** සතිපට්ඨාන ධර්මයෝ වනාහි මට පැහැදිලි නොවෙත්යැයි දක්වයි. බුද්ධ වචනය වනාහි තෙරුන්ට මනාව ප්‍රගුණය. **උදාහරති** යනු අවසාන අවවාදය නොදෙයි යන්න ගැන කියයි. **අනන්තරං අබාහිරං** ධර්ම වශයෙන් හෝ පුද්ගලයන් වශයෙන් යන දෙකම නොකොට මෙතෙක් ධර්මය අනුන්ට දේශනා නොකරන්නෙමියි සිතන්නේ ධර්මය අන්තර, අභ්‍යන්තර කිරීම නම් වේ. මේ පුද්ගලයාට දේශනා කරන්නෙමියි සිතන්නේ වනාහි පුද්ගලයා අභ්‍යන්තර කිරීම නම් වේ. මොහුට දේශනා නොකරන්නෙමියි සිතන්නේ පුද්ගලයා බාහිර කිරීම නම් වේ. මෙසේ නොකොට දේශනා කරන ලද්දේය යන අර්ථයි. **ආචරියමුට්ඨි** යනු යම්සේ පිටස්තර අයට ආචරියමුට්ඨි නම් වේ. තරුණ කාලයේ කිසිවකුටත් නොකියා පසුකාලයේ මරණාසන්නව සිටින්නෝ ප්‍රියමනාප වූ අතවැසියකුට කියත්. මෙසේ තථාගතයන් වහන්සේගේ, මෙය මහලු කාලයේ, පසු කාලයේ කියන්නෙමියි සඟවා තබාගත් කිසිවක් නැතැයි දක්වයි. **අහං භික්ඛුසංඝං** මම ම භික්ෂු සංඝයාව පරිහරණය කරන්නෙමි කියා හෝ, **මමුද්දෙසිකො** යනු මම උදෙසිය යුතු තැන, කියාදෙන්නා වන්නේය. නියම කරන්නා වන්නේය. භික්ෂු සංඝයා මා පමණක්ම උදෙසා මා පමණක්ම බලාපොරොත්තු වෙමින් පවතිත්වා. මගෙන් පසුව හෝ නොවේවා. යමක් හෝ එය හෝ වේවායි මෙසේ හෝ මොහුට වේවා යන අර්ථයි. **න එවං හොති** (මෙසේ නොවෙයි.) බෝමැඩදීම ඊර්ෂ්‍යාව හා මාත්සර්ය නැතිකළ බැවින් මෙසේ නොවෙයි. **සකිං** යනු හෙතෙම කුමක් නිසා **ආසීතිකො** අසූවයස් ඇත්තේ මේ අවසාන වයස් සීමාවට පැමිණි බව දැන්වීමට කියන ලදී.

**වෙඛමිස්සකෙන** රෝද බැඳීම ආදී නොයෙක් ප්‍රතිසංස්කරණවලින් යුක්තව. **මඤ්ඤෙ** යනු නොයෙක් ප්‍රතිසංස්කරණවලින් යුත් දිරාගිය

කරත්තයක් මෙන් යයි සිතමි. රහත්ඵල නමැති ප්‍රතිසංස්කරණවලින් යුත් සිව් ඉරියව් පැවැත්ම භාග්‍යවතුන් වහන්සේම වන්නේ යැයි දක්වයි. දැන් ඒ කාරණය ප්‍රකාශ කරමින් 'යසමිං ආනන්ද සමයෙ (ආනන්දය! යම්කලෙකදී) ආදිය කීය. එහි **සබ්බ නිමිත්තානං** රූප නිමිති ආදිය. **එකච්චානං වේදනානං** ලෞකික වේදනාවන්ගේ. **තස්මාතිහ ආනන්ද** යම් හෙයකින් මේ ඵලසමාපත්ති වාසයෙන් අපහසුතාවයක් නොවෙයි. ඒ නිසා නුඹලාද ඒ සඳහා මෙසේ වාසය කරව්යැයි දක්වයි. **අත්තදීපා** මහා සමුද්‍රය මැද දිවයිනක් මෙන් තමාව දීපයක්, පිහිටක් කොට වාසය කරව්. **අත්තසරණා** තමාම පිහිට කරගත්හ. අනුන් පිහිට කර නොගන්න. ධම්මදීප - ධම්මසරණ යන පදවලදී ද මේ ක්‍රමයමයි. **තමතග්ගෙ** ඔහුව උසස් තැන්හි - මැද 'ත' කාරය පද සන්ධි කිරීම සඳහා කියන ලදී. මෙය කියා ඇත. මොව්හු අග්‍රතමයෝය. අග්ගතම යන තන්හි 'තම' යෙදීම සිඳ දමා ආනන්දය! ඔව්හු අතිශයින් අග්‍ර ස්ථානයෙහි, උත්තම වූ ස්ථානයෙහි සිටිත්. ඔවුන්ගේ අතිශයින්ම අග්‍ර ස්ථානයෙහි වන්නාහ. යම් ඒ ශික්ෂාකාමීහු වෙත්ද ඒ සියල්ලන් අතර සතර සතිපට්ඨානයට නැඹුරු වූ භික්ෂුව අග්‍ර වන්නේය. රහත්බව කුළුගැන්වීමෙන් දේශනාව සංග්‍රහ කෙරේ.

## දෙවන බණවර වර්ණනාව නිමියේ ය.

**වෙසාලියං පිණ්ඩාය පාවිසි** යනු කවදා පිවිසියේ ද? උතු වේලාවෙන් නික්ම විශාලාවට ගිය කල්හි, භාග්‍යවතුන් වහන්සේ වනාහි වසන ලද වස් ඇත්තේ බේළුව ගමින් නික්ම සැවැත්නුවරට යන්නෙමියි පැමිණි මගින්ම ආපසු හැරී පිළිවෙලින් සැවැත්නුවරට පැමිණ දෙව්රම් වෙහෙරට වැඩි සේක. ධර්මසේනාපතීන් වහන්සේ වනාහි භාග්‍යවතුන් වහන්සේට වත් දක්වා දිවා විහාරස්ථානයට ගියේ එහි අතවැසි භික්ෂූන් වත් දක්වා නික්මගිය කල්හි දිවා විහාරය ඇමද සම්කඩ අතුරා පා සෝදා පළඟක් බැඳ ඵලසමාපත්තියට පිවිසියේය. ඉක්බිති අනුපිළිවෙලින් එයින් නැගීසිටියහුට මෙසේ සිතින. පළමුවෙන් පිරිනිවන්පාන්නේ අග්‍රශ්‍රාවකයන් වහන්සේලාද? බුදුරජාණන් වහන්සේද ඉක්බිති අග්‍රශ්‍රාවකයන් වහන්සේලා පළමුවයැයි දැන තමාගේ ආයු සංස්කාරය බැලීය. හෙතෙම දින සතකින් තමාගේ ආයු සංස්කාරය වන්නේ යැයි දැන කවර ස්ථානයක පිරිනිවන් පාන්නෙම්දැයි බැලීය. ඉක්බිති රාහුල තෙරුන් වහන්සේ තව්තිසාවේ පිරිනිවන්පෑවේය. **අඤ්ඤාකොණ්ඩඤ්ඤ** තෙරුන්වහන්සේ ඡද්දන්ත විලේ

පිරිනිවන් පෑවේය. මම කොහේ පිරිනිවන් පාන්නෙම්දැයි නැවත සිතන්නේ මව අරමුණුකොට සිහිය පිහිටුවාලීය. මගේ මව රහතන් වහන්සේලා හත්නමකගේ මවය. නමුත් තෙරුවන් කෙරෙහි අප්‍රසන්නය. ඇයට හේතුවාසනාවක් ඇත්තේද නැද්ද කියා ආවර්ජනා කර බලා සෝවාන් මාර්ගයට වාසනාව ඇති බව දැන කවරකුගේ දේශනාවක් එයට හේතුවන්නේදැයි බලන්නේ අන් කෙනෙකුගේ නොව මගේම දේශනාවක් හේතු වන්නේ යැයි දැනගත්තේය. ඉදින් මම පසුබට වන්නෙම් නම් ජනයා මෙසේ කියන්නාහ. සැරියුත් තෙරුන් වහන්සේ අන් මහජනයාට උපකාරී වෙයි. යම්සේ වනාහි උන්වහන්සේගේ සමචිත්ත සූත්‍රාන්ත දේශනා දවසේ දී කෝටි ශත සහශ්‍රයක් දෙවිවරු රහත්බව ලැබූහ. තෙමගෙහි පිහිටි දෙවිවරුන්ගේ සංඛ්‍යාවක් නැත. වෙනත් තැන්වලදීද අනේකවූ අවබෝධ වූවන් දක්නට ලැබේ. තෙරුන් වහන්සේ කෙරෙහි සිත් පහදවා පවුල් අසූදහසක් දෙව්ලොව උපන්හ. දැන් උන්වහන්සේ තම මවගේ මිථ්‍යාදෘෂ්ටිය අත්හරවන්නාට නොහැකි විය. ඒ නිසා මවව මිථ්‍යාදෘෂ්ටියෙන් මුදවා උපන් කාමරයේම පිරිනිවන් පාන්නෙමියි තීරණය කරගෙන අදම භාග්‍යවතුන් වහන්සේගේ අනුමතිය ලබාගෙන නික්ම යන්නෙමියි චුන්ද තෙරුන් ඇමතීය. ඇවැත්නි, චුන්ද! ධර්මසේනාපතීන් වහන්සේ නාලක ගමට වඩිනු කැමැත්තේය. ඇවැත්නි! පාත්‍රා සිවුරු ගන්න යැයි අපගේ පන්සියයක් භික්ෂූන්ට දන්වන්න යැයි පැවසීය. තෙරුන් වහන්සේ එසේ කළේය. ඒ භික්ෂූහු සෙනසුන සකස්කොට දිවා විහරණය කරන ස්ථානය ඇමද එහි දොරටුවේ සිට දිවා විහාර ස්ථානය දෙස බලා මේ මාගේ අවසන් දැක්මයි. නැවත ඒමක් නැත කියා පන්සියයක් භික්ෂූන් පිරිවරා භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණ වැඳ භාග්‍යවතුන් වහන්සේට මෙසේ ප්‍රකාශ කළ සේක.

ඡින්නොදානි භවිස්සාමි ලොකනාථ මහාමුනි
ගමනාගමනං නත්ථි පච්ඡිමා වන්දනා අයං

ජීවිතං අප්පකං මය්හං ඉතො සත්තා හමච්චයෙ
නික්ඛි පෙය්‍යාමහං දෙහං භාරවොරොපනං යථා

අනුජානාතු මෙ භන්තෙ භගවා අනුජානාතු සුගතො
පරිනිබ්බාණ කාලොමෙ ඔස්සට්ඨො ආයුසංඛාරො

ලෝකයට පිහිට වූ මහා මුනීන්ද්‍රයන් වහන්ස! මම දැන් ජරාවට පත්වූයේ වෙමි. නැවත යාමක් ඊමක් නැත. මේ මාගේ අවසාන වන්දනාවයි.

මාගේ ජීවිතය ඉතා කෙටිය. මෙයින් දින සතක් ගතවූ තැන මම දේහය අත්හරිමි. යම්සේ බරක් බිම තබන්නාක් මෙනි.

භාග්‍යවතුන් වහන්ස! සුගතයන් වහන්ස, මට අවසර දෙන සේක්වා. මේ මාගේ පිරිනිවන්පානා කාලයයි. ආයු සංස්කාරය හරින ලදී.

බුදුවරයන් වහන්සේලා වනාහි කුමක් නිසා පිරිනිවන් පාන්නෙහිදැයි ඇසූකල්හි මරණය පිළිබඳව වර්ණනාවක් කළා වන්නේය. පිරිනිවන් පාන්නට එපායැයි කීකල්හි සසරෙහි ගුණ කීමක් වන්නේය. මිථ්‍යාදෘෂ්ටිකයෝ දොස් නොනගත්වායි මේ ප්‍රශ්න දෙකම නොවදාළ සේක. ඒ නිසා සාරිපුත්තය, කොතැන්හි පිරිනිවන් පාන්නෙහි දැයි ඇසූ සේක. ස්වාමීනි! මගධයේ නාලක ගමෙහි උපන්ගෙය ඇත. මම එහි පිරිනිවන් පාන්නෙමියි කීකල්හි, සාරිපුත්‍රය! එසේය. එයට කාලය සුදුසුයැයි වදාළ සේක. දැන් වනාහි දෙවු, කනිටු අන්‍ය භික්ෂූන්ට මෙබඳු භික්ෂූන් වහන්සේ නමක් නැවත දක්නට නොලැබේ. එබැවින් ඔවුන්ට ධර්මයක් දේශනා කරන්නයැයි වදාළහ. ශාස්තෲන් වහන්සේ මගෙන් ඍද්ධි විකුබ්බනය පෙරටු වූ ධර්මදේශනාවක් බලාපොරොත්තු වන්නේ යැයි දැනගෙන භාග්‍යවතුන් වහන්සේට වැඳ තල්ගසක් පමණ උසට අහසට නැගී නැවත බැස භාග්‍යවතුන් වහන්සේට වැඳ තල්ගස් සතක් පමණ උසින් අහසේ සිට ඍද්ධි ප්‍රාතිහාර්ය දක්වා ධර්මදේශනා කළේය. මුළු නගරයේම ජනයා ඒකරාශී වූහ. තෙරුන්වහන්සේ බැස බුදුන් වැඳ ස්වාමීනි! මට යාමට කාලයයි අවසර ඉල්වූහ. භාග්‍යවතුන් වහන්සේ, ධර්මසේනාපතීන් වහන්සේව සුදානම් කරන්නෙමියි ධර්මාසනයෙන් නැගිට ගඳකිළිය දෙසට වැඩමවා මිණිපළගෙහි වැඩසිටියේය. තෙරුන්වහන්සේ තුන්වරක් ප්‍රදක්ෂිණාකොට සිව්තැනක සිට වැඳ භාග්‍යවතුන් වහන්ස, මෙයින් කල්ප ශතසහශ්‍ර අසංඛ්‍යයකට මත්තේ අනෝමදස්සී බුදුන්ගේ පාදමූලයේ වැටී ඔබවහන්සේගේ දැකීම (හමුවීම) ප්‍රාර්ථනා කළෙමි. මාගේ ඒ ප්‍රාර්ථනාව සමෘද්ධ විය. ඔබවහන්සේව දක්නා ලදී. ඒ පළමු දැකීමයි. මේ අවසාන දර්ශනයයි. නැවත ඔබවහන්සේව දකින්නට නොලැබේයයි කියා ඇඟිලි දසය එක්තැන් කර ඇඳිලි බැඳ

පෙනෙන තෙක් ඉදිරිපිටට ගොස් මෙතැන් පටන් ච්‍යුති ප්‍රතිසන්ධි වශයෙන් කිසිම තැනක ගමනාගමනයක් නැතැයි වැඳ පිටත්ව ගියේය. සාගරය අවසන්කොට ඇති මහපොළව කම්පා විය. භාග්‍යවතුන් වහන්සේ පිරිවරාගෙන සිටි භික්ෂූන්ට මෙසේ වදාළ සේක. මහණෙනි, ඔබලාගේ දෙටු සොහොයුරා පසුපස යන්න. භික්ෂූහු දොරටුව තෙක් පසුගමන් කළහ. තෙරුන්වහන්සේ ඔවුන් අමතා ඇවැත්නි! ඔබවහන්සේලා නතරවන්න. අප්‍රමාදී වන්නයැයි නතර කරවා තමන්ගේ පිරිස සමග පිටත්ව ගියේය. මනුෂ්‍යයෝ ආර්යයන් වහන්සේ පසුගමන් වඩිති. නැවත ආපසු නොවඩින්නේයැයි හඬා වැළපෙමින් පසුපස ගමන් කළහ. ඇවැත්නි, ඔබවහන්සේලා අප්‍රමාදී වන්න. සංස්කාරයෝ නම් මෙසේ වන්නාහ යැයි නතර කළහ.

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරුන්වහන්සේ අතරමග සත්දිනක් මනුෂ්‍යයන්ට අනුග්‍රහ දක්වමින් සවස නාලක ගමට වැඩ ගම්දොර නිග්‍රෝධ වෘක්ෂ මූලයෙහි වැඩසිටියේය. ඉක්බිති උපරේවත නම් වූ තෙරුන්ගේ බෑනනු කෙනෙක් ගමින් පිටතට යන්නේ තෙරුන් දැක එළඹ වැඳ සිටියේය. තෙරුන්වහන්සේ ඔහුට මෙසේ පැවසූහ. ඔබගේ මව ගෙදර සිටීද? එසේය ස්වාමීනියි කී කල්හි යන්න. මා මෙහි පැමිණ සිටින බව දන්වන්න. කුමක් නිසා ආවේදැයි ඇසුවහොත් අද වනාහි එක් දවසක් ඇතුල්ගම සිටින්නේය. උපන් කාමරය පිළියෙළ කරන්න. පන්සියයක් භික්ෂූන්ට වැඩසිටින්නට තැන් පිළියෙළ කරන්න යැයි වදාළේය. හෙතෙම ගොස් මැණියනි! මගේ මාමා පැමිණියේයැයි කීය. දැන් කොහිදැයි ඇසූවිට ගමට පිවිසෙන තැනයයි පැවසීය. තනිවද? තවත් කවුරු හෝ සිටිත්ද? පන්සියයක් භික්ෂූහු සිටිති. කුමන කරුණකට වැඩියේද? ඔහු ඒ පුවත සැළ කළේය. මෙපමණ භික්ෂූන්ට වාසය කරන්නට තැන් කෙසේ සූදානම් කරමුද? කුඩා කල පැවිදිව වයස්ගත වී ගිහි වන්නට සිතනවා විය හැකියයි බැමිණිය සිතන්නී උපන් කාමරය සූදානම් කරවා පන්සියයක් භික්ෂූන්ට නතරවන්නට තැන් පිළියෙල කරවා දඬුවැටපහන් ආදිය දල්වා තෙරුන්ට පණිවිඩ යැවුවාය. තෙරුන්වහන්සේ භික්ෂූන් සමග ප්‍රාසාදයට නැගී උපන් කාමරයට ගොස් වැඩසිටියේය. එසේ වැඩසිට ඔබවහන්සේලාගේ වාසස්ථානවලට වඩින්නයැයි භික්ෂූන් පිටත්කර හැරියේය. ඔවුන් ඉවත්ව ගිය මොහොතේම තෙරුන්වහන්සේට ඉතා දරුණු ආබාධයක් හටගත්තේය. ලෝහිත පක්ඛන්දී නම් වූ ලේ වැගිරෙන මාරාන්තික වේදනාවක් හටගත්තේය. එක් භාජනයක් ඇතුළට ගන්නා

විට එකක් පිටතට ගනී. මාගේ පුත්‍රයාගේ තත්ත්වය මට දරාගත නොහැකැයි කියා තමන්ගේ කාමරයට වී සිටියාය. සතරවරම් දෙවිවරු ධර්මසේනාපතීන් වහන්සේ කොහි වසන්නේදැයි බලන්නේ නාලක ගමෙහි උපන්ගෙයි පිරිනිවන් මංචකයෙහි වැඩසිටින බව දැන අවසන් දැක්ම සඳහා යන්නෙමුයි අවුත් වැඳ සිටියාහ. තෙරුන් වහන්සේ තුඹලා කවරහුදැයි ඇසූවිට ස්වාමීනි! මහරජවරුය. කුමක් නිසා ආවාහුද? ගිලානෝපස්ථානයට පැමිණියෙමුයි කීවිට, එසේය. ගිලානෝපස්ථානය සඳහා කෙනෙක් සිටී. තොප යන්නයැයි පිටත් කළේය. ඔවුන් ගියවිට ඒ ක්‍රමයෙන්ම ශක්‍ර දේවේන්ද්‍රයාත්, ඔවුන් ගිය කල්හි සුයාම ආදී මහා බ්‍රහ්මයෝත් පැමිණියාහ. තෙරුන්වහන්සේ ඔවුන්වද එසේම පිටත්කර හැරියේය.

බැමිණිය දෙවියන්ගේ පැමිණීම හා පිටත්ව යාම දැක, මාගේ පුත්‍රයාට වැඳ වැඳ යන්නා වූ මොවුන් කවුරුන්දැයි සිතන්නී තෙරුන් වැඩසිටින කාමරය ලඟට ගොස් දරුව! චුන්ද, දැන් තත්ත්වය කෙසේදැයි ඇසුවාය. හෙතෙම ඒ පුවත දන්වා ස්වාමීනි! මහෝපාසිකාව පැමිණියේ යැයි දැන්වීය. කුමක් නිසා අවේලාවේ පැමිණියේදැයි තෙරුන්වහන්සේ විචාළේය. ඕ තොමෝ මා ඔබගේ මව ඔබව දකින්නට ආවෙමියි කියා දරුව, පැමිණියේ කවුරුන්දැයි පළමුව විචාළාය. උපාසිකාවෙනි, සිව්වරම් රජදරුවෝය. දරුවෝ තුඹ සතරවරම් රජදරුවන්ට වඩා උසස්ය. උපාසිකාවෙනි, මොව්හු ආරාමිකයන් හා සමානය. අපගේ ශාස්තෲන් වහන්සේ පිළිසිඳගත් තැන් පටන් කඩුගත් අත් ඇතිව ආරක්ෂා කළහ. දරුව, ඔවුන් ගියාට පසුව පැමිණියේ කවුද? ශක්‍ර දේවේන්ද්‍රයාය. දරුව, තුඹ දෙවියන්ගේ රජුට වඩා උසස්ය. උපාසිකාවෙනි, මොහු බඩුබාහිරාදිය ගන්නා සාමණේර නමක් බඳුය. අපගේ ශාස්තෲන් වහන්සේ තව්තිසාවෙන් බස්නා කල්හි පාත්‍රා සිවුරු ගෙන බැස්සේය. දරුව, ඔහු පැමිණ ගියාට පසුව දිළියෙමින් පැමිණියේ කවරෙක්ද? උපාසිකාවනි, මොහු ඔබගේ භාග්‍යවතුන් වහන්සේ ද ශාස්තෲන් වහන්සේ ද වන මහා බ්‍රහ්මයාය. දරුව, තුඹ මාගේ භාග්‍යවතුන් වහන්සේ වන මහා බ්‍රහ්මයාට වඩා ඔබ උතුම්ය. එසේ උපාසිකාවනි, මොහු වනාහි කවරෙක් ද? අපගේ ශාස්තෲන් වහන්සේ උපන් දිනයේ මහා බ්‍රහ්මයෝ සතරදෙනෙක් මහා පුරුෂයාණන්ව රන්දැළකින් පිළිගත්හ. ඉක්බිති බැමිණියගේ පුත්‍රයාගේ මේ අනුභාවය මෙසේ නම් මාගේ පුත්‍රයාගේ භාග්‍යවත් ශාස්තෲන් වහන්සේගේ අනුභාවය කෙබඳු වන්නේදැයි සිතනවාත් සමගම පස්වනක් ප්‍රීතිය ඉපිද මුළු ශරීරය

පුරා පැතිරී ගියේය. මාගේ මවට ප්‍රීති සෝමනස්සයක් ඇතිවී යයි තෙරුන් වහන්සේ, දැන් ධර්මදේශනාවට සුදුසු කාල යැයි සිතා, මහෝපාසිකාවෙනි! කුමක් සිතුවේදැයි ඇසීය. මේ මාගේ පුත්‍රයාගේ ගුණය. මොහුගේ ශාස්තෘන් වහන්සේගේ කෙබඳු ගුණයක් තිබිය හැකිද? කියා දරුව මම සිතුවෙමි.

මාගේ ශාස්තෘන් වහන්සේ උපන් මොහොතේත් මහාභිනිෂ්ක්‍රමණයේදීත් සම්බෝධියට පත් අවස්ථාවේදීත් දම්සක් පැවතුම් වේලාවේත් දසසහශ්‍රී ලෝකධාතුව කම්පා විය. සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්තිඥාණ දර්ශනය යන මේවායෙන් සමානයෙක් නම් නැත. ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි මෙසේය යනාදී ලෙස විස්තරකොට බුදුගුණ හා මිශ්‍ර වූ ධර්මදේශනාවක් දේශනා කළේය. බැමිණිය ප්‍රිය පුත්‍රයාගේ ධර්මදේශනාව අවසානයේ සෝතාපත්තිඵලයේ පිහිටා පුත්‍රයාට මෙසේ කීවාය.

දරුව! උපතිස්ස! කුමක් නිසා මෙසේ කළේද? මෙබඳු වූ අමාවක් මා හට මෙතෙක් කල් නුදුන්නේ ඇයිද? තෙරුන් වහන්සේ දැන් මාගේ මව වූ රූපසාරී බ්‍රාහ්මණියට ජීවත්වීමේ මිළ දෙන ලදී. මෙපමණක් වටීයැයි සිතා මහා උපාසිකාවනි, යන්න කියා බ්‍රාහ්මණියව පිටත්කර යවා චුන්දය, වේලාව කෙසේදැයි කීය. ස්වාමීනි! බොහෝ අලුයම් කාලයයි. එසේනම් භික්ෂු සංඝයා රැස්කරන්න යැයි කියා, ස්වාමීනි! රැස්ව සිටිතියි කී විට චුන්දය! මා ඔසවා හිඳුවන්නයැයි කීය. තෙරුන් වහන්සේ භික්ෂූන් ඇමතුයේය. ඇවැත්නි! වර්ෂ හතලිස් හතරක් මා නුඹලා සමග හැසිරීමේදී යම් කායික වාචසික හා මානසික අරුචි දෙයක් සිදුවූයේ නම් එයට සමාවන්න.

ස්වාමීනි! මෙතෙක් කල් අපගේ සෙවනැල්ලක් මෙන් ඔබවහන්සේව අත්නොහැර හැසිරෙන අපට අරුචි වූවක් නම් නැත. ඔබවහන්සේ අපට සමාවන්න යැයි කීහ. ඉක්බිති තෙරුන් වහන්සේ අරුණලු වැටීගෙන එනවිට මහපොළොව කම්පා කරමින් අනුපාදිසෙස නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑයේය. බොහෝ දෙව් මිනිස්සු තෙරුන් වහන්සේ පිරිනිවන්පෑමේ සත්කාරයන් කළහ. ආයුෂ්මත් චුන්ද තෙරුන් වහන්සේගේ පාත්‍රා සිවුරුද ධාතුන් වහන්සේලා අඩංගු පෙරහන්කඩයද ගෙන දෙව්රම් වෙහෙරට ගොස් ආනන්ද තෙරුන් ද රැගෙන භාග්‍යවතුන් වහන්සේ

සමීපයට පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේ ධාතූන් වහන්සේලා අඩංගු පැස ගෙන ගාථා පන්සියයකින් තෙරුන්ගේ ගුණ කියා ධාතු චෛත්‍යයක් කරවා රජගහ නුවරට යාම පිණිස ආනන්ද තෙරුන්ට දැන්වූ සේක. තෙරුන් වහන්සේ භික්ෂූන්ට දැන්වීය. භාග්‍යවතුන් වහන්සේ මහා භික්ෂු සංඝයා පිරිවරා රජගහ නුවරට වැඩි සේක. එහි වැඩිය කල්හි මහ මුගලන් තෙරුන් වහන්සේ පිරිනිවන් පෑ සේක. භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේගේ ද ධාතූන් රැගෙන චෛත්‍යයක් කරවවා රජගහ නුවරින් නික්ම පිළිවෙලින් ගංගානම් ගඟ පෙදෙසට අභිමුඛව ගොස් උරුවෙලාවට පිවිසියේය. එහි ගංඉවුරේ භික්ෂු සංඝයා පිරිවරා වැඩහිඳ එහිදී සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේගේ පිරිනිවන්පෑම හා සම්බන්ධ කර සූත්‍රයක් දේශනාකර උරුවෙලාවෙන් නික්ම විශාලා නුවරට වැඩියේය. මෙසේ වැඩියේ 'ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලය ගතකොට පාත්‍රා සිවුරු ගෙන විශාලා නුවර පිඬු පිණිස වැඩියේය' යන්න මෙහි අනුපිළිවෙල කථාවයි.

**නිසීදනං** මෙහි සම්කඩක් අදහස් කෙරේ. **උදෙන චෙතියං** උදේශි යක්ෂයාගේ චෛත්‍යය කළ තැන සෑදූ විහාරය ගොතමක ආදියේ නම්ද එසේමය. **භාවිතා** වඩන ලදී. **බහුලීකථා** පුනපුනා කරන ලද. **යානිකථා** සුදුසු යානාවක් මෙන් කරන ලද. **වත්‍ථුකථා** පිහිටි යන අර්ථයෙන් මන්දිරයක් මෙන් කරන ලද **අනුට්ඨිතා** පිහිටි. **පරිචිතා** හාත්පසින් ආරක්ෂිත. මනාව වර්ධනය වූ. **සුසමාරද්ධා** මනාව ආරම්භ කරන ලද. මෙසේ අනියම් ලෙස කියා නැවත නියම ලෙස දක්වමින් 'තථාගතයන් වහන්සේගේ වනාහි' ආදිය කීය. මෙහිද **කප්පං** යනු ආයු කල්පයයි. ඒ ඒ කාලවල මිනිසුන්ගේ යම් ආයු ප්‍රමාණයක් වේද, එය සම්පූර්ණ කරමින් සිටින්නේය. **කප්පාවසෙසං** වා යනු අඩුවෙන් හෝ බොහෝ හෝ ගතකළ වර්ෂ සියයකට අතිරේක හෝ මහාසීව තෙරුන් වහන්සේ මෙසේ පැවසූහ. බුදුවරයන් වහන්සේලාගේ අස්ථානයේ ගර්ජනා නැත. යම්සේ වනාහි බෙලුව ගමේදී හටගත් මාරාන්තික වේදනාවත් දස මාසයකින් ප්‍රහීණ කළේය. මෙසේ නැවත නැවතත් ඒ සමාපත්තියට සමවැදී දසමාසයක් ගෙවන්නේ මේ භද්‍ර කල්පයට සිටින්නේය. කුමක් නිසා නොසිටියේද? **තෘෂ්ණාදීන්** විසින් ගන්නා ලද ශරීරය වනාහි දත් වැටීම් ආදිය මගින් අභිභවනය කෙරේ. බුදුවරු ද දත්වැටීම් ආදියට පත් නොවී පස්වන ආයු කොටසෙහි බොහෝ ජනයාට ප්‍රියමනාප කාලයෙහිම පිරිනිවන් පාති. බුද්ධ, අනුබුද්ධ, මහා ශ්‍රාවකයන් පිරිනිවන් පෑකල්හි එකම කණුවක්

මෙන් සිටිය යුතුය. බාල සාමණේර පිරිසෙන් හෝ හටගත්තේ අහෝ! බුදුවරයන් වහන්සේලාගේ පිරිස කියා පහත් කොට සැළකීමක් බවට පත්වන්නේය. ඒ නිසා පිහිටියේ නැතැයි කීය. මෙසේ කී කල්හිද යමෙක් වනාහි රුචි කරයිද, එය ආයුකප්ප යැයි යන මෙය අටුවා කථාවේ දක්වන ලදී. **යථා තං මාරෙන පරියුට්ඨිත චිත්තො** මෙහි තං යනු නිපාත මාත්‍රයකි. යම්සේ මාරයා විසින් මැඩගෙන සිටි සිත් ඇත්තේ, යටත් කරගත් සිත් ඇත්තේ අන්කිසි පෘථග්ජනයෙක් අවබෝධ කරගන්නට නොහැකි වන්නේය. එපරිද්දෙන් තේරුම් ගන්නට නොහැකිවිය යන අර්ථයි. යමකුගේ වනාහි සර්වප්‍රකාරයෙන්ම දොළොස් ආකාර විපල්ලාසයන් (වෙනස්වීම්) ප්‍රහීණ නැද්ද මාරයා ඔහුගේ සිත මැඩගෙන සිටී. තෙරුන්ගේ විපල්ලාස හතරක් ප්‍රහීණ නැත. ඒ නිසා ඔහුගේ සිත මාරයා මැඩ ගත්තේය. ඔහු වනාහි සිත මැඩගැනීම කරන්නේ කුමක් කරයිද? බියජනක රූපාරම්මණ පෙන්වයි. ශබ්දාරම්මණ හෝ අස්වයි. ඉක්බිති සත්ත්වයෝ එය අසා හෝ බලා හෝ සිහිය බැහැර වී විවෘත වූ මුඛ ඇතිව සිටිත්. ඔවුන්ගේ මුඛයට අත දමා හදවත පිරිමදියි. එයින් සිහි නැතිව සිටිත්. මේ මාරයා තෙරුන්ගේ මුඛයෙන් අත දමන්නට කිම හැකි වන්නේද? බියජනක අරමුණක් දැක්වීද? එය දැක තෙරුන්වහන්සේ නිමිති ආලෝකයක් තේරුම් ගත්තේ නැත. භාග්‍යවතුන් වහන්සේ දන්නේ නමුත් තුන්වරක් දක්වා ආමන්ත්‍රණය කළේ ඇයි? පසුව, ස්වාමීනි! භාග්‍යවතුන් වහන්සේ වැඩසිටින්න යැයි ඉල්වා සිටි කල්හි මේ වරද ඔබගේමය. මේ අපරාධය ඔබගේමය යන දෝෂාරෝපණයෙන් ශෝකය තුනීකිරීම සඳහාය. **මාරො පාපිමා** මෙහි සත්ත්වයින් අනර්ථයෙහි යොදවමින් මරණයට පත්කරන්නේනුයි මාරො නම් වේ. **පාපිමා** යනු එයටම සමානාර්ථ පදයකි. ඔහු වනාහි පාප ධර්මයන්ගෙන් යුක්ත බැවින් පාපිමා යැයි කියනු ලැබේ. කණ්හ, අන්තක, නමුචි, පමත්ත බන්ධු යන මේවා ද ඔහුටම කියන නම්ය. **භාසිතා බො පනෙසා** යනු මේ වනාහි භාග්‍යවතුන් වහන්සේගේ බුදුවීමෙන් අටවන සතියේ බෝමැඩටම අවුත්, භාග්‍යවතුන් වහන්ස, යමක් සඳහා නුඹ විසින් පාරමී ධර්මයන් පුරන ලද ද ඒ ඔබගේ අර්ථය සම්පූර්ණ විය. අවබෝධ කළ සර්වඥතා ඥානය ගැන ලෝකයෙන් විමසීමෙන් ඔබට කවර ප්‍රයෝජනයක්ද? ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස, පිරිනිවන්පාන්න යැයි ඉල්ලා සිටියේය. භාග්‍යවතුන් වහන්සේ ද ඔහුට 'න තවාහං' ආදිය කියා ප්‍රතික්ෂේප කළේය. ඒ වෙනුවෙන් 'භාසිතා බො පනෙසා භන්තෙ' (ස්වාමීනි! මේ භාසිතය වනාහි) ආදිය කීය. එහි **වියත්තා** මාර්ග වශයෙන් ව්‍යක්ත වූ, එසේම

විනීත වූ, එසේම විසාරද වූ **බහුස්සුතා** ත්‍රිපිටක වශයෙන් මොවුන්ට බහුශ්‍රැත බවක් ඇත්තේනුයි 'බහුස්සුතා' නම් වේ. එම ධර්මයම දරන්නේ නුයි ධම්මධර නම් වේ. එසේ නැතහොත් පර්යාප්තියෙන් බහුශ්‍රැත වූ ප්‍රතිවේධයෙන් බහුශ්‍රැත වූ ද පර්යාප්ති, ප්‍රතිවේධ ධර්මයන් දැරීම් වශයෙන් ධම්මධර නම් වේ. මෙසේ මෙහි අර්ථ දතයුතුය. **ධම්මානුධම්ම පටිපන්නා** ආර්ය ධර්මයාගේ අනුධර්ම වූ විදර්ශනා තත්වයට පත්වූ **සාමීචි පටිපන්නා** ගැලපෙන ප්‍රතිපදාවකම පිළිපන්. **අනුධම්මචාරිනො** ධර්මයට අනුව හැසිරෙන ස්වභාව ඇති **සකං ආචරියකං** තමන්ගේ ආචාර්යවාදය. **ආචික්ඛිස්සන්ති** ආදී වූ සියල්ල එකිනෙකට සමානාර්ථ ඇති පදයෝය. **සහධම්මෙන** හේතු සහිත කරුණු සහිත වචනයෙන් **සප්පාටිහාරියං** යම්තාක් නෛර්යාණික කොට ධර්මය දේශනා කරන්නාහ. **බ්‍රහ්මචරියං** යනු ශික්ෂාත්‍රය ඇතුළත් සියලු ශාස්ත්‍ර බ්‍රහ්මචරියාව ඉඩ සඵල වූ ධ්‍යානයෙන් ලබන ආශ්වාද වශයෙන් **ඵීතං** වැඩිදියුණු වූ සම්පූර්ණ මලින් පිරුණු එකක් මෙන් අභිඤ්ඤා සම්පත්ති වශයෙන්, **විත්ථාරිකං** පැතුරුණු ඒ ඒ දිශාවන්හි පිහිටීම් වශයෙන් **බාහුජඤ්ඤං** බහුජනයා විසින් දන්නා ලද, අවබෝධ කරන ලද, මහජනයාට අවබෝධ වශයෙන් **පුථුභූතං** සර්වප්‍රකාරයෙන් පළල්බවට පත්. කෙසේ ද? **යාවදෙව මනුස්සෙහි සුප්පකාසිතං** යම්පමණ ඤාණවන්ත දෙවියන් ද මනුෂ්‍යයන් ද යන සියල්ලන් විසින් මනාව ප්‍රකාශ කරන ලද යන අර්ථයි.

**අප්පොස්සුක්කො** ආශාවක් නැති. පාපිෂ්ඨය! නුඹ වනාහි අටවන සතියේ පටන් ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස, සුගතයන් වහන්ස, දැන් පිරිනිවන් පාන්න' යැයි හඬ නගමින් ඇවිද්දේය. අද මෙතැන් පටන් පහවූ උත්සාහ ඇති කෙනෙක් වන්න. මට පිරිනිවන්පෑම සඳහා උත්සාහ නොකරන්න යැයි කියයි. **සතො සම්පජානො ආයු සංඛාරං ඔස්සජි** සිහිය මනාව පිහිටුවා නුවණින් පිරිසිඳ ආයු සංස්කාරය අත්හළේය. තුන් මාසයක් පමණ සමාපත්තියට සමවැද එයින් පසුව සමවදින්නේ නැතැයි සිත් ඇතිකර ගත්තේය. ඒ ගැන කියන ලදී. ඔස්සජි (අත් හළේය.) **උස්සජ්ජි** යැයිද පාඨයකි. **මහාභූමිචාලො** විශාල වූ භූමිකම්පාවක්. එකල්හි වනාහි දසසහශ්‍රී ලෝකධාතුව කම්පා විය. **හිංසනකො** බියජනක. **දෙවදුන්දුභියො ච ඵලිංසු** දිවබෙර ද ගුගුළේය. මේඝයද වියලි ගර්ජනා නැගීය. අකල් විදුලිය නිකුත් කළේය. හදිසි වර්ෂාවක් වැස්සේයැයි කියන ලදී. **උදානං උදානෙසි** කුමක් කියා උදන් ඇනීද? කෙනෙක් මෙසේ කියන්නේය. පසුපසින් ලුහුබඳිමින් ස්වාමීනි! පිරිනිවන්පාන්න. ස්වාමීනි

පිරිනිවන්පාන්න යැයි කීමෙන් පීඩාවට පත්ව බිය නිසා භාග්‍යවතුන් වහන්සේ ආයු සංස්කාර කළේය. එබඳු කීමකට ඉඩක් ඇති නොවේවා. බියට පත්වූවහුට උදානයක් නැත යන කාරණය දැක්වීම පිණිස ප්‍රීතිවේගයෙන් විසිරී ගිය උදානයක් ප්‍රකාශ කළේය.

එහිදී සියලු සුනඛ සිවල් ආදීන්ට ප්‍රත්‍යක්ෂ වශයෙන් සමාන කළ, වෙන්කළ යන අර්ථයෙන් තුලං නම් වේ. එය කුමක්ද? කාමාවචර කර්මය සමාන නැත. සමාන නොවන්නේය. මෙයට සමාන වූ අන්‍ය ලෞකික කර්මයක් නැත්තේනුයි අතුලං. එය කුමක්ද? මහග්ගත කර්මයක්ද? නැත්නම් කාමාවචර ද රූපාවචරද සමාන, අරූපාවචර අතුල වේ. අල්ප වූ විපාක ඇත්තේනුයි තුලං. බොහෝ විපාක ඇත්තේ අතුල. **සම්භවං** හටගැන්මට හේතු වූ පිඬු කරන්නා වූ එක්රැස් කරන්නා වූ යන අර්ථයි. **භව සංඛාරං** නැවත භවයක් සකස් කරන්නා වූ **අවස්සජී**. විසුරුවා හැරියේය. **මුනි** යනු බුද්ධමුනි. **අජ්ඣත්තරතො** ස්වකීය අධ්‍යාත්මයේ ඇලුනු. **සමාහිතො** උපචාර, අර්පනා සමාධි වශයෙන් සංසුන්, **අභින්දි කවචමිවා** යනු යුද ඇඳුමක් මෙන් බිඳී ගියේය. **අත්ත සම්භවං** යනු තමා තුළ හටගත් කෙලෙස් මෙය කියන ලදී. විපාක සහිත යන අර්ථයෙන් හටගත් භවය සකස් කිරීමේ අර්ථයෙන් භව සංඛාර යැයි ලබන ලද නම් ඇති තුල අතුල සංඛ්‍යාත වූ ලෞකික කර්මද අත්හළේය. යුදබිමෙහිදී මහා යෝධයෙක් යුද ඇඳුමක් මෙන් තමා තුළ හටගත් කෙලෙස්ද අභ්‍යන්තරයේ ඇලුනු සමාධියෙන් යුක්ත වී බිඳ දැම්මේය. එසේ නැත්නම්, **තුලං** යනු සමාන කරන්නේ, තීරණය කරන්නේ. **අතුලංච සම්භවං** නිර්වාණයත්, භවයත් **භවසංඛාරං** යනු භවගාමී වූ කර්මය. **අවස්සජි මුනී** යනු පංච ස්කන්ධයන් අනිත්‍යය. පස්කඳ නිරෝධ කිරීම නිර්වාණයයි. නිත්‍යයි ආදී ලෙසින් සමකර බලන්නේ බුද්ධමුනි භවයෙහි ආදීනවත් නිර්වාණයේ ආනිසංසත් දැක ඒ ස්කන්ධයන්ට මුල් වූ භවසංඛාර නම් වූ කර්මයත් කර්මක්ෂය කිරීම සඳහා හේතු වන්නේය යන ලෙස කියන ලද කර්මක්ෂය කරන්නා වූ ආර්ය මාර්ගයෙන් අත්හැර දැමීය. කෙසේද යත්, අධ්‍යාත්මයේ ඇලුනේ සමාධිගත වූයේ තමා කෙරෙහි හටගත්, යුද ඇඳුම මෙන් බිඳ දැම්මේය. එයද විදර්ශනා වශයෙන් අධ්‍යාත්මයේ රැඳුනා වූ ද සමථ වශයෙන් සමාධිගත වූ ද යන ලෙස පූර්ව කොටසේ පටන් සමථ විදර්ශනා බලයෙන් යුදඇඳුමක් බඳු ආත්මභාවය හාත්පසින් වටකරගෙන සිටියා වූ තමා තුළ හටගත් බැවින් 'අත්ත සම්භව' කියා ලබන ලද නම් ඇති සියළු කෙලෙස් ජාලාව සිඳ දැම්මේය. කෙලෙස් නොමැති බැවින් කර්මය

ප්‍රතිසන්ධියක් ඇති නොකරන බැවින් අවශ්‍යතාවක් නැතිවෙයි යනාදී ලෙස කෙලෙස් ප්‍රහාණය කිරීමෙන් කර්මය අත්හළේය. ප්‍රහීණ වූ කෙලෙස් ඇත්තාට බියක් නැත. ඒ නිසා බිය නැතිවම ආයු සංස්කාර අත්හළේය. බිය නොවූ බව දැන්වීම පිණිස උදානයක් ප්‍රකාශ කළේය යැයි දතයුතුයි.

**යං මහා වාතා** යම්කලකින් හෝ යම්කලක මහා වායු හමයිද, මහා වායු හමමින් උපකෙඛපක නම් වූ වාතයෝ හමා යත්. ඒ වායු හමමින් හැටදහසකට අධික යොදුන් නව ලක්‍ෂයක් ජලය දරණ වාතය සිඳ දමත්. එයින් අහසේ ජලය පහත බසී. එය පහළ බසිනවිට පෘථිවිය පහතට බසී. නැවත වායුව තම බලයෙන් පෙරහන්කඩයක මෙන් ජලය පිරෙයි. එයින් ජලය පිටත ගලයි. එය උඩට මතුවන විට පෘථිවිය උඩට පනී. මෙසේ ජලය කම්පා වී පෘථිවිය කම්පා වෙයි. මේ කම්පනය අද කාලයේ ද වෙයි. ඝන බව නිසා උඩ යට යන බවක් පෙනෙයි. **මහිද්ධිකො මහානුභාවො** සමෘද්ධියේ මහත්තත්වය නිසා මහද්ධිකය. අනුභව කළයුත්තහුගේ මහත් බව නිසා මහානුභාව නම් වේ. **පරිත්තා** යනු දුර්වල අප්පමාණ බලවත්. **සො ඉමං පඨවිං කමෙපති** හෙතෙම ඍද්ධිය උපදවා උත්සාහවත් වන්නේ මහ මුගලන් තෙරුන් මෙන්, විමසා බලන්නේ හෝ මහානාග තෙරුන්ගේ බෑනා වූ සංඝ රක්ඛිත සාමණේර මෙන් පෘථිවිය කම්පා වෙයි. ඒ ආයුෂ්මතුන් වහන්සේ වනාහි හිසකෙස් බාන තැනදීම රහත්බවට පත්ව මෙසේ සිතීය. යම් භික්‍ෂුවක් පැවිදි වූ දවසේම රහත්බවට පත්ව වෛජයන්ත ප්‍රාසාදය කම්පා කළේ නම් එබඳු භික්‍ෂුවක් සිටීද? එහිදී එබඳු කිසිවෙක් නැතැයි දැන මම කම්පා කරන්නෙමියි අභිඥා බලයෙන් වෛජයන්ත ප්‍රාසාදය මස්තකයේ සිට පාදයෙන් පහරදී කම්පා කරන්නට නොහැකිවිය. ඉක්බිති ඔහුට ශක්‍රයාගේ නාටක ස්ත්‍රීහු මෙසේ කීහ. පුත, සංඝරක්ඛිතය, ඔබ ගඳ ගසන හිසකින් යුක්තව වෛජයන්තය සොළවන්නට සිතන්නෙහිය. දරුව, මේ ප්‍රාසාදය මනාව පිහිටා ඇත්තකි. කෙසේනම් සොළවන්නට හැකිවන්නෙහිද? සාමණේරයෝ මෙසේ සිතුහ. මේ දේවතාවෝ මා සමග සෙල්ලම් කරති. මම වනාහි ගුරුවරයකු නොලද්දෙමි. මාගේ ගුරුවරයා වූ සාමුද්දිකා මහානාග තෙරුන් කොහිදැයි ආවර්ජනය කරමින් මහා සමුද්‍රයෙහි ජල ලෙනක් මවා දවල් දවස එහි වැඩසිටින්නේ යැයි දැනගෙන එහි ගොස් තෙරුන් වැඳ සිටියේය. ඉක්බිති ඔහුට තෙරුන් වහන්සේ මෙසේ කීහ. කිම දරුව සංඝරක්ඛිත, ඉගෙන නොගෙන යුද්ධයට පිවිසියේද කියා, දරුව, වෛජයන්තය, සොලවන්නට නොහැකි වූයේදැයි ඇසීය. ස්වාමීනි,

නොහැකි විය. ඉක්බිති ඔහුට තෙරුන් දරුව, ඔබ වැනි කෙනෙක් නොසොල්වන්නේ නම් අන් කවරෙක් සොලවන්නේද? දරුව, ඔබ ජලය මතුපිට පාවෙන ගොම වැරටියක් දැක තිබේද? කියා දරුව, කබලෙහි සාදන කැවිලි වර්ගයක් සාදන අය අගින් අග කඩත්. මේ උපමාවෙන් දැනගන්න යයි කීය. හෙතෙම ස්වාමීනි, මෙපමණක්ම ඇතැයි කියා ප්‍රාසාදය පිහිටි ප්‍රදේශය ජලය වේවායි අධිෂ්ඨාන කොට වෛජයන්තය දෙසට ගමන් කළේය. දෙව්දුව ඔහුව දැක, එක්වරක් ලජ්ජා වී ගොස් සාමණේර නම නැවතත් එයි. නැවත එයි කියා කියූහ. ශක්‍ර දේවේන්ද්‍රයා, මාගේ පුත්‍රයා සමග නොකියන්න. දැන් ඔහු විසින් ගුරුවරයකු ලබන ලදී. ක්‍ෂණයෙන් ප්‍රාසාදය කම්පාවන්නේ යයි කීය. සාමණේරයන් වහන්සේ පා ඇඟිල්ලෙන් ප්‍රාසාදයේ කොතට පහර දුන්නේය. ප්‍රාසාදය සතර පැත්තට නැමෙන්නට විය. දෙවියෝ දරුව! ප්‍රාසාදය තිබෙන්ට ඉඩදෙන්න: ප්‍රාසාදය තිබෙන්නට ඉඩහරින්නයැයි හඬ නැගුහ. සාමණේරයෝ ප්‍රාසාදය නියම තැන තබා ප්‍රාසාදය මුදුනේ සිට උදන් ඇනූහ.

**අජ්ජෙවාහං පබ්බජිතො අජ්ජපත්තාසවක්ඛයං**
**අජ්ජ කම්පෙමි පාසාදං අහො බුද්ධසසුළාරතා**
**අහො ධම්මසසුළාරතා අහෝ සංඝසසුළාරතා**

මම අදම පැවිදි වූයෙමි. අදම ආශ්‍රවයන් ක්‍ෂයකොට අදම ප්‍රාසාදය කම්පා කරමි. අහෝ! බුදුරජාණන් වහන්සේගේ උදාරත්වය අහෝ ධර්මයේ උදාරත්වය! අහෝ සංඝයාගේ උදාරත්වය.

මීට පසු පෘථිවි කම්පා සයේදී යමක් කිවයුතු ද එය මහාපදානයෙහි කියන ලදමැයි. මෙසේ මේ පඨවි කම්පා අටෙහිදී පළමුවැන්න ධාතු කැළඹීමෙන්, දෙවැන්න ඍද්ධි බලයෙන්, තුන්වන සතරවන ඒවා පිනෙහි බලයෙන් ද පස්වැන්න ඥාණ තේජසින් ද සයවැන්න සාධුකාර දීම් වශයෙන්ද විය. මහාසත්ත්වයන් මව්කුසට එළඹෙනවිටත්, ඉන් නිකුත්වන විටත් ඔහුගේ පුණ්‍ය තේජසින් මහපොළොව කම්පා විය. අභිසම්බෝධියේදී ඥාණ තේජසින් මඩනා ලද්දේ කම්පා විය. දම්සක් පැවතුමේදී සාධුකාර දීමේ සළකුණක් ලෙස සාධුකාර දෙමින් කම්පා විය. ආයු සංස්කාර හැරීමේදී කරුණාවට සළකුණු තබමින් සිතේ ඇතිවන කැළඹීම ඉවසාගත නොහැකිව කම්පා විය. පරිනිර්වාණයේදී හඬාවැළපීමේ වේගය අඩුවීම සඳහා කම්පා විය. මේ අර්ථය වනාහි පඨවි දේවතා වශයෙන් දතයුතුයි.

මහාභූතයක් වූ පෘථිවියෙහි වනාහි, අචේතනික බැවින් මෙවැන්නක් නැත. **ඉමෙ ඛො ආනන්‍ද අට්ඨහෙතු.** මෙහි 'ඉමෙ' (මේවා) යනු දක්වන ලද නිදර්ශනයි. මෙපමණකින්ම වනාහි ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ ඒකාන්තයෙන් අද භාග්‍යවතුන් වහන්සේ විසින් ආයු සංස්කාර හැරීම සැළකීය. භාග්‍යවතුන් වහන්සේද, එසේ සිතාගත් බව දන්නේ නමුදු එයට ඉඩක් නොදීම අනික් අට ද සම්පිණ්ඩනය කරමින් **අට්ඨබො ඉමා** (ඉක්බිති මේවා) එහි **අනෙකසතං ඛත්තිය පරිසං** යනු බිම්බිසාර සමාගම, ඤාති සමාගම, ලිච්ඡවි සමාගම ආදිය හා සමාන අන් සක්වලවලදීද ලැබෙයිමය. **සල්ලපිත පුබ්බං** අල්ලාප සල්ලාප කරන ලද **සාකච්ඡා** යනු ධර්මසාකච්ඡාද ඇතුළත් වේ. **යාදිසකො තෙසං වණ්ණො** ඔව්හු සුදුපාට වෙත්. කාලවර්ණ වෙති. කළු රන්වන් පාටය. මේ සටහන අරභයා කියන ලදී. සටහනද හුදෙක් ඔවුන්ට පෙනේමය. භාග්‍යවතුන් වහන්සේ වනාහි නොදියුණු ගෝත්‍රිකයකු සමාන නොවේ. පැළඳගත් මිණිකොඩොල් ඇතිව බුද්ධවේශයෙන් හිඳියි. ඔව්හු වනාහි තමන්ගේ සමාන සළකුණුව දකිත්. **යාදිසකො එතෙසං සරො** යනු ඔව්හු සිඳුනු ස්වර ඇත්තෝද වෙත්. බිඳුනු ස්වර ඇත්තේය. කාකස්වර ඇත්තේය. කටුක ස්වර ඇත්තේය. කැඩුනු ස්වර ඇත්තේය. ශාස්තෲන් වහන්සේ වනාහි බ්‍රහ්මස්වර ඇත්තේමය. මෙය වනාහි වෙනත් වෙනත් භාෂාවන් සඳහා කියන ලදී. ඉදින් වනාහි ශාස්තෲන් වහන්සේ රාජාසනයේ සිටියේ කියයි. අද රජතුමා මධුර ස්වරයෙන් කථා කරයි. කථාකොට භාග්‍යවතුන් වහන්සේ නික්මගිය කල්හි නැවත රජු පැමිණි බව දැක මේ කවරෙක්දැයි විමතියක් ඇතිවෙයි. එහි **කොනු ඛො අයං** මේ ස්ථානයෙහි දැන්ම මගධ භාෂාවෙන්, සිංහල භාෂාවෙන්, මිහිරි ආකාරයෙන් කියන්නේ, කියන්නේ මේ කවරෙක්ද? අතරක් නැතිව කියන මොහු දෙවියෙක්ද, නැත්නම් මනුෂ්‍යයෙක් ද? මෙසේ විමසන්නාහුද නොදනිත් යන අර්ථයි. මෙසේ නොදන්නා අයට කුමක් සඳහා ධර්මය දේශනා කරයිද? පෙර පුරුද්ද සඳහාය. මෙසේ අසන ලද ධර්මය අනාගතයට හේතුවෙයි කියා අනාගතය උදෙසා දේශනා කරයි. **අනෙකසතං බ්‍රාහමණපරිසං** ආදී සොණදණ්ඩ, කූටදන්ත සමාගම ආදී වශයෙන් ද අන්‍ය සක්වලවල් වශයෙන් ද සම්භවය දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ කුමක් නිසා මේ අටපිරිස ගෙනහැර දැක්වීද? බිය නොවන බව දැක්වීම සඳහාය. මේවා ගෙනහැර දක්වා මෙසේ වදාළහ. ආනන්දය, මේ අට පිරිස වෙත පැමිණ ධර්මදේශනා කරන තථාගතයන් වහන්සේට භයක් හෝ ඇල්මක් හෝ නැත. මාරයා වනාහි තනිව දැක තථාගතයන් වහන්සේ බිය වන්නේය

කියා කවරෙක් මෙසේ සඤ්ඤාවක් උපදවන්නට සුදුසුද? ආනන්දය! තථාගතයන් වහන්සේ භය නැත. තැතිගැන්මක් නැත. සිහියෙන් හා වැටහීමෙන් යුක්ත වූයේ ආයු සංස්කාරය අත්හළේය. **අභිභායතනානි** යටපත්කරන කරුණු කුමක් යටපත් කරත්ද? විරුද්ධ ධර්මයන්ට අරමුණු, ඒවා වනාහි ප්‍රතිපක්ෂ භාවයෙන් විරුද්ධ ධර්මයන් අභිභවනය කරත්. පුද්ගලයාගේ ඤාණයාගේ උත්තරීතර බව සඳහා අරමුණු. **අජ්ඣත්තං රූපසඤ්ඤී** ආදියෙහි වනාහි අධ්‍යාත්මික රූපයෙහි පරිකර්ම වශයෙන් අජ්ඣත්ත රූපසඤ්ඤී නම් වේ. අධ්‍යාත්මය වනාහි නීල පරිකර්මය කරන්නේ කෙස්වල හෝ පිතෙහි හෝ ඇසේ තාරකාවගේ හෝ කරයි. පීත පරිකර්මය කරන්නේ මේදයෙහි හෝ සමෙහි හෝ අත්පා තලවල හෝ ඇස්වල කහපැහැ ඇති තැන්වල කරයි. ලොහිත පරිකර්මය කරන්නේ මස්වල හෝ ලේවල හෝ දිවෙහි හෝ ඇස්වල හෝ රතු තැන්වල කරයි. ඕදාත පරිකර්මය කරන්නේ ඇටවල හෝ දත්වල හෝ නියවල හෝ ඇස්වල සුදු තන්හි හෝ කරයි. එය වනාහි අතිශයින් නිල්, අතිශයින් කහපාට, අතිශයින් රතුපාට, ඉතා සුදුපාට හෝ නොවෙයි. ශුද්ධ නැත්තේම වෙයි. **එකො බහිද්ධාරූපානි පස්සති** යනු යමකුට මෙසේ අධ්‍යාත්මික වූ පරිකර්මය හටගත්තේ වෙයිද, නිමිති බාහිර ද හෙතෙම මෙසේ අධ්‍යාත්මය පරිකර්මයට බාහිරවද අර්පණා වශයෙන් අධ්‍යාත්මක අරූපසඤ්ඤී වූයේ හුදෙකලාව බාහිර රූප දකියි කියා කියයි. මෙහි ඉතිරි සියල්ල සතරවැනි අභිභායතයේ කියන ලද ක්‍රමයමය. මේ සතරෙහි වනාහි ටිකක් විතර්ක චරිත වශයෙන් ආයේය. බොහෝ ප්‍රමාණයක් මෝහ චරිත වශයෙන් සුවර්ණය දෝස චරිත වශයෙන් ද දුර්වර්ණය රාග චරිත වශයෙන් ද මොවුන්ට මේවා එයට සප්පාය වන ආකාරය විස්තර වශයෙන් විශුද්ධි මාර්ගයේ චරිත නිර්දේශයේ කියන ලදී. පස්වන අභිභායතනාදියෙහි. **නීලානි** යනු සියල්ල එකට එක්තැන් කිරීම් වශයෙන් කියන ලදී. **නීලවණ්ණානි** වර්ණ වශයෙන් **නීලනිදස්සනානි** දැකීම් වශයෙන් නොපෙනෙන විවර, නොබිඳුනු වර්ණ, එකම නිලක්ව වී පෙනෙන්නේ යැයි කියන ලදී. නිල් ආලෝකයක්, නිල් ප්‍රභාවකින් යුක්තය යන අර්ථයි. මෙයින් ඔවුන්ගේ ශුවිශුද්ධ බව දක්වයි. පිරිසිදු වර්ණ වශයෙන් වනාහි මේ ප්‍රබල ආයතන සතර කියන ලදී.

**උමමාපුප්ඵ** මේ මල ඉතා සිනිඳුය. මෘදු ලෙස පෙනෙන්නේ නීල වර්ණම වෙයි. ගිරිකණ්ණික ආදී මල් සුදුපාටින් පෙනෙන්නේය. ඒ නිසා මෙයම ගන්නා ලදී. ඒවා නොවේ. **බාරාණසෙය්‍යකං** බරණැස් නුවර

පහළ වූ. එහි වනාහි කපු ද මෘදුය. නූල් කටින්නෝ ද රෙදි වියන්නෝද දක්‍ෂයෝය. ජලයද පිරිසිදුය. මොළොක්ය. ඒ නිසා ඒ වස්ත්‍රය දෙපාර්ශ්වයෙන්ම සුමටය. දෙපැත්තම මටසිලිටුව පෙනෙයි. **පීතානි** ආදියෙහිද මේ ක්‍රමයෙන්ම අර්ථය දතයුතුයි. නීල කසිණය ඉගෙන ගන්නහු විසින් නිලෙහි නිමිති ගනී. මලෙහිද වස්ත්‍රයෙහි ද වර්ණධාතු වශයෙනි. මේ ආදී කසිණයක් සාදා ගැනීමද එහි පරිකර්මද අර්පණා විධානයද යන සියල්ල විශුද්ධි මාර්ගයෙහි විස්තර සහිතව කියන ලදී. මේ අටවැදෑරුම් ප්‍රබල කාරණා බිය නැති බව දැක්වීම සඳහාම ගෙනහැර දක්වන ලදී. මේවාද කියා මෙසේ කීය. ආනන්දය! මෙබඳු රූප වූ සමාපත්තීන්ට සමවදින්නා වූත් ඉන් නැගිටින්නා වූත් තථාගතයන් වහන්සේට භයක් හෝ එහි ඇල්මක් හෝ නැත. මාරයා වනාහි එකක් දැක තථාගතයන් වහන්සේ බියවන්නේ යැයි කවරෙක් නම් මෙබඳු හැඟීමක් උපදවන්නට යෝග්‍යද? ආනන්දය! තථාගතයන් වහන්සේ අභීතය. තැතිගන්නේ නැත. සිහියෙන් යුක්තව ආයුසංස්කාර හළේය.

විමොක්‍ෂ කථාව කියන ලද අර්ථ ඇත්තේය. මේ අෂ්ට විමොක්‍ෂයන්ද අභීත බව දැක්වීම සඳහාම ගෙනහැර දක්වන ලදී. මේවාද කියා මෙසේ පැවසීය. ආනන්ද! මේ සමාපත්තිවලට සමවදින්නා වූත් ඉන් නැගී සිටින්නා වූත් තථාගතයන් වහන්සේට බියක් හෝ ඇල්මක් නැත. -පෙ- ආයු සංස්කාර හළේය.

දැන්ද භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන්ට ඉඩක් නොදීම එකමිදාහං යනාදී ලෙස අන් දේශනාවක්ද පටන් ගත්තේය. එහි **පඨමාභි සම්බුද්ධො** යනු බුදුවී පළමුවෙන් ම අටවන සතියෙහි **ඔසසටෙඨා** යනු අත්හරින ලදී. මෙසේ කියා මේ නිසා මේ දස සහශ්‍රී ලෝකධාතුව කම්පා වීයැයි පැවසීය. අලං යනු ප්‍රතික්ෂේප කිරීමේ වචනයකි. බොධිං යනු සිව්මග නුවණ අවබෝධ කිරීම. **සද්දහසි ත්‍වං** තථාගතයන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළබව විශ්වාස කරන්නෙහිදැයි කියයි. **තසමාතිහානන්ද** යනු යම්හෙයකින් මේ වචනය විශ්වාස කරන්නේ නම් ඒ නිසා මෙය ඔබට දුක්කටයක් (දුකුළා ඇවතක්) යක් වන්නේ යැයි දක්වයි. **එකමිදාහං** යනු භාග්‍යවතුන් වහන්සේ හුදෙක් මම මෙහිදී ඔහුට ඇමතුයේ නොවේ. වෙන දාකද අමතා ඕලාරික වූ නිමිත්තක් දැක්වූයෙමි. එයද ඔබ විසින් තේරුම් ගත්තේ නැත. මෙය ඔබගේ වරදකි. මෙසේ ශෝකය නැතිකිරීම සඳහා නොයෙක් ආකාරයෙන් තෙරුන් වහන්සේට දෝෂාරෝපණ

කරන්නට පටන් ගත්තේය. **පියෙහි මනාපෙහි** මව, පියා, සහෝදරයා, සහෝදරිය ආදීන්ගෙන් ජන්මයෙන් වෙන්වීම, මරණයෙන් වෙන්වීම, භවයෙන් වෙනස් තත්ත්වයකට පත්වීම **තං කුතෙත්ථ ලබ්භා** යනු තං යනු ඒ නිසා, යම්හෙයකින් සියළුම ප්‍රියමනාප වස්තූන්ගෙන් වෙන්වීම, ඒ නිසා දස පාරමිතා පුරාද සම්බෝධියට පත්ව ද දම්සක් පවත්වා ද යමක ප්‍රාතිහාර්ය දක්වාද දෙවාරෝහණය කරද යම් ඒ දෙයක් හටගත්තේද, උපන්නේද, පහළ වූයේද ඒ සියල්ල පලුදුවන නැතිවන ස්වභාව ඇත්තේය. තථාගතයන් වහන්සේගේ ශරීරයද එබඳුය. හඬාවැළපීමෙන් එසේ නොවේවායි වළක්වා ගැනීමක් සිදුවිය නොහැක්කකි. **පුනපච්ඡාවමිස්සති** යමක් අත්හළේ ද වැමෑරුයේ ද එය වනාහි නැවත කන්නේය යන අර්ථයි. **යථයිදං බ්‍රහමචරියං** යම්සේ මේ ශික්ෂාත්‍රය සංග්‍රහ කිරීම ශාසන බ්‍රහ්මචරියාවයි. **අංගනියං** ගමනට සුදුසු. **චිරට්ඨිතිකං** බොහෝ කල්පැවැත්ම වශයෙන්, චිරස්ථායී. **චත්තාරො සතිපට්ඨානා** ආදී සියල්ල ලෞකික ලෝකෝත්තර වශයෙන් කියන ලදී. මේ බෝධිපාක්ෂික ධර්මයන්ගේ විනිශ්චය විභාගය සියලු ආකාරයෙන්ම විශුද්ධිමාර්ගයේ ඤාණදස්සන විශුද්ධි නිර්දේශයෙහි කියන ලදී. මෙහි ඉතිරිය කියන ලද අයුරුමය.

**තුන්වන බණවර වර්ණනාව නිමියේ ය.**

**නාගාපලොකිතං** යනු යම්සේ වනාහි මහජනයාගේ ඇට අගින් අග එකට බැඳී සිටී. පසේබුදුවරයන් වහන්සේලාගේ වනාහි අංකුසයෙහි එල්ලන ලද්දාක් මෙනි. බුදුවරයන් වහන්සේලාගේ එසේ නොවේ. බුදුවරයන් වහන්සේලාගේ වනාහි හැකිල්ලක් මෙන් එකට බැඳී සිටියේය. ඒ නිසා පසුපස බලන කල්හි ග්‍රීවය හරවන්නට නොහැකිය. යම්සේ වනාහි ඇත්රජෙක් පසුපස බලනු කැමැත්තේ මුළු ශරීරයම හරවා බලයි ද මෙසේ හැරවිය යුතුය. භාග්‍යවතුන් වහන්සේ වනාහි නගරදොරටුවේ සිට විශාලා නුවර දෙස බලන්නෙමියි සිතූනුවිටම භාග්‍යවතුන් වහන්සේ අනේක කල්ප කෝටි සහශ්‍රයක් පාරමිතා පුරන ඔබවහන්සේ විසින් ග්‍රීවය හරවා ආපසු බැලීමක් නොකරන ලදැයි මේ පොළොව කුඹල් සකක් මෙන් කැරකී භාග්‍යවතුන් වහන්සේව විශාලා නුවර දෙසට යොමුකළේය. ඒ ගැන මෙය කියන ලදී. හුදෙක් විශාලාව පමණක් නොවේ. රජගහ, නාලන්ද-පාටලීගම, කෝටිග්‍රාමය, නාදික ග්‍රාමය ආදී ඒ ඒ තැන්වලින් නික්මෙන කල්හි ඒ ඒ පසුදැක්ම වන්නේය. කුමක් නිසා

ඒ ඒ තැන්වලදී හස්තියකු මෙන් නොබැලීද? පුදුමයක් නොවන බැවිනි. ඒ ඒ තැන නතර වී බලන්නහුට මෙය පුදුමයක් නොවේ. ඒ නිසා නොබැලීය. තවද විශාලානුවර රජවරු ළංවූ විපත්ති ඇත්තාහු වර්ෂ තුනක් ගියතැන විනාශ වන්නාහ. ඔව්හු ඒ නගරදොරටුවේ 'නාගාපලොකිත' (හස්තියකු සේ බැලූ) නම් වූ චෛත්‍යයක් සාදවා ගඳමල් ආදියෙන් පුදත්. එය ඔවුන්ට බොහෝ කලක් හිතසුව පිණිස වන්නේ යැයි අනුකම්පාවෙන් එසේ බැලීය. **දුක්ඛස්සන්තකරො** සසර දුක අවසන් කරන **චක්ඛුමා** පස් ඇසකින් යුත්. **පරිනිබ්බුතො** ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවන් පෑවේය.

මහාපදෙසෙ විශාල අවකාසයක මහත් වූ කාරණය - බුද්ධාදී උත්තමයෝ මහත් වූ මහත් වූ කාරණා සාක්‍ෂ්‍ය ලෙස දක්වා කියන ලද මහා කාරණා යන අර්ථයි. **නෙව අභිනන්දිතබ්බං** තුටුපහටු වූවන් විසින් සාධුකාර දී කලින්ම නොඇසිය යුතුයි. මෙසේ කළ කල්හි පසුව මෙය නොගැලපේයැයි කියන්නේ නමුත් කිම කලින් මෙය ධර්මයකි. දැන් ධර්මයක් නොවේය කියා විශ්වාසය අත් නොහරියි. **න පටික්කොසිතබ්බං** යනු මේ බාලයා කුමක් කියයිද මෙසේ කලින් කිවයුතුව තිබිත. මෙසේ කීකල්හි කිවයුතු දෙයද නොකියන්නේය. ඒ නිසා කියන ලදී. 'සතුටු නොවී, නොකැඳවා' යනාදී ලෙස **පද ව්‍යඤ්ජනානි** පද සංඛ්‍යාත වූ සළකුණු. **සාධුකං උග්ගහෙත්වා** මෙතැන පෙළ කියන ලදී. මෙතැන අර්ථය කියන ලදී. මෙතැන අනුසන්ධි ගැලපීම කියන ලදී. මෙතැන පූර්ව අපර ගැලපීම යනාදී ලෙස මනාව අවබෝධ කරගෙන **සුත්තෙ ඔතාරෙතබ්බා** සූත්‍රයන් බැස්සවිය යුතුයි. **විනයෙ සන්දස්සෙතබ්බානි** විනයෙහිදී සැසඳිය යුතුය. මෙහි දී සුත්තං යන්නෙන් විනය ගැනේ. මෙසේ කියා ඇත. කොහි දමන ලදද? සැවැත්නුවර සූත්‍ර විභංගයෙහි විනය නම් ඛන්ධකයි. මෙසේ කියා ඇත. කොසඹෑ නුවර විනයේ මෙසේ විනය පිටකයද හාත්පසින් ගනු නොලැබේ. උභතො විභංගයට වනාහි සූත්‍ර, ඛන්ධක, පරිවාර, විනය යන ලෙස විනය පිටකය හාත්පසින් ගනු ලබයි. එසේ නැත්නම් සූත්‍ර පිටකය - සූත්‍ර විනය පිටකය, විනය මේ පිටක දෙක ගනු ලබති. සූත්‍රාන්ත අභිධර්ම පිටකයන් හෝ සූත්‍ර-විනය පිටකය, විනය මෙසේ පිටක තුන ඇතුළත් නොවේ. සූත්‍ර නොවන බුද්ධ වචනයන්ද ඇත. කෙසේද යත් ජාතක පටිසම්භිදා නිද්දෙස, සුත්ත නිපාත, ධම්මපද, උදාන, ඉතිවුත්තක, විමානවත්‍ථු, පේතවත්‍ථු, ථෙරගාථා - ථෙරීගාථා අපදාන යැයි සුදින්න තෙරුන්වහන්සේ වනාහි සූත්‍ර නොවන බුද්ධවචනයක් නම්

නැත්තේ යැයි ඒ සියල්ල එකට දමා ත්‍රිපිටකයැයි සූත්‍ර විනය දක්වීය. ඉක්බිති ඒ කාරණය දක්වන්නේ මේ සූත්‍රය ගෙනහැර දක්වීය. ගෞතමිය! ඔබ යම් ධර්මයක් දන්නෙහිද, මේ ධර්මයෝ සරාගී බව පිණිස හේතු වන්නේය. විරාගය පිණිස නොවේ. එක්වීම පිණිස හේතුවන්නේය. වෙන්වීම පිණිස නොවේ. දඩිව ගැනීම පිණිස හේතුවෙයි. දඩිව නොගැනීම පිණිස නොවේ. බොහෝ දේ පැතීම සඳහා හේතු වේ. අල්පේච්ඡතාවය සඳහා නොවේ. අසතුට පිණිසය. සතුට පිණිස නොවේ. කුසීතබව සඳහාය. වීර්ය ආරම්භය සඳහා නොපවතී. එක්රැස්වීම පිණිස හේතු වේ. උතුම් විවේකය සඳහා හේතු නොවේ. එක්රැස් කිරීම පිණිස වන්නේය. විසුරුවා හැරීම පිණිස නොවේ. ගෞතමිය, ස්ථිර වශයෙන්ම දනගන්න. මේ ධර්මය නොවේ. මේ විනය නොවේ. මෙය ශාස්තෘ ශාසනය නොවේ.

ගෞතමිය, යම් ඒ ධර්මයක් දන්නේද මේ ධර්මයෝ විරාගය පිණිස හේතුවෙත්ද රාගය පිණිස නොවේද, වෙන්වීම පිණිස හේතුවේ. එක්වීම පිණිස නොවේ. දඩිව නොගැනීම පිණිස හේතුවේ. මෙය අල්පේච්ඡතාවය පිණිස වේ. බොහෝ දේ පැතීම සඳහා නොවේ. සතුට පිණිස හේතු වේ. අසතුට පිණිස නොවේ. වීර්යාරම්භය පිණිස හේතුවේ. කුසීත බව සඳහා නොවේ. උතුම් විවේකය පිණිසය. එක්රැස්වීම පිණිස නොවේ. අත්හැරීම පිණිස හේතුවන අතර එක්රැස් කිරීම පිණිස නොවේ. ගෞතමිය ඒකාන්ත වශයෙන් දනගන්න. මේ ධර්මයයි. මේ විනයයි. මේ ශාස්තෘ ශාසනයයි. ඒ නිසා **සුත්තෙ** යන්නෙහි සියළු ත්‍රිපිටක බුද්ධවචනය අඩංගු වේ. **විනයෙ** යනු මේ රාගාදී විනය කාරණා හා සැසඳිය යුතුය යන අර්ථයි. **න චෙව සුත්තෙ ඔතරන්ති** සූත්‍ර පිළිවෙලින් කිසිතැනක නොගොස් වැස්ම ඉවත්කර සැඟවුණු වෙස්සන්තර, සැඟවුනු උම්මග්ග, සැඟවුනු විනය වේදල්ල පිටක යන කවර හෝ තැනකින් ආවේයැයි දක්වන්නේය යන අර්ථයි. මෙසේ ආවා වූ ඒවා රාගාදී විනයෙහි නොපෙනෙත්ද අත්හළ යුතු වේ. ඒ නිසා කියන ලදී. මහණෙනි! මෙසේ වනාහි අත්හළ යුතුයි. මේ උපක්‍රමයෙන් සියළු තන්හි අර්ථ දතයුතුයි. **ඉදං භික්ඛවෙ චතුත්ථං මහාපදෙසං** ධාරෙය්‍යාථ යනු මේ සතරවැන්න ධර්මයට පිහිටවීමට ඉඩක් ඇති සේ දරන්න. මෙතැන වනාහි මේ ප්‍රකීර්ණකය දතයුතුයි. සූත්‍රයෙහි මහාප්‍රදේශ සතරක් ඛන්ධකයෙහි මහා ප්‍රදේශ හතරක් ප්‍රශ්න විසඳන ක්‍රම සතරක්, සූත්‍ර, සූත්‍රානුලෝම, ආචරියවාද තමන්ගේ මතය කියා සංගීති තුනකි. එහි මේ ධර්මයයි. මේ විනයයි. ධර්ම විනිශ්චයෙහිදී මේ සතර මහා ප්‍රදේශයන්

ප්‍රමාණවත්ය. යමක් මෙහි සැසඳේනම් එයම ගතයුතුයි. කෑගැසුවත් ඉතිරිවා නොගත යුතුයි. මෙය කැපය. මෙය අකැපය යනුවෙන් කැප අකැප විනිශ්චයක් ඇතිවූ කල්හි මහණෙනි! මා විසින් යමක් මෙය නොගැලපේ යැයි ප්‍රතික්ෂේප කරන ලදද එය අකැපය. විරුද්ධ වෙයි. කැප දෙය වළක්වයි. එය ඔබලාට කැප නැත ආදී ලෙස ඛන්ධකයෙහි කියන ලද මහා ප්‍රදේශ සතර ප්‍රමාණවත්ය. ඒ පිළිබඳ විනිශ්චය කථාවන් සමන්තපාසාදිකාවෙහි කියන ලදී. එහි කියන ලද ආකාරයට යමක් කැපයයි ගැලපේද එයම කැපය. අනික අකැපය. මෙසේ සනිටුහන් කළයුතුයි. එකක් ව්‍යාකරණ සහිත (විස්තර කළ යුතු ප්‍රශ්නයකි. බෙදා විස්තර කළයුතු ප්‍රශ්නයකි. පිළිතුරු විචාරීමෙන් විසඳිය යුතු ප්‍රශ්නයකි. තැබිය යුතු ප්‍රශ්නයකි. මේ සතර ආකාර ප්‍රශ්න විසඳීම් නම් වේ. එහි ඇස අනිත්‍යයි විචාරන ලද්දහු විසින් එසේය. අනිත්‍යයයි. ඒකාන්තයෙන් විසඳිය යුතුයි. සෝත ආදියෙහිද මේ ක්‍රමයමය. මේ එක් විස්තර කිරීම් සහිත පැනයකි. ඇසනම් අනිත්‍යයි කියා අසනු ලැබුවහු විසින් ඇස පමණක් නොවේ. සෝත (කණ) ද අනිත්‍යයි. කණ ද අනිත්‍යයි. මෙසේ බෙදා විසඳිය යුතුයි. මේ බෙදා වෙන්කර විසඳිය යුතු ප්‍රශ්නයයි. ඇස යම්සේද කණ එසේය. කණ යම්සේද ඇස ද එසේය කියා අසන ලද්දහු විසින් කවර අර්ථයකින් විචාරන්නේදැයි පිළිතුරු දී දැකීම් අර්ථයෙන් යැයි පිළිතුරු දුන් කල්හි නැතැයි කියා උත්තර දිය යුතුය.

අනිත්‍ය අර්ථයෙන් අසමියි කීකල්හි එසේයැයි පිළිතුරු දිය යුතුයි. මේ ප්‍රශ්න කිරීම විවරණය කළයුතු ප්‍රශ්නයකි. ජීවය එයයි. ශරීරය එයයි ආදිය විචාළහු විසින් මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් පැහැදිලි කර නැතැයි තැබිය යුතුය. මේ ප්‍රශ්නය විසඳිය යුතු නැත. මෙය නොවිසඳා තැබිය යුතු ප්‍රශ්නයයි. මෙසේ ඒ ඒ ආකාරයෙන් ප්‍රශ්නයන් ඉදිරිපත් වූ කල්හි මේ සතර ආකාර ප්‍රශ්න විසඳීම් ප්‍රමාණවත්ය. මොවුන්ගේ වශයෙන් ඒ ප්‍රශ්නය විසඳිය යුතුය. සූත්‍රාදියෙහි වනාහි සූත්‍ර නම් සංගායනා තුනේදී සංගායනාවට නැගූ පිටකත්‍රයයි. සූත්‍රයන්ට ගැලපෙන යනු අනුලොම කප්පිය නම් වේ. ආචරියවාද නම් අටුවායි. අත්තනොමති නම් න්‍යායක් ගැනීමෙන් අවබෝධකර ගැනීමෙන් තමන් ලබන ප්‍රතිභානයයි. එහි සූත්‍ර වැළැක්විය යුතු නැත. එය ප්‍රතික්ෂේප කරන්නහු විසින් බුදුන් වහන්සේවද වැළැක්වූයේ වෙයි.

අනුලොම කප්පිය නම් සූත්‍රයට ගැලපෙන්නක්ම ගතයුතුයි. අනිකක් නොගත යුතුයි. පන්සියයක්, සත්සියයක්, දහසක් දෙනා සහභාගී වූ මේ සංගීති තුනකි. සූත්‍ර ද එහිදී ප්‍රමාණවත් ලෙස ගැනින. වෙනත් ගරුකළ යුතුයැයි සූත්‍ර නොගත යුතුයි. එහි අඩංගු වන්නා වූ පදව්‍යඤ්ජන ආදිය සූත්‍රයෙහි අඩංගු නොවේ. විනයෙහි දක්නට නොලැබේ යැයි දතයුතුයි.

**කම්මාරපුත්තස්ස** යනු රන්කරු පුත්‍රයකුගේ, ඔහු වනාහි පොහොසත් මහා කෙළෙඹියෙකි. භාග්‍යවතුන් වහන්සේගේ මුල් හමුවීමේදීම සෝවාන් වී තමන්ගේ අඹවනයෙහි විහාරයක් කරවා පිළිගැන්වීය. ඒ නිසා කියන ලදී. 'අම්බවනෙ' කියා. **සූකර මද්දවං.** බොහෝ තරුණ නොවූ බොහෝ වයස්ගත නොවූ එක් දෙවු ඌරකුගේ මස්, ඒ මස වනාහි මෘදුය. සිනිඳුය. එය පිළියෙල කර මනාව පිසවා යන අර්ථයි. (කෙනෙක් මෙසේ කියත්. සූකර මද්දවය යනු මොලොක් බතකට පස්ගෝරස යුෂ දමා සකස්කළ ආහාරයට නමකි. යම්සේ ගවපාන යන නාමය මෙනි. තව කෙනෙක් මෙසේ අදහස් කරති. සූකරමද්දව යනු රසායන විධියකි. එය වනාහි රසායන ශාස්ත්‍රයෙහි දක්නට ලැබේ. එය චුන්ද විසින් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන්පෑම නොවේවායි පිළියෙල කර දුන් දෙයකි. දෙදහසක් දිවයින් පිරිවර කරගත් සිව් දිවයින්වල දෙවියෝ එහි දිව්‍යඕජස් යෙදූහ.

**නාහං තං** යනු මේ සිංහනාදය කුමක් නිසා නාද කරයිද, අනුන්ගේ දෝෂාරෝපණයෙන් මිදීමට තමා විසින් වළඳා ඉතිරි කොටස භික්ෂූන්ට හෝ මිනිසුන්ට හෝ දෙන්නට නුදුන්නේය. වලක් සාරවා එහි දම්මවා විනාශ කළේයැයි කියනු කැමැත්තවුන් මෙය අසා වචනයක් කියන්නට ඉඩක් නොතිබේවායි අනුන්ගේ අපවාදයෙන් නිදහස්වීම පිණිස සිංහනාද පවත්වයි. **භුත්තස්සච සූකර මද්දවෙන** අනුභව කළහුට ඇතිවිය. අනුභව කිරීම නිසා නොවේ. යම්හෙයකින් නොවැළඳුයේ නම් අතිශයින් කටුක වේදනාවක් හටගත්තේය. සිනිඳු බොජුනක් වැළඳූ බැවින් වනාහි තුනී වූ වේදනාවක් ඇතිවිය. ඒ නිසාම පයින් ගමන් කිරීමට හැකිවිය. **විරිච්චමානො** නිතර පැවැති රුධිර විරේචනයට සමානය. **අවොච** යනු තමා විසින් පතන ලද තැන පිරිනිවන්පෑම සඳහා මෙසේ කීය. මේවා වනාහි ධර්මසංග්‍රාහක තෙරවරුන් විසින් යොදන ලද ගාථායැයි දතයුතුයි.

ඉංඝා යනු චෝදනාර්ථයේ නිපාතයකි. **අච්ඡෝදිකා** පැහැදිලි ජලය. **සාතොදිකා** මිහිරි ජලය. **සීතොදිකා** තරමක් සීතල ජලය. **සෙතකා** මඩ නැති. **සුපතිත්ථා** සුන්දර වූ තොටුපලවල්.

**පුක්කුසො** යනු ඔහුගේ නාමයයි. **මල්ලපුත්තො** මල්ල රාජපුත්‍රයා. මල්ල රජවරු තමන්ට ලැබෙන වාරය අනුව රජකම කරත්. යම්තාක් ඔවුන්ට වාරය නොපැමිණෙත්ද එතෙක් වෙළඳාම් කරත්. මොහුද වෙළඳාමම කරන්නේ ගැල් පන්සියයක් සූදානම් කර ධූරවායුව හමා එන කල්හි ඉදිරියෙන් යයි. පසුපසින් වායුව හමන කල්හි ගැල් පදවන්නාව ඉදිරියෙන් යවා තෙමේ පසුපසින් යයි. එකල්හි වනාහි පසුපසින් සුළඟ හැමීය. ඒ නිසා මොහු ගැල් පදවන්නාව ඉදිරියෙන් යවා සම්පූර්ණ රුවන් යානාවක හිඳ කුසිනාරාවෙන් නික්ම පාවා නුවරට යන්නෙමියි මගට පිළිපන්නේය. එබැවින් කියන ලදී. 'කුසිනාරාවේ සිට පාවා නුවරට යන මගට පිළිපන්නේ වෙයි. **ආළාරො** යනු ඔහුගේ නමයි. මොහු වනාහි දීඝපිංගලය. ඔහුට ආළාර කියාද නමක් විය. **කාළාමො** යනු ගෝත්‍ර නාමයයි. **යත්‍රහිනාමා** යනු යම් නමක් **නෙව දක්ඛිස්සති** නොදක්කේය. යම්තැනක ශබ්දය යෙදූ බැවින් වනාහි අනාගත වශයෙන් කියන ලදී. මෙවැන්නක් වනාහි මෙබඳු තැන්වල ශබ්ද ලක්ෂණයයි. **නවෙජරන්තිසු** හැසිරෙන කල්හි **අසනියා ඵලන්තියා** නව ආකාර අසනි බිඳෙන්නාක් මෙන් මහා හඬක් නංවමින් නව ආකාර අසනි (හෙන) නම් **අසඤ්ඤ** - විචක්ක, සතෙර, ගඟර, කපිසීස, මච්ඡවිලොලික, කුක්කුටක දණ්ඩමණික, සුක්ඛාසනී යන නවයයි. එහි **අසඤ්ඤ** හඬ නොනගයි. විචක්ක එක් චක්‍රයක් ඇතිකරයි. සතෙරා යනු විදුලියක් මෙන් වී වැටෙයි. ගඟරා නම් ගුගුරමින් වැටෙයි. කපිසීස නම් බැම ඔසවන වඳුරකු මෙන් වෙයි. මච්ඡවිලොලිකා යනු දඟලන මත්ස්‍යයකු වැනි. **කුක්කුටකා** කුකුළන් මෙන් වී වැටෙයි. **දණ්ඩමණික** නම් නඟුලක් මෙන් වී වැටේ. **සුක්ඛාසනී** නම වැටුනු තැන උදුරාදමයි. **දෙවෙ වස්සන්තෙ** වියළි ගර්ජනාවක් කොට අතරින් පතර වසින්නේ **ආතුමායං** තමා නිසාම වාසයකරමි. **භුසාගාරෙ** ධාන්‍ය ශාලාවේ **එතථෙසො** මේ කාරණයෙහිලා මේ මහා ජනකාය රැස් විය. **ක්ව අහොසි** කොහි සිටියෙහිද? **සො තං භන්තෙ** යනු ස්වාමීනි! ඒ තුඹ. **සිංගීවණ්ණං** රත්‍රන් පාට. **යුගං මට්ඨං** සිනිඳු ඇඳුම් යුගලයක්, සිනිඳු සාටක දෙකක් යන අර්ථයි. **ධාරණීයං** අතරතුරේ මා විසින් දරාගත යුතුයි. ඇඳගත යුතු යන අර්ථයි. හෙතෙම එය වනාහි එබඳු වූ උත්සව දවසෙහිම පැළඳ වෙන වෙලාවන්හිදී බහා තබයි. මෙසේ උතුම් වූ

මංගල වස්ත්‍ර යුගලයක් උදෙසා කීය. **අනුකම්පං උපාදාය** මා කෙරෙහි අනුකම්පා කර අවඥාදෙහි මේ උපචාර වචනයකි. එකක් මට දෙන්න. එකක් ආනන්ද තෙරුන්ටය යන අර්ථයි. කුමක් නිසා එය තෙරුන්වහන්සේ ගත්තේද? එසේය. ගත්තේය. කුමක් නිසාද? මස්තකප්‍රාප්ත වූ කටයුතු ඇති බැවින්. කෙසේ හෝ මොහු මෙබඳු ලාභයක් අත්හැර දමා උපස්ථායක තනතුරට පත්වූයේද ඔහුට ඒ උපස්ථායක තනතුර ලැබින. මස්තකප්‍රාප්ත විය. ඒ නිසා ගත්තේය. කෙනෙක් මෙසේද කියන්නාහුය. ආනන්ද තෙරුන්ට සැලකිල්ලක් ලැබුනේ නැත. වර්ෂ විසිපහක් උපස්ථාන කරන ඔහු විසින් භාග්‍යවතුන් වහන්සේ ලඟින් කිසිවක් ලබන ලද්දේ නොවෙයි. ඔවුන්ගේ එබඳු වචනයකට ඉඩ නොතබා එය පිළිගත්තේය. තවද භාග්‍යවතුන් වහන්සේ, ආනන්ද තෙරුන් එය පිළිගෙන තමා පරිභෝග නොකරයි. මටම පූජා කරන්නේය. මල්ලපුත්‍රයා විසින් ආනන්ද තෙරුන්ට පූජා කරනු ලබන්නේ අත් සංඝයාද පූජා කළා වන්නේය. මෙසේ මොහුට මහත් වූ පුණ්‍යරාශියක් වන්නේ යයි තෙරුන්වහන්සේට එකක් දෙවා වදාළේය. තෙරුන්වහන්සේද ඒ කාරණය නිසාම පිළිගත්තේය.

ධම්මියා කථාය චීවර දාන අනුමෝදනා කථාවෙන් - **භගවතො කායං උපනාමිතං** හැඳීම් පෙරවීම් වශයෙන් එකට ඇලුනු භාග්‍යවතුන් වහන්සේද එයින් එකක් හැඳගත් සේක. එකක් පොරවාගත් සේක. **වීතච්චිකං** විය යම්සේ පහවූ ගිනිදැල් ඇති අඟුරු අතිශයින් බබලයි. එහි පිටත ප්‍රභාවක් නැත. මෙසේ පිටත ප්‍රභාවක් නැතිව දිලිදෙයි යන අර්ථයි. **ඉමෙසු බො ආනන්ද ද්වීසු කාලෙසු** කුමක් නිසා මේ දෙකාලයන්හි මෙසේ වන්නේද? ආහාර විශේෂය නිසාත් බලවත් වූ සතුට නිසාත් මේ දෙකල්හිම සියලු සක්වල දෙවියෝ ආහාරයේ ඕජස් බහාලති. ඒ ප්‍රණීත ආහාරය කුසට ඇතුල්ව ප්‍රසන්න රූපයක් ඇතිකරයි. ආහාර නිසා හටගත් රූපයේ ප්‍රසන්න බව නිසා මනස සයවැනිකොට ඇති ඉන්ද්‍රියයෝ අතිශයින් බබලත්. බුදුවන දවසෙහි ද උන්වහන්සේට අනේක කල්ප කෝටිසත සහශ්‍රයක් රැස්කරන ලද මාගේ කෙලෙස් සමූහය අද ප්‍රහීණ වීයැයි ආවර්ජනා කරන්නහුට බලවත් සතුටක් උපදී. සිත පහදී. සිත ප්‍රසන්න වූ කල්හි ලේ ප්‍රසන්න වෙයි. ලේ ප්‍රසන්න වූ කල මනස හයවැනි කොට ඇති ඉන්ද්‍රියයෝ අතිශයින් බබලත්. පිරිනිවන්පානා දවසේද මම අද දුන් නොයෙක් ලක්ෂගණන් බුදුවරයන් විසින් පිවිසි අමෘතමහා නිර්වාණය නම් වූ නගරයට පිවිසෙන්නෙමියි ආවර්ජනා කරන්නහුට බලවත් සතුටක්

උපදී. සිත පහදී. සිත පහන් කල්හි ලේ පැහැදෙයි. ලේ ප්‍රසන්න වූ කල්හි මනස හයවන කොට ඇති ඉන්‍ද්‍රියයෝ අතිශයින් බබලත්. මෙසේ ආහාර විශේෂයෙන් හා බලවත් සන්තෝෂයෙන් මේ දෙකල්හිම මෙසේ වන්නේයයි දතයුතුයි.

**උපවත්තනෙ** පෙරදිග පැත්තේ නිවත්තන සල්වනයේ **අනන්තරෙන යමකසාලානං** සල්ගස් දෙකක් අතර **සංගීවණ්ණං** යනාදී ගාථා සංගායනා කාලවලදී ඇතුළත් කරන ලදී. **නහාත්වා ච පිවිත්වා ච** මෙහිදී එදා භාග්‍යවතුන් වහන්සේ ජලස්නානය කරන කල්හි ගඟෙහි **මත්ස්‍ය,** කැස්බාදීහුද දෙතෙර වනරොදවල්ද යන සියල්ල ස්වර්ණවර්ණ විය. **අම්බවනං** ඒ ගංඉවුරේම අඹවනයක් **ආයස්මන්තං චුන්දකං** ඒ මොහොතෙහි ආනන්ද තෙරුන් වහන්සේ දියසළුව මිරිකමින් නතරවිය. චුන්ද තෙරුන් වහන්සේ ලඟ සිටියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට ඇමතූ සේක. 'ගන්ත්වාන බුද්ධො නදියං කකුත්ථං' (භාග්‍යවතුන් වහන්සේ කකුත්ථ නදියට වැඩ) යනාදී ගාථාවන් සංගීති කාලයන්හිදී ඇතුළත් කරන ලදී. එහි **පවත්තා භගවා ඉධ ධම්මො** යනු භාග්‍යවතුන් වහන්සේ මේ ශාසනයේ පැවැත්වූ සුවාසූ දහසක් ධර්මස්කන්ධයන් පවත්නේය යන අර්ථයි. **පමුඛෙ නිසීදි** ශාස්තෘන් වහන්සේට පෙරටුව සිටියේය. මෙපමණක්ද තෙරුන් වහන්සේ නොපැමිණියේය. මෙසේ නොපැමිණි 'ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමතීය. **තෙ අලාභා** අන්‍යයන්ට යම් ඒ දානානිසංස සංඛ්‍යාත ලාභයෝ වෙත්ද ඔව්හු අලාභයෝය. **දුල්ලද්ධං** පින් විශේෂයෙන් ලබන ලද නමුත් මනුෂ්‍යාත්මය දුර්ලභය. **යස්සතෙ** යමක මනාව නොපැසුණු සහල් ඇති බව හෝ බොහෝ තෙත් වන බවක් කවුරු දනිත්ද? කවරාකාර හෝ අවසන් පිණ්ඩපාතය වළඳා තථාගතයන් වහන්සේ පිරිනිවන්පෑ සේක. ඒකාන්තයෙන් ඔහු විසින් යම් දෙයක් දුන්නා විය යුතුයි. **ලාභා** යනු දිට්ඨධම්මික සම්පරායික දානානිසංස සංඛ්‍යාත ලාභයෝ. **සුලද්ධං** ඔබගේ මනුෂ්‍යාත්ම භාවය යහපත් ලෙස ලබන ලදී. **සම සමඵලා** සියළු ආකාරයෙන්ම සමසම වූ ඵල ඇති. සුජාතාව විසින් පිළිගන්වන ලද යම් ඒ පිණ්ඩපාතයක් වළඳා තථාගතයන් වහන්සේ බුදුබවට පත්විය. හෙතෙම රාග, දෝස, මෝහ සහිත කාලයෙහි අනුභව කරන ලදී. චුන්ද විසින් දෙන ලද මේ දානය ප්‍රහීණ වූ රාග, දෝස, මෝහ ඇතිකල්හි වළඳන ලදී. කෙසේනම් මේවා සමාන ඵලානිංස ඇත්තේ වන්නේද? පරිනිර්වාණ සමතාවය සමාපත්ති සමතාවය හා අනුස්සරණ සමතාවය නිසාය. භාග්‍යවතුන් වහන්සේ

වනාහි සුජාතාව විසින් දෙනලද පිණ්ඩපාතය වළඳා සවුපාදිසෙස නිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පෑ සේක. චුන්ද විසින් දෙන ලද දානය වළඳා අනුපාදිසෙස නිර්වාණධාතුවෙන් පිරිනිවන්පෑ සේක. මෙසේ පිරිනිවන්පෑමේ සමතාවය නිසාද සමානඵල ඇත්තේය. බුදුවන දවසේද කෝටිවිසිහතර ලක්‍ෂයක් සංඛ්‍යාත සමාපත්තීන්ට සමවැදුනේය. පිරිනිවන්පානා දිනයේද ඒ සියල්ලට සමවදී. මෙසේ සමාපත්ති සමතාවය නිසාද සමානඵල ඇත්තේය. පසුව සුජාතාවටද මෙසේ අසන්නට ලැබෙන. ඒ වෘක්ෂ දේවතාවෙක් නොවේ. බෝධිසත්ත්වයන් වහන්සේය. උන්වහන්සේ එම දවස ඒ පිණ්ඩපාතය වළඳා උතුම් වූ සම්මා සම්බෝධියට පත්විය. උන්වහන්සේට සත් සතියක් යැපෙන්නට එය ප්‍රමාණවත් විය. මෙය අසා සිහිපත් කරන්නා වූ ඇයට බලවත් ප්‍රීතියක්, සොම්නසක් ඇතිවිය. මට මහත් ලාභයක් සිදුවිය. චුන්ද ද මෙසේ සිහිකරයි. මා විසින් අවසාන පිණ්ඩපාතය දෙන ලදී. මාගේ ධර්ම ශීර්ෂය ගන්නා ලදී. මාගේ පිණ්ඩපාතය වලඳා ශාස්තෲන් වහන්සේ අනුපාදිසෙස නිර්වාණධාතුවෙන් පිරිනිවන් පැවේයයි අසා මට මහත් ලාභයක් විය. සිහිකරන්නා වූ මට බලවත් සොම්නසක් ඇතිවිය. මෙසේ අනුස්මරණ සමතාවය නිසාද සමානඵල වේයැයි දතයුතුයි. **යසසං චනනනිකං** පිරිවර පවත්නා ආධිපතෙය්‍ය **සංවතනනිකං** දෙවු බවට පමුණුවන සංයමතො සීල සංයමයෙන් සංවර වන්නහුගේ යන අර්ථයි. **වෙර නං චීයති** පස්ආකාර වෛරය නොවැඩෙයි. **කුසලො ජහාති පාපක** කුසලය වනාහි ඥාණසම්ප්‍රයුක්ත වූයේ ආර්ය මාර්ගයෙන් සම්පූර්ණයෙන් පව්වූ වූ ලාමක වූ අකුසල් අත්හරියි. **රාගදොස මොහකඛයා සනිබ්බුතො** හෙතෙම මෙසේ පව් අත්හැර රාගාදිය ක්‍ෂය කිරීමෙන් කෙලෙස් නිර්වාණයෙන් පිරිනිවන්පෑවේය. මෙසේ චුන්දගේ දක්ෂිණාවද තමාගේද දක්ෂිණෙය්‍ය සම්පත්තිය ප්‍රශංසා කරමින් උදන් ඇනීය.

**සතරවන බණවර වර්ණනාව නිමියේ ය.**

**මහතා භික්ඛු සංඝෙන සද්ධිං** මහත් වූ භික්‍ෂු පිරිසක් සමග මෙහි භික්‍ෂූන්ගේ සංඛ්‍යාවේ සීමාවක් නැත. බෙළුව ගමෙහිදී වේදනාව නැතිකිරීමේ පටන් නොබෝකලකින්ම භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පාන්නේයැයි අසා ඒ ඒ තැන්වලින් පැමිණි භික්‍ෂූන් අතුරෙන් එක්

භික්ෂුවක්වත් ආපසු ගියේ නැත. ඒ නිසා ගණන ඉක්මවාගිය භික්ෂු පිරිසක් වූහ. **උපවත්තනං මල්ලානං සාලවනං** යම්සේ වනාහි කලම්බනදී තීරයෙන් රජමව්විහාර දොරටුවෙන් ථූපාරාමයට යායුතුයි. මෙපරිද්දෙන් හිරඤ්ඤවතියේ ඉහලම තීරයෙන් සල්වන උයනයි. යම්සේ අනුරාධපුරයේ ථූපාරාමය මෙනි. මෙසේ එය කුසිනාරාවෙහි වෙයි. යම්සේ ථූපාරාමයේ දකුණු දොරටුවෙන් නගරයට පිවිසෙන මග ප්‍රාචීන දිසාව දෙසට ගොස් උතුරු පැත්තෙන් නතරවෙයිද එපරිද්දෙන් උයනෙන් සල්වන පෙතට ප්‍රාචීනාභිමුඛව ගොස් උතුරෙන් නතරවන්නේය. ඒ නිසා එය උපවත්තන යැයි කියනු ලැබේ. **අන්තරෙන යමකසාලානං උත්තරසීසකං** ඒ මංචකයෙහි එක් පැත්තක සල්ගස්පෙළ ශීර්ෂය දෙසින් වෙයි. එකක් පා පැත්තේය. එහිද එක් තරුණ සල්ගසක් හිසට ඉතා ලංවද එකක් පාදයට ඉතා ලංවද වෙයි. තවද යමක සාලා යන්නෙන් මුල, කඳ, අතු පත්‍ර යන මේවායින් එකිනෙක ගැටී සිටියා වූ සල්ගස්ද කියන ලදී. **මඤ්චකං පඤ්ඤාපෙහි** ඒ උයනෙහි රාජ කුලයට නිදන මංචකයක් ඇත. ඒ ගැන සළකා මංචකයක් සූදානම් කරන්නයැයි කීය. තෙරුන් වහන්සේද එයම සූදානම් කර දුන්නේය. **කිලන්තොස්මි ආනන්ද නිපජ්ජිස්සාමි** ආනන්ද, ක්ලාන්ත වූයේ වෙමි. හොවින්නෙමි. තථාගතයන් වහන්සේට වනාහි :-

**ගොචරි කළමෙබාච ගංගෙය්‍යො පිංගලො පබ්බතෙය්‍යකො**
**හෙමවතො ච තම්බොච මන්දාකිනී උපොසථො**
**ඡද්දන්තොයෙව දසමො එතෙ නාගානමුත්තමා ති**

(ගොචරී - කලම්බ - ගංගෙය්‍ය - පිංගල පබ්බතෙය්‍යක - හෙමවත -තම්බ - මන්දාකිනී - උපොසථ හා දසවැනි ඡද්දන්ත යන මොව්හු හස්තීන් අතර උත්තමය.)

මෙහිද යම් ඒ ගොචරී සංඛ්‍යාත වූ ප්‍රකෘති හස්තීන් දසදෙනෙකුගේ බලය ඒ එක කලම්බක ඇතෙකුට ඇත. මෙසේ දස ගුණයකින් වැඩුනු ගණනින් ප්‍රකෘති ඇතුන් කෝටි සහශ්‍රයක බලප්‍රමාණය වූ ඒ සියලුම බල චුන්දගේ පිණ්ඩපාතය වැළඳූ තැන් පටන් පෙරහන්කඩයට දමන ලද ජලය මෙන් පිරිහීමට පත්විය. පාවා නගරයෙන් ගව් තුනක් ඇත කුසිනාරාව පිහිටියේය. මේ අතරතුර විසිපස් තැනක හිඳ මහත් උත්සාහයෙන් යන්නේ නමුදු හිරු බැසයන වේලෙහි, සන්ධ්‍යා වේලාවේ භාග්‍යවතුන් වහන්සේ සල්වනයට වැඩියේය. මෙසේ රෝගය සියළු නිරෝගී බව මර්ධනය

කරමින් එයි. මේ කාරණය දක්වන්නට මෙන් සියලු ලෝකයාට සංවේගය ඇතිකරන වචනයක් වදාරමින් 'ආනන්දය, ක්ලාන්ත වූයේ වෙමි. වැද හොවින්නෙමි'යි වදාළේය. කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ මෙසේ මහත් උත්සාහයෙන් මෙහි වැඩියේද? වෙන තැනක පිරිනිවන් පාන්නට නොහැකිද? පිරිනිවන් පාන්නට වෙන කිසිතැනක නොහැක. කරුණු තුනකක් හේතුවෙන් මෙහි වැඩියේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ බලයි. මා වෙන තැනක පිරිනිවන් පෑකල්හි මහා සුදස්සන සූත්‍රයට අර්ථෝත්පත්තියක් සිදු නොවේ. කුසිනාරාවෙහි පිරිනිවන් යම්හෙයකින් මම දෙව්ලොව විඳිය යුතු සැපසම්පත් මනුෂ්‍ය ලෝකයේදීම අනුභව කරන ලදී. එය බණවර දෙකකින් සරසා දේශනා කරන්නෙමි. මාගේ ඒ දේශනාව අසා බොහෝ කුසල් කරන්නට සිතත්. තව දෙයක්ද දකී. මා වෙනතැනක පිරිනිවන්පාන්නේ සුභද්‍ර නොදකී. ඔහුද බුදුවරයකු විසින් හික්මවිය යුත්තෙකි. ශ්‍රාවකයන් විසින් හික්මවිය යුතු කෙනෙක් නොවේ. ශ්‍රාවකයෝ ඔහුව හික්මවන්නට අපොහොසත් වෙති. කුසිනාරාවේ පිරිනිවන්පාන්නට සිටින මා වෙත පැමිණ ඔහු ප්‍රශ්න විචාරන්නේය. ප්‍රශ්න විසඳා අවසානයේ සරණයන්හි පිහිටා මා සමීපයේ පැවිද්ද උපසම්පදාව ලබා කමටහන් ගෙන මා ජීවත්ව සිටියදීම රහත්බවට පැමිණ අවසාන ශ්‍රාවකයා නම් වන්නේය. තවත් කරුණක් දකී.

මා වෙන තැනක පිරිනිවන්පානා කල්හි ධාතු බෙදා ගැනීමේ මහා කලබලයක් ඇතිවෙයි. ගඟක් මෙන් ලේ ගලන්නේය. කුසිණාරාවෙහි පිරිනිවන්පෑ කල්හි දෝණ නම් බ්‍රාහ්මණයා ඒ විවාදය සංසිඳුවා ධාතූන් බෙදා දෙන්නේය. මේ කාරණ තුන නිසා භාග්‍යවතුන් වහන්සේ මහත් උත්සාහයකින් මෙහි වැඩියේ යැයි දතයුතුයි. **සීහසෙය්‍යං** යනු මෙහි කාමභෝගී සෙය්‍යාව, ප්‍රේත සෙය්‍යාව, සීහසෙය්‍යාව, තථාගත සෙය්‍යාව කියා සෙය්‍යාවන් සතරක් ඇත. මහණෙනි, එහි බොහෝසෙයින් කාමභෝගී සත්ත්වයෝ වම්ඇලයෙන් නිදාගනිත්. මේ කාමභෝගී සෙය්‍යාව නම් වේ. ඔවුන් අතරද බොහෝ සෙයින් දකුණු ඇලයෙන් නිදන්නෝ නැත. මහණෙනි, බොහෝසෙයින් ප්‍රේතයෝ උඩුකුරුව සයනය කරත්. මේ ප්‍රේත සෙය්‍යාවයි. අල්ප වූ මස් ලේ ඇති බැවින් ප්‍රේතයෝ ඇට සමූහයේ ගැටීම නිසා එක් ඇලයකින් නිදන්නට නොහැකි වෙත්. උඩුකුරුවම සයනය කරත්. මහණෙනි! මෘගරාජ වූ සිංහයා දකුණු ඇලයෙන් නිදාගනී. -පෙ- සතුටු සිතැත්තේ වෙයි. මේ සීහ සෙය්‍යාවය.

තේජසින් උසස් බැවින් මෘගරාජ වූ සිංහයා ඉදිරි ගාත් දෙක එක තැනකත් පසු ගාත් දෙක එක තැනකත් තබා නගුට කලවා දෙක අතර තබා පෙරපාද පසුපාද හා නගුට තිබෙන ඉඩ සළකා ඉදිරි පාදෙක මත හිස තබා දවස් හතක්ද සයනයකොට පිබිදින්නේ තැති නොගෙන පිබිදෙයි. හිස පමණක් ඔසවා ඉදිරිපාද ආදිය තිබෙන ඉඩකඩ සළකා බලයි. ඉදින් කිසි ඉඩක් නොමැතිව තබාගෙන ඇත්නම් මෙය ඔබගේ ජාතියේ ශූරභාවයට නොගැලපේයැයි නොසතුටුව එහිම නිදයි. ගොදුරු පිණිස නොයයි. අත්නොහැර එතනට සිටිකල්හි තොපගේ ජාතියටත් ශූරභාවයටත් මෙය ගැලපේදැයි තුටුපහටු වූයේ නැගිට සිංහාවලෝකනයෙන් බලා කෙසරු ගසා තුන්වරක් සිංහනාදකොට ගොදුරු පිණිස පිටත්වෙයි.

චතුර්ථ ධ්‍යාන සෙය්‍යාව වනාහි තථාගත සෙය්‍යාව යැයි කියනු ලැබේ. ඒ අතර මේ සීහසෙය්‍යාව ආවේය. මෙය වනාහි තේජසින් ඔදවැඩුනු ඉරියාපථ ඇති බැවින් උතුම් සෙය්‍යාව නම් වේ. පාදෙ පාදං යනු දකුණුපාදයේ වම්පාදය. අච්චාධාය ටිකක් ඉක්මවා තබා ගොප් ඇටයෙන් ගොප්ඇටය, දණින් හෝ දණෙහි, ගැටෙන්නේ නිතර වේදනා උපදී. සිත එකඟ නොවේ. නිදීම අපහසුය. යම්සේ වනාහි නොගැටෙයිද මෙසේ ඉක්මවා තබන ලද වේදනා නූපදී. සිත එකඟ වෙයි. සයනය පහසු වෙයි. ඒ නිසා මෙසේ හොත්තේය. නොනැගිටින සෙය්‍යාවකින් සිටිය බැවින් මෙහි නැගිටීමේ සංඥාව මෙනෙහිකොටයැයි නොකියන ලදී. කායික වශයෙන් මෙහි නොනැගිටීම දතයුතුයි. නිද්‍රා වශයෙන් ඒ රාත්‍රිය භාග්‍යවතුන් වහන්සේගේ භවාංග සිතට අවකාසයක් නොවීය. පළමු යාමයෙහි මල්ල රජදරුවන්ට ධර්මදේශනා කිරීම විය. මධ්‍යම යාමයෙහි සුභද්දට ද පශ්චිම යාමයේ භික්ෂූන්ට ද අවවාද කළේය. ඉතා අලුයම පිරිනිවන්පෑ සේක. සබ්බඵාලි ඵුල්ලා යනු හාත්පස සියළු වෘක්ෂ මල්ඵලවලින් ගැවසී ගත්තේය. හුදෙක් එම උද්‍යානයෙහි පමණක් නොවේ. සියලුම දස සහශ්‍රී ලෝකධාතුවල මල් හටගැනීමට සුදුසු ගස් මල්වලින් ගැවසී ගත්තේය. ඵල හටගන්නා ගස් ගෙඩිවලින් බරවිය. සියලු ගස්වල කඳෙහි කඳමල් අතුවල අතුමල් වැල්වල මල් ආකාසවල තාරකා මල් පොළෝතලය බිඳගෙන දඬුමල්ද පිපින. මුළු සමුද්‍රයට පස්වනක් පද්මයන්ගෙන් ගැවසී ගත්තේය. යොදුන් තුන්දහසක් පලල හිමවත සනට සැදුනු මොණරපිල් කළඹක් මෙන් නිරන්තරයෙන් මාලාදාමයන්හි කෙසරුවලින් ගැවසීගත්තාක් මෙන් මනාව පොළා බඳින ලද මුදුන්

මල්කඩක් මෙන් සම්පූර්ණයෙන් පිරුණු මල් සුමුගක් ලෙසද අතිශයින් සිත්කළු විය. **තෙ තථාගතසස සරීරං ඔකිරනති** ඒ යමක සල්උයනේ භූමි දේවතාවන් විසින් සොලවන ලද කඳ අතු විටපවලින් මල් තථාගතයන් වහන්සේගේ දේහයේ විසුරුවත්. ශරීරය මත්තේ මල් විසුරුවත් යන අර්ථයි. **අභිප්පකිරනති** නිතර, පුනපුනා විසුරුවත්. **දිබ්බානි** දෙව්ලොව නන්දා පොකුණේ හටගත් ඒවා සුවර්ණ වර්ණය. කොලකුඩයක් බඳු පත්‍රය. මහාතිඹක් ප්‍රමාණ රේණු ඇත. හුදෙක් මදාරා මල් පමණක් නොවේ. අන්‍ය වූද දිව්‍යමය පරසතු කෝවිළාර පුෂ්පයන්ද ස්වර්ණ කරඬුද රජතමය කරඬුද පුරව පුරවා සක්වල මුවවිට ද දෙව්ලොව ද බ්‍රහ්මලෝකවලද සිටියා වූ දෙවියන් විසින් දමන ලද මල් අහසින් වැටේ.

**තථාගතසස සරීරං** අතරතුර නොවිසිරීව අවුත් අවුත් මල්රේණු තථාගතයන් වහන්සේගේ සිරුර වසා සිටී. **දිබ්බානිපි චන්දන චුණ්ණානි.** වරවාරණ දේවතා නම් වූ එක් දීර්ඝායුෂ්ක දෙවියෙක් මහා පුරුෂයා මිනිස් ලොව ඉපිද බුදුවන්නේ යැයි අසා පිළිසිඳ ගන්නා දවසේ එය රැගෙන යන්නෙමියි මල්මාලාවක් ගොතන්නට පටන්ගත්හ. එය ගොතමින් සිටින අතර මහාපුරුෂයාණෝ මව්කුස පිළිසිඳ ගත්තෝය. තොප කවුරුන් සඳහා ගොතන්නේදැයි ඇසූවිට, තවම ගොතා අවසන් නැතැයිද කුසෙන් බිහිවන දිනයේ රැගෙන යමියි කීහ. නැවත මව්කුසින් නික්මියේ යැයි අසා මහාභිනිෂ්ක්‍රමණ දිනයේ යන්නෙමියි එකුන් තිස්වසක් ගිහිගෙයි සිට අද මහාභිනිෂ්ක්‍රමණය කළේයැයි අසා බුදුවන දවසේ යන්නෙමුයි, සයවසක් මහාප්‍රධන් වීර්යය කොට අද බුදුවූයේ යැයි අසා දම්සක් පවත්වන දිනයේ යන්නෙමියි සත්සතියක් බෝමැඩ ගතකර ඉසිපතනයට ගොස් දම්සක් පැවැත්වීම කළේයැයි අසා යමක ප්‍රාතිහාර්යය දවසේ යන්නෙමියි අද යමක ප්‍රාතිහාර්ය පැවැත්වී යැයි අසා දේවාරෝහණ දවසේ යන්නෙමුයිද අද දේවාරෝහණය කළේයැයි අසා ආයු සංස්කාර හරනා දිනයේ යන්නෙමුයි ද අද ආයු සංස්කාර හළේයයිද අසා තවමත් අවසන් නැතැයි පිරිනිවන්පානා දිනයේ යන්නෙමුයි අද භාග්‍යවතුන් වහන්සේ සල්ගස් දෙක අතර දකුණු ඇලයෙන් සිහිනුවණින් සිංහසෙය්‍යාවෙන් යුක්තව ඉතා අලුයම් වේලෙහි පිරිනිවන් පාන්නේය. තුඹලා කාහට මාලා ගොතන්නහුදැයි අසා නැවත මේ කුමක්ද? අදම මව්කුස පිළිසිඳ ගත්තේය. අදම මව්කුසින් බිහිවිය. අදම මහාභිනිෂ්ක්‍රමණය කළේය. අදම බුදුවිය. අදම දම්සක් පැවැත්විය. අදම යමක ප්‍රාතිහාර්ය දැක්විය. අදම දෙව්ලොවින් බැස්සේය. අදම ආයු සංස්කාර හළේය.

අදම පිරිනිවන් පාන්නේය. පසුදා කැඳ පානය කරන වෙලාවක්වත් තිබිය යුතුය. දස පාරමිතා පුරා බුදුබවට පත්වූවහුට මෙය යෝග්‍ය නොවන්නේ යැයි ගොතා අවසන් නොකළ මාලාවන් රැගෙන අවුත් සක්වළ ඇතුළේ අවකාශයක් නොලබන්නාහු සක්වල මුවවිටෙහි තැනක් ලැබ සක්වල මුවවිටෙන් ද දුවන්නවුන් අතින් අත, ගෙලින් ගෙල ගෙන රත්නත්‍රය අරබයා දෙතිස්මහා පුරුෂ ලක්‍ෂණයන්, ෂඩ්වර්ණ රැස්, දසපාරමී, අඩසක් ජාතක සියයක් සොළොස් බුද්ධඥානයන් අරභයා ගායනා කර ඒ ඒ අවසන්හි මහා යසස්, මහා යසස් යැයි කියත්. මේ ගැන මෙය කියන ලදී. තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍යමය සංගීතය අහස්තලයේ වාදනය වේ.

භාග්‍යවතුන් වහන්සේ වනාහි සල්ගස් දෙක අතර දකුණු ඇලයෙන් වැඩ සිටියේම පොළවේ සිට සක්වල මුවවිටත් සක්වළ මුවවිටෙන් බඹලොව දක්වාත් රැස්වූ පිරිස නිසා මහත් වූ උත්සවයක් දැක ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට දැන්වීය. එබැවින් කියන ලදී. 'ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට -පෙ- තථාගතයන් වහන්සේ පූජා පිණිස.

මෙසේ මහා සත්කාර දක්වා එයින් ද තමන්ගේ නොහැකියාවම පෙන්වමින් නඛො ආනඤ එතතාවතා ආදිය කීය. මෙය කියන ලදී. ආනන්දය, දීපංකර පාදමූලයේ හොත් මා විසින් අෂ්ට ධර්මයන් ගලපා අභිනීහාර කරන්නේ මාලාදාම තූර්ය සංගීත සඳහා ප්‍රාර්ථනාව කළේ නැත. මේ සඳහා පාරමිතා පූරණ ලද්දේ නොවේ. ඒ නිසා මම මේ පූජාවෙන් පුදන ලද්දේ නොවෙමි. කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ වෙන තැන්වලදී 'උමමා' (එනම් තිල්පාට මල්වර්ගය) මලක් පමණක්වත් ගෙන බුදුගුණ සිහිකර කරන ලද පූජාවෙන් බුද්ධඥානයෙන් ද පිරිසිඳ දැක්විය නොහැකි විපාකයක් වර්ණනා කර මෙහිදී මෙබඳු මහා පූජාවක් ප්‍රතික්‍ෂේප කරන්නේද? පිරිසට අනුග්‍රහ පිණිසත්, සසුනේ බොහෝකල් පැවැත්ම සඳහාත්ය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ ප්‍රතික්‍ෂේප නොකරන්නේද අනාගතයෙහි සීලය පැමිණි තැන සීලය පුරන්නේ නැත. සමාධියට පැමිණි තැන සමාධිය පුරන්නේ නැත. විදර්ශනාව එළඹි තැන විදර්ශනාවට පත් නොවෙත්. උපස්ථායකයන් සමාදන් කරවා පූජාවන් කරමින් හැසිරෙන්නාහ. ආමිස පූජාව නම් වූ මෙය ශාසනය එක දවසකුදු, එක් කැඳ බොන මොහොතකුදු පවත්වා ගන්නට නොහැකි වෙයි. මහා

විහාරය හා සමාන වූ විහාර දහසක් මහාචෛතිය සමාන චෛත්‍ය දහසක් ශාසනය දරා සිටින්ට අසමත් වෙයි. යමකු විසින් කරන ලදද ඔහුටම වෙයි. සම්‍යග් ප්‍රතිපත්තිය වනාහි තථාගතයන් වහන්සේට යෝග්‍ය පූජාවයි. එයම ඔහු විසින් පතන ලදී. එයින් ශාසනයද දරාසිටීමට හැකිවෙයි. ඒ නිසා එය දක්වන්නේ **යො ඛො ආනන්ද** ආදිය පැවසීය. එහි **ධම්මානුධම්ම පටිපන්නො** යනු නවආකාර ලෝකෝත්තර ධර්මයන් අනුධර්මයනුත් පූර්වභාග ප්‍රතිපදාවට පිළිපන්නේ එම ප්‍රතිපදාවම සුදුසු බැවින් සාමීචි (නිවැරදි පිළිවෙල) යයි කියනු ලැබේ. ඒ නියම ප්‍රතිපදාවට පත්වූයේනුයි = **සාමීචිපටිපන්නො** - එම පූර්වභාග ප්‍රතිපදා සංඛ්‍යාත අනුධර්මයේ හැසිරෙයි. පුරයි. අනුධම්මචාරී නම් වේ. පුබ්බභාග ප්‍රතිපදාව නම් සීලය නම් වූ ආචාර ප්‍රඥප්තියත් ධුතංග සමාදානයෙන් ගෝත්‍රභූ සිත දක්වා සම්මා පටිපදා යැයි දතයුතුයි. ඒ නිසා යම් භික්ෂුවක් අගරු වූ කාරණා සයක පිහිටා පැනවීම ඉක්මවා යයිද නුසුදුසු ලෙස ජීවිකාව කෙරේද මේ ධම්මානුධම්ම පටිපදාවට පිළිපන්නේ නොවෙයි. යමෙක් වනාහි තමාට පනවන ලද ශික්ෂාපද, ශාස්තෘන් වහන්සේ නමැති වෙරළ, තථාගතයන් නමැති සීමාව තථාගතයන් නමැති සීමා තුල (කලු තුල) අණුමාත්‍රයක්වත් නොඉක්මවයි. මේ ධර්මානුධර්ම ප්‍රතිපදාවට පිළිපන් වන්නේය. භික්ෂුණියටද එසේමය. යම් උපාසකයෙක් පංච වෛරයන්, දශ අකුසල කර්මපථයන් සමාදන්ව ජීවත්වෙයිද මෙය ධර්මානුධර්ම ප්‍රතිපදාවට පිළිපන්නේ නොවෙයි. යමෙක් වනාහි තුන්සරණයෙහි පිහිටා පන්සිල් දසසිල් සම්පූර්ණ කරන්නේ වෙයිද මසකට උපොසථ අටක් කරයිද දන් දෙයිද සුවඳ පූජා මල් පූජා කරයිද මවට උපස්ථාන කරයිද පියාට උපස්ථාන කරයිද ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට උපස්ථාන කරයිද මොහු ධර්මානුධර්ම ප්‍රතිපදාවට පිළිපන් තැනැත්තා වන්නේය. උපාසිකාවටද එසේමය. **පරමාය පූජාය** යනු උතුම් පූජාවෙන්. මෙය නිරාමිස පූජාවට මගේ ශාසනය රඳ සිටින්නට හැකිවෙයි. යම්තාක් මේ සිව්පිරිස මා මේ පූජාවෙන් පුදන්නාහුද එතෙක් කල් මාගේ ශාසනය නබෝමැද පූර්ණ චන්ද්‍රයා මෙන් බබලන්නේ යයි දක්වයි.

**අපසාදෙසි** බැහැර කළේය. **අපෙහි** ඉවත්ව යන්න. තෙරුන් වහන්සේ එක වචනයෙන්ම තල්වැට දමා එකත්පසෙක සිටියේය. **උපට්ඨාකො** ආදී ප්‍රථම බෝධියෙහි තාවකාලික උපස්ථායක බව ගැන කීය. ස්වාමීනි! මේ ආයුෂ්මත් උපවාණ තෙරුන්ය. මෙසේ තෙරුන්

විසින් කියන ලද කල්හි ආනන්ද තෙර උපවාණ තෙරුන් - දොස් සහිත බව සැළකීය. දැන් ඔහුගේ නිදොස් බව කියන්නෙමියි භාග්‍යවතුන් වහන්සේ 'යෙභුයෙ‍්‍යන ආනන්‍ද' (ආනන්දය, බොහෝ සෙයින්) ආදිය පැවසූහ. එහි යෙභුයෙ‍්‍යන මෙය අසඤ්ඤසත්තයේත් අරූප දේවතාවන්ගේත් නොගොස් නතරවීම ගැන කීය. අපුඨයො ස්පර්ශ නොවූ බර නොවූ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයේ කෙසගක් ප්‍රමාණ අවකාසයේ සියුම් වූ ආත්මභාව මවාගෙන දහය දහය බැගින් මහේශාක්‍ය දෙවිවරු සිටියහ. ඔවුන්ට ඇතින් විස්ස විස්ස ඔවුන්ට ඇතින් තිහ තිහ. හතළිහ හතළිහ. පනහ පනහ. හැට හැට ආදී වශයෙන් දෙවියෝ සිටියහ. ඔව්හු ඔවුනොවුන් අතින් හෝ පාදයෙන් හෝ වස්ත්‍රයෙන් හෝ බාධා නොකරත්. ඉවත්වන්න. නොගැටෙන්න යනුවෙන් කීමක්වත් නැත. සාරිපුත්‍රය, ඒ දේවතාවෝ වනාහි දසයක් වී, විස්සක් වී, තිහක් වී, හතළිහක් වී, පනහක් වී, හැටක් වී, ඉදිකටු තුඩක් මත්තේ ද සිටිත්. ඔවුනොවුන්ට බාධා නොකරත් යැයි කියන ලද අයුරින්ම වූහ. ඔවාරෙනෙතා ආවරණය කරමින් තෙරුන්වහන්සේ වනාහි ප්‍රකෘතියෙන්ම ඇත්පැටියෙක් මෙන් විශාල සිරුරක් ඇත්තේය. පංශුකූල චීවරය පොරවා ගත්විට තවත් විශාල විය. තථාගතං දස්සනාය භාග්‍යවතුන් වහන්සේගේ මුහුණ බලන්නට නො ලබන්නාහු මෙසේ ඝෝෂා කළහ. කිම, තෙරුන් විනිවිද බලන්නට නොහැක්කෙමු. දෙවියෝ වනාහි පෘථග්ජනයන් විනිවිද දකින්නට සමත් වෙති. රහතන් වහන්සේලාව එසේ බැලිය නොහැක. තෙරුන්ගේ මහේශාක්‍ය බව නිසාත් තේජස නිසාත් ලඟාවන්නට ද නොහැකි වෙත්. කුමක් නිසා තෙරුන් වහන්සේ තේජසින් පිරුණේ වන්නේද? අන්‍ය රහතන් වහන්සේලා එසේ නොවේ. යම්හෙයකින්ද කාශ්‍යප බුදුන්ගේ චෛත්‍යයෙහි ආරක්ෂක දේවතාවෙක් සිටියේය. විපස්සී බුදුන් පිරිනිවි කල්හි ඒකඝන වූ රන්ගොඩක් බඳු ධාතු ශරීරය තබා එකම චෛත්‍යයක් කළහ. දීර්ඝායුෂ්ක බුදුවරයන් වහන්සේලාට වනාහි එකම චෛත්‍යයක් වෙයි. මිනිස්සු එය රියනක් දිගින් ද වියනක් පළලින් ද අඟල් සතරක් ඝනකමින් ද ස්වර්ණමය ගඩොල්වලින් ද රත්හිරියල් මනෝසිලා මැටි ද එක් කර තලතෙලින් අනා යොදුනක් පමණ උස් කළහ. අනතුරුව භූමි දේවතාවන් යොදුනක් පමණද අනතුරුව ආකාස දේවතාවන්ද අනතුරුව උණුසුම් වළාහක දෙවිවරු ද අනතුරුව ජල වලාකුළුවල දෙවියෝ ද පසුව අහසේ දෙවිවරුද අනතුරුව චාතුර්මහා රාජික දෙවිවරුද, පසුව තව්තිසා දෙවිවරුද යොදුනක් පමණ උස්කළහ. මෙසේ සත්යොදුන් චෛත්‍යයක් විය.

මිනිසුන් මල්, ගඳ, වස්ත්‍ර ආදිය රැගෙන පැමිණි කල්හි ඒවා ආරක්ෂක දේවතාවෝ ගෙන ඔවුන්ට පෙනෙන්නට තිබෙන චෛත්‍යවලට පුදත්. එකල්හි මේ තෙරුන්වහන්සේ බ්‍රාහ්මණ මහාසාල කුලයක ඉපිද එක් කසාවතක් රැගෙන ගියේය. දෙවියෝ ඔහුගේ අතින් ඒ වස්ත්‍රය ගෙන චෛත්‍යයට පිදූහ. බ්‍රාහ්මණයා එය දැක ප්‍රසන්න සිත් ඇත්තේ මම ද අනාගතයෙහි මෙබඳු බුදුවරයකුගේ චෛත්‍යයෙහි ආරක්ෂක දේවතාවා වෙමියි ප්‍රාර්ථනාකොට එයින් චුතව දෙව්ලොව උපන්නේය. දෙව්ලොවත් මිනිස්ලොවත් සැරිසරද්දී කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලොව පහළවී පිරිනිවන්පෑවේය. උන්වහන්සේට ද එකම ධාතු ශරීරයක් විය. එය රැගෙන යොදුනක් පමණ චෛත්‍යයක් කරවූහ. හෙතෙම එහි ආරක්ෂක දේවතාවා වී සසුනෙහි අතරක් නැතිව දෙව්ලොව ඉපිද අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එයින් චුතව මහාසාර කුලයක පිළිසිඳ ගෙන, ඉන් නික්ම පැවිදිව රහත්බවට පත්වූයේය. මෙසේ චෛත්‍යයේ ආරක්ෂක දේවතාවා වී ආ බැවින් තෙරුන්වහන්සේ බොහෝ තේජස් ඇත්තේ වී යයි දතයුතුයි.

**දෙවතා ආනන්ද උජ්ඣායන්ති** මෙසේ ආනන්දය, දෙවියෝ හඬනගත්. මාගේ පුත්‍රයාගේ අන් කිසිදු දෝෂයක් නැත්තේ යයි දක්වයි. **කථං භූතාපන භන්තෙ** (ස්වාමීනි, කෙසේ වූයේද) යැයි කුමක් නිසා කීවේද භාග්‍යවතුන් වහන්සේ නුඹලා දෙවියෝ උද්ඝෝෂණය කරත්යැයි කියන්නහුය. කෙසේ වූවාහු වනාහි නුඹලා මෙනෙහි කරන්නහුද කිම ඔබගේ පරිනිර්වාණය ඉවසත්දැයි නොපවසමි. ඔවුන් එය නොඉවසන බවක් දක්වමින් **සන්තානන්දා** ආදිය පැවසූහ. එහි **පඨවිසඤ්ඤිනියො** යනු අහසෙහි පොළවක් මවා එහි පඨවී යන හැඟීම ඇතිව. **කන්දන්ත** හඬත්. **ඡින්නපාතං පපතන්ති** මැද සිඳුනාක් මෙන් වී එහෙන් මෙහෙන් වැටෙත්. **ආවට්ටන්ති** වැටෙන්නාහු වැටුනු තැනටම එත්. **විවට්ටන්ති** වැටුනු තැනින් වෙන තැනකට වැටෙමින් යති. තව ද දෙපා විහිදුවා වරක් ඉදිරියටත් වරක් පසුපසටත් වරක් දකුණටත්, වරක් වමටත්, පෙරළෙමින් වැටෙත්. වෙන තැන්වලට වැටෙත් යයි කියයි. **සන්තානන්ද දෙවතා පඨවියං පඨවිසඤ්ඤිනියො** ප්‍රකෘති පෘථිවිය වනාහි දෙවියෝ දරන්නට නොහැකි වෙත්. එහි 'හත්‍ථක' බ්‍රහ්මයා මෙන් දෙව්වරු කිඳ බසිත්. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. 'හත්‍ථක, ඕලාරික වූ ආත්මභාවයක් නිර්මාණය කරන්න. ඒ නිසා යම් දේවතාවෙක් පොළවෙහි පොළවක් මැවීද ඒ ගැන **කීය. පෘථිවියෙහි පඨවි සඤ්ඤා ඇති - වීතරාගා** ප්‍රහීණ වූ දොම්නස්

ඇති ගල්ටැඹක් බඳු අනාගාමී ක්ෂීණාශ්‍රව දේවතාවෝ. **වස්සං වුත්ථා** බුද්ධකාලයෙහි වනාහි අවස්ථා දෙකකදී භික්ෂූහු රැස්වෙත්. වස් එළඹීම ළං වූ කල්හි කමටහන් ගැනීම පිණිස වස්වසන ලදුව ගන්නා ලද කමටහන් උදව් කරගෙන උපදවාගත් විශේෂත්වයන් දන්වා සිටීම සඳහා බුද්ධකාලයේදී මෙන්ම ලංකාවේදී ද ගඟෙන් එගොඩ භික්ෂූහු ලෝහ ප්‍රාසාදයේ රැස්වූහ. මෙගොඩ භික්ෂූහු තිස්සමහා විහාරයේ රැස්වූහ. ඔවුනතුරෙන් ගඟෙන් එගොඩ භික්ෂූහු කුණු ඉවත් කිරීම, ඇමදීම ආදියට අවශ්‍ය දේ රැගෙන මහා විහාරයේ රැස්ව චෛත්‍යයේ සුණු පිරියම්කොට වසන ලද වස් ඇතිව අවුත් ලෝහප්‍රාසාදයේ රැස්වන්නයැයි වත් දක්වා පහසු තැන්වල වාසය කොට වසන ලද වස් ඇතිව අවුත් ලෝහප්‍රාසාදයේ පංචනිකාය මණ්ඩලයෙහි යම් කෙනෙකුට පෙළ ප්‍රගුණද ඔවුහු පෙළ සජ්ඣායනා කරත්. යම්කෙනෙකුට අටුවාව ප්‍රගුණ ද ඔව්හු අටුවා සජ්ඣායනා කරත්.

යමෙක් පාලිය හෝ අටුවාව හෝ නොසළකා හැර සිටිත්ද එය කවරකු ලඟින් ඉගෙන ගත්තේදැයි අසා එය නිවැරදි කර උගන්වත්. ගඟෙන් මෙගොඩ භික්ෂූහු ද තිස්සමහා විහාරයෙහි මෙසේම කරත්. මෙසේ දෙකාලයෙහිම භික්ෂූන් රැස් වූ කල්හි යමෙක් කලින් වස් එළඹීම සඳහා කමටහන් ගෙන ගියාහුද විශේෂ දැන්වීම සඳහා එත්. මෙබඳු අය වෙනුවෙන් **පුබ්බෙ භන්තෙ වස්සං වුත්ථා** (ස්වාමීනි, පෙර වස් වැසුවෙමු.) ආදිය පැවසීය. **මනොභාවනීයෙ** සිතින් වඩන ලද, පුරුදු කරන ලදද, යම්කෙනෙක් වනාහි මනස වඩත්ද රාගාදී කෙලෙස් පාකර හැරියේද මෙබඳු අයය යන අර්ථයි. තෙරුන් වහන්සේ වනාහි වත්සම්පන්න වූයේ මහලු භික්ෂුවක් දැක දැඩිව් හිඳගත්තේ නැත. පෙරගමන්කොට අතින් කුඩයද පාත්‍රා සිවුරුද ගෙන ආසනයක් සූදානම් කර දෙයි. එහි හිඳගත්තහුට වතාවත් කර සෙනසුන පිළියෙල කර දෙයි. නවක භික්ෂුවක් දැක තුෂ්ණිම්භූතව නොහිඳියි. ලඟ සිට වත්කරවයි. ඔහු ඒ වතාවත්වල පිරිහීමක් ප්‍රාර්ථනා නොකරන්නේ මෙසේ කීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, ආනන්ද තෙරුන් මනසට සුවදෙන දර්ශනයක් නොලබමියි සිතයි. දැන් ඔහුට මනස සතුටු කරන දර්ශන ඇති තැනක් කියන්නෙමියි.

යම්තැනක වාසය කරන්නේ එහෙ මෙහෙ ඇවිදින්නේ නැතිව ලබන්නේය. සිත සතුටුකරන භික්ෂූන් දැකීම සඳහා යැයි සිතා. **චත්තාරිමානි** (මේ සතර) ආදිය කීය. එහි **සංසසා** යනු බුද්ධාදියෙහි පහන් සිත් ඇති,

වත් සම්පන්න වූ යමකුට උදේ පටන් චෛත්‍ය මිදුල් ඇමදීම ආදී සියළු වත් කරන ලදැයි පෙනෙයි. **දසසනීයානි** දැකීමට සුදුසු. දැකීම සඳහා යායුතු. **සංවෙජනීයානි** සංවේගය ඇතිකරන්නා වූ ඨානානි යනු කරුණු හෝ ප්‍රදේශවල සමානයන් හෝ. **යෙහි කෙචි** මේ චෛත්‍ය චාරිකාවේ සාර්ථකභාවය දැක්වීම සඳහා කියන ලදී. එහි සාර්ථකභාවය දැක්වීම සඳහා කියන ලදී. එහි **චෙතිය චාරිකං ආහිණ්ඩනතා** යමෙක් වනාහි ඒ ඒ තැන්වල චෛත්‍ය අංගණ අමදින්නේ ආසන සෝදන්නේ බෝධියට පැන් වත්කරන්නේ ඇවිදිත්. ඔවුන්ට කිවයුතු දෙයක් නැත. අසවල් විහාරයෙහි චෛත්‍යය වඳින්නෙමුයි නික්මගොස් පසන් සිත් ඇතිව පසුව කලුරිය කරන්නේ ද අනතුරුව ස්වර්ගයෙහි පිහිටන්නේය යන්න දක්වයි.

**අදසසනං ආනන්‍ද** යම් මේ කාන්තාවක් නොදැකීම. මෙයම උතුම් ප්‍රතිපත්තියයි දක්වයි. දොර වසා සෙනසුනෙහි සිටියා වූ භික්ෂුව අවුත් දොර ලඟ සිටිය ස්ත්‍රියක යම්තාක් නොදකීද ඒතාක් ඒකාන්ත වශයෙන් ආශාවක් ඇති නොවේ. සිත නොසැළෙයි. දැකීම ඇතිකල්හි ඒ දෙකම වන්නේය. ඒ නිසා කියන ලදී. 'අදසසනං ආනන්‍ද' (ආනන්‍දය - නොදැකීම) **දසසනෙ භගවා සති කථං** යනු භික්‍ෂාව ගෙන පැමිණි තැන් ආදියෙහි දැක්ම ඇතිකල්හි කෙසේ පිළිපැදිය යුතුදැයි විචාරයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, යම්හෙයකින් කඩුවක් ගෙන මා සමග කථා කරන්නෙහි ද මෙහිම තාගේ මස් පට පට ගා කන්නෙමියි සිටියා වූ යක්‍ෂණියක් සමග කථාකිරීම මෙන් වටනේය. එක ආත්මභාවයක ඒ නිසා විනාශය වෙයි. අපායන්හි සීමාවක් නැති දුක් අනුභව කිරීමක් නැත. කාන්තාවක සමග කථාබහ කරද්දී විශ්වාසයක් ඇතිවෙයි. විශ්වාසයක් ඇතිකල්හි සිදුරක්, දෝෂයක් ඇතිවෙයි. එයට වැටුන සිත සීල හානියට පත්ව අපාය පූරවන්නෙක් වෙයි. ඒ නිසා 'අනා ලාපො' (කථා නොකිරීම) යැයි කීය. මෙසේද කියා ඇත.

**සල්ලපෙ අසිහත්‍ථෙන පිසාචෙනාපි සල්ලපෙ**
**ආසීවිසම්පි ආසීදෙ යෙන දට්ඨො න ජීවති**
**නත්‍වෙව එකො එකාය මාතු ගාමෙන සල්ලපෙ**

(කඩුවක් අතැති අය සමග කථා කරන්නේය. ප්‍රේතයකු සමග කථා කරන්නේය. ආශීර් විසඳ ලඟින් සිටින්න. යම් සර්පයකු විසින් දෂ්ට

කරන ලද්දේ ජීවත් නොවෙයි. නමුත් එක්කෙනෙක් එක් ස්ත්‍රියක් සමග කථාබහ නොකරන්නේය.)

ආලපනෙනත පන ඉදින් ස්ත්‍රියක් දවසක් හෝ විචාරයිද සීල් හෝ ඉල්වයි. ධර්මය හෝ අසනු කැමැති වෙයි. ප්‍රශ්න හෝ විචාරයි. මෙබඳු වූවන්ට පැවිද්දන්ගෙන් වැඩක් ඇත. මෙබඳු වූ කල්හි කථානොකරන ගොලුවා, මේ බිහිරා, මොහු කා, මුව තදකරගෙන හිඳීයයි කියත්. ඒ නිසා අවශ්‍ය දෙයක් කථා කළයුතු වෙයි. මෙසේ කථා කරන්නහු විසින් කෙසේ පිළිපැදිය යුතුදැයි විචාරයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, මහණෙනි! මෙහි එන්න. ස්ත්‍රීන් කෙරෙහි මාතෘ චිත්තයක් ඇතිකරගන්න. සහෝදරියන් කෙරෙහි සහෝදරිය යන සිත ඇතිකරගන්න. දූවරුන් කෙරෙහි දුහිතෘ චිත්තයක් ඇතිකර ගන්න. මේ අවවාදය වෙනුවෙන් සති ආනඤ උපට්ඨපෙතබ්බා ආනන්ද සිහිය පිහිටුවා ගතයුතුයි කියා වදාළේය. අව්‍යාවටා තූලින් නොබඳින ලද උත්සාහවන්ත නොවන්න. යදෙත්ථ සට්ඨා උතුම් අර්ථයෙහි රහත්බවෙහි ගැටෙන්න. අනුයුජ්ජථ එහි වෙන්නොවූ සිහිය වීර්යයෙන් තැවීම හේතුකොටගෙන ආතාපිනො නම් වේ. කයෙහිද ජීවිතයෙහිද නිරපේක්ෂතාවය පහිතත්තා යොදන ලද සිත් ඇතිව වාසය කරව්.

කථං පන භනෙත ඒ ක්ෂත්‍රිය පණ්ඩිතාදීන් සමග කෙසේ පිළිපැදිය යුතුද? ඒකාන්තයෙන් ඔව්හු මගෙන් විචාරන්නාහ. ආනන්ද ස්වාමීනි, තථාගතයන් වහන්සේගේ ශ්‍රීදේහය පිළිබඳව කෙසේ පිළිපැදිය යුතුද? මම ඔවුන්ට කෙසේනම් පිළිතුරක් දෙන්නෙම්ද කියා අසයි. අහතෙන වත්‍ථෙන අළුත් කසී වස්ත්‍රවලින් විහතෙන කප්පාසෙන යනු මනාව පොළන ලද කපුවලින්, කසීසලු වනාහි සියුම් බැවින් තෙල් උරා නොගනී. කපුවලට එසේ තෙල් උරාගනී. ඒ නිසා මොනවට පොළන ලද කපුවලින් යැයි කීය. ආයසාය යනු ස්වර්ණමය, මෙහි රත්‍රං 'ආයස' යන්නෙන් අදහස් කළේය. රාජා චක්කවත්ති මෙහිදී කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ ගිහියන් මැද සිට මියගිය රජුට ථූපයක් සෑදීම සුදුසු බව අනුමත කළේද? සිල්වත් පෘථග්ජන භික්ෂුවකට නැත. ආශ්චර්යයක් නොවන බැවිනි. පෘථග්ජන භික්ෂූන්ට ථූප සෑදීම අනුමත කළේ නම් තම්බපණ්ණි දිවයිනේ ස්තූපවලට ඉඩක් ලැබෙන්නේ නැත. අන් තැන්වලද එසේය. ඒ නිසා ඔබට අමුත්තක් නොවන්නේ යයි අනුමත නොකරයි. සක්විති රජු ලෙස උපදින්නේ එක්කෙනෙක්මය. ඒ නිසා ඔහුට ථූපයක් කිරීම පුදුම දෙයක්

වෙයි. පෘථග්ජන සීලවන්තයාට වනාහි පිරිනිවන්පෑ භික්ෂුවකට මෙන් මහත් වූ සත්කාරයක් කරන්නට වටී.

**විහාරං** යනු මෙහි මණ්ඩලමාලයේ විහාරය අදහස් කෙරේ. එයට පිවිස. **කපිසීසං** උළුවහු කෙළවර පිහිටි අගුල් රුක. **රොදමානො අට්ඨාසි** ඒ ආයුෂ්මතුන් වහන්සේ වනාහි මෙසේ සිතීය. ශාස්තෲන් වහන්සේ විසින් මා හට සංවේගජනක වූ වාසස්ථානයක් ගැන කියන ලදී. චෛත්‍ය චාරිකාවේ සාර්ථකභාවය කියන ලදී. ස්ත්‍රීන් කෙරෙහි පිළිපැදිය යුතු ප්‍රශ්නය විසඳන ලදී. තම සිරුරෙහි ප්‍රතිපත්ති කියන ලදී. ථූප සෑදීමට යෝග්‍ය සතරදෙනා කියන ලදී. ඒකාන්තයෙන් අද භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පාන්නේ යයි මෙසේ සිතන්නා වූ ඔහුට බලවත් වූ දොම්නසක් ඇතිවිය. ඉක්බිති ඔහුට මෙසේ සිතින. භාග්‍යවතුන් වහන්සේ ලඟ හැඬීම අපහසු දෙයකි. එකත්පසෙකට ගොස් ශෝකය තුනී කරගන්නෙමි. හෙතෙම එසේ කළේය. ඒ නිසා කියන ලදී. 'රොද මානො අට්ඨාසි' (හඬමින් සිටියේය.) අහංච වතම්හි මම ද වෙමි. 'අහංවතම්හී' කියාද පාඨයක් ඇත. යො මම අනුකම්පකො යමෙක්මට අනුකම්පා කරයිද අනුශාසනා කරයිද හෙට පටන් කා හට මුහුණ සෝදන ජලය දෙම්ද? කාගේ පා සෝදන්නෙම්ද? කාගේ සෙනසුනක් පිරිසිදු කරන්නෙම්ද? කාගේ පාසිවුරු ගෙන හැසිරෙන්නෙම්ද කියා බොහෝසෙයින් වැළපුනේය.

**ආමන්තෙසි** යනු භික්ෂු සංඝයා අතර තෙරුන් නොදැක ආමන්ත්‍රණය කළේය. **මෙත්තෙන කායකම්මෙන** මෙත්සිත් වශයෙන් පැවැත්වූ මුහුණ සෝදන ජලය පැන්දීම ආදී කාය කර්මයෙන්. **හිතෙන** අභිවෘද්ධි සිතින් කරන ලද දෙයින්. **සුඛෙන** සුවසොම්නස් වශයෙන් කරන ලද දුක් දොම්නස් සිතින් නොසිට යන අර්ථයි. **අද්වයෙන** කොටස් දෙකකට කර නොකිරීමෙන් යම්සේ එකෙක්, ඉදිරිපිටට කරයි. අනභිමුඛයේ නොවේ. කෙනෙක් අනභිමුඛයේ කරයි. සම්මුඛයේ නොකරයි. මෙසේ විභාග නොකොට කරන ලදැයි සිතා කියන ලදී.

**අප්පමාණෙන** ප්‍රමාණයක් නැතිව, සක්වළ ද අතිශයින් සම්බාධක සහිතය. භවාග්‍රය ද ඉතා පහත්ය. ඔබ විසින් කරන ලද කාය කර්මයම විශාල යයි දක්වයි. **මෙත්තෙන වචීකම්මෙන** මෛත්‍රී සිත් වශයෙන් පවත්නා මුහුණ සේදීමට කාලය දන්වා සිටීම ආදී වචීකර්මයෙන් තවද අවවාද අසා, එසේය ස්වාමීනි යි කියන වචන මාත්‍රයම මෛත්‍රී වචීකර්මයයි.

මෙත්තෙන මනොකම්මෙන කල් ඇතිව සිරුරු පිළිදැගුම් කර විවේක ආසනයක හිඳ ශාස්තෘන් වහන්සේ නීරෝගි වෙත්වා. හිංසාවක් නොවේවා. සැපවේවා. මෙසේ පැවැතියා වූ මනෝකර්මයෙන් කතපුඤ්ඤොසි. කල්ප ශතසහස්‍රයක් ප්‍රාර්ථනා සහිතව සිටි බව දක්වයි. කරන ලද පින් ඇත්තේ වෙමියි මෙපමණකින් විශ්වාසය නොතබන්න. ප්‍රමාදයට පත් නොවන්න අනතුරුව ප්‍රධන් වීර්යයෙහි යෙදෙන්න. එසේ යෙදුනේ වහා රහත්බවට පත්වන්නෙහිය. ධර්මසංගීති කාලයෙහි රහත් බවට පත්වන්නෙහිය. මා බඳු කෙනෙකුට කරන ලද ඇපළුපකාර නිෂ්ඵල නොවන්නේ යැයි දක්වයි.

මෙසේ ද කියා මහපොළව පතුරුවන්නාක් මෙන් අහස පතුරුවන්නාක් මෙන් සක්වලගිර උදුරන්නාක් මෙන් මහමෙර ඔසවන්නාක් මෙන් මහා දඹගස කඳෙන් ගෙන සොලවන්නාක් මෙන් ආයුෂ්මත් ආනන්ද තෙරුන්ගේ ගුණකථාව අරඹමින් ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. එහි දී මහණෙනි! යම් ඒ කෙනෙක් මෙබඳු යැයි කුමක් නිසා නොවදාළේද? අන් බුදුවරයකුට නැති නිසාය. මෙයින්ම මෙය දතයුතුයි. යම්සේ සක්වළ අතරෙහිද අන් බුදුවරයන් වහන්සේ නමක් නැතය. පණ්ඩිතො ව්‍යක්ත. මෙධාවී ස්කන්ධ - ධාතු - ආයතන පිළිබඳ විශාරද වූ භික්ඛු පරිසා ආනන්දං දස්සනාය යම්කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දකිනු කැමැත්තාහුද තෙරුන් වෙත පැමිණෙත්. ආයුෂ්මත් ආනන්ද තෙරුන්වහන්සේ හාත්පසින්ම ප්‍රසන්නය. ලස්සනය. බහුශ්‍රැතය. සංඝ සොභනය කියා තෙරුන්ගේ ගුණ අසා පැමිණෙත්. ඔවුන් ගැන, භික්ෂු පිරිස ආනන්ද තෙරුන් දැකීම සඳහා පැමිණියාහ යැයි කීය. සැමතන්හි මේ ක්‍රමයයි. අත්තමනා දැකීමෙන් නොව ඇසීමෙන් සමෙති සිය සිතින් සතුටට පත්ව. ධම්මං යනු කෙසේද ඇවැත්නි! ඉවසාගත හැකිද? යැපෙන්නට හැකිද? කිම යෝනිසෝ මනසිකාරයෙන් වැඩ කරන්නහුද? ආචාර්ය උපාධ්‍යායන් කෙරෙහි වත් පුරන්නේ ද මෙබඳු වූ පිළිසඳර කථාවක්. එහි භික්ෂුණීන් කෙරෙහි කිම? සහෝදරියනි, අෂ්ටගරු ධර්ම සමාදන්ව පවතින්න. මෙයද වෙන් කිරීමකි. උපාසකයන් කෙරෙහි, උපාසකවරුනි, යහපත් පැමිණීමකි. (ඔබගේ පැමිණීම හොඳයි.) ඔබගේ කිසියම් අවයවයක් හෝ හිස හෝ රිදෙන්නේ ද, ඔබගේ දූදරුවෝ සුවසේද? මෙසේ පිළිසඳර කථා නොකරයි. මෙසේ කළයුතුයි. කෙසේද? උපාසකවරුනි, තුන් සරණ පන්සිල් රකින්න. මාසයකට අටවරක්

පෙහෙවස් රකින්න. මව්පියන්ට උපස්ථාන වතාවත් කරන්න. ධාර්මික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් පෝෂණය කරන්න. උපාසිකාවන් කෙරෙහිද මෙසේය.

දැන් ආනන්ද තෙරුන්ව සක්විති රජකු හා සමාන කරමින් 'මහණෙනි, මේ සතර දෙනෙක්' ආදිය පැවසූහ. එහි **ඛත්තියා** නම් අභිෂේක කරන ලද හෝ නැති ක්ෂත්‍රියයෝය. ඔව්හු සක්විති රජවරු නම් වෙති. රූමත්ය. දැකුම්කලුය. ප්‍රසාදජනකය. අහසින් යන්නාහු රාජ්‍යය අනුශාසනා කරත්. ධාර්මිකය. දැහැමි රජෙකි යනුවෙන් ඔහුගේ ගුණකථාව අසා ඇසීමෙන්ද, දැකීමෙන්ද යුක්තවූවාහු සතුටුසිත් ඇත්තෝ වෙත්. **සාසති** යනු කෙසේනම් පියවරු රාජධර්මය පුරත්ද? පරපුර රකිත්ද කියා පිළිසඳර කථාකරයි. බ්‍රාහ්මණයන් කෙරෙහි වනාහි කෙසේද ඇදුරුතුමනි, මන්ත්‍ර කියන්නහුද? කිම ශිෂ්‍යයෝ මන්ත්‍ර උගනිත්ද? දක්ෂිණාව හෝ වස්ත්‍ර හෝ වර්ණවත් වස්ත්‍ර හෝ ලබන්නහුද? මෙසේ පිළිසඳර කථා කරයි. ගෘහපතීන් කෙරෙහි කිම පියවරුනි, නුඹලාට රජගෙදරින් හෝ දඬුවමින් හෝ බලයෙන් හෝ යම්කිසි පීඩාවක් ඇත්ද? මනාව වර්ෂාව ලැබේද? මෙසේ පිළිසඳර කථාකරයි. ස්වාමීනි! ශ්‍රමණයන් කෙරෙහි කෙසේද? කිම පැවිදි පිරිකර සුලභව ලැබේද? ශ්‍රමණ ධර්මයන්හි ප්‍රමාද නොවන්න. මෙසේ පිළිසඳර කථා කරයි.

**කුඩ්ඩනගරකෙ** නගර ප්‍රතිරූපක වූ බාධා සහිත කුඩා නගරවල. **උජ්ජංගල නගරකෙ** විෂම නගරයෙහි. **සාඛා නගරකෙ** යම්සේ ගස්වල අතු කුඩා වේද එපරිද්දෙන් අනික් විශාල නගරවල ශාඛා බඳු කුඩා නගර. **ඛත්තිය මහාසාළා** ක්ෂත්‍රිය මහාසාර බවට පත්වූ මහා ක්ෂත්‍රියයෝ. හැමතන්හි මේ ක්‍රමයයි. ඔවුනතර ක්ෂත්‍රිය මහාසාළයෝ නම්, යමෙකුට කෝටි සියයක් කෝටි දහසක් ධනය වළලා තබන ලද දවසේ වියදම සඳහා එක් කහවනු කරත්තයක්වත් ලබයි. සවසට කරත්ත දෙකක් ඇතුළට එයි. බ්‍රාහ්මණ මහාසාළයෝ නම් යමකුගේ අසූකෝටියක් ධනය තැන්පත් කර තිබේද, දවසේ වියදමට එක් කහවනු කළයක් වියදම් වෙයි. සවසට එක් ගැලක් ඇතුලට එයි. ගෘහපති මහාසාළයෝ නම්, යමකුගේ හතළිස් කෝටියක් ධනය නිදන් කර තිබේද, දවසේ වියදමට කහවනු ද්‍රෝණ එකොළසක් වියදම් වෙයි. සවසට කුම්භයක ප්‍රමාණය ඇතුලට ලැබෙයි.

**මාහෙවං ආනන්ද** අවච ආනන්ද, මෙසේ නොකියන්න. මෙය නොදියුණු නගරයක්යැයි නොකිවයුතුයි. මම මේ නගරයේ සම්පත්

ගැන කියන්නට නොයෙක්වර සිටියෙමි. හුන්නෙමි. මහත් උත්සාහයෙන්, මහත් පරාක්‍රමයෙන් මෙහි පැමිණියේ යැයි කියා **භූතපුබ්බං** ආදිය කීය. **සුභික්ඛා** කෑම්බීම් ආදියෙන් සම්පූර්ණ. **හත්ථිසද්දෙන** එක් ඇතෙක් ශබ්ද කරන කල්හි අසූදහසක් හස්තීහු නාද කරත්. මෙසේ හස්ති ශබ්දයෙන් තොර නොවූයේ වෙයි. අශ්ව ශබ්දයෙන් ද මෙසේය. මෙහි වනාහි පින්වත් සත්ත්වයෝ සෛන්ධවයන් සතරදෙනා බැගින් යොදන ලද රථවලින් ඔවුනොවුන් ලුහුබඳිමින් හැසිරෙත්. මෙසේ රථ හඬින් ගැවසුනේ වෙයි. නිරන්තරයෙන් යොදන ලද බෙර ආදි තූර්යයන්ගෙන් නිරතුරු යුක්ත වූයේ වෙයි. එහි **සම්මසද්දො කයිතාලම් ශබ්දය - තාල සද්දො** අත් තාළ, චතුරශ්‍ර, අම්මණ ආදියේ තාල ශබ්ද කුළුබෙර ශබ්දයද කියත්. **අසනාථ පිවථ ඛාදථ** රසවිඳින්න. පානය කරන්න. අනුභව කරන්න. මේ වනාහි මෙහි කෙටි අර්ථයි. පින්වතුනි, අනුභව කරන්න යන මේ දසවැනි ශබ්දයෙන් නිරන්තර යුක්තවූයේ වෙයි. නොසිඳි ශබ්ද ඇත්තේය. යම්සේ වනාහි වෙනත් නගරවල කසල ඉවත්කරව්. උදැල්ල ගන්න. පැස ගන්න. වෙන පළාතකට යන්නෙමු. හාල්මිටක් ගන්න. බත්මුලක් ගන්න. පළිහ, ආයුධ සූදානම් කරන්න යන මෙබඳු ශබ්ද ඇසේ. මෙහි එබන්දක් නැතැයි දක්වයි. 'දසවෙනි ශබ්දයෙන්' යැයි කියා කුසාවතිය, ආනන්ද රාජධානිය ප්‍රාකාර සතකින් වටකරන ලද්දේ වෙයි කියා සියළු මහා සුදර්ශන සූත්‍රය නිමවා 'ආනන්ද, ඔබ යන්න' ආදිය වදාළහ. එහි **අභික්කමථ** ඉදිරිපිටදී සමාවන්න. එන්න යන අර්ථයි. කිම! ඒ අය භාග්‍යවතුන් වහන්සේ වැඩිබව නොදන්නහුද දනිත්මය. බුදුවරයන් වහන්සේලා වැඩිතැන වනාහි මහත් කලබලයක් ඇතිවෙයි. කිසියම් කටයුත්තක් නිසා සිටිය බැවින් නොපැමිණියේය. ඔව්හු පැමිණ භික්ෂු සංඝයාට සිටින්නට, හොවින්නට සුදුසු තැන් සූදානම් කර දෙන්නේ යැයි ඔවුන් සමීපයෙහි අවේලාවේ නමුත් භාග්‍යවතුන් වහන්සේ පිටත්කර හැරියේය. **අම්හාකං වනො** මෙහි 'නො' කාරය නිපාත මාත්‍රයකි. **අසාවිනො** හටගත් දුක්. **දුම්මනා** නොසතුටු සිත් ඇති **චෙතොදුක්ඛ සමප්පිතා** දොම්නසින් යුක්ත වූවාහු. **කුලපරිවත්තසො කුලපරිවත්තසො ඨපෙත්වා** එකිනෙක කුල පෙරළිය. කුල හැකිලීම, වීථි වශයෙන් ද වෙන වෙනම තබා.

**සුභද්දො නාම පරිබ්බාජකො** උසස් බ්‍රාහ්මණ මහාසාල කුලයෙන් පැවිදි වූ ඡන්න පරිබ්‍රාජකයා. **කංඛාධම්මො** විමතිය, සැකය, කුමක් නිසා මොහුට අද මෙසේ සිතීද? එබඳු වූ වාසනාවක් නිසාය. පෙර වනාහි පින් කරන කල්හි සහෝදරයෝ දෙදෙනෙක් වූහ. ඔව්හු එකතුව ගොවිතැන්

කළහ. එහි වැඩිමල් සොයුරාට, එක් ශස්‍ය වාරයකදී නව වාරයක් අගහස් දානයක් දිය යුතුයයි සිතින. හෙතෙම වපුරන කාලයේ බීජ දී ගොයම් පීදෙන කාලයේ බාල සොයුරා සමග කථා කළේය. ගොයම් බන්ඩි කාලයේ බඩ කපා දෙන්නෙම් යි තරුණ අස්වැන්න නසන්නෙහිදැයි ඇසීය. දෙටු සොහොයුරා බාලයාගේ අකමැති බව දැනගෙන කුඹුර දෙකට බෙදා තමන්ගේ කොටසින් ගොයම් ගොබ පලා කිරිගෙන ගිතෙල් හා පැණි යොදා දන් දුන්නේය. වී පැසෙන කල්හි හබලපෙති සාදා දුන්නේය. ගොයම් කපන කාලයේ එයින් අග්‍ර කොටස ද වෙණු කරන කල්හි එහි අග්‍ර භාගය ද මිටි බදින කල්හි එහි අග්‍ර භාගයද ගොයම් පාගනවිට එහි අග්‍රභාගය ද ගබඩා කරනවිට ද යන එක් ශස්‍ය වාරයක නව වාරයක් අග්‍ර දානය දුන්නේය. බාල සොයුරා වනාහි උදුරා දුන්නේය. ඔවුනතුරෙන් දෙටු සොහොයුරා අඤ්ඤාකොණ්ඩඤ්ඤ විය. භාග්‍යවතුන් වහන්සේ, මම කාටනම් පළමුවෙන් ධර්ම දේශනා කරන්නෙම්දැයි බලන්නේ, අඤ්ඤා කොණ්ඩඤ්ඤ එක් ශස්‍ය වාරයකදී නව වාරයක් අග්‍ර දානය දුන්නේය. මේ අග්‍ර ධර්මය ඔහුට දේශනා කරන්නෙමියි සියල්ලන්ට පළමු ධර්මදේශනා කළේය. හෙතෙම අටලොස් කෙලක් බ්‍රහ්මයන් සමග සෝවාන් ඵලයෙහි පිහිටියේය. බාල සොහොයුරා වනාහි නතරවී පසුව දන් දුන් නිසා ශාස්තෲන් වහන්සේ පිරිනිවන්පෑ කල්හි මෙසේ සිතා ශාස්තෲන් වහන්සේව දකිනු කැමැත්තේ විය. මා භගවන්තං විහෙඨෙසි තෙරුන්වහන්සේ වනාහි මේ අන්‍ය තීර්ථකයෝ වනාහි තමන් පිළිගන්නා දේම පිළිගනිත්. එය විසඳීම පිණිස භාග්‍යවතුන් වහන්සේ බොහෝවේලා කථා කළයුතු බැවින් කය හා වචනයෙන් වෙහෙසක් ඇතිවෙයි. ස්වභාවයෙන්ම භාග්‍යවතුන් වහන්සේ වෙහෙසට පත්වන්නේ යයි සිතමින් මෙසේ කීය. පරිබ්‍රාජකයා මේ භික්ෂුව මට අවස්ථාවක් නොදෙයි. ඕනෑකම ඇත්තහු විසින් එකඟ කරගෙන කරගත යුතුයැයි තෙරුන්වහන්සේව එකඟ කරගන්නට දෙවන වරටත් තුන්වන වරටත් මෙසේ කීය. අසොසාසිබො තිරය ලඟ සිට කියන්නහුට ප්‍රකෘති කණින්ම ඇහුම්කන් දුන්නේය.

අසා සුභද්ද සඳහාම මහත් උත්සාහයෙන් පැමිණි බැවින් 'අලං ආනන්ද' ආනන්ද අවශ්‍ය නැත. ආදිය පැවසීය. එහි අලං යනු ප්‍රතික්ෂේප කිරීම් අර්ථයේ නිපාතයකි. අඤ්ඤාපෙබො වා දැනගනු කැමැත්තේ වී. අබ්භඤ්ඤංසු යම්සේ ඔවුන්ගේ ප්‍රතිඥාව වේද එසේම දැනගත්හ. මෙය කියන ලදී. ඉදින් ඔවුන්ගේ ඒ ප්‍රතිඥාව නෛර්යාණික නොවේනම්

සියල්ලෝම ප්‍රතික්ෂේප කරත්. එසේ නොවේනම් ප්‍රතික්ෂේප නොකරත්. ඒ නිසා ඔවුන්ගේ ප්‍රතිඥාව නෛර්යාණිකද නැද්ද යනුවෙන් තීරණය කිරීම මේ ප්‍රශ්නයේ අර්ථයයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ නෛර්යාණික නොවන බව කීමෙන් අර්ථයෙන් හා අවකාසයෙන් තොර බව නිසා 'අලං' අනවශ්‍යයි කියා ප්‍රතික්ෂේප කොට ධර්මයම දේශනා කළේය. ප්‍රථම යාමයේදී මල්ල රජදරුවන්ට ධර්මදේශනා කර මධ්‍යම යාමයෙහි සුභද්දට අවසාන යාමයේ භික්ෂු සංඝයාට අවවාද දී ඉතා අලුයම පිරිනිවන් පාන්නෙමියි කියා භාග්‍යවතුන් වහන්සේ වැඩියේය. **සමණොපි තත්‍ථ න උපලබ්භති** පළමුව සෝවාන් වූ ශ්‍රමණයෙක්ද එහි නැත. දෙවෙනි සකෘදාගාමී ශ්‍රමණයෙක්ද තුන්වන අනාගාමී ශ්‍රමණයෙක්ද සතරවනුව රහත් ශ්‍රමණයකුද එහි නැත යන අර්ථයි. **ඉමස්මිං බො** පළමු දේශනාවෙන් අනියම් ලෙස කියා දැන් තමන්ගේ ශාසනය නියම කරන්නේ මෙසේ කීය. **සුඤ්ඤා පරප්පවාදා සමණෙහි** යනු සිව්මග සඳහා අරඹන ලද විදර්ශකයන් සතරදෙනා විසින් මාර්ගස්ථ සතරදෙනාගෙන්, ඵලස්ථ සතරදෙනාගෙන් යන ශ්‍රමණයන් දොළොස්දෙනාගෙන් ශූන්‍ය වූ අන්‍යවාදයන්ගෙන් හිස් වූ.

**ඉමෙ ච සුභද්ද** මේ භික්ෂූන් දොළොස් දෙන. **සම්මා විහරෙය්‍යුං** මෙහිදී සෝතාපන්න පුද්ගලයා තමා විසින් අවබෝධ කරගත් තැන අන් කෙනෙකුට කියා ඔහුව සෝවාන් කරන්නේ මනාව වාසය කරයි නම් වේ. සකෘදාගාමී ආදීන් කෙරෙහිද මේ ක්‍රමයයි. සෝවාන් මාර්ගයේ පිහිටි තැනැත්තා අන් අයවද සෝවාන්මගෙහි පිහිටියවුන් කරන්නේ මනාව වාසය කරයි නම් වේ. සෙසු මාර්ගස්ථයන් කෙරෙහිද මේ ක්‍රමයමයි. සෝවාන් මාර්ගය සඳහා ඇරඹූ විදර්ශකයා තමාගේ ප්‍රගුණ කළ කර්මස්ථානය කියා අන් අයද සෝවාන් මාර්ගය සඳහා ආරම්භක විදර්ශකයකු කරන්නේ මනාව වාසය කරයි නම් වේ. සෙසු මාර්ග සඳහා ආරම්භ කළ විදර්ශකයන් කෙරෙහිද මේ ක්‍රමයමය.

සම්මා විහරෙය්‍යුං (මනාව වාසය කරන්නේය) යන්න මේ සඳහා කියන ලදී. **අසුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්ස** යනු ලෝකය රහතන්ගෙන් හිස් නොවූයේ වන්නේය. **එකූනතිංසො වයසා** වයසින් එකුන්තිස්ව. **යං පබ්බජිතං** මෙහි යං යනු නිපාත මාත්‍රයකි. **කිං කුසලානුඑසී** කුසලය කුමක්දැයි සොයන්නේ, එහි **කිං කුසලං** යනුවෙන් සර්වඥතා ඥානය අදහස් කෙරේ. එය සොයන්නේ යන අර්ථයි. **යතොහං** යම්තැනක

පටන් මම පැවිදි වූයෙම්ද මේ අතරතුර පිරුණු පනස්වස් යැයි දක්වයි. ඤායසස ධම්මා ආර්යමාර්ග ධර්මයාගේ පදෙසවත්තී කොටසක විදර්ශනා මාත්‍රාවක්වත් පවත්වන්නේ ඉතො බහිද්ධා මාගේ ශාසනයෙන් පිටත. සමණොපි නත්ථි කොටසක පිහිටි විදර්ශනා ඇත්තෙක්ද නැත. ප්‍රථම ශ්‍රමණයා වූ සෝවාන් පුද්ගලයාද නැතැයි කියන ලදී. යෙ එත්ථ යනු යමෙහි මෙහි ඔබගේ ශාසනයේ ශාස්තෘන් වහන්සේ ඉදිරියේ අතවැසියකු ලෙස අභිෂේක කරන ලද්දේ නම් ඔවුන්ට මහා ලාභයකි. ඔවුන් විසින් මනාව ලබන ලදී. වෙනත් ආගම්හි වනාහි යම් අතවැසියකුට, ආචාර්යයෙනි, මොහුව පැවිදි කරන්න. මොහුට අවවාද කරන්න. මොහුට අනුශාසනා කරන්න යැයි කියයි ද හෙතෙම තමාගේ සමතන්හි තැබුවා වන්නේය. ඒ නිසා ඔහුට මොහුව පැවිදි කරන්න. මොහුට අවවාද කරන්න. මොහුට අනුශාසනා කරන්න යැයි කියයි. මේ ලාභයෝ වෙත්. තෙරුන් ද සුභද්ද එම බාහිර සමයට ගෙන මෙසේ කියන ලදී. අලත්ථ ඛො කෙසේ ලැබුවේද? තෙරුන් වහන්සේ වනාහි ඔහුව එකත්පසෙකට ගෙන පැන් කළයකින් හිස තෙමා තචපඤ්චක කර්මස්ථානය (කෙසා - ලොමා - නඛා - දන්තා - තචො) කියා කෙස්රවුල් කපා කසාවත් පොරවා සරණ පිහිටුවා භාග්‍යවතුන් වහන්සේගේ සමීපයට රැගෙන ගියේය. භාග්‍යවතුන් වහන්සේ උපසම්පදා කර කමටහන් දුන් සේක. හෙතෙම එය ගෙන උයනෙහි එකත්පසෙක එක් සක්මනකට වී උත්සාහ කරන්නේ, වෑයම් කරන්නේ පටිසම්භිදා සහිත රහත්බවට පැමිණ බුදුන් වැඳ හුන්නේය. ඒ ගැන අචිරූපසම්පනෙනා ඛො පන (උපසම්පදා වී නොබෝකල් ඇත්තේ) යැයි කියන ලදී. 'ඔහු ද භාග්‍යවතුන් වහන්සේගේ සාක්ෂ්‍ය වශයෙන් අවසන් ශ්‍රාවකයා විය' යනුවෙන් සංගීතිකාරකයන් විසින් කියන ලදී. එහිදී හෙතෙම භාග්‍යවතුන් වහන්සේ ජීවමානව සිටියදී පැවිදිව පසුව උපසම්පදා ලැබ කමටහන් ගෙන රහත්බවට පත්වෙයි. ජීවමාන කාලයෙහි කමටහන් ගෙන පසුව රහත්බවටම පත්වෙයි. ඔහු වනාහි අවසාන ශ්‍රාවකයාය. මොහු වනාහි භාග්‍යවතුන් වහන්සේ ජීවමානව සිටියදීම පැවිදිවිය. උපසම්පදා විය. කමටහන්ද ගෙන රහත්බවට පත්විය.

**පස්වන බණවර වර්ණනාව නිමියේ ය.**

දැන් භික්ෂු සංඝයාට අවවාද දීම ආරම්භ කළේය. එය දක්වන්නට 'අථඛො භගවා' ආදිය කියන ලදී. දෙසිතො පඤ්ඤත්තො ධර්මයද දේශනා කරන ලදී. පණවන ලදී. විනයද දේශනා කරන ලදී. පණවන ලදී. 'පණවන ලදී' යනු ස්ථාපිත කරන ලදී. පිහිටුවන ලදී යන අර්ථයි. සො වො මමච්චයෙන. ඒ ධර්මවිනය නුඹලාට මගෙන් පසුව ශාස්තෘන් වහන්සේය. පිහිටුවන්නා වූ මා විසින් නුඹලාට මෙය සැහැල්ලුය. මෙය ගරුකය. මෙය පිළියම් කළහැකිය. මෙය පිළියම් කළ නොහැකිය. මෙය ලෝකයටම පොදු වරදකි. මෙය පණවන ලද වරදකි. මේ ආපත්තිය පුද්ගලයකුගේ සමීපයේ හටගනී. මේ ආපත්තිය කණ්ඩායමක් හමුවේ පැන නගී. මෙය සංඝයා සමීපයේ නැග එයි. සත්ආකාර ආපත්ති කාණ්ඩ වශයෙන් බැසගන්නා ලද වස්තුවෙහි ඛන්ධක, පරිවාර සහිත උභය විභංගයත් මා විසින් විනයැයි දේශනා කරන ලදී. ඒ සියලුම විනය පිටකය මා පිරිනිවන්පෑ කල්හි නුඹලාට ශාස්තෘන් වහන්සේ නමකගේ කාර්යය ඉටුකරන්නේය. ජීවමානව සිටියදීම මා විසින් මේ සතර සතිපට්ඨාන සතර සම්‍යග්ප්‍රධාන සතර ඍද්ධිපාද පංච ඉන්ද්‍රිය පංචබල සප්ත බොජ්ඣංග, ආර්ය අෂ්ටාංගික මාර්ගය යන මේවා ඒ ඒ ආකාරයෙන් බෙදා වෙන්කර සූත්‍රාන්ත පිටකය දේශනා කරන ලදී. ඒ මුළු සූත්‍රාන්ත පිටකයම මා පිරිනිවන්පෑ කල්හි නුඹලාට ශාස්තෘන් වහන්සේගේ කාර්යය ඉටු කරන්නේය. ජීවමානව සිටියදීම මා විසින් පංචස්කන්ධය දොළොස් ආයතන අටළොස් ධාතු චතුරාර්ය සත්‍යයන් ඉන්ද්‍රියන් විසිදෙක හේතු නවය සතර ආකාර ආහාර ස්පර්ශ සත වේදනා සත සඤ්ඤා සත චේතනා සත සිත් සත එහිද මෙපමණ ධර්මයෝ කාමාවචරය. මෙතෙක් රූපාවචරය. මෙතෙක් අරූපාවචරය. මෙතෙක් අඩංගුය. මෙතෙක් අඩංගු නැත. මෙතෙක් ඒවා ලෞකිකය. මෙතෙක් ඒවා ලෝකෝත්තරය. මේ ධර්මයන් බෙදා සිව්විසි සමන්තපඨානයත්, අනන්ත වූ ක්‍රමයන්ගෙන් යුත් මහා සතිපට්ඨානයත් අඩංගු අභිධර්ම පිටකය දේශනා කරන ලදී. ඒ මුළු අභිධර්ම පිටකයට මා පිරිනිවන් පෑ කල්හි නුඹලාට ශාස්තෘන් වහන්සේ නමකගේ කාර්යය ඉටුකරන්නේය. මෙසේ බුදුවීමේ පටන් පිරිනිවන්පෑම දක්වා හතළිස් පස්වසක් මේ සියල්ල මා විසින් කියන ලදී. ප්‍රකාශ කරන ලදී. තුන්පිටකයත් නිකාය පසත් අංග නවයත් අසූසාර දහසක් ධර්මස්කන්ධය මෙසේ විශාල වූ ප්‍රභේද ඇත්තේය. මෙසේ මේ අසූසාර දහසක් ධර්මස්කන්ධයෝ පවතිත්. මම හුදෙකලාව පිරිනිවන් පාන්නෙමි. මම ද වනාහි දැන් තනිව අවවාද කරමි. අනුශාසනා කරමි.

මා පිරිනිවන්පෑ කල්හි මේ අසූසාර දහසක් ධර්මයෝ නුඹලාට අවවාද කරන්නෝය. අනුශාසනා කරන්නාහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ බොහෝ කාරණා දක්වමින් 'මගෙන් පසුව එය ඔබලාට ශාස්තෘ වන්නේය යනුවෙන් අවවාද දී නැවත අනාගතයේදී වැළැක්විය යුතු දේ දක්වමින් යථා බො පන (යම්සේ වනාහි) ආදිය වදාළහ. එහි **සමුදාචරනති** යනු කියත්. ව්‍යවහාර කරත්. **නාමෙනවා ගොතෙතන වා** නවකයෙක් යැයි නොකියා තිස්සය, නාගය යනාදී ලෙස නමින් හෝ කාශ්‍යප, ගෞතම ආදී ගෝත්‍ර නාමයෙන් හෝ ඇවැත්නි තිස්ස, ඇවැත්නි කස්සප යන ලෙස ආවුසොවාදයෙන් (ඇවැත්නි, කියා ආමන්ත්‍රණය කිරීමෙන්) හෝ කිවයුතුය. **භනෙත ති වා ආයසමා වා** ස්වාමීනි! තිස්ස, ආයුෂ්මත් තිස්ස යන ලෙස කථාකළ යුතුයි. **සමූහනතු** බලාපොරොත්තු වන්නේ උදුරා දමන්න. ඉදින් කැමැතිනම් උදුරා දමන්න යන අර්ථයි. කුමක් නිසා උදුරා දමන්න යැයි ඒකාන්ත වශයෙන් නොකියා විකල්ප වචනයෙන් තැබීද, මහාකාශ්‍යපයන් වහන්සේගේ හෝ බලය දුටු බැවිනි. උදුරා දමන්න යැයි භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශකළත් සංගීති කාලයේදී කාශ්‍යප රහතන් වහන්සේ උදුරා නොදමන්නේය. ඒ නිසා විකල්පයෙන් තැබීය. එහිදී ඇතැම් තෙරවරු මෙසේ කීහ. පාරාජිකා සතර හැර ඉතිරි බුද්දානු බුද්දක ආදී වශයෙන් පංචසතික සංගීතියේදී (පළමු සංගායනාව) බුද්දානුබුද්දක කථාව ආවේය. මෙහි විනිශ්චය වනාහි සමන්තපාසාදිකා විනය අටුවාවේදී කියන ලදී. තවකෙනෙක් වනාහි මෙසේ කීහ. ස්වාමීනි! නාගසේන! කොපමණක් බුද්දකද කවරක් අනුබුද්දක දැයි මිළිඳු රජු විසින් ඇසූකල්හි මහරජ! දුකකට ආපතති බුදදකය. දුබභාසිත අනුබුදදකය යැයි කියන ලද බැවින් නාගසේන තෙරහු බුද්දානුබුද්දක හඳුන්වා දෙයි.

මහාකාශ්‍යප තෙරුන්වහන්සේ එය නොදන්නේ ඇවැත්නි! අසනු ලැබේවා. අපට ශික්ෂාපද තිබේ. ගිහියන්ට අයත් ඒවා ගිහියෝ දනිත්. මෙය ශ්‍රමණ වූ, ශාක්‍යපුත්‍ර වූ අපට කැපය. මෙය අපට අකැපය. ඉදින් අපි බුද්දානුබුද්දක ශික්ෂාපද අතහැර දමන්නෙමු නම් මෙසේ කියන්නෝ ඇතිවන්නාහ. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් දිගුකල් පැවැත්ම සඳහා තම ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවන ලදී. ශාස්තෘන් වහන්සේ ජීවත්ව සිටියදී ඔව්හු ඒ ශික්ෂාපද රැක්කාහ. මොවුන්ගේ ශාස්තෘන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි නොරකිත් කියාය.

සංඝයාට සුදුසු කාලයයි. සංඝයා ශාස්තෘන් වහන්සේ විසින් නොපනවන ලද දෙයක් නොපනවන්නේය. පණවන ලද දෙයක් සිඳ නොදමන්නේය. පනවන ලද ශික්ෂාපදයන්හි සමාදන්ව පැවතිය යුතුය. මෙය නියමයයි. කර්මවාක්‍යය අස්වයි. එය මෙසේ නොගත යුතුයි. නාගසේන තෙරුන් වහන්සේ වනාහි විරුද්ධවාදීන්ට මෙබඳු ඉඩක් නොවන්නට මෙසේ පැවසීය. මහාකාශ්‍යප තෙරුන් වහන්සේ බුද්දානු බුද්දක ආපත්තීන් උදුරා නොදැමිය යුතුයයි කර්මවාක්‍යය ප්‍රකාශ කළේය.

බ්‍රහ්මදණ්ඩ කථාවද සංගායනාවේදී ආ බැවින් සමන්ත පාසාදිකාවේදී එය විභාග කරන ලදී. කංඛා යනු සැකය. විමති යනු විභාග කරන්නට අසමත් බව. බුදුවූයේද? බුදු නොවේද, ධර්මයද ධර්මය නොවේද, සංඝයාද සංඝයා නොවේද? මාර්ගයද මාර්ගය නොවේද, ප්‍රතිපදාවද, ප්‍රතිපදාව නොවේද? මෙසේ යමෙක් හට සැකයක් උපදීද එය තොපට කියමි. මහණෙනි! විචාරන්න යනු මෙහි කෙටි අර්ථයයි. සත්‍ථුගාරවෙනාපි න පුච්ඡෙය්‍යාථ යනු අපි ශාස්තෘන් වහන්සේ සමීපයේ පැවිදි වූයෙමු. අපගේ සිව්පසයද ශාස්තෘන් වහන්සේ සන්තකය. ඒ අපි මෙතෙක් කල් සැක නොකොට අද අවසන් වේලාවේ සැක කරන්නට සුදුසු නැත. ඉදින් ශාස්තෘන් වහන්සේට ඇති ගෞරවය නිසා නොවිචාරන්න. සහායකොපි භික්ඛවෙ සහායකස්ස ආරොචෙතු නුඹලාගේ යමෙක් යම් භික්ෂුවකට හිතවත්ද මිත්‍රද හෙතෙම ඔහුට සැල කෙරේවා. මම එක් භික්ෂුවකට කියන්නෙමි. ඔහුගේ කථාව අසා සියල්ලෝම සැක නැත්තෝ වෙත්වායි දක්වයි. එවං පසනෙනා මම මෙසේ විශ්වාස කරමි යන අර්ථයි. ඤාණමෙවා නිසැක බව ප්‍රත්‍යක්ෂ කරන ඤාණයම මෙහි තථාගතයන් වහන්සේට ශ්‍රද්ධා මාත්‍රයක් නොවේ යන අර්ථයි. ඉමෙසං හි ආනන්‍ද මේ තිරය ඇතුළත සිටින්නා වූ පන්සියයක් භික්ෂූන්ට යො පච්ඡිමකො යමෙක් ගුණ වශයෙන් පසුපසට අයත් ආනන්ද තෙරුන් ගැන කියන ලදී.

අප්පමාදෙන සම්පාදෙථ සිහිය තොර නොකිරීමෙන් සියළු කටයුතුවල යෙදෙන්න යැයි භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් මංචකයේ වැඩසිටියේ හතළිස්පස් වර්ෂයක් දෙන ලද සියළු අවවාද එකම අප්‍රමාද පදයක බහා ප්‍රදානය කළ සේක. 'අයං තථාගතස්ස පච්ඡිමා වාචා' (මේ තථාගතයන් වහන්සේගේ අවසන් වචනයයි.) මේ වනාහි සංගීති කාරකයන්ගේ වචනයකි.

ඒට පසුව පරිනිර්වාණයට අවශ්‍ය කටයුතු කොට භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑ සේක. ඒ බව දැක්වීමට 'ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ප්‍රථම ධ්‍යානයට ආදිය කියන ලදී. එහි **පරිනිබ්බුතො භන්තෙ** යනු නිරෝධ සමාපත්තියට සමවැදුනු භාග්‍යවතුන් වහන්සේගේ ආශ්වාස, ප්‍රශ්වාස නතරවීම ගැන මෙසේ විචාළේය. **න ආවුසො** යි කීය. (නැත ඇවැත්නි) තෙරුන්වහන්සේ කෙසේ දන්නේද? තෙරුන්වහන්සේ වනාහි ශාස්තෘන් වහන්සේ සමගම ඒ ඒ සමාපත්තීන්ට සමවදිමින් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයෙන් නැගිටීම දක්වා ගොස් දැන් වනාහි භාග්‍යවතුන් වහන්සේ නිරෝධ සමාපත්තියට සමවැදුනේ, එම නිරෝධය තුළ අපවත්වීමක් සිදු නොවන්නේ යයි දනියි.

> **අථ ඛො භගවා සඤ්ඤා වෙදයිත නිරොධ සමාපත්තියා වුට්ඨහිත්වා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනං සමාපජ්ජි -පෙ- තතියජ්ඣානා වුට්ඨහිත්වා චතුත්ථජ්ඣානං සමාපජ්ජි**

(ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිට නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට සමවැදුනේය. -පෙ- තතියජ්ඣානයෙන් නැගිට චතුර්ථ ධ්‍යානයට සමවැදුනේය.)

මෙහිදී භාග්‍යවතුන් වහන්සේ විසිහතර තැනක ප්‍රථමධ්‍යානයට සමවැදුනේය. දහතුන් තැනක ද්‍විතිය ධ්‍යානයටත්, එසේම තතිය ධ්‍යානයටත් එසේම පසළොස් තැනක චතුර්ථධ්‍යානයටත් සමවැදුනේය. කෙසේද? දස අසුභයන්හි, ද්වත්තිංසාකාරයේ, අෂ්ට කසිණවල මෙත්තා, කරුණා, මුදිතාවල ආනාපානයෙහි, පිරිසිඳ අවකාසයෙහි යන මේ විසිහතර තැන්හි ප්‍රථමධ්‍යානයට සමවැදුනේය. දෙතිස් ආකාරයත් දස අසුභත් හැර තෙළෙස් තැනක ද්‍විතියධ්‍යානයටත් ඒවාගේම තතියධ්‍යානයටද සමවැදුනි. අෂ්ට කසිණයන්හි උපෙක්ෂා බ්‍රහ්ම විහාරයෙහි, ආනාපානයෙහි පිරිසිඳ අවකාසයේ සිටි ආරුප්පවල යන මේ පසළොස් තැනක චතුර්ථ ධ්‍යානයට සමවැදුනි. මෙයද කෙටිකථා පුවතයි. නිවන්පුරට පිවිසෙන භාග්‍යවතුන් වහන්සේ වනාහි ධර්මස්වාමී වූයේ විසිහතර කෝටියක් පමණ වූ සමාපත්තිවලට පිවිස විදේශයකට යන්නේ නෑ ජනයාව වැළඳගෙන මෙන් සියළු සමාපත්ති සැප අනුභවකොට පිවිසියේය.

**චතුත්‍ථජ්ඣධානා වුට්ඨහිත්‍වා සමනනතරං භගවා පරිනිබ්බායි** යනු මෙහි ධ්‍යානයන්ට සමීපයෙහි වූ ප්‍රත්‍යවේක්‍ෂාවට සමීප වූ යැයි ළංවීම් දෙකකි. එහි ධ්‍යානයෙන් නැගිට භවාග්‍රයට බැස්සහුට එහිම පිරිනිවන්පෑම ධ්‍යාන සමනන්තර (ධ්‍යානයට ළංව පිහිටි) නම් වේ. ධ්‍යානයෙන් නැගිට නැවත ධ්‍යාන අංගයන් ප්‍රත්‍යවේක්‍ෂාකොට භවාංගයට බැස්සහුට එහිම පරිනිර්වාණය ප්‍රත්‍යවේක්‍ෂා සමනන්තරය නම් වේ. මේ සමනන්තර දෙකම (සමීපව පිහිටීම) භාග්‍යවතුන් වහන්සේ ධ්‍යානයට සමවැදී ධ්‍යානයෙන් නැගිට ධ්‍යාන අංග ප්‍රත්‍යවේක්‍ෂා කොට භවංග සිතකට පිවිසියහුට එහම පිරිනිවන්පෑම ප්‍රත්‍යවේක්‍ෂා සමනන්තරය නම් වේ. මේ සමනන්තර දෙකම වේ. භාග්‍යවතුන් වහන්සේ ධ්‍යානයට සමවැද ධ්‍යානයෙන් නැගිට ධ්‍යානඅංග ප්‍රත්‍යවේක්‍ෂා කර භවාංග සිතෙන් විස්තර කළ දුක්ඛ සත්‍යයෙන් පිරිනිවන්පෑවේය. යම් ඒ බුදුවරුද පසේ බුදුවරුද ආර්ය ශ්‍රාවකයෝද යටත්පිරිසෙයින් කොහේ හෝ කුහුඹුවකු අරහයා සියල්ල භවාංග සිතෙන්ම ප්‍රකාශ නොකළ දුක්ඛ සත්‍යයෙන් කලුරිය කරත්. මහපොළව කම්පා වීමාදිය කියන ලද ආකාරයෙන්මය.

**භූතා** සත්ත්වයෝ. **අප්පටිපුග්ගලො** විරුද්ධ පුද්ගලයකු නැති. **බලප්පත්තො** දසවිධ ඥාණබලයන්ට පත් වූ. **උප්පාද වයධම්මිනො** හටගැනීම හා අභාවය ස්වභාවකොට ඇති. **තෙසං වූපසමො** ඒ සංස්කාරයන් උපසමනය කිරීම නම් වූ අසංඛත නම් වූ නිර්වාණයම සුඛය යන අර්ථයි.

**නාහු අස්සාස පස්සාසො** ආශ්වාස ප්‍රශ්වාස නැති. **අනෙජො** තණ්හා සංඛ්‍යාත වූ ආශාවෙන් තොර බැවින් අනෙජ නම් වූ. **සන්තිමාරබ්භ** අනුපාදිසෙස නිර්වාණය අරභයා, ඒ සඳහා. **යං කාලමකරි** යමෙක් කලුරිය කළේද මෙය කියන ලදී. ඇවැත්නි, යමෙක් මාගේ ශාස්තෘ වූ බුද්ධ මුනීන්ද්‍රයන්ගේ ශාන්තියට යන්නෙමියි සංසිඳීම අරහයා කලුරිය කළේය. එසේ සිතැතිව සිටියහුගේ ආශ්වාස ප්‍රශ්වාස නැත. සිදු නොවේ. **අසල්ලීනෙන** පසුබට නොවන, නොහැකිලුනු මනාව ප්‍රබෝධමත් වූ සිතින්. **වෙදනං අජ්ඣවාසයි.** වේදනාව ඉවසීය. වේදනාව අනුව නොපැවත එහෙ මෙහෙ පෙරලුනේය. **විමොක්ඛො** කිසියම් ධර්මයකින් අනාවරණ විමොක්‍ෂයයි. සියළු ආකාරයෙන්ම නොපැනවූ බවට පත්ව බබලන නිර්වාණයට සමාන විය. **තදාසි** යනු පරිනිර්වාණය සමග මහපොළව සෙළවීම. මෙසේ පහත කියන ලද භූමිකම්පාව ගැන කියන ලදී. එය

වනාහි ලොමුඩැහැ ගන්වන, බියජනක ද විය. **සබ්බාකාරවරූපෙතෙ** සියළු උතුම් කාරණයන්ගෙන් යුක්ත. **අවීතරාගා** පෘථග්ජනයෝද සෝවාන් හා සකෘදාගාමීන් ඔවුන්ගේ වනාහි දෝමනස්සය ප්‍රහීණ නැත. ඒ නිසා ඔව්හුද අත් බැඳගෙන හඬත් යැයි සියල්ල පෙර පරිදිම දතයුතුය. **උජ්ඣායන්ති** ආර්යයෝ තමන්ටද ඉවසාගත නොහැකි වන්නාහ. සෙසු ජනයාව කෙසේ අස්වසත්ද, කියමින් කැගසත්. **කථං භූතා පන භනෙත ආයස්මා අනුරුද්ධො සලලකෙඛති** ස්වාමීනි, දෙවියෝ කෙසේ වීද? ආයුෂ්මත් අනුරුද්ධ තෙරහු සිතා බැලීය. කිම ඔවුන්ට ශාස්තෘන් වහන්සේගේ පිරිනිවන්පෑම ඉවසිය හැකිද? ඉක්බිති ඔවුන්ගේ තත්ත්වය දැක්වීම පිණිස තෙරුන්වහන්සේ **සන්තාවුසො** (ඇවැත්නි, වෙත්) ආදිය පැවසීය. ඒ කියන ලද අර්ථයමැයි.

**රත්තාවසෙසං** බොහෝ අලුයම පිරිනිවන්පෑ බැවින් රාත්‍රියේ ඉතිරි කොටස සුළු වූවකි. **ධම්මියා කථාය** අන්‍ය වෙන් වෙන් වූ ධර්මකථාවක් නම් නැත. ඇවැත්නි, දෙවියන් සහිත ලෝකයේ අසහාය පුද්ගලකු වූ ශාස්තෘන් වහන්සේට මේ මාරයා ලජ්ජා නොවීය. ලෞකික මහාජනයාට කෙසේනම් ලජ්ජා වන්නේද?

මෙබඳු වූ මරණය හා සම්බන්ධ වූ කථාවන්ගෙන් කල්ගත කළහ. ඒ කථා කරන්නවුන්ට මොහොතින් අරුණ නැග්ගේය.

**අථඛො** යනු අරුණ නැගීම දැක ම තෙරුන් වහන්සේ තෙරුන්ට මෙසේ පැවසීය. **තෙනෙව කරණීයෙන** පිරිනිවන්පෑ තැන කෙබඳු ලෙස මාලා ගන්ධ ආදියෙන් කරන සත්කාර කෙසේ විය යුතුද, භික්ෂු සංඝයාට හිඳිනා තැන් කෙසේ විය යුතුද ඛාද්‍ය, භෝජ්‍ය ආදිය කෙසේ විය යුතුද. මෙසේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑ බව අසා කළයුතු යම් කටයුතු වේද ඒවා **සබ්බං ච තාලාවචරං** යනු සියළු තූර්යභාණ්ඩ. **සන්නිපාතෙථ** බෙර හසුරුවා රැස්කරව්. ඔව්හු එසේම කළහ. **මණ්ඩලමාලෙ** වස්ත්‍රමය රවුම් ශාලාවේ **පටියාදෙන්තා** සරසන්නෝ **දක්ඛිණෙන දක්ඛිණං** නගරයට දකුණු දිග් භාගයෙන්ම දකුණු දිසා කොටස, **බාහිරෙන බාහිරං** ඇතුල් නගරයට නොපිවිස පිටතින්ම නගරයේ බාහිර කොටස ගෙන, **දක්ඛිණතො නගරස්ස** අනුරාධපුරයට දකුණු දොරටුව සමාන තැනක තබා සත්කාර සම්මාන කර ජේතවනය සමාන තැනක දවන්නෙමුයි යන අර්ථයි. **අට්ඨමල්ල පාමොක්ඛා** මධ්‍යම වයසේ බලසම්පන්න මල්ල රජදරුවන්

අටදෙනා. **සීසං නහාතා හිස් සෝදා නාවා ආයසමනතං අනුරුදධං** තෙරුන්වහන්සේ දිවැස් ඇත්තේයැයි ප්‍රකටය. ඒ නිසා ඔවුන් සිටියදීත් අන් මහ තෙරවරුන් අතරේ මෙය ප්‍රකට නොකර කියන්නේ යැයි තෙරුන්ගෙන් විචාළාහ. **කථංපන භනෙත දෙවතානං අධිපපායො** යනු ස්වාමීනි! අපගේ අභිප්‍රාය දනිමු. දෙවියන්ගේ අදහස කෙබඳුදැයි ඇසූහ. තෙරුන්වහන්සේ පළමුව ඔවුන්ගේ අදහස දක්වමින් 'තුමහාකං ඛො' (නුඹලාගේ වනාහි) ආදිය කීය. **මකුටබනධනං නාම මලලානං චෙතියං** මල්ල රජවරුන්ගේ සැරසෙන මංගල ශාලාවට මේ නමය. ගරුකරන ලද්දේය යන අර්ථයෙන් මෙය චෙතියං කියා කියන ලදී. යාව **සනධිස මල සංකටීරා** යනු මෙහි සන්ධි නම් ගෘහ සන්ධි - සමල නම් මළ නික්ම යන නාළ - **සංකටීරං** යනු කුණු දමන තැන. **දිබෙබහි ච මනුසසකෙහි ච** නචෙචහි උඩ දෙව්වරුන්ගේ නෘත්‍යයෝ වෙත්. පහත මිනිසුන්ගේ ගීත ආදියෙහි මේ ක්‍රමයයි. තවද දෙවියන් අතර මිනිස්සු, මිනිසුන් අතරේ දෙවියන් යැයි මෙසේ ද සත්කාර ගරුකාර දක්වමින් ගියහ. **මජඣෙන මජඣං නගරසස හරිතවා** මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ දේහය ගෙනයනු ලබන කල්හි බන්ධුලමල්ල සේනාපතියාගේ බිරිඳ වූ මල්ලිකාව, භාග්‍යවතුන් වහන්සේගේ දේහය රැගෙන එන්නේ යැයි අසා තම ස්වාමියාගේ මිය යාමේ පටන් පාවිච්චි නොකර තබන ලද විශාඛාවගේ මහා ප්‍රසාදනයට සමාන වූ මහාලතා පසාදනය ගෙන්වාගෙන මෙයින් ශාස්තෘන් වහන්සේට පූජා කරන්නෙමියි එය ඔපදමා සුවඳපැනින් සෝදා දොරටුව ලඟ සිටියාය. ඒ පළඳනාව වනාහි ඒ ස්ත්‍රීන් දෙදෙනාගේද දෙව දානිය චෞරයාගේ ගෙදරද යන තුන්තැනක විය. ඕතොමෝ ද ශාස්තෘන් වහන්සේගේ දේහය දොරටුව අසලට ලඟා වූ කල්හි දරුවෙනි, ශාස්තෘ ශරීරය බස්වන්න යැයි කියා ඒ පළඳනාව ශාස්තෘ දේහය මත තැබීය. එය ශීර්ෂයේ පටන් දිග හළ විට සිරිපතුල දක්වා විහිද ගියේය. ස්වර්ණවර්ණ වූ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය සප්ත රතනමය මහා පළඳනාවෙන් සැරසුනේ අතිශයින් බැබලුනේය. ඇය එය දැක පසන් සිත් ඇත්තී ප්‍රාර්ථනාවක් කළාය. භාග්‍යවතුන් වහන්ස, යම්තාක් සසර ඇවිදින්නෙම්ද ඒ තාක් මට වෙන් වෙන්වූ සැරසීම් කටයුත්තක් නොවේවා. නිරන්තරයෙන් ආභරණ පැළඳ ගත්තාක් බඳු ශරීර ඇත්තේ වේවා. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේව සප්ත රතනමය පළඳනාවෙන් ඔසවා පෙරදිග දොරටුවෙන් බැහැරට ගෙන නගරයේ පෙරදිගින් ඇති මකුටබන්ධන නම් මල්ල රජදරුවන්ගේ චෛත්‍යයෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය තැන්පත් කළහ.

පාවාය කුසිනාරායං යනු පාවා නගරයෙහි පිඬු පිණිස වැඩමවා කුසිනාරාවට යන්නෙමියි මගට පිළිපන්නේ වෙයි. රුක්ඛමූලෙ නිසීදි මෙහිදී කුමක් නිසා දිවා විහාරය කියා නොකියන ලදද? දිවා විහරණය පිණිස නොසිටි බැවිනි. තෙරුන්වහන්සේගේ වනාහි පිරිවර භික්ෂූහු සියල්ලෝම සැපසේ වර්ධනය වූ මහා පුණ්‍යවන්තයෝය. ඔව්හු මධ්‍යාහ්න වේලාවේ රත් වූ පාෂාණයක් බඳු පොළවෙහි පයින් ගමන් කරන්නාහු පීඩාවට පත්වූහ. තෙරුන් වහන්සේ ඔවුන් දැක භික්ෂූහු පීඩාවෙත්. යායුතු තැන ද දූරය. ටික වේලාවක් විවේක ගෙන වෙහෙස නිවාගෙන සවස්කාලයේ කුසිනාරාවට ගොස් දසබලයන් වහන්සේව බලන්නෙමියි මාර්ගයෙන් ඉවත්ව එක් ගසක් මුල සඟල සිවුර එළා පැන් කලයේ පැනින් අත්පා සිහිල් කරගෙන හුන්නේය. පිරිවර භික්ෂූහු ද වෘක්ෂමූලයේ සිට යෝනිසෝ මනසිකාරයෙන් වැඩකරන්නාහු රත්නත්‍රයේ ගුණ වර්ණනා කරමින් හුන්නාහ. මෙසේ අව් රස්නය දුරුකිරීම සඳහා හුන් බැවින් දිවා විහාරය කියා නොකියන ලදී.

මන්දාරවපුප්ඵං ගහෙත්වා මහා පාත්‍රයක් පමණ පුෂ්පයක් අමතර දණ්ඩක සවිකර කුඩයක් මෙන් ගෙන අද්දසා ඛො එන්නහු දුරදීම දුටුවේය. දැකම මෙසේ සිතීය. ආජීවකයාගේ අතෙහි මේ පුෂ්පය තිබෙනු පෙනේ. මෙයද සැමකල්හි මනුෂ්‍ය පථයක දක්නට නොලැබේ. යම්කලෙක වනාහි යම් ඍද්ධිවන්තයෙක් ඍද්ධි ප්‍රාතිහාර්ය කරයිද එකල සර්වඥ වූ බෝධිසත්ත්වයන් මව්කුසට පිවිසීම ආදියෙහි වෙයි. අද වනාහි කිසිවකු විසින් ඍද්ධි ප්‍රාතිහාර්යයක් නොකරන ලදී. මාගේ ශාස්තෘන් වහන්සේ මව්කුසට පිළිවිසියේ නොවේ. මව්කුසින් නික්මුනේ නොවේ. උන්වහන්සේගේ බුද්ධත්වය ද අද නොවේ. දම්සක් පැවැත්මද නැත. යමක ප්‍රාතිහාර්යයද නැත. දේවාරෝහණයද නැත. ආයු සංස්කාර හරණයද නොවේ. මාගේ ශාස්තෘන් වහන්සේ වනාහි මහලුය. ස්ථිරවම පිරිනිවන් පාන්නේය. ඉක්බිති ඔහුගෙන් අසා බලන්නෙමියි සිතක් උපදවාගෙන, ඉදින් හිඳගෙනම විචාරන්නේ නම් ශාස්තෘන් වහන්සේට අගෞරවයක් කළා වන්නේයැයි නැගිට සිටි තැනින් ඉවත්ව ඡද්දන්ත ඇත්රජෙක් මාණික්‍යමය සම්කඩක් මෙන් දසබලයන් වහන්සේගේ දේහයෙහි මේඝවර්ණ වූ පංශුකූල චීවරය පොරවා නියදසය එක් කිරීමෙන් බබලන ඇඳිලි සිරසෙහි තබාගෙන ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ආජීවකයාට පෙරටුව ඇවැත්නි, අපගේ ශාස්තෘන් වහන්සේව දන්නේදැයි ඇසීය. ඇයි ශාස්තෘන් වහන්සේ පිරිනිවන් පෑ

බව නොදන්නෙහිදැයි ඇසීය. නොදන්නේ යයි කීය. ක්ෂීණාශ්‍රවයන් ගේ දැනුම ආවර්ජනාව හා බැඳී පවතී. ආවර්ජනා නොකළ බැවින් ඔහු නොදැන ඇසීයයි කෙනෙක් කියති. තෙරුන්වහන්සේ සමාපත්ති බහුලය. රාත්‍රී ස්ථාන, දිවාස්ථාන, ලෙන්, මණ්ඩප ආදියෙහි නිරන්තර සමාපත්ති බලයෙන් කල්ගත කරයි. කුලයට සමීප ගමට පිවිස දොරකඩ සමාපත්තියට සමවැද සමාපත්තියෙන් නැගිට භික්ෂාව ගනී. තෙරුන්වහන්සේ වනාහි මේ අවසන් ආත්මභාවයෙන් මහාජනයාට උපකාර කරන්නෙමියි යමෙක් මා හට භික්ෂාව හෝ දෙත් ද ගඳමල් ආදියෙන් හෝ සැළකිලි දක්වත්ද ඔවුන්ට එය මහත්ඵල වන්නේ යයි මෙසේ කරයි. ඒ නිසා සමාපත්ති බහුල බැවින් නොදනී. මෙසේ නොදන්නා බැවින්ම අසයි කියා කියත්. එය නොගත යුතුයි. මෙහි නොදැනීම පිළිබඳ කාරණයක් නැත.

ශාස්තෲ පරිනිර්වාණය වනාහි දස සහශ්‍රී ලෝකධාතුව කම්පාවීම් ආදි නිමිතිවලින් සලකුණු කරන ලදී. තෙරුන්ගේ පිරිසෙන් ඇතැම් භික්ෂූන් විසින් භාග්‍යවතුන් වහන්සේව දක්නා ලදී. කෙනෙකු විසින් නොදක්නා ලදී. එහි යමකු විසින් දැක තිබේද ඔව්හුද දකිනු කැමැත්තාහ. නොදුටුවිරූ අයද දකිනු කැමැත්තාහ. එහි යමකු විසින් නොදක්නා ලද ද ඔව්හු දැකීමට ඇති බලවත් ඕනෑකම නිසා ගොස් භාග්‍යවතුන් වහන්සේ කොහිදැයි විචාරන්නාහු පිරිනිවන් පෑවේයයි අසා දරාගත නොහැකි වූහ. සිවුරු ද පාත්‍රයද දමා එක් සිවුරක් පෙරවා හෝ යම්තමින් පොරවාගෙන පපුවට ගසාගනිමින් හඬන්නාහ. එහි මිතිස්සු මහා කස්සප තෙරුන් සමග පැමිණියා වූ පාංශුකූලික භික්ෂූහු තමන් ස්ත්‍රීන් මෙන් හඬත්. ඔව්හු කිම අපව සනසන්නේ නැද්දැයි මට දොස් පවරත්. මේ මහා වනාන්තරය හිස් වූවකි. මෙහි යම් යම් ආකාරයකින් හැඬීමෙහි දෝෂයක් නැත. කල්ඇතිව අසා ශෝකය අඩුවන්නේ යැයි භික්ෂූන්ට සිහිය උපදවා ගැනීම පිණිස දන්නාක් මෙන් විචාළේය. **අජ්ජසත්තාහපරිනිබ්බුතො සමණො ගොතමො** යනු ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පිරිනිවන්පා සත් දිනකි. **තතො මෙ ඉදං** යනු ඒ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පිරිනිවන් පෑ තැන් සිට.

**සුභද්දො නාම වුඩ්ඪ පබ්බජිතො** සුභද්ද යනු ඔහුගේ නාමයයි. මහලු කල්හි පැවිදි වූ බැවින් වුඩ්ඪපබ්බජිත යැයි කියනු ලැබේ. කුමක් නිසා ඔහු මෙසේ ප්‍රකාශ කළේද? භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෛරයෙනි. මෙය වනාහි ඛන්ධකයෙහි ආතුමා වස්තුවේ ආවකි. කලින්

කරණවැමියකු වූ මහළු පැවිද්දෙක් භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාවෙන් නික්ම එක්දහස් දෙසියපනහක් භික්ෂූන් සමග ආතුම නගරයට යනකල්හි, භාග්‍යවතුන් වහන්සේ වඩින්නේ යැයි අසා වැඩියකල්හි කැඳ දානයක් දෙන්නෙමියි සාමණේරව සිටි පුතුන් දෙදෙනෙකුට මෙසේ කීය. දරුවෙනි! භාග්‍යවතුන් වහන්සේ වනාහි එක්දහස් දෙසියයක් මහා භික්ෂු සංඝයා සමග ආතුම නගරයට වඩින්නේය. දරුවෙනි, නුඹලා ගොස් හිසකෙස් කැපීමට උවමනා උපකරණ රැගෙන ගෙයක් පාසා ඇවිදින්න, ලුණු, තෙල්, හාල් හා අනුභව කළයුතු දේ රැස්කරව්. පැමිණියා වූ භාග්‍යවතුන් වහන්සේට කැඳ දානයක් දෙන්නෙමු කියා ඔව්හු එසේ කළහ. මිනිස්සු, ඒ දරුවන් මනහර, වැටහීම් ඇතියවුන් දැක කළයුතු දේත් නොකළ යුතු දේත් කරත්මය. කරන ලද කල්හිද දරුවෙනි, කුමක් ගන්නහුද කියා අසත්. අපට වෙනත් දෙයකින් ප්‍රයෝජනයක් නැතැයි ඔව්හු කියත්. අපගේ පියා භාග්‍යවතුන් වහන්සේ පැමිණි කල්හි කැඳ දානයක් දෙනු කැමැත්තේ යයි කියති. ඒ අසා මිනිස්සු පරීක්ෂා නොකොට ඔවුන්ට ගෙනෙන්ට හැකි සියල්ල දෙත්. යමක් නොහැකි වේද මිනිසුන් විසින් යවනු ලැබේ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආතුමා නගරයට වැඩමවා ධාන්‍යාගාරයට පිවිසි කල්හි සුභද්‍ද තෙමේ සවස් කාලයේ ගම්දොරට ගොස් මිනිසුන් ඇමතීය. උපාසකවරුනි! මම නුඹලාගෙන් බලාපොරොත්තු නොවෙමි. මාගේ දරුවන් විසින් ගෙනෙන ලද තෙල් ආදියම සංඝයාට ප්‍රමාණවත්ය. මට අත් උදව් පමණක් දෙන්න. මේ මේ දේ ගන්න යැයි සියලු උපකරණ ගෙන්වාගෙන විහාරයෙහි උදුන් සූදානම් කර එක් කලු සිවුරක් හැඳ එබන්දක්ම පොරවා මෙය කරව්. මෙය කරව් යැයි මුළු රාත්‍රියම සංවිධානය කරමින් ලක්ෂයක් වියදම්කොට භොජ්ජයාගු නම් ආහාරය ද මධුගොළක නම් කැවිලි ද පිළියෙල කරවීය. භොජ්ජයාකු නම් අනුභව කොට පානය කළයුතු කැඳ, එහි ගිතෙල්, මීපැණි, මත්ස්‍ය, මාංශ, මල්ඵල රසාදිය යම් කැයුතු දේ ඇද්ද ඒ සියල්ල එහි දැම්මවිය. ක්‍රීඩා කරන්නවුන්ට හිසේ ගෑමට සුදුසුය. සුවඳවත්ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කල්ඇතිවම සිරුර පිළිදැගුම් කොට භික්ෂු සංඝයා පිරිවරා පිඬු පිණිස හැසිරීමට ආතුමා නගරය දෙසට පිටත්ව ගියේය. භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස ගමට වඩියි. ඔබ විසින් කාහට කැඳ පිළිගන්වන්නේද කියා මිනිස්සු ඔහුට පැවසූහ. හෙතෙම හැඳ පෙරවා සිටි කලුපාට සිවුරුවලින්ම යුක්තව එක් අතකින් හැන්දක් ද ගෙන බ්‍රහ්මයා මෙන් දකුණු දණ බිම තබා වැඳ ස්වාමීනි, භාග්‍යවතුන්

වහන්ස කැඳ පිළිගනු සේක්වායි කීහ. ඉක්බිති දන්නා නමුත් තථාගතයන් වහන්සේලා විචාරත්යැයි ඛන්ධකවල ආ ආකාරයටම භාග්‍යවතුන් වහන්සේ විචාරා ද අසා ද ඒ මහලු පැවිද්දාට ගරහා ඒ අවස්ථාවෙහි අකප්පිය සමාදාන ශික්‍ෂාපදයද හිස්රැවුල් කපන උපකරණ භාවිතය පිළිබඳ ශික්‍ෂාපදයද යන ශික්‍ෂාපද දෙක පණවා මහණෙනි! අනේක කල්පකෝටි ගණනක් භෝජනය සොයන්නවුන් සමගම කල්ගත කරන ලදී. මෙය වනාහි නුඹලාට අකැපය. මේ අධර්මයෙන් උපයාගත් භෝජනය පරිභෝග කළාහු අනේකවූ ආත්මභාව සියගණනක් අපායන්හිම උපදින්නේය. ඉවත්වන්න. නොගන්න. භික්‍ෂාව සඳහා පිටත්ව ගියේය. එක භික්‍ෂුවක්වත් කිසිවක් පිළිගත්තේ නැත. සුභද්ද තෙමේ නොසතුටුව, මොහු සියල්ල දනිමියි ඇවිදියි. ඉදින් නොගනු කැමැත්තේ නම්, යවා දැන්විය යුතුයි. මේ පිසින ලද ආහාරය බොහෝ දවස් තිබෙන්නේ දවස් හතක් තබාගත හැක. මෙය වනාහි මාගේ දිවි ඇතිතෙක් පවත්නේය. ඔහු විසින් සියල්ල නසන ලදී. මොහු මා කෙරෙහි හිතවත් බවක් නැත්තේ යයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෛර බැඳ දසබලයන් වහන්සේ ජීවමානව සිටියදී කිසිවක් කියන්නට නොහැකි විය. ඔහුට මෙසේ සිතින. මේ උසස් කුලයෙන් පැවිදි වූ මහාපුරුෂයෙකි. ඉදින් කිසිවක් කියම්ද මට ම තර්ජනය කරන්නේය. ඒ මේ භාග්‍යවතුන් වහන්සේ අද පිරිනිවන් පෑවේයයි අසා ලබන ලද අස්වැසුම් ඇත්තෙක් මෙන් තුටුපහටු වූයේ මෙසේ කීය. තෙරුන්වහන්සේ එය අසා හදවතට වැදුනු පහරක් මෙන් හිසට පාත්වූ වියලි හෙණයක් මෙන් හැඟී ගියේය. උන්වහන්සේට ධර්ම සංවේගය පහළවිය. දවස් හතකට පළමු භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑවත් අද ද උන්වහන්සේගේ දේහය රන්පැහැයෙන් යුක්තමය.

භාග්‍යවතුන් වහන්සේ විසින් දුකසේ ගොඩනැගූ සසුනෙහි මේ සුළු පාපී කසටක්, කටුවක් ඇතිවිය. මේ පවිටා වනාහි වැඩෙන්නේ මෙබඳු වූ වෙනත් සහායකයන් ලැබ ශාසනය පසුබස්වන්නට හැකිවන්නේය. ඉක්බිති තෙරුන්වහන්සේ සිතීය. ඉදින් වනාහි මම මේ මහල්ලාව මෙහිම රෙදිකඩක් අන්දවා අළු විසුරුවා බැහැර කරවන්නෙම් ද මිනිස්සු ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ දේහය තිබියදීම ශ්‍රාවකයෝ විවාද ඇතිකර ගනිත් යැයි අපට දොස් පවරත් යැයි සිතා ඉවසන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ විසින් වනාහි එකට එකතු නොකළ මල් රාශියක් මෙන් ධර්මය දේශනා කරන ලදී. එහි යම්සේ වාතය වැදීමෙන් සමහර මල් එහෙ මෙහෙ විසිරී යයි. එපරිද්දෙන් මේ මෙබඳු පවිටු පුද්ගලයන්

නිසා කල්ගත වනවිට විනයෙහි ශික්ෂාපද එක දෙක බැගින් විනාශ වන්නේය. සූත්‍රයන්හි එකක් දෙකක් ප්‍රශ්න වාරයන් නැසී යත්. අභිධර්මයෙහි එක දෙක වෙනස් වෙනස් භූමිකාවන් නැසී යත්. මෙසේ පිළිවෙලින් මුල නැසුනු කල්හි පිසාචයන් හා සමවූවෝ වෙමු. ඒ නිසා ධර්මවිනය සංගායනාවක් කරන්නෙමු. මෙසේ ඇතිකල්හි ශක්තිමත් නූලකින් ගැට ගසන ලද මල් මෙන් මේ ධර්මවිනය ස්ථිරව පිහිටන්නේය.

භාග්‍යවතුන් වහන්සේ මේ සඳහා මට ගව්තුනක් පෙරගමන් කළේය. අවවාද තුනකින් උපසම්පදාව දුන්නේය. කයින් සිවුරු පෙරළිය කළේය. අහසට අත දිගුකර චන්ද්‍රයාට සමාන උපමා ප්‍රතිපදාවක් කියා සාක්ෂ්‍ය සහිතව කීවේය. තුන්වරක් මුළුශාසන නමැති රත්නය සඟවාලීය. මා වැනි භික්ෂූන් සිටියදී මේ පාපියෙක් සසුනෙහි දියුණුවන්නට ඉඩක් නොලැබිය යුතුයි. යම්තාක් අධර්මය නොබැබලෙයිද ඒතාක් ධර්මය පසුබසින්නේ නැත. යම්තාක් අවිනය නොබැබලේද ඒ තාක් විනය පරාජය නොවෙයි. අධර්මවාදීහු බලවත් නොවෙත්. ධර්මවාදීහු දුර්වල නොවෙත්. විනය විරෝධීහු බලවත්තයෝ නොවෙත්. විනයවාදීහු දුර්වල නොවෙත්. ඒතාක් අපි ධර්මවිනය දෙක සංගායනා කරන්නෙමු. ඉක්බිති භික්ෂූහු තම තමන්ට ගැලපෙන දේ ගෙන කැප-අකැප දේ කියන්නාහ. ඉක්බිති මේ පවිටා තමාම නින්දාවට පැමිණෙන්නේය. නැවත හිස ඔසවන්නට අසමත් වෙයි. ශාසනය සමෘද්ධිමත්, සම්පත් ඇතිවන්නේය. හෙතෙම මෙසේ මා හට සිතිවිල්ලක් උපන්නේ යැයි කිසිවකුට නොදන්වා භික්ෂු සංඝයාව සැනසීය. එබැවින් කියන ලදී. 'අථඛො ආයසමා මහාකසසපො -පෙ- හෙතං ඨානං විජ්ජති' (ඉක්බිති ආයුෂ්මත් මහා කාශ්‍යප තෙරුන්වහන්සේ -පෙ- මෙය සිදුවිය නොහැක්කකි.)

**චිතකං** විසිරියනක් උස සඳුන් චිතකය. **ආළිමෙපසසාම** යනු ගිනි ගන්වමු. **න සකෙකාන්ති ආළිමෙපතුං** යනු අටදෙනෙක්, දහසය දෙනෙක්, තිස්දෙකක් වශයෙන් ජනයා එකතුවී පන්දම් දෙක බැගින් ගෙන තල්වැටින් පවන් ගසමින් සම් පසුම්බිවලින් පිඹිමින් ඒ ඒ දේ කරමින් ගිනි ගන්වන්නට නොහැකි විය. **දෙවතානං අධිපපායො** මෙහිදී ඒ දේවතාවෝ ද තෙරුන්ගේ උපස්ථායක දෙවියෝ ද අසූමහා ශ්‍රාවකයන් කෙරෙහි සිත් පහදවා උන්වහන්සේලාට උපස්ථාන කරන අසූව අසූව බැගින් කුල දහසක් ස්වර්ගයෙහි උපන්නාහ. එපරිද්දෙන් තෙරුන් කෙරෙහි සිත පහදවා ස්වර්ගයෙහි උපන් දෙවිවරු ඒ හමුවේදී තෙරුන් නොදැක, අපගේ

හිතමිත්‍ර තෙරුන් වහන්සේ කොහිදැයි සොයන්නාහු අතරමග වඩින බව දැක අපගේ මිත්‍ර තෙරුන් වහන්සේ වඩිනතුරු චිතකය ගිනි නොගනීවායි අධිෂ්ඨාන කළහ. මිනිස්සු එය අසා මහා කාශ්‍යප නම් වූ ඒ භික්ෂූන් වහන්සේ පන්සියයක් භික්ෂූන් සමග දසබලයන් වහන්සේගේ පා වඳින්නෙමියි එයි. උන්වහන්සේ පැමිණෙන තෙක් චිතකය නොදැල්වෙයි. ඒ භික්ෂුව කෙබඳු කෙනෙක්ද? කළුද සුදු ද? උස ද මිටිද? මෙබඳු වූ භික්ෂූන් සිටි කල්හි දසබලයන් වහන්සේගේ පිරිනිවන්පෑම කුමක්දැයි කෙනෙක් සුවඳමල් ආදිය ගෙන ඉදිරිමගට පිළිපන්හ. කෙනෙක් වීදි සරසා එන මග බලමින් සිටියහ. ඉක්බිති ආයුෂ්මත් මහා කාශ්‍යප තෙරුන්වහන්සේ කුසිනාරාව දෙසට හිසනමා වැන්දේය. තෙරුන් වහන්සේ චිතකය ප්‍රදක්ෂිණා කොට ආවර්ජනා කරමින් මේ ස්ථානයේ පාදයෝ වන්නාහ. ඉක්බිති පා සමීපයේ සිට අභිඥාපාදක චතුර්ථ ධ්‍යානයට සමවැදී ඉන් නැගිට චක්‍රලක්ෂණ දහසකින් සමලංකෘත දසබලයන් වහන්සේගේ පාදයෝ කපු වැදැල්ලත් සමග වස්ත්‍ර යුගල පන්සියයක් ද ස්වර්ණමය දෙන ද සඳුන් චිතකය ද දෙකට බෙදී අවුත් මාගේ හිස මුදුනේ පිහිටාවායි අධිෂ්ඨාන කළේය. අධිෂ්ඨාන සිතත් සමගම ඒ වස්ත්‍ර යුගලයන් දෙබෑ වී වලාකුළු අතරින් පූර්ණ චන්ද්‍රයා මෙන් ශ්‍රීපාදයෝ නික්මුනාහ. තෙරුන් වහන්සේ විකසිත වූ රත්පියුම් හා සමාන වූ අත් දිගුකර ස්වර්ණවර්ණ වූ ශාස්තෲන් වහන්සේගේ ශ්‍රීපාදයන් වළලුකර තෙක් දැඩිව අල්ලා ගෙන තමන්ගේ සිරසෙහි තබාගත්තේය. එබැවින් මෙසේ ඇත. භගවතො පාදෙ සිරසා වන්දී (භාග්‍යවතුන් වහන්සේගේ පාදයෝ හිසින් වඳිනු ලැබූහ.) යැයි කියා ඇත.

මහාජනයා මේ පුදුමය දැක එකහඬින් මහානාද පැවැත්වූහ. ගඳමල් ආදියෙන් පුදා ඇතිතෙක් වැන්දේය. මෙසේ වනාහි තෙරුන් වහන්සේ විසිනුත් මහාජනයා විසිනුත් ඒ භික්ෂූන් පන්සියය විසිනුත් වඳිනවාත් සමගම නැවත අධිෂ්ඨාන කිරීමේ කාර්යයක් නැත. ප්‍රකෘති අධිෂ්ඨාන වශයෙන් ම තෙරුන් වහන්සේගේ අතින් මිදී ලාරස බඳු පැහැ ඇති භාග්‍යවතුන් වහන්සේගේ අතින් මිදී ලාරස බඳු පැහැ ඇති භාග්‍යවතුන් වහන්සේගේ පාදතලයෝ සඳුන් දර ආදී කිසිවක නොගැටී පිහිටි තැනම පිහිටියාහ. නියම තැන පිහිටියේ විය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් පිටවන විටදී හෝ ඇතුල්වන විටදී පුළුන් අංශුවක්වත් රෙදි දාවළු නූල් පොටක්වත් තෙල් බිඳුවක්වත් ලී කැබැල්ලක්වත් තිබුනු තැනින් සෙලවූයේවත් නැත. සියල්ල නියම තැන්වල

තිබූ ලෙසින්ම විය. නැගිට වනාහි අස්තයට ගිය සූර්යයා මෙන් ද චන්ද්‍රයා මෙන් ද තථාගතයන් වහන්සේගේ පා ලඟ අතුරුසිදුරු නැතිව මහාජනයා මහා හඬින් විලාප නැගුහ. පිරිනිවන් පෑ අවස්ථාවටත් වඩා කරුණාවෙන් යුක්ත විය.

**සයමෙව භගවතො චිතකො පජ්ජලි** යනු මෙය වනාහි දල්වන්නට උත්සාහ කරන කිසිවකුටත් නොපෙනීම් වශයෙන් කියන ලදී. දේවතානු භාවයෙන් වනාහි මෙය හාත්පසින් එක්වරම දිලිසෙන්නට විය. **සරීරානෙව අවසිස්සිංසු** කලින් එක ගොඩක සමූහයක් වශයෙන් පැවැති බැවින් ශරීරය (සරීරං) නම් විය. දැන් විසිරීගිය බැවින් 'සරීරානී' කියන ලදී. සමන්මල් පොහොට්ටුවක් බඳු වූ ද සෝදන ලද මුතු ඇටයක් සමාන වූ ද රන් හා සමාන වූ ද ධාතූන් වහන්සේලා ඉතිරි වූහ යන අර්ථයි. දීර්ඝායුෂ විඳි බුදුවරයන් වහන්සේලාගේ ශරීර රන්කඳක් මෙන් ඒකඝන වෙයි. භාග්‍යවතුන් වහන්සේ වනාහි මම බොහෝකල් නොසිට පිරිනිවන් පාන්නෙමි. මාගේ ශාසනය තවමත් සැමතන්හි පැතිරුනේ නැත. ඒ නිසා පිරිනිවන් පෑවා වූ මාගේ අබඇටයක් පමණ වූ ද ධාතූන් රැගෙන තම තමන් වසන තැන්වල චෛත්‍යයක් කොට ගරු දක්වන්නා වූ මහාජනයා ස්වර්ග පරායණ වන්නාහු යයි ධාතූන් වහන්සේලා පැතිරයාම අධිෂ්ඨාන කළ සේක. උන්වහන්සේගේ ඇතැම් ධාතූන් වහන්සේලා විසිරී ගියහ. කීපයක් විසිර ගියේ නැත. දළදා වහන්සේලා සතර නමත් අකුධාතු දෙකත් නළල ය යන ධාතූන් සත්නම නො විසිරුණාහ. ඉතිරිවා විසිරී ගියේය. එහිදී කුඩාම ධාතූන් වහන්සේලා අබඇට පමණ වූහ. මහා ධාතූන් වහන්සේලා මැදින් කැඩුනු හාල්ඇටයක් ප්‍රමාණ වූහ. ඉතාම විශාල ඒවා මැදින් බිඳුනු මුංඇටයක ප්‍රමාණ විය. **උදක ධාරා** යනු බාහුවේ අග, කෙණ්ඩාව පමණ තල්කඳක් පමණ වූ දියධාරාවන් අහසින් වැටී නිවා දැම්මේය. **උදකසාලකෙ** පිරිවරා සිටි සල්ගස් ගැන මෙය කියන ලදී. ඒවායේදී අතු රිකිළි අතරද ජලධාරා නිකුත්වී නිවා දැමූහ. භාග්‍යවතුන් වහන්සේ ගේ චිතකය විශාල වූවකි. හාත්පසින් පොළොව බිඳී නඟුලිස පමණ දියදහරක්, මුදුන්මල්කඩක් බඳු දිය දහරා උඩට නැගී චිතකයට වදී. ගන්ධෝදකෙන රන් කළයකද රිදී කළයකද පුරවා ගෙනෙන ලද නොයෙක් සුවඳ ජලයෙන් නිබ්බාපෙසුං ස්වර්ණමය, රිදීමය, දඬු අටකින් විසුරුවා සඳුන් සෑය නිවා දැමූහ. මේ චිතකය දැවෙන කල්හි පිරිවරා සිටි සල් ගස්වල අතපතරින් රිකිලි අතුරින් පත්‍ර අතුරින් ගිනිදැල් පැන නගී. පත්‍රයක් හෝ අත්තක් හෝ මලක් හෝ දැවුනේ නම් නැත.

කුහුඹියෝ ද වාණරයෝ ද, ගිනිදැල් අතර නොහැසිරෙත්. අහසින් වැටුනු දියධාරාවල ද සල්ගස්වලින් නිකුත් වූ දියධාරාවලද පොළව පලාගෙන මතු වූ දියධාරාවලද ස්වභාවය ප්‍රමාණවත්ය. මෙසේ චිතකය නිවාදමා මල්ල රජවරු සන්ථාගාරයේ සිව් වර්ගයක සුවඳ පිරිබඩවා ලදපස්මල් විසුරුවා මත්තෙහි රෙදිවියන් බඳවා ස්වර්ණමය තාරකාවලින් සරසා එහි සුවඳ මාලාවන්, මල්මාලාවන්, එල්වා සන්ථාගාරයේ සිට ශීර්ෂාභරණ බැඳීම් සංඛ්‍යාත හිස සැරසන මංගල්‍ය ශාලාව දක්වා දෙපස තිර හා කළාලවලින් ආවරණය කර මත්තෙහි රෙදි උඩුවියන් බඳවා ස්වර්ණමය තාරකාවලින් සරසවා එහිද සුවඳවැල්, මල්මාලා, මාණික්‍ය වැල් ආදිය එල්වා මිණිදඬුවලින් ද උණගස්වලින්ද පංචවර්ණ කොඩි ඔසවා හාත්පස ධජපතාක ඔසවා සමතලා මාර්ගවල කෙසෙල්ගස්ද පුන්කලස් ද තබවා දඬුවැටපහන් දල්වා අලංකාර කරන ලද හස්තිරාජයාගේ පිටෙහි ධාතූන් වහන්සේලා සහිත රුවන් දෙණ තබා මල්ගඳ ආදියෙන් පුදා උත්සවශ්‍රීය පවත්වමින් ඇතුල් නගරයට පිවිස සන්ථාගාරයේ (නගර ශාලාවේ) ශක්තිමත් ආසනයක තබා ඒ මත්තෙහි ශ්වේතඡත්‍රයක් දැරීය. 'ඉක්බිති කුසිනාරා නුවර මල්ල රජදරුවෝ භාග්‍යවතුන් වහන්සේගේ ධාතූන් වහන්සේලා නගර ශාලාවෙහි දවස් හතක් ආරක්ෂිත මැදිරියක තබා' යනාදී ලෙස සියල්ල දතයුතුයි. එහි **සත්තිපංජරං කරිත්වා** යනු ආයුධ ගත් අත් ඇති පුරුෂයන් විසින් වටකරවා, **ධනුපාකාරා** පළමුව ඇතුන් හිසින් හිස ගැටෙන සේ වටකළහ. අනතුරුව අශ්වයන් ගෙළින් ගෙළ පහරමින් තැබූහ. ඉක්බිති රථ ඇණයෙන් ඇණය ගැටෙන සේ තැබීය. අනතුරුව යෝධයන් බාහුවෙන් බාහුව ගැටෙන සේත් ඔවුන් අග අගින් අග ගැටෙන දුනුවලින් වටකළහ. මෙසේ හාත්පස යොදුනක් පමණ තැන් දවස් හතක් යුද ඇඳුම්වලින් ගැවසී ගත්තාක් මෙන් කොට ආරක්ෂක විධිවිධාන යෙදූහ. ඒ ගැන කියන ලදී. **ධනුපාකාරං පරික්ඛිපාපෙත්වා** කුමක් නිසා මොව්හු මෙසේ කළාහුද? මීට කලින් සති දෙකකදී ඔව්හු භික්ෂු සංඝයාට හිඳීම්, සැතපීම් ආදියට ඉඩපහසුකම් සකස් කරන්නාහු ආහාරපාන සංවිධානය කරන්නාහු උත්සවයක් පවත්වන්නට නොහැකි වූහ. ඒ නිසා ඔවුන්ට මෙසේ සිතින. මේ සතිය උත්සව පවත්වන්නෙමු. මෙසේද සිදුවීමට ඉඩ ඇත. අපගේ යම්කිසි ප්‍රමාද දෝෂයක් දැක කිසිවෙක් අවුත් ධාතූන් වහන්සේලා ගන්නේය. ඒ නිසා ආරක්ෂා යොදා සැණකෙළි පවත්වමු යයි ඔව්හු එසේ කළහ.

අජාසත්ත රජු කෙසේ ඇසුවේද, පළමුව වනාහි ඇමැතිවරු අසා මෙසේ සිතූහ. ශාස්තෲන් වහන්සේ වනාහි පිරිනිවන් පෑවේය. ආපසු ගෙනෙන්නට නොහැක. පෘථග්ජන ශ්‍රද්ධාවෙන් වනාහි අපගේ රජුට සමාන කෙනෙක් නැත. ඉදින් මොහු මේ ක්‍රමයෙන්ම අසන්නේද ඔහුගේ හදවත පැළෙන්නේය. අප විසින් රජතුමාව ආරක්ෂා කළයුතුයි. ඔව්හු ස්වර්ණමය දෙනවල් තුනක් ගෙනවුත් චතුමධුරවලින් පුරවා රජු සමීපයට ගොස් මෙසේ කීවාහ. දේවයන් වහන්ස, අපි සිහිනෙන් මෙසේ දුටුවෙමු. එහි දොස් නැතිකිරීම සඳහා ඔබ වහන්සේ දුහුල් වස්ත්‍රයක් හැඳ නාසා සිදුර පෙනෙන තෙක් මෙසේ චතුමධුර දෙනෙහි බැසිය යුතුයැයි කීහ.

රජු හිතවත් ඇමැතිවරුන්ගේ වචන අසා, දරුවෙනි! එසේ වේවායි පිළිගෙන එසේ කළේය. ඉක්බිති එක් ඇමැතිවරයෙක් ආභරණ ගලවා කෙස් විසුරුවා යම් දිසාවක බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවේද ඒ දෙසට හැරී වැඳගෙන රජුට මෙසේ කීය. දේවයන් වහන්ස, මරණයෙන් මිදෙන සත්ත්වයෙක් නැත. අපගේ ආයුෂ වඩවන චෛත්‍යයක් වූ පින්කෙතක් වූ අභිෂේක පීඨයක් බඳු වූ ඒ භාග්‍යවත් ශාස්තෲන් වහන්සේ කුසිනාරා නුවරදී පිරිනිවන්පෑ සේක. ඇසූ විගසම රජුට සිහි නැතිවිය. චතුර මධුර පිරවූ දෙණ රත්විය. ඉක්බිති ඔහුව එයින් ඔසවා දෙවෙනි දෙක තැබීය. ඔහු සිහි ලැබ, දරුවෙනි! කුමක් කියන්නහුදැයි ඇසීය. මහරජතුමනි! ශාස්තෲන් වහන්සේ පිරිනිවන් පෑයේය. රජුට නැවතද සිහි නැතිවිය. චතුමධුර දෙණ රත්විය. ඉක්බිති ඔහුව එතනින් ද ඔසවා තුන්වන දෙනක තැබූහ. ඔහු නැවත සිහිය ලබා දරුවෙනි, කුමක් කියන්නහුදැයි ඇසීය. මහරජතුමනි, ශාස්තෲන් වහන්සේ පිරිනිවන් පෑයේය. රජුට නැවතද සිහි නැතිවිය. ඉක්බිති ඔහුව ඔසවා නාවා හිස මතට කළවලින් පැන් වත්කළහ. රජු සිහිය ලැබ අසුනින් නැගිට සුවඳ කැවූ මාණික්‍ය වර්ණ කෙස් රන් එලයකට සමාන වර්ණයෙන් යුත් පිටමත විසුරුවාගෙන අතින් පපුවට ගසමින් පබලු වැල්වලට සමාන මනාව වට වූ ඇඟිලිවලින් ස්වර්ණ වර්ණ වූ බිඹුපල වැනි වර්ණයෙන් යුත් පපුව තෙමන්නාක් මෙන් ගෙන හඬන්නේ උමතු විලාශයෙන් වීදිය මැදට පිවිසියේ, සැරසුණු නාටක ජනයා පිරිවරාගෙන නගරයෙන් නික්ම ජීවක අඹවනයට ගොස් යම්තැනක වැඩසිටිය භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මදේශනා කරන ලද්දේ ද එතැන බලා සර්වඥ වූ භාග්‍යවතුන් වහන්ස, මේ ස්ථානයේ සිට ධර්මදේශනා කළා නොවේද? ඔබ අපගේ

ශෝක නමැති උල් ගලවා දැමූ සේක. මම ඔබවහන්සේ සරණ ගියෙමි. භාග්‍යවතුන් වහන්ස, මට වචනයක්වත් කථා නොකරන්නේ ඇයිදැයි නැවත නැවතත් හඬා වැළප, භාග්‍යවතුන් වහන්ස, මම වෙනත් දිනක මෙබඳු කාලයක ඔබවහන්සේ මහා සංඝයා පිරිවරා දඹදිව් තලයෙහි චාරිකාවේ හැසිරෙන්නේ යැයි අසමි. දැන් වනාහි මම ඔබවහන්සේ පිළිබඳව නොගැලපෙන, නුසුදුසු පුවතක් අසමි යනාදිය කියා, හැටක් පමණ වූ ගාථාවන්ගෙන් භාග්‍යවතුන් වහන්සේගේ ගුණ සිහිකර මෙසේ සිතීය. මගේ හැඬීමෙන් යමක් සිදුනොවෙයි. දශබලයන් වහන්සේගේ ධාතූන් වහන්සේලා ගෙන්වා ගනිමියි මෙසේ අස්වැසුනේය. මේ සිහි නැතිවීමේ පුවත ආදිය අවසානයේ දූතයකු යැවීය.

ඒ ගැන 'අථඛො රාජා' (ඉක්බිති රජු) ආදිය පැවසීය. එහි දූතං පාහෙසි යනු දූතයකු ද ලිපියක් ද යැවීය. යවාද ඉදින් යහපතක් දකීනම් එසේය. යහපතක් නොපෙනේ නම් උපායකින් ගෙන එමියි සිව්රඟ සෙනඟ සූදානම් කර තමාද පිටත්ව ගියේය. එපරිද්දෙන් අජාතසත්තු රජතුමා ද මෙසේ ලිච්ඡවී රජවරු ද දූතයකු යවා තමන්ම සිව්රඟ සෙනඟ සමග පිටත්ව ගියහ. එහි අන් සියළු දෙනාටම වඩා සමීප වූ පාවෙය්‍ය නගරවැසියෝ තුන් ගව්වක ප්‍රමාණයේ නගරයෙහි වාසය කරත්. භාග්‍යවතුන් වහන්සේ ද පාවා නුවරට පිවිසම කුසිනාරාවට වැඩියේය. ඉක්බිති කුමක් නිසා පළමුවෙන් එහි නොපැමිණියාහුද? විශාලා පිරිවර සහිත මේ රජවරු මහා පිරිස් සූදානම් කළ බැවින් ප්‍රමාද විය.

තෙ සංඝෙ ගතෙ එතදවොචුං ඒ සත් නගරයන්හි වැසි සියල්ලෝම අවුත් අපට ධාතූන් වහන්සේලා දෙන්න. නැත්නම් යුද්ධ කරමු. කුසිනාරා නගරය වටකරගෙන මෙසේ සිටියකල්හි මෙසේ භාග්‍යවතුන් වහන්සේ අපගේ ගම්පළාතේ යයි පිළිතුරු දුන්හ. ඔව්හු වනාහි මෙසේ කීහ. අපි ශාස්තෘන් වහන්සේට පණිවිඩ නොයැව්වෙමු. ගොස් ගෙනාවේද නැත. ශාස්තෘන් වහන්සේ වනාහි තමන්වහන්සේම වැඩමවා පණිවිඩයක් යවා අප කැඳවූ සේක. තුඹලා වනාහි තුඹලාගේ ගම් ප්‍රදේශයේ යම් රත්නයක් පහළවේද එය අපට දෙන්නහුද? දෙවියන් සහිත ලෝකයේ බුද්ධරත්නය සමාන රත්නයක් නැත. මෙබඳු වූ උතුම් රත්නයක් ලැබූ අපි එය නොදෙන්නෙමු. තුඹලා පමණක් මවගේ තනයෙන් කිරි බීවාහු නොවන්නාහ. අපි ද මවගෙන් කිරි බීවෝ වෙමු. තුඹලා පමණක් නොව අපිද පුරුෂයෝ වෙමු. මෙසේ ඔවුනොවුන් අතර අහංකාර බස් පවසා

ලියුම්වලට පිළිතුරු යවත්. ඔවුනොවුන් මානයෙන් යුක්තව ගර්ජනා කරත්. යුද්ධයකදී කුසිනාරා වැසියන්ටම ජය අත්වන්නේය. කුමක් නිසාද? යම්හෙයකින් ධාතු වන්දනාව පිණිස පැමිණි දෙවිවරු ඔවුන්ගේ පක්ෂයේ වූහ. පෙළෙහි වනාහි 'භාග්‍යවතුන් වහන්සේ අපගේ ගම්පළාතේ පිරිනිවන් පෑයේය. භාග්‍යවතුන් වහන්සේගේ ධාතුන් වහන්සේලාගෙන් කොටසක් නොදෙන්නෙමු' යන මෙපමණක් දක්නට ලැබේ.

එවං වුතෙත දොණො බ්‍රාහමනො ද්‍රෝණ බ්‍රාහ්මණයා ඔවුන්ගේ මේ විවාදය අසා මේ රජවරු භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ තැන වාද කරත්. මෙය සුදුසු දෙයක් නොවේ. මේ වාද කිරීමෙන් වැඩක් නැත. ඔවුන් සංසිඳුවන්නෙමියි ඔහු ගොස් ඒ රැස්ව සිටි පිරිසට මෙසේ කීය.

උස්තැනක සිට බණවර දෙකක ප්‍රමාණය කීය. එය දොණ ගර්ජනාව නම් විය. එහි පළමු බණවරෙහි එක පදයක්වත් ඔව්හු නොදත්හ. දෙවන බණවර අවසානයේ මේ අපගේ ගුරුතුමාගේ හඬයැයි කියා සියල්ලෝම නිහඬ වූහ. දඹදිව් තලයේ වනාහි කුලගෙයක උපන්නහු බහුල වශයෙන් ඔහුට අතවැසියෙක් නම් නැත. ඉක්බිති ඔව්හු තමන්ගේ වචනය අසා නිහඬව තුෂ්ණිම්භූත වූ බව දැනගෙන නැවත මෙසේ කීය. 'සුණනතු භොනෙතා' (පින්වතුනි, අසත්වා.) මෙසේ ගාථා දෙකක් කීය. එහි.

අමහාකං බුදෙධා අපගේ බුදුරජාණන් වහන්සේ අහුබනතිවාදො බුද්ධ භූමියට නොපැමිණ පාරමිතාවන් පුරන්නේ ක්ෂාන්තිවාදී තාපස කාලයේ, ධර්මපාල කුමාර කාලයේ ඡද්දන්ත ඇත් කාලයේ භූරිදත්ත නාගරාජ කාලයේ චම්පෙය්‍ය නාගරාජ කාලයේ සංඛපාල නාගරාජ කාලයේ මහාකපි කාලයෙහි ද තවත් වනෙ බොහෝ ජාතකයන්හි අනුන් කෙරෙහි නොකිපී ඉවසීමම කළේය. ක්ෂාන්තියම වර්ණනා කළේය. කිම දැන් දැන් ඉටු අනිටු තාදී ලක්ෂණයන්ට පත්වූයේ, සර්වප්‍රකාරයෙන් අපගේ බුදුරජාණන් වහන්සේ ක්ෂාන්තිවාදී වූ සේක. මෙබඳු වූ ඔහුට, උත්තම පුද්ගලයකුගේ ශරීරය බිඳීගිය කල්හි මෙබඳු ඔවුනොවුන් කළහ කිරීම නොහොබී. සුදුසු දෙයක් නොවේ. නහි සාධු යං මෙය යහපත් නොවේ. සරීර භංගෙ ශරීරය විනාශ වීම නිමිති කරගෙන - ධාතු කොට්ඨාශයන් හේතුකරගෙන යන අර්ථයි. සියා සමපහාරො ආයුධවලින් ඔවුනොවුන් පහරදීම යහපත් නොවන්නේයැයි කියන ලදී. සබෙබව

**භොනෙතා සහිතා** නුඹලා සියළු දෙනාම එක්වන්න. සමගිවන්න. භේද නොවන්න. **සමෙමොදමානා සිතින්ද** ඔවුනොවුන් සන්තෝෂ වචී. **කරොමට්ඨභාගෙ** භාග්‍යවතුන් වහන්සේගේ ශරීර කොටස් කොටස් අටකට බෙදමු. **චක්ඛුමතො** ඇස් පසක් ඇති චක්ඛුමනත වූ බුදුරජාණන් වහන්සේට හුදෙක් නුඹලා පමණක් නොව බොහෝ ජනයා පැහැදුනේ විය. ඔවුනතුරෙන් එක් අයෙක්වත් ලබන්නට අයුක්තියක් නම් නැත්තේ යයි බොහෝ කරුණු කියා දන්වා සිටියේය.

**තෙසං සංඝානං ගණානං පටිස්සුණිත්වා** එහි රැස්වූ භික්ෂූන්ට පොරොන්දු වී **භගවතො සරීරානි අට්ඨමා සමං සුවිභත්තං විභජිත්වා** (භාග්‍යවතුන් වහන්සේගේ ශරීර කොටස් සමාන කොටස් අටකට බෙදා) මේ එහි පිළිවෙල කථාවයි.

ද්‍රෝණ තෙමේ ඔවුන්ට පොරොන්දු වී රන්දෙණ විවෘත කරවීය. රජවරු පැමිණ දෙණෙහි ස්වර්ණවර්ණ වූ ධාතූන් දැක, භාග්‍යවතුන් වහන්ස, සර්වඥයන් වහන්ස, පෙර අපි ඔබවහන්සේගේ දෙතිස්මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සමන්විත වූ සවණක් බුදුරැසින් අලංකාර වූ අසූවක් අනුව්‍යඤ්ජනයන්ගෙන් බබලන්නා වූ ශරීරය දුටුවෙමු. දැන් වනාහි ස්වර්ණවර්ණ ධාතූන් ඉතිරිවිය. භාග්‍යවතුන් වහන්ස, මෙය ඔබවහන්සේට සුදුසු නොවන්නේ යයි හැඬූහ. බ්‍රාහ්මණයා ඒ වේලාවේ ඔවුන්ගේ ප්‍රමාදය දැනගෙන දකුණු දළදාව ගෙන තලප්පාවේ සඟවා ගත්තේය. ඉක්බිති ඉතිරිය සමාන කොටස් අටකට බෙදීය. සියළුම ධාතු ස්වාභාවික නැළියෙන් නැළි සොළසක් විය. එක එක නගරවැසියා නැළි දෙක බැගින් ලැබූහ. බෙදන්නා වූ බ්‍රාහ්මණයා තබාගත් ධාතු ඔහුටය. ශක්‍ර දේවේන්ද්‍රයා දෙවියන් සහිත ලෝකයාගේ සැක දුරුකිරීම පිණිස චතුරාර්ය සත්‍ය කථාවට උදව් වූ භාග්‍යවතුන් වහන්සේගේ දකුණු දළදා වහන්සේ කවරකු විසින් ගන්නා ලදදැයි බලන්නේ බ්‍රාහ්මණයා විසින් ගන්නා ලදැයි දැක, බ්‍රාහ්මණයා ද දළදා වහන්සේට සුදුසු සත්කාර දක්වන්නට සමත් නොවන්නේය. එය ගන්නෙමියි තලප්පාවෙන් ගෙන රන් කරඬුවක තබා දෙව්ලොවට ගෙන ගොස් සිළුමිණි සෑයෙහි තැන්පත් කළේය. බ්‍රාහ්මණයාද ධාතු බෙදා දළදාව නොදක්නේ සොරකු විසින් ගන්නා ලද බැවින් කවරකු විසින් මාගේ ධාතූන් වහන්සේ ගන්නා ලදදැයි අසන්නටවත් අසමත් විය. නුඹ විසින් ධාතූන් බෙදන ලද්දේ නොවේද?

පළමුවෙන්ම තමන්ට ද ධාතූන්වහන්සේලා අවශ්‍ය බව නොදත්තේද? මෙසේ තමා කෙරෙහිම දෝෂාරෝපණය කරන්නේ මටද කොටසක් දෙන්න යැයි කියන්නට ද නොහැකි විය. ඉක්බිති මේ ස්වර්ණමය කුරුණියෙන් තථාගතයන් වහන්සේගේ ධාතු බෙදන ලදී. මෙය තබා මම ථූපයක් කරන්නෙමියි සිතා පින්වතුනි! මට මේ ධාතු මැන්න කුරුණිය දෙන්න යැයි කීය.

පිප්ඵලී වනවාසී මෞර්යයෝ අජාසත් ආදීන් මෙන් දූතයකු යවා යුද්ධයට සූදානම්ව නික්මුනාහ. රජගහ නුවර භාග්‍යවතුන් වහන්සේගේ ධාතූන් වහන්සේලාට චෛත්‍යයක් ද උත්සවද පැවැත්වූහ. කෙසේ කළේද? කුසිනාරාවේ සිට රජගහනුවර තෙක් යොදුන් විසිපහකි. මේ අතරතුර අට ඉස්බක් පළල් සමතලා මාර්ගයක් කරවා යම්සේ මල්ල රජවරු ඔටුනු බඳින තැන හා නගර ශාලාව අතර පූජා කළාහුද එබඳු යොදුන් විසිපහක් මග පූජා කරවවා ලෝකයාට කළකිරීමක් ඇතිනොවන පරිදි සියළු තන්හි අතරතුර ආපණ විවෘත කරවා ස්වර්ණ දෝණියෙහි තබන ලද ධාතූන් ආරක්ෂිත මැදිරියකින් වටකර තමන්ගේ රාජ්‍යයේ පන්සියයක් යොදුන් ප්‍රදේශයේ මිනිසුන් රැස් කරවූයේය. ඔව්හු ධාතූන් ගෙන කුසිනාරාවෙන් ධාතු සැණකෙළි පවත්වමින් නික්ම යම් යම් තැනක වර්ණවත් මල් දක්නට ලැබේද ඒ ඒ තැන්වලදී ධාතූන් වහන්සේලාව ආරක්ෂා මධ්‍යයේ තබා පූජා කළහ. ඒ ඒ මල් හිඟ වූ කල්හි යත්. රථයේ වියගහ පසුපසට පැමිණෙනවිට දවස් සතක් ධාතු සැණකෙළි පවත්වත්. මෙසේ ධාතු රැගෙන එන්නවුන්ට සත්වර්ෂ සත්මාස සත් දවසක් ගතවිය. මිථ්‍යාදෘෂ්ටිකයෝ මෙසේ කීහ. ශ්‍රමණ ගෞතමයන් පිරිනිවන්පෑ කාලයේ පටන් බලහත්කාරයෙන් සැණකෙළි පැවැත්වීමෙන් උපද්‍රවයට පත්වූයෙමු. අපගේ සියළු තථාගතයෝ නැසුනාහයි උද්ඝෝෂණය කරන්නා වූ අසූහය දහසක් පමණ අපායෙහි උපන්හ. රහතන් වහන්සේලා ආවර්ජනා කොට බලන්නේ මහාජනයා හිත කිළිටි කරගෙන අපායෙහි උපදිත්. ශක්‍ර දේවේන්ද්‍රයා දැක ධාතූන් වහන්සේලා ගෙන ඒමට උපායක් යොදන්නෙමියි ඔහුගේ සමීපයට ගොස් ඒ බව දන්වා මහරජ, ධාතූන් රැගෙන ඒමට උපායක් යොදන්න යැයි කීහ.

ශක්‍රයා මෙසේ කීය. පෘථග්ජනයෝ නම් අජාසත්ට සමානය. ශ්‍රද්ධාවක් නැත. හෙතෙම මගේ වචනය නොකරන්නේය. තවද මාරයාගේ විහිලුවක් මෙන් විකාරයක් දක්වන්නෙමුයි මහා ශබ්දයක් අස්වන්නෙමු.

යකුන් විසින් අල්ලාගත් ඉවත දැමූ ආරෝචකයන් කරන්නෙමි. මහරජතුමනි, අමනුෂ්‍යයෝ කිපුණාහ. ධාතූන් වහන්සේලා ගෙන්වා ගන්න යැයි කියව්. මෙසේ ඔහු ගෙන්වා ගත්තේය.

ඉක්බිති ශක්‍රයා ඒ සියල්ල කළේය. තෙරවරු ද රජු වෙතට පැමිණ මහරජතුමනි, අමනුෂ්‍යයෝ කිපියාහ. ධාතූන් වහන්සේලාව ගෙන්වාගන්න යැයි කීහ. රජු ස්වාමීනි, තවමත් මාගේ සිත සතුටුවී නැත. මෙසේ ඇතිකල්හිද ගෙනෙත්වායි කීය. සත්වන දිනයෙහි ධාතූන් වහන්සේලා ගෙනෙන ලදී. මෙසේ ගෙනෙන ලද ධාතූන් රැගෙන රජගහනුවර ස්තූපයක්ද පූජාවක් ද කළේය. අනික් අයද තම තමන්ගේ බල පරිදි ගෙනවුත් තම තමන්ගේ තැන්වල ස්තූප කරවා පූජා කළහ. එවමෙතං භූතපුබ්බං යනු මෙසේ මේ ධාතු බෙදීමද දසථූපයන් නිර්මාණය කිරීමද දඹදිව සිදුවිය යැයි පසුව සිටි සංගීති කාරකයෝ පැවසූහ.

මෙසේ ථූපයන් පිහිටි කල්හි මහා කාශ්‍යප රහතන් වහන්සේ ධාතූන් වහන්සේලාට සිදුවිය හැකි අනතුරක් දැක අජාසත් රජු වෙත පැමිණ මහරජ, එක් ධාතු නිධානයක් කළයුතුයයි පැවසීය. එසේය ස්වාමීනි, නිදන් කිරීමේ කාර්ය මට පැවරේවා. ස්වාමීනි! කෙසේනම් ධාතූන් වහන්සේලා ලබා ගනිමුද? මහරජතුමනි, ධාතූන් වහන්සේලා වැඩමවීම ඔබතුමාගේ කාර්යයක් නොවේ. එය අපට භාරය. එසේය ස්වාමීනි, ඔබවහන්සේ ධාතූන් වැඩමවා දෙන්න. මම ධාතු නිධානය කරන්නෙමි යි කීය. තෙරුන් වහන්සේ ඒ ඒ රජ කුලවලට පූජා පැවැත්වීමට පමණක් ප්‍රමාණවත් ධාතූන් තබා ඉතිරි ධාතූන් රැගෙන ආවේය.

රාම ග්‍රාමයෙහි ධාතූන් වහන්සේලාව නාගයන් විසින් ගන්නා ලදී. එයට අනතුරක් නැත. අනාගතයෙහි ලංකාද්වීපයේ මහා විහාරයෙහි මහා සෑයෙහි නිධන් කරවන්නේ යැයි ඒවා ගෙන ආවේ නැත.

ඉතිරි නගර හතෙන් ගෙනවුත් රජගහ නුවරට ගිනිකොන දිශාවේ තබා මේ ස්ථානයේ යම් පාෂාණයක් තිබේද එය අතුරුදන් වේවා. පස් පිරිසිදු වේවා. ජලය නොනගීවායි අධිෂ්ඨාන කළේය. රජු ඒ ස්ථානය සාරවා එයින් ගොඩගත් පස්වලින් ගඩොල් සාදවා අසූමහා සව්වන්ගේ චෛත්‍යයන් කරවයි. රජු මෙහි කුමක් කරන්නේදැයි අසන්නවුන්ට ද

මහා ශ්‍රාවකයන් වහන්සේලාගේ චෛත්‍යයන් සාදවන්නේය කියාත් ධාතු නිධාන කිරීමක් ගැන නොකියත්.

අසූරියනක් පමණ ඒ පෙදෙස ගැඹුරු වූ කල්හි යට ලෝහ තහඩුවක් අතුරා එහි ථූපාරාම චේතිය සරයේ ප්‍රමාණයට තඹ ලෝහයෙන් ගෙයක් කරවා අට බැගින් රන්වන් සඳුන්මය කරඬුද ථූපයන් ද කරවීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගේ ධාතූන් රන්වන් සඳුන්මය කරඬුවක තබා ඒ කරඬුව වෙනත් එබඳු කරඬුවක තබා එයට වෙනත් සඳුන් කරඬුවක ඒ ලෙසටම තබා මේ ආකාරයෙන් කරඬු අටක තැන්පත් කර ඒ කරඬු අට එක්තැන් කර මේ ආකාරයෙන්ම ඒ කරඬු අට රන් සඳුන් ථූප අටකද ඒ කරඬු රතුපාට සඳුන් කරඬුවල ද ඒ කරඬු රත්සඳුන් ථූප අටකද ඒ කරඬු අට ඇත්දත් කරඬු අටකද ඒ කරඬු ඇත්දත් ථූප අටකද ඒවා රතනමය කරඬු අටකද ඒ රත්නමය කරඬු අට රත්නමය ථූප අටකද ඒවා ස්වර්ණමය කරඬුවලද ඒවා ස්වර්ණ ථූප අටකද ඒවා රිදී කරඬු අටකද ඒවා රිදී ථූප අටකද ඒ රිදී ථූප අට මැණික් කරඬු අටකද ඒවා මාණික්‍ය ථූප අටකද ඒවා පද්මරාග කරඬු අටකද ඒවා පද්මරාග ථූප අටකද ඒවා වෛරෝඩි කරඬු අටකද ඒවා වෛරෝඩි ථූප අටකද ඒවා පලිඟු කරඬු අටකද ඒවා පළිඟු චෛත්‍ය ථූපාරාම චෛත්‍යය පමණ විය. ඒ මත්තේ මාණික්‍යමය ගෘහයක් කරවීය. ඒ මත්තේ ස්වර්ණමය ගෘහයක්ද ඒ මත්තේ රිදීමය ගෘහයක්ද ඒ මත්තේ තඹලෝහමය ගෙයක්ද කරවීය.

එහි රතනමය වැලි අතුරවා, ජලයෙහි හා ගොඩබිම සෑදෙන මල් දහස් ගණනක් විසුරුවා පන්සියයක් ජාතක කථාවන්ද අසූමහා ශ්‍රාවකයන් ශුද්ධෝදන මහරජු, මහාමායා දේවිය, සහජාත සප්ත වස්තුනුත් යන සියල්ල රනින් කරවීය.

පන්සියය බැගින් රන් රිදී පුන්කලස් තැබ්බවීය. පන්සියයක් රන් දද එසවීය. පන්සියයක් ස්වර්ණ ප්‍රදීපයන් ද පන්සියයක් රජතමය ප්‍රදීපයක් ද කරවා ඒවා සුවඳ තෙලින් පුරවා ඒවායෙහි දුහුල් පහන්වැටි තැබ්බවීය.

ඉක්බිති මහා කාශ්‍යප තෙරුන් වහන්සේ මල්මාලාවන් නොමැලවේවා. සුවඳ නොනැසේවා. පහන් නොනිමේවායි අධිෂ්ඨාන කොට රන්පටවල ලියවා තැබීය.

අනාගතයෙහි පියදාස නම් කුමාරයෙක් සේසත් නංවා අසෝක ධර්මරාජයා වන්නේය. ඔහු මේ ධාතුන් වහන්සේලාව විසුරුවා හරින්නේ යයි රජු සියලු ආභරණවලින් පුදා මුලපටන් දොරවල් වසමින් නිකුත් විය. ඔහු තඹ ලෝහමය දොර වසා දොර වසන, හරින ලනුව යතුරු මුදුවෙහි බැඳ එහිම විශාල මැණික් සමූහයක් තැබ්බවීය.

අනාගතයේ පහළ වන්නා වූ දිළිඳු රජවරු මේ මැණික් ගෙන ධාතුන් වහන්සේලාට සත්කාර කරත්වායි ලියා තැබීය. සක්දෙව් රජ විශ්වකර්මයා අමතා දරුව, අජාසත් රජු විසින් ධාතු නිධානයක් කරන ලදී. එහි ආරක්ෂා විධිවිධාන යොදන්න යැයි පිටත්කර හැරීය. ඔහු අවුත් වාල සංඝාට යන්ත්‍රයක් යෙදවීය. ලී රූප ඒ ධාතු ගර්භයෙහි පළිඟු වර්ණ කඩුගෙන වාතයට බඳු වේගයෙන් හාත්පස හැසිරෙමින් යන යන්ත්‍රයක් යොදා එක යතුරකට සම්බන්ධකර හාත්පසින් ගඩොල් ගෙයක ආකාරයෙන් ගල්වලින් වටකර මත්තේ එකකින් වසා පස් දමා බිම සමතලා කර ඒ මත්තේ පාෂාණමය ථූපයක් සෑදවීය.

මෙසේ ධාතු නිධානය නිමවූ කල්හි දිවි ඇතිතෙක් සිට තෙරුන් වහන්සේද පිරිනිවන් පෑ සේක. රජතුමා ද මිය ගියේය. ඒ මිනිස්සුද මිය ගියාහ.

අපර භාගයෙහි පියදාස නම් රජෙක් ඡත්‍ර නංවා අසෝක නම් ධර්මරාජව ඒ ධාතුන් ගෙන දඹදිව පුරා බෙදා හැරියේය.

කෙසේද? ඔහු නිග්‍රොධ සාමණේරයන් වහන්සේ නිසා සසුනෙහි පැහැදී අසූසාර දහසක් විහාර කරවා ධාතුන් වහන්සේලා කොහෙන් ලබාගන්නෙමුදැයි ඇසීය. මහරජ, ධාතු නිධානයක් ඇතැයි අසා ඇත. අසවල් තැන යයි නොපෙනේ. රජු රජගහ නුවර චෛත්‍යයක් බිඳවා ධාතු නොදැක නැවත ප්‍රතිසංස්කරණය කරවා භික්ෂු භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්පිරිස රැගෙන විශාලා නුවරට ගියේය. එයින්ද නොලැබ කපිලවස්තු පුරයටද එයින් නොලැබ රාම ග්‍රාමයට ගියේය. රාමග්‍රාමයේ නාගයෝ චෛත්‍යය බිඳින්නට ඉඩ නුදුන්හ. චෛත්‍යයට ගැසූ උදැල්ල

කැලිවලට කැඩී යයි. මෙසේ එහිද නොලැබ අලලකපප නගරයටද, වෙඨදීපය, පාවක, කුසිනාරා යන සියළු තන්හි චෛත්‍යයන් බිඳවා ධාතු නොලැබ ඒවා නැවත පිළිසකර කරවා නැවත රජගහ නුවරට ගොස් සිව් පිරිස රැස්කරවා, අසවල් තැන ධාතු නිධන්කර ඇතැයි කවරකු විසින් හෝ අසා තිබේදැයි විමසීය. එහිදී එක්, එකසිය විසිවයස් තෙරනමක් අසවල් තැන ධාතු නිධන්කර ඇතැයි නොදනිමි. නමුත් මගේ පියා මහතෙර නමකි. මා සත්වයස් කල්හි මල්කරඬුවක් මා ලවා ගෙන්වාගෙන, සාමණේරය එන්න. අසවල් ගස් අතරේ පාෂාණ චෛත්‍යයක් ඇත. එහි යමු යැයි ගොස් පුදා සාමණේරය මේ ස්ථානය මතක තබාගන්න වටීයයි පැවසීය. මම මෙපමණක් දනිමියි මහරජ යැයි පැවසීය.

රජු ඒ ස්ථානයම විය යුතුයයි කියා ගොස් එහි පාෂාණ ථූපයත්, පස් ද ඉවත්කර යමින් හුණු පොළවක් දුටුවේය. එයින් හුණු ද ගඩොල්ද ඉවත්කර පිළිවෙලින් පිරිවෙණට බැස සප්ත රත්නමය වැලි ද ආයුධ ගත් අත් ඇති ලී රූප ද කරකැවෙනු දුටුවේය. හෙතෙම යකැදුරන් ගෙන්වා බලිකර්මයක් කරවවා ද අවසානයක්, කෙළවරක් නොදක්නේ දෙවියන්ට වඳිමින් ධාතූන් වහන්සේලාව ගෙන අසූසාර දහසක් විහාරවල නිධන්කොට ගරුසත්කාර කරන්නෙමි. දෙවියෝ මට අනතුරක් නොකරත්වායි කීය. සක්දෙව් රජ චාරිකාවේ හැසිරෙන්නේ ඒ දැක විශ්වකර්මයා අමතා දරුව! ධර්මරාජ වූ අසෝක රජු ධාතූන් වහන්සේලාව බැහැර ගෙනයන්නෙමියි පිරිවෙණට බැස සිටී. එහි ගොස් ලී රූප ඉවත් කරන්න. හෙතෙම පස්වයස් ගම්දරුවකු මෙන් ගොස් රජු ඉදිරියේ දුන්නක් ගත් අත් ඇතිව සිට මහරජතුමනි, ඉවත් කරමියි කීය. දරුව, ඉවත් කරන්නයැයි කීය. ඊය ගෙන බැඳ තිබුණු තැනට විද්දේය. සියල්ල විසිරී ගියේය. ඉක්බිති රජතුමා ලතුවෙහි එල්ලා තිබුනු යතුරු කැරැල්ල ගත්තේය. මැණික් සමූහය දුටුවේය. අනාගතයේ දිළිඳු රජවරු මේ මැණික් ගෙන ධාතූන් වහන්සේලාට සත්කාර කරත්වායි ලියා තිබූ අකුරු කියවා කෝපයට පත්ව මා වැනි රජකු දිළිඳුයයි කියන්නට යෝග්‍ය නොවේයැයි නැවත නැවතත් තල්ලු කරමින් දොර විවෘත කරගෙන ඇතුල්ගෙට පිවිසියේ අවුරුදු දෙසිය දහඅටකට පෙර දල්වන ලද පහන් එසේම බබලයි. තිලුපුල් මල් ඒ මොහොතේ අතුරන ලද්දක් මෙන් සුවඳින් යුක්ත විය. රජු රන්පට ගෙන, අනාගතයේ පියදාස නම් කුමාරයෙක් රජවී අශෝක නම් වූ ධර්මරාජයෙක් වන්නේය. හෙතෙම මේ ධාතු බෙදා හරින්නේ යැයි කියවා, මම වනාහි මහා කාශ්‍යප තෙරුන් වහන්සේ විසින් දක්නා ලදැයි

කියා වම් අත හකුළාගෙන දකුණු අතින් අත්පුඩි ගැසීය. හෙතෙම එම ස්ථානයෙහි වඳින්නට ධාතු ස්වල්පයක් පමණක් තබා ඉතිරි ධාතු සියල්ල ගෙන ධාතු මන්දිරය පෙර පරිදිම වසා තබා සියල්ල පැවැති තත්ත්වයට පත්කර මත්තෙහි පාෂාණ චෛත්‍යයක් සාදවා අසූහාර දහසක් විහාරවල ධාතු තැන්පත් කර මහ තෙරවරුන්ට වැඳ මෙසේ විචාළේය. ස්වාමීනි! මම සසුනෙහි දායාද ඇත්තේ වෙමි. මහරජ, ඔබ කුමකට දායාදකොට ඇත්තෙහිද? මහරජ, ඔබ සසුනෙන් බාහිර කෙනෙකි. ස්වාමීනි! අනූහය කෝටියක් ධනය වියදම් කර අසූහාර දහසක් කරවූ මට දායාද නැත්තේ නම් දායාදකොට ඇත්තේ කවරෙක්ද?

මහරජ, ඔබ සිව්පසය දෙන දායකයෙකි. යමෙක් වනාහි තමන්ගේ පුතකු හෝ දුවණියක පැවිදි කරවයිද මෙය සසුනේ දායාද ඇත්තේ නම් වන්නේය. හෙතෙම පුත්‍රයාවද දුවණියද පැවිදි කරවීය. ඉක්බිති තෙරවරු ඔහුට මෙසේ කීහ. මහරජ, දැන් ඔබ සසුනෙහි දායාද ඇත්තේ වන්නෙහිය.

'එවමෙතං භූතපුබ්බං' යන්නෙන් මෙසේ මෙය අතීතයෙහි ධාතු නිධානයක් දඹදිව් තලයෙහි සිදුවූවකි යි තුන්වන සංගායනා කාරකයෝ මේ පදය ලියා තැබූහ. 'අට්ඨදොණං චක්ඛුමතො සරීරං' (තථාගතයන් වහන්සේගේ ශරීරය ද්‍රෝණ අටකි) මේ ආදී ගාථාවන් වනාහි ලංකාද්වීපවාසී තෙරවරුන් විසින් කියන ලදී.

**මහාපරිනිබ්බාණ සූත්‍ර වර්ණනාව නිමියේ ය.**

## මහා වර්ග වර්ණනාව සමාප්තයි.

## දීඝ නිකායට්ඨ 1 වන කාණ්ඩය